2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.26 **වෙලාව:- ප ව. 1.20**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි අංක 449 නැවත සාක්ෂියට කැඳවයි.</u>

සම්පූර්ණ නම : දොන් නිශාන්ත ලෝරන්ස් රාමනායක පියතුමා

<u>නැවත කැඳවා දිවුරුම් දෙයි.</u>

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීම අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයා අරඹයි.

****

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : ගරු පියතුමා දැන් මෙම පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ගේ සුභ සාධනය සඳහා වෙන් කර ඇති අරමුදල සම්බන්ධයෙන් කතෝලික සභාවේ කටයුතු කිරීමට කොළඹ අහරදගරු හිමිපාණන් විසින් මණ්ඩලයක් පත් කරලා තිබෙනවද?

පි : පත් කරලා තිබෙනවා ස්වාමීණි.

ප්‍ර : ඔබතුමාට කියන්න පුළුවන් ද මෙම මණ්ඩලයේ සාමාජිකයන් කවුද කියලා?

පි : පුළුවන් ස්වාමීණි. අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මා හට ඒ නම් ඇතුලත් ලිඛිතව මට ලබා දී තිබෙනවා ස්වාමීණි. එහි පිටපතක් මා සමඟ ඇති හෙයින් මා එම නම් ටික ප්‍රකාශ කරන්නට කැමතියි. ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ ස්වාමීණි.

Rt.Rev.Dr.Maxwell Silva – Auxiliary Bishop of Colombo.

Rt.Rev.Dr.J.D. Anthony - Auxiliary Bishop of Colombo.

Very Rev.Fr.Jude Samantha–Procurator General – In charge of Funds.

Rev.Fr.Freely Muthukudarachchi

Rev.Fr.Gihan Riddley.

Rev.Fr.Claud Nonis.

Rev.Fr. Prasad Harshana.

Rev.Fr.:Lawrence Ramanayake

Rev.Fr.Jude Raj Fernando –Administrator – St.Anthony's Shrine, Kochchikade.

Rev.Fr. Manjula Niroshan Fernando – Parish Priest – St.Sebastian's Church, Katuwapitiya.

Mr. Marius Madurawela – Account

President Secretariya Copy

FAIR COMMENT — BY JEZEEM —

<u>මේ අවස්ථාවේදි එකී ලේඛනය NR1 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර සිටීමට අවසර පතනවා.</u>

ප්‍ර : මෙම මණ්ඩලයේ ගරු පියතුමා ඔබතුමත් සාමාජිකයෙක්ද?

පි : එහෙයි ස්වාමිණි.

ප්‍ර : මේ මණ්ඩලය පත් කර තිබෙන්නේ කවදාද?

පි : ස්වාමිණි මෙහි මූලිකත්වය ගෙන වැඩ කටයුතු අපි දින 3 කින් ආරම්භ කලත් මණ්ඩලයක් විදියට ප්‍රකාශයට පත් කළේ මැයි මාසේ මගේ මතකයේ විදියට 2 වන සතියේ විදියට තමයි 2019 මැයි මාසේ 2 වන සතියේ වගේ තමයි ස්වාමිණි මේ මණ්ඩලය පත් කළේ. නමුත් අපි ලිඛිතව ගත්තේ නැහැ අවශ්‍යතාවයක් වුණේ නැහැ ලිඛිතව ඉදිරිපත් කරන්න. නමුත් අපිට අවශ්‍යතාවයක් ඇති වුණ මොහොතක දී ඒ මූල්‍යමය කටයුතුවලට අහරදගරුතුමා ඔය ලිපිය මා හට ලබා දුන්නා. ඒ සමඟම තව ලිපියක් මට ලබා දුන්නා මෙහි වැඩ කටයුතු කරගෙන යන්න මේ සෙත්සරණ කියන ආයතනයේ අධ්‍යක්ෂක තුමාට මෙහි සහන සේවා කටයුතු කරගෙන යන්න අවසරය ලබා දෙන්න කියන ලිපියකින් මා හට ඒ වගකීම පවරපු ලිපියකුත් මා සමඟ තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : ඒ ලිපිය ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවද?

පි : මා ලඟ තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : දැන් ගරු පියතුමා පාස්කු ප්‍රහාරයෙන් අගතියට පත් වින්දිත ජනතාව වෙනුවෙන් සුභ සාධන කටයුතු කිරීම සඳහා යම් අරමුදලක් පිහිටුවනු ලැබුවද?

පි : ඔව් ස්වාමිණි, අහරදගුරු හිමිපාණන් මා ඊයේ ප්‍රකාශ කළ පරිදි ඒ අවස්ථාව සිදු වෙලා දින 2, 3 ට පසුව ප්‍රධාන පෙළේ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු 6 ක ගිණුම් 6 ක් විවෘත කරලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම සුභ සාධන කටයුතු සියල්ලම සහ මුදල් පරිහරණය පිළිබඳව අධීක්ෂණය කරන්නේ මේ තමන් මීට පෙර කියපු මණ්ඩලය මගින්ද?

පි : ඒ මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ ස්වාමිණි කාදිනල් හිමිපාණන්. එම රැස්වීමේදී එම සියළුම අධීක්ෂණ කටයුතු එම කණ්ඩායම සමඟ සිදු කරනවා.

ප්‍ර : දැන් මෙම අරමුදලට ඉතාලි රදගුරු සම්මේලනයෙන් කොපමණ මුදලක් පරිත්‍යාග කර තිබේද? කියන්නේ Italian Bishop Conference එකෙන්?

පි : ස්වාමිණි එහි වාර්තාවත් මගේ අතේ තිබෙනවා ස්වාමිණි. ලැබිච්ච මූල්‍යමය තොරතුර පිළිබඳ සියළුම වාර්තා ටික ස්වාමිණි මට සුළු

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

මොහොතක් ලබා දෙන්න මම එම සංඛ්‍යාව ඔබවහන්සේට ප්‍රකාශ කරන්නම්.

මේ අවස්ථාවේදි <u>අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ගරු ලෝරන්ස් රාමනායක පියතුමාට ලියන ලද ලිපියක් 2019 අප්‍රේල් මස 29 වන දිනැති ලිපිය NR 2 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතමි</u>.

ප්‍ර : පියතුමා ඔබතුමා ලඟ තිබෙනවද? මොකක්ද ඔබතුමා ලඟ තිබෙන්නේ?

පි : මා ලඟ තිබෙනවා විදේශ අඟරදගුරු හිමිපාණන් විදේශගත වෙලා මේ කරුණ සම්බන්ධයෙන් පාප් වහන්සේට කරුණු දක්වන්න ගිය අවස්ථාවේදි එහි පාප් වහන්සේ ශුද්ධොත්තම පියතුමා සහ අනෙකුත් එතුමාට ලබා දුන්නු දායකත්වය එක එක අය, පියතුමන්ලා. ඒ වගේම ජනතාව විදේශ මුදල් වශයෙන් ලබා දුන්න ලේඛනයේ පිටපතක් සහතික කරපු පිටපතක් මගේ මුල්‍යමය ෆයිල් එකේ තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : ඒ පිටපතේ මොකක්ද සඳහන් වෙලා තියෙන්නේ ගරු පියතුමා?

පි : Relief fund for the rehabilitation of 2019 Easter Disaster Victims and Churches. Collection details Funds received from Italy and Europe on the visit of His Eminence.

<u>එම ලේඛනය එනම් මෙම පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූ ජනතාවගේ අරමුදලට පිටරටින් ලැබී ඇති මුදල් සම්බන්ධයෙන් තිබෙන ලේඛනය NR3 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ සභාය පතනවා.</u>

ප්‍ර : දැන් එම වාර්තාව අනුව කොපමණ මුදලක් සම්පූර්ණයෙන් ලැබිලා තියෙනවද කතෝලික සභාවට?

පි : ස්වාමිණි මාර්තු මස 31 වෙනි දින දක්වා 2020 ලැබුණු මුළු මුදල මිලියන 518 යි 089079 ශත 09 ක් ලෙස එහි විගණණ කටයුතු කරන පියතුමා සටහන් කරලා මා වෙත වාර්තාවක් ලබා දීලා තිබෙනවා.

ප්‍ර : දැන් මෙම මුදල ලැබී තිබෙන්නේ පිටරටින් නේද?

පි : ස්වාමිණි සම්පූර්ණ මුදල් ප්‍රමාණයම නෙමෙයි, මා පෙර කියපු ලේඛනයේ සඳහන් මුදල් සියල්ලම පිටරටින් විදේශ මුදල් විදියට ලැබීලා තියෙනවා.

ප්‍ර : NR 3 ලෙස ලකුණු කරන ලද ලේඛනයේ සම්පූර්ණ මුදල පිටරටින් තමයි ලැබිලා තියෙන්නේ?

පි : එහෙයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබතුමා ලඟ තියෙනවද ශුද්ධෝත්තම පියතුමා විසින් දීලා තියෙන මුදල කොපමණ මුදලක්ද?

පි : එහෙයි ස්වාමිණි. ඒක මිලියන 19 යි 516302 යි ශත 50 ක් වශයෙන් සඳහන් වෙලා තියෙනවා ස්වාමිණි. මෙය රුපියල් වලින් සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර : දැන් එම මුදල, දැන් තමා මේ කියපු මුදල ගරු පියතුමා පාස්කු ප්‍රහාරයෙන් අගතියට පත් වූ ජනතාවට ලැබුණේ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පෞද්ගලිකව ගිහිල්ලා ඒ මුදල ඉල්ලපු නිසා කියලා කිව්වොත් හරිද?

පි : මම හිතන්නේ ගෞරවණීය සභාවට කියන්න කැමතියි උන්වහන්සේ ඉල්ලුවේ නැහැ ස්වාමිනි මේ විපතට පත් වෙච්ච ජනතාවගේ මේ කඳුළු කතාව අහලා ශුද්ධෝත්තම පියතුමා පවා ඊමේල් හරහා අඟරදගරු හිමිපාණන්ට සහ පෞද්ගලිකව දුරකථන ඇමතුම් දීලත් විස්තර අහලා තිබුනා මාව හැකි ඉක්මණට හමුවෙලා මේ ගැන සාකච්ඡා කරන්න කියලා ඉල්ලීමක් වාචිකව අඟරදගරු හිමිපාණන් කාදිනල් හිමිපාණන් අපිත් එක්ක බෙදා ගත්තු අවස්ථා තිබුනා ස්වාමිනි. ඒ ගිය අවස්ථාවේදි මේ ජනතාව වෙනුවෙන් දුන්න මුදලක් විදියට තමයි අපි සඳහන් කරන්න කැමතියි ඉල්ලුව සඳහනක් ගැන අඟරදගරු හිමිපාණන් අපිට දන්වලා නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම අරමුදල සම්බන්ධයෙන් සියළුම ආදායම් සහ වියදම් සංවිධාන විගණනයකට ලක් කරලා තිබෙනවද?

පි : ඔව් ස්වාමිනි මේ වන කොට වර්ෂය නිමා වෙලා තියෙන නිසා අඟරදගරු හිමිපාණන්ගේ මෙහෙයවීමෙන් නිමල් හෙට්ටිආරච්චි සහ Company කියන සමාගමට මේ විගණන කටයුතු භාර දීලා තියෙනවා. මේ වන කොටත් ඒ විගණන කටයුතු සිදු වෙමින් පවතිනවා ස්වාමිනි.

ප්‍ර : දැන් පියතුමා ඔබතුමා ලඟ තිබෙනවද වාර්තාවක් 2020 මාර්තු මස 31 වන දින දක්වා ලැබී ඇති සම්පූර්ණ මුදලයි, ඒ මුදලට අමතරව වියදම් කරපු මුදලයි ඊට පස්සේ ඒකේ ශේෂයත් සඳහන් වාර්තාවක් තියෙනවද?

පි : තියෙනවා ස්වාමිනි. මා සතුව පවතිනවා.

<u>මේ අවස්ථාවේදි එම ගිණුම් වාර්තාව 2020 මාර්තු මස 31 වන දිනට තිබෙන ගිණුම් වාර්තාව NR 4 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනවා</u>.

ප්‍ර : දැන් මෙම වාර්තාව අනුව ලැබී තිබෙන සම්පූර්ණ මුදල කොපමණද 2020 මාර්තු මස 31 වන දිනට?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මිලියන 518 යි ස්වාමිණි. සහ ඉතුරු මුදල මගේ ඒ Document එක ගත්ත නිසා මා සතුව හරියට ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ඉල්ලනවා. මිලියන 518089079 යි ශත 09 ක් විදියට සටහන් වෙලා තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : එතකොට සම්පූර්ණ වියදම් කර තිබෙන මුදල?

පි : මේ ආකාරයෙන් තියෙනවා ස්වාමිනි මේකේ අපිට සඳහන් කරන්න පුළුවන් වැඩ සටහන් 3 ක් මේ මුළු Relief work එක තුළම ක්‍රියාත්මක වුනා. Counseling වැඩ සටහන, Spiritual වැඩ සටහන සහ Social වැඩ සටහන කියල. අන්න ඒ අනුව මේ වන කොට මූලික වශයෙන් වියදම් වෙලා තියෙනවා ස්වාමිනි මිලියන 379154911 ශත 2 ක්. ඉතුරු වෙලා තියෙනවා ස්වාමිණි මිලියන 138934165 යි ශත 7 ක් ස්වාමිණි.

ප්‍ර : දැන් ගරු පියතුමා ඔබතුමා ඊයේ දින සාක්ෂි ලබා දුන් විට ඔබතුමා කිව්වා සරීටාස් කොළඹ සෙත්සරණ ආයතනය විසින් මෙම පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූ සැදෑවතුන්ගේ පවුල් සඳහා සාමාජීය සහ අධ්‍යාත්මික පෝෂණ වැඩ සටහනක් එම ප්‍රහාරය සිදු වී දින 2 ට පසුව අතිගරු කාදිනල් හිමිපාණන්ගේ උපදෙස් මත ආරම්භ කළ බවට?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මෙම වැඩසටහන ප්‍රායෝගිකව දියත් කළේ කුමන ආකාරයෙන්ද යන්න විස්තර කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි : පුළුවන් ස්වාමිණි. මා ඊයේ සඳහන් කළ පරිදිම කණ්ඩායම් 3 ක් අඟරදගරු හිමිපාණන්ට මේ වැඩසටහනට Appoint කළා, පත් කළා. 1 වෙනි කණ්ඩායම තමයි අධ්‍යාත්මික කණ්ඩායම, ඒ කණ්ඩායමේ පියතුමන්ලා 6 දෙනෙක්ව යොමු කලා මේ කණ්ඩායමට සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ අධ්‍යාත්මික කටයුතු සොයා බලා නිවෙස් බැහැ දැකලා ඒ වැඩ කටයුතු කරන්න කියලා. ඒ පියතුමන්ලා සමඟ තව කන්‍යා සොහොයුරියන් සහ අනෙකුත් පියතුමන්ලා එකතු වෙලා මේ සෑම කතෝලික නිවසක්ම ඒ වගේම අනෙකුත් නිවාස බැහැ දැකලා කතෝලික අයගේ වත්පිළිවෙත් අපි ඒ නිවාසවල ඉෂ්ඨ කලා මොකද ඒ රටේ පවතින තත්ත්වය අනුව. ඒ වගේම ස්වාමීන් වහන්සේලා සමඟ එකතු වෙලා බෞද්ධ නිවාසත් බැහැ දැකලා ඒ ප්‍රදේශයේ සිටින ස්වාමීන් වහන්සේලා සමඟ බැහැ දැකලා මේ අධ්‍යාත්මිකව ඔවුන්ට දිරි ගන්වන්නට වැඩසටහන එදා සිට අද වනතුරුත් ස්වාමිණි ක්‍රියාත්මක වෙනවා. දෙවන වැඩ සටහන සඳහා ස්වාමිණි අපි විශේෂයෙන්ම Counseling මනෝ උපදේශනය සඳහා අපි කටුවපිටිය ප්‍රදේශයේ ඒ මීසමට අයිති නිවාසයක් කුළියට අරගෙන

Fair Comment by Jezeem

අවුරුද්දක ඒ Counseling Center එකක් විදියට එතන Open කරලා ඒ වැඩ කටයුතු විශේෂයෙන් ප්‍රමුඛතාවය කටුවපිටියට දුන්නේ පිරිස වැඩි නිසා ස්වාමිණි. එතන එම Center එක හරහා මේ උපදේශන කටයුතු ඔවුනුත් Professional කණ්ඩායමක් සමඟ එකතු වෙලා මේ අහරදගරුතුමා මේ වැඩ සටහන භාර දුන්නා Counseling කරලා ඉන්න Professional පියතුමෙකුටම. ඒ හරහා 86 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් එක්ක මේ වැඩ සටහන කටුවපිටියේ දියත් කළා. ඒ හා සමගාමීව කොච්චිකඩේ අයගෙත් දමිළ භාෂාවත් තිබුණ නිසා දමිළ භාෂාවේ Counselor's ලා එකතු කරලා ඒ අයත් එක්ක මේ ගෙවල් බැහැ දැකලා ඒ වැඩ සටහන දියත් කළා. ඒ වගේම තුන්වන අංගය තමා ස්වාමිණි සමාජ සේවා කොටස. ඒ සඳහා අපි කටුවපිටයේ sub office එකක් සෙත්සරණේ උප කාර්යාලයක් විදියට මේ සිදුවීම සිද්ධ වෙලා 4 වන දවසේ දී ඒ ප්‍රදේශයේ තිබිච්ච පියතුමන්ලා රැදී සිටින නිවහනක එක කොටසක් ඉක්මණින් සූදානම් කරලා ඒ වැඩසටහනට යොදා ගත්තා. ඉන් සති 2 ට පසුව අපි Container Box එකක් Convert කරලා වෙනස් කරලා අරන් ගිහිල්ලා sub office එකක් විදියට කටුවපිටිය දේවස්ථාන භූමියේ තියලා මේ වැඩ සටහන දියත් කරනවා සමාජ සේවාව පැත්තෙන් විය යුතු සියළුම දත්ත එකතු කරලා එතන උප කාර්යාලයක් විදියට අවශ්‍ය කරන පහසුකම් ලබා දීලා අවශ්‍ය කරන Staff එක ලබා දීලා ඒ වැඩ සටහන ඒ ප්‍රදේශයේ තුළ ක්‍රියාත්මක වුණා. කොළඹ අවට අපගේ ප්‍රධාන ආයතනය හරහාම ඒ සම්බන්ධීකරණ කටයුතු සිද්ධ කළා ස්වාමිණි. මේ ආකාරයෙන් තමයි ස්වාමිණි අපි මේ සෑම ඊයේ මා ගෞරවණීය විනිශ්චය මණ්ඩලයට ලබා දුන්න ඒ පත්‍රිකාවක් ඒ කොයි ආකාරයෙන්ද සිද්ධ වුනේ කියලා ඒ Telephone Numbers ඔක්කොමත් එක්ක ස්වාමිණි ජනතාවට විපතට පත් වුණු සෑම පවුලකටම ඔවුන්ගේ භාෂාව අනුව මේ පත්‍රිකාවක් බෙදා දීලා සෑම මොහොතකදීම අපිට සම්බන්ධ වෙන්න කියලා කිව්වා. ඒ වගේම අපිත් අපේ ආයතනය හරහා වෙනම තිදෙනෙක් පත් කරලා තිබුණා දවසක් ඇර දවසක්, දවස් 100 ක් යන කල් දවසක් ඇර දවසක් මේ හැම පවුලකටම දුරකථනයෙන් අමතලා ඔවුන්ගේ සැප දුක් විමසලා ඔවුන් ඉන්න තත්ත්වය බලලා, අවශ්‍යතා බලලා මේ අංග 3 යටතේ ක්‍රියාත්මක වුණා ස්වාමිණි.

ප්‍ර : දැන් ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවද මේ අන්දමට මේ විපතට පත් වූ සැදෑවතුන්ගේ පවුල් සඳහා මනෝ සාමාජික සහ

Presidential Commission of Inquiry
FAIR COMMENT BY JEZEEM

අධ්‍යාත්මික පෝෂණය වැඩ සටහනක් සම්බන්ධයෙන් සාරාංශයක් තිබෙනවද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : පත්‍රිකා 3 ක් ?

පි : පත්‍රිකා.

ප්‍ර : සිංහල භාෂාවෙන්, එකක් ඉංග්‍රීසි භාෂාවෙන් සහ එකක් දෙමළ භාෂාවෙන්?

පි : එහෙයි ස්වාමිණි.

<u>එම විපතට පත් වූ සැදෑවතුන්ගේ පවුල් සඳහා මනෝ සාමාජික සහ අධ්‍යාත්මික පෝෂණ වැඩ සටහනේ සාරාංශය මේ අවස්ථාවේදී NR 5 වශයෙනුත්,</u>

සිංහල භාෂාවෙන් තිබෙන වැඩ සටහන NR5(A) වශයෙනුත්,

දෙමළ භාෂාවෙන් තිබෙන පත්‍රිකාව NR5(B) වශයෙනුත්,

ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන පත්‍රිකාව NR5(C) වශයෙනුත් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතමි.

ප්‍ර : දැන් ගරු පියතුමා ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් ප්‍රකාශයක් SCFR195/2019 මානව හිමිකම් නඩුවේ 57 වන වගඋත්තරකරු වන අතිඋතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගේ දිවුරුම් ප්‍රකාශයට යා කර තිබෙනවා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එම දිවුරුම් පෙත්සමේ පිටපතක් ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවද?

පි : තිබෙනවා ස්වාමිණි.

<u>එම පිටපතට අදාල එනම් ශ්‍රේෂ්ඨාධිකරණයේ SCFR195/2019 නඩුවට අදාල මෙම පියතුමා විසින් දෙන ලද දිවුරුම් ප්‍රකාශය සහ ඊට අදාල ඇමුණුම් NR6 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතමි.</u>

ප්‍ර : දැන් තමුන් මෙම දිවුරුම් ප්‍රකාශයේ සෙත්සරණ සංවිධානය විසින් පාස්කු ප්‍රහාරය හේතුකොට ගෙන කටුවපිටිය සහ කොච්චිකඩේ දේවස්ථානවලට අදාලව විපතට පත්වූවන් සහ තුවාලවූවන් පිළිබඳව ලැයිස්තු ඉදිරිපත් කර තිබෙනවා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : දැන් ඒ අනුව තුවාල ලැබූ ජනතාව වෙනුවෙන් ඒ සඳහා මෙම අරමුදලින් කොපමණ මුදලක් වැය කර තිබෙනවද?

පි : මූලික වශයෙන් ස්වාමිණි පවුල් 381 කට මිලියන 137483 යි රුපියල් 974 යි ශත 48 ක් විදියට ස්වාමිණි ඔබතුමන්ලාට ලබා දුන්න පත්‍රිකාවේ සඳහන් කර තිබෙනවා ස්වාමිණි.

Parliament Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ මොන පත්‍රිකාවේද ගරු පියතුමා?

පි : මූල්‍යමය පත්‍රිකාවේ වියහියදම් කියන පත්‍රිකාව යටතේ මූල්‍යමය තොරතුරු තියෙන පත්‍රිකාව යටතේ, C733 කියන පත්‍රිකාව යටතේ සඳහන් වෙලා තියෙනවා ස්වාමීණි. C732 කියන පත්‍රිකාව යටතේ කොච්චිකඩේ සහ C733 කියන පත්‍රිකාව යටතේ කටුවපිටිය වියහියදම් ලැයිස්තුව දීලා තිබෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් රජයෙන් මෙම ප්‍රහාරයට පසුව මේ අසරණ වූ පුද්ගලයින් හට කටුවපිටිය සහ කොච්චිකඩේ නිවාස ලබාදීමට හෝ නිවාස අළුත්වැඩියා කිරීමට වැඩ පිළිවෙලක් ආරම්භ කෙරුවද එවකට රජය විසින්?

පි : ඔව් ස්වාමීණි එවකට රජය විසින් විශේෂයෙන්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ස්වාමීණි සුවිශේෂී වැඩ සටහනක් අප ආයතනය සමඟ එකතු වී ඒ නිවාස බැහැ දැකලා ඔවුන් දියත් කළා ස්වාමීණි. ඒ වැඩ සටහනේ ඔවුන් පළවෙනි පියවර ක්‍රියාවට නැංවුවා ඒ කාල වකවානුව තුළ. එම වැඩ සටහන ඔවුන් නම් කළා ස්වාමීණි ස්වශක්ති වැඩ සටහන කියලා. ඒ වැඩ සටහන යටතේ ස්වාමීණි ඔවුන් මිලියන 94 ක Budget එකක් අයවැයක් ඉදිරිපත් කරලා අපිටත් එහි පිටපත් ලබා දීලා විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩලයේ කාර්යය, Cabinet Decision එකකින් එය අනුමත කර ගත්තු ලේඛන අපිටත් ලබා දීලා එහි 1 වෙනි පියවර විතරක් ස්වාමීණි ක්‍රියාත්මක කර ගැනීමට හැකියාව ලැබුණා. ඉතින් ඒකේ ඉතුරු ටික ක්‍රියාත්මක කර ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ ස්වාමීණි, මේ ගැන අපි වත්මන් අග්‍රාමාත්‍යතුමාට මේ ලිපි ලේඛන ලබා දීලා මෙහි ජනතාව බලාපොරොත්තු වන දෙයක්, බලා ගෙන ඉන්න දෙයක් විදියට මේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සමඟ එකතු වෙලා කරන වැඩ සටහනේ ඉතිරි ටික කර ගෙන යන්න අපි ඉල්ලීමකුත් කළා ස්වාමීණි.

ප්‍ර : දැන් ගරු පියතුමා ඔබතුමා ලඟ මේ සම්බන්ධයෙන් යම් ලේඛනයක් තිබෙනවද?

පි : තිබෙනවා ස්වාමීණි. ඒකේ තියෙනවා ස්වාමීණි කැබිනට් මණ්ඩල තීරණය විදියටත්, ඒ වගේම ඒ නාගරික ජනාවාස අධිකාරිය විසින් ස්වාමීණි අප හට ලබා දුන්න කොපියකුත් තියෙනවා ස්වාමීණි ඒ වැඩ සටහන් ඔබතුමාලට මතක් කලොතින් නිපුණ සවිය විදියට ඔවුන් වැඩ සටහනක් කළා. ඒ වගේම නිපුණ දැව සවිය විදියට වැඩ සටහනක් කළා. ප්‍රජා සවිය විදියට ඔවුන් වැඩ සටහනක් කළා. ඒ වගේම දෑත සවිය විදියට වැඩ සටහනක් කළා. ඒ කොයි ආකාරයෙන්ද මූල්‍යම කටයුතු සිද්ධ කළේ, බෙදලා දුන්නේ එහි සාරාංශයක් මා සතුව පවතිනවා ස්වාමීණි.

FAIR COMMENT BY JEZEEM

ප : දැන් ගරු පියතුමා ඔබතුමා කිව්වා මේ කැබිනට් පත්‍රිකාවක් තිබෙනවා කියලා?

පි : ඔව් ස්වාමිණී.

<u>මේ අවස්ථාවේදි මෙම පාස්කු ප්‍රහාරයෙන් අගතියට පත් ජනතාවට සහන සැලසීමේ 2019 මැයි මස 21 වන දිනැති කැබිනට් පත්‍රය NR7 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතමි</u>.

ප : දැන් මේ සම්බන්ධයෙන් කතෝලික සභාව වෙනුවෙන් යම් යම් වියදම් දැරුවද?

පි : මේ වැඩ සටහනේ දී නෙමෙයි ස්වාමිණී වෙනත් වැඩ සටහන් අර සමාජ සේවාව යන කොටසේ තව වැඩ සටහන් 4 ක් ක්‍රියාත්මක වුණා. අන්න ඒ 4 ට අඟරදගුරු හිමිපාණන්ට ලැබුණු මූල්‍යමය ඒ දායකත්වයෙන් ඒ දේවල්වලට ලබා දුන්නා ස්වාමිණී.

ප : දැන් ඒ සම්බන්ධයෙන් ගරු පියතුමාට ලේඛන තිබෙනවද?

පි : රජයේ පැත්තෙන්ද

ප : නැහැ කතෝලික සභාව විසින් ආයෝජනය කරන ලද මුදල සම්බන්ධයෙන්?

පි : ඔව් ස්වාමිණී ඒ ලේඛනයත් අර හා සමානව වේලාසන ලබා දුන්නු 732 යටතේ ඒකෙත් සියළුම විස්තර තියෙනවා ස්වාමිණී අපි කොයි ආකාරයෙන්ද ජනතාවට ඒ මූල්‍යමය දායකත්වය ලබා දුන්නේ කියලා.

ප : දැන් ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවාද මෙම පාස්කු ප්‍රහාරයෙන් අසරණ වූ එක් එක් රෝගීන් එනම් රෝගීන් තුන් දෙනෙක්ගේ Video දර්ශන?

පි : එහෙයි ස්වාමිණී.

(මේ අවස්ථාවේදී එක් Video දර්ශනයක් තිරයේ දිස්වීමට සලස්වයි)

පි : මේ ස්වාමිණී සිරිමාන්න කියන තාත්තා තමන්ගේ දුවයි පුතයි තමන්ට අහිමි වෙච්ච තාත්තා අම්මත් එක්ක ඉන්නේ. වෙන කිසිම දරුවෙක් නැහැ, මේ බෞද්ධ පවුලක තාත්ත කෙනෙක්.

එම Video දර්ශනයේ ඔහුගේ කතාව කොමිෂන් සභාවට ඇසෙන ලෙස හඬ නංවයි)

මාස 11 ක් නික්මිලත් මේ වේදනාව තුළ ඉන්න අයගේ දර්ශනයක් ස්වාමිණී අපි නැරඹුවේ. කොච්චිකඩේ විපතට පත් වෙච්ච දුවයි, පුතයි අහිමි වෙච්ච තාත්තා කෙනෙක්. ඔවුන් හැම විටම ඉල්ලන්නේ එක දෙයයි. අපිට සාධාරණයක් හොයලා දෙන්න, අපේ දරුවෝ වෙනුවෙන් කියන සත්‍යයට තමයි අපි උසවා ගෙන අඟරදගරුතුමන් ඉල්ලන ඕනෑම අවස්ථාවකදීත් හමුවන්න

FAIR COMMENT — BY JEZEEM

අවස්ථාවක් අහරදගරු හිමිපාණන් ඔවුන් වෙනුවෙන් ලබා දීලා තියෙන්නේ ස්වාමිණි.

(තවත් Video දර්ශනයක් තිරයේ දිස්වීමට සලස්වයි)

පි : ස්වාමිණි මේ ඉන්නේ සාරන්‍යා කියන දෙමළ අම්මා කෙනෙක්. බැඳලා අවුරුද්දයි මාස 3 යි. දරුවා කුසේදී තමයි ස්වාමිණි මේ ව්‍යසනයට ලක් වුණේ තමන්ගේ ඒ ස්වාමි පුරුෂයා ඒ ස්ථානයේදීම මිය යනවා. මේ අම්මා හොඳටම අසනීප වෙනවා තුවාල ලබලා තාමත් ඇඟිලි වැඩ කරන්නේ නැහැ ස්වාමිණි. දමිළ භාෂාවෙන් තමයි සිංහල භාෂාව අමාරුවෙන් කතා කරනවා. පහුවදා දරුවා උපදිනවා ස්වාමිණි සීසර් සැත්කමක් කරලා. වෛද්‍යවරු දරුවාව ගන්නවා ස්වාමිණි. පුදුමාකාර වේදනාවකින් ඉන්නේ. කුළී නිවාසයක තමන්ගේ අසරණ අම්මයි, තාත්තයි එක්ක එක කාමරයක් වගේ තැනක තමයි මේ දියණිය, මේ අම්මා ඉන්නේ තමන්ගේ දරුවත් එක්ක. ඒ වගේම ගොඩක් අපිත් එක්ක සම්බන්ධ වෙනවා මේ පවුල්. මේ අම්මා ඉල්ලන්නේ එක දෙයක් තමයි, මට මහත්තයා අහිමි වෙලා පහුවදා දෙවියන්වහන්සේ තෑග්ගක් දුන්නා. මේ අම්මා, මේ දරුවන්ගේ අම්මා යෝජනා කරනවා තව විවාහයක් කර ගන්න කියලා. ඇය ඒකට කැමති නැහැ. ඇය කියන්නේ මට දෙවියන්වහන්සේ දුන්නු තෑග්ග.

(එම Video දර්ශනයේ ඇයගේ කතාව කොමිෂන් සභාවට ඇසෙන ලෙස හඬ නංවයි)

පි : ඇය කියපු දෙයක් තමයි ස්වාමිණි පෞද්ගලිකව මගේ මහත්තයා බලාපොරොත්තු වුණේ 21 වෙනිදා ඔය සුවිශේෂී දවසේ මගේ දරුවා ඉපදෙයි කියලා. ඒ නිසා ඒ අප්‍රේල් මාසෙම තමන්ගේ කුස ඉබලා කිව්වේ පාස්කු දවසේ දරුවා ඉපදෙන්න ඕනේ. පාස්කු දවසේ ඉපදෙන්න ඕනේ කියලයි. එදා උදෙත් නැගිටලා දරුවා ඉපදෙයිද කියලා කුස අතගාලා තමයිලු මේ තාත්තයි, එයයි පල්ලි ගියේ. එතකොට අපි ඉවසගෙන ඉමුයි කිව්වාලු 26 වෙනිදා තමයි දින දීලා තිබුනේ දරුවා ඉපදෙන්න. ඉතින් මේ යම් ආකාරයක උපදේශනය තුල ගොඩ ආපු පවුලක් විදියට අපිට ඉදිරිපත් කරන්න පුළුවන් ස්වාමිණි. හැබැයි මේ කතන්දර ඔක්කොමත් එක්කම අපි ඉගෙන ගෙන මදි උත්තර දෙන්න මේ සිදුවීමේදි. අපේ අත්දැකීම් මදි. අපිට උත්තර නැති නිසා තමයි සාධාරණත්වයක් ඉල්ලා සිටින්නේත

(පියතුමා මේ අවස්ථාවේදි හැඟුම්බර වී පිළිතුරු දෙයි)

ප්‍ර : ගරු පියතුමා 3 වෙනි clip එක

(මේ අවස්ථාවේදී තවත් Video දර්ශනයක් තිරයේ දිස්වීමට සලස්වයි)

Presidential Commission of Inquiry
FAIR COMMENT
BY JEZEEM

පි : මේ ඉන්නේ ස්වාමිණි තමන්ගේ බැඳලා මාස ගණනයි. භාර්යාවත් එක්ක පල්ලි යනවා. කකුල අහිමි වෙනවා. මාස 3 ½ ක් වෙන කල් අපිට මේ සොහොයුරා හම්බ වෙන්න යන්න බැරි වුණා. අපිව පිළිගත්තේ නැහැ. මාස 3 ½ න් තමයි අපිට මුහුණ දකින්න පුළුවන් වුණේ, අපිව එපා කිව්වා. කෙසේ වෙතත් අවුරුද්ද නිමා වන දවසේ තමයි ස්වාමිනි මේ අපි දකින දර්ශන පෙළ සහ ඔහුත් කොච්චිකඩේ සිද්ධස්ථානයේදී පාදය අහිමි වෙච්ච සොහොයුරෙක්. සහ ඔහුත් ඉන්නේ කුළියට. පුදුමාකාර ශක්තියක් දැන් ඔහු සතුව තිබෙන බව මේ Video පටයෙන් අපිට නරඹ ගන්න පුළුවන්. දමිළ සොහොයුරෙක්.

(එම Video දර්ශනයේ ඔහුගේ කතාව කොමිෂන් සභාවට ඇසෙන ලෙස හඬ නංවයි)

පි : ස්වාමිණි අපි ඔහුගේ භාර්යාවගෙන් Voice cut එකක් ගන්න උත්සාහ කළා. එතකොට මොහු කිව්වා වැඳලා ඉල්ලන්නම් පියතුමෙනි මගේ භාර්යාව මේ වෙන කල් මම එක පිංතූරයක්වත් කාටවත් ගන්න දුන්නේ නැහැ, ඕන දෙයක් මගෙන් අහන්න මම දන්න විදියට කියන්නම්, භාර්යාව ප්‍රසිද්ධියටවත්, පිංතූරයක්වත් කිසිම තැනකවත් පළ කරන්න එපා කියලා භාර්යාව ඒ අසලම ඉන්නවා. ඒක නිසා ඒක වේදනාකාරී භාර්යාව කියන්නේ ඔය කතාව අහන්න එන්න එපා කියන එක තමයි භාර්යාව හැමදාම අපෙන් ඉල්ලන්නේ. ඔය කතාවත් එක්ක ස්වාමිණි කියන්න තියෙන දේ තමයි ගොඩ ඇවිල්ලා තියෙනවා,නමුත් ඔවුන්ගේ සැනසීම, එකම සැනසීම බලාපොරොත්තු වෙන්නේ මේ ව්‍යසනය කරපු අයට සාධාරණය කොයි ආකාරයෙන්ද ඉෂ්ඨ වෙනවා කියන සත්‍යතාවය.

<u>මේ අවස්ථාවේදී එම Video දර්ශන 3 අයත් CD තැටිය NR8 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතයි.</u>

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

සාක්ෂිකරු විසින් NR8 වශයෙන් ලකුණු කරන ලද CD තැටිය කොමිෂන් සභාව ඉදිරියේදි ප්‍රදර්ශනය කිරීමේදි එක්තරා හැඟුම්බරව සාක්ෂි දුන් බව සටහන් කර තබමි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා:</u>

ප්‍ර : ගරු පියතුමා ඔබතුමා ඊයේ දිනයේ ඡායාරූප රාශියක් ලකුණු කෙරුවා රජයේ අධිනීතිඥවරිය විසින්, දැන් ඊට අමතරව ඔබතුමා ලඟ තිබෙනවද වෙනත් ඡායාරූප?

පි : එහෙයි ස්වාමිණි.

(ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : දැන් මේ ඡායාරූපය ගැන තමාට සුළු වචනයක් කියන්න පුළුවන්ද?

පි : ඔව් ස්වාමිණි මේ ඡායාරූපයෙන් පෙන්නුම් කරන්නේ තමන්ගේ අම්මා අහිමි වෙලා දරුවෝ තිදෙනෙක් ඉන්න පවුලක බාල දියණියයි. ඇයගේ ඔය වෙන විට අපිට හමුවෙද්දි ඔය පිංතූරෙවත් තාත්තා කැමති වුනේ නැහැ කිසිම කෙනෙකුගේ පිංතූරයක් ගන්නවට. කොහොම හරි මේ පිංතූරය අපිට ලැබුණා, මේ වන කොට ඔළු කටුවත් ගලවලා ප්‍රතිකාර ලබමින් ඉන්න මොහොතක. ඉතින් දරුවෝ තිදෙනම හිසේ ආබාධ ඇතිව තමයි ස්වාමිණි සිටින්නේ. මේ ඉන්නේ පුංචිම දැරිය. සිතුකි අප්පුහාමි කියලා. අවුරුදු 4 යි. අම්මා අහිමි වෙලා ගැහුණු දරුවෝ තිදෙනෙක් එක්ක තමයි තාත්තා ජීවත් වෙන්නේ. සිතුකිට මේ පේන දියණියට අවුරුදු 4 යි. තෙනුරි 2 වන දියණිය අවුරුදු 10 යි. නෙතුකි 3 වන දියණිය වැඩිමහල් දියණිය අවුරුදු 13 යි, ඔවුන් නිවාසයේ ජීවත් වෙනවා, පාසැල් යනවා, නමුත් ජීවිතය තාම අනතුරක ඉන්න තත්ත්වයක තියෙන්නේ. ඔළු කටුව ගලවලා ඔපරේෂන් කරලා, නමුත් කාලෙන් කාලෙට ප්‍රශ්න මතුවෙන මට්ටමක ඉන්න ආදරණිය දියණියක්. ඒ වගේම කාදිනල් හිමිපාණන්ගේ දරුවෝ 3 දෙනෙක් විදියට තමයි මේ කාදිනල් හිමිපාණන් ලඟට මේ දියණිය දැන් දුවගෙන යන්නේ.

ප්‍ර : දැන් මේ ගරු පියතුමා කිව්වා ශල්‍යාකර්මයක් සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : ඒ ශල්‍යාකර්මයට වියදම් කෙරුවේ කවුරු කවුද කියලා මේ කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

පි : අභරදගරු හිමිපාණන්ගේ මේ මූල්‍ය අරමුදලෙන් තමයි ස්වාමිණි වියදම් කළේ මේ පවුල වෙනුවෙන් මේ තිදෙනා වෙනුවෙන් මිලියන 2 යි දශම 29 ක්. ඒ කියන්නේ ලක්ෂ 22 ක් වියදම් කරලා තියෙනවා මේ දරුවෝ තිදෙනෙක්ගේ ශල්‍යාකර්මවලට පමණක් ස්වාමිණි. තාත්තා අධික ණය බරින් ඉන්නේ ස්වාමිණි. ඒ වගේම මිලියන 6 ක ණයක් තිබුණා ස්වාමිණි. ඒ කාලසීමාවේදි තාත්තා හිටියේ තනිකරම ඉස්පිරිතාලේ, මේ දරුවෝ තුන්දෙනා තැන් තුනක තියාගෙන, ඒත් මාස 3 ක වගේ කාලයක් එයා කරගෙන ගිය ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම වහලා දාලා ඇණහිටලා තිබුණේ. ඒ මිලියන 6 කර ගන්න බැරිව අභරදගුරු තුමා තවත් මිලියන 2 ක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ලක්ෂ 20 ක් දීලා බැංකුවට කතා කරලා මේ වැඩ කටයුතු කර ගෙන යන්න උපදෙස් දෙන්න කියන ඉල්ලීම මේ පවුල වෙනුවෙන් රඳගුරුතුමා මැදිහත් වෙලා කරලා තියෙනවා. අපි ණය ගෙව්වේ නැහැ කාගෙවත් අපිට එහෙම ගෙවන්න ගියොතින් මේ මුදල මදි වෙනවා. ඒක නිසා විශේෂ අවශ්‍යතාවයක් විදියට අපි මේ පවුලට, මේ දරුවන්ගේ තත්ත්වය බලලා අපි ඒ ණය මුදලෙන් කොටසක් ගෙවලා ඔවුන්ව යම්කිසි ආකාරයක නිදහස් කරලා මේ තාත්තත් එක්ක මේ දියණියෝ තිදෙනා ජීවත් වෙනවා ස්වාමිණි.

<u>මේ අවස්ථාවේදි එම සිතුකි අප්පුහාමි කියන දරුවාගේ ඡායාරූපය NR9 (A) වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතමි.</u>

(මේ අවස්ථාවේ තවත් ඡායාරූපයක් තිරසේ දිස්වේ)

ප : ගරු පියතුමා මේ ඡායාරූපයෙන් පෙන්වන්නේ කවුද කියලා ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

පි : ඔව් ස්වාමිණි මේ ඉන්නේ අම්මා කෙනෙක් පිළිස්සුම් සහිතව, කකුල සම්පූර්ණයෙන්ම Damage වෙච්ච වර්ජින් මේරි කියන දම්ළ අම්මයි, මේ අම්මාගේ වයස අවුරුදු 35 යි. ස්වාමි පුරුෂයා ජීවතුන් අතර ඉන්නවා නම සුමේදන්. ඒ වගේම කොච්චිකඩේ විපතට තමයි, සිද්ධස්ථානයේදි තමයි හසු වුණේ, වැල්ලම්පිටිය ප්‍රදේශයේ තමයි ජීවත් වෙන්නේ. ඒ වගේම ඇයගේ ස්වාමි පුරුෂයත් බෝම්බ ප්‍රහාරයට ලක් වෙලා තුවාල ලබලා තමයි ඉන්නේ. ඔහුත් දරුණු තුවාල ලබලා රෝහල් ගතවෙලා බිරිඳගේ පාදයේ තුවාල සමඟ ජීවත් වෙනවා. ඒ වගේම දියණියක් ඇයට සිටිනවා ස්වාමිණි, දියණියගේ උදරයට දැඩි හානි සිද්ධ වුණා එකම අර මම ඊයේ කියපු විදියට දම්ළ පවුල් දේවස්ථානයට ගියාම එකටම ඉන්න නිසා මේ මුළු පවුලම මේ ව්‍යසනයේදි තුවාල ලැබුවා, ඔවුනුත් ජීවත් වෙන්නෙත් තාමත් ස්වාමිණි කුළී නිවහනක තමයි. ඒ දුප්පත්කමත් එක්ක තමයි මේ පවුල ජීවත් වෙන්නේ. තාමත් අපි ප්‍රතිකාර සඳහා උදව් උපකාර කරමින් මේ පවුල සමඟ අපි වැඩ කටයුතු කරගෙන යනවා.

<u>මේ අවස්ථාවේදි මෙම වර්ජින් මේරි දියණියගේ ඡායාරූපය NR9 (B) වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතමි.</u>

(තවත් ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප : ගරු පියතුමා මේ තිබෙන ඡායාරූපය කුමක්ද කියලා කියන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : මේ ඉන්නේ කටුවපිටිය දේවස්ථානයේ ව්‍යසනයට මුහුණ දුන්නු අම්මා කෙනෙක්. තිළිනා හර්ෂනී කියලා අවුරුදු 35 යි. ඇය සුවිශේෂි අම්මා කෙනෙක්. තමන්ගේ පිරිමි දරුවා මියගියා ස්වාමිණි. ඔය පුංචි දරුවත් ඉන්නවා, ඊට ඉහළින් ඉන්නේ තමන්ගේ ලොකු දියණිය. ලොකු බලාපොරොත්තු රාශියක් සමඟ ජීවත් වෙන අම්මා කෙනෙක්. මම ඊයෙත් සඳහන් කළා ඉනේ ප්‍රදේශයෙන් පහළ පණ නැහැ. ඇඟිලි 10 න් ඇඟිලි 9 ක් වැඩ කරන්නේ නැහැ, එක ඇඟිල්ලක් වැඩ කරන්නේ. එක ඇහැක් තියෙන්නේ කෘතිම ඇහැක්. පුදුමාකාර බලාපොරොත්තුවකින් ඇය ජීවත් වෙන්නේ. ඇය මාස 14 යි දවස් 2 ක්ම රෝහල් තුළ තමයි තමන්ගේ ජීවිතය ගත කළේ. ගිය සිකුරාදා ඇයව නිර්මාණය අලුතින් හදපු කාමරයක තමයි තමන්ගේ නිවසේම යොමු කළා. නිවසට අරගෙන ගියා. වෛද්‍ය ප්‍රතිකාර ලබනවා, ඒ වගේම පැය 24 ම නර්ස් කෙනෙක් මේ ගෙදර රඳවන්න අපි කටයුතු කරලා තියෙනවා. Electric wheel Chair එකක තමයි ස්වාමිණි ඉන්නේ. ඉතින් මේ පවුලටත් මේ තිළිනටත් සුවිශේෂි දායකත්වයක් ලබා දුන්නා දේශයේ පෞද්ගලික ආයතනයක් අහරදගරුතුමාගේ ඉල්ලීම අහලා අවදානම් තත්ත්වයක හිටිය අම්මා කෙනෙක්, මැරෙයි කියලාම තමයි බලාපොරොත්තු වෙලා හිටියේ. ඒ වගේම ස්වාමි පුරුෂයාගෙත් ප්‍රශ්නයක් තියෙනවා ස්වාමිණි මේ වන කොට Court Order එකක් අරන් තියෙනවා මේ සම්බන්ධතාවය තියාගන්න එපා කියලා. ඇය යම්කිසි මානසික පීඩනයකින් ඉන්නේ මේ හේතුව නිසා නෙමෙයි ඊට පෙර සිටම වෙන් වෙලා හිටපු අම්මා කෙනෙක්. මේකත් එක්කම මේ පවුලට දැඩි බලපෑම් කරනවා මානසික ආතතියක ඉන්න පියෙක් විදියට. ඒක නිසා උසාවියෙන් විශේෂ නියෝගයක් අරගෙන මේ තාත්තට මේ අම්මාව බැහැ දකින්න දෙන්නේ නැහැ. සියළුම වෙනස්කම් සිද්ධ වෙනවා ස්වාමිණි ඒ පැමිණිමත් එක්ක. ඒ එක්කම සුවිශේෂී ලක්ෂණයක් තියෙනවා අපගේ පෞද්ගලික රෝහලෙන් අහරදගරුතුමා කරපු සේවාව වෙනුවෙන් දේශයට. මිලියන 10 ක මුදලක් ගත්තේ නැහැ. ආසිරි සෙන්ට්‍රල් කියන පෞද්ගලික රෝහලෙන් මේ ඇයගේ ඔපරේෂන් එකට විතරක් ඒ දවස් 77 ක් ඇය ඒ රෝහලේ ප්‍රතිකාර ලැබුවා සුවිශේෂි ස්ථානයක. ඒකේ මුළු මුදල ලක්ෂ 100 ක්. අහරදගුරුතුමාට කරන උපහාරයක් විදියට ඒක waive off කළා. ඉන් අනතුරුව මේ වන කොට අපේ අහරදගුරු හිමිපාණන්ගේ මුදලින් ලක්ෂ 122 ක් වියදම් කරලා තියෙනවා. අනික් දේවල්වලට. ඔක්කොම වියදම ලක්ෂ 228 මේ වන කොට ඇයගේ ජීවිතය ආරක්ෂා කර ගන්න වියදම් කර තියෙනවා අර මිලියන 10 ත් එක්ක. ඇයගේ පුදුමාකාර

Proof Copy
FAIR COMMENT
BY JEZEEM

තියෙන්නේ වෛද්‍යවරු බැහැ දකින්න යනවා ගෙදර, කියන්නේ අහසයි පොළවයි වගේ අනික් රෝගින් එක්ක බැලුවාම මේ අම්මා. මේ අම්මා ගෙදරට ඇරලන්න ගිය දවසේ අපි ගියා. ගියාම කිව්වේ ෆාදර් දැන් මට රැකියාවක් කරන්න ඕනේ, ඒ තරම් බලාපොරොත්තු තියෙන්නේ. ෆාදර් මට මේ ඇඟිල්ලි පහක් පණ අරන් දෙන්න මගේ මේ දරුවෝ දෙන්නට කන්න දෙන්න මේ හැඟීම්බර වෙන්නේ ස්වාමිණි ඔවට උත්තර නැති වෙන නිසයි.

මේ අවස්ථාවේදි එම තිළිණ හර්ෂනී ස්ත්‍රියගේ ඡායාරූපය NR9(C) වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතයි.

දැන් වේලාව : ප.ව. 2.20 යි
මෙතැන් සිට ල/ලේ :- යමුණා දසනායක මිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව. 2.20
පෙරසටහන් ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක

<u>ජනාධිපති නීතිඥ ශ්‍රමිල් පෙරේරා මහතා</u>

ප්‍ර: දැන් ගරු පියතුමා මේ අන්දමට පාස්කු ප්‍රහාරයෙන් අසරණ වූ වෙනත් රෝගීන්ගේ යම් සුවිශේෂ සාක්ෂි දීමට ඔබතුමාට පුලුවන්ද?

උ: ඔව් ස්වාමීනි අපිට දකින්න පුලුවන් දේවල් පෙන්වන්න පුලුවන්. ඒ වගේම ඉන්නවා ස්වාමීනි කටුවාපිටියේ 8 දෙනෙක් තාත්තා හයකුයි අම්මලා දෙන්නෙකුයි ඒ අයගේ ඔක්කෝම දරුවෝ ස්වාමිපුරුෂයෝ භාර්යාවෝ මියගිහිල්ලා තනියම. ඒ 8 දෙනාට තුවාල නැහැ ස්වාමීනි. හැබැයි තුවාල හොදයි දැන් ඒ 8 දෙනාගෙන් එක තාත්තා කෙනෙක් දැනට නිදාගන්නේ සෙමට්‍රියේ. ඒ කියන්නේ තමන්ගේ දරුවෝ වළලලා තියෙන තැන. සුසන්ත කියන තාත්තා. අගරදගුරු හිමිපාණන් උත්සාහයක් දැරුවා මේ අයව විදේශගත කරලා මේ අමතක කරන්න මේ සිදුවීම හැමතැනටම අගරදගුරුතුමා ලිව්වා ඔවුන්ව බාරගන්න කියලා විශේෂයෙන්ම ඉතාලි දේශයේ ඒ සම්බන්ධතා තුල ඒ වැඩ කටයුතු කරගෙන යද්දි තමයි මේ කොරෝනා ප්‍රශ්නයක් මතුවුනේ. එව්වා අපිට පේන්නේ නැහැ ස්වාමීනි පින්තූරයට නහන්න බැහැ. ඒ එක සිදුවීමක් ඔබතුමන්ලත් එක්ක බෙදා ගන්නේ. ගෙදර නෙමේ ඉන්නේ දවසේ නගර සභාවේ වැඩ කරන්නේ ත්‍රීවිල් එකක් තියෙනවා ඔක්කොටොම හොරෙන් ඔක්කොම වැඩ නිමා කරලා යනවා ඒ වගේම ඔහුගේ වත්කම් පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා ඉන්නේ නැන්දම්මත් එක්ක ගෙවල් ලියලා තියලා නැහැ කිසි දෙයක් ඒ නිසා එතනත් ප්‍රශ්න රාශියක් තියෙනවා. නමුත් හරිම ධෛර්යය සම්පන්න තාත්තා කෙනෙක් හරිම ජවසම්පන්න තාත්තා කෙනෙක් අපි සියලු දෙනාටම හොරෙන් රාත්‍රියට යන්නේ මිනිය වළලලා තියෙන ඒ සුසාන භූමියට ගිහිල්ලා තමයි හොරෙන් එතෙන්ට ගිහිල්ලා කුරුසේ බදා ගෙන නිදා ගන්නේ. ඒ එක චරිතයක්.

ප්‍ර: ඒ හැමදාම රාත්‍රියෙ යනවාද ඔහු පියතුමා?

උ: අපිට හොයා ගන්න බැහැ හැබැයි අපි කෝල් කලාම answer කරේ නැති වුනාම අපි දන්නවා මෙයා ඉන්නේ එතන තමයි කියලා. ඒක දැකලා තියෙන අයත් ඉන්නවා. කොව්වර උපදේශනය කලත් හා කියලා දවල් වරුවේ කිව්වාට රෑට නතර වෙන්නේ එතන. ඒ වගේ ගොඩක් කථා තියෙනවා ස්වාමීන ඒවගේ අතීතය මතක් වෙද්දි ඔවුන් උත්තර ඉල්ලද්දී අපිට උත්තර දෙන්න බැරිව යනවා.

ප්‍ර: ගරු පියතුමා වෙන විශේෂ සාක්ෂියක් මේ සම්බන්ධයෙන් ඔබතුමාට ගරු කොමිෂන් සභාවට කියන්න පුලුවන්ද ? වෙනත් සිද්ධි සම්බන්ධයෙන් විශේෂ සිද්ධි ?

FAIR COMMENT — BY JEZEEM

උ ඒ වගේම ස්වාමීනි ඒ සිදුවීම් මතක් වෙද්දි මට එකපාරටම ඒ කරුණු කාරණා කියා ගන්න බැරිවෙන්නේ ඒ වාගේම තව අම්මාකෙනෙක් ඉන්නවා එයත් ඒ වගේමයි නිවසේ තනි වෙලා එයාගේ ඔලුකටුව ගලවලා තමයි තිබුනේ දැන් ආපහු තත්වයකට පත් වෙලා ඉන්නවා. ඒ අම්මත් ඉන්නේ වහ බොනවද නැද්ද කියන මට්ටමක. මා ඊයෙත් සඳහන් කලා ස්වාමීනි මේ 8 දෙනාගෙන් එක්කෙනෙක් වහ බිව්වොතින් 8 දෙනාම ඊට පස්සේ වහ බොනවා.එක්කෙනාට එක්කෙනා බැඳිලා ඉන්නේ. ඒ නිසා ඔවුන් ඉල්ලන්නේ ස්වාමීනි එක දෙයයි මේක කරපු අය අපිට හොයලා දෙන්න ඒ අවස්ථාවේදී විශ්වාසය තබලා තියෙන්නේ ඔබතුමන්ලා කෙරෙහි විතරයි ඒ අය.

ප්‍ර: දැන් ගරු පියතුමා ඒ දෙක විතරද තව තියෙනවාද ?

උ: තියනවා ස්වාමීනි. හැඟීම්බර වෙන්න බැරි නිසා මට මේ කිසිම දෙයක් කියන්න බැහැ.

ප්‍ර: දැන් අපි ඒ මාතෘකාවට පස්සේ එමු. ගරු පියතුමා ඊයේ ඔබ සාක්ෂි ලබා දුන්නා මේ විපතට පත් වූ ජනතාවගේ ණය පිළිබඳව විස්තරයක් . එම විස්තරය දැනටමත් C.739 කියලා ලේඛනයක් ඉදිරිපත් කරලා තියෙනවා දැන් මේ C739 කියන ලේඛනය අනුව කතෝලික සභාව විසින් දැනට ජනතාවගේ ණය පියවීම සඳහා කොපමණ මුදලක් වැයකර තිබෙනවාද?

උ: මිලියන 6.72 ක් ස්වාමීනි. වැය කරලා තියෙනවා ඒ අත්‍යවශ්‍යම කරුණු නිසා අපි ගෙවපු ණය. පිළිබඳව ඒවා ගෙවිය යුතුයි එහෙම නැත්නම් ඔවුන්ගේ ජීවිත පැවැත්මට ප්‍රබල හානියක් සිදු කරන නිසා

ප්‍ර: දැන් ඉදිරියේදි එම ජනතාවට ගෙවීමට ඉතිරිවී තිබෙන ණය මුදල් ප්‍රමාණය කොපමණද ?

උ: මිලියන 34.48 ක් තිබෙනවා ස්වාමීනි අපිට වාර්තා වෙලා තියෙන මේ ඔක්කෝම සමීක්ෂණ අපි කරලා බලලා ගත්ත වාර්තාවලින් සනාථ කරලා විය යුතු දේවල් විදියට ගත්තු වාර්තා විතරයි ස්වාමිනි බොහෝ දෙනෙක්ගේ ණය තුරුස් තියෙනවා නමුත් සාධාරණ හේතු සහ ක්‍රමවේද තියෙන නිසාඅපි ඒවා මෙතන ලැයිස්තු ගත කරලා නැහැමේ ගෙවිය යුතුයි කියලා අපි evaluate කරපු ඒවා ස්වාමිනි.

ප්‍ර: දැන් ගරු පියතුමා එවකට රජය විසින් මියගිය අයට රුපියල් මිලියනයක මුදලක් වන්දි මුදලක් දීමට පොරොන්දු වුනා ඒක ඔබතුමා දන්නවා නේද?

උ: ඔව් compensation විදියට ඔවුන්ට ගෙව්වා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබතුමා ලඟ ලේඛනයක් තිබෙනවාද ඔබතුමා දන්නා පරිදි මේ මියගිය අයට රජයෙන් වන්දි මුදල් නොලැබූ පුද්ගලයන් පිළිබඳ විස්තරයක් ?

උ: ඔව් ස්වාමීනි මට එහෙම කරුණු පවුල් දෙකක් සිටිනවා ස්වාමීනි ඒ පවුල් දෙක කොච්චිකඩේ ව්‍යසනයට ලක්වෙලා ඒ මුල් කාලයේ

FAIR COMMENT BY JEZEEM

නෙමෙයි ඊට පස්සේ මියගිය පවුල් දෙකක් ඉන්නවා ස්වාමීනි ඔවුන්ට ඒ වන්දි මුදල් පිරිනැමිලා ලැබිලා නැහැ ස්වාමිනි. තිබෙනවා ස්වාමීනි ෆ්ලොරිඩ කියන තැනැත්තිය මියගියේ 2020/01/29 වෙනිදා Jaffna වල. ඇයට ඒ මුදල ලැබිලා නැහැ ස්වාමීනි . ඒවාගේම ස්වාමීනි ඇන්තනී ස්වාමි ස්ටීවන් කියන කෙනා මියගියේ රෝහලේ ඉද්දි තමයි මේ දෙදෙනා මියගියේ ස්වාමීනි 2020/03/12 වෙනිදා තමයි ඔහු මියගියේ. ඔහුටත් ඒ මුදල ලැබිලා නැහැ ස්වාමීනි. ඒකේ වාර්තාවත් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේ දී එවකට රජය විසින් වන්දි මුදල් නොලැබූ පුද්ගලයින් පිළිබඳ විස්තරකරන ලද ලේඛනය NR 10 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතයි.

ප්‍ර: දැන් ගරු පියතුමා මේ විපතට පත්වූ දරුවන් වෙනුවෙන් ඩයලොග් සමාගම සමඟ කොළඹ අගරදගුරු විසින් යම් ශිෂ්‍යාධාර දීමට ගිවිසුමක් ඔබතුමා ලඟ තිබෙනවාද ?

උ: තිබෙනවා ස්වාමීනි. ඒක පැහැදිලි කිරීමක් කලොත් ස්වාමිනි විපතට පත් වූ සෑම දරුවෙක් වෙනුවෙන්ම මම ඊයෙත් ප්‍රකාශ කරා සුවිශේෂී ශිෂ්‍යාධාර වැඩ සටහනක් සූදානම් කරා ස්වාමිනි ඒ විස්තර ටික මා සතුව තිබෙනවා කටුවාපිටිය දේවස්ථානයේ විපතටපත් ඒ පවුල්වලින් දරුවන් 185 ක් සහ කොච්චිකඩේ පවුල් වලින් දරුවන් 102 ක් එකතු කරලා තියෙනවා ස්වාමිනි ඒ ලෙවල් වෙනකල් මට්ටමේ ඉන්න දරුවෝ. ඒ වගේම ඉපදුනු දරුවන් වෙනුවෙනුත් ඒ ශිෂ්‍යාධාර වැඩ සටහන යනවා ස්වාමීනි. උසස් අධ්‍යාපනය කරගෙන යන තවත් දරුවන් 20 ක් කටුවාපිටියෙන් සහ කොච්චිකඩෙකන් දරුවෝ 15 දෙනෙකුටත් ඒ දීමනාව දෙනවා එතකොට 322 දෙදෙනෙකුට ස්වාමීනි අගරදගුරුතුමා කෙරෙහි දැඩි විශ්වාසයක් තබලා ඩයලොග් ආසියාටා සමාගම අගරදගුරුතුමා සමඟ එකතුවෙලා මේ සුවිශේෂී වැඩ සටහන කරන්න විශ්වාසය තැබුවා ස්වාමීනි. එහිදී අපි විශේෂ වැඩ සටහනක් දියත් කරා .

ප්‍ර: ගරු පියතුමා ඔබතුමා කිව්වා ඩයලොග් සමාගම විසින් මේ අන්දමට ශිෂ්‍යත්ව දුන්නා කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබතුමා ලඟ ලිපියක් තිබෙනවා නේද 2020 ජුනි මස 24 වෙනි දින ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔබතුමා ලියන ලද ලිපියක්?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ තහවුරු කිරීමේ ලිපිය අධ්‍යාපනික අවශ්‍යතා සම්බන්ධව?

උ: ඔව් ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එම 2020 ජුනි මස 24 වෙනි දින මෙම ගරු කොමිෂන් සභාවට ලියන ලද රාමනායක පියතුමා විසින් දෙන ලද ලිපිය මේ අවස්ථාවේදී NR 11 A වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතනවා.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවාද මේ අන්දමට ශිෂ්‍යත්ව දුන් දරුවන්ගේ නාම ලැයිස්තුව ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එම ශිෂ්‍යත්ව දුන් කුඩා දරුවන්ගේ නාම ලැයිස්තුව මේ අවස්ථාවේදි NR 11 B වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතමි.
එම NR 11 B කටුවාපිටිය සහ කොච්චිකඩේ දේවස්ථාන දෙකටම තිබෙනවා . එතකොට කටුවාපිටියට ශිෂ්‍යත්ව වශයෙන් කොපමණ මුදලක් දීලා තිබෙනවාද ?

උ: ස්වාමීනි සම්පූර්ණ මුදලක් කටුවාපිටියට අගරදගුරු හිමිපාණන්ගේ අරමුදලින් මිලියන 71.08 ක් වෙන්කරලා ඒකට තැන්පත් කරලා තියෙනවා ඒ බැංකුවට එය ක්‍රියාත්මක කරගෙන යන්න .

ප්‍ර: එතකොට කොච්චිකඩේ දේවස්ථානය කුඩා දරුවන්ට ?

උ: මිලියන 41.05 ක් ඒ සඳහා වෙන් කරලා තියෙනවා.

ප්‍ර: දැන් ඊට අමතරව විශ්ව විද්‍යාල වලට යන සිසුන් වෙනුවෙනුත් ශිෂ්‍යාධාර වැඩ පිළිවෙලක් සකස් කරලා තිබෙනවා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ගරු පියතුමා ලඟ තිබෙනවාද යම් වාර්තාවක් ?

උ: ඔව් ස්වාමීනි මා සතුව තිබෙනවා. විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපනය කරන ආයතනවලට ඉල්ලුම්කරලා තියෙන ලැයිස්තුවක් 35 දෙනෙකුගේ **එම ලැයිස්තුව මේ අවස්ථාවේදි විශ්ව විද්‍යාලය සඳහා ඉදිරිපත් කර තිබෙන සිසුන්ගේ ලැයිස්තුව මේ අවස්ථාවේදී NR 11 C වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතයි.**

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා .</u>

ප්‍ර: පියතුමනි, NR 11 A ලිපියට අමුණලා තියෙන්නේ අර දැනට මේ දරුවන් වෙනුවෙන් වියදම් කරලා තියෙන මුදල අධ්‍යාපන කටයුතු සඳහා?

උ: එහෙයි ස්වාමීනි. ඒක තැන්පත් කරලා තියෙන්නේ මාස්පතා ඒ අදාල accounts වලට ස්වාමිනි. ඒ මුදල් automatically යන විදියට බාරදීලා තියෙන්නේ ඒකේ ඒ අයිතිකරු එතකොට බැංකුවත් එක්ක agreement එකකින් තමයි ස්වාමිනි සිද්ධ වෙන්නේ. ඒ මුදල් ඒ බැංකුවට ලබා දීලා තියෙනවා ඔය ආකාරයෙන් අදාල මුදල එම පවුලේ දරුවාගේ account එකට ගිහිල්ලා ඒ account එකෙන් 75%ක් ස්වාමිනි බාරකරුගේ හෝ

FAIR COMMENT — BY JEZEEM

දෙමව්පියන්ගේ account එකකට යනවා ඒ මාස්පතා ඒ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් .

ප්‍ර: ඒ යන 75% ක මුදල තක්සේරු කරලා තියෙනවාද මාසෙකට මේ ළමයින්ට අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මුදලද කියන එක ?

උ: එහෙයි ස්වාමීනි දල වශයෙන් තමයි තියෙන්නේ ස්වාමිනි අපි ඒ කියන්නේ transport නැතුව ස්වාමීනි ඒ ඔවුන්ගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මාසෙකට ඒ මුදල ඇතිවෙයි කියලා අපි අනුමාන කරලා තමයි ස්වාමීනි ඒ මුදල අපි මාස්පතා දෙන්නට කටයුතු කරලා තියෙන්නේ .

ප්‍ර: ඒ කියන්නේ මේක assessment එකක් විතරයි ඒ කියන්නේ නිවැරදි වශයෙන් ගණනය කරලා

උ: නිවැරදි වශයෙන් නෙවේ ස්වාමීනි. ඒකේ break down එක ස්වාමිනි අපි ඒ දරුවන්ට ලබා දුන්නේ පුංචි පොතක සඳහන් කරලා තියෙනවා ඔවුන්ගේ වයස් කාණ්ඩ අනුව කොයි ආකාරයෙන්ද මේ මුදල මාසිකව ඔවුන්ට ලැබෙන්නේ කියලා.

****

<u>ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා.</u>

එම ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් පොතක් තිබෙනවා සාරාංශයක් වශයෙන් එය මේ අවස්ථාවේදී ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් තිබෙන අත්පොත මේ අවස්ථාවේදි NR 11 D වශයෙන් සලකුණු කිරිමට ගරු කොමිෂන් සභාවේ අවසර පතයි.

උ: එම පොත ස්වාමිනි සෑම දරුවෙකුටම ලබා දීලා තියෙනවා දෙමව්පියන් සමඟ කොයි ආකාරයෙන්ද එය සිදු වෙන්නේ කියන තොරතුරු එම පොතේ අඩංගු වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමාට කියන්න පුලුවන්ද මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා ?

උ: ශිෂ්‍යාධාර වැඩසටහනද නැතනම් පොදු

ප්‍ර: ශිෂ්‍යාධාර ?

උ: ස්වාමිනි අපි සැලසුම් කරගෙන තියෙන විදියට සෑම දරුවෙකුටම ඔවුන්ගේ ගිණුම් පොත්වලට ඔය ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවා 25%ක් ඒ දරුවාගේ නමින් තැන්පත් වෙනවා ඒකට වෙනම ගිණුම් පොතක් අදාල බැංකුවත් එක්ක කතා කරලා දරුවට ලබා දීලා තියෙනවා. ඒ වගේම මේ instructions දීලා තියෙනවා ඒකෙන් 75%ක් ඒ ගාඩියන්ගේ හෝ දෙමව්පියන්ගේ නමට යනවා ඒ එකඟතාවය මත තමයි මේ වැඩසටහන වෙන්නේ අර ඉතුරු වෙන 25% ස්වාමිනි ඔහුට හෝ ඇයට අවුරුදු 18 වුනාට පස්සේ ලිපියක් දීලා තියෙනවා ඒ ලිපිය බැංකුවට පෙන්වලා ඒ මුදල් ලබා ගැනිමේ හැකියාව දීලා තියෙනවා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

එතකොට ඒ බැංකුවට instructions ඔක්කොම දීලා තියෙනවා අවුරුදු 18 කොහොමද පිරෙන්නේ කාගෙද පිරෙන්නේ කල් කියලා . එතකොට අර 75% ප්‍රයෝජනයට ගන්න පුලුවන් ඒක එක ක්‍රමයක් ස්වාමීනි. ඊට පස්සේ මාස හතරෙන් හතරට නිවාඩු කාලේ මේ දරුවන්ව වයස් කාණ්ඩ අනුව ගෙන්වලා eluviation එකක් ඇගයීමක් කරගෙන යනවා. ඒ අවස්ථාවේදී අපේ ඔය පුංචි පොත් පිංචේ සඳහන් කරලා තියෙනවා ඒ වැඩ කටයුත්ත කොහොමද අපි කරන්නේ කියලා නිවාඩු කාලේ මේ දරුවන්ට මේ පළවෙනි වැඩසටහන කරන්න නියමිතව තිබුනේ අප්‍රේල් මාසේ 2020 නමුත් මේ කොරෝනා සිදුවීමත් එක්ක ඒක අපිට කරන්න බැරිවුනා ස්වාමීනි කොච්චිකඩේ සහ කොළඹ අවට ඉන්න දරුවෝ වෙන වෙනම කරලා තමයි අපි සැලසුම් කරලා තිබුනේ අපේ ආයතනය වෙනුවෙන් ඒ සමාලෝචනය Evaluation එක කරන්න අපි වැඩ සුදානම් කරලා හිටියේ නමුත් කරගෙන යන්න අපිට බැරිවුනා . අන්න ඒ අවස්ථාවේදි අපි තවත් දෙයක් අනාගතේ ඔවුන්ට පුරුදු කරන්න සැලසුමක් තියෙනවා. ඒ දරුවන්ට කියනවා අපි මේ ව්‍යසනයේ මානසික මට්ටම හොඳ වුනාම ඒ සම්බන්ධතාවය අපි දරුවොත් එක්ක පවත්වාගෙන ගිහිල්ලා මොකද ඒ ලෙවල් නිමා වෙනකල් මේ වැඩ සටහනේ ඒ දරුවොත් එක්ක යන නිසා ස්වාමීනි අපි කියනවා ඔබට අධ්‍යාපනයට යන බිල් එකතු කරන්න කියලා මේ දෙන්නෙ රු 6000 ක් නම් මාසෙකට හම්බ වෙන්නේ සාධාරණ අධ්‍යාපනයට යන වියදම්වල බිල් අපිට වාර්තා කරන්න කියලා එතකොට මාස හතරෙන් හතරට ඒකෙන් අපි බලාපොරොත්තු වෙනවා දරුවන්ට උගන්වන්න වගකීම් දෙයක් මේ අනුන්ගේ මුදලක් තමයි ඔබට හම්බ වෙන්නේ ඔබ වෙනුවෙන් දුන්න මුදලක් ඒකට යම්කිසි වගකීමක් ඔබ දරන්නට ඕනේ. ඒකේ වගකීම ඔබ බාරගත යුතුයි කියලා . ඒ නිසා 5 වසරින් සිටින සෑම 5 වසරෙන් ඉහලින් සිටින සෑම දරුවෙකුටම මේ උපදේසය අපි මේ වෙනකොටත් ලබා දීලා තියෙනවා හතර වසර සිටින දරුවන්ට අපි ඒ උපදේසය දීලා නැහැ . ඒකේ වගකීම දෙමව්පියන්ට පවරලා තියෙනවා දෙමව්පියන් අනිවාර්යයෙන්මන්ම ඒ මාස හතරේ document එකක් ලියකියවිල්ලක් දෙන්නට ඕනේ දෙමව්පියන් අත්සන් කරලා මේක කොයි ආකාරයෙන්ද වියදම් කරේ කියන දෙය ඒකේ වගකීම හුරු කරන්න.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා කිව්වා ඩයලොග් ආයතනය සමඟ මේ සම්බන්ධයෙන් යම් ගිවිසුමකට එළඹුනා කියලා.

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එම ගිවිසුමේ පිටපතක් පියතුමා ලඟ තිබෙනවාද?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව් ස්වාමීනි. ඒ පොත් පිංචේ පැහැදිලි කරලා තියෙනවා ස්වාමිනි අගරදගුරු හිමිපාණන් ගේ අරමුදලෙන් කීයක්ද යන්නේ ඩයලොග් සමාගමෙන් කීයක්ද යන්නේ කියලා ඒකට හදපු ගිවිසුම මේ බාරදෙන්නේ ස්වාමීනි.

මේ අවස්ථාවේදි ඩයලොග් සමාගම සහ කොළඹ අගරදගුරු සමඟ තිබෙන එම ගිවිසුම එනම් 2018 නොවැම්බර් මස 27 වෙනි දින ගිවිසුම NR 11 E වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතනවා.

ප්‍ර: දැන් ගරු පියතුමා කටුවාපිටිය ජනතාවගේ නිවාස ඉදි කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ කටයුතුවලට කුමන ආකාරයේ මැදිහත් වීමක්ද කතෝලික සභාව සිදු කලේ ?

උ: ස්වාමීනි මා ඊයෙත් පැහැදිලි කලා ඕකේ මූලික කරුණ ,එවකට සිටි නිවාස සංවර්ධන අධිකාරියේ ඇමතිතුමා අගරදගුරුතුමාට පොරොන්දු වුනා කටුවාපිටිය ප්‍රදේශයට ඉඩම් අරන් දුන්නොත් ස්වාමීනි අපි නිවාස ටික හදලා දෙනවා කියලා. ඒ නිසා ඒ පොරොන්දුව මත ඉඩම් ගත්තා ස්වාමිනි මිලියන 50 ක වටිනා ඉඩම් දෙකක් ඒ ප්‍රදේශයේ අරගෙන තිබෙනවා. නිවාස ස්වාමිනි කටුවාපිටිය ප්‍රදේශයේ නිවාස අවශ්‍යතාවය තිබුනා ස්වාමිනි 31ක අන්න ඒ අවශ්‍යතාවය ඉෂ්ඨ කරන්නට . ඒක ඊට පස්සේ මුල් ගලක් තිබ්බා ස්වාමිනි එතන නමුත් ආණ්ඩුවේ වෙනස්වීමත් එක්ක එය ක්‍රියාත්මක කරගන්න බැරුව ගියා ස්වාමිනි ඒ සම්බන්ධයෙන් මා ලඟ ලිපිගොනුව තිබෙනවා ස්වාමීනි. කටුවාපිටිය ප්‍රදේශයේ දැඩි අවශ්‍යතාවයක් තියෙනවා කුලි නිවාසවල ඉන්න මේ විපතටපත් වෙච්ච පවුල් වෙනුවෙන් ඉතින් මේකේ තියෙනවා ස්වාමිනි ඉඩම් එක්ක නිවෙස් ඉල්ලලා ඉන්න 25 දෙනෙක් පවුල් ඒ වගේම ඉඩම් තියෙනවා ස්වාමිනි 6 දෙනෙකුට නිවාස 6 ක් තනා දෙන්න කියලා. ඒ කියන්නේ කටුවාපිටියේ නිවාස 31 ක් සෑදීමට ඔවුන් පොරෙන්දු වුනා ස්වාමීනි. කොච්චිකඩේට රජය පොරොන්දු වුනා එවකට ඒ flats වලින් නිවාස අරගෙන දෙනා මේ කුලි පදනම මත ඉන්න විපතට පත් පවුල්වලට කියලා. එතකොට කොච්චිකඩේ ඉන්නවා ස්වාමීනි අපිට වාර්තා වෙච්ච පවුල් 62 ක් ඒවාගේම ඉඩම් තිබෙන තිදෙනෙක් ඉන්නවා ස්වාමිනි නමුත් මේ තිදෙනා කෙච්චිකඩේ මේ කොළඹ අවට නෙමේ පිටස්තර අයට ඒ අයත් අපෙන් ඉල්ලීම කරලා තිබෙනවා නිවාස තමන්ගේ ඉඩම්වල හදලා දෙන්න කියලා . ඒ අනුව ස්වාමීනි 65 දෙනෙක් කොච්චිකඩේ විපතට පත්වුන පවුල් අතර සිටිනවා මේ ඉල්ලීම කරලා . ඒ අයට ස්වාමීනි සුවිශේෂි කරුණු කීපයක් සඳහන් කරන්න කැමතියි රජය එවකට සිටි රජය මේ පවුල් වලට ගිහිල්ලා සුවිශේෂ ආකාරයෙන් ඔවුන්ව Evaluate කරා. ඔවුන් Evaluate කරලා අපිත් ඒක්ක සම්බන්ධ වෙලා ප්‍රධාන ලියකියවිල්ලක් සුදානම් කලා ඔවුන් ඒකට සුදුසුද නැද්ද කියලා ඒකේ කොපියක් අපිට ලබා දීලා තියෙනවා

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි එහි පිටපතක්ද මේ සමඟ ඇති බව ප්‍රකාශ කරනවා නමුත් මේක ක්‍රියාත්මක කරගන්න හැකියාවක් ලැබුනේ නැහැ ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා කුලී නිවාස වල ඉන්න අය අපට නිවහනක් ලැබෙයි කියලා මොකද ස්වාමිනි අපි දැන් කුලිය ගෙවනවා. සමහර අයට අපි පොරොන්දු වුනා. ගිය අවුරුද්දේ පලවෙනි අවුරුද්ද සමරද්දී මේ නිවාස ටික අපි කොහොම හරි ඔවුන්ට ලබා දෙනවා කියලා නමුත් ඒක කරගන්න හම්බ වුනේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ තියෙන ආර්ථික අපහසුතා සමඟ අගරදගුරුතුමාට ලිපි එවනවා අපිට පුලුවන් නම් මේ නිවාසවල කුලිය ගෙවන්න මුදලක් ලබා දෙන්න කියලා ඒකටත් දැන් අපි කටයුතු කරගෙන යනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා කිව්වා කටුවාපිටිය දේවස්ථානයේ නිවාස ඉල්ලීම් සම්බන්ධව තහවුරු කිරීමේ ලිපියක් ඔබතුමා ලඟ තිබෙනවා කියලා ?

උ: තිබෙනවා ස්වාමීනි.

මේ අවස්ථාවේදී මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද මෙම සාක්ෂිකරු විසින් 2020 ජුනි මස 24 වෙනි දින තහවුරු කිරීමේ ලිපිය නිවාස ඉල්ලීම් සම්බන්ධව NR 12 A වශයෙන් ලකුණු කරමි.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා ලඟ තිබෙනවාද නිවාස මේ අන්දමට දීමට තිබෙන නාම ලැයිස්තුවක් ?

උ: තිබෙනවා සවාමීනි. අපේ ඉල්ලුම් කරලා අවශ්‍යතා බලලා සනාථ කර ගත්ත ලැයිස්තුවක් අපි සුදානම් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එම නාම ලැයිස්තුව කටුවාපිටිය සහ කොච්චිකඩේ යන දේවස්ථාන දෙකටමද ?

උ: දෙකටම ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේදි මෙම නිවාස ඉල්ලීම් සම්බන්ධයෙන් කරන ලද බැතිමතුන්ගේ නාම ලැයිස්තුව NR 12 B වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතයි.

ප්‍ර: දැන් ගරු පියතුමා මේ නිවාස අවශ්‍යතාවය තවම තිබෙනවාද ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ සම්බන්ධයෙන් කතෝලික සභාව විසින් කුමක් හරි කරගෙන යනවාද ?

උ: ඔව් ස්වාමිනි අපිට විශේෂයෙන් ඉතාලියේ පාදුවා , අපේ වගේම කරිටාස් ආයතනයකින් නිවාස 6ක් ඉදි කිරීමට අපිට මුල්‍යමය ආධාර ලැබුනා හැබැයි ඒ මුදල් ස්වාමීනි මේඅගරදගුරු හිමිපාණන්ගේ අරමුදලට දැම්මේ නැහැ ඒ ගොල්ලෝ එකතු කරලා දෙන නිසා අපේ ආයතනයට ලබා දීලා ඒ හරහා නිවාස 6 ක් ඉදි වෙමින් පවතිනවා තට්ටු නිවාස විදිහට තට්ටු 3 කටඑක තට්ටුවකට නිවාස දෙක ගානේ ස්වාමීනි ඒකට අදාල සියල්ලක් මා සතුව තියෙනවා ස්වාමීනි. ඒ නිවාස දැනට අපිට කරගන්න දැඩි අවශ්‍යතාවය තියෙන පවුල් 6 කට ඒ නිවාස 6 ලබා

FAIR COMMENT BY JEZEEM

දීමට කටයුතු කරනවා ඒ පලවෙනි අවුරුදු නිමාවේදි දෙන්න උත්සාහයක් දැරුවා ස්වාමීනි නමුත් අපිට කරගන්න ලැබුනේ නැහැ විශේෂයෙන්ම මේ තිබිච්ච කොරෝනා වෛරස් තත්වය නිසා ඒ නිසා. අප ආයතනය විසින් මේ සුවිශේෂී නිවාස යෝජනා ක්‍රමයක් විදියට මේ ආකාරයෙන් ස්වාමීනි අපි ඩිසයින් කරලා පවුල් 6 කට තමයි අපිට දෙන්න හැකියාවක් තියෙන්නේ දැනට. අපි උත්සාහ කරනවා අනාගතේ රජය මේ වැඩ පිළිවෙල ගෙනියන්නේ නැත්නම් කොහොමහරි දෙයකින් මේ නිවාස අවශ්‍යතාවය ඉෂ්ඨ කරලා දෙන්න නමුත් ඒක අපිට ලොකු අභියෝගයක් මිලියන ගණනක් යනවා මේ නිවාසය ඉදි වෙන්නේ මේ බ්ලොක් එක ඉදි වෙන්නේ ජාඇල බොල්ලත කියන ප්‍රදේශයේ අපි ඉඩමක් මිලදී ගෙන මේ නිවාස 6 මේ ආකාරයෙන් දැනට ඉදිවෙමින් පවතිනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා දන්නවාද මුස්ලිම් වර්ල්ඩ් ලීග් කියන ආයතනයේ ප්‍රධානියා වන මොහොමඩ් බිල් කියන මහත්මයා 2019 ලංකාවට පැමිණියා ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවේදි ඒ මුස්ලිම් වර්ල්ඩ් ලීග් කියන ආයතනයෙන් මෙම කටුවාපිටිය සහ කොච්චිකඩේ මෙම සිදුවුන බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් මූල්‍යමය ආධාරයක් දීමට පොරොන්දු වුනා .?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ කොපමණද ඒ මුදල ? ගරු පියතුමා ඔබතුමා දන්න හැටියට?

උ: යූ එස් ඩොලර්ස් මිලියන 05 ක් කියලා තමයි ස්වාමිනි සඳහන් කලේ. ඔවුන් මගේ මතකේ හැටියට එයා පෝර්ට් එකෙන් ඇවිල්ලා කෙලින්ම ආවේ අගරදගුරු හිමිපාණන් කාදිනල් හිමිපාණන් හමු වෙන්න ඉන්පස්සේ තමයි ඔය වැඩ සටහනට ගියේ ඒ අවස්ථාවේදි ස්වාමිනි රදගුරුතුමාට පොරොන්දු වුනා අපි සුවිශේෂී දායකත්වයක් මෙම විපතට පත් පවුල් වලට ලබා දෙනවා රජය හරහා කියලා ඒ පිළිබඳව අගරදගුරු හිමිපාණන් දන්නවා වාචිකව ඔවුන් පොරොන්දුවකුත් දිලා තිබෙනවා ස්වාමිනි ඒ කරුණත් අපි දන්නවා. ඒ වගේම අපිට මතකයි ස්වාමීනි වීඩියෝ, පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මෙහි ඩමී චෙක්පතක් එවකට සිටි ජනාධිපතිතුමාට ලබා දුන්නා මගේ මතකේ විදියට නෙළුම් පොකුණ රංග පීඨයේදි එම අදාල අය සමඟ මේ චෙක්පත ලබා දුන්නා කියලා මගේමතකයක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ සම්බන්ධයෙන් අතිගරු ඕමල්පේ සෝභිත තේරෝ හාමුදුරුවන් වහන්සේ මේ ලඟදී රූපවාහිනී නාලිකාවේ මේ සම්බන්ධයෙන් දේශනාවක් පැවැත්තුවා .?

උ: එහෙමයි ස්වාමීනි.

(විඩියෝ පටයක් ප්‍රදර්ශනය කරයි)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එම දේශණය තිබෙන සි. ඩී තැටිය NR 13 වශයෙන් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසර පතමි.

ප්‍ර: ගරු පියතුමා ඊයේ දිනයේ ඔබතුමා සියෝන් දේවස්ථානයට ලබා දුන් මූල්‍යමය ආධාර ගැන සාක්ෂි දුන්නා ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවේ දී මෙම ගරු කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කර සිටියා රුපියල් මිලියන 5 ක චෙක්පතක් එම දේවස්ථානයේ රොෂාන් දේවගැතිතුමන්ට කාදිනල් හිමිපාණන් විසින් 2019 ජුනි මස 16 වෙනි දින එම චෙක්පත cash වශයෙන් යෙදෙව්වේ ඇයි කියලා ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබතුමාට ගරු පියතුමා කියන්න පුලුවන්ද මේ සම්බන්ධයෙන් තවදුරටත් ඔබතුමා හොයලා බැලුවද ඊයේ සහ අද අතරතුර ?

උ: ඔව් ස්වාමීනි ඊයේ රාත්‍රියේදී එතුමව දුරකථනයෙන් අමතලා මේ සම්බන්ධයෙන් හොයලා බැලුවා ස්වාමීනි. අපි ස්වාමීනි ඊයේ සඳහන් කල පරිදි අපේ ලිඛිතව ඊ. මේල් විද්‍යුත් පණිවිඩයක් සහ තැපෑලෙන් යොමු කලා ලිපි මේ සම්බන්ධයෙන් අපිව දැනුවත් කරන්න කියලා. මා ඊයේ දවසෙදි කිව්වා අපිට පිළිතුරක් ලැබුනේ නැහැයි කියලා ඊයේ රාත්‍රියේදි අපි දුරකථන ඇමතුමක් ලබලා දීලා උත්තරයක් අපිට එවන්න හැකියාවක් තියෙනවා ද කියලා මම විමසුවාම එතුමා කිව්වා උත්තරය ඊ මේල් වලින් එව්වා පියතුමනි බලන්න කියලා ඒ රාත්‍රියේම බැලුවා එතකොට තිබුනේ නැහැ නමුත් ඇවිල්ලා තිබුන ඒක trash එකට තමයි ගිහිල්ලා තිබුනේ ස්වාමීනි. ඊට පස්සේ සොයා ගත්තා ඒ ඊ මේල් එක. ඒ නිසා එතුමා අපිට ඊ මේල් තමන්ගේම ලෙටර් හෙඩ් එකෙන් එතුමා අපිට ඊ මේල් හරහා මේ මාසේ 11 වෙනිදා එම ලියුම ලියලා තියෙනවා. ස්වාමීනි අපි 09 වෙනිදා තමයි ඊමේල් පණිවිඩය යොමු කලේ ජූනි මාසේ 09වෙනිදා එතුමා 11 වෙනිදා ඊ මේල් වලින් අපිට ගණුදෙනු එවලා තිබුනා නමුත් අපේ එකේ සඳහන් වුනේ නැහැ trash එකට ගිහිල්ලා නිසා හොයා ගන්න බැරිවුණා. ඊයේ රාත්‍රියේ දී අපි හොයාගෙන එහි පිටපතක් අපි අරගෙන ආවා . එතුමා අපිට දැනුම් දීලා තියෙනවා එතුමා මේ මුදල බාර ගත්තා ඒ මුදල කොයි ආකාරයෙන්ද වියදම් කලේ කියලා. ඊ මේල් එකකින් එතුමා අපිට ලබා දීලා තියෙනවා ස්වාමීනි ලිපියක්. ඒ ලිපියේ සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි දුන්න කාදිනල් මිලියන හිමිපාණන්ගෙන් ගත්ත මිලියන 05 න් මිලියන තුනක් රෝගීන් සඳහා වියදම් කලබවත්, මිලියන 2ක් දේවස්ථානය ගොඩ නැගීමට යොමු කල බවත් ඒ අවස්ථාවේදී මම කියා සිටියා පස්සේ අද උදෑසන ඒ එක්කම අපි වෙනම ලිපියක් ඔබතුමාට එවනවා මේකේ අයවැය වාර්තාවක් අප හට ලබා දෙන්න කියන පණිවිඩයත් ස්වාමීනි ඔබතුමන්ලා අපව දැනුවත් කරපු ආකාරයට ඒ අවස්ථාවේදි ඒ ප්‍රශ්න

FAIR COMMENT BY JEZEEM

කිරීමත් තුළ අපටත් හැඟීගියා අපි සමහර විට වගකීමෙන් තොරව මේක ක්‍රියාත්මක වුනා කියන හැඟීම ඊයේ අපිට දැනුනා විශේෂයෙන් මට. ඒ නිසා මම ක්‍රියාත්මක වෙලා මේ තොරතුරු අද රැගෙන ආවා ස්වාමිනි.

ප්‍ර: මේ අවස්ථාවෙ දී එම රොෂාන් මහේෂන් දේවගැතිතුමා විසින් එවන ලද ඊ මේල් 2020 ජුනි මස 11 වෙනි දිනැති ඊ.මේල් පණිවිඩය NR 14 A වශයෙනුත් ඊට අදාල ඇමුණුම NR 14B වශයෙනුත් ලකුණු කිරීමට ගරු කොමිෂන් සභාවේ අවසරය පතනවා.

ප්‍ර: දැන් ගරු පියතුමා ඔබතුමා ඊයේ සාක්ෂි දුන්නා කොළඹ අගරදගුරු කාදිනල් හිමිපාණන් වෙතට 2019 ජුලි මස 19 වෙනි දින බස්නාහිර පළාත් සභාව විසින් රුපියල් මිලියන දෙකයි දශම පහක් වටිනා චෙක්පත් දෙකක් මෙම අරමුදලට පරිත්‍යාග ලෙස ලැබුනු බවට ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුලුවන්ද එම චෙක්පත් දෙක වලංගුවී තිබූ දිනය පිළිබඳව ?

උ: ඔව් ස්වාමීනි එම චෙක්පත් ලියලා තියෙන දිනය විදියට සඳහන් වෙන්නේ 2019/04/ 29 විදියටයි නමුත් ඊට පහලින් තියෙනවා ස්වාමීනි මෙය දීර්ඝකරන ලදි කියලා 2019 /06/20 වෙනිදා සිට දින 30 ක් දක්වා දීර්ඝකරන ලදි කියලා ඉන් පහල සීල් එකක් මුද්‍රාවක් එක්ක සඳහන් කරලා තියෙනවා ස්වාමීනි. එතකොට මෙම චෙක්පත අගරදගුරු හිමිපාණන්ට ලබා දෙන්නේ 2019/07/19 වෙනි දිනයි . එතකොට අර දීර්ඝ කරන ලද සඳහනත් එක්ක ස්වාමීනි මේක කල් ඉකුත් වෙන්නේ 2019/07/20 වෙනි දිනයි ස්වාමිනි එතකොට ලැබෙන්නේ 2019/07/19 වෙනි දිනයි ස්වාමීනි. ඒ මිලියන දෙකයි දශම පහේ චෙක්පත් දෙක අගරදගුරු හිමිපාණන් ගේ ගිණුමට බැර කරන ලද රිසිට් පත තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ගරු පියතුමා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් අප කතෝලික සභාවේ ප්‍රධාන එඩේරා වශයෙන් අපි අප සියලුම බැතිමතුන් විසින් සලකනවා ඒ කියන්නේ our Chef Shepherd දැන් ගරු පියතුමා මේ සම්බන්ධයෙන් මේ පාස්කු ප්‍රහාරයට පසුව අති උතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් විසින් මේ ප්‍රධාන එඩේරා වශයෙන් කතෝලික ජනතාවට කරන ලද සේවය ඔබතුමාට කියන්න පුලුවන්ද ?

උ: ඔව් ස්වාමීනි. ප්‍රථමයෙන්ම අපේ කතෝලික සභාවේ ශ්‍රී ලංකා ඉතිහාසය තුල කාදිනල්වරුන් දෙදෙනෙක් පමණයි මේ වෙන කොට අපිට මුණ ගැසෙන්නේ . ඉතිහාසයේ පලවෙනි කෙනා අති උතුම් තෝමස් කාදිනල් හිමිපාණන්. දෙවනි කෙනා තමයි අපිට ඉතිහාසයේම හමුවෙන්නේ අපගේ ආදරණීය ප්‍රධාන එඩේරා වන අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත්

FAIR COMMENT BY JEZEEM

හිමිපාණන් එතුමා සුවිශේෂී නායකත්වයක් දුන්නා ඒ නායකත්වය තුල මා ආඩම්බර වෙනවා ස්වාමිනි අද එතුමාගේ නායකත්වය යටතේ මේ සහන සේවා කටයුතු දියත්කරන්න ලැබීම වාසනාවක් කියලා. ප්‍රහාරය අවාසනාවන්ත වුනත් එතුමාගේ නායකත්වය යටතේ වැඩ කිරීමට ලැබීම භාග්‍යයක් කියලා මා සලකන්නේ සැබැවින්ම එතුමා ජාතික එඩේරෙක් නිසයි. ආගමේ පැත්තකින් තිබ්බත් එතුමා අවසානේදි මේ වෙන කොට ජාතික එඩේරෙක් සැබෑම මඟ පෙන්වන්නෙක්. අපි එඩේරා කියන වචනය ස්වාමීනි පාවිච්චි කරන්නේ ධර්මය තුල බැටළුවන් මෙහෙයවන කෙනාට. බැටළුවන් නැති වුනාම ස්වාමින් වහන්සේ ජේසුස්වහන්සේ අපිට කිව්වා 99 දෙනා දාලා නැතිවෙච්ච බැටලුවා හොයාගෙන යනවා කියලා. අපිට ඉන්නෙත් අන්න එවැනි එඩේරෙක්. සිදුවීම පොඩියි ව්‍යසනය විශාලයි නමුත් බොහෝ දෙනෙක්ගේ දෙනෙත් වැහුනා ස්වාමීනි මේ සිදුවිමේදී බොහෝ දෙනෙක්ගේ දෙනෙත් විවෘත කරන්න ඕනේ නිසා ඒ දේ හඳුනාගත්ත නිසා ස්වාමීනි මේ අපේ නායක එඩේරාණන් සැබෑ නායකත්වයක් දුන්නා අවශ්‍ය තැන ජනතාව නිහඬ කරවලා තමන්ගේ අධ්‍යාත්මික බලය හරි විදියට යොමු කරලා ඒ නායකත්වය තුල මේ සිදුවිමෙන් බොහෝ දෙනෙක්ව සනසවලා අනිත් අයගේ ඇස් පාදන්න හැකියාවක් ලැබිච්ච ආදරණීය සදාදරණීය තාත්තා කෙනෙක්ගේ චරිතය අපිට අත්දකින්න ලැබුනා. මා මේ ගරු සභාව ඉදිරියෙදී ප්‍රකාශ කලා ඒ නායකත්වය නිසා තමයි අදටත් අපටත් කඳුළු එන්නේ ඒ නායකයාට හැකි වුනා මේ වේදනාව දැකලා හමුවෙලා අඬන්න පුලුවන් වුනා. ඒ නායකයාට පුලුවන් වුණා තමන්ගේ ආරක්ෂක නිළධාරින් කියද්දි මල ගෙවල්වල යන්න එපා මිනි වළලන්න යන්න එපා කියද්දි ඕගොල්ලෝ ඉන්න ඕගොල්ලන්ගේ ආරක්ෂාව තියාගෙන මගේ පරණ රථයේ යතුර මට කරුණාකරලා ගෙනල්ලා දෙන්න කාර් එකේ මම තනියම යනවා මගේ ජනතාවත් එක්ක මැරෙන්න මම සූදානම් නැත්නම් මම මේ දම් පාට මේ රතු පටිය පළඳින්නේ නැහැ ඕගොල්ලෝ ඉන්න තැන ඉන්න මට දෙන්න මගේ පරණ කාර් එකේ යතුර අවදානම ගන්න ඕනේ තැන අවදානම ගත්තා ස්වාමීනි . ඒ නිසා තමයි මේ ජනතාව මේ පවුල් 381 අදටත් එක්තරා විදියකට ඔබ වහන්සේලා ඉදිරියේ කියන්නේ නිහඬවෙලා සිතින් දේවල් දරාගෙන ඉන්නේ උන්වහන්සේගේ හඬ නිසයි උන් වහන්සේ ඒ ජනතාවට ආදරෙයි කියලා දැනුන නිසයි කියපු නිසා නෙවේ දැනුන නිසයි. ඒ නායකත්වය නිසා තමයි ස්වාමීනි අපගේ සේවක මඩුල්ලත් එක්ක දිවා රෑ නොබලා අපේ මේ පොඩි ආයතනය සෙත්සරණ කියන ආයතනය මේ තරම් සුවිශේෂී කාර්ය බාරයක් කලේ උදේ හවස මෙතුමා අපෙන් අහන ප්‍රශ්ණ වලට උත්තර දෙන්න අපි බැඳිලා ඉන්නවා. ඒ මාසෙකට සැරයක් නෙමේ උදේ හවස අහන්නේ මේ ප්‍රශ්නෙට මොකද ලියුම් මිටි ගණන් මේ අය එවද්දි අපි හැම ලියුමකම කියවලා ඒ තැන අදාල

FAIR COMMENT
BY JEZEEM

තැන මාක් කරලා හයිලයිට් කරලා පාදර් ලෝරන්ස් Please attend to this immediately and me a report එහෙම කියද්දි මගේ ආයතනයේ ඉන්නේ ස්වාමිනි සුලු පිරිසක්. දවසකට ලියුම් 6 ක් 7 ක් එද්දි වාර්තාවක් ගහන්න තරම් ශක්තියක් තිබුනේ නැහැ. හැබැයි නායකත්වයේ තිබිච්ච ඒ එඩේරක ගතිය නිසා මේ සෑම දේකටම පුංචි දේ පවා නායකත්වය දෙන්නට එතුමාට හැකියාව තිබුනා. ඒ සියල්ල කලේ ස්වාමිනි එතුමා කාදිනල් හිමිපාණන්වරයෙක්. ඒ කියන්නේ පාප් වහන්සේගේ නියෝජිතයෙක් ඒ කියන්නේ ලෝකෙටම ඉන්නේ ඒ ජාතියේ නියෝජිතයෝ මේ වෙනකොට 120 ට ආසන්න ප්‍රමාණයක් එතුමාට තවත් වගකීම් රාශියක් මේ කතෝලික ලෝකය තුල පැවරිලා තියෙනවා. පාප්වහන්සේ ශුද්ධෝතම පියතුමා විසින් ඒ සියල්ලක් කර පින්නා ගෙන තමයි මේ පුංචි දෙයටත් එතුමා සංවේදි වුනේ. අපිට පුලුවන් ස්වාමිනි එතුමාගේ සංවේදිකම නිසා අපිට කිසිසේත් බැහැ නිදා ගන්න මේ සිදුවීමේදි මගේ ආයතනයේ පිරිස සමඟ නිදවරාපු දවස් එමට තිබුනා. ඒ ආයතනයේ සොයුර සොයුරියන් ගෙදර යන්නේ නැතුව ආයතනයේ නිදා ගත්තු දවස් එමට තිබුනා. ඒ කලේ මේ නායකත්වයේ තියෙන ආදරය ලෙන්ගතුකම නිසයි ස්වාමිනි එතුමත් අතඇරියා නම් අපිත් අත අරිනවා . හැබැයි එතුමා මේ සෑම සියලු දෙයක්ම හොයලා බලන්න පුලුවන් ප්‍රඥාන්විත නායකත්වයක් යටතේ ක්‍රියාත්මක වෙන නායකයෙක්. කියලා අපි හඳුනා ගත්තා ඒ නිසා තමයි අදටත් මේ සෑම තොරතුරක්ම update වෙලා යාවත්කාලින වෙලා එතුමාට කිව්වේ නැත්නම් යන්න ගිහිල්ලා ඒක හොයා ගෙන එන්න එනකන් ඉන්න නායකයෙක් ඒ නිසා ඒ නායකත්වය ගරු කරනවා ඒ වගේම අගය කරනවා මා අඩම්බර වෙනවා එවැනි කාදිනල් හිමිපාණන්වරයෙක් දකින්න අපේ දැස් වාසනාවන්ත වෙච්ච නායකත්වයක් සහ ඒවගේම හරිම සරලව දිවි පෙවෙතෙක් එක්කම සරව කතා කරන්න පුලුවන් කෙනෙක් එක්ක මේ ගනුදෙනු ටික කරගෙන යන්න ලැබීම මා සලකනවා ස්වාමීනි මේ මුලු මෙහෙයුමේම වගකීම ගත්තු පියතුමෙක් විදියට මේ අපගේ ආදරණීය ප්‍රධාන එඩේරාණන් වන අති උතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් .

ප්‍ර: ගරු පියතුමා ඔබතුමා දන්නවා නේද එවකට රජය විසින් කාදිනල් හිමිපාණන්ට වෙඩි නොවදින රථයක් දුන්නා කියලා ?

උ: ඔව්. ස්වාමිනි

ප්‍ර: ගරු කාදිනල් හිමිපාණන් එය ප්‍රතික්ෂේප කල බවත් ඔබතුමා දන්නවා නේද ?

උ: ඔව් ස්වාමිනි ඒ රථයේ පිටිපස්සේ දොර මං ඇරලත් බැලුවා ස්වාමිනි දැකලා නැති නිසා ඒ අවස්ථාවේදී ස්වාමිනි එතුමාගේ පෝට්කෝව එක යටට ඔය වාහනය ගෙනල්ලා නතර කරලා තියලා මං හිතන්නේ විනාඩි ගාණයි ගියේ ඔබ තුමාට මෙහෙම තිලිණයක් එවලා තියෙනවා රජයෙන්

FAIR COMMENT BY JEZEEM

කියලා කිව්වාම එතන වටකරගෙන හිටපු ආරක්ෂක නිළධාරින් කිව්වා දැන් අපි රදගුරුතුමාගේ ජීවිතයට වග කියනවා කියලා . දැන් මම සාක්ෂි දෙනවා ස්වාමීනි ඒ වටකරගෙන හිටිය එස් . එෆ් එකේ විශේෂ කාර්ය බලකාය

ප්‍ර: STF?

උ: STF එකක් නෙවේ ස්වාමිනි SF කියලා තව එකක් තියෙනවා ස්වාමිනි. SF කියන Special Force කියන එක එතුමාගෙන් තමයි ආරක්ෂාව දීලා තිබ්බේ ඒ අය කිව්වා දැන් අපිට පුලුවන් පාරෙදි උන්වහන්සේව ආරක්ෂා කරන්න වෙඩි වදින්නේ නැතිව එක්කාගෙන යන්න. අපිට පුලුවන් බැස්සාට පස්සේ මනුෂ්‍යයන් විදියට ආරක්ෂා කරන්න එහෙම කිය කිය ඉද්දිම තමයි ස්වාමීනි ගෙනාපු කෙනාට පණිවිඩය ආවේ ඔය වාහනය අරගෙන මගේ භූමියෙන් කරුණාකරලා අරගෙන යන්න කියලා . එතකොට ඒ ආරක්ෂක නිළධාරීන් තුෂ්නිම්භූත වුනා අපි මේ බොහොම අමාරුවෙන් ඉල්ලගත්ත රථය ඇයි උන්වහන්සේ යවන්න කියන්නේ. මගේ ආරක්ෂාව තියෙන්නේ මගේ දෙවියන් අතේ මිසක් ඔය එවලා තියෙන රථය අනුව නෙවේ. මාව මැරුවොත් මරපුදෙන් ආරක්ෂාකර ගන්න බැරිනම් කමක්නැහැ මගේ ජනතාව ආරක්ෂා කරන්න බැරිනම් ඇයි මාව ආරක්ෂා කරන්නේ අවසාන පිළිතුර වුනේ ඒකයි. පියතුමන්ලා ගිහිල්ලා කිව්වා අපිට ඔබ වහන්සේ වටිනවා ඔබ වහන්සේ ආරක්ෂා වුනෝතින් බොහෝ දෙනෙක් නැහැ මගේ ජනතාව ආරක්ෂා කරන්න බැරිනම් මාව ආරක්ෂා කරන්නත් එපා එවැනි නායකත්වයක් අපිට දුන්නා ස්වාමීනි.

ප්‍ර: ගරු පියතුමා මේ පාස්කු ප්‍රහාරයට පසුව මුල ඉඳලාම අතිගරු මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් ක්‍රියා කලේ යම්කිසි දේශපාලනික අරමුණක් තියාගෙනද කියලා හුහාක් චෝදනා තිබෙනවා ඒ සම්බන්ධයෙන් ගරු පියතුමාට මොකක්ද කියන්න පුලුවන් ?

උ: ස්වාමිනි පූජක ජීවිතය අවුරුදු 19 ක් මගේ නිමයි. නමුත් අපි ඉතාමත් කිට්ටුවෙන් ඇසුරු කරපු අගරදගුරු හිමිපාණන් කාදිනල් හිමිපාණන් අපි කවදාකවත් දැකලා නැහැ එවැනි චරිතයක් . එවැනි ආකාරයෙන් පක්ග්‍රාහි කියලා කියන්න තරම් ගණුදෙනු කරද්දි ඕනෑ තරම් අවස්ථාවක් තිබුනා පක්ෂයකට ලෙන්ගතු වෙලා වැඩ කටයුතු කරන්න නමුත් එවැනි අවස්ථාවල් අපිට කිසිම කොල කැල්ලකවත් තමන්ගේ අදහස් ප්‍රකාශ කරද්දි වැරදි දේ වැරදියි කියලා අපිටත් බැනලා තියෙනවා ස්වාමීනි. ඒ වගේම අපි දකිනවා ඒ නායකත්වය ඒ පක්ෂ වලටත් දෙනවා ස්වාමීනි. ඒක නිසා අපිට හමුවෙලා නැහැ පක්ෂග්‍රාහි කියන්න තරම් හේතුවක් එතුමාගේ ජීවිතයේ මේ කියන චෝදනා සමඟ. ඒ නිසා අපි කිසිසේත් අනුමත කරන්නේ නැහැ උන්වහන්සේ පක්ෂයකට ලෙන්ගතුව මේ සිදුවිමේදී ක්‍රියා කරා කියලා පුන පුනාම කිව්වේ අර මා කියපුවිදියට මාස 14 ක් ගිහිල්ලත් අපේ ඇස් වලට කඳුළු එන්නේ

FAIR COMMENT BY JEZEEM

එතුමාගේ ඇස් වලට කඳුළු එන්නේ අපිට උත්තර නැති නිසා ස්වාමීනි ඔවුන්ට කියන්න මේ අහන අසරණ ජනතාව ඇයි අපි මොකටද ජීවත් වෙන්නේ පියතුමනි මගේ දරුවෝ නැතුව ඇයි පියතුමනි මං ජීවත් වෙන්නේ මට ආදරය කරපු ස්වාමිපුරුෂයා නැතුව , ඇයි පියතුමනි මේක පල්ලියේදි අපිට මෙහෙම කලේ කියද්දි උත්තර නැති වෙද්දි තමයි ස්වාමීනි අපිට ඇඬෙන්නේ .අන්න ඒ නිසා තමයි මෙතුමා එදා ඒ ආකාරයෙන් දේශපාලන අධිකාරියට චෝදනා කරලා බැන වැද්දේ. ඒක ඒ දේශපාලන අධිකාරියට විතරක් නෙමේ වත්මනෙත් ඒවගේම තමයි මේ දේ කරන්නට හැකියාවක් නැති වුනොත් උන්වහන්සේ අනිවාර්යයෙන් උන්වහන්සේගේ කටහඬ විවෘත කරාවි ඒක දේශපාලනය කිරීමක් ලෙස ස්වාමිනි මා හඳුනාගන්නේ නැහැ මා දකින්නේ නැහැ ස්වාමීනි.

මින් පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රානි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 3.20 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා :

මෙම අවස්ථාවේදී අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ඉතාලියේ දෙන ලද මාධ්‍ය සාකච්ඡාවක් සම්බන්ධයෙන් CD තැටිය දැනටමත් NR-08 යනුවෙන් CD තැටියේ සඳහන් කර තිබෙනවා.

මේ අවස්ථාවේදී අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ඉතාලියේ මාධ්‍ය සාකච්ඡාවකදී දෙන ලද දේශනය දැනටමත් NR-08, CD තැටියෙහි ඇතුළත් වී තිබෙන බවට මම ගෞරවයෙන් කොමිෂන් සභාවට කියා සිටිනවා.

ප : දැන් ගරු පියතුමා අවසාන වශයෙන් ඔබතුමා දන්නා හැටියට මෙම විපතට පත් ජනතාව වෙනුවෙන් ඔබතුමාට කියන්න පුළුවන්ද මෙම ගරු කොමිෂන් සභාවට රජය විසින් දැනටමත් ගෙන ඇති පියවර සහ ජනතාවගේ පුනරුත්ථාපන කටයුතු සඳහා ගෙන ඇති පියවර පිළිබඳව සමස්තයක් වශයෙන් ඔබතුමා සෑහීමට පත් වෙනවාද කියලා?

පි : ස්වාමීනි රජය පැත්තෙන් හිටපු සහ වත්මනේ පවතින රජයන් දෙක ගැනම සඳහන් කළොතින් ඔවුන් ගත්තු වගකීම් කිහිපයක් ගිය පාර හිටපු රජය තීන්දු තීරණ ගත්තා. ඔවුන් ක්‍රියාත්මක වුණා. සමහර දේවල් ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. ඒක නිසා ජනතාව බලාපොරොත්තු වෙනවා එවකට සිටි රජය ගත්තු සහන සැලසුම ඒ රජය හරහා වේවි කියලා බලාපොරොත්තුවක් තියෙනවා. ඒ වගේම වත්මන් ඉන්න රජයට කාදිනල් හිමිපාණන් මේ කරුණු කාරණා සියල්ලම සංක්ෂිප්තව අග්‍රාමාත්‍යතුමන්ව ගෙන්වලා අප සමඟ සාකච්ඡාවක් තියලා මේ ජනතාව වෙනුවෙන් කළයුතු ඉතුරු වෙලා තියෙන දේවල් කරන්න ඉදිරිපත් වෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒකේ කරුණු තුනක් අගරදගුරු හිමිපාණන් මතක් කළා. පෙර රජයේ ඒගොල්ලොත් පොරොන්දු වුණා දේවස්ථාන ගොඩ නගලා දෙන්න. ඔවුන් ඒ කියපු විදියට දේවස්ථාන දෙක අපගේ බස්නාහිර පළාතේ ඔවුන් ගොඩ නගලා දුන්නා. ඒ වගේම නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක වැඩසටහන මේ රජයේ වෙනස්වීමත් එක්ක නතර වුණා. ඒක නිසා ඔවුන්ට ඒක ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. වත්මනේදී ඒ තිබිච්ච ප්‍රශ්නත් එක්ක දැන් තියෙන ප්‍රශ්නය තමයි මේ අසාධ්‍ය රෝගීන් තිස් ගණනක් ඉන්නවා ස්වාමීනි. ඒ නිසා ඔවුන්ට

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍රතිකාර කිරීමට අපි මේ මුදලින් වෙන් කරලා තියෙන්නේ මිලියන විසි පහක් පමණයි ස්වාමීනි. ඒකෙන් අපි කර ගන්න බැහැයි කියලා හොඳාකාරවම දන්නවා. ඒ නිසා රජය පොරොන්දු වුණා විශේෂයෙන්ම ජයවර්ධනපුර රෝහල හරහා මේ තිස් නම දෙනා Criticaly Injured තිස් නම දෙනෙක් සිටිනවා. ඔවුන්ට ප්‍රතිකාර කිරීමට රජය පොරොන්දු වුණා. ඒ වගේම ඒ පොරොන්දුවට අදාළ ලිපි ලේඛන අපිට ඒ අදාළ ආයතනවලින්, සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙතින් ඒවා භාරගත් බවටත්, ඒ වගේම ජාතික සෞඛ්‍ය සංවිධානයේ අරමුදලින් එයට යන වියදම් ලබා දීමෙන් ලිපි දෙකක් අපට ලබා දීලා ඒ වගකීම ඔවුන් භාර ගත්තු බවට සඳහනක් තියෙනවා. මේ වගකීම මේ රජය ඉදිරියට ගෙන යාමේ පොරොන්දුව සහ මේ වෙනකොට ක්‍රියාත්මකවීම තියෙනවා මේ අසාධ්‍ය රෝගීන් සම්බන්ධයෙන්. නමුත් අපට තව ප්‍රධාන ගැටළුවක් වෙලා තිබෙනවා ඔබතුමන්ලා සියළු දෙනාට දැනුම් දුන්නු පරිදි ණය තුරුස් සහ නිවාස ප්‍රශ්නය. ඒකනිසා ඒ ඔවුන්ගේ ජීවිතයේ අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා ඒ දෙකම. ඔවුන් බලාපොරොත්තුවන් ඉන්නවා ඔවුන්ගේ ජීවිතයට ඒ සහනය රජය මගින් පොරොන්දු වෙච්ච දෙයක් ලබා දේවි කියලා. ඒ නිසා එතුමා අහන ප්‍රශ්නයට පිළිතුර සෑහීමට පත් වන්නේද කියලා. මට සෑහීමට පත්වන්න හැකියාවක් නැහැ ස්වාමීනි. අවංකවම අදහස් බෙදා ගත්තෝතින් මේ කිසි දෙයක් කළා කියලා ඔවුන්ගේ නැති වෙච්ච දේවල් ඔවුන්ට සොයා ගන්නට බැහැ. ඒ නිසා සෑහීමකට පත්වීමට හේතුත් තියෙනවා හේතු කිහිපයක්. ඒ සියල්ලට අභිබවා යන හේතුව තමයි ඔබ වහන්සේලා ඉදිරියේ අපි පුන පුනා කියන්නේ. අපි දන්නවා කතෝලික සභාව Extra Mile එකක් මේකේ ගියා. එක්තරා පවුලක ළමයි හතර දෙනෙක්, තුන් දෙනෙක් කිසිම ලියකියවිල්ලක් නැතුව ගෙදරට ගිහිල්ලා භාර අරගෙන කතෝලික පාසල්වලට යොමු කළා ස්වාමීනි. අදාළ Document කිසි දෙයක් නැහැ. ඒ වගේම සතයක්වත් ගත්තෙත් නැහැ. දරුවෝ භාර ගත්තා කියලා ශාන්ත බෙනඩික් විදුහලේ විදුහල්පතිතුමා, සහෝදරතුමා ගෙදරට ගිහිල්ලා දරුවා එවන්න එදා සිට කියපු පොරොන්දුව දුන්නා. ඒ Extra Mile එක ගියා. අපි විශ්වාස කරනවා රජයත් ඒ Extra Mile එක යාවි කියලා. ඒ සියල්ලට වඩා ස්වාමීනි ඔබතුමන්ලා ඒ Extra Mile එක යයි කියලා අපි විශ්වාස කරනවා.

****

FAIR COMMENT BY JEZEEM

ගරු අදිකාරි මැතිණිය :

ප : ගරු පියතුමනි, ඔබතුමන්ගේ සංවේදී කථාව මානව දයාවක් ඇති මිනිසුන් ලෙස අපිත් ඉතාමත්ම සංවේදීව අසාගෙන සිටියා. විශේෂයෙන්ම මිනිසුන්ට තියෙනවා ඉතාමත්ම Basic Units දෙකක් Fulfill කරගැනීමේ අවස්ථාවකදී තමයි මේ මිලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරය සිද්ධ වුණේ. එකක් අහිංසක මිනිසුන් පිරිසක් දෙවියන් යදිමින් සිටීම. ඒ වගේම තවත් මිනිසුන් පිරිසක් තමන්ගේ උදේ ආහාරය බුදිමින් සිටින අවස්ථාවක. ඒක නිසා ඔබ වහන්සේගේ වේදනාව අපි සියළු දෙනාම ඔබ වහන්සේත් සමඟ Share කර ගත්තා මම ප්‍රථමයෙන්ම කියන්නට කැමතියි. මම ඇත්තටම ඉතාම සංවේදී වුණා. මට ඇසීමට තියෙන ප්‍රශ්නවත් කෙසේ අසම්දෝ කියලා මට හිතා ගන්නට අපහසුයි. කෙසේ වුවත් පියතුමනි මෙම කොමිසමට තියෙන විශාල වූ කාර්යභාරය එකක් තමයි මෙම විපතට පත් වූ ජනතාව වෙනුවෙන් සහ ඔවුන් වෙනුවෙන් ජීවත්වන්නවුන් සඳහා කිසියම් සහන ලබාදීම සඳහා අපි විසින් යෝජනා ඉදිරිපත් කිරීම. ඒ අනුව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් පියතුමාගේ උගත් නීතීඥ මහතා ගොඩක් මම මේ කොළේ ලියාගෙන තිබ්බ ප්‍රශ්න ඔබ වහන්සේගෙන් ඇසුවා. නමුත් තවදුරටත් මට ඇසීමට ප්‍රශ්න කිහිපයක් තියෙනවා. මම ඒ ප්‍රශ්න කිහිපය ඔබ වහන්සේගෙන් අසන්නම්. ඔබ වහන්සේ පුනරුත්ථීයක් සිද්ධ වෙනවා නම් ඒ ප්‍රශ්නවලට උත්තර දී තිබෙනවා හෝ යම් දෙයක් කීම ප්‍රමාණවත්. මොකද මට දැන් මගේ මතකය හොඳ තත්ත්වයකට නැතුව ගියා. ගරු පියතුමනි ඔබතුමන්ලාගේ සෙත් සරණ සමාජ සුභසාධන වැඩසටහන යටතේ මෙම 2019 අප්‍රේල් 21 ප්‍රහාරයෙන් මිය ගියවුන් සහ ඔවුන්ගේ විවිධ ආබාධිත තත්ත්වයන්ට පත් වූ ජීවත්වන අය වෙනුවෙන් ඔබතුමන්ලා ඉතාම හොඳ වැඩසටහනක් කරලා තියෙනවා. නොයෙකුත් යෝජනා ක්‍රම වගේ තමයි මම ඒවා දුටුවේ. එම යෝජනා ක්‍රම පිළිබඳව තීරණ ගැනීමේදී ඔබතුමන්ලා කිසියම් ක්‍රමවේදයක් ඒ කියන්නේ Formula එකක් වගේ එකක් හැදුවද මෙම වන්දි, ඒවා ගණනය කිරීම සඳහා?

පි : ස්වාමීනි ගණනය කිරීම කියන එක මට අපැහැදිලියි. නමුත් තොරතුරු එකතු කිරීමට සමීක්ෂණයේදී පෝරමයක් හදලා තමයි සමීක්ෂණය කළේ. ඒ වගේම ස්වාමීනි අපි යම්කිසි Criteria ටිකක් පාවිච්චි කළා යම්කිසි තීරණයකට එන්න පෙර වන්දියක් ගෙවනවද, ඒ වගේම මේ පවුලට මොකද්ද කරන උදව්වේදී යම්කිසි Criteria ටිකක් පාවිච්චි කළා ස්වාමීනි.

ප : මොකද්ද පියතුමනි පැහැදිලි කරන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : අපි කියන්නේ ස්වාමීනි දැන් අපි ඉස්සරලාම කළා මිය ගිය පවුලේ කෙනෙක් ඉන්නවා නම් අපි මොනවද කරන්නේ කියලා. එදා තිබිච්ච අවශ්‍යතාවය තමයි ඔවුන්ට සමහර අයට මේ වළලා ගන්න යම් මුදලක් නැහැ, කර ගන්න දෙයක් නැහැ, කුලී ගෙවල්වල ඉඩ නැහැ. මේ අවස්ථාවේදී අපි Immediately අගරදගුරුතුමා එක ලක්ෂයක් දෙන්න තිරණය කළා මළ ගෙවල්වල වැඩ කටයුතු ටික කරන්න කියලා. ඒ වගේම එදිනෙදා ජීවත් වෙන්න මේ පළවෙනි සතියේදී සිදුවීම වෙලා ස්වාමීනි පළවෙනි සතියේදී කරපු දේවල් දාගත්තු Criteria ටික තමයි පළවෙනි කාල පරිච්ඡේදයේදී. අපේ තිබුණා ස්වාමීනි Immediate Relief, Mid term relief and Long term relief කියන එක. එතකොට Immediate Relief එකේදී අපේ Criteria තිබුණා ස්වාමීනි ඉල්ලන ඒ අවශ්‍යතාවය බලලා, අපි ඒගොල්ලන්ට යම්කිසි සහනයක් දෙන්න කටයුතු කරමු. මූල්‍යමය නම් මූල්‍යමය. ඒ වගේම පියතුමන්ලා හරහා හරි, කන්‍යා සොහොයුරියන් හරහා හරි Immediately දියයුතු දේවල් ටික කරන්න උන් වහන්සේ අවසර දුන්නා. අර Mid term කියන අවස්ථාවේදී අපි Criteria ටිකක් දා ගත්තා ස්වාමීනි ඒ ගෙදර අවශ්‍යතාවය. උදාහරණයක් විදියට ස්වාමීනි මුළු පවුලම මිය ගිය පවුල් කිහිපයක් ඉන්නවා. ඔවුන්ගේ ඥාතීන් ඉන්නවා. ඔවුන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා රාශියක් තියෙනවා දැන්. ඒ ඥාතීන්ගේ අවශ්‍යතා ඉෂ්ඨ කරන්න අපි ඉදිරිපත් වුණේ නැහැ. අපි කෙළින්ම කිව්වා Direct, Indirect. Direct Family එකට තමයි අපේ මේ සහන සේවාව අපි දියත් කරන්නේ සහ මූල්‍යමය ආධාරය දෙන්නේ. Indirectly මේ පවුල්වලට සම්බන්ධ වෙලා ඉන්න අයට අපි දෙන්න නැහැ කියන Criteria එක පාවිච්චි කළා ස්වාමීනි. අන්න ඒ වගේ Criteria ටිකක් හරහා තමයි අපි මේ මූලික සේවාව කරගෙන ගියේ.

ප්‍ර : එහෙම නැතුව දැන් පියතුමා මේකට, මෙම වැඩසටහනට ඔය වන්දිය ගණනය කිරීමේදී මට පොඩි උදාහරණයක් පියතුමාට කියන්නට පුළුවන්. දැන් අපි හිතුවොත් කිසියම් රැකියාවක නියුතු කෙනෙක් තමන්ගේ පවුලට උදව් කරමින් හිටියා, එයා මැරුණා. ඒත් එයා ජීවතුන් අතර සිටියා නම් සහ එයාගේ පවුලේ ඉන්න දරුවන්ගේ වයස්, එයාගෙන් යැපුණු දෙමව්පියන්ගේ වයස වැනි දේවල් ගැන සැළකිල්ලකට අරගෙන SF Income එවැනි දේවල් ගැන ගණනයක් කළාද?

පි : එහෙමයි ස්වාමීනි. අපි ඒ අනුව තමයි ස්වාමීනි ඒ පැත්ත Income Generation ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා ස්වාමීනි. ඒ

FAIR COMMENT BY JEZEEM

පැත්තෙදී යම්කිසි Criteria ටිකක් මට සමාවෙන්න ඒක පැහැදිලි කරන්නේ නැතුව ගියාට. ඒ පැත්තෙන් ස්වාමීනි ඒ දේවල් බලලා තමයි අපි මුල්‍යමය දායකත්වයක් දුන්නේ. මේ පවුලේ හය දෙනෙක් ඉන්නවා නම් අපි ඒ හය දෙනාට ගැළපෙන පළවෙනි මාස තුනේදී වියදම දුන්නා. ඒක Calculation එකක් තිබුණා ස්වාමීනි.

ප : එතකොට ඔබ වහන්සේට පුළුවන්ද මේ කොමිසමට හෝ නැතිනම් අපිට, කොමිසමට දෙන්න මොකද අපිත් එවැනි ක්‍රමවේද අනුගමනය කරන්න ඕන. අපිත් තර්කානුකූලව පිළිගන්නට පුළුවන් විදියට තමයි අපේ යෝජනා ඉදිරිපත් කරන්නේ. ඉතිං අපි කැමතියි පියතුමාගේ කණ්ඩායම එසේ ගණනය කිරීමේදී ඔය විවිධ නිර්නායකයන් පාවිච්චි කළා නම් ඒවා පිළිබඳව දැන ගන්නට.

පි : හරි ස්වාමීනි. මම ඒකට සූදානම් වෙලා ආවේ නැහැ. මට අවස්ථාවක් දුන්නා නම් ස්වාමීනි.

ප : දෙන්න පුළුවන්?

ප : මට ඒ Criteria, නිර්නායක ටික මේ ගෞරවනීය සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්.

****

ගරු සභාපතිතුමා :

ප : පියතුමනි ඒ නිර්නායකයන් අපිට ලිඛිතව විස්තරාත්මකව සැපයුවොත් ඒක දැනට ප්‍රමාණවත්. කොමිෂන් සභාවේ ලේකම්ට ලිඛිතව සපයන්න.

පි : එහෙමයි ස්වාමීනි. පොරොන්දු වෙනවා. ඒක එවන්නම්.

****

ගරු අදිකාරි මැතිණිය :

ප : ගරු පියතුමනි මරණයට පත් වූ අයෙකුට ඔබ ආයතනයෙන්, සෙත් සරණ ආයතනයෙන් ලබා දුන් මුදල, වන්දි මුදල ජීවිතයක් නැති වීම, Lost of life. ඒක හැමෝටම සමානව දෙන්න ඇති කියලා හිතනවා. එම මුදල කියන්න පුළුවන්ද ඔබතුමන්ට කීයක් දුන්නද?

පි : ලක්ෂය ගාණේ තමයි. ඒක අර වන්දියකට වඩා ස්වාමීනි නිර්නායකය වුණේ ඒ වැඩ ටික කර ගන්න කියන නිර්නායකය තමයි දුන්නේ. ඒ මිය ගිය හැම කෙනෙකුටම ලක්ෂය ගාණේ දුන්නා. එතකොට මිය ගිය සංඛ්‍යාව වැඩි කිරීම ලක්ෂය එතකොට ඒ මුදල එනවා ස්වාමීනි. ඊට අමතරව අපි කියමු මේ ඊයේ පෙරේදා මිය ගිය අයගේ ස්වාමීනි ඒ මිණියේ වැඩ කටයුතු ඒ කියන්නේ මේක අරගෙන යන්න ඕන Jaffnaවලට. එතකොට

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සල්ලි භේදයක් බැලුවේ නැහැ. ඒගොල්ලෝ අසරණයි. තමන්ගේ සහෝදරයා තමයි පිටරට ඉඳලා මේ දියණිය බලා ගන්න, අක්කව බලා ගන්න ආවේ. එතකොට අවුරුද්දක් තිස්සෙම ඇය හිටියේ රෝහලේ. එතකොට මෙහේ එයා නතර වෙලා හිටියේ. ඒකනිසා අපි ඒ මුල්‍යමය ආධාරය ඒ ආකාරයෙන් කරලා ඒ සියළුම මරණ ගෙදර වැඩ කටයුතුවලදී අනිවාර්යයෙන් ස්වාමීනි ලක්ෂයකට වඩා වියදම් වුණා. නමුත් අපි මුදල බැලුවේ නැහැ. මේ ටික කර ගැනීමේ අදහස තුළ තමයි ඒ වගේ Exception Cases කිහිපයකුත් තියෙනවා ස්වාමීනි.

ප : දැන් එයින් අදහස් වෙන්නේ ගරු පියතුමනි ජීවිතයක් අහිමි වීම වෙනුවෙන් ඔබතුමන්ලාගේ ආයතනයෙන් කිසියම් වන්දි මුදලක් ගෙව්වේ නැහැ?

පි : ස්වාමීනි ඒක වන්දි මුදලක් විදියට නෙමෙයි පිරි නැමුවේ කියන එක තමයි මූලිකව තියෙන්නේ අපිට. ඒක කර ගන්න බැරි වුණා.

ප : දැන් අර ආබාධිත තත්ත්වයට ගරු පියතුමනි පත්වෙලා ඉන්නවනේ. ඒ අයගෙත් තියෙන්න පුළුවන් පූර්ණ ආබාධිත වෙලා, එහෙම නැත්නම් Partial Disability අර්ධ වශයෙන් ආබාධිත වෙලා වගේ. ඒගොල්ලන්ටත් කිසියම් වන්දි මුදලක් ගෙව්වද පියතුමන්ලා?

පි : මේ වෙනකොට ස්වාමීනි ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ඨ කරමින් එය මා සඳහන් කරපු පරිදි Criticaly Injurd කියන අය, අසාධ්‍ය තත්තවයේ ඉන්න අයගේ අවශ්‍යතාවලට අපි කන්න නැති ඒ වගේ බැරිකමක් තියෙනවා නම් Income Generation එකක් නැත්නම් අපි මුල්‍යමය ආධාරය ලබා දෙනවා ස්වාමීනි මේ ඉන්න පවුල් තිස් නමයට ප්‍රමුඛතාවයක් ලබාදීලා. Income Generation එකකට අපි යොමු කරලා තියෙනවා එයාගේ Capacity එක බලලා ඒක එක්කෝ ශක්තිමත් කරන්න නැත්නම් ඒ පවුලට යම්කිසි Fix Deposit එකක් දාලා ආදායම් මාර්ගයක් එන විදියට. නමුත් ඒ තරමට අපිට අපේ Fund එකේ මුදල් නැහැ ස්වාමීනි. ලොකු Fix Deposit එකක් දාලා මාසයකට රුපියල් විසි දාහක් එන්නත් ලොකු මුදලක් දාන්න ඕන ස්වාමීනි. ඉතිං ඒක නිසා එවැනි හැකියාවක් අපිට නැති නිසා අපි රජයත් එක්ක එකතු වෙලා මේ දේ කරන්න අදහසක් තියෙනවා අර Criteria සහ නිර්නායක ඔබතුමිය ඉල්ලුවා වගේම අපි යෝජනා කරලා තියෙනවා රජයට මේ පවුල්වල Income Generation එක ඇති කරන්න යම්කිසි වැඩ සටහනක් අපිත් එක්ක එකතු වෙලා කරන්න කියන ඉල්ලීම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැනට පියතුමන්ලාගේ සෙත් සරණ ආයතනයෙන් මෙබඳු මෙම ත්‍රස්ත ප්‍රහාරයට භාජනය වූ පවුල්වලට වන්දි ලබා දීමේදීත් අර මා පෙර සඳහන් කරපු ආකාරයේ විශේෂ වූ නිර්නායක සැදීමක් කරලා නෙමෙයි ඔබතුමා කියන විදියට ඔවුන් දැනට පත් වී සිටින තත්ත්වය දිහා බලලා, ඔවුන්ට යම් යම් සහන ලබා දුන්නා?

පි : එහෙයි.

ප්‍ර : එහෙම කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ගරු පියතුමනි පවුලේ වැඩිහිටියන් සියළු දෙනාම මිය ගොස් සහ ඔවුන්ගේ රැකවරණය සඳහා කිසිම හව් හරණක් නොමැති දරුවන් කී දෙනෙක් සිටිනවාද සහ ඔවුන් දැනට කොහේද සිටින්නේ?

පි : ස්වාමීනි අවුරුදු 18 ට අඩු දරුවන් දෙදෙනෙක් ගැන විතරයි අපිට සඳහනක් තියෙන්නේ ස්වාමීනි. ඒ අය දෙදෙනාම ඉන්නේ ස්වාමීනි බස්නාහිර පළාතෙන් පිටත තමයි අපට සඳහන් වෙලා තියෙන්නේ ඒ දෙදෙනා ගැන. ඒ දෙදෙනා සිටින්නේ තමන්ගේ ඥාතීන් එක්ක කියන සඳහන තමයි තියෙන්නේ. අපි සොයා බැලීමක් කරනවා. ඒ වගේම Guardian කෙනෙක්ව ඔවුන්ට සොයා දෙන්නට නීතිමය උපදෙස් ඔවුන්ට ලබා දීලා තියෙනවා ස්වාමීනි. ඥාතීන් අතර ඉන්නේ. අවුරුදු 18 ට වඩා වැඩි දරු පිරිසක් ඉන්නවා. ඒ අයත් මේ වෙනකොට ඉන්නේ කටුවාපිටිය ප්‍රදේශයේ ඉන්නවා. ඒ අයත් ඉන්නේ තමන්ගේ එක්කෝ තමන්ගේ අම්මගේ දෙමව්පියෝ ළඟ. එහෙම නැත්නම් තාත්තාගේ දෙමව්පියෝ යටතේ ස්වාමීනි.

ප්‍ර : එසේ නොමැතිව ගරු පියතුමනි දැන් කුඩා දරුවන් එවැනි අය පල්ලිය භාරයේ Orphanage වල එහෙම ඉන්නවද?

පි : නැහැ ස්වාමීනි. කිසිවෙක් මේ සම්බන්ධයෙන් නැහැ.

ප්‍ර : පියතුමන් කරන ලද විශේෂ සුභසාධන වැඩසටහන් ගැන කථා කළා. මෙම අප්‍රේල් 21 ප්‍රහාරයේදී විදේශීය රටවල්වල ජාතීනුත් මෙම ප්‍රහාරයට හසුවීම නිසා මම ගරු පියතුමන්ගෙන් දැන ගන්නට කැමතියි ඔබතුමන්ලාගේ සෙත් සරණ ආයතනය විසින් එම විදේශිකයන් සඳහා කිසියම් හෝ සහන සේවාවන් ලබා දුන්නාද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : පියතුමන්ට අපට කියන්න පුළුවන්ද සියළුම දෙනා නැතුව ගිය පවුල් කීයක් තියෙනවද කියලා? අම්මා, තාත්තා, දරුවන්?

පි : අවසරයක් දුන්නොත් ස්වාමීනි මගේ Staff එකේ එක්කෙනෙක්ගෙන් අහන්න. කමක් නැද්ද ස්වාමීනි. ස්වාමීනි මගේ

FAIR COMMENT BY JEZEEM

Data base එකේ තොරතුරුත් තියෙනවා. මට මේ පත්‍රිකාව එක පාරට සොයා ගන්න, ස්වාමීනි කොච්චිකඩේ පවුල් තුනක් සිටිනවා මුළු පවුලම මිය ගිය. කටුවාපිටිය එක පවුලක් ඉන්නවා ස්වාමීනි මුළු පවුලම මිය ගිය.

ප : සියෝන් දේවස්ථානයේ තොරතුරු ගරු පියතුමනි ඔබතුමන්ලා ගාව නැතිද?

පි : නැහැ ස්වාමීනි. ඒක අපේ දේවස්ථානය යටතේ පත් වෙන්නේ නැහැ. ඒක පෞද්ගලික දේවස්ථානයක් විදියට තමයි යන්නේ. ඒක කතෝලික දේවස්ථානයක් නොවෙයි. ඒක අර බයිබල් සමාගම්වලට අයිති දේවස්ථානයක් විදියට යන්නේ. ඒක නිසා අපි මුල්‍යමය දායකත්වය ලබා දුන්නා ස්වාමීනි. එතනින් එහාට අපි තොරතුරු ඒකරාශී කර ගන්න ගියේ නැහැ. අපට හැකියාවක් නැහැ.

ප : මොකද්ද ඔය සියෝන් දේවස්ථානය වෙනුවෙන් ලබා දීපු මුල්‍යමය දායකත්වය?

පි : ස්වාමීනි මිලියන දහයක් ලබා දුන්නා අවස්ථා දෙකකදී. අපි ගිහිල්ලා එක පාරක් ඒ ජනතාවටම ලබා දුන්නා මේ සෙත් සරණ ආයතනය වගේම ස්වාමීනි මඩකලපුවේ තියෙනවා කතෝලික සභාවේ EHED කියන ආයතනය.

ප : මොකද්ද ඒ ආයතනයේ නම?

පි : EHED, Batticaloa. ඒක Short form එකෙන් යන්නේ ස්වාමීනි. ඒ ආයතනයට මිලියන පනහක් අපි යොමු කරලා, ඒ ආයතනය හරහා මේ වින්දිතයන්ට, මේ විපතට පත් වූ අයට ලබා දුන්නා ස්වාමීනි.

ප : මොකද්ද ඔබ වහන්සේට කියන්න පුළුවන්ද EHED කියන Short form එකෙන් කියන ආයතනයේ නම?

පි : Economic, එක පාරටම කියා ගන්න බැහැ ස්වාමීනි. ඒකේ Letter Head එකකුත් තියෙනවා.

ප : අකුරු ටික කියන්නකෝ ඉස්සරලාම ගරු පියතුමනි?

පි : EHED. අපි SEDEC කියනවා වගේ ස්වාමීනි Social Action Arm ආවම එහෙම කියනවා වගේ EHED කියන කතෝලික සභාවේ සමාජ සේවාව කරන ආයතනය තමයි Batticaloa වල ඒ ආයතනය හරහා තමයි ඒක කළේ. ඒකේ තොරතුරු සියල්ලම ස්වාමීනි අපි වාර්තා කළා ස්වාමීනි. දෙවෙනි එක අගරදගුරු හිමිපාණන් ගිහිල්ලා චෙක්පතක් හරහා ඒ දේවස්ථානයේ ප්‍රධාන දේවගැතිවරයා වන රොෂාන් දේවගැතිතුමාට ලබා දුන්නා ස්වාමීනි.

EAR COMMENT BY JEZEEM

ප්‍ර : මම ඔය ප්‍රශ්නය විශේෂයෙන්ම ඇහුවේ ගරු පියතුමනි, දැන් ඔබතුමන් දන්නවනේ රජය රුපියල් මිලියනයක වන්දියක් මිය ගිය අයෙකුට ගෙවීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අරගෙන තිබුණානේ?

පි : එහෙමයි.

ප්‍ර : අතිගරු මැල්කම් රංජිත් පියතුමාත් එම වන්දි මුදල ලබා දීම පිළිබඳව සතුටෙනුත් සිටින බවක් හැඟී ගියේ නැහැ. නිකම් ඕනම කෙනෙකුට දෙන විදියට තමයි මේක දුන්නේ කියලා. රජයේ වන්දි මැරුණ කෙනෙකුට එම ප්‍රමාණය තමයි දෙන්නේ, මේක විශේෂ දෙයක් කියලා. මම ඔබ වහන්සේගෙන් දැන ගන්නට කැමතියි පවුලේ සියළු දෙනාම මිය ගිය අවස්ථාවකදී අපි කාටද වන්දි ගෙවිය යුත්තේ. සියළුම දෙනා පවුලේ මැරුණා නම්? ඔබ වහන්සේගේ අදහස කුමක්ද ඒ පිළිබඳව කියලා අපට ප්‍රකාශ කරන්න පියතුමනි?

පි : ස්වාමීනි ඒ අවස්ථාවේදී සියළු දෙනා මැරිච්ච පවුල්වල ඔය කියපු ටිකට අපි කාටවක්වත් ගෙව්වේ නැහැ ස්වාමීනි. හැබැයි රජය ගෙව්වා ස්වාමීනි. ඒ ඉදිරිපත් වෙච්ච කෙනාට තමයි තියෙන්නේ. ඔය ප්‍රශ්නයම අපිට අපේ කොච්චිකඩේ පවුලක් ඉන්නවා, මුළු පවුලම නැති වුණා. ඒ තාත්තා ඉදිරිපත් වෙලා මේ වන්දි මුදල් ටික ගත්තා. එහෙන් ගත්ත විදියටම අපෙනුත් ඔය දෙන සහන ඉල්ලගෙන ආවා. අපි දුන්නේ නැහැ ස්වාමීනි. කොච්චිකඩේ ඒ පවුලට ඒ සහනය ලබා දුන්නේ නැහැ. හේතුව මේ තාත්තා ඉදිරිපත් වෙද්දී මේ උදාහරණය තාත්තාගේ ගෙදර නෙමෙයි ඉන්නේ මේ පවුල. මේ පවුල ඉන්නේ ඒ විවාහක භාර්යාවගේ ගෙදර තමයි මේ පවුල ඉන්නේ. එතකොට භාර්යාවගේ අම්මයි, තාත්තයි හරිම අසරණයි. දෙමටගොඩ. ඒ පවුලත් එක්ක තමයි මේ පවුල ඉඳලා මේ දේවස්ථානයට එන්නේ. එතකොට මේ පවුලේ අය ඔක්කොම මැරෙනවා. හිටියේ මෙතන. හැබැයි මේ පවුලේ ස්වාමි පුරුෂයාගේ දෙමව්පියෝ ඉන්නවා මට්ටක්කුලියේ. එතකොට එයා හරි කඩිසරයි. ඒගොල්ලෝ වයස්ගත නැහැ තරුණයි. එයා ඉදිරිපත් වෙලා මේ මිනී ටික මේගොල්ලෝ හින්දු, අරගොල්ලෝ කතෝලික. මේ මිනී ටික අරගෙන ගිහිල්ලා ඒ ඔක්කොම වැඩ කටයුතු ටික කතෝලික ආකාරයෙන් කරනවා ස්වාමීනි. හැබැයි එතකොට ඒ කරන එක දැකලා ග්‍රාම සේවකලා හරහා ඒ තුන් දෙනාට හිමි මිලියන තුනම, ලක්ෂ තිහම ඒ පියා ලබා ගත්තා ස්වාමීනි. හැබැයි මේ අසරණ පවුල දැනටත් අසරණ වෙලා ඉන්නවා. මේ පවුල යැපුණේ ඒ පවුලෙන් ස්වාමීනි. ඒගොල්ලොත් ඉන්නේ දෙමටගොඩ ස්වාමීනි. ඒගොල්ලෝ දමිළ.

FAIR COMMENT BY JEZEEM

ඒ වගේම හින්දු. ඉතිං ඒ අවස්ථාවේදී අපි විශේෂ සැළකිල්ලක් දක්වලා අපි යම්කිසි දායකත්වයක් ඒ පවුලට දුන්නා එක වතාවක් විතරක් ස්වාමීනි. නැතුව අපෙන් ලැබිච්ච දේවල් නැහැ ස්වාමීනි.

ප්‍ර : පියතුමනි ඔබ වහන්සේට කියන්නට පුළුවන්ද ස්වයං රැකියා වගේ දේවල් සහ එදිනෙදා සුළු වෘත්තීන්වල නියැළුණු අය, රජයේ හෝ පෞද්ගලික නොවන එවැනි වෘත්තීන්වල නියැලී සිටින අය ආබාධිත තත්ත්වයට පත් වුණා නම් ඔවුන්ට දැන් ඔබ වහන්සේ ප්‍රකාශ කළා කිසියම් සහනයක් ලබා දුන්නා කියලා. එම සහන මුදල ලබා දුන්නෙත් අර පියතුමන් මීට පෙර සඳහන් කරපු පරිදි එම අවස්ථාවේ සිටින තත්ත්වය දිහා බලලාද? එහෙම නැත්නම් ඔවුන්ට තවත් කාලයක රැකියාව කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වූ නිසා අපි මොකක් හරි ගණිතමය සූත්‍රයක් හෝ භාවිතා කර මොවුන්ට දීර්ඝකාලීනව සහන ලබා දීමේ වැඩ සටහනක් හැටියටද එම අය සම්බන්ධයෙන් කටයුතු කළේ?

පි : නැහැ ස්වාමීනි. අපි ඒකෙන් තොර ගත්තා Income Generation එකට අවශ්‍ය පිරිස තෝරාගෙන තමයි අපි ඒ ව්‍යාපෘතියට ප්‍රමුඛතාවය දුන්නේ ස්වාමීනි. පෙර කියපු විදියට ස්වාමීනි ඔබතුමිය කියපු විදියට තමයි අවශ්‍යතාවය බලලා තමයි මේ දේ ප්‍රමුඛවම අපි සිද්ධ කළේ. මොකද වැඩි මුදලකට යන්න නැහැ පවුල් 381 ක් රැක බලා ගන්න ඕන. මේ වෙනකොට තියෙන්නේ මිලියන 518 ක් තමයි ඔක්කොම හම්බ වෙලා තිබුණේ ස්වාමීනි. එහෙම බැලුවොතින් අපි එක සමානව දුන්නොතින් එහෙම අපිට ලක්ෂ පහළොවයි එක්කෙනෙකුට දීගන්න පුළුවන් වෙන්නේ ස්වාමීනි. අපි එහෙම Calculation එකක් කළේ නැහැ අවශ්‍යතාවය බැලුවා. නමුත් මේ වෙනකොට අපි හඳුනා ගත්ත File එක අපි දුන්නා Income Generation අවශ්‍යතාවය තියෙන අය හඳුනාගෙන ඒ අයට දැන් අපි ව්‍යාපෘතියක් විදියට Professional අයත් එක්ක එකතු වෙලා ඒගොල්ලන්ගේ Capacity එක බලලා ස්වාමීනි දැන් ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙමින් යනවා Stages තුනකට තියෙනවා. එකක් ආරම්භය, ඊට පස්සේ පවත්වාගෙන යාම, ඒ වගේම ශක්තිමත් කිරීම කියන කොටස් තුන හරහා ඒ මූල්‍යමය දායකත්වයට අපි අපේ Budget එකෙන් මූල්‍යමය මුදල් වෙන් කරගෙන තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ගරු පියතුමනි පවුලේ ආර්ථික බර කරට ගෙන සිටි අය මිය ගියා නම් එබඳු පවුල්වලට ජීවන වියදම් දීමනාවක් ගෙව්වාද?

පි : එහෙමයි ස්වාමීනි. පළවෙනි මාස කිහිපයේදී අපි ගෙව්වා ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉෂ්ඨ කරගෙන යන්න. ඒ යන විදියට අපේ අර අගරදගුරුතුමා අපිට පත් කරලා දුන්න කමිටුවෙන් තීරණයක්

FAIR COMMENT BY JEZEEM

ආවා, ඒ යන විදියට ගියෝතින් අපිට යන්න අමාරු වෙනවා මේ ලැබිලා තියෙන මූල්‍යමය තත්ත්වයත් එක්ක. නමුත් අපි ඒගොල්ලන්ට එක එක ක්‍රමවේද සොයලා දුන්නා. අපි දන්න, අපිව සොයා ගෙන ගොඩක් පිරිස් ආවා ස්වාමීනි අපිට මේ අරමුදලට සල්ලි දුන්නේ නැහැ. නමුත් ඒගොල්ලෝ සෘජුවම ඒ පවුල්වලට උදව් කරනවා කියලා. ඉතිං අපි අපේ තොරතුරු දත්තයන් ටික ඒ අයත් එක්ක බෙදා ගත්තා. අපි ඒ Red cross එකත් එක්ක ඒ දත්ත බෙදාගෙන ඒගොල්ලෝ කරන දේවල් කරන්න කියලා කිව්වා. ඒ වගේම සර්වෝදය එකත් එක්ක බෙදා ගත්තා. ඒ වගේම World vision එකත් එක්ක ඒ තොරතුරු බෙදාගෙන ඒ අයට කිව්වා පුළුවන් දෙයක් කරන්න කියලා. හැබැයි අපි කිව්වා දැනුවත් කරන්න කියලා කරන දේවල්. නමුත් අපි බලාපොරොත්තු වෙච්ච මට්ටමේ දැනුවත් කිරීමක් සිද්ධ වුණෙත් නැහැ ස්වාමීනි. නමුත් මේ අයගේ වගකීම සම්පූර්ණයෙන් අපිට ගන්න හැකියාවක් තිබුණේ නැහැ ස්වාමීනි.

ප : තවමත් ගරු පියතුමනි එම දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන ආයතන මෙම කණ්ඩායම සමඟ කටයුතු කරමින් ඉන්නවද? ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට හෝ ඔවුන්ගේ පවුලේ සිටින තවත් රැකියාවක් කළහැකි අයෙකුට ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම හෝ ඔහුට රැකියා සොයාදීම්?

පි : නැහැ ස්වාමීනි. පෙරත් ඒක දැනෙන තරම් මට්ටමක තිබුණේ නැහැ අපිව දැනුවත් කරපු විදියට. අපි මේ පවුල්වලින් තොරතුරු, මාර්ග දෙකයි ස්වාමීනි තියෙන්නේ ඕක දැන ගන්න. එක්කෝ කරන කට්ටිය අපිට කියන්න ඕන. එහෙම නැත්නම් මේ Affected Families වල ඉන්න අය අපිට කියන්නට ඕන. හැබැයි මේ දෙකම අපිට වාර්තා වෙලා නැහැ ස්වාමීනි. පුංචි පුංචි මුදල් දීමනා දීලා තියෙනවා. රුපියල් විසිදාහක් මේ පවුල්වලට දුන්නා අපිට පුළුවන් විදියට කරන්න කියලා. අන්න එහෙම වාර්තා වෙනවා මිසක් සම්පූර්ණ පවුලක් අරගෙන ඒගොල්ලන්ගේ වගකීම අපි අරගෙන යනවා කියන වාර්තාවක් අපිට කොහේවත් නැහැ ස්වාමීනි.

ප : දැන් ගරු පියතුමනි සමාජ සේවා අමාත්‍යාංශය වගේ ආයතනයක් පියතුමන්ලාගේ සෙත් සරණත් සමඟ සම්බන්ධ වුණේ නැද්ද? මෙම කණ්ඩායම සම්බන්ධයෙන් යම් යම් සුභසාධන කටයුතු කිරීමේදී රජයේ සම්පත්ධාරීන්?

පි : එහෙයි ස්වාමීනි.

ප : රජයේ මුදල් නෙමෙයි, රජයේ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවල මෙවැනි කටයුතු සම්බන්ධයෙන් විශේෂ දැනුම තියෙන අය. ඒ වගේ අය සම්බන්ධ වුණේ නැද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තමයි ස්වාමීනි ඒ අයව සම්බන්ධ කර ගන්න උත්සාහ කළේ. නමුත් ඒ අවශ්‍යතාවය තියෙන පවුල ඒ දෙන උපදේශය පිළිපදින්න තරම් මට්ටමක නැහැ. එක්කෝ තවම රෝගාතුර. ඒ වගේ තත්ත්වයක් තියෙනවා. නමුත් මේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඔය කාර්යයේදී දායකත්වය ආරම්භයේ සිටම දුන්නා ස්වාමීනි. ඒ අනුව තමයි ඒගොල්ලෝ ව්‍යාපෘතියක් නිර්මාණය කළේ. ඔය දැයට සවිය, ඒ සවි පහක් යටතේ ඒගොල්ලෝ ඒ දේවල් ඔක්කොම Analys කරලා, ඒ සහයෝගය දෙන්න කටයුතු කළා ස්වාමීනි. ඒකේ පළවෙනි පියවර විතරයි ක්‍රියාවට නංවන්නට පුළුවන් වුණේ. අන්න එතනදී රාජ්‍ය දායකත්වය මේ පවුල්වලට යම් ආකාරයකින් අවශ්‍ය අයට ලැබුණා ස්වාමීනි.

ප්‍ර : ගරු පියතුමා කියන ඔය ජනාවාස සංවර්ධන අධිකාරිය කියන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියද නැත්නම් ?

පි : නැහැ ස්වාමීනි. ඒක යටතේ තියෙනවා USDA කියලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒක නිවාස සහ ඉදිකිරීමේ අමාත්‍යාංශය යටතේ තියෙන්නේ නේද පියතුමනි?

පි : ඒක ස්වාමීනි ඒ කාලයේ තිබුණේ එකම ආයතනය යටතේ තමයි ස්වාමීනි. ඒකේ Letter Head එකකුත් තියෙනවා ස්වාමීනි. ඒක යන්නේ එහෙමයි. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය අනුබද්ධ විදියට තමයි යන්නේ ස්වාමීනි.

ප්‍ර : පියතුමන්ට හිතන්නේ ඔය ආයතනයද කටුවාපිටිය දේවස්ථානයේ සියෝන් ඇතුළු අනෙකුත් කොච්චිකඩේ දේවස්ථානය බෝම්බ ප්‍රහාරයෙන් විනාශ වුණහම අළුතින් නැවත ඉදිකර දීම සඳහා ඉදිරිපත් වුණේ?

පි : නැහැ ස්වාමීනි නැහැ. ඒක ස්වාමීනි ඒ ඉදිකිරීම් කටයුතුවලට State Engineering Cooperation එකයි, හමුදාවල් තමයි යෙදෙව්වේ ස්වාමීනි. කොච්චිකඩේ දේවස්ථානය Navy එකෙන්, නාවික හමුදාවෙන් සහ කටුවාපිටිය දේවස්ථානය යුධ හමුදාව හරහා තමයි Engineering Cooperation එක හරහා සිද්ධ වුණේ.

ප්‍ර : දැන් ගරු පියතුමනි මගේ අවසාන ප්‍රශ්නය දැන් ඔබ වහන්සේ මට හිතෙනවා මෙම වැඩසටහන ඉතාමත්ම පෞද්ගලික අංශයේ සහ මේ සඳහා පුණ්‍යාධාර ලබාදෙන එක් එක් මිනිසුන් විසින් ලබා දුන්න ආධාරවලින් රුපියල් මිලියන 518 ක ආධාරයක් යොදවමින්

Presidential Secretariat Copy
LEAK COMMENT BY JEZEEM

මෙම පුද්ගලයන් සඳහා විවිධ සහන වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙනවා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබතුමන්ගේ අධ්‍යයනය හෝ ඔබතුමන්ගේ අත්දැකීම අනුව මෙම සියළුම කණ්ඩායම්වලට තවදුරටත් කොයිතරම් කාලයක් මෙම සහන වැඩසටහන් ක්‍රියාත්මක කළයුතුව ඇතියි කියලා ඔබතුමා ළඟ කිසියම් තොරතුරු තිබෙනවාද? එහෙම නැත්නම් ඔබතුමාගේ අත්දැකීමෙන් යමක් මෙම කොමිසමට කියන්නට පුළුවන්ද?

පි : ඔව් ස්වාමීනි. අපි ප්‍රමුඛතාවය මේ වෙනකොට මේ වත්මනේදී දීලා තියෙන කොටස් තුනක් තියෙනවා ස්වාමීනි. පළවෙනි කොටස තමයි තවමත් රෝගාතුර වූ අයව ඒකෙන් මුදවා ගන්න යථා තත්ත්වය පත් කරන්න ප්‍රමාඛතාවය. දෙවෙනි ප්‍රමුඛතාවය තමයි ස්වාමීනි Income Generation එක. ඔවුන්ට යම්කිසි ආදායමක් නැතුව ඉන්න අයට ආදායම් උත්පාදනය කර ගන්න ක්‍රමයක් හදලා දෙන එක ස්වාමීනි. තුන්වෙනි දේ තමයි ස්වාමීනි ණයතුරුස් හා නිවාස වැඩසටහන ඔය කරුණු දෙකත් එක්ක මේ අයට දායකත්වය ලබාදෙන දෙක අපේ මට්ටමින් අනිත් ටික ප්‍රායෝගිකව කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ගරු පියතුමා ළඟ අදහසක් තියෙනවද ඔය කියන ලද කරුණු කාරණා තවදුරටත් කිසියම් කාලයක් දක්වා ගෙන යාමට මෙන්න මේ තරම් වූ මුල්‍ය දායකත්වයක් අවශ්‍ය වෙනවා කියලා. රජය විසින් මැදිහත් වීම මගින් අපිට මෙතරම් මුදල් ප්‍රමාණයක් තව අවශ්‍ය වෙනවා කියලා පියතුමන්ට කියන්නට පුළුවන්ද?

පි : අපිට එහෙම ගණනයක් කර ගන්න පුළුවන් ස්වාමීනි අපේ තියෙන දත්ත අනුව. උදාහරණයක් විදියට කිව්වෝතින් ස්වාමීනි දැන් තාත්තලා මැරිච්ච දරුවෝ ටික ඉන්නවා. එතකොට තාත්තලා නැහැ දැන්. එතකොට අම්මා තමයි මේ පවුල අරගෙන යන්නේ. ඉතිං එහෙම අයගේ ඉන්නේ ගොඩක් අය කාන්තාවෝ ගැහැණු ළමයි ඉන්නේ. එතකොට අපිට කියන්න පුළුවන් මාසයකට, දැන් මේ අම්මා වැඩට යන්න, අම්මට වැඩක් කර ගන්න දන්නේ නැහැ. එතකොට දැන් ජීවත් වෙන්නේ තාත්තා දුන්න One Million එක දාගෙන ඒ ටිකයි, අපි දෙන ටිකෙන් තමයි. අපි උත්සාහයක් කරනවා. අපි කියන්නේ Five Million හරි Ten Million හරි මෙන්න මේ පවුල්, මෙන්න මේ Criteria එකේ තාත්තා මැරිලා අවිවාහක දරුවෝ රැකියාවල් නොකර ඉන්න දරුවෝ ඔන්න ඔය Criteria එක දාලා මේගොල්ලෝන්ට මාසයකට රුපියල් විසි දාහක් අතට එන්න යම්කිසි මුදලක් දාන්න. ඒක රජය යටතේ හරි කියා ගන්න පුළුවන්. නමුත් මාසිකම ඒකෙන් එන Interest එක

FAIR COMMENT BY JEZEEM

මේ දරුවන්ට දෙන්න රැකියාවක් කරන තාක්කල්. ඔන්න ඔය වගේ වැඩපිළිවෙලක් අපිට හදලා දෙන්න පුළුවන් ස්වාමීනි ඒකේ අපේ තියෙන දත්ත පදනම් කරගෙන. අන්න එතනදී ඒගොල්ලන්ට ලොකු සහනයක් එනවා. ඒගොල්ලෝ දන්නවා මට රුපියල් විසි දාහක් මාසයකට දැන් අනිවාර්යයෙන් එනවා කියලා.

ප්‍ර : ඔබ වහන්සේ ඒ යෝජනා කරන එක ඒ ජනතාවට දැනුවත් කරන්නට එපා. අපි කිසියම් තර්කානුකූල පදනමක් මත තමයි අපේ යෝජනා රජයට ඉදිරිපත් කරන්නේ ගරු පියතුමනි. ඒක නිසා වේලාසනින් ජනතාවට මේ ගැන බලාපොරොත්තුවක් දෙන්නට එපා කියලා මම කාරුණිකව ඉල්ලනවා ඔබතුමාගෙන්. බොහොම ස්තුතියි.

පි : එහෙමයි ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයා විසින් යම් පැහැදිලි කර ගැනීමක් සඳහා අවසර ඉල්ලයි. අවසර ලබා දෙයි.

****

ජනාධිපති නීතීඥ ශාමිල් පෙරේරා මහතා :

ප්‍ර : ගරු පියතුමා කතෝලික සභාව විසින් මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වින්දිතයන්ට ලබා දුන්නේ පරිත්‍යාග මුදලක් කියලා කිව්වොත් හරිද?

පි : හරි ස්වාමීනි. පරිත්‍යාගයක් විදියට තමයි දුන්නේ. නැවත ලබා ගැනීමේ අදහසක් කොහෙත්ම නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් මෙම පාස්කු ප්‍රහාරයෙන් මේ අන්දමට අසරණ වූ වින්දිතයන්ට වන්දි මුදලක් ලැබීම සම්බන්ධයෙන් නීති කෘතයක් ආරම්භ කරගෙන යනවද?

පි : ඔව් ස්වාමීනි. අපි ජනතාවත් එක්ක සාකච්ඡා කරගෙන යනවා නීතිමය ආකාරයෙන් හැකියාවක් තියෙනවා නම් ඒගොල්ලන්ගේ කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා නිතිමය ආකාරයෙන් වන්දි මුදලක් ලබා ගැනීමට ක්‍රමවේදයක්. මේ වෙනකොට අපි සාකච්ඡා මට්ටමේ යනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබතුමා දන්නවා නේද ශ්‍රී ලංකා නීති සංගමය විසින් නොමිළේ මේ වන්දි මුදල් සම්බන්ධයෙන් යම් වැඩසටහනක් කටුවාපිටියේ පැවැත්වුවා?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පැවැත්වුවේ ජූනි මාසේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ගිය අවුරුද්දේ ජූනි මාසේ?

පි : එහෙමයි.

ප්‍ර : එම වැඩසටහනට ආවේ හරි සුළු දෙනයි?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒකට හේතුව මොකද්ද?

පි : ඒ අවස්ථාවේ ස්වාමීනි ඔවුන්ගේ මානසික මට්ටමක හිටියේ නැහැ නීතියට යන්න ඕන කියලා. අපිට නීතියක් නැහැයි කියන අදහසින් තමයි හිටියේ. තවත් අපිට ඔය ගැන මතක් කර කර ඔතනට එන්න බැහැයි කියන අදහස තමයි ස්වාමීනි ඒ අය කිව්වේ. ඒක නිසා නීති සංගමයෙන් අපිට යෝජනා කළා මේක අධිකරණය කරලා ඊටත් පෙර. අපි තමයි ඒක තවත් ප්‍රමාද කළේ ස්වාමීනි. ඒ ජනතාව ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න තරම් මානසික මට්ටමක සිටියේ නැති බව තමයි අපිට වැටහී ගියේ ඔවුන් එක්ක ගණුදෙනු කරද්දී.

ප්‍ර : දැන් වර්තමානයේ අතිගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් මේ අන්දමට වන්දි මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් නීති කෘත්‍යයක් ආරම්භ කරලා තිබෙනවද?

පි : දැනට තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ නීති කෘත්‍යය?

පි : මූලික වශයෙන් ඒ අදාළ පවුල් සමඟ නීතීඥවරුන් සම්බන්ධ කරගෙන, ඒ පවුල්වල තොරතුරු ටික එකතු කරගෙන නීතිය ඉදිරියට යන්න පුළුවන්ද කියන සාකච්ඡා මට්ටමේ පවතිනවා ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ගරු පියතුමනි ඔබතුමා කිව්වා කොච්චිකඩේ දේවස්ථානයේ පවුල් තුනකුත්, කටුවාපිටිය දේවස්ථානයේ එක් පවුලකුත් සම්පූර්ණයෙන්ම මිය ගියා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පවුල් හතරේ සම්පූර්ණ විස්තර අපට ලබා දෙන්න පුළුවන්ද?

පි : පුළුවන්. මේ මොහොතේ ස්වාමීනි මා සතුව නැහැ.

ප්‍ර : නැහැ. අපිට ලිඛිතව කොමිෂන් සභාවේ ලේකම්ට එවන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. එහෙමයි ස්වාමීනි.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ පියතුමන් මේ කොමිෂන් සභාවට ලබා දුන්න සාක්ෂිවලට අමතරව යමක් කියන්න තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. මට අවසර දෙන්න. විශේෂයෙන්ම ජනතාව එක්ක මම සමාව අයදිනවා ඉස්සරලාම බලාපොරොත්තු නොවිච්ච විදියට මම හැඟීම්බර වුණා. අර අතීතයේ දේවල් මතක් වෙද්දී. ඒක නිසා සමාව ප්‍රථමයෙන් ඉල්ලා සිටිනවා. ඒ එක්කම විශේෂ ප්‍රථමයෙන් ස්තුතිය කියන්න මා කැමතියි. ඊට පළවෙනි හේතුව තමයි ඔබතුමන්ලා කෙරෙහි මේ ජනතාව විශ්වාසයක් තබලා තියෙනවා. ඒ විශ්වාසය මේ ජනතාවට මෙතනට ඇවිල්ලා ප්‍රකාශ කරන්න බැරි නිසා ඒ ජනතාව නියෝජනය කරලා ඒක මා මේ ගෞරවනීය සභාව ඉදිරියේදී කොමසාරිස්තුමන්ලා ඉදිරියේ ප්‍රකාශ කරනවා. ඒ විශ්වාසය තියලා තියෙන්නේ වන්දියක් හොයනවට වඩා සාධාරණත්වය වෙනුවෙන් ස්වාමීනි. එමනිසා ඔබතුමන්ලා සැමටත් විශේෂයෙන්ම අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ මේ වෙනුවෙන් අපි කියපු විදියට Extra Mile එකක් ඔබතුමන්ලා යන බවට අපිට තේරෙනවා වැටහෙනවා. ඒක සාමාන්‍ය දෙයක් නොවෙයි. ඒක මේ ඉතිහාසය මම දන්නේ නැහැ අපේ අත්දැකීම් අනුව ඉගෙන ගන්නකොටවත් මේ වගේ දෙයක් මෙච්චර ගැඹුරින් වෙනවා කියන දෙයක් අපි අහලත් නැහැ ස්වාමීනි. මේ ඔබ කොමසාරිස්තුමන්ලා විදියට මේ කටයුතු, ඒක නිසා අපි කතෝලික සභාව වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙනවා නමස්කාර පූර්වකව ඔබතුමන්ලාගේ මේ සේවාව බොහෝ සේ අගය කරනවා. මෙවන් අවස්ථාවකදී ඒ විශ්වාසය ඔබතුමන්ලා කෙරෙහි තබා තිබීම සම්බන්ධව එක වගකීමක් ස්වාමීනි. ඉතිං ඒ නිසා ඒ වගකීම කරට අරගෙන වැඩ කිරීම සම්බන්ධයෙන් මාගේ ප්‍රණාමය මේ මොහොතේදී ප්‍රථමයෙන්ම පුද කරනවා. ඒ වගේමයි ස්වාමීනි මේ වෙනුවෙන් අපි දකිනවා මුදලට වඩා දේශයට අළුත් අත්දැකීමක් ඒ වගේම මේ තියෙන ප්‍රශ්නවලට පිළිතුරක් යම් ආකාරයකින් මේක Green Light එකක් වේවි ස්වාමීනි ඔබතුමන්ලා කරන මේ විද්වත් මණ්ඩලය හරහා කරන Recommendations නිර්නායකයන් අනාගතයේදී ගොඩක් ප්‍රශ්නවලට පිළිතුරු ඒවි කියන බලාපොරොත්තුව ආගමික නායකයෝ වශයෙන් අපි තුළත් මේ විපතට පත් වෙච්ච ජනතාවගේ අදහසකුත් තියෙනවා, ඔවුන් කියනවා අපේ ජීවිතයේ මේ තුවාල වෙච්ච දේවල් මැරිච්ච කෙනා මිය ගිහිල්ලා ඉවරයි පෙනෙන්න නැහැ. හැබැයි ඉතුරු වෙන පිරිසක් තියෙනවා ස්වාමීනි. ඒ අය කියන්නේ මේ ලකුණු මේ අපේ තියෙන සළකුණු කවදාහරි දවසක අපේ දේශයේ විමුක්තියේ සළකුණු වේවි කියලා. විමුක්තියේ සළකුණු වේවි. මේ තුවාල

FAIR COMMENT BY JEZEEM

අපිට තුවාලයක් නොවේවි. මේක ආදරණීය අත්දැකීමක් වේවි. අපේ දේශයේ මේ තියෙන අන්තවාදී අදහස් මත දරන අයට සියළුම. අපි දන්නේ නැහැ ස්වාමීනි මොන මොන ආගම්වල, කතෝලික සභාවෙත් අන්තවාදීන් ඉන්නවද කියලා අපට හමුවෙලා නැහැ ස්වාමීනි. ඒ සියළු දෙනාටම මේ කොමිෂන් සභාවෙන් දෙන නිර්දේශය අපි වේදනාව තුළ ජීවත් වෙන්නම්. හැබැයි අපිට ලස්සන අපේ දරුවන්ට ජීවත් වෙන්න ලස්සන දේශයකට ඔබතුමන්ලා සියළු දෙනා දෙන මේ Recommendations Green Light එහෙම නැත්නම් ආලෝකයේ දහරාව වේවා කියන එක බලාපොරොත්තුවක් මේ ජනතාව අතර තියෙනවා ස්වාමීනි. ඒ නිසා මා අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා මේ තමන්ගේ Extra Mile එක ගිහිල්ලා මේ දේ කරන්න ඉදිරිපත් වෙලා සිටින ඔබ සියළු දෙනා වෙනුවෙන්ම. ඒ වගේම නීතිපති දෙපාර්තමේන්තුවේ මෙතන සිටින, මෙතන නොසිටින, ඒ වගේම දිවා රැයක් නොබලා මේ ජාතික මෙහෙවරක් විදියට සළකලා ඔබතුමන්ලා කරන සේවාව මේ පවුල් 381 වෙනුවෙන් මා ඔබතුමන්ලාට ස්තුති පූර්වකව, නමස්කාර පූර්වකව ඒ ස්තූතිය පුදකර සිටින්නට කැමතියි ස්වාමීනි. ඒ වගේම අනෙකුත් පැමිණ සිටින, මේ සේවයේ යෙදී සිටින සියළු දෙනාටම මාගේ අවංක ආදර ස්තූතිය මා මේ මොහොතේදී පුද කරනවා ස්වාමීනි.

ප්‍ර : ස්තූතියි පියතුමනි. ඔබතුමා මේ කොමිෂන් සභාව ඉදිරියේ අද දැක්වූ වේදනාව කඳුළු, මෙම අනතුරෙන් ජීවිත අහිමි වූ පුද්ගලයින්ගේ පවුල්වල තුවාල ලැබූ තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්වල වේදනාව කඳුළු පසුගිය වසර එකකට ආසන්න කාලසීමාවක් තුළ අපි කරන මේ ක්‍රියාදාමයේදී අපිට හොඳින් වැටහුණා, අපිට හොඳින් දැණුනා. ඒ හේතුව නිසා තමයි අපි සියළු දෙනාම ඔබතුමන් කියපු විදියට දිවා රෑ නොබලා බොහෝවිට අපගේ පවුල්වල පුද්ගලික කරුණු පැත්තක තියලා මේ ක්‍රියාදාමයේ අපි නිරත වෙලා සිටින්නේ. ඒ සඳහා ඔබතුමන් කියපු විදියට නීතිපති දෙපාර්තමේන්තුවේ කණ්ඩායමේ දායකත්වය ඉහළින්ම ලැබිලා තියෙනවා. ඒ වගේම කියන්න ඕනේ මෙම කොමිසමට අනුයුක්ත කරලා තියෙන පොලිස් නිලධාරීන්ගේ දායකත්වයත් ඒ හා සමානව උපරිමයෙන්ම අපට ලැබිලා තියෙනවා. ඒ වගේම මෙම කොමිෂන් සභාවේ කටයුතු කරන අනෙක් සියළු නිලධාරීන්ගේ දායකත්වයත් ඒ හා සමානව ලැබෙනවා. ඒ සියළු දෙනා කරන ඒ දායකත්වයෙන් පිළිඹිබු වන්නේ ඔබ වහන්සේ කියපු හැටියට මේ සිද්ධියේ සත්‍ය මොකද්ද කියන එක හොයාගෙන ජනතාවට ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම අපේ ප්‍රධාන කාර්යයක් බව වටහා ගැනීමයි. අපට ලැබිලා තියෙන බලතල ප්‍රමාණය තුළ නීතියට

FAIR COMMENT — BY JEZEEM

අනුකූලව ඒ සියළු කටයුතු අපට හැකි උපරිම හැකියාවෙන් කිරීමට අපි හැමවිටම බැඳිලා ඉන්නවා කියන එක ඔබතුමන් හට දන්වනවා. ස්තූතියි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතුවලට දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් ගරු පියතුමන් හට කොමිෂන් සභාවේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. කොමිෂන් සභාවේ කටයුතු ප.ව. 4.30 තෙක් කල් දමනවා.

කොමිෂන් සභාව ප.ව. 4.30 ට නැවත රැස්වේ.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.06.29 **වෙලාව:- ප ව. 1.20**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි අංක 459 සාක්ෂියට කැඳවයි.</u>

සම්පූර්ණ නම : **චන්ද්‍රකීර්ති ධර්මගුප්ත ගජනායක .**

වයස : **අවුරුදු 69 යි ,**

ජාතිය : **සිංහල,**

ආගම : **බෞද්ධ,**

තනතුර : **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, රාජ්‍ය බුද්ධි සේවාව සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව**

<u>දැනට පදිංචි ස්ථානය</u>: 61/46/L අබේරත්න මාවත, බොරලැස්ගමුව.

<u>ප්‍රතිඥා දී කැඳවයි.</u>

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ඔබතුමා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් සේවය කළ බව කියා සිටියා ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වුණේ කොයි වකවානුවේද?

පි : 1971 මැයි 1 වෙනිදා ස්වාමිණි.

ප්‍ර : කුමන තනතුරක් යටතේ ද?

පි : උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් ස්වාමිණි.

ප්‍ර : ඔබ දැනට පොලිස් සේවයෙන් විශ්‍රාම ගොස් සිටින්නේද?

පි : එහෙමයි්

ප්‍ර : ඔබ කුමන වර්ෂයේ ද ශ්‍රී ලංකා පොලිසියෙන් විශ්‍රාම ලැබුවේ?

පි : 2011 අගෝස්තු මාසේ ස්වාමිණි.

ප්‍ර : ඒ ඔබ කියා සිටියා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : ඔබගේ මෙම කාලසීමාව තුළ ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ කුමන කුමන අංශවලට සම්බන්ධ වෙලාද කටයුතු කර තිබෙන්නේ?

පි : ස්වාමිණි වැඩිපුරම කාලයක් මගේ සේවාවෙන් මම සේවය කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ. එහි අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කළා. ඊට පස්සේ එහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් ද සේවය කළා. ඊට අමතරව මම රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා හැටියට සේවය කළා. මගේ වගකීම් තිබුණා ස්වාමිණි ජනාධිපති ආරක්ෂක අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් අගමැති ආරක්ෂක අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන්, ඇමති

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ආරක්ෂක අංශය, පොලිස් විශේෂ කාර්යාංශය, ත්‍රස්තවාදී විමර්ශන දිසාව, අපරාධ වාර්තා කොට්ඨාශය යන පොලිසියට අනුබද්ධ අංශ කිහිපයක් ම මගේ යටතේ අධීක්ෂණය වුණා ස්වාමිණි.

ප්‍ර : ඔබ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාවේ සිටි බව ප්‍රකාශ කර සිටියා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ අධ්‍යක්ෂකවරයා වශයෙන් රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වුණේ කුමන වකවානුවේ ද?

පි : 2003 වර්ෂයේදී ස්වාමිණි.

ප්‍ර : ඊට පෙර ඔබ රාජ්‍ය බුද්ධි සේවාව හා සම්බන්ධ වී රාජකාරී කර තිබුණද?

පි : එසේ ස්වාමිණි අවුරුදු 3 ක් පමණ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් මම එහි සේවය කළා.

ප්‍ර : 2003 අවුරුද්දේ ඔබ අධ්‍යක්ෂක ධුරයට පත් වුණාට පස්සේ රාජ්‍ය බුද්ධි සේවාවේ ඔබ එම තනතුරේ කොපමණ කාලයක් රාජකාරී කළාද?

පි : 2011 වර්ෂයේ විශ්‍රාම යන තෙක්ම එහි අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කළා ස්වාමිණි.

ප්‍ර : ආසන්න වශයෙන් වසර 8 ක් පමණ කියලා කිව්වොත් මං නිවැරදි ද?

පි : එසේය.

ප්‍ර : දැන් අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් ඔබ සෘජුවම වාර්තා කලයුතු නිලධාරීවරයෙකු හෝ නිලධාරීවරුන් සිටිනවද?

පි : මා වාර්තා කලේ සෘජුවම ආරක්ෂක ලේකම්වරයා වෙත ස්වාමිණි.

ප්‍ර : දැන් 2003 වර්ෂයේ සිට මේ 2011 වර්ෂය දක්වා කාල වකවානුව තුළ ඔබ අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් කටයුතු කිරීමේදී ලේකම් ආරක්ෂක වශයෙන් කටයුතු කරන්නට යෙදුනේ ත්‍රිවිධ හමුදාවට සම්බන්ධ නිලධාරීන්ද එසේ නැත්නම් පරිපාලන නිලධාරීන්ද? නැත්නම් ඒ දෙගොල්ලෝම යටතේ ඔබතුමා සේවය කළාද?

පි : ඒ දොගොල්ලෝම යටතේ මා සේවය කර තිබෙනවා ස්වාමිණි.

ප්‍ර : පරිපාලන නිලධාරීන් යටතේත් ඔබ සේවය කළ බව කියා සිටියා?

පි : එහෙමයි.

ප්‍ර : මේ අවස්ථාවේදි මතකයක් තිබෙනවද එම නිලධාරිවරයෙකු හෝ වරුන්ගේ නම්?

පි : මට මතකයි ජුනයිඩ් මහත්මයා, චන්දා නන්ද සිල්වා මැතිතුමා.

ප්‍ර : එසේම 2009 වසරේ දී LTTE ත්‍රස්තවාදය පරාජය කරන අවස්ථාවේත් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වශයෙන් සිටියේ ඔබ ?

පි : එහෙමයි ස්වාමිණි .

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සාක්ෂිකරු මේ අධ්‍යක්ෂක බුද්ධි කියන මේ ධුරය දරන පුද්ගලයාගේ යුතුකම ඒහෙම නැත්නම් වගකීම මොකක්ද කියලා ඔබට මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කිරීමේ හැකියාවක් තියෙනවද ?

පි : ඔව් ස්වාමිණි. අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව වශයෙන් මගේ මූලික වගකීම් වූයේ රාජ්‍ය ආරක්ෂාවට තුඩුදෙන කරුණු සම්බන්ධයෙන් ඊට ඇති තර්ජන සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු සොයා විශ්ලේෂණය කොට එය ඇස්තමේන්තු කොට එහි ප්‍රමාණය ආරක්ෂක ලේකම්වරයා වෙත වාර්තා කිරීමයි

ප්‍ර : ඔබ කියා සිටියා මේ විශ්ලේෂණය කිරීමක් සම්බන්ධව, පැහැදිලි කරන්න ඔබ මොකක්ද මේ විශ්ලේෂණය කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද කියලා?

පි : විශ්ලේෂණය යනුවෙන් අපි අදහස් කළේ ස්වාමිණි අපෙන් සාමාන්‍යයෙන් කෙරුණේ අපිට ලැබුණු තොරතුරු නිරවද්‍යතාවය සත්‍ය අසත්‍යතාවය පිළිබඳ අප සතුව තිබෙන ස්වාධීන තොරතුරු අප ලේඛණාගාරයේ තියෙන දත්ත සහ අපේ නිලධාරීන්ගේ තියෙන දැනුම යනාදි සියල්ල කටයුතු සාකච්ඡා මාර්ගයෙන් ඒ තොරතුර ඉහළට දැනුම්දීමට සුදුසු ද, නියම බුද්ධි තොරතුරක්ද යන වග තීරණය කරන්නේ ඒ විශ්ලේෂණයෙන් පසුවයි. ඒක හරියටම කියනවා නම් ස්වාමිණී පතලකින් හම්බ වෙන මැණික් ගලක් ඔපමට්ටම් කරලා ඉදිරිපත් කරනවා වගේ කාර්යයක්

ප්‍ර : ඒ කියන්නේ ඔබ වෙත යම් තොරතුරක් ලැබුණාම රාජ්‍ය බුද්ධි සේවාව වෙත ඒම තොරතුර ඔබ ලඟ තිබෙන දත්ත සහ ඔබගේ නිලධාරීවරුන්ගේ දැනුම, පළපුරුද්ද යන සියළු කාරණා යොදලා ඒක පරීක්ෂා කරලා බලලා ඉහළට යැවීමට සුදුසුද යන්න තීරණය කිරීමයි ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ මෙහිදී ඉහළට යැවීම යන්නෙන් කුමක්ද අදහස් කරන්නේ?

පි : එසේ අදහස් කරන්නේ ස්වාමිණි මගේ වාර්තා කරන නිලධාරියා වන ආරක්ෂක ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

ප්‍ර : දැන් ඔබ මේ තොරතුරු ඉදිරිපත් කළේ ආරක්ෂක ලේකම්වරයාට පමණද?

පි : බොහොම අවස්ථාවක ආරක්ෂක ලේකම්වරයාට පමණයි ස්වාමිණි. ඇතැම් අවස්ථාවල ඉතා කලාතුරකින් වගේ විශේෂයෙන් සාමය කඩවීම් වැනි දෑ ඉක්මණින් ක්‍රියාත්මක විය යුතු නිසා ඒවැනි අවස්ථාවලදි මා පොලිස්පතිවරයා සහ කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැනුම්දීමක් කරනවා. ඊට

FAIR COMMENT BY JEZEEM

හේතුව ස්වාමිණි ඇතැම් අවස්ථාවල ලේකම්වරයා වෙත යවන ලියුම් ප්‍රමාද වුවහොත් ක්‍රියාකාරී වශයෙන් ක්‍රියා කිරීමට පොලිසියට අවස්ථාවක් ලබාදීම තුලින්.

ප්‍ර : ඔබ ඊට අමතරව රාජ්‍ය නායක එහෙම නැත්නම් ජනාධිපතිවරයා වෙත මේවා සම්බන්ධයෙන් වාර්තා කිරීමක් සිදු කරන්නේ නැද්ද?

පි : මට අවකාශ තියෙනවා ස්වාමිණි සෘජුවම ඕනම අවස්ථාවක ඒ තියෙන තොරතුරේ වැදගත්කම, බැරෑරුම්කම අනුව මට අවස්ථාව සපයා දීලා තිබුණා සෘජුවම ආරක්ෂක ලේකම්වරයා ඕනම අවස්ථාවක හමුවීමටත්, අතිගරු ජනාධිපතිතුමා ඕනෑම අවස්ථාවක හමු වී ඒ තොරතුරු ඔවුන් වෙත ඉදිරිපත් කිරීමට. මට ඊට අමතරව විශේෂ දුරකථන පහසුකමකුත් මට ලබා දීලා තිබුණා ඔවුන් දෙදෙනාට අවශ්‍යතාව මත ඇමතීමට Hot line යනුවෙන් හඳුන්වන විශේෂ දුරකථන පහසුකම් මට ලබා දීලා තිබුණා.

ප්‍ර : ඔබට ඕනෑ වෙලාවක ජනාධිපතිතුමත්, ආරක්ෂක ලේකම්තුමත් දුරකථනයෙන් සම්බන්ධ කිරීමට සහ ඔවුන් මුණගැසීමට ඔබට අවස්ථාවක් ලබා දී තිබුණා අධ්‍යක්ෂක, රාජ්‍ය බුද්ධි සේවාව වශයෙන්?

පි : ඒසේය ස්වාමිණි

ප්‍ර : ඔබ පෙර පැහැදිලි කරන්නට යෙදුනේ මේ ගරු කොමිෂන් සභාවට අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයේ වගකීම?

පි : ඒහෙමයි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවක් පැවැත්මේ අවශ්‍යතාවය කුමක්ද? ඒහෙම නැත්නම් රාජ්‍ය බුද්ධි සේවාවක වගකීම කුමක්ද කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : රජයේ ඉහළම වගකීමක් තමයි ස්වාමිණි ජාතික ආරක්ෂාව සැපයීම. ජාතික ආරක්ෂාව සැපයීමට අදාල තුඩුදෙන තර්ජන සම්බන්ධයෙන් වාර්තා කිරීම එහි ඇති තර්ජනවල ස්වභාවය ලේකම්තුමා සහ ජනාධිපතිතුමා දැන ගන්නේ බොහෝ වෙලාවට අප මාර්ගයෙන්.

ප්‍ර : අප මාර්ගයෙන් කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාව?

පි : රාජ්‍ය බුද්ධි සේවාව මාර්ගයෙන්. අපේ වගකීම නිසි කලට, නිසි වෙලාවට අපි ලද තොරතුරු විශ්ලේෂණය කොට ඔවුන් වෙත වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කිරීම.

ප්‍ර : ඒ කියන්නේ රාජ්‍ය ආරක්ෂාවට බලපාන කරුණු බව ඔබ කියා සිටියා?

පි : ඒහෙමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කෙටියෙන්, ඉතාමත් කෙටියෙන් ඔබට කියන්න පුළුවන්ද මේ රාජ්‍ය ආරක්ෂාවට බලපානවා, ඒ කියන්නේ කුමක්ද ඒමගින් ඔබ අදහස් කරන්නේ?

පි : ස්වාමිණි රාජ්‍ය ආරක්ෂාව කියන වචනයට නිශ්චිත නිර්වචනයක් නැහැ, නමුත් අපි සාමාන්‍යයෙන් පොදුවේ පාවිච්චි කරන්නේ යම්කිසි රාජ්‍යයක මහජනතාවගේ යහපැවැත්ම සඳහා මහජනතාවගේ සුරක්ෂිත භාවය, එකී රජයේ භෞමික අඛණ්ඩතාවය ස්වෛරීත්වය යන දේවලට ඇති පහසුකම් සැපයීමේ හැකියාවයි. එය සංවිධානයක් මගින්, පුද්ගලයෙක් මගින්, කිසියම් රටක් මගින් විය හැකියි.

ප්‍ර : දැන් මෙහිදී මෙයට අන්තර්ගත වෙනවද ඒ රටේ ඉන්න මහජනතාවගේ සාමාන්‍ය පුරවැසියන්ගේ ආරක්ෂාවත්?

පි : අනිවාර්යයි ස්වාමිණි.

ප්‍ර : ඔබ සේවය කළ කාලය තුල ජාතික ආරක්ෂාවට ප්‍රධාන වශයෙන් තිබූ තර්ජනය කුමක්ද?

පි : මා සේවය කළ කාලය තුළ මා හට තිබූ විශේෂම හා වැදගත්ම කර්තව්‍ය වූයේ උතුරේ ත්‍රස්තවාදය වැළැක්වීමට, පාලනය කිරීමට අවශ්‍ය තොරතුරු ලේකම්වරයා වෙත දැනුම් දීමයි.

ප්‍ර : දැන් එම කාලයේදී යම් යම් පුද්ගලයින්ට වන තර්ජන ඒ කියන්නේ LTTE කියන ත්‍රස්තවාදී සංවිධානයේ යම් යම් රාජ්‍ය නායකයින්ට එහෙම නැත්නම් යම් යම් පුද්ගලයින්ට වන තර්ජනයන් සම්බන්ධයෙනුත් කරුණු අනාවරණය වීමක් සිදු වුණාද?

පි : එසේයි ස්වාමිණි අවස්ථා කිහිපයකදීම LTTE සංවිධානයට අවශ්‍යව තිබුණේ දකුණු පළාතේ දේශපාලන නායකත්වය විනාශ කර දකුණේ දේශපාලනය දුර්වල කිරීමයි. ඒ අනුව නායකයන් බොහෝ දෙනෙකුට තර්ජනය තිබුණා අපි ඒවා තර්ජනයේ ප්‍රමාණය ඇස්තමේන්තු කොට අපි හැම අවස්ථාවකම ආරක්ෂක ලේකම්තුමා මාර්ගයෙන් ඒ ඒ අදාල ප්‍රභූවරුන්ට, පුද්ගලයින්ට දැනුම් දුන්නා. ඊට අමතරව ලේකම්තුමාගේ අවසරය පරිදි මම පුද්ගලිකව ගිහිල්ලා ඇමතිවරු, ප්‍රභූවරු කිහිප දෙනෙකුටම පුද්ගලිකවම ඔවුන්ට ඇති තර්ජනය පිළිබඳ පැහැදිලි කිරීම් කරලා තියෙනවා.

ප්‍ර : කවුද ඒ පුද්ගලයින්?

පි : ගරු කදිරගාමන් මැතිතුමා.

ප්‍ර : විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමන් මැතිතුමා ?

පි : එතුමාට විශාල වශයෙන් තර්ජන තිබුණා. මගේ වාර්තා මත එතුමාට මගේ මතකයේ හැටියට විශේෂ කමාන්ඩෝ භටයින් පවා

FAIR COMMENT BY JEZEEM

100 කට ආසන්න සංඛ්‍යාවක් යොදවලා තිබුණා. ඊට පස්සේ ස්වාමිණි ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමාට තර්ජන තිබුණා. මම එතුමාට පුද්ගලිකව කතා කරලා තියෙනවා. එතුමා මීගමුව ප්‍රදේශයේ පොලිස් අධිකාරීවරයාගේ මාර්ගයෙන් මම දැනුම් දුන්නා ඇති තර්ජන. ගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට තර්ජන තිබුණා. පුද්ගලයෝ හම්බ වෙලා ඔහුගේ නිළ නිවාසයේදී ඔහුගේ තර්ජනය පිළිබඳ මම ඔවුන් දැනුවත් කළා. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට තර්ජන තිබුණා. ඒ බව මම එතුමට පාර්ලිමේන්තුවට ගිහිල්ලා දැනුම් දුන්නා කණ්ඩායමක් අපිට අත්අඩංගුවට ගන්න පුළුවන්කම ලැබුණා. ඊට අමතරව ආරක්ෂක මණ්ඩලයේ සියළු නිලධාරීන්ට තිබුණු තර්ජන මා සහභාගී වූ හැම රැස්වීමකදිම ඔවුන් වෙත නිරන්තරයෙන් මතක් කළා. ඩග්ලස් දේවානන්ද මැතිතුමාටත් තිබුණු තර්ජන නිතර මම ඔහුට මතක් කළා ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබගේ සේවා කාලය තුළ ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු හෝ බුද්ධි තොරතුරු අනාවරණය වෙලා තිබුණාද නැද්ද?

පි : මා ආයතනය භාර ගන්න අවදියේ ස්වාමිණි මුස්ලිම් කටයුතු ගැන සොයා බැලීම සඳහා වෙනම අංශයක් අපි Desk එකක් කියනවා ස්වාමිණි, ඒ Desk එකක් ආරම්භ කරලා තිබුණා.

ප්‍ර : සමාවන්න ඒ මොන අවුරුද්දේ ද?

පි : මම භාර ගත්තේ 2003 දී. 2002 දී විතර ආරම්භ කරලා තිබුණා ස්වාමිණි. මුස්ලිම් Desk එකක්. ඒ කියන්නේ මුස්ලිම් කටයුතු පිළිබඳ අධික්ෂණය කරනවා නෙමෙයි නියාමනය කිරීම සඳහා විශේෂ අංශයක් තිබුණා.

ප්‍ර : ඒ කියන්නේ ඉස්ලාම් ආගම සම්බන්ධවද එහෙම නැත්නම්?

පි : අන්තවාදී විදියට ආගම ප්‍රචාරය කරන කටයුතු වලදී අන්තවාදී ලෙස අප වෙත වාර්තා වෙන කරුණු සම්බන්ධයෙන් නියාමනය කිරීම.

ප්‍ර : තමයි මේ Desk එක පිහිටවලා තිබ්බේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම Desk එක ආරම්භ කරලා තිබ්බේ ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන්ද නැත්නම් සියළු ආගම් අන්තවාදි...

පි : සියළු ආගම් හා දේශපාලන කටයුතු යනාදිය සම්බන්ධයෙන් අවධානයෙන් අවබෝධයෙන් සිටීමට විශේෂ අංශයක් තිබුණා. ඒකෙන් මේක වෙන් කරලා වෙනම අංශයක් පවත්වන්නට යෙදුනා අර අන්තවාදී මත ඉස්මතු වූ නිසා.

FAIR COMMENT BY JEZEEM

ප : ඒ කියන්නේ මාගේ ප්‍රශ්නය වන්නේ ගජනායක මහත්මයා මෙම Desk එක පිහිටුවලා තිබ්බේ ඉස්ලාම් ආගම සම්බන්ධයෙන් පමණක් ද නැත්නම් අනෙකුත් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ අනෙකුත් ආගම් ?

පි : නැහැ මේ Desk එක විශේෂයෙන්ම මුස්ලිම් අන්තවාදය පිළිබඳ අපි Q Desk එක වශයෙන් හඳුන්වනවා. එය ස්ථාපිත කලේ අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන්, මුස්ලිම් අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් නියාමනය කිරීමක් සඳහා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : සාක්ෂිකරු පැහැදිලි කිරීමක් සඳහා මෙය අසන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඔබ කලින් ප්‍රකාශ කෙරුවා ආගමික අන්තවාදය සහ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් වෙනම Desk එකක් තිබ්බා කියලා?

පි : තිබුණා එහෙමයි ස්වාමිණි.

ප : එතකොට ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් සොයන්න තිබ්බ Desk එකක් ඇරියේ අර ප්‍රධාන Desk එකට අතුරු Sub Division එකක් හැටියටද ?

පි : එහෙමයි ස්වාමිණි. සමාවෙන්න ස්වාමිණි යටතේ නෙමෙයි ඒක වෙනමම.

ප : දැන් පැහැදිලි කරන්න ආයිත් කියන්න ඉස්සෙල්ලා කියන්න ගිය එක?

පි : කලින් තිබුනේ 2002 ට කලින් මම කලින් ප්‍රකාශ කළ විදියට ආගමික අංශවලින් වන අන්තවාදී ක්‍රියා සහ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව නියාමනය කිරීම සඳහා අංශයක් තිබුණා. ඒක විස්තර කරනවා නම් මට M කියලා කියන්න පුළුවන්. ඒ M වශයෙන් එහෙම තිබියදි ස්වාමිණි අර අන්තවාදී කටයුතු ඉස්මතුවීම් නිසා වෙනම ඒවා කටයුතු නියාමනය කිරීමට Q යනුවෙන් තව අංශයක් ස්ථාපිත කළා. මම යනකොටත් ඒක කරලා තිබ්බේ ස්වාමිණි.

****

(මේ අවස්ථාවේදි ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ මහතා මාධ්‍යය පැමිණ සිටීම සම්බන්ධයෙන් ඉංග්‍රීසියෙන් සාක්ෂිකරුට කරුණු පැහැදිලි කර දෙයි)

FAIR COMMENT BY JEZEEM

(ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා විසින්ද ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුට ඉංග්‍රීසියෙන් කරුණු පැහැදිලි කර දෙයි)

(ඒ සම්බන්ධයෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය විසින්ද සාක්ෂිකරුට ඉංග්‍රීසියෙන් කරුණු පැහැදිලි කර දෙයි)

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප : ඔබ ප්‍රකාශ කර සිටියා කිසියම් තොරතුරක් ලැබුණම එය විශ්ලේෂණය කර ඉහළ අංශයන් වෙත ඉදිරිපත් කිරීමේ වගකීම තමයි ප්‍රධාන වශයෙන් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි වශයෙන් පැවරී තිබුණේ කියලා?

පි : ඒහෙමයි ස්වාමිණි.

(මේ අවස්ථාවේදී C4B ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා උතුමාණෙනි)

(පරීක්ෂා කර බලයි)

ප : මෙම තොරතුර බුද්ධි තොරතුරක් ද නැද්ද කියලා මේ අවස්ථාවේදි ප්‍රකාශ කරන්න පුළුවන්ද ?

පි : ස්වාමිණි මේ ලිපිය මම පරීක්ෂා කළා. බැලු බැල්මටම මෙය බුද්ධි තොරතුරක් කියා කියන්න බැහැ, හේතුව මෙහි Author කෙනෙක් නැහැ. අපිට කොහෙන් ආපු ලියුමක් ද කියලා කොහෙන් ආපු තොරතුරක්ද කියලා අපිට මෙතනින් කියවෙන්නේ නැහැ. අපිට විශ්ලේෂණය කිරීම සදහා තොරතුරුකරුවන්ගේ විශ්වාසනීයත්ව අවශ්‍යයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> :

ප : උපකල්පනය කෙරුවොත් C4B එවන පුද්ගලයා ඔය C4B ලේඛනය ලැබෙන පුද්ගලයා දන්නවා කියලා, තේරුණාද මගේ ප්‍රශ්නේ, දැන් උපකල්පනය කරන්න C4B හි අත්සනක් තිබුණේ නැති වුණාට ඒක යන්නේ දැන් ඒක ලැබෙන පුද්ගලයා දන්නවා C4B කාගෙන්ද එන්නේ කියන එක.

පි : මට දැන ගන්න පුළුවන්ද ස්වාමිණි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ කියන්නේ C4B එවපු පුද්ගලයා දන්නේ නැති හින්දා මුකුත් කියන්න බැහැ කියලානේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් උපකල්පනය කරන්න C4B ඔබට ලැබෙනවා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ දන්නවා C4B එවන්නේ කවුද කියන එක?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබගේ මොකක්ද assessment එක මොකක්ද?

පි : ස්වාමිණි අපේ කණ්ඩායම්, මගේ ඉන්නවා සහකාර අධ්‍යක්ෂකවරු මේ විෂය භාර, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු ඉන්නවා. මෙවැනි තොරතුරක් ලැබුණාම මේ විෂයට අදාල Desk Officers ලා ඒ කියන්නේ කාර්යාංශය භාර නිලධාරීන් සහකාර අධ්‍යක්ෂකවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු සහ අපේ ලේඛණ, අපේ ලේඛනාගාරයේ ඇති දත්ත තොරතුරුත් අපි ගෙනල්ලා පරීක්ෂා කරලා බලනවා මේ කියන අය ඇත්ත වශයෙන්ම අපේ දෝශ දර්ශනයට ලක් වෙච්ච අය ඉන්නවද කියලා. එහෙම කරලා යම්කිසි ස්ථාවරයකට එන්න පුළුවන් ස්වාමිණි ඒ විශ්ලේෂණයකින් පසුව මේක බුද්ධි තොරතුරක් ද කියලා.

ප්‍ර : ඔබට C4B පෙන්නුවාම ඔබ ඉස්සෙල්ලාම කිව්වා ඕක බුද්ධි තොරතුරක්ද කියන්න බැහැ ඕක එවන තැනැත්තා දන්නේ නැති හින්දා කියලා?

පි : තැනැත්තා සහ අපිට පොඩ්ඩක් හරි පසුබිම දැන ගන්න අවශ්‍යයි ඒක තමයි මම කිව්වේ ස්වාමිණි මේ ලේඛනවල තියෙන තොරතුරු අපි බලන්න ඕනේ මේ නම් කිහිපයක් තියෙනවා ඒ අය අපේ ලේඛනවල ඉන්නවද, ඔවුන්ගේ පසුබිම මොකක්ද කියලා අපිට විශ්ලේෂණය කිරීමක් අවශ්‍යයි. බැලූ බැල්මට කියන්න අමාරුයි ස්වාමිණි.

ප්‍ර : නැහැ ඔබ උපකල්පනය කරන්න ඔය තියෙන නම් ඉන්න පුද්ගලයින්ගේ පසුබිම දන්නවා කියලා ?

පි : ඔව් ස්වාමිණි, එහෙම අපේ වාර්තාවල තියෙනවා නම් යම්කිසි පසුබිමක් තියෙනවා නම් අපිට කියන්න පුළුවන් මේකේ යම්කිසි බුද්ධිමය තත්ත්වයක් බුද්ධිමය තොරතුරක් බවට අපිට පිළිගන්න පුළුවන් ස්වාමිණි.

ප්‍ර : නැහැ ඔබ දැන් ප්‍රශ්නෙට උත්තරය දෙන්නේ ඔය ලේඛනය රාජ්‍ය බුද්ධි අංශයට ලැබුණ ලේඛනයක් කියලා හිතාගෙන නේ ?

පි : එහෙමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අපි උපකල්පනය කරමු ඔය ලේඛනය C4B කියන ලේඛනය හැදුවේ රාජ්‍ය බුද්ධි සේවා අංශයෙන් කියලා, එතකොට ඔය C4B එකේ තියෙන්නේ තොරතුරක්ද බුද්ධි තොරතුරක් ද?

පි : මම කලින් කිව්ව විදියට ස්වාමිණි මේ අය අපේ වාර්තාවලට ඇවිල්ලා තියෙනවා නම් මේ කට්ටිය යම්කිසි සත්‍යයක් මේකේ තියෙනවා කියලා අපිට ඒත්තු ගියොත් අපිට ඒක සලකන්න පුළුවන් බුද්ධි තොරතුරක් හැටියට.

ප්‍ර : නැහැ මිස්ටර් ගජනායක දැන් ඔය C4B ලේඛනය තියෙනවා නේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ හිතන්න C4B ලේඛනය හදන්නේ රාජ්‍ය බුද්ධි සේවය විසින් කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ බලන්නේ රාජ්‍ය බුද්ධි සේවය හදපු ලේඛනයක්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය ලේඛනයේ තියෙන්නේ තොරතුරක් ද බුද්ධි තොරතුරක්ද?

පි : මේ ලේඛනය අපේ ආයතනයෙන් ආවා නම් අනිවාර්යයෙන් ම බුද්ධි තොරතුරක් විය යුතුයි ස්වාමිණි. මෙහෙම ලේඛනයක් ඉදිරිපත් වෙනවා නම් ඒ කට්ටිය ඒ වගකීම ගන්නට ඕනේ විශ්ලේෂණයකින් පස්සේ තමයි ඒ තොරතුර එවන්නට ඕනේ. මේ අය අපේ වාර්තා වල ඉන්න කෙනෙක් නම් තමයි ඕනේ මෙහෙම එකක් එවන්න.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර : ඔබගේ අවධානයට මා තවදුරටත් ඉදිරිපත් කරනවා C4C දරන ලේඛනය.

මෙම C4C දරන ලේඛනයේ කතෘවරයා වන්නේ අධ්‍යක්ෂක, රාජ්‍ය බුද්ධි සේවාව කියලා මා ඔබට තවදුරටත් ප්‍රකාශ කර සිටිනවා?

(සාක්ෂිකරු විසින් C4C ලේඛනය පරීක්ෂා කර බලයි)

පි : මෙය අනිවාර්යයෙන්ම බුද්ධි තොරතුරක් ස්වාමිණි. මෙය යම්කිසි විශ්ලේෂණයකට ලක් කරලා පරීක්ෂා කරලා ඒ මත සකස් කරපු බුද්ධි තොරතුරක් C4C.

ප්‍ර : ඔබට මේ C4C සහ C4B තව පරීක්ෂා කරලා බලලා ඔබට මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්ද C4C කියන ලේඛනය පිළියෙල කර

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තිබෙන්නේ මේ C4B කියන ලේඛනය පදනම් කරගෙනද නැද්ද කියලා?

පි : පොඩ්ඩක් පැහැදිලි මදි..

ප්‍ර : මෙම C4C කියන ලේඛනය බුද්ධි අධ්‍යක්ෂක විසින් පිළියෙල කර තිබෙන්නේ C4B කියන ලේඛනය පදනම් කරගෙන ද නැද්ද කියලා ඔබතුමාට මතයක් Opinion එකක් ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි : මට එසේ කිරීම අමාරුයි ස්වාමිණි. මොකද මෙහි C4C Whaහි විස්තරාත්මකව සඳහන් කරනවා විදේශීය බුද්ධි අංශයක් මගින් තොරතුරු වාර්තා කර ඇත යනුවෙන්. එය යම්කිසි වගකීමක් භාරගෙන තියෙනවා නවත් අපේ සමහර විට මිත්‍ර රටක බුද්ධි අංශයක් විය යුතුයි. එහෙම නම් අපිට යම්කිසි විශ්වාසණියත්වයක් ඒ කෙරෙහි තබන්නට පුළුවන්.

ප්‍ර : What I ask you was, whether C4C is prepared from the information received from the C4B?

පි : ඒක මට කියන්න බැහැ.

ප්‍ර : ඔබගේ අවධානයට මා ඉදිරිපත් කරනවා C4A කියන ලේඛනය. මෙම ලේඛනයේ eyes only යන වචන කණ්ඩය සඳහන් වෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ වගේම Top secret කියන වචන කණ්ඩයත් සඳහන් වෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : Top secret කියන වචන කණ්ඩයෙන් අදහස් කරන්නේ කුමක්ද කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ?

පි : මේ වචන දෙකම ස්වාමිණි බුද්ධි අංශ ක්ෂේත්‍රයේ පාවිච්චි කරන වචන දෙකක්. ඉහත සඳහන් Top secret සහ eyes only, ඇත්තෙන්ම ස්වාමිණි එය your eyes only විය යුතුයි ස්වාමිණි. මේ වචන දෙක භාවිතා කරනු ලබන්නේ විශේෂයෙන්ම බුද්ධි අංශ වලින්. Top secret යනුවෙන් අදහස් කරන්නේ එහි අන්තර්ගතය අතිශය රහසිගතවූත්, සංවේදීවූත් තොරතුරක් සහ එය ඉදිරිපත් කරපු පුද්ගලයාගේ අනන්‍යතාවය ආරක්ෂා කලයුතු නිසාත් ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගැනීමේ අවශ්‍යතාවය නිසාත් Top secret යනුවෙන් මුද්‍රා තැබීම හෝ සටහනක් යෙදීම සාමාන්‍යයෙන් බුද්ධි අංශ මගින් සිදු කරනු ලබනවා. your eyes only යනුවෙන් සඳහන් කරනු ලබන්නේ කිසියම් විශේෂිත පුද්ගලයෙකුට පමණක් දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලබන කිසියම් සංවේදී තොරතුරක් මත. එවැනි තොරතුරක් ස්වාමිණි ඒ පුද්ගලයා විසින් කිසිවිටෙකත් පිටපත් ලබා නොගත යුතුයි. එය හුදෙක්ම එකී

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පුද්ගලයාගේ දැන ගැනීම සඳහා හෝ කිසියම් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා භාවිතා කලයුතු එකක් විය යුතුයි .

ප්‍ර : දැන් eyes only හරි Top secret හරි මෙම වචන කණ්ඩය සහිත ලිපියක් ලබන්නාවූ පුද්ගලයා විසින් ඒ තොරතුර ග්‍රහණය කර ගත්තාට පසු ඒ තොරතුර සපයන මේ eyes only වචන පෙළ සඳහන් ලේඛනය, ඒ ලේඛනයට කුමක්ද සිදු කරන්නේ?

පි : එය අනිවාර්යයෙන්ම එය නිශ්චිත පුද්ගලයා විසින් විනාශ කලයුතුයි.

ප්‍ර : ඒ ලැබෙන පුද්ගලයා විසින් විනාශ කළයුතුයි අනිවාර්යයෙන්ම?

පි : අනිවාර්යයෙන්ම. ඒවැනි your eyes only කියන වාක්‍ය සාමාන්‍යයෙන් ස්වාමිණි යවනු ලබන්නේ මම විසින් යවනු ලැබුවේ මගේ අවුරුදු 8 ක කාලය තුල අතිගරු ජනාධිපතිතුමාට හෝ ලේකම්තුමාට පමණයි. ආරක්ෂක ලේකම්ට හා ජනාධිපතිතුමාට පමණයි ස්වාමිණි. කිසිවිටෙක ඉන් පහළ තනතුරක කෙනෙකුට your eyes only කියන ලිපියක් සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ කිව්වානේ eyes only කියන ලේඛනයක් ලැබෙන තැනැත්තා එය විනාශ කළයුතුයි කියලා?

පි : ඒසේයි.

ප්‍ර : දැන් ඒම ලේඛනයේ තියෙන කරුණු මත තවත් යම් ක්‍රියාමාර්ග ගතයුතුව තිබෙනවා නම් ඒතකොට ඒවැනි අවස්ථාවකත් ඔය eyes only කියන ලේඛනය විනාශ කලයුතුද?

පි : සාමාන්‍ය පිළිගැනීම ස්වාමිනි මේ බුද්ධි ක්ෂේත්‍රයේ එය විනාශ කලයුතුයි. නමුත් එය ලැබෙන තැනැත්තා උපුටා අරගෙන ඔහුට ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ ලේඛනය විනාශ කරන්න ඕනේ. නමුත් එයාට උපුටා ගෙන ක්‍රියාදාමයකට යන්න පුළුවන්. එයාට විශේෂයෙන් ජනාධිපතිතුමාට නම් කැබිනට් පත්‍රයක් හරි මොකක් හරි වෙන දාන්න පුළුවන් ක්‍රියාකාරයක් ගන්න පුළුවන් ස්වාමිණි. නමුත් ඒ ලේඛනය අතිශ්‍යයින්ම රහසිගතයි කොහෙන්ද ආවේ අරවා මේවා කියන ඒක කාටවත් කිසි කෙනෙකුට දැන ගන්න අවශ්‍යතාවයක් නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ කියන්නේ ඒ ලේඛනයේ අන්තර්ගත කොටස් ඒ ලැබුණු තැනැත්තාට අරගෙන ඒ සම්බන්ධයෙන් වෙන ලියුමක දාලා යවන්න පුළුවන්?

FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන්, ඒක තමයි බලාපොරොත්තු වෙන්නේ ස්වාමිණි.

ප්‍ර : අර ලියුම විනාශ කරන්න ඕනේ?

පි : ඒසේමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර : C4A කියන ලේඛනය ආමන්ත්‍රණය කර තිබෙනවා පොලිස්පතිවරයා වෙත?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ජාතික බුද්ධි ප්‍රධානී විසින් ආරක්ෂක ලේකම් වෙනුවෙන් පොලිස්පති වෙත යොමු කරන ලද තොරතුරක් කිව්වොත් හරිද?

පි : හරි ස්වාමිණි.

ප්‍ර : මෙම C4A කියන ලේඛනයේ ඊට පහතින් පෑනකින් FNA කියලා තීන්ත පෑනෙන් ලියලා තිබෙනවා?

පි : එසේමයි.

ප්‍ර : මා ප්‍රථමයෙන් ඔබගෙන් අහන්නේ මේ C4A කියන ලේඛනයේ තින්ත පෑනකින් FNA යන වාක්‍ය කණ්ඩය ඇතුලත් කිරීම එය ඇතුලත් කරන ලද පුද්ගලයා විසින් සිදු කලයුතු වෙනවද නැද්ද ?

පි : මෙම ලිපියේ ස්වාමිණි අන්තර්ගතය අනුව විශේෂයෙන්ම Top secret සහ eyes only යනුවෙන් සඳහන් කර තිබියදීත් අන්තර්ගතයේ ඇතුලත් කරුණුවල තිබෙන්නා වූ සංවේදී භාවය අනුවත් FNA යනුවෙන් පොලිස්පතිවරයා සඳහන් කර මේ ලිපිය වෙනත් කණ්ඩායමක් වෙත යොමු කිරීම මාගේ හැඟීමේ සහ මාගේ දැනීමේ හැටියට වැරදියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : ඇයි ඒ?

පි : ස්වාමිණි පොලිස්පතිතුමා කියන්නේ වගකීමක් උසුලන පුද්ගලයෙක්. මෙහි අන්තර්ගතය විශාල ව්‍යසනයකට තුඩු දෙන්නක් විය හැකියි. මෙයා FNA කියන වචනය පොලිසියේ භාවිතා කරන ඉතාමත් primitive සරල වචනයක්. මෙක පොලිසියෙත් සාමාන්‍ය මාගේ අත්දැකීම් අනුව අවුරුදු 40 ක ඒක ගණන් ගන්නේ නැති වචනයක් ස්වාමිනි. මෙයාට නිසි උපදෙස් දෙන්න තිබුණා. එහෙම නැත්නම් කණ්ඩායමක් කැඳවන්න තිබ්බා සුදුසු කණ්ඩායමක්. ඔහුට සම්පත් තියෙනවා මේකට. මේක ඉතාම පහළ මට්ටමේ නිලධාරියෙක් කළා නම් අපිට අදහා ගන්න පුළුවන් ස්වාමිණි. පොලිස්පතිවරයාගෙන් කියන්නේ මීට වඩා

FAIR COMMENT BY JEZEEM

වගකීමෙන් යුතු සටහනක් මම නම් බලාපොරොත්තු වෙනවා ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර : දැන් ඔබ කියා සිටියා මේ FNA කියන වචනය සාමාන්‍යයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ ඉතාම සරල primitive word එය සඳහන් වුණාද දන්නේ නැහැ යන්න ඔබගේ පිළිතුරේ සටහන් වෙනවා. ඔබට මේ ගරු සභාවට උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න පුළුවන්ද FNA කියන වචනය මොන වගේ අවස්ථාවකදි ද සාමාන්‍යයෙන් පොලිස් සේවයේ ...

පි : මේක සරල අපරාධයක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කරපුවාම සහ සුළු අපරාධ සම්බන්ධයෙන් වැඩි වශයෙන් පොලිසියේ භාවිතා වන යෙදුමක්, කෙටි යෙදුමක්. නිශ්චිත නියෝගයක් නිකුත් කිරීමේ හැකියාව පොලිස්පතිවරයා වෙත තිබිය යුතුයි. විශේෂයෙන්ම මෙවැනි සංවේදී රහසිගත තොරතුරක් ලැබුනු අවස්ථාවකදී.

ප්‍ර : අතිරහස්‍ය යන වචනයත් මේ බුද්ධි ක්ෂේත්‍රයේ භාවිතා කරන වචනයක්ද?

පි : අතිරහස්‍යයි කියන එක Top secret කියන වචනයම සිංහල අර්ථය විය යුතුයි කියලා මගේ අදහස.

ප්‍ර : මේ අවස්ථාවේදි ඔබ වෙත මා පෙන්වා සිටිනවා දැනටමත් මේ කොමිෂන් සභාව වෙත ට ඉදිරිපත් කරලා තිබෙන X94 දරන ලේඛනය පෙන්වා සිටීමට

මෙම X94 කියන්නේ ඔබ පෙර පරීක්ෂා කරපු C4C කියන ලේඛනයේ කතෘවරයාගේ අත්සන සහ ලිපි ශීර්ෂය සහිතව තිබෙන ලේඛනය?

පි : බැලු බැල්මට ඔව් ස්වාමිණි.

ප්‍ර : C4A සහ C4C (X94) යන ලේඛන දෙකම එකම දවසේ එකම දින සහිත ලේඛන කිව්වොත් නිවැරදි ද?

පි : හරි ස්වාමිණි.

ප්‍ර : මෙම තොරතුරු සහිත ලේඛන 2ක් පොලිස්පතිවරයා වෙත ලැබුණු අවස්ථාවකදි ඔබට කීමට හැකියාවක් තිබෙනවද මෙම C4A වල සඳහන් FNA පමණක් දැමීම ඒ තොරතුරට අදාලව ගතයුතු නිවැරදිම ක්‍රියාමාර්ගයද නැද්ද කියලා ?

පි : මම කලින් සඳහන් කළ පරිදි ස්වාමිණි ලිපි දෙකේම අන්තර්ගත කරුණු එකමයි. එහිදි ලිපිය ලබන තැනැත්තා එනම් පොලිස්පතිවරයා මේ ලිපියට දක්වා තිබූ අවධානය සහ උනන්දුව

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගැන වසර 40 ට අධික කාලයක් පොලිස් සේවයේ අත්දැකීම් ඇති මට හැඟී යන්නේ මීට වඩා උනන්දුවක්, අවධානයක් මේ තොරතුර වෙත යොමු කොට ඔහුගේ සම්පත් පාවිච්චි කොට අඩුම තරමේ සාකච්ජාවක් කැඳවා විශේෂයෙන්ම ඔහුගේ යටතේ පැවතුන විශේෂ කාර්ය බලකාය වැනි අංශ සෘජුවම ඔහු යටතේ තිබුණේ ස්වාමිණි. ඔහුට ක්‍රියාත්මක වෙන්න තිබුණා කියන එක මගේ පෞද්ගලික හැඟීම. මට මතකයි ස්වාමිණි බුද්ධි අංශ ප්‍රධානියා හැටියට ඇතැම් අවස්ථාවලදි විදේශගත ක්‍රිකට් කණ්ඩායම් ලංකාවේ තරඟාවලියට සහභාගි වෙන අවස්ථාවලදි ඔවුන් වෙත තර්ජන ඇති බව මම විසින් සාකච්ඡා කිහිපයක් මෙහෙයවා පොලිස් මූලස්ථානයේදි පවා අපි තීරණ කළා ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව අපි සැලසීම අපේ යුතුකම කියලා. එහිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් පවා රාජකාරීවලට යොමු කරලා ඒ ආරක්ෂක කටයුතු අපි සංවිධානය කළා. මම කියන්නට උත්සාහ කරන්නේ ස්වාමිනි මේ තොරතුර ඉතාමත් නිශ්චිත තොරතුරක් හැටියට අවස්ථා කිහිපයදි වාර්තා වෙලා තියෙනවා ඒ ගැන සැලකීමේදි මේ තොරතුරට අනිවාර්යයෙන් ම මීට වඩා අවධානයක් යොමු කොට සුදුසු ක්‍රියාමාර්ගයක් ගතයුතුව තිබුණා යන්න මගේ පෞද්ගලික හැඟීමයි.

දැන් වේලාව : ප.ව.2.20 යි
මෙතැන් සිට ල/ලේ :-යමුණා දසනායක මිය

President Secretariat
FAIR COMMENT
BY JEZEEM

වේලාව ප.ව 2.20
පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා.
සටහන් ගැනිම ල/ලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප්‍ර සාක්ෂිකරු ඔබ කිව්වේ ඔබ බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ක්‍රියා කරන අවස්ථාවකදි මෙම තොරතුර ලැබුනා නම් කරපු ක්‍රියාවක්ද?

උ සරල වශයෙන් ස්වාමිනි මා අර වගේ දේකට ක්‍රීඩා තරඟයකට පවා සැපයුවා නම් මම අනිවාර්යයෙන්ම ගිහිල්ලා ස්වාමිනි මට කිව්වු සම්බන්ධකම් පැවැත්තුවා පොලිස්පතිත් එක්ක. මට පුළුවන් කම තිබ්බා මගේ ජ්‍යෙෂ්ඨත්වයත් තිබුනා. කොළඹ ඉන්න ජ්‍යෙෂ්ඨ පොලිස්පති ට කථා කරලා මේවා ක්‍රියාත්මක කරවන්න .

ප්‍ර ඔබ ඒ අනුව කටයුතු කලේ බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ?

උ වශයෙන්.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.

ප්‍ර දැන් මා තවත් උපකල්පිත ප්‍රශ්ණයක් නමුත් කොමිෂන් සභාවේ කාර්යය සඳහා අවශ්‍යයයි . ඔබ පරික්ෂා කරපු C 04 A කියන ලේඛණයේ පුද්ගලයන් නම් කිහිපයක්ම සඳහන් වෙනවා.?

උ එහෙමයි.

ප්‍ර සහරාන් කියන පුද්ගලයාගේ නමත් මෙහි සඳහන් වෙනවා නිවැරදිද ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි.

ප මෙම සහරාන් කියන පුද්ගලයා සම්බන්ධව රාජ්‍ය බුද්ධි සේවාව ඒ වන විට කටයුතු කරමින් ඒ කියන්නේ ඔහු පිළිබඳව තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාව සතුව තිබුනා නම් සහ 2018 නොවැම්බර් මාසයේදි පොලිස් නිළධාරීන් දෙදෙනකු ඉතාමත් ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීම 2018 දෙසැම්බර් මාසයේදි මාවනැල්ල ප්‍රදේශයේ දි බුදු පිළිම වලට හානි කිරීම, 2019 අවුරුද්දේ ජනවාරි 16 වෙනි දින පුපුරණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සොයා ගැනීම, සහ එම සොයා ගැනීමට ආදාලව තොරතුරු සැපයූ පුද්ගලයාගෙන් පසුව වෙඩි තබා තුවාල සිදු කර මරණයට පත් කිරීමට තැත් කිරීම යන ක්‍රියාවලින් සිදු වෙලා තියෙන අවස්ථාවකදී මෙම X 94 එහෙම නැත්නම් C 4 C හි අවසාන ඡේදයේ සඳහන් ඉහත සඳහන් තොරතුරු පිළිබඳව රහසිගතව පරීක්ෂණ සිදු කරමින් පවතී යන්න සඳහන් කිරීම මගින් මේ සඳහන් බුද්ධි තොරතුර අව තක්සේරුවට ලක් කර තියෙනවාද නැද්ද ?

උ ස්වාමිනි ඉහත කී බුද්ධි තොරතුර ඉදිරිපත් කර ඇත්තේ අප්‍රේල් මාසේ 09 වෙනිදා 2019 දි. කලින් සඳහන් කරපු සිද්ධින් ඔක්කෝම ඊට පෙර වෙච්ච අපේ ආයතනයේ ලේඛණගත වෙච්ච සිදුවීම්.මේ තොරතුරු පිටිපස යම්කිසි විශ්ලේෂණයක් කරා නම් නිශ්චිත වශයෙන්ම මෙතෙන්දි ප්‍රහාරයක් මේ සංවිධානාත්මක කල්ලිය විසින් සිදු කරනවා කියන්න තීරණය කරන්න පුළුවන්කම තියෙනවා.හේතුව විශේෂයෙන්ම වනාතවිල්ලුවේදී හමුවුනු පුපුරණ ද්‍රව්‍ය ස්වාමිනි ඒවා මීට කලින් අපි LTTE සංවිධානය විසින් භාවිතා කරන ලද පුපුරණ ද්‍රව්‍ය නොවෙයි. පරීක්ෂා කලොත් අපේ ලේඛණ වල තියෙනවා ඒවා ISIS කණ්ඩායම් වල භාවිතා කල පුපුරණ ද්‍රව්‍ය කියලා.

ප පැහැදිලි කරන්න ?

උ ඒ මම මට කුතුහලය නිසා මම පොඩ්ඩක් හොයලා බැලුවා ස්වාමිනි. එහි තිබුනා අපේ LTTE සංවිධානයෙන් පහුගිය කාල සීමාව තුලම පාවිච්චි කරපු C 4 නමුත් මෙතෙන්දි තිබුණේ ඇමෝනියා නයිට්‍රේට් වගේ හරියට ඒ වගේ දේවල්. ඒවා පාවිච්චි කලේ වැඩිපුරම ඇෆ්ගනිස්ථාන් වගේ IS වගේ කණ්ඩායම් කියලා මට සාමාන්‍ය දැනීමක් තියෙනවා . ඒ වගේ දැනිම් සහ හමු වෙච්ච ප්‍රමාණය ආයුධ, අරකලින් කරපු මිනී මැරුම් මිනී මැරීමට තැත් කිරීම. රාළහාමිලා දෙන්නෙක් පොලිස් රාළහාමිලා දෙන්නෙක් මැරීම. තව කණ්ඩායම් දෙකක් අතර තව 2017 දි ඇති වෙච්ච අරගලය කාත්තන්කුඩියේ බයිසිකල් එකක් පුපුරවා හැරීම. වැනිදෑ එවැනි සිදුවීම් ස්වාමිනි අපේ ලේඛණයේ ලේඛණගත සිදුවීම්.මේවා ගැන හොයලා බලලා මේවා සමඟ මේ කටයුතු විශ්ලේෂණය කරා නම් ස්වාමීනි .පැහැදිලි චිත්‍රයක් මතුවෙන්නට ඕනෑ

FAIR COMMENT BY JEZEEM

මේ තොරතුරේ තියෙන නිශ්චිත භාවය සහ එහි නැවත පරික්ෂාවක් කරන්න අවශ්‍ය නැහැ මේ නිශ්චිත වශයෙන්ම මේ තොරතුර සඳහන් කරුණු සිද්ධ වෙයි කියන එක.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු ඔබගේ අවධානය යොමු කරනවා C. 4 C දරණ ලේඛණයේ අවසාන වැකියට මේ සම්බන්ධයෙන් තවදුරටත් විමර්ෂණය කරමින් පවතිනවා කියන එක එහෙම තියෙනවා නේද ?

උ ඔව් ස්වාමිනී

ප්‍ර ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කරපු කාල සීමාව තුල ඔබගේ වාර්තා වල ඔය වැකිය සාමාන්‍යයෙන් සඳහන් වෙනවාද ?

උ මගේ මතකයේ හැටියට නම් ස්වාමිනි මේක කලින් සඳහන් කල විදිය ආකාරයටම එහි ඇති වැදගත්කම පහත වැටීමක් තමයි මේවාගෙන් සිදු වෙන්නේ මොකද අර විශ්ලේෂණය නිසියාකාරව කරලා තිබ්බා නම් මෙවැනි වාක්‍යයක් කිසිසේත්ම අවශ්‍ය වෙන්නේ නැහැ ස්වාමිනි මෙතෙන්ට. මෙවැනි බුද්ධි තොරතුරක මේ වගේ තොරතුරක් අපි ඉදිරිපත් කරන්නේ නැහැ . මොකද අපි සාමාන්‍යයෙන් කියන්නේ ස්වාමිනි අපි දෙපැත්තට වැනිලා වනමින් ගහන සමාවෙන්න ඒ වචනය පාවිච්චි කලාට ස්වාමිනි වනලා ගහන තොරතුරක් වගේ දෙයක් මගේ මට තේරෙන්නේ .

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර Mr. ගජනායක C4C ලේඛණයේ 2019 ජනවාරි 16 වනාතවිල්ලුවේ ලැක්ටෝස් වත්තෙන් පුපුරන ද්‍රව්‍ය හමුවීම සහ එම පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සඳහා උදව් කල අයෙකු මරා දැමීම සඳහා වච්නතිව් පොලිස් මුරපොලට පොලිස් නිළධාරීන් දෙදෙනෙකු ඝාතනය කර අවි ආයුධ පැහැර ගෙන යාම වැනි තොරතුරු ඇතුල්වී නැත්තේ ඇයි ද කියා ඔබට අදහසක් ප්‍රකාශ කරන්න පුවවන්ද ? SIS එකේ එම තොරතුරු තිබිලා නැද්ද ?

උ ඒක තමයි මට ප්‍රශ්ණය ස්වාමීනි. මට ප්‍රශ්ණය ඒකයි මේ තොරතුරු මෙච්චර තියෙද්දි අප සතුව මේ තොරතුර මේ කරුණුත් මත තහවුරු කරමින් ඉදිරිපත් කරානම් මීට වැඩි ශක්තිමත් තොරතුරක් බවට පත් වෙනවා.

ප්‍ර නමුත් මෙම තොරතුරේ ඔබ බලන්න සහරාන් 2018/12/26 මාවනැල්ල ප්‍රදේශයේ ආගමික ප්‍රතිමා වලට පහර දීම් ගැන සඳහන් කරලා තියෙනවා?

FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි.

ප්‍ර එතකොට 2019 ජනවාරි 16 සිදුවීම සඳහන් නොකිරීම තුලින් කිසියම් ආකාරයක තොරතුරු නිසි පරිදි ඉදිරිපත් නොකරීමක්ද මේ තියෙන්නේ ?

උ මට කියන්න අමාරුයි ස්වාමිනි ඒක.කොහොමහරි එතන

ප්‍ර ඒ කියන්නේ එම තොරතුරු ඉදිරිපත් කරා නම් මෙම තොරතුරු වල තිබෙන භයානකත්වය ඒ කියන්නේ තව වැඩිවෙලා මේක බලන අය හිතනවා නේ කිසියම් හෝ සබඳතාවයක් ?

උ අඩු තරමේ annexure එකක්වත් දෙන්න තිබ්බා ස්වාමිනී මේ ඉලක්කය තමයි මගේ මතය.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර ඔබට පෙන්වා සිටින මෙම X 94 දරණ ලේඛණය පිටු දෙකකින් සමන්විත ලේඛණයක්.මෙම ලේඛණයේ අවසානයට සෙකියුරිටි ඇඩ්වයිස් වශයෙන් සඳහන් කරපු ඡේදයක් තිබෙනවාද ?

උ ඔව් ස්වාමීනී.

ප්‍ර ඔබට එය කියවීමට හැකියාවක් තිබේද මේ අවස්ථාවේදි?

උ ස්වාමීනි Security advice this document is a property of the state intelligence service (SIS).It contains classified information and must be handled in accordance with established security procedures. It is loaned to your agency in confidence and any and may not further disseminated in whole or part without the written consent of the director .

ප්‍ර මෙම වාක්‍ය කණ්ඩයෙන් අදහස් වන දේ ඔබට වාර්තා කිරීම සඳහා පැහැදිලි කරන්න පුළුවන්ද ?

උ මෙය ස්වාමිනි මෙම කණ්ඩය සාමාන්‍යයෙන් ලෝකයේ ඕනෑම බුද්ධි අංශවල භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂ වල අන්තර්ගත පොදු කරුණක්.සාමාන්‍යයෙන් මෙම තොරතුරු වල අයිතිය තියෙන්නේ ඒ තොරතුරු දිරිපත් කරන තැනැත්තාට ඒ නිසා ඒවා බෙදා හැරීම කොටසක් හෝ සම්පුර්ණ වීම බෙදාහැරීම නොකල යුතු බවයි සඳහන් වන්නේ.

ප්‍ර මෙහි classified information යන්න සඳහන් වෙනවා ? ඔබට එය පැහැදිලි කිරීමට හැකියාවක් තියේද බුද්ධි සේවාවන් හා සමඟ?

උ සාමාන්‍යයෙන් ස්වාමීනි බුද්ධි තොරතුරු classified කරනවා කියන්නේ කැටගරයිස් කරනවා වර්ගීකරණය කරනවා කොන්ෆිඩෙන්ෂල් රහසිගතයි ඉතා රහසිගතයි සහ මා කලින් සඳහන් කරපු ආකාරයට

FAIR COMMENT BY JEZEEM

your eyes only වශයෙන් . තොරතුරේ ඇති සංවේදී භාවය මත මේ වර්ගකිරීම් වෙනස් වෙනවා.

ප මේ තොරතුර අති රහස්‍යයයි කියන එකද එමඟින් අවධාරණය වෙන්නේ?

උ ඒක ස්වාමීනි ඒක වෙනම සීල් එකක් . සාමාන්‍ය හැම ලිපි ශීර්ෂයකම මේක ටයිප් කරලා තියෙන්නේ ස්වාමීනි.අර ඒක සාමාන්‍ය දෙයක්.අපේ ආයතනයේ හැම ලිපි ශීර්ෂයකම මෙය හුඟක් මා දැකලා තියෙන හුඟක් බුද්ධි අංශ ලෝකයේ මේ ආකාරයෙන් මේ තොරතුරු අනවශ්‍ය පුද්ගලයන්ට යෑම වලක්වා ගැනීම පිණිස තමයි ස්වාමීනි මේ යෙදුම යොදලා තියෙන්නේ.

ප X 94 කියන ලේඛණයට වර්ගීකරණයක් ලබා දී තිබේද?

උ මේ ඡායා පිටපතේ අනුව අති රහස්‍යයයි යනුවෙන් .

ප අති රහස්‍යය වර්ගීකරණයක් සහිතව පොලිස්පති වෙත යන මෙම ලේඛණයේ වැදගත් භාවය ප්‍රථමයෙන් මෙම ගරු සභාවට පැහැදිලි කරන්න?

උ ස්වාමීනි මෙහි ඇති සංවේදී තොරතුරුවල වැදගත්කම නිසා තමයි මේ අතිරහස්‍ය යන මුද්‍රාව තබා ඇත්තේ යන්න මගේ හැඟීමයි. මෙහි වර්ගීකරණය අති රහස්‍යය යනුවෙන් අදාල කොටුවේ මුද්‍රා තබා ඇත.
මේ අවස්ථාවේදී X 95 ලෙස දැනටමත් ලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛණයද සාක්ෂිකරු වෙත ඉදිරිපත් කර සිටිනවා උතුමාණෙනි
X 95 කියවා බලයි.

ප බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් X 94, X 95 ,C 4 B දරණ තොරතුරු වලින් ඔබ බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් සිටි අවස්ථාවකදී ඔබ වෙත තිබුනානම් ඔබ ගත හැකිව තිබූ ක්‍රියා මාර්ගය ඔබ බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් මොනවගේ ක්‍රියා පිළිවෙතක්ද ගන්නේ ? ඒ සියලු තොරතුරු මා ඔබ වෙත පෙර සඳහන් කරන්නට යෙදුනු සියලුම තොරතුරු ඔබ සතුව තිබිලා මේ ග්‍රයිරන් එකත් සිදුවූවාට පසුව X 95 සඳහන් තොරතුරුත් ඔබට ලැබුනාට පසුව ඔබ අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් සිටියේ නම් ඔබ ගන්නා පියවර කුමක්ද? කියලා පැහැදිලි කරන්න පුළුවන්ද ?

උ ස්වාමීනි මුලින්ම කියන්නට ඕනෑ මේ තොරතුරු සියල්ලම පදනම් වෙලා තියෙන්නේ මට පෙනෙන පරිදි විදේශීය රටකින් ලැබුණු තොරතුරක් පදනම් කරගෙන .මා අධ්‍යක්ෂක වශයෙන් සිටියා නම් මම මුලින්ම කරන්නේ ඒ තොරතුර ලබාදුන් ආයතනය අපේ හිතවත් ආයතන වලින් අපිට නිතර තොරතුරු ලැබෙනවා ඒ හිතවත් ආයතනයේ ඒජන්තවරයා මගේ කාර්යාලයට ගෙනවිත් වැඩිදුර මේ ගැන විමසා බලනවා. මා එසේ සඳහන් කරන්නේ ස්වාමීනි, අප මීට කලින් එවැනි බුද්ධි තොරතුරු ගැන සාකච්ඡා මගින් නිශ්චිත බව සත්‍ය බව තහවුරු

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කරගෙන ඇති නිසයි මට උදාහරණයක් කියන්න අවසර දෙන්න ස්වාමීනි අපිට තොරතුරු ලැබුනා L.T.T.E සමයේ මුහුදේ L.T.T.E යාත්‍රා , ආයුධ ප්‍රවාහනය කරනවා සහ මව් නෞකාව මඟින් බෙදා හරින බවට.මම ඉක්මනින්ම ඒ තොරතුරු ලබා දුන් විදේශීය බුද්ධි අංශයේ ඒජන්තවරයා මගේ කාර්යාලයට කැඳවාගෙන ඇවිත් අපගේ තිබුනු දත්ත සහ සියලු තොරතුරු ඔහු සමඟ සාකච්ඡා කොට එතනින් නොනැවතී ස්වාමීනි නාවික හමුදාවේ බුද්ධි අංශ ප්‍රධානියත් මගේ කාර්යාලයට ගෙනැවිත් අපි දවස් කීපයක් මේ විශ්ලේෂණ කටයුතු කරලා decoding සංඥා යනාදිය දැඩි විමර්ශනයට ලක් කරලා අවසාන වාර්තාවක් අපි සකස් කරා නිශ්චිත වශයෙන්ම L.T.T.E සංවිධානයේ නැව් පිළිබඳව ඒ නැවවල තියෙන පාට, දිග , පළල සිල්ලක්ම සහිත වාර්තාවක් අපි සුදුසු කටයුතු සඳහා ආරක්ෂක ලේකම්වරයා වෙත ඉදිරිපත් කලා ඒ තොරතුරේ නිශ්චිත භාවය පසුකාලීනව ඔප්පු කලා නාවික හමුදාවෙන්. මම ඒක මතක් කලේ ස්වාමීනි අපි මේ තොරතුරු සුදුසු පුද්ගලයන් සමඟ අවශ්‍ය අවස්ථා වකදී හුවමාරු කර ගත යුතුයි අපේ පොදු ඉලක්කය එකක් වන නිසා. මේ තොරතුර සනාථ කිරීමට වෙනත් බුද්ධි අංශ වල තොරතුරු තිබෙන්නට ඇති . මෙහිදී මට එවැනි කාර්යයක් සිදු කරා බවට පේන්නේ නැහැ ස්වාමීනි .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු තමන්ට ලැබුනානම් තමන් මෙය මුලින්ම ඉදිරිපත් කරන්නේ කාටද?

උ ඉදිරිපත් කරන්න කලින් ස්වාමීනි මෙහි සත්‍ය අසත්‍යතාවය පිළිබඳ දැඩි විමර්ෂණයට ලක් කල යුතුයි.

ප්‍ර සත්‍ය බවට ?

උ ලේකම්තුමාට ස්වාමීනි. මම ගනුදෙණු කලේ ලේකම්තුමා එක්ක පමණයි ස්වාමීනි.

ප්‍ර ඔබ ඊට ඉහලින් රාජ්‍ය නායකයා සමඟ?

උ රාජ්‍ය නායකයා සමඟ ස්වාමීනි මට පොඩ්ඩක් අවසර දෙන්න අපි හැමදාම අවුරුදු පහක් මම කෙලින්ම ජාතික ආරක්ෂක සභාවට සහභාගි වුනා අපි ආරක්ෂක මණ්ඩලයට. ඒ සෑම බදාදාම ස්වාමීනි නොවරදවාම පැවැත්තුවා. ඊට කලින් සෑම අඟහරුවාදාම . ආරක්ෂක ලේකම්තුමා අපේ බුද්ධි ප්‍රධානී සියලු දෙනාම හමුදාවල සහ මම ගෙනල්ලා අපි පසුගිය සතියේ ඉස්මතු වෙච්ච බුද්ධි තොරතුරු සාකච්ඡා කරලා ඒවාගෙන් ගන්න ක්‍රියා මාර්ග එතෙන්දි ඒ ඉන්න අය අතර අපි බෙදා ගන්නවා. පහුවෙනි බදාදා අනිවාර්යයෙන්ම රටේ නායකයා ජනාධිපතිතුමාගේ

FAIR COMMENT BY JEZEEM

ප්‍රධානත්වයෙන් පවත්වන ජාතික ආරක්ෂක මණ්ඩලයේ සාකච්ඡාවට භාජනය කරලා අවශ්‍ය කටයුතු අපි හැමවෙලාවෙම ගැනීමේ පුරුද්ද අවුරුදු පහකට අධික සංඛ්‍යාවක් මගේ පලපුරුද්ද තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>.

ප්‍ර සාක්ෂිකරු දැන් ඔබෙන් මේ අවස්ථාවේදි අහපු ප්‍රශ්නයට ඔබ කිව්වා මේ තොරතුරු ඔබට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ලැබුනා නම් ඔබ කෙලින්ම ආරක්ෂක ලේකම්වරයා දැනුවත් කිරීමක් කරනවා කියන එක?

උ එසේය මැතිතුමනි.

ප්‍ර ඊට පස්සේ ඔබ කිව්වා මේ සති අන්තයේ, සතියකට සැරයක් පැවැත්වෙන ආරක්ෂක කවුන්සලයේත් ඔය සඳහනක් කරනවා කියලා ?

උ එසේය ස්වාමීනි.

ප්‍ර යම් අවස්ථාවක ඔය ආරක්ෂක ලේකම්ට ඔබ තොරතුර දැන්නුවාට පස්සේ ආරක්ෂක ලේකම් ඒ තොරතුර සම්බනධයෙන් දක්වන ප්‍රතිචාරය ඔබගේ මතය හැටියට මදිනම් තොරතුරට ගැලපෙන ප්‍රතිචාරයක් ඔබ ආරක්ෂක ලේකම් ගෙන් දකින් නැත්නම් ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කරන වෙනයම් කටයුත්තක් තියෙනවාද?

උ එහෙම අවස්ථාවක් මට මුණ ගැහිලා නැහැ ස්වාමීනි. අපේ මම කලින් කිව්වා වගේ අඟහරුවාදා මෙය සාකච්ඡා කරන්නේ හමුදා පොලිස් ඔක්කෝම ප්‍රධාන නිළධාරීන් ඔක්කෝම ඉදිරියේ. එතකොට ඒ අවස්ථාවේදිම ඔවුන් සටහන් කර ගන්නවා අවශ්‍ය කරන දේ ලේකම් තුමාගේ නියෝග වලට.එතකොට ඒකේ ප්‍රගතිය ඊගාව අඟහරුවාදා සාකච්ඡා වෙනවා .

ප්‍ර හරි මම ඔබට කියන අවස්ථාව මං කියන්නේ ඒ රැස්වීමකදී ආරක්ෂක ලේකම් දැනුවත් කිරීමක් සම්බන්ධයෙන් නෙවේ මන් කියන්නේ? ඔබට මේ තොරතුර ලැබෙනවා ඉස්සෙල්ලාම එතකොට රැස්වීම තියන්න කලින් වෙන්න පුලුවන්. ඔබ ඒ සම්බන්ධව ආරක්ෂක ලේකම්ව දැනුවත් කරනවාද ?

උ එහෙමයි

ප්‍ර ඔබ ඒ ආරක්ෂක ලේකම් ඒ අවස්ථාවේදී දැනුවත් කෙරුවහාම ආරක්ෂක ලේකම් ඒ අවස්ථාවේදී එම තොරතුරට දක්වන ප්‍රතිචාරය අනතුරට සාපේක්ෂව මදි නම් ඔබ මොනවද ගන්න ක්‍රියා මාර්ගය ?

උ මට එතුමා අභිබවා යන්න හැකියාවක් නැහැ ස්වාමීනි. මම ඒක මගේ අතින් නම් කෙරෙන්නේ නැහැ ඒක. මේ මම බලාපොරොත්තු වෙනවා මගේ කෙරේ විශ්වාසයක් තියෙනවා එතුමා. අනිවාර්යයෙන්ම මේක

FAIR COMMENT BY JEZEEM

මෙහෙම කියන්නේ සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්න කියලා මට වෙනත් මාර්ගවලින් බලන්න පුලුවන් ඇත්ත වශයෙන්ම ස්වාමීනි ක්‍රියා මාර්ගයක් ගැනෙනවාද කියලා. මම සම්බන්ධකම් පවත්වනවා නම් පවත්වන්නේ ඉතාම කිට්ටු බුද්ධි අංශත් සමග පොලිස්පතිතුමා සමඟ කොළඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සමඟ සම්බන්ධකම් පවත්වනවා මට දැනෙනවා මොකක්හරි මගේ ඒ තොරතුරු වලට ක්‍රියාත්මක වෙනවා කියන එක මට දැනෙනවා ස්වාමීනි.

ප මම ඔබෙන් අහන්නේ ප්‍රශ්නය ඔබ එහෙම ක්‍රියාත්මක වුනේ නැත්නම් ඔබ මොනවද කරන්නේ කියන එක?

උ එහෙම ඒ අවස්ථාවේදී මම අසරණ වෙනවා ස්වාමීනි.

ප දැන් ඔබ කිව්වා සතියකට වරක් ආරක්ෂක කවුන්සලයට ඉස්සෙල්ලා වෙනම රැස්වීමක් තිබ්බා කියලා ?

උ එහෙමයි ස්වාමීනි.

ප ඒකට කියන්නේ බුද්ධි සමාලෝචන ?

උ බුද්ධි සමාලෝචන රැස්වීම කියලා කියන්නේ

ප දැන් එම රැස්වීමේ ප්‍රධානත්වය ගන්නේ ආරක්ෂක ලේකම්වරයා ?

උ එහෙමයි.

ප එම රැස්වීමේදි ඔබට මේ ලැබිලා තියෙන තොරතුරු සම්බන්ධයෙන් ඔබ ඒ රැස්වීමට පෙර ආරක්ෂක ලේකම් දැනුවත් කරනවාද ?

උ එහෙමයි

ප එම රැස්වීමේදී ආරක්ෂක ලේකම් එම කටයුත්ත සාකච්ඡාවට භාජනය වෙන්නේ නැහැ එතකොට ඔබට ගන්න පුලුවන් ක්‍රියා මාර්ගය මොකක්ද?

උ මම එතෙන්දි ආපහු මතක් කරනවා ස්වාමීනි. මටවෙන තැනක් නැහැ. ඔය ප්‍රධානීන්ඔක්කොම හම්බ වෙන්න . මම එතනේදි කියනවා මැතිතුමනි මේ කාරණය ගැන මොකද අපේ තීරණය කරන්නේ කියලා මතක් කිරීමක් කරනවා ස්වාමීනි. මම සටහන් කරගෙන යන්නේ ස්වාමීනි මම කතා කරගත යුතු දේවල් මම මතක් කරනවා විශේෂයෙන්ම මම ලිඛිතව දෙනවා එතුමට එතකොට මගේ සාකච්ඡාවටත් භාජනය කරනවා අතිශය සංවේදි කරුණු හැර.

ප එතකොට මං වෙන අවස්ථාවක ඔබට උදාහරණයක් ලෙස ඔබ පොලිස් සේවයේ අවුරුදු 41 ක් හිටපු හින්දයි මේ ප්‍රශ්නය අහන්නේ ඔබට අද පෙන්නලා තියන තොරතුරු සියල්ල පොලිස්පති වශයෙන් ඔබට ලැබෙනවා ඒ කියන්නේ C 4 A ,C 4 B, C 4 C ලේඛනවල සඳහන් තොරතුරු පොලිස්පති වශයෙන් ඔබ ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද ?

උ ස්වාමීනි මේ තොරතුර අතිශය සංවේදී භයානක තොරතුරක් පුපුරණ ද්‍රව්‍ය ,තියෙනවා මා යටතේ ඉන්නවා මම පොලිස්පති නම් විශේෂ කාර්ය බලකාය ඒ බාර නිළධාරියා මම හැකි ඉකිමනින් මම ඔහුව ගෙන්වනවා ගෙන්වලා ඔහුට මේ කාර්ය බාර දෙනවා සුළු වශයෙන් ඊට

FAIR COMMENT BY JEZEEM

අමතරව මට ක්‍රියාත්මක වෙන්න පුළුවන් මගේ විදියට මට පුළුවන් රෝඩ් බ්ලොක් ටිකක් දාන්න මට පුළුවන් ආරක්ෂක නිළධාරින් දෙන්නෙක් දාන්න හැම ඔය කියන ස්ථානයකටම. මගේ මට්ටමින් මට කරන්න පුළුවන් දේවල් මට කරන්න පුළුවන් රේඩියෝ කාර් එකක් දාන්න පුලුවන් ස්වාමීනි. දාලා අපිට ඕනේ මේ ප්‍රධාන දේ තියන සිදුවීම වලක්වා ගන්න. මේකේ ඇත්ත නැත්ත වුනා හෝ නොවුනා ඒක පස්සේ imidiate වහාම ක්‍රියාත්මක වෙන්න ඕනේ මේ ක්‍රියාව මේවෙන ව්‍යසනය නවත්වන්න පොලිස්පති හැටියට මම අනිවාර්ය මේ සිද්ධිය කරනවා අපට තියෙනවා සම්පත් තියෙනවා සර්වියලන්ස් දාන්න පුලුවන්ඔනේ තරම් මිනිස්සු ඉන්නවා අපේ ගාව.CCTV කැමරා හයි කරපු වාහන තියෙනවා අපිට. අපි ඒවා දාලා සැක කටයුතු පුද්ගලයෝ අල්ලන්න හදිසි නීතිය තියෙන්න ඕනේ නැහැ ස්වාමීනි, ඕන තරම් අපිට නිශ්චිත තොරතුරු ලැබිලා තියෙද්දි අපිට වාහන කිහිපයක් සෝදිසි කරන්න පුළුවන් තත්වයක් තියෙනවා.අපිට ඒවා පොලිස් නිළධාරියෙක් හැටියට අනිවාර්යයෙන්ම පොලිස් නිළධරින්ට කරන්න තිබුනා. මම පොලිස්පති නම් අනිවාර්යයෙන් කරනවා ඒක. රෝඩ් බ්ලොක්ස් ටිකක් පාරවල් ටිකට දැම්මා නම් පණිවිඩය එනවා ස්වාමීනි. ත්‍රස්තවාදියා ප්‍රහාර දෙන්නේ හැම වෙලාවකම දුර්වල අවස්ථාවක.අපි ඒ වෙලාවට සුදානම් වෙලා හිටියා නම් ත්‍රස්තවාදියා පලාතකට එන්නේ නැහැ.

ප්‍ර මගේ අවසන් ප්‍රශ්නය ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වශයෙන් ඉඳලා ඒ තොරතුරු ටික තමන්ට ලැබෙනවා ඔබ ආරක්ෂක ලේකම්ට කියනවා නමුත් එතනින් එහාට මුකුත් වෙන්නේ නැහැ කියලා ඔබට තේරුම් ගියොත් ඔබ ඒ පිළිබඳව රටේ ආරක්ෂාව පිළිබඳ ප්‍රධානියා වන ජනාධිපතිවරයාට කෙලින්ම දැනුම් දෙනවාද නැද්ද ?

උ හරි අසීරු ප්‍රශ්නයක් ස්වාමීනි. ඒක පෞද්ගලිකවම මම එතෙන්දි ලේකම්වරයා යම්කිසි අපහසුතාවයකට පත් කිරීමක් වගේ දෙයක් වන නිසා මම ඒක මට එම පුද්ගලයන් දෙදෙනාම මම ආශ්‍රය කරපු කාලය තුල අවුරුදු 10 ක් තුල මට පුලුවන්කම තියෙනවා කියන්න ස්වාමීනි නමුත් ප්‍රතිපත්තියක් හැටියට මම ඒක කරන්නේ නැහැ.

ප්‍ර ප්‍රතිපත්තියක් වශයෙන් කරන්නේ නැත්තේ රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයා අමාරුවේ දාන්න ඕන් නැති හින්දානේ ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර රටේ ආරක්ෂාවද වැදගත් ආරක්ෂක ලේකම් වරයා අමාරුවේ දාන එකද වැදගත් ?

උ රටේ ආරක්ෂාව වැදගත් ස්වාමීනි.

ප්‍ර එතකොට එහෙම නම් ඔබ ඒ ප්‍රශ්නෙට ?

උ බුද්ධි අධ්‍යක්ෂ වරයා හැටියට මට සම්පත් නැහැ ස්වාමීනි මට ගිහින් කරන්න.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔබ කලින් කිව්වානේ ඔබට සෘජුවම රටේ ප්‍රධානියා ජනාධිපතිවරයාව කථා කරන්න දුරකථන පහසුකම් දීලා තිබ්බා කියලා?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර ඔබගේ අට අවුරුදු කාලසීමාව තුල ඒක පාවිච්චි කරලා තියෙනවා කියා ඔබ කිව්වානේ ?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර එතකොට මේ තොරතුරු ටික ඔබට ලැබිලා තිබ්බා නම් ඔබ ඒ අවස්ථාව ලබා ගන්නවාද නැද්ද ?

උ ස්වාමිනි බුද්ධි මේක මණ්ඩලයෙන් පසුව පහුවදා අපි සාකච්ඡා වෙනවා

ප්‍ර ඔබ කරපු එක නෑ ?

උ ලේකම්තුමා කරේ නැත්නම්.

ප්‍ර ඔව්?

උ ලේකම්තුමා කරේ නැත්නම් ඉතින් මට හරි අසීරු තත්වයට පත් වෙනවා මොකද මට පහසුකමක් නැහැ .

ප්‍ර මොකද රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ඔබ කිව්වා රටේ ආරක්ෂාව තියෙන ප්‍රධාන වගකීම ඔබට කියලා?

උ සත්‍යයක් . සම්බන්ධයෙන් දැනුම්දීම. ස්වාමීනි.

ප්‍ර දැනුම්දීම ඔබගේ ප්‍රධාන වගකීමක් කියලා ඔබ කිව්වා ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර එතකොට මේ දැන් තොරතුර ලැබිලා තියෙන්නේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් නේද ?

උ ඔව්.ස්වාමීනි සාමාන්‍යයෙන් අපි පෞද්ගලික මට්ටමෙන් අපි කොළඹ මිලිටරි intelligent මිලිටරියේ හිටිය කට්ටිය සමග කථා බහ කරනවා ඉතින් අපිට ඕවා කියලා අන් ඔෆිසියලි අපි කතා කරනවා නමුත් අර ලේකම්තුමා නොකර හිටියා කියලා ඊට උඩින් අපි එහෙම අපිට මට පුළුවන් ස්වාමීනි මට පුලුවන්කම තියෙනවා කොළඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා තනතුරෙන් මට කණිෂ්ඨ නිළධාරියෙක් . මට පුලුවන් එතුමාට කියලා කරන්න පුලුවන් මට්ටම් තියෙනවා ස්වාමීනි .

ප්‍ර දැන් ඔබ කියන විදියට ඔබ සමඟ යම්කිසි සම්බන්ධතාවයක් තියෙනපොලිස් නිළධාරි ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට කිව්වායින් පස්සේ ඔවුන් ගත්තු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් වෙන්නේ නැත්නම් මොකක්ද ඔබට තියෙන විකල්පය?

උ මට ඉතින් ආපහු යන්න තියෙන්නේ ලේකම්තුමා ගාවට තමයි ස්වාමීනි.

ප්‍ර එයින් උඩහට යන්නේ නැහැ ඔබ?

උ එයින් උඩහට මගේ කාලය තුල නම් මම ගිහිල්ලා නැහැ ස්වාමීනි. නමුත්

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර ගජනායක මහත්මයා ඔබ අවුරුදු 41 ක දීර්ඝ පොලිස් රාජකාරි වලින් පස්සේ 2011 වර්ෂයේදි විශ්‍රාම යනකොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් සේවය කලේ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර මේ මුස්ලිම් අන්තවාදී පිරිස් පිළිබඳව ඔබට මුල් තොරතුරු වාර්තා වුනේ කොයි කාලෙද?

උ මුස්ලිම් අන්තවාදය මාගේ සේවා කාලය තුලදී ස්වාමීනි අන්තවාදී කටයුතු පිළිබඳ එතරම් වාර්තා වුනේ නැහැ . නමුත් මුස්ලිම් ඉතාම ආවේගශීලිව මුස්ලිම් ආගමික කටයුතු මෙහෙයවන බවට විටින්විට තොරතුරු ලැබුනා අපිට. ඒවා තමයි අපි මොනිටර් කලේ .

ප්‍ර ඒ කොයි කාලෙද?

උ 2004 විතර මගේ මතකේ හැටියට අපේ මතකයි ස්වාමීනි 2004 විතර පිටරටින් ආපු දේශකවරයෙක් පවා අපි පිටමං කරන්න ක්‍රියාත්මක වුනා. මේ ඉන්දියාවෙන් ආපු තව්සික් ජමාත් නායකයා මේ ඔහු ඒකරලා අපි බ්ලැක් ලිස්ට් කලා අසාදු ලේඛණ ගත කලා.මගේ මතකේ හැටියට ස්වාමීනි .

ප්‍ර ඒ කියන්නේ ඔබට වැටහෙනවා නේද 2004 ඉඳලාම මේ අන්තවාදී ස්වභාවය පිළිකාවක් වගේනිකම් වැවෙමින් පැවතියා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබේ සේවා කාලය තුල ඔබට මතකද ඒ සම්බන්ධයෙන් ගත්තු යම් ක්‍රියා මාර්ග මොනවත් තිබුනාද ?

ප්‍ර දැන් ඔබ 2011 විශ්‍රාම ගියාට පස්සේ ඔබ නැවතත් උපදේශක මට්ටමෙන් සේවය කරානේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබට වැටහෙන ආකාරයකට මෙවැනි වාතාවරණයකදී ඒ කියන්නේ මේ අපි මුහුන දීපු අන්තවාදී තත්වය පිළිබඳව උපදේශක මට්ටමෙන් ඔබ එවකට සිටි රාජ්‍ය පාලකයන් දැනුවත් කලේ කොයි විදියටද ?

උ උපදේශක මට්ටමෙන් ඒ අවස්ථාවේදී මට ජාතික නැඟනල් කවුන්සිල් එකට යන්න අවස්ථාවක් තිබුනේ නැහැ ස්වාමීනි නමුත් බුද්ධි අංශ වාර්තා මට ලැබුනෙත් නැහැ ස්වාමීනි මම දැනුවත් වෙන්නේ සාමාන්‍යයෙන් පුවත්පත් මාර්ගයෙන් මට තොරතුරක් මට තොරතුරක් ලැබෙන මාර්ගයක් තිබුනේ නැහැ ස්වාමීනි.

ප්‍ර ඩිරෙක්ට් ඉන්වෝල් වෙන්න chance එකක් තිබුනේ නැහැ .?

උ තිබුනේ නැහැ ස්වාමීනි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඔබෙන් ප්‍රශ්ණයක් ඇහුවා ගරු උගත් කොමසාරිස්තුමා 2004 දී ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් මුල් තොරතුර ලැබුනායින් පස්සේ ඔබලා යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත්තාද නැද්ද කියන එක ?

උ එහෙමයි.

ප්‍ර ගත්තාද නැද්ද කියන එකට පිළිතුරක් දෙන්න ඒ ගත්තු ක්‍රියා මාර්ගය අපි මේ මාධ්‍ය නොමැතිව ලබා ගන්නම්.?

උ අන්තවාදී යනුවෙන් මම අදහස් කරන්නේ අසාමාන්‍ය විදියට ආගම පතුරවන විලාශයන් අපිට නිරික්ෂණය වුනා .

ප්‍ර හරි ඔබෙන් ඇහුව ප්‍රශ්නය ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගත්තාද නැද්ද කියන එක විතරයි ගත්තාද නැද්ද කියලා කියන්න ඊට පස්සේ අපි ?

උ ගත්තා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>.

ප්‍ර සාක්ෂිකරු බුද්ධි සමාලෝචන මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් වලදි මෙම බුද්ධි තොරතුරු සම්බන්ධව මුල්ම කරුණු ඉදිරිපත් කරන්නේ කවුරුන් විසින්ද ?

උ සෑම බොහෝ අවස්ථාවලදී මුලික ඉදිරිපත් කිරීම් කරන්නේ මම ස්වාමීනි.

ප්‍ර මම කියන්නේ කවුරු වශයෙන්ද ?

උ රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයා මම තමයි මුලික ඉදිරිපත් කිරීම් කරන්නේ .

ප්‍ර ඔබ කලින් දැක්කා බුද්ධි තොරතුරක් විශේෂ බුද්ධි තොරතුරක් එවැනි තොරතුරක් පැමිණියායින් පසුව ඒ අනිවාර්යයෙන්ම බුද්ධි සමාලෝචන මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කල යුතුයි නේද ?

උ අනිවාර්යයෙන්ම ස්වාමීනි.

ප්‍ර යම් බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයෙක් එවැනි තොරතුරක් බුද්ධි සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කිරීම පැහැර හරිනවා නම් ජනාධිපතිවරයාගේ මුලිකත්වයෙන් කෙරෙන ආරක්ෂක අංශවලට ඉදිරිපත් කිරීමට පැහැර හරිනවා නම් එයට හේතු වන්නේ කුමක්ද ?

උ එය අතිශය ඔහුගේ රාජකාරි පැහැර හැරීමක් ස්වාමීනි.

ප්‍ර රාජකාරි පැහැර හැරීමක් ?

උ ඔහුගේ වගකීම තමන් වෙත ලැබෙන තොරතුරු අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂවරයා හට විශේෂ තොරතුරක් රටේ රාජ්‍ය නායකයාට දැනුම්දීමේ හැකියාවක් තිබෙනවා නේද ?

උ අනිවාර්යයෙන්ම තිබෙනවා .

ප්‍ර ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයාට පහසුකම් ලබලා දීලා තියෙනවා දුරකථන පහසුකම් ලබා දී තිබෙනවා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එය ලබා දී තිබෙන්නේ විශේෂ තොරතුරු සැපයීමට කියලා තමුන් පිළිගන්නවා ?

උ එහෙමයි.

ප්‍ර එහෙමනම් බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයා මෙවැනි තොරතුරක් ලැබුන විට රාජ්‍ය නායකයා දැනුවත් කිරීම කල යුතුයි නේද?

උ අනිවාර්යයෙන්ම ඔහුගේ වගකීම ස්වාමීනි.

ප ඔහුගේ වගකීම කියලා තමන් පිළිගන්නවා ?

උ එසේමයි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර මිස්ට ගජනායක දැන් ඔබ උපකල්පනය කරන්න 2019/04/04 දිනයේ ජාතික බුද්ධි ප්‍රධානියා ලෙස කටයුතු කලේ ඔබ කියලා ?

උ එහෙමය.

ප්‍ර එතකොට ඔබට මෙම කොමිෂම හමුවේ පෙන්වන ලද C4 C C 4 B කියන ලේඛණ දැක්කනේ තවත් X 94, X 95 කියලා ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර දැන් ඔය බුද්ධි තොරතුර 2019/04/04 වෙනි දින අධ්‍යක්ෂක , ජාතික බුද්ධි සේවාවට ලැබිලා තියෙන්නේ බ්‍රහස්පතින්දා දවසක ? එතකොට ඔබ මෙම කොමිසම හමුවේ ප්‍රකාශ කරපු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වන බුද්ධි සමාලෝචන රැස්වීම පැවැත්විය යුත්තේ මම හිතන්නේ 09 වෙනිදා ? 2019/04/09 වෙනිදා ඔබ නම් එවකට සිටපු ජාතික බුද්ධි ප්‍රධානියා ඔබ එම රැස්වීමේ දී ලේකම්ට මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කල පරිදි ප්‍රථම යෙන්ම මෙම තොරතුර ඉදිරිපත් කරන්නේ ඔබද?

උ අනිවාර්යයෙන්ම. ඒ වෙනකොට මම ස්වාමීනි මම ලිඛිතව දැනුම් දීලා තියෙන්නේ පස්සේ මේක සාකච්ඡාවට භාජනය කරනවා.

ප්‍ර ලිඛිතව තොරතුරු ඉදිරිපත් කරන්නේ ප්‍රථමයෙන්ම ඔබ තමයි ?

උ එහෙමයි.

ප්‍ර ජාතික බුද්ධි ප්‍රධානියා ලෙස ?

උ එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ඔබ ප්‍රකාශ කලා සෑම බදාදා දිනකම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නැෂනල් සෙකුරිටි කවුන්සිල් ජාතික බුද්ධි ?

උ මණ්ඩලය .

ප්‍ර මණ්ඩලය රැස්වෙනවා කියලා එතකොට එම රැස්වීමේදී 2019 /04/04 වෙනි දින ලැබුණු බුද්ධි තොරතුරු පිළිබඳ ප්‍රථමයෙන්ම ජනාධිපති තුමාට වාර්තා කරන්නේ ඔබද?

උ සමහර විට මම දන්නේ නැහැ ස්වාමීනි ආරක්ෂක ලේකම්තුමා එතුමාට ඒ කාලය තුල දැනුම් දුන්නාද කියලා මම අනිවාර්යයෙන්ම මම හිටියා නම් මම දැනුම් දෙනවාමයි.

ප්‍ර මම අහන්නේ වෙනමම දැනුම් දිම නෙවෙයි ?

උ අනිවාර්යයෙන්ම මම දැනුම් දෙනවා.

ප්‍ර ඔබනේ ජාතික බුද්ධි ප්‍රධානියා ලෙස මෙම කරුණු ඉදිරිපත් කරන්නේ එම රැස්වීමට ?

උ ඔව්.

ප්‍ර දැන් ඔබ එහෙම ඉදිරිපත් කරනවානේ ඒ ලේකම්වරයාට සහ අතිගරු ජනාධිපතිතුමාට ?

උ එහෙමයි.

ප්‍ර දැන් ඔබ ඊලග සතියෙන් යනවානේ මේ මේ රැස්වීම් දෙකටම ?

උ ඔව්.

ප්‍ර ඒ රැස්වීමේදි නැවත වරක් මේ පිළිබඳව වෙනම කථා කරනවාද ?

උ ඒක අවශ්‍යතාවය මතුවුනොත් ස්වාමිනි ඒ මොකහරි ක්‍රියාත්මක වියයුතුයි පොලිස්පතිතුමා ඉන්නවා . පොලිස්පතිතුමාට කරුණු ඉදිරිපත් කරන්න පුවවන් ස්වාමීනි .ඒ ගත්ත ක්‍රියා මාර්ගය පිළිබඳව මොකද පොලිස්පතිතුමා ජාතික ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් . කොළඹ දිසාව බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ආරක්ෂක ස්වාමීනි සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයෙක්. ඔවුන් ඔක්කෝම දැන් දන්නවා මේක ස්වාමීනි ඔවුන් වෙත ඉදිරිපත් කරලා තියෙන්නේ ගත යුතු ක්‍රියා මාර්ග අනිවාර්යයෙන් ඔවුන් ගත යුතුයි

ප්‍ර ගතයුතු නැහැ මම අහන්නේ දැන් ජාතික ආරක්ෂාව පිළිබඳව ආයතනයේ ප්‍රධානියා ඔබනේ?

උ ඔව්.

ප්‍ර එතකොට ඔබ තමයි මෙම බුද්ධි තොරතුරු විශ්ලේෂණය කරලා මෙම බුද්ධි තොරතුරු වල තියෙන වැදගත් භාවය පිළිබඳව හොඳටම අවබෝධයක් තියෙන ඉන්ටලිජන්ස් ඔෆිසර් එතකොට ඔබ දෙවනි සතියේ රැස්වීමේදි මෙම ආරක්ෂක ලේකම්ට පවසන්නේ නැද්ද අඩුම තරමේ සර් මෙහෙම කරුණු මම මේහෙම ඉස්සෙල්ලා රැස්වීමට ඉදිරිපත් කලා හෙට ජනාධිපතිතුමාගෙත් රැස්වීම තියෙනවා එතුමාත්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අපෙන් අහන්න පුළුවන් මොනවද කරලා තියෙන්නේ කියලා අපි අද රැස්වීමේදී මොනවද කරලා තියෙන්නේ කියන එක සාකච්ඡා වෙන්නේ නැද්ද සමාලෝචන රැස්වීමේදි ?

උ සාකච්ඡා වෙනවා සමාලෝචන රැස්වීමේදි .

ප සමාලෝචන රැස්වීමේදි ?

උ සමාලෝචන කරනවා ස්වාමීනි.

ප කරනවා නේද ?

උ ඔව් කෙරෙනවා..

ප ඒ වගේම ඔබ ජනාධිපතිතුමා ගේ ලඟට යනවා නේ බදාදා රැස්වීමට

උ එහෙමයි.

ප ඒ දෙවනි රැස්වීමට ?

උ ඔව්.

ප මේ බුද්ධි තොරතුරු ලැබුනාට පසුව තිබෙන දෙවනි ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ජාතික බුද්ධි ?

උ මණ්ඩලය .

ප මණ්ඩල රැස්වීමට ? එතෙන්දිත් ඔබ අහනවාද නැවත වරක් ඔබ නේ ඉස්සෙල්ලාම කරුණු ඉදිරිපත් කරන්නේ නැවත වරක් ඔබට ඔබ ගිය සතියේ පොඩ්ඩක් ආපස්සට හැරිලා මම මෙන්න මෙහෙම අතිශයෙන්ම ජාතික ආරක්ෂාවට වැදගත් බුද්ධි තොරතුරක් ඉදිරිපත් කරා එම බුද්ධි තොරතුර පිළිබඳව ගෙන ඇති ක්‍රියා මාර්ගය කථා කරමින් තමයි මම මගේ අද දින මේ ඉදිරිපත් කිරීම කරන්නේ කියලා කියනවාද ?

උ අනිවාර්යයෙන්ම කියනවා. සමාලෝචයක් කරනවා .

ප ඔබ ඒ ආකාරයටකොයිතරම් කාලයක් මෙම බුද්ධි තොරතුරු පිළිබඳව ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පිළිබඳව ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවත්වෙන බුද්ධි සමාලෝචන රැස්වීමේදි සහ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීමේදී ප්‍රගතිය පිළිබඳ සමාලෝචයක් කරනවාද ඔබ ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රධානියා හැටියට?

උ සාමාන්‍යයෙන් ස්වාමීනි ඒ වගේ ක්‍රියාමාර්ගයක් ගත යුතු අවස්ථාවේදි මටඅවස්ථාව හරියට මට මතක නැහැ ගණන් කියන්න නමුත් අපි ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් අපි එතෙන්දි සාකච්ඡා වෙනවා පොලිස්පතිතුමා ඉදිරිපත් කරනවා කරුණු , යුධ හමුදාවේ කට්ටිය ඉදිරිපත් කරනවා එතෙන්දි සාකච්ඡා මණ්ඩලයක් ඉතින් ඒක ඔක්කොම ක්‍රියාත්මක වෙනවා අපි එතෙන්දි කිසිම අපේ සුළුතර සංඛ්‍යාවක් කීමට ඉදිරිපත් වෙන්නේ නැහැ.

ප එසේ කටයුතු කිරීම තුලින් ඔබ උත්සාහයක් කරනවාද?මෙම වැදගත් බුද්ධි තොරතුර මඟින් ලැබී ඇති තොරතුරු අනුව සිදුවිය හැකි විනාශය නතර කර ගැනීම සඳහා ජාතික බුද්ධි ප්‍රධානියා ලෙස ඔබගේ වගකීම් සහ

Registered Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

යුතුකම් නිසි පරිදි ඉටු කිරීමට ඔබ වගකීමකින් කටයුතු කරනවාද එසේ ක්‍රියා කිරීම
තුලින් ?

උ අනිවාර්යයෙන් මුලිකම සහ ප්‍රධානතම අරමුණ එහෙයි ස්වාමීනි වළක්වාගැනීම. ව්‍යසනය වළක්වා ගැනීම.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා .</u>

සාක්ෂිකරුගෙන් ලබා ගැනීමට නියමිත ඉතුරු සාක්ෂි මාධ්‍යය නොමැතිව ලබා ගන්නා බව කොමිෂන් සභාව සටහන් කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර ඔබ කියා සිටියා ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව 2002 වර්ෂයේ පමණ සිට ඩෙස්ක් එකක් ආරම්භ කර පවත්වාගෙන ගියා කියලා ?

උ එහෙමයි.

ප්‍ර ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් පත් වුනාට පසුව නැත්නම් ඔබගේ සේවා කාලය තුල මෙම අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා වුනාද ?

උ අසාමාන්‍ය පරිදි දේශණ පැවැත්වීම තමයි වාර්තා වුනේ ස්වාමීනි.කිසිම සහාසික ක්‍රියාවක් අපරාධමය ක්‍රියාවක් මගේ කාලය තුල වුනේ නැහැ කිසිම අපරාධ ගණයේ වරදක් එම සංවිධානයේ කිසිවකින් ක්‍රියාත්මක වුනේ නැහැ ස්වාමීනි. මට යමක් කීමට අවශ්‍යයයි. කුඩා කණ්ඩායම් කිහිපයක් මගේ මතකයේ හැටියට චෙට්ටි කණ්ඩායමක්, නොක්ස් කණ්ඩායම සහ බිල් ලාඩින් කියන කණ්ඩායම නම් වශයෙන් කණ්ඩායම් කිහිපයක් නැගෙනහිර ක්‍රියාත්මක වුනා ස්වාමීනි තරමක කාලයක් ක්‍රියාත්මක වුනා නමුත් ඔවුන් අපේ අවධානයට තුඩුදුන් නේ නැහැ අපරාධවලට සම්බන්ධ වුනු බවට අපිට වාර්තා වුනේ නැහැ ඒකණ්ඩායම් ඒවා අක්‍රීය වුනා කාලයාගේ ඇවෑමෙන් .

ප්‍ර මෙම ඉස්ලාම් ආගමික අන්තවාදය ලංකාවේ ඇති වෙන්න පුලුවන් එහෙම නැත්නම් ඉදිරියට ඇති වෙන්න පුලුවන් ද නැද්ද කියන්න ඔබට වැටහුනාද බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් සිටියේදි?

උ අනිවාර්යයෙන්ම ලෝක ත්‍රස්තවාදි දිහා බලද්දි ස්වාමීනි මේක ව්‍යාප්ත වෙන එක වළක්වාගන්න හරි අමාරුයි මේ ගෝලීයකරණයත් සමඟම යෑම් ඊම් බොහෝ වැඩිවෙලා තියෙනවා.අතිශයෙන්ම සෝදිසියෙන් අවධානයෙන් සිටියේ නැත්නම් අපේ දුර්වලකම් වලින් ත්‍රස්තවාදීන් ප්‍රයෝජන ගන්න හැකියාව තියෙනවා.හේතුව ත්‍රස්තවාදීන්ට අවශ්‍යයයි

FAIR COMMENT — BY JEZEEM

ප්‍රසිද්ධිය. ඔවුන් බොහෝ මුදලක් වියදම් කරනවා ප්‍රසිද්ධිය වෙනුවෙන් අපේ රට පාවිච්චි කිරීමේ අවධානමක් නැහැ කියලා මට කියන්න බැහැ.

ප්‍ර ඔබ එසේ නිරීක්ෂණය කරා නම් ඔබ අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් ඉන්නකොට මොනවහරි පියවරක් ගත්තාද ඒ සම් බන්ධයෙන්?

උ අපිට කරන්න පුලුවන් දේ තමයි ස්වාමීනි ඒ සම්බන්ධයෙන් කණ්ඩායම් යොදවලා දැනුවත් කිරීම් කරලා මම විශේෂයෙන්ම මගේ මට්ටමින් මට කරන්න පුලුවන් දෙයක් තිබුනා ස්වාමීනි මේ ත්‍රස්තවාදය මගේ දැනීමේ හැටියට මැඩ පවත්වන්න බැරි එහි ප්‍රධාන හේතුවක් කොට තිබ්බේ භාෂාව,භාෂාව නොදැනුවත්කම නිසා තමයි විශේෂයෙන් LTTE සංවිධානයත් අපි මේ තරම් දුරදිගඇරන් ගියේ මොකද තොරතුරු හොයන්නට බැහැ භාෂාව නොදන්නා නිසා මගේ මට්ටමින් මම පොලිස් පරීක්ෂකවරයෙක් ඉතාම රහසිගතව යෙදෙව්වා මුස්ලිම් ආගම ඉගෙන ගන්න අරාබි භාෂාව ඉගෙන ගන්න පූර්ණ කාලීනව ඔහු පලාතටවත් ආවේ නැමහැ ඔෆිස් එකේ මට මේකේ තර්ජනය තේරුණා ස්වාමීනි. ඊට පස්සේ මම ආවාට පස්සේ මොනවා වුනාද කියන්න මම දන්නේ නැහැ. දෙමළ භාෂාව ඉගෙන ගන්න නිළධාරීන් මම 85 දෙනෙක් ස්වාමීනී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ මම වාඩි කරවලා සමත් කලා. අපිට වැරදිච්ච තැන මම දකින හැටියට මේ භාෂාව පිළිබඳ අනිවාර්ය දැනීමක් බුද්ධි නිළධාරීන්ට අවශ්‍යයයි.

ප්‍ර දැන් මෙම ඔබ එසේ යොමු කරන්නට යෙදුණු ඉස්ලාම් ධර්මය ඉගෙනීමට සහ අරාබි භාෂාව ඉගෙනීමට යොමු කරන්නට යෙදුණු පොලිස් පරීක්ෂකවරයාගේ නම මොකක්ද?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අවස්ථාවේදි සාක්ෂිකරුට ලේඛණයක් ලබා දෙයි.ඔහු ගේ උත්තරය එම ලේඛණයේ ලියා කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එම ලේඛණයේ ඇති නම සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් කල යුතු බව ලඝුලේඛිකාවට නියෝග කරමි.

උ Mr. I.P. Wickramaarchchi.

මෙතැන් පටන් සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි මිය.

Present Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 3.20 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඔබගෙන් කොමිෂන් සභාව ඇසූ ප්‍රශ්නයක් මා නැවතත් ඇසීමට අවසර ඉල්ලා සිටිනවා. යම් අවස්ථාවකදී මම මෙසේ අහන්නම්. යම් අවස්ථාවකදී ආරක්ෂක ලේකම් වශයෙන් පරිපාලන නිලධාරියෙකු ඉදලා ඔබ විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රහස්‍ය වාර්තාවක් ජාතික ආරක්ෂාවට බලපාන රහස්‍ය වාර්තාවක සඳහන් කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් ක්‍රියාත්මක වුණේ නැත්නම් බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් ඔබ ඊළඟ තලය වන ජනාධිපතිවරයාට එය වාර්තා කිරීමට කටයුතු කරනවාද නැද්ද?

පි : ඔව් ස්වාමීනි අවස්ථානුකූලව ක්‍රියාත්මක නොවුණා නම් මට මොකක් හරි ජාතික ආරක්ෂාව ගැන හිතලා ....,

ප්‍ර : ඔබ බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් රාජකාරී කිරීමේදී ඔබට ආරක්ෂක ලේකම්වරයාට දැනුම් දුන් තොරතුරක් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීමක් සම්බන්ධයෙන් අත් දැකීමක් තියෙනවද නැද්ද?

පි : මට එහෙම අත් දැකීමක් නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් පෙර පෙන්වන්නට යෙදුණු C-4(b) කියන තොරතුරු ඔබට ලැබුණු විටෙක, ආරක්ෂක ලේකම්ට අමතරව ගිහි සමාජයේ පුද්ගලයන් දැනුවත් කිරීමට අධ්‍යක්ෂ - බුද්ධි වශයෙන් ඔබ කටයුතු කරනවාද නැද්ද?

පි : අනිවාර්යයෙන්ම මගේ යුතුකම හැටියට, ස්වාමීනි තිබුණු තර්ජන හැටියට මගේ යුතුකම තමයි මම විශ්වාස කරනවා මට ලැබුණොත් මම ඒ අදාළ ස්ථානවලට ප්‍රධානීන් දැනුවත් කරනවා.

ප්‍ර : උදාහරණයක් වශයෙන් ගතහොත්?

පි : උදාහරණයක් වශයෙන් ගත්තොත් මා දැන් කලින් සඳහන් කළ පරිදි තර්ජනය තිබ්බ පුද්ගලයෝ හමුවෙලා මම ගිහිල්ලා කථා කෙරුවා ස්වාමීනි. හැබැයි ආරක්ෂක ලේකම්ගේ අනුදැනුම ඇතුව. මම ගිහිල්ලා ඔවුන්ට කිව්වා ඔබලට මේ විදියේ තර්ජන තියෙනවා. මම අහවලා මට හේතු තියෙනවා. සමහර විද්‍යාත්මක සාක්ෂි තියෙනවා. සමහර තාක්ෂණික සාක්ෂි තියෙනවා මට මේවා කියන්න. ඒ හින්දා තමයි මම මේ කියන්නේ. පරිස්සම් වෙන්න කියන එක. සමහර වෙලාවට ඇතැම් අවස්ථාවලදී ආරක්ෂක නිලධාරින් මට බල කළා ස්වාමීනි ඇවිල්ලා කියන්න මේක ඔබතුමා මේ ඇමතිවරුන්ට කියන්න. මේ කට්ටිය කිව්වට අහන්නේ නැහැ කියලා. මම ගිහිල්ලා කට්ටියට කිව්වා මේක කරන්න එපා මෙන්න මේවා තමයි තියෙන්නේ අපි මේ නිකමට නෙමෙයි කියන්නේ. අපි මේ සාක්ෂි ඇතුව බුද්ධි තාක්ෂණික සාක්ෂි ඇතුව සනාථ කළාට තොරතුරු මත තමයි අපි තීරණවලට ඇවිල්ලා ගිහිල්ලා දැනුවත් කළේ ස්වාමීනි. ඉතිං මෙවැනි තොරතුරක් ආවානම් අනිවාර්යයෙන්ම විශේෂයෙන්ම දැන් මෙහි සඳහන් කරුණු අනුව පල්ලි, කෝවිල්, පල්ලිවලට, හෝටල්වලට

FAIR COMMENT BY JEZEEM

අනිවාර්යයෙන් මගේ මට්ටමේ හැටියට මට ගිහිල්ලා දැනුවත් කරන්න පුළුවන්කම තිබුණා ස්වාමීනි.

එපමණයි උතුමාණෙනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු මම මේ ප්‍රශ්නය ඔබෙන් අහන්නේ අපිට අපේ වාර්තාවේ යම්කිසි අවස්ථාවක සංසන්දනයක් කරන්න වෙනවා මේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ගෙන තිබ්බ ක්‍රියාමාර්ග සහ පසු අවස්ථාවකදී ගෙන තිබ්බ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්. ඒක හින්දා දැන් ඔබ කිව්ව හැටියට 2004 දී ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් යම්කිසි තොරතුරක් ඔබගේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙනවා. නමුත් ඒ DESK එක 2002 ඉඳලා පැවතිච්ච එකක්. දැන් ඒ වගේ තොරතුරු ලැබුණහම පස්සේ රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒක එම අනතුරට මුහුණ දෙන්න ගත්තු ක්‍රියාමාර්ග මොනවාද? ඔබ දැනටමත් විස්තර කරලා තිබ්බ එකට අමතරව?

පි : මම ගත්ත ක්‍රියාමාර්ගද ස්වාමීනි.

ප්‍ර : ඔව්?

පි : මම ගත්ත ක්‍රියාමාර්ග මම දැනුවත් කර, නිලධාරීන් දැනුවත් කිරීම විටින්විට කරනවා අපි උපදෙස් පන්ති තියලා, විශේෂ පාඨමාලා සකස් කරලා ඒ කාර්ය මණ්ඩල දැනුවත් කිරීම් කරනවා.

ප්‍ර : ඒ උපදෙස් පන්ති, පාඨමාලා සකස් කරන්නේ රාජ්‍ය බුද්ධි සේවාවල පුද්ගලයින්ට විතරද නැත්නම් පොලීසියේ අයටද?

පි : මට විතරයි ස්වාමීනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයේ අයට විතරයි?

පි : එහෙමයි. මට අවශ්‍යතාවයක් නැහැ. මම සමහර අවස්ථාවල පොලිස්පතිතුමා මගෙන් ඉල්ලා සිටියොත් මම ගිහිල්ලා දේශන පවත්වනවා හුඟක් අවස්ථාවල.

ප්‍ර : එහෙම පවත්වලා තියෙනවද?

පි : මම මුස්ලිම් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් නම් පවත්වලා නැහැ ස්වාමීනි. L.T.T.E. එක සම්බන්ධයෙන් නම් අනේක වාරයක් මම ගිහිල්ලා දේශන පවත්වලා තියෙනවා අපේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා.

ප්‍ර : අනෙක් ක්‍රියාමාර්ග මොනවාද?

පි : මට මතකයේ හැටියට ස්වාමීනි මම කරපු එක තමයි අර මම කලින් කිව්වා වගේ භාෂාව පිළිබඳ අනෙකුත් දැනුවත් කිරීම්. මගේ මතකයට එන්නේ එච්චරයි ස්වාමීනි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබගේ මතකයේ හැටියට ඔබ දැන් ඔය ලැබුණු තොරතුරු ආරක්ෂක මණ්ඩලය දැනුවත් කරනවනේ?

පි : අනිවාර්යයෙන් ස්වාමීනි.

ප්‍ර : බුද්ධි සමාලෝචන මණ්ඩලය දැනුවත් කරනවනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ ලබාදුන් තොරතුරු අනුව එවකට පැවති රජය ඒ සම්බන්ධයෙන් ගත්තු ක්‍රියාමාර්ග මොනවාද?

පි : මගේ කාලය තුළ ස්වාමීනි මම දැනුම් දුන්නේ බුද්ධි ආරක්ෂක මණ්ඩලයට අර මද්‍රාසා පාසල් අසාමාන්‍ය විදියට ක්‍රියාත්මක වෙනවා, යෑම් ඊම් කෙරෙනවා කියන එක පමණයි මගේ මතයේ හැටියට බුද්ධි තොරතුරක් හැටියට ආරක්ෂක මණ්ඩලයට දැනුම් දුන්නේ. අපිට කිව්වා ඒක Monitor කරන්න කියලා. අපි ඒක Monitor කළා අපේ කණ්ඩායම් දාලා ඒ පළාත්වල නියාමනයක් කෙරුණා ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වන්නේ ආරක්ෂක මණ්ඩලය දැනුවත් කිරීමෙන් පසු මද්‍රාසා පාසල් නියාමනය කිරීම?

පි : නියාමනය කිරීම. ගිහිල්ලා ආපු කට්ටියයි, ගිය කට්ටියයි පිළිබඳව අපේ Monitor කිරීමක් කළා ස්වාමීනි.

ප්‍ර : හරි. ඔබගේ නියාමනයේදී ඔබට අනාවරණය වුණ කරුණු මොනවාද?

පි : විශේෂ දෙයක් එහෙම වුණේ නැහැ ස්වාමීනි. අපට තේරුණා වර්ධනයක් වෙනවා මේ මුස්ලිම් මද්‍රසා පාසල් පිටරටවල්වල යාමට ලොකු උනන්දුවක් අපි නිරීක්ෂණය කළා ස්වාමීනි. ලොකු උනන්දුවක් මැලේසියාව, සෞදි අරාබියාව වගේ රටවල්වලට කණ්ඩායම් වශයෙන් අපි නිරීක්ෂණය කළා. හැබැයි අපට එයින් එක් කෙනෙක්ගෙවත් අපිට වාර්තා වුණේ නැහැ සාහසික ක්‍රියාවලට එල්බ වෙනවා අපට වාර්තා වුණේ නැහැ ස්වාමීනි ඒ කාලය තුළදී.

ප්‍ර : හරි. දැන් ඔබ ලබා දුන් තොරතුරු අනුව මද්‍රාසා පාසල් නියාමනය කිරීමට එවක රජය යම්කිසි ක්‍රියාදාමයක් පටන් ගත්තද ක්‍රියා පටිපාටියක්?

පි : රජයේ, අපේ හැරෙන්නට වෙන මටනම් මගේ මතකයට එන්නේ නැහැ ස්වාමීනි. අපේ ආයතනය හැරෙන්නට වෙන ක්‍රියාමාර්ගයක් යෙදුණාද කියලා මට කියන්න අමාරුයි ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ ගත්තු එකම ක්‍රියාමාර්ගය තවදුරටත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මගින් විමසීමෙන් සිටීම පමණයි?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : දැන් ඒ පාසල්වල උගන්වන පොත්පත් ආදිය සම්බන්ධයෙන් යම්කිසි තොරතුරක් ලැබුණද මේක අන්තවාදයට යැවෙන්න පුළුවන් පොත්පත් පාවිච්චි කරනවද කියලා?

පි : ඒ පිළිබඳ විශේෂ දැනීමක් මට නැහැ. සමහරවිට අර මම යොදවපු නිලධාරියා අනිවාර්යයෙන්ම දැනගත යුතුයි ස්වාමීනි.

ප්‍ර : ඔබ අපට ලියලා දුන්න නම?

පි : දුන්න නම.

ප්‍ර : එතකොට දැන් ඔබගේ මේ විමර්ශනය අතරතුරදී ඔබට පෙනී ගියාද විදේශීය රටවලින් අසාමාන්‍ය ලෙස ආගම ඉගැන්වීම සඳහා ලංකාවට පුද්ගලයින් පැමිණෙනවා කියලා?

පි : අනිවාර්යයෙන්ම ස්වාමීනි.

ප්‍ර : ඒ විදියට වැඩියෙන්ම ආවේ මොන රටවල්වලින්ද?

පි : අරාබි රටවල්වලින් තමයි ස්වාමීනි. මට මතක හැටියට මැලේසියා, අරාබිකරයේ තමයි...,

ප්‍ර : අරාබි ප්‍රදේශයෙන් සහ මැලේසියාව?

පි : එහෙමයි.

ප්‍ර : ඒ ආගමික ඉගැන්වීම් කරන පුද්ගලයින් ලංකාවට ගෙන ඒමට දායකත්වය දැක් වූ යම්කිසි සංවිධාන තිබ්බද මූලිකව ඔබ හඳුනා ගත්තු?

පි : බොහෝ අවස්ථාවල ස්වාමීනි ඔවුන් කොළඹ කිසියම් ආයතනයක ලේඛනගත කරලා තමයි යෑම් ඊම් කළේ. මට මතක නැහැ ස්වාමීනී ඒකේ ලේඛනගත, නමුත් රාජ්‍ය ආයතනයක් නෙමෙයි ස්වාමීනි ඒක.

ප්‍ර : ආ ඒක පෞද්ගලික ආයතනයක ලේඛනගත කරලා?

පි : ලේඛනගත වුණා ස්වාමීනි. අර නිලධාරියා අනිවාර්යයෙන්ම දන්නවා.

ප්‍ර : අර නිලධාරියා අනිවාර්යයෙන්ම දන්නවා?

පි : දන්නවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කියන තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාවේ දත්ත ගබඩාවේ තියෙන්න ඕනද?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : අනිවාර්යයෙන්ම තියෙන්න ඕන?

FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන්ම තියෙන්න ඕන.

ප්‍ර : ඒක විනාශ වීමක් සිදු වෙන්නේ ...?

පි : නැහැ විනාශවීමක් වෙන්නේ නැහැ ස්වාමීනි. මට ආඩම්බරයි කියන්න ලංකාවේ කොහේවත් නැහැ ඒ වගේ දත්ත ගබඩාවක්.

ප්‍ර : හරි. දැන් ඔය ආපු ආගමික ඉගැන්වීම්වල යෙදුණු පුද්ගලයින් ලංකාවට ආවේ මොන Visa අරගෙනද?

පි : සංචාරක Visa අරගෙන. ඒ පදනම මත තමයි ස්වාමීනි අපි අර එක්තරා පුද්ගලයෙකුව පිටුවහල් කළේ.

ප්‍ර : ඒ පුද්ගලයාගේ නම මතකද?

පි : ජෙනුල් අබ්දීන්.

ප්‍ර : ජෙනුල් අබ්දීන් ඉන්දියාවේ තබ්ලික් ජමාත් සංවිධානයේ නායකයා?

පි : නායකයා.

ප්‍ර : ඉන්දියාවේ නෙමෙයි තමිල්නාඩුවේ තබ්ලික් ජමාත් සංවිධානයේ නායකයා?

පි : තමිල්නාඩුවේ. එහෙමයි.

ප්‍ර : දැන් ඔබගේ මේ ආයතනය මේ ඉස්ලාම් අන්තවාදීන් සම්බන්ධයෙන් විමසීමෙන් සිටින අවස්ථාවලදී යම් යම් සංවිධානවල නම් ඔබගේ අවධානයට යොමු වුණාද?

පි : ඔව් ස්වාමීනි. මට ඒ තරම් විශේෂ දැනීමක් තිබ්බේ නැහැ. නමුත් තබ්ලික් ජමාත්, තවුහිද් ජමාත් ඒ වගේ සංවිධාන ශ්‍රී ලංකා තබ්ලික් ජමාත් යන සංවිධාන ගැන කථා බහ නිතර තිබුණා.

ප්‍ර : ඊට අමතරව ජමාතේ ඉස්ලාම් කියන සංවිධානය ගැනත් කථා කළාද?

පි : ජමාතේ ඉස්ලාම් මට හුරු නමක් ස්වාමීනි.

ප්‍ර : පෙර පුද්ගලයින්ගේ නම් ඔබට යම් මතකයක් තියෙනවද?

පි : පසුව මේ සිද්ධියෙන් පස්සේ තමයි ස්වාමීනි මට මාධ්‍ය මගින් අරෙහේ මෙහේ දැන ගත්ත දැනීම තමයි මට තියෙන්නේ.

ප්‍ර : නැහැ. ඒ අවස්ථාවේදී?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : සංවිධාන ගැන විතරයි?

පි : සංවිධාන ගැන විතරයි. පුද්ගලයින් ගැන කවුරුත් එහෙම කැපී පෙනෙන චරිතයක් ඉස්මතු වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : සංවිධානවල නායකත්වය දැරුවේ කවුද කියලා ...?

පි : නැහැ ස්වාමීනි නැහැ.

****

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප : ගජනායක මහත්මයා, ඔබ සේවය කරන කාලයේ Senior DIG ගණුදෙනු කරන්නේ DIG එක්ක පමණද? DIG ගණුදෙනු කරන්නේ SSP එක්ක විතරද? SSP ගණුදෙනු කරන්නේ ASP විතරද? මේ ක්‍රමය ඒ කාලයේත් පැවතුණාද?

පි : මේ හයිරාකි කියන, මොකද්ද ඒකට කියන්නේ...., ඒක තමයි හැටි. නමුත් ඒකෙන් පරිබාහිරව යන්න බැහැ කියලා කොහේවත් නැහැ.

ප : අවශ්‍ය අවස්ථාවල්වලදී ඕනම නිලධාරියෙකුට කථා කරලා වැඩේ කරාද, මොනවද කෙරුවේ කියලා අහන්න පුළුවන්කම තියෙනවනේ?

පි : තියෙනවා.

ප : දැන් අපිට තේරිච්ච විදියට මෑත කාලයේදී ඔය හයිරාකි එකෙන් පිට පැනලා වැඩ කිරීමට අකැමැති බවක් හැඟුණා. නමුත් ඒ එක්කම තමන් දෙන නියෝග පහළ නිලධාරීන් ක්‍රියාත්මක කරනවද කියන එක පිළිබඳව වටහා ගැනීමක් නැහැ. එතකොට තමන් නියෝගයක් දුන්නහම පහළ නිලධාරියෙකුට තමන්ගේ PA තමයි ඒ පහළ නිලධාරියාට ඒක යවන්නේ. එතකොට ඇත්තටම මේ ක්‍රමය යම් ආකාරයක වෙනස්කමකට භාජනය කිරීම සුදුසුය කියලා ඔබ හිතනවද?

පි : අනිවාර්යයෙන්ම විය යුත්තේ කාර්යය කිරීම මිසක අර Procedures Follow කිරීම නෙමෙයි අවශ්‍යතාවය සිදු කිරීම. නමුත් සමහර අය ඒක එක්කෙනාගෙන් එක්කෙනාට වෙනස් ස්වාමීනි. ඒක එක එක්කෙනා විදියට. සමහරවිට දැන් අපි උදාහරණයක් හැටියට කිව්වොත් මම රාළහාමී කෙනෙක් එක්ක ගණුදෙනුවක් නැහැ මට. නමුත් අවස්ථාවක් වුණොත් මට කරන්න වෙනවා. ඉතිං ඒක තමයි, ඒක අර අපේ සම්ප්‍රදායෙන් පිට.

ප : දැන් ඔබ හිතනවද පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුව තුළ එකිනෙකා අතර පවතින තොරතුරු හුවමාරු කර ගැනීම මීට වඩා විධිමත්ව කිරීම සුදුසුය කියලා?

පි : අනිවාර්යයෙන්ම ස්වාමීනි. මේ ප්‍රශ්නයට මුල ඒක. මේ ප්‍රශ්නයට මුල ඒක. පොලීසිය විතරක් නෙමෙයි ස්වාමීනි මුළු ලෝකයේම තියෙන ප්‍රශ්නයක් මේක. මේ Intra Agency rivalry කියන එක. ඒ කියන්නේ ආයතන අතරේ තියෙන විරහා. මට උදාහරණයක් කියන්න අවසර දෙන්න ස්වාමීනි. ලෝකයේ වෙච්ච විශාලම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ත්‍රස්තවාදී ප්‍රහාරය 09.11 සැප්තැම්බර්. ඒ පරීක්ෂණයේදී මතු වෙච්ච කරුණක් තමයි ඇමෙරිකාවේ ඔත්තු සේවය සහ FBI එක. ඒ කියන්නේ Federal Bureau of Investigation ඒ දෙක අතර තිබ්බ විරහා. ඒ දෙක සම්බන්ධ වෙලා තිබ්බා නම් මේ ප්‍රශ්නය වෙන්නෙත් නැහැ සමහරවිට. අපෙත් ඕක තියෙනවා. කොයි රටෙත් ඕක තියෙනවා. ඒ Agencies අතර නොහොඳ නෝක්කඩු තියෙනවා.

ප්‍ර : ඒ සම්බන්ධතාවය ඇති කරන්න මොකද්ද කළ යුත්තේ? ඔබට යෝජනා කරන්න පුළුවන්ද?

පි : මට යෝජනා කළහැකියි ස්වාමීනි. ඇත්ත වශයෙන් බුද්ධි මණ්ඩලයක් පත් කළයුතුයි එක නිලධාරියෙක් යටතේ. එතකොට එතනින් තමයි වෙන්නේ ඔක්කොම Share වෙන්නේ. වෙන කොහේවත් යන්නේ නැහැ. එතකොට බුද්ධි මණ්ඩලයේ ප්‍රධානියා බුද්ධි තොරතුරු පිළිබඳව හසල දැනුමක් තියෙන වෙන්න ඕන. ඔය Custom, Immigration, Prisions, Nacotics, CID, NIB, SIS, TID ඔය ආයතන ඔක්කොගේම නියෝජිතයෝ එක වහලක් යටට ගෙනල්ලා ශක්තිමත් බුද්ධි මණ්ඩලයක් හැදුවොත් අනිවාර්යයෙන්ම ඒ කරලා Central Data Base එකක් හැදුවොත් අපිට ඔය ප්‍රශ්නයෙන් ගැළවෙන්න පුළුවන්.

ප්‍ර : එතකොට SIS Directorට තියෙන්නෙත් ඒ කාර්යභාරය නෙවෙයිද?

පි : ඒ SIS Director ඕන නම් එතනින් තියන්න පුළුවන් උඩින්ම.

ප්‍ර : එතකොට එයා යටතේ හැමෝටම මේ විදියට තොරතුරු ගලා ආවහම ...?

පි : අන්න හරි. එයාගේ වගකීම අරයට තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : තොරතුරු හුවමාරුවීම?

පි : එතකොට අපි අතරේ මණ්ඩලයේ ඔක්කොම දන්නවා. Custom එකත් දන්නවා, Prision එකත් දන්නවා, TID එකත් දන්නවා, Nacotics එකත් දන්නවා. එතකෙට මේක එහෙම්පිටින්ම ඒකාබද්ධයි. එතනින් තමයි තොරතුරු කේන්ද්‍රගත වන්නේ.

ප්‍ර : දැන් ඔබේ දැනීම අනුව මේ ක්‍රමය වෙන කොහේද, වෙන ඔය රටවල්වල ක්‍රියාත්මක වෙනවද?

පි : දැන් මම කලින් කිව්ව විදියට CIA එකයි, FBI එකයි එක්කහු කරලා වෙන Director කෙනෙක් පත් කළා. Director - Intelligence කියලා පත් කළා.

ප්‍ර : ඇමෙරිකාවේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඇමෙරිකාවේ.

ප්‍ර : ඒ ඇරෙන්න ඔබ දන්න විදියට තව මොනවද තොරතුරු?

පි : මට එහෙම නැහැ.

ප්‍ර : අඩුම ගාණේ රුසියාවේ, ඉන්දියාවේ, සෝවියට් දේශයේ ඒ වගේ එහෙම?

පි : මට මතකයක් නැහැ ස්වාමීනි. හැබැයි මම අර කියපු ප්‍රශ්නය හැම රටේම තියෙනවා.

ප්‍ර : තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒකේ හේතුව මේ එකිනෙකා තියෙන තරහකාරිත්වයද?

පි : හරියටම හරි.

ප්‍ර : අනිත් එක්කෙනාට වැඩිය අපි තොරතුරු ටිකක් දීලා ....,

පි : දීලා අපි ඉස්සරහින් ඉන්න ඕන කියන එක. ඒක හරි කණගාටුදායක ...,

ප්‍ර : එතකොට ඒකට හේතුව මේ ලකුණු දමා ගැනීමද?

පි : හරියටම හරි.

ප්‍ර : ඔබ හිතන්නේ ඒ ක්‍රමය අද නෙමෙයි ඒ කාලයේත් තිබුණාද?

පි : ඒ කාලයේත් තිබුණා

ප්‍ර : අදත් තියෙනවා?

පි : අදත් තියෙනවා.

ප්‍ර : හෙටත් තියේවි?

පි : හෙටත් තියේවි.

ප්‍ර : ඔබ හිතන විදියට මේ තත්ත්වය නැති කිරීම අපිට අපේ ජාතියේ ආරක්ෂාව තහවුරු කරන්න වඩාත් ප්‍රබල හේතුවක් වේවි නේද?

පි : අනිවාර්යයෙන්ම ස්වාමීනි උත්සාහයක හරි යෙදෙන්න පුළුවන් අර විදියේ මම දන්නේ නැහැ මණ්ඩලයක් පත් කරලා තොරතුරු හුවමාරු වෙන්නම ඕන. අපි තොරතුරු හුවමාරු කරලා ඒවා තවදුරටත් ඔප මට්ටම් කළහැකියි ස්වාමීනි. ඒක වෙන්නේ නැහැ. ඒක හරි කණගාටුදායක තත්ත්වයක්. අපි මේවා Saggest කරලා තිබුණා හුඟාක් කල් ස්වාමීනි. උත්සාහ කළා හුඟාක් අවස්ථාවල. නමුත් ක්‍රියාත්මක වීමේදී කොහොම හරි අර ඔබතුමා කිව්ව විදියටම ලකුණු දමා ගැනීමේ ...,

ප්‍ර : ඔබ විශේෂයෙන් ඒ කාලයේ යෝජනා කරපු දේවල් ක්‍රියාත්මක නොවිච්ච දේවල් පිළිබඳව අපිව දැනුවත් කරන්න බැරිද? අඩුම ගාණේ ලිපියක් මගින් අපේ ලේකම්තුමාව දැනුවත් කළොත් අපි

FAIR COMMENT
BY JEZEEM

ඒවා ගැන අධ්‍යයනයක් කරලා අපේ වාර්තාවට ඉදිරි කාලයේදී ඇතුළත් කරන්න පුළුවන් වේවි එහෙම වුණොත්?

පි : අපි දකින දෙයක් තමයි ස්වාමීනි අපිට එහෙම එක නිලධාරියෙක් ඒකේ විශේෂ හැකියාවල් මේවා කරගෙන එනකොට එයා මාරු වෙනවා. නැත්නම් උසස්වීම් ලැබෙනවා. එතකොට ඉතිං අපිට එයාගේ උසස්වීම වළක්වන්නත් බැහැ. ඒකත් අසාධාරණයි. එතකොට ඊළඟට නිලධාරියෙක් එනවා. ඉතිං මේක අඛණ්ඩව පවතින විදියක් ජේන්න නැහැ. ඉතිං සමහරවිට ඒ විෂය එහෙම්පිටින්ම වෙනස් වෙච්ච එකක් එයාට ඊගාවට හම්බ වෙන්නේ. එතකොට අර ආපු ගමන එහෙම්පිටින්ම කැඩෙනවා. ඉතිං හරි අමාරුයි ස්වාමීනි ඒ වගේ දෙයක් කර ගන්න.

ප්‍ර : ඔබට අවස්ථාවක් ලැබුණොත් එවැනි තොරතුරු පිළිබඳව අපව දැනුවත් කරන්න පුළුවන්ද ඉදිරි මාසයක කාලය ඇතුළත වගේ?

පි : අනිවාර්යයෙන්ම. මට එහෙම මගේ අදහස්, අර භාෂා පිළිබඳ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම ස්වාමීනි ඒක කරන්නම ඕන දෙයක්. මොකද අපිට අපි අතරේ ඉන්න පොලිස් නිලධාරීන් ගත්තොත් එහෙම අපිට සියයට ඉතාම සුළු සංඛ්‍යාවක් තමයි මේ භාෂා පිළිබඳ ප්‍රවීණත්වයක් තියෙන්නේ. ඉතිං මොකක් හරි Incentive එකක්, දිරි දීමනාවක් වගේ දේවල් දීලා ඒක දැන් වුණත් දැන් අපි උදාහරණයක් හැටියට ගත්තොත් මම Training School එකෙන් Out වෙනකොට මම දෙමළ Pass වී තිබිය යුතුයි. ඒක බොරුවට කරන්නේ. එහෙම නෙමෙයි දෙමළ කියන එක අපිට අත්‍යවශ්‍යයි. මම දුක් වෙනවා ස්වාමීනි මට දෙමළ බැරි වෙච්ච එක ගැන.

හොඳයි. Thank You.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබට ඔය බුද්ධි තොරතුරක් ලැබිලා තියෙනවා 04 වෙනිදා අප්‍රේල් මාසයේ?

පි : එහෙමයි.

ප්‍ර : ප්‍රහාරය වෙලා තියෙන්නේ අප්‍රේල් 21. එතකොට එම කාලය තුළ රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂවරයා පොලිස්පතිවරයාටත්, පොලිස්පතිවරයා විසින් අනෙකුත් පහළ නිලධාරීන්ටත් ආරක්ෂක උපක්‍රම යොදන ලෙස, ආරක්ෂාව යොදන ලෙස දැනුම් දීලා තියෙනවා. යම් හෙයකින් මෙම කාලසීමාව තුළ පහළ නිලධාරීන් කිසිදු නිසි ආරක්ෂක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකරනවා

FAIR COMMENT BY JEZEEM

නම් ඒ පිළිබඳ ආවේක්ෂණය කිරීමට රාජ්‍ය බුද්ධි අංශයට හැකියාවක් තියෙනවා නේද?

පි : නැහැ ස්වාමීනි. අපිට ඇත්ත වශයෙන්ම පොලීසියේ කටයුතු අධීක්ෂණය කරන්න අපිට සීමාවක් නැහැ. මොකද අපි අනුයුක්ත කරලා තියෙන්නේ රාජ්‍ය ආරක්ෂක ....,

ප්‍ර : නැහැ නැහැ. කෙළින්ම අධීක්ෂණය කිරීමක් නෙමෙයි. ඔවුන්ගේ රාජකාරී නෙමෙයි. මෙම දැන් ඔය ස්ථානවලට නිසි ආරක්ෂාවක් ලබා දී තිබෙනවද? නැද්ද? ඒවාගේ ආරක්ෂාව ප්‍රමාණවත්ද කියලා එම කාලසීමාව තුළ අප්‍රේල් 04 ඉඳන් 21 වෙනිදා කාලසීමාව තුළ එම තැන්වලට ආරක්ෂාව නිසිලෙස ලැබිලා තියෙනවද කියලා බුද්ධි අංශ මගින් සොයා බැලීමට හැකියාවක් තිබුණා නේද? තියෙනවා නේද?

පි : අනිවාර්යයෙන්ම. අනිවාර්යයෙන්ම. තිබුණා. හැකියාවක් තිබුණා. මේක පාවිච්චි කරපු අපි ඉදිරිපත් කරපු තොරතුරේ ගත්ත ක්‍රියාමාර්ගය වුණාද කියලා අපේ නිලධාරීන්ගේ මාර්ගයෙන් හොයා ගන්න තිබ්බා.

ප්‍ර : ඒ ආරක්ෂක නිසි පිළිවෙලට ....?

පි : ඒකත් වෙලා නැහැ කියලා තමයි කණගාටු.

ප්‍ර : එසේ නොවීමට නම් ඒ සම්බන්ධයෙන් වහාම නැවත වැඩිදුරටත් පියවරක් ගැනීම රාජ්‍ය බුද්ධි අංශය විසින් කළ යුතුයි නේද?

පි : අඩු තරමේ මතක් කිරීමක්වත්, සිහි කැඳවීමක්වත් කරන්න තිබ්බා ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන්. ඊළඟ ප්‍රශ්නය. දැන් ඔබ කිව්වා ආරක්ෂක ලේකම්වරයා වශයෙන් ආරක්ෂක කටයුතු පිළිබඳව දැනුමක් නැති නිලධාරියෙක් පත්වීම ආරක්ෂක කටයුතු නිසියාකාරයෙන් කරගෙන යාමට බාධාවක්ද?

පි : මගේ හැඟීම ස්වාමීනි ඒ ආරක්ෂක කටයුතු පිළිබඳ කෙනෙක් ඉන්නවා නම් වඩාත්ම සුදුසුයි. නමුත් එහෙමම විය යුතු නැහැ. නමුත් වඩා පහසුයි ඔහුට තියෙනවා සම්බන්ධීකරණය කිරීමේ හැකියාවක් දරපු නිලය අනුව. නමුත් එහෙමම වියයුතු නැහැ ස්වාමීනි.

ප්‍ර : සිවිල් පරිපාලන නිලධාරියෙක් ....?

පි : සිවිල් පරිපාලනයට කළ හැකියි.

****

FAIR COMMENT BY JEZEEM

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : ගජනායක මහත්මයා මම අර ඉස්සරලත් අහන්න හැදුව ප්‍රශ්නය තමයි 2011 න් පස්සේ ඔය Q Desk එකට මොකද වුණේ?

පි : තවමත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : තවමත් තියෙනවද?

පි : තවමත් තියෙනවා.

ප්‍ර : නමුත් ඒක ක්‍රියාකාරී තත්ත්වයේ පවතිනවද?

පි : මගේ දැනීම හැටියට තියෙනවා. ඔබතුමාට අර නිලධාරියාගෙන් වැඩි විස්තර දැන ගන්න පුළුවන් ස්වාමීනි. මම Retire වුණායින් පස්සේ අතන තියෙන සම්බන්ධකම් එහෙම්පිටින්ම නැති වෙනවා ස්වාමීනි.

ප්‍ර : ගිය අවුරුද්දේ මේ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් මොකක්වත් විස්තරයක් දැන ගන්න බැරි වුණාද? 2019 අප්‍රේල් සිද්ධිය සම්බන්ධයෙන් ඔය Desk එකෙන් මොකක්වත් විස්තරයක් දැන ගන්න බැරි වුණාද?

පි : මටනම් ඒ ගැන කියන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ දැන් ඔබ ඉන්න කාලයේ අර සිරියාවට ගියයි කිව්වනේ මේ තරුණයෝ?

පි : සිරියාවට නෙමෙයි මැලේසියාවට.

ප්‍ර : මැලේසියාවටද?

පි : මැලේසියාවට.

ප්‍ර : ඒ මැලේස්සියට ගියේ මොකද්ද කාරණය කියලා?

පි : ඒ ආගමික කටයුතු සඳහා තමයි. ආගමික කටයුතු සඳහා තමයි යන්නේ ස්වාමීනි.

ප්‍ර : සාමාන්‍යයෙන් කොච්චර වගේ ගිහිල්ලා තියෙනවද?

පි : ඒක විස්ස තිහ Group තමයි යන්නේ ස්වාමීනි. පහළොව විස්ස ඒ වගේ Groups යනවා එනවා. නිතර ගියා ඒත අපේ අසාමාන්‍ය යෑම් ඊමක් වුණා. ඒක තමයි අපේ අවධානයට යොමු වුණේ.

ප්‍ර : දැන් එතකොට දැන් විදේශවලින් තොරතුරු ලැබෙනවා නම් ඔය ලැබෙන්නේ ඔබටද?

පි : ස්වාමීනි.

ප්‍ර : විදේශවලින් යම්කිසි තොරතුරු ලැබෙනවා නම් ලැබෙන්නේ ඔබටද?

පි : අනිවාර්යයෙන්ම. අපි විදේශ රටවල් කිහිපයක් සමඟම ඉතාම කිට්ටුවෙන් සම්බන්ධකම් පැවැත්වුවා ස්වාමීනි. ඉතිං ඔවුන් අපි දුරකථනයෙන් පවා සම්බන්ධකම් පවත්වන මට්ටමකට අපි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගෙනත් තිබුණා. මම පුද්ගලිකව ගෙනත් තිබුණා. ඕන වෙලාවක මට ඔය, වෙන එකක් තියා උදාහරණයක් විදියට RAW එකේ නායකයාට මට කෙළින්ම කථා කරන්න පුළුවන් මට්ටමක් අපි හදාගෙන තිබුණා. ඔහුට ඕන නම් මට කථා කරන්න පුළුවන් මට්ටමක් අපි හදාගෙන තිබ්බා උදාහරණයක් හැටියට.

ප්‍ර : දැන් මැලේසියාවෙන් විස්තර දැන ගන්න බැරි වුණාද ඔය ගිය විෂය සම්බන්ධයෙන් මොකද්ද කළේ අරෙහේ මෙහේ කියලා?

පි : නැහැ ස්වාමීනි. අපිට ඒ දවස්වල, අවංකවම කියනවා නම් ඒ දවස්වල මේක තර්ජනයක් බවට අපිට තේරුණේ නැහැ. තර්ජනයක්, අපි දැන් නිරීක්ෂණය කළේ මේ මොකද යන්නේ කියන වගේ තමයි, තර්ජනයක් හැටියට අපිට දැනුනෙත් නැහැ. නමුත් අපේ වගකීමක් හැටියට අපි දැනුම් දුන්නා මෙන්න මෙහෙම අසාමාන්‍ය දෙයක් සිද්ධ වෙනවා කියන එක.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ට ගජනායක ඔබ සඳහන් කළා විශාල ලෙස විදේශ රටවල්වලින් ආගම ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පුද්ගලයන් ආවා කියලා. ඔබ අධ්‍යක්ෂ ලෙස 2011 වසර දක්වා සේවය කිරීමේදී ඔබට තොරතුරු වාර්තා වුණාද ශ්‍රී ලංකාවේ මුස්ලිම් තරුණ පිරිස් විශාල සංඛ්‍යාවක් අරාබි භාෂාව, කුරානය සහ ඉස්ලාම් ආගම පිළිබඳව අධ්‍යයනය සඳහා විදේශ රටවල්වලට යනවා කියලා?

පි : ආගමික කටයුතුවලට යනවා කියන එක තමයි අපිට තේරුණේ. ඉතිං ඒ තුළදී අනිවාර්යයෙන්ම අරාබි භාෂාව ඉගෙන ගන්නට හැකියාව ...,

ප්‍ර : ඒ කියන්නේ තරුණ පිරිස්?

පි : තරුණ පිරිස් ස්වාමීනි.

ප්‍ර : විශාල වශයෙන් යන බවට ...?

පි : විශාල වශයෙන් අර විදියේ මම කලින් සඳහන් කෙරුවේ 20, 15, 20, 15 ඒ වගේ. විශාල වශයෙන් නෙමෙයි. නමුත් ඔක්කොම එක්කහු වුණොත් ලොකු ගාණක් වෙනවා.

ප්‍ර : මොන රටවල්වලටද?

පි : මැලේසියාව, සෞදි අරාබියාව වගේ රටවල්වලට ස්වාමීනි.

ප්‍ර : තුර්කිය වගේ රටවල්වලට යන කවුරුත් .....?

පි : තුර්කියට මගේ මතකයේ හැටියට නම් නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොන ප්‍රදේශවල තරුණ පිරිස්ද මෙසේ යන්නේ කියලා?

පි : නැගෙනහිර. වැඩිපුරම නැගෙනහිර, පුත්තලමත් තිබුණා.

ප්‍ර : නැගෙනහිර සහ පුත්තලම?

පි : පුත්තලම.

ප්‍ර : නැගෙනහිර කියන්නේ කොහේද වාලච්චේන, මඩකලපුව, කාත්තන්කුඩිය කොහේද ඒ?

පි : ඒ ප්‍රදේශ තමයි. කාත්තන්කුඩිය නැගෙනහිර.

ප්‍ර : ඔබ ජාතික බුද්ධි ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන කාලයේදී ත්‍රිවිධ හමුදාවල්වල තිබිච්ච බුද්ධි ඒකක ප්‍රධානීන් සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරමින් ඔවුන්ගේ තොරතුරු ඔබ වෙත සම්ප්‍රේෂණය වීම වැනි දේවල් සිද්ධ වුණාද? ඔවුන්ගේ තොරතුරු?

පි : අනිවාර්යයෙන්ම. අපි සාකච්ඡා කරලා, හුඟාක් විශේෂයෙන්ම අපිට ඒ දවස්වල තිබුණේ ස්වාමීනි L.T.T.E. ප්‍රශ්නය අපට වැඩිපුර තිබ්බේ. නමුත් අපි සාකච්ඡා කෙරුවා. මගේ කාර්යාලයට ඒ කට්ටිය එනවා. මම ඒ කට්ටියගේ කාර්යාලවලට යනවා. එහෙම අපි ගිහිල්ලා අපි බොහොම කට්ටුවෙන් අපේ සම්බන්ධීකරණය සිද්ධ වුණා.

ප්‍ර : දැන් එහෙමනම් 2019 අප්‍රේල් 04 වෙනි දින ඔබ ජාතික බුද්ධි සේවයේ අධ්‍යක්ෂ ලෙස සිටියදී නම් ඔබ මෙම කොමිසම ඉදිරියේදී නිරීක්ෂණය කරපු බුද්ධි තොරතුරු විදේශීය බුද්ධි ආයතනයකින් ලැබුණු බුද්ධි තොරතුරු ඔබට ලැබුණු විගසම ඔබ Director of Military Intelligence සමඟ කථා කර මෙම බුද්ධි තොරතුරුවල තියෙන තොරතුරු පිළිබඳව වැඩිදුරටත් සොයා බලනවද?

පි : අනිවාර්යයෙන්ම ස්වාමීනි. මගේ කාලයේ නම් මගේ සහායට වෙනම යුධ හමුදා නිලධාරියෙක් මට දීලා තිබ්බා. මට දේශීයව එයාගේ සේවය මගේ Office එක තුළම ලැබුණා. දැන්නම් මම හිතන්නේ ඒක නැහැ. මට දීලා තිබ්බා යුධ හමුදාවෙන්, නාවික හමුදාවෙන්, ගුවන් හමුදාවෙන් මගේ සහායට දීලා තිබ්බා. ඉතිං මට හැම වෙලාවෙම ඒ කට්ටියත් එක්ක...,

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේදී ඔබ දැන් මීට පෙර සඳහන් කරපු ආකාරයට බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම පිළිබඳව ඔවුන්ගේ අකැමැත්තක් තිබුණාද?

පි : ඒක ඇවිල්ලා ඇතුළේ තියෙන දෙයක් ස්වාමීනි. ඒක නමුත් උඩින් අපිට පෙන්නුවාට සමහරවිට අකැමැත්තක් තියෙන්නත් පුළුවන්. නමුත් පොදුවේ අපේ විශේෂයෙන් L.T.T.E. සංවිධානය සම්බන්ධයෙන් නම් අපි හුඟාක් දුරට එකා වන් වැඩ කළා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ප්‍රකාශ කළා 2011 ඔබ සිටින කාලයේදී තබ්ලික් ජමාත්, තවුහිත් ජමාත් වැනි ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන පිළිබඳව ඔබට තොරතුරු වාර්තා වුණා කියලා. ඔබට වාර්තා වුණේ එම ආගමක අන්තවාදය මොන වගේ දේවල්ද කථා කරන්නේ කියලා?

පි : ඒක තමයි ස්වාමීනි. ඔවුන් සාමාන්‍ය සම්ප්‍රදායික මුස්ලිම්වරු විදියට නෙමෙයි ඔවුන් හැසිරුණේ. එයින් ඔබ්බට ගිහිල්ලා ඒක තමයි අපේ අවධානයට යොමු වුණේ. නමුත් මගේ කාලසීමාව තුළ කිසිම අවස්ථාවක ඔවුන් සාහසික ක්‍රියාවලට, ත්‍රස්තවාදී ක්‍රියාවලට පෙළඹවූ බවක් මට වාර්තා වුණේ නැහැ.

ප්‍ර : නැහැ. එහෙම නැතුව ඔබට වාර්තා වුණාද ඔවුන් ඒකදේවවාදය. එක දෙවි කෙනෙක් විතරයි සිටිය යුත්තේ. ඉස්ලාම් රාජ්‍යයක් ඇති කළ යුතුයි. එවැනි දේවල් ඔබට වාර්තා වුණේ නැහැ 2011 දී?

පි : නැහැ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබට වාර්තා වුණාද 2011 දී ජාතික තවුහිත් ජමාත් කියන සංවිධානය ගැන?

පි : ඔව්.

ප්‍ර : National Thawheeth Jamath?

පි : ඒක මට වාර්තා වුණාද කියලා මට හරියටම මතක, කොහොම හරි මගේ දැනීමේ තියෙනවා ඒ වචනය.

ප්‍ර : ඒ නායකයා පිළිබඳව සහරාන් හෂීම් ගැන?

පි : සහරාන් හෂීම් පස්සේ තමයි ඒක.

ප්‍ර : නමුත් 2011 දී වාර්තා වුණේ නැහැ?

පි : නැහැ. 2011 දී වාර්තා වුණේ නැහැ.

ප්‍ර : ඔබ සඳහන් කළා, කර තිබෙනවා මෙම කොමිසමේදී ඔබගේ ප්‍රකාශයේ ඉංග්‍රීසි භාෂාව මෙම බුද්ධි නිලධාරීන්ට Sorry, දෙමළ සහ අරාබි භාෂාව මෙම බුද්ධි නිලධාරීන් විසින් ප්‍රගුණ කළ යුතුයි කියා. IS වගේ ගෝලීය ත්‍රස්තවාදයක් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ඉංග්‍රීසි භාෂාව ඔබගේ බුද්ධි නිලධාරීන්ට මනා ලෙස ප්‍රගුණ කළ යුතුයි කියලා ඔබ සිතුවේ නැද්ද? ඔබ සිතන්නේ නැද්ද?

පි : ඒක සාමාන්‍ය දෙයක් ස්වාමීනි. නමුත් අරක විශේෂයි. දෙමළ සහ මුස්ලිම්, දෙමළ සහ අරාබි එක විශේෂයි.

ප්‍ර : ඒ වගේම දැන් ඔය ගෝලීය ත්‍රස්තවාදය පිළිබඳ දැනුම සහිත නිලධාරීන් ඔබගේ කාර්යාලයට ...?

FAIR COMMENT BY JEZEEM

පි : අපේ පුහුණු පාඨමාලා අභ්‍යන්තරවත්, විදේශවත් කෙරෙනවා ස්වාමීනි. අපේ ආයතනය මගින් විටින්විට පාඨමාලා කරනවා. ඒවායේදී ඔය වගේ කටයුතු සාකච්ඡාවට භාජනය කෙරෙනවා.

ප්‍ර : දැන් ඔබ අධ්‍යක්ෂ - බුද්ධි ලෙස සිටින කාලයේදී ඔය ISIS ත්‍රස්තවාදී සංවිධානය විසින් අපේ දකුණු ආසියා කලාපයේ රටවල්වල විවිධ ප්‍රහාරයන් එල්ල කළානේ. ඒ පිළිබඳව ඔබ සහ ඔබගේ බුද්ධි නිලධාරීන් දැනුවත්ව සිටියාද?

පි : මම හිතන්නේ අර Desk එකෙන් විශේෂ අංශයෙන් Monitor කරන්න ඇති ස්වාමීනි. මගේ පුද්ගලික දැනීමක් නම් නැහැ.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය. ඉස්ලාම් ආගමික අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව බුද්ධි තොරතුරු සෙවීම සඳහා තොරතුරුකරුවන් ලෙස ඉස්ලාම් ආගමික මුස්ලිම් අයවළුන් යෙදවීමේ අවධානමක් තිබෙනවාද?

පි : ඒක අපේ විශේෂ දක්ෂතාවයක් තියෙන්න ඕන මේ Agent Handling කියන එක ප්‍රධාන කාර්යයක් තමයි බුද්ධි අංශයක. නමුත් මුස්ලිම් අපේ L.T.T.E. ත්‍රස්තවාදීන් උදාහරණයකට ගත්තොත් එහෙම අපි ගාව හුඟාක් හිටියා ද්‍රවිඩ ඔත්තුකරුවන්. ඒ වගේ ස්වාමීනි මුස්ලිම් ඔත්තුකරුවන් බඳවා ගැනීමේ හැකියාවක් තියෙනවා. ඒකට උත්සාහ කරන්න ඕන. ලොකු වැයවීමක් කරන්න ඕන. ඉතිං කරන්න පුළුවන් ඒක.

ප්‍ර : මම තවදුරටත් ඒ ප්‍රශ්නයේම ඉස්සරහට යන්නම්. L.T.T.E. ත්‍රස්තවාදය සඳහා ද්‍රවිඩ ජාතිකයන් තොරතුරුකරුවන් සහ ඔත්තුකරුවන් හෝ යොදවා තොරතුරු ලබා ගැනීම සහ ඉස්ලාම් ආගම අදහන්නෙකු ඒ කියන්නේ එක දෙවියන් කෙනෙක් තමයි ඉන්නේ. ඉස්ලාම් අල්ලාහ් දෙවියන් ඉස්ලාම් රාජ්‍යය ගැන කථා කරන පරිසරයක් තුළ ඉස්ලාම්වරයෙකු විසින් ඉස්ලාම්වරයෙකුට විරුද්ධව බුද්ධි තොරතුරු නිවැරදි ලෙස ලබා දෙයිද?

පි : ඒක ඒ පුද්ගලයාගේ හැකියාව අනුව තමයි ස්වාමීනි ඒ පුද්ගලයාගේ දක්ෂතාවය අනුව ඔහු Handle කරන්න පුළුවන්. මොකද ඕනම මිනිහෙක්ගේ දුර්වලතාව තියෙනවා. සල්ලි තියෙනවා දුර්වලතා වෙන වෙන දුර්වලතා තියෙනවා. ඒවා හොයාගෙන ගිහිල්ලා අරයව ග්‍රහණයට අල්ලගන්න පුළුවන්කම තියෙන්න ඕන. ඒ Handle කරලා එයාව භාවිතා කරන පුද්ගලයා.

ප්‍ර : නිලධාරියාගේ දක්ෂතාවය තමයි?

පි : නිලධාරියාගේ දක්ෂතාවය අනුව. අපිට පහසුකම් තියෙනවා ඒවා ඕනතරම් අපිට එයාගේ දුර්වලතාවය හොයාගෙන ගිහිල්ලා, ඒවාට

FAIR COMMENT BY JEZEEM

දීලා එයාව අපේ පැත්තට නම්මා ගන්න හැකියාව තියෙනවා. එහෙම දැනටත් ඉන්නවා කිහිප දෙනෙක් ඉන්නවා අපි දැනුවත්ව. හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය බව පවසයි.

****

නීතීඥ ගිම්හානි ගමගේ මිය :

ප්‍ර : සාක්ෂිකරු ඔබ පවසා සිටියා මුස්ලිම් තරුණයන් පිටරටවල්වලට ආගම ඉගෙන ගැනීමට කණ්ඩායම් වශයෙන් පිටත් වුණා කියලා. මට දැන ගැනීමට අවශ්‍ය වන්නේ ඔවුන්ට ඒ සඳහා ආර්ථිකමය වශයෙන් දායකත්වය ලබා දුන් කණ්ඩායම් පිළිබඳව ඔබ දැනුවත්ව සිටියාද?

පි : ඒ දවස්වල බොහෝ සුළු වශයෙන් තමයි, 10, 15 තමයි යන්නේ. එතකොට අපි ඇත්ත වශයෙන්ම ඒක ලොකු ප්‍රශ්නයක් හැටියට ඒ දවස්වල ගත්තේ නැහැ. දැන් තමයි ඒවා අපිට අපේ අවධානයට යොමු වෙන්නේ.

ප්‍ර : දැන් ඒ කාලයේ ඔබ කිව්වා ඔවුන් කණ්ඩායම් වශයෙන් එහෙම ආගමික ලොකු ආගමික නැඹුරුවක් තියෙනවා ඔවුන් එහෙම කණ්ඩායම් වශයෙන් යන්න ගත්තා කියලා. එතකොට සොයලා බැලුවේ නැද්ද එයාලට ඔවුන්ගේ මුස්ලිම් පල්ලිවලින්ද ඒක කරන්නේ නැත්නම් වෙනත් සංවිධානයක් විසින්ද එය කරන්නේ කියලා?

පි : අනිවාර්යයෙන්ම මුස්ලිම් පල්ලි මේවාට උදව් කරනවා කියන එක පැහැදිලියි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඒ කාලයේ ඔබ බුද්ධි අධ්‍යක්ෂවරයා වශයෙන් සිටි කාලයේදී ලංකාවේ මුස්ලිම් සමූළු පවත්වා තිබෙනවාද?

පි : මුස්ලිම් සමූළු මගේ මතකයේ හැටියට විශාල රැස්වීමක් තිබ්බා බෙත්තාරාමයේ ස්වාමීනි මගේ මතකයේ හැටියට. ඒක මොකද්ද සමුළුවක් කියලා මතක නැහැ. යම්කිසි ලොකු රැස්වීමක් තිබ්බා බෙත්තාරාමයේ.

ප්‍ර : ළඟකදී තිබුණා බෝරා මුස්ලිම් සමුළුවක් කියලා. ඔබ ඒ පිළිබඳව ...?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක අන්තවාදී සංවිධානයක් නෙමෙයි ස්වාමීනි. ඒක ඇවිල්ලා බෝම්බ නිශ්චිත පුද්ගලයෝ කණ්ඩායමකගේ හමුවීමක්. ඒක අවුරුදු කිහිපයක් ලංකාවේ වෙනවා. මේ ළඟදිත් මම හිතන්නේ තිබුණා ස්වාමීනි. ඒක අපි Monitor කරනවා. නමුත් මේකෙන් තර්ජනයක් කොහෙත්ම නැහැ.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ ඔබට තොරතුරු ලැබුණහම ඒ පිළිබඳ විශ්ලේෂණයක් කරනවා කියලා. දැන් 2004 සිටම අර Speacial Desk එකකුත් දාලා මුස්ලිම් ආගමට එයාලගේ නැඹුරුතාවයක් තියෙන අන්තවාදී පැත්තකට නැඹුරු වෙනවා කියලා දැනගෙන තිබිලා ඒ කාලයේ Prediction එකක් තිබ්බේ නැද්ද එතකොට මෙයාලා මොන පැත්තටද යන්නේ කියලා?

පි : අපිට අනිවාර්යයෙන් තේරුණා ස්වාමීනි. මේක අසාමාන්‍ය විදියට සම්ප්‍රදානුකූලව මුස්ලිම්වරුන්ගෙන් ඔබ්බට යන ගතියක් තේරුණා. ඒක තමයි අපි විශේෂයෙන්ම අපි විශේෂ Desk එකක් දාලා මගේ පාලනය තුළ මම වෙනම නිලධාරියෙක් අපට තේරුණා තර්ජනයක් මේකේ එනවා කියලා.

ප්‍ර : මොන වගේ තර්ජනයක් ගැනද? දැන් ඒ කියන්නේ දැන් ඒක මේ වගේ ත්‍රස්තවාදී තර්ජනයක් දක්වා යා හැකියි කියලා Prediction එකක් කළේ නැද්ද?

පි : තරුණ පිරිස් එක්කහු වුණාම ආවේගශීලීව කථා කරනවා. අපට තේරුණා මේකේ අර සම්ප්‍රදානුකූල ආගමෙන් එළියට ගිහිල්ලා මේකට්ටිය Radical දැඩි මතධාරී පිරිසක් බිහි වෙන්න යනවා කියන එක අපට තේරුණා.

ප්‍ර : මගේ ඊළඟ ප්‍රශ්නය වෙන්නේ මේ ආරක්ෂක කවුන්සලයේදී ඔබලා දෙන තොරතුරු සම්බන්ධයෙන්. දැන් ඔබ ආරක්ෂක බුද්ධි අධ්‍යක්ෂ වශයෙන් සිටියදී මේ වගේ ආරක්ෂක තොරතුරක් පොලීසියට දීමෙන්, පොලීසියේ, පොලිස්පතිට දීමෙන් සහ පොලිස් නිලධාරීන් අතට පත්වීමෙන් ඒ තොරතුරු සම්බන්ධයෙන් ඔබ ඔවුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ කුමන ආකාරයේ Steps ගැනීමක්ද? එයාලා මොන වගේ ක්‍රියාමාර්ගයක්ද?

පි : අපි බලාපොරොත්තු වෙන්නේ ස්වාමීනි සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න. සුදුසු ක්‍රියාමාර්ගයක් කියන්නේ ඒ තොරතුරේ හැටියට. විශේෂයෙන්ම අප්‍රේල් 09 වෙනිදා හම්බ වෙච්ච තොරතුරට නම් අනිවාර්යයෙන්ම පිරිස් බලය යොදවන්නට තිබ්බා. සාමාන්‍ය දෙයක් ඒක. ඉතාම සරළ දෙයක්. පිරිස් බලය යෙදෙව්වා නම්, එක පල්ලියකට රේඩියෝකාරයෙක් ගාණේ දාලා තිබ්බා නම් ඒක දැක්කහම ත්‍රස්තවාදියා අහක බලාගෙන යනවා. මොකද

FAIR COMMENT BY JEZEEM

ත්‍රස්තවාදියා Alert එක තියෙන තැනට එන්නේ නැහැ කවදාවත්. ඔහු යන්නේ හැම වෙලාවෙම Alert නැති තැනකට. ඉතිං අපේ යුතුකම තමයි ඒ තැන් Alert කරන එක. ඉතිං Alert කිරීම කියන්නේ අපි ආයුධ සන්නද්ධ දෙන්නෙක් පේන්න දැම්මා නම්, රේඩියෝකාරයෙක් දැම්මා නම් එයා හිතනවා රයිට් අපේ තොරතුර පිටට ඇවිල්ලා. ඒ හන්දා එයාගේ ක්‍රියාදාමය එයා ආපස්සට හැරෙනවා.

ප්‍ර : එතකොට ඔබ පිළිගන්නවද රාජ්‍ය බුද්ධි අංශයෙන් වුණත් මේ පිළිබඳව කාදිනල්තුමාව දැනුවත් කිරීමේ හැකියාවක් තිබුණා කියලා?

පි : මට කියන්න බැහැ කොහොමද, මම හිටියා නම් ස්වාමීනි මම කාදිනල්තුමා දැනුවත් කිරීම මට මම දන්නේ නැහැ මොන Protocol එකක්ද ඒකට තියෙන්නේ කියලා. නමුත් මම අනිවාර්යයෙන්ම ඒ දේවස්ථානවලට මට ගිහිල්ලා ඒ අදාළ දේවස්ථානවල පූජකතුමන්ලට දැනුවත් කිරීමේ හැකියාවක් තියෙනවා. තිබිය යුතුයි. ඒක වගකීමක්.

****

ගරු සභාපතිතුමා :

ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යභාරය සඳහා දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

සාක්ෂිකරුව මුදා හරිමි.

නැවතත් කොමිෂන් සභාවේ කටයුතු මාධ්‍යයට විවෘත කරමි.

දැන් වේලාව ප.ව. 3.55 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.29 වේලාව :- ප.ව. 3.55

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංක : 696

01.	සම්පූර්ණ නම	:	සතරසිංහ ආරච්චිගේ ෂර්ලි ග්ලැඩ්වින් සතරසිංහ
02.	වයස	:	අවුරුදු 55 යි
03.	ජාතිය	:	සිංහල
04.	ආගම	:	බුද්ධාගම
05.	තනතුර	:	සහකාර පොලිස් අධිකාරී (ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය)
06.	ලිපිනය	:	අංක 44/9/බී, යක්කල පාර, ගම්පහ.

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : සතරසිංහ මහත්මයා, ඔබ පොලිස් දෙපාර්ත්මේන්තුවේ සේවය සඳහා බැඳුණේ කවදද?

පි : 1990.05.27

ප්‍ර : ඒ කුමන තනතුරකටද?

පි : උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා.

ප්‍ර : එතැන් පටන් ඔබ මේ දක්වා පොලිස් දෙපාර්තමේන්තුවේ ලබා ඇති උසස්වීම් මොනවාද?

පි : මම IP නිලයට උසස් වුණා. ඊට පස්සේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර, ඊට පස්සේ දැන් සහකාර පොලිස් අධිකාරීවරයෙක් වශයෙන් සේවය කරනවා.

ප්‍ර : ඔබ යම් අවස්ථාවකදී ඔය සේවා කාලය තුළදී ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ සේවය සඳහා අනුයුක්ත වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කවදද?

පි : 1994.08.31

ප්‍ර : ඔබ තවමත් එම ස්ථානයේම නේද සේවය කරන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ 2019 ජනවාරී ඉඳලා අප්‍රේල් මාසය දක්වා වූ කාලය තුළදීත් සේවය කළේ එම ස්ථානයේදීමද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොන වගේ තනතුරක්ද ඔබ ඒ අවස්ථාවේදී, ඔබ කිව්වනේ සහකාර පොලිස් අධිකාරීවරයෙක් කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔය විෂය සම්බන්ධයෙන් බැලුවහම මොන වගේ කාර්යභාරයක්ද ඔබ කළේ?

පි : මම පෙර ආරක්ෂක රාජකාරීත් කළා. ඒ එක්කම ප්‍රවර්ධන අංශයේ රාජකාරීත් අධීක්ෂණය කළා ස්වාමීනි.

ප්‍ර : අපට ඒ කාර්යය ගැන වැඩි පැහැදිලිකමක් නැති නිසා ඔබට පුළුවන්ද ඒවා ගැන කෙටියෙන් පැහැදිලි කරන්නට?

පි : පෙර ආරක්ෂක රාජකාරී කියන්නේ අතිගරු ජනාධිපතිතුමා පිටත ස්ථානවල සහභාගී වන උත්සවවල රාජකාරී මෙහෙයවීම. ඒ කියන්නේ Office එකෙන් එහෙම නැත්නම් නිවසෙන් බාහිරව සහභාගී වන රාජකාරීවල.

ප්‍ර : ඔය ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ඉන්නවද?

පි : ඒ වකවානුවේ හිටියා ස්වාමීනි.

ප්‍ර : ඔබ ඒ වකවානුව කියලා අදහස් කරන්නේ මොන වකවානුවද?

පි : හිටපු ජනාධිපතිතුමාගේ සේවා කාලය.

ප්‍ර : ඔබ හිටපු ජනාධිපතිතුමා කියලා කාවද අදහස් කළේ?

පි : මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා.

ප්‍ර : එහෙමනම් මා කිව්වෝතින් නිවැරදිද 2019 ජනවාරි ඉඳලා 2019 අප්‍රේල් වෙනකොටත් ඔබ ඔය සඳහන් කරපු නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒ තනතුරේ කටයුතු කළා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔහුගේ නම මොකද්ද?

පි : රොහාන් සිල්වා මහතා.

ප්‍ර : ඔබ කිව්වනේ ඔය ජනාධිපතිතුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබුවාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට කොයි ආකාරයටද එතුමාගේ ආරක්ෂාව පිළිබඳව තක්සේරු කරනු ලැබුවේ? මොන ක්‍රමවේදයන්ද ඒ සම්බන්ධයෙන් අනුගමනය කළේ?

පි : ප්‍රධාන වශයෙන් රාජ්‍ය බුද්ධි සේවයෙන් තොරතුරු ලබා ගන්නවා. පොලීසිවලින්, අපේ සංචාරයේ යන අදාළ පොලීසිවලින්, අපේ බුද්ධි අංශ මගින් ඒවා තොරතුරු ලබා ගන්න ප්‍රධාන වශයෙන් රාජ්‍ය බුද්ධි අංශයේ තොරතුරු තමයි අපි ලබා ගන්නේ.

ප්‍ර : ඔය ඔබ සඳහන් කරන ලද විවිධ ආයතන වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා යම් හමුවීම් තිබුණද?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ හමුවීම් කොපමණ කාලයකට සැරයක්ද පැවැත්වුණේ?

පි : විශේෂයෙන්ම මාසයකට වරක් ඒ විවිධ බුද්ධි අංශ, වෙනත් විශේෂ කොට්ඨාශ ගෙනල්ලා සාකච්ඡා කරනවා. ඊට අමතරව සුවිශේෂී රාජකාරියක් වෙතොත් විශේෂයෙන්ම ඒ කොටස් අදාළ අංශ ගෙන්වලා ඒ පිළිබඳව සාකච්ඡා කරලා අවශ්‍ය උපදෙස් ලබා ගන්නවා.

ප්‍ර : ඔබ සුවිශේෂී රාජකාරියක් කියලා ඔබේ පිළිතුරෙහි සඳහන් කරනු ලැබුවා. මොකද්ද ඒකෙන් අදහස් කරන්නේ?

පි : සාමාන්‍යයෙන් නිදහස් දින උත්සවයක්, එහෙම නැත්නම් විශාල ප්‍රමාණයේ වෙනත් උත්සව සාමාන්‍යයෙන් සිද්ධ වෙනවා. ඒ වගේ දේවල් තමයි සුවිශේෂී රාජකාරී වන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ගරු ජනාධිපතිතුමා විශේෂයෙන් සහභාගී වන්නා වූ යම් උත්සවයක් තිබෙනවා නම් ඒ පිළිබඳව ආරක්ෂිත තත්ත්වය පිළිබඳ තක්සේරුවක් කෙරුවද?

පි : ජනාධිපතිතුමා සහභාගී වන සියළුම රාජකාරීවලදී තක්සේරු වාර්තාවක් ලැබෙනවා ස්වාමීනි. අර වගේ විශාල ප්‍රමාණවල උත්සවයන් තියෙනකොට අදාළ නියෝජිතයන් ගෙන්වලා ඒ පිළිබඳව සියළු දෙනාම දැනුවත් කිරීමක් සිද්ධ වෙනවා.

ප්‍ර : ඔබ කිව්වා විවිධ ආයතන වෙතින් ආරක්ෂිත තත්ත්වය පිළිබඳව වාර්තාවන් කැඳවනු ලබනවයි කියලා මේ මාසිකව පවත්වනු ලැබූ ඒ රැස්වීම්වලදී?

පි : මාසිකව පවත්වන රැස්වීම්වලදී ඒ අදාළ විවිධ විශේෂයෙන් කොට්ඨාශවලින් නියෝජිතයින් ඇවිල්ලා ඒ සාකච්ඡාවට සහභාගී වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔවුන්ට කොහොමද රැස්වීම පවත්වන දිනය පිළිබඳව දැනුම් දෙන්නේ?

පි : ඒක නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කාර්යාලයෙන් තමයි සිද්ධ වෙන්නේ. පිටත රාජකාරී නැති දවසක හුඟක් වෙලාවට ඒ දවස තීරණය වුණේ හැම මාසෙකම වාගේ අඟහරුවාදා දවසක්. මොකද Cabinet රැස්වීම් තියෙන දවසේ අතිගරු ජනාධිපතිතුමා කොළඹ රැඳෙන නිසා.

ප්‍ර : දැන් ඒ රැස්වීම් එතකොට හැම අවස්ථාවකදීම එවකට එම අංශය භාරව රාජකාරී කළ නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන්ද පැවැත්වුණේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සතරසිංහ මහත්මයා ඔබ ඒ රැස්වීම්වලට සහභාගී වුණාද?

පි : සහභාගී වුණා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : එම රැස්වීම්වලදී කරනු ලබන සාකච්ඡාවන්වල තොරතුරු යම් ආකාරයක වාර්තාගත කිරීමක් සිදු කරනු ලැබුවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වාර්තාගත කිරීම සිදු කළේ කොහේද?

පි : ඒක නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාර විසින් ඒ වාර්තාගත කිරීම කරලා ඒක ඊට පස්සේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒක බලලා, අත්සන් කරලා උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ ඒක අලවනවා ස්වාමීනි.

ප්‍ර : ඒකේ අලවනවා. හොඳයි. එතකොට ඒ පොත සාමාන්‍යයෙන් දිගටම නඩත්තු කරගෙන යනවා නේද ඒ කාලය තුළදී?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබත් ඒ රැස්වීම්වලට සහභාගී වුණා කිව්වනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද 2019 ජනවාරි මාසයේ ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව යම් තක්සේරුවක් කරනු ලැබුවද කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කවදද ඒක පැවැත්වුවේ?

පි : 2019.01.23

ප්‍ර : ඔබ ඒ රැස්වීමට සහභාගී වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහත්මයා ඒකට සහභාගී වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් කුමන නිලධාරියෙක්ද ඒ රැස්වීමට සහභාගී වුණේ?

පි : රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් පොලිස් අධිකාරී, ජනක සෙනෙවිරත්න මහතා.

(ඉංග්‍රීසි භාෂාවෙන් පැහැදිලි කරනු ලබයි)

ප්‍ර : එතුමා ඒ රැස්වීමට සහභාගී වෙමින් මොන කරුණුද මේ ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳ තක්සේරුවේදී ජනවාරී මාසේ ඔබලාට දැනුම් දීලා තියෙන්නේ?

පි : දෙමළ ඊයස් පෝරාව විදෙස් ක්‍රියාකාරකම් සම්බන්ධව දැනුම් දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ ගැන පමණයිද?

පි : නැහැ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මහා .....,

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : I think I will ask specific question otherwise unnecessary information will come. ජනවාරි ඒ කියන්නේ ඔබ කියන්නේ කරුණු කිහිපයක් පිළිබඳව 2019 ජනවාරි මාසේ 23 වෙනිදා පැවති මේ රැස්වීමේදී දැනුම් දීලා තියෙනවා කියලනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොයි වෙලාවකවත් පොලිස් අධිකාරි, ජනක සෙනෙවිරත්න මහත්මයා රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් ඔබලාගේ අවධානයට ගෙනල්ලා තියෙනවද ඒ වනවිට වනාතවිල්ලුවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ වැටලීමක ප්‍රතිඵලය අනුව යම් පුපුරණ ද්‍රව්‍ය සොයාගෙන තියෙනවාය කියලා?

පි : ඒ ජනවාරි 23 වෙනිදා තියෙන රැස්වීමේදී ඒ සම්බන්ධව දැනුම් දීලා නැහැ ස්වාමීනි.

ප්‍ර : කියලා නැහැ. එහෙමනම් අනිවාර්යයෙන්ම මේ වනාතවිල්ලුව සිද්ධියට අදාළව මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිමවලට හානි කිරීම් සම්බන්ධයෙන් සැක කරනු ලබන පුද්ගලයින්ගේ සම්බන්ධතාවයක් පිළිබඳවත් එහි සඳහන් කරලා නැතුව ඇති නේද?

පි : එහෙමයි ස්වාමීනි. එම රැස්වීමේදී, වෙනත් රැස්වීමේදී ....,

ප්‍ර : ඒකේ කියලා නැහැ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට පුළුවන්ද මේ අවස්ථාවේ 2019 ජනවාරී මාසේ 23 වෙනිදා ඒ පවත්වන ලද රැස්වීමේ සටහන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම සටහන් ඔබ කිව්වා නියෝජ්‍ය පොලිස්පති, රොහාන් සිල්වා මහතා විසින් පරීක්ෂා කරලා අත්සන් කරනු ලබනවාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහොමද ඔහු අත්සන් කරන්නේ? කොහෙද ඔහු අත්සන් කරන්නේ?

පි : මෙම ලේඛනය පුද්ගලික සහකාර විසින් සකස් කරලා Computerගත කරායින් පස්සේ ඒක ආපහු බලලා ඒකේ පල්ලෙහා අවසානයේදී අත්සන් කරනවා.

ප්‍ර : අත්සන් කරනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔහු ඔහුගේ මුද්‍රාව යොදනවද?

පි : නිල මුද්‍රාව තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නම ලියනවා, මුද්‍රාව තබනවා?

පි : එහෙමයි ස්වාමීනි. නම Computer කරලා තියෙනවා. නම සහිතව තියෙන මුද්‍රාව ඊට පස්සේ යොදලා තියෙනවා.

ප්‍ර : ඔබ රොහාන් සිල්වා මහතාගේ අත්සන හඳුනනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොන අවස්ථානුගත කරුණු යටතේද ඔබට ඔහුගේ අත්සන දකින්නට ලැබිලා තියෙන්නේ?

පි : බොහෝ රාජකාරී නියෝග නිකුත් කරනවා. අනෙකුත් ලියකියවිලි අත්සන් කරලා තියෙනවා. ඒක නිසා මේක බොහොම පුරුදු අත්සනක් ස්වාමීනි.

ප්‍ර : පුරුදුයි?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන 2019 ජනවාරී 23 දින දරන ඒ රැස්වීමේ සටහන් නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහතා විසින් අත්සන් කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2019 ජනවාරී මස 23 වන දින නිලධාරීන්ගේ ගමන් සටහන් පොතෙහි අලවා ඇති එදින පවත්වන ලද රැස්වීමේ විස්තර C-741 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

ප්‍ර : දැන් ඔය ජනවාරී මාසයේ පවත්වපු රැස්වීම ගැණනේ සතරසිංහ මහත්මයා කිව්වේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට 2019 පෙබරවාරී මාසෙත් ඔය වගේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා රැස්වීමක් පැවැත්වුවද?

පි : ස්වාමීනි දෙකක් පවත්වලා තියෙනවා.

ප්‍ර : මට කියන්නකෝ සාමාන්‍ය මාසික රැස්වීම ගැන?

පි : 2019.02.15 වෙනිදා පවත්වලා තියෙනවා.

ප්‍ර : ඒ රැස්වීමටත් රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් නිලධාරියෙක් පැමිණියද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කවුද?

පි : පොලිස් අධිකාරී, ජනක සෙනෙවිරත්න මහතා.

ප්‍ර : ඔබතුමා ඒ රැස්වීමට සහභාගී වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබේ නියෝජ්‍ය පොලිස්පතිවරයා වන රොහාන් සිල්වා මහත්මයා එයට සහභාගී වුණාද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ රැස්වීමේදී පොලිස් අධිකාරී ජනක සෙනෙවිරත්න මහත්මයා ISIS සංවිධානය පිළිබඳව යම් කරුණු අනාවරණය කිරීමක් කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද ඔහු කිව්වේ? You can read out those to three paragraph. All to gather what you have high lighted? ඒ ඔක්කොම කියවන්න?

පි : ශ්‍රී ලංකාව තුළ ISIS සංවිධානයේ ක්‍රියාකාරීන් වශයෙන් සිටි 28 ක් සිරියාවට පිටව ගොස් ඇති බවත්, ඉන් 03 ක් ගුවන් ප්‍රහාරයකින් මිය ගොස් ඇති බවත් සඳහන් කරලා තියෙනවා. ඊට පස්සේ තියෙනවා ISIS මතවාද දරන 100 කට වැඩි පිරිසක් ශ්‍රී ලංකාව තුළ වෙසෙන බවත්, ඔවුන් කොළඹ, මහනුවර, මඩකලපුව යන ප්‍රදේශවල වෙසෙන බවත්, මින් මඩකලපුව ප්‍රදේශයේ ක්‍රියාත්මක National Thawheeth Jamath සංවිධානය විසින් මෙම සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවකදී අන්‍ය ආගමිකයන් විනාශ කිරීමෙන් මෙරට ඉස්ලාම් රාජ්‍යයක් ස්ථාපනය කළහැකි බවට අදහස් දක්වා ඇති බව. මහනුවර හා මාවනැල්ල ප්‍රදේශවල බුද්ධ ප්‍රතිමාවලට ප්‍රහාර සිදුකළ හදුනාගත් කණ්ඩායම් සමාජ ජාලා වෙබ් අඩවි තුළින් ISIS මතවාද හදුනාගෙන ක්‍රියාත්මක කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව.

ප්‍ර : ඒ හැරෙන්නට ඔහු තවත් කරුණු රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් ඉදිරිපත් කරලා තියෙනවා අනෙකුත් විෂය පථයන්වලට නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට පුළුවන්ද 2019 පෙබරවාරි 15 වෙනිදා පවත්වන ලද මාසික ආරක්ෂණ තත්ත්ව තක්සේරුවට අදාළ වාර්තාව ඉදිරිපත් කරන්නට?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම වාර්තාවත් ඔබ කලින් සඳහන් කළ ආකාරයට නියෝජ්‍ය පොලිස්පති, රොහාන් සිල්වා මහතා විසින් අත්සන් කරලා තියෙන වාර්තාවක්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2019 පෙබරවාරී මස 15 වන දින නිලධාරීන්ගේ ගමන් සටහන් පොතෙහි නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහතා විසින් අත්සන් කොට ඇති එම මාසික රැස්වීමේ වාර්තාව C-742 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ කිව්වනේ ඔබලාගේ රැස්වීම් පවත්වන්නේ මාසිකව කියලා මේ තක්සේරුව ලබා ගන්නට?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මාර්තු මාසේ රැස්වීමක් පැවැත්වුවද?

පි : මාර්තු මාසයේ රැස්වීමක් පවත්වලා නැහැ ස්වාමීනි.

ප්‍ර : හැබැයි මාසිකව නේද පවත්වන්නේ?

පි : විශේෂ රාජකාරී අධිකව යෙදිලා තිබුණොත් එහෙම, තව එතුමා විදේශගත වෙලා තිබුණොත් එහෙම පවත්වන්නේ නැහැ.

ප්‍ර : එතකොට එහෙමනම් ඊළඟ රැස්වීම පැවැත්වුවේ කවදද?

පි : 2019.04.18 වෙනිදා.

ප්‍ර : 04.18 වෙනිදා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම රැස්වීමට ඔබ සහභාගී වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහතාගේ මූලිකත්වයෙන්ද එය පැවැත්වුවේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් කවුද සහභාගී වුණේ?

පි : පොලිස් අධිකාරී, ජනක සෙනෙවිරත්න මහතා.

ප්‍ර : පොලිස් අධිකාරී, ජනක සෙනෙවිරත්න මහතා ISIS සංවිධානයට අදාළ යම් තොරතුරු මෙම රැස්වීමේදී ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව තක්සේරු කිරීම සඳහා ඔබලාගේ අවධානයට ඉදිරිපත් කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඔහු කිව්වේ?

පි : කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍රය කර ගනිමින් ISIS සංවිධානයට සම්බන්ධ National Thawheeth Jamath සංවිධානයේ නායක මොහොමඩ් තාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් මෙරට අන්‍යා ආගමිකයන් ඝාතනය කළයුතු බවට තම අනුගාමිකයන් දැනුවත් කර ඇති බව.

ප්‍ර : ඔබට එදිනට අදාළ රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කරන්නට පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි 2019 අප්‍රේල් මස 18 වන දින නිලධාරීන්ගේ ගමන් සටහන් පොතෙහි එදින පවත්වන ලද ආරක්ෂක රැස්වීම් වාර්තාව C-743 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : C-743 ලේඛනය අනුව ඔබට කියන්නට පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් පැමිණි එම නිලධාරියා විසින් දක්වන ලද කරුණුවලට පසුව ඒ පිළිබඳව නැවතත්, ඒ කියන්නේ ISIS සංවිධානය පිළිබඳව නැවතත් ඔය රැස්වීමේදී සාකච්ඡා කරලා තියෙනවද කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද වෙලා තියෙන්නේ?

පි : ඒකේ නියෝජ්‍ය පොලිස්පති, රොහාන් සිල්වා මහතා සඳහන් කරලා තියෙනවා ISIS සංවිධානයට සම්බන්ධ පුද්ගලයින් තම අතට හසුවන කුමක් හෝ යමකින් මිනිස් ඝාතන සිදු කිරීමේ අරමුණින් සිටින බැවින්, බුද්ධි තොරතුරු ඉතා වැදගත් වන බව මා දන්වන ලදී.

ප්‍ර : දැන් ඊට ඉස්සර වෙලා මේ නියෝජ්‍ය පොලිස්පතිවරයා තවත් කරුණක් කියලා තියෙනවද? ඔය රැස් වූ අයගේ අවධානයට යොමු කිරීමට?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද කියලා තියෙන්නේ?

පි : පවතින දේශපාලන වාතාවරණය හා ඉදිරියේදී මැතිවරණ සමයක් එළඹෙන බැවින් ප්‍රභූවරයා ආරක්ෂා කිරීමේදී බුද්ධි තොරතුරු මත පදනම්ව ක්‍රියාත්මක වීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී.

(ස්වාමීනි එම තොරතුරු දෙකම C-743(a) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

දැන් වේලාව : ප.ව. 4.20 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 4.20 යි.
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය :</u>

ප : ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා අප්‍රේල් මාසේ ඒම රැස්වීම පවත්වනු ලැබුවේ 2019 අප්‍රේල් 18 වෙනිදා කියලා?

පි : ඒහෙමයි ස්වාමිනි.

ප : දැන් ඔය රැස්වීමේදී කොයිම වෙලාවකවත් රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් පොලිස් අධිකාරී ජනක සෙනෙවිරත්න මහත්මයා ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ අවධානයට යොමු කරලා තියෙනවද විදේශයකින් යම් බුද්ධි තොරතුරක් හෝ අඩුගානේ තොරතුරක් ලැබිලා තියෙනවය කියලා යම් ප්‍රහාරයක් සිදුවීමේ ඉඩකඩ තිබෙන බවට?

පි : නැත ස්වාමිනි.

ප : එහෙම තොරතුරක් ලැබිලා නැහැ?

පි : ලැබිලා නැහැ ස්වාමිනි.

ප : එතකොට මේ අවස්ථාව වන විට එදින ඔබලාගේ අවධානයට යොමු කරලා තියෙනවද ඒදින පැවති රැස්වීමේදි මම කියන්නේ?

පි : ඒහෙමයි ස්වාමිනි.

ප : අර රොහාන් සිල්වා මහත්මයා යම් නිරීක්ෂණයක් කෙරුවානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඊට පස්සේ හෝ ඔබේ, ඔබේ කියලා මම අදහස් කරන්නේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය විසින් මේ පවත්වනු ලැබූ මේ රැස්වීමේදී අවධානයට යොමු කරලා තියෙනවද වනාතවිල්ලුවේදි 2019 ජනවාරි 16 වෙනිදා සොයා ගනු ලැබූ පුපුරණ ද්‍රව්‍ය පිළිබඳව?

පි : නැත ස්වාමිනි.

ප : 2018 දෙසැම්බර් මාසයේදී මාවනැල්ල ප්‍රදේශයේ බුද්ධ ප්‍රතිමා කීපයකට හානි සිදු කරමින් ඒ වගේම හින්දු කෝවිල් වල තිබූ ඇතැම් ප්‍රතිමාවලට හානි කරමින් යම් යම් සිද්ධීන් සිදු වෙලා තිබුන බව?

පි : නැත ස්වාමිනි.

ප : බුද්ධ ප්‍රතිමාවලට හානි කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ පුද්ගලයින් ලැට්ටෝස් වත්තේ ඒ කියන්නේ වනාතවිල්ලුවේ පුපුරණ ද්‍රව්‍ය සොයා ගනු ලැබූ ඒ අවස්ථාවේ ඒකට අදාල පුද්ගලයින් සමඟ සම්බන්ධකම් තිබුණ බව?

පි : නැත ස්වාමිනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම මාවනැල්ල ප්‍රදේශයේ කබීර් හෂීම් ඒවකට ගරු ඇමතිතුමාගේ ලේකම්වරයෙක් වූ තස්ලින් නැමැත්තාට ඔහුගේ මරණය සිදු කිරීමට තැත් කිරීමක් සිදු වෙලා තිබුණ බව?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒ කිසිම කරුණක් පිළිබඳව සඳහන් වෙලා නැහැ ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ වගේම කාත්තන්කුඩිය ප්‍රදේශයේ සිදු වූ බයිසිකල් බෝම්බ පිපිරීමක් පිලිබඳවත් එහි සඳහන් වෙලා නැහැ කියලා මා කිව්වොතින් නිවැරදි ද ඒ අවස්ථාවේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැනුම් දීමක් කරලා නැහැ ඔබලාට?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ මෙතෙක් වෙලා මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවේ ඔය මාසිකව පවත්වනු ලබන රැස්වීම් ගැනනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබේ පිළිතුරෙහි අද දින සඳහන් කරනු ලැබුවා මේ මාසික රැස්වීම් හැරෙන්නට යම් විශේෂ අවස්ථාවලදීත් රැස්වීම් පවත්වලා තක්සේරු වාර්තාවන් ලබා ගන්නවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට එහෙම නම් අපේ රටට නිදහස ලැබුණු දිනය විදියට අපි සාමාන්‍යයෙන් පෙබරවාරී මාසේ 4 වෙනිදා නිදහස් උත්සවය සමරනවානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : 2019 පෙබරවාරී 4 වෙනිදා නිදහස් උත්සවය පවත්වන කොට ගරු ජනාධිපතිතුමා එවකට ගරු ජනාධිපති ලෙස කටයුතු කරන ලද, ඒ තනතුරේ සිටි මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සහභාගී වුනානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒකට ලොකු ජන සංඛ්‍යාවකුත් රටවැසියන්. විදේශිකයන් සහභාගී වෙනවානේ?

පි : එහෙමයි ස්වාමිනි

ප්‍ර : එතකොට ඒ පිළිබඳව තක්සේරු වාර්තාවක්, ආරක්ෂිත තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා ගන්නට කටයුතු කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් වූ රැස්වීම තිබ්බේ කවද්ද?

පි : 2019 පෙබරවාරී මස 03 වන දින.

ප්‍ර : ඒ කියන්නේ නිදහස් දිනයට පෙර දිනයේදී නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහිදී ඔය රාජ්‍ය බුද්ධි සේවය නියෝජනය කරමින් යම් නිළධාරියෙක් සහභාගී වුණාද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කවුද සහභාගී වුණේ?

පි : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලලිත් නානායක්කාර මහතා.

ප්‍ර : ඔබ එම රැස්වීමට සහභාගී වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔය සාකච්ඡාවේදී ISIS සංවිධානයේ බලපෑම පිළිබඳව සාකච්ඡා කරනු ලැබුවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද සාකච්ඡා වුණේ?

පි : ඔහු ප්‍රකාශ කරලා තියෙනවා ISIS සංවිධානය ඉරානය හා ඉරාකයේ දී පසුබෑමට ලක්වීමත් සමඟ එම සංවිධානයේ සාමාජිකයින් මව් රටවලට යවා ප්‍රසිද්ධ උත්සව ස්ථානවලදී අන්‍යාගමිකයන් හට ප්‍රහාර එල්ල කරන ලෙසට දැනුම් දී ඇති බව. ඒ අනුව මෙම මතවාදවලට නැඹුරු වූ පුද්ගලයින් 125 දෙනෙකු පමණ සිටින බවත්, එලෙස මෙරට පැමිණි දෙදෙනෙකු වැල්ලම්පිටිය හා දෙහිවල යන ප්‍රදේශවල වෙසෙන බවට හඳුනා ගෙන ඇති බවත්.

ප්‍ර : දැන් ඔබ විසින් කියවන්නට යෙදුනු ඔය කරුණු දෙක මගින් ගම්‍ය වෙනවා නේද මේ ISIS මතවාදවලට නැඹුරුවූණු පුද්ගලයින් සැළකිය යුතු සංඛ්‍යාවක් කොළඹ ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ මේ නිදහස් උත්සවය පැවැත්වීමට නියමිත වූ ප්‍රදේශයට ආසන්නයේ ජීවත් වෙන බව?

පි එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහෙම නම් ඔබලා ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් යම් යම් විධිවිධාන යෙදුවද මේ තොරතුර කරනකොටගෙන?

පි : ඔව් ඒ සම්බන්ධව නියෝජ්‍ය පොලිස්පතිතුමා තමයි ඒ සම්බන්ධව මූලික තීරණය අරගෙන අදාල අංශවලට යොමු කරලා ඒ පිළිබඳව තීරණ ගන්නේ.

ප්‍ර : තීරණය ගන්නේ නමුත් ඔබ දන්නවද එහෙම කෙරුවද නැද්ද කියලා?

පි : මේ පිළිබඳව දැනුවත් කළා එතනට සහභාගී වූ සියළුම ඒජන්සීස්වලට. ඒගොල්ලන්ට මේ පිළිබඳව දැනුවත් වෙලා කිසිම ප්‍රශ්නයක් ඇති නොවන විදියට රාජකාරී කරන ස්ථානවල රාජකාරී කරන්න කියලා අවශ්‍ය උපදෙස් ලබා දුන්නා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔව්, මොකද යම් ප්‍රශ්නයක් ඇති වුනොත් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයකුත් තිබිලා ඒ ප්‍රශ්නයේ වගකීම එන්නේ ඔබලාට නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වාර්තාව ඉදිරිපත් කරන්න පුළුවන්ද ඔබට?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි 2019 පෙබරවාරි මස 3 වන දින දරන නිලධාරීන්ගේ ගමන් සටහන් පොතෙහි ඇතුලත් කොට ඇති එම වාර්තාව C744 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත්,</u>

<u>සාක්ෂිකරු විසින් කියවන්නට යෙදුන ISIS සංවිධානය සහ ඊට සම්බන්ධ පුද්ගලයින් සම්බන්ධයෙන් 125 සම්බන්ධයෙන් වූ එම පේජ 2 ම ස්වාමීනි C744(A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමටත් අවසර පතනවා.</u>

පි : සතරසිංහ මහත්මයා ඔබ කියන්නට දන්නවද 2019 අප්‍රේල් මාසේ 04 වෙනිදාත්, 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදාත්, අතරතුර වූ කාලය තුලදී එවකට ගරු ජනාධිපතිතුමා කිසියම් රැස්වීමකට සහභාගී වුණාද කියලා, ප්‍රසිද්ධ රැස්වීමකට මහජනතාව පැමිණෙන?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කොහේද?

පි : 2019.04.12 වන දින මඩකලපුව ප්‍රදේශයේ වෙම්බර් ක්‍රීඩාංගනයේ පැවති රට වෙනුවෙන් එකට නැගිටිමු යන උත්සවය සඳහා සහභාගි වෙනවා.

ප්‍ර : ඔබ එම රැස්වීමට එතුමා සමඟ සහභාගි වුනාද ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ අද දින මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි දෙමින් ප්‍රකාශ කරනු ලැබුවා සාමාන්‍යයෙන් ඒ වගේ රැස්වීම් වලට එතුමා යනවා නම් ආරක්ෂක තත්ත්වය පිළිබඳව සලකා බැලීමට විශේෂ රැස්වීමක් පවත්වනවාය කියලා?

පි : එහෙමයි ස්වාමිනි .

ප්‍ර : එතකොට ඔබ ඔය කියන රැස්වීම පැවැත්තුනේ කවදද?

පි : මේ රැස්වීම පැවැත් වුනේ 2019.04.12 වෙනි දින.

ප්‍ර : එහෙම නම් 2019.04.12 ට පෙර එවැනි විශේෂ රැස්වීමක් ආරක්ෂිත තත්ත්වය පිළිබඳව තක්සේරු කිරීම සඳහා පවත්වනු ලැබුවද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : එහෙම පැවැත්තුවේ නැහැ?

පි : නැත.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ආරක්ෂිත තත්ත්වය පිළිබඳව සොයා නොබලා එවැනි රැස්වීමකට ඔබ ආරක්ෂාව දෙන ඒ කියන්නේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය ආරක්ෂාව සපයන VIP නැත්නම් ප්‍රභූවරයාව යොමු කිරීම සුදුසු ද?

පි : ස්වාමිනි ඒ පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයෙන්..

ප්‍ර : ඉස්සරවෙලා මගේ ඒකට උත්තර දීලා ඊට පස්සේ පැහැදිලි කරන්න?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සේ දැන් කියන්න කෝ මොකද කළේ කියලා?

පි : රාජ්‍ය බුද්ධි සේවයෙන් රහස්‍ය තොරතුරු වාර්තාවක් කැඳවලා තියෙනවා.

ප්‍ර : කවදද කැඳෙව්වේ?

පි : 2019.04.01 දිනැති අංක T/PSD/4283/04/2019 දරන ලිපිය.

ප්‍ර : මොකක්ද ඒ ලිපිය මගින් කළේ?

පි : ඒ උත්සවය සම්බන්ධව ආරක්ෂක තත්ත්ව වාර්තාවක් ලබා ගෙන තියෙනවා.

ප්‍ර : ඒතකොට කවුද ඔය තොරතුර සපයපු ඒ ආරක්ෂක තත්ත්ව වාර්තාව ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයට ඒවන ලද තැනැත්තා?

පි : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍ය බුද්ධි සේවාවේ නිලන්ත ජයවර්ධන මහතා.

ප්‍ර : කවදද ඔහු ඒ වාර්තාව දාතම් කරලා තියෙන්නේ?

පි : 2019.04.10

ප්‍ර : පිටු කීයකින් සමන්විත වාර්තාවක් ද ඒක?

පි : 8 ක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ වාර්තාව ඔබ ලඟ තියෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒක අද මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි 2019.04 වන මස 10 දාතමින් ජනාධිපති ආරක්ෂක දිසාව නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් එවා ඇති එම වාර්තාව C745 වශයෙන් ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා

<u>ස්වාමිනි ඒ අනුව C745 ලෙස ලකුණු කිරීමට යෙදුනු මෙම ලේඛනය X97 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : ඔය වෙබර් ක්‍රීඩාංගනයේදී පැවැත්වුණු ඔය රැස්වීමට ඔබ සහභාගී වුණා කියලා කිව්වානේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒහෙමයි ස්වාමීනි.

ප්‍ර : කී දෙනෙක් පමණ ඒයට සහභාගී වුණාද මහජනතාව?

පි : මහජනතාව 5000 ට ආසන්න පිරිසක් සහභාගි වුණා.

ප්‍ර : මා ඔබේ අවධානය දැන් නැවතත් අර රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඉදිරිපත් කරලා තියෙන ආරක්ෂක තත්ත්ව වාර්තාව කෙරෙහි යොමු කරනවා. ඒ තත්ත්ව වාර්තාවේ හැම පිටුවේම අවසානයේ ඒ කියන්නේ පිටු අංකය ගාවට තියෙනවා නේද දිනයකුයි වෙලාවකුයි?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ මීට පෙරත් ආරක්ෂක තත්ත්ව වාර්තා දැකලා තියෙනවා නේ සතරසිංහ මහත්මයා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට කරුණාකරලා පැහැදිලි කරන්න පුළුවන්ද ඒ මොකක්ද දිනය සහ වෙලාවෙන් අදහස් කරන්නේ කියලා?

පි : ඒක රාජ්‍ය බුද්ධි සේවයෙන් ලිපිය Print එකපු වෙලාව ස්වාමීනි.

ප්‍ර : මුද්‍රණය කරන ලද දිනය සහ වේලාව නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ගරු ජනාධිපතිතුමා විසින් මඩකලපුව සංචාරය ඔබ කිව්වා 2019.04.12 වෙනිදා සිදු කලාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා සාමාන්‍යයෙන් තියෙන ආකාරයට විශේෂ රැස්වීමක් ඒ බුද්ධි අංශ ගෙන්නලා මේ අවස්ථාවේ පැවැත්තුවේ නැහැ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : නමුත් රාජ්‍ය බුද්ධි සේවය වෙතින් ආරක්ෂක තත්ත්ව වාර්තාවක් කැඳවනු ලැබුවයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔවුන්ගේ තක්සේරුව වෙලා තියෙන්නේ මොකක්ද ආරක්ෂිත තත්ත්වය පිළිබඳව?

පි : ඔවුන් විවිධ මාතෘකා යටතේ ඒ ටික?

පි : එහෙමයි ස්වාමීනි. අතිගරු ජනාධිපතිතුමාට හෝ මෙම සංචාරයට ත්‍රස්තවාදී අන්තවාදී හෝ වෙනත් කණ්ඩායම් වෙතින් තර්ජනය පවතින බවට නිශ්චිත තොරතුරු මෙතෙක් වාර්තා වී නොමැති වුවද පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

ප්‍ර : මොනවද ඒ කරුණු ?

පි : විවිධ දේශපාලන මත දරන කණ්ඩායම් ඒකරාශී වීම හරහා ඇති විය හැකි නොසන්සුන්කාරී තත්ත්වයන් සම්බන්ධවයි. ප්‍රදේශයේ පවතින දේශපාලන වාතාවරණය සහ නව පත්කිරීම් වලට

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එරෙහිව පවතින විරෝධතා පිළිබඳවයි. ඉස්ලමික් ස්ටේට් IS සංවිධානයට ලැදි පුද්ගලයින් සහ මුස්ලිම් අන්තවාදී ක්‍රියාකාරකම් පිලිබඳවයි. විදේශයන්හි ජීවත් වන දෙමළ විසිරනයේ ක්‍රියාකාරිත්වය සහ සෑම පෙළඹීම මත පුනරුත්ථාපනය වූ සහ නොවූ LTTE සාමාජිකයන්ගේ ක්‍රියාකාරිත්වය. ආගමික සහ සමාජීය ගැටළු මගින් වියහැකි බලපෑම් සම්බන්ධව, එබැවින් අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ ක්‍රමවේදයන් අනුගමනය කිරීම සහ එතුමාට දර්ශනය වෙන සීමාව තුල සහ ආසන්නයට පැමිණෙන පුද්ගලයින් මනා පරීක්ෂාවකට ලක් කිරීම කාලෝචිත වේ.

ප : එතකොට සාමාන්‍ය තක්සේරුව වෙලා තියෙන්නේ ගරු ජනාධිපතිතුමාට හරි ඒ සංචාරයට හරි එක්කෝ ත්‍රස්තවාදී නැත්නම් අන්තවාදී එහෙමත් නැත්නම් වෙනත් කණ්ඩායම් වෙතින් තර්ජන පවතින බවට නිශ්චිත තොරතුරු වාර්තා වෙලා නැහැ කියලා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ වාර්තා වෙලා නැහැ කියලා කියන්නේ 2019 අප්‍රේල් මාසේ මේ වාර්තාව මුද්‍රණය කරන ලද 9 වෙනිදා අනිත් අතට බලන කොට මේ ආවරණ ලිපිය එහි දාතම් කරලා තියෙන අප්‍රේල් මාසේ 10 වෙනි දා දක්වා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ වගේම නමුත් එහි කියනවා අවධානය යොමු කරන්නට කියන කරුණු අතරේ එකක් විදියට කියනවා ඉස්ලමික් ස්ටේට් ත්‍රස්තවාදී සංවිධානයට ලැදි පුද්ගලයින් සහ මුස්ලිම් අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අනික් කරුණු ඇතුලුව?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ වගේම ඔවුන් යෝජනාවක් කරනවා ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ ක්‍රමවේදයන් අනුගමනය කරන්න, ඒතුමාට දර්ශනය වන සීමාව තුල සහ ආසන්නයට පැමිණෙන පුද්ගලයින් මනා පරීක්ෂාවකට ලක් කරන්න කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

<u>ස්වාමිනි තක්සේරුව යටතේ, තක්සේරුව වශයෙන් සඳහන් වෙනවා ස්වාමිනි 1 වන පිටුවේ සාක්ෂිකරු විසින් කියවන ලද එම කොටස මා අවසර පතනවා එය X97(A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න.</u>

ප : ඒ වගේම මේ ආරක්ෂක තත්ත්ව වාර්තාව මගින් ඉස්ලමික් ස්ටේට් සංවිධානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්ව පිළිබඳව කියලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ මොන පිටුවේද?

පි : 6 වන පිටුවේ ස්වාමිනි.

ප්‍ර : මම අහන්නේ ඉස්ලමික් ස්ටේට් සංවිධානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය අපිට ගහලා තියෙන ඒකේ පිටුව 5 කියලා තියෙන්නේ?

පි : First page ඒකත් ඒක්ක මම ගණන් කලේ ස්වාමිනි. First page එක නැතුව ස්වාමිනි. ඒහෙමයි ස්වාමිනි ඒක 5.

ප්‍ර : ඉස්ලමික් ස්ටේට් සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය ගැන සඳහන් කරලා තියෙනවද?

පි : ඒහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොනවද කියලා තියෙන්නේ?

පි : ශ්‍රී ලංකාව තුල ජීවත් වන මුස්ලිම් තරුණයින් 130 ට ආසන්න පිරිසක් ISIS සංවිධානයේ මත වාදය වෙත නැඹුරුව සිටින බවත්, ඔවුන් අතරින් පුද්ගලයින් 30 ට ආසන්න පිරිසක් මඩකලපුව ප්‍රදේශයේ පදිංචි බවටත්, බුද්ධි තොරතුරු හරහා හඳුනා ගෙන ඇති බවට වාර්තා වේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍රය කර ගනිමින් ක්‍රියාත්මක ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ හිටපු නායක ඒම්.සී.ඒම්.සහ්රාන් යන අය විසින් මෙරට දේශපාලන ක්‍රමය, ප්‍රජාතන්ත්‍රවාදය, නීති පද්ධතිය සහ අන්‍යාගමිකයන් පිළිබඳ විවේචනාත්මක අදහස් දක්වමින් වීඩියෝපට සිය සමාජ ජාලා ගිණුම හරහා ප්‍රචාරය කර ඇති බවත්, සංවිධානයේ මතවාදයට නැඹුරු වූ පිරිස් අදාල වීඩියෝ පට පරිශීලනය කර ඇති බවටත් අනාවරනය වී ඇත. එසේම මොහු විසින් සිය සමාජ ජාලා ගිණුම් හරහා වීඩියෝ පට යොමු කරමින් අල්ලා දෙවියන් විසින් යොමු කරන ලද දර්ශනය ප්‍රතික්ෂේප කරන අයවලුන් කෆර් හෙවත් කාෆීර්වරුන් ලෙස සඳහන් කරමින් ඔවුන් විනාශ කර ඉස්ලාමය ආරක්ෂා කලයුතු බවට ප්‍රචාරය කර ඇත. එමෙන්ම IS සංවිධානයේ මතවාදය වෙත නැඹුරුව සිටින පුද්ගලයින් IS වෙබ් අඩවිය සහ සමාජ ජාලා ගිණුම් නිරන්තරයෙන් පරිශීලනය කරමින් IS ප්‍රචාරණ මාධ්‍යය ඔස්සේ ලබා දෙන උපදෙස් / නියෝග සහ සිරියාවේ සහ ඉරානයේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරීක්ෂණය කරමින් සිටින බවට වාර්තා වී ඇත.

<u>ස්වාමිනි ඉස්ලමික් ස්ටේට් සංවිධානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය යන හිසින් තිබෙන එම සටහන X97(B) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : X97(B) මගින් සතරසිංහ මහත්මයා පැහැදිලිව සඳහන් කරලා තියෙනවා නේද IS සංවිධානයේ මතවාදයට යම් සැලකිය යුතු සංඛ්‍යාවක් නැඹුරු වෙලා ඉන්නවා මුස්ලිම් තරුණයින්ගෙන් ලංකාවේ ඉන්න. ඒකෙන් 30 කට විතර ආසන්න පිරිසක් මඩකලපුව ප්‍රදේශයේ ජීවත් වෙන බවට බුද්ධි අංශ විසින් හඳුනාගෙන තිබෙනවා කියලා?

පි : ඒහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ වගේම ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ හිටපු නායක සහරාන් යන අය මේ රටේ තියෙන දේශපාලන, ප්‍රජාතන්ත්‍රවාදය, නීති පද්ධතිය. අන්‍යාගමිකයන් පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන බව ඒවා වීඩියෝ පට මගින් ප්‍රචාරය කරන බව ඒ ගැනත් සඳහන් කරලා තියෙනවා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේ පවතින සදාචාරාත්මක ක්‍රම වලට විරුද්ධව අදහස් ප්‍රකාශ කරන බවට බුද්ධි අංශ වලට වාර්තා වී ඇති මෙම තැනැත්තා එනම් සහරාන් තවදුරටත් කියනවා මේ X97(B) මගින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිය ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් තමයි ඒක කරන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මේ X97 වාර්තාවේ කොහේවත් කියලා තියෙනවද

(ස්වාමිනි එම ප්‍රශ්නය වෙනුවට වෙනත් ප්‍රශ්නයක් යොමු කිරීමට අවසර අයැදිනවා)

ප්‍ර : දැන් මේ වාර්තාවේ ඒ කියන්නේ X97 හි කොහේවත් සඳහන් වෙලා නැහැ නේද නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ තිබෙන ක්‍රියාකාරකම් ගැන, IS මතවාදය අනුව මුස්ලිම් තරුණයින් ඊට අනුගත වෙමින් සිටින බව සඳහන් කෙරුවට මඩකලපුව ප්‍රදේශයෙන් පරිබාහිරව ජාතික තවුහිද් ජමාත් සංවිධානයට අයත් අය විසින් කරලා තිබෙන සාපරාධී ක්‍රියා හෝ එහෙම නැත්නම් මා කලින් සඳහන් කල ආකාරයට අර වනාතවිල්ලුවේ තිබිලා සොයා ගන්නා ලද පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් හරි එහෙම නැත්නම් ඊට අදාල වූ එයට සම්බන්ධකමක් තියෙන මාවනැල්ල බුදු පිළිම වලට හානි කරන ලද පුද්ගලයින් හරි ඒ සිද්ධීන් ගැන සඳහන් වෙලා නැහැ නේද?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒවා මඩකලපුව දිස්ත්‍රික්කයෙන් පරිබාහිරයි නේද ?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නමුත් මඩකලපුව දිස්ත්‍රික්කය ඇතුලත සිදු වූ යම් දෙයක් පිළිබඳව සඳහන් වෙලා තියෙනවා නේ, මොකක්ද වවිනතිව් පොලිස් මුර පොලේදී නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය කිරීම ගැන.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට වවිනතිව් එන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයට නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට මේ වාර්තාව ඉදිරිපත් වෙන්නේ 2019.04 මාසේ 10 වෙනිදා දාතමින් තමයි අවාරණ ලිපිය සමඟ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොටත් හැබැයි මේ වාර්තාව අනුව කියන්නේ වවිනතිව් පාලම අසල මාර්ග බාධකයේදි ඒසේ ඝාතනය කරන ලද පොලිස් නිලධාරීන් දෙදෙනා ඝාතනය කිරීම සම්බන්ධයෙන් සැක පිට අරගෙන ඉන්නේ LTTE සංවිධානයේ සාමාජිකයන් 2 ක් කියලා විතරයි නේද?

පි : එහෙමයි ස්වාමිනි

ප්‍ර : ඒ මිසක් ඒ සැකය වෙනත් ස්ථානයකට එල්ල වූ බවක් මේ 10 වෙනිදා වාර්තාවේ කොහේවත් සඳහන් වෙලා නැහැ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : ඊලඟට බලන්න වාර්තාවේ 6 වන පිටුව. ඒ 6 වන පිටුවේ සඳහන් වෙනවද 6 වගේම 7 අවි ආයුධ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමක් පිලිබඳව?

පි : එහෙමයි ස්වාමිනි

ප්‍ර : මොකක්ද සඳහන් වෙන්නේ?

පි : යුධමය වාතාවරණය පැවති සමයේදී මෙන්ම මානුෂික මෙහෙයුමෙන් පසුවද ප්‍රදේශය ආශ්‍රිතව පුපුරණ ද්‍රව්‍ය සහ අවි ආයුධ විශාල ප්‍රමාණයක් සොයා ගෙන ඇත. වර්තමානය වන විටද එසේ සොයා නොගන්නා ලද අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය තිබීමේ හැකියාව බැහැර කල නොහැක.

ප්‍ර : ඒ හැරෙන්නට මොනවද කියන්නේ?

පි : 2018.07.05 වන දින මඩකලපුව පොලිස් වසමේ කස්ටම් පාරේ පිහිටි නැගෙනහිර පලාත් ආණ්ඩුකාර නිල නිවස පිහිටි ඉඩමේ පිටුපස ඇති පර්චස් 5 ක පමණ බිම් ප්‍රමාණයක තිබී SFG 87 වර්ගයේ ජීව බෝම්බ 2 ක් හමු වී ඇත. 2018.04.28 වන දින මඩකලපුව යුද හමුදා බුද්ධි අංශ මගින් කරදියාරු පොලිස් වසමේ කරඩියකුලම් කැළෑ ප්‍රදේශයේ තිබී අංක 128061979 දරන T56 අවිය සහ එම වර්ගයේ හිස් පතරොම් ගැබක් සොයා ගෙන ඇත.

ප්‍ර : කියලා සඳහන් වෙනවා, වාර්තා කරලා තියෙනවා නේද ?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ස්වාමිනි අවි ආයුධ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම මාතෘකාව යටතේ තිබෙන එම තොරතුරු X97(C) අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : දැන් මේ ආකාරයට සවිස්තාරාත්මකව අවි ආයුධ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම් ගැන සඳහන් කරලා තියෙන IS මතවාදයට නැඹුරුතාවයක් තිබෙන තරුණ මුස්ලිම් කණ්ඩායමක් ජීවත් වන ප්‍රදේශයක් බවට හඳුනා ගෙන තියෙන ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායකයා විසින් සමාජ ජාල ගිණුම් හරහා යම් යම් ප්‍රචාරණයන් සිදු කරන බවට සඳහන් කරනු ලබන මෙම ආරක්ෂක තත්ත්ව වාර්තාවේ කොහේවත් සඳහන් වෙනවද ඒ වන විට විදේශයකින් රාජ්‍ය බුද්ධි සේවාව වෙත තොරතුරු ලැබිලා තියෙනවයි කියලා යම් ආකාරයක ප්‍රහාරයක් මේ මුස්ලිම් අන්තගාමී කණ්ඩායම් විසින් සිදු කිරීමේ ප්‍රවනතාවයක් තිබෙන බව?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : දැන් සහරාන් පිළිබඳව මේ X97 හි රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වරයා ඔහුගේ අත්සන යටතේ එවනු ලබන මේ වාර්තාවේ සඳහන් කෙරුවට එහෙම නම් ඔබ කියන්නේ එම වාර්තාවේ කොහෙවත්ම සඳහන් කරලා නැහැ කියලද මේ එම්.සි.එම් සහරාන් කියන තැනැත්තා ඇතුළු කණ්ඩායමක් යම් ආකාරයක ප්‍රහාරයක් ඒ කියන්නේ ට්‍රක් ප්‍රහාරයක් හෝ ස්වයං ඝාතක ප්‍රහාරයක් හෝ පිහි ප්‍රහාරයක් හෝ ආයුධ ප්‍රහාරයක් හෝ සිදු කල හැකි බවට වාර්තා වී තිබෙන බව?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : ඒ වගේ කිසිම දෙයක් සඳහන් වෙලා නැහැ?

පි : වාර්තා කරලා නැහැ ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වානේ 5000 පමණ ප්‍රමාණයක් සංඛ්‍යාවක් ජනතාවක් මේ රැස්වීමට සහභාගී වුනාය කියලා?

පි : එහෙමයි ස්වාමිනි

ප්‍ර : සතරසිංහ මහත්මයා ඔබත් කිව්වා මේ ගරු ජනාධිපතිතුමා සමඟ මේ රැස්වීමට සහභාගි වුණාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : යම් හෙයකින් ඔබලා දැනගෙන හිටියා නම් ඒ වන විටත් රාජ්‍ය බුද්ධි සේවය වෙත විදේශ තොරතුරු සපයන්නන් විසින් මේ රාජ්‍ය බුද්ධි සේවයේ සඳහන් සහරාන් ඇතුළු කණ්ඩායමක් විසින් මා කලින් සඳහන් කල ආකාරයේ කිසියම් හෝ ආකාරයේ ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාව තිබුනයි කියලා 2019 අප්‍රේල් මාසේ 12

FAIR COMMENT BY JEZEEM

වෙනිදා ඔබලා ගරු ජනාධිපතිතුමා සමඟ එම මඩකලපුවේ පැවති රැස්වීමට යනවද නැද්ද?

පි : යන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඇයි ඒ?

පි : ආරක්ෂක තත්ත්වය දුර්වලයි ස්වාමීනි. කොයි වෙලාවේ ප්‍රභූවරයාට පහරක් එල්ල වෙයිද කියලා විශ්වාසයක් නැහැ. ඒ නිසා අපිට ප්‍රභූවරයාට හානියක් සිද්ධ වෙන එක ප්‍රභූ ආරක්ෂකයන් හැටියට ඒක අනුමත කරන්නේ නැහැ එක්ක යන්නේ නැහැ ස්වාමිණි

ප්‍ර : ඒහෙමනම් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ 1994 සිට මේ දක්වා සේවය කරනු ලබන නිලධාරියෙක් විදියට ඔබේ මතය මොකක්ද එවැනි වැදගත් තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවය සතුව තිබුණා නම් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය වෙත දැනුම් දීම සම්බන්ධයෙන් ?

පි : ඒක අනිවාර්යයෙන් දැනුම් දියයුතු වෙනවා මොකද ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කරන්නේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය ප්‍රමුඛව ඒක නිසා අනිවාර්යයෙන්ම ඒක අපේ කොට්ඨාශයට දැනුවත් කරන්න සිද්ධ වෙනවා.

ප්‍ර : එහෙම නම් ඔබලා ජනාධිපතිවරයාට එම රැස්වීමට 2019 අප්‍රේල් මාසේ 12 වෙනිදා සහභාගී වන්නට ඉඩ දුන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් ඉදිරිපත් කරලා තියෙන මේ X97 හි එවැනි අනතුරක් පිළිබඳ සේයාවක් හෝ නැති වුණ නිසාද?

පි : එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : සාක්ෂිකරු ජනාධිපතිවරයාගේ ආරක්ෂාව භාරව ඉන්නේ ජනාධිපති ආරක්ෂක අංශය කියලා කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගන්න ඕනේ ඔබ ජනාධිපති ආරක්ෂක අංශය කියලා කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ තීරණ ගැනීමේදි අනෙකුත් බුද්ධි අංශ සහ පොලිස් අංශවලින් ලැබෙන වාර්තා වැදගත් වෙනවා කියන එක හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට එවැනි වාර්තාවල ජනාධිපතිවරයාට නිශ්චිතව තර්ජනයක් තියෙනවා කියලා කිව්වොත් ඒක ඔබලා සැළකිල්ලට ගන්න ප්‍රධාන කාරණයක් වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහෙම ජනාධිපතිවරයාට නිශ්චිත තර්ජනයක් කියලා දන්වලා නැති වුණත් මහජනතාවට යම්කිසි තර්ජනයක් වෙන්න පුළුවන් කියන එක ඒ වාර්තාවෙන් අනාවරණය වෙනවා නම් ඒ කරුණත් ඔබ ජනාධිපතිවරයාගේ ආරක්ෂාව තීරණය කිරීමේදි සැළකිල්ලට ගන්නවද?

පි : අනිවාර්යයෙන් ස්වාමීනි.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>:

ප්‍ර : සතරසිංහ මහත්මයා දැන් ඔබ ජනාධිපති ආරක්ෂක අංශයේ සේවය කරලා බොහෝ පළපුරුදු නිලධාරියෙකු නිසා ඔබට වැටහෙනවද රාජ්‍ය බුද්ධි සේවය විසින් මේ වැදගත් තොරතුර ඔබ අංශය වෙත වාර්තා නොකිරීම ඔවුන්ගේ රාජකාරියේ යම් ආකාරයක නොසැළකිල්ලක් කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් මේ බෝම්බ පිපිරීම සම්බන්ධ තොරතුර ඒ කියන්නේ අප්‍රේල් 21 බෝම්බ පුපුරණවාය කියන තොරතුර ඔබ අංශයට දැන ගන්න ලැබුණේ කවදද?

පි : බෝම්බ පුපුරණ තුරුත් අපට දැන ගන්න ලැබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එතකොට රාජ්‍ය බුද්ධි සේවය විසින් මෙවැනි වැදගත් තොරතුරක් ජනාධිපති ආරක්ෂක අංශයට දන්වා නොසිටීම ජනාධිපතිවරයාගේ ආරක්ෂාව පමණක් නෙමෙයි, මුළු මහත් ජාතියේම ආරක්ෂාව යම්කිසි ආකාරයක තර්ජනයකට ලක් කිරීමක් කියලා කියන්න පුළුවන් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : මිස්ටර් සතරසිංහ, 2019.04.12 මඩකලපුවේ රැස්වීම මේක පැහැදිලි කර ගැනීම සඳහා පමණයි අසන්නේ රැස්වීම පැවති ක්‍රීඩාංගනයේ නම මොකක්ද?

පි : මඩකලපුව වෙබර් ක්‍රීඩාංගනය.

ප්‍ර : මගේ ප්‍රශ්නය 2019.04.12 වන දින රැස්වීමට ජනාධිපතිතුමා සමඟ ඔබලා ගියාද කොළඹ ඉඳලා?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප : කොළඹ ඉඳලද ජනාධිපතිතුමා ගියේ නැත්නම් පොළොන්නරුවේ සිටද එම රැස්වීමට ජනාධිපතිතුමා සහභාගීවීම සඳහා පිටත් වුණේ?

පි : මට ඒ පිළිබඳව හරි මතකයක් නැහැ මොකද මම දින 2 ට පෙර ප්‍රථම තමයි මඩකලපුවට ගියේ ස්වාමීනි පෙර ආරක්ෂක රාජකාරී සඳහා. ජනාධිපතිතුමා කොළඹ ඉඳන්ද එහෙම නැත්නම් පොළොන්නරුවේ නිවසේ ඉඳන් ආවද කියලා මට මතකයක් නැහැ ස්වාමීනි.

ප : ඔබට මතකයක් තියෙනවද මෙම 5000 ක් පමණ දෙනෙක් සහභාගි වූ රැස්වීමේ වේදිකාවේ සිටියේ කවුද කියලා, වේදිකාවේ සිටපු විශේෂයෙන්ම ජනාධිපතිතුමා රැස්වීමකට යන කොට වේදිකාවේ ඉන්නවා නේ එතුමාගේ සමීපතම දේශපාලන කණ්ඩායමක්, කවුද හිටියේ කියලා ඔබට මතකයක් තියෙනවද?

පි : මට මතක විදියට මේ රැස්වීමේදි ප්‍රධාන වේදිකාවේ වාඩි වෙලා තිබුනේ නැහැ අතිගරු ජනාධිපතිතුමා පල්ලෙහා වාඩිවෙලා හිටියේ. වේදිකාවේ වෙනත් කටයුතු සඳහා තමයි දැනට මට මතකයේ තිබෙන්නේ ස්වාමීනි.

ප : පල්ලෙහා වාඩිවෙලා හිටිය තැන කවුද හිටියේ, දැන් මෙහෙම පේලියක් දානවානේ, ?

පි : ප්‍රදේශයේ දේශපාලඥයන්, Governer ..

ප : නම කියනවා නම් සුදුසුයි?

පි : හිස්බුල්ලා මහතා, රජයේ නිලධාරීන් ආදී පිරිස තමයි ජනාධිපතිතුමා ආසන්නයේ පුටුවල වාඩි වෙන්නේ ස්වාමීනි.

ප : දේශපාලඥයන් හැටියට හිටියේ හිස්බුල්ලා මහතා පමණද?

පි : නැත ස්වාමීනි, ඒ ප්‍රදේශයේ අයත් වෙන කොළඹින් ගිය දේශපාලඥයන් සහභාගී වුණා ස්වාමීනි.

ප : කවුද කොළඹින් ගිය දේශපාලඥයන් ඔබට මතකයක් තියෙනවද?

පි : මට පැහැදිලි මතකයක් නැහැ ස්වාමීනි.

ප : අසාද් සාලි මහතා ගියාද ඔය රැස්වීමේ හිටියද?

පි : පැහැදිලි මතකයක් නැහැ ස්වාමීනි.

ප : මතක නැහැ නේ?

පි : නැහැ ස්වාමීනි.

ප : අසාද් සාලි මහතා අතිගරු ජනාධිපතිතුමා සමඟ එකම රථයක ගියා කියලාවත් ඔබට තොරතුරක් ලැබුණාද එම රැස්වීමට?

පි : මට මතක නැහැ ස්වාමීනි ඒ සිද්ධිය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි තවදුරටත් ප්‍රශ්න ඇසීමට උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය අවසර ඉල්ලයි. අවසර ලබා දෙමි.

FAIR COMMENT — BY JEZEEM —

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මහත්මිය</u>:

ස්වාමීනි C744 කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කිරීමට අවසර පතනවා.

ප්‍ර : C744 කියලා අපි ලකුණු කළේ අර පෙබරවාරි මාසේ 3 වෙනිදා පැවතුන විශේෂ රැස්වීම සතරසිංහ මහත්මයා, ඒකේ අපි C744(A) කියලා අර ඡේද දෙකක් ලකුණු කලේ, ISIS සංවිධානය ඉරාකයේදි පසුබෑම ගැනයි, ලංකාවේ 125 ක් විතර මේ මතවාදවලට නැඹුරුවීම ගැනයි?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් මම ඔබේ අවධානය යොමු කරන්නේ ඒ C744(A) කියලා ලකුණු කරපු ඒ ඡේද 2 ට ආසන්නයේම ඊට යටින් තියෙන ඡේදය කෙරෙහි, මේ වාර්තාවේ කොහේ හරි සඳහන් වෙනවද ඩ්‍රෝන කැමරා පාවිච්චි කරලා රසායනික අවි මගින් ප්‍රහාර එල්ල කිරීමේ හැකියාවක් තියෙන බවට අනාවරණය වුණාය කියලා? තියෙනවා නම් ඒ කොහේද? මොනවද කියලා තියෙන්නේ?

පි : පකිස්ථානය, ඉන්දියාව සහ අනෙකුත් රටවල සමාජ ජාලා ඔස්සේ මෙම මතවාද සහ සම්බන්ධතා පවත්වන සාමාජිකයන් බොහෝ පිරිසක් දැනට ලංකාවේ සිටින බවත්, ඔවුන් විශේෂයෙන් ඩ්‍රෝන කැමරා හා රසායනික අවි මගින් ප්‍රහාර එල්ල කරන ලෙසට උපදෙස් ලබා දී ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් බව.

ප්‍ර : සඳහන් වෙලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ මේ සමාජ ජාලා ඔස්සේ පකිස්ථානයත්, ඉන්දියාවත් අනෙකුත් රටවලුත් එක්ක මේ IS මතවාදය සමඟ සම්බන්ධතා පවත්වන බොහෝ පිරිසක් ලංකාවේ ඉන්නවා කියන එක ඒකෙන් පැහැදිලි වෙනවා, ඒ හැරෙන්නට ඒ අය ඩ්‍රෝන කැමරා හා රසායනික අවි මගින් ප්‍රහාර එල්ල කරන්න උපදෙස් ලබා දී තිබෙන බවටත් හෙළිදරව් වුණ බව එයින් අනාවරණය වෙනවා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි එම ඡේදය C744(B) වශයෙන් ලකුණු කිරීමට අවසර අයැදිනවා</u>.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

වෙනත් ප්‍රශ්න නොමැති බව උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය සහ ජනාධිපති නීතිඥවරිය දන්වයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි.
නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරිමි.

කොමිෂන් සභාවේ කටයුතු ප.ව. 5 පසුවී විනාඩි 35 තෙක් කල් දමමි. මින් පසුව අද දින කොමිෂන් සභාව ඉදිරියේ මෙහෙයවන සාක්ෂි මාධ්‍යය නොමැතිව අප්‍රසිද්ධියේ මෙහෙයවන බව සටහන් කර තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-06-29 වේලාව- ප. ව. 5-50

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. - සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. - සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නම - මොහොමඩ් හෆීස් මාර්සෝ
වයස - අවු 63 යි.
ආගම - ඉස්ලාම්.
ජාතිය - මැලේ.
රැකියාව- නියෝජ්‍ය පොලිස්පති.
ලිපිනය - 150, හයිලෙවල් පාර , මහරගම.
ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති මාසෝ මහත්මයා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනේ කවදාද ?

උ 1979 අප්‍රේල් මස 23 වෙනි දින.

ප්‍ර ඒ කුමන තනතුරකටද?

උ උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස .

ප්‍ර ඔබ පොලිස් දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගත්තේ කවදාද ?

උ 2016 /10/29 වෙනි දින.

ප්‍ර 1979 සිට 2016 දක්වා වූ ඒ කාලය තුලදී ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ ලබා තිබූ උසස්වීම් පිළිබඳව කෙටියෙන් මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද ?

උ මා 1979 / 4/23 වෙනි දින මම පොලිසියට බැඳුනා. ඊට පස්සේ මම පොලිස් පරීක්ෂක තනතුරට උසස් වුණා. 1987 ජුනි මාසේ පමණ. ඊට පස්සේ අවුරුදු හතරෙන් පසුව ප්‍රධාන පොලිස් පරීක්ෂකට උසස් වුනා. ඊට පස්සේ තවත් අවුරුදු හතරහමාරෙන් පසුව සහකාර පොලිස් අධිකාරි තනතුරට උසස් වුනා. ඊට පස්සේ අවුරුදු 8 න් පසුව පොලිස් අධිකාරී තනතුරටත් අවුරුදු 5 න් පසුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරටත් ආයේ අවුරුදු 5 න් පසුව නියෝජ්‍ය පොලිස්පති තනතුරටත් සාමාන්‍ය උසස් වීමේ ක්‍රියා පටිපාටිය මත පමණක්ම තමයි මේ උසස්වීම ලැබුනේ.

ප්‍ර දැන් ඔය ඔබේ සේවා කාලය තුලදී ඔබ බොහෝ ස්ථානවල බොහෝ අංශ වල සේවය කරන්නට ඇති නේද ?ඒ කුමන ස්ථානද කුමන අංශද කියන එක පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්නට පුළුවන්ද ?

උ මුලින්ම ආධුනික කාලයේ මන් සේවය කලේ කැළණිය කොට්ඨාශයේ පෑලියගොඩ පොලිස් ස්ථානයේ එතකොට මම ඇත්ත වශයෙන්ම මගේ මූලික පුහුණුවීම්වල තමයි වැඩිපුර යෙදිලා හිටියේ ආධුනික කාලය හින්දා. ඊට පස්සේ මගේ යම්කිසි දෙයක් දැකලා මාව ඇමති ආරක්ෂක අංශයට අනුයුක්ත කරා. මගේ විශේෂ යම්කිසි හැකියාවක් දැකලා ඇමති ආරක්ෂක අංශයේ මම හිතන්නේ සෑහෙන කාලයක් හිටියා මම

Fair Comment BY JEZEEM

එවකට ඒ ගමන්ම වැඩිපුර මම ක්‍රීඩාවල තමයි මම යෙදිලා හිටියේ . මම හිතන්නේ අවුරුදු 12 ක් විතර. ඊට පස්සේ මම මිරිහානේ පොලිසියේ වැඩ කලා . ස්ථානාධිපති අපරාධ සහ ස්ථානාධිපති රථවාහන හැටියට. ඊට පස්සේ මට පත්වීම හම්බ වුනා අතුරුගිරිය ස්ථානාධිපති හැටියට 93 දී 93 න් පස්සේ 94 දි මම ගියා මහරගම ස්ථානාධිපති වශයෙන්. එතන මට විශේෂ ඇමතීමක් හම්බ වුනා එවකට සිටි පොලිස්පති ෆ්‍රැන්ක් සිල්වා මහත්මයාගෙන් අපේ හිටපු විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහත්මයාගේ security එක බාර ගන්න කියලා පස්සේ මම එතන හිටියා අවුරුදු 6 ක් විතර හැබැයි එතුමා ජීවිතක්ෂයට පත්වෙච්ච දවසේ මම හිටියේ නැහැ . එතකොට මම හැරිලා ගිහිල්ලා අවුරුදු 2ක් විතර වෙනවා . ඊට පස්සේ මම ආවා SIS එකට. ඒ ඇවිල්ලා 2001 වගේ මගේ මතකයේ හැටියට ඊට පස්සේ SIS එකේ මාස 08 ක් ඉඳලා ඊට පස්සේ මම ගියා අනුරාධපුර . අනුරාධපුර එතන තන්තිරිමලේ මෙහෙයුම් බාරව හිටියා මෙහෙයුම් රාජකාරි බාරව ගම්මාන වල border village එකේ. ඊට පස්සේ නැවතත් මාව කැඳවීමට ලක් කලා SIS එකට එදා ඉඳන් මම 2016 අප්‍රේල් හරි මැයි වගේ. එතකන් මම SIS එකේ හිටියා ඊට පස්සේ මම අධ්‍යක්ෂ විශේෂ පොලිස් කාර්යංශයට ගියා ඒක ඇවිල්ලා පොලිස්පති තුමා යටතේ තියෙන බුද්ධි අංශයක්.

ප එතනින් තමයි ඔබ විශ්‍රාම ලැබුවේ ?

උ එතනින් තමයි මම විශ්‍රාම ලැබුවේ.

ප දැන් ඔබ පැහැදිලි කෙරුවා මේ ගරු කොමිෂන් සභාවට අවස්ථා දෙකකදී ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ රාජකාරි කෙරුවා කියලා ? රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ රාජකාරි කරන ලද සම්පූර්ණ කාලය කොච්චරද ?

උ සම්පූර්ණ කාලය අවුරුදු 15 ක් විතර වෙනවා පහලොව හමාරක් විතර වෙනවා. අර කෙටි කාලයයි ඊට පස්සේ දිගටම හිටපු කාලයයි.

ප එතකොට ඔබ කිව්වානේ පලවෙනි අවස්ථාවේ දි අර මාස 08 ක් තමයි රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කලේ කියලා ඒ වගේම ඔබ කිව්වා ඔබට මතක විදියට 2001 වසරේ වගේ තමයි ඒ පලවෙනි වතාවට ඒ මාස 08 රාජ්‍ය බුද්ධි සේවයේ හිටියේ කියලා ?

උ එහෙමයි ස්වාමිනි.

ප දෙවනි අවස්ථාවේ ඔබ රාජ්‍ය බුද්ධි සේවයට ආවේ කවදාද ?
2016 නේ එතකොට කිව්වේ අර දැන් ඔබ කිව්වා අවුරුදු 14 ක් හිටියායි කියලා රාජ්‍ය බුද්ධි සේවයේ . මාස 08 ක් පලවෙනි අවස්ථාවේ 2016 න් අවසන් වුනානම් ඔබේ කාල සීමාව ඔය අවුරුදු 14 එහෙමනම් ඔබ සේවයට ගියේ රාජ්‍ය බුද්ධි සේවයේ දෙවනි අවස්ථාවට මොන වසරේ වගේද ?

උ මට මතක හැටියට 2001 නැත්නම් 2002 දි වගේ .

ප නැහැ ඒ පළවෙනියෙන් මනේ මාස 08 නේ ?

FAIR COMMENT BY JEZEEM

උ මාස 08 , 2000 ඉඳන් 2001 වගේ ඊට පස්සේ 2002 හරි 2003 වගේ මට හරියට පැහැදිලි නැහැ මන් මගේ ප්‍රකාශයේ දීලා තියෙනවා.

ප 2002 වගේ . තමයි ඔබ ගිහිල්ලා තියෙන්නේ ?

උ 2002 වගේ.

ප දැන් ඔබ රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත කෙරුවහම අනිත් සැම නිළධාරියෙක්ම වගේ ඊට අනුයුක්ත කරලා තියෙන යම් පුහුණුවීමකට භාජනය වුනාද ?

උ ඔව් . මම මුලික පුහුණුවීම ලැබුවා මම සහකාර පොලිස් අධිකාරී වරයෙක් වශයෙන් මම බැඳුනේ මුලික පුහුණුවීම් ලැබුනා.

ප කවුරු විදියටද ?

උ සහකාර පොලිස් අධිකාරි වශයෙන් තමයි බැඳුනේ ඒක ඇත්ත වශයෙන්ම ඒක නමුත් බුද්ධි අංශයට එනකොට ඒක කියන්නේ සහකාර අධ්‍යක්ෂක කියලා .

ප සහකාර අධ්‍යක්ෂක කියලා ?

උ ඔව්. එතකොට මට පුහුනුවිමක් ලැබුනා මුල් කාලයේ බැඳෙනකොට. විශේෂයෙන් මුලික පුහුණුවිමක් . ඊට පස්සේ උසස් පුහුනුවීම් ලබලා තියෙනවා. ඊට පස්සේ විශේෂඥ පුහුණුවීම් ලබලා තියෙනවා තොරතුරු විශ්ලේෂණය සම්බන්ධයෙන් .

ප මම පොඩ්ඩක් බාධා කරනවා අර මූලික පුහුණුවේදී මොන වගේ දේවල්ද පුහුණු කරන්නේ ?

උ මුලික පුහුණුවේදී සාමාන්‍යයෙන් බුද්ධි නිළධාරියෙක් වශයෙන් තමන්ගේ මුලික රාජකාරී මොකක්ද , ඒ ගොල්ලන් ට දිය යුතු ගුණාංගය මොකක්ද, එතකොට ඒ ගොල්ලෝ තොරතුරු කාරයෝ පවත්වාගෙන යන යා යුත්තේ කෙසේද ? තොරතුරු කාරයෝ බඳවා ගන්නේ කෙසේද ? වාර්තා ලියන්නේ කෙසේද ? අන්න ඒ වගේ මූලික පාඨමාලාවක් තමයි එතන සාමාන්‍යයෙන් දෙන්නේ

ප එතකොට විශේෂ පුහුණුවේදී මොනවද උගන්වන්නේ ?

උ විශේෂ පුහුණුවේදි අපි කියමු විශ්ලේෂණය සම්බන්ධයෙන් තොරතුරු විශ්ලේෂණය සම්බන්ධයෙන් විශේෂ පුහුණුවීම් තියෙනවා. එතකොට අවේක්ෂණ සම්බන්ධයෙන් විශේෂ පුහුණුවීම් තියෙනවා . එතකොට අපි ඉංග්‍රිසියෙන් කියනවා psychological operations කියලා එහෙම විශේෂ පුහුණුවීම් තියෙනවා එතකොට තාක්ෂණය පිළිබඳ විශේෂ පුහුණුවීම් තියෙනවා තාක්ෂණය කියන කොට ලොකු පරාසයක් ඒක කියන්නේ technical aid කියලා technical aid එව්වා.

ඉතින් එතකොට ඒ අනුව විශේෂයෙන්ම දුරකථන විශ්ලේෂණ ඒ වගේ.

ප ඒ කියන්නේ දුරකථන තොරතුරු විශ්ලේෂණ ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ තොරතුරු විශ්ලේෂණය. ඊලඟට දත්ත කළමණාකරණය . දත්ත ගබඩා කිරීම් ඒ වගේ ඒ විෂයට අදාල නොයෙක් නොයෙක් විශේෂිත වූ පුහුණුවීම් දෙනවා

ප එතකොට ඔබ ඒ වගේම සඳහන් කලා උසස් පුහුණුවීමකුත් ලැබෙනවා කියලා ?

උ ඔව්.

ප මොකක්ද මේ උසස් පුහුණුවීම කියන්නේ ?

උ උසස් පුහුණුවීම් කියන්නේ අපි හිතමුකෝ ඔබ යම්කිසි දෙයකින් පරිණත භාවයකට පත් වුනා නම් ඔබ ඒකේ විශේෂඥයෙක් වෙනවා එතකොට ඔබට ඒ පිළිබඳ වෙනමම පුහුණුවීම් දෙනවා . දේශීය විදේශීය වෙනම පුහුණුව දෙනවා ඒ තෝරා ගත්ත කට්ටියට ඒ විෂයයට අදාලව. ඒ ඒ පුහුණුවීම් දෙනවා මම විශේෂඥ හැම දෙයක්ම කරලා නැහැ එකක් හරි දෙකක් හරි තමයි කරලා තියෙන්නේ.

ප මොනවද ඔබ විශේෂඥතාවය ලැබූ පුහුණුවීම්?

උ විශේෂයෙන්ම තොරතුරු විශ්ලේෂණය.

ප සම්බන්ධයෙන් ඔබ විශේෂ පුහුණුවක් ලබලා තියෙනවා ?

උ ඔව්.

ප එතකොට ඔබ ඔය සඳහන් කරපු තෙයාකාර පුහුණුව ලංකාවේ අනිවාර්යයෙන්ම ඔබට ලැබෙන්නට ඇති නේද?

උ ඔව්. එහෙමයි ස්වාමිනි.

ප එතකොට ඔබ විදේශයන්හිදි පුහුණුවීම් සඳහා සහභාගි වුනාද ?

උ සහභාගි වුනා .

ප මොන රටවල් වලද ? මොන මොන ආයතන මගින්ද ඔබව පුහුණු කලේ?

උ ඔස්ට්‍රේලියාවේ දෙවරක් ගියා . ඊට පස්සේ පිටරට කට්ටිය මෙහේ ආවා.ඒ පුහුණුවීම් කලා. විශේෂයෙන්ම තොරතුරු විශ්ලේෂණය සම්බන්ධයෙන් ඊලඟට මම පකිස්ථානයේ මම ගිහිල්ලා තියෙනවා . ඒවගේ රටවල් කිහිපයක මම පුහුණුවීම් ලබලා තියෙනවා විශේෂයෙන්ම හුගක් පුහුණුවීම් ලබලා තියෙන්නේ පිටරට වල මෙහෙ එන කට්ටිය මගින් දීපු පුහුණුවීම් තමයි හුගක් ලබලා තියෙන්නේ. එතකොට විදේශ පුහුණුවීම් මං 3 ක් විතර කරලා තියෙනවා මම ඔය කියන ඔස්ට්‍රේලියාවේ ඊලඟට පකිස්ථානය වගේ තැන්වල.

ප දැන් ඔබ කිව්වානේ ඔබ දත්ත විශ්ලේෂණය සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලබලා තියෙනවා කියලා . දැන් ඔය විශ්ලේෂණය කරන්න නම් දත්ත ඒ සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන්නට ඕනෙනේ.

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි.

ප ඒ තොරතුරු ලැබීමේ මූලාශ්‍ර මොනවාද රාජ්‍ය බුද්ධි සේවාවට.?

FAIR COMMENT BY JEZEEM

උ තොරතුරු දෙකොටසකට බෙදන්න පුළුවන් . එකක් තමයි විවෘත තොරතුරු අනික තමයි සංවෘත තොරතුරු විවෘත තොරතුරු අපිට ගන්න පුළුවන් මුද්‍රිත සහ Electronic and Print media විද්‍යුත් මුද්‍රිත මාධ්‍යය

ප ඒ කියන්නේ ඕනෑම මෙම මහජනතාවට විවෘත වූ දේවල් තමයි ඔබ කියන්නේ විවෘත මාධ්‍යය කියලා ?

උ ඒ සමාජ ජාලයෙන් . ඒ එකක් ඊලඟට සංවෘත තොරතුරු අපි ගන්න ඕනේ අපි ක්‍රියාවේ යොදවලා තියෙන්නේ අපි ක්‍රියාකාරිව භූමියේ වැඩ කරන නිළධාරීන් ගෙන් ඒ ගොල්ලන්ගෙන් තමයි අපි ඒ තොරතුරු ගන්නේ.

ප ඒ කියන්නේ ground level එකෙන්

උ ඒ කියන්නේ ground level we call them operatives ඒ ඇවිල්ලා තොරතුරු ලබා ගැනීම. තව එකක් තියෙනවා sharing of Intelligence ඒක අපි කරන්නේ ආයතනයත් එක්ක.

ප හුවමාරුව ?

උ තොරතුරු හුවමාරුවඒ අපේ අන්‍යොන්‍ය සම්බන්ධතාවය මත අපි දේශීයවත් විදේශීයවත් එහෙම තොරතුරු අපි ලබා ගන්නවා ඒක Intelligence sharing තොරතුරු හුවමාරු කරගැනීම .

ප තොරතුරු හුවමාරු කිරීම.?

උ ඔය දෙවර්ගය තමයි කෙරෙන්නේ.

ප දැන් විදේශයෙන් බැලුවාම විදේශයෙන් අපිට තොරතුරු ලැබෙනවාද ඔය වගේ ?

උ අනිවාර්යයෙන්ම ලැබෙනවා.

ප එතකොට අපිත් දන්න දේවල් විදේශයන්ට දෙනවාද ?

උ අනිවාර්යයෙන්ම දෙනවා.

ප ඒක අන්‍යොන්‍ය අවබෝධය මතද කරන්නේ ?

උ අන්‍යොන්‍ය අවබෝධය මත තමයි කරන්නේ.

ප ඒ සඳහා හොඳ අවබෝධයක් තියෙන්නට ඕනේද රාජ්‍ය බුද්ධි සේවයත් ඔබේ සහායකයිනුත් අතර ඒ කියන්නේ counter partsලත් එක්ක ?

උ ඒක තමයි දැන් ස්වාමිනි ඔය තොරතුරේ වටිනාකම තියෙන්නේ තොරතුර කොයිතරම් දුරට නිශ්චිතද කියන එක

ප ඔව්.

උ එතකොට ඒ නිශ්චිත මත තමයි ඇත්ත වශයෙන්ම අපට හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යන්නේ. ඉතින් අපි හිතුවා අපි දෙන තොරතුරු වගේම ඒ ගොල්ලන්ගෙන් ලැබෙන තොරතුරු ඒකට බොහෝ දුරට බලපානවා. ඉතින් මම දන්නා තරමින් මගේ පලපුරුද්ද හැටියට ඔය විදේශයේ ඉන්න 99% ක් නැත්නම් 95%ක් නිශ්චිත තොරතුරු තමයි එන්නේ ඒ දෙයාකාරයි සමහර එව්වා සාමාන්‍ය

FAIR COMMENT BY JEZEEM

තොරතුරු දෙනවා . සමහර ඒවා බුද්ධි තොරතුරු කියලා එනවා සාමාන්‍ය තොරතුරු එනවා general intelligence ඒවා එච්චර බලපාන්නේ නැහැ නමුත් විශේෂ අවස්ථාවල එනවා නිශ්චිත තොරතුරු ඒවා සෘජුවම ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරු .

ප්‍ර එතකොට ඔබ කියන්නේ ඒක ලංකාවෙනුත් ඒ වගේ නිශ්චිත තොරතුරු ලැබෙන්නට පුළුවන්ද බුද්ධි තොරතුරු ලංකාව තුලදී?

උ ලංකාව තුලදී ලැබෙන්න පුළුවන් ඒ ලැබුනොත් අපි ඒ අවශ්‍ය කට්ටියත් එක්ක අපි අනිවාර්යයෙන්ම ඒක share කර ගන්න ඕනේ හුවමාරු කර ගන්න ඕනේ.

ප්‍ර ඒ වගේම විදේශයන්ගෙනුත් අපිට බුද්ධි තොරතුරු ලැබෙන්නට පුළුවන්ද ඒ වගේ ?

උ පුළුවන්

ප්‍ර සාමාන්‍ය තොරතුරු බැලුවොත් අපි සාමාන්‍ය තොරතුරක් බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කර ගන්නට පුළුවන්ද ?

උ පුළුවන් ඒක මෙහෙමයි

ප්‍ර එකම ක්‍රමවේදය අනුවද ?

උ එතන තමයි විශ්ලේෂණය බලපාන්නේ. දැන් හුඟක් දුරට එන තොරතුරු ඇවිල්ලා සාමාන්‍ය තොරතුරු වෙන්න පුළුවන්. සංවෘත තොරතුරුත් වෙන්න පුළුවන්. විවෘත තොරතුරුත් එන්න පුළුවන්. එතකොට මේ සම්බන්ධයෙන් මොනවා හරි ප්‍රශ්ණයක් තියෙනවා නම් අපි ප්‍රශ්ණගත ඒවා හඳුනාගන්න ඕනේ ඉස්සරලා තොරතුරු කාරයන්ගේ විශ්වාසවන්ත අඳුරාගන්න ඕනේ. ඊට පස්සේ ඒත් එකක්ම අපි ගන්න ඕනේ සාමාන්‍ය තොරතුරු මේ දෙක එකතු කරලා ඒ හිඩස් තියෙනවා නම් ඊට පස්සේ අපි ඊලඟට ක්‍රියාත්මක වෙන්න ඕනේ ඒ හිඩස් පුරවන්න

ප්‍ර කොහොමද ඒක පුරවන්නේ ?

උ ඒ හිඩස් පුරවන්නේ අපේ ඉන්නවානේ භූමියේ වැඩ කරන කට්ටිය ඒ අය උසස් නිළධාරීන් මාර්ගයෙන් . මෙන්න මේ තොරතුර අවශ්‍ය දේ විතරක් අපි ඒ ගොල්ලන්ට යවනවා.ඔක්කොම නෙවෙයි අවශ්‍ය බුද්ධි තොරතුර අවශ්‍ය අඩංගු නෛතික කරුණු තමයි අපි යවන්නේ. ඇවිල්ලා මේ සම්බන්ධයෙන් අපිට තොරතුරු දෙන්න කියලා . එතකොට ඊට අමතරව අපේ SIS එකේ ගබඩාවේ තොරතුරු ලක්ෂ ගණන් තියෙනවා තොරතුරු එතකොට එව්වා අපි පුනරීක්ෂණය කරන්න ඕනේ we call it record check

ප්‍ර record check ?

උ record check කරන්න ඕනේ. ඉතින් එතකොට ඒ තුලිනුත් තොරතුරු ගන්න පුළුවන් ඒක ඇත්ත වශයෙන්ම ඒක ක්‍රමයක් තියෙනවා ඒ ක්‍රමය අනුගමනය කලා නම් අපිට Button එක ඔබන්න විතරයි තියෙන්නේ ,

FAIR COMMENT BY JEZEEM

තොරතුරු ගලා එනවා. හැබැයි ඉතින් මෙව්වට ඒ දත්ත ඉස්සෙල්ලාම feed කරලා තියෙන්න ඕනේ.

ප ඔව් ඒ ඔබ කියන්නේ තාක්ෂණික වශයෙන් ලබා ගන්න කොට?

උ ඔව් තාක්ෂණික වශයෙන් ඒ නැතත්, ඒ තොරතුරු ඒ අදාල අංශ වල තියෙන්න ඕනේ.

ප තියෙන්න ඕනේ. ඒ කියන්නේ භෞතික ආකාරයට?

උ භෞතික ආකාරයට තියෙන්න ඕනේ ඒ භෞතික ඒක තමයි ඒ hard එක තමයි අපි soft එකට කරන්නේ අපි.ඒක බලන්නේ තාක්ෂණයෙන් කරන්නේ අපි .

ප එතකොට ඔබ දුරකථන විශ්ලේෂණය ගැනත් කිව්වානේ ?

උ ඔව්.අනිවාර්යයෙන්ම.

ප එතකොට දුරකථන විශ්ලේෂණයත් එහි සිදු කිරීමක් කරනවාද ?

උ ඒකත් කරන්න ඕනේ. ඒ තොරතුරු තහවුරු කරන්න ඔක්කෝම ගන්න ඕනේ.ඔක්කෝම ගන්න ඕනේ ඒ අරන් ඒ එකතු කරලා ඒ අදාල තොරතුරු එකතු කරලා ඊට පස්සේ අපි චිත්‍රයක් මවන්න ඕනේ ඒ චිත්‍රයේ බලන්න ඕනේ ඒ චිත්‍රයේ මේවා එනවාද කියලා එතකොට අපි තොරතුරු බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කරනවා.

ප පරිවර්තනය කරනවා හොඳයි . බොහොම ස්තූතියි . දැන් අපිට තවදුරටත් ඔබේ කාර්යභාරය ඔබ ඔය අවුරුදු 14 ක් තුලදී සිදු කරපු කාර්ය භාරය පැහැදිලිව වටහා ගැනීම සඳහා මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවයේ ව්‍යුහය පිළිබඳව ව්‍යුහාත්මක වශයෙන් ඒක කොහොමද ඔබේ කාල පරිච්ඡේදය තුලදී සකස් වෙලා තිබුනේ ?

උ මගේ කාලය පරිච්ඡේදය තුලදි සකස් වෙලා තිබුනේ ඒක අධ්‍යක්ෂ තමයි මුලිකයා ඒ ආයතනයේ එයා වගකියන්නේ සෘජුවම ආරක්ෂක ලේකම්ට.

ප ආරක්ෂක ලේකම්ට ?

උ ඒ සෘජුවම වග කියන්නේ ආරක්ෂකලේකම්ට .

ඊට අමතරව CNI. CNI ජාතික බුද්ධි ප්‍රධානි හිටියා .එයත් එක්ක සම්බන්ධකම් පවත්වන්න ඕනේ. මෙතෙන්දි මට අවසර දෙන්න පොඩි යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න ?

ප පැහැදිලි කිරීමක් කරන්න

උ දැන් හුඟක් වෙලාවට යම් යම් ගැටළු මතුවුනා .

ප මොනවද ගැටළු ඔබේ සේවා කාලය තුලදී වුණ දේවල්ද?

උ ඔව්.එතකොට .Gap එකක් තිබුනා secretary Defence Director SIS අනිවාර්යයෙන්ම CNI අන්න ඔතන පොඩි ගැටළුවක් තිබුනා .ඒකට හේතුව තව වෙන තුරු අපි මේකට ප්‍රඥප්තියක් ජාතික වශයෙන් මේ ප්‍රතිපත්ති සකස් කරලා නැහැ ප්‍රඥප්තියක් හදලා නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මොකටද ?

උ ජාතික තොරතුරු සේවය ගැන

ප්‍ර ජාතික තොරතුරු සේවය පිළිබඳව ප්‍රඥප්තියක් මේ වන තුරු සකස් නොකරපු එක ඔබ හඳුනා ගන්නවා මේ ක්‍රමයේ තියෙන අඩුපාඩුවක් හැටියට ?දුර්වලතාවයක් හැටියට ?

උ ඔව් chain of command කියන එකේ.

ප්‍ර ඒ කියන්නේ It is not documented of any where the chain of command

උ exactly ‘

ප්‍ර that’s why you say there is a failure

උ Absolutely

ප්‍ර දැන් යම් හෙයකින් මම ඉතුරු කොටසට යන්න ඉස්සෙල්ලා ඔබෙන් අහනන කැමතියි රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාට පුළුවන්ද දැන් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාත් ආරක්ෂක ලේකම්වරයාත් අතරට තමයි ඔය රාජ්‍ය බුද්ධි ජාතික බුද්ධි ප්‍රධානි ඉන්නේ ?

උ ජාතික බුද්ධි ප්‍රධානි.

ප්‍ර එතකොට රාජ්‍ය බුද්ධි ප්‍රධානියට පුළුවන්ද ඒ කියන්නේ අධ්‍යක්ෂකවරයාට director SIS ට පුළුවන්ද CNI නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානියාව නොතකා හරින්න නැත්නම් අවතක්සේරු කරන්න ?

උ එහෙම කරන්න බැහැ.

ප්‍ර ඒ කියන්නේ තමන් ඒ පුද්ගලයාට කැමති වුනත් ඒ පුද්ගලයාට ඒ තනතුර දරන්න සුදුසු කම් තිබුනත් නැතත් ඔහු සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න ඕනේ ,ඔහුගේ යම් ආකාරයට කොයි ආකාරයටද ඔවුන් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් හට ගන්නේ ?

උ ඇත්තටම අන්‍යොන්‍ය සම්බන්ධතාවය හට ගන්නේ මේ තොරතුරු පල්ලහා ඉඳන් උඩට ගලාගෙන එනකොටත් උඩ ඉඳන් පල්ලහාට ගලා ගෙන එන කොටත් . එතකොට තමයි හට ගන්නේ එතකොට අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය දෙන හැම තොරතුරක්ම ගැනම මෙයා දැනුවත් වෙන්න ඕනේ.

ප්‍ර කව්ද දැනුවත් වෙන්න ඕනේ ?

උ ජාතික බුද්ධි ප්‍රධානී අනිවාර්යයෙන්ම දැනුවත් විය යුතුයි. ඒකයි ඒ දාලා තියෙන්නේ . එයාගේ මූලික කාර්යය තමයි මේ තියන ජාතික බුද්ධි සේවා පද්ධතියේ තියෙන ජාතික බුද්ධි සේවයයි එතකොට ත්‍රිවිධ හමුදා බුද්ධි සේවයයි සම්බන්ධීකරණය කරන්නේ .

ප්‍ර සම්බන්ධීකරණය කරන්නේ ජාතික බුද්ධි ප්‍රධානි?

උ එයා තමයි කරන්නේ .

ප්‍ර එතකොට එහෙමනම් ඔහු ඉතාම වැදගත් තනතුරක් තමයි දරන්නේ ?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප ඒ නිසා තමන් ගේ පෞද්ගලික ආකල්ප එහෙම නම් ජාතික බුද්ධි ප්‍රධානි සමඟ කටයුතු කරන කොට කෙනෙක්ට අදාල වෙන්නේ නැහැ ?

උ ඒක අදාල වෙන්නේම නැහැ. මේක හුදෙක් රාජකාරී මට්ටමෙන් කල යුතු දෙයක් .

ප කලයුතු දෙයක් ඒක අනිවාර්යයද ?

උ එය අනිවාර්යයයි.

ප එතකොට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකට යටින් ඉන්නේ කවුද ?

උ අධ්‍යක්ෂකට යටින් ඉන්නවා අතිරේක අධ්‍යක්ෂක කියලා .Additional Director

ප Additional Director ඔහුගේ කාර්ය භාරය මොකක්ද ?

උ ඔහුගේ හුඟක් වෙලාවට ඔය අතිරේක අධ්‍යක්ෂක කරේ හුඟක් වෙලාවට පරිපාලනය සම්බන්ධව තමයි හුඟක් කලේ .නමුත් ඊට අමතරව එයාට යම්කිසි වගකීමක් දෙනවා යම්කිසි විෂයක් පිළිබඳ විෂයන් කීපයක් තියෙනවා විෂයක් පිළිබඳ එයාට දෙනවා හුඟක් වෙලාවට එයා කරේ හුඟක් වෙලාවට පරිපාලනය සම්බන්ධයෙන් තමයි.

ප පරිපාලනය සම්බන්ධව වූ විෂය ඔහු කලා ?

උ ඔව්.ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

ප නියෝජ්‍ය අධ්‍යක්ෂවරු ඔබේ වකවානුවේදී කී දෙනෙක් හිටියාද ?

උ මම හිතන්නේ මට මතක හැටියට 10 ක් විතර හිටියා.
විෂයන් කීපයක් ආවරණය කරන්න .

ප එතකොට මොනවද ඔබ ඔය සඳහන් කරන විෂයයන් ?

උ එකක් තමයි counter terrorism, Political Parties, Trade unions වෘත්තිය සමිති, Extremism ඊලඟට Training , ඊලඟට Technical aid, surveillance අරව මේවා . ඊලඟට foreign mission කියලා එකක් තිබ්බා. ඒවගේ කීපයක් තිබ්බා .

ප ඒ වගේම ඔබ කිව්වා පරිපාලනයත් මේවා යටතට ආපු එක විෂයක් ?

උ එක විෂයක් ඔව්.

ප එතකොට දැන් ඔබ දත්ත විශ්ලේෂණය සම්බන්ධයෙන් තමයි එතකොට විශේෂ දැනුමක් ලබා ගත්තා කියලා කිව්වේ නේද ?

උ එහෙමයි ස්වාමිනි.

ප ඔය subjects එහෙම නැත්නම් ඔය අදාල විෂයන් නියෝජ්‍ය අධ්‍යක්ෂක වරුන්ට ලබාදීලා තිබුනනේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප ඒ හැරෙන්නට ලංකාවේ යම් යම් පළාත් ඔවුන් පාලනය කළාද?

උ ඔව් . මේ හැම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට අතිරේක අධ්‍යක්ෂ ඇතුළුව ඒ ගොල්ලන්ට පළාත් 09 ක් දීලා තිබ්බා.එතකොට ඒ ගොල්ලන් යටතේ හිටියා සහකාර අධ්‍යක්ෂවරු නැත්නම් ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරු ඒ ගොල්ලන්ටත් ඒ පළාත් වල දිස්ත්‍රික් වගේ යම් යම් තැන් දීලා තිබ්බා .

FAIR COMMENT BY JEZEEM

එතකොට ඔය පහලින් එකක දිවයින පුරාම පහලින් පිහිටා ඇති භූමියේ කට්ටිය හිටියා ඒ ගොල්ලන් ඒ station වලම තමයි හිටියේ ඒ ගොල්ලන් ඒ පොලිසි වල වැඩ කලා. ඒ ගොල්ලන්ට කියන්නේ DIB District Intelligence Bureau දිස්ත්‍රික් බුද්ධි කාර්යංශය එතකොට මේ ගොල්ලොත් එක්ක ඒ ගොල්ලන් සම්බන්ධීකරණය කරලා ඒ පළාතේ වෙන දේවල් ඔක්කෝම දේශපාලන , සමාජ , ආර්ථික ඔය සම්බන්ධයෙන් එන හැම එකක්ම ඒ ගොල්ලන් දෙන්න ඕනේ සහකාර අධ්‍යක්ෂවරයාට, සහකාර අධ්‍යක්ෂවරයාගේ වගකීම තමයි අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට දෙන එක. ඒ තොරතුරු ඔක්කෝම.

ප්‍ර එතකොට අර ධුරාවලිය අනුව ඉහළට තොරතුරු ගලා ගෙන ඒමක් සිද්ධ වෙනවා?

උ ඒ ඒ විෂයට අදාල තොරතුර ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කරන්නේ මොකක්ද ඒක විෂය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට දෙනවා .ඊට පස්සේ විෂය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඒ භූමියේ කට්ටියත් එක්ක සම්බන්ධ කම් කරනවා තවදුරටත්. එහෙම තමයි ඒ ක්‍රියාකාරිත්වය යන්නේ .

ප්‍ර ඒ කියන්නේ ඔබ කියන ආකාරයට ඔය තොරතුරු සැපයීම බිම් මට්ටමේ ඉඳලා සිරස්ව වගේම තිරස්වත් සිද්ධ වෙනවාද ?

උ එතකොට ඒක යන්නේ සමහර විට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඒ විෂය පථය භාර නෙවේ වෙන්න පුළුවන් . එතකොට එයා දෙන්න ඕනේ විෂය පථය බාර නියෝජ්‍ය අධ්‍යක්ෂකට.

ප්‍ර අදාල විෂය පථය බාර එක්කෙනාට දෙනවා.?

උ ඊට පස්සේ එයා විෂය පථය බාර එක්කෙනාගේ වගකීම තමයි ඒක භූමියත් එක්ක සම්බන්ධීකරණය කර ගන්න.

ප්‍ර එතකොට මොකද ඇයි දැන් තොරතුර දුන්නනේ වෙනත් සහකාර අධ්‍යක්ෂක වරයෙක්ට. ඒ නිසා දැන් ඔහු බිම් මට්ටමේ එක්කෙනත් එක්ක සම්බන්ධ කරනවා ?

උ සම්බන්ධ කර ගන්නවා.

ප්‍ර එහෙම තමයි තොරතුරු රැස්කරගෙන ඊට පස්සේ දත්ත විශ්ලේෂණයට යනවාද ? අර ඔබ සඳහන් කරපු ආකාරයට ?

උ ඊට පස්සේ දත්ත විශ්ලේෂණයට අනිවාර්යයෙන්ම යන්න ඕනේ.

ප්‍ර අනිවාර්යයෙන්ම යනවා අධ්‍යක්ෂකවරයා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා යම් නියෝගයක් කරනවා ඒ නියෝගය කරන්නේ ඔහු බිම් මට්ටමේ ඉන්න නිළධාරියෙකුට නැත්නම් නිළධාරි කණ්ඩායමකට.එතකොට ඔය විධානය කොහොමද අර බිම් මට්ටමේ ඉන්න නිළධාරින්ට යන්නේ අධ්‍යක්ෂකවරයා ගෙන් ?

FAIR COMMENT BY JEZEEM

උ එහෙම සෘජුවම අධ්‍යක්ෂකවරයා යම්කිසි නියෝගයක් කලා නම් ඇත්ත වශයෙන්ම එතකොට ඒ බිම් මට්ටමේ ඉන්න නිළධාරිට සිද්ධ වෙනවා ඒ කෙළින්ම අධ්‍යක්ෂකවරයාට ඒ තොරතුරු දෙන්න .

ප Is that that the director would directly contact the ground level people or does it go through the deputies and to the ground level people

උ ඒක සාමාන්‍යයෙන් වෙන්න ඕනේ ඒ තොරතුරු උඩ ඉඳන් පල්ලහාට ගලාගෙන එන්න ඕනේ.

ප ඒ කියන්නේ ඒ අදාල නිළධාරීන් මාර්ගයෙන් පල්ලහාට එනවා බිම් මට්ටමට.?

උ යනකොටත් ඒ විදියටම තමයි යන්න ඕනේ.

ප ඒ විදියටමයි යන්න ඕනේ ?

උ ඔව් ඇතැම් අවස්ථාවල ඇති කෙලින්ම එම තොරතුරු විමසන අවස්ථාවනුත් ඇති ඒ ඇවිල්ලා අධ්‍යක්ෂවරයාගේ බිම් මට්ටමේ තියෙන සම්බන්ධතාවය අනුව. එතන වෙනත් කාරණාත් ඇති ඕවට. අනිවාර්යයෙන්ම තියෙනවා. එහෙම සිද්ධීන් වෙලා තියනවා.

ප එතකොට ඒකේ හැකියාවකුත් තිබෙන බවයි ඔබ කියන්නේ ?

උ ඔව්.එහෙම හැකියාවක් තියෙනවා .

ප නමුත් සාමාන්‍ය ක්‍රමවේදය වෙන්නේ අර තොරතුර ගලා ආවේ කොහොමද තමන්ට පණිවිඩය ලැබුනේ කොහොමද ඒ ආකාරයටම රැස්කර ගන්නා ලද්දාවූ ඒ දත්ත ඉහලට යනවා ?

උ එහෙම තමයි වෙන්නේ.

ප එතකොට දැන් අපේ රටේ පළාත් තියෙනවානේ 09 ක් නේ ?

උ ඔව්.

ප එතකොට ඒකෙන් දෙකක් තමයි එකක් උතුරේ තියනවා අනිත් එක නැගෙනහිර තියෙනවා ?

උ එහෙමයි ස්වාමිනි.

ප උතුරේ ඉන්න ජන කොට්ඨාශය ඒ සම්භවය අනුව බැලුවහම ද්‍රවිඩ සම්භවයක් තියෙන අය වැඩිපුරම?

උ එහෙමයි ස්වාමිනි.

ප ඒ අය කථා කරන්නේ දමිළ භාෂාව?

උ ඔව්.

ප අදහනවා හින්දු ආගම, කතෝලික ආගම. අදහන්නන් වන්නට පුළුවන්. නැගෙනහිර පළාත ගත්තාම එතන ද්‍රවිඩ සම්භවයක් තියෙන අයත් ඒ වගේම මුස්ලිම් සම්භවයක් තියෙන අයත් සමහර විට සිංහල සම්භවයක් තියෙන අයත් ඉන්නවා නේද ?

උ එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට එහෙමනම් ඒ ගොල්ලන්ගේ සංස්කෘතින් එකිනෙකාට වෙනස්. ඔවුන් අදහන ආගම් වෙනස්. ඔවුන් පැවතෙන පසුබිම වෙනස් වෙනවා?

උ එහෙමයි ස්වාමිනි

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවය කාර්යක්ෂමව තොරතුරු රැස් කර ගන්න නම් ඔය පළාත් පාලනය කරන කොට නැත්නම් පළාත් වලින් බිම් මට්ටමින් තොරතුරු ගන්න කොට යම් ක්‍රමවේදයක් අනුගමනය කරනවාද?

උ ඔව්. ස්වාමිනි දැන් ඔතන විශේෂයෙන්ම උතුරු නැගෙනහිර දැන් නැගෙනහිර ගත්තාම නැගෙනහිර සම්පූර්ණයෙන්ම ජනගහනය බැලුවාම 1/3, 1/3, 1/3 තමයි තියෙන්නේ . එතකොට ඒ ඒ පළාත් අනුව අපි දාන්න ඕනේ ඒ සමාජ සංස්කෘතියටයි ඒ ආගම පසුබිමටයි ඒ සම්බන්ධයෙන් දැනුමක් ඇති නිළධාරින්. එතකොට විශේෂයෙන්ම දමිළ භාෂාව කථා කරන්න . ඉතින් දමිළ භාෂාව කරනකොට .

ප්‍ර ඇයි ඒ ?

උ නැත්නම් තොරතුරුකාරයෝ පවත්වාගෙන යන්න බැහැනේ. දැන් දමිළ භාෂාව දන්නේ නැති කෙනෙක් කොහොමද තොරතුරු කාරයෙක් පවත්වාගෙන යන්නේ . එහෙම වුනොත් සන්නිවේදනය ප්‍රශ්නයක් නේ.

ප්‍ර ඔහු ආගන්තුකයි ඒ තියෙන පරිසරයට ?

උ ආගන්තුකයි ඔව්. සමහර විට දන්නවා නම් ප්‍රශ්නයක් නැහැ.දන්නේ නැත්නම් ප්‍රශ්නයක් අනිත් එක දැන ගත්තත් වැඩක් නැහැ ඒ හරියේ එයාගේ ඒ පසුබිම ඒ පළාතේ පසුබිම එයා හොඳට දැන ගෙන ඉන්න ඕනේ.භූමිය එහෙම නැත්නම් තොරතුරු ගන්න හුහක් අමාරු වෙනවා . තොරතුරු කාරයෝ බඳවා ගන්න අමාරු වෙනවා. තොරතුරු බඳවා ගත්තත් ඒවා ලබා ගන්න අමාරු වෙනවා. ලබා ගන්න හරියට ඒක හරියට ලස්සනට ඒක වාර්තා කරන්නත් අමාරු වෙනවා. ඒ ප්‍රශ්නය තියෙනවා.

ප්‍ර ඉතින් එතකොට මොකක්ද රාජ්‍ය බුද්ධි සේවය කරන්නේ ඔය ප්‍රශ්නයට පිළිතුරක් විදියට ඔබේ කාලයේදී මං අහන්නේ ?

උ ඒ කාලයේදී හුහක් අපි උතුරු නැගෙනහිරට දැම්මේ දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් කියවන්න පුළුවන්, අය තමයි දැම්මේ. එතකොට මේ ගොල්ලෝ ඒ කට්ටියත් එක්ක සංනිවේදනය කරලා මේ ගොල්ලෝ තොරතුරු දුන්නා.පසු කාලයේදි මං දන්නේ නැහැ ඒක මොනවද වුනේ කියලා විශේෂයෙන්ම දැන් ඔය ප්‍රශ්ණෙදි අර ද්‍රවිඩ ප්‍රශ්නය එකක් . මේ ප්‍රශ්නය තව එකක්. ප්‍රශ්ණ දෙකක් මෙතන.

ප්‍ර ඔබ ඔය ද්‍රවිඩ ප්‍රශ්නය කියන්නේ එල්. ටී. ටී. ඊ. සංවිධානයේ ප්‍රශ්නය?

උ එල්. ටී. ටී.ඊ ,ප්‍රශ්නය මේක තව එකක්.

ප්‍ර මේ ප්‍රශ්නය කියන්නේ මේ මුස්ලිම් අන්තවාදය?

උ මුස්ලිම් අන්තවාදය .ඉතින් ඒ අනුව බලලා හරි නිළධාරීන් භූමියට දැම්ම තමයි රාජ්‍ය බුද්ධි සේවයෙන් විය යුත්තේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔබගේ වකවානුව තුලදී ඔය පැවතුනාය කියන ක්‍රමවේදය අනුව එය සාර්ථකව ඔබේ බිම් මට්ටමේ ඉන්න නිළධාරීන් ජනතාව අතර ගැවසිලා අවශ්‍ය තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයට ලබා දුන්නාද ?

උ අනිවාර්යයෙන්ම ලබා දුන්නා උතුර සම්බන්ධයෙනුත් නැගෙනහිර සම්බන්ධයෙනුත් එතකොට එතෙන්ට හුඟක් වෙලාවට දාලා හිටියේ දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් ලියන්න පුළුවන් , කියවන්න පුළුවන් කට්ටිය එතකොට ඒ ගොල්ලෝ ඒ හරියට සංනිවේදනය කලා තොරතුරු කරුවන් එක්ක. ඒ අතින් ඒ තොරතුරු අවශ්‍ය විදියට අපට ආවා . ඒවා තමයි අපි වාර්තා කලේ උඩට.

ප්‍ර ඔබට කියන්න පුළුවන්ද මාසෝ මහත්මයා ඔගේ වකවානුව තුලදී ඒ රාජකාරි කාලය තුලදී ජ්‍යෙෂ්ඨ නිළධාරීන් කණිෂ්ඨ නිළධාරීන් සමඟ රාජකාරි කරනකොට අන්‍යොන්‍ය විශ්වාසය පදනම් කරගෙනද ඒක කලේ කියලා ?

උ ඔව් ස්වාමිනි. මේ ඇත්ත වශයෙන්ම මේ බුද්ධි ආයතනයක තියෙන්න ඕනේ එකම මම හිතන්නේ දේ තමයි ඒ නිළධාරීන් අතර අන්‍යොන්‍ය විශ්වාසය අන්‍යොන්‍ය විශ්වාසය නැතුව මේ රාජකාරි කිරීම හරිම අපහසුයි. ඒ විශ්වාසය අනිවාර්යයෙන්ම තියෙන්න ඕනේ. ඒ විශ්වාසය ගොඩනඟා ගන්න ඕනේ. ඒ විශ්වාසය මත තමයි ඕන බුද්ධි අංශයක් පවතින්නේ.ඒ විශ්වාසය නැත්නම් ඒ බුද්ධි අංශයේ පැවැත්ම යම්කිසි ප්‍රශ්නාර්ථයක් වෙනවා.

ප්‍ර ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ කඩා වැටීමක් එහෙම වුනොත් සිද්ධ වන්නට පුළුවන්?

උ වෙන්නට පුළුවන්.

ප්‍ර ඔබේ ධුර කාලය ඒ කියන්නේ ඔබ සේවය කරපු කාලය තුල දී මේ රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ අධ්‍යක්ෂක තනතුර එහි දැරුවාද ?

උ මම එවකට ආණ්ඩුව පරිවර්තනය වුනාට පස්සේ .

ප්‍ර මොන ආණ්ඩුවද කියලත් කියන්න ඕනේ දැන් .?

උ 2005 වසරේ ආණ්ඩු පෙරළියත් එක්කම හිටපු අධ්‍යක්ෂතුමාට එතනින් මාරුවීමක් ලැබුනා. මාස දෙක හමාරක් හෝ තුනක් හෝ මං වැඩ බලන අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කලා.

ප්‍ර කටයුතු කලා .ඊට ඉස්සරවෙලා ඔබ මොන තනතුරක්ද දැරුවේ රාජ්‍ය බුද්ධි සේවයේ ?

උ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් මං හිටියේ.

ප්‍ර දැන් ඔබේ ඔය ධුර කාලයන් තුලදී ඔබ රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් යම් යම් රැස්වීම් වලට සහභාගි වෙලා තියෙනවාද?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර මොන වගේ රැස්වීම් වලටද?

FAIR COMMENT BY JEZEEM

උ අතිරේක අධ්‍යක්ෂ නෙමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉන්නකොටත් මං සහභාගි වෙලා තියෙනවා . විශේෂයෙන්ම මන් CDS ඒ කියන්නේ මාණ්ඩලික ආරක්ෂක ප්‍රධානී රැස්වීමට යන්නේ මමයි .ඒක හුඟක් කථා වෙන්නේ counter terrorism සම්බන්ධයෙන් ඒ කියන්නේ ත්‍රස්ත මර්ධන සම්බන්ධයෙන්. ඒක හැම මම අවුරුදු ගාණක්ම‍ං ගියා මං හිතන්නේ අවුරුදු 7ක් 8 ක් වගේ දිගටම ගියේ මමයි . ඊට අමතරව අධ්‍යක්ෂකතුමා යම්කිසි දෙයකින් එතුමාට යන්න බැරිවෙච්ච අවස්ථාවලදී ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම්වලට මම ගිහිල්ලා තියෙනවා.එතකොට ඒ මම නියෝජ්‍ය අධ්‍යක්ෂ , අතිරේක අධ්‍යක්ෂක ඉන්නකොට.එතකොට මම වැඩ බලන කාලේදී මං හිතන්නේ ආරක්ෂක කවුන්සලයට දෙපාරක් ගිහිල්ලා තියෙනවා .මං මාස 3 යි හිටියේ දෙපාරක් ගිහිල්ලා තියෙනවා.අවස්ථා දෙකක මම මගේ ඉදිරිපත් වීම් කරලා තියෙනවා.

ප එතකොට ඔබ බස්නාහිර සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම් වලටත් ගිහිල්ලා තියෙනවාද ?

උ ඒකත් මං ගිහිල්ලා තියෙනවා ඒකත් මම නියෝජ්‍ය අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ වෙලා ඉන්නකොට. ඒකත් මාසෙකට සැරයක් තියෙන්නේ. ඒක බලන්නේ බස්නාහිර පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයයි.එතකොට ඒක ව්‍යුහය හැදුවේ ඒකේ තියෙනවා ආමි ඒකේ තියනවා SF west කියලා western province එතකොට එයාට අයිති වෙන භූමි ප්‍රමාණය තමයි ඒ ආමි එකෙන් දාපු එකට තමයි අපි රාජ්‍ය බුද්ධි සේවයෙන් ගියේ ඒකේදී හුඟක් වෙලාවට ඔය බුද්ධි තොරතුරු ගැන කථා කරනවා .

ප මං දැන් ඔබේ අවධානය වැඩියෙන්ම යොමු කරන්නේ MOD රැස්වීම් සහ security council එකේ රැස්වීම් පිළිබඳව .ඔබට කියන්නට පුළුවන්ද ආරක්ෂක මණ්ඩල ප්‍රධානී බුද්ධි රැස්වීම් කොපමණ කාලයකට සැරයක් පවත්වනු ලැබුවාද කියලා .?

උ ඒක ස්වාමිනි මාසෙකට සැරයක් පවත්වනු ලබනවා ඒක.

ප මාසෙකට සැරයක්?

උ ඔව්.

ප එතකොට ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන රැස්වීම්?

උ ඒක සුමානෙකට සැරයක්.

ප යම් නිශ්චිත දිනයක් තිබ්බාද ?

උ හැම අඟහරුවාදාම තියෙනවා ඒක.

ප ඒ යම් තවත් රැස්වීමක් පවත්වන්නට පෙරද ඒ රැස්වීම තියන්නේ ?

උ පවත්වන්න පෙර තමයි තියෙන්නේ.

ප මොකක්ද ඒ අනිත් රැස්වීම?

උ අනිත් රැස්වීම ආරක්ෂක council රැස්වීම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන රැස්වීමට ඔබ සහභාගි වෙලා තියෙනවාද ?

උ අනිවාර්යයෙන්ම සහභාගි වෙලා තියෙනවා.

ප්‍ර ඔබ රැස්වීම් වලට සහභාගි වූ වකවානුවේදි ආරක්ෂක ලේකම් විදියට කව්ද කටයුතු කලේ ?

උ වර්තමාන ජනාධිපතිතුමා අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා .

ප්‍ර ඔහු තමයි එවකට ආරක්ෂක ලේකම් විදියට කටයුතු කෙරුවේ ?එතකොට කව්රු කව්රුද ඔය මොන මොන නිළධාරීන්ද සහභාගි වුනේ ඒ රැස්වීම් වලට ?

උ ඔව් ඒකට අනිවාර්යයෙන් ජාතික බුද්ධි ප්‍රධානි ඉන්නවා ඊලගට ත්‍රිවිධ හමුදාවේ බුද්ධි නිළධාරින් ඉන්නවා. ඊලගට special Branch එකේ පොලිස් විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂක ඉන්නවා.එතකොට අධ්‍යක්ෂ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉන්නවා.ඊලඟට ඉන්නවා අධ්‍යක්ෂ ත්‍රස්ත මර්ධන කොට්ඨාශය TID එයා ඉන්නවා. ඒ කට්ටිය තමයි ඉන්නේ.

ප්‍ර දැන් පොලිස් විශේෂ කාර්යාංශය ඉන්නවාද විශේෂ කාර්ය බලකාය ?

උ නැහැ. විශේෂ කාර්යංශය ඉන්නවා , විශේෂ කාර්ය බලකාය ඉන්නවා. දෙකම ඉන්නවා.

ප්‍ර දෙගොල්ලන්ම ඉන්නවා?

උ දෙගොල්ලන්ම ඉන්නවා.

ප්‍ර එතකොට ඔය රැස්වීමේ ඉස්සරවෙලාම කවුද කථා කරන්නේ ?

උ ඉස්සෙල්ලා කථා කරන්නේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය .

ප්‍ර ඒ ආරක්ෂක ලේකම් වරයා විසින් ඔබලාව ඇමතුවාට පස්සේ ?

උ ඔව්.

ප්‍ර සාමාන්‍යයෙන් සුමානයකට සැරයක් සතියකට සැරයක් පවත්වන මේ රැස්වීම අහඹරුවාදා දිනවල තිබුනා කිව්වොතින් මා නිවැරදිද?

උ ඔව් නිවැරදියි.

ප්‍ර එතකොට ඒ රැස්වීමේදී ඔබ කිව්වානේ රාජ්‍ය බුද්ධි සේවයේ නිළධාරියා විසින් ඉදිරිපත් කිරීමක් කරනවා කියලා?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඒ න්‍යාය පත්‍රය අනුව අනිවාර්යයෙන්ම රැස්වීම පටන්ගත්තාට පස්සේ නියමිත ආකාරයට පලමුවෙනි ඉදිරිපත් කිරීම කරන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ නිළධාරියාද ?

උ අනිවාර්යයෙන්ම. රාජ්‍ය බුද්ධි සේවය තමයි කරන්න ඕනේ .

ප්‍ර ඔහු මොනවා පිළිබඳවද ඒ ඉදිරිපත් කිරීම කරන්නේ ?

උ සාමාන්‍යයෙන් මේ රැස්වීම කරන්නේ ඒ අවස්ථාවේ ඒ සුමානය ඇතුලත තියෙන ප්‍රවනතාවයන් . ඒ බුද්ධි අපි කියන්නේ ප්‍රවනතාවයන්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ කියන්නේ ඊට ඉස්සරවෙලා තිබුනේ අඟහරුවාදා නම් බදාදා ඉඳලා මේ අඟහරුවාදා දක්වාවු රටේ තිබුණු තත්වය පිළිබඳව?

උ රටේ තිබුනු තත්වය පිළිබඳව හැඳින්වීමක් කරනවා ඒ හැඳින්වීම අනුව ඒක හුඟක් වෙලාවට දේශපාලන, ආර්ථික, සමාජ අනුව බෙදෙනවා. ඒ අතරතුර විශේෂතත්වයක් තිබුනා නම් ඒ සම්බන්ධයෙන් එයා අනිවාර්යයෙන්ම යම්කිසි සමාලෝචනයක් කරන්න ඕනේ ඒ සම්බන්ධයෙන් එතන හුඟක් බුද්ධි තොරතුරු හුවමාරු වෙනවා.

ප්‍ර කාත් එක්කද?

උ අනිත් කට්ටියත් එක්ක.

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවය එතන ඉන්න අනිත් නිළධාරීන් සමඟ තොරතුරු හුවමාරු කර ගන්නවා?

උ තොරතුරු හුවමාරු කර ගන්නවා එහෙම තමයි හුඟක් වෙලාවට ඒ සාකච්ඡා පවතින්නේ .

ප්‍ර මාසෝ මහත්මයා දැන් ඔය බුද්ධි තොරතුරු කියන ඒවා තම තමන් වෙත ගලා ආපු ඒවනේ නේද? එතකොට යුද හමුදාව , නාවික හමුදාව, ගුවන් හමුදාව පොලිසිය රාජ්‍ය බුද්ධි සේවය කියන අයට තම තමන්ගේ බුද්ධි අංශ වලට තමයි ඔය තොරතුරු ලැබිලා තියෙන්නේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එතකොට ඒ ගොල්ලෝ කැමතිද අනිත් අයත් එක්ක තමන්ට ලැබුණු මේ බුද්ධි තොරතුරු හුවමාරු කර ගන්න ?

උ ඒක අනිවාර්යයෙන්ම සිදුවන දෙයක් හැබැයි ඒවාට සීමාත් තියෙනවා .

ප්‍ර මොනවාද ඒ සීමාවන් ?

උ ඒ සීමාවන් අතර දැන් අපි යම්කිසි අපි හිතමුකෝ මෙහෙම දැන් අපි යම්කිසි බුද්ධි මෙහෙයුමක් හරි මොකක් හරි අපි කරනවා ඒ කරලා හුඟක් වෙලාවට ඒ මෙහෙයුම් සම්බන්ධයෙන් හැබැයි කියන්නේ ඒ තොරතුරු සමහර විට අනිත් අතට පත් වුනොත් එහෙම සමහර විට එම මෙහෙයුම් අඩාල වෙන්න පුළුවන් . අසාර්ථක වෙන්න පුළුවන්. එතකොට අපි දැන ගන්න ඕනේ අපි දිය යුතු තොරතුරු මොනවාද දිය නොදිය යුතු තොරතුරු මොනවාද කියලා අපිට හැම දෙයක්ම හංගන්න බැහැ. අවශ්‍ය තොරතුරු අනිවාර්ය යෙන්ම දෙන්න ඕනේ ඒක හුඟක් වෙලාවට general information වෙන්න පුළුවන් . general intelligence වෙන්න ඕනේ. ඒවා දෙන්න ඕනේ.ඒක හරියට ඒ දැනට ඉදිරිපත් කරන එක්කෙනා හරියට ඉදිරිපත් කරන්න ඕනේ මේ රාජ්‍ය ජාතික ආරක්ෂාවට කිසි තර්ජනයක් නොවන විදියට ආරක්ෂා වන විදියට තමයි එයා ඒ සමාලෝචනය කරන්න ඕනේ.

ප්‍ර මාසෝ මහත්මයා දැන් ඒ ආකාරයට දෙවන පාර්ශවයකට ලබා දෙන්නට පුළුවන් බුද්ධි තොරතුරු ලබා දී ඒ දෙවන පාර්ශවයට ලබා දීමේ වාසි තියෙනවාද ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ අනිවාර්යයෙන්ම වාසි තියෙනවා.

ප්‍ර මොනවාද ඒ වාසි ?

උ ඒ සමහර විට මෙහෙමයි දැන් එකම දේ මත ඔය අංශ තොරතුරු හොයනවා.

ප්‍ර කීපයක් හොයනවා ?

උ එතකොට රාජ්‍ය බුද්ධි අංශයෙන් ඒ විෂය මත එකක් කියනවා ඒ වගේ නොයෙක් නොයෙක් කට්ටිය ඒ විෂය මත එක එක කියනවා එතකොට මෙතන තියෙනවා ඒ තොරතුරු ඔක්කොම එකතු කරලා යම්කිසි චිත්‍රයක් එනවා .අන්න ඔතන තමයි ඕකේ වැදගත් කම තියෙන්නේ.

ප්‍ර ඒක නිසා ?

උ එකම දෙයක් ගැන එක එක්කෙනාට කෑලි කෑලි තමයි හම්බ වෙන්නේ. එක එක කොටස්. එතකොට එම කොටස් එකතු කිරීම තමයි ඔතනින් හුඟක් දුරට සිද්ධ වෙන්නේ? .

ප්‍ර බුද්ධි සමාලෝචන මණ්ඩලයෙන් සිද්ධ වෙන්නේ ඒකයි ?

උ ඒක තමයි හුගක් දුරට සිද්ධ වෙන්නේ.

ප්‍ර දැන් ඔබ කිව්වා ඉදිරිපත් තත්වානුකූල කරුණු අනුව සමහර තොරතුරු ඔබ තීරණය කරන්නට පුළුවන් අනිත් පාර්ශවයන්ට නොදී ඉන්න මොකද දැනට යන ක්‍රියාන්විතයකට එමගින් හානියක් සිදු වෙන්න පුළුවන් නිසා?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි.

ප්‍ර එතකොට ඒ තොරතුරු නොදීම ඔබ දෙවන පාර්ශවයක් වෙත නොකරනවා වගේම ඔබේ ප්‍රධානියා වෙන ආරක්ෂක ලේකම්වරයාටත් එය එසේම බලපානවාද ?

උ නෑ.එතුමාට අනිවාර්යයෙන්ම දැනුම් දෙන්න ඕනේ.

ප්‍ර එතකොට ඔබලා විසින් ඔබලා සතුව තියෙන හැම තොරතුරක්ම එහෙම නම් ආරක්ෂක ලේකම්වරයා වෙත දැනුම් දෙනවා කියලා මා කිව්වොතින් නිවැරදිද ?

උ නිවැරදියි

ප්‍ර එසේ එය සිදුවිය යුතුද හැම වෙලාවේම?

උ සිදුවිය යුතුයි ඇත්ත වශයෙන්ම සිදු විය යුතුයි.

ප්‍ර දැන් ඔබ කිව්වානේ ඔය රැස්වීමට ගොඩක් පාර්ශවයන් සහභාගි වෙනවා කියලා එතකොට ඒ වගේම ඔබ කිව්වා මේ යම් යම් ඉදිරිපත් කිරීම් කරනවයි කියලා ඒ ඉදිරිපත් කිරීම් ඔබ කෙරුවේ වාචිකවද ලිඛිතවද නැත්නම් රූප දෘෂ්‍ය මාධ්‍යයෙන්ද ?

උ වාචිකව කරනවා, රූප දෘෂ්‍ය මාධ්‍යයෙන් කරනවා. ලිඛිතව කිසි දෙයක් දෙන්නේ නැහැ.

ප්‍ර ලිඛිතව කිසි දෙයක් දෙන්නේ නැහැ ?

FAIR COMMENT BY JEZEEM

උ හැබැයි MOD එක එක්කෙනෙක් ඉන්නවා එයා ඒක minute කර ගන්නවා ඔක්කෝම .

ප ඒ කියන්නේ පවත්වන හැම බුද්ධි සමාලෝචන රැස්වීමකම ඒ රැස්වීමේ සිදුවන දේ පිළිබඳව සටහන් ගන්නවා ආරක්ෂක අමාත්‍යාංශය ?

උ ආරක්ෂක අමාත්‍යාංශය සටහන් ගන්නවා ඒ එක්කම අර කට්ටිය ඒකට ඉස්සරහින් යොදා ගන්නවා ඉන්න කට්ටිය.

ප තව පොඩි ප්‍රශ්ණයක් තියෙනවා එසේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් යොදා ගනු ලබන සටහන් ඒ රැස්වීම් වලට සහභාගි වන පාර්ශවයන් වෙත ලබා දෙනවාද ?

උ මම දන්නා තරමින් නම් එහෙම ලබා දෙන්නේ නැහැ.

ප නමුත් ආරක්ෂක අමාත්‍යාංශය සතුව ඒවා තියෙනවාද ?

උ සතුව තියෙනවා.

ප එතකොට දැන් ඔබ කිව්වා වාචිකව ඉදිරිපත් කිරීම් කරනවා ලිඛිතව ඉදිරිපත් කිරීම් කරනවා නැහැ ලිඛිතව යමක් දෙන්නේ නැහැ නමුත් රූප දෘෂ්‍ය මාර්ගයෙන් කරනවා කියලා ?එතකොට ඒක හැමෝටම මේක බලාගන්නට පුළුවන් කියන එකනේ ඒකෙන් අදහස් කරන්නේ ?

උ එහෙමයි ස්වාමිනි

ප ඒ වගේම මගේ මූලික ප්‍රශ්ණයකට පිළිතුරු දෙන ගමන් ඔබ සඳහන් කෙරුවා අර අනිත් දෙවන පාර්ශවවලට දුන්නේ නැති වුනාට ඔබ ආරක්ෂක ලේකම් වරයාට ඔබලා සතු දිය යුතු සියළුම තොරතුරු දෙනවාය කියලා ?

උ එහෙමයි ස්වාමිනි.

ප එතකොට කොහොමද ඒ සඳහා අවස්ථාව ලැබෙන්නේ කොයි වෙලාවටද කොයි ආකාරයටද ඒ තොරතුරු ලබා දීම කරන්නේ ?

උ ඔව් හුඟක් වෙලාවට මම මේක අධ්‍යක්ෂවරයා කරලා තියෙනවා යන්න ඉස්සෙල්ලා එයාගේ permission ගන්නවා කථා කරන්න හම්බ වෙන්න පුද්ගලිකව.

ප ඒ කියන්නේ මේ රැස්වීම තියෙන දවසේමද ?

උ දවසේම ඉස්සෙල්ලා .

ප මේ රැස්වීමට පෙර ?

උ පෙර .

ප පූර්ව හමුවීමක් තියෙනවා ?

උ තියෙනවා අවශ්‍යනම් . එහෙම නැත්නම් පස්සෙත් අවශ්‍ය නම් කියනවා එතකොට එතුමා ඒකට ඉඩ දෙනවා.

ප එතකොට ඕක අඟහරුවාදාම නොකලාට ප්‍රශ්ණයක් නැහැනේ ?

උ අඟහරුවාදා නොකලාට ප්‍රශ්ණයක් නැහැ.

ප තමන්ට යම් තොරතුරක් ආරක්ෂක ලේකම්වරයාට දෙන්නට ඕනේ කියලා බුද්ධි අධ්‍යක්ෂකවරයාට තේරෙනවා නම් රාජ්‍ය බුද්ධි සේවාවේ

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ඔහුට ඔබ කියන්නේ අවස්ථාව තියෙනවා ආරක්ෂක ලේකම්වරයාව අමතලා වෙලාවක් වෙන් කරගෙන ගිහිල්ලා ඒ තොරතුරු දැනුම් දෙන්න?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි.

ප හැබැයි ලිඛිතව මොකුත් දෙන්නේ නැහැ කියලාද කියන්නේ ?

උ ලිඛිතව මුකුත් දෙන්නේ නැහැ . හැබැයි මෙහෙමයි සමහර විට ලිඛිතව ඕකට භාජනය කරලා නැති තොරතුරු ලිඛිතව වෙනම යන අවස්ථාවලුත් තියෙනවා.special reports එහෙම , එහෙමත් තියෙනවා.

ප එහෙමත් තියෙනවා අර විදියට ලිඛිතව නැතුවත් දෙන අවස්ථාවල් තියෙනවා ?එතකොට ඔබට කියන්නට පුළුවන් ද එහෙමනම් දැන් අර ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලටත් ඔබ සහභාගි වෙලා තියෙනවා කියලා කිව්වානේ ?

උ දෙපාරක් සහභාගි වෙලා තියෙනවා.

ප දැන් ඒකේ මුලිකත්වය අරගන්නේ කවුද ?

උ ඒකත් අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවය , අධ්‍යක්ෂ , රාජ්‍ය බුද්ධි සේවය.

ප ආරක්ෂක මංඩලය security council එක?

උ ඒ කියන්නේ මුලසුන දරන්නේද ?

ප ඔව් ?

උ අතිගරු ජනාධිපතිතුමා .

ප ඔබ සහභාගි වෙලා තියෙන රැස්වීම්වල මූලිකත්වය ගත්තේ කව්ද ?

උ අතිගරු ජනාධිපතිතුමා.

ප එතකොට ගරු ජනාධිපති විදියට කව්ද ධූරය හෙබවුයේ ?

උ හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා.

ප ඔබ කිව්වා ආරක්ෂක සමාලෝචන රැස්වීම්වලදී ප්‍රථමයෙන්ම ඉදිරිපත් කිරීම කරන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා කියලා ?

උ එහෙමයි ස්වාමිනි.

ප එතකොට ආරක්ෂක මණ්ඩල රැස්වීම්වල කවුද ප්‍රථමයෙන්ම ඉදිරිපත් කිරීම් කරන්නේ?

උ ඒකත් රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ.

ප ඔබට කියන්නට පුළුවන්ද මාසෝ මහත්මයා මොන හේතුවක් නිසාද ආරක්ෂක සමාලෝචන රැස්වීම් වල ඒ වාගේම ආරක්ෂක මංඩල රැස්වීම්වල මොකද මේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාම පලවෙනියෙන්ම මේ ඉදිරිපත් කිරීම කරන්නේ ?මොකක්ද වැදගත්කම?

උ ස්වාමිනි රටක ප්‍රධානතම ආයතනය තමයි ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවය. එතකොට රාජ්‍ය බුද්ධි සේවය වග කියන්න ඕනේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මූලික වගකීම එන්නේ ඒ ගොල්ලන්ට.ඒක

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තමයි ඒ හේතුව හින්දා තමයි මේ මුලික සමාලෝචනය අධ්‍යක්ෂක විසින් කරන්නේ .

ප්‍ර ඒ කියන්නේ ජාතික ආරක්ෂාව බිඳෙනවා නම් එතන ලොකු ප්‍රශ්ණයක් රටට ඇති වෙනවා ?

උ අනිවාර්යයෙන්ම.

ප්‍ර ඒක නිසා තමයි රාජ්‍ය බුද්ධි සේවාවට ප්‍රමුඛත්වය ලැබෙන්නේ ?

උ ඒක තමයි ප්‍රමුඛ ආයතනය ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් .

ප්‍ර එතකොට DMI කොයි වෙලාවේද ඔහුගේ ඉදිරිපත් කිරීම කරන්නේ?

උ විශේෂයෙන් වැඩි වශයෙන් ගන්නේ එයා ඊලඟට අනිවාර්යයෙන්ම හුඟක් වෙලාවට මන් දැකලා තියෙනවා ඒ DMI තමයි ඊලඟට ගන්නේ .

ප්‍ර ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයාට පස්සේ DMI තමයි ඒක කරන්නේ ?

උ කරන්නේ.

ප්‍ර දැන් ඔය රැස්වීමට CNI ඒ කියන්නේ ජාතික බුද්ධි ප්‍රධානි සහභාගි වෙනවාද ?

උ අනිවාර්යයෙන්ම සහභාගි වෙනවා.

ප්‍ර එතකොට ආරක්ෂක සමාලෝචන එකටත් ජාතික බුද්ධි ප්‍රධානි සහභාගි වෙනවා ?

උ අනිවාර්ය යෙන්ම සහභාගි වෙනවා.

ප්‍ර ආරක්ෂක රැස්වීමේදී ජාතික බුද්ධි ප්‍රධානිට තියෙන්නේ මොන වගේ කාර්ය භාරයක්ද? ඔහුගේ ක්‍රියාකාරිත්වය කොයි වගේද ?

උ ඔහු එතන හිටියට ඔහු ඔය ඔක්කොම සමාලෝචනය ගියාට පස්සේ ඔහුට යමක් තියෙනවා නම් තමයි ඔහු කුමක්හරි පවසන්නේ .

ප්‍ර ඒ කියන්නේ දැන් ආරක්ෂක ලේකම්වරයා විසින් මුලසුන ගන්නවා . ජාතික බුද්ධි ප්‍රධානි මොනවා හරි තියෙනවා නම් විතරයි කියන්නේ ?

උ තියෙනවා නම් විතරයි කියන්නේ .සමහර විට සමාලෝචන අවස්ථාවේදී එයාට යම් දෙයක් කියන්න තියෙනවා නම් එයා ඒ අතරවාරයේ කියනවා .

ප්‍ර ඔබට කියන්නට පුළුවන්ද ඔබේ මේ අවුරුදු 14 ක අත්දැකීම එක්ක ඇත්තටම මේ ත්‍රිවිධ හමුදාව, පොලිසිය සමඟ සම්බන්ධිකරණ කටයුතු කරන ජාතික බුද්ධි ප්‍රධානීගේ කාර්ය භාරය මොකක්ද කියලා ?

උ ඇත්ත වශයෙන්ම එයාගේ ප්‍රධාන කාර්ය භාරය තමයි රාජ්‍ය සේවා බුද්ධි ජාතික බුද්ධි සේවාව, ත්‍රිවිධ හමුදාවේ බුද්ධි අංශ එතකොට , විශේෂ කාර්යාංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශය, මේ ඔක්කෝම සම්බන්ධිකරලා සම්බන්ධි කරණය තමයි එයාගේ විශේෂම මුලික වගකීම. ඒ එක්කම ඒ අනුව ඊට අමතරව යම් යම් බුද්ධි තොරතුරු තියෙනවා නම් ඒක අනිවාර්යයෙන්ම එයා දැන ගෙන ඉන්න ඕනේ.

FAIR COMMENT
BY JEZEEM
Presidential Secretary Copy

ප එතකොට මේ ඒ හැමෝම තම තමන් සතු බුද්ධි තොරතුරු ආරක්ෂක ලේකම්වරයාගේ තරමට නොදුන්නත් සෑහෙන ප්‍රමාණයක් තොරතුරු ලබා දිය යුතුයි ජාතික බුද්ධි ප්‍රධානි වෙත?

උ ඔව්.

ප එතකොට ඔබ කියන්නේ සතියකට වරක් අඟහරුවාදා පැවැත්වෙන ආරක්ෂක සමාලෝචන රැස්වීමේදි ජාතික බුද්ධි ප්‍රධානි විසින් මොනවා හරි තියෙනවා නම් තමයි කථා කරන්නේ ?

උ මොනවා හරි තියෙනවා නම් තමයි කථා කරන්නේ.

ප එතකොට අපි දැන් කල්පනා කලොත් ආරක්ෂක මණ්ඩල රැස්වීම ගැන ජාතික බුද්ධි ප්‍රධානිට එතන තියෙන කාර්ය භාරය කොයි වගේද ?

උ අර කාර්ය භාරය තමයි එතනත් තියෙන්නේ . එහෙම නැත්නම් සමහර විට ජනාධිපතිතුමා අහන්න පුළුවන්. නැත්නම් secretary Defence අහන්න පුළුවන්. එතකොට ඒ අවස්ථාවේදි එයාගේ සමාලෝචනය තියෙනවා නම් එයා කරනවා .

ප එතකොට සමහර වෙලාවට මෙහෙම තත්ත්වයක් ඇතිවුනොත් රජය බුද්ධි ප්‍රධානි විසින් යම් තොරතුරු දන්නවා ඔහු විසින් ඒ පිළිබඳව මේ ආරක්ෂක මණ්ඩල රැස්වීමේදි හෝ නැත්නම් ආරක්ෂක සමාලෝචන රැස්වීමේදී සඳහන් කිරිමක් කරන්නේ නැහැ කරුණු .එතකොට ඒ පිළිබඳව ජාතික බුද්ධි ප්‍රධානීට කථා කරන්නට පුළුවන්ද ඒක ඔහුගේ රාජකාරිය වෙනවාද?

උ සත්‍ය වශයෙන්ම ඔහුට තොරතුරක් හම්බ වුනාම ඔහු ඒ ඒ තොරතුරු අනිවාර්යයෙන්ම ඒක දැනුම් දිය යුතුයි. එහෙම නැත්නම් ඔහුට තවත් ඒ තොරතුර ප්‍රගුණ කරන්නනම් අදාල රාජ්‍ය බුද්ධි සේවයට එතකොට අනිත් බුද්ධි අංශවලට ඒ සම්බන්ධයෙන් වැඩිපුර කරුණු හොයලා ඒ ඔක්කෝම තමයි එයාට සමාලෝචනය කරන්න පුළුවන්. ඔය දෙකම එයාට කරන්න පුළුවන්.

ප ඒ සමාලෝචනය ඔහුට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු සැපයීම කාගේ රාජකාරියද කාගේ වගකීමද ?

උ ඒ ඒ අදාල බුද්ධි අංශයට ඒක එයාට දෙන්න ඕනේ

ප ඒ කියන්නේ ප්‍රමාණවත් කරුණු තියනවා නම් එතකොට ජාතික බුද්ධි ප්‍රධානිට ඒ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්?

උ පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u> .

ප සාක්ෂිකරු දැන් ඔබ කියපු හැටියට රාජ්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂකවරයාට කෙලින්ම ආරක්ෂක ලේකම්ට රිපෝර්තු කරන්න පුළුවන් ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ අනිවාර්යයෙන් පුළුවන් ස්වාමිනි .

ප්‍ර එතකොට එහෙම හැකියාවක් තියෙන කොට ඔහුගේ තවත් වගකීමක් වෙනවාද ජාතික බුද්ධි ප්‍රධානියාටත් ඒ තොරතුරම ලබා දෙන්න. ?

උ ඔතනදි ඒ තොරතුර තියෙන ස්වභාවය අනුව හුඟක් වෙලාවට එතන වෙනස්වීම් සිද්ධ වෙන්න පුළුවන්. එතකොට මේක සෘජුවම ජාතික ආරක්ෂාවට බලපාන එකක් නම් එතකොට වෙනත් බොහොම සංවේදී තොරතුරක් නම් ඉතින් එයා දැන ගන්න ඕනේ අධ්‍යක්ෂක දැනගන්න ඕනේ මේක මෙයාට දිය යුතුද නැද්ද කියලා ඉතින් ඒ වගේ ප්‍රශ්ණත් එනවා ස්වාමිනි. ඉතින් එයා තමයි හරිම විනිශ්චය කරන්න ඕනේ . මම මේ කොහොමද මේක කරන්නේ කියලා. හැබැයි සාමාන්‍ය තොරතුරු නම් අනිවාර්යයෙන්ම දැනුම් දෙන්න ඕනේ.

මෙතැන් පටන් සටහන් ගැනිම ල/ලේ ඉන්ද්‍රාණි මිය.

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 6.50 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබේ අත්දැකීම් අනුව අවුරුදු 14 ක් රාජ්‍ය බුද්ධි සේවයේ නියැලුණු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් විදියට ඔබට කියන්නට පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයා රජයේ ප්‍රධානියා අංක එක පුරවැසියා වන ජනාධිපතිවරයාත් අතර සාමාන්‍යයෙන් පවතින්නේ මොන වගේ සම්බන්ධතාවයක්ද කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවයට තියෙන්න ඕන කෙළින්ම ජනාධිපතිවරයාට කථා කරන්න ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් තොරතුරු තියෙනවා නම් අනිවාර්යයෙන්ම එය කථා කළ යුතුමයි. ඒ වගකීම එයාට තියෙනවා.

ප්‍ර : ඒ සඳහා පහසුකම් තියෙනවද? ඒ කියන්නේ දුරකථන පහසුකම් තියෙනවද ඔබගේ කාලයේදී?

පි : ඒ කාලයේදී තිබුණා. Hot Line කියලා තියෙනවා.

ප්‍ර : මොකද්ද ඔය Hot Line කියන්නේ?

පි : Hot Line කියන්නේ දැන් ඒක අදාළ කට්ටියට විතරයි කථා කරන්න පුළුවන්.

ප්‍ර : මොකද්ද ඒක? අපිට Hot Line නැහැනේ.

පි : අදාළ කට්ටිය කියන්නේ දැන් මට Hot Line එකක් තියෙනවා නම්, මට Direct එයාට කථා කරන්න පුළුවන්. එතකොට ඒ කථා කරන්නේ එයත් එක්ක විතරයි. Hot Line කියන්නේ ඒක තමයි. ඒ අතර සමහරවිට සාමාන්‍ය දුරකථනයෙන් කථා කරන්නත් පුළුවන්. Hot Line කියන්නේ ඒක තමයි. සීමිත කට්ටියට තමයි ඒකෙන් කථා කරන්න පුළුවන්.

ප්‍ර : ඔබ කියන්නේ ඔබගේ ඔය සේවා කාලය තුළදී රාජ්‍ය බුද්ධි සේවාවට ඒකේ අධ්‍යක්ෂවරයාට Hot Line එකක් තිබුණා රටේ ජනාධිපතිවරයා සමඟ කෙළින්ම කථා කරන්නට පුළුවන් කිසිදු බාධාවකින් තොරව?

පි : තිබුණා.

ප්‍ර : මගේ සහෝදර නිලධාරියා අහනවා නොම්මරය මොකද්ද කියලා?

පි : මම වැඩ බැලුවා විතරයි.

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වා මේ ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට ඔබ සහභාගී වෙලා තියෙනවා. එතකොට CNI සහභාගී වෙනවා. ජනාධිපතිතුමා ඒකේ මුලසුන දරනවා. DMI ඔබට පස්සේ ඉදිරිපත් කිරීම කරනවා කියලා. ඒ ඇරෙන්නට ඔය ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගී වන්නේ වෙන කවුද?

පි : ත්‍රස්ත මර්ධන කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා, අපරාධ පරීක්ෂණ කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා, ඒ එක්කම කොළඹ අපරාධ ....,

ප්‍ර : Did the TID Officers take part in the those days?

පි : Yes. ඊළඟට අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශය CCD එයත් ඉන්නවා.

President's Secretariat's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : Security Council නැත්නම් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී අර ආරක්ෂක සමාලෝචන රැස්වීම්වලදී ගත්ත විදියට ඒ රැස්වීමේ වන සටහන් ගන්නවද? Minutes ගන්නවද?

පි : ඒක ගන්නවා President Secretariat ගන්නවා ඒක.

ප්‍ර : ජනාධිපතිවරයාගේ ලේකම් කොට්ඨාශය විසින් ඒක ලබා ගන්නවා?

පි : ගන්නවා.

ප්‍ර : දැන් ඒවා එතන මේ සාකච්ඡාවට සහභාගී වන පාර්ශවයන් අතර බෙදා හරිනවද?

පි : නැහැ. එහෙම වෙන්නේ නැහැ.

ප්‍ර : දැන් ආරක්ෂක සමාලෝචන මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගී වෙනකොට ඔවුන් එදිනෙදා යම් දෙන ලද නිශ්චිත දිනයක ඒ රැස්වීමට සහභාගී වුණේ කවුද කියන එක පිළිබඳව පසුව පරීක්ෂා කරලා බලන්නට යම් ක්‍රමවේදයක් තියෙනවද?

පි : නැහැ. අපි එන ගමන්ම අපිට දෙනවා Attendance Register යක් Mark කරන්න දෙනවනේ. ඒකේ අපි ...,

ප්‍ර : These are the Defense Ministry ?

පි : Defense Ministry. ඒ දෙකේම. ඒකෙත් දෙනවා, ආරක්ෂක කවුන්සිලයේත් දෙනවා.

ප්‍ර : ඒ දෙකේම ඕගොල්ලන්, නිලධාරීන් ඒ රැස්වීම්වලට සහභාගී වුණහම තමන්ගේ පැමිණීම සටහන් කරනවා?

පි : පැමිණීම සටහන් කරනවා.

ප්‍ර : නම ලියලා, තනතුර ලියලා, අත්සන් කරනවා?

පි : අත්සන් කරනවා. ටෙලිෆෝන් නම්බරයත් සමහර වෙලාවට හුඟක් වෙලාවට දානවා.

ප්‍ර : Email Address එකත් දානවා?

පි : Email එකත් දානවා.

ප්‍ර : ඔබගේ වකවානුව තුළදී යම් බුද්ධි තොරතුරක් පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරුවහම ගරු ජනාධිපතිතුමා විසින් ඒ අවශ්‍ය නම් ඒ අවස්ථාවල්වලදී උපදෙස් ලබා දීමක් කරනු ලැබුවාද?

පි : මට නම් ඒක හරියට කියන්න බැහැ. මම වැඩ බලන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් තමයි හිටියේ. නමුත් එහෙම වුණාද කියන්න මට නිශ්චිතව කියන්න බැහැ.

ප්‍ර : ඒක ඔබ දන්නේ නැහැ?

පි : මම දන්නේ නැහැ ඒක.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් අර ආරක්ෂක සමාලෝචන මණ්ඩලයේදී ඔබ කිව්වනේ තොරතුරු හුවමාරුවීමක් සිද්ධ වෙනවා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒක සිද්ධ වෙනවද ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී?

පි : ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී ඒ තරම්ම ඒක සිද්ධ වෙන්නේ නැහැ. හේතුව ඒකට එන නිලධාරීන් ඉතාමත් සීමිතයි. ඒකට ඔය කියන්නේ CNI, Air Force Int. එක එන්නේ නැහැ, Navy එක එන්නේ නැහැ, CID එක එන්නේ නැහැ. ඒ කවුරුත් එන්නේ නැහැ. ඒකේ එන්නේ SIS එකයි DMI එකයි තමයි එන්නේ. අනිත් කට්ටිය එන්නේ නැහැ. එතකොට එතන මූලික කාර්යභාරය තියෙන්නේ CNI ට මොනවා හරි තියෙනවා නම් එයා තමයි ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : ආරක්ෂක අමාත්‍යාංශයේ අභහරුවාදා පවත්වන රැස්වීම හඳුන්වන්නේ මොන නමකින්ද?

පි : ඒක ඉංග්‍රීසිවලින් කියන්නේ Intelligence Coordinating Meeting, බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම, ආරක්ෂක අමාත්‍යාංශය.

ප්‍ර : බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම. එතකොට බුද්ධි සමාලෝචන රැස්වීම කියන්නෙත් ඒකද?

පි : ඔව්. ඒකම තමයි.

ප්‍ර : එතකොට අර Security Council Meeting එකට කියන්නේ මොකද්ද?

පි : ඒක ආරක්ෂක කවුන්සිල් රැස්වීම.

ප්‍ර : දැන් ආරක්ෂක මණ්ඩල රැස්වීම එහෙම නැත්නම් Security Council රැස්වීම්වලට ඔබ කිව්ව ආකාරයට ගරු ජනාධිපතිතුමා, රාජ්‍ය බුද්ධි සේවය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, TID එක, CCD එක ඒ වගේ රාජ්‍ය නිලධාරීන් හැරෙන්නට ආරක්ෂක ලේකම්වරයා සහභාගී වෙනවද?

පි : ආරක්ෂක කවුන්සිල්ද ඔය කියන්නේ.

ප්‍ර : This is the Council?

පි : ආරක්ෂක කවුන්සිලයට ඒ ඔක්කොම සහභාගී වෙන්නේ නැහැ. ආරක්ෂක කවුන්සිලය සහභාගී වෙන්නේ CNI, Secretary Defense, Prime Minister, එතකොට හුහක් විදේශීය අමාත්‍යාංශයේ ලේකම්, එතකොට අගමැතිතුමාගේ ලේකම්, එතකොට Director SIS, Director DMI.

ප්‍ර : එතකොට දේශපාලනඥයින් කවුරුත් සහභාගී වෙනවාද අග්‍රාමාත්‍යවරයාත්, ජනාධිපතිවරයාත් හැරෙන්නට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම ගිය එක අවස්ථාවකවත් දේශපාලනඥයෝ සහභාගී වුණේ නැහැ මම ගිය අවස්ථාවල.

ප්‍ර : ජනාධිපතිතුමාගේ ලේකම්වරයාත් අර සටහන් ගන්න සහභාගී වෙනවාද?

පි : මම නම් සටහන් ගන්නවා දැකලා නැහැ. නමුත් එයා සහභාගී වෙනවා අනිවාර්යයෙන්ම.

ප්‍ර : එයා සහභාගී වෙනවා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබට මතකයිනේ, CDS?

පි : CDS ඉන්නවා. අනිවාර්යයෙන්ම ඉන්නවා.

ප්‍ර : අර ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන රැස්වීම කොහේද තියන්නේ?

පි : ජනාධිපති ලේකම් කාර්යාලයේ.

ප්‍ර : ඒ රැස්වීම තිබ්බේ සුමානේ කවදද?

පි : ඒ රැස්වීම් දෙකකටයි මම සහභාගී වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔබ දන්න ආකාරයට සාමාන්‍යයෙන්? දැන් අඟහරුවාදා තියෙනවා කිව්වනේ?

පි : මාසයකට සැරයයි තියන්නේ. මාසයකට සැරයක් තියෙනවා. සාමාන්‍යයෙන් ඔය කියන්නේ ජාතික ආරක්ෂක කවුන්සිල් රැස්වීම.

ප්‍ර : මාසයකට සැරයයි?

පි : මාසයකට සැරයයි.

ප්‍ර : සුමානයකට සැරයක් තියෙන්නේ මොකද්ද?

පි : ඒක ඇවිල්ලා ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි සමාලෝචන රැස්වීම, ආරක්ෂක අමාත්‍යාංශයේ. ඒක ආරක්ෂක ලේකම් ප්‍රධානත්වයෙන්.

ප්‍ර : The evidence before this commission had been on every Tuesday there had been a meeting with the Secretary Defense?

පි : Yes.

ප්‍ර : You give a briefing and then you prepare yourself in order to take part in the meeting on the subsequent day with the President. That is the Security Council Meeting. Each week on Wednesdays that there had been the Security Council Meeting.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : As far as I remember, There is a no specific day for the Security Council Meeting. It is funds once a month. As far as I know. I cant remember whether there is a specific day. I cant remember. But once a month yes there is a meeting.

ප්‍ර : O.K.

ප්‍ර : මාසෝ මහත්මයා ඔබට මතකද 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ලංකාවේ විවිධ ස්ථානවල සිදු වුණ බෝම්බ පිපිරීම් ගැන?

පි : මතකයි.

ප්‍ර : ඒ අවස්ථාව වනවිට ඔබ රජයේ සේවයෙන් විශ්‍රාම අරගෙන නේද හිටියේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ කිව්වා දත්ත විශ්ලේෂණය පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ විශේෂ පුහුණුවක් ලබා තිබුණාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මේ තොරතුර ඇහුවහම ලංකාවේ කිහිප ස්ථානයක සාමාන්‍ය ජනතාවගේ දිවි අහිමි කරමින්, මේ වගේ පිපිරීම් සිදුවෙලා තියෙනවා කියලා දැන ගත්තහම ඔබ මොකද කළේ?

පි : අනිවාර්යයෙන්ම එය අපි කියනවා ඉංග්‍රීසියෙන් Intelligence Failure. ඒක බුද්ධි අංශයේ තිබිච්ච අඩුපාඩුවක් කියලා එකපාරටම කාටත් ඒක එනවා. එතකොට ඊට පස්සේ මම ඒකේ ඇත්ත වශයෙන්ම පසුබිම මම දැනගෙන හිටියේ නැහැ. පස්සේදී....,

ප්‍ර : ඔබ මොකද කළේ ඉතිං?

පි : පස්සේදී ඔය පත්තරවල ගිය එව්වා, ඊට පස්සේ මම Website බැලුවා, අරවා බැලුවා. ඊට පස්සේ මම මගේ පුද්ගලික යම් විශ්ලේෂණයක් මම කළා.

ප්‍ර : ඒ සඳහා ඔබ දැන් යම් විශ්ලේෂණයක් කරන්න දත්ත අවශ්‍යයිනේ. තොරතුරු අවශ්‍යයිනේ ඔබ අපිට අද පැහැදිලි කරපු විදියට ඒ තොරතුරු හොයා ගත්තද?

පි : ඔව්. වැදගත්ම තොරතුරු අන්තර්ජාලයේ ගියා ඕක. මම හිතන්නේ ඒක පොලිස්පතිතුමා විසින් හැම නිලධාරියෙකුටම, මම හිතන්නේ ඕක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - බස්නාහිර පළාත, එතකොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - විශේෂ කාර්ය බලකාය, එතකොට නියෝජ්‍ය පොලිස්පති - විශේෂ ආරක්ෂක දිසාව ඒගොල්ලන්ට මම හිතන්නේ IG Minute එකක් ගහලා තියෙනවා ඒකේ. ඒක සංසරණය වුණා හැම තැනම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඒ ලිපිය දැකලා තියෙනවාද?

පි : මම ඒ ලිපිය දැක්කා. ඒක තමයි මූලික පදනම වුණේ.

(ස්වාමීනි C-4(a) ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : මාසෝ මහත්මයා බලන්න මා ඔබට පෙන්වන මේ ලේඛනය.

පි : මේක දැක්කේ නැහැ.

ප්‍ර : එහෙනම් මොකද්ද දැක්කේ?

පි : මම දැක්කේ IG අත්සන් කරපු එක. ආ මේ තියෙන්නේ හරි හරි. හරි මේක තමයි. මේකත් එක්ක තව Annexure එකක් තිබ්බා. මේකත් නෙමෙයි. මේක.

(සාක්ෂිකරු ස්වාමීනි තමන් මීට පෙර දැක තිබෙන ලේඛන ලෙස C-4(a) ලේඛනයත්, ඒ වගේම C-4(c) ලේඛනයත් හඳුනා ගනියි)

ප්‍ර : ඒ දෙකනේ දැක්කේ?

පි : මේකත් දැක්කා.

ප්‍ර : ඒ ලේඛන දැක්කහම ඔබ මොකද කළේ?

පි : ස්වාමීනි මේකේ මේ වාර්තා කිරීමේදී යම් අතපසුතාවයක් වෙලා තියෙනවා. ඒ දීපු තොරතුර මම දන්නේ නැහැ ඉන්දියාවෙන් දීපු. නමුත් මේ සිද්ධිය වෙලා තියෙනවා. එතකොට මෙතන තියෙනවා යම්කිසි වචන හැසිරවීමේ යම්කිසි අඩුපාඩුවක් Alleged කියලා තියෙනවා. එතකොට Alleged කියලා කියනකොට ඒ තොරතුරේ තියෙන ශක්තිමත්භාවය, ප්‍රශස්තභාවය යම්කිසි හීනවීමක් වෙනවා.

ප්‍ර : දැන් ඔබ ඔය Alleged කියන වචනය යොදලා පිළියෙල කරලා තියෙන ලේඛනය විදියට හඳුනා ගතත් C-4(a) කියන ලේඛනය.?

පි : ඔව්.

ප්‍ර : එය ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා විසින් අත්සන් කරලා නිකුත් කරලා තියෙන ලේඛනයනේ?

පි : ලේඛනය ඔව්.

ප්‍ර : ඔබ කිව්වා දැන් මේ Alleged කියන වචනය දැක්කහම ඔබට තේරුණා කියලා යම් දියාරු බවක් ඇති වෙලා තියෙනවා කියලා?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඇයි එහෙම කියන්නේ?

පි : දැන් තොරතුරු නිශ්චිතයි නම් කවදාකවත් මේ Alleged කියන වචනය, Imminent කියන වචනය එන්න ඕන.

ප්‍ර : Imminent කියලා තියෙන්න ඕන?

පි : Imminent තියෙන්න ඕන. ඒ Imminent කියන වචනය ආවානම් මේක පැහැදිලියි. නිශ්චිතයි.

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : Imminent කියන වචනය යෙදුවහම ඔබ කියන්නේ මේ තොරතුරේ නිශ්චිත බව උද්දීපනය වෙනවා කියලා?

පි : උද්දීපනය වෙනවා. එහෙම නැත්නම් ඔය Information on a planned attack Alleged දාන්නේ නැතුව.

ප්‍ර : නමුත් Alleged කියන වචනය ආපු ගමන් අර තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙලා මේකේ තියෙන අර වැදගත්කම, මේකේ තියෙන බරපතලභාවය අඩුවීමක් වෙනවා?

පි : අඩුවීමක් වෙනවා.

ප්‍ර : ක්ෂයවීමක් වෙනවා?

පි : ක්ෂයවීමක් වෙනවා.

ප්‍ර : ඉතිං ඔබ මොකද කළේ?

පි : සිද්ධිය වුණානේ. සිද්ධිය වුණාට පස්සේ මම මේක කියෙව්වා හොඳට.

ප්‍ර : මේක කියන්නේ?

පි : C-4(c) කියෙව්වා. ඒකේ එක්තරා කියාගෙන යනකොට මේ සම්බන්ධයෙන් තොරතුරු ලැබිලා තියෙනවා. එතකොට පල්ලිය Target කරලා තියෙනවා. ඊට පස්සේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මේකට ඉලක්කයක් වෙලා තියෙනවා. ඒ ඔක්කෝම යනවා. නමුත් තියෙනවා මෙතන. ඔක්කොම තියෙනවා. එතකොට මෙතන තවත් නිරීක්ෂණයක් දාලා තියෙනවා මෙන්න මේ හරියේදී. ඒක මම හොඳට දැක්කා. සහරාන් යන අය සමාජ ජාලා ගිණුම් ඔස්සේ සිය අනුගාමිකයන් අභිප්‍රේරණය කිරීමේදී මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කර ගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කළ බවට මේ වෙනතෙක් නිරීක්ෂණය වී නොමැති කියන එකෙන් ආයේ මේකේ වැදගත්කම අඩු වෙලා තියෙනවා. එතකොට ඒ අනුව තමයි අනිත්, ඇත්ත වශයෙන්ම මේ තොරතුරු සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කරන්න ඕන නිලධාරීන්ට මේ තොරතුරු ගැන මම හිතන්නේ විශ්වාසවන්තභාවය අඩුවීමක් සිදු වෙලා තියෙනවා මෙතනින්.

ප්‍ර : ඒ තමයි ඔබේ මතය?

පි : ඒ මගේ මතය ඒක තමයි.

ප්‍ර : ඉතිං විශ්ලේෂණය පිළිබඳව පුහුණුවක් ලබලා තියෙන ඔබ මේ තොරතුරු දැක්කහම ඔබට මොනවද හිතුණේ? මොනවද ඔබ කළේ?

පි : ඇත්ත වශයෙන්ම මේ තොරතුර මේක Base කරලා තියෙන එක මම දන්නේ නැහැනේ. කොහේද Base කරලා තියෙන එක.

FAIR COMMENT
BY JEZEEM

එතකොට මට ඒ Base කරලා තියෙන එක අනිවාර්යයෙන්ම ඒක බැලිය යුතුයි. ඒ තොරතුරු මතනේ මේ තොරතුරු ඇවිල්ලා තියෙන්නේ. එතකොට ඒ Base එක කොහෙන්ද ආවේ කියන එක වැදගත් වෙනවා. ඉතිං මේ කරලා තියෙන්නේ Reproduction එකක්නේ මෙතන වෙලා තියෙන්නේ. අන්න ඒක තමයි අවශ්‍ය වෙන්නේ මෙතනට.

ප්‍ර : ඉතිං ඒ පාර ඔබ මොකද්ද කළේ?

පි : ඒ පාර මම ඔය Web site වලට ගියා. Web site වලට ගියාට...,

ප්‍ර : එය සාමාන්‍යයෙන් කරන ක්‍රමවේදය කියලා ඔබ කිව්වා. අර තොරතුරක් බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කරනකොට කරන විශ්ලේෂණ ක්‍රියාවලියේදී සංවෘත සහ විවෘත තොරතුරු හොයනකොට ඔබ කිව්වා විවෘත තොරතුරු ගන්නවා කියලා Web site එකෙන්?

පි : ඔව්. Web site එකෙන්.

ප්‍ර : ඒ අනුවද ඔය කළේ?

පි : ඔව්. ඒ අනුව මම Web site එකට ගිය ගමන් 2018 සැප්තැම්බර් 01 වෙනිදා කොයිම්බතූර් දිස්ත්‍රික්කයේ තමිල්නාඩු ප්‍රාන්තයේ පස් දෙනෙක් අත් අඩංගුවට ගන්නවා. ඒ ගන්නේ ජාතික විමර්ශන ඒජන්සිය විසින් ඉන්දියාවේ. මේ ජාතික විමර්ශන ඒජන්සිය කියන්නේ මේක අළුතින් ඉන්දියාවට ආපු දෙයක්. මේගොල්ලෝ කරන්නේ හුදෙක්ම ත්‍රස්ත ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනය තමයි මේගොල්ලෝ සිදු කරන්නේ. කලින් තිබුණේ නැහැ. මේක ආවේ 2011 Mumbai attack එකේදී. 26 නොවැම්බර් මාසේ 2008 දී Mumbai attack එකක් වුණා. ඒ Mumbai attack එකේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේක ස්ථාපිත කළේ. National Intelligence Agency කියන එක.

ප්‍ර : Agency?

පි : ඔව්. එතකොට ඒක පනතක් මගින් ඒ අවුරුද්දෙම මාසයක් වැනි කාලයෙන් සම්මත වුණා. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේක ආවේ. කලින් මේක තිබුණේ නැහැ. මේක හරියට අපේ TID එක වගේ.

ප්‍ර : Indian Intelligence Agency එක අපේ TID එකට සමානයි?

පි : නැහැ නැහැ. Intelligence නෙමේ. Investigation, NIA, National Investagation Agency It's like our TID. ඒගොල්ලෝ කරන්නේ ත්‍රස්ත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විතරයි මේගොල්ලෝ විමර්ශනය කරන්නේ. එතකොට මේගොල්ලෝ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අල්ලා ගත්තාට පස්සේ මේගොල්ලන්ගෙන් ප්‍රශ්න කරලා, ඒ අනුව තවත් විමර්ශන කරලා, මේගොල්ලෝ මාස හයක් හතක් තිස්සේ කරන විමර්ශනයේ ප්‍රතිඵලය තමයි මම හිතන විදියට එතනින් SIS එකට ඇවිල්ලා තියෙන්නේ. එතකොට මේකට පාදක වෙන්නේ එම තොරතුරු මත තමයි මේක පාදක වෙලා තියෙන්නේ.

ප : දැන් ඔබට එහෙම හිතන්න ඇයි කරුණු තුඩු දුන්නේ? මොනවද ඒ කරුණු?

පි : ඒකේ ගියානේ මේ සහරාන්ගේ නම ගියා. ඔය Web site එකේ.

ප : දැන් Now your mind should go to incidents that would have happened prior to the explosion.

පි : ඒකෙන් පස්සේ ඊට කලින් මීට පූර්ව සිද්ධීන් තිබ්බා කිහිපයක්. එකක් තමයි මාවනැල්ලේ බුදු පිළිම කැඩීම. දෙක වනාතවිල්ලුවේ Raid එක. තුන අර කාත්තන්කුඩියේ Explosion එක. තවත් එකක් තිබ්බා යම්කිසි පිපිරීමක් වෙලා එක් අයෙක්, රිල්වාන් මම නම හරියට දන්නේ නැහැ. එතකොට මේ තොරතුරු අනුව බලපුවාම දැන් විශේෂයෙන්ම වනාතවිල්ලුවේ සිද්ධියේදී හතර දෙනෙක්ගේ නම් කියැවෙනවා. ඒ හතර දෙනා ඒ ආපු එකේ නම් තියෙනවා හතර දෙනාගේම. අර C-4(a) එකෙත් තියෙනවා. ඔව් C-4(a) එකේ තියෙනවා. මෙයාගෙත් තියෙනවා. දෙකක් තියෙනවා මෙයාගේ C-4(c) එකෙත් තියෙනවා. අරකේ හතරම තියෙනවා. මේකේ දෙකක් තියෙනවා. එතකොට මේක අනිවාර්යයෙන්ම මේගොල්ලන්ව ප්‍රශ්න කරන්න ගිහිල්ලා ඇති ඔය ඔක්කොම බුද්ධි අංශ. අනිවාර්යයෙන්ම ප්‍රශ්න කළ යුතුයි. එතකොට ඊට පස්සේ තමයි මේ තොරතුර ආවේ. ඔය කොහෙන් හරි ආපු තොරතුරක්. එතකොට ඒ අනුව විශ්ලේෂණය කරනකොට අනිවාර්යයෙන්ම යම්කිසි ඒගොල්ලෝ නිගමනයකට එන්න ඕන. මේ හතර දෙනාගේ නම අතන කියැවෙනවා. එතකොට ඒක විශ්ලේෂණයක් හරියට සිදු වුණාද. ඊට අමතරව මම දන්න තරමින් වනාතවිල්ලුවේ අවි ආයුධ ඒ වගේ පුපුරණ ද්‍රව්‍ය අල්ලලා තිබ්බා. සමහර පුපුරණ ද්‍රව්‍යවල හිස් තිබ්බා. එතකොට විශ්ලේෂකයෙක් වශයෙන් අපිට යම්කිසි නිගමනයක් එන්න ඕන. එතකොට මේ හිස් වෙච්ච එක, මේ පුපුරණ ද්‍රව්‍යයට මොකද වුණේ, මොකද වුණේ. එතකොට ඒක. එතකොට ඒ ඒ ඔක්කොම බලපුවාම අපිට මේකට යම්කිසි වටිනාකමක් දෙන්න තිබුණා මේ තොරතුරට ඔය විශ්ලේෂණය කරා නම්. ඊට අමතරව අපේ Operatives ඉන්න ground operativesලා ඒගොල්ලන්ට දෙන්න තිබ්බා. මෙහෙම එකක් තියෙනවා, ඕගොල්ලන්ට මේ සම්බන්ධව

FAIR COMMENT BY JEZEEM

තොරතුරු මොනවද තියෙන්නේ. ඒක ගන්න තිබ්බා ඒ තොරතුර. ඊළඟට Record Check කරන්න තිබ්බා. එතකොට මේගොල්ලෝ Interrogate කරලා තියෙනවනේ. එතකොට අර දත්ත අරක යන්නම ඕන නැහැ පරිගණකයට. ඊට කලින් desk වල තියෙනවනේ කරපු දේවල් Interrogation Reports අරවා මේවා. ඒවා ගන්න තිබ්බා. එතකොට අපේ චෙන්නායිවල ඉන්නවා එක්කෙනෙක් බුද්ධි නිලධාරියෙක්. එයා මේ සම්බන්ධයෙන් මොකද්ද දන්නේ. එයාගේ Reports ඇවිල්ලා තියෙනවද. මේ ඔක්කෝම එකතු කරපුවාම එතකොට මේකට තවදුරටත් වැඩි වටිනාකමක් දෙන්න අවස්ථාව තිබුණයි කියලා තමයි මම විශ්වාස කරන්නේ.

ප : බොහොම ස්තුතියි මාසෝ මහත්මයා ඒ පැහැදිලි කිරීමට. අපි දැන් එකින් එක ඒ ඔබට මුහුණ දෙන්නට සිද්ධ වුණ ඒ පියවරවල් එකින් එක කථා කරමුකෝ. දැන් ඔබ කිව්වා මේ C-4(a), C-4(c) කියන ලේඛන දැක්කහම ඔබට තේරුණා කියලා බුද්ධි අංශවල කඩා වැටීමක් සිද්ධ වෙලා තියෙනවා කියලා?

පි : අනිවාර්යයෙන්ම. ඔව්.

ප : ඒ අනුව ඔබට තියෙන අත්දැකීම් අනුව ඔබ තොරතුරු සෙව්වයි කිව්වා. ඒ අනුව ඔබට දැන ගන්නට ලැබුණයි කියලා කිව්වා 2018 සැප්තැම්බර් මාසේ 01 වෙනිදා කොයිම්බතූර්වල සැකකරුවන් පස් දෙනෙක්ව අත් අඩංගුවට අරගෙන තියෙනවා කියලා?

පි : ඔව්.

ප : ඔබට මොන ආකාරයටද ඒ තොරතුර ලැබුණේ?

පි : ඒ තොරතුර ලැබුණේ මම කලින් කිව්වා මෙන්න මේ තියෙන්නේ, C-4(a) කියන ඒක. ඒක ස්වාමීනි මේකට පස්සේ, මේ සිද්ධියට පස්සේ මේක සමාජ මාධ්‍යවල ගියා. ඉන්දියානු පුවත්පත්වල ගියා. ඒකේ විශේෂයෙන්ම සඳහන් කරලා තිබ්බා මේ සහරාන්ගේ නම.

ප : ඔබ මේ ගරු කොමිෂන් සභාවට කිව්වා කරුණු හොයනකොට මේ බුද්ධි අංශවල කඩා වැටීම මොකක් නිසා සිදුවෙලා තියෙනවද කියලා ඔබේ අවධානය යොමු වුණා කියලා කොයිම්බතූර්වල 2018 සැප්තැම්බර් මාසේ 01 වෙනිදා යම් තරුණයින් අත් අඩංගුවට ගැනීමක් පිළිබඳව. ඔබ ඒක Internet එක හරහාද ලබා ගත්තේ?

පි : ඔව් ස්වාමීනි.

ප : ඒකෙන් ඔබ බාගත කර ගත්තාද ඒ ලිපිය?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒක The Hindu පුවත්පතේ වාර්තා වෙච්ච එකක් කියලා මා කිව්වොත් ඒක නිවැරදිද?

පි : මේක හින්දු පුවත්පතෙන් බාගත එකක්.

ප්‍ර : ඒ කියන්නේ ඔබ මේ සිද්ධියට අදාළව අන්තර්ජාලයේ සැරි සරනකොටද මේ The Hindu පුවත්පතේ ඒ කියන්නේ 2018 සැප්තැම්බර් මාසේ 03 වෙනිදා ප්‍රකාශිත මේ පුවත්පතේ තියෙන කොයිම්බතූර්වල තරුණයින් අත් අඩංගුවට ගැනීමක් ගැන කියෙව්වේ?

පි : ඔව්.

ප්‍ර : ඒ ඔබ ගත්ත ලේඛනයද දැන් ඔබ පරීක්ෂා කරන්නේ?

පි : ඒක තමයි.

(ස්වාමීනි එම ලේඛනය Five arrested for plot to kill leaders of Hindu out fits යන මාතෘකාව යටතේ The Hindu පුවත්පතේ 2018 සැප්තැම්බර් 03 වන දින ප්‍රකාශිත බවට සඳහන් මෙම ප්‍රවෘත්ති වාර්තාව C-745 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා)

ප්‍ර : දැන් C-745 ලේඛනය බැලුවහම තරුණයින් පස් දෙනෙක් අත් අඩංගුවට ගත්ත බව එහි සඳහන් වෙනවා නේද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔවුන් චෙන්නායි ඉඳලා කොයිම්බතූර් දක්වා ආපු බවත් එහි සඳහන් වෙනවනේ?

පි : සඳහන් වෙනවා.

ප්‍ර : ඊළඟට ඔබට ඒ ලේඛනය ඇරෙන්නට වෙන මොනවද මේ සම්බන්ධයෙන් සොයනකොට ලැබුණේ?

පි : Struggle for Hindu Existense කියන Document එක, මේක තියෙන්නේ HENB කියන Website එකෙන් අරන් තියෙන්නේ. ඒකේ තියෙනවා Five fanatic Jihadis held in Coimbatore for allegedly plotting to eliminate leaders of Hindu ourfits ඒ ලේඛනය.

ප්‍ර : එය කවදද පළවෙලා තියෙන්නේ HENB Website එකේ?

පි : සැප්තැම්බර් 03 වෙනිදා 2018.

(ස්වාමීනි 2018 සැප්තැම්බර් මස 03 වන දින HENB Website එකේ Five fanatic Jihadis held in Coimbatore for allegedly plotting to eliminate leaders of Hindu ourfits යන මාතෘකාව යටතේ ප්‍රකාශයට පත් වී ඇති මෙම ප්‍රවෘත්ති වාර්තාව C-746 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එම වාර්තාවේ මෙසේ අත් අඩංගුවට ගන්නා ලද එම තරුණයින් IS සංවිධානයට යම් සම්බන්ධතාවයක් තිබෙන බවට වාර්තා වෙලා තියෙනවද?

පි : මේකේ තියෙනවා ස්වාමීනි Struggle for Hindu Exinstence කියන එකේ The police believes that Ismail is on Is member and used to share information regarding the terrorist group on his facebook. එතකොට මේ පුද්ගලයා මුහුණු පොතේ IS සම්බන්ධයෙන් මතවාදය IS සාමාජිකයා කියලා මේ වාර්තාවේ තියෙනවා.

ප්‍ර : ඒ වගේම ඒකේ තියෙනවද One of the five members was said to be a sympathizer of the Islamic State of Jammu and Kashmir?

පි : ඔව් ඒකේ තියෙනවා One of the five members was said to be a sympathisor of the Islamic State of Jammu and Kashmir. It is a banned organization කියලත් තියෙනවා.

ප්‍ර : එතකොට මේ තරුණයින්ට විරුද්ධව පෙර වැරදි ගැන වාර්තා වෙන්නේ නැති බවත් එහි සඳහන් වෙනවද?

පි : එක තරුණයෙක් ගැන සඳහන් වෙනවා. ඒක සම්බන්ධයෙන් අපරාධ ගැන වැරදීමක්. ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් කිසි දෙයක් නැහැ.

ප්‍ර : එතකොට I am on this pahagraph. Though these youth did not have any previous enmity with the leader they were inspired by the IS modul and other radical religious outfits and hatched a plot. A senior official said අන්න ඒක පොඩ්ඩක් Translate කරලා කියනවද?

පි : ඒකේ කියන්නේ මේ අල්ල ගත්තු තරුණයන් සම්බන්ධයෙන් මූලිකව කලින් කිසිම ඔය හින්දු, ඔය මරන්න තිබුණයි කියන ඔය හින්දු අන්තවාදී, හින්දු මූලධර්මවාදී ප්‍රාදේශීය දේශපාලනයත් එක්ක කිසිම සතුරුකමක් තිබුණේ නැහැයි කියලා කියන්නේ. නමුත් මේගොල්ලෝ IS මතවාදය හින්දා ඒ කියන්නේ ඒගොල්ලොන්ට එරෙහි වන සෑම කෙනෙක් ඉන්නවා නම්, ඒ මූලධර්මවාදයට විරුද්ධව නැගී හිටිනවා නම් අන්න ඒ කට්ටිය මේගොල්ලෝ ඒ කට්ටිය සම්බන්ධයෙන් මේගොල්ලෝ ක්‍රියා කරනවා කියලා තමයි මෙතන දාලා තියෙන්නේ. ඒ කියන්නේ ඒ කට්ටිය මරණයට පත් කරන්න කියලා. ඒක තමයි මේකෙන් කියැවෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ තවදුරටත් ඔය අන්තර්ජාලයේ මේ තොරතුරු හොයමින් සැරිසරනකොට Outlook කියන විද්‍යුත් තැපෑලට අදාළව යම් ලේඛන පරිහරණය කෙරුවද?

පි : ඔව්. Outlook කියන Website එකෙන් NIA Raids TN Location ඒ කියන්නේ Tamil Location Link to ISIS like group third lead කියන මාතෘකාව යටතේ මම ඒක මගේ ප්‍රකාශය දීමේදී මම ඒක ඉදිරිපත් කළා.

ප්‍ර : ඉදිරිපත් කරලා තියෙනවා මේ විමර්ශන සිදු කරන කොමිසමේ පොලිස් ඒකකයට?

පි : ඒකකයට.

ප්‍ර : කවදද ඕක ප්‍රකාශයට පත් වෙලා තියෙන්නේ මේ Website එකේ?

පි : මේක ප්‍රකාශයට පත් වෙලා තියෙන්නේ ඔක්තෝම්බර් 31, 2019 දී. ඒ කියන්නේ සිද්ධියෙන් පස්සේ.

(ස්වාමීනි එය C-747 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : එම ප්‍රවෘත්ති නිවේදනයේ මෙම තරුණයින් සහ සහරාන් හෂීම් අතර යම් සම්බන්ධතාවයක් පිළිබඳව කරුණු හෙළි වෙනවද?

පි : ඔව්. මේකේ එක්තරා වාක්‍යයක කියැවෙනවා He said the investigation in the case revealed that the charge sheeted the accused persons and their associates who were radicalized on the violent extremist anology of ISIS by following the speeches and the videos of the Sri Lanka ISIS leader Zaharan Hasheem over social media platforms.

ප්‍ර : You have to translate that Mr. Maso?

පි : මේකෙන් කියැවෙන්නේ ස්වාමීනි වැඩිදුර පරීක්ෂණයේදී ඒගොල්ලන්ට අනාවරණය වෙලා තියෙනවා මේ චෝදනාවට ලක් වෙච්ච තරුණයෝ සහරාන්ගේ දේශන සහ සහරාන් විසින් ඉදිරිපත් කරන ලද වීඩියෝ පටය තුළින් ISIS කියන මතවාදය මේගොල්ලන්ට ඒක සිත් තුළට කා වද්දලා තියෙනවා කියලා.

ප්‍ර : එතකොට ඒක වැදගත් කරුණක් වෙනවා?

පි : ඒක වැදගත් කරුණක්. මේ සමාජ ජාලයෙන් තමයි ඔක්කොම වෙලා තියෙන්නේ.

ප්‍ර : සමාජ ජාලයෙන් තමයි ඔක්කොම සිදු වුණා කියලා ඔබ දැන් මේ නිරීක්ෂණය කරන්නේ?

පි : නිරීක්ෂණය කරන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට දැන් ඒ හැරෙන්නට ඔබ The Hindu Business Line කියන Website එක හරහා මොනවා හරි සොයා ගත්තද?

පි : ඔව්. එතකොට Hindu Website එකේ මම සොයා ගත්තා ස්වාමීනි මේකේ කියවලා තියෙනවා මෙම Alerts sent to Sri Lanka After a probe inquire to the ISIS case by NIA කියන මාතෘකාව යටතේ.

ප්‍ර : කවදද මෙය ප්‍රකාශයට පත්වෙලා තියෙන්නේ?

පි : මේක අප්‍රේල් 24, 2019. ඒ කියන්නේ සිද්ධියෙන් දවස් තුනකට පස්සේ.

(ස්වාමීනි එම ප්‍රවෘත්ති වාර්තාව C-748 වශයෙන් ලකුණු කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : ඒ C-748 මගින් මොනවද වාර්තා කරලා තියෙන්නේ ඔවුන්?

පි : මේකෙන් වාර්තා කරලා තියෙන මේ තරුණයෝ අත් අඩංගුවට අරගෙන විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ සම්බන්ධව මේ වගේ ....,

ප්‍ර : කවුද විමර්ශනය කරලා තියෙන්නේ කියලත් කියන්න?

පි : ජාතික විමර්ශන ඒජන්සිය ඉන්දියාවේ. ඉන්දියාවේ ජාතික විමර්ශන ඒජන්සිය මාස ගණනක් තුළ විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ තොරතුරු එන්නේ. ඒක ....,

ප්‍ර : දැන් ඔබ කිව්වා කලින් මේ තරුණයින්ව අත් අඩංගුවට අරන් තියෙන්නේ කොයිම්බතූර් පොලීසිය 2018 සැප්තැම්බර් 01 වෙනිදා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ දැන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන C-748 මේ ප්‍රවෘත්ති වාර්තාව පළ වෙනවා 2019 අප්‍රේල් 24 වෙනිදා ඒ කියන්නේ ලංකාවේ ප්‍රහාරය සිදු වෙලා දවස් තුනකට පස්සේ මේ NIA මාර්ගයෙන් තොරතුරු ලැබිලා තියෙනවයි කියලා ලංකාවට, සමාවෙන්න ස්වාමීනි NIA විසින් සොයාගෙන තියෙන තොරතුරු ලංකාවට යම් ආකාරයකට ලැබිලා තියෙන බව එයින් අනාවරණය වෙනවා කියලා? කොහොමද ඒක එවලා තියෙන්නේ?

පි : ඔව්. ලැබිලා තියෙන්නේ රාජ්‍ය තාන්ත්‍රික මාර්ගය තුළින් තමයි ලැබිලා තියෙන්නේ. Diplomatic Channels.

ප්‍ර : The input was sent through Diplomatic Channels. වෙන මොනවද කියන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතකොට මේකේ තවත් තියෙනවා මේගොල්ලන්ගේ විමර්ශනයේදී මේගොල්ලෝ Videos දැකලා තියෙනවා සහරාන් හෂීම්ගේ, National Thawheeth Jamath නායකයා සහරාන් හෂීම්ගේ වීඩියෝ දැකලා තියෙනවා. ඒ වීඩියෝ එකේ ඒගොල්ලන්ට දැන ගන්න ලැබිලා තියෙනවා Indian High Commission එකේ Attack එකක් වෙන්න යනවා කියලා. ඊට අමතරව ඒගොල්ලෝ තවදුරටත් සමාජ ජාලයට පිවිසිලා මේ ISIS සම්බන්ධයෙන් Accounts අරගෙන ඒ කියන්නේ ඒක ඒගොල්ලන්ගේ නිරීක්ෂණය කරනකොට ඒක දැකලා තියෙනවා. මේ සහරාන් හෂීම් කියන එක්කෙනාගේ ප්‍රකාශය අනුව ලංකාවේ පල්ලිවලට, කතෝලික කියලා නැහැ පල්ලිවලට ප්‍රහාර එල්ල කරනවා කියලා.

ප්‍ර : එතකොට දැන් අපි ඉදිරියට යන්නට ඉස්සරලා මම කැමතියි ඔබෙන් තව ප්‍රශ්නයක් අහලා යම් තොරතුරක් ලබා ගන්න. ඔබ ගරු කොමිෂන් සභාවට කිව්වා ජාතික විමර්ශන අධිකාරිය විසින් තමයි නැත්නම් ඒජන්සිය විසින් තමයි මේ තොරතුරු සොයා ගෙන තිබුණේ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයෙන් තමයි මේ තොරතුරු ලංකාව වෙත ලබා දීලා තියෙන්නේ කියලත් කිව්වා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඉන්දියාවේ බුද්ධි තොරතුරු රැස් කරන ආයතන කීයක් තියෙනවද කියලා?

පි : ඉන්දියාවේ මූලික වශයෙන් බුද්ධි, ඉන්දියාව ඇතුළත, රට ඇතුළත මූලික වශයෙන් තියෙනවා දෙකක්. ඒකක් තමයි IB

ප්‍ර : මොකද්ද IB කියන්නේ?

පි : ඒක Intelligence Bureau කියන එක.

ප්‍ර : ඒක මේ අපේ රාජ්‍ය බුද්ධි සේවය වගේද?

පි : ඒක අපේ රාජ්‍ය බුද්ධි සේවය වගේ තමයි. ඊළඟට තියෙනවා, ප්‍රාන්තවලට තියෙනවා වෙනම බුද්ධි ඒකක.

ප්‍ර : ඒකේ නම මොකද්ද ඒකේ?

පි : ඒකේ Thamilnadu එකට කියන්නේ Q Branch කියලා.

ප්‍ර : ඒ මොකද ඒ Q Branch කියන්නේ?

පි : ඒක තමයි දීලා තියෙන නම ඒගොල්ලෝ Q Branch කියලා. ඒ කියන්නේ Thamilnadu Intelligence Unit තමයි Arm එක තමයි.

ප්‍ර : එතකොට තමිල්නාඩුවේ විතරද ඔය වගේ ...?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ වගේ අනිත් Stateවලත් State විසි ගාණක් තියෙනවනේ. අනිත් ප්‍රාන්තවල. අනිත් ප්‍රාන්තවලත් ඒ වගේ තියෙනවා බුද්ධි අංශ ඉන්දියාවේ. මම කියන්නේ මේ තමිල්නාඩුවට ආවේණික වූ බුද්ධි අංශ Q Branch එක.

ප්‍ර : එතකොට ඒ හැරෙන්නට ඔබ කිව්වා ජාතික විමර්ශන ඒජන්සියක් තිබෙනවා කියලා?

පි : ඔව්. ඉස්සර කලින්ම මේ ඔක්කෝම කළේ CBI එක.

ප්‍ර : මොකද්ද CBI එක කියන්නේ?

පි : CBI එක Central Bureau of Investigation කියන එක. ඒකත් CID එකට සමාන කරලා තියෙන්නේ ඒක. පස්සේදි අර මම කලින් කිව්වා වගේ ස්වාමීනි 2018.11.21 Mumbai attack එකක් වුණානේ. Mumbai attack එකක් වෙච්චහම මේගොල්ලන්ට ඇත්ත වශයෙන්ම ආවා අදහසක් මේක Investigation එක CBI එකට දෙන්න ඒගොල්ලොන්ට කරන්න බැහැ, මේකට වෙනම එකක් ස්ථාපිත කරන්න ඕන කියලා තමයි National Investigation Agency එක හැදුවේ 2008 වසරේම. Mumbai එක වුණේ 2008 නොවැම්බර් 26. එතකොට මේකම තමයි ඇමෙරිකාවත් කළේ World Trade Centre එකට Inland Security කියලා එකක් දැම්මා. Homeland Security කියලා. ඒකත් කළේ ඔය විදියට. එතකොට මේකේ ප්‍රතිඵලය ....,

ප්‍ර : ඒ කියන්නේ 9/11 ප්‍රහාරයෙන් පස්සේ?

පි : ඔව්. ප්‍රතිපත්ති තීරණයක් ගත්තා මාසයක් ඇතුළත මේක නීතිගත කළා. නීතිගත කරලා පාර්ලිමේන්තුවෙන් පාස් වුණා මේ NIA එක.

ප්‍ර : ඉන්දියාවේ?

පි : ඉන්දියාවේ.

ප්‍ර : දැන් ඔබ යම් හඳුන්වා දීමක් කළා ඔය ආයතන කියනකොට රට ඇතුළේ තමයි ඔය ආයතන ක්‍රියාත්මක වෙන්නේ. ඉතිං ඔය බුද්ධි තොරතුරු ගලා යාම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් පිටරටවල් සමඟත් සිද්ධ වෙන්න ඕනනේ. එතකොට පිටරටවල් එක්ක කටයුතු කරන්න එහෙමනම් වෙනම ආයතනයක් තියෙනවද?

පි : අනිවාර්යයෙන්ම තියෙනවා.

ප්‍ර : ඒ මොකද්ද?

පි : ඒ ආයතනය තමයි ඉංග්‍රීසිවලින් කියනවා නම් RAW. Research and Analysis wing ඒගොල්ලෝ තනිකර විදේශ බුද්ධි තමයි ඒගොල්ලන්ගේ ඉලක්ක.

President's Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

ප : එතකොට අපිට තොරතුරු ලැබෙනවා නම් ඔය Research and Analysis Wing එහෙම නැත්නම් RAW හරහාද තොරතුරු ලැබෙන්නේ?

පි : අනිවාර්යයෙන්ම RAW හරහා.

ප : අපිට විතරක් නෙමෙයි. වෙන රටවල්වලටත් ඒ ආකාරයට තමයි ඔවුන් තොරතුරු ලබා දෙන්නේ?

පි : එතකොට Protocol Wise ඒගොල්ලෝ දෙන්නේ නැහැ. ඒගොල්ලෝ RAW එකට දෙන්නේ. RAW එක මාර්ගයෙන් තමයි අපිට එන්නේ. එහෙම තමයි මේක ඇවිල්ලා තියෙන්නේ.

ප : ඔබේ සේවා කාලය තුළදී මොන වගේ සම්බන්ධතාවයක්ද ඉන්දියාවේ බුද්ධි අංශ සමඟ තිබුණේ?

පි : ඉතාමත්ම කිට්ටු සම්බන්ධතාවයක් තිබ්බා ඒගොල්ලත් එක්ක. විශේෂයෙන්ම ඔය ත්‍රස්තවාදී කාල වකවානුවන් තුළ. මේගොල්ලන්ගෙන් සමහර තොරතුරු එනවා නිශ්චිත තොරතුරු. ඒක අපිට විශ්වාසවන්තදායකයි. නිශ්චිත තොරතුරු තිබුණා. අපිට තියෙන්නේ යම්කිසි ඒකට තව මොනවා හරි එකතු කරනවා නම් එකතු කරලා ඒ තොරතුරු ගැන ක්‍රියාත්මක වෙන්න විතරයි. හැබැයි සමහර තොරතුරු තියෙනවා කලින් කලට කොටස් වශයෙන් එන්නේ. එතකොට ඒවා සමාලෝචනය කරලා, විශ්ලේෂණය කරලා අපි තොරතුරක් බවට පත් කරනවා. එහෙම කරලා තියෙනවා මම. එහෙම කරලා සාර්ථක ප්‍රතිඵලත් අරන් තියෙනවා.

ප : එතකොට දැන් ඔබට කියන්නට පුළුවන්ද මම තොරතුරක් පෙන්නුවෝතින් ඒ තොරතුර ඔබ ඔය සඳහන් කරපු ආකාරයට තොරතුරක්ද? බුද්ධි තොරතුරක්ද කියලා?

(ස්වාමීනි C-4(b) ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා)

පි : මේ තොරතුරු නිශ්චිතභාවයක් තියෙනවා. ඇත්ත වශයෙන් නිශ්චිතභාවයක් තියෙනවා මේ තොරතුරේ.

ප : ඇයි ඔබ කියන්නේ ගරු කොමිෂන් සභාවට මා ඔබට පෙන්වන C-4(b) ලේඛනයේ තියෙන තොරතුරේ නිශ්චිතභාවයක් තියෙනවා කියලා?

පි : මේ තොරතුර මම දන්න තරමින් යම්කිසි ආයතනයකින් ඇවිල්ලා තියෙනවා. ඒ ආයතනය මම හොඳට දන්නවා. මේකේ පාවිච්චි කරලා තියෙන වචන, මේකේ පාවිච්චි කරලා තියෙන ක්‍රමය, එතකොට මේකේ තියෙන අඩංගු දේ නිශ්චිත වශයෙන් කියන්න පුළුවන්. හැබැයි එකක් තමයි තියෙන්නේ මේකේ දිනය හරියට වකවානු දරන දිනය හරියට දීලා නැහැ. එතනයි තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ඊළඟට තව එකක් තියෙනවා මේකේ Weapon knife attack කියලා තියෙනවා. Weapon knife අන්න ඒ දෙක සමඟරවිට මේගොල්ලෝ අදහස් කරනවා ඇති ඔය සමඟර ISIS කට්ටිය ගිහිල්ලා ඔය හැමතැනම වුණා යුරෝපීය රටවල්වල විශේෂයෙන්ම අනින එක. සමඟරවිට ඒක අදහස් කරලා ඇති. එහෙම නැත්නම් Suicide attack එකක් සමඟ මේක වෙන්න පුළුවන් කියන්න ඒගොල්ලෝ අදහස් කරලා ඇති. හැබැයි ඉතිං මේ අඩුපාඩු ටික තවදුරටත් විශ්ලේෂණය කරලා මේකට තවත් වටිනාකමක් එකතු කරන්න පුළුවන් කියන එකයි මගේ නිරීක්ෂණය.

ප්‍ර : දැන් බැලූ බැල්මට මා ඔබට පෙන්වා සිටින ඔය C-4(b) ලේඛනයේ අඩංගු දේ තොරතුරක්ද? බුද්ධි තොරතුරක්ද?

පි : මේක බුද්ධි තොරතුරක්.

ප්‍ර : බුද්ධි තොරතුරක්?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : ඔබ කිව්වා තවදුරටත් ඔය බුද්ධි තොරතුර වැඩි දියුණු කර ගන්න පුළුවන් කියලා. මොන ක්‍රමවේදයද ඔබට ඔය තොරතුරු ලැබුණා නම් ඔබ ඒ සඳහා යොදා ගන්නේ?

පි : පළමුව අපේ භූමියේ තියෙන ක්‍රියාකාරීන්. ඒක අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් ලවා ඒ තොරතුරු ලබා ගන්න ඕන එක. දෙවෙනි එක ....,

ප්‍ර : ඔය Trade Craft of Intelligence Analysis කියන එකද ඔබ ඔය සඳහන් කරන්නේ?

පි : ඔව්. Trade Craft of Intelligence Analysis කියන ඒ මූලික මූලධර්මය, සිද්ධාන්තය අපි මේකට යොදන්න ඕන. එතකොට ...,

ප්‍ර : කොහොමද ඒක කරන්නේ? එකක් තමයි බිම් මට්ටමේ ඉන්න අයගෙන් තොරතුරු රැස් කරනවා?

පි : ඔව්. Alert Resources කියලා කියන්නේ ඒක. ඊළඟට මේ පදනම් වෙච්ච තොරතුරු සම්බන්ධයෙන් අපේ දත්තවල තියෙන තොරතුරු මොනවද?

ප්‍ර : ඒවා බලනවා?

පි : එතකොට මේක හොඳට පැහැදිලි වෙනවා මේකත් එක්ක සම්බන්ධ අපි ගාව තියෙනවද තොරතුරු. එතකොට ඒක. ඊළඟට අපිට පුළුවන් මේකේ Telephone Numbers තියෙනවා නම් ඒවා බලන්න. එතකොට .....,

ප්‍ර : කාගේ ටෙලිෆෝන් නොම්මරද දැන් බලන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : දැන් මෙතන එහෙම ඇවිල්ලා නැහැ. මෙතන Telephone Numbers මොකුත් ...,

ප්‍ර : පැහැදිලි මදි ඔබේ පිළිතුර ටිකක්. කාගේ තොරතුරුද බලන්නේ? ටෙලිෆෝන් නොම්මරද?

පි : ඔව්. ඒක තමයි. දැන් මෙතන නම් ටිකක් කියවලා තියෙනවානේ. මේ නම් අනිවාර්යයෙන්ම අපේ බුද්ධි දත්තවල තියෙන්න පුළුවන්නේ.

ප්‍ර : ඒ කියන්නේ මේ සහරාන් හෂීම්, ජාල් අල් කිතාල්, රිල්වාන්, සාහිඩ් මවුලවී, ෂාහිඩ්, මිල්හාන් කියන අයගේ තොරතුරු?

පි : ඔව්. ඒ තොරතුරු. ඒ තොරතුරු ඔස්සේ අපි විමර්ශනය කරන්න ඕන. ඊළඟට අපේ චෙන්නායිවල ඉන්නවනේ එක්කෙනෙක්. මේ සම්බන්ධව එයාට මොනවද කියන්න පුළුවන්.

ප්‍ර : ඒ කියන්නේ ඔහු එතන ඉන්න නියෝජ්‍ය නේවාසිකව ඉන්න එක්කෙනාද?

පි : නේවාසිකව ඉන්නේ ඉන්දියානු උප කොමසාරිස් කාර්යාලයේ. එයා අනිවාර්යයෙන්ම මේ සම්බන්ධකම් පවත්වන්න ඕන ඒ කට්ටියත් එක්ක.

ප්‍ර : කවුද ඔය චෙන්නායිවල තියෙන උප කොමසාරිස් කාර්යාලයේ ඉන්න නියෝජිතයත් එක්ක සම්බන්ධකම් පවත්වන්න ඕන?

පි : අනිවාර්යයෙන් පවත්වන්න ඕන.

ප්‍ර : කවුද කවුද? Who?

පි : Intelligence Officer, බුද්ධි නිලධාරියෙක් ඉන්නවා. එතකොට එයා පවත්වන්න ඕන එතන තියෙනවා Q Branch එකත් එක්ක. එතකොට IB එක තියෙනවා. එතකොට Investigation Agencies තියෙනවා. ඒ කට්ටියත් එක්ක පවත්වන්න ඕන. මේ තොරතුරු ආපුවාම අනිවාර්යයෙන්ම පවත්වනවා නම් සමහරවිට එයාට මෙහෙට කලින් මේක දැන ගන්න ලැබෙන්න පුළුවන්.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ අපේ ලංකාවේ නියෝජිතයෙක් ඒ උප කොමසාරිස් කාර්යාලයේ ඉන්නවා?

පි : ඉන්නවා.

ප්‍ර : ඔහු සම්බන්ධකම් පවත්වන්නට අවශ්‍යයි ඉන්දියාවේ ඔබ සඳහන් කරපු මේ බුද්ධි ඒකක සමඟ?

පි : සමඟ.

ප්‍ර : එතකොට ඔහුව මෙහෙයවන්නේ එතකොට ලංකාවේ ඉඳලා කවුද?

පි : අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවය?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔහුට අවශ්‍ය නම් තොරතුරු තවදුරටත් දැනගන්න ඔහුට හැකියාව එහෙමනම් තියෙනවා අර උප කොමසාරිස් කාර්යාලයේ ඉන්න ශ්‍රී ලංකාවේ නියෝජිතයා සමඟ සම්බන්ධ වෙලා අවශ්‍ය උපදෙස් දෙන්න?

පි : ඔව්.

ප්‍ර : හොඳයි. එතකොට මොකද වෙන්නේ?

පි : එතකොට එහෙන් තොරතුරු එනවනේ. ඊට අමතරව දැන් මේකට පූර්ව සිද්ධීන් වෙලා තියෙනවානේ.

ප්‍ර : මොනවද ඒ?

පි : ඒ පූර්ව සිද්ධීන් තමයි මාවනැල්ලේ සිද්ධිය. අර බුදු පිළිමවලට හානි කිරීම. ඊට පස්සේ වනාතවිල්ලුවේ සිද්ධිය. ඊළඟට කාත්තන්කුඩියේ බයිසිකල් බෝම්බය පිපිරීමේ සිද්ධිය. ඊට අමතරව තව සිද්ධියක් තිබ්බා බෝම්බයක් හදන්න ගිහිල්ලා සිද්ධියක් වෙලා ඉස්පිරිතාලේ හිටියා. දැන් මේ සිද්ධීන් අනිවාර්යයෙන්ම භූමියේ ඉන්න කට්ටිය ඒගොල්ලන්ගෙන් ප්‍රශ්න කරලා ඇතිනේ අනිවාර්යයෙන්ම. එතකොට ඒ සිද්ධීන්වල මේ සමහර නම් ඇවිල්ලා ඇතිනේ. එතකොට ඒ නමුයි මේ නමුයි සසඳනකොට අනිවාර්යයෙන්ම හොඳ විශ්ලේෂණයක් කරන්න පුළුවන් කියන එක තමයි මගේ මතය. ඊළඟට ඔය වනාතවිල්ලුවේ අවි ආයුධ, පුපුරණ ද්‍රව්‍ය ගන්නකොට සමහර ඒවා හිස් තිබුණා. එතකොට හිස් තියෙනකොට ඒකේ තේරුම ඇවිල්ලා ඒක පාවිච්චි කරලා. එතකොට ඒක මොනවට හරි උපයෝගී කරලා. එතකොට ඒ අනුව එයාට අනිවාර්යයෙන්ම නිරීක්ෂණය වෙන්න ඕන මේ යම්කිසි සිද්ධීන් සමුදායක් මෙතන වෙනවා කියලා. ඉතිං ඒක එයා නිරීක්ෂණයට ලක් කරලා මේකට තවදුරටත් වටිනාකමක් දෙන්න තිබුණයි කියන එක තමයි මම නිරීක්ෂණය කළේ.

ප්‍ර : කවුද එහෙම නිරීක්ෂණය කරලා වටිනාකම දීමේ වගකීම පැවරිලා තිබ්බේ කාටද?

පි : ඒ වගකීම තියෙන්නේ රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂට. එයා පවරනවා ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂකට. ඉතිං ඒගොල්ලන්ගේ රාජකාරිය තමයි ලස්සනට ඒක කරලා දෙන එක.

ප්‍ර : එතකොට දැන් ඔබ ඔය කියන විදියට ඔබ නිරීක්ෂණය කරපු තොරතුරු ගැනනේ ඔය කියන්නේ. එතකොට ඔබේ විශ්ලේෂණ කුසලතාවය අනුව, අත්දැකීම් අනුව, පුහුණුව අනුව ඔබ හිතනවා මේ සියළුම කටයුතු ඔය ලැබුණු C-4(a) කියන ලේඛනය

FAIR COMMENT BY JEZEEM

බැලුවහම, සමාවෙන්න C-4(b) ලේඛනය දිහා බැලුවහම එය තව වඩා වර්ධනය කර ගන්නට ඕන නම් එම ක්‍රමෝපායන් අනුගමනය කළොත් තවත් මෙහි ගුණාත්මකභාවය වැඩි වෙනවා කියලා?

පි : සත්තකින්ම.

ප්‍ර : ඔබට තේරෙන විදියට, ඔබ නිගමනය කරපු විදියට C-4(b) ලේඛනයේ තියෙන තොරතුරු ලංකාවට ලැබිලා තියෙන්නේ කොහෙන්ද?

පි : මේක විදේශ බුද්ධි අංශයෙන් ලැබිලා තියෙන්නේ.

ප්‍ර : ඔව්. ඒක කියනවනේ විදේශ බුද්ධි අංශයකින් ලැබුණා කියලා. ඔබ ඔබේ රාජකාරී තුළදී ඇමෙරිකාවෙන් ලැබුණු බුද්ධි තොරතුරු කියවලා බලලා තියෙනවද?

පි : කියවලා බලලා තියෙනවා.

ප්‍ර : එතකොට මහා බ්‍රිතාන්‍යයෙන් ලැබුණු බුද්ධි තොරතුරු කියවලා බලලා තියෙනවද?

පි : කියවලා බලලා තියෙනවා.

ප්‍ර : ඕස්ට්‍රේලියාවෙන් ලැබුණු තොරතුරු කියවලා තියෙනවද?

පි : කියවලා තියෙනවා.

ප්‍ර : එතකොට ඉන්දියාවෙන් ලැබුණු බුද්ධි තොරතුරු කියවලා බලලා තියෙනවද?

පි : කියවලා තියෙනවා.

ප්‍ර : වෙනත් රටවල්වලින් ලැබුණු බුද්ධි තොරතුරු කියවලා තියෙනවාද?

පි : කියවලා තියෙනවා.

ප්‍ර : එහෙම නම් ඒ අත්දැකීම් අනුව ඔබට කියන්නට පුළුවන්ද මා ඔබේ අවධානය යොමු කරන C-4(b) ලේඛනය මේ ලෝකයේ තියෙන විවිධ රටවල්වලින් කුමන බුද්ධි සේවයක් මගින් ලංකාව වෙත එවා තිබෙන්නට පුළුවන්ද ඔබේ මතය අනුව?

පි : අපේ අසල්වාසී රටෙන්.

ප්‍ර : අපට අසල්වාසී කිහිපයක් තියෙනවා නේද? කොහේද?

පි : Big Brother. ඉන්දියා.

ප්‍ර : ඉන්දියාවෙන්. මසෝ මහත්මයා ඔබ කියනවා ඔබ මේ ලෝකයේ තියෙන අනෙකුත් රටවල්වලින් ලැබුණු, ඒ කියන්නේ සියළුම රටවල්වලින් ලැබුණු, බොහොමයක් රටවල්වලින් ලැබුණු බුද්ධි තොරතුරු කියවලා තියෙනවා කියලා. දැන් මම ඔබෙන් ඇහුවාම ඔබ කියනවා මේ C-4(b) ලේඛනය ඉන්දියාවෙන් එවලා තියෙන බව තමයි ඔබේ මතය වෙන්නේ. ඔබට පුළුවන්ද ඔබ ඔය දරන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මතය සාධාරණීකරනය කරන්න? ඒක තහවුරු කරන්න කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ කරුණු?

පි : මේ ශෛලිය එකක්.

ප්‍ර : ශෛලිය In English?

පි : ශෛලිය, Style.

ප්‍ර : Style of What?

පි : Style of writing and the contents.

ප්‍ර : Yes. The manner in which that it is written?

පි : written.

ප්‍ර : ඒ ලිපිය ලියා තියෙන ආකාරය?

පි : එතකොට මේකේ යම්කිසි වචන දෙකක් පාවිච්චි කරනවා ඒගොල්ලෝ.

ප්‍ර : ඒ ලිපිය ලියා තියෙන ආකාරය දැන් අපි දන්නේ නැහැනේ. අපිට කියලා දෙන්න ඕන. ඔය ලිපිය ලියලා තියෙන ආකාරය කිව්වහම අදහස් කරන්නේ මොකද්ද?

පි : ලිපිය ලියලා තියෙන ආකාරය කිව්වහම ඒ ශෛලියයි. මේක පාවිච්චි කරන Font එකයි. එතකොට ....,

ප්‍ර : ඒ ශෛලියද එතකොට කියන්නේ Style of letters ද ඔය කියන්නේ?

පි : Style of letters and the font, the font that they have used.

ප්‍ර : එතකොට මේ ලිපිය ලිවීම සඳහා යොදාගෙන තියෙන Font එක, අකුරු වර්ගය සහ ප්‍රමාණය ඔබේ අත්දැකීම අනුව ඉන්දියාවේ ඔත්තු සේවයන්ද එය පාවිච්චි කරන්නේ ඒ වගේ?

පි : ඒගොල්ලන් මේ විදියට තමයි ලියන්නේ.

ප්‍ර : එතකොට අන්තර්ගතය? දැන් ඔබ කිව්වනේ Contents කියලා.?

පි : ඔව්.

ප්‍ර : අන්තර්ගතය ඔබ ඇයි කියන්නේ ඉන්දියාවෙන් කියලා?

පි : මේකේ මෙතන Input කියලා වචනයක් පාවිච්චි කරනවා. මේ Input කියන වචනය පාවිච්චි කරන්නේ ඒගොල්ලෝ තමයි.

ප්‍ර : ඔබේ අත්දැකීම් Input කියන වචනය පාවිච්චි කරනවා ඉන්දියාවේ?

පි : ඉන්දියාවේ.

ප්‍ර : එතකොට ඔය Input කියන වචනය එහෙනම් ස්ථාන දෙකක මේකේ දැක්වෙනවා නේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. ස්ථාන දෙකක දැක්වෙනවා.

ප්‍ර : වෙන මොනවද ඔබට ඉදිරිපත් කරන්න පුළුවන් කරුණු මේක ඉන්දියාවේ කියලා?

පි : තව මේකේ තියෙනවා Enquiry කියලා.

ප්‍ර : එතකොට Enquiry කියන එකෙන් අදහස් කරන්නේ මොකද්ද?

පි : සාමාන්‍යයෙන් අනිත් හුඟක් වෙලාවට I වචනය පාවිච්චි කරනවා.

ප්‍ර : Inquiry ඒගොල්ලෝ කියන්නේ?

පි : Inquiry. මේගොල්ලෝ Enquiry කියලා තමයි පාවිච්චි කරන්නේ.

ප්‍ර : ඉන්දියාව සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ Enquiry කියලා?

පි : ඔව්. මේක ඇමෙරිකාවත් පාවිච්චි කරනවා Americal Style us Style but India also uses it.

ප්‍ර : India also uses it හරි වෙන?

පි : වෙන ඉතිං මේ ශෛලිය බැලූ බැල්මට මට කියන්න පුළුවන්.

ප්‍ර : Simplicity of Language?

පි : ඔව්. බොහොම සරළ, බොහොම සරළව තමයි මේක ලියලා තියෙන්නේ. ඊළඟට මේකේ තියෙනවා It is further learned that they have conducted reconnaisances of the Indian High Commission. දැන් අපි දැක්ක දෙයක් තමයි ස්වාමීනි මේක ලැබුණේ ඉන්දියාවෙන්නේ. එතකොට ඉන්දියාවෙන් ලැබුණහම Indian High Commission එක They have hundred person alertness. එතකොට ඉන්දියාවේ ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ ඒ ආයතන ඒගොල්ලෝ හරියට ආරක්ෂාව දාලා ඒ ආරක්ෂාව සියයට සීයක් ස්ථාපිත කළා. එතකොට මගේ අදහස හැටියට බුද්ධි නිලධාරියෙක් වශයෙන් ඒක තමයි ඒගොල්ලන්ට හුඟාක් වෙලාවට මේ Target එකට යන්න බැරි වුණේ කියලා මගේ නිරීක්ෂණය. නමුත් ඊට පරිබාහිරව බැලුවම අනිත් තැන්වල එහෙම සිද්ධියක් වෙලා නැහැ. නිකම් හරි සිද්ධියක් වෙලා තිබ්බා නම් අනිවාර්යයෙන්ම ඒවත්, හැබැයි ඉතිං එතන පල්ලි කියනකොට හැම එකක්ම අපිට මේවා කරන්න තිබ්බා. ඉතිං මේකේ හෝටල් ගැන සඳහන් කරලා නැහැ. ඊට පස්සේ නමුත් හෝටල්වලටත් ගහලා තියෙනවා. ඒක මම දන්නේ නැහැ ඒක කොහොමද වුණේ කියලා. නමුත් මම යන්නේ මේ Base එකේ මම යන්නේ.

ප්‍ර : එතකොට ඔබේ මතය වෙන්නේ මේක ඉන්දියාවෙන් ආවා කියලා?

පි : අනිවාර්යයෙන්ම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙමනම් ඒ කියන්නේ ඔබ කිව්වා බාහිර විදේශයන් සමඟ තොරතුරු හුවමාරු කර ගන්නේ, බුද්ධි තොරතුරු හුවමාරු කර ගන්නේ RAW ආයතනයෙන් කියලා. ඒ අනුව ඔබේ මතය වෙන්නේ C-4(b) ලේඛනයේ තිබෙන තොරතුරු RAW ආයතනය වෙතින් ලංකාවට ලැබුණු බවද? ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබී තිබෙන බවද?

පි : ඔව්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු දැන් ඉන්දියන් ඔත්තු සේවකයින් මෙම තොරතුරු ලැබුණා නම් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට මේ සම්බන්ධව ඔවුන් දන්වා සිටීමක් සාමාන්‍යයෙන් කළයුතුද?

පි : අනිවාර්යයෙන්ම කළ යුතුයි. දැන් ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලයෙත් ඉන්නවා අපිත් එක්ක සම්බන්ධීකරණ නිලධාරියෙක්. ඒ නිලධාරියත් එක්ක සම්බන්ධකමක් තිබුණා නම් අනිවාර්යයෙන්ම ඒ නිලධාරීන්ගෙන් තොරතුරු ලැබෙන්න ඕන. නමුත් මේ තොරතුරු එන්නෙත් එයාලා දීපු තොරතුරු හරහා එතනට ඇවිල්ලා එතනින් තමයි මෙතනට එන්නෙත්. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ඉන්නවා නියෝජිතයෙක්. එයාට ලැබිලා එයාගෙන් තමයි මෙතනට එන්නෙත්.

දැන් වේලාව : ප.ව. 7.50 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 7.50
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

ප : ඒ වගේම ඉන්දියාවට සම්බන්ධ ටජ් හෝටලය වැනි ආයතනයකට ඒ සම්බන්ධව ඔවුන් දැනුම්දීම් සාමාන්‍යයෙන් LTTE කාලයේ සිදු කලානේද මොකක් හරි ප්‍රහාරයක් සිදු වන අවස්ථාවකදී එම හෝටල්වලට දැනුම් දීමක්?

පි : ඔව් එහෙම සිදු කළා.

ප : සිදු කලා LTTE ප්‍රහාර සිදු වන වෙලාවේ ටජ් එකටත් ඒ සම්බන්ධව ඉන්දියන් සේවයටත් දැනුම් දිමක් සිදු කළා?

පි : ඔව්.

ප : මෙම අවස්ථාවේදි එවැනි දැනුම් දීමක් සිදු නොවීම සම්බන්ධයෙන් ඔබට යමක් කියන්න පුළුවන්ද?

පි : ඒක තමයි ස්වාමිණි දැන් හෝටල් ගැන මේකේ දාලා නැහැ. ඒ හින්දා ඒ ගැන මට හරියට කියන්න බැහැ. මෙතන හොටෙල් සම්බන්ධයෙන් කිසිම මෙතන තියෙන්නේ ඉන්දියන් මහ කොමාසාරිස් කාර්යාලයයි පල්ලිය ගැනයි විතරයි මෙහි සඳහන් වෙලා තියෙන්නේ. මේකේ සඳහන් වෙලා නැහැ. ඉතින් හෝටලයට ආවේ කොයි තරම් තොරතුරු කොයි කාලෙක ආව එකක්ද කියලා මම දන්නේ නැහැ ඒක.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : දැන් ඔබ කියපු කාරණා සම්බන්ධයෙන් තව කරුණක් තියෙනවා ඔබ කිව්වා ලංකාවේ ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ නියෝජිත යෙක් ඉන්නවා කියලා, ඒ RAW ඒජන්සියේ එකේ නියෝජිතයෙක්ද ඔබ සඳහන් කෙරුවේ?

පි : ඔව් එහෙම තමයි.

ප : දැන් ඔය රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු ඔය තොරතුර සාමාන්‍යයෙන් ඒ තොරතුරු ලැබෙන්නේ ඉන්දියාව හරහාද නැත්නම් ලංකාවේ ඉන්න මහ කොමසාරිස් කාර්යාලය හරහාද?

පි : ඉන්දියාව හරහා එයාට එනවා. එයා තමා මෙහාට එවන්නේ.

ප : ආ. එතකොට ඉන්දියාවෙන් කෙලින්ම රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වෙත ලැබීමක් සලස්වන්නේ නැහැ?

පි : ඒකනේ Diplomatic Channels කියලා කිව්වේ That's why the High Commission is involved.

ප : ලංකාවේ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයේ ඉන්න RAW නියෝජිතයාගෙන් ලැබුණා කියලා ඔබ නිරීක්ෂණය කරන්නේ?

පි : නිරීක්ෂණය කරන්නේ. එහෙම තමයි ලැබෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : එහෙම නම් මේ ගරු කොමසාරිස්තුමන්ලා විසින් අසන ලද ඒ ප්‍රශ්නයට මම තව කොටසක් එකතු කරන්නට කැමතියි ඔබෙන් උත්තරයක් විදියට ලබා ගන්නට, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට ලැබුණු C4B ලේඛනයේ සඳහන් කරුණු පිළිබඳව යම් අස්ථිර භාවයක් තිබුණා නම් ඔහුට කිසියම් හෝ බාධාවක් නැහැ නේද ලංකාවේ ස්ථානගත වෙලා ඉන්න RAW ආයතනයේ, සංවිධානයේ නියෝජිතයාව අමතලා මේ තොරතුරෙහි තියෙන සත්‍යවාදී භාවය පිළිබඳව කරුණු සොයා බලන්නට?

පි : කිසිම බාධාවක් නැහැ එයාට ඒක විමසන්න පුළුවන්. අනිවාර්යයෙන් විමසන්න පුළුවන්.

ප්‍ර : සහ එසේ සොයා බැලීමට දවස් ගාණක් ගත වෙන්නේ නැහැ නේද, 4 වෙනිදා හම්බ වුණා නම් 20 වෙනිදා වෙන කල් කාලය ගත කරන්නට අවශ්‍ය වෙන්නේ නැහැනේ අප්‍රේල් මාසේ?

පි : එච්චර අවශ්‍ය වෙන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ ඔය නිරීක්ෂණය කරන ලද කරුණු ඔබ විශ්ලේෂණය කළාද?

පි : ඔව්.

ප්‍ර : විශ්ලේෂණය කරලා ඔබ යම් වාර්තාවක් විදියට යමක් සැකසුවද?

පි : ඔව් මම ඇත්ත වශයෙන්ම මම ඒක කාටත් දෙන්න නෙමෙයි මගේ දැනුම මේවා කර ගන්න, මම බුද්ධි නිලධාරියෙක් හින්දා මම විශ්ලේෂණය කළා ඒක. එතකොට මම මෙතනට ආපුවාම ඇහුවාම මම හිතුවා මේක දෙන්න ඕන කියලා ඒක තමයි මම ඕක ඉදිරිපත් කළේ.

ප්‍ර : ඔබ අපේ පොලිස් විමර්ශන අංශයට ඒ වාර්තාව ඉදිරිපත් කෙරුවා?

පි : ඕක මම ඉදිරිපත් කළේ ස්වාමිණි මේක ඇවිල්ලා තේරීම් කාරක සභාවේදි මම මේක කළේ. ඇත්තවශයෙන්ම මේක තුනක් වෙලා තියෙනවා. එකක් තමා තේරීම් කාරක සභාවෙන් දාපු මේක Inquiry එක පරීක්ෂණය. ඊලඟට එවකට හිටපු ජනාධිපතිතුමා වෙනම එකක් දැම්මා. මේක 3 වෙනි එක මේ. එතකොට මම කළේ 1 වෙනි සැරේ මේ Parliament Select Committee එකේ තිබිච්ච ඒගොල්ලන්ගේ Findings අනුව තමයි මං මේක කළේ. ඒ කියන්නේ සිද්ධිය වෙලා මම හිතන්නේ මාසයක් දෙකක් ඇතුළත තමා මම...

ප්‍ර : ඒ වාර්තාව නැවත දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

(ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී)

You have not signed it Mr. Maso ?

පි : No, I have signed it here.

ප්‍ර : ඒ පළවෙනි පිටුව විතරයිනේ?

පි : ඔව් ස්වාමිණි. මේක තමයි වාර්තාව ස්වාමිණි.

ප්‍ර : දැන් මාසෝ මහත්මයා ඔබ පළවෙනි පිටුවේ මේ වාර්තාවේ යමක් ලියලා තියෙනවා නේද? Handing over for further investigations කියලා සහ එතන අත්සනක් යොදලා තියෙනවා 2020 ජුනී මාසේ 19 වෙනිදා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබට පුළුවන්ද මේ වාර්තාව අවසානයේ අත්සන් කරලා අද ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නට?

පි : එහෙමයි ස්වාමිණි මම අද දිනේ දාලා මම අත්සන් කරලා ඒක ඉදිරිපත් කරනවා.

ස්වාමිණි මෙම සාක්ෂිකරු විසින් How the Easter Sunday 21/4 Bombing could have been in pre-empted යන ශීර්ෂය යටතේ ඉදිරිපත් කොට තිබෙන වාර්ථාව C749 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

පි : ස්වාමිණි එතන පොඩි වෙනස්කමක් කරන්න ඕනේ Post incident එකට pre incident කියලා දාලා තියෙනවා. Pre incident එකට post incident කියලා දාලා තියෙනවා. එය වැරදීමක් ඒක. දෙවෙනි පිටුවේ 2,

ප්‍ර : To compare and analyze the following …

පි : That should be Pre incident not Post incident.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:**</u>

ප්‍ර : ඒ වගේම සාක්ෂිකරු 2 වන පිටුවේ ඔබ සඳහන් කරලා තියෙන Note නැත්නම් සටහන එය නිවැරදි විය යුතුයි නේද?

(සාක්ෂිකරු අදාල කොටසට අවධානය යොමු කරයි)

පි : මම දන්න තරමින් නම් මෙතන එහෙම

ප්‍ර : 2 වන පිටුවේ Note reports on the risk කියලා තිබෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : ඒකේ ඔබ කියලා තිබෙන්නේ මේ සහරාන් හෂීම් සහ ඒ අත්අඩංගුවට ගත්ත 5 දෙනා සම්බන්ධයෙන් තිබ්බ සම්බන්ධකම

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පාස්කු ප්‍රහාරයට මාස 6 ට පෙර ප්‍රසිද්ධ වෙලා තිබ්බා කියලා පත්තරේ? ඒක නිවැරදි වෙන්න ඕන නේ?

පි : ඒකත් නිවැරදි වෙන්න ඕන.

ප්‍ර : සහරාන්ගේ නම මාස 6 ට ඉස්සෙල්ලා මේ පස්දෙනා සමඟ සම්බන්ධවීමක් තිබ්බේ නැහැ නේද?

පි : නැහැ, නැහැ ඒක හරි.

ප්‍ර : ඒ නිවැරදි කිරීම සිදු වුණාට පසුවත් ඔබ මේ වාර්තාවේ දාලා තියෙන ඔබගේ නිගමනයේම ස්ථීර වශයෙන් සිටිනවද?

පි : සිටිනවා, ඇත්ත වශයෙන්ම සිටිනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ කිව්වා ගරු කොමිෂන් සභාවට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ ඒ පරීක්ෂණය යන අවස්ථාවේදී තමයි එහි නිගමන මත ඔබ මේ C749 කියන ලේඛනය පිළියෙල කළේ කියලා. එහිදී ඔබ මොන මොන තොරතුරු ද මේ බුද්ධි වාර්තා විශ්ලේෂණය සඳහා, බුද්ධි විශ්ලේෂණය සඳහා උපයෝගී කර ගත්තේ?

පි : මම කලින් ඉදිරිපත් කළ මේ ලේඛන 4.

ප්‍ර : නැවත කියන්න පුළුවන්ද ඒවා මොනවද කියලා?

පි : හින්දු පත්තරේ, හින්දු Website එකේ

ප්‍ර : ඒ කියන්නේ C745, C746, C747 සහ C748 කියන ලේඛන?

පි : ලේඛන.

ප්‍ර : ඔබ මේ බුද්ධි විශ්ලේෂණය කරන අවස්ථාවේදී ඔය C745 සිට C748 දක්වා වූ ලේඛන පදනම් කරලා ඔබට පෙනී ගියාද රාජ්‍ය බුද්ධි සේවාව තමන්ගේ රාජකාරිය ඉටු කිරීමට සමත් වෙලා තියෙනවද කියලා?

පි : සමත් වෙලා නැහැ, ඒගොල්ලන් අසමත් වෙලා තියෙනවා.

ප්‍ර : ඇයි ඔබ කියන්නේ අසමත් වෙලා කියලා, ඒ සඳහා ඔබ හඳුනා ගනු ලැබූ යම් කරුණු ඔබේ C749 කියන වාර්තාවේ අන්තර්ගත කළාද?

පි : විශේෂයෙන්ම ස්වාමිණි රාජ්‍ය බුද්ධි අංශය විසින් මේ ලැබූ විදේශ බුද්ධි තොරතුරු ආයතනයෙන් ලැබිච්ච තොරතුරු සම්බන්ධයෙන් අපි කියනවා Counting Diligence කියලා, Trade craft එකේ. ඒක කරලා නැහැ. ඒකේ sources alert කරලා නැහැ. source alert කරලා ground information අරන් නැහැ, මට තේරෙන විදියට. ඊලඟට ඒගොල්ලෝ websites, Electronic media අර මීඩියා වල තොරතුරු අරන් නැහැ.

ප්‍ර : ඔව්.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඊලඟට ඒගොල්ලෝ හරියාකරව Telephone Analysis කලාද කියන එක ප්‍රශ්නයක් තියෙනවා. එතකොට ඊලඟට අපේ රාජ්‍ය බුද්ධි නිලධාරියෙක් ඉන්නවා චෙන්නායි වල. එයා සම්බන්ධ කරලා මේ සම්බන්ධයෙන් එයා තොරතුරු දීලා තියෙනවද, ඒ වගේ වාර්තාවක් කැඳවලා තියෙනවද. ඒක සිද්ධ වෙලාද කියලා මම දන්නේ නැහැ. ඊලඟට මේකේ තවත් තියෙනවා පුර්ව සිද්ධීන් කිහිපයක්. ඒ පුර්ව සිද්ධීන් මේකට එයා ආදේශ කරලා නැහැ ඒගොල්ලෝ මම කලින් කිව්වා වගේ

ප්‍ර : ඒගොල්ලෝ කියන්නේ නැතුව කවුද කියලා කියමු නේද?

පි : රාජ්‍ය බුද්ධි සේවාවෙන්.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවෙන් ඒවා ආදේශ කරලා නැහැ, ඔව්?

පි : එතකොට මාවනැල්ල බුදු පිළිම කැඩීම සිද්ධිය සම්බන්ධයෙන්, වනාතවිල්ලුව එතන තියෙන අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අවි ආයුධ එතකොට පුපුරණ ද්‍රව්‍ය, ඊලඟට කාත්තන්කුඩි සිද්ධිය ඒ තොරතුරු හරියට මේකට විශ්ලේෂණයට භාජනය කරලා නැහැ. ඒකත් එක්ක. ඒ අනුව තමයි මම මේ ඔක්කොම විශ්ලේෂණය සිදු කරලා තියෙන්නේ නිරීක්ෂණයන් අනුව.

ප්‍ර : එතකොට ඔබේ මේ නිරීක්ෂණයන් සහ විශ්ලේෂණයන් අනුව ඔබේ නිගමනය වෙන්නේ, රාජ්‍ය බුද්ධි සේවාව මේ වැදගත් තොරතුරු C4B හි අඩංගු තොරතුරු නිසි පරිදි භාවිතා කිරීමේදී අසමත් වෙලා තියෙනවා කියලද?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඔබ කිව්වා ඔබ විශ්‍රාම ගන්නට පෙර පොලිස් බුද්ධි කාර්යාංශයේ

පි : පොලිස් විශේෂ බුද්ධි කාර්යාංශයේ

ප්‍ර : විශේෂ බුද්ධි කාර්යාංශයේ සේවය සඳහා අනුයුක්ත කරනු ලැබුවාය කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද එම ඒකකයේ සේවය කරපු නිලධාරියෙක් විදියට මොන වකවානුවේද මෙම කාර්යාංශය පිහිටුවනු ලැබුවේ, මොන හේතුවක් නිසාද එය පිහිටුවනු ලැබුවේ කියලා?

පි : මේක, මම ප්‍රකාශයක් දීලා තියෙනවා, මට කාල වකවානු ඒ ප්‍රකාශය මට බලා ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ,

ප්‍ර : මම ඔබට යෝජනා කලොත් එය පිහිටුවනු ලැබුවේ 1988 /1989 කාලය තුලදී කියලා ඔබ එකඟ වෙනවද?

පි : එකඟ වෙනවා.

ප්‍ර : එතකොට කුමන හේතුවකටද ඒක පිහිටුවේ කියලා ඔබට මතකයක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක පිහිටුවන්න හේතුව තමයි ඇත්ත වශයෙන්ම පොලිස්පතිතුමා යටතේ බුද්ධි අංශයක් තිබුණේ නැහැ. ඒ අවශ්‍යතාවය මතු වුණා 1989 ඒ කියන්නේ අර ප්‍රචණ්ඩකාරී සිදුවීම් සිදු වුණා දකුණේ. එතකොට ඒකේ අවශ්‍යතාවයක් මතු වෙච්ච හින්දා තමයි ඒ අනුව තමයි මේක ස්ථාපනය වුණේ විශේෂ බුද්ධි කාර්යාංශයක් හැටියට. සෘජුවම පොලිස්පතිතුමාගේ අධීක්ෂණය යටතේ.

ප්‍ර : එතකොට ඔවුන්ට තියෙන බලතල මොනවද?

පි : ඔවුන්ට තියෙන සාමාන්‍යයෙන් බුද්ධි තොරතුරු සොයාගෙන ඒක පොලිස්පතිට වාර්තා කිරීම එකක්. ඊලඟට ඒ අවශ්‍ය තැන්වලට සෘජුවම වාර්තා කරන්න පුළුවන්. ඒ කියන්නේ ඒ DIG ට නැත්නම් සීනියර් DIG ට එහෙම නැත්නම් කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට ඒ දේ තිබුණා. ඒ තොරතුරේ තියෙන වටිනාකම ඒ තොරතුරේ තියෙන සංවේදිතාවය අනුව තමයි එයා කරන්නේ. සංවේදී තොරතුරු නම් එයා වහාම වාර්තා කරන්න ඕනේ IG ට. සාමාන්‍යයෙන් ඔය අපරාධ ගැන එතකොට දුෂිත ක්‍රියා ගැන, ඒවා නම් එයා කෙලින්ම එයාට DIG ට වාර්තා කරන්නත් පුළුවන්. SSP Division ට වාර්තා කරන්නත් පුළුවන්. ඒ කරලා හුඟක් වෙලාවට නිලධාරීන්ගෙන් ලැබෙන අකටයුතුකම් ඒවත් පුළුවන්. එතකොට මේක විශේෂයෙන්ම පාදක වුණේ පොලිස්පතිගේ නීතිය හා සාමය රැකීම සම්බන්ධයෙන් තමයි මූලිකව මේක ස්ථාපනය කළේ. නීතිය හා සාමය To Maintain Law and Order ඒක තමයි මූලිකව මේවා වුණේ.

ප්‍ර : හැබැයි විමර්ශනය කිරීමටත් ඔවුන්ට නෛතික බාධාවක් නැහැනේ?

පි : පොලිස් නිලධාරීන් අතරේ විමර්ශනය කිරීමට නෛතික බාධාවක් නැහැ ඒගොල්ලන්ට ඒ බලය තිබ්බා.

ප්‍ර : මම කැමතියි ඔබගෙන් තව කරුණක් දැන ගන්න, ඒ තමයි ඔබේ අවධානය මා යොමු කරන්නට කැමතියි C4A ලේඛනය කෙරෙහි. එහි තිබෙනවා නේද ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පතිවරයා වෙත එවා ඇති බවට දැක්වෙන මේ ලිපියේ eyes only කියලා සඳහන් වෙනවානේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : eyes only කියලා ඔබේ පළපුරුද්ද අනුව, ඔබේ දැනුම අනුව සඳහන් කරන්නේ කුමන අවස්ථාවකදී ද?

පි : ස්වාමිණි මේ eyes only කියන වචනය සාමාන්‍යයෙන් ලිපි හුවමාරුවේදී පාවිච්චි වෙනවා. හැබැයි eyes only කියලා ඒ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වචනය යෙදුවොත් ඒ යෙදුම යෙදුවොත් ඒක සීමා වෙන්න ඕනේ දෙන්නෙක් අතරයි. ඒ දෙන්නයි ලබන්නයි අතර පමණයි.

ප : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : ඒක තමයි ඒකේ සංවේදීත්වය, ඒකේ රහස්‍ය භාවය. එතකොට එය ලැබුණයින් පස්සේ එයාට ..

ප : මොකක්ද සිදු කරන්න ඕනේ, ලබන්නා මොකක්ද කරන්න ඕනේ?

පි : ලබන්නා මේකේ සම්පූර්ණ අන්තර්ගතය කියවලා අන්තර්ගතය එයාට ඕන නම් සටහන් කර ගන්න පුළුවන්. ඊට පස්සේ එයා අනිවාර්යයෙන්ම මේක විනාශ කලයුතුයි. මේක තියාගන්න බැහැ file කරන්නත් බැහැ, තියා ගන්නත් බැහැ මේක අනිවාර්යයෙන්ම විනාශ කළ යුතුයි. ඒක එන්නත් ඕනේ සීල් කවරයක දාලා සීල් කරලා ඔක්කොම එන්න ඕනේ.

ප : ඒක තමයි ක්‍රමවේදය?

පි : ගලවන කොට ගලවන්නත් ඕනේ ලබන්නා විතරයි.

ප : වෙන කවුරුත් ගලවන්න බැහැ?

පි : වෙන කවුරුත් ගලවන්න බැහැ.

ප : PA ට ගලවන්න බැහැ, පෞද්ගලික සහායකට?

පි : බැහැ, එයාටත් බැහැ. eyes only එයාටත් බැහැ ගලවන්න.

ප : ඒ කියන්නේ කා වෙතද මේ නම ලියලා තියෙන්නේ මේ ලිපිය ලැබිය යුතුයි කියලා, ඒ තැනැත්තා විතරමයි මේක බලන්නේ?

පි : එයා විතරයි ගලවන්න ඕනේ. සීල් එක පවා එයා විතරයි ගලවන්න ඕනේ.

ප : ඔබ කියන්නේ ඒ තැනැත්තා ඒ ලිපිය ගත්තා ඒකේ තියෙන අන්තර්ගතය ග්‍රහණය කරගෙන ඔහුට පුළුවන් වෙනත් ලේඛනයක් සකස් කරන්න?

පි : අනිවාර්යයෙන්ම.

ප : ඒකෙන් අදහස් කරනවද එහෙම නම් කිසිසේත්ම, කිසිසේත්ම තමන්ට ලැබුණු ලේඛනය තමන්ගේ ඇස් දෙකට විතරක් බලන්න ලැබුණු ලේඛනය වෙන කාටවත් බැහැර කරන්න බැහැ කියලා?

පි : බැහැ.

ප : එහෙම නම් බලන්න මා ඔබේ අවධානය යොමු කරනවා ඔය C4A ලේඛනයේ දකුණුපස පහළ කෙලවරේ FNA යන කෙටි සටහන යොදා පූජිත ජයසුන්දර Inspector General of Police කියන මුද්‍රාව යොදලා ඒකට ඉහළින් යම් යම් පාර්ශවයන් වෙත මෙය යොමු කරලා තියෙනවා නේද කියලා?

පි : ඔව්. එහෙම එයා පිටසනක් දාලා තියෙනවා.

ප : දැන් එය නිසි ක්‍රමවේදයද? එහෙම කරන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : මේ තොරතුර බැලූ බැල්මට මේක මේ තොරතුරේ යම් ආරක්ෂාවට තර්ජනය වීමේ ප්‍රවණතාවයක් තියෙනවා. ඒ එක්කම මේ තොරතුරේ යම්කිසි ඒ තොරතුරේ ශක්තිමත් භාවය අඩු කරලත් තියෙනවා.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : ඒ කියන්නේ මෙතන alleged කියලා දාලා තියෙන වචනය හින්දා ඒකයි.

ප්‍ර : ඒ කියන්නේ ඒක එහෙම නම් යොදලා තියෙන්නේ ජාතික බුද්ධි ප්‍රධානී නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ජාතික බුද්ධි ප්‍රධානීට මේ අන්තර්ගතය යොමු කරන්න ඔහුට යම් ලේඛනයක් ලැබෙන්න ඕන නේ?

පි : හරි එය ඔහුට ලැබෙන්න ඕනේ.

ප්‍ර : එතකොට මා ඔබේ අවධානය යොමු කරනවා C4C ලේඛනයට. දැන් ඔය C4C ලේඛනය ජාතික බුද්ධි ප්‍රධානීට ලැබුණා නම් ඔහුට පුළුවන්ද නිශ්චිතවම මේ ප්‍රහාරය සිදු වන බව හඟවන imminent එහෙම නැත්නම් Planned Attack යන වචන යොදන්න?

පි : ඔහුගේ නිරීක්ෂණයක් තියෙනවා මෙතන, ඔහුගේ යම් නිරීක්ෂණයක් තියෙනවා මෙතන....

ප්‍ර : ඔහු කියලා කියන්නේ කවුද කියලා කියන්න?

පි : අධ්‍යක්ෂක, රාජ්‍ය බුද්ධි සේවාවේ නිරීක්ෂණයක් තියෙනවා මෙතන සහරාන් යන අය සමාජ ජාලා ගිණුම් ඔස්සේ සිය අනුගාමිකයන් අභිප්‍රේරණය කිරීමේ දී මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කර ගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කළ බවට මේ වන තෙක් නිරීක්ෂණය වී නොමැත. මෙන්න මේ ප්‍රශ්නය මෙතනත් තියෙනවා, එතකොට මෙතනිනුත් ඒ තොරතුරේ තියෙන ශක්තිමත් භාවය අඩාල වෙලා තියෙනවා.

ප්‍ර : එතකොට ජාතික බුද්ධි ප්‍රධානී තමන්ගේ C4A ලේඛනය පිළියෙල කෙරුවේ යම් හෙයකින් ඔය C4C ලේඛනය මත පදනම් වෙලා නම් ඔහු alleged කියන වචනය මාතෘකාවේ යෙදීමේ යම් වරදක් තියෙනවද?

පි : ඒකේ වරදක් මට පේන්නේ නැහැ.

ප්‍ර : නමුත් ඔබ කියන විදියට alleged යන වචනය ඉවත් කරලා C4C ලේඛනයේ ..

(ස්වාමිණී සාක්ෂිකරුගේ අවධානය X94 කෙරෙහි යොමු කරනවා)

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : දැන් මා ඔබේ අවධානයට යොමු කරපු අර C4C ලේඛනයේ තියෙන කරුණු X94 ලේඛනයේ තියෙනවද කියලා බලන්න?

X94 කියලා කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් 2019.04.09 වෙනිදා පූජිත් ජයසුන්දර මහතා වෙත යවා ඇති ලිපියක්. එය ඔහු පිටපත් කරලා තියෙනවා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට?

පි : ඔව්, ඒකත් මම සඳහන් කර තිබෙනවා නිරීක්ෂණය වී නොමැත කියා.

ප්‍ර : ඒ කියන්නේ ඔය ලේඛන දෙකේම තියෙන්නේ එක නේද?

පි : දෙකේම තියෙන්නේ එක. ලේඛන දෙකේම තියෙන්නේ එකම අන්තර්ගතය තියෙන්නේ. ඒ අන්තර්ගතය ඒ විදියටම තියෙනවා. ඒ අන්තර්ගතය is verbatim .

ප්‍ර : ඒ කියන්නේ ඒ වචන ඒ ආකාරයෙන්ම තියෙනවා?

පි : තියෙනවා.

ප්‍ර : එහෙම නම් මා කිව්වොතින් නිවැරදි ද C4C ලේඛනයේ තියෙන්නේ මේ X94 රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් යවන ලද ලිපියේ උපුටා ගැනීමක් කියලා?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : එතකොට බලන්න C4A ලේඛනය, එය පරීක්ෂා කරලා බැලුවාම එය තොරතුරක් ද බුද්ධි තොරතුරක්ද ඔබේ අත්දැකීම් සහ පුහුණුව අනුව?

පි : මේකේ alleged කියන වචනයෙන් සම්පූර්ණයෙන්ම ඒ බුද්ධි තොරතුරේ වටිනාකම නැති කරලා තියෙනවා. ඒ අනුව මේකේ විශ්වාසවන්ත භාවය හීන වෙලා තියෙනවා.

ප්‍ර : දැන් ඔය alleged කියන වචනය යොදන් නැතුව ගත්තා නම් C4A ලේඛනය එහෙම නම් එය තොරතුරක්ද බුද්ධි තොරතුරක්ද?

පි : එය බුද්ධි තොරතුරක්.

ප්‍ර : බුද්ධි තොරතුරක් නම් එය දැන් ඔබලා දෙනවානේ grading, ශ්‍රේණිගත කිරීම් කරනවානේ, මොන ශ්‍රේණියේද ඔබ මෙය ඇතුලත් කරන්නේ?

පි : ඒක ඉහලම ශ්‍රේණියේ A Grading දෙනවා.

ප්‍ර : alleged කියන වචනය මේකට යෙදීම නිසා C4A ඔබ කියනවා එහි තියෙන ගුණාත්මක භාවය අඩු වුණාය කියලා,?

පි : ඔව් ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : alleged කියන වචනය යෙදීම නිසා මේක නිකම්ම තොරතුරක් බවට පත් වෙනවද?

පි : නිකම්ම තොරතුරක් බවට පත් වෙනවා.

ප්‍ර : ඒකට යම් ගුණාත්මක අගයක් දෙන්නටම බැරිද?

පි : ගුණාත්මක අගයක් ඒකට දෙන්න බැහැ alleged කියන වචනය පාවිච්චි කරලා එතනම තියෙනවා අවිශ්වාසයක්. එතන තියෙනවා අවිශ්වාසයක්. වෙන්නත් පුළුවන් නැති වෙන්නත් පුළුවන්.

ප්‍ර : එම නිසා ඔබ කියන්නේ අර A ශ්‍රේණිය දිය හැකි ගුණාත්මක භාවයෙන් ඉහළ තිබුණ මේ බුද්ධි තොරතුර එහි කඩා වැටීමක් සිද්ධ වෙනවා?

පි : කඩා වැටීමක් සිද්ධ වෙලා තියෙනවා.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>:

ප්‍ර : සාක්ෂිකරු දැන් සාමාන්‍යයෙන් බුද්ධි තොරතුරක වටිනාකම මැනීමේදී ප්‍රශ්න 6 ක් අහනවනේ?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : When, Who... ඒ ටික. දැන් ඔය ප්‍රශ්න 6 ඔය C4A ලේඛනය සම්බන්ධයෙන් යොමු කෙරුවොත් ඒකෙන් කීයකට උත්තර ලැබෙනවද?

පි : Who කියන එක තියෙනවා ස්වාමිණි. How කියන එක තියෙනවා. එතකොට Who, How එතකොට මෙතන When කියන එක පැහැදිලි නැහැ, ඊලඟට අනිත් එක What කියන එක තියෙනවා.

ප්‍ර : Why?

පි : Why ඒ ඔක්කොම තියෙනවා මෙතන

ප්‍ර : How?

පි : ඒකත් තියෙනවා මෙතන Suicide attack.

ප්‍ර : Where?

පි : Where ත් තියෙනවා.

ප්‍ර : එතකොට ප්‍රශ්න 4 ට උත්තර?

පි : ප්‍රශ්න 4 ට උත්තර තියෙනවා. එකකටයි මෙතන උත්තර නැත්තේ. When කියන එකටයි. ඒ When කියන එකට උත්තර නැහැ.

ප්‍ර : ඔය වචනයක් තියෙනවානේ shortly කියලා?

පි : shortly හරි, ඒ shortly කිව්වම එතන වැදගත්කමක් තියෙනවා, මම තොරතුරේ වැදගත්කම බලලා කියන්නේ, එතකොට බුද්ධි නිලධාරියෙක් වශයෙන් මම විශ්ලේෂණය කරන කොට මේ ප්‍රශ්න

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අනිවාර්යයෙන්ම පැන නගිනවා. අපි කියමුකෝ when කියමුකෝ එතකොට when කියන වචනය එනවා. මෙතන shortly කියලා තියෙනවා, එතකොට මේක වෙන්නේ අප්‍රේල්, එතකොට අප්‍රේල් මාසේ කතෝලිකයන්ගේ, ක්‍රිස්තියානි භක්තියන්ගේ විශේෂත්ව අවස්ථාව තමයි මහ සිකුරාදයි, පාස්කු ඉරිදයි. එතකොට බුද්ධි නිලධාරියෙක් වශයෙන් එයාගේ පළපුරුද්ද මත එයාට යම්කිසි අදහසක් නැත්නම් එයාගේ පළපුරුද්දෙන් එයා යම්කිසි නිරීක්ෂණය එයාට අනිවාර්යයෙන් ඔළුවට එන්න ඕනේ. නිශ්චිත තොරතුරු නැත්නම්. එහෙම නැත්නම් එයා source මාර්ගයෙන් ගන්න ඕනේ. නැත්නම් අනිවාර්යයෙන්ම ඒක දෙන්න ඕනේ, ඒ නිරීක්ෂණය දෙන්න ඕනේ. දැන් LTTE ත්‍රස්තවාදී සම්බන්ධයෙන් ඒගොල්ලන්ගේ දින වකවානු තියෙනවා. ඉතින් ඒ බුද්ධි නිලධාරි වශයෙන් ඒ පලපුරුද්ද අපිට තියෙනවා. අපි කියනවා අහවල් දිනේ අහවලාගේ මරණය සමරනවා, අනිවාර්යයෙන්ම මේ බුද්ධි තොරතුර මත මේ කාලේ තමයි මේක මේ ප්‍රහාරය දියත් වීමට බොහෝ සේ ඉඩ තියෙන්නේ. බොහෝ සේ. අපිට නිශ්චිතව කියන්න බැහැ නමුත් බොහෝ සේ. ඉතින් ඒ වගේ නිගමනවලට අනිවාර්යයෙන්ම බුද්ධි නිලධාරීන්ට එන්න වෙනවා. Ground source නැත්නම්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඒ කියන්නේ ඔබ දැන් ලබා දුන් පිළිතුර අනුවත් ඔබ තවමත් ඉන්නවද ඔබේ මතයේ C4A කියන ලේඛනය තොරතුරක් විතරක් කියලා?

පි : ස්වාමිණි මේ alleged කියන වචනය ඇයි මං දන්නේ නැහැ නොදැනුවත්ව පාවිච්චි කළාද, දැනුවත්ව පාවිච්චි කලාද කියලා මම දන්නේ නැහැ, හැබැයි මේ වචනෙන් සම්පූර්ණයෙන්ම මේක දියාරු වෙලා කියන එක තමයි මගේ මතය. නමුත් ඔබ කියන විදියට ඔය කරුණු 6 න් 5 ක්ම තියෙනවා මෙතන. එතකොට ඒ අනුව නිරීක්ෂණය කරන කොට එක අතකින් මේක බුද්ධි තොරතුරක් හැටියට එහෙමත් ගණන් ගන්න පුළුවන්. හැබැයි alleged කියන වචනය පාවිච්චි කලාම ඔක්කොම දියාරු වෙලා යනවා. ඒකයි මෙතන තියෙන ප්‍රශ්නේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය:</u>

FAIR COMMENT BY JEZEEM

President's Secretary's Copy

ප්‍ර : මාසෝ මහත්මයා 6 කින් 5 කට උත්තර ලැබෙනවා නම් ඒක කොහොමද හුදෙක් තොරතුරක් බවට පත් වෙන්නේ?

පි : දැන් මේකේ මම ගන්නේ alleged කියන වචනය තමයි මම ගත්තේ. එතකොට ඔය කියන විදියට 6 න් 5 ක්ම තියෙනවා නම් ඒක අනිවාර්යයෙන්ම බුද්ධි තොරතුරක් විය යුතුයි. අනිවාර්යයෙන්ම විය යුතුයි. නමුත් මේ alleged කියන වචනය පාවිච්චි කිරීමෙන් එතකොට මෙයත් පාවිච්චි කරලා තියෙනවා රාජ්‍ය බුද්ධි සේවයත් පාවිච්චි කරලා තියෙනවා වචනය. මේ CNI ත් පාවිච්චි කරලා තියෙනවා. ජාතික බුද්ධි ප්‍රධානීත් මේක පාවිච්චි කරලා තියෙනවා. එතකොට

ප්‍ර : දැන් මට තියෙනවා ප්‍රශ්න, කියන්නකෝ? ජාතික බුද්ධි ප්‍රධානීත් පාවිච්චි කරලා තියෙනවා, රාජ්‍ය බුද්ධි ප්‍රධානීත් පාවිච්චි කරලා තියෙනවා ඒකනේ මේ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් බලන්න C4A කියන ලේඛනය, C4A ලේඛනයේ පලමුවන ඡේදයේ 3 වන පේලියේ ඉදලා බලන කොට මෙහෙම තියෙනවානේ, It is also revealed that they are planning to target some important churches ඒ කියන්නේ ඔවුන් යම් වැදගත් දේවස්ථානවලට පහර දීම සඳහා ඒවා ඉලක්ක කරගෙන තිබෙන බව අනාවරණය වෙලා තියෙනවා, අනාවරණය වෙලා තියෙනවා කියලා කියන්නේ යම් මූලික කටයුතු සිදු කළාට පස්සේ තමයි අපිට මේ කරුණු එළියට එන්නේ?

පි : පැහැදිලියි.

ප්‍ර : එකඟයි ද?

පි : එකඟයි.

ප්‍ර : ඊලඟට තියෙනවා according to the information, තොරතුරට අනුව Indian High Commission in Sri Lanka is one of the targets. එම ඉලක්කවලින් එකක් තමයි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, ඇයි මෙහෙම කියන්නේ. Among the planned attack and reconnaissance have already been conducted. Reconnaissance කියන්නේ මොකක්ද?

පි : Reconnaissance කියන්නේ ඒ සම්බන්ධයෙන් ඔත්තු බැලීම, තොරතුරු බැලීම.

ප්‍ර : ඉතින් එතකොට ඔත්තු බලලා තොරතුරු බලලා ඔවුන් විසින් සොයාගෙන තියෙනවා නම් ඒ ලැබුණු තොරතුර අනුව ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය එසේ ප්‍රහාරයට ලක් වීමට ඉලක්ක වන එක් ස්ථානයක් කියලා, එතන ස්ථිර බවක් නැද්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : තියෙනවා ස්ථිර බවක්.

ප්‍ර : ස්ථිර බවක් තියෙනවා, නමුත් අර ඒ වගේම බලන්න පලමුවන ඒ ඡේදය ආරම්භ කරන විදිය, information receive by the state intelligence service reveals that Sri Lanka based Zaharan Hasheem of National Thowheed Jamath and his associates are planning to carry out a suicide terrorist attack in Sri Lanka shortly. ඉතින් C4B එකේ තියෙන කරුණු මෙහි නැවත ඇතුලත් කරලා තියෙනවා. එතකොට alleged කියන වචනය ඔබ කියනවා නම් C4B එකේ තියෙන කරුණු බුද්ධි තොරතුරක් කියලා, එයම අන්තර්ගත කරලා තියෙනවා නම් C4A ලේඛනයේ මාතෘකාවේ alleged කියන වචනය දාපු පළියට ඒක කොහොමද හුදෙක් තොරතුරක් වෙන්නේ මාසෝ මහත්තයා? මට නම් තේරෙන්නේ නැහැ?

පි : දැන් මේ alleged කියන වචනය අනිවාර්යයෙන්ම මේ තොරතුර සම්පුර්ණයෙන්ම මේ තොරතුර අඩාල කර තියෙනවා. අඩාල කරලා කියන්නේ දියාරු කර තියෙනවා. දැන් ඔබ කියන දේ පැහැදිලියි මට 100% ම පැහැදිලියි. ඒකේ තර්කයක් නැහැ. නමුත් ඔබ කියන විදියට මේ කරුණු 6 න් 5 ක්ම සනාථ වෙලා තියෙනවා. ඒකත් පැහැදිලියි. නමුත් ඒ විශ්වාසවන්ත භාවය සම්පුර්ණයෙන්ම බිඳලා තියෙනවා මේ alleged කියන වචනය පාවිච්චි කරලා. ඒකයි මම කියන්නේ.

ප්‍ර : ඔබ එතනින් දශමයක්වත් එහාට වෙන්න කැමති නැහැ,?

පි : නැහැ මම එහාට වෙන්න කැමති නැහැ alleged කියන වචනය පාවිච්චි කරලා තියෙනවා. දැන් ඔබ කියන එක හරි කරුණු 6 න් 5 ක්ම හරි. සමහර බුද්ධි නිලධාරීන් සමහර විට වෙන මතයක් දරයි. මම දරන මතය

ප්‍ර : ඔබේ මතය වෙන්නේ?

පි : මේ alleged කියන වචනය පාවිච්චි කිරීමම තමයි දැන් ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. ඒ වගේ අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවයත් එයත් පාවිච්චි කරලා තියෙනවා ඒ වචනය එයා හුහක් දියාරු කර තියෙනවා. දැන් මේකේ බලන කොට දියාරු කිරීම අඩුයි. අරකේ දියාරු කිරීම වැඩියි. අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාවේ දියාරු කිරීම වැඩියි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවෙන් ඒක දියාරු කරනවා වැඩියි? ඒ කියන්නේ ඔබ කියන්නේ C4C ලේඛනයේ දියාරු වීම අතිශ්‍යයින්ම ප්‍රබලයි කියලා.

පි : අතිශ්‍යයින්ම ප්‍රබලයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් එහෙම කිරීම සුදුසු ද, අධ්‍යක්ෂකවරයෙකුට රාජ්‍ය බුද්ධි සේවයේ?

පි : ඔව් ස්වාමිණි ඒක මම කිව්වේ මේක හරියට විශ්ලේෂණය කරන්න ඕනේ. Critical Analysis අපි කියන්නේ. කවදාවත් බුද්ධි තොරතුර මේවා වෙන්නේ නැහැ, මේකට දැඩි වටිනාකමක් දෙන්න තිබ්බා. ඒ කියන්නේ අපි ගාව තිබ්බා තොරතුරු. අපි විශ්ලේෂණයට භාවිතා කලේ නැහැ. පුර්ව සිද්ධීන් තිබ්බා. ඒවා අපි හරි විශ්ලේෂණයට භාජනය කලේ නැහැ. එතකොට විදේශිය ඔත්තු සේවයේ නම් ටිකක් තිබ්බා. ඒ නම් ටික යම්කිසි සිද්ධියක ඒ නම් ටික එළියට ආවා. ඉතින් ඒකයි මම කියන්නේ ඇයි මේවා කරේ නැත්තේ.

ප්‍ර : දැන් අපිට මෙහෙම කියන්න පුළුවන්ද කෙනෙක්ට තර්ක කරන්න පුළුවන්ද අධ්‍යක්ෂකවරයා කියලා කියන්නේ ඉතාමත් රාජකාරී බහුල මේ හැම දෙයක් ගැනම වෙන වෙනම බලන්න බැරි තමන්ගේ යටතේ ඉන්න නිලධාරීන් කෙරෙහි විශ්වාසය තියලා ඔවුන් දෙන දේ බාහිරට නිකුත් කරන කෙනෙක් කියලා. එහෙම කිව්වොත් එහෙම තර්ක කලොත් කෙනෙක් රාජ්‍ය බුද්ධි සේවාවේ අවුරුදු 14 ක අත්දැකීම් අනුව ඔබ එයට එකඟ වෙනවද එම තර්කය සඳහා?

පි : එකඟ වෙන්නේ නැහැ.

ප්‍ර : ඇයි ඔබ එකඟ වෙන්නේ නැත්තේ, මොනවද හේතු?

පි : ඇත්ත වශයෙන්ම මේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකට වගකීම් සම්භාරයක් තියෙනවා. නමුත් එයා යටතේ ඉන්න අතිරේක අධ්‍යක්ෂක නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් ඇත්ත වශයෙන්ම ඒගොල්ලන්ගෙන් පෙරිලා තමයි මේක එන්න ඕන. ඒගොල්ලන්ගෙන් පෙරිලා ඇවිල්ලා ඉතින් ඒ තොරතුරු තමයි රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකට දෙන්නේ. ඉතින් රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක බලනවා මේ බුද්ධි තොරතුරු බලලා එයාගේ දැනුමේ හැටියට විශ්ලේෂණය කරලා එයාට යම්කිසි අපැහැදිලිතාවයක් තියෙනවා නම් ඒ කට්ටිය ගෙන්නලා තව සාකච්ඡා කරලා මේක ප්‍රගුණ කරන්න ඕනද නැද්ද කියා. ඇයි මේක ජාතික ආරක්ෂාවට වැදගත් තොරතුරක් මේක. නිකම් තොරතුරක් නෙමෙයි. ඉතින් ඒක එයා සිද්ධ කරන්න ඕනේ.

ප්‍ර : ඒ කියන්නේ, ඔබ කියන්නේ තමන්ගේ කනිෂ්ඨ නිලධාරියෙක් පවරලා තියෙන රාජකාරිය අනුව පිළියෙල කරගෙන එන ලේඛනයට ඇස් දෙක වහගෙන අත්සන් කරන්න ඔහුට බැහැ, ඔහු එය කියවලා බලලා අන්තර්ගතය ගැන සෑහීමට පත් වෙලා අවබෝධයෙන් තමයි ඒ අත්සන තියන්නට ඕන?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : ඒ අත්සන තියන්න ඉස්සෙල්ලා ඔබ කියනවා ක්‍රමවේදයක් ඒ තමයි අවශ්‍ය නම් ඔහු ඒක කියවලා බලලා තේරුම් අරගෙන නිලධාරීන් කැඳවලා ඔවුන් සමඟ සාකච්ඡා කරලා සෑහීමකට පත් වුණාට පස්සේ තමයි මෙය අත්සන් කරලා නිකුත් කරන්න පුළුවන්.

පි : අනිවාර්යයෙන්ම.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතිමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ කිව්වා C4C දරන ලේඛනයේ අවසාන වාක්‍ය හින්දා එය දියාරු කිරීමක් වෙලා තියෙනවා කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ මේ පිළිබඳ පරීක්ෂණ පවත්වමින් තිබෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : මෙම කොමිෂන් සභාව ඉදිරියේදිත් තවත් රාජ්‍ය බුද්ධි සේවයේ පිළිබඳ දැනුමක් ඇති යම් සාක්ෂිකරුවකු ප්‍රකාශ කර සිටියා ඔය අවසාන සටහන පරීක්ෂණ පවත්වමින් තිබෙනවා කියන එක සාමාන්‍යයෙන් වාර්තාවල අඩංගු කරන දෙයක් කියලා?

පි : ඔව් එහෙම අඩංගු කරනවා හුඟක් වෙලාවට.

ප්‍ර : ඒක එහෙම සාමාන්‍යයෙන් අඩංගු කරනවා, එතකොට ඒ අඩංගු කරන්නේ අනෙක් රාජ්‍ය බුද්ධි සේවයෙන් යවන වෙනත් බුද්ධි තොරතුරුවලත් ඔය වාක්‍යයම තියෙනවා?

පි : අනිවාර්යයෙන් තියෙනවා. හුඟක් අවස්ථාවල තියෙනවා.

ප්‍ර : ඒ කෝනයෙන් බැලුවාම, ඒ සම්ප්‍රදායෙන් බැලුවාම එය වාක්‍ය C4C ලේඛණයේ අඩංගු කල පමණින් ඒ බුද්ධි තොරතුරේ දියාරු වීමක් තිබෙනවද?

පි : අනිවාර්යයෙන්ම. එතකොටත් දියාරු වීමක් තිබෙනවා. තවදුර පරීක්ෂණ පවත්වනවා කියන්නේ තොරතුරේ නිශ්චිත භාවයක් තාම හරියට කියන්නේ නැහැනේ එතකොට.

ප්‍ර : අර සම්ප්‍රදායක් තිබ්බත් හැම එකේම වගේ දානවා?

පි : සම්ප්‍රදායක් තිබ්බ පලියට දාන්නේ නැහැ, ඇත්ත වශයෙන් විමර්ශනය කළයුතුයි කියලනේ කියන්නේ. එතකොට අනිවාර්යයෙන්ම විමර්ශනය කරලා තවත් එකතු කරන්න වෙනවා ඉදිරියට. එකතු කිරීමක් සිද්ධ කරන්න වෙනවා.

ප්‍ර : දැන් අපි හිතමු මෙහෙම දැන් ඔය තොරතුර රාජ්‍ය ආරක්ෂාවට ඉතාමත් වැදගත් ඉක්මණින්ම ක්‍රියා කලයුතු තොරතුරක්,

පි : එහෙමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒක හින්දා ලැබුණු ගමන්ම අවශ්‍ය කරන්න පුළුවන් විශ්ලේෂණය කරලා ඒ වෙලාවේම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය හැකි ආයතනවලට යවනවා.

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඕක ඉතාමත් ඉක්මණින් ක්‍රියාත්මක කරන්න ඕන, ඒක යවන ගමන් තවදුරටත් එම තොරතුරේ නිශ්චිත භාවය දැන ගැනීම සඳහා ඔය විදියට තවත් පරීක්ෂණ කරනවා?

පි : කරනවා.

ප්‍ර : එතකොට ඒකෙන් ඔය තොරතුර දියාරු වීමක් වෙනවද?

පි : ඔව් ඒකෙන් තොරතුරු දියාරු වෙනවා කියන්නේ මේක තාමත් පරීක්ෂණ පවත්වනවා, තවදුරටත් මේකේ ඒ කියන්නේ තොරතුර තවදුරටත් පරීක්ෂණ වෙමින් පවතිනවා කියන්නේ ස්වාමිණි මේ තොරතුර සම්පූර්ණ තොරතුරක් නොවෙයි කියන අදහසනේ ඒකේ තියෙන්නේ. එතකොට තවදුරටත් මේක හොයලා තොරතුරු තවදුරටත් මේකට එකතු කරන්න ඕන කියන අදහස තමයි තියෙන්නේ.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ දීර්ඝ කාලීන අත්දැකීම් තිබෙන රාජ්‍ය බුද්ධි නිලධාරියෙක්. මම ඔබගෙන් මෙම ප්‍රශ්නය අසන්නේ දැන් ඔබ මේ සඳහන් කරන C4C කියන ලේඛනයේ අවසාන ඡේදයට පෙර ඡේදයේ කියනවා සහරාන් යන අය සමාජ ජාලා ගිණුම් ඔස්සේ සිය අනුගාමිකයින් අභිප්‍රේරණය කිරීමේදි මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාල ඉලක්ක කර ගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කල බවට මේ වන තෙක් නිරීක්ෂණය වී නොමැති නමුත් සියළු අන්‍යාගමිකයන් ඝාතනය කිරීම උතුම් ආගමික කරුණක් බවත් අන්‍යාගමිකයන් විනාශ කරමින් ඉස්ලාමය ප්‍රවර්ධනය කලයුතු බවටත් සඳහන් කරමින් 2016 වර්ෂයේ සිටි සිය සමාජ ජාලා සහ ආගමික දේශන හරහා අනුගාමිකයින් අභිප්‍රේරණය කරනවා නිරීක්ෂණය වී ඇත. ඔබට බුද්ධි අධ්‍යක්ෂකවරයෙක් ලෙසත් සේවය කරලා අවුරුදු 15 ක් වගේ දීර්ඝ කාලයක් බුද්ධි අංශයක රාජකාරී කරලා මේ ඡේදයෙන් කියන්නේ ඇත්ත කියලා අවබෝධ කර ගන්න ඇයි බැරි, මේ ඡේදෙන් කියන්නේ අර බුද්ධි තොරතුර C4B කියන එකේ තොරතුරු dilute කිරීම සඳහා හිතාමතාම කරන ලද කිසිම දෙයක් නෙමෙයි මේකේ තියෙන්නේ මේ ඇත්ත තොරතුරක් 2016 වර්ෂයේ සිට මෙම බුද්ධි SIS Director ලඟ තියෙන

FAIR COMMENT BY JEZEEM

තොරතුරුවලින් ඔහුට පේන්නේ නැහැ මේ ඉන්දියාවේ intelligence service එකක් කියන තොරතුරු පිළිබඳව වාර්තාවීමක් ඔහුට වෙන්නේ නැහැ, ඔහුට වාර්තා වෙන තොරතුරු අනුව තමයි ඔහු මේ ජේදයෙන් කියන්නේ සත්‍යම දේ කියලා ඔබ හිතන්නේ නැත්තේ ඇයි? ඔහු කියන්නේ ඔහුට තිබෙන තොරතුරු අනුව, ඔහුට ඉන්දියාවේ තොරතුරුවලින් ආවට ඔහු කියන්නේ ලංකාවේ ඔහුගේ අංශය කරන ලද දේවල්වලින් 2016 වර්ෂයේ ඉදලම මේ සහරාන් ලා මේවා මේවා කියනවා, හැබැයි සහරාන්ලා ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට හෝ කතෝලික පල්ලිවලට ගහන බවක් කොහේවත් කියලා නැහැ ඒකයි මම අහන්නේ ඔබගෙන් ඒ ප්‍රශ්නය?

පි : පැහැදිලියි, බොහොම පැහැදිලියි. දැන් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය මේ නිරීක්ෂණය දාන්නේ එයාගේ පදනම් වෙච්ච තොරතුරු මත. එයාගේ පදනම් වෙච්ච තොරතුරු මත තමයි එයා මේ නිරීක්ෂණය දාන්නේ. එතකොට ඒ හා සමානව සමගාමීව එයා විදේශ බුද්ධි සේවයෙන් ආපු තොරතුරු සම්බන්ධයෙන් හරි හැටි විශ්ලේෂණයක් නොකර තමයි මේක දාලා තියෙන්නේ. විශ්ලේෂණය නොකර. එතකොට හරිහැටි විශ්ලේෂණයක් කලා නම් කවදාවත් ඔය කියන නිරීක්ෂණය එයාට දාන්න බැහැ.

ප්‍ර : නැහැ, නැහැ ඔබ නැවතත් අර පරණ තැනට යනවා, එයා විශ්ලේෂණය කරනවා කියන එක හොඳට පේනවා මේ පිටු 2 ක C4C කියන ලේඛනයෙන්. එයා ඒ බුද්ධි තොරතුරු විශ්ලේෂණය කරනවානේ, මොකද විදේශීය බුද්ධි අංශයකින් එන C4B කියන එකේ තියෙන තොරතුරුවලට අදාලව තමයි ඔහු දේශීය බුද්ධි තොරතුරු ආශ්‍රිතව තමයි ඔහුගේ විශ්ලේෂණය කරන්නේ. එහෙමනේ ඔබත් පැහැදිලි කලේ, දැන් දේශීය තොරතුරු ආශ්‍රිතවයි මේ බුද්ධි විශ්ලේෂණය කරන්නේ කියාල, ඕන නම් විදේශීය රාජ්‍යයෙනුත් තවදුරටත් තොරතුරු අහන්න පුළුවන්, නමුත් ඔහු මේ C4C එකේ පිටු 2 ක දීර්ඝ එකකින් කරන්නේ ඔහු දේශීය මේ අපේ බිමේ තිබෙන බුද්ධි තොරතුරු අධ්‍යයනය කරලා තමයි ඔහු මේ රිපෝට් එක දාන්නේ. එතකොට ඒ රිපෝට් එකේ ඔහු ඇත්ත වශයෙන්ම කියන්නේ 2016 වර්ෂයේ ඉදලා සහරාන් කියන පුද්ගලයා කරලා තියෙන දේවල්වල ඔහුගේ නිරීක්ෂණය, හැබැයි ඇත් වශයෙන්ම බැලුවොත් ඔහුට හම්බ වෙලා නැහැ සහරාන් මේ කතෝලික පල්ලි සහ ඉන්දියානු මහකොමසාරිස් වලට ගහනවයි කියන එක. ඉතින් එහෙම එකක් දේශියව නැතුව එතුමාට කියන්න පුළුවන්ද ගහනවයි කියලා මට හම්බ වුණා කියලා එකක්?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිණි දැන් මේකෙන් හොඳට පැහැදිලි වෙන්නේ මේගොල්ලෝ මේ තොරතුරු පදනම් කරගෙන තියෙන්නේ සමාජ ජාලය මත පමණයි. භූමියට ගිහිල්ලා නැහැ. ඕක තමයි ඕකෙන් ගම්‍ය වෙන්නේ.

ප්‍ර : එහෙම ඔබට කියන්න පුළුවන්ද?

පි : පුළුවන් කියන්න, තොරතුරු සමාජ ජාලෙන් විතරක් තොරතුරු හොයන බුද්ධි අංශයක් ලෝකේ කොහේවත් නැහැ. අනිවාර්යයෙන්ම භූමියේ වැඩ කරන කට්ටිය ඉන්න ඕනේ. ඒගොල්ලන්ට තොරතුරු හම්බ වෙන්න ඕනේ. ඒගොල්ලෝ තොරතුරු ගේන්න ඕනේ. එතකොට මේ කියන විදියට සමාජ ජාලයෙන් පමණයි ඔය නිරික්ෂණය කරලා තියෙන්නේ. නමුත් භූමියෙන් නෙමෙයි. මට මේ නිරික්ෂණයෙන් පේන්නේ එච්චරයි.

ප්‍ර : සමාජ ජාල සහ ආගමික දේශන හරහා කිව්වාම? ආගමික දේශන සහරාන් කරලා තියෙනවා කාත්තන්කුඩි ප්‍රදේශයේ 2014, 15 වර්ෂවල ඉදලාම මහජනතාව රැස්කරලා මේ අන්තවාදී ආගමික දේශන කරලා තියෙනවා, එතකොට SIS එකේ Director ගේ අර ඔබත් සඳහන් කල ප්‍රාදේශිය මට්ටමින් ඉන්න බුද්ධි තොරතුරු රැස් කරන අය එතුමාට තොරතුරු එවලා තියෙනවාද කියලා කෙනෙකුට කියන්න පුළුවන්නේ, ඔබ කියනවා නැහැ, නැහැ ඉන්ටනෙට් එකෙන් ගිහිල්ලා තමයි මේ රිපෝට් එක හදන්නේ කියලා, නමුත් තවත් කෙනෙකුට කියන්න පුළුවන් නැහැ මගේ ලඟ තොරතුරු තිබුණා බුද්ධි නිලධාරින් එවපු ඊට අමතරව අන්තර්ජාලය හරහාත් ගිහිල්ලා තොරතුරු හොයාගෙන තමයි මේක ලියලා තියෙන්නේ කියලා, ඒකට ඔබ මොකක්ද කියන්නේ?

පි : සමහරවිට ඒ භූමිවලින් ඔය තොරතුරු හම්බ වෙලා ඇති. මත වාදය පතුරන එක, ආගම ගැන කියන එක, ඒවා තොරතුරු හම්බ වෙලා ඇති. නමුත් මේ සන්නද්ධතාවය, මේ කඳවුරු පවත්වාගෙන යාම එතකොට ප්‍රහාරයක් දියත් කිරීම ඒ සම්බන්ධයෙන් තොරතුරු නැහැනේ. දැන් ඔය මට මතකයි මම SIS එකේ ඉන්න කාලේ ඕවගේ සෑහෙන තොරතුරු මම දීලා තියෙනවා. අහවල් තැන දේශන පැවැත්තුවා, අහවල් තැන ආගම් ප්‍රචලිත කළා, ඒවා තියෙනවා. ඒ ඇවිල්ලා මතවාදය ප්‍රචලිත කරන එකක් ඒක. දැන් මේක ඇවිල්ලා ඒක නෙමෙයි ඒකෙන් එහාට ගියපු එකක්, මේක සන්නද්ධ වෙච්ච එකක්, සන්නද්ධ වන එකක්, එතකොට ආයුධ එකතු කරන එකක්, කෑම්ප් පවත්වගෙන යන එකක්. ඒ හින්දයි මම කියන්නේ ඒ ඇවිල්ලා hard intelligence.

ප්‍ර : ඒ වගේම මම අහන්න කැමතියි දැන් සමාජ ජාලා ගිණුමක් ඔස්සේ සහරාන් කියනවාද කිසිම අවස්ථාවක මම සහ මගේ කණ්ඩායම

Proceedings Copy
LAW COMMENT BY JEZEEM

කතෝලික පල්ලි සහ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල කරන්න සුදානම් වෙනවා කියලා, සමාජ ජාලා වෙබ් අඩවියකින්. ඔබ ඉතාම අවධානයෙන් කල්පනා කරන්න Indian Intelligence එක සමාජ ජාලා වෙබ් අඩවියකට ගිහිල්ලද මේ තොරතුරු ලංකාවට එවලා තියෙන්නේ? එහෙම නැත්නම් ඔබ දන්නවා හොඳටම මේගොල්ලෝ කොහොමද මේ තොරතුරු හොයා ගත්තේ කියලා, එතකොට ඒ දෙක සසඳන්න බලන්න ඔබ? ඉන්දියානු Intelligence එවපු තොරතුර සමාජ ජාලා තොරතුරක් නෙමෙයි කියලා ඔබ කියනවානේ?

පි : අනිවාර්යයෙන්ම

ප්‍ර : මේකේ ඔබ නිරන්තරයෙන්ම තර්ක කරනවා මේ සමාජ ජාලාවලට ගිහිං තමයි තොරතුරු හොයන්නේ කියලා, නමුත් සහරාන් කිසියම් අවස්ථාවකදි සමාජ ජාලා එකකට ගිහිල්ලා කියයිද මම ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට කතොලික පල්ලිවලට ගහනවයි කියලා, ඔබ ඒ ගැන මොකද කියන්නේ?

පි : ස්වාමිණි මේක මූලිකවම මේ තොරතුරු ඔක්කොම අනාවරණය වුනේ 1918 සැප්තැම්බර් මාසේ 1 වෙනිදා අර 5 දෙනෙක් අත්අඩංගුවට ගත්ත එකෙන්. දීර්ඝ කාලීනව කරපු විමර්ශනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ ඔක්කොම හොයා ගත්තේ. එතකොට ඒ ඔක්කොම හොයා ගත්තායින් පස්සේ සාමාන්‍යයෙන් විමර්ශන අංශයක් කරන්නේ එයාගේ Facebook එකට යනවා, එයාගේ හැම ගිණුමකටම යනවා, තවත් තොරතුරු හොයා ගන්නවා. වටිනා කමක් දෙන්න. අන්න ඒ විදියට තමයි තොරතුරු ඇවිල්ලා තියෙන්නේ. එතකොට NIA එකට තිබුණා National Investigation Agency එකට තිබුණා ප්‍රශ්න කරලා මේ තොරතුරු දැන ගන්න. ඊට පස්සේ සමාජ ජාලා වෙබ් අඩවියට දුන්නා මේ සම්බන්ධයෙන් ඒගොල්ලෝ තමිල්නාඩුවේ ප්‍රාන්ත 20 ක විතර Raid කරලා තියෙනවා CD ස් අරන් තියෙනවා ඒවා සමාජ ජාලාවලට ගිහිල්ලා තියෙනවා ඒවා raid කරලා තියෙනවා. ඒවත් විශ්ලේෂනය කරලා ඇති. මේ තොරතුරු එන්නේ පොඩ්ඩයි, නමුත් විශාල වැඩ කොටසක් කරලා සංක්ෂිප්ත කරලා තමයි මේ වාර්තාව එන්නේ.

ප්‍ර : ඔබගෙන් මම අන්තිම ප්‍රශ්නේ අහන්නම් මේ alleged කියන වචනය දැන් මේක ලියුමක තියෙන දෙයක් පොඩි කෙනෙකුට කියන්න පුළුවන්, ඔබ නෙමෙයි ඔබ බුද්ධි නිලධාරියෙක් නිසා ද දන්නේ නැහැ මේ වචනය පිළිබඳව මෙතරම් අර්ථ කථනයක යෙදෙන්නේ, මේ alleged කියන එක අර බුද්ධි තොරතුරක

FAIR COMMENT BY JEZEEM

තියෙන්න ඕන W 6 ම තියෙනවා වගේනේ මේකේ තියෙන්නේ W 6 ම මේකේ තියෙනවා කියලා තමයි ඔබත් මම හිතන්නේ පිළි ගන්නේ, මේ alleged කියන වචනයක් නිසා මේක සමහර විට typing errors එකක් වෙන්න පුළුවන්, Human errors කියලා එකකුත් වෙන්න පුළුවන්නේ, Human errors ඒවා තියෙනවා කියලා ඔබට බුද්ධි ප්‍රධානියෙක් ලෙස ඔබට අත්දැකීමක් නැද්ද, ඕනම බුද්ධි තොරතුරක Human errors තියෙන්න පුළුවන්. එතකොට බුද්ධි ප්‍රධානියෙක් හෝ පොලිස්පතිවරයා හෝ කවුරු හෝ ආරක්ෂක ලේකම් හෝ මේ Human errors එක ගැනම වැඩි අවධානයක් යොමු කරමින් අනික් වැදගත් තොරතුරු පසෙකලා කටයුතු කිරීමෙන් බුද්ධිමය කාර්ය භාරයක් සිද්ධ වෙනවද කොහේ හෝ රටක මේවා ?

පි : ඔය alleged වචනය තමයි ස්වාමිණි ඔබ කියන්නේ. ඔය alleged වචනය මම දන්නේ නැහැ ජාතික බුද්ධි ප්‍රධානී අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙන නිරීක්ෂණය අනුව ඒක පාවිච්චි කළාද එහෙම නැත්නම් ඒක එයාට සාමාන්‍යයෙන් ඔබ කිව්ව ආකාරයට හුදෙක් එයාගේ අත්වැරදීමකින් ඒක වුණාද කියලා මම දන්නේ නැහැ. ඒ වචනය මෙතන කොහොමද පාදක වුණාද කියලා මම දන්නේ නැහැ. දැන් ඔය කියන විදියට Human Errors තියෙන්න පුළුවන්. නමුත් ප්‍රශ්නෙ තියෙන්නේ මෙතන අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයේ ඒ සම්බන්ධයෙන් හරියට නිශ්චිතව ඒක සඳහන් කරලා නැහැ, ඒ උඩ මෙයා මේක ලිව්වද දන්නේ නැහැ. ඒක මට හරියට කියන්න බැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු මගේ උගත් කොමසාරිස්වරිය අහපු ප්‍රශ්නයට පැහැදිලි කර ගැනීමට මම අහන්නේ ඔබගෙන් අහපු ප්‍රශ්නෙට ඔබ කිව්වා C4A, B සහ C දරන ලේඛන වල field එකට ගිහිල්ලා ගත්තු තොරතුරු නැහැයි කියන එක.

පි : ඒක හොඳට පැහැදිලි වෙනවා.

ප්‍ර : එයින් ඔබ අදහස් කලේ ඔබ සාක්ෂි ලබා දීමේදී ඉස්සෙල්ලාම කිව්වානේ Information එක සංවෘත සහ විවෘත source 2 ක් තියෙනවා කියලා, එතකොට ඔබ අර වෙබ් එකෙන් ගන්න එක විවෘත source එකක්? ඔබ අර field එකට ගිහිල්ලා ගත්තේ නැහැ කියන එකෙන් අදහස් කරන්නේ අර සංවෘත source එකෙන් ගත්තේ නැහැ කියන එකද?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔබ එයින් අදහස් කෙරුවද ඔබගේ ලකුණු කරපු ඔබේ Intelligence Analysis Report එකෙත් තියෙනවා ඔය C4A, B සහ C දරන ලේඛනවලින් එකක හරි වනාතවිල්ලුව අවි ගබඩාවෙන් සොයා ගත්තු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් සඳහනක් කිරීමක් කෙරුවා නම් අර සංවෘත source එකකට ගිහිල්ලා ඒ කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නැත්නම් TID එකට ගිහිල්ලා ඒ තොරතුරු අරගෙන ඔතන දැම්මා නම් එතකොට ඔය බුද්ධි තොරතුරේ වටිනාකම ඉහළ යනවා කියන එකද ඔබ අදහස් කරන්නේ?

පි : අනිවාර්යයෙන්ම.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඒ වගේම ඔබට මතකයක් තියෙනවද ඔය වනාතවිල්ලුව ප්‍රදේශයේ තිබිලා අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමට ආධාර කරපු කබීර් හෂීම් මහත්මයාගේ ලේකම් වරයෙක් වන තස්ලිම් යන අයගේ මරණය සිදු කරන්නට යම් උත්සාහයක් දරලා තිබුණා කියලා?

පි : මම ඒක විවෘත ආරංචි මගින් දැක්කා. මම ඒක TV එකෙන් දැක්කා.

ප්‍ර : එතකොට ඔබට අවබෝධයක් තිබුණාද කා විසින් ද මේ ප්‍රයත්නය දරලා තියෙන්නේ කියලා?

පි : ඔව් මේ සිද්ධින් ඔක්කොම සහභාගි වෙලා මේක සහරාන්ගේ අනුගාමිකයන් විසින් කරන ලද්දක් බව නිසැකයෙන්ම පැහැදිලි වෙනවා.

ප්‍ර : ඒ ප්‍රයත්නය පිළිබඳවත් 2019.04.09 දරන ඒ කියන්නේ X94 එහෙම නැත්නම් C4C කියන ලේඛනයේ සඳහන් වෙලා නෑ නේද?

පි : ඒක සඳහන් වෙලා නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදි මෙම සාක්ෂිකරුගෙන් වැඩිදුර සාක්ෂි ලබා ගැනීම ජූලි මස 03 වෙනි දින සිකුරාදා ප.ව. 12 පසු වී විනාඩි 30 ට කල් තබනවා. අද දින කොමිෂන් සභාවේ කටයුතු මෙයින් නතර කරන අතර හෙට පස්වරු 12 පසු වී විනාඩි 30 ට නැවත කොමිෂන් සභාව රැස්වෙනවා.

FAIR COMMENT BY JEZEEM

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය කියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය 2020-0630 වේලාව- ප.ව. 1.30
සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -
01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය සාමාජික

පෙනි සිටීම
අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිශානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසිමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - ලුවිස් ෆොන්සේකා ආරච්චිගේ රොහාන් ජයම්පති සිල්වා
වයස - අවු - 59 .
ආගම - සිංහල/ බෞද්ධ
තනතුර .- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත බාරව .
ප්‍රතිඥා දෙයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර ඔබ දැනට වැදගත් පළාතක දකුණු දිසාව බාර ජ්‍යෙෂ්ඨ නියේජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කරන බව කියා සිටිනවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබගේ කාර්යාලය පිහිටා තිබෙන්නේ කොහේද ?

උ මාතර නුපේ.

ප්‍ර දැන් ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේද ?

උ 1982 ජුලි මාසේ 26 වෙනිදා මං ආධුනික උප පොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් සේවයට බැඳෙනවා.

ප්‍ර නැවත කියන්න ඒ වර්ෂය?

උ 1982 ජුලි මාසේ 26 වෙනිදා.

ප්‍ර july?

උ july

ප්‍ර ඔබ ආධුනික උපපොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වෙලා යම් අවස්ථාවකදී පොලිස් සාමාන්‍ය සේවයෙන් කිසියම් හෝ විශේෂ අංශයකට සම්බන්ධ වුනාද ?

උ ඔව්.

ප්‍ර මොකක්ද ඒ ?

උ 1984 වර්ෂයේදී මං පොලිස් විශේෂ කාර්ය බලකායේ ප්‍රථම කණ්ඩායමේ සාමාජිකයෙකු හැටියට සේවයට එක්වුනා.

ප්‍ර නැවත කියන්න කරුණාකරලා ?

උ 1984 වරෂයේදී මමපොලිස් විශේෂ කාර්ය බලකාය ආරම්භක සාමාජිකයෙක් හැටියට සේවයට එක්වුනා.

ප්‍ර ඔබ එසේ පුහුණුවකුත් ලැබුවාද ඒ අනුව ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කොපමණ කාලයක්ද ?

උ අපි මාස 6 ක පමණ කාලයක් .ඒකියන්නේ මාස 3 ක පමණ කාලයක් මූලික පුහුණුව ලැබුවා. විදේශීය පුහුණු කරුවන් අතින් . ඊට පස්සේ තවත් මාස 3 ක කාලයක් පුහුණු උපදේශකවරයෙක් වශයෙන් මෙම පුහුණු කදවුරේම දෙවන කණ්ඩායම පුහුණු කරමින් සහ පුහුණු වෙමින් සිටියා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඉන් අනතුරුව ඔබ පුහුණු වීමෙන් පසුව ඔබ කිසියම් ස්ථානයකට සම්බන්ධ වුනාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කොහාටද ඒ ?

උ 1984 ම ඔක්තෝබර් මාසේ මඩකලපුවප්‍ර දේශයේ කල්ලඩි කියන කදවුර එවකට හමුදා පාලනය යටතේ තමයි නැගෙනහිර පළාත තිබුනේ .විශේෂ කාර්ය බලකායෙන් මුල්ම වතාවට 1984 වර්ෂයේ ඔක්තෝබර් 04 වෙනිදා කල්ලඩි හමුදා කදවුර බාරගත්තා. ඒ හමුදා කදවුර බාරගැනීමේ පුරෝගිමී නිළධාරියෙක් හැටියට මම කල්ලඩි කදවුරට සේවයටගියා.

ප්‍ර ඔබ එස්. ටී.එෆ්. ඒ කියන්නේ විශේෂ කාර්ය බලකායේ කොපමන කාලයක් සේවය කලාද ?

උ වර්ෂ අටක කාලයක් සේවය කලා.

ප්‍ර වර්ස අටක කාලය

උ එහෙමයි.

ප්‍ර එම කාල සීමාව තුල ඔබ ක්‍රියාන්විත මෙහෙයුම් රාජකාරී කටයුතු සිදු කළාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබට කෙටියෙන් කියන්න පුළුවන්ද ඒ කොයි වගේ ප්‍රදේශවලද කියලා?

උ නැගෙනහිර පලාතේ මඩකලපුව ප්‍රදේශයේ එවකට මම 87 අතිගරු ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ආරක්ෂක සේවයට පැමිණියා. ඒ 1984 සිට 87 දක්වා තිබිච්ච ප්‍රධාන මෙහෙයුම් සියල්ල්ටම මම සහභාගි වුනා. එවකට1986 වර්ෂයේ ඉන්දියාවේ ඉඳන් ආපු අවි ආයුධ තොගයක් අල්ලා ගැනිම ඇතුලු ඒ කියන්නේ ප්‍රධානම දැනට එවකට විශේෂ කාර්ය බලකායෙන් අත් අඩංගුවට ගත්ත ප්‍රධානම අවි ආයුධ තොගය ඒකයි ඒ මෙහෙයුමත් මගේ නායකත්වය යටතේ තමයි සිදුවුනේ.

ප්‍ර ඔබේ නායකත්වය යටතේ?

උ එහෙමයි.

ප්‍ර දැන් ඔබ කියා සිටියා 1987 ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ආරක්ෂක රාජකාරියට සම්බන්ධ වුනා කියලා.?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කෙටියෙන් කොහොමද ඔබ සම්බන්ධ වුනේ ?

උ 1987 අවුරුද්දේදී පාර්ලමේන්තුවේදී එවකට ජනාධිපති තුමාට අත්බෝම්බ ප්‍රහාරයක් එල්ල වුනා . ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් අතින්. එම ප්‍රහාරයෙන් පස්සේ එතුමා ගේ ආරක්ෂක රාජකාරි සම්බන්ධයෙන් මතුවෙච්ච ප්‍රශ්ණ සහගත තත්වයන් යටතේ අප විශේෂ පුහුණුවක් ලබා ගෙන හිටිය කණ්ඩායමක් හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාවට නැවතත් ලොකු ආරක්ෂක පුහුණුවක් ලබලා දීලා 1987 වර්ෂයේ මාව එවකට පොලිස් පරික්ෂක වරයෙක්

Presidential Secretary's Copy
LEAK COMMENT BY JEZEEM

අප ඇතුළු මා ඇතුළු කුඩා කණ්ඩායමක් එතුමාගේ ආරක්ෂක රාජකාරියට යෙදෙව්වා.

බ ඔබ කියා සිටියා ඔබලා විශේෂ පුහුණුවක් ලද පුද්ගලයන් බව ?

උ එහෙමයි.

ප මේකක්ද ඔබ එමඟින් අදහස් කරන්නේ මොකක්ද ඒ විශේෂ පුහුණුව කියන්නේ ?

උ මා ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් වර්ෂයක කාලයක් පුහුණුවක් ලැබුවා පොලිස් විද්‍යාලයේ ඊට පස්සේ විශේෂ කාර්ය බලකායේ එස්. ඒ. එස් . නැත්නම් kini mini service ඒ කියන්නේ බ්‍රිටිස් පුහුණුකරුවන් යටතේ විශේෂ පුහුණුවක් ලැබුවා.

ප ඒ මොනවා සම්බන්ධයෙන්ද ?

උ ත්‍රස්තවාදී මර්ධනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ඊට පස්සේ 1986 වර්ෂයේදී මා පකිස්ථානයේ ත්‍රස්තවාදී විරෝධී ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරුවා එහේ තිබිච්ච ඒ කමාන්ඩෝ කදවුරේ ඒ එක්කම මාස 03 ක පුහුණු පාඨමාලාවක් .

ප ඒක පකිස්තාන් රාජ්‍යයේ කළේ?

උ ඒක පකිස්ථාන රාජ්‍යයේ කලේ කමාන්ඩෝ පුහුණු පාඨමාලාවක් .

ප දැන් ඔබ කියා සිටියා 1986 වර්ෂයේදි ඔබ පොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් උසස් වීමක් ලද බව ?

උ 1986 වර්ෂයේදි මා අර කලින් කියපු මෙහෙයුමේ මගේ සාර්ථකත්වය මත මම විශේෂ උසස්වීමක් ලැබුවා පොලිස් පරීක්ෂක වරයෙක් හැටියට.

ප ඔබ ජනාධිපති ආරක්ෂක අංශයට 1987 සම්බන්ධ වුනාට පසුව එම අංශයේ කොපමණ කාලයක් ඔබ සේවය කළාද ?

උ 1987 වර්ෂයේ මා ජනාධිපති ආරක්ෂක අංශයට බැඳුනට පස්සේ අතිගරු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන සහ ඉන් අනතුරුව ප්‍රේමදාස ජනාධිපතිතුමාගෙත් ආරක්ෂක සේවයේ නිරතව සිටියා. ඉන්පසුව 1991 වර්ෂයේ මා එයින් ඉවත් වෙලා කෙටි කාලයකට මා නැවත මෙහෙයුම් රාජකාරි සඳහා ගියා නැවතත් මා 1995 වර්ෂයේදි ප්‍රභූ ආරක්ෂක රාජකාරිය සඳහා සම්බන්ධ වෙනවා.

ප 1995 නැවත ඔබ සම්බන්ධ වෙලා එම සේවයේ කොපමණ කාලයක් ඔබ සේවය කරනවාද ?

උ 1995 වර්ෂයේ මං ප්‍රභූ ආරක්ෂක සේවයේ රාජකාරි සඳහා සම්බන්ධ වුනාට පසුව 2019 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා මා ප්‍රභූ ආරක්ෂක රාජකාරින් වල නිරත වෙලා හිටියා.

ප ඔබ මෙම කාල වකවානුව තුල ඔබ ඔබගේ සේවයේ පොලිස් සේවයේ උසස් වීම් ඔබ ලැබුවාද ?

උ එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ගරු කොමිෂන් සභාවට කියන්න පැහැදිලි කරන්න කවද්ද මොනවද ඒ ලැබුණු උසස්වීම් කියලා ?

උ 1986 වර්ෂයේ මම පොලිස් පරීක්ෂක ධුරයට විශේෂ උසස්වීමක් ලැබුවා.ඉන් අනතුරුව 1993 වර්ෂයේ මා ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයට උසස් වීම් ලැබුවා. ඉන් අනතුරුව 1998 වර්ෂයේ මා සහකාර පොලිස් අධිකාරි ධුරයට උසස්වීම් ලැබුවා.ඊට පස්සේ 2006 වර්ෂයේ මා පොලිස් අධිකාරි ධූරයට උසස් වීම් ලැබුවා. 2011 වර්ෂයේ මා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ධූරයට උසස්වීම් ලැබුවා 2015 වර්ෂයේ මා නියෝජ්‍ය පොලිස්පති ධූරයට උසස්වීම් ලැබුවා . 2020 වර්ෂයේ ජනවාරි 1 වෙනිදා සිට මා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස්වීම් ලැබුවා.

ප්‍ර ඒ කියන්නේ ඔබ ප්‍රභූ ආරක්ෂක රාජකාරි යේ යෙදී සිටියේ පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරී, පොලිස් අධිකාරි., ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සහ නියෝජ්‍ය පොලිස්පති යන නිලතල දරමින් ප්‍රභූ ආරක්ෂක රාජකාරියේ යෙදී සිටියා කිව්වොත් හරිද?

උ එහෙමයි.

ප්‍ර ඔබ මේ ප්‍රභූ ආරක්ෂක රාජකාරිය කියන්නේ කුමන පුද්ගලයන් සම්බන්ධයෙන් වන ආරක්ෂක රාජකාරියද ?

උ ප්‍රභූ ආරක්ෂක රාජකාරිය කියන්නේ මම ඇත්තටම මම අතිගරුජනාධිපතිතුමන්ලා පස් දෙනකුගේ හතර දෙනකුගේ සම්පූර්ණ කාලයක් වැඩ බැලුවා . ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයෙක්ව සිටි අනුරුද්ධ රත්වත්ත ඇමතිතුමාගේ ප්‍රධාන ආරක්ෂක නිළධාරි වශයෙන් රාජකාරි කලා ප්‍රභූ ආරක්ෂක රාජකාරියේදි එක එක තරාතිරම්වල ප්‍රභූවරුන් වශයෙන් වෙන් වෙනවා අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව , ඊලඟට ගරු අගමැතිතුමන්ලාගේ ආරක්ෂාව සහ ගරු ඇමතිතුමන්ලා සහ මන්ත්‍රීතුමන්ලාගේ ආරක්ෂාව මේ සඳහා ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය අගමැති ආරක්ෂක කොට්ඨාශය සහ ඇමති ආරක්ෂක කොට්ඨාශය වශයෙන් කොට්ඨාශ තුනක් වෙන් වෙන් වශයෙන් තියෙනවා. ඊට අමතරව අනිකුත් ප්‍රභූන්ගේ ආරක්ෂාව ගරු විනිසුරුතුමන්ලාගේ ආරක්ෂාව සඳහා වෙනමම අධිකරණ ආරක්ෂක කොට්ඨාශයක් තියෙනවා තානාපති තුමන්ලාගේ ආරක්ෂාව සඳහා විදේශීය කටයුත් සම්බන්ධයෙන් තානාපති ආරක්ෂක කොට්ඨාශයක් තියෙනවා ඔය ආකාරයෙන් ප්‍රභූ ආරක්ෂක රාජකාරින් විවිධ කොට්ඨාශ වලට ඒ ඒ වගකීම් යටතේ පවරලා තියෙනවා.

ප්‍ර ඔබගේ මේ සේවාකාලය තුල ඔබ ජනාධිපති ආරක්ෂක සේවාවේ පි. එස්. ඩී එකේ නැත්නම් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම කොට්ඨාශයේ කොපමණ කලක් සේවය කළාද ?

උ මම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත් වෙන්න ඒ ඡන්ද මැතිවරණ ව්‍යාපාර වලට මං සම්බන්ධ වුනා ඇමති ආරක්ෂක

FAIR COMMENT BY JEZEEM

කොට්ඨාශයේ ඉඳලා එතුමා ජනාධිපතිතුමා වුනාට පස්සේ 2005 වර්ෂයේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයට සම්බන්ධ වුනා . ජනාධිපතිතුමා වශයෙන් එතුමා පත්වුනාට පස්සේ , 2005 සිට මා 2019 දක්වා ජනාධිපති ආරක්ෂක කොට්ඨාශ වල රාජකාරි කරලා තියෙනවා.

ප්‍ර දැන් සාක්ෂිකරු ඔබ 2019 ගිය අවුරුද්ද වන විට ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ කිසියම් තනතුරක් හෙබෙව්වාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මොකක්ද ඒ තනතුර ?

උ 2019 වෙනකොට මම ජනාධිපති ආරක්ෂක දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති වරයා වශයෙන් රාජකාරි කරමින් සිටියේ.

ප්‍ර ඒ කියන්නේ PSD. එහෙම නැත්නම් ජනාධිපති වරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන කොට්ඨාශයේ ප්‍රධාන නිළධාරියා ඔබද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ ඒ සම්බන්ධවවෙලා හිටියේ විශේෂ කාර්ය බලකායේ සාමාජිකයකු වශයෙන්ද ? සාමාන්‍ය පොලිස් සේවයේ සාමාජිකයෙකු වශයෙන්ද?

උ මා 1991 වර්ෂයේදි විශේෂ කාර්ය බලකායෙන් ඉවත් වුනා ඒ ඉවත් වුනායින් පසුව මා සාමාන්‍ය පොලිස් නිළධාරිවරයෙකු වශයෙන් තමයි රාජකාරි කටයුතු වල යෙදුනේ. මා අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව බාරගන්නා විට මා සාමාන්‍ය පොලිස් නිළධාරියෙක් වශයෙන් ජනාධිපති ආරක්ෂක දිසාව බාර කටයුතුකලා.

ප්‍ර ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් 2019 අවුරුද්ද ඔබ කටයුතු කල බව කියා සිටියා.

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ජනාධිපති වරයාගේ ආරක්ෂාව සැලසුම් කිරීමේ වගකීම කාටද තියෙන්නේ ?

උ සැලසුම් කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් එහි වගකීම මා සතු වෙනවා මා එහිදී මාගේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදක නිළධාරි වරුන් 15 දෙනෙක් පමණ ඉන්නවා එම කණ්ඩායම සමඟ නිරන්තර සාකච්ඡාවේ යෙදෙනවා එම කණ්ඩායම අවශ්‍ය පරිදි රාජකාරිවල නියැලිලා තියෙනවා ඒ ලැබෙන කරුණු පදනම් කරගෙන ඒ අයගේ නිර්දේශ ලබා ගෙන කටයුතු කරනවා ඒ අනුව තමයි සැලසුම් සකස් කරන්නේ.

ප්‍ර එම නිළධාරිවරුන්ට අමතරව ඔබ මේ ආරක්ෂාව සැලසුම් කිරීමේදී ලංකාව තුල කරලා තිබ්බ බුද්ධි සේවාව න් සහ අනිකුත් අංශයන් සම්බන්ධ කර ගන්නාවද ?

උ එහෙමයි ස්වාමිනී.

ප්‍ර කොහොමද ඒකොයි ආකාරයෙන්ද?ඒකට සම්බන්ධ කර ගන්නේ ?

උ අතිගරු ජනාධිපතිතුමාගේ රාජකාරියකදී ප්‍රධාන රාජකාරි සම්බන්ධයෙන් මා වෙත දැනුම් දීමක් කරායින් පස්සේ මා ඒ පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයෙන් විශේෂ කාර්යංශයෙන් බස්නාහිර පළාත් බුද්ධි

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තොරතුරු ඒකකයෙන් සමහර අවස්ථාවන්වල ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශයෙන් සහ අපි යම්කිසි පළාතකට යනවා නම් ඒ පළාතේ අදාල බුද්ධි අංශ වලින් වාර්තා කැදවලා සෑහීමකට පත්වුනායින් පස්සේ තමයි ඒ රාජකාරි සඳහා සංවිධාන කටයුතු කරන්නේ.

ප්‍ර දැන් ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සැලසීමේදී ආරකෂාව තක්සේරු කිරීමක් එහෙම නැත්නම් ආරක්ෂාවේ රටේ පවතින ආරක්ෂාව සහ ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සැපයීම සඳහා තක්සේරු කිරීමක් ඔබ විසින් සිදු කරනවාද?

උ එහෙමයි ස්වාමීනි සමාවෙන්න ස්වාමීනි මං මේ අවස්ථාවේදී රටේ නායකයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සංවේදි තොරතුරු සපයන්න සිද්ධ වෙනවා. ඒ නිසා මන් හිතන්නේ මේ තොරතුරු පුවත්පත් වලට යන එක එන ප්‍රධානියකුටත් ඒක ප්‍රශ්ණයක් වෙයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර ඔබ කියන පරිදි සංවේදි කරුණු සම්බන්ධයෙන් අපි පසු අවස්ථාවකදි මාධ්‍ය නොමැතිව විමසනවා දැනට සංවේදි නොවන කරුණු සම්බන්ධයෙන් විමසිමක් කරනවා ?

උ එහෙමයි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර මාසිකව ඔබ විසින් ඔබගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් ජනාධිපති පොලිස් කොට්ඨාශයේ නිළධාරීන් සහ ජාතික බුද්ධි සේවාව සහ අනිකුත් බුද්ධි සේවාවන් වල සහභාගිත්වයෙන් මාසිකව පවත්වනවාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම රැස්වීම ඔබ අඛණ්ඩව පවත්වනුලබන මාසික රැස්වීමක්ද ?

උ එහෙමයි ස්වාමීනි. මා නියෝජ්‍ය පොලිස්පති ජනාධිපති ආරක්ෂකදිසාව බාරව පත්වුදා සිට සෑම මාසයකම නොකඩවා හැම මාසෙකම ජාතික බුද්ධි තොරතුරු ඒකකය විශේෂ කාර්යංශය බස්නාහිර පලාත් බුද්ධි කොට්ඨාශය ත්‍රස්ත විමර්ෂන කොට්ඨාශය ඊටඅමතරව කොළඹ දිසාවේ තිබෙන කොට්ඨාශ ඒ කියන්නේ බස්නාහිර පළාත් දකුණ කොළඹ මධ්‍යම සහ උතුර ඒ කොට්ඨාශ භාර නිළධාරීන් ඊට අමතරව මගේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ සිටින සියලුම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදක නිවේදන නිළධාරීන් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයන් සහ අවශ්‍ය යැයි හැගෙන වෙනත් තොරතුරු සපයන්නන් ගෙන්වලා මාසිකව රැස්වීමක් පවත්වනවා. ඒ පවත්වන රැස්වීම අනිවාර්යයෙන්ම මාසිකව පවත්වනවා. ඊටඅමතරව වෙනත් විශේෂ අවස්ථාවන්වල ඒ කියන්නේ ජාතික නිදහස් උත්සවය , එහෙම නැත්නම් වෙනත් රණවිරු පෙළපාලියක් එහෙම නැත්නම් මැයි දිනය ඒ වගේ ප්‍රධානතම උත්සව

FAIR COMMENT — BY JEZEEM

වලදි මා මේ හා සමානම ඒ ජ්‍යෙෂ්ඨ නිළධාරින් කැදවලා මා සාකච්ඡාවක් පවත්වලා ඒ කරුණු දැන ගෙන තමයි ඒ කටයුතු සංවිධානය කරන්නේ.

ප්‍ර මෙම රැස්වීම සඳහා ඔබ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලය එහෙම සහභාගි කර ගන්නවාද ?

උ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගි කරවගන්නේ නැහැ. මොකද අපේ මා රාජකාරි කල කාලසීමාවන්තුල අනිකුත් ඒ කියන්නේ විශේෂ කාර්ය බලකාය ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය සහ ඒ අදාල අංශ හැර හමුදා සම්බන්ධයක් තිබුනේ නැති නිසා ඒ අධ්‍යක්ෂ මණ්ඩලය කැදෙව්වේ නැහැ නමුත් සමහර අවස්ථාවන්වල හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙනුත් කැදවලා අපි සාකච්ඡාවල් තියපු අවස්ථාවන් තියෙනවා. ගුවන් හමුදා සහ යුද හමුදා intellignt එහෙම නැත්නම් බුද්ධි නිළධාරින් සමඟ සාමුහිකව සාකච්ඡා පැවැත්වූ අවස්ථාවන් මගේ රාජකාරි කාලසීමාව තුළ තියෙනවා

ප්‍ර මෙම මාසික රැස්වීම් වලට නැවත ගියොත් මෙම මාසික රැස්වීමක් පැවැත්වීමෙන් පසු ව ඒ මාසික රැස්වීමේදි සාකචඡා කළ කරුණු සම්බන්ධයෙන් සටහන් තැබීමක් කවුරු හෝ විසින් සිදු කරනවාද ?

උ මා විසින් පෞද්ගලිකවම ඒ කරුණු සටහන් කරනවා සටහන් කරලා උසස් නිළධාරින්ගේ ගමන් සටහන් පොතේ ඒ සාකච්ඡාවේදි එක් එක් බුද්ධි නිළධාරින් දක්වපු කරුණු සහ මා පලකල අදහස් හා නිර්දේශයන් සම්බන්ධ සටහනක් තබනවා.

ප්‍ර එවැනි සටහන් ඔබට අද දින මා පෙන්වා සිටියහොත් හඳුනාගන්න පුලුවන්ද ?

උ පුලුවන් ස්වාමීනි.

C. 741 මා පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර මෙය ඔබට හඳුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි ස්වාමීනි මගේ අත්සනින් සටහන් තබපු සටහනක්.

ප්‍ර මෙම C. 741 දරණ ඔබගේ සටහනට අනුව 2019 ජනාවරිමස 21 වෙනිදින ආරක්ෂක සමාලෝචන රැස්වීමක් පවත්වලා තියෙනවා.?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ජනාධිපති වරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන්?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එමරැස්වීමට සහභාගි වෙලා තිබෙන ආයතන මොනවාද ?

උ රාජ්‍ය බුද්ධි සේවය, ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශය, විශේෂ කාර්යංශය, බස්නාහිර පළාත් බුද්ධි අංශය , කොළඹ අපරාධ කොට්ඨාශය.කොළඹ දකුණ හා කොළඹ මධ්‍යම කොට්ඨාශ වල නියෝජිතයින්.

ප්‍ර සහභාගි වෙලා තිබෙනවා ?

උ එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මෙහිදී රාජ්‍ය බුද්ධි සේවාව වෙනුවෙන් සහභාගි වෙලා තිබෙන නිළධාරිවරයා මුස්ලිම් අන්තවාදී සංවිධාන සම්බන්ධයෙන් කිසියම් හෝ කරුණු දැක්වීමක් සිදු කරලා තියෙනවාද?

උ නැත ස්වාමිනි 1/23 වෙනිදා පැවැත්වූ සාකච්ඡාවේදි මුස්ලිම් අන්තවාදීන් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයෙන් කරුණු අනාවරණය වෙලා නැහැ .

ප්‍ර මේ වන විට 2019 ජනවාර් 23 වෙනිදා වෙන විට පොලිස් නිළධාරිවරුන් දෙදෙනෙක් වවුනතිව් වලදී අමානුෂික ලෙස ඝාතනය කිරීම, 2018 දෙසැම්බර් මාසේ බුද්ධ ප්‍රතිමා ඇතුලු අන්‍යාආගමික පිළිම වලට හානි කිරීම,සහ 2016 ජනවාරි මාසේ 16 වෙනිදා වනාතවිල්ලුවේදි සොයා ගන්නට යෙදුනු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් කිසිදු හෝ කරුණක් සඳහන් වෙලා තියේද ?

උ කිසිදු කරුණක් සඳහන් වෙලා නැහැ ස්වාමීනි.

ප්‍ර 2018 දෙසැම්බර් මාසේ බුද්ධ ප්‍රතිමා ඇතුළු ඒ ආගමික පිළිමවන් වලට හානි කිරීම සහ වනාතවිල්ලුවේ සොයා ගන්නට යෙදුණු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම රැස්වීමට පෙර රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඔබ වෙත ලිඛිතව හෝ වාචිකව දැනුවත් කර තිබුනාද ?

උ නැත ස්වාමීනි.

ප්‍ර C. 742 දරණ ලේඛණය මේ අවස්ථාවේදි පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා ස්වාමීනි. මෙම ලේඛණය ඔබට හඳුනාගන්නට පුලුවන්ද හඳුනාගන්නවා නම් කුමක් වශයෙන්ද හඳුනාගන්නේ ?

උ ස්වාමීනි මා මාගේ මතකයේ හැටියට 2019 පෙබරවාරි මාසේ මා ජාතික නිදහස් උත්සවය වෙනුවෙන් සාකච්ඡාවක් පැවැත්තුවා විශේෂ සාකච්ඡාවක්. ඊට අමතරව මේ සාකච්ඡාව 2019/02/15 වෙනිදා පවත්වලා තියෙන්නේ මම මාසිකව පවත්වන බුද්ධි සාකච්ඡාව.

ප්‍ර මාසිකව පවත්වන බුද්ධි සාකච්ඡාව?

උ මාසිකව පවත්වන බුද්ධි සාකච්ඡාව.

ප්‍ර ඔබ 2019 පෙබරවාරි මාසේ මාසිකව පවත්වන එම බුද්ධි සාකච්ඡාවට අදාලව ඔබ විසින් තබන ලද සටහන වශයෙන්ද C. 742 හඳුනාගන්නේ?

උ එහෙමයි

ප්‍ර එම රැස්වීම පවත්වලා තිබෙන්නේ 2019 පෙබරවාරි මස 15 වෙනි දින ?

උ එහෙමයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු ඔබ මාසිකව පවත්වන දිනයක් තියෙනවාද ?

උ ස්වාමිනි ජනාධිපතිතුමාගේ කාල සටහන් අනුව බොහෝ වෙලා ස්වාමිනි එවකට මගේ මතකයේ හැටියට අගහරුවාදා හෝ බදාදා තමයි කැබිනට් මණ්ඩලයේ රැස්වීම් පැවැත්වෙන්නේ. එදාට අනිවාර්යයෙන්ම

FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමා කර්යාල කටයුතු වල යෙදෙන්නේ. එදා තමයි මන් තෝරාගන්නේ මොකද පිට වැඩ සටහන් නැති නිසා කල් ඇතිව අනිකුත් අංශ වලට දැනුම් දිය හැකි නිසා ඒ කැබිනට් මන්ඩල රැස්වීම පැවැත්වෙන දිනයක් තමයි ගොඩක් වෙලාවට මාසික බුද්ධි සාකච්ඡාවට තීන්දු කර ගන්නේ.

ප්‍ර ඒ කියන්නේ මාසික මුල් සතියේ වලද? අවසන් සති වලද?

උ රාජකාරි ස්වභාවය අනුව ස්වාමීනි මුල් සතියේ හෝ මැද සතියේ කොයියම්ම අවස්ථාවක හරි හැම මාසෙකම සාකච්ඡාවක් පවත්වලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර ජනාධිපතිතුමා දුර බැහැර යනවා නම් විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවලට යනවා නම් එවෙලේ බුද්ධි සාකච්ඡා කලින් පවත්වනවාද ?

උ ස්වාමීනි මාසිකව පවත්වන සාකච්ඡාවට අමතරව උතුරු නැගෙනහි පළාත් වලට යනවා නම් ඊට කලින් සාකච්ඡාවක් පවත්වලා ඒ ප්‍රදේශයේ තත්වය ගැනත් ඒ ආරක්ෂක සංවිධාන ගැනත් සාක්ච්ඡා කිරීම තමයි සිරිත ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර ඔබ කියා සිටියා 2019 පෙබරවාරි මාසේ නිදහස් දිනය සම්බන්ධයෙනුත් ඔබ බුද්ධි රැස්වීමක් පැවැත්වූ බව ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම බුද්ධි රැස්වීම පවත්වා ඔබ ඊට අදාලව යම් සටහනක් එම රැස්වීමේ සඳහන් කරන්නට යෙදුනු කරුණු සම්බන්ධව ඇතුලත් කලාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම සටහන් ඔබට අද දින දුටුවොත් අදුනාගන්න පුවවන්ද?

උ පුලුවන් ස්වාමිනි.

ප්‍ර C 744 සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා මා මෙම C. 744 දරන ලේඛනයේ දැනටමත් ලකුණු කර ඇති C. 44 A C. 44 Bසහ C. 44 C යන ඡේදයන් සාක්ෂිකරුගේ අවධානයට යොමු කර සිටිනවා.

ප්‍ර මෙම C. 7 44 A සහ Bමඟින් ඊට පෙර මෙම ප්‍රශ්ණය සකස් කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර මෙම C 744 ට අනුව රාජ්‍ය බුද්ධි සේවාව විසින් එකී බුද්ධි රැස්වීමේදි කරුණු ඉදිරිපත් කර තිබෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මෙහි C 744 A සහ C 744 B කියන ඡේදයන් එම බුද්ධි තොරතුර කිසියම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් ඉදිරිපත් කරපු බුද්ධි තොරතුරු සම්බන්ධයෙන්ද සටහන් වෙලා තිබෙන්නේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කවුරු විසින්ද එය ඉදිරි පත් කර තිබෙන්නේ ?

FAIR COMMENT BY JEZEEM

උ රාජය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් නානායක්කාර මහතා විසින් තමයි එම තොරතුර ඉදිරිපත් කර තිබෙන්නේ.

ප්‍ර එම ඡේදයන් දෙකට අනුව කුමක්ද සඳහන් වෙලා තිබෙන්නේ ?

උ ISIS සංවිධානය ඉරානය සහ ඉරාකය යේදී පසු බෑමට ලක්වීමත් සමග එම සංවිධානය සාමාජිකයන් මවු රටවලට යවා ප්‍රසිද්ධ උත්සව ස්ථාන වලදී අන්‍යාගමිකයන් හට ප්‍රහාර එල්ල කරන ලෙසට දැනුම් දී ඇති බවත් මෙම මතවාදයට නැඹුරු වුණු පුද්ගලයන් 125 දෙනෙකු පමණ සිටින බවත් එලෙස මෙරට පැමිණි දෙදෙනකු වැල්ලම්පිටිය සහ දෙහිවල යන ප්‍රදේශවල වෙසෙන බවට හඳුනාගෙන ඇති බවත් .

ප්‍ර දැන් මෙම සංවිධානය සහ එහි සාමාජිකයන් සම්බන්ධයෙන් සඳහන් කර තිබුනට එමඟින් ජනාධිපතිවරයාට හෝ ජාතික ආරක්ෂාවට තර්ජනයක් සිදුවෙලා තියෙන බව හෝ ඇති බව සටහන් කරලා තියෙනවාද?

උ නැත ස්වාමීනි.

ප්‍ර මේ රැස්වීම පැවැත්වූ දිනය 2019/02/03 වෙනිදා ?

උ එහෙමයි.

ප්‍ර ඔය අවස්ථාවේදීවත් ඔබව දැනුවත් කරන්නට යෙදුනද මා පෙර සඳහන් කරපු වවුනතිව් වල සිදුවූ පොලිස් නිළධාරින් ඝාතනය , එමෙන්ම පිළිමවලට හානි කිරීම, සහ වනාතවිල්ලුවේ දී සොයා ගන්නට යෙදුණු ඒ විශාල ප්‍රමාණයක් වන පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ?

උ නැත ස්වාමීනි.

ප්‍ර මෙම කරුණු දැක්වීමේදි 2019/02/03 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාව විසින් ISIS සංවිධානය සහ එහි ඒ අයට පක්ෂපාති පුද්ගලයන් ලංකාවේ සිටින බව පැහැදිලි කර තිබුනට එම පුද්ගලයන් සහ මා පෙර කී සිද්ධීන් අතර සම්බන්ධතාවයක් තිබිය හැකි බවට හෝ තියෙනවා නෙවේ තිබිය හැකි බවට මෙම රැස්වීමේදි සඳහන් කරන්නට යෙදුනද?

උ නැත ස්වාමීනි.

ප දැන් මා C. 744 B කියන ඡේදය කෙරේ ඔබගේ අවධානය යොමු කරනවා කුමක්ද එමඟින් සඳහන් වන්නේ ?

උ පකිස්ථානය , ඉන්දියාව සහ අනිකුත් රටවල් වල සමාජ ජාලා ඔස්සේ මෙම මතවාදයත් සමඟ සම්බන්ධතා පවත්වන සාමාජිකයන් බොහෝ පිරිසක් දැනට ලංකාවේ සිටින බවත් මොවුන් විශේෂයෙන් ද්‍රෝන කැමරා හා රසායනික අවි මඟින් ප්‍රහාර එල්ල කරන ලෙසට උපදෙස් ලබා ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වන බවත් .

ප්‍ර මෙම ඡේදයේ ප්‍රකාශ කරලා තිබෙන්නේ අයි එස් අයි එස් මතවාදයට නැඹුරු පුද්ගලයන් විසින් ISIS සංවිධානයේ දැනුම් දීම අනුව ප්‍රහාරයන් එල්ල කිරීමට පුලුවන් කියන ආකාරයත්?

උ එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර සහ ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඔබ වෙත දැනුම් දීලා තියෙනවා ?

උ එහෙමයි.

ප්‍ර දැන් මේ අවස්ථාවේදී මෙම ඡේදයෙන්වත් කියා සිටියාද අර පෙර මා සඳහන් කරන්නට යෙදුණු පොලිස් නිළධාරිවරුන්ගේ ඝාතනය , බුදු පිළිම ඇතුළු පිළිම වලට හානි කිරීම සහ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම. සම්බන්ධයෙන් කිසිදු හෝ සඳහනක් එහිදී සිදු කෙරුනද?

උ කිසිදු හෝ සම්බන්ධතාවයක් හෝ කිසිදු සඳහනක් වුනේ නැහැ ස්වාමීනි.

ප්‍ර යම් හෙයකින් පිළිම වලට හානි කරන්නට යෙදුණු පුද්ගලයින් සහ ඒ පුපුරණ ද්‍රව්‍ය සොයා ගන්නට විශාල ප්‍රමාණයක් පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සහ එයට සම්බන්ධ වූ පුද්ගලයන් අතර ඇති සම්බන්ධතාවය මෙම C. 744 B කියන ඡේදයට සම්බන්ධකර තිබුනා නම් ඔබ 2019/02/04 වෙනිදා ගන්නට යෙදුණු ආරක්ෂක විධි විධාන ජනාධිපති වරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක විධිවිධාන වෙනස් කරනවාද නැද්ද ?

උ ස්වාමිනි සාමාන්‍යයෙන් ජාතික නිදහස් දින උත්සවයකදී අපි අපේ ලංකාවේ තියන අත්දැකීම් අනුව ත්‍රස්තවාදීන් කලින් අපිට එල්ල වෙච්ච ප්‍රහාර සහ මේ දැනට අපට ඒ වෙනකොට තිබිච්ච අයි. එස් මතවාදි තිබිච්ච තොරතුරු සහ ද්‍රෝණ තාක්ෂණය ඔස්සේ ප්‍රභූ වරුන්ට තිබු ප්‍රහාර ඊශ්‍රාලය සහ ඇමරිකාවේ ජනාධිපතිවරුන්ට එල්ල වෙච්ච ප්‍රහාර ඒ සියල්ලම සැලකිල්ලට අරගෙන රටේ ඉන්න සියලුම ප්‍රභූන් සහ විදේශිය තානාපතිවරුන් සහභාගි වන ජාතික නිදහස් උත්සවයක් ඒ උත්සවයේදී අපි ගන්නට පුලුවන් උපරිම ආරක්ෂාව යොදවනවා කොහොමටත් යොදවලා තමයි ඒ උත්සවය පවත්වන්නේ . අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් තව දැනගෙන තිබුනානනම් තවදුරටත් ඒ සම්බන්ධයෙන් අවධානයක් යොමු කරනවා නමුත් අපි ඒ උත්සවය පවත්වන්න ගතයුතු සියලුම ආරක්ෂක පියවර අරගෙන තිබුනා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඒකට යමක් එකතු කරන්න ඔන .යම් අවස්ථවක ඔබව C 744 දරණ ලේඛණයෙන් ඔබ දැනුවත් කරලා තිබ්බානම් ඔය වනාතවිල්ලුව අවි ගබඩාව සොයා ගැනීමේ දී අනාවරණය වන නම් අතුරින් යම් පුද්ගලයින් නිදහස් දිනය සැමරීම නැත්නම් ජාතික කොඩියට ගෞරව කිරීම හෙළා දකිමින් ප්‍රසිද්ධ මාධ්‍යයේ ප්‍රකාශ කර ඇති බව ඔබට C 744 න් දැන්වුවා නම් ඔබ මොකක්ද ගන්නා ක්‍රියා මාර්ගය ?

උ ඒ අවස්ථාවේදී එහෙම නම් ඊට එහා ගිය ඒකට ඉලක්ක ගත ආරක්ෂක පියවර ගන්නට අපි ක්‍රියා කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ කියන්නේ ඔබ 2019 පෙබරවාරි 04 වෙනිදා ගන්නට යෙදුණු ආක්ෂක ක්‍රියා මාර්ග වලට වඩා වැඩි යමක් ඔබ ගන්නවා කියන එකද ?

උ එතනදී ස්වාමීනි මම හිතන්නේත් මම ඒ වෙනකොට විදේශීය රාජ්‍ය නායකයොත් සහභාගී වුනා. අපි සෑම තර්ජන එල්ල විය හැකි හැම අංශයක්ම බලලා අවශ්‍ය උපරිම ආරක්ෂාව යොදවලා තිබුනේ ස්වාමීනි. එහිදී මං හිතන්නේ ස්වාමීනි ඒකෙන් ආවරණය වෙනවා කොයියම් තරාතරමක හෝ ඩ්‍රෝන තාක්ෂණය ඔස්සේ හෝ වේවා වෙනත් දුර බැහැර ඉඳන්බර අවියකින් ප්‍රහාරයක් හෝ වේවා වාහනයකින් පැමිණිලා හෝ වේවා නැත්නම් ස්නයිපර් ප්‍රහාරයක් හෝ වේවා මොනයම්ම ආකාරයක තර්ජනයක් වුනත් මැඩලන්න පුලුවන් ආකාරයේ ආරක්ෂාවක් අපි සලසලා තිබුනා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර මෙම කාලසීමාවේදී ජනපති ඝාතන සැලසුම ක් ගැන කථා වෙලා තිබ්බා නේද ?

උ තිබුනා ස්වාමීනි. නමුත් අපි ඒවත් ඔක්කෝම අපි ජනාධිපති වරයෙකුට ස්වාමීනි සාමාන්‍යයෙන් එල්ල විය හැකි තර්ජන නොයෙකුත් පැතිකඩවලින් එනවා ස්වාමීනි අපි ඒ සම්බන්ධයෙන් දැනුවත්

ප්‍ර ඇයි ඔබ හිනාවුනේ කියන්න ? නැහැ ස්වාමීනි රටක නායකයකුට දේශපාලනික වශයෙන් ඉන්නවා විරුද්ධවාදීන්, පාතාලයේ ඉන්නවා විරුද්ධවාදීන් , විදේශිය රටවල ඔත්තු සේවා වල ඉන්නවා විරුද්ධවාදීන් , උන්මන්තකයෝ ඉන්නවා ,සමහර වෙලාවට වෙනත් පෞද්ගලික හේතූන් මත ඉන්නවා විරුද්ධවාදීන් ඔය ආකාරයේ ස්වාමීනි නොයෙකුත් ආකාරයේ විස්තරාත්මකව කියන්න පුලුවන් ස්වාමීනි අත්දැකීම් අනුව නොයෙකුත් ආකාරයේ විරුද්ධවාදීන් ඉන්නවා . ඒ හැම අංශයක්ම ආවරණය වන ආකාරයේ ආරක්ෂක සැලැස්මක් තමයි ස්වාමීනි අපි හදන්නේ .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර C 742 ලේඛණයට ඔබගේ අවධානය මා නැවත යොමු කර සිටිනවා. මෙම C 742 දරණ ඔබගේ සටහනට අනුව මාසික 2019 පෙබරවාරි මාසයේ පවත්වන්නට යෙදුණු මාසික බුද්ධි රැස්වීමේදී ජනාධිපතිවරයාගේ ආරක්ෂාව වෙනුවෙන් ඒ බුද්ධි රැස්වීමට ඔබ පෙර කී ලෙස රාජ්‍ය බුද්ධි සේවාව පැමිණිලා තිබෙනවාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ටී. අයි. ඩි. ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශය ?

උ එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර සහ ඔබ පෙර සඳහන් කරන්නට යෙදුණු අනිකුත් ආයතන?

උ එහෙමයි. සියළුම ඒ වගේ බුද්ධි ආයතන ඇවිල්ලා තියෙනවා සාමාන්‍ය පරිදි .

ප්‍ර පැමිණිලි තියෙනවා?

උ එහෙමයි.

ප්‍ර මෙම රැසවීම ඔබ කොච්චර වෙලාවක් පවත්වලා තියෙනවාද ?

උ ස්වාමිනි සාමාන්‍යයෙන්

ප්‍ර වෙලාව කීයේ ඉඳලා කීයටද?

උ උදේ 10 ට. උදේ 10 ට පටන් ගන්නවා පටන්ගත්තාම එදා දවසේ මතුවෙන කරුණු අනුව මෙම සාකච්ඡාව 9.30ට පටන් ගෙන තියෙනවා ස්වාමීනි. පටන් අරගෙන සාමාන්‍යයෙන් පැය එක හමාරක් දෙකක් තියෙනවා. ඒකේ අවසන් කරපු වේලාව දාලා නැහැ ස්වාමීනි නමුත් සාමාන්‍ය වශයෙන් පැය එක හමාරක් දෙකටත් අතර කාලයක් මේ සාකච්ඡාව පැවැත්වෙනවා .

ප්‍ර මෙම මාසික රැස්වීමේදී ජාතික බුද්ධි සේවාව විසින් ISIS සංවිධානය ඒ සම්බන්ධව කිසියම් කරුණු සැලකිරීමක් කරලා තියෙනවාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කුමක්ද එහි සඳහන් වෙලා තිබෙන්නේ ?

උ මෙහිදී රාජ්‍ය බුද්ධි සේවයේ එවකට පොලිස් අධිකාරි ජනක සෙනවිරත්න මහතා දන්වලා තියෙනවා ශ්‍රී ලංකාව තුල ISIS සංවිධානයේ ක්‍රියාකාරින් වශයෙන් සිටි 28 ක් සිරියාවට පිටව ගොස් ඇති බවත් ඉන් තුනක් ගුවන් ප්‍රහාර යකින් මියගොස් ඇති බවත් ISIS මතවාදය දරන 100 කට වැඩි පිරිසක් ශ්‍රී ලංකව තුල වෙසෙන බවත් ඔවුන් කොළඹ, මහනුවර , මඩකලපුව යන ප්‍රදේශ වල වෙසෙන බවත්, මින් මඩකලපුවේ ප්‍රදේශයේ ක්‍රියාත්මක නැෂනල් තව්හිද් ජමාද් සංවිධානය විසින් එම සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවකදි අන්‍යාගමිකයන් විනාශ කිරීමෙන් මෙරට ඉස්ලාම් රාජ්‍යයක් ස්ථාපනය කලහැකි බවට අදහස් දක්වා ඇති බවත් මහනුවර සහ මාවනැල්ල ප්‍රදේශවල බුද්ධ ප්‍රතිමා වලට ප්‍රහාර සිදු කර හදුනාගත් කණ්ඩායම් සමාජජාලා වෙබ් අඩවි තුලින් ISIS මතවාදී හදුනාගෙන ක්‍රියාත්මක කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව.

ප්‍ර එකී ඡේදයන් තුන මා C742 A ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා. දැන් මෙම තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාව විසින් අනාවරණය කරාම ඔබ ඒ සම්බන්ධයෙන් කිසියම් හෝ පියවරක් ගත්තාද?

උ ස්වාමීනි මෙවැනි බුද්ධි සාකච්ඡාවලදී ත්‍රස්තවාදී කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වයන් දෙමළ ඊයස්පෝරාවේ විදේශිය සහ ලංකාවේ ක්‍රියාකාරත්වයන් පිළිබඳව මුස්ලිම් අන්තවාදීන් පිළිබඳව සහ මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් නැත්නම් වෙනත් පාතාල ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් එවකට මට මතකයි මාකඳුරේ මධුෂ් ගෙත් විශාල

FAIR COMMENT BY JEZEEM

ක්‍රියාකාරකම් කීපයක් තිබුනා ලංකාවේ . ඔය ආකාරයේ වශයෙන් සෑම සිද්ධියක් සම්බන්ධයෙන්ම අපි එක හා සමානම අනුව සලකලා බලලා කටයුතු කරනවා . මොනවා හරි ඉලක්ක ගත තොරතුරක් ලැබුනොත් ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම අපි ක්‍රියාමාර්ග අරගෙන අවශ්‍ය පියවර ගන්නවා ස්වාමීනි.ඒ කිසිම දෙයක් අපි ඉලක්ක ගත තොරතුරක් හැටියට ලැබුනේ නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර තමුන් ඉලක්ක ගත තොරතුරක් වශයෙන් සඳහන් කරේ මොකක්ද?

ප්‍ර පසුගිය දිනවල අපි දැකපු අර අහවල් දවසේ අහවල් විදියටම ඒ ප්‍රහාරයන් එල්ල වෙනවා වගේ ඉලක්ක ගත තොරතුරක් කිසිම අවස්ථාවක අනාවරනය වුනේ නැහැ ස්වාමීනි.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර ඔබ කියා සිටින්නේ ඉලක්ක ගත තොරතුරක් මෙහි නැති බව ?

උ සඳහන් වෙලා නැහැ ස්වාමීනි.

ප්‍ර දැන් ඔබට මෙම සටහනේ ඉලක්කගත කරුණක් සඳහන් වෙලා තිබුනානනම් ඔබ පියවරක් ගන්නා බව ඔබ කියා සිටියානේ ?

උ එහෙමයි.

ප්‍ර එවැන්නක් ඔබට මෙම ගරු සභාව වෙත දන්වා සිටින්න පුළුවන්ද ?

උ ස්වාමීනි 2019/02/13 වෙනිදා උද්ඝෝෂණයක් සම්බන්ධයෙන් සටහනක් තියෙනවා ස්වාමීනි එදාම අපිට අනාවරණය වෙච්ච ඒ උද්ඝෝෂණය සඳහා කොළඹින් පිටත එකම ස්ථානයක් වෙන් කරලා දීමේ අවශ්‍යතාවයක් පැන නැඟිලා තිබුනා ඒ කියන්නේ අපි එහෙම කරේ ජනාධිපති කාර්යාලය හා කොටුව ජනාධිපති මන්දිරයේ ආරක්ෂක රාජකාරි සඳහා පහසුවන ආකාරයට නැත්නම් උද්ඝෝෂණ කරුවෝ සියළු දෙනාම ජනාධිපති කාර්යාලය ඉදිරිපිටයි ඇවිල්ලා රැස්වෙලා ප්‍රශ්ණ මතු වෙනවා . ආරක්ෂාවට තර්ජනයක් . මහජනතාවට පීඩාවක් ඒවගේ නිසා මම ඒ අවස්ථාවේදීම කොළඹ මධ්‍යම කොට්ඨාශ බාර නිළධාරියාට දැනුම් දුන්නා අධිකරණ නියෝගයක් අරගෙන ඒ අය සඳහා සුදුසු එක ස්ථානයක ඒ අය ස්ථානගත කරන්නකියලා ඒවගේ ස්වාමීනි මට අත්දැකිම් අනුව කියන්න පුළුවනි පසුගිය ජනාධිපතිතුමන්ලාගේ ආරක්ෂක රාජකාරින් වලදී මෙවැනි ඉලක්ක ගත තොරතුරු ලැබුනම එතුමන්ලා සමහර සංචාර වලට අපි ගෙනියන් නැතුව අපි නවත්වපු අවස්ථාවල් තියෙනවා ස්වාමීනි. එහෙම නවත්වලා තියෙනවා ඒ වගේ specific information අපිට ලැබුනු අවස්ථාවන්වල ප්‍රභූවරයා දැනුවත් කරලා ඒ සඳහා නොගිය අවස්ථාවන්

FAIR COMMENT BY JEZEEM

තියෙනවා ඒ නැත්නම් ඒ සහභාගි වෙන්න තිබිච්ච අවස්ථාව යන ක්‍රියා මාර්ගය වෙනත් උපාය මාර්ගය උපයෝගි කර ගනිමින් වෙනස් ආකාරයකට කර ගැනිමට කටයුතු කරලා තියෙනවා.

ප මේ අවස්ථාවේදී ඉලක්ක ගත තොරතුරක් සම්බන්ධයෙන් වන මෙම තොරතුර රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඉදිරිපත් කර ඇති තොරතුර සහ ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරු විසින් ගන්නට යෙදුණු පියවරට අදාල ඡේදය C. 742 B ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා. මෙම C 742 B මා පෙර ලකුණු කරන්නට යෙදුණු C 742 A ට ඉහලින් තිබෙන ඡේදය බවත් ගෞරවයෙන් දන්වා සිටිනවා.
ඔබට මතකයක් තියෙනවාද 2019 මාර්තු මාසය සඳහා මෙම බුද්ධි ආරක්ෂක රැස්වීමක් ඔබගේ ප්‍රධානත්වයෙන් පැවැත්තුවා ද නැද්ද කියන්න?

උ මාර්තු මාසේ පවත්වන්නට ඇති අනිවාර්යයෙන්ම.

ප මෙම ගරු කොමිෂන් සභාවට ගිය දිනයේ සාක්ෂි දෙන්නට යෙදුණු සහකාර පොලිස් අධිකාරි සතරසිංහ දන්වා සිටියානම් 2019 මාර්තු මාසේ එවැනි රැස්වීමක් පැවැත්තුවේ නැහැ කියලා ඔබ ඒක පිළිගන්නවාද ?

උ මම ඒක සිරිතක් හැටියට හැම මාසෙකම රැස්වීම් පැවැත්වුවා. මම හිතන්නේ අර උසස් නිළධාරින්ගේ ගමන් සටහන් පොත පරික්ෂා කලොත් අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් කරුණු සනාථ කරගන්න පුළුවන් වෙයි ස්වාමීනි.

ප 2019 අප්‍රේල් මාසේ 12 වෙනිදා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මඩකලපුව ප්‍රදේශයේ සංචාරයක් සිදු කල බව ඔබට මතකයිද?

උ එහෙමයි ස්වාමීනි

ප මෙම සංචාරයට අදාලව ඔබ විසින් අර බුද්ධි නිළධාරින් ගෙනල්ලා රැස්වීමක් හෝ වාර්තා කැඳවීමක් සිදු කරාද කියන්න මතකයක් තියෙනවාද ?

උ එහෙමයි ස්වාමීනි අනිවාර්යයෙන්ම ක්‍රියාන්විත ප්‍රදේශයක රාජකාරියක් නිසා කොහොමටත් ජනාධිපතිතුමා කොළඹින් පිට රාජකාරි සඳහා යද්දී රාජ්‍ය බුද්ධි සේවයෙන් සහ විශේෂ කාර්යංශයෙන් ඒ වගේ තැන්වලිනුත් කැඳවනවා. මේ මඩකලපු සංචාරය සම්බන්ධයෙන් මට මතකයි රාජ්‍ය බුද්ධි සේවයෙන් විශේෂ කාර්යංශයෙන් සහ ත්‍රස්ත විමර්ශණ කොට්ඨාශයෙන් වාර්තා කැඳෙව්වා තර්ජිත විශ්ලේෂණ වාර්තාවක් එතුමාගේ සංචාරයේ යාමට සුදුසුද නැත්ද යන්න සම්බන්ධයෙන් නිර්දේශ එවන්න කියලා අපි යවලා තියෙනවා ස්වාමීනි.ඔබට ඒ නිර්දේශයන් අද දින ඒ අනුව බුද්ධි සේවාවේ නිර්දේශයක් ලැබුනාද ?

උ ලැබුනා වගේ මතකයි ස්වාමීනි.

ප ඔබට එය අද දින දුටුවොත් හඳුනාගන්න පුළුවන්ද ?

උ එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර X 97 පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා. පෙන්වා සිටිනවා සාක්ෂිකරුට. බලන්න මෙම 2019/04/12 දින නියමිත වෙලා තිබුණු සංචාරය සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඉදිරිපත් කරන ලද බුද්ධි වාර්තාවද කියලා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මෙම x 97 දරණ ලේඛණය දැනටමත් x 97 A ලෙස ලකුනු කර ඇති කොටස ඔබගේ අවධානයට යොමු කරනවා .

උ අතිගරු ජනාධිපතිතුමාට හෝ මෙම සංචාරයට ත්‍රස්තවාදී, අන්තවාදී හෝ වෙනත් කණ්ඩායම් විසින් තර්ජන පවතින බවට නිශ්චිත තොරතුරු මෙතෙක් වාර්තා වී නොමැති වුවද පහත කරුණු කෙරේ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

ප්‍ර ඔබට මේ අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද මෙම බුද්ධි තොරතුරු වාර්තාව කියවලා ඉවරවුනාට පසුව මෙම x 97 A දරන කොටසින් දක්වා තිබෙන කරුණු වලට අනුව ඔබට වැටහුනේ කුමක්ද ?

උ විශේෂිත ඉලක්කගත තර්ජනයක් නොමැති බව.

ප්‍ර කාටද ?

උ අතිගරු ජනාධිපතිතුමාට හෝ එම රැස්වීමට සහභාගි වන මහජනතාවට.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර ඔය බුද්ධි තොරතුරේ දිනය කුමක්ද ?

උ දිනය ස්වාමිනි 2019/04/10 .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර මෙම අවස්ථාවේදි මා සාක්ෂිකරු වෙත C. 4 , C. 4 A, C. 4 B, C. 4 C ලේඛණයන් පෙන්වා සිටිනවා මෙහි C. 4 B සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා.

යම් හෙයකින් මෙම C. 4 B සාක්ෂිකරුට පෙන්වා සිටිනවා උතුමාණෙනි . ඒ වගේම X 94 ද පෙන්වා සිටිනවා.

උ X94 (කියවයි) ප්‍රහාර එල්ල වන තුරු මා මේ කිසි තොරතුරක් සම්බන්ධයෙන් නිශ්චිතව දැන ගෙන සිටියේ නැහැ ස්වාමීනි.

ප්‍ර නැහැ මගේ ප්‍රශ්නය යම් හෙයකින් මෙම C. 4 B සහ X 94 දරණ ලේඛණ වල සඳහන් තොරතුරු ඔබ සලකන්නේ කුමන වර්ගයේ තොරතුරක් හැටියටද ?

උ ඉලක්ක ගත ප්‍රහාරයක් සම්බන්ධයෙන් ලද නිශ්චිත බුද්ධි තොරතුරක් හැටියට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප ඉලක්ක ගත ප්‍රහාරයක් සම්බන්ධයෙන් ලැබුණු නිශ්චිත බුද්ධි තොරතුරක් වශයෙන් ? දැන් X 94 දරණ ලේඛණයේ දිනයක් සඳහන් වෙනවාද ?

උ 2019/04/09 වෙනිදා අත්සන් කරලා තියෙනවා ස්වාමීනි.

ප 2019/04/09 වනදා දැන් මෙම X 94 ලේඛණයේ සඳහන් කරුණු හෝ එක්කරුණක් වත් ඔබ වෙත ඉදිරිපත් කරන්නට යෙදුණු X 97 ලේඛණයේ දක්වලා තිබෙනවාද ? X 97 ලෙස ඔබ වෙත ලැබුණු බුද්ධි තොරතුර මඩකලපුව රැස්වීමට අදාලව?

උ එහෙමයි.

ප එම බුද්ධි තොරතුරේ මා ඔබට පෙන්වා සිටි X94 හි සඳහන් තොරතුරු ඇතුලත් වෙනවාද ?

උ කිසිදෙයක් සඳහන් වෙලා නැහැ ස්වාමීනි.

ප කිසිවක් සඳහන් වෙලා නැහැ .

ප එම X 97 හි C. 4 B ලෙස පෙන්වා සිටි ලේඛණයේ සඳහන් කරුණු ඇතුලත් වෙනවාද නැද්ද ?

උ නැත.

ප ඔබගේ දැනීමේ හැටියට ජනාධිපතිවරයා මඩකලපුව ප්‍රදේශයේ සංචාරයක් 2019/04/12 වෙනිදින සිදුකරන ලද අවස්ථාවක මෙම X 94 දරන වාර්තාවේ සඳහන් තොරතුරු ඔබට අනුව අවශ්‍ය තොරතුරුද නැද්ද ?

උ ඉතාමත්ම අවශ්‍ය තොරතුරු ස්වාමිනි මොකද මුස්ලිම් අන්තවාදය නැගෙනහිර පළාතේ තමයි බහුලව පැතිරිලා තියෙන්නේ මුස්ලිම්වරුන් අපි යන්න හිටියේ මඩකලපුවට . ගියේ මඩකලපුවට 4/12 වෙනිදා මේ තොරතුර මට 10 වෙනිදා ලැබුනානම් අනිවාර්යයෙන්ම ජනාධිපතිතුමාව රැගෙන යන එක වලක්වාගන්නට ඉඩ තිබුනා ස්වාමීනි

මින් පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි .

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 2.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : දැන් ගරු ජනාධිපතිතුමා, ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ඔය 2019.04.12 දින මඩකලපුවේ සංචාරය කළාද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ සඳහා ජනාධිපති ආරක්ෂක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති වශයෙන් ඔබ එම සංචාරය අනුමත කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : යම් හෙයකින් ඔබ ඉදිරියේ තිබෙන මේ X-94 සහ C-04(b) ලේඛනයේ සඳහන් තොරතුරු ඔබ වෙත 2019.04.10 වන දින පත් වූවානම් මෙම නිල සංචාරය ඔබ විසින් අනුමත කරනවද නැද්ද?

පි : අනිවාර්යයෙන්ම මා ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කරලා ඒක අවලංගු කරනවා. එතුමා මාර්ගයෙන් බැරිනම් මා ආරක්ෂක ලේකම්තුමාට හෝ පොලිස්පතිතුමාට හෝ මේ සම්බන්ධයෙන් දැනුම් දීලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නවා ස්වාමීනි.

ප්‍ර : කරුණාකර නැවත ඔබේ පිළිතුර කියන්න?

පි : අනිවාර්යයෙන්ම මම මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කරලා මේ සංචාරය අවලංගු කරනවා. එසේ එතුමා එකඟ නොවුණොත් මම ආරක්ෂක ලේකම්තුමාට හෝ පොලිස්පතිතුමාට එතුමන්ලාව දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් ඒ හරහා අවශ්‍ය පියවර ගන්නවා ස්වාමීනි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : රාජ්‍ය බුද්ධි අංශය මෙම නොදැන්වීම මත ජනාධිපතිවරයාගේ ජීවිත ආරක්ෂාව පවා අවධානම් තත්ත්වයකට පත්වෙලා තියෙනවද? මෙවැනි තොරතුරක් නොදැන්වීමෙන්?

පි : ස්වාමීනි ඒ තොරතුර ලැබුණා නම් හොඳයි ස්වාමීනි.

ප්‍ර : නැහැ නොදැන්වීමෙන්?

පි : නොදැන්වීම තුළින් යම් අවදානම් තත්ත්වයකට පත්වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : එය බුද්ධි සේවයේ නොසැලකිලිභාවයක් මත සිදු වෙලාද?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි 04.10 වෙනකොට මේ තොරතුර රාජ්‍ය බුද්ධි තොරතුරු සේවයට තිබුණා නම් එම තොරතුර මා වෙත දැනුම් දීම යුතුකමක්ව තිබුණා ස්වාමීනි.

ප්‍ර : යුතුකමක් නෙමෙයි ඒක අනිවාර්ය දැනුම් දීමක් විය යුතුයිනේ?

පි : අනිවාර්යයි ස්වාමීනි. එහෙමයි.

ප්‍ර : වගකීමක්?

පි : වගකීමක් ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඇයි ඔබ එම තොරතුර අනිවාර්යයෙන්ම ජනාධිපති ආරක්ෂාව දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති වන ඔබ වෙත දැනුම් දියයුතු බව සඳහන් කරන්නේ?

පි : ස්වාමීනි මා රාජ්‍ය බුද්ධි සේවයෙන් තර්ජිත විශ්ලේෂිත වාර්තාවක් කැඳවන්නේ මෙවැනි සියුම් තොරතුරු බලාපොරොත්තුවෙන්මයි. මොකද අපට නොලැබෙන, අපිට නොපෙනෙන බුදධි තොරතුරු සම්බන්ධයෙන් තක්සේරුවක් ලබා ගැනීමටයි රාජ්‍ය බුද්ධි තොරතුරු සේවය, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය, විශේෂ කාර්යාංශය වැනි විශේෂිත ආයතනවලින් අපි තොරතුරු වාර්තා කැඳවන්නේ. ඉතිං ඒ වගේ තැනකින් කැඳවනකොට එම තොරතුරක් එවැනි විශේෂිත නිශ්චිත තොරතුරක් තියෙනවා නම් එය අතිගරු ජනාධිපතිතුමාගේ සහ ඒ උත්සවයට සහභාගී වන අනෙකුත් ප්‍රභූවරුන්ගෙත්, මහජනතාවගෙත් ආරක්ෂාව සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම වැදගත් වෙනවා ස්වාමීනි.

ප්‍ර : X-97 දරන වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ කවුරු වෙතද?

පි : එවකට නියෝජ්‍ය පොලිස්පතිව හිටිය මා වෙත.

ප්‍ර : කවුරු විසින්ද ඉදිරිපත් කරලා තිබෙන්නේ?

පි : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - රාජ්‍ය බුද්ධි සේවාව, නිලන්ත ජයවර්ධන මහතා විසින්.

ප්‍ර : ඔහු එය අත්සන් කරලා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සන හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවද?

පි : මට ...,

ප්‍ර : නැහැ. කමක් නැහැ.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : ඔබ ජනාධිපති ආරක්ෂක අංශයේ සේවයේ යෙදිලා ඉන්නකොට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ ලිපි කලින් ලැබිලා තියෙනවද?

පි : ලැබෙනවා ස්වාමීනි. දිගටම ලැබෙනවා.

ප : එතකොට ඒ කාලයේදී අධ්‍යක්ෂ - රාජ්‍ය බුද්ධි සේවයේ කවුද සේවය කෙරුවේ?

පි : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - නිලන්ත ජයවර්ධන මහතා.

ප : එතකොට ඔබ නිලන්ත ජයවර්ධන - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ අත්සන කලින් දැකලා තියෙනවාද?

පි : දැකලා තියෙනවා ස්වාමීනි. කෙටි අත්සනක් දාලා තියෙන්නේ. සීල් එක ගහලා තියෙනවා. මම හිතන්නේ මේ අත්සන තමයි ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප : මෙවැනි බුද්ධි වාර්තා ඔබ වෙත ඉදිරිපත් කරන්නේ කිසියම් නිශ්චිත ක්‍රියාමාර්ගයක් යටතේද?

පි : එහෙමයි ස්වාමීනි. නිශ්චිතවම අපි ඒ ජනාධිපතිතුමාගේ සංචාරය වෙනුවෙන්ම සකස් කළ විශේෂිත තක්සේරු වාර්තාවක්.

ප : මෙය ඔබ විසින් යොමු කරන ලද ඉල්ලීමකට ලැබුණු පිළිතුරු වාර්තාවක්ද?

පි : එහෙමයි.

ප : ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් යොමු අංකයක් X-97 ත් සඳහන් වෙනවද?

පි : මෙහි සඳහන් වෙලා නැහැ. ආ එහෙමයි ස්වාමීනි. තියෙනවා. 2019.04.01 වෙනිදා මෙම සංචාරය පිළිබඳව මා දැනගත් ප්‍රථම අවස්ථාවේම, ඒ කියන්නේ අප්‍රේල් 01 වෙනිදා මා දැනගත් ප්‍රථම අවස්ථාවේම මා D/PSD/4283/04/2019 යටතේ ලිපියක් යවලා තියෙනවා.

ප : නැවත කරුණාකර ඒ අංකය කියන්න?

පි : 2019.04.01 වෙනි දිනැති අංක D/PSD/4283/04/2019 දරන ලිපියෙන් මා මෙම සංචාරය සම්බන්ධයෙන් නිශ්චිත තක්සේරු වාර්තාවක් ඉල්ලුම් කරලා තියෙනවා ස්වාමීනි.

ප : ඒ අනුව ලැබුණු පිළිතුර තමයි මේ X-97 දරන වාර්තාව?

පි : එහෙමයි.

ප : ඒ ඉල්ලීම කළේ කාගෙන්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම ඉල්ලීම කළේ රාජ්‍ය බුද්ධි සේවය භාර අධ්‍යක්ෂගෙන්. එහෙම නැත්නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගෙන්.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : නම කියන්න?

පි : නිලන්ත ජයවර්ධන මැතිතුමාගෙන්.

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ විසින් ලිඛිතව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍ය බුද්ධි සේවයේ නැත්නම් අධ්‍යක්ෂගේ....?

පි : අධ්‍යක්ෂගේ නමින් තමයි යවන්නේ ස්වාමීනි.

ප්‍ර : හරි. අධ්‍යක්ෂගේ නමින් එහෙම ලිඛිතව කරුණු ඉල්ලීමට අමතරව දුරකථනයෙනුත් ඔහු හා සම්බන්ධ වෙලා තියෙනවද?

පි : දුරකථනයෙන් ස්වාමීනි විශේෂිත අවස්ථාවල සම්බන්ධ වෙනවා.

ප්‍ර : එතකොට අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවයට විශේෂ තොරතුරක්, සංවේදී තොරතුරක් තිබෙනවා නම් ජනාධිපති ආරක්ෂක අංශය දැනුවත් කළයුතුව තිබෙන ඒක ඔබටය දුරකථනයෙන් දැනුම් දීමේ අපහසුතාවයක් තිබෙනවද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : ඔබ ඔහු සමඟ මීට කලිනුත් සම්බන්ධයි?

පි : සම්බන්ධයි.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : අප්‍රේල් 01 වෙනිදා ඔබ ඉල්ලා සිටිය නිසා එයා අප්‍රේල් Jock එකක්වත් කියලා හිතුවද?

පි : ස්වාමීනි සාමාන්‍ය වශයෙන් ඔය යවන ලිපි සම්බන්ධයෙන් හැම දවසකම යවනවා ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : මෙම X-97 ලේඛනයේ දැනටමත් X-97(b) ලෙස සළකුණු කර තිබෙන කොටස කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනවා?

පි : මඩකලපු දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක ජාතික තවුහිද් ජමාත්, National Thawheeth Jamath - NTJ සංවිධානයේ හිටපු නායක එම්.සී.එම්. සහරාන් යන අය විසින් මෙරට දේශපාලන ක්‍රමය, ප්‍රජාතන්ත්‍රවාදය, නීති පද්ධතිය සහ අන්‍ය ආගමිකයන් පිළිබඳව විවේචනාත්මකව අදහස්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දක්වමින් වීඩියෝ පට සිය සමාජ ජාල ගිණුම් හරහා ප්‍රචාරය කර ඇති බවත්, සංවිධානයේ මතවාදයට නැඹුරු වූ පිරිස් අදාළ වීඩියෝ පට පරිශීලනය කර ඇති බවටත් අනාවරණය වී ඇත. එසේම මොහු විසින් සිය සමාජ ජාලා ගිණුම් හරහා වීඩියෝ පට යොමු කරමින් අල්ලාහ් දෙවියන් විසින් යොමු කරන ලද දර්ශනය ප්‍රතික්ෂේප කරන අයවළුන් කුෆර් හෙවත් කාෆිර්වරුන් ලෙසත් සඳහන් කරමින් ඔවුන් විනාශ කර ඉස්ලාමය ආරක්ෂා කළයුතු බවටත් ප්‍රචාරය කර ඇත.

ප්‍ර : මෙම සහරාන් යන පුද්ගලයා ගැන රාජ්‍ය බුද්ධි සේවාව ඔබ වෙත X-97(b) මගින් දැනුවත් කළාට අර මා පෙර කියා සිටි X-94 දරන ලේඛනයේ සිදු වියහැකි මරාගෙන මැරෙන ප්‍රහාරය ගැන කිසිවක් සඳහන් කර තිබෙනවද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : මෙම X-97(b) කියන කොටසට පසුව මෙම ලේඛනයේ තවත් ශීර්ෂයක් යටතේ කරුණු ඉදිරිපත්, බුද්ධි තොරතුරු ඉදිරිපත් කර තිබෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ උප ශීර්ෂය?

පි : නැගෙනහිර පළාත තුළ අන්තවාදී සංවිධානවල ක්‍රියාකාරිත්වය.

ප්‍ර : මෙම ශීර්ෂය යටතේ සංවිධානයන් හෝ සංවිධානවල අන්තවාදී සංවිධානවල නම් සඳහන් කර තිබෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. National Thawheeth Jamath සංවිධානයේ සහ සුන්නතු වල් ජමාත් IASWJ සංවිධානයේ සාමාජිකයන් අතර ඇති වූ ගැටුම්කාරී තත්ත්වයක් ගැන සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ 2017.03.17 වෙනිදා සිදු වූ ගැටුම්කාරී තත්ත්වය ගැන?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මෙම අන්තවාදී සංවිධානවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මෙම උප ශීර්ෂය යටතේ දක්වා තිබෙන්නේ නැත්නම් ඔබට වැටහුණේ මෙය බරපතල තත්ත්වයක් ලෙසද නැත්නම් ඒක එච්චර සුළු ඒ කියන්නේ එච්චර ගණන් ගතයුතු නැති තත්ත්වයක් ලෙසද?

පි : සාමාන්‍ය බුද්ධි තොරතුරක තිබෙන බුද්ධි තොරතුරක් තමයි මෙයින් සඳහන් කරලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : එමඟින් ජාතික ආරක්ෂාවට හෝ ජනාධිපතිවරයාගේ ආරක්ෂාවට තර්ජනයක් වියහැකි බව සඳහන් කර තිබෙනවද?

පි : කිසිම සඳහනක් නැහැ ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : X-94 ලේඛනයේ සඳහන් ජාතික තවුහිද් ජමාත් නායක සහරාන් මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමේ හැකියාව තිබෙන බව මෙම වෙද්දිවත් සඳහන් කරලා තියෙනවද?

පි : නැත ස්වාමීනි.

(මේ අවස්ථාවේදී X-97 ලේඛනයේ නැගෙනහිර පළාත තුළ අන්තවාදී සංවිධානවල ක්‍රියාකාරිත්වය යන උප ශීර්ෂය යටතේ තිබෙන කොටස X-97(d) ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)

ප්‍ර : මෙම X-97 ලේඛනයේ X-97(c) ලෙස දැනටමත් ලකුණු කර ඉදිරිපත් කර ඇති අවි ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම යන උප ශීර්ෂය යටතේ තිබෙන කොටස වෙත මා ඔබගේ අවධානය යොමුකර සිටිනවා?

පි : අවි ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම්, යුධමය වාතාවරණය පැවති සමයේදී මෙන්ම මානුෂික මෙහෙයුමෙන් පසුවද ප්‍රදේශය ආශ්‍රිතව පුපුරණ ද්‍රව්‍ය සහ විශාල අවි ආයුධ ප්‍රමාණයක් සොයාගෙන ඇත. වර්තමානය වනවිටද එසේ සොයා නොගන්නා ලද අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය තිබීමේ හැකියාව බැහැර කළ නොහැක. 2018.07.05 වෙනි දින මඩකලපුව පොලිස් වසමේ, කස්ටම් පාරේ, නැගෙනහිර පළාත් ආණ්ඩුකාර නිල නිවස පිහිටි ඉඩමේ පිටුපස ඇති පර්චස් පහක බිම් ප්‍රමාණයක තිබී SFT-87 වර්ගයේ ජීව බෝම්බ දෙකක් හමු වී ඇත. 2018.04.28 වන දින මඩකලපුව යුධ හමුදා බුද්ධි අංශය මගින් කරදියනාරු පොලිස් වසමේ කරදියකුලම් කැලෑ ප්‍රදේශයක තිබී T-56 අවිය සහ එම වර්ගයේ හිස් පතොරම් තොගයක් සොයාගෙන ඇත.

ප්‍ර : දැන් මෙම X-97 කියන බුද්ධි තොරතුරේ සඳහන් කරලා තියෙනවද වනාතවිල්ලුවේදී සොයා ගන්නට යෙදුණු අර විශාල ප්‍රමාණයක් වූ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන්?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : මෙම X-97 සඳහන් කරලා තිබෙනවද වවුනතිව්වල සිදු වූ පොලිස් නිලධාරී ඝාතනය ගැන?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : ඔබගේ වැටහීමට අනුව ජනාධිපතිවරයා ඒ කියන්නේ රටේ මුල් පුරවැසියාගේ ආරක්ෂාව සපයන ප්‍රධාන නිලධාරියා වශයෙන් ඔබ සළකනවද එම තොරතුරු අත්‍යවශ්‍ය තොරතුරු කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ එම තොරතුරු X-97 දරන ලේඛනයේ තිබුණා නම්, ඔබ ජනාධිපතිවරයාට මෙම නිල සංචාරය සඳහා යාමට අවශ්‍ය ආරක්ෂක අනුමැතිය ලබා දෙනවාද?

පි : නැත ස්වාමීනි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබගෙන් දැන ගැනීම පිණිස අහන්නේ. ආරක්ෂක විධිවිධාන, ආරක්ෂක උපදෙස් මත සංචාරයන් යාමට නොයාමට උපදෙස් දුන්න අවස්ථාවලත් ජනාධිපතිවරුන් සංචාරවල යෙදෙන අවස්ථාවල් තියෙනවද?

පි : සමහර අවස්ථාවල යෙදෙන අවස්ථාවල් තියෙනවා ස්වාමීනි. හැබැයි බොහෝ දුරට සියයට අනූවක්ම ඒ සංචාරයවල් දැනුම් දුන්නට පස්සේ යන්නේ නැහැ ඒ වාතාවරණය තේරුම් අරගෙන. යනවයි කියපු අවස්ථාත් තියෙනවා ස්වාමීනි. එතනදී අපි විශේෂ විධිවිධාන යොදා ගන්නවා ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

(දැනටමත් C-743 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා)

ප්‍ර : මා ඔබට කියා සිටියොත් මෙය 2019 අප්‍රේල් මාසයේ ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබගේ මූලිකත්වයෙන් පැවති ආරක්ෂක බුද්ධි සාකච්ඡාව සම්බන්ධයෙන් වන ඔබගේ සටහන කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි.

ප්‍ර : මෙය 2019.04.18 වෙනි දින තමයි ඔබ විසින් පවත්වලා තිබෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : මෙම C-743 දරන ලේඛනයේ රාජ්‍ය බුද්ධි සේවයේ පො.ප. ජනක සෙනෙවිරත්න විසින් ඉදිරිපත් කරන කරුණු යටතේ ISIS සංවිධානය සම්බන්ධයෙන් විස්තරයක් ඇතුළත් වෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : කුමක්ද සඳහන් වන්නේ?

පි : කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ISIS සංවිධානය සම්බන්ධ National Thawheeth Jamath සංවිධානයේ නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් මෙරට

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

අන්‍ය ආගමිකයන් ඝාතනය කළයුතු බවට තම අනුගාමිකයන් දැනුවත් කර ඇති බව.

ප : මෙම තොරතුර ඔබට ලැබුණම ඔබ ඒ සම්බන්ධයෙන් කිසියම් සටහනක් එහෙම නැත්නම් ඔබගේ නිරීක්ෂණයක් මේ C-743 ට ඇතුළත් කර තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. මෙම සටහනේම පවතින දේශපාලන වාතාවරණය හා ඉදිරියේදී මැතිවරණ සමයක් එළඹෙන බැවින් ප්‍රභූවරයා ආරක්ෂා කිරීමේදී බුද්ධි තොරතුරු මත පදනම්ව ක්‍රියාත්මක වීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී. එසේම ISIS සංවිධානයට සම්බන්ධ පුද්ගලයන් තම අතට හසුවන කුමක් හෝ යමකින් මිනිස් ඝාතන සිදු කිරීමේ අරමුණින් සිටින බැවින් බුද්ධි තොරතුරු ඉතා වැදගත් වන බව මා දන්වන ලදී.

ප : එය දැනටමත් C-743(a) ලෙස ලකුණු කර ඉදිරිපත් කර තිබෙනවා. මෙම රැස්වීම්වලදී ඔබ වෙත මෙම රැස්වීමේදීවත් ඔබව දැනුවත් කරන්න යෙදුණද මා පෙර සඳහන් කරපු වවුනතිව්වල සිදු වූ පොලිස් නිලධාරී ඝාතනය, 2018 දෙසැම්බර් 23 සහ 26 දිනවල සිදු වූ ආගමික පිළිමවලට හානි කිරීම සම්බන්ධයෙන්, 2019.01.16 වෙනි දින වනාතවිල්ලුවේදී සොයා ගන්නට යෙදුණු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන්, 2019 මාර්තු මාසයේදී පමණ එම පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමට තොරතුරු සපයන්නට යෙදුණු තස්ලිම් කියන තොරතුරුකරුට වෙඩි තැබීම සම්බන්ධයෙන් සහ 2019.04.16 වෙනි දින කාත්තන්කුඩිය ප්‍රදේශයේදී සිදු වූ පරීක්ෂණාත්මක පිපිරවීම සම්බන්ධව තොරතුරක් සඳහන් වෙනවද?

පි : නැත ස්වාමීනි.

ප : දැන් මේ තොරතුරුත් ඔබ වෙත ඉදිරිපත් කරන්නට යෙදුණා නම් මේ C-743 ඔබගේ නිරීක්ෂණය වෙනස් වෙනවද?

පි : අනිවාර්යයෙන්ම මා ඒ සම්බන්ධයෙන් සඳහන් කරනවා.

ප : දැන් මෙම බෝම්බ පිපිරීම සිදුවන අවස්ථාවේදී ජනාධිපතිවරයා ලංකාවේ සිටියද?

පි : නැත ස්වාමීනි.

ප : ඔහු විදේශගතවද සිටියේ එහෙනම්?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඇයි ඔබ එම සංචාරය සඳහා එහෙනම් සහභාගී නොවුණේ?

පි : සාමාන්‍යයෙන් පෞද්ගලික සංචාරයක් යන අවස්ථාවල ඒකට අවශ්‍ය සුදුසුම ආරක්ෂක නිලධාරීන් කිහිප දෙනෙක් යොදවලා මා ඒ සංචාරයෙන් වැළකී සිටීම තමයි සාමාන්‍ය සිරිත ස්වාමීනි. ඒ

Director's Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ පෞද්ගලික සංචාරයක් නිසා මා ඒ සංචාරයට සහභාගී වුණේ නැහැ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු අතිගරු ජනාධිපතිතුමා මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ඒ 2019 අප්‍රේල් මාසයේදී යෙදුණු විදේශීය සංචාරය යොදා ගත්ත දිනය කවද්ද? ඒ කියන්නේ ගිය දිනය නෙමෙයි මම කියන්නේ ගිය දිනය නෙමෙයි. එම සංචාරය තහවුරු කර ගැනීමක් වුණේ කවද්ද?

පි : තහවුරු කර ගැනීම මට නිශ්චිතවම දිනය මතක නැහැ. අප්‍රේල් මාසේ දිනයක තමයි මොකද පෞද්ගලික සංචාරයක් නිසා ස්වාමීනි වැඩි කාලයක් නැතුව තමයි කෙටි දැනුම් දීමකින් තමයි යන්න සූදානම් වුණේ ස්වාමීනි. මගේ මතකයේ හැටියට අප්‍රේල් මාසයේම තමයි යන්න ලැහැස්ති වුණේ.

ප්‍ර : ඔබගේ මතකයේ හැටියට අප්‍රේල් මාසේ අළුත් අවුරුද්දට ඉස්සරලද පස්සෙද?

පි : අළුත් අවුරුද්දට කලින් ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට C-743 කියලා ලේඛනයක් පෙන්නුවානේ දැන්?

පි : එහෙමයි.

ප්‍ර : ඒක 2019 අප්‍රේල් මාසේ 18 වෙනි දින තිබ්බ රැස්වීමේ වාර්තාව නේද?

පි : එහෙමයි.

ප්‍ර : ඔය වාර්තාවේ සහරාන් හෂීම්ගේ නම සඳහන් වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සහරාන් හෂීම්ගේ නම සඳහන් වෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට සහරාන් හෂීම්ගේ නම C-743 සඳහන් කරලා තිබ්බත් අර ඔබට කලින් පෙන්වපු C-4(b) සහ X-94 දරන ලේඛනවල තිබ්බ තොරතුරු, සහරාන් හෂීම් ගැන තිබ්බ තොරතුරු ඕකේ දැනුවත් කිරීමක් වුණේ නැහැ?

පි : දැනුවත් කිරීමක් වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා ගරු මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා 2019 අප්‍රේල් මාසේ විදේශගත වුණා කියලා?

පි : එහෙමයි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට යම්කිසි අවස්ථාවක ජනාධිපතිවරයා විදේශගත වුණහම පස්සේ යම්කිසි අවස්ථාවක රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන ඔබට දුරකථන ඇමතුමක් ගන්නවද?

පි : විදේශගත වෙලා ඉන්නැද්දී දුරකථන ඇමතුමක් ගත්තා මතකයි ස්වාමීනි.

ප්‍ර : කවද්ද ඒ දුරකථන ඇමතුම ඔබට නිලන්ත ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ලබා ගත්තේ?

පි : මම හිතන්නේ ප්‍රහාරයට දිනකට හෝ දෙකකට ප්‍රථමයෙන්.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රහාරය සිදු වුණේ 21?

පි : 21. 20 වෙනිදා රාත්‍රියේ හෝ 19 වෙනිදා රාත්‍රියේ තමයි මගේ මතකයේ හැටියට.

ප්‍ර : ඔහු ඔබට දුරකථන ඇමතුම ලබා ගත්තේ ඔබගේ ජංගම දුරකථනයටද?

පි : මගේ ජංගම දුරකථනයට ස්වාමීනි.

ප්‍ර : එවකට ඔබ පාවිච්චි කරපු ජංගම දුරකථනයේ අංකය මොකද්ද?

පි : 071-8591898

ප්‍ර : එතකොට ඒ දුරකථනට තමයි ඒ ඇමතුම ලැබුණේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඇමතුම අරගෙන ඔහු මොනවද ඔබගෙන් ඇහුවේ?

පි : මගේ මතකයේ හැටියට ස්වාමීන් වහන්සේ ඇහුවේ ජනාධිපතිතුමා මම ගියේ නැත්තේ ඇයි කියලා එයා දැනගෙන හිටියේ නැහැ. මම ගිය නැත්තේ ඇයි කියලා ඇහුවම මම කිව්වා මම පෞද්ගලික සංචාරයක් නිසා මම ගියේ නැහැ කියලා. ඊට පස්සේ ඇහුවා කවද්ද ජනාධිපතිතුමා එන්නේ කියලා. ඒ තොරතුරු තමයි ඇහුවේ ස්වාමීනි.

ප්‍ර : කවද්ද ජනාධිපතිතුමා ...?

පි : නැවත ලංකාවට එන්නේ කියලා.

ප්‍ර : ඒ තොරතුරු විමසන්න හේතුව ඔබට කිව්වේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබත් ඇහුවේ නැද්ද?

පි : සාමාන්‍ය වශයෙන් නිලන්ත ජයවර්ධන මහත්මයා මට නිතරම Calls දෙනවා. ඒකනිසා මම ඒ සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් දැක්වුවේ නැහැ ස්වාමීනි. ඒ කියන්නේ එහෙම මම ඇයි එහෙම අහන්නේ කියලා මම ඇහුවේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එතකොට ජනාධිපතිවරයා රටින් පිටව යාම පිළිබඳව බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා දැනුවත් වෙන්නේ නැද්ද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : දැනුවත් ස්වාමීනි. අනිවාර්යයෙන්ම දැනුවත්. මොකද පෞද්ගලික සංචාරයක් වුවත් ස්වාමීනි ඒ රටේ පවතින ආරක්ෂක විශ්ලේෂණ ඒ කියන්නේ ආරක්ෂිත තර්ජන විශ්ලේෂිත වාර්තාවක් මා ගෙන්වා ගන්නවා ස්වාමීනි ජනාධිපතිතුමා යාමට ප්‍රථමයෙන්. සිංගප්පූරුවේ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ වාර්තාවක් මා ගෙන්න ගන්නවා එතුමා රට යන්න කලින්.

ප්‍ර : එතකොට ඒ ගෙන්න ගන්නේ කවුරු හරහාද?

පි : ඒ ගෙන්න ගන්නේ ජාතික බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාගෙන් තමයි මම කැඳවන්නේ ස්වාමීනි.

ප්‍ර : හරි. දැන් 2019 අප්‍රේල් 20 වෙනිදා වෙනවිට ගරු මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා කොයි රටේද හිටියේ?

පි : සිංගප්පූරුවේ.

ප්‍ර : එතකොට ඔබගේ මතකයට අනුව ඒ සම්බන්ධයෙන් මොකද්ද ඒ වාර්තාවට කියන්නේ?

පි : තර්ජිත වාර්තාවක්. තර්ජිත විශ්ලේෂිත වාර්තාවක්.

ප්‍ර : තර්ජිත විශ්ලේෂිත වාර්තාවක් ඔබ රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ හරහා ලබා ගත්තද?

පි : මම හිතන්නේ ස්වාමීනි මට හරි මතකයක් නැහැ. අනිවාර්යයෙන්ම අපි විදේශ සංචාරයකට ප්‍රථමයෙන් තර්ජිත වාර්තාවක් කැඳවනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ සාමාන්‍ය ක්‍රමවේදය...?

පි : සාමාන්‍ය ක්‍රමවේදයට අනුව කැඳවනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට එහෙම කැඳවන්නේ මොකටද කියලා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ දන්නවා?

පි : දන්නවා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ ඔබගේ මතකයේ හැටියට මේ ජනාධිපතිවරයාගේ සිංගප්පූරු සංචාරයට පෙර ...?

පි : කැඳවන්න ඇති ස්වාමීනි ඒ වාර්තාවත් ඇති ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කියන තොරතුරු ඔබ කියන සාක්ෂියට අනුව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂට දැනුමක් නොමැතිව ජනාධිපතිවරයාට රටින් පිටවීම තිබෙන අවකාශය අඩුයි කියලද?

පි : අඩුයි. අනිවාර්යයෙන්ම දැනුවත් වෙනවා ස්වාමීනි.

ප්‍ර : අනිවාර්යයෙන්ම දැනුවත් වෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ ඒ විදියට තර්ජිත විශ්ලේෂිත වර්තාවක් ගන්නකොට අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවයට දන්වනවද ගරු ජනාධිපතිතුමා මේ දවසේ ඉඳලා මේ දවස වෙනකම් ඒ පිටරට ඉන්නවා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : විශේෂිතව සඳහනක් කරන්නේ නැහැ ස්වාමීනි. ඒක ආරක්ෂාව සම්බන්ධයෙන් අහවල් රටේ සංචාරයක් යාමට නියමිතයි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය බුද්ධි තොරතුරු ලබා දෙන්න කියලා තමයි ඉල්ලන්නේ ස්වාමීනි.

ප්‍ර : සාමාන්‍යයෙන් ඒ වගේ ගමනකට කොච්චර කාලයකට ඉස්සරලද ඔබ ලබා ගන්නේ තොරතුරු?

පි : අපිත් සාමාන්‍යයෙන් ස්වාමීනි ඒ තොරතුර අප වෙත ලැබුණ වහාම වගේ අපි ඉල්ලීමක් කරනවා.

ප්‍ර : ඔබට ඒ ගමන පිළිබඳ තොරතුරු ලැබුණ ...?

පි : වහාම අපි ඒ පිළිබඳ වාර්තාවක් කැඳවනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ජනාධිපතිවරයා ඒ විදියට පිටරටක සංචාරයක පුද්ගලික හෝ රාජ්‍යය සංචාරයක යෙදෙන අවස්ථාවලදී ඔහුට ක්ෂණිකව ඔහු සම්බන්ධ කර ගැනීමේ ක්‍රමවේදයක් තියෙනවද?

පි : ස්වාමීනි අපි සම්බන්ධ ....,

ප්‍ර : විස්තර කරන්න එපා ක්‍රමවේදයක් තියෙනවද?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ක්‍රමවේදයක් තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : එවැනි ක්‍රමවේදයක් තියෙන බව රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ දන්නවද?

පි : දන්නවා ස්වාමීනි.

ප්‍ර : දන්නවා?

පි : එහෙමයි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමනි, ඔබ ජනාධිපතිවරුන් කිහිප දෙනෙකුගේම ආරක්ෂාව සම්බන්ධයෙන් දිගටම කටයුතු කරපු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඒ අනුව බලනකොට ඔබට මේ මොහොතේදී හිතෙනවද අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් ඔබ කිසිම දෙයක් නොදැන සිටීම ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉතාම තදබල අනතුරක් හැටියට දකිනවද?

පි : එහෙමයි ස්වාමීනි. අවාසනාවන්ත සිද්ධියක් ස්වාමීනි. කණගාටුවට කරුණක්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : දැන් ඔබට හිතෙන විදියට ඇයි මෙහෙම වුණේ? මෙච්චර ප්‍රබල තොරතුරක් ජනාධිපති ආරක්ෂක අංශයේ ප්‍රධානියා හැටියට ඉන්න ඔබටවත් දැන ගන්න ඉඩක් නොලැබුණේ ඇයි මෙහෙම වුණේ?

පි : ඒ ගැන මට කියන්න තේරෙන්නේ නැහැ ස්වාමීනි. මා දැන ගතයුතු තොරතුරක් අනිවාර්යයෙන්ම.

ප්‍ර : දැන් ඔබ කියන්නේ අප්‍රේල් 20 වෙනිදා හෝ නිලන්ත ජයවර්ධන මහත්මයා කථා කරපු වෙලාවේවත් අඩුම තරමින් මෙවැනි තර්ජනයක් තියෙනවා කියලා හෙට බෝම්බයක් පුපුරනවා කියන එක ඔබ වෙත දැනුම් දීමක් කළේ නැහැ නේ?

පි : කිවයුතුව තිබුණා ස්වාමීනි. ඒක දැන ගත්තේ නැහැ.

ප්‍ර : දැනුම් දුන්නේ නැහැ?

පි : එහෙමයි. මොකද එසේ දැන ගත්තා නම් ස්වාමීනි පහුවෙනිදා උදේ ඒ කියන්නේ 21 වෙනිදා අපි අපේ පුහුණු පාසලේ, මොකද ජනාධිපතිතුමා ලංකාවේ නැහැ. සිංහල අවුරුදු පැවතිච්ච කාලයක්. අපිගොඩක් වෙලාවට අපි ගොඩක් මහන්සියෙන් වැඩ කරන කණ්ඩායම් එකතු වෙලා මේ ආරක්ෂක සේවාව පවත්වාගෙන යන්නේ. ඒ සියළුම ඒ කියන්නේ විශේෂ කාර්ය බලකාය, ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය, සාමාන්‍ය පොලිස් නිලධාරීන්, ඒකට සම්බන්ධ ගුවන් හමුදා සහ යුධ හමුදා නිලධාරීන් ඒ අයත් එක්ක අපි අවුරුදු උත්සවයක් සංවිධානය කරලා තිබුණා අපේ කුඹුක ප්‍රභූ ආරක්ෂක පුහුණු මධ්‍යස්ථානයේ. ඒක සංවිධානය කරලා තිබුණේ 21 වෙනිදා උදේ. ඉතිං ඔය තොරතුරක් අපිට දන්නවා නම් අපි එහෙම උත්සවයක් කවදාකවත් සංවිධානය කරන්නේ නැහැ. ඔය ප්‍රහාරය එල්ල වෙනකොට, මට පණිවිඩය ලැබෙනකොට අපි උත්සව අවස්ථාවේ හිටියේ. සිංහල අවුරුදු උත්සවයේ අපේ ඒ කියන්නේ කුඹුක පුහුණු පාසලේ.

ප්‍ර : ප්‍රහාරයක් වෙලා කියලා දැන ගන්නකොට ඔබට මොනවද හිතුණේ?

පි : දැනගන්නකොට, ඇත්තටම විශ්මිත වුණා ස්වාමීනි. එකපාරටම එහෙම ප්‍රහාරයක් ගැන සඳහන් වෙනකොට.

ප්‍ර : ඒ කියන්නේ රටේ ජනාධිපතිවරයාගේ ආරක්ෂාව සලසන ප්‍රධානම නිලධාරියා ඔබනම්, ඔබත් ඒ පිළිබඳව අඳුරේ හිටියා නම් ඒ කියන්නේ එතන ලොකු හිඩැසක් සිදුවෙලා තියෙන බව?

පි : ගැටළුවක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : එපමණක් නොවෙයි. ඔබට හිතෙන්නේ නැද්ද ජනාධිපතිවරයාගේ ආරක්ෂාව මෙපමණ අනතුරේ නම් සමස්ත ජාතියේම ආරක්ෂාවත් මුළුමනින්ම අනතුරේ හෙළලා තියෙනවයි කියලා?

පි : එහෙම කියන්න පුළුවන් ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : එතකොට කොතනද වරද ඔබට පේන විදියට? කාගෙද වරද ඔබට පේන විදියට? හදවතට එකඟව අපිට නිකම් දැනුම් දෙන්න බලන්න?

පි : එම තොරතුරු දැනගත් අය ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරපු ආකාරය සම්බන්ධයෙන් වගකීමක් තියෙනවා ස්වාමීනි.

ප : දැනගෙනත් ඔබ වැනි ඉහළ නිලධාරීන්ට දැනුවත් නොකර එක වරදක් නේ?

පි : වරදක් ස්වාමීනි.

බොහොම ස්තුතියි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : සාක්ෂිකරු තමන්ට මෙම අනතුරු පිළිබඳ දැනුම් දීමක් ලැබුණා නම් තමන් ඒ පිළිබඳ ජනාධිපතිවරයාට දැනුම් දෙනවද?

පි : අනිවාර්යයෙන්ම දැනුම් දෙනවා ස්වාමීනි.

ප : ජනාධිපතිතුමා අප්‍රේල් මාසේ මෙම සංචාරයට කලින් සැළසුම් කළ එක් වරක් එය අවලංගු කර නැවත ආපහු සංචාරයේ යෙදුණද?

පි : එහෙමයි ස්වාමීනි. ඒ සංචාරය කලින් සැළසුම් කරලා තිබිච්ච සංචාරයක්. ඒක වැළකිලා නැවත ආපහු ....,

ප : ඒ දින කියන්න බලන්න. අප්‍රේල් මාසේම ...?

පි : මම හිතන්නේ ඊට කලින් මාසේ. මාර්තු හරි ඊට කලින් ....,

ප : අප්‍රේල් 06 වෙනිදා වගේ දිනක යාමට සූදානම් වෙලා තිබ්බා ඊට පසු එය අවලංගු කර නැවත 16 වගේ....?

පි : එහෙමයි ස්වාමීනි. එහෙමයි.

ප : එහෙම සිද්ධියක් වුණාද?

පි : එහෙමයි ස්වාමීනි. එහෙම සිද්ධියක් වුණා ස්වාමීනි. තර්ජිත විශ්ලේෂිත වාර්තාවත් මම හිතන්නේ කැඳවුවේ මම මුල් අවස්ථාවේ. මොකද මගේ මතකයේ හැටියට.

ප : ඇයි එහෙම මුල් අවස්ථාවේදී අප්‍රේල් මාසයේ මුල් කාලයේදී එය අවලංගු කරලා දෙවෙනි ඊට පසු 10 වෙනිදට පසු ආපසු ජනාධිපතිතුමා විදේශගත වුණේ?

පි : මම හිතන්නේ පෞද්ගලික හේතුවක් නිසා තමයි ස්වාමීනි ඒ සංචාරය කල් දාන්න වුණේ. මොකද අපි නිශ්චිත තොරතුරු විමසන්නේ නැහැ ස්වාමීනි පෞද්ගලික සංචාරයක් සම්බන්ධයෙන්. ඒත් සංචාරය කල් දැමුව කථාව සත්‍යයක් ස්වාමීනි.

ප : ඒ කුමන හේතූන් මත එවැනි දෙයක් සිද්ධ වුණාද කියන එක ...?

FAIR COMMENT BY JEZEEM

පි : දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : තමන්ලා දන්නේ නැහැ?

පි : එහෙමයි.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : මහත්මයා මේ බෝම්බය පිපිරීමෙන් පස්සේ ඒක ජනාධිපතිතුමාට දැන්වුවේ ඔබද?

පි : සිද්ධිය දැනගත් වහාම මම දැනුම් දුන්නා ස්වාමීනි. මම දැනුම් දුන්නේ ඒ දුරකථන මාර්ගයෙන් මම දැනුම් දීමක් කළා ස්වාමීනි.

ප්‍ර : ඒ වෙනකොට ජනාධිපතිතුමා මේ සිද්ධිය සම්බන්ධයෙන් දන්නේ නැහැ?

පි : මම හිතන හැටියට දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එතුමා මොකද්ද කිව්වේ?

පි : එතුමා ටිකක් නිශ්ශබ්ද වෙලා ඉඳලා පස්සේ කිව්වා කරුණු වාර්තා කරලා, එදා එතුමා කොහොමටත් ලංකාවට එන්න හිටියේ. ඒ සම්බන්ධයෙන් මම කිව්වා ඒ සිදුවීම සිදු වෙච්ච හැමතැනටම මම යනවා කියලා මම ඒ සම්බන්ධයෙන් තොරතුරු හොයලා කියන්නම් කියන කථාව කිව්වා. මොකුත් එතනින් එහාට කථා කළේ නැහැ. එතුමා ආරක්ෂක ලේකම්තුමාට අමතන බව දැනුම් දුන්නා ස්වාමීනි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මහත්මයා ඔබට රාජ්‍ය බුද්ධි සේවාවේ නිලන්ත ජයවර්ධන මහතා 2019.04.10 දිනයෙන් යුතුව එවලා තිබුණානේ අර Thread Assessment එකක් ඉල්ලපු එකකට පිළිතුරක් හැටියට?

පි : එහෙමයි.

ප්‍ර : ඒකේ තියෙන Islamic State සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය කියන එක කියෙව්වහම ඔබට මොකද්ද සිතුණේ?

පි : ස්වාමීනි ඔය සම්බන්ධයෙන් ඔය තොරතුර ඊට මාස හයකට පමණ කලින් ඉඳන්ම අපිට ඔය තොරතුරු සම්බන්ධයෙන් ඔය බුද්ධි සාකච්ඡාවලදී සාකච්ඡා වුණා. ඒ කියන්නේ නිශ්චිතවම නම් වශයෙන් නොවුණත් ලංකාවේ අන්තවාදී සංවිධානයේ සාමාජිකයෝ විදේශගත වෙන එක, ලෙබනනයේදී ඒ කට්ටිය පුහුණුව ලබපු ඒවා, එතකොට අපේ ලංකාවේ දෙදෙනෙක් ගුවන් ප්‍රහාරවලින් මිය ගිය එක ඒ සම්බන්ධ තොරතුරු සාමාන්‍ය බුද්ධි තොරතුරු හැටියට අපිට ලැබිලා තිබුණා ස්වාමීනි. එතකොට

Present Secretary's Copy
LEAK COMMENT BY JEZEEM

මේකත් සාමාන්‍ය බුද්ධි තොරතුරක් හැටියට තමයි ඒ තොරතුරේ තිබුණේ.

ප්‍ර : නැහැ. මම ඔබගෙන් අසන්නේ ජනාධිපතිවරුන් කිහිප දෙනෙකුගේම ආරක්ෂක ප්‍රධානියා ලෙස කටයුතු කරන ඔබ වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට IS සංවිධානයේ ශ්‍රී ලාංකික ක්‍රියාකාරිත්වය කිව්වහම සාමාන්‍ය දෙයක් හැටියටද ඒක කාලයක් තිස්සේ කථා කරපු නිසා ඔබට හැඟී ගියේ. එහෙම නැත්නම් මේක වැඩි අවධානයක් යොමු කළයුතු භයානක තත්ත්වයක් විදියටද හැඟී ගියේ?

පි : ඇත්තටම අපි ඔය වකවානුව වෙනකොට L.T.T.E. ඩයස් පෝරාවට වඩා වැඩි අවධානයක් යොමු කරලා තිබුණා ISIS සංවිධානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන්. මොකද විදේශීය රටවල සිදු වෙච්ච ප්‍රහාරයන්, ඒ වගේ අපේ කට්ටිය පුහුණුව ලබලා තියෙන තත්ත්වයන් යටතේ වැඩි අවධානයක් යොමු කරලා තිබුණා ස්වාමීනි. අපි මාසිකව බුද්ධි තොරතුරු රැස් කරන්න කණ්ඩායම් ගෙන්නුවෙත් ඔය අදාළ තොරතුරු රැස් කරන්නම තමයි.

ප්‍ර : ඔබ අතිගරු ජනාධිපතිතුමාට ඔබ එවකට මෙම අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට මෙම Islamic State සංවිධානය ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වයක් තියෙනවා කියන එක කියා තිබුණාද මෙම ලිපිය ලැබුණාට පසුව?

පි : ස්වාමීනි අපි සාමාන්‍යයෙන් අතිගරු ජනාධිපතිතුමා සමඟ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් සාකච්ඡාවට යන්නේ නැහැ Specific Information එකක් තිබුණොත් ඇරෙන්න. මොනවා හරි විශේෂ තොරතුරක් තිබුණොත් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරනවා හැර අපි ජනාධිපතිතුමාට ඒ හැම තොරතුරක්ම, ඒ කියන්නේ සාමාන්‍ය බුද්ධි තොරතුරු වශයෙන් තොරතුරු දැනුම් දෙන්නේ නැහැ. නමුත් එතුමාගේ ආරක්ෂාවට බලපාන, ඒ වගේම අපි යන ගමන් සංචාරවලදී ආරක්ෂාවට බලපාන කරුණු සම්බන්ධයෙන් කෙළින්ම කියා සිටිනවා.

ප්‍ර : අවසාන ප්‍රශ්නය මගේ. ඔබ දැනට දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස සේවය කරනවනේ 2020 ජනවාරී 01 වෙනිදා සිට.

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මේ දක්වා ඔබට නිරීක්ෂණය වුණාද ඔබගේ බුද්ධි නිලධාරීන් හරහා දකුණු පළාතේ IS සංවිධානය හා සම්බන්ධ ඉස්ලාම් ආගමික අන්තවාදීන්ගේ ක්‍රියාකාරිත්වයක ආරම්භයක් වී තිබෙනවාද, නැත්නම් අතීතයේ පටන් ක්‍රමිකව මෙය ආරම්භ වී වර්ධනය වෙමින් පවතිනවාද ඒ වගේ තොරතුරු?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි. දැනට හම්බන්තොට ප්‍රදේශයේ සහරාන්ගේ පුහුණු පාසලක් පැවැත්විලා තිබිලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපි නිරීක්ෂණය කරගෙන යනවා. ගාල්ලේ ඒකට සම්බන්ධ පුද්ගලයෝ කිහිප දෙනෙක් ගැවසෙනවා. මොකද ගාල්ල, හම්බන්තොට, මාතර ඒක ඉස්ලාමීය ජාතිකයන් ඉන්න Pockets තියෙනවා. ඒවාවල ඉන්න කණ්ඩායම් තියෙනවා. අපි දැනට සතියකට ප්‍රථම මාතර පල්ලිය ආශ්‍රිතව නිකරුණේ ගැවසිච්ච ත්‍රිකුණාමලයේ පදිංචි මුස්ලිම් තරුණයෙක්ව අත් අඩංගුවට ගත්තා අපේ ආවේක්ෂණ නිලධාරීන්. අපි ඒ සම්බන්ධයෙන් සැළකිලිමත් ස්වාමීනි. අපි ඒ සම්බන්ධයෙන් අවධානයෙන් ඉන්නේ. තවමත් යම්කිසි ප්‍රහාරයකට ඇති ඉඩකඩ අපි බැහැර කරලා නැහැ.

ප්‍ර : ඔබට නිරීක්ෂණය වෙලා තිබෙනවාද ඔය තවුහිද් ජමාත් කියන සංවිධානයමද ඔබ සඳහන් කළ හම්බන්තොට සහ ගාල්ල ප්‍රදේශවල ක්‍රියාත්මක වන්නේ? එහෙම නැත්නම් අළුත් සංවිධාන තියෙනවාද?

පි : එහෙමයි. හම්බන්තොට තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයන් තමයි පුහුණුව ලබලා තිබුණේ. ඒ අය අත් අඩංගුවට අරගෙනත් තියෙනවා. දැනටත් අත් අඩංගුවේ ඉන්නවා ස්වාමීනි. National Thawheeth Jamath.

ප්‍ර : ඔබට තොරතුරු ලැබුණාද 2017 වසරේ බෞද්ධ ආගමික සිද්ධස්ථානයක් සහ ඉස්ලාම් ආගමික දේවස්ථානයක් අතර ඇති වෙච්ච අරගලයක් ගිංතොට ප්‍රදේශයේ?

පි : ගිංතොට ප්‍රදේශයේ සිදුවීම් කිහිපයක් වෙලා තිබුණා ස්වාමීනි. හැබැයි ඒ ගිංතොට ප්‍රදේශයේ ප්‍රවණතාවයක් තියෙනවා මුස්ලිම් අයට සිංහල අයගේත් සම්බන්ධයක් තියෙනවා. මේ මෑතකදීත් දැන් සතියකට පමණ ඉස්සර ආරාවුලක් ඇති වුණා. එතනදී මුස්ලිම් සිංහල දෙගොල්ලොම එකතු වෙලා තව මුස්ලිම් කණ්ඩායමකට පහර දීලා තිබුණා. ඒ වගේ එතන සම්පූර්ණම අන්තවාදීම නෙමෙයි. නමුත් අන්තවාදී එක්කෙනෙක් දෙන්නෙක් පතුරන අදහස් නිසා තමයි ප්‍රශ්න මතු වෙන්නේ ස්වාමීනි. එහෙම සිදුවීම් තියෙනවා. ගිංතොට සිද්ධියක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : සිංහල බෞද්ධ ආගමික කණ්ඩායම් සහ ඉස්ලාම් ආගමික කණ්ඩායම් අතර යම් යම් සැකයක් හෝ අනවබෝධය හෝ යම්කිසි හේතුවක් නිසා ගැටුම්කාරී තත්ත්වයන් වර්ධනය වීමේ ප්‍රවණතාවයක් දකින්නට ලැබෙනවද ඔය දකුණු පළාත තුළත්?

පි : දකුණු පළාත තුළත් ඔය ගාල්ලේ, මහමෝදර ඒ වගේ පැතිවල එහෙම අළු යට ගිණි වගේ සැක සංකාත් තියෙනවා මැතිණියනි. ඒ සම්බන්ධයෙන් අපි නිරන්තර අවදියෙන්, සෝදිසියෙන් ඉන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නිරන්තරව අවදියෙන්, සෝදිසියෙන් සිටිමින් මොනවා හරි ක්‍රියාත්මක වෙමින්, වැඩසටහන් හෝ කිසියම් බුද්ධි තොරතුරු මත පදනම්ව එවැනි අළු යට ගිණි මෙන් පවතිනා දේවල් මතුපිටට ඇවිල්ලා විශාල කලබලකාරී තත්ත්වයන් ඇති නොවීම වළක්වා ගැනීම සඳහා කිසියම් වැඩසටහනක් ඔබ යටතේ පොලිස් ස්ථාන විසින් ක්‍රියාත්මක කරනවද?

පි : එහෙමයි ස්වාමීනි. මෙහිදීත් මම හැම මාසයකම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් වෙනමත්, බුද්ධි අංශ නිලධාරීන් වෙනමත් කැඳවලා සාකච්ඡා පවත්වනවා. ඒ සාකච්ඡාවලදී ඔය සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් දෙනවා. ඊට අමතරව කුඩා කණ්ඩායම් රහසිගතව ගෙනල්ලා ඒ අය සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු ආකාරය සම්බන්ධයෙන් මගේ තියෙන දැනුම සහ අත්දැකීමුත්, අපේ තියෙන බුද්ධි තොරතුරුත් අනුව අවශ්‍ය උපදෙස් ලබා දෙනවා.

ප්‍ර : ඉස්ලාම් ආගමික තරුණ පිරිස් මෙම අන්තවාදී නව ප්‍රවණතාවයට ඇදී යාම වළක්වා ගැනීම සඳහා ඔබගේ අධීක්ෂණය යටතේ තිබෙන පොලිස් ස්ථානවලින් කරන කිසියම් විශේෂ වූ වැඩසටහන් තිබෙනවාද?

පි : ස්වාමීනි සාමාන්‍යයෙන් මුස්ලිම් ජනතාව සමඟ සුහදව, මිත්‍රශීලීව කටයුතු කරන හැටියට තමයි දැනුම් දීලා තියෙන්නේ. එතකොට අපිට අවශ්‍ය තොරතුරු ලබා ගන්නත්, තොරතුරුකරුවන් ඒ ආගමික නායකයන් සහ මුස්ලිම් ජනතාවගේ ප්‍රභූ පැලැන්තිය හරහා ලබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කරලා තියෙනවා.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ ජනාධිපතිතුමා සමඟ සාමාන්‍යයෙන් ආරක්ෂක තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කිරීම් එහෙම කරනවද?

පි : ස්වාමීනි නිශ්චිත තොරතුරු ලැබිච්ච අවස්ථාවල ඒ ආකාරයේ සාකච්ඡාවල් කරනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔය ISIS සංවිධානය පිළිබඳව බුද්ධිමය තොරතුරු තමන්ලට යම්කිසි ප්‍රමාණයකට ලැබිලා තිබ්බා නේද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ සම්බන්ධව ඔබ ජනාධිපතිතුමාට යම්කිසි දැනුවත් කිරීමක් කළාද?

පි : එසේ දැනුවත් කිරීමට තරම් නිශ්චිත තොරතුරු අපිට ලැබුණේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නිශ්චිතව දැනුවත් කිරීමට ප්‍රමාණවත් තරම් හම්බ වුණොත් තමයි ....?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ පෙන්වා සිටි 4-b ලේඛනය වගේ තොරතුරක් ලැබුණා නම් ....?

පි : අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් දැනුවත් කරනවා ස්වාමීනි.

ප්‍ර : ජනාධිපතිතුමාට දැනුවත් කිරීමක් කරනවා?

පි : එහෙමයි. මොකද මා අත්දැකීමෙන් දන්නවා ස්වාමීනි, මම ජනාධිපතිතුමන්ලා කිහිප දෙනෙක් සමඟ රාජකාරී කරලා මගේ දුර මම තියාගෙන ඉන්නවා. මම වෘත්තිමය රාජකාරියක් කරන්නේ. අවශ්‍ය දේ පමණක් දැනුවත් කිරීමේ පුරුද්දක් මගේ තිබුණා ස්වාමීනි.

ප්‍ර : ජනාධිපතිතුමා දිවයිනෙන් බැහැරව හිටියහම ආරක්ෂක තත්ත්වය පිළිබඳව විමසා බැලීම් කරනවද?

පි : අවශ්‍ය අවස්ථාවලදී දුරකථනයෙන් සම්බන්ධ වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ තමුන් සමඟද නැත්නම් වෙනත් නිලධාරීන් සමඟද?

පි : මාත් සමඟ දුරකථනයෙන් සම්බන්ධ වෙන අවස්ථාත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ආරක්ෂක තත්ත්වය පිළිබඳ ...?

පි : ආරක්ෂක තතත්වය, සංචාර සම්බන්ධයෙන් විමසනවා ස්වාමීනි. ඒ අවස්ථාවේදී මාත් ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් අවශ්‍ය කරුණු පැහැදිලි කරනවා.

ප්‍ර : දැන් මෙම සිද්ධිය වුණායින් පස්සේ ආරක්ෂක තත්ත්වය ගැනත් තමාගෙන් විමසා බැලුවද?

පි : මම ඊට පස්සේ ආපහු මම ඒ සිදුවීම් සිදු වෙච්ච හැම හෝටලයකටම සහ ඒ සිදුවීම් සිද්ධ වෙච්ච හැම සිද්ධස්ථානයකටම එදාම ගියා. ගිහිල්ලා ඒ අවශ්‍ය ඒ සිදුවීම් වෙලා තියෙන ආකාරය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළා ස්වාමීනි.

ප්‍ර : කාටද?

පි : අතිගරු ජනාධිපතිතුමාට.

ප්‍ර : ජනාධිපතිතුමා ඔබගෙන් විමසුවද නැත්නම් ඔබ සෘජුවම සම්බන්ධ වෙලා?

පි : සොයලා බලලා කියන්න කියලා කිව්වා ස්වාමීනි. මම කොහොමට් මගේ පුරුද්දක් හැටියට හැම ලංකාවේ සිදුවුණ පිපිරීම් හැම ලොකු දෙයක් විශාල දෙයක් මොනවා හරි දෙයක් තිබුණොත් ත්‍රස්තවාදී සංවිධාන කටයුත්තක් මම එතනට ගිහිල්ලා

FAIR COMMENT BY JEZEEM

මගේ නිරීක්ෂණය කරන එක මගේ පුරුද්දක්. ඒ අනුව මම හැමතැනටම ගියා ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥවරයා තවත් ප්‍රශ්න කිහිපයක් ඇසීමට අවසර ඉල්ලා සිටියි. අවසර ලබා දෙනවා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඔබ ප්‍රකාශ කරපු අර ජනාධිපතිවරයාගේ සිංගප්පූරු සංචාරය සම්බන්ධයෙන් තර්ජිත ආරක්ෂක වාර්තාවක්....?

පි : එහෙමයි.

ප්‍ර : තර්ජිත විශ්ලේෂණ ආරක්ෂක වාර්තාවක්. මෙම වාර්තාව කොහේද තියෙන්නේ. එය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : ස්වාමීනි මගේ මතකයේ හැටියට සිංගප්පූරුවට ඊට මාසයකට කලිනුත් ගියා. මමත් ඒ සංචාරයට සහභාගී වුණා රාජකාරිමය වශයෙන්. ඒ අවස්ථාවේදී ගත්තා තර්ජිත වාර්තාවක්. මට කොහොමටත් හරියට මතකයක් නැහැ ඒ වාර්තාව මොකද අපි මාස දෙකක් ඇතුළත වගේ සංචාරයේ යෙදෙනවා නම් අපි ඒ වාර්තාවට අමතරව Update කර ගන්නවා ඇරෙන්න මම වෙන විශේෂයෙන් අයදුම් කරන්නේ නැහැ. නමුත් තර්ජිත වාර්තාවන් අනිවාර්යයෙන්ම තියෙන්න ඕන ස්වාමීනි ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය සතුව විදේශ සංචාරය සම්බන්ධයෙන්.

ප්‍ර : ඔබට ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : මා සතුව නැහැ ස්වාමීනි.

ප්‍ර : දෙවැන්න. මෙම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නිලන්ත ජයවර්ධන ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා ජනාධිපතිවරයා සමඟ නිතරම සම්බන්ධවීම් තිබුණාද නැද්ද කියන්න ඔබට වැටහීමක් තියෙනවද?

පි : ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂ, බුද්ධි අධ්‍යක්ෂතුමා සහභාගී වෙනවා. ඊට අමතරව සම්බන්ධතාවයක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : කොහොමද ඒ සම්බන්ධතාවය?

පි : දුරකථනයෙන් සම්බන්ධ වූ බවත් මා දන්නවා.

ප්‍ර : අර ඔබ 2019.04.18 පවත්වපු මාසික බුද්ධි රැස්වීමේදී කොළඹ දකුණ සහ කොළඹ මධ්‍යම කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සහභාගී වුණාද?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන් විසින් ඔබ වෙත දැනුම් දීමක් කළාද මා අර පෙර පෙන්වන ලද X-94, C-04(b) දරන ලේඛන සම්බන්ධයෙන්?

පි : නැත ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නැත යනුවෙන් සඳහන් කරයි.

කොමිෂන් සභාව හමුවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යයට දැක් වූ සහයෝගය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

සාක්ෂිකරුව මුදා හරිනවා.

දැන් වේලාව ප.ව. 3.20 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.30 වේලාව :- ප.ව. 3.20 යි

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංක : 562

01.	සම්පූර්ණ නම	:	බබා මාහිල් ඩෝල්
02.	වයස	:	අවුරුදු 65 යි
03.	ජාතිය	:	මුස්ලිම් මැලේ
04.	ආගම	:	ඉස්ලාම්
05.	තනතුර	:	විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
06.	පුද්ගලික ලිපිනය	:	574/1/ඒ, හල්ගහදෙණිය පාර, කළපළුවාව, රාජගිරිය.

සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි

සාක්ෂිකරු : මාගේ සාක්ෂිය මේ වනවිට එය රහසිගතව කරන මෙන් ඉතා කරුණාවෙන් මා ඉල්ලා සිටිනවා.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් කරන ලද ඉල්ලීම සළකා බලමි. සාක්ෂිකරු විසින් මෙම කොමිසමේ පොලිස් ඒකකයට කර ඇති ප්‍රකාශය නිරීක්ෂණය කිරීමෙන් සාක්ෂිකරුගේ ඉල්ලීම සාධාරණ බව කොමිෂන් සභාව තීරණය කරයි. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මාධ්‍යය නොමැතිව අප්‍රසිද්ධියේ ගන්න බව සටහන් කර තබමි. මාධ්‍යය මේ අවස්ථාවෙන් ශාලාවෙන් පිට කරයි. අද දින තවත් සාක්ෂිකරුවෙකු සිටින අතර, ඔහුගේ සාක්ෂිය ප්‍රසිද්ධියේ ලබා ගන්නා බව දන්වමි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩෝල් මහත්මයා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණේ කවදද?

පි : 1976 ඔක්තෝම්බර් මාසේ 15 වෙනිදා.

ප්‍ර : ඔබ කවදා තෙක් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කළාද?

පි : 2014 වර්ෂයේ පෙබරවාරී මස 07 වෙනිදා තෙක් මම අවුරුදු 38 ක කාලයක් පොලිස් සේවයේ නියුතුව රාජකාරී කළා.

ප්‍ර : මා කිව්වෝතින් නිවැරදිද ඔබගේ පෞද්ගලික ජීවිතය සළකලා බැලුවහම ඔබ පැවතෙන්නේ ඇත්තටම පොලිස් පසුබිමකින් කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි. මගේ සීයා පොලීසියේ. මගේ තාත්තා පොලීසියේ. මමත් පොලීසියේ. Third Generation Police Officer.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : ඔබ 1976 පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණට පස්සේ 2014 විශ්‍රාම ගන්නා තුරු මේ දිවයිනේ කුමන ස්ථානවල සේවය කරලා තියෙනවද?

පි : මම 1996 ඔක්තෝම්බර් 15 වෙනිදා මම පොලීසියට බැඳිච්ච දිනයේ තමයි මම බුද්ධි අංශයට ආවේ. ඊට ප්‍රථම මම ගාල්ල, පේදුරුතුඩුව, හැටන්, OIC නෝර්වුඩ්, OIC-හබරාදූව, මාතර, OIC–Traffic, ඊට පස්සේ ආපහු OIC-හබරාදූව, ඊට පස්සේ OIC-වඳුරඹ. වඳුරඹ පොලිස් ස්ථානය විවෘත කළ වෙලාවේ මම තමයි First OIC හැටියට ගියේ 1986. ඊට පස්සේ OIC-රත්ගම, OIC-හික්කඩුව, OIC- බද්දේගම, HQI-Galle, From there I got promoted as ASP in 1993.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර දෙයි)

ප : OIC-හික්කඩුව ඊට පස්සේ?

පි : OIC-බද්දේගම, මූලස්ථාන පොලිස් පරීක්ෂක - ගාල්ල, ඊට පස්සේ එහෙන්ම Promote වුණා ASP හැටියට. ඊට පස්සේ එතන SP වෙලා මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ SP හැටියට හිටියා. ඊට පස්සේ මම බුද්ධි අංශයට ආවා.

ප : ඔබගේ ඔය දීර්ඝ සහ බහුවිධ රාජකාරී ස්ථාන සළකලා බලනකොට ඔබ සේවා කාලය තුළදී කරලා තිබෙන වැදගත් වැටලීම් මොනවාද?

පි : අපි පොලිස් නිලධාරීන් වශයෙන් රාජකාරී කරනකොට අපිට Good Entries, සාදු සටහන් ලැබෙනවා. මට සාදු සටහන් 2000 කට වැඩි ප්‍රමාණයක් මම ලබාගෙන තියෙනවා මගේ පොලිස් සේවය තුළ. එයින් මට පොලිස්පතිතුමාගේ ඇගයීම් 10 කට වැඩි ප්‍රමාණයකුත්, විශේෂ වැටුප් වර්ධක 10 කට වැඩි ප්‍රමාණයක් මම ලබාගෙන තියෙනවා. ඒවා විවිධ විශේෂයෙන්ම අපරාධ මෙහෙයවීම සම්බන්ධව. ඒකෙන් මුල්ම අවස්ථාව වෙන්නේ මම ආධුනික පොලිස් පරීක්ෂකවරයෙක් හැටියට මම ගාල්ලේ වැඩ කරනකොට ගාල්ලේ තිබුණු වයින් Store එකක් මංකොල්ලා කාලා ඒකේ රුපියල් තිස් හත්දාහක මුදලක් මම ඒ වෙලාවෙම පිටිපස්සේ දුවලා ගිහිල්ලා තරුණ කාලයේම ඒ වැටලීම කළා. ඊළඟට එතනදී පා පැදි 36 ක් හොරකම් කරපු එකක් ඒවාට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඔක්කොම මට පොලිස්පතිගේ ප්‍රශංසා ලැබිලා තියෙනවා. ඊළඟට මම විශේෂයෙන්ම Point pedro වල ඉන්නකොට මම තමයි Navy එකත් එක්ක ගිහිල්ලා 1983 දී හිරේදී මිය ගිය කුට්ටිමනීව Arrest කළේ. ඒ කුට්ටිමනීගේ Arrest එකත් එක්කම මට තර්ජනයක් ඇවිල්ලා මාව පොලිස්පතිතුමා නැවත වරක් මාව OIC-Norwood කරලා Transferයක් ඇවිල්ලා නෝර්වුඩ්වල 83 ඉඳලා මම හබරාදූවට ආවා එතනින් OIC හැටියට. ඒ රාජකාරී කරන ගමන් මම නැවත වරක් 86 දී වඳුරඹ පොලිස් ස්ථානය විවෘත කරලා එතනදී මම OIC - වඳුරඹ හැටියට ගියේ First OIC. මම නිර්භයව කියන්න පුළුවන් එතනදී තමයි ලංකාවේ දකුණේ ත්‍රස්තවාදය Insider කෙනෙක් මුලින්ම ඇල්ලුවේ මම. මාපලගම රුක්මගේ ධර්මසේන නැමැති JVP Suspectව අල්ලලා, ඒක ලොකු විමර්ශනයක් කරලා එහිදී හෙළිදරවු වුණා මේ JVP සංවිධානය නැගී හිටිනවා කියන එක හෙළිදරව් වුණේ එතනින්. අවුරුදු ගාණක් හිරේට ගිහිල්ලා හිරෙන් පැනලා ආපු එක්කෙනෙක්. ඔහුව ඊට පස්සේ අපි මතුගම පොලීසියට භාර දීලා ඊට පස්සේ මම රත්ගම පොලීසියට ගිහිල්ලා රත්ගම පොලීසියේදී මට JVP එකෙන් දෙපාරක් වෙඩි තිබ්බා. බේරුණා. මගේ හිටිය රාළහාමි නැති වුණා. එතනදී තමයි මම විශේෂයෙන්ම බෙන්තොට පොලීසියට පහර දීම, මීටියාගොඩ බැංකුව මංකොල්ල කෑම එවැනි ඔක්කෝම අපරාධ JVP එකෙන් කරපු අපරාධ ඔක්කොම මෙහෙයවලා, අවි ආයුධ සහ ඔක්කොම අරගෙන මට විශේෂ Promotion එකක් හම්බ වුණා CI කෙනෙක් හැටියට.

දැන් වේලාව : ප.ව. 3.30 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව.3.30
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාජල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : දැන් ඔබ ඉතා පැහැදිලි විස්තරයක් කළා ඔබට කොහොමද පොලිස් දෙපාර්තමේන්තුවේ සාදු සටහන් ලැබිලා තියෙන්නේ, ඒ වගේම පොලිස්පතිතුමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පැසසුම්වලට භාජනය වන්නට ඔබ සිදු කරලා තියෙන කාර්යයන් මොනවද කියලා. එහෙම නම් ඔබට කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ඔබේ ඔය දීර්ඝ කාලීන සේවා කාලය තුළදී ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ සේවය සඳහා අනුයුක්ත වෙලා හිටියද? එහෙම නම් ඒ මොන කාල වකවානුවේද?

පි : ඔව් මම රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත වෙන්නේ 1996 ඔක්තෝබර් 15 වෙනිදා. මට අමතක වෙන්නේ නැහැ මම පොලිසියට බැඳිච්ච දවස. ඉන් පස්සේ තමයි මම පුහුණුව ලබලා මම 2003 වර්ෂයේදී I get an appointment as an Intelligence Officer බුද්ධි නිලධාරියෙක් හැටියට,First Secretary පලමු ලේකම් හැටියට මම ලංකාවේ තානාපති කාර්යාලයේ බැංකොක් වල මම සේවයට යනවා. 2003 සහ 2004. ඒකට මූලික හේතුව අපි ඒ දවස්වල LTTE එක්ක සාම සාකච්ඡාවක් කරන අවධිය. එතනදී ඒවා පිළිබඳ අධ්‍යයනය කරන්න තමයි මම විශේෂයෙන්ම මට පත්වීමක් දීලා 2003 දී බැංකොක් වලට ගියේ.

ප්‍ර : ඔබ අද දින දිවුරුම් දෙන කොට මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා ඔබ මුස්ලිම් ජාතිකයෙක් කියලා. ඒ වගේම මැලේ සම්භවයක් තියෙන තැනැත්තෙක් කියලා?

පි : Yes Your Honour I am a Malay by race and I am Muslim because I born for Muslim parents.

ප්‍ර : ඔබට එහෙම නම් කියන්න පුළුවන්ද ඔබට භාෂා කීයක් කතා කරන්න පුළුවන්ද කියලා?

පි : සිංහල, I studied in Sinhala මම ඉගෙන ගත්තේ සිංහලෙන්. සිංහල විද්‍යාලයට තමයි ගියේ. මුලින්ම ගියේ කණිෂ්ඨ විද්‍යාලයකට. මම ඉපදුනේ කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ. මගේ තාත්තා පොලිස් කොස්තාපල් කෙනෙක්. හරි ආඩම්බරයෙන් මම ඒක කියනවා ඔබතුමාලා ඉදිරියේදී. ඊට පස්සේ English.My parents were converse in English Tamil and Malay.

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : භාෂා 4 ක් කතා කරන්න පුළුවන් ඔබට. දැන් ඔබ කිව්වා ඔබව මේ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳෙන කොටම රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත කරනු ලැබුවාය කියලා?

පි : නැහැ, නැහැ.

ප්‍ර : එහෙනම් මොකක්ද?

පි : 1996.

ප්‍ර : 96 ඔබව අනුයුක්ත කරන කොට ඔබ යම් කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරලා තියෙනවා?

පි : අනිවාර්යයෙන්ම.අනිවාර්යයෙන්ම.

ප්‍ර : එතකොට ඔබව ඒ සාමාන්‍ය සේවයේ ඉඳලා රාජ්‍ය බුද්ධි සේවයට තෝරා ගන්නට යම් සුදුසුකමක් ඔබට තිබුණද? කොහොමද ඔය තෝරා ගැනීම වුණේ? ඔබ සම්බන්ධ වීම වුණේ?

පි : ඇත්ත වශයෙන්ම මාව තවත් නිලධාරියෙක් විසින් They recommended me and there was a request සහ මට ඉල්ලීමක් කෙරුවා ඇවිල්ලා එතන රාජ්‍ය බුද්ධි සේවයට ඇවිල්ලා වැඩ කරන්න කැමතිද කියලා ඇහුවා මම කැමති වුණා. විශේෂයෙන්ම Language...

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ තවත් නිලධාරියෙකුගේ රෙකමදාරුව මත තමයි ඔබව රාජ්‍ය බුද්ධි සේවයට නිර්දේශ කරනු ලැබුවේ?

පි : එසේමයි.

ප්‍ර : එතකොට ඔබට ඔය භාෂාවන් 4 ක් කතා කරන්න පුළුවන්කම තියෙනවා කිව්වානේ?

පි : එහෙමයි.

ප්‍ර : එය ඔබට වාසිදායක ලෙස පිහිටියාද ඒම හැකියාව ?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : සාමාන්‍යයෙන් පුහුණුවක් ලබා දෙනවා නේද රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත කළාම නිලධාරියෙක්?

පි : ඔව්. බුද්ධි සේවයට ගිය වහාම බුද්ධි සේවයට බඳවා ගැනීම process එකක් තියෙනවා. මාව අනුමත කළාට අමතරව මා පිළිබඳව පසුබිම් පරීක්ෂණයක් දැඩි ලෙස කරනවා. දැඩි ලෙස කරලා තමයි මාව ඇත්ත වශයෙන්ම බුද්ධි අංශයකට අපිව ගන්නේ. ඒ අනුව තමයි ඒ process එක ඉවර කරලා තමයි මාව අනිවාර්යයෙන්ම මේකට ගත්තේ. ඊළඟට අනිවාර්යයෙන්ම Basic කියන්නේ මූලික පුහුණුවක් දෙනවා.That is Intelligence State Craft එක සම්බන්ධව මට මූලික පුහුණුවක් දුන්නා සති දෙකක පුහුණුවක් SIS එක ඇතුලේම තමයි. එතකොට NIB තිබුණේ දැන් SIS. එතකොට මම ඒ පුහුණුව ලැබුවා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ කිව්වානේ ඔබේ පසුබිම බලලා තමයි ඔබව බඳවා ගනු ලැබුවේ කියලා? ඒ වගේම ඒ අවස්ථාව වන විට වසර කිහිපයක සාමාන්‍ය රාජකාරීවල හොඳ පුහුණුවක් ඔබට පොලිස් නිලධාරියෙක් විදියට තිබුණ බව ඔබේ පිළිතුරෙන් පැහැදිලි වුණා?

පි : ඔව් අනිවාර්යයෙන්ම. අවුරුදු, 76 සිට 96 දක්වා අවුරුදු 20 ක කාලයක් තුළ මම ඉතාමත් අත්දැකීම් ලැබූ නිලධාරියෙක්. විවිධ ක්ෂේත්‍රවල විවිධ තරාතිරම්වල

ප්‍ර : ඒ කියන්නේ දෙපාර්තමේන්තුවේ පන්නරය ලබමින් දැන් මේ එන අවස්ථාවක්?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද වර්තමාන තත්ත්වය බැලුවාම, රාජ්‍ය බුද්ධි සේවයේ දැනුත් නිලධාරීන් ඔය වගේ පොලිස් දෙපාර්තමේන්තුවේ අත්දැකීම් ලබපු අයද අනිවාර්යයෙන් ම ඒ සේවාව සඳහා බඳවා ගන්නේ කියලා?

පි : ඔව්, මම බුද්ධි සේවයට බැඳෙන කොට නම් විශේෂයෙන්ම වැඩිපුරම 90% ක් විතර හිටියේ Uniform Service එකෙන් මේකට බඳවා ගත්ත නිලධාරීන් තමයි හිටියේ. ඊට පස්සේ අපේ අළුත් Director මම හිතන්නේ මිස්ටර් ගජනායකගේ කාල වකවානුවේදී තමයි සර් කිව්වේ අපි අළුතින් SIS එකටම කියලා නිලධාරීන් බඳවා ගමු කියලා. ඒ අනුව Sub Inspectors ලා කිහිප දෙනෙකුයි, රාළහාමිලා කිහිප දෙනෙකුයි, WPC ලා කිහිප දෙනෙකුයි බඳවා ගත්තා මුලින්ම. ඒගොල්ලෝ පොලිස් පුහුණුව දීලා ඒ පුහුණුවෙන් අවසානයේදි SIS එකට ගෙනල්ලා ඒගොල්ලන්ට අපි විශේෂයෙන්ම අපිමයි පුහුණුව කලේ ඒගොල්ලන්ට.Intelligence collections සම්බන්ධව Intelligence State Craft එක සම්බන්ධව අපි ගෙනල්ලා පුහුණු කලා.

ප්‍ර : ඩෝල් මහත්මයා ඔබගේ පසුබිම බැලුවාම මම කැමතියි ඔබෙන් යම් මතයක් දැන ගන්නට. ඒ තමයි ඔබ වගේ අනෙකුත් නිළධාරීන් සාමාන්‍යයෙන් පොලිස් රාජකාරීවල යෙදිලා රාජ්‍ය බුද්ධි සේවයට එන කොට මේ පසුබිමේ තියෙන යම් ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව මනා අවබෝධයකින් එන්නේ නේද?You have a very good understanding of the background issues that you have at the Police Department.

පි : Definitely.

ප්‍ර : එතකොට එහෙම නැතුව පොලිස් අභ්‍යාස විද්‍යාලයෙන් පමණක් පුහුණුව ලබලා අළුතින් බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය බුද්ධි සේවයට බඳවා ගැනීමේ යම් අවාසි ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ

FAIR COMMENT BY JEZEEM

අවුරුදු 13 ක පමණ කාලයක් සේවයේ නියුතු වූ නිලධාරියෙක් විදියට දකිනවද?

පි : අනිවාර්යයෙන් ම සර් මම Uniform එක ඇඳගෙන බුද්ධි සේවයට ආවයින් පසුව I had a very difficult time in adopting in to that system.

ප්‍ර : මට තිබුණා එම තත්ත්වයට හැඩ ගැහීමේ very difficult time ..

පි : Very difficult time to adopt myself.

ප්‍ර : ඉතාමත් දුෂ්කර අවස්ථාවක්.

පි : අනුවර්ථනය වෙන්න හරි අමාරු වුණා මට අපි Uniform ඒකට පුරුදු වෙච්ච විදියට හරි අපහසුවක් දැනුනා. නමුත් I overcame that.

ප්‍ර : නමුත් එය මම පහසුවෙන් ජය ගත්තා නේද?

පි : Yes.

ප්‍ර : දැන් මගේ ප්‍රශ්නෙට උත්තර දුන්නේ නැහැ හැබැයි, මම අහන්නේ..

පි : එතකොට එතනදී මම කියන්න තියෙන්නේ විශේෂයෙන්ම අපි පොලිස් දෙපාර්තමේන්තුව තුලදී ලබන පන්නරය. විශේෂයෙන්ම අපරාධ විද්‍යාව සම්බන්ධව අපි ලබන අත්දැකීම, අපරාධ මෙහෙයවීම, අපරාධ විමර්ශනය මේ සියළු දේම අළුත් දේවල් නෙමෙයි අපි මේ Intelligence State Craft එක කරන කොට සර් ඔබතුමාලට මම මේක Present කරනවා. කරන කොට මේකේ තියෙන දේවල් අළුත් දේවල් නෙමෙයි. මේවා අනිවාර්යයෙන්ම අපි ලැබූ පන්නරය මේකට use කරන්න පුළුවන්.

ප්‍ර : පාවිච්චි කරන්න පුළුවන්?

පි : අනිවාර්යයෙන්ම පුළුවන්. ඒක හැබැයි ලොකු වාසියක් අපි Uniform ඉදලා මේකට ආවනම් අළුත් දෙයක් නෙමෙයි, අපිට තියෙනවා ලොකු වාසියක් තියෙනවා. ඒක අඩුපාඩුවක් හැටියට මට පේනවා.

ප්‍ර : ඒ නිලධාරීන්ට ඒ පසුබිම් අත්දැකීම් නැති නිසා ඒ පුහුණුව නැති නිසා එය අඩුපාඩුවක් විදියට ඔබ දකිනවා?

පි : අනිවාර්යයෙන්ම මිනිස්සු ප්‍රශ්න කරන්න ගියාම interrogations වලට ගියාම ඒවා හුඟක් දේවල් තියෙනවා අර සාක්ෂි ආඥා පනත යටතේ අපි වැඩ කරන්නේ කොහොමද ඒ ඔක්කොම නීත්‍යානුකූල ප්‍රශ්න තියෙනවා.

ප්‍ර : නැවත දැන් ඔබේ සේවා කාලය ගැන බැලුවොත් ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ මොන මොන තනතුරුවල රාජකාරී කළාද?

FAIR COMMENT BY JEZEEM

පි : මම මුලින්ම 1996 දී රාජ්‍ය බුද්ධි සේවයට ගියේ සහකාර පොලිස් අධිකාරීවරයෙක් හැටියට. ඒතනදී මාව මුලින්ම දැම්මේ Counter Terrorism Unit එකට, ප්‍රති ත්‍රස්ත ඒකකයේ Assistant Director කෙනෙක් විදියට තමයි මට පත්වීම ලැබුණේ.

ප්‍ර : සහකාර අධ්‍යක්ෂක වරයෙක් විදියට. එතකොට ඔබ කොපමණ කාලයක් ඒ තනතුරේ රාජකාරී කලාද?

පි : ඒ තනතුරේ මම 2003 වෙන කල් රාජකාරී කෙරුවා. ඒ අතරතුරදී මට Promotions හම්බ වුනා SP හැටියට, SSP හැටියට. එතකොට මම 2002 දී මාව පත් කෙරුවා DDQ. DDQ කියන්නේ ඉස්ලාම් Desk එක Islamic Affairs සම්බන්ධව විමර්ශනය කරන Desk එකේ Head හැටියට මාව පත් කලා 2002 දී.

ප්‍ර : එතකොට 2002 ට ඉස්සරවෙලා ඔය Q-Desk ඒක රාජ්‍ය බුද්ධි සේවයේ තිබුණේ නැද්ද?

පි : .No, No It was established in 2002.

ප්‍ර : එහෙම 2002 වසරේදී Q කියලා Desk එකේ ඉස්ලාම් ධර්මයට අදාලව එය අනුගමනය කරන පුද්ගලයින් සම්බන්ධයෙන් පිහිටු වන්නට හේතු වුණ කරුණ මොකක්ද?

පි : විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ තිබුණු

ප්‍ර : දැන් ඔය LTTE යුද්ධය සිවිල් යුද්ධය තියෙන කාලේ?

පි : එක්කම LTTE ඒකේ ගත්තු උත්සාහයන් තිබුනා මුස්ලිම් තරුණයින් ඒ පැත්තට නැඹුරු කරගෙන එක ගමනක් යන්න බලාගෙන ඒගොල්ලන්ගේ Ideology එක තිබුණේ උතුරු නැගෙනහිර එක පළාතක් කර ගෙන රාජ්‍යයක් පිහිටු වන්න. එතනදි මේගොල්ලෝ මුස්ලිම් තරුණ තරුණියන් ඒ පැත්තට නැඹුරු කර ගෙන ඒවා සම්බන්ධව කටයුතු කරන්න අවස්ථාවක් ලබා ගත්තා කියන එක අපට පැහැදිලිව පෙනුනා ඒ ගමන්ම සමහර මුස්ලිම් සහෝදර සහෝදරියන් ඊට විරුද්ධව කටයුතු කරන ගමන්ම ඒගොල්ලෝ වෙනම නැගී හිටින තත්ත්වයක් අපිට පෙනුනා. එතකොට අපිට එතනදි හිතුනේ දෙමල ත්‍රස්තවාදයට අමතරව මෙතන තව ත්‍රස්තවාදයක් මෙයින් පැන නැගුනොත් තව ප්‍රශ්නයක්. ඒක නිසා අපි ඒ පිළිබඳව අපේ නෙත් යොමන්න ඕන කියලා ඒ සම්බන්ධව අපි කටයුතු කෙරුවේ. ඒක තමයි මූලික හේතුව.

ප්‍ර : ඔබට මතකද Oluvil Declaration ඔලුවිල් ප්‍රකාශනය කියන එක?

පි : ඔව්, ඔව්

ප්‍ර : ඒඔලුවිල් ප්‍රකාශනයත් ඔය 2002 ඔබ සඳහන් කරන ලද Q-Desk එක පිහිටුවීමත් අතර යම් සම්බන්ධතාවයක් තියෙනවද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන්ම තියෙනවා.

ප්‍ර : ඒ ඔලුවිල් ප්‍රකාශනයේදි මොකද සිද්ධ වුනේ නැගෙනහිර පළාතේදී?

පි : එතනදී ඇති වුණේ මුස්ලිම් තරුණයෝ ඒකතු වෙලා ඒගොල්ලෝ වෙනම මුස්ලිම් දේශයක් පිහිටුවීම පිළිබඳව තමයි එතන කතිකාව ආවේ. ඒක තමයි මූලික වුනේ. නමුත් පස්සේ අපිට පෙනී ගියා මේක මෙතන දේශපාලනමය තත්ත්වයකුත් පිටුපස්සේ තියෙනවා. මෙතන දේශපාලන නායකයන් විසින් මේක තරුණයන් LTTE පැත්තට නැඹුරු වෙන එක නතර කරන්න ගත්ත උත්සාහයක් හැටියටත් මට අවබෝධ වුනා.

ප්‍ර : ඒ Desk එක මෙහෙයවපු නිලධාරියා විදියට, ජ්‍යෙෂ්ඨ නිලධාරියා විදියට ඔබට ඒ අවබෝධය ලැබුණයි කියලයි ඔබ කියන්නේ?

පි : ඔව් මම සමහර දේශපාලන නායකයන්ට ඒ පැත්තේ උතුරු නැගෙනහිර කතා කලාමත් ඒගොල්ලන්ගේ මනස තිබුණේ ඒ පිළිබඳව තමයි. එහෙම තමයි මට කතා කරලා කිව්වේ.

ප්‍ර : ඉතින් ඔබලා ඔය අනුගමනය කරපු ක්‍රියා කලාපය ඒ කියන්නේ ඔය ක්‍රමෝපාය Desk එකක් පිහිටවලා නැගෙනහිර පලාතේ මුස්ලිම් තරුණයින් LTTE සංවිධානය සමඟ එකමුතු වෙලා රජයට විරුද්ධව නැගී සිටින්නට තිබෙන ඒ ඉඩ ප්‍රස්ථාව ඇතිරීම සඳහා යෙදු ඒ ක්‍රමෝපාය සාර්ථක වුණාද?

පි : මට බුද්ධි අංශයක් හැටියට මට කියන්න පුළුවන් අනිවාර්යයෙන්ම ඒ අවස්ථාවේ සාර්ථක වුණා කියලා.

ප්‍ර : ඔබ එහෙම රාජකාරී කරමින් ඉන්න අවස්ථාවේදි යම් අවස්ථාවක ඔබේ සේවය අත්හිටුවනු ලැබුවද?

පි : මගේ සේවය අත්හිටුවනු ලැබුවේ 2010 දී.

ප්‍ර : නැවත සේවයේ ඔබව පිහිටුවනු ලැබුවද?

පි : ඔව් මාව 7 ක් හෝ 8 ට පසුව මාව නැවත සේවයේ පිහිටෙව්වා.

ප්‍ර : එතකොට ඔබ සේවය කරපු නැති ඔය කාලය තුලදි ඔබ කිසියම් කටයුත්තක් කිරීම සඳහා ඔබේ අවධානය යොමු කලාද ? යම් දෙයක් හැදෑරීමට අවධානය යොමු කලාද ?

පි : මාව විශේෂයෙන්ම මගේ ආගම පැත්තට මම නැඹුරු වෙලා හුඟක්ම කාලය ගත කලේ පල්ලියේ. කුර්ආනය අධ්‍යයනය කරන්න මම උනන්දු වුනා.

ප්‍ර : එතකොට කුර්ආනය අධ්‍යයනය කරමින් ඔය ඉන්න අවස්ථාවේදි ඔබ තවත් එතනින් එහාට මේ සමාජ කටයුතු පිළිබඳ ඔබේ අවධානය යොමු කලාද?

පි : ඒ ගමන්ම මගේ බුද්ධි අංශයේ තියෙන පසුබිමත් එක්කම ඒ මුස්ලිම් සහෝදරයන්ව තරුණ තරුණියන්ව ආශ්‍රය කරන කොටත්

FAIR COMMENT BY JEZEEM

මට පෙනුන දෙයක් තමයි අපි මීට වැඩිය ඉදිරියට ශ්‍රී ලංකා භූමි තලය තුල මීට වැඩිය Nation building වලට ජාතිය ගොඩ නැගීම සඳහා මුස්ලිම් ප්‍රජාවට මීට වඩා ලොකු සේවයක් කරන්න පුළුවන් කියන අදහස මට ඇවිල්ලා මම ඒ සම්බන්ධව ක්‍රියා කළා. ඒ අනුව තමයි මම රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක එකතු වෙලා විශේෂයෙන්ම ARC කියලා Group එකක් තිබ්බා Advisory Council කියලා Sir, එතනදි අපි කලේ මේ පල්ලිය කේන්ද්‍ර කරගෙන සමාජය ඉදිරියට කොහොමද අපි මේ කටයුතු කර ගෙන යන්නේ කියලා අපි 2018 වර්ෂයේ ලොකු උත්සවයකුත් තිබුණා. මේ පල්ලිවලින් කරන කාර්යයන් පිළිබඳව අධ්‍යයනය කරලා We had a function called the National Musjith Award. We chose the best Musjith.

ප්‍ර : ඒ කියන්නේ හොඳම පල්ලිය තෝරා ගැනීම සඳහා ඔබලා පියවර ගත්තා?

පි : සංහිදියාව

ප්‍ර : එතකොට මොන නිර්නායකද ඒ සඳහා ඔබලා භාවිතා කළේ ඔය හොඳම පල්ලිය තෝරා ගැනීමට?

පි : Pre-Musjith Eco Friendly then සංහිදියාව, youth development and self employment.

ප්‍ර : එතකොට ඔය පිළිබඳව දැන් ලංකාවේ පල්ලි කීයක් විතර තියෙනවද ඉස්ලාම් භක්තිකයින් යන?

පි : 2000 ට වැඩ ප්‍රමාණයක් තියෙනවා ස්වාමිණි මම in fact I was a member of the Wakf Board, Sri Lanka Wakf Board for 3 years. So I am conversant about the Musjith. So there are about 2000 and above Musjiths. මම වකුප් සභාවේ නියෝජිතයෙක්එම නිසා මම ලංකාවේ තියෙන පල්ලි පිළිබඳව හොඳින් දන්නවා

ප්‍ර : එහෙම නම් මේ ලංකාවේ තියෙන ඉස්ලාම් භක්තිකයන් යන පල්ලි 2000 ටම ඔබලා කතා කරලා ඔය හොඳම පල්ලිය තේරීමේදි අනුගමනය කරනු ලබන, සලකා බලනු ලබන නිර්නායකයන් පිළිබඳව ඔවුන්ව දැනුවත් කළාද?

පි : එහෙමයි.

ප්‍ර : ඔය කටයුතු වලදි ඔබට විවිධ මිත්‍රයින් මුණ ගැහෙන්නට ඇති?

පි : අනිවාර්යයෙන්ම. ඊට අමතරව මාව විශේෂ Trustee Board Member කෙනෙක් විදියට පත් කරනවා Colombo Grand Mosque in Sri Lanka.

ප්‍ර : කොළඹ මහ පල්ලියේ භාරකාර මණ්ඩලයේ You are a Trustee?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : Yes Trustee.

ප්‍ර : භාරකරුවෙක් ලෙසට

පි : I was Actually the Vice President of the Trustee Board.

ප්‍ර : නියෝජ්‍ය සභාපති ලෙසට පත් කරනු ලැබුවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : දවටගහ Mosque ?

පි : Not Davatagaha Mosque Sir, This is the Grand Mosque it's called the Grand Mosque, Old Moor Street.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>:

ප්‍ර : ඒ මහා පල්ලියේ ඉන්න වෙන ඔබ දන්න සමාජයේ මේ වකවානුවේදී කතා කරන වෙන අය ඔය වකුෆ් බෝඩ් එකේ හිටියද?

පි : මගේ Trustee Board එකේ.

ප්‍ර : Trustee Board භාරකාර මණ්ඩලයේ?

පි : භාරකාර මණ්ඩලයේ පහුගිය 21.04 දින මියගිය ත්‍රස්තවාදීන් දෙදෙනෙක්ගේ පියා අපේ මණ්ඩලයේ හිටියා. මගේ සාමාජිකයෙක්.

ප්‍ර : ඔහුගේ නම මොකක්ද?

පි : ඊබ්‍රාහිම්

ප්‍ර : ඊබ්‍රාහිම් මහත්තයත් ඔබ කියන්නේ ඔය භාරකාර මණ්ඩලයේ හිටියයි කියලා?

පි : එහෙමයි.

ප්‍ර : හොඳයි අපි ඒක ගැන පස්සේ කතා කරමු. දැන් ඔබ කිව්වානේ හොඳම පල්ලිය තෝරා ගන්න ඔබලා යම් සැලසුමක් හදලා ඒක ක්‍රියාත්මක කරන්නට කටයුතු කෙරුවා?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඒ අනුව හොඳම පල්ලියක් තෝරා ගත්තද?

පි : ඔව් කෙසෙල්වත්ත පල්ලිය අපි criterion එක හැටියට වැඩ කරපු නිසා ඒගොල්ලන්ව තමයි තෝරා ගත්තේ ඒගොල්ලන්ට අපි One million වල තෑග්ගකුත් ප්‍රදානය කළා.

ප්‍ර : ඔබ ඔය සමාජ සේවා කටයුතු කරනු ලැබූ අවස්ථාවේදී මුස්ලිම් ජන කොට්ඨාශයට අදාලව ඔබට අබ්දුල් හකීම් කියලා මහත්මයෙක් මුණ ගැහුනද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම සමාජ සේවා වැඩ කරන කොට මට හකීම්ව මුණ ගැහෙනවා. එයා ARC එකේ Member කෙනෙක් අපේ ARC Group එකේ Member කෙනෙක්. ඒ වගේම කොලොන්නාව ගංවතුර වෙලාවේ අපි ගංවතුර ආධාර කරන්න ගිය වෙලාවේ තමයි විශේෂයෙන්ම අපි සම්බන්ධකමක් ඇති වෙන්නේ.

ප්‍ර : ඔබ ඊට පෙර ඔය හකීම් මහත්මයාව දැන ගෙන හිටියද?

පි : නැහැ මම හකීම්ව දැන ගන්නේ Social Service කරන්න ගිහිල්ලා තමයි.

ප්‍ර : මේ සමාජ සේවා සත්කාරක කටයුතු කරන්න ගිහිල්ලා තමයි ඔබ ඔහුව හඳුනා ගන්නේ?

පි : That's Right.

ප්‍ර : ඔබත් ඔහුත් අවස්ථා කීයකදී පමණ මුණ ගැහිලා තියෙනවද?

පි : කීප වරක් මට..

ප්‍ර : ඒ කියන්නේ සාමාන්‍ය ඔය සමාජ සුභ සිද්ධි කටයුතුවලදී මුණ ගැහෙනවා?

පි : ඔව් ඔව් හරියට මුණ ගැහිලා තියෙනවා. අපිත් එක්ක පල්ලිවලට මේ පිළිබඳව දැනුවත් කරන්න ගිය අවස්ථාවලදි අපිත් එක්ක එකට ගමන් කරලා තියෙනවා, එකට ඉදලා තියෙනවා.

ප්‍ර : ඒ අනුව ඔබත් හකීම් මහතාත් අතර ළඟ සම්බන්ධතාවයක් ගොඩ නැගුනද?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඔබලාගේ මේ ඇසුරෙදී හකීම් මහත්මයා ඔබට දැනුම් දුන්නද ඔහුට ඔබෙන් කිසියම් උපකාරයක් අවශ්‍යයි කියලා?

පි : ඔව් එසේමයි හාමුදුරුවනේ.

ප්‍ර : ඉතින් ඔබ විමසුවද ඔහුගෙන් මොකක්ද මගෙන් ඔබට ඕන උපකාරය කියලා?

උ ඒ කියන්නේ Jesus will come back. Isa aleh Salam we call . Isa aleh Salam . That he will come back one day as the final Christ. Prophet. Sorry Prophet. That's what I have learnt and I have heard. The next caliphate is going to be the final after Mahadees going to be Jesus Christ who is Mary's son who has come as the final Prophet to this world. So even Catholics say that Jesus is coming back again. Christ comes back again. That is what I know. I just cannot deeply elaborate in to this. This is what I learnt. But tobe to be honest with you all I don't believe in that. I only believe in Quran. I believe in Quran that is the devalation of God and so I follow Quranic verses, Quranic practices and I also believe in the Prophet as the final messenger of our God.

ප්‍ර ඉතින් Mr. Dole ඒක හේතුවක් වෙන්න පුලුවන්ද දැන් මුස්ලිම් භක්තිකයka කියන්නේ යේසුස් එනවා කියන එක ඒක හේතුවක් වෙන්න පුලුවන්ද මේ මුස්ලිම් බැතිමතුන් සහ කතෝලික බැතිමතුන් අතර අරගලයකට ?

උ I think of if you are a Christian I think you read the first testament, the second testament and everything

ප්‍ර I am only asking

උ No, no I am telling it speak about all religions what is the first testament, what is thaurath? what is the gospel? what is the injel? Everything is there in written form. So that is not going to according to my knowledge that's a reason for the conflict

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

between the Christians and the Muslims I don't think that is my opinion this is my opinion I don't think. I don't think. And I don't have evidence to say that also. Because this is the reason for why the Muslims fighting no way I don't think. This is something to do with the history Sir now this is Amiganon this is the historically ඓතිහාසිකව මෙම ගැටුම තියෙන්නේ ක්‍රිස්තියානි, යුදෙව්වරුන් සහ මුස්ලිම්වරු අතරනේ ඓතිහාසිකව තියෙන්නේ ඕක තමයි ඕක නිර්වචනය කරලා එක එක විදියට ඉදිරිපත් කරලා ඕක තමයි ගෙනියන්නේ ඉස්සරහට මේක අවාසනාවකට මේකට දැන් බෞද්ධාගමත් පටලවාගෙන තියෙනවා කොහෙන්ද කියලා ඉවර වෙලා ඕක තමයි අපි කවදාකවත් කියලා නැහැනේ අපි බෞද්ධාගමත් එක්ක මෙහෙම සටන් කරනවා කියලා දැන් බලන්න ඕක පටන් ගන්නේ කව්ද ISIS එකෙන් කොහෙන් පටන් ගත්තේ අල්කයිඩා එකෙන් කොහේද ඇෆ්ගනිස්ථානයේ .. බාමින් බුදු පිළිම කඩලා. ලංකාවේ ආහාෂය අරගෙන මොකද කලේ මාවනැල්ලේ බුදුපිළිම කඩාගෙන ගියා.ඉතින්එක එක් විදියට එක එක නිර්වචනය කරන විදියට තමයි මේක හදා ගෙන තියෙන්නේ . ඒක නිසා මම මැඩම් කිව්ව වගේ අපි සිකුරාදාට ඇවිල්ලා දේශනය කරන පුද්ගලයා එයාගේ.තියන අභිමාර්ථය එයාගේ තියෙන එයාවෙන නිකායකින් කියලා එයා බලනවා එයාගේ නිකාය ප්‍රවර්ධනය කරන්න තව එක්කෙනෙක් එයාගේ නිකාය පවත්වාගෙන යනවා එතකොට මෙතන ඇතුලේ තියෙනවා ගැටුමක් එක එක්කනා අතරේ ගැටුමක් තියෙනවා ඒක නිසා මේක ඕක එක හේතුවක් එකක් කියලා කියන්න බැහැ .මට පේන්නේ නැහැ මේක ක්‍රිස්තියානි ධර්මයට විරුද්ධව අපි මේක කරන්න හේතුව වෙලා තියෙන්නේ අපේ අවසාන කලීෆාවරයා එන නිසා So even the Christians believe that Jesus is born again. There's sector no in the Christianity saying that Jesus is born again. ඒ වගේ විවිධ නිකායවල් අදහන දේවල් තියෙනවා So I don't think Sir that is the reason I don't see any reason why the conflict for the Muslim and Christians.

ප්‍ර දැන් මේ මොහොමඩ් කියන නබිතුමා මැරුනේ ක්‍රිස්තු වර්ෂ 632 නේද දන්නවාද ඒක?

උ After he was 63 years when he passed away. After 23 years of Prophet hood

ප්‍ර එතකොට එදා සිට 1924 දක්වා විවිධ රටවල මේ caliphate එක නිබ්බා කියලා කිව්වොත් තමා ඒක ගැන දන්නවාද?

උ ඔව් එක වෙලාවට එක එක කට්ටිය ඒගොල්ලෝම නිර්මණය කලානේ ISIS එක ඉස්ලාමික් ?

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ISIS එකට ඉස්සෙල්ලා 1924 ?

උ . From time to time they have believed in Caliphate is coming, Caliphate is coming. I was not so interested in knowing that. I am not conversant enough to make any statement about that.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්ය භාරය සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට ප්‍රකාශ කරමි.

මීට අමතරව කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂි හේතුවෙන් යම්කිසි අවස්ථාවක සාක්ෂිකරුට යම් තර්ජනයක් හෝ අනතුරක් සිදුවීමට හැකියාවක් ඇති බව කොමිෂන් සභාවට හැඟී යන හෙයින් 2015 අංක 4 දරන සාක්ෂිකරුවන් සහ වින්දිතයන් හට පහසුකම් සැලසීමේ සහ ආරක්ෂාව ලබා දීමේ පනතේ 25 (4) උප වගන්තිය ප්‍රකාර මෙම සාක්ෂිකරුට හිමිවිය යුතු සියලු අයිතීන් සහ වරප්‍රසාදයන් ඔහුට ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ හා පහසුකම් සලසා දීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරමි.

කොමිෂන් සභාවේ කටයුතු රාත්‍රී 10 තෙක් කල් දමනවා .

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.06.30 වේලාව :- ප.ව. 10.20

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

01.	සම්පූර්ණ නම	:	පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි
02.	වයස	:	අවුරුදු 52යි
03.	ජාතිය	:	සිංහල
04.	ආගම	:	බෞද්ධ
05.	තනතුර	:	අධ්‍යක්ෂ (අලෙවි) (කාර්මික සංවර්ධන මණ්ඩලය)

සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි.

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : මහත්මයා ඔබ දැනට අධ්‍යක්ෂ (අලෙවි), කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවය කරනු ලබනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ කාර්මික සංවර්ධන මණ්ඩලයට සේවයට බැඳුණේ කුමන වසරේදිද?

පි : 2015 වසරේ ජූලි මාසේ 10 වෙනිදා.

ප්‍ර : ඒ දැනට දරන තනතුරටමද?

පි : දැනට දරන තනතුරටමයි.

ප්‍ර : ඒ අනුව ඔබ මේ වනවිට කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්තව ආසන්න වශයෙන් අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ කරලා තිබෙනවා කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමීනි නිවැරදියි.

ප්‍ර : ඔබ අධ්‍යක්ෂ (අලෙවි) තනතුර දැරීම සඳහා ඔබේ මූලික අධ්‍යාපන සුදුසුකම් මොනවාද?

පි : ශාස්ත්‍රවේදී උපාධියක් ව්‍යාපාර කළමනාකරණය වෙනුවෙන් ලබා තියෙනවා. ඒ වගේම පශ්චාත් උපාධියක් ව්‍යාපාර කළමනාකරණය වෙනුවෙන් ලබාගෙන තියෙනවා. ඒ වගේම එංගලන්තයේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබලා තියෙනවා.

ප්‍ර : එසේම අලෙවි ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔබට කොපමණ කාලයක් ඔබ රාජකාරී කරලා තියෙනවද වෙනත් ආයතනවලට අනුයුක්තව?

පි : වසර 20 ක් පමණ මා රාජකාරී කරලා තියෙනවා අලෙවි ක්ෂේත්‍රය සම්බන්ධව.

ප්‍ර : කෙටියෙන් සඳහන් කරන්න පුළුවන්ද ඒ කුමන ආයතනවලට අනුයුක්තවද කියලා?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම රක්ෂණ ක්ෂේත්‍රයේ වැඩ කළා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, යුනියන් ඇෂුවරන්ස් රක්ෂණ සමාගම සහ සෙලින්කෝ රක්ෂණ සමාගම.

ප්‍ර : කාර්මික සංවර්ධන මණ්ඩලය කුමන අමාත්‍යාංශයක් යටතේද පවතින්නේ?

පි : වර්තමානයේ එය කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතිනවා.

ප්‍ර : වර්තමානයේ කියලා ඔබ අදහස් කරන්නේ කොයි කාලයේ ඉඳලද ඒ නම යටතේ, අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යන්නේ?

පි : 2015 වසරේ සිට.

ප්‍ර : ඊට පෙර කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනත් නමකින් හඳුන්වනු ලැබූ අමාත්‍යාංශයක් යටතේද පැවතුණේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කුමක්ද?

පි : සම්ප්‍රදායික සහ කුඩා ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ පැවතියා.

ප්‍ර : කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය කියලා කිව්වොත් හරිද?

පි : ඒත් නිවැරදියි.

ප්‍ර : කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවලා තිබෙන්නේ යම් පනතක් මගින් ව්‍යවස්ථාපිතව කියලා කිව්වොත් ඒක හරිද?

පි : ඒක නිවැරදියි.

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද ඒ කුමන පනත යටතේද පිහිටුවා තිබෙන්නේ කියලා?

පි : 1969 අංක 36 යටතේ පිහිටුවා තිබෙනවා. මෙය එවකට සම්ප්‍රදායක කර්මාන්ත හා කුඩා ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ තමයි පැවතුණේ. 1969 මේ පනතින් අපිව ක්‍රියාත්මක කළා.

ප්‍ර : 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේයි මේක පිහිටුවනු ලැබුවේ ඔබේ ආයතනය කියලා කිව්වොත් ඒක හරිද?

පි : නිවැරදියි.

ප්‍ර : දැන් මේ පනත ප්‍රකාරව ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීමේ අවශ්‍යතාවයක් එහෙම නැත්නම් ඒක පිහිටුවීමේ පරමාර්ථය කුමක්ද කියලා?

පි : එවකට කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවති දුර්වලතා හඳුනාගෙන එහිදී විශේෂයෙන්ම කර්මාන්තකරුවන් සංවර්ධනය කිරීම, ප්‍රචාරණය කිරීම සහ ඔවුන්ගේ කර්මාන්ත ධෛර්යමත් කිරීම තමයි මූලික

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අරමුණ වුණේ. මේ සඳහා තමයි මේ පනත මූලිකව පිහිටුවනු ලැබුවේ.

ප : පනත ප්‍රකාරව මේ කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවනු ලැබුවේ මේ කර්මාන්තකරුවන් ධෛර්යමත් කරන්න, නඟා සිටුවන්න අවශ්‍ය පහසුකම් සළසලා දෙන්න කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : එය නිවැරදියි.

ප : දැන් ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංවිධානාත්මක ව්‍යූහය. ඒ කියන්නේ ඉහළ සිට පහළට නිලධාරීන් ධුරාවලිය මොන ආකාරයටද තියෙන්නේ කියන එක සම්බන්ධයෙන් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : පැහැදිලි කරන්න පුළුවන්.

ප : ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඒ සම්බන්ධයෙන් ඒ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යූහය ඔබට ලේඛනයකින් පැහැදිලි, Organisational Structure ආයතනික ව්‍යූහය ඔබට රූපයක් මගින් වඩා පැහැදිලි කර ගැනීමට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවාද?

පි : හැකියාවක් තියෙනවා ස්වාමීනි.

ප : දැන් මේ අවස්ථාවේදී ඒක ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන්.

(මේ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංවිධාන ව්‍යූහය දැක්වෙන සටහන C-752 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා)

ප : සාක්ෂිකරු දැන් ඔබට මේ C-752 දරන ලේඛනය ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යූහය සම්බන්ධයෙන් සැකෙවින් පැහැදිලි කරන්න හැකියාවක් තිබෙනවද?

පි : එහෙමයි.

ප : කියන්න?

පි : ස්වාමීනි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යූහය සැලකුවාම මෙහි මූලික වන්නේ සභාපතිවරයෙක් ඉන්නවා. ඒ සභාපතිවරයා යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා. මේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සභාපතිතුමා පත් වන්නේ අමාත්‍යාංශයෙන්. ඉන්පසුව අපේ ඉන්නවා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක්. අධ්‍යක්ෂ ජනරාල්වරයා තමයි අපේ මූලික පරිපාලන කටයුතු මෙහෙයවන්නා. ඉන්පසුව අපිට ඉන්නවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙක්. ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනා යටතේ ඉන්නවා අධ්‍යක්ෂවරුන් නව දෙනෙක්. මේ නව දෙනා තමයි අධ්‍යක්ෂ

FAIR COMMENT BY JEZEEM

(පරිපාලන), අධ්‍යක්ෂ (ගිණුම්), අධ්‍යක්ෂ (සැලසුම්), අධ්‍යක්ෂ (අලෙවි), අධ්‍යක්ෂ (ව්‍යවසායකත්ව සංවර්ධන), අධ්‍යක්ෂ (කාර්මික ජනපද), අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන), අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා), අධ්‍යක්ෂ (ඉංජිනේරු). මේ විදියට තමයි අපේ අධ්‍යක්ෂවරුන් පිහිටවලා තියෙන්නේ. මේ අධ්‍යක්ෂවරුන් යටතේ ස්වාමීනි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ඉන්නවා. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් යටතේ ඉන්නවා Development Officers ලා කියනවා, ඒ කියන්නේ අපේ සංවර්ධන නිලධාරීන් ඉන්නවා. මේ විදියට තමයි අපේ ව්‍යූහය සැකසිලා තියෙන්නේ. සමස්ථ කාර්ය මණ්ඩලය අපේ 550 ක් පමණ වෙනවා. මේ වගේම කාර්යය අපේ සංවිධාන ව්‍යූහය ශක්තිමත් කරන්නට ලංකාව පුරා ප්‍රාදේශීය කාර්යාල 25 ක් ක්‍රියාත්මක වෙනවා. ඒ ප්‍රාදේශීය කාර්යාලත් මේ ව්‍යූහය යටතට අයිති වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ එක් එක් දිස්ත්‍රික්කයකට දාළව වෙන වෙනම ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යනු ලබනවාද?

පි : එහෙමයි.

ප්‍ර : නැවත පැහැදිලි කර ගැනීමක් වශයෙන් මහත්මයාගෙන් අහනවා නම් දැන් මේ ව්‍යූහයේ ඉහළින්ම සිටින්නේ සභාපති කියන තනතුර?

පි : එහෙමයි.

ප්‍ර : ඒ සභාපති තනතුරට පත්වන පුද්ගලයා පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

පි : සභාපති පත් කරනු ලබන්නේ අදාළ අමාත්‍යාංශයේ ඇමතිතුමා.

ප්‍ර : දැන් ඔබ කිව්වා ඔබ 2015 සිට 2020 වර්ෂය දක්වා කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්තව සේවය කළා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : 2015 සිට මේ දක්වා මෙම කාර්මික සංවර්ධන මණ්ඩලය භාර අමාත්‍යාංශයේ ඇමතිවරයා වශයෙන් කවුද කටයුතු කළේ?

පි : 2019 දෙසැම්බර් වෙනකල් ඇමති ධුරය දැරුවේ රිෂාඩ් බදුර්දීන් ඇමතිතුමා. ඉන්පසුව නව රජයේ ජනාධිපතිතුමාගේ පත්වීමෙන් පසුව විමල් වීරවංශ ඇමතිතුමා තමයි වර්තමානයේ අපේ ඇමතිතුමා විදියට කටයුතු කරන්නේ.

ප්‍ර : සභාපති තනතුරට පසුව අධ්‍යක්ෂ ජනරාල් කියලා තනතුරක් තිබෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ තනතුරේ වර්තමානයේ කවුද කටයුතු කරන්නේ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : වර්තමානයේ පී.එල්.යූ. රත්නමලල, වරලත් ඉංජිනේරුවරයෙක් රාජකාරී කරනවා.

ප්‍ර : රත්නමලල මහත්මයා කොච්චර කාලයක ඉඳලා මේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කටයුතු කරනු ලබනවාද?

පි : වසර 07 ක් පමණ.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා මේ අධ්‍යක්ෂ ජනරාල් යටතේ අංශ නමයක් තියෙනවයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබත් ඒ වගේ අංශ නමයෙන් එකක අලෙවි අධ්‍යක්ෂ විදියට කටයුතු කරනවා කියලා කිව්වොත් ඒක නිවැරදියිද?

පි : එය නිවැරදියි.

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඇයි මේ අංශ නමයක් පත් කරලා තියෙන්නේ කියලා?

පි : කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවාව දීප ව්‍යාප්තව සිදු කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය 550 ක් ඉන්නවා. ඒ 550 ට අපි බලාපොරොත්තු වෙන්නේ සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම විශේෂයෙන්ම. එහිදී අපට මේ සියළුම ලංකාව පුරා සිටින අපේ සියළුම ප්‍රාදේශීය කාර්යාල හරහා අපේ කර්මාන්තකරුවන්ට සේවා ලබාදීම සඳහා මෙය ඉතාමත්ම සැලසුම් සහගතව කළයුතු නිසා අපේ එක් එක් අංශය වශයෙන් අංශ නමයකට කඩා වෙන් කරලා තියෙනවා. විශේෂයෙන්ම අපි තාක්ෂණික දැනුම, ඉංජිනේරුමය දැනුම, එතකොට ව්‍යවසායකත්ව දැනුම මේ විදියට සේවා ලබා දීමේ පහසුව තකා අපි මේ අංශයන් පිහිටුවලා තියෙනවා.

ප්‍ර : ඔබ දැනට අධ්‍යක්ෂ (අලෙවි) වශයෙනුයි කටයුතු කරන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න හැකියාවක් තියෙනවද අධ්‍යක්ෂ (අලෙවි) වශයෙන් මහත්මයාගේ ප්‍රධාන රාජකාරී වගකීම් මොනවාද කියලා?

පි : එහෙමයි. මට හැකියාවක් තියෙනවා. මගේ අංශය තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයේ විශේෂයෙන්ම ප්‍රවර්ධන කටයුතු මූලික කරගත් වැඩ කටයුතු සිද්ධ කරන්නේ. මෙහිදී මට අනු ඒකක හතරක කාර්යභාරයන් පැවරිලා තියෙනවා. එකක් තමයි අබලි කළමනාකරණ ඒකකය. තව එකක් තමයි දෙවෙනි එක උප කොන්ත්‍රාත් ඒකකය. තුන්වෙනි එක තමයි ලක්කම් අලෙවි මධ්‍යස්ථානය. හතරවෙනි අනු ඒකකය තමයි මාධ්‍ය ඒකකය. මේ ඒකකයන් හතරම මගේ යටතේ ක්‍රියාත්මක වෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ සඳහන් කළා අබලි ලෝහ ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ඔබ යටතේ තියෙන්නේ කියලා?

පි : එහෙමයි.

ප්‍ර : මොකද්ද මේ අබලි ලෝහ ද්‍රව්‍ය කළමනාකරණය කියලා කියන්නේ?

පි : 2005 වසරේ කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍ය කේ.ඩී. ලාල් කාන්ත මැතිතුමා විසින් ලංකාවේ රාජ්‍ය ආයතනවල තියෙන ඉවත් කළ අබලි ද්‍රව්‍ය ලබාගෙන කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට බෙදා දීමේ වැඩ පිළිවෙලක් පටන් අරගෙන තියෙනවා. මේ වැඩ පිළිවෙල පටන් අරගනිද්දී අමාත්‍ය සංදේශයක් මගින් මෙය මෙය කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පවරා තිබෙනවා.

ප්‍ර : දැන් අබලි ලෝහ ද්‍රව්‍ය කළමනාකරණය ඒකකය පිහිටුවීමට මූලික වන්නේ 2005.07.13 වෙනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් කියලා මහත්මයා සඳහන් කළා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට මේ අවස්ථාවේදී හැකියාවක් තිබෙනවද මේ ගරු කොමිෂන් සභාවට ඒ අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් ඉදිරිපත් කරන්න?

පි : එහෙමයි. හැකියාව තියෙනවා.

(මේ අවස්ථාවේදී සාක්ෂිකරුට 2005 ජූලි 22 දින සහ අ.ම.ප./05/0741/041/012 අංකය දරන සමාංක අංකය යටතේ කුඩා හා ග්‍රාමීය කර්මාන්ත ඇමතිවරයා විසින් ඉදිරිපත් කළ සංදේශයට අදාළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය C-753 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා)

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබ මේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අබලි ලෝහ ද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් මේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ වෙනමම පිහිටෙව්වා රාජ්‍ය ආයතනවලින් අබලි ද්‍රව්‍ය ලබා ගැනීමට කියලා කිව්වොත් ඒක හරිද?

පි : එය නිවැරදියි.

ප්‍ර : දැන් ඒ අනුව කුමන රජයේ ආයතනවලින්ද මේ 2006 වර්ෂයේ ඒ කාල වකවානුවේදී මේ අබලි ලෝහ ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා ගනු ලැබුවේ ඒ කාලයේ?

පි : අපි අබලි ද්‍රව්‍ය ලබා ගැනීමේදී විශේෂයෙන්ම කාණ්ඩ විදියට අපි ලබා ගන්නේ. ඒ කියන්නේ අබලි යකඩ, ටීනවට්ටි, ඇළුමිනියම්, පිත්තල, තඹ, පියුටර්, දුණුකොළ, ඊයම්. මේ වගේ එක එක වර්ගයන්ගෙන් තමයි අබලි ද්‍රව්‍ය අපි ලබා ගන්නේ. විශේෂයෙන්ම අබලි යකඩ සහ ටීනවට්ටි සඳහන් කළොත් එය ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මහේස්ත්‍රාත් අධිකරණය, බන්ධනාගාර

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

දෙපාර්තමේන්තුව, රෝහල්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, ගුවන් හමුදාව, නාවික හමුදාව, යුධ හමුදාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව. ඒ වගේම අපි ඇළුමිනියම් ලබා ගැනීම සඳහා භාවිතා කරනවා, භාවිතා කරන ක්‍රමවේදය යටතේ රාජ්‍ය ආයතන අපිට සහයෝගය දක්වනවා සහ ඒ අයගෙන් අපි ලබා ගන්නවා. ලංකා විදුලිබල මණ්ඩලය, ගමනාගමන මණ්ඩලය, මහේස්ත්‍රාත් අධිකරණ, බන්ධනාගාර දෙපාර්තමේන්තුව.

ප : දැන් මේ ලෝහ ද්‍රව්‍ය, අබලි ලෝහ ද්‍රව්‍ය ලබා ගැනීමේදී 2013 වර්ෂයේදී යම්කිසි විශේෂ පියවරක් මේ සම්බන්ධයෙන් වැඩි දියුණු කිරීමක් කරනු ලැබුවද?

පි : එහෙමයි.

ප : ඒ කුමක්ද පැහැදිලි කරන්න?

පි : අබලි ද්‍රව්‍ය පිටරට යැවීම තහනම් කරනු ලැබුවා අබලි ද්‍රව්‍ය විදියට. ඒ කියන්නේ අබලි ද්‍රව්‍ය අගය එකතු කරන්නේ නැතුව එලෙසම අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම තහනම් කරනු ලැබුවා.

ප : අබලි ද්‍රව්‍ය, අබලි ලෝහ කළමනාකරණය පිළිබඳව මාර්ගෝපදේශකයක් කාර්මික සංවර්ධන මණ්ඩලයට හඳුන්වා දීමක් සිදු කරනු ලැබුවද 2013 වර්ෂයේදී?

පි : එහෙමයි. මෙය සිද්ධ කරනු ලැබුවේ සම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශය. ඒකට හේතුව වුණේ 2005 අපිට අබලි ද්‍රව්‍ය අපිට ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලැබුණා. එහෙත් මේක දිගින් දිගටම කරගෙන යාමේදී ගැටළු මතු වුණා. විශේෂයෙන්ම කර්මාන්තකරුවන් ඔවුන්ට ලබා දෙන ප්‍රමාණයන් ගැන ප්‍රශ්න ඇති වුණා. ඒ වගේම ආයතනවලින් අපිට ගැටළු මතු වුණා. ඒ නිසා අපිට මේ නියාමනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැග්ගා 2013 වසරේදී. ඒ නිසා එය නියාමනය කිරීම සඳහා අබලි ලෝහ කළමනාකරණ පිළිබඳ මාර්ගෝපදේශයක් අපි 2013 වසරේ නොවැම්බර් මාසයේදී එළි දක්වනු ලැබුවා.

ප : ඒ කියන්නේ මෙතෙක් 2006 වර්ෂයේ සිට කරගෙන ආපු ක්‍රියාවලියම වඩාත් ඵලදායී ලෙස කාර්යක්ෂමව නැත්නම් කළමනාකරණය කරන්න තමයි මේ ආයතනය විසින් මාර්ගෝපදේශක සංග්‍රහයක් හඳුන්වා දෙනු ලැබුවේ?

පි : එහෙමයි. නිවැරදියි.

ප : දැන් ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනවද මේ 2013 වර්ෂයේ හඳුන්වා දෙනු ලැබූ ඒ

FAIR COMMENT BY JEZEEM

අබලි ලෝහ කළමනාකරණයට අදාළ මාර්ගෝපදේශකයේ පිටපතක්?

පි : එහෙමයි. මට ලබා දෙන්න පුළුවන්.

(මෙම ලේඛනය C-754 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා)

ප්‍ර : දැන් සාක්ෂිකරු මා ඔබේ අවධානය යොමු කරනවා මේ 2013 වර්ෂයේ නොවැම්බර් මාසයේ හඳුන්වා දෙනු ලැබූ අබලි ලෝහ කළමනාකරණ මාර්ගෝපදේශකය කෙරෙහි?

ප්‍ර : අබලි ලෝහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශයේදී මෙහි පාලන ව්‍යූහය ප්‍රතිපත්ති කමිටුව සහ කළමනාකරණ කමිටුව කියලා කමිටු දෙකක් යටතට පාලන ව්‍යූහයක් ස්ථාපිත කරලා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් සැකෙවින් පැහැදිලි කරන්න?

පි : විශේෂයෙන්ම මාර්ගෝපදේශක සංග්‍රහය යටතේ බලාපොරොත්තු වුණේ ගැටළුකාරී තත්ත්වයක් පැවතියා අතීතයේ. ඒ නිසා මෙය කිසියම් වූ පාලන ව්‍යූහයක් යටතට පත් කිරීම සහ එය ප්‍රතිපත්ති කමිටුවක් සහ කළමනාකරණ කමිටුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට. ප්‍රතිපත්ති කමිටුවෙන් අපි බලාපොරොත්තු වෙන්නේ සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අබලි ලෝහ ලබා දීමේදී එය සංවර්ධනය කිරීම, දියුණු කිරීම සහ වර්ධනය කිරීම සඳහා වන කිසියම් වූ ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නත්, ඒ වගේම මේ හා සම්බන්ධ වන විශේෂ ගැටළු හඳුනාගෙන එය සමස්ථ පද්ධතිය පුරා ගෙන යාමටත්, මේ ප්‍රතිපත්ති කමිටුව ක්‍රියාත්මක වෙනවා. මේ ප්‍රතිපත්ති කමිටුව හරහා අදාළ තොරතුරු එකතු කරලා, ඒවා කැබිනට් මණ්ඩලයට යවලා, කැබිනට් මණ්ඩලයෙන් ඒ සඳහා වන නිර්දේශයන් ලබා ගැනීම සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර : කළමනාකරණ කමිටුවෙන් කුමක්ද සිද්ධ වෙන්නේ?

පි : කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක වෙන්නේ විශේෂයෙන්ම එය සමස්ථ අබලි කළමනාකරණ ඒකකයේ පරිපාලන ව්‍යූහය ක්‍රියාත්මක කරවීම. කෙසේද මෙය ක්‍රියාත්මක කළ යුත්තේ, කෙසේද මෙය සංවර්ධනය කළ යුත්තේ මෙන්න මේ පරිපාලනමය ගැටළු සහ ඒවා නිරාකරණය කිරීම සඳහා තමයි කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර : දැන් මේ අබලි ලෝහ ව්‍යාපෘතියේ මෙහෙයුම කටයුතු කිරීමේ ප්‍රධානතම නැත්නම් වගකිව යුතු නිලධාරියා වශයෙන් මේ මාර්ගෝපදේශකය අනුව කාවද නම් කරලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : විශේෂයෙන්ම වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වශයෙන් නම් කරලා තියෙන්නේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ (අලෙවි) කියන තනතුරේ ඉන්න පුද්ගලයා තමයි මෙහයි වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වශයෙන් නම් කරලා තියෙන්නේ.

ප්‍ර : එය සඳහන් කර තිබෙන්නේ 2013 නොවැම්බර් මාර්ගෝපදේශක සංග්‍රහයේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ කළමනාකරණ ඒකකය කියන මාතෘකාව යටතේ තිබෙන පළවෙනිම ඡේදයේ කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : නිවැරදියි.

ප්‍ර : නැවත ඒ සඳහන් වෙලා තිබෙන ස්ථානයට අපේ අවධානය යොමු කළොත්, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ කළමනාකරණ ඒකකය කියන මාතෘකාව යටතේ අබලි ලෝහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ අබලි ලෝහ කළමනාකරණ ඒකකය මගින් සිදු කළයුතු අතර, එහි වගකිව යුතු ප්‍රධාන නිලධාරියා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂ වශයෙනුයි එය සටහන් වෙන්නේ කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : එය නිවැරදියි ස්වාමීනි.

(අදාළ සටහන 2013 මාර්ගෝපදේශකයේ අදාළ සටහන C-754(a) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා)

ප්‍ර : ඉන් අනතුරුව සඳහන් වෙලා තිබෙනවද අබලි ලෝහ ව්‍යාපෘතිය සුපරීක්ෂණය, කළමනාකරණය, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම සභාපති සහ සාමාන්‍යාධිකාරී විසින් කළයුතු බවටත්, අදාළ වාර්තා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණ මණ්ඩලයට වාර්තා කළයුතු බවටත් සටහන්ව තිබෙනවද?

පි : එහෙමයි. සටහන් වී තිබෙනවා.

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට අබලි ලෝහ කර්මාන්තකරුවන්ට ලබාදෙන කොට මුලින්ම මේ කර්මාන්තකරුවන් ඔබේ ආයතනයේ ලියාපදිංචි වීමක් සිදු කළ යුතුයිද?

පි : එසේමයි. ලියාපදිංචි වීමක් කළ යුතුයි.

ප්‍ර : එය මේ මාර්ගෝපදේශකයේ අංක 02 යටතේ කර්මාන්තකරුවන් ලියාපදිංචියේත් සඳහන් වෙලා තියෙනවා?

පි : තියෙනවා.

ප්‍ර : පැහැදිලි කරන්න මේ කොයි ආකාරයටද ලියාපදිංචිය සිද්ධ වෙන්න ඕන කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : ලියාපදිංචිය සඳහා අපි වාර්ෂිකව භාෂා තුනෙන් අපි පුවත්පත් දැන්වීම් පළ කරනවා. ඒ පුවත්පත් දැන්වීම් පළ කළාට පස්සේ මේ සඳහා අවශ්‍යතාවය තියෙන කර්මාන්තකරුවන් ඉල්ලුම් පත්‍රයක් මගින් අපගෙන් ඉල්ලීම් කළ යුතුයි. මේ ඉල්ලුම් පත්‍රය Web site එකෙන් ගන්න පුළුවන්. ඒ වගේම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ගන්න පුළුවන්. ඒ වගේම සියළුම ප්‍රාදේශීය කාර්යාලවලින් තමන්ගේ අයදුම්පත ගන්න පුළුවන්. මේ ගන්න අයදුම්පත ඔහු විසින් නිවැරදිව පුරවා නැවත අපේ ප්‍රාදේශීය කාර්යාල හෝ ප්‍රධාන කාර්යාලයට භාරදිය යුතුයි. මෙහිදී අප වසරකට රුපියල් දහසක මුදලක් අය කරනවා මේ සාමාජිකයත්වය වෙනුවෙන්, මේ ලියාපදිංචිය වෙනුවෙන්. මේ ලියාපදිංචිය සඳහා වන අයදුම්පත පිරවීමේදී සහ එය අපෙන් ලබා ගැනීමේදී සියළුම තොරතුරු නිවැරදිව සඳහන් කළ යුතුයි. එය අදාළ කර්මාන්තය පිහිටා තිබෙන වසමේ ග්‍රාම සේවා නිලධාරී මහත්මයා විසින් සනාථ කළ යුතුයි. එය ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව තමයි අපේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබෙන්නේ. ඉන්පසුව කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරී මහත්මයෙක් අදාළ කර්මාන්තශාලාවට ගිහිල්ලා එතනදී ඒ කර්මාන්තශාලාවේ ක්‍රියාකාරිත්වය, ඒ වගේම කර්මාන්තශාලාවේ මොන වගේ දේවල්ද නිෂ්පාදනය කරන්නේ, මොන වගේ භාණ්ඩද නිෂ්පාදනය කරන්නේ සහ ඒ අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලි අධ්‍යයනයක් කරලා එය වාර්තා කරනවා අදාළ අයදුම් පත්‍රයේම. මේ අයදුම් පත්‍රය සනාථ කළාට පස්සේ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ එය අනුමත කරලා ප්‍රධාන කාර්යාලය වෙත එවනු ලබනවා. ඉන්පසු අලෙවි අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත එය ලියාපදිංචිය සඳහා තෝරා ගන්නවා.

ප්‍ර : දැන් අබලි ලෝහ සඳහා අයදුම් පත්‍රය ඔබ කිව්වා මේ ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන්න ඕනෙයි කියලා?

පි : එහෙමයි නිවැරදියි.

ප්‍ර : ඒ සහතික කරන්න අවශ්‍ය වෙන්නේ අදාළ වසමේ කර්මාන්තයේ පැවැත්ම පිළිබඳව මෙහෙම කර්මාන්තශාලාවක් තියෙනවා කියන දේ පිළිබඳව එකී නිලධාරීන් පරීක්ෂා කරලා දැනුවත් වෙලා බවටයි එය සහතික කරන්නේ කියලා කිව්වොත් ඒක හරිද?

පි : එය නිවැරදියි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉන් අනතුරුව ඔබ කිව්වා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරියෙකු ගිහිල්ලා මේක ඒ කර්මාන්තකරුගේ අයදුම් පත්‍රය සඳහන් කර්මාන්තය පරීක්ෂා කරලා බලනවයි කියලා?

පි : නිවැරදියි.

ප්‍ර : ඒ කුමටද පරීක්ෂා කරලා බලන්නේ?

පි : අපගේ නිලධාරියා අදාළ කර්මාන්තයට ගොස් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය එය අබලි ද්‍රව්‍ය නිර්දේශය සඳහා ලබාදිය යුතුද, ඔහු ඒ අබලි ද්‍රව්‍ය ලබාගෙන කරන නිෂ්පාදනය මොකක්ද සහ ඔහුගේ ධාරිතාව ඔහු වසරකට ඒ අයදුම්පතේ තියෙනවා කොපමණ ප්‍රමාණයක් අයදුම් කළ යුතුද කියලා. ඒ ප්‍රමාණය නිර්දේශ කිරීම මෙවැනි කරුණු කාරණා නිවැරදිද කියලා තක්සේරුවක් ගැනීම සඳහා තමයි මේ ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරන්නේ.

ප්‍ර : ඒ අනුව ඒ පරීක්ෂණය සඳහා යා යුත්තේ ඒ සඳහා තාක්ෂණික දැනීමක් තිබෙන නිලධාරියෙකු නේද?

පි : දැනට අපි ප්‍රාදේශීය කාර්යාලවල ඉන්න නිලධාරීන් මේ සඳහා යොමු කරනවා. විශේෂ අවශ්‍යතාවයන් තියෙනවා. විශේෂ අවශ්‍යතාවයන් කියලා මම මෙහි සඳහන් කරන්නේ තාක්ෂණික වශයෙන් දැනුම සහ අත්දැකීම් තියෙන පුද්ගලයෙක් නිලධාරියෙක් එතනට යැවීම සඳහා වන අවශ්‍යතා තියෙනවා. මෙන්න මේ අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ තුළින් තමයි අපි ඉදිරියට තාක්ෂණික නිලධාරියෙකු සඳහා ඒ අවස්ථාව ලබා දෙන්නේ. නැත්නම් සාමාන්‍යයෙන් අපි කරන්නේ ප්‍රාදේශීය කාර්යාලයේ ඉන්න නිලධාරී මහත්මයෙක් තමයි මේ සඳහා යොදවා ගන්නේ.

ප්‍ර : දැන් මහත්මයා මේ මාර්ගෝපදේශකයේ අංක 3 සහ 4 වශයෙන් දන්න කරුණු යටතේ සඳහන් වෙන්නේ රජයේ ආයතනවලින් අබලි ලෝහ ප්‍රසම්පාදනය සහ ඒ අවශ්‍ය තක්සේරුව ලබා දීම සම්බන්ධයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබට සැකෙවින් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : අපි සියළුම රාජ්‍ය ආයතනවලට ලිඛිතව දැනුම් දෙනවා අපිට අබලි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් තිබෙනවා කියලා. ඒ වගේම අපි කැබිනට් පත්‍රිකාව හරහා අපි මෙය ක්‍රියාත්මක කරලා අපි සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට කෙසේද ඔවුන්ගේ අබලි ද්‍රව්‍ය ලබා දීලා ඔවුන්ගේ කර්මාන්තය සඳහා අපි දායකත්වය අපේ අත්වැල දෙන්නේ කියලා. අපි ලිඛිතව ඔවුන්ට දැනුම් දීලා ඔවුන් ළඟ තියෙන මේ අබලි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා අපි ක්‍රියාත්මක වෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අබලි ලෝහ ද්‍රව්‍ය මිලදී ගැනීමේ පදනම වෙන්නේ වත්මන් තොග පවත්නා ප්‍රමාණය, ඒවායේ භාවිතය, පරිභෝජනය සහ ඉල්ලුම මත කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : එය නිවැරදියි.

ප්‍ර : දැන් අබලි ලෝහ ලැයිස්තුවක් සහ රාජ්‍ය ආයතන අදාළ අබලි ලෝහ සැපයිය හැකි ලබාගත හැකි රාජ්‍ය ආයතන සම්බන්ධයෙනුත් මේ මාර්ගෝපදේශකයේ සඳහන් වෙලා තිබෙනවද?

පි : එහෙමයි. සඳහන් වෙලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒවායේ තෝරාගත් අබලි ලෝහ කාණ්ඩ වශයෙන් මොනවද සඳහන් වෙලා තියෙන්නේ?

පි : අබලි යකඩ, චීනචට්ටි, ඇළුමිනියම්, පිත්තල, තඹ, පියුටර්, දුණුකොළ සහ ඊයම් මෙහි සඳහන්ව තිබෙනවා

ප්‍ර : ඒ එක් එක් අබලි ලෝහ කාණ්ඩ සැපයීමට හැකි රාජ්‍ය ආයතනත් වගුගත කරලා මෙහි සඳහන් වෙලා තිබෙනවද?

පි : එහෙමයි. එහි සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර : ඒ අනුව ඔබ අබලි යකඩ, චීනචට්ටි සපයන ප්‍රධාන රාජ්‍ය ආයතන මොනවාද කියලා සඳහන් කරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. අබලි යකඩ සහ චීනචට්ටි අපට ලබා දෙන්නේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මහේස්ත්‍රාත්, අධිකරණ, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, රෝහල්, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා යුධ හමුදාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

ප්‍ර : ඇළුමිනියම් අබලි ලෝහ කාණ්ඩ ලබා ගන්න පුළුවන් රාජ්‍ය ආයතන මොනවාද?

පි : ඇළුමිනියම් අපට ලබාගත හැකි වන්නේ ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ගමනාගමන මණ්ඩලය, මහේස්ත්‍රාත් අධිකරණ, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, රෝහල්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

ප්‍ර : පිත්තල අබලි ලෝහ කාණ්ඩ කොහොමද මොන ආයතනවලින්ද ලබා ගන්න පුළුවන්?

පි : පිත්තල අපිට ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, රෝහල් විශේෂයෙන් අපිට සඳහන් කරන්න පුළුවන් ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : තඹ ලබා ගන්න පුළුවන් රාජ්‍ය ආයතන මොනවාද?

පි : ලංකා විදුලිබල මණ්ඩලයෙන් අපිට තඹ ලබා ගන්න පුළුවන්. මහේස්ත්‍රාත් අධිකරණ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, රෝහල් මේ සඳහා අපිට අවස්ථාව ලබා දීලා තියෙනවා.

ප්‍ර : දැන් මේ තඹ ලබා ගන්නකොට ඔබ සඳහන් කළා ලංකා විදුලිබල මණ්ඩලය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහොමද තඹ ලබා ගන්න පුළුවන් මේ විදුලිබල මණ්ඩලයෙන්?

පි : විශේෂයෙන්ම තඹ කියන ලෝහය අපිට සෘජුව ලබා ගැනීමේ හැකියාවක් නැහැ. අපි තඹ ලබා ගන්නේ Transformer නිෂ්පාදනය කරලා තියෙන තඹ භාවිතා කරලා. ඒ නිසා අපි Transformer හරහා තමයි විශේෂයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයෙන් අපි තඹ ලබා ගන්නේ.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ටෙලිකොම් ආයතනයේ තඹ කේබල් තමන්ලා ගන්නේ නැද්ද?

පි : අපි ගන්න ඇත්තටම අපි ඉල්ලීම් කරනවා දිගටම. ගැටළුවක් තිබෙනවා. ඒගොල්ලෝ Semi Government නිසා ඒගොල්ලන් විශේෂයෙන්ම ටෙලිකොම් ආයතනයෙන් අපිට තඹ ලබා දීම සිදු වෙන්නේ නැහැ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : දැන් මේ පිත්තල වැඩි වශයෙන් ලබා ගන්නේ කොහොමද?

පි : පිත්තල අපිට මා ඉහත සඳහන් ....,

ප්‍ර : ඔව්. ඔබ දැන් සඳහන් කළානේ?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව ඉන් පස්සේ මේ 2017 වර්ෂයෙන් විතර පස්සේ පිත්තල වෙනත් ආයතනයකින් විශේෂයෙන් තොග වශයෙන් ලබා ගැනීමක් සිදු කළාද?

පි : එහෙමයි.

ප්‍ර : පැහැදිලි කරන්න?

පි : විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ පසුගිය යුධ සමයේදී භාවිතා කරන ලද පිත්තල කොපු, උණ්ඩ කොපු ඔවුන් ගාව ගොඩක් තියෙනවයි කියලා අපිට දැනුම් දීමක් කළා. ඒ අනුව

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔවුන් එක්ක සාකච්ඡාවක් කරලා, ඒ සියළුම එතනදී අපිට මූලික වශයෙන් ටොන් 300 ක් විතර තියෙනවා කියලා තමයි අපිට දැනුම් දුන්නේ. ඒ අනුව ඒ පිත්තල කොපු කිසිසේත්ම භාවිතයට ගත නොහැකි විදියට තලලා තමයි අපිට ලබා දෙන්නේ. එය උණු කිරීමෙන් පමණයි කිසියම් හෝ ප්‍රයෝජනයකට ලබාගත හැක්කේ.

****

ගරු අදිකාරි මැතිණිය :

ප්‍ර : ආරක්ෂක අමාත්‍යාංශයෙන් පිත්තල කොපු ලබාදීම ආරම්භ වුණේ මොන වර්ෂයේදීද?

පි : 2017 අවුරුද්දේදී.

ප්‍ර : ඊට ඉස්සරලා ආරක්ෂක අමාත්‍යාංශය දුන්නේ නැහැ නේද පිත්තල කොපු?

පි : පිත්තල කොපු දීලා නැහැ ස්වාමීනි.

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : දැන් මම ඔබෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ මේ වගුවේ සඳහන් වෙන්නේ නැහැ. නමුත් ඒක දැන් ඒ ආකාරයට ලබා ගැනීමක් සිදු කරනු ලබන නිසා?

පි : එහෙමයි ස්වාමීනි. මේක විශේෂ අවස්ථාවක්.

ප්‍ර : පියුටර කියලා අබලි ලෝහ කාණ්ඩයක් තිබෙනවද?

පි : තියෙනවා.

ප්‍ර : එය කොහෙන්ද ලබා ගන්න පුළුවන්?

පි : ලංකා විදුලිබල මණ්ඩලයෙන්.

ප්‍ර : දුණුකොළ අබලි ලෝහ කාණ්ඩ කොහෙන්ද ලබා ගන්නේ?

පි : ගමනාගමන මණ්ඩලය හරහා ලබා ගන්නවා. වාහනවල තියෙන අමුද්‍රව්‍යයක් විදියට තමයි මේකේ තියෙන්නේ. එය අපට ලබාගත හැකියි.

ප්‍ර : ඊයම් ලබා ගන්නේ?

පි : ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් අපිට ලබා ගන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා මේ ආකාරයට ප්‍රධාන රජයේ ආයතනවලින් ලබා ගන්න මේ අබලි ලෝහ කර්මාන්තකරුවන්ට නිකුත් කරනකොට යම්කිසි නිර්නායක සැළකිල්ලට ගන්නවද?

පි : එහෙමයි.

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් මේ නැවත මම ඔබෙන් අහන්නේ මේ කර්මාන්තකරුවන්ට අබලි ලෝහ නිකුත් කිරීමේදී මොනවා හරි කරුණු නිර්නායක සැළකිල්ලට ගන්නවද?

පි : එහෙමයි. නිර්නායක සැළකිල්ලට ගන්නවා.

ප : එය 2013 මාර්ගෝපදේශකයේත් සඳහන් වෙලා තිබෙනවද?

පි : එහෙමයි. සඳහන් වෙලා තිබෙනවා.

ප : ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

පි : පුළුවන්. විශේෂයෙන්ම අපි කාණ්ඩ කරනවා අපේ ඉන්න කර්මාන්තකරුවන්. ඔවුන් සුළු, කුඩා සහ මධ්‍ය වශයෙන්. විශේෂයෙන්ම මෙම කර්මාන්තකරුවන් මෙසේ කාණ්ඩ කිරීමේදී අපි ඔවුන්ගේ වාර්ෂික පිරිවැටුම සළකා බලනවා. මේ පිරිවැටුම වාර්ෂිකව මිලියන දහයට අඩු නම් ඔහු අපි සුළු පරිමාණ කර්මාන්තකරුවෙක් විදියටයි සළකන්නේ. මිලියන දහය සහ මිලියන දෙසීය කියන පිරිවැටුම් තලයේ ඉන්නවා නම් ඔවුන් අපි කුඩා පරිමාණ කර්මාන්තකරුවන් විදියට සළකනවා. මිලියන දෙසීය සහ මිලියන හයසීය කියන අංශයේ ඉන්නවා නම් ඔවුන් අපි මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විදියට සළකනවා. ඒ නිසා ඔවුන්ගේ වාර්ෂික පිරිවැටුම මෙහිදී සළකා බලනවා. ඒ පිරිවැටුම අනුව ඔවුන් අදාළ කාණ්ඩය සඳහා යොමු කරනු ලබනවා.

ප : ඊට අමතරව සේවක සංඛ්‍යාවත් සැළකිල්ලට ගන්නවාද?

පි : සේවක සංඛ්‍යාවත් සැළකිල්ලට ගන්නවා. විශේෂයෙන්ම මෙතනදී අපි සේවක සංඛ්‍යාව සැළකිල්ලට විශේෂයෙන්ම සළකා බලන්නේ වාර්ෂික පිරිවැටුම. විශේෂයෙන්ම මේ සේවක සංඛ්‍යාව සැළකීමේදී ස්වාමීනි සමහර අංශයන්වල සේවක ප්‍රමාණය වැඩියෙන් භාවිතා කරනවා. සමහර අංශයන්ගේ සේවක ප්‍රමාණය අඩුවෙන් භාවිතා කරනවා. මේ නිසා අපි ඒ අංශය ගැන සැළකිලිවුණා. සළකනවා අපි. කෙසේ වෙතත් මූලිකව අපි සළකා බලන්නේ වාර්ෂික පිරිවැටුම මත.

ප : දැන් ඔබ සඳහන් කරන ආකාරයට මේ නිර්නායක යොදා ගන්නේ සුළු, කුඩා හෝ මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් පමණයි?

පි : එහෙමයි.

ප : ඒ කියන්නේ මේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට පමණයි?

පි : එහෙමයි. අපේ පනතින් අපිට අවසර ලබා දීලා තියෙන්නේ මේ කාණ්ඩයන් තුන සඳහා වන අවශ්‍යතා සපුරාලන්නටයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : යම් කර්මාන්තකරුවෙක් වාර්ෂික පිරිවැටුම මිලියන 600 ඉක්මවා යනවා නම් ඔහු මහා පරිමාණ කර්මාන්තකරුවෙක් විදියටද ඒ අනුව සළකනු ලබන්නේ?

පි : එහෙමයි. නිවැරදියි.

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඔය රජයේ ආයතනවලින් බැහැර කෙරෙන මේ අබලි ලෝහ මිලදී ගැනීමේදී මිල තීරණය කරන්නේ කොහොමද? ඒකට මොකක් හරි නිර්නායක තිබෙනවද ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න?

පි : විශේෂයෙන්ම මිල කමිටුව අපි කැඳවන්නේ අපිට අබලි ද්‍රව්‍ය ලබාදෙන රාජ්‍ය ආයතන ...,

ප්‍ර : ඉස්සරලම කියන්න ගෙවන්න ඕනද? සල්ලි ගෙවන්න ඕනද? රජයේ ආයතනවලට කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ඒ අබලි ලෝහ ලබා ගන්නකොට ගෙවීමක් කරන්න ඕනද?

පි : ගෙවීමක් කළ යුතුයි.

ප්‍ර : ගෙවීමක් කරලා තමයි ඔබ ආයතනය ලබා ගන්නේ?

පි : අපි ලබා ගන්නේ ගෙවීමක් කරලා. මේ ගෙවීමේ ප්‍රමාණය කිලෝ එකකට කොච්චරක්ද කොපමණද කියන එක තීරණය කිරීම සහ අදාළ අබලි ද්‍රව්‍ය කර්මාන්තකරුවන්ට ලබා දීමේ මිල තීරණය කිරීම සඳහා මෙන්න මේ මිල කමිටුව, අපි සඳහන් කරපු මිල කමිටුව ස්වාමීනි වැදගත් වෙනවා. මේ මිල කමිටුවේදී අපි විශේෂයෙන්ම අබලි ද්‍රව්‍ය ලබාදෙන රාජ්‍ය ආයතන නිලධාරීන් සහ අපේ කර්මාන්තකරුවන් සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්, ඒ වගේම අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මාර්ගයෙන් තමයි මෙය තීරණය කරන්නේ. මෙතනදී විශේෂයෙන්ම අපි සළකන්නේ අදාළ අබලි ද්‍රව්‍ය කුමක්ද, එය වෙළඳපොලේ විටිනාකම කීයද, එය අදාළ රාජ්‍ය ආයතන අපට ලබාදෙන මිල ඒ අනුව අපි තීරණය කරනවා. ඒ සඳහා සටහනක් තියෙනවා. ඒ මිල අනුව අපි අදාළ කර්මාන්තකරුවන්ට ලබා දෙන්නේ කෙසේද යන්න මෙන්න මේ සියළු කරුණු කාරණා මෙහිදී සාකච්ඡා කරනවා.

ප්‍ර : මේ 2013 නොවැම්බර් 13 මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 6 වශයෙන් මේ මිල කමිටුව සංයුතිය සහ එය අනුගමනය කරන ක්‍රියා පටිපාටියේ සඳහන් වෙලා තිබෙනවද?

පි : එහෙමයි. නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා අදාළ අමාත්‍යාංශයේ සාමාජිකයන් දෙදෙනෙකුත්, ඔබේ ආයතනයේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුත්, ඒ අමුද්‍රව්‍ය බැහැර කරන රාජ්‍ය ආයතනවල සාමාජිකයෝ දෙදෙනෙකුත් මිල කමිටුවේ අඩංගු වෙනවයි කියලා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ඊට අමතරව කාර්මික, ඒ කියන්නේ මේ කර්මාන්තකරුවන් මිලදී ගන්න කාර්මික සංගමයේ සාමාජිකයනුත් දෙදෙනෙක් එහි සංයුක්ත වෙනවද?

පි : එසේමයි.

ප්‍ර : ඇයි ඒ?

පි : ඔවුන් තමයි තීරණය කරන්නේ වෙළඳපොල වටිනාකමට ඔවුන් දායකත්වයක් ලබා දෙනවා. විශේෂයෙන්ම වෙළඳපොල මිල තීරණය කිරීමේදී ඔවුන්ගේ සහාය ඉතාමත් වැදගත්. ඔවුන් තමයි දන්නේ වර්තමානයේ අපි දකින මිලට නෙමෙයි ඇත්තටම ප්‍රායෝගිකව ඔවුන් අත් වින්ද මිල තමයි අපිත් එක්ක සාකච්ඡා කරන්නේ. ඒ අනුව ඔවුන් අපිට අදහස් ලබා දෙනවා. මේ මිල අඩු වෙන්න ඕන. මේ මිල වැඩි වෙන්න ඕන කියලා ප්‍රායෝගිකව ඔවුන් අත් වින්ද තත්ත්වය තමයි අපිට පැහැදිලි කරන්නේ. ඒ අනුව අපි සාකච්ඡා කරනවා අපිට ලබාදෙන, අපට ද්‍රව්‍ය ලබාදෙන ආයතනත් එක්ක ලබා දීලා තමයි අපි මිල තීරණය කරන්නේ. මොකද ඔවුන්ට අපි විශේෂයෙන්ම වටටම් ලබා දෙනවා මේ සඳහා. ඒ වට්ටම් ලබා දීමේදී ඔවුන්ට උපරිම සහනය ලබා දීම සඳහා මෙය ක්‍රියාත්මක වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව අබලි ලෝහවල ගැණුම් මිල තීරණය කරන්නේ මේ මිල කමිටුව විසින් කියලා කිව්වොත් ඒක හරිද?

පි : එහෙමයි නිවැරදියි.

ප්‍ර : එතකොට ගෙවීම් ක්‍රමවේදය අබලි ලෝහ මිලට ගැනීම වෙනුවෙන් රාජ්‍ය ආයතනයට ගෙවිය යුතු මුදල් පියවීම ඒ ආදී කටයුතුත් කළමනාකරණය කරන්නේ මේ මිල කමිටුවෙන්ද?

පි : එහෙමයි. විශේෂයෙන්ම වර්තමානය වනවිට අබලි ද්‍රව්‍ය සඳහා මිල ගෙවීම ක්‍රම දෙකකට සිද්ධ වෙනවා. ඇත්තටම 2005 වසරේ මේ පනත ක්‍රියාත්මක වෙද්දී මේ තත්ත්වය තිබුණේ නැහැ ස්වාමීනි. වර්තමානය වෙනකොට මිල අපි තීරණය කළාට පස්සේ අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී මිලදී ගත්තට පස්සේ අපි ඒ සඳහා අදාළ බර අනුව අපි අදාළ රාජ්‍ය ආයතනයට අපි මුදල් ගෙවනවා. විශේෂයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේත් ඔවුන්ගේ ඉන්වොයිස්පත ඔවුන් ඉදිරිපත් කරහම ඔවුන්ට අපි මුලින්ම මුදල් ගෙව්වට පස්සේ තමයි ඔවුන්ගේ අබලි ද්‍රව්‍ය අපිට ලබා දෙන්නේ. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයත් එසේමයි.

ප්‍ර : දැන් ඔබ මෙතෙක් වෙලා පැවසුවේ මේ අබලි ලෝහ ගැණුම් මිල තීරණය කිරීම සම්බන්ධයෙන්. ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද අබලි ලෝහ විකුණුම් මිල කොහොමද තිරණය කරන්නේ කියලා?

පි : පුළුවන් ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ කර්මාන්තකරුවන්ට විකුණන මිල?

පි : විශේෂයෙන්ම මෙතනදී අපි විකුණුම් මිල තීරණය කිරීමේදී අපි ගැණුම් මිලට අපි ප්‍රවාහන ගාස්තුවක් අය කරනවා. ඒ වගේම අපේ කාර්යාල වියදම් සඳහා අපි කිසියම් මුදලක් අය කරනවා. ඒ වගේම අපි ලාභයක් තබා ගන්නවා. ඒත් එක්කම අපිට අදාළ බදු මුදල් ගෙවීමෙන් පසුව විකුණුම් මිල තීරණය වෙනවා.

ප්‍ර : විකුණුම් මිල තීරණය කරන මොකක් හරි සූත්‍රයක් තියෙනවද?

පි : විකුණුම් මිල තීරණය කිරීමේදී විශේෂයෙන්ම මම මුලින් සඳහන් කළා වගේ සුළු කර්මාන්ත, කුඩා කර්මාන්ත සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා වන ලබා දෙන විශේෂ වට්ටම් අපි සූදානම් කරලා තියෙනවා. සුළු කර්මාන්ත සඳහා අපි 25% ත් 30% ත් කියන ප්‍රමාණයට අපි ඔවුන්ට වට්ටම් ලබා දෙනවා. විශේෂයෙන්ම මේ වට්ටම් ලබා දීමේදී අපි වෙළඳපොලේ එකඟ වෙන, එහෙම නැත්නම් අද කර්මාන්තකරුවන් සහ අපිට අබලි ද්‍රව්‍ය ලබාදෙන ආයතනත් සමඟ එකඟ වෙන මිලෙන් අපි 25% ක් සහ 30% ක් අතර මේ දෙකෙන් එකක් අපි උපයෝගී කර ගන්නවා අදාළ සහනය ලබා දීම සඳහා මේ සුළු කර්මාන්තකරුවන් සඳහා. විශේෂයෙන්ම කුඩා පරිමාණ කර්මාන්තකරුවන් සඳහා එය 20% ත් 25% ත් වෙනවා. මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා එය 10% ත් 15% ත් අතර වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ සුළු කර්මාන්තකරුවන් සඳහා වැඩි වට්ටමක් 25% ත් 30% ත් අතර වට්ටමක් ලබා දෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඊට වඩා අඩු මට්ටමක් කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ටත්, මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට ඊට වඩා අඩු වට්ටමකුත් ලබා දීමක් සිදු කරනවා?

පි : එහෙමයි. එය නිවැරදියි.

ප්‍ර : එයින් අදහස් වෙන්නේ මේ කුඩා, සුළු, මධ්‍යම කර්මාන්ත සංවර්ධනය කිරීම ව්‍යාපාර සංවර්ධනයටද මේ වට්ටමක් ලබා දීලා දිරිමත් කිරීමක් සිදු කරනු ලබන්නේ?

පි : එසේමයි. අපගේ විශේෂයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයේ විශේෂ අපගේ ඉලක්කය තමයි විශේෂයෙන්ම සුළු කර්මාන්ත ලංකාවේ නඟා සිටුවීම. ඒ වගේම සියළුම කර්මාන්ත නඟා සිටුවීම තමයි අපේ ඉලක්කය. කෙසේ වෙතත් සුළු කර්මාන්ත සඳහා අපි ප්‍රමුඛත්වය ලබා දෙනවා. ඔවුන්ව තමයි අපි නඟා සිටුවන්නට ඕන. ඒ නිසා ඔවුන්ගේ ප්‍රමාණය වැඩියි. ඔවුන්ගේ වපසරිය එහෙම

FAIR COMMENT BY JEZEEM

නැත්නම් ඒ කර්මාන්තකරුවන්ගේ ප්‍රමාණය වැඩියි. ඔවුන් නඟා සිටුවීම සඳහා තමයි විශේෂයෙන්ම ඔවුන්ට 25% ක අපි වට්ටමක් ලබා දෙන්නේ. කුඩා පරිමාණ කර්මාන්ත කියන්නේ සාමාන්‍යයෙන් පිරිවැටුම මිලියන 200 ක වගේ ප්‍රමාණයේ තියෙන අය. ඒ නිසා ඔවුන්ට අපි දෙන ප්‍රමාණය ඊට වැඩිය ටිකක් අඩුවෙන් තමයි ලබා දෙන්නේ.

ප්‍ර : දැන් මේ අබලි ලෝහ ව්‍යාපෘතිය වාර්ෂිකව විශේෂ විගණනයක් සිදු කරලා මෙය කළමනාකරණය කළ යුතු බවට අභ්‍යන්තර විගණනයක් මගින් කළමනාකරණය සිදු කළයුතු බවට මේ මාර්ගෝපදේශකයේත් සඳහන් වෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කොහේද සඳහන් වෙන්නේ?

පි : අංක 08 යටතේ සඳහන් වෙනවා.

ප්‍ර : අභ්‍යන්තර විගණනයක් වාර්ෂිකව සිදු කළයුතු බවට?

පි : එහෙමයි.

ප්‍ර : එය ප්‍රායෝගිකව වාර්ෂිකව සිදු වෙනවද?

පි : ප්‍රායෝගිකව අභ්‍යන්තර විගණනයක් සිද්ධ වෙනවා.

ප්‍ර : දැන් ඔබ මේ මාර්ගෝපදේශකයේ එක් ස්ථානයකදී සඳහන් කළා මෙහි දැනටමත් C-754(a) වශයෙන් ලකුණු කරපු ස්ථානයේ සඳහන් වෙනවා මෙහි ප්‍රධාන වගකිව යුතු නිලධාරියා තමයි අධ්‍යක්ෂ (අලෙවි) කියලා?

පි : එහෙමයි. එය නිවැරදියි.

ප්‍ර : ඔබ සඳහන් කළා 2015.07.10 වෙනිදා ඉඳලා මේ දක්වා ඔබ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ (අලෙවි) වශයෙන් කටයුතු කරනු ලබනවා කියලා?

පි : එහෙමයි. එය නිවැරදියි.

ප්‍ර : මේ අබලි ලෝහ කළමනාකරණ ව්‍යාපෘතියේ ඒ අනුව මේ අවුරුදු පහ පුරාවට මහත්මයාගේ අධීක්ෂණය යටතේද සිද්ධ වුණේ. නැත්නම් ඒකේ වෙනසක් වෙනවද?

පි : මේක මගේ අධීක්ෂණයෙන් නෙමෙයි සිද්ධ වුණේ. 2015 ජූලි මාසේ 10 වෙනිදා මම රාජකාරී භාර ගන්නවා අලෙවි අධ්‍යක්ෂ විදියට. මෙය මම මුලින් සඳහන් කළ ඒකකයන් හතර මම ක්‍රියාත්මක කරනවා මගේ නිලධාරීන් හරහා. 2015.05.17 දිනයේදී දැනුම් දීමකින් තොරව මාව අලෙවි අධ්‍යක්ෂ ධුරයේ සිටියදීම අබලි ඒකකය මගෙන් ඉවත් කරනවා.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : සාක්ෂිකරු කලබල වෙන්නේ නැතුව හොඳට හිතලා උත්තර දෙන්න. ඔබව අලෙවි අධ්‍යක්ෂ වශයෙන් පත් කරන්නේ 2015 ජූලි මාසේ 10 වෙනිදා?

පි : එහෙමයි ස්වාමීනි.

ප : 2015 ජූලි මාසේ 10 වෙනිදා ඉඳලා කවදා වෙනකම් ඔබ ඒ තනතුර දැරුවද?

පි : තනතුර තවම දරනවා ස්වාමීනි. එහි අබලි කළමනාකරණ ඒකකය මගේ යටතේ තිබුණේ. එය මගෙන් ඉවත් කරනු ලැබුවා 2017.05.17 වෙනිදා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප : දැන් ඔබ කිව්වා මේ අබලි ලෝහ ව්‍යාපෘතිය මහත්මයාගෙන් ඉවත් කරනු ලැබුවා කියලා ඔබගේ රාජකාරී ලැයිස්තුවෙන්?

පි : එහෙමයි.

ප : ඔබට එය කවුද දැනුම් දුන්නේ? මොන ආකාරයටද දැනුම් දුන්නේ?

පි : මට ලිඛිතව, එවකට හිටපු මගේ සභාපතිතුමා මට ලිඛිතව දැනුම් දුන්නා. මගේ දැනීමේ හැටියට පනත යටතේ මට ලබා දීලා තියෙන්නේ නිසි බලධාරියා විදියට මම. ඒ නිසා අධ්‍යක්ෂවරයා සහ අධ්‍යක්ෂවරයා ඉවත් කිරීම කෙසේ වුවාදැයි කියා මට පැහැදිලි නැහැ. ඇයි මාව ඉවත් කළේ කියන එකටත් හේතු සාධක නැතුව තමයි මාව ඉවත් කරලා තියෙන්නේ.

ප : දැන් ඔබට ඔබේ ඒ රාජකාරී ඉවත් කිරීම සහ ඔබව අබලි ලෝහ කළමනාකරණ කටයුතුවලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඔබට ලබා දුන්නු ලිපියේ පිටපතක් මේ අවස්ථාවේදී ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : හැකියාවක් තියෙනවා ස්වාමීනි.

ප : එය 2017.05.17 දින දරන අංක 3/1/1/44 දරන අංකය සහ ඔබ සඳහන් කළ පරිදි සභාපතිවරයෙකු විසින් අත්සන් කරන ලද ලිපිය කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : එය නිවැරදියි.

(අදාළ ලිපිය C-755 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා)

ප : දැන් මහත්මයා මේ C-755 කියන ලිපියේ, අදාළ ලිපියේ අත්සනක් තිබෙනවා මේ Chairman, Industrial Development Board of Ceylon කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : ඒ අත්සන කාගෙද කියලා ඔබට හඳුනාගන්න පුළුවන්ද?

පි : එය මගේ හිටපු සභාපතිවරයාගේ අත්සන.

ප්‍ර : නම කියන්න?

පි : මහින්ද ජිනසේන මැතිතුමා.

ප්‍ර : එතුමා විසින් අත්සන් කරන ලද ලේඛන ඔබට ඔබේ රාජකාරී පරාසය තුළදී දක්නට ලැබිලා තියෙනවද?

පි : ඉන් පෙර ලැබිලා තියෙනවා.

ප්‍ර : ඒ අනුව ඔබට ඒ අත්සන හඳුනා ගන්න පුළුවන්ද?

පි : මට හඳුනා ගත හැකියි.

ප්‍ර : දැන් මේ ලිපියේ මොනවද සඳහන් වෙලා තියෙන්නේ?

පි : මේ ලිපියේ විශේෂයෙන්ම සඳහන් වෙලා තියෙන්නේ අබලි ද්‍රව්‍ය ඒකකයෙන් මා ඉවත් කර ඒ වෙනුවට මගේ අංශයේ රාජකාරී කළ, එවකට රාජකාරී කළ උප කොන්ත්‍රාත් ඒකකය මා රාජකාරි සඳහා භාරදීලා තිබුණා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුට. ඔහුට ඒ අදාළ සියළු වගකීම් පවරා තිබුණා.

ප්‍ර : කවුද ඒ නිලධාරියා?

පි : පී.පී.පී.එස්. දික්වැල්ල මහත්මයා. ඔහු නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් මා යටතේ සිටිය.

ප්‍ර : දැන් මේ C-755 කියන ලිපියේ ඔබට මේ පී.පී.පී.එස්. දික්වැල්ල, නියෝජ්‍ය අධ්‍යක්ෂ විදියට එවකට කටයුතු කරපු නිලධාරියෙක්ට ඔබේ රාජකාරී අබලි ලෝහ කළමනාකරණය සම්බන්ධ රාජකාරී භාර දීම සම්බන්ධයෙන් යමක් සඳහන් වෙලා තිබෙනවද? ඒක පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : ඔව්. මෙතන මට ලබා දුන් ලිපියේ සඳහන් වෙලා තියෙනවා මා සතු සියළු ලිපි ලේඛන අබලි ද්‍රව්‍ය ඒකකය සඳහා වන සියළු ලිපි ලේඛන අදාළ නිලධාරියාට වහාම භාර දෙන ලෙස.

ප්‍ර : දැන් එහෙම ඔබේ යටතේ තිබිච්ච එකී අංශය, ඒ රාජකාරිය ඔබ යටතේ සිටි නිලධාරියෙකුට එසේ භාර දීමට කටයුතු කරන්න ඒක හේතු වුණේ මොකද්ද කියලා ඔබ එවකට හිටපු සභාපතිගෙන් අහලා බැලුවද? හොයලා බැලුවද?

පි : මම සභාපතිතුමත් එක්ක සාකච්ඡා කළා. සභාපතිතුමා ඒකට පැහැදිලි උත්තරයක් දුන්නේ නැහැ මට ඒ අවස්ථාවේදී. ඒ විදියට තමයි එදා ඒ සාකච්ඡාව ඉවර වුණේ.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප්‍ර : පැහැදිලි උත්තරයක් දුන්නේ නැහැ කියන්නේ මොකක් හරි උත්තරයක් දුන්නද?

පි : නැහැ ස්වාමීනි. මේ විදියට ඔයා වැඩ කරගෙන යන්න කියන පණිවිඩය තමයි මට එතුමා එදා ලබා දුන්නේ.

ප්‍ර : එසේ ඔබගෙන් ඒ ඒකකය ඉවත් කිරීමට පෙර යම්කිසි මොනවා හරි සිද්ධියක් වුණාද? ඔහු ඔබට කියපු දෙයක් ඔබ කෙරුවේ නැද්ද? නැත්නම් ඒ වගේ සිද්ධියක් වුණාද?

පි : නැහැ ස්වාමීනි. එහෙම සිද්ධියක් වුණේ නැහැ. සාමාන්‍යයෙන් මා කාර්මික සංවර්ධන මණ්ඩලය තුළ රාජකාරී කරන්නේ කිසියම් වූ නීති රාමුවක් තුළ. එතනින් එහාට මට යන්න බැහැ කියන පණිවිඩය මම හැම කෙනාටම දීලා තියෙනවා. ඒ රාමුවේ තමයි මම රාජකාරී කළේ. හැබැයි කිසිම අවස්ථාවක සභාපතිතුමා මට බලපෑම් කරලා නැහැ මේ දේ කරන්න, මේ දේ කරන්න කියලා. කෙසේ වෙතත් මා රාජකාරී කරන කාලය හැම අවස්ථාවකදීම නීති රාමුවක් තුළ කටයුතු කරන්න මම ක්‍රියාත්මක වෙනවා.

****

ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : ඒ කියන්නේ ඔබ අධ්‍යක්ෂ (අලෙවි) කියන තනතුරේම රැකියාව කළා. නමුත් ඔබට අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරීවලින් ඔබ සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබුවා කිව්වොත්?

පි : එහෙමයි එය නිවැරදියි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : එම අබලි ද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ ඔබගේම නියෝජ්‍ය අධ්‍යක්ෂ කෙනෙකුට දුන්නනේ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට එයා අධීක්ෂණය කරන්නේ කවුද?

පි : එයා අධීක්ෂණය කරන්නේ සෘජුවම සභාපතිතුමා.

ප්‍ර : නමුත් ඔහු ඉන්නේ ඔබගේ අංශයේ නේද?

පි : මගේ අංශයේ ඉන්නේ.

ප්‍ර : ඔහු නියෝජ්‍ය අධ්‍යක්ෂ?

පි : එහෙමයි.

ප්‍ර : එයාව අධීක්ෂණය කරන්නේ කෙළින්ම සභාපතිතුමා?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : සභාපතිතුමා.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : දැන් ඔබට දැන ගන්න ලැබුණ විදියට හෝ ඔබට හිතුණ විදියට ඇයි මෙහෙම කළේ?

පි : මට සෘජු පිළිතුරක් දෙන්න බැහැ. හේතුව සභාපතිතුමාගේ සිතුවිල්ල කෙසේද කියා. කෙසේ වෙතත් මා හැම වෙලාවෙම අවස්ථාව කර ගන්නේ මා නිවැරදිව රාජකාරී කරන නිසා එය කිසියම් වූ බාධකයක් වුණාද කියන්න මම දන්නේ නැහැ. කෙසේ වෙතත් මම නිවැරදි රාජකාරී කරන විදියට තමයි මම එතන කටයුතු කරන්නේ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :

ප්‍ර : දැන් ඒ අනුව 2017.05.17 වෙනිදායින් පස්සේ අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරී කටයුතුවලට මහත්මයා සහභාගී වුණේ නැද්ද?

පි : නැහැ මම සහභාගී වුණේ නැහැ.

ප්‍ර : ඊට පස්සේ නැවතත් ඔබට යම් අවස්ථාවකදී ඒ ඔබෙන් ඉවත් කරපු රාජකාරී කටයුත්තම නැවත ඔබට භාරදීමක් සිදු කරාද?

පි : එහෙමයි. නැවත මට භාර දුන්නා.

ප්‍ර : ඒ කොයි කාලයේද?

පි : ඒ 2019.05.16 වෙනිදා නව සභාපතිවරයෙක් පැමිණියා නවීන් අදිකාරම් මහත්මයා. එතුමා පැමිණියට පසුව මෙහි කිසියම් වූ මෙය නිවැරදි කළ යුතුයි ඔහු මාත් සමඟ පැවසුවා. Guide Line මාර්ගෝපදේශනය යටතේ ඔබ තමයි නිසි බලධාරයා. ඒ නිසා වෙනත් අයෙකුට මෙය පැවරීම නොගැළපෙන බවද සඳහන් කළා. ඒ නිසා ඔහු වහාම මාව යථා තත්ත්වයට පත් කළා.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබට ලිපියක් මගින් දැනුම් දීමක් කරනු ලැබුවද?

පි : එහෙමයි ස්වාමීනි. මට ලබා දීලා තියෙනවා ලිපියකින්.

ප්‍ර : ඔබට ලැබිච්ච ඒ ලිපිය මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : හැකියාවක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔබ ප්‍රකාශය ලබාදෙන කොට පොලිස් ඒකකයට ලබා දුන්නාද?

පි : දුන්නා. මුලින්ම මම ලබා දුන්නා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබට ඒ ලිපිය නැවත දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(සාක්ෂිකරුට 2019.05.16 සහ 3/1/1/44 දරන ලිපිය පෙන්වා සිටිනවා)

ප්‍ර : මේක ඔබ හඳුනා ගන්නවද?

පි : හඳුනනවා. එහෙමයි.

ප්‍ර : කාටද මේක ආමන්ත්‍රණය කරලා තියෙන්නේ?

පි : මෙය මා වෙත එවන ලද ලිපියක්. මෙය අත්සන් කරලා මෙය එහි වගකීම ලබාගෙන තියෙන්නේ නවීන් අදිකාරම් ගරු සභාපතිතුමා එවකට හිටපු සභාපතිතුමා.

ප්‍ර : නවීන් අදිකාරම් මහතාගේ අත්සන ඔබට හඳුනා ගන්න හැකියාවක් තිබෙනවද?

පි : මට හැකියාවක් තිබෙනවා.

ප්‍ර : ඔහුගේ රාජකාරී පරාසය තුළ ඔබ මීට පෙර මේ අත්සන දැකලා තිබෙනවද?

පි : එහෙමයි මම දැකලා තිබෙනවා. රාජකාරී කරද්දී මේ අත්සන මම දන්නවා. එතුමාගේ අතින්ම තමයි මට මේ ලිපිය භාර දුන්නේ.

දැන් වේලාව : ප.ව. 11.20 යි

මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව.11.20 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප : සාක්ෂිකරු ඔබ මීට පෙර ප්‍රකාශ කෙරුවා කාර්මික සංවර්ධන මණ්ඩලය 2015 ඉදලා පැවතියේ එක්තරා ඇමතිවරයෙක් යටතේ කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඒ කියන්නේ කාර්මික සහ වාණිජ කටයුතු අමාත්‍යවරයා යටතේ?

පි : කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය.

ප : කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යවරයා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : එවකට ඒ අමාත්‍ය ධූරය දැරුවේ කවුද?

පි : රිෂාඩ් බදුර්දීන් ඇමතිතුමා.

ප : දැන් ඔබට මේ 2019 මැයි 16 වෙනි දින දරන ලිපිය ඔබට දෙන කොට කවුද ඒ ඇමති ධූරය දැරුවේ?`

පි : එතකොටත් මේ තනතුරම දැරුවේ ඇමතිතුමාම තමයි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:

මෙම ලිපිය C756 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ප : සාක්ෂිකරු යම් අවස්ථාවකදි ඒ අමාත්‍යවරයත් තනතුරෙන් ඉල්ලා අස්වුණා නේද?

පි : එහෙමයි.

ප : කවද්ද ඒ ඉල්ලා අස්වීම දුන්නේ?

පි : අර රජය දින 52 කදී වෙනස් වුණා.

ප : නැහැ, නැහැ පාස්කු දින ප්‍රහාරයෙන් පසුව යම් අවස්ථාවක දී ඔබගේ අමාත්‍යවරයා ඉල්ලා අස් වුණාද නැද්ද?

පි : ඉල්ලා අස් වුණා ස්වාමිණි.

ප : කවද්ද ඒ ඉල්ලා අස්වීම වුණේ?

පි : ඒක මට දින මතකයක් නැහැ.

ප : ඒ අමාත්‍යවරයා ඉල්ලා අස් වුණාම පස්සේ කවුද වැඩ බැලුවේ ඒ අවස්ථාවේදී?

පි : ඒ අවස්ථාවේදි ලේකම්තුමා තමයි වැඩ බැලුවේ. අමාත්‍යාංශයේ ලේකම්තුමා.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප : නියෝජ්‍ය ඇමතිවරයෙක් හිටියද?

පි : නියෝජ්‍ය ඇමතිවරයෙක් හිටියා.

ප්‍ර : කවුද?

පි : බුද්ධික පතිරණ ඇමතිතුමා.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප : ඔබ ඔය සංවිධාන ව්‍යුහය බලන්න දීලා තියෙන?

පි : එහෙමයි ස්වාමිණී.

ප : ඒකේ Director Marketing වගකියන්නේ Deputy Director General Development ?

පි : එහෙමයි.

ප : Deputy Director General Development වගකියන්නේ Director General ට?

පි : එහෙමයි.

ප : සභාපතිට කෙලින්ම වගකියන අය කිසිවෙකු මෙම ඇතුලේ නැහැ?

පි : එහෙමයි.

ප : එහෙම තියෙද්දි ඔබ කොහොමද කියන්නේ ඔබගේ නියෝජ්‍ය අධ්‍යක්ෂක කෙලින්ම සභාපතිතුමත් සමඟ මෙම අබලි ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය පිළිබඳව කටයුතු කළා කියලා, කොහොමද ඒ?

පි : ඇත්තෙන්ම දැන් මේ එතුමා සෘජුව සියළුම අත්සන් ලබා ගැනීම් ක්‍රියාකාරිත්වය සඳහා වන අනුමැතිය ලබා ගැනීම් සියළුම අධ්‍යක්ෂක ජනරාල් හරහාවත් නොවෙයි සෘජුවම සභාපතිතුමා හරහා තමයි සිද්ධ කලේ අදාල ගෙවීම් කටයුතු සියල්ලම සෘජුවම සභාපතිතුමා හරහා තමයි සිද්ධ කලේ.

ප : එතකොට Deputy Director General Development හෝ Director General කියන දෙන්නම මේ නිලධාරියාගෙන් ඇහුවේ නැද්ද ඇයි ඒගොල්ලන් ඔක්කොම මහහැරලා කෙලින්ම Chairman එක්ක වැඩ කරන්නේ කියලා මේ ආයතනයේ?

පි : එහෙම ප්‍රශ්න කරන්න ඇති ස්වාමිණී මම ඒක හරියටම දන්නේ නැහැ, කෙසේ වෙතත් මා දන්න ක්‍රියාකාරිත්වය ගැන සඳහන් කරනවා නම් අදාල සියළුම වැඩ කටයුතු සෘජුවම සභාපතිතුමා හරහා තමයි සිද්ධ වුනේ, ඔහු සහ සභාපතිතුමා අතර සෘජු සම්බන්ධතාවයක් තිබුණා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ Organization structure එකේ සභාපතිත් එක්ක වැඩ කරන්නේ ආයතනයේ Internal Auditor ටයි, සහ Chairman ගේ Office එකක් තියෙනවානේ චූටි?

පි : එහෙමයි.

ප්‍ර : මේ Office එකේ කාර්ය මණ්ඩලය විතරයි නේ?

පි : එහෙමයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : දැන් මහත්මයා අබලි ලෝහ කළමනාකරන ව්‍යාපෘතිය යටතේ කර්මාන්තකරුවන් අයදුම් පත්‍ර ඉදිරිපත් කරලා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මුලින් ලියාපදිංචි වීමක් සිදු කළයුතුයි කියලා ඔබ සඳහන් කලා ඔවුන්ට අබලි ලෝහ ලබා ගන්න අවශ්‍ය නම්?

පි : එහෙමයි. අයදුම් පත්‍ර සම්පූර්ණ කර අදාල ප්‍රාදේශිය කාර්යාලයට හෝ ප්‍රධාන කාර්යාලයට භාර දිය යුතුයි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද කොලෝසස් පුද්ගලික සමාගමකි. එසේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ ලබා ගැනීමට ලියාපදිංචි වීමට අයදුම්පතක් ඉදිරිපත් කරලා තියෙනවද?

පි : එහෙමයි ඔවුන් මට එය මට සඳහන් කළ හැකියි. 2017 වර්ෂයේ අගෝස්තු මස 10 වන දින අපගේ අංක 581586 අංකය යටතේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් නමින් කර්මාන්තකරුවකු අයදුම් පතක් අප වෙත යොමු කර තිබුණා.

ප්‍ර : අදාල අයදුම් පත්‍රයේ මුල් පිටපත ඔබේ ආයතනය විසින් මෙම කොලෝසස් පෞද්ගලික සමාගමට අදාලව පවත්වාගෙන යනු ලබන ගොනුව මේ අවස්ථාවේදි ඔබ භාරයේ තිබෙනවද?

පි : එහෙමයි මගේ භාරයේ තිබෙනවා.

ප්‍ර : දැන් එය පරීක්ෂා කරලා බලලා ඔබට ගරු කොමිෂන් සභාවට වැඩිදුරටත් ඒ අනුව සාක්ෂි ලබා දෙන්න හැකියාවක් තිබෙනවද?

පි : එහෙමයි මට ලබා දෙන්න පුළුවන් ස්වාමිණි.

ප්‍ර : දැන් මේ කොලෝසස් පුද්ගලික සමාගම, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පුද්ගලික සමාගමක් විදියට ලියාපදිංචි වෙලා තිබෙනවද?

පි : ලියාපදිංචි වෙලා තියෙනවා ස්වාමිණි. ඒ මා සතුව තිබෙන සමාගම් අංකය වශයෙන් PV78667 යටතේ ඔවුන් පුද්ගලික සමාගමක් ලෙස කොලෝසස් ප්‍රයිවට් ලිමිටඩ් නමින් ලියාපදිංචිය ලබාගෙන තිබෙනවා.

ප්‍ර : එහි ලිපිනයක් සඳහන් වෙනවද?

පි : එහි ලිපිනයක් සඳහන් වන්නේ නැහැ.

Provisional Hansard Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ සඳහන් කලා මේ කොලෝසස් පුද්ගලික සමාගමේ ලියාපදිංචි සහතිකයකුත් ඔබ සතුව තිබෙන ගොනුවේ තිබෙනවයි කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කියන්නේ අයඳුම් පත්‍රය ඉදිරිපත් කරන කොට එය ඔබේ කාර්මික සංවර්ධන මණ්ඩලයට ඉදිරිපත් කළයුතුයිද?

පි : එහෙමයි අපි අයඳුම් පතත් සමඟ අනිවාර්යයෙන් ම ව්‍යාපාර ලියාපදිංචිය ඉදිරිපත් කළ යුතුයි.

<u>මේ අවස්ථාවේදී සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අංක PV 78667 දරන සමාගම් අංකය යටතේ පෞද්ගලික සමාගමක් වශයෙන් සංස්ථාගත කිරීමේ සහතිකයක් නිකුත් කර තිබෙනවා. එය කොලෝසස් ප්‍රයිවට් ලිමිටඩ් පෞද්ගලික සමාගමකට ලියාපදිංචිය සම්බන්ධ ලේඛනය C757 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.</u>

ප්‍ර : දැන් ඔබ සඳහන් කලා මේ එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් කියලා කර්මාන්තකරුවෙක් 2016 සහ 2017 වර්ෂයට අදාලව අබලි ලෝහ ලබා ගන්න කාර්මික සංවර්ධන මණ්ඩලයට අයඳුම් පතක් ඉදිරිපත් කරලා තිබුණා කියලා?

පි : එහෙමයි එය නිවැරදියි.

ප්‍ර : දැන් මහත්මයා එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියලා කර්මාන්තකරුවෙක් කොලෝසස් පුද්ගලික සමාගමට අදාලව ඔබේ ආයතනය වෙත අයඳුම් පත්‍රයක් ඉදිරිපත් කළා කියලා ඔබ සඳහන් කළා?

පි : එහෙමයි එය නිවැරදියි.

ප්‍ර : ඒ අයඳුම්පත්‍රය ඉදිරිපත් කරන්න කලින් ඔබේ ආයතනයේ ලියාපදිංචි වීම සඳහා වෙනමම ලේඛනයක් මගින් ඉල්ලුම් කළයුතුයි ද? නැත්නම් මේ අයඳුම්පත්‍රය මගින්මද ඒ ලියාපදිංචියත් සිද්ධ වනු ලබන්නේ?

පි : ලියාපදිංචිය සිදු වන්නේ අපගේ අයඳුම් පත්‍රය මගින්මයි.

ප්‍ර : ඔබ මීට පෙර සඳහන් කළා මේ කොලෝසස් පුද්ගලික සමාගම මුල්වරට එසේ ලියාපදිංචිය සඳහා අයඳුම් කර තිබෙන්නේ 2017 අගෝස්තු 09 වෙනිදා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ ඔබ දිනය සඳහන් කලේ අදාල කර්මාන්තකරු එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයේ අදාල කර්මාන්තකරු විසින් සඳහන් කර තියෙන දිනයද?

පි : එසේමයි.

ප්‍ර : දැන් එහි මුල් පිටපත මේ අවස්ථාවේදි ඔබ භාරයේ තිබෙනවද?

පි : තිබෙනවා.

Prosecution Copy
FAIR COMMENT BY JEZEEM

ප : එහි සහතික පිටපතක් ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනවද?

පි : එහෙමයි ලබාදීමේ හැකියාව තිබෙනවා.

<u>මේ අවස්ථාවේදි 2016/2017 වර්ෂයට අදාලව කර්මාන්තකරු වශයෙන් එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් යන අය විසින් 2017 අගෝස්තු 09 වන දින කොලෝසස් පුද්ගලික සමාගම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අදාල අයදුම් පත්‍රය C758 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.</u>

ප : දැන් ඔබට මේ C758 කියන ලේඛනයේ මූලිකව සඳහන් වෙලා තිබෙන මේ කර්මාන්තකරුගේ විස්තර සම්බන්ධයෙන් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : පුළුවන්. මට හැකියාවක් තිබෙනවා. අයදුම්පත්‍රයේ විශේෂයෙන්ම අපි සලකන්නේ මේ අයදුම්පත්‍රය අදාල කර්මාන්තකරු විසින් පිරවිය යුතුයි. මුලින්ම ඔහුගේ නම, ලිපිනය, පෞද්ගලික තොරතුරු අපිට සඳහන් කරන්න ඕනේ. අංක 5 යටතේ .

ප : පොඩ්ඩක් ඉන්න, ලිපිනය වශයෙන් සඳහන් වෙන්නේ කුමක්ද?

පි : ලිපිනය වශයෙන් සඳහන් වෙන්නේ ඔහුගේ පෞද්ගලික ලිපිනයයි. අංක 2 යටතේ සඳහන් වෙන්නේ ඔහුගේ පෞද්ගලික ලිපිනය හෝ ලිපි ලැබෙන ලිපිනය.

ප : මොකක්ද ලිපිනය?

පි : නොම්මර 37, ඕල්මෝ ස්ට්‍රීට්, Colombo 12.

ප : වෙන මොනවද සඳහන් වෙලා තිබෙන පෞද්ගලික තොරතුරු?

පි : ඔහුගේ ජාතික හැඳුණුම් පත් අංකය, දුරකථනය,ජංගම දුරකථනය සහ ෆැක්ස් අංකය මෙහි සඳහන් වෙලා තිබෙනවා.

ප : දැන් මහත්මයා මේ C758 ලේඛනයේ Address of the Industry කියන එකේ අර ඔබ කලින් සඳහන් කරපු අංක 37, ඕල්මෝ ස්ට්‍රීට්, Colombo 12 කියන එක කපලා වෙන ලිපිනයක් අතින් ආපහු ලියලා තියෙනවා නේද?

පි : එහෙමයි. අංක 5 යටතේ සඳහන් කළ යුත්තේ අදාල කර්මාන්ත ශාලාව පිහිටා තිබෙන ලිපිනය විය යුතුයි. එහෙත් මොහු සඳහන් කර තිබෙන්නේ ඔහුට ලිපි ලැබෙන ලිපිනයයි. එය අපගේ ක්ෂේත්‍ර නිලධාරී විසින් අදාල නිරීක්ෂණය කිරීමේදි ඇයට දැන ගන්න ලැබිලා තියෙනවා සඳහන් කරලා තිබෙන්නේ තැපැල් ලිපිනය කියලා. ඒ නිසා වහාම ඇය එය නිවැරදි කරලා තියෙනවා.

ප : මොකක්ද ඒ අදාල කර්මාන්තය පිහිටපු ස්ථානය වශයෙන් ලිපිනය වශයෙන් සඳහන් වන්නේ?

පි : අංක 111/A/6, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.

FAIR COMMENT BY JEZEEM

ප : මේ C758 අයඳුම් පතේ අංක 8 වශයෙන් මොනවද සටහන් වෙලා තියෙන්නේ?

පි : අංක 8 වශයෙන් සඳහන් වෙලා තියෙන්නේ අදාල කර්මාන්තකරු විසින් අදාල කර්මාන්තය සිදු කර ගෙන යාම සඳහා කුමන වර්ගයේ යන්ත්‍රෝපකරණ ඒ සඳහා යොදා ගන්නවාද, ඒ අදාල යන්ත්‍රෝපකරණවල අශ්වබල තත්ත්වය සහ එහි වටිනාකම. මෙයින් අපි අදහස් කරන්නේ මේ තොරතුරු ලබා ගැනීමෙන් ඔහුගේ ධාරිතාවය ගැන කිසියම් හෝ අවබෝධයක් අපිට ලබා ගැනීම සඳහා තමයි විශේෂයෙන්ම මේ Investment එක සහ විශේෂයෙන්ම යන්ත්‍රෝපකරණ තොරතුරු අපි ලබා ගැනීම සිද්ධ කරන්නේ.

ප : අංක 9 වශයෙන් මොනවද සඳහන් කර තියෙන්නේ?

පි : විශේෂයෙන්ම අපි මේ අබලි ද්‍රව්‍ය ලබා දීමේදි මේවා උණුකර අඩි එකතු කර භාණ්ඩ නිපදවීම තමයි අපි අපේක්ෂා කරන්නේ. ඒ හරහා තමයි කර්මාන්තකරුවන් සම්බන්ධ කිරීමට, ඒ කර්මාන්තකරුවන් දිරි ගැන්වීමට අපි භාවිතා කරන්නේ. විශේෂයෙන්ම මෙතනදි අංක 9 යටතේ අපි බලාපොරොත්තු වෙන්නේ අදාල වාත්තු සඳහා වන උඳුන, එහි ධාරිතාවය සහ මාසෙකට වර්ථමානයේ ඔහු සතුව තිබෙන මේ උඳුනෙන් කොපමණ ප්‍රමාණයක් උණුකරවා ගත හැකිද කියන දේ තමයි අපි මෙතනින් බලාපොරොත්තුවෙන් දැන ගන්නට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : සාක්ෂිකරු පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි, මේ C758 දරන ඉල්ලුම් පතේ ඔබ කියපු පරිදි ඒ කර්මාන්තය පිහිටි ස්ථානය අංක 5 නේ දක්වන්නට ඕනේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප : මේ ඉල්ලුම් පත ඔබගේ ආයතනයට ලැබෙන විට එම කර්මාන්තය තිබ්බ ස්ථානය එනම් කොලෝසස් ප්‍රයිවට් ලිමිටඩ් තියන කර්මාන්තය තිබ්බේ කොතනද කියලද දක්වලා තිබ්බේ?

පි : දක්වලා තිබුණේ 37, ඕල්මෝස් ස්ට්‍රීට්, කොළඹ 12 කියන ලෙස තමා සඳහන් කරලා තිබුණේ.

ප : ඊට පස්සේ ඔබ කියන හැටියට ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදු වන්නේ මේක ලැබුණට පස්සේ නේද?

පි : එහෙමයි ස්වාමිණි.

ප : දැන් මේ C758 දරන ඉල්ලුම් පත ඔබගේ ආයතනයට ලැබෙන විට එහි තිබෙන සියළුම තොරතුරු සපුරා පුරවලා තියෙන්න ඕනද නැද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : සපුරා තිබිය යුතුයි.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : දැන් ඔබ මීට පෙර සඳහන් කලා කර්මාන්තකරුවෙක් අයදුම් පතක් ඉදිරිපත් කරන කොට ඒ කර්මාන්තය පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් අදාල වසමේ කර්මාන්තය පිහිටා තිබෙනවාය කියලා සහතික කළයුතුයි කියලා?

පි : එහෙමයි නිවැරදියි.

ප්‍ර : දැන් ඔබේ අවධානය මෙම C758 ලේඛනයේ අයදුම් පතේ 3 වන පිටුවට යොමු කළහොත් එහි ග්‍රාම නිලධාරීවරයෙක් කුමන වසමෙහි ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින්ද එය සහතික කරලා රාජකාරි මුද්‍රා තබා තිබෙන්නේ?

පි : මෙහි අපිට කර්මාන්ත පිහිටා තිබෙන ප්‍රදේශය, වසමේ ඉන්න ග්‍රාම නිලධාරී තමයි මෙය සනාථ කළ යුත්තේ. මේ අයදුම්පතට අනුව එසේ කිසිම සනාථ වීමක් සිදු වී නැත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : ඒක පැහැදිලි කරන්න?

පි : අදාල කර්මාන්තය පිහිටා තිබෙන වසමට අයිති බව අදාල ග්‍රාම සේවා නිලධාරී මහත්මයා විසින් සනාථ කළ යුතුයි මේ කර්මාන්තය මේ වසමේ පිහිටා තිබෙන්නේ කියා. එය අදාල ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කළ යුතුයි. එහෙත් මේ අයදුම්පත අදාල කර්මාන්තය පිහිටා තිබෙන ලිපිනය කිසිසේත්ම ග්‍රාම සේවා මහත්මයෙක් විසින් සනාථ කරලා නැහැ.

ප්‍ර : දැන් ඔබ කියන හැටියට මේ ඉල්ලුම් පත්‍රය ලැබෙන විට මේ කර්මාන්තය පිහිටා තිබෙන ස්ථානය 27, පරණ මුවර් වීදිය, කොළඹ 12 කියලා තමයි සඳහන් කරලා තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔය 3 වන පිටුවේ තියෙන ග්‍රාම සේවා නිලධාරිගේ සටහනයි ප්‍රාදේශීය ලේකම්ගේ තහවුරු කිරීමයි කරලා තියෙන්නේ කොයි කොට්ඨාශයේ අයද?

පි : මේක කරලා තියෙන්නේ අදාල බල ප්‍රදේශයේ අය නෙමෙයි ස්වාමිණි.

ප්‍ර : අහන ප්‍රශ්නෙට උත්තර දෙන්නකෝ, ඒක කරලා තිබෙන්නේ කවුද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක කරලා තියෙන්නේ ප්‍රභාත් එස්. වීරසිංහ ග්‍රාම නිලධාරී, කොච්චිකඩේ දකුණ කියන ප්‍රාදේශිය බල ප්‍රදේශයේ නිලධාරිවරයා විසින්.

ප්‍ර : එතකොට ප්‍රාදේශිය ලේකම් කොයි ප්‍රාදේශිය ලේකම්ද කරලා තියෙන්නේ?

පි : එම්.ඒ.එස්. කාංචන ගුණවර්ධන මහත්මයා Divisional Secretary Colombo.

ප්‍ර : දැන් ඔබගේ දැනීමට අනුව මේ කොච්චිකඩේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේද මේ කොලෝසිස් ප්‍රයිවට් සමාගමේ කර්මාන්ත ශාලාව පිහිටා තිබ්බේ?

පි : නැහැ.

ප්‍ර : කොයි ග්‍රාම නිලධාරී?

පි : වැල්ලම්පිටිය ග්‍රාම සේවා වසමේ තමයි පිහිටා තිබෙන්නේ.

ප්‍ර : එතකොට C758 දරන ලේඛනයේ වැල්ලම්පිටිය ග්‍රාමසේවා නිලධාරීගෙන් සහතිකයක් තියෙනවද?

පි : නැත ස්වාමිණි.

ප්‍ර : දැන් ඒ වගේම ප්‍රාදේශිය ලේකම් ඒ වැල්ලම්පිටිය ප්‍රදේශයට අදාල ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකයකුත් මෙහි සටහන් වෙන්නේ නැහැ ඒ අනුව?

පි : එහෙමයි සටහන් වෙන්නේ නැහැ.

ප්‍ර : දැන් මෙම C758 අනුව කර්මාන්තකරු කුමන අබලි ලෝහද ඉල්ලුම්කර තිබෙන්නේ?

පි : අබලි පිත්තල, තඹ සහ සින්ක් කියන අබලි ද්‍රව්‍ය තමයි ඔහු විසින් ඉල්ලුම් කර තිබෙන්නේ.

ප්‍ර : එසේම අදාල කර්මාන්තකරු නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් සඳහන් කරලා තියෙනවද?

පි : එහෙමයි සටහන් කරලා තිබෙනවා. අංක 10 යටතේ සඳහන් කරලා තිබෙනවා.

ප්‍ර : මොනවද සටහන් කරලා තිබෙන්නේ?

පි : Brass rope සහ copper wire.

ප්‍ර : එසේම මෙම පෞද්ගලික සමාගමේ සේවක සංඛ්‍යාව සම්බන්ධයෙනුත් මෙහි කර්මාන්තකරු ඉල්ලුම්කරු සටහන් කරලා තියෙනවද?

පි : සටහන් කරලා තියෙනවා ස්වාමිණි. නුපුහුණු 15 ක්, සාමාන්‍ය පුහුණු 10 ක්, පුහුණු 5 ක් සහ කළමනාකාරිත්වය යටතේ රාජකාරි කරන 7 දෙනෙක් මෙහි සඳහන් කරලා තිබෙනවා.

ප්‍ර : කර්මාන්තකරු මොනවද, කොච්චර ප්‍රමාණයකින්ද අබලි ලෝහ ඉල්ලලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔහු මසකට පිත්තල ටොන් 15 ක් ඉල්ලුම් කරලා තියෙනවා. තඹ ටොන් 30 ක් ඉල්ලුම් කරලා තියෙනවා, සින්ක් ටොන් 15 ක් ඉල්ලුම් කරලා තිබෙනවා.

ප්‍ර : දැන් ඔබ කිව්වා මේ කර්මාන්තකරු අයදුම් පතේ සඳහන් කරලා තියෙනවා කියලා ඉල්ලුම් කරන ලෝහ සහ ඒ අවශ්‍ය ප්‍රමාණ, ඔහුට අවශ්‍ය ප්‍රමාණ?

පි : එහෙමයි.

ප්‍ර : එසේම ඔබ සඳහන් කළා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ නිලධාරියකු විසින් අදාල ස්ථානයට ගිහිල්ලා ඒක පරීක්ෂා කරලා බලලා තමයි නිර්දේශයක් සිදු කරනු ලබන්නේ කියලා?

පි : එහෙමයි එය නිවැරදියි.

ප්‍ර : ඒ ආකාරයට මේ අයදුම්පතට එසේ නිර්දේශ කිරීමක් සිදු කරලා තියෙනවද?

පි : නිර්දේශ කිරීමක් සිදු කරලා තිබෙනවා.

ප්‍ර : ඔබට ඒ කවර නිලධාරියෙකු විසින්ද ඒ නිර්දේශ කිරීම කරලා තියෙන්නේ කියලා හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් මට හඳුනා ගත හැකියි.

ප්‍ර : කවුද මොන නිලධාරියෙකු විසින්ද?

පි : බී.කේ.පී.බී රුද්‍රිගු ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරියෙ එවකට කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ රාජකාරී කළා. ඇය විසින් මෙය නිරීක්ෂණය කරලා තිබෙනවා.

ප්‍ර : ඒ නිලධාරිණියගේ නමක් සඳහන් වෙලා තියෙනවද අයදුම් පත්‍රයේ?

පි : සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : මොකක්ද ඇයගේ නිර්දේශය වෙලා තියෙන්නේ?

පි : ඇය නිර්දේශ කරනවා තඹ ලබා දෙන්න පුළුවන්. ඒ වගේම මේ ආයතනය අපනයනය කරන ආයතනයක්. ඒ නිසා පිත්තල සහ සින්ක් ලබා දීමේ හැකියාවක් නැහැ කියා. ඒ වගේම මේ අවස්ථාව වන විට අදාල ආයතනයේ උඳුන සාදමින් තිබිලා තියෙනවා, ඒ කියන්නේ නිෂ්පාදන කටයුතු සඳහා සුදානම් කරමින් තිබිලා තියෙනවා කියලා තමයි සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර : කවදද ඒ නිලධාරිණිය ඒ නිරීක්ෂණය සිදු කර තිබෙන්නේ?

පි : ඇය 2017 වර්ෂයේ 08 වන මාසේ 21 වන දින තමයි මේ නිර්දේශය ලබා දී තිබෙන්නේ.

ප්‍ර : ඉන් අනතුරුව අධ්‍යක්ෂක, අලෙවි විසින් මේ සම්බන්ධයෙන් යම්කිසි නිර්දේශයක් කරලා තියෙනවද මේ අයදුම් පත්‍රයේ?

පි : මේ අයදුම් පත්‍රයේ අධ්‍යක්ෂක, අලෙවි නොවෙයි නියෝජ්‍ය අධ්‍යක්ෂක, ප්‍රාදේශිය කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා

FAIR COMMENT BY JEZEEM

විසින් අදාල නිර්දේශය ලබා දී තියෙනවා මේ අයඳුම් පත්‍රයේ හැටියට.

ප්‍ර : කවදද ඒ අදාල නිර්දේශය ලබා දී තිබෙන්නේ?

පි : එය ලබා දී තිබෙන්නේ 2017 වසරේ 08 වන මාසේ 22 වෙනි දින.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔය C758 දරන ලේඛනයේ 3 වන පිටුවනේ ඔබ දැන් කියව කියව හිටියේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එහි තියෙනවා නේද Details given all these inspections carried out on above industry is done successfully. I recommended to issue the following metals scraps to the above industry තියෙනවානේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒකට යටින් යම් වගුවක් තියෙනවා නේද?

පි : එහෙමයි.

ප්‍ර : 1,2,3 කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ වගුවේ තියෙන බ්‍රාෂ්, කොපර්ස්, සින්ක් කියන කරුණු කාගේ අත් අකුරෙන්ද ඇතුලත් කරලා තියෙන්නේ කියලා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි.

ප්‍ර : කාගේද ඒ අත්අකුරු?

පි : එය කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරියාගේ අත් අකුරු.

ප්‍ර : කවුද ඒ නිලධාරියා?

පි : නිලධාරියා බී.කේ.පී.බී. රුද්‍රිගු මහත්මිය.

ප්‍ර : එතකොට ඒ වගුවට යටින් reasons if unable to recommend කියලත් තියෙනවානේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒකට ඉස්සරහියින් තියෙන අත්අකුරු කාගේද?

පි : ඒත් අපගේ නිලධාරියාගේ අත් අකුරුමයි.

ප්‍ර : ඒ කියන්නේ කවුද?

පි : බී.කේ.පී.බී. රුද්‍රිගු මහත්මිය.

ප්‍ර : ඔව්, එතකොට ඔබගේ සාක්ෂියට අනුව මේ රුද්‍රිගු මහත්මිය වගුවේ බ්‍රාෂ්, කොපර්, සින්ක් කියලා ඇතුලත් කරලා ඊට පස්සේ ආපහු එකක් කපලා, ඒ කියන්නේ බ්‍රාෂ් සහ සින්ක් කපලා ඒක recommend කරන්න බැහැ කියලා දාලා තියෙනවා නේද?

Proceedings Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එහෙම දාන්න හේතුව මොකක්ද? මොකද recommend කරන්නේ නැත්නම් එකපාරටම වගුවේ දාන්නේ නැතුව ඉන්න තිබුණනේ වගුවේ?

පි : ඒකට මට පැහැදිලි උත්තරයක් දෙන්න අමාරුයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය :</u>

ප්‍ර : මේ බී.කේ.පී.බී. රුද්‍රිගු කියන මහත්මිය එවකට කවර නිළයකද කටයුතු කළේ?

පි : ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරිනියක් විදියට රාජකාරී කළා.

ප්‍ර : ඇය දැනටත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුයුක්තව සේවය කරනු ලබනවද?

පි : එසේමයි, වර්ථමානයේ මගේ ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශයේ රාජකාරී කටයුතු කරමින් ඉන්නවා.

ප්‍ර : දැන් මෙම අයදුම්පතට අදාලව මේ කොලෝසස් පුද්ගලික සමාගමට 2017 වර්ෂයේ ඒ අනුව අබලි ලෝහ නිකුත් කිරීමක් සිදු කර තිබෙනවද?

පි : සිදු කරලා තිබෙනවා ස්වාමිණි. 2017 වර්ෂයේ කිලෝ 16856.8 ක් අපි නිකුත් කරලා තියෙනවා.
(සාක්ෂිකරුට වෙනත් ලේඛනයක් පෙන්වා සිටී)
2017.09.29 වන දින කිලෝ 50 ක් මුලින් ලබා දීලා තියෙනවා. එහි වටිනාකම 21250.17 යි.

ප්‍ර : දැන් මහත්මයා ඔබ පොලිස් ඒකකයට ඔබේ ප්‍රකාශය ලබා දෙන කොට මේ කොලෝසස් පුද්ගලික සමාගමට 2017 වර්ෂයට අදාලව ලබා දුන්නු අබලි ලෝහ සම්බන්ධයෙන් යම්කිසි ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබුවද?

පි : එහෙමයි මා ඉදිරිපත් කරනු ලැබුවා.

ප්‍ර : ඒ ලේඛනය ලියාපදිංචි අංකය 1611216 යටතේ ලියාපදිංචි කරන ලද කර්මාන්තකරු සම්බන්ධයෙන් ලේඛනය කියලා කිව්වොත් හරිද?

පි : එය නිවැරදියි.

ප්‍ර : නැවත පැහැදිලි කර ගන්න අහනවා නම් කොලෝසස් පුද්ගලික සමාගම ඒ අනුව ඔබේ ආයතනයේ ලියාපදිංචි වී තිබෙන්නේ අංක 1611216 යටතේ ද?

පි : එහෙමයි.

ප්‍ර : දැන් එහි කර්මාන්තකරු එම්.අයි ඉන්ෂාෆ් අහමඩ් වශයෙනුත් සටහන් වෙලා තිබෙනවා?

පි : එහෙමයි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලියාපදිංචි අංක 1611216 දරන සහ එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුට 2017 වර්ෂයට අදාලව නිකුත් කරන ලද අබලි ලෝහ ප්‍රමාණය සඳහන් ලේඛනය C759 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයා C759 පරීක්ෂා කරලා බලලා කියන්න මොනවද ලබා දීලා තිබෙන අබලි ලෝහ?

පි : ඔහු වෙත ලබා දීලා තියෙනවා 2017 වර්ෂයේ පිත්තල ඇමුණුම් කොපු ලබා දීලා තියෙනවා. ඒ වගේම cable off cuts ලබා දීලා තිබෙනවා.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : cable off cuts කියන්නේ මොනවද?

පි : cable off cuts කියන්නේ මැඩම් ..

ප්‍ර : 17 ෆෝම් එකේ බ්‍රාෂ්, කොපර්, සින්ක් කියලා දාලා බ්‍රාෂ්සුයි, සින්කුයි කපලා තියෙනවානේ,?

පි : එහෙමයි.

ප්‍ර : recommend කරලා තියෙන්නේ කොපර් 30 මෙට්‍රික් ටොන්ස් දෙන්න විතරයි.

පි : එහෙමයි.

ප්‍ර : ඔය ෆෝම් එකේ ඇත්තටම දීලා තියෙන ඒවා මොනවද?

පි : දීලා තියෙන්නේ පිත්තල දීලා තියෙනවා. පිත්තල ඇමුණු කප් විදියට. ඒ වගේම පිත්තල වයර්. වයර්වල පිත්තල තියෙනවා. පිත්තල කියන්නේ තඹ තියෙනවා විශේෂයෙන්. ඒත් වයර් වල කොටස් කපපු කොටස් තමයි දාලා තියෙන්නේ cable off cuts විදියට ලබා දීලා තියෙන්නේ.

ප්‍ර : ඒවායේ තියෙන්නේ මොනවද?

පි : තඹ තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : පිත්තල කොච්චරක් දීලා තියෙනවා කියලද තියෙන්නේ මේකේ ප්‍රමාණය?

පි : කිලෝ 16856 ක් ලබා දීලා තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : ඒ කියන්නේ මේ C759 කියන ලේඛනයේ emanations මොනවද කප් කියලා තියෙනවා බ්‍රාජ් කියලා ඒ කියන්නේ මේ උණ්ඩ ලෝහ .

පි : පිත්තල කොපු.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පිත්තල කොපු වලින් තමයි මේ පිත්තල ලබා දීම සිදු කර තිබෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : පිත්තලවල ප්‍රමාණය තමයි ඔබ සඳහන් කලේ මේ කිලෝ ප්‍රමාණය?

පි : එහෙමයි.

ප්‍ර : කොච්චරක්ද?

පි : 16856.8 යි.

ප්‍ර : එහි පිත්තල එක කිලෝ එකක් කීයටද ලබා දීලා තියෙන්නේ කියලා එහෙම ඔබට කියන්න හැකියාවක් තිබෙනවද ?

පි : මුළු ගණන තමයි මට මේ වෙලාවේ ප්‍රකාශ කල හැක්කේ.

ප්‍ර : ඊට අමතරව ට්‍රාන්ස් ෆෝමර්ස් ලබා දීලා තිබෙනවයි කියලා මේ C759 ලේඛනය අනුව පැහැදිලි වෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කියන්නේ මේ ට්‍රාන්ස් ෆෝමර්ස් මගින් මොනවද ලබා ගන්න පුළුවන්?

පි : ට්‍රාන්ස් ෆෝමර්ස් අපිට විදුලි බල මණ්ඩලයෙන් ලැබෙනවා. ට්‍රාන්ස් ෆෝමර්ස් වල තඹ අඩංගු වෙලා තියෙනවා. ඒ තඹ ලබා දීමේදී අපි තඹ ඉල්ලුම්කරුවන්ට අපි ට්‍රාන්ස් ෆෝමර් ලබාදීම අපි සාමාන්‍යයෙන් කරනු ලබනවා.

ප්‍ර : කොපමණ ප්‍රමාණයක් ද මේ ට්‍රාන්ස් ෆෝමර්ස් මගින් තඹ ලබා දීලා තියෙන්නේ?

පි : ට්‍රාන්ස් ෆෝමර්ස්වල ධාරිතාවය එහි ප්‍රමාණය අනුව තඹ එහි අඩංගුවන ප්‍රමාණය වෙනස් වෙනවා. විශේෂයෙන්ම අපි මෙතනදි KVA කියන ඒ ධාරිතාවය ගණන් කරනවා. ඒ ගණිතය අනුව තමයි අපි ලබා දෙන්නේ. ඒ අනුව මෙහි 328 ක් ලබා දීලා තියෙනවා. එහි කිනම් වර්ගයට එහෙනම් කිනම් ධාරිතාවයකට අයත්ද කියලා මෙතනදි පැහැදිලි කිරීමක් කරන්න මට අපහසුයි. 328 ක් ට්‍රාන්ස් ෆෝමර්ස් ලබා දීලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා,</u>

ප්‍ර : සාක්ෂිකරු C758 දරන අයදුම් පත්‍රය අනුමත කිරීමේදි කොලෝසස් සමාගමට ලබා දෙන්න අනුමත කරලා තියෙන්නේ තඹ මෙට්ට්‍රික් ටොන් 30 ක් විතරයි?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : බ්‍රාෂ් ඒ කියන්නේ පිත්තල හා සින්ක් දෙන එක නිර්දේශ කරලා නැහැ?

පි : නැහැ ස්වාමිණි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නමුත් ඔබ මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු C759 දරන ලේඛනය අනුව කොලෝසස් සමාගම 2017 වර්ෂයේදි පිත්තල ලබා දීලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : අනුමත කරලා තිබ්බේ නැති වුණාට?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොහොමද ඒක ලබා දෙන්නේ අනුමත කරලා නැතිකොට?

පි : මේ වෙලාවේ රාජකාරී කලේ මම නෙමෙයි නිසා මට පැහැදිලි උත්තරයක් දෙන්න අපහසුයි.

ප්‍ර : එහෙනම් මේකට උත්තරයක් දෙන්න. අනුමත කරලා නැති අබලි ද්‍රව්‍යයක් ඒ කර්මාන්තකරුට ලබා දෙන්න පුළුවන්ද?

පි : බැහැ.

ප්‍ර : ඒ C758 දරන ලේඛනයේ කියලා තියෙනවා නේද ඇයි මේ පිත්තල සහ සින්ක් දෙන එක නිර්දේශ කරන්නේ නැති හේතුවත් ඒකේ ලියලා තියෙනවානේ?

පි : එහෙමයි ස්වාමිණි සඳහන් කරලා තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>

ප්‍ර : ඒ අනුව මහත්මයා මේ C759 කියන ලේඛනයේ 2017 වර්ෂයේදි ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ලබා දී තිබෙන අබලි ලෝහ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් සටහන් වෙලා තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා කර්මාන්තකරුවන් වාර්ෂිකවත් ලියාපදිංචිය සිද්ධ වෙන්න ඕනෙයි කියලා?

පි : එසේමයි එය නිවැරදියි.

ප්‍ර : දැන් ඒ වාර්ෂිකව ලියාපදිංචිය සිද්ධ කරන කොට ඒක අලුත් ලියාපදිංචි අංකයක් යටතේද සිද්ධ වෙන්නේ එහෙම නැත්නම් එම ලියාපදිංචි අංකය යටතේම නව අයදුම්පතක් ඉදිරිපත් කළයුතුව තිබෙනවද?

පි : නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුයි.

ප්‍ර : දැන් 2018 වර්ෂය සඳහා මේ කොලෝසස් පුද්ගලික සමාගම වෙනුවෙන් අදාල කර්මාන්තකරු එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් යන අය විසින් නව අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙනවද?

පි : එසේමයි ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍ර : එහි මුල් පිටපත මේ අවස්ථාවේදී ඔබ භාරයේ තිබෙනවද?

පි : තිබෙනවා.

ප්‍ර : කවදද අදාල අයදුම්පත්‍රය ඉදිරිපත් කරලා තියෙන්නේ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපගේ කාර්යාලය වෙත 2018.06.04 වන දින ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍ර : ඒ ඔබේ කාර්යාලයට ඉදිරිපත් කරලා තිබෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ කිව්වා දෙවන වරට 2018 වර්ෂයට ඉදිරිපත් කරපු අයඳුම් පත්‍රයේ මුල් පිටපත මේ අවස්ථාවේදි ඔබ භාරයේ තිබෙනවා කියලා?

පි : එසේමයි.

ප්‍ර : එහි කර්මාන්තකරු විසින් අයඳුම් පත්‍රය ඉදිරිපත් කරපු දිනය වශයෙන් කවදද සටහන් වන්නේ?

පි : එය 2018 මාර්තු මස 27 වන දින ලෙස දක්වා තිබෙනවා.

<u>එම්.අයි ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරු කොලෝසස් පුද්ගලික සමාගම වෙනුවෙන් 2018.03.27 වන දින කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අයඳුම් පත C760 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.</u>

ප්‍ර : දැන් ඔබ කලින් සඳහන් කළ ආකාරයට නැවතත් කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට මෙහි මොනවද අඩංගු වෙලා තියෙන විස්තර?

පි : මෙය නව අයඳුම්පත්‍රයක් වුවත් එය පසුගිය වසරේ ලෙසම නව අයඳුම්පතේ සියළුම තොරතුරු අපි වෙත ලබා දියයුතුයි. එසේම ග්‍රාම සේවා නිලධාරී මහත්මයා සහ අදාල ප්‍රාදේශීය ලේකම්තුමාගේ නිර්දේශ සහිතව අප වෙත ඉදිරිපත් කළ යුතුයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදි සටහන් කර තබන්නේ නීතිඥ හරීන් සද්ධාසේන මහතා සමඟ නීතිඥ ගීතාංජලී තෙන්නකොන් මිය මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ආරම්භයේ සිටම මේ දක්වාම කොමිෂන් සභා ශාලාවේ රැඳී සිටිය බවයි. උගත් නීතිඥවරයා ප්‍රකාශ කර සිටින්නේ ඔහු මේ අවස්ථාවේදි නිරීක්ෂකයෙකු වශයෙන් පමණක් ශාලාව තුළ රැඳී සිටින බවයි. මේ අවස්ථාවේදී කොමිෂන් සභාව උගත් නීතිඥවරයාගෙන් අසනවා ඔහුට මහින්ද ජිනසේන හිටපු සභාපති කාර්මික සංවර්ධන මණ්ඩලයේ උපදෙස් ලැබිලා තියෙනවද ඔහුට කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නොතිසියක් ලැබිලා තියෙනවද නැද්ද යන්නයි. උගත් නීතිඥවරයා පවසන්නේ ඒ සම්බන්ධයෙන් ඔහුට උපදෙස් ලැබී නොමැති බවත්. ඔහුට උපදෙස් ලබා දී තිබුණේ මෙහි පැමිණ මෙම

FAIR COMMENT — BY JEZEEM

සාක්ෂිකරුගේ සාක්ෂිය සම්බන්ධයෙන් නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වීමට පමණක් බවයි.

මේ අවස්ථාවේදී උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය සහ ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවියගෙන් කොමිෂන් සභාව විමසා සිටින්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින යම් නීතිඥවරයෙකු උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය සමඟ යම්කිසි අවස්ථාවක සම්බන්ධවීමක් සිදු වූයේද යන්නයි. මේ අවස්ථාවේදී උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය ප්‍රකාශ කර සිටින්නේ ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා ඇයගෙන් මහින්ද ජිනසේන මහතාගේ සාක්ෂි සම්බන්ධයෙන් යම් විමසීමක් කළ බවත්, එනම් මහින්ද ජිනසේන මහතා විසින් මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති ලේඛනවල පිටපත් ලබා ගැනීමට හැකියාවක් ඇද්ද යන්න විමසා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඔහුට උගත් අතිරේක සොලිසිටර් ජනාරාල් මෙනවිය විසින් පිළිතුරක් ලබා දුන් බවත්, ඒ අවස්ථාවේදී මහින්ද ජිනසේන මහතා වෙත කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති දැන්වීම ලැබුණු බවට උගත් ජනාධිපති නීතිඥවරයා දැන සිටිය බවත් සඳහන් වූ බවයි.

මේ අවස්ථාවේදී කොමිෂන් සභාව දන්වා සිටින්නේ මහින්ද ජිනසේන හිටපු සභාපති කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ වූ දැන්වීම ලැබුණාද නැද්ද යන්න හෙට දින මෙම කොමිෂන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන අවස්ථාවේදී තහවුරු කරන ලෙසත් උගත් නීතිඥවරයාට දන්වමි. ඊට අමතරව හැකි නම් මේ අවස්ථාවේදී එම උපදෙස් ලබා ගෙන කොමිෂන් සභාවට දන්වන ලෙසටද නියෝග කරමි.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>:

ප්‍ර : දැන් සාක්ෂිකරු නැවත ඔබේ අවධානය යොමු කරනවා C760 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරපු ඒම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරු විසින් 2018 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රය කෙරෙහි.

එහි කර්මාන්තය පිහිටි ස්ථානය වශයෙන් මෙවර කුමක්ද සටහන් කර තිබෙන ලිපිනය?

පි : මෙවර ඔහු නිවැරදිව අදාල කර්මාන්ත ශාලාව පිහිටා තිබෙන ස්ථානය සඳහන් කරලා තිබෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කුමක්ද ලිපිනය?

පි : කොලෝසස් ප්‍රයිවට් ලිමිටඩ්, අංක 111/A6 අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර : දැන් මෙහි අදාල කර්මාන්තය පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා විසින් සහ අදාල දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශීය ලේකම් සනාථ කිරීමක්, සහතික කිරීමක් සිදු කර තිබෙනවද?

පි : කිසිදු සහතික කිරීමක් සිදු කර නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඒ ග්‍රාම නිලධාරිගේ අත්සන සහ නිල මුද්‍රාව තිබෙන ස්ථානයත් ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව තිබෙන ස්ථානත් මේ අයඳුම් පත්‍රයේ හිස්ව තිබෙනවා කවුරුත් සහතික කර නැහැ කියලා කිව්වොත් ඒක නිවැරදිද ?

පි : එය නිවැරදියි ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව මේ අයඳුම් පත්‍ර 2 ටම අදාලව කර්මාන්තකරු කර්මාන්තය පිහිටා තිබෙන ස්ථානයේ ග්‍රාම නිලධාරීවරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා මොනම ආකාරයකටවත් අවස්ථා දෙකේදිම සහතික කිරීමක් කරලා නැහැ කියලා කිව්වොත් ඒක හරි ද?

පි : එය නිවැරදියි.

ප්‍ර : දැන් නැවත ඔබේ අවධානය යොමු කරනවා මෙම C760 කියන ලේඛනයේ අංක 6 කෙරෙහි. මොනවද ඒහි සඳහන් වෙලා තියෙන්නේ?

පි : එහි සටහන් වෙලා තියෙනවා අදාල කර්මාන්තකරු විසින් සිදු කරන ලද මුළු ආයෝජනය කුමක්ද යන්න වග.

ප්‍ර : ඒ කියන්නේ ඔහු සතුව ඔහුගේ කර්මාන්තයේ තිබෙන යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන්?

පි : සම්බන්ධයෙන් සඳහන් කර තිබෙනවා.

ප්‍ර : මොනවද ඉල්ලුම් කර තිබෙන්නේ?

පි : ඔහු මෙවර 2018 වසර සඳහා තඹ මාසිකව මෙට්ට්‍රික් ටොන් 150 ක්, පිත්තල මාසිකව මෙට්ට්‍රික් ටොන් 100 ක්, ඇලුමීනියම් මාසිකව මෙට්ට්‍රික් ටොන් 50 ක් ඉල්ලුම් කරලා තියෙනවා.

ප්‍ර : ඒ ඔබ සඳහන් කරන්නේ අංක 9 යටතේ තිබෙන මේ Capacity of Production monthly කියන මාතෘකාව යටතේ තිබෙන කරුණු ?

පි : ඒය අංක 11 යටතේ මා සඳහන් කරන්නේ ඔහු වෙතින් ඉල්ලා ඇති මුළු අබලි ද්‍රව්‍ය ප්‍රමාණයන්

ප්‍ර : දැන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද අංක 9 යේ මොකක්ද සටහන් වෙලා තිබෙන්නේ කියලා?

පි : අංක 9 යටතේ සඳහන් කරලා තිබෙන්නේ ඔහු කරන නිෂ්පාදනවල ස්වභාවයන් සහ ඒ නිෂ්පාදනවලින් ඔහු මාසිකව

FAIR COMMENT BY JEZEEM

ගොඩ නඟන සම්පූර්ණ වටිනාකම තමයි මෙහි සඳහන් කරලා තියෙන්නේ අංක 9 යටතේ.

ප්‍ර : මොනවද සටහන් කරලා තියෙන්නේ?

පි : ඔහුගේ එක නිෂ්පාදනයක් තමයි බ්‍රාස්යාඩ්. ඒ අනුව ඔහු මාසිකව මෙට්ට්‍රික් ටොන් 100 ක් නිෂ්පාදනය කිරීමටත් ඒ තුලින් එය මුළු වටිනාකමක් ලෙස ගත්තොත් ඒය මිලියන 50 ක් වන බවත් ඔහු සඳහන් කරලා තියෙනවා. ඒ වගේම කොපර් වයර් rode and pipe මාසිකව ඔහු නිෂ්පාදනය කළ ප්‍රමාණය මෙට්ට්‍රික් ටොන් 150 ක් එහි වටිනාකම මිලියන 100 ක් ලෙසත් සඳහන් කරලා තිබෙනවා. මේ ඔහු සඳහන් කරන්නේ මාසිකව ඔහු නිෂ්පාදනය කරන භාණ්ඩ වල වටිනාකම්. ඒ වගේම ඇලුමිනියම් Ingot කියන භාණ්ඩය නිෂ්පාදනය කිරීම සදහා ඔහු ටොන් 50 ක් උපයෝගි කර ගන්නවා, ඒ වගේම ඒ තුලින් ඔහු මිලියන 3.25 ක් මාසෙකට නිෂ්පාදනය කරනවා එහි වටිනාකම් සහිතව. මේ ඔහු සඳහන් කර තියෙන්නේ මාසිකව ඔහු කරන නිෂ්පාදනයන් වල වටිනාකම්.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ඒ කර්මාන්ත ශාලාව ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවද? කර්මාන්ත ශාලාව පරීක්ෂා කිරීමක් කළාද?

පි : කර්මාන්ත ශාලාව පරීක්ෂා කිරීමක් කරලා තියෙනවා ස්වාමිණි.

දැන් වේලාව : රාත්‍රී 12.20 යි

මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් ගැනීම ල/ලේ දම්මිකා මිය.
වේලාව රාත්‍රී 12.20
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය.

ප්‍ර 2013 මාර්ගෝපදේශකයේ සඳහන් අකාරයට මෙපමණ ප්‍රමාණයක නිෂ්පාදනයක් සිදු වෙනවා නම් එය ඔහු මෙම කර්මාන්තකරු කුඩා සුලු හෝ මධ්‍යම පරිමාණ කර්මාන්ත කරුවෙක් වශයෙන් නම් කරන්න හැකියාවක් තිබෙනවාද ?

උ නම් කිරීමට හැකියාවක් නැහැ.

ප්‍ර ඇයි කියලා පැහැදිලි කරන්න ?

උ මධ්‍යම ප්‍රමාණ කර්මාන්තකරුවෙකුගේ වාර්ෂික පිරිවැටුප මිලියන 600 තමයි උපරිමය මෙහි අපි උදාහරණයක් ලෙස ගත්තොත් අංක දෙක යටතේ කොපර් වයර් සඳහන් කර තිබෙනවා එය මාසිකව ඔහු නිෂ්පාදනය කරන මෙට්‍රික්ටොන් 150 නිෂ්පාදනය කරනවා . ඒවගේම ඔහු ඒ වෙනුවෙන් උපයන ලද මුදල මිලියන 100 යි. එය වාර්ෂිකව ගත්කල එය මිලියන 1200 ක් වට පත්වෙනවා එසේ නම් එමනිසා මිලියන 600 ක ප්‍රමාණයක් ඉක්මවා ඇති බවයි මගේදැනීමේ හැටියට මට පැවසිය හැක්කේ ස්වාමීනි.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා .

ප්‍ර එය සනාථ කරන්න ආදායම් බදු Inland Revenue එකෙන් එය සනාථ කරනවාද ?

උ අපිත් කාර්මික සංවර්ධන මණ්ඩලයට ස්වාමිනි එවැනි කිසිම ලේඛනයක් ඉදිරිපත් කරලා නැහැ .

ප්‍ර ඒ ගොල්ලෝ ඉදිරිපත් කරන්න ඕනේ ද?

උ අපිට ඉදිරිපත් කිරීමට අවශ්‍ය නැහැ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය

ප්‍ර මේ අංක 09 යටතේ කර්මාන්ත කරු විසින්ම තමයි මේ තොරතුරු ලබා දීලා තියෙන්නේ ?

උ එසේය ඔහු විසින්ම අදාල අයදුම්පත පුරවා තිබෙනවා .

ප්‍ර දැන් ඒ අනුව මොහුට කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ කළමණාකරණ ඒකකයෙන් ලබා දෙන අබලි ලෝහ ලබා දෙන්න හැකියාවක් තිබෙනවාද ?

උ මේ යටතේ ලබා දීමට හැකියාවක් නැත ස්වාමීනි.

President's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර ඇයි ඒ ?

උ ඔහු මධ්‍ය පරිමාණ අපගේ වර්ගීකරණයට අනුව නොවේ ඊට ඉහලින් තමයි ඔහුගේ සම්පූර්ණ වටිනාකම් නිෂ්පාදන වටිනාකම් රැදි තිබෙන්නේ .

ප්‍ර නමුත් මෙම අයදුම් පත්‍ර ප්‍රකාරව මෙම කොලෝසස් පුද්ගලික සමාගමේ කර්මාන්ත කරු එම්. අයි. ඉන්සාෆ් අහමඩ් යන අයට 2018 වර්ෂය සඳහා අබලි ලෝහ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලබා දිලා තියෙනවාද?

උ ලබාදීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර ඒ ලබා දීලා තිබෙන අබලි ලෝහ ප්‍රමාණය සහ මිල වටිනාකම සම්බන්ධයෙන් ඔබ ලේඛණයක් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවාද ?

උ හැකියාවක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර ඔබ පොලිස් ඒකකයට ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදීත් එය ලබා දීලා තියෙනවාද ?

උ ලබා දීලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර මේ අවස්ථාවෙදී සාක්ෂිකරු විසින් 2018 වර්ෂය සඳහා ලියා පදිංචි අංක 1811226 යටතේ සහ එම්. අයි. ඉන්සාෆ් අහමඩ් කර්මාන්තකරු විසින් කොලෝසිස් පුද්ගලික සමාගමට අදාලව කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලබා දී ඇති භාණ්ඩ සම්බන්ධයෙන් විස්තර ඇතුලත් ලේඛනය C. 761 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා .

ප්‍ර දැන් මේ C. 761 ප්‍රකාරව 2018 වර්ෂයේ මොනවද ලබා දීලා තියෙන අබලිලෝහ ?

උ 2018 වසරේ ට්‍රාන්ස්ෆෝමර් ලබා දීලා තියෙනවා ඒවගේම පිත්තල ඇමුණුම් කොකු ලබා දීලා තියෙනවා 2018 වසරේ ඒ අබලි ද්‍රව්‍ය තමා අපි ලබා දීලා තියෙන්නේ.

ප්‍ර කොච්චර ප්‍රමාණද සහ එහි මිල වටිනාකමත් සඳහන් කරන්න ?

උ අයිතම මම හිතන්නේ බොහොමයක් තිබෙනවා එහි 2018 වසරේ ගත්තාම පිත්තල කොපු 2018/01/24 දින කිලෝ 25000 ක් ලබා දීලා තියෙනවා . 2018/2/15 දින කිලෝ 4. 6 යි. ආයේ 2018/02/22 වෙනි දින කිලෝ 25000යි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අවස්ථාවේදී නීතිඥ හරීන් සද්ධාසේන මහතා ප්‍රකාශ කර සිටින්නේ ඔහුගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා සමඟ සම්බන්ධ වීමක් ඔහුගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා වන ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ සම්බන්ධ වීමක් සිදු කිරීමට බැරිවුවත් කාර්මික සංවර්ධන

FAIR COMMENT BY JEZEEM

මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් නීතිඥ සද්ධාසේන මහතාගේ පෙනී සිටීම ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටී.ඊට අමතරව ඔහු ඉල්ලා සිටින්නේ මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාවක් වෙනත් දිනයක ලබා දෙන ලෙසයි.

ඒ අනුව කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් නීතිඥ සද්ධාසේන මහතා සහ නීතිඥ ගීතාංජලී තෙන්නකෝන් මෙනවියේ ගේ පෙනී සිටීම සටහන් කරන බව සටහන් කර තබමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර දැන් ඔබ ඒ අනුව කොලෝසස් පුද්ගලික සමාගමට 2017/2018 වර්ෂයට සහ 2018 /2019 වර්ෂවලට අදාලව ලබා දී ඇති අබලි ලෝහ සම්බන්ධයෙන් ලේඛන ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබුවා?

උ එහෙමයි. නිවැරදියි.

ප්‍ර දැන් ඔබ කලින් සාක්ෂි ලබා දෙන කොට සඳහන් කරා 2013 මාර්ගෝපදේශනයේ සඳහන්ව තිබෙනවා කියලා මේ වාර්ෂික විගණනයක් සිදු කල යුතු බවට එහි සටහනක් ඇති බවට ? වාර්ෂික අභ්‍යයන්තර විගණනයක් ?

උ එහෙමයි මම සඳහන් කලා.

ප්‍ර දැන් මේ කොලෝසස් පුද්ගලික සමාගමට අදාල අබලි ලෝහ ලබා දීම සම්බන්ධයෙන් ඒ අනුව අභ්‍යයන්තර විගණනයකුත් සිදු කරලා තිබෙනවාද ?

උ එහෙමයි අභ්‍යයන්තර විගණනයක් සිදු කරලා තිබෙනවා. එය 2018/06/19 වෙනි දින අභ්‍යයන්තර විගණක විසින් අභ්‍යයන්තර කටයුතු සඳහා මේ අදාල ක්‍රියාවලිය සඳහා විගණක විමසුමක් සිදු කර තිබෙනවා .

එය අංක 7/ 1 A /064/18 /MKT 2018/6/19 වන දින අධ්‍යක්ෂක අලෙවි වෙත අභ්‍යයන්තර විගණන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ඉදිරිපත් කරනු ලැබූ විගණන විමසුමට අදාල ලේඛණයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

උ ස්වාමිනි මා වෙත යොමු කල විගණන විමසුමක් නොවෙයි මෙය නියෝජ්‍ය අධ්‍යක්ෂක ඒ අවස්ථාවේදී රාජකාරි කල නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයා වෙත යොමු කල විගණන විමසුමක්.

ප්‍ර ඒ කියන්නේ ඔබ කලින් සඳහන් කල පී . පී. ජී. එස්. දික්වැල්ල මහත්මයා වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් කිවවොත් හරිද?

උ එය නිවැරදියි.

Project Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර මොකක්ද මේ අභ්‍යයන්තර විගණක විසින් විමසීමක් සිදු කර තිබෙන්නේ ?

උ එසේමයි දිගු විමසීම් කර තිබෙනවා එහි මූලික හරය.

ප්‍ර ඒ ලේඛනය මහත්මයාට මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවාද ?

උ ඉදිරිපත් කල හැකියි ස්වාමීනි.

අදාල ලේඛනය 201806/19 දරණ නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි , ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ආමන්ත්‍රණය කරමින් අභ්‍යන්තර විගණන විසින් ඉදිරිපත් කර ඇති එකී ලිපිය C. 762 වශයෙන ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා

ප්‍ර දැන් ඔබ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න මේ කොලෝසස් පුද්ගලික සමාගමට ලබා දීපු අබලි ලෝහ සම්බන්ධයෙන් මොනවද අභ්‍යයන්තර විගණකගේ නිරීක්ෂණ සහ ඒ විමසුමේ මොනවද සටහන් වෙලා තියෙන්නේ කියලා ?

උ විගණක විසින් අසා තිබෙනවා කිලෝ 30,000 ක් නිර්දේශ කරලා තියෙනවා එහෙම නම් ඔහුට 30,000 ක් දුන්නේ ඇයි 15000 ක් නිර්දේශ කරලා තියෙද්දි එයනිවැරදි ලෙස අදාළ ලේඛනයේ සඳහන් කරලා නැත්තේ ඇයි කියලා ඒ කියන්නේ කොලෝසස් කියන ආයතනයේ අවශ්‍යතාවය අදාල ලේඛණ වල නිවැරදිව දක්වා නැත්තේ ඇයි කියලා ඔහු විගණනය විමසීමක් කරලා තියෙනවා

ප්‍ර ඒ ඔබ සටහන් කලේ ඒ ලේඛනයේ පලවෙනි විමසුම සම්බන්ධයෙන් ?

උ එහෙමයි

ප්‍ර දෙවනි විමසුම කුමක් සම්බන්ධයෙන්ද තියෙන්නේ ?

උ දෙවනි විමසුම තිබෙන්නේ 2017/08/01දින සිට 2018/04/28 දක්වා කාලය තුල පිත්තල 208,921 .36 (දෙලක්ෂ අටදාස් නවසිය විසි එකයි ශත තිස්හයක්)කිලෝ ග්‍රෑම් කර්මාන්ත කරුවන් 129 දෙනෙකුට බෙදා දී තිබිණි .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

දැන් වේලාව උදෑසන 00.30 කොමිෂන් සභාවේ කටයුතු අද දින නැවත ප.ව. 12.30තෙක් කල් තබනවා මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අද දින ප්‍රථමයෙන් ලබා ගන්නා ලෙසට උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ වරියට නියෝග කරනවා එසේම කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ වරුන්වන සද්ධාසේන මහතා

Project Secretary Copy
FAIR COMMENT BY JEZEEM

සහ තෙන්නකෝන් මෙනවියට දන්වා සිටින්නේ හෙට දින ප.ව. 12. 30ට මෙම කොමිෂන් සභාවේ කටයුතු ආරම්භ කිරීමෙන් පසු මෙම සාක්ෂිකරුගේ මූලික සාක්ෂි විමසීම අවසන් වූ පසු ඔහුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නිතීඥ වරුන්ට ලබා දෙන බවයි. එය ලබා ගන්නවාද නැද්ද යන්න තීරණය කිරීම ඔවුන්ගේ වගකීමක් බවයි.

තවද දන්වා සිටින්නේ කොමිෂන් සභාවේ කාලසීමාව මෙම වර්ෂයේ 2020 සැප්තැම්බර් මස 20 වෙනි දිනෙන් අවසන් වීමට නියමිතව ඇති හෙයින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා වෙන දිනයක් ලබා දීමට හැකියාවක් නොමැති බවයි. සාක්ෂිකරුට අද දින නැවතත් ප.ව. 12. 30ට කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටින ලෙසට අවවාද කරමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.01 වේලාව :- ප.ව. 1.05

සටහන් කළේ :- කේ.එම්.වන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය ,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධි නීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතීඥ හරීන් සද්ධාසේන මහතා සමඟ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටී.

සම්පූර්ණ නම :- පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි
වැඩිදුර සාක්ෂි සඳහා නැවත කැඳවයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා ජනාධිපති නීතිඥ, හරීන් සද්ධාසේන මහතා සහ නීතිඥ ගීතාංජලී තෙන්නකෝන් මෙනවිය සිටින බව සටහන් කරමි. එසේම එලෙස පෙනී සිටීමට එකී උගත් නීතිඥවරුන්ට බලය පවරා දෙන ලිපියක් කොමිෂන් සභාවට උගත් ජනාධිපති නීතිඥවරයා ඉදිරිපත් කරයි. එම ලිපිය මෙම කොමිෂන් සභාවේ ලේකම් නමින් 2020 ජූනි මස 30 දාතමයෙන් මහින්ද ජිනසේන යන අයගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති බව සටහන් කර තබමි. මෙම ලේඛනය කොමිෂන් සභාවේ ලේඛනයක් ලෙස ගොනු කර තබන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.
සාක්ෂිකරු ප්‍රතිඥා දෙයි

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ඊයේ දින සාක්ෂි ලබා දෙමින් දැනටමත් C762 වශයෙන් ලේඛනයක් ලකුණු කර ඉදිරිපත් කරනු ලැබුවා. එය අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වෙත 2018.06.19 වන දින ඉදිරිපත් කරන ලද ලිපියක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙය අභ්‍යන්තර විගණන විසින් සිදු කරන ලද විමසීම කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි; එය නිවැරදියි ස්වාමීනි.

ප්‍ර; එහිදි ඔබ පසුගිය අවස්ථාවේදී සාක්ෂි ලබා දෙන කොට එකී ලිපියේ පළවෙනි කාරණය සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන්නා?

පි: ලබා දුන්නා.

ප්‍ර; මේ අවස්ථාවේදී ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ C762 දරණ ලේඛනයේ අංක 02 වශයෙන් ඇතුළත් කර තිබෙන දෙවන විමසීම කුමක්ද යන්න සම්බන්ධයෙන් ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: මට පැහැදිලිවම පුළුවන්. අංක 2 යටතේ අභ්‍යන්තර විගණක විසින් විගණන විමසුමක් ඉදිරිපත් කරලා තියෙනවා 2017.08.01 දින සිට 2018.04.28 දක්වා කාලය තුළ පිත්තල, 208,921.36 කිලෝග්‍රෑම් කර්මාන්ත කරුවන් 229 දෙනෙකුට බෙදා දී තිබිණි. තවද එම තොගයෙන් 30% ක 66,801.4 කිලෝග්‍රෑම් ප්‍රමාණයක් කොලෝසස් පෞද්ගලික සමාගමට නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. එම කර්මාන්තකරු සඳහා පමණක් වැඩි තොග ප්‍රමාණයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔබගේ පැහැදිලි කිරීම් ඒ සඳහා පිළිතුරු වශයෙන්.

ප්‍ර දැන් ඔබට තුන්වෙනි කරුණ සම්බන්ධයෙන් කුමක් වශයෙන් ද සඳහන් වන්නේ?

පි; තුන් වන කරුණු වශයෙන් සඳහන් කරලා තිබෙනවා. කර්තමාන්තකරු වෙත 2018.01.24 දින පිත්තල කිලෝ ග්‍රෑම් 25,000 ද 2018.02.22 වන දින පිත්තල කිලෝ ග්‍රෑම් 25,000 ද ලබා දී තිබිණි. මසකටත් අඩු කාලයක් තුළ නිර්දේශිත මාසික අමුද්‍රව්‍ය සීමාවන් ඉක්මවා එකම කර්මාන්තකරුවෙකු වෙත පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්.

ප්‍ර: හතරවෙනි විමසුම් කරුණ කුමක්ද?

පි: හතරවෙනි විමසුම් කරුණ යටතේ කාර්මාන්තකරුවන් සඳහා අබලි නිකුත් කිරීම ලැයිස්තු ගත අනුපිළිවෙලට සිදු කරන බව සඳහන් වෙන නමුත් 2017 අගෝස්තු මස හෝ ඊට ආසන්න දිනක අලෙවි අංශයෙන් ලියාපදිංචි කර ඇති ඉහත ආයතනයට කෙටි කලක් තුල අංක දෙක මගින් සඳහන් කර ඇති අනෙකුත් කර්මාන්තකරුවන් අභිබවා පිත්තල නිකුත් කිරීමේ ක්‍රමවේදය පැහැදිලි කිරීම සඳහා .

ප්‍ර; අංක 05 කරුණෙන් මොකක්ද විමසා තිබෙන්නේ?

පි: අංක 05 කරුණ යටතේ මෙම කර්මාන්තකරු විසින් 2017.12.14 දිනැතිව අධ්‍යක්ෂක ජෙනරාල් වෙත යොමු කර ඇති ලිපිය මඟින් අමුද්‍රව්‍ය ලෙස මෝටාර් උණ්ඩ ටොන් විසිපහක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර එම ලිපියෙහි එම ස්ථානය පරීක්ෂාකර වාර්තා කරන ලෙස සභාපතිතුමා ඔබ වෙත සටහන් කර තිබුණි. ඊට අදාළ වාර්තාවක් කර්මාන්තකරුගේ ගොනුවේ පරීක්ෂා නොවීම.

ප්‍ර; අවසාන අංකය එහෙම නැත්නම් අංක 06 යටතේ තිබෙන්නේ කුමක්ද?

පි: අංක 06 යටතේ සටහන් කර තිබෙනවා ස්වාමීනි අබලි ලෝහ ව්‍යාපෘතිය කළමනාකරණය පිළිබඳව මාර්ගෝපදේශය සඳහන් වන පරිදි යකඩ නොවන ලෝහ අමුද්‍රව්‍ය, අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන දේශීය කුඩා පරිමාණ කර්මාන්ත කරුවන් විශාල ප්‍රමාණයකට අමුද්‍රව්‍ය සැපයීම සඳහා සහය වීම මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කර තිබිණි. ඒ අනුව කොලෝසස් පුද්ගලික සමාගමෙහි මාසික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සැපයීම සඳහා එකවර පිත්තල කිලෝග්‍රෑම් විසිපන්දහසක් බැගින් ලබා දී තිබිණි. ඒ අනුව මණ්ඩලයෙහි ලියාපදිංචි පිත්තල අමුද්‍රව්‍යය වශයෙන්

FAIR COMMENT BY JEZEEM

භාවිතා කරනු ලබන අනෙකුත් කර්මාන්තකරුවන් හටද අගතියක් සිදු නොවන පරිදි ඔවුන්ගේ මාසික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සපයනු ලබන්නේ ද යන්න.

ප්‍ර: දැන් 2018 ජූනි මාසයේ 19 වන දින වනවිට නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වශයෙන් කවුද කටයුතු කරේ?

පි; පී.පී.පී.එස්. දිග්වැල්ල මහත්මයා නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් වැඩ රාජකාරි කළා.

ප්‍ර; එතකොට ඒ නිලධාරියා වෙත තමයි මේ විගනන විමසුම ඉදිරිපත් කර තිබෙන්නේ?

පි; නිවැරදියි.

ප්‍ර; එකී නිලධාරියා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් පිළිතුරු ලිපියකින් අභ්‍යන්තර විගනන වෙත දැනුම් දීමක් සිදු කර තිබෙනවාද?

පි: දැනුම් දීමක් සිදු කර තිබෙනවා.

ප්‍ර; එකී අභ්‍යන්තර විගනන වෙත නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි අංශයේ පී.ජී.පී.එස් දික්වැල්ල මහතා ඉදිරිපත් කළ එකී ලිපියේ මහත්මයාට මේ අවස්ථාවේදී පිටපතක් ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනවාද?

පි: තිබෙනවා පිටපත ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවා.

ප්‍ර: ඒ කවර දිනය දරණ ලිපියක්ද?

පි: 2018.07.25 වෙනි දිනැති ලිපියක්.

ප්‍ර; එකී පිළිතුරු ලිපිය මේ අවස්ථාවේදී C763 වශයෙන් ලකුණු කර ඉදිපත් කරනු ලබයි.දැන් මෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි අංශය කියලා අත්සන තියෙනවා ඒ අත්සන ඔබට හඳුනා ගන්න හැකියාවක් තියෙනවාද?

පි; මට හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඒ කවුරුන් විසින් අත්සන් කර තිබෙන්නේ?

පි: ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂක පී.ජී.පී.එස්. දික්වැල්ල මහතාගේ අත්සනක්.

ප්‍ර; දන් මහත්මයාට මේ C763 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරපු ලිපියෙහි අඩංගු කරුණු අනුව විගණන විමසුමේ එක් එක් කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තියෙන පැහැදිලි කිරීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න හැකියාව තියෙනවාද?

පි: තිබෙනවා ස්වාමිනි ඒ අනුව පැහැදිලි කර ගැනීම සඳහා කොලොසස් පෞද්ගලික සමාගම සඳහා පිත්තල නිකුත් කිරීම යන ශීර්ෂය යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂක පි.ජී.පි. එස් දික්වැල්ල මහත්මයා විසින් අදාළ පිළිතුරු ඉදිපත් කර තිබෙනා ඒ යටතේ උක්ත කාරණය සම්බන්ධයෙන් 2008.16.09 වන දිනැති අංක 07/1A /064/18/ NKT දරණ ලිපියෙන් ඉල්ලා ඇති පැහැදිලි කිරීම අංක.01 2017.08.21 දින කොළඹ දිස්ත්‍රික් කාර්යාලය විසින් ආයාතනය පරීක්ෂා කර බලා තඹ ටොන් 30 ක් ලබා දීම නිර්දේශය කර තිබූ අතර පිත්තල නිෂ්පාදනය සඳහා අවශ්‍ය උදුන් ඉදි කරමින් බැවින් පිත්තල ලබා දීම නිර්දේශ කර නොතිබිණි ඒ අනුව

Fair Comment BY JEZEEM

අදාළ කර්මාන්තය පරීක්ෂාක කිරීම සඳහා සභාපති තුමා විසින් පත් කල කමිටුව 2017.09.12 වන දින ස්ථානීය පරීක්ෂාවක් සිදු කල අතර එහිදී තඹ නිෂ්පාදනය තහවුරු විය. ඒ පිළිබඳව අදාළ වාර්තාවේ සඳහන් කර ඇත්තේ එහෙත් පිත්තල නිෂ්පාදනය සඳහා උදුන් හා යන්ත්‍ර සූත්‍ර සිවි කරමින් පැවති නිසා එහි සවිකරිමට අවසන් වූ පසුව යන්ත්‍ර ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා පිත්තල ලබා දීමට නිර්දේශ කරන ලදී. ඒ අනුව අදාළ ආයතනයට පිත්තල උණ්ඩ කොපු නිකුත් කිරීමෙන් පසුව නිෂ්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරිමෙන් පසු මසකට කිලෝ 15000 ක් ලබා දීමට නිර්දේශය කරන ලදී. කොළඹ දිස්ත්‍රික් කාර්යාලය විසින් අයදුම් පත්‍රයේ තඹ ප්‍රමාණයක් නිර්දේශය කර තිබූ හෙයින් අදාළ අයදුම්පත්‍රය පාවිච්චි කර අතර ලියාපදිංචි කළ අතර ලියාපදිංචි කර්මාන්ත ලේඛනයට කර්මාන්තකරුගේ තඹ අවශ්‍යතාවය ඇතුලත් කර ඇත. එහෙත් පිත්තල ලබා දීම සඳහා පසුව නිර්දේශ කර හෙයින් පිත්තල අවශ්‍යතාවය ලියාපදිංචි කර්මාන්ත ලේඛණයට ඇතුලත් කිරීමට අත පසු වී ඇත. අංක.02 යටතේ පිළිතුරු ලබා දී තිබෙනවා සභාපතිගේ දැනුම්දීම හා නිර්දේශය මත එම පිත්තල ප්‍රමාණය නිකුත් කර ඇති අතර මාස නවයකට ආසන්න කාලයක් සඳහා මෙම ප්‍රමාණය නිකුත් කර ඇත. අංක.03 යටතේ සඳහන් කර තිබෙනවා. අදාල කර්මාන්ත ස්ථානය කමිටුව විසින් නිරීක්ෂනය කිරීමේදී පිත්තල නිෂ්පාදනය කිරීමේ ධාරිතාවයට සමාන ලෙස නිරීක්ෂණය වුවත් කර්මාන්ත කරු විසින් අයදුම්පත්‍රයේ අත්සන් කර තිබුණේ මසක පිත්තල කිලෝග්‍රෑම් 15000/ ක් පමණක් නිර්දේශය කරන ලදී. එහෙත් කර්මානතකරු විසින් සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීම්වලට අනු මැතිය සහිතව මෙම ප්‍රමාණය ලබා දී ඇත. අංක.04 යටතේ ව්‍යාපෘතිය ලියාපදිංචි වී ඇති පිත්තල කර්මාන්තයේ නියැලි සිටින කර්මාන්තකරුවන්ට එම කාලය තුල ඔවුන්ගේ අවශ්‍යතාව සඳහා පිත්තල නිකුත් කර ඇති අතර කොලෝසස් කර්මාන්ත ආයතනයට සභාපතිතුමාගේ දැනුම් දීමක් සහ අනුමැතිය ඇති එම කර්මාන්ත ශාලාවේ අවශ්‍යතාවට අමුද්‍රව්‍ය ලබා දී ඇත.අංක 05 යටතේ එහෙත් අදාළ ලිපියේ සභාපතිතුමා සටහන් කර ඇත්තේ අදාළ ස්ථානයේ පරීක්ෂා කර වාර්තා කරන ලෙස නොව අදාළ කණ්ඩයට අවශ්‍ය ප්‍රමාණයට නිකුත් කරන ලෙසයි Please issue as per batch production අංක .06 යටතේ අබ්ලි ලෝහ ව්‍යාපෘතිය ලියාපදිංචි කර්මාන්ත කරුගේ අවශ්‍යතාවය සම්පූර්ණ ආකාරයෙන් පිත්ල භාණ්ඩ නිෂ්පාදකයින්ට අගතියක් සිදු නොවන ආකාරයෙන් පිත්තල අමුද්‍රව්‍ය නිකුත් කර ඇති අතර ඉදිරියේදී ඔවුන්ගේ අවශ්‍යතාව සපුරන ආකාරයෙන් පිත්තල නිකුත් කරනු ඇත. මේ තමයි සමස්ත පිළිතුරු ලිපිය සඳහන් වෙන්නේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා වර්තමානයේ අධ්‍යක්ෂක අලෙවි වශයෙන් කටයුතු කරන්නේ මහත්මයායි කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: එය නිවැරදියි.

ප්‍ර; ඒ අනුව ඔබ මේ අනිත් 2017,2018 සහ 2019 වර්ෂයන් හිදි කොලොසස් පුද්ගලික සමාගමේ කර්මාන්තකරුට සහ අනිකුත් කර්මාන්ත කරුවන්ට ලබා දී ඇති අබලි ලෝහ සමාන ආකාරයෙන් නැත්නම් ඒ 2013 වර්ෂයේ මාර්ගෝපදේශනයට නිබෙන නිර්නායකවලට අනුකුලව ලබාදීලා තිබෙනවාද කියලා ඔබ විසින් සංසන්ධනාත්මක පරීක්ෂා කිරීමක් සිදු කරනු ලැබුවාද?

පි: පරීක්ෂාකිරීමක් සිදුකරනු ලැබුවා ස්වාමිනි.

ප්‍ර: මොනවාද ඔබේ නිරීක්ෂණ වුනේ?

පි: මගේ නිරීක්ෂණ වුනේ කොලොසස් පෞද්ගලික සමාගමට හා අනිනකුත් සියලු කර්මාන්ත කරුවන්ට කොපමණ ප්‍රමාණයක් පිත්තල කේබල් ඔන් කට්,ට්‍රාන්ස්ෆෝර්ටර්ස් ලබා දීලා තියෙනවාද එහෙම නම් ඒ ලබා දීලා තිබෙන මුළු ප්‍රමාණයෙන් කොලෝෂස් සමාගමට සියට කීයක ලබා දීලා තියෙනවා ද කියලා Percentage කියන එක ප්‍රතිශයක් ලබා දිලා තියෙනවා ද කියලා.මම නිරීක්ෂණය කරා ඒ වාර්ථාව මා සතුයි.

ප්‍ර: ඒ අනුව ඔබ සංසන්ධනාත්මක වාර්තාවක් සකස් කරනු ලැබුවාද?

පි: ඔව්. මම සකස් කරනු ලැබුවා.

ප්‍ර: ඒ වාර්ථාව සකස් කරන්න ඔබ උපයෝගි කරගත්තේ ඒ මොනවාද ලේඛන ?

පි: මං මෙහිදි මා සතුව තිබෙනවා කොලෝසස් පෞද්ගලික සමාගමේ මුල් ලිපි ගොනුව ඒ වගේම මගේ අලෙවි අංශය සතුව තිබෙනවා අනෙකුත් කර්මාන්තකරුවන්ට ලබා දී දුන් පිත්තල හා සම්බන්ධ සියලු තොරතුර මේ නිර්නායකන් තමා මේ තොරතුරු භාවිතා කරේ අදාළ තොරතුරු සහ සංසන්ධනාත්මක මේ ලේඛනය සැකසිම සඳහා.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මේ ප්‍රතිශත සහ ප්‍රතිශත වශයෙනුත් ගණනය කරලා සන්සන්ධනාත්මක වාර්තාවක් සකස්කරනු ලැබුවා කියලා?

පි: එහෙමයි.

ප්‍ර; එහි පිටපතක් ඔබට මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනවාද?

පි: හැකියාවක් තියෙනවා ස්වාමිනි.

මෙම සාක්ෂිකරු විසින් කරන ලද එකී සන්සන්ධනාත්මක වාර්තාව C764 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් ඔබට C764 වශයෙන් ලකුණු කර ඉදිරපත් කරන ලද මෙම ලේඛනයේ ඔබ වගුවක් ආකාරයටද තමයි ඔබ මේක මේ සකස් කරලා තියෙන්නේ?

පි: එහෙමයි එය නිවැරදියි.

ප්‍ර: ඒ වගුවේ මොනවාද ඔබ අඩංගු කරලා තියෙන කරුණු කියලා ඒ වගුව ඔබට මේ අවස්ථාවේදී පැහැදිලි කරන්න හැකියාවක් තියෙනවාද?

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

පි: තිබෙනවා මට පැහැදිලි කරන්න හැකියාවක් තිබෙනවා.

ප්‍ර: දැන් ඔබ 2017 වර්ෂයේ සම්බන්ධයෙන් ඇතුලත් කර ඇති දත්ත සම්බන්ධයෙන් පැහැදිලි කරන්න මුලින්ම?

පි: 2017 වර්ෂයේ මා පැහැදිලි කිරීමක් සඳහා කොලොසස් පෞද්ගලික සමාගමට සහ අනිකුත් සියලුම කර්මාන්ත කරුවන්ට ලබා දුන් පිත්තල කොපු ඒ වගේම කේබල් හෝ කට්ස් තමයි මේ 2017 වසරේ කොලොසස් සමාගම ලබා දීලා තිබෙන්නේ. ඒ සංසන්දනාත්මක තොරතුරුත් එක්ක මම සංසන්දනයක් කරා ඒ අනුව 2017 වසරේ කොලෝසස් පෞද්ගලික සමාගමට ඇලුමිනියම් කප් කිලෝ ග්‍රෑම් දාසයදහස් අටසිය පනස් හයයි දශම අටක් (16856.8 kg) ලබා දී තිබෙනවා. එහි මුළු වටිනාකම හැට අටලක්ෂ හැටඑක්දහස් එකසිය තිස් එකයි සත අසුපහයි(6861131.85 kg) ස්වාමිනි. ඒ වසරේම ඇලුමිනියම් කප් ලබා දෙනවා අනෙකුත් කර්මාන්තකරුවන්ට එය මුලු වශයෙන් කිලෝග්‍රෑම් අසුඅටදහස් දෙසිය පනස් හතරයි පොයින්ට් එකයි හයක්(88254.16 kg).එහි වටිනාකම තුන්සිය හතලිස් අට ලක්ෂ පනස් අටදාහස් එකසිය හැටපහයි (34858165100). ඒ අනුව ඇමුණුම්කප් ලබා දීමේදී කොලෝසස් සමාගමට මුලු ලබා දුන් ප්‍රමාණය 19.1% ලබා දී තිබෙනවා කිලෝ ග්‍රෑම් වශයෙන් බර සලකා බැලීමේදී ඒ වගේම මෙය මිල ගණන් සලකා බැලීමේදී එය 16.4% අගයක් ගන්නවා. ඊන් පසුව කේබල් ඔෆ් කට්ස් අපි කිලෝග්‍රෑම් වලින් තමයි ලබා දෙන්නේ.

ප්‍ර; ඔබ මොකක්ද ලබා ගන්න ලෝහය?

මේ වයර් පිත්තල වයර්, තඹ වයර් තියෙනවා මේ වයර්වල කට් කපලා ඉවත් ඉවත් කරන කොටස තමයි මේ අපි පිත්තල ඕෆ් කට්ස් කියලා ලබා දෙන්නේ. මෙහිදි කොලෝසස් පෞද්ගලික සමාගමට කිලෝ ග්‍රෑම් පන්දහස් හත්සිය තිස්හතරක් පොයින්ට් දශම පහක් ලබා දී තිබෙනවා (5734.5 kg) . එය ගණනයක් විදියට ගත්තාම එය නමලක්ෂ හතලිස් තුන්දහස් එකසිය අසුඑකකයි සත අසුනමයක් වෙනවා (943181.89). අනිකුත් කර්මාන්ත කරුවන් සඳහා එය හදාස් එකසිය අනුහයයි කිලෝ ග්‍රෑම් එය මිල එහි මිල දශ ලක්ෂ දහනවදාහස් විසි එකක් වෙනවා. ඒ අනුව කේබල් ඔෆ් කට්ස් ලබා දී තිබෙනවා 48% ක් කොලෝසස් සමාගම ස්වාමිනි. එහි මිල සංසන්ධනය කිරීමේදී එයත් 48% වෙනවා ඒ අනුව කොලෝසස් පෞද්ගලික සමාගම වෙනුවෙන් ලබා දී තිබෙන 2017 වසරේ ලබා දී තිබෙන මුලු බර අනුව ප්‍රමාණය 22591.3 යි වෙනවා. එහි වටිනාකම හැත්තෑ අටලක්ෂ හාරදහස් තුන්සිය දහතුනයි හැතෑහතරක් වෙනවා. අනෙකුත් කර්මාන්තකරුවන් සඳහා ලබා දී ඇත්තේ කිලෝ ග්‍රෑම් අනුහතර දහස් හාරසිය පනහනයි. එය මුදලක් වශයෙන් තුන්සිය පනස් අටලක්ෂ හැත්තෑ හත්දහස් නවසිය අසුහයක් වෙනවා.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සම්පූර්ණ එකේ ?

පි: සර් සම්පූර්ණ එකේ හරි වසර 17,18,19 සන්සන්ධනය මම කරලා තියෙනවා.

ප්‍ර: 2017 තොරතුරු සියල්ල ප්‍රකාශ කෙරුවාද?

පි: කෙරුවා 2017 වසරේ ස්වාමිනි ඒක සිදු කරා.

****

<u>ගරු අදි කාරිය මැතිණිය</u>

ප්‍ර: 2017 වසරේ ඔය වාර්තාවෙන් සඳහන් කරේ කොලෝසස් ප්‍රවයිවට් ලිමිටඩ් සහ අනෙකුත් සුලු කර්මාන්ත කරුවන් විසින් ඉල්ලන ලද අබලි ද්‍රව්‍ය පිළිබඳව ලබා දී ඇති අකාරයනේ ඔබ කිව්වේ කොතරම් ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට වාර්ථා වී තියෙනවාද ඔවුන් ඇත්ත වශයෙන් ඔවුන්ගේ අවශ්‍යතා ලෙස ඉල්ලූ ගාන සහ ඊට සාපේක්ෂව ලබා දී ඇති ප්‍රමාණය ගැන සන්සන්ධනාත්මකව බැලීමක්?

පි: සන්සන්ධනාත්මකව බලලා මේ අවස්ථාවේදී ඉදිරිපත් කලනොහැකියි. ලබා දෙන්න හැකියාව තිබෙනවා ස්වාමිනි මේ .

ප්‍ර: දැන ඇත්තටම මෙච්චරක් අවශ්‍යතාවයක් තියෙනවා කියලා කිව්වාම ඔබගේ ආයතනයෙන් ඔවුන්ට ලබාදෙන්නේ කොපමණක්ද කියන එක?කොලෝසස ප්‍රයිවට් ලිමිටඩ් සහ අර සුලු කර්මාන්තකරුවන් සියලු දෙනාම.

පි: හැකියාවක් තියෙනවා ස්වාමිනි.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් 2017 වර්ෂයට අදාළ සියලු සංඛ්‍යා දත්ත ඔබ මේ අවස්ථාවේදී ඔබ ප්‍රකාශ කරලා අවසන්ද?

පි; ප්‍රකාශ කරලා අවසන්.

ප්‍ර දැන් 2018 වර්ෂයේ ඒ අනුව ඒ ඔබේ සන්සන්ධනාත්මක දත්ත නිරීක්ෂණය සම්බන්ධයෙන් පැහැදිලි කරන්න?

පි: 2018 වසරේ අපි කොලෝසස් පුද්ගලික සමාගමට ඇමුණුම් කප්ස් සහ ට්‍රාන්ස් ෆෝටරිස් ලබා දී තිබෙනවා. එහිදි ඇමුණුම් කප් අපි ලබා දීලා තිබෙනවා එක් ලක්ෂ හාරදහසක් එහි ඒ බර අනුව ඔය එය හාරසිය හත්ලක්ෂ එක් දහස් නමසිය සත විස්සක් වෙනවා මිල සන්සන්ධනය කිරිමේදී ඒ වගේම අනෙකුත් කර්මාන්ත කරුවන් සඳහා අපි ලබා දී තිබෙන්නේ එක්ලක්ෂ අනුඑක්දහස් හාරසිය පනස්තුනක් දශම දෙකයි හයයි ප්‍රමාණයක් බර සැලකිල්ලට ගැනීමේදී එය මිල සැලකිල්ලට

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගැනීමේදී හත්සිය පනස්නමලක්ෂ විසිතුන්දහස් දෙසිය දාසයක් වනවා. මෙය සම්පූර්ණ කර්මාන්ත කරුවන් හා සැසඳීමේදී 34.31% කොලසස් පෞද්ගලික සමාගමවෙත අපි බර අනුව අපි ලබා දී තිබෙනවා.එය මිල සන්සන්දය කිරිමේදී එය 34.98 ක් වනවා ස්වාමිනි.ට්‍රාන්ස්පෝමර් අපි ලබාදෙන්නේ ඒකක වශයෙන් ඒකක වශයෙන් ට්‍රාන්පෝම්ර්ස් ලබා දීමේදී කොලොසස් පෞද්ගලික සමාගමට තාරපෙවිටි තුන්සියවිසි අටක් අපි ලබා දීලා තිබෙනවා.

ප්‍ර: තරාපැවි කියලා කියන්නේ මොනවාද?

පි: තාරා පෙවි කියලා කියන්නේ ට්‍රාන්ස්පෝම්ස්වලට තරාපැවි කියලා තමයි අපි භාවිතා කරන්නේ. ඒ අනුව තරාපැවි තුන්සියවිසිඅටක් සඳහා කොලොසස් පුද්ගලික සමාගම අපවෙත ගෙවා තිබෙනවා තුන්සිය දහතුන් ලක්ෂ හැටතුන්දහස් පන්සිය අටයි සත තිස් දෙකක්.අනෙකුත් කර්මාන්තකරුවන් සඳහා අපි තරා පෙවි හත්සිය හතලිස් හයක් ලබා දී තිබෙනවා.එය හත්සිය හැත්තැලක්ෂ විසිදහස් අටසිය හතිලස් හතරක් වෙනවා. මේ අනුව සැසඳීමේදී තරාපැවි අනෙකුත් කර්මාන්තකරුවන් හා සැසදිමේදී 30.54% ප්‍රමාණයක් කොලෝසස් පුද්ගලික සමාගමට අපි ලබා දී තිබෙනවා එය මුදල සැලකිමේදී 28.93 ක් වෙනවා.2019 වසරේ දී අපි ලබා දී තිබෙන්නේ තරාපැවි පමණයි. එය කොලෝසස් පෞද්ගලික සමාගම වෙත තරාපැවි හැත්තෑ දෙකක් අපි ලබා දී තිබෙනවා. එය අනුතුන් ලක්ෂ අසුපන්දහස් අටසිය පනස් අටයි සත අසූ එකක් වෙනවා. අනෙකුත් කර්මාන්තකරුවන් සඳහා එය තරා පෙවි පන්සිය නමයක් ලබා දී තිබෙනවා. ඒ අනුව එහි වටිනාකම 60683940 ක්. මෙය සැසඳීමේදී 12.39 % වෙනවා ස්වාමිනි. එය මිල සැසැඳීමේදී 13.39% වෙනවා. ඒ අනුව 2017,සහ 2019 වසර සැසඳීමේදී මිළ සැලකීමේදී අප වෙත අටිසිය අනු දෙලක්ෂ පනස්පන්දහස් පන්සිය අනු දෙකක මුදලක් ගෙවා කොලෝසස් පෞද්ගලික සමාගම අපෙන් අඛ්ලි ද්‍රව්‍ය ලබා ගෙන තිබෙනවා අනෙකුත් කර්මාන්ත කරුවන් මේ වරස තුන සඳහා 249205186 අප සඳහා අපි ඔහුට අඛ්ලි ද්‍රව්‍ය ලබා දී තිබෙනවා. මෙය සංසන්දනාත්මක සැලකිමේදී අනෙකුත් කර්මාන්ත සහ කෝලෝසස් පෞද්ගලික සමාගම අතර සංසන්ධනාත්මකව බැලිමේ දී එය 35.81% වනවා මුලු වසර තුන සැසඳීමේදී එපමණයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මේ අඛ්ලි ලෝහ ද්‍රව්‍ය කර්මාන්තකරුවන්ට ලබා දෙන කොට ඒ කර්මාන්ත කරු වර්ගකී කරණයකට ලක්වෙනවායි කියලා සුළු කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත කරුවන් කියලා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ හඳුනා ගැනීම මත ඒ එක් එක් කර්මාන්තකරුට අඛ්ලි ලෝහ ද්‍රව්‍ය ලබා දෙන්නේ යම් කිසි වට්ටමක් මත සහනදායි මිලකට කියලා ඔබ සාක්ෂි ලබා දෙන කොට වැඩිදුරටත් ප්‍රකාශ කරා?

පි: එය නිවැරදියි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ සංසන්ධනාත්මක වාර්තාව ඔබ සකස් කරන කොට කෝලෝසස් පුද්ගලික සමාගමේ කර්මාන්තකරු වෙත ඒ අබලි ලෝහ ලබා දීලා තිබෙන මිලගණන් 2013 වර්ෂයේ මාර්ගෝපදේශක නිර්ණායකයන්ට යටත්ව ලබා දුන්නද යන්න කාරණය සම්බන්ධයෙනුත් පරීක්ෂා කරලා බැලුවාද?

පි: මම පරික්ෂාවක් කෙරුවා ස්වාමිනි.

ප්‍ර: මොනවද ඔබේ නිරීක්ෂණ?

පි: ඒ අනුව මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් සඳහා අපි ලබා දෙනවා වට්ටම 15% පමණ වෙනවා. එහෙත් කෝලෝසස් පෞද්ගලික සමාගම සඳහා ඊට වැඩි ප්‍රතිශතයක වට්ටමක් ලබා දී තිබෙනවා.

ප්‍ර: මොන කරුණු මතද මොන පදනම මතද ?

පි: මා සතුව අදාළ භාණ්ඩ අලෙවි කිරීමේ දී නිකුත් කර රිසිටිපත් තිබෙනවා අදාළ මිල සඳහන් කර තිබෙනවා ලබා දී ඇති ප්‍රමාණයන් සඳහන් ලිපි ලේඛනයන් මා සතුව තියෙනවා ඒ අනුව මට ප්‍රකාශ කල හැකියි අදාළ රිසිට් පත සැලකීමේ දී ලබා දී තිබෙන මිල ගණන් අනෙකුත් කර්මාන්තකරුවන් සඳහා ලබා දී කියන මිළගණන් සැසඳීමේදී අදාළ 15% ට වැඩි වට්ටමක් අදාළ කොලෝසස් පුද්ගලික සමාගම වෙත ලබා දී තිබෙන බව

ප්‍ර: දැන් ඔබේ ගණනයට ඔබ යම්කිසි ඉන්වොයිස් පත්‍රයක් අදාළ කර ගත්තාද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ඉන්වෝයිසි පත්‍රයක් අදාළ කරගෙන ඔබට වැඩිදුරටත් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

පි: පුළුවන් මට පැහැදිලි කිරිමක් කළ හැකියි. ඉන්වොයිස් අංක HO5560 2017.10.11 වන දින මෙය නිකුත් කර තිබෙන්නේ N'I ඉන්ෂාෆ් අහමඩ් 111/416, අවිස්සාවෙල්ල පාර,වැල්ලම් පිටිය. description එහි සඳහන් වී තිබෙනවා ඇමුණුම් කප්ස් බ්‍රාස් ලබා දී තිබෙන ප්‍රමාණය කිලෝග්‍රෑම් 1625 යි එහි මිල සඳහන් වී ඇත්තේ රුපියල් 398 .75. ඒ අනුව 648208 සම්පූර්ණ වටිනාකමක් සහිතව ඉන්වොයිස් පතක් මගින් අදාළ නිකුත් කිරිම සිදු කර තිබෙනවා මෙම නිකුත් කිරීම සිදු කර තිබෙන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂක දික්වැල්ල මහතා විසින්

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් අදාළ ගණනය කිරීමට භාවිතා කරන ලද ඉන්වොයිස් අංක H05560 දරණ සහ 2017 .10.11 වෙනිදිනැති ඉන්වොයිස් පත්‍රය C765 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා දැන් ඔබ කිව්වා ඔය

****

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම ලේඛනය සාක්ෂිකරු භාරයේ තිබෙන මුල්ලේඛනය වශයෙන් ලකුණු කර ඇති හෙයින් එකී ලේඛනයේ ඡායා පිටපතක් ලබා ගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර ඉන් පසු මුල් පිටපත නැවත සාක්ෂිකරු වෙතට මුදා හරින ලෙසට නියෝග කරමි. අධිකරණයකින් නැවත නියෝගයක් ලැබෙනතුරු මෙම මුල් ලේඛනය සුරක්ෂිතව තබා ගන්නා ලෙසටද සාක්ෂිකරුට නියෝග කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මේ ඉන්වොයිස් පත්‍රය අනුව පිත්තල කිලෝග්‍රෑම් එකක් සහිතව සඳහා අය කර ගෙන ඇති මුදල රුපියල් 398.75 ක් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් එසේ නම් එය නිවැරදිව ලබාදිය යුතුව තිබෙනු මුදල කීයද?

පි: කර්මාන්ත කරුවන් සඳහා අබලි ද්‍රව්‍ය ලබා දීමේදී සුළු කර්මාන්ත කරුවන් සඳහා අප 25% ක වට්ටමක් ලබා දෙනවා. ඒ අනුව අදාළ සුළු පරිමාණ කර්මාන්ත කරුවන් සඳහා 387.26 තමයි අපි පිත්තල ලබා දෙන්නේ එක කිලෝග්‍රෑමයක් සඳහා.

ප්‍ර: ඒ කියන්නේ මේ 2017 වර්ෂයේ ?

පි: ඒ අනුව කොලෝසස් පුද්ගලික සමාගම සඳහා 15% ක ප්‍රතිශතයකට අනුව වට්ටමකට අනුව මේ ලබා දුන්නා නම් එය රුපියල් 438.85 ක් විය යුතුයි. ඒ අනුව මාගේ ගණනය මා සිදු කලා අදාළ සියලුම අලෙවි කටයුත්ත සඳහා ඒ අනුව දළ වශයෙන් මිලියන 4.6 ක අලාභයක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත සිදු වී තිබෙනවා මෙවැනි වැඩි ප්‍රතිශතයක වට්ටමක් අදාළ කර්මාන්ත ශාලාව සඳහා සඳහා ලබා දීම තුළින් .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු කලෝසස් පෞද්ගලික සමාගම ලංකා කාර්මික මණ්ඩලයේ තිබෙන රීතිවලට අනුව සුළු පරිමාණ ,මධ්‍ය පරිමාණ,නැත්නම් මහා පරිමාණ කර්මාන්තවලින් කුමන ගණයටද අයිති වෙන්නේ ?

පි; මෙය ආරම්භයේ දී මධ්‍ය පරිමාණ ගණයේ පැවතුණා ඉන්පසුව 2018 වසරේ එය අපගේ සුළු කුඩා සුළු හෝ මධ්‍ය පරිමාණ ගණයට අයත් වන්නේ නැහැ එයට හේතුව තමයි ස්වාමිනි එහි වාර්ෂික පිරිවැටුම මිලියන 600 ඉක්මවා තිබීම නිසා .

****

FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඔබ ගනණය කිරීමේ දී යොදා ගත්තේ කුමන කර්මාන්තකරුවන්ට ලබා දෙන වට්ටම මතද?

පි: සුළු කර්මාන්ත කරුවන්ට ලබා දෙන 25% ක වට්ටම තමා මා සැලකුවේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: 2017 වර්ෂයේදී කොලෝස්ස් පුද්ගලික සමාගම ලියාපදිංචි වන විට ඔවුන් සුළු පරිමාණ නැත්නම් මධ්‍යම පරිමාණ ඝනයටද වැටෙන්නේ?

පි: ඒ අවස්ථාවේදී ඔවුන් මධ්‍ය පරිමාණ ගණයේ තමයි ඔවුන්ව සටහන්ව තිබුණේ.

ප්‍ර: ඒ කියන්නේ 2017 පළවෙනි වරට ලියාපදිංචි කරන කොට?

පි: කරන කොට.

ප්‍ර: එතකොට මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට දෙන වට්ටම කියද?

පි: 15% යි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඒ මත ද ඔබ ගණනය සිදු කරනු ලැබුවේ?

පි: ඒ මත තමයි මා ගණනය සිදු කලේ.

ප්‍ර: 15% වට්ටමක් සලකා බලලා ?

පි: 15% වට්ටමක් සලකා බලලා

****

<u>ගරු අදිකාරිය මැතිණිය</u>

ප්‍ර: පැහැදිලි කර ගැනීමක් කර ගන්න ඕනේ ඔය ගයිඩ් ලයින් ඒකේ උපදේශක මාලාව නේද?

පි: ඔව් මාර්ගෝපදේශනය සංග්‍රහය.

ප්‍ර: මාර්ගෝපදේශනය ඒකේ තියෙනවාද පැහැදිලිවම කියලා වාර්ෂික පිරිවැටුම මිලියන 600 ට වැඩියි සමාගම් සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ අඩලි ද්‍රව්‍යය ලබා දීමට හැකියාවක් නොමැත කියලා?

පි: අඩලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ ස්වාමිනි සුළු, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ඒ සඳහා වන නිර්නායකයන් ලබා දී තිබෙනවා ඒ නිර්ණායකයන්ට හසු නොවන කර්මාන්ත මේ ව්‍යාපෘතිය යටතේ අදාළ පහසුකම් වට්ටම් ලබා දී අඩලි ද්‍රව්‍ය නිකුත් කර නොහැකියි තත්ත්වයක් තමයි තිබෙන්නේ

ප්‍ර: එතකොට ඔබ සඳහන් කරන්නේ ඒ මධ්‍යම පරිමාණ එකක් හැටියට 2017 ලියා පදිංචි වෙන අවස්ථාවේ තිබූ කොලෝසස් පුද්ගලික සමගම 2018 වසර වෙන කොට එම කාණ්ඩයෙන් අයින් වෙනවා?

FAIR COMMENT BY JEZEEM

පි; අයින් වෙනවා.

ප්‍ර: එතකොට දැන් 2018 වසරේත් එම සමාගමට දීලා තියෙනවාද අර සුළු කර්මාන්ත කරුවන්ට දෙන 25% වට්ටම ?

පි: 20% පමණ වට්ටමක් ලබා දෙනවා

ප්‍ර: 20% විතර වට්ටමක් ලබා දී තිබෙනවා 2017 ක් දීලා තියනවා 20% ක පමණ

පි: එසේය ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරුවා C763 වශයෙන් අභ්‍යන්තර විගණනය විමසීමට එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි අංශයෙන් යවනු ලබන 25.7.2018 දරන ලිපිය?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම ලිපියේ අංක 02, අංක,03, අංක.04, යන කරුණු වලින් දක්වලා තියෙන්නේ යම් කිසි පියවරවල් ගෙන තිබෙනවා එවකට ලංකා කාර්මික මණ්ඩලයේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව කියලා ?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් අබලි ද්‍රව්‍ය විකිණීමේදී ඒ සඳහා සකස් කරපු මාර්ගෝපදේශක මාලාවක් ඔබ විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරුවා C754 කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ C754 දරණ මාර්ගෝපදේශවලට අනුව ?

පි; එහෙමයි .

ප්‍ර: යම් යම් අවස්ථාවල තීරණ ගැනීමේ බලය සභාපති වරයාට දීලා තියෙනවද? එහෙම නැත්නම් වෙන තැනකින් ද ඒ තිරණ ගැනීමේ බලය දීලා තියෙන්නේ

පි: අදාළ කැබිනට් අනුමැතියට අනුව ස්වාමිනි මෙහි අබලි ව්‍යාපෘතියේ නිසි බලධාරියා වන්නේ වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වන්නේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක කියලා තමයි සඳහන් වෙලා තියෙන්නේ. ඒ අනුව අලෙවි අධ්‍යක්ෂකගේ ඒ අනුමැතිය හෝ නිර්දේශය නොමැතිව මෙලෙස ක්‍රියා කිරීම මෙයට පටහැනි බවයි මගේ හැඟීම.

ප්‍ර: ඒ ඔබේ හැඟිම මං කියන්නේ මාර්ගෝපදේශනය අනුව?

පි: මාර්ගෝපදේශන අනුව එසේ කල නොහැකියි.

ප්‍ර: ඒ මාර්ගෝපදේශය අනුව මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය පිළිබඳව අධීක්ෂණයක යම් කිසි තැනකින් කරන්න ඕනේද?

පි: හදිසි නම් කලයුතුයි ස්වාමිනි.

ප්‍ර: කවුද ඒක කරන්න ඕනේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඒක කරන්න ඕනේ කලමනාකරණ කමිටුවක් තියෙනවා ඒ කළමනාකරණ කමිටුව මගින් තමයි මේ සියලු අධික්ෂන කල යුත්තේ.
ප්‍ර: කොතනන ද ඒ කළමනාකරණ කමිටුවක් ගැන සඳහන් කරන්නේ?
පි: සඳහන් වෙන්නේ 13 වෙනි පිටුවේ සඳහන් වෙනවා ස්වාමිනි.
ප්‍ර: ඒ කියන්නේ C 754 දරණ ලේඛනයේ 13 වෙනි පිටුවේ .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>
මාර්ගෝපදේශකයේ 4 වෙනි පිටුවේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
ප්‍ර: C754 ලේඛනයේ 4 වෙනි පිටුවේ?
පි; එහෙමයි ස්වාමිනි.
ප්‍ර: අංක .13?
පි: 13.
ප්‍ර: ඒ 2017 ඉඳලා ඒ කලමනාකරණ කමිටුවක් තිබ්බාද?
පි: මාගේ දැනීමේ හැටියට කළමනාකරණ කමිටුවක් පැවතිලා නැහැ ස්වාමිනි.
ප්‍ර: ඒ කළමනාකරණ කමිටුව පත් කිරීමේ වගකීම දැරිය යුත්තේ කවුද?
පි: අමාත්‍යාංශ ලේකම්තුමා.
ප්‍ර තමයි අදාළ කළමනාකරණ කමිටුව මූලිකත්වය අරගෙන එය මෙහෙයවන්නට ඕනේ? අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරේ කවුද?
පි: එවකට රංජිත් අශෝක මහත්මයා තමයි අපගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් රාජකාරි කටයුතු කරේ.
ප්‍ර: ඒ මොන අමාත්‍යාංශයේද?
පි: කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ.
ප්‍ර: 2017 ඉඳලා ඒ මහතා කවදා වෙනකම් ඒ ලේකම් තනතුර දරුවද?
පි: මට නිශ්චිත දිනයක් පැවසීමට නොහැයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>
ප්‍ර: උදයසරි මහත්මයා ?
පි; ස්වාමිනි.
ප්‍ර: ඔබව පත්කලේ මේ තනතුරට ඔබ කලින් දැරූ තනතුරට කවුද?
පි: මහින්ද ජීනසේන සහපතිතුමා තමා මාව පත් කළේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි එතකොට ඒ පත්කලාට පස්සේ මේ අබලි කළමනාකරණ ඒකකයේ කටයුතු වලට සහ එකී ඒකකයේ ක්‍රියාකාරකම්වලට මේ සභාපතිවරයා යම් කිසි ආකාරයකින් මැදිහත් වීමක් සිද්ධ වුනාද? ඔබ දැනුවත්ව?

පි: මා එක්ක රාජකාරි කරන අවස්ථාවන්හිද මාත් එක්ක කිසිම බලපෑමක් සිදු කලේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ එක් සමාගමකට මේ හා සමානව අනික් සමාගම් එක්ක සංසන්දනය කරන කොට වැඩිපුර මේ අබලි ද්‍රව්‍ය විශාල ප්‍රමාණයන් නිකුත් කිරීම කලේ කාගේ නියෝග මතද?

පි: මේ ගැන මට පැහැදිලි පිලිතුරක් ලබා දීමට නොහැකියි එයට හේතුව තමයි ස්වාමිනි මා අදාළ කාර්ය භාර්යන් මුලුමනින්ම ඉවත් කර තිබු නිසා අදාළ කාර්යන් සහ ක්‍රියාවලීන් සිදු වූ ආකාරය පිළිබඳව මට පැහැදිලිව පිළිතුරක් ලබා දිය නොහැකියි.

ප්‍ර: දැන් ඔබ ඊයේ රාත්‍රියේදී ප්‍රකාශ කල ආකරයට C760 දරණ ලේඛනය ඒ කියන්නේ 2018 වසර සඳහා අර අදාළ අයදුම්පත්‍රය දැන් මේ අයදුම් පත්‍රයේ දක්වා තිබෙන ආකාරයට කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය අසම්පූර්ණව තමයි සලකා බලලා තියෙන්නේ?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අසම්පූර්ණව සලකා බැලීම සඳහා නීත්‍යානුකූලව ඉඩකඩක් තිබෙනවද ?ඔබගේ දැනීමේ හැටියට?

පි නැත ස්වාමිනි හැම වසරකම අයදුම්පත ඉදිරිපත් කරන්නේ නව අයදුම් පත්‍රයක් ලෙසින් අපි renewal ඒ කියන්නේ නැවත ඉස්සරහට ගෙන එහි අයදුම්පත් ලෙස අපි අයදුම් පත් නිකුත් කර නැහැ. අපි නිකුත් කරන්නේ එකම අයදුම්පතයි එය නව අයදුම්පතක් විදියට තමයි අපි සලකන්නේ සමහර විට ස්වාමිනි අදාළ කර්මාන්ත ශාලාව වැසි යන්න පුළුවන් සමහර විට අදාළ ස්ථානයෙන් වෙනත් ස්ථානයකට ඒ අදාළ කර්මාන්ත ශාලාව ගෙනියන්න පුළුවන් මෙවැනි හේතු මත අපි අදාළ ස්ථාන පරීක්ෂණයේදී සහ අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ නිර්දේශය ලබා ගන්නවා.

ප්‍ර: දැන් ඔබ නිරීක්ෂණය කරානේ C758 දරණ ඒ අයදුම් පත්‍රය ඒ කියන්නෙ 2016 සහ ,2017 වසර සඳහා නියමිත අයදුම්පත්‍රය ද කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා විසින් සහතික කරලා නැහැනේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ සහතික කරලා තියෙන්නේත් වෙනත් ප්‍රදේශයක ග්‍රාම නිලධාරිවරයෙක්?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අනුව බලන කොටත් මේ අයදුම් පත්‍රය 2016 සහ 2017 වසර සඳහා ද නීත්‍යානුකූලව ඉදිරිපත් නොකර ඇති බව ඔබ පිළිගන්නවාද?

FAIR COMMENT BY JEZEEM

පි: මම පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: එවැනි පසුබිමක් යටතේ 2018 වසර සඳහා ද අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමේදී ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: අසම්පූර්ණ අයදුම්පත්‍රයක් මත මෙපමණ විශාල ප්‍රමාණයක් අබලි ද්‍රව්‍ය අදාළ සමාගමට පමණක් ලබා දීම ඔබ දකින්නේ කොයි විදියටද?

පි: මාර්ගෝපදේශයට යටත්ව එය සිදු කල නොහැක ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මාර්ගෝපදේශ දීලා තියෙන ඒ කියන්නේ පිළිවෙල සම්පූර්ණයෙන්ම උල්ලංගනය වුනා කියලා ඔබ පිළිගන්නවද?

පි: මං පිළිගන්නවා ස්වාමිනි

ප්‍ර; එලෙස උල්ලංගනය වීම කුමන ආකාරයටක සිදුවුනාද කියලා ඔබට විස්තර කරන්න පුළුවන්ද ?

පි: අදාළ කරුණු කාරණා මට පැහැදිලි කරන්න පුළුවන් ස්වාමිනි අදාළ ක්‍රියාකාර්තවයන් ගැන මට පැහැදිලි කර නොහැකියි ස්වාමිනි.

ප්‍ර: දැන් මගේ අවසාන ප්‍රශ්නය මේ ආකාරයට එක් ආයතයකට නීත්‍යානුකූල ඉල්ලුම්පත්‍රයක් පවා ඉදිරිපත් කිරීම නොකර තිබියදී විශාල අබලි ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දීම පිළිබඳව ඒ ඒ අබලි ද්‍රවය ලබා ගැනීමට නොහැකි වෙච්ච අනිකුත් සුළු කර්මාන්ත කරුවන් පැමිණිලි කරාද?

පි: එයත් ඒ වසරේදී පැමිණිලි කරන්නට ඇතැයි මා විශ්වාස කරනවා. ඉන් පසුව මා අදාළ රාජකාරි භාර ගැනිමෙන් පසුව බොහෝ අවස්ථාවන්හි ඔවුන් ඒ අදාළ පැමිණිල්ල භාර ගැනීම සිදු කරනවා දැනටත් ඒ පැමිණිල්ල සිද්ධ කරමින් ඉන්නවා. ඔවුන්ට විශාල අගතියක් වුනා මේ සම්බන්ධව දිගින් දිගටම කියලා ඔවුන් තාමත් ඒ පැමිණිලි අපිට මා වෙත ලබා දෙනවා.

ප්‍ර: එතකොට ඒ පැමිණිලි සම්බන්ධයෙන් ඔබ ආයතනය ගත් පියවර මොනවද?

පි: අපි වර්තමානයේ අපිට ලැබෙන සියලුම පිත්තල සහ තඹ අපි මේ වෙනකොටත් අපි මෙලෙසම අපි තඹ ටොන් 25,30 මේ වගේ ප්‍රමාණයක් අපි ලබා ගන්නවා ආරක්ෂක අමාත්‍යාංශයෙන් සියලු දෙනාටම සියලු දෙනාටම සමව නැත්නම් ඒ ගොල්ලන්ගේ තියෙන capacity අනුව පුංචි ප්‍රමාණයක් අඩු වැඩි වෙන විදියට අපි ලබා දෙනවා කිසිම කෙනෙකුට මේ වෙන කොට අපි අතර ලියාපදංචි වී තිබෙන සියලුම කර්මාන්තකරුවන්ට අද වන විට අවම වශයෙන් අපි දෙන්නේ කිලෝ 424 යි ඒ ප්‍රමාණයවත් අවම වශයෙන් සියලු දෙනාමට මේ වන කොට මට වගකීමෙන් කියන්න පුළුවන් ලබා දීලා තියෙනවා.

ප්‍ර: දැන් ඒ සුළු කර්මාන්තකරුවන්ට අගතියක් සිදුවූ බව පැහැදිලිවට පේනවානේ?

පි: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඊට අමරතව ඔබගේ ආයතනයටත් යම් ආකාරයක පාඩුවක් හෝ අගතියක් සිදුවෙලා තියෙනවද? මේ විදියට විශාල අබලි ප්‍රමාණයක් එක් කර්මාන්ත ශාලාවකට පමණක් ලබා දීම තුලින්?

පි: පැහැදිලිවම අගතියක් සිදුවෙලා තියෙනවා විශේෂයෙන්ම අපේ ක්‍රියාකාරිත්වයට දැඩි ප්‍රහාරයක් එල්ලවෙලා තියෙනවා මේ වෙන කොට එලෙස කටයුතු කිරීම සම්බන්ධව ඒ වගේ මිල මුදලින් අපිට යම්කිසි අලාභයක් වෙලා තියෙනවා ඒ වගේම අපේ මාර්ගෝපදේශන සංග්‍රහය අපිට නිසි පිලිවෙලට කරගෙන යෑමේ දැඩි අපහසුතාවයට අපි පත්වෙලා තියෙනවා . හේතුව තමයි මේ වන විට මෙයින් අගතියටපත් කර්මාන්ත කරුවන් අපි ගැන තියෙන විශ්වාසය අඩු වෙලා තියෙන බවයි මගේ හැඟීම.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා විශාල අලාභයක් මේ අයුරින් සිදුවෙලා තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබගේ දැනීමේ හැටියට එයට වගකිව යුත්තේ කවුද?

පි: මා විශ්වාස කරන්නේ සියලුම මෙහෙයුම් කටයුතු සඳහා වගකීම මා වෙනුවෙන් භාරගත්තා නම් අයකු මේ සියලුම කටයුතුවල වගකීම අබලි කළමනාකරණ ඒකකයේ වගකීම අදාළ අලෙවි අධ්‍යක්ෂකවරයාට පැවරිලා තියෙන නිසා ඒ වගකිම දැරුවා නම් යම් කිසි අයෙකු ඔහුට මෙහි වගකීම යායුතුයි කියලා මගේ හැගීම.

ප්‍ර: ඔබ අලෙවි අධ්‍යක්ෂක තනතුරෙන් ඉවත් කරේ කවුරුන් විසින්ද?

පි: පැහැදිලි නැහැ.

ප්‍ර: ඔබ එම හිටිය තනතුරෙන් ඉවත් කරේ කවුද?

පි: මාගේ හිටපු සභාපතිතුමා විසින් මාව ඉවත් කරනු ලැබුවා.

ප්‍ර: ඒ සභාපතිවරයාට ඔබ ඉවත් වීමට කිරීමට බලයක් තිබෙද?

පි: මාර්ගෝපදේශන සංග්‍රහයට අනුව තනි තීරණයක් අනුව එසේ කල නොහැකි බවයි මාර්ගෝපදේශන සංග්‍රහයට අනු තියෙන්නේ කිසියම් හෝ මෙවැනි නිසි බලධාරියා ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් කෙනෙකු පත්කිරීම මේ දැවැන්ත බලවත් ශක්තිමත් කරුණු ප්‍රතිපත්ති කමිටුව හරහා කැබිනට්ටුව දැනුවත් කිරීමෙන් පසු සිදු කිරීමට බව තමයි මෙහි තියෙන්නේ මේ සෘජුව සඳහන් කර නැහැ ස්වාමිනි. එහෙත් මෙහි ගම්‍ය වන්නේ එවැනි දැඩි තීරණයක් එවැනි සෘජු තීරණකයක් ගැනීමේදී එවැනි නිර්දේශයක් එහෙම නැත්නම් ඔවුන් දැනුවත් කිරීමක් කල යුතුබවයි මගේ හැගීම. අදාළ මාර්ගෝපදේශනයක් සංග්‍රහයට යටත්වයි මා මේ ප්‍රකාශ කරන්නේ.

ප්‍ර: සභාපතිවරයා විසින් ඔබ ඉවත් කිරීමට යම් කිසි හේතුවක් තිබ්බද?

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: නැත ස්වාමිනි.

ප්‍ර: එය හදිසියේ කල එකක්ද?

පි: ඔව් මට අදාළ ලිපිය ලැබෙන තුරු මා දැන සිටියේ නැහැ මාව ඉවත් කිරීම ඒ වගේම කිසිම කරුණක් සඳහන් කර නැහැ ඇයි මාව ඉවත් කරන්නේ යන්න කිසිම කරුණක එහි සඳහන් කර නැහැ.

ප්‍ර: තමන්ම මෙම තනතුරට පත් කරේ සභාපතිවරයා විසින්?

පි: 2015 ජූලි මාසේ 10 වෙනිදා රාජකාරි භාර ගන්න අවස්ථාවේදී නරන්තරයෙන්ම නිරැතිවම අදාළ අංශයන් අධ්‍යක්ෂවරයා සතු වෙනවා. ඒ නිසා ආදල පත්වීම සිදු කරන අවස්ථාවේදී මාගේ හිටපු සභාපතිතුමා තමයි ඒ අවස්ථවේ හිටියේ ඒ නිසා තමයි මං එතුමාගේ නම සඳහන් කළේ. ඒ නිසා මට එතුමා පත් කිරීමක් කෙසේ වෙතත් මා අදල පත්වීම ලද නිසා අදාළ අංශයන්හි වගකීම මා වෙත පැවරිලා තිබුණා.

ප්‍ර: සභාපතිවරයා පත් කරනු ලැබුවේ කවුරුන් විසින්ද?

පි: පැහැදිලි නැහැ.

ප්‍ර: සභාපතිවරයා පත් කරනු ලැබුවේ?

පි: සභාපතිවරයා පත්කරනු ලබන්නේ අමාත්‍යාංශ ඇමතිතුමා විසින් බවයි අපි සමාන්‍ය සිදුවෙන ක්‍රමවේදය.

ප්‍ර: එම කාල සීමාවේදී මෙම සභාපතිවරයා පත් කරනු ලැබුවේ අමාත්‍යවරයාගේ නම මොකක්ද?

පි: එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ තමයි අපේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ තිබුණේ එහි ඇමතිවරයා විදියට කටයුතු කරේ රිසාඩ් බදූර්දීන් ඇමතිතුමා.

ප්‍ර: තම අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු කිරීමේදී තමන්ට සභාපතිවරයාගෙන් හෝ අමාත්‍යවරයාගෙන් යම් බලපෑම් සිදුවුවද?

පි: මට පෞද්ගලිකව කිසිදු බලපෑමක් සිදුවුනේ නැහැ. මාත් එක්ක රාජකාරි කරන අවස්ථාවන්හි හිටපු සභාපතිතුමා හෝ මට එවැනි කිසිදු බලපෑමක් කරේ නැහැ. මගේ රාජකාරිය මට නිසි අයුරින් මං කරගෙන යන්න මට හැකියාවක් ලැබුණා.

ප්‍ර: එසේ නම් ඔබ අයින් කිරීමට හේතුවක් තියෙනවද?

පි: මට පැහැදිලිවම එය තාමත් මට ප්‍රශ්නයක් ඇයි මාව හේතු නොදන්නවා මාව ඉවත් කලේ ඇයි කියන්න මේ බව මගේ අධ්‍යක්ෂක ජනරාල්තුමාට මං දන්නවා සිටියා එතනින් එහාට මම යන්න උත්සහ කරේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට විරුද්ධව යම් යම් පාර්ශවයන්ගෙන් පැමිණිලි එහෙම ලැබිලා තිබුණාද?

පි: නැහැ මට එහෙම කිසි එහෙම පැමිණිලි ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර: තමන් තමන්ගේ මේ තනතුරෙන් ඉවත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්ට ලිඛිතව දැනුම් දුන්නාද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහි පිටපතක් මට ලබා දුන් ලිපියේ පිටපතක් අධ්‍යක්ෂක ජෙනරාල්තුමාට ලබා දී තිබෙනවා ඒ අනුව මා ඔහුට මේ බව සඳහන් කරා. එතුමා සඳහන් කරා මටත් පිටපතක් ලැබුණු බව ඒ නිසා මම එතුමා මා එය දැනගත්තා නිසා මම නැවත වාරයක් පැමිණිලි කිරීමට උත්සුක වුනේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබගේ ඒ මාරුවීම සම්බන්ධව විරුද්ධත්වයක් ප්‍රකාශ කරාද ?

පි: නැහැ ස්වාමිනි මම විරුද්ධත්වයක් ප්‍රකාශ කරේ නැහැ .

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබගේ පත්වීම ඔබ අධ්‍යක්ෂක තනතුරකනේ හිටියේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබගේ පත්වීම සභාපතිවරයාද කරන්නේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින්ද අනුමත කරන්නේ?

පි: එය අධ්‍යක්ෂක මණ්ඩලයේ විසින් අනුමත කරන්නේ.

ප්‍ර: අනුමත කරාම සාමාන්‍යයෙන් සභාපතිතුමාගේ අත්සනින් පත්වීම් ලිපියක් ලැබනෙවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ වගේ අවස්ථාවකදී ඔබ අයින් කිරීම කල හැක්කේ සභාපතිවරයාටද එහෙම නැත්නම් අධ්‍යක්ෂක මණ්ඩලයට ද? එම තනතුරෙන්?

පි: මාර්ගෝපදේශන සංග්‍රහයට යටත්ව නම් ස්වාමිනි අධ්‍යක්ෂක මණ්ඩලයටත් එසේ කල නොහැකි බවයි මගේ හැගිම කෙසේ වෙත්ත අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියක් හෝ ලබා නොගෙන තමයි මාව ඉවත් කරලා තියෙන්නේ.

ප්‍ර: මාර්ගෝප සංග්‍රහය ගැන ඔබ නිතරම කථා කරන්නේ ඔබගේ පත්වීම සම්බන්ධයෙන් මාර්ගෝප සංග්‍රහයේ තියෙනවාද ඔබව තනතුරට පත්කිරිමක් ?

පි; තනතුරට පත්කිරීම ස්වාමිනි කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලිලෝහ කලමණාකරනය ඒකක යටතේ සඳහන් වෙනවා අබලි ලෝහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ අලෙවි ලෝහ කලමනාකරණ ඒකකය මඟින් සිදු කල යුතු අතර එහි වගකිවයුතු ප්‍රධාන නිලධාරියා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක වේ යනුවෙන් සඳහන් වී තිබෙනවා.

ප්‍ර: ඔබ ඔබගේ පත්කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයෙන් කිරීමට අමතරව මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් අනුමැතිය ඇති මෙම උපදේසක මොකක්ද ඒකට කියන්නේ?

පි: මාර්ගෝපදේශන සංග්‍රහය ස්වාමිනි.

ප්‍ර: ඔබ මාර්ගෝපදේශන සංග්‍රහයේ පැහැදිලිව තියෙනවා ඔබව එම තනතුරට පත් කර යුතු බව නිලනාමයෙන්ම?

FAIR COMMENT BY JEZEEM

පි: එසේමයි .

ප්‍ර: එතකොට ඔබ පැමිණිල්ලක් කරාම අධ්‍යක්ෂක ජෙනරාලුත් මේ පිළිබඳව ඔබට සහනයක් ලබා දීම හෝ ඒ වෙනස් කිරීමට කටයුතු කලේ නැද්ද?

පි: අමාත්‍යාංශ ලේකම්ට වාර්තා කරාද? ඒ වෙනස් කිරීම් කරපු එක?

පි: නෑ ස්වාමිනි නැහැ වාර්තා කරේ නැහැ.මම මගේ අධ්‍යක්ෂක ජෙනරාල්තුමාව දැනුවත් කිරීම පමණයි සිදු කරේ.

ප්‍ර: දැන් ඔය මාර්ගෝපදේශන සංග්‍රහය 2013 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් ලැබිච්ච එකක්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට එවකට සාමප්‍රදායික කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වරයා ඔබලාගේ ආයතනයේ සභාපති හෝ අධ්‍යක්ෂක ජනරාල් අමතා ලියුමක් එවනවානේ මෙහෙම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් තියෙනවා මෙන්න මාර්ගෝපදේශන සංග්‍රහය සහ අමත්‍ය මණ්ඩලයේ තීරණය එවනවා කියලා?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබගේ අංශයේ ඒ ලිපිය තියනෙවද? අමාත්‍යාංශ ලේකම්ගේ ලියුම මෙම අමාත්‍ය මණ්ඩලයේ තිරණය දැනුම් දීම සහ ඒ අනුව තමයි අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය කරන්න පුළුවන් වෙන්නේ කියලා?

පි: නැහැ ස්වාමිනි නෑ මගේ දැනට මා සතුව නැහැ. මම විශ්ස්වාස කරනවා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලේඛනාගාරයේ ඇති කියලා.

ප්‍ර: දැන් ඔය කුඩා කර්මාන්තකරුවන්ගේ association කියලා තියෙනවානේ ?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒවා සඳහන් කරානේ එහෙම නොසතුටට පත්වුනා කියලා ඔබට මෙම කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කරන්න පුළුවන්ද දැන් ඔබ සඳහන් කරා වර්ෂික පිරිවැටුම මිලියන සියයට සුළු කර්මාන්ත මිලියන 200 ට කුඩා කාර්මාන්ත මිලියන 600 මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එවැනි කර්මාන්තකරුවන්ගේ association වල නම් සහ කවුද ඒවාවල සභාපතිවරුන් හැටියට ඔබලාගේ ආයතනයේ රැස්වීම්වලට පැමිණෙන්නේ? දුක්ගැනවිලි සාකච්ඡා කිරීමට ?

පි අපිට පිත්තල කර්මාන්ත සඳහා මට සම්පූර්ණ නම් ලබා දිය නොහැකියි කෙටියෙන් මට ලබා දෙන්න පුළුවන් කර්මාන්ත සංගම් තුනක් තිබෙනවා එකක් පිලිමතලාවේ තිබෙනවා ඒ ජයසිංහ මහත්මයා යන නමින් ලේකම්වරයෙක් සිටිනවා තව සමස්ත ලංකා පිත්තල සංගමය තිබෙනවා. එහි ලේකම් විදියට චමින්ද මහත්මයා කටයුතු කරනවා. ගම්පහ දිස්ත්‍රික් පිත්තල සංගමය තිබෙනවා එහි ලේකම් විදියට නිමල් මහත්මයා රාජකාරි කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එච්චරයිද තියෙන්නේ association පිත්තල වලට ?

පි: පිත්තලවලට.

ප්‍ර: තමයි සංගම් තියෙන්නේ?

පි: අනිත් ඇලුමිනියම් සංගම්නුත් තියෙනවා. මං මේ විශේෂයෙන් සඳහන් කරේ පිත්තල සංගම් මොකද ඒ ගොල්ලන්ගෙන් තමයි මට මේ දැඩි විරෝධතාවය පැමිණෙන්නේ.

ප්‍ර: එතකොට ජාතික ශිල්ප සභාව කියලා ආයතනයකුත් තිබෙනවානේ ඔය අමාත්‍යාංශය යටතේම ?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට ජාතික සිල්ප සභාව යටතේ ලියාපදිංචි වෙලා ඉන්න පිත්තල කර්මාන්තකරුවෝ විශාල පිරිසක් ඉන්නවානේ ?

පි: එහෙමයි .

ප්‍ර: එගොල්ලන්ගේ මාසික පිත්තල අවශ්‍යතාවය සඳහා ඒ ගොල්ලන් කරන කරා පිත්තල භාණ්ඩ නිෂ්පාදනය ඔබ සඳහන කරා වගේ පිළිමතලාව තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රධාන ප්‍රමුකස්ථානය එම පිත්තල කර්මාන්ත කරුවන්ගේ අබලි පිත්තල අවශ්‍යතාවය පිළිබඳව ජාතික ශිල්ප සභාව විසින් ඔබලාට කෙලින්ම ඉල්ලිම් ඉදිරිපත් කරාද?

පි: නෑ අපිට එහෙම ආයතනයක් විදියට ඉල්ලීම් සිදුකරේ නැහැ ඒ වකවානුවල.

ප්‍ර: ඔබලා හැම තිස්සේම කරේ අර කර්මාන්ත කරුවන් ඔබලාගේ අයදුම් පත්‍රය පිරෙව්වාම ඒ ගොල්ලන්ගේ ඉල්ලීම ගැන බලන එක පමණයි ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට දැන ගන්නට ලැබුණාද ජාතික ශිල්ප සභාවටත් ඇවිල්ලා මේ පිත්තල කර්මාන්තකරුවෝ තමන්ගේ අවශ්‍යතාවයන් නොළැඹෙන එක ගැන පැමිණිලි කරනවා හෝ ඔවුන් සංගම් වශයෙන් ගිහිල්ලා ශිල්ප සභාවට හෝ අමාත්‍යාංශයට පැමිණිලි කරනවා කියන එක?

පි: ශිල්ප සභාවේ එය වාචිකව මගේ හිතවතුන්ගෙන් මා දැනගෙන තිබෙනවා ඔවුන් හරහාත් පිත්තල ලබා දෙන බවට කර්මාන්තකරුවන් සඳහා එහෙත් මෙවැනි ඉල්ලීමක් හෝ මෙවැනි චෝදනා මුඛයෙන් කතා කිරිමක් අප සම්බන්ධව මා වෙත දැනුම් දීමක් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට මා මීට පෙරත් කිව්වා වගේ මෙම කොමිෂම දැන ගැනිමට කැමති මේ කර්මාන්තකරුවන් ඉල්ලපු පිත්ල සහ ඔවුන්ගේ සැබෑ අවශ්‍යතාවයනේ ඉල්ලන්නේ ඒක ඉෂ්ට වුනාද ඔබලා පිත්තල ලබා දීමේදී මේ ඒක සංසන්දනාත්මකව බලන්න ඔනේ කොලෝසස් පෞද්ගලික සමාගමට ඉල්ලපු ප්‍රමාණයම දුන්නාද සහ කුඩා කර්මාන්ත කරුවන්ට ඔවුන් ඉල්ලන ප්‍රමාණයම සපුරා ලීමට ඔබලාට නොහැකි වුනාද කියන එක?

පි: ලබා දෙන්න පුළුවන් ස්වාමිනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: කොලෝසස් සමාගමට ඔබලා දෙන පිත්තලවලට සිද්ධවෙන්නේ මොකක්ද කියලා ඔබ දන්නවද? ඒ ගොල්ලෝ භාණ්ඩ නිෂ්පාදනයක් කරනවාද ?

පි: මේ සඳහා මට නිරීක්ෂණය මහින් ලැබුණු තොරතු පමණයි මා දන්නේ. ඔවුන් තඹ වයරයක් නිෂ්පාදනය කරලා එය පිටරට යවනවා කියලා තමයි මට දැන ගන්න ලැබිලා තියෙන්නේ. මම අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර නැහැ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මට තව එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා ඔබ කිව්වා ඔබගේ පත්වීම ලිපිය ලබා දුන්නේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩයේ සභාපතිවරයා අතින් බව?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය ඔබ ලඟ තිබෙනවද?

පි: මේ අවස්ථාවේදී ඉදිරිපත්කල නොහැකියි ස්වාමිනි.

ප්‍ර ඔබගේ පත්වීම?

පි: මට ඉදිරිපත් කරන්න පුළුවන් අබලි ද්‍රව්‍ය එකකයේ ඉවත් කිරීමේ ලිපිය මා සිතුව තියෙනවා.

ප්‍ර: නෑ ඒක දැනටමත් ලකුණු කරලා නේ තියෙන්නේ? ඔබ අලෙවි අධ්‍යක්ෂක?

පි: අධ්‍යක්ෂක.

ප්‍ර: අධ්‍යක්ෂක වශයෙන් පත්කිරීමේ ලිපියක් ඔබ ගාව නැහැ?

පි: මට ඉදිරිපත් කරන්න පුළුවන් මේ අවස්ථාවේදී නොහැකියි ස්වාමිනි.

ප්‍ර: ඒ ලිපිත් සමඟ ඔබට පැවරිලා තියෙන රාජකාරි පිළිබඳවත් ඒ පත්වීමේ ලිපියත් සමඟ ලැබුණද?

පි: රාජකාරි මට පත්වීමේ ලිපියට අමතර ඒත් එක්කම ලැබුණේ නැහැ. මට අපේ ප්‍රධාන කාර්යාලය මානව සම්පත් අංශයෙන් වෙනමම ලේඛනයක් ලබා දී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර වෙනම ලේඛනයක් ලබා දී තිබෙනවා ඔබගේ අලෙවි අධ්‍යක්ෂක වශයෙන් ඔබ පැවරිලා තියෙන රාජකාරි සම්බන්ධයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබලාගේ ආයතනයේ Scheme of recruitment නැත්නම් පත්කිරීමේ ක්‍රමවේදයක් බඳවාගැනීමේ ක්‍රමවේදයක් ?

පි; තියෙනවා ස්වාමිනි.

ප්‍ර: අපිට පස්සේ ඒ ලේඛන ඉදිරිපත් කරන්න?

පි; එහෙමයි ස්වාමිනි හැකියි.

FAIR COMMENT
BY JEZEEM

මේ අවස්ථාවේදී මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් විසින් පෙනී සිටින උගත් නීතිඥවරයිගෙන් අවශ්‍ය දැයි විමසමි නැත යනුවෙන් ප්‍රකාශ කරයි මින් පසුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්දජින සේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍ර තිස්ස මහතාගෙන් මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය ද යන්න විමසි අවශ්‍ය බව පවසයි අවස්ථාව ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>

ප්‍ර: දැන් උදයසිරි මහත්මයා ඔබතුමා ඊයේ දිනයේත් අද දිනයේත් ඉතාම පැහැදිලිව ගරු කොමිෂන් සභාවට විස්තර කෙරුවා තමන්ගේ ආයතනයේ තියෙන ව්‍යුහ ගැන ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ වැඩ කටයුතුවලට මහත්මයා ඉස්සෙල්ලාම බැඳෙන්නේ කොයි කාලේද?

පි: 2015.07 වෙනි මාසේ 10 වෙනිදා.

ප්‍ර: එතකොට කවුද ඇමති?

පි: රිසාද් බදුර්දීන් ඇමතිතුමා.

ප්‍ර: කවුද සභපති?

පි: මහින්ද ජිනසේන මහත්මයා.

ප්‍ර: ඊට පස්සේ මොන තනතුරකට මහත්මයා ඔතෙන්ට බැඳෙන්නේ?

පි: අලෙවි අධ්‍යක්ෂක තනතුරට.

ප්‍ර: ඊට පස්සේ 2015?

පි: 2015.

ප්‍ර: ඊට පස්සේ මහත්මයා දැන් වැඩ කරන්නේ මොන තනතුරකද?

පි: අලෙවි අධ්‍යක්ෂක තනතුරේමයි.

ප්‍ර: එතකොට දැන් ඔබතුමා ගරු කොමිෂන් සභාවට සාක්ෂි දුන්නේ 2017,2018,2019,?

පි: එහෙමයි.

ප්‍ර: කියන අවුරුදුවල අබලි ද්‍රව්‍ය වශයෙන් පිත්තල මිලදී ගැනීමක් සම්බන්ධයෙන් දුන් සාක්ෂියක් එතකොට උදයසිරි මහත්මයාට ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද 2015 ඉදලා මේ ප්‍රශ්නගත කාල සීමාව වන 2019 දක්වා සභාපති වරු දෙන්නෙක් හිටියා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ?

පි; එහෙමයි.

ප්‍ර: මහත්මයාට මතකයිද 2018 වසරේ අවසාන කාල භාගෙයේදී දවස් පනස් දෙකක ආණ්ඩුවක් මේ රටේ ස්ථාපනය වුනා.?

පි: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතනින් පස්සේ තමයි මහින්ද ජීනසේන මහත්මයා සභාපතිත්වයෙන් අයින් වුනේ?

පි; එහෙමයි.

ප්‍ර: ඊට පස්සේ 2019 ජනවාරි මාසේ වර්තමාන සභාපති නවීන් අධිකාරම් මහත්මයා වැඩ භාරගත්තා කිව්වොත් මහත්මයා පිළිගන්නවා නේද?

පි: පිළිගන්නවා.

ප්‍ර: නවීන් අධිකාරම් මහත්මයා සභාපතිවරයා වශයෙන් කටයුතු කරනා කාලයේත් මේ කොලෝසස් සමාගමට පිත්තල සැපයීමක් සිදුවෙලා තියෙනවා 2019 ජනවාරි මාසේ?

පි: එහෙමයි

ප්‍ර: නවින් අදිකාරම් සභාපති දුරයට පත්කෙරුවේ රිසාඩ් බදුරුදීන් ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ කාලේ ඇමතිවරයා?

පි: අමැතිවරයා.

ප්‍ර: මහින්ද ජීනසේන වැඩ භාරගන්න කොටත් සභාපතිවරයා හැටියට කටයුතු කලේ රිසාඩ් බදුරුදීන්?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට මේ සභාපතිවරුන් දෙන්නාගේම කාල සීමා තුලදී ඔය කොලෝසස් කියන පුද්ගලික සමාගමට පිත්තල නිකුත් වීමක් සිදුවෙලා තියෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: දැන් මහත්මයා ඔය යම් කිසි අවිස්ථාවකදී තමන්ගේ දුරයෙන් ඉවත් කරලා කියලා මේ ගරු කොමිෂන් සභවේ සාමාජික ගරු කොමිෂන් සභාව විසින් කරපු ප්‍රශ්නයකට මහත්මයා උත්තර දුන්නානේ ?

පි; එහෙමයි.

ප්‍ර: දුරයෙන් ඉවත් වීමක් වුන් නැහැනේ ?

පි: මම ඒ තනතුරේ එහෙමම ඉන්නවා.

ප්‍ර: දුරයෙන් ඉවත් කිරීමක් කලේ නැත?

පි: එහෙමයි. එහෙම කරේ නැහැ

ප්‍ර: මහත්මයා දිගටම 2015 ඉඳලා අලෙවි කළමණාකරු හැටියට කටයුතු කෙරුවා?

පි: අලෙවි අධ්‍යක්ෂ විදියට.

ප්‍ර: සමාවෙන්න අලෙවි අධ්‍යක්ෂක කටයුතු කෙරුවා?

පි: එහෙමයි.

ප්‍ර: 2015 කටයුතු කෙරුවා ?

පි: 2015 ඉදලා මේ දක්වා අලෙවි අධ්‍යක්ෂක ලෙස කටයුතු කරනවා.

ප්‍ර: එතකොට යම් කිසි සිදුවීමක් වුණා 2017 මැයි මාසේ?

පි; එහෙමයි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ සිදුවීම තමයි මහත්මයාගේ මහත්මයාට පවරලා තිබ්බ වගකීම් දෙකක් ඉවත් වුණා?

පි: ඉවත් වුණා.

ප්‍ර: නැතිව දුරයෙන් කිරීමක් වෙනස් වුණේ?

පි: දුරයෙන් මාරුකිරීමක් කිසිසේත්ම සිදුවුනේ නැත.

ප්‍ර: ඒක තමයි marketing division එක ඒ කියන්නේ?

පි: අලෙවි අංශය.

ප්‍ර: අලෙවි අංශයේ කටයුතු වලින් මහත්මයා ඉවත් කරනු ලැබුවා.?

පි: අලෙවි අංශයෙන් නෙමේ මාව ඉවත් කරේ අබලි ද්‍රව්‍ය ඒකකය.

ප්‍ර: අලෙවි අංශයෙන් අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම් කටයුතුවලින් ඉවත් වුනා?

පි: එහෙමයි.

ප්‍ර: ඊට පස්සේ තවත් ක්ෂේත්‍රයකින් අයින් කෙරුවානේ?

පි: ඒ වෙනකොටත් උපකොන්ත්‍රාත් ඒකකය අදාළ නිලධාරියා නියෝජ්‍ය අධ්‍යක්ෂක යටතේ තිබුණේ එය මාගේ සුපරීක්ෂණ යටතේ ඔහු තමයි ක්‍රියාත්මක කලේ ඔහුට තමයි අබලි ද්‍රව්‍ය ඒකකය පැවරුවේ.

දැන් වේලාව.ප.ව.2.05
මෙතැන් සිට:ල/ලේ මුතුමාලි.

President Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.02.10 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : එතකොට එහෙම ඉවත් කිරීම සිදු වුණායින් පස්සේ උදයසිරි මහත්මයා සඳහන් කළා ගරු කොමිෂන් සභාවට තමන් කාටවත් තමන්ගේ මේ ධුරයේ ක්ෂේත්‍රයන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ලිඛිත පැමිණිල්ලක් කරලා නැහැ?

පි : නැත ලිඛිත පැමිණිල්ලක් කර නැත.

ප්‍ර : තමන්ගේ තමන්ට කෙළින්ම සෘජුවම තමන් වාර්තා කරන්නේ ඕනේ අධ්‍යක්ෂ ජනරාල්වරයටනේ?

පි : එහෙමයි.

ප්‍ර : අධ්‍යක්ෂක ජනරාල්වරයාට කරලා නෑ?

පි : අධ්‍යක්ෂක ජනරාල්වරයාට සිදු කළේ නෑ. හේතුව තමයි අධ්‍යක්ෂක ජනරාල්වරයාට මෙහි පිටපතක් ලබා දීලා තියෙනවා. මම ඔහුත් සමඟ සාකච්ඡා කළා. ඒ අනුව ඔහු කිව්වා මා දැන ගත්තා කියලා මෙයා ඒ අනුව වාචිකව මම ඔහුට මේ බව පැමිණිලි කළා.

ප්‍ර : නමුත් ලිඛිත පැමිණිල්ලක් කෙරුවේ නෑ?

පි : සිදු කළේ නැත.

ප්‍ර : තමන්ගේ ප්‍රධාන නිලධාරී වශයෙන් සැලකෙන අමාත්‍යාංශ ලේකම් ආයතනයේ?

පි : පැහැදිලි වුණේ නෑ.

ප්‍ර : අමාත්‍යාංශ ලේකම්වරයාට වගකීමක් පැවරුණානේ තමන්ගේ ආයතන සම්බන්ධයෙන්?

පි : පැවරෙනවා.

ප්‍ර : එතකොට ඒ අමාත්‍යාංශ ලේකම්වරයාට පැමිණිල්ලක් කෙරුවේ නෑ?

පි : නැත මම පැමිණිල්ලක් කෙරුවේ නෑ.

ප්‍ර : ඔම්බුඩ්ස්මන් කියලා ධූරයක් තමන් අහලා තියෙනවනේ?

පි : අහලා තියෙනවා.

ප්‍ර : අවශ්‍ය නම් එතෙන්ටත් පැමිණිලි කරන්න තිබ්බනේ?

පි : තිබුණා.

ප්‍ර : කෙරුවේ නෑ?

පි : කෙරුවේ නෑ.

ප්‍ර : තමන් ගරු කොමිෂන් සභාවට ඊයේ දිනයේ සාක්ෂි දෙන කොට ප්‍රකාශ කෙරුවා මහත්මයා තමන් අස්කරපු හේතුවක් මහත්මයා දන්නේ නෑ කියලා කිව්වා?

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

පි : එහෙමයි.

ප්‍ර : ඒ හේතුව තියෙනවා නම් ඒක ප්‍රකාශ කරන්න ඕනේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහත්මයා එයා තමයි?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට දැන් මහත්මයලාගේ සමාගමේ මණ්ඩලයේ

පි : මණ්ඩලයේ.

ප්‍ර : කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයක් තියෙනවා?

පි : අධ්‍යක්ෂක මණ්ඩලයක් තියෙනවා.

ප්‍ර : ඒ අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව රැස් වෙන්න ඕනේ?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව තියෙනවා policy committee ඒ කියන්නේ ප්‍රතිපත්ති කමිටුව?

පි : එහෙමයි.

ප්‍ර : ඒකත් රැස් වෙන්න ඕනේ?

පි : ඒක මාස තුනකට වරක් රැස් විය යුතුයි.

ප්‍ර : එතකොට ඊට අමතරව තියෙනවා තවත් කමිටුවක් කළමනාකරණ කමිටුව management committee?

පි : එහෙමයි.

ප්‍ර : හරිනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒකත් රැස් වෙන්න ඕනේ?

පි : එයත් රැස් විය යුතුයි.

ප්‍ර : දැන් ඔබතුමා දැන් ගරු අධිකරණට අද දිනයේ ඉදිරිපත් කෙරුවනේ ලේඛනයක් යම් කිසි ලේඛනයක දත්ත ඉදිරිපත් කෙරුවනේ අර?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔය C 764 කියලා කියන්නේ මහත්මයා පිළියෙල කරපු ලේඛනයක්ද ?

පි : මේ මාගේ අංශය විසින් මා විසින් හදපු ලේඛනයක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී C 764 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය උගත් ජනාධිපති නීතිඥවරයාට ලැබීමට සලස්වන්න.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා

ප්‍ර : දැන් මේ C 764 කියන ලේඛනය මහත්මයා පුද්ගලිකව හදපු ලේඛනයක්ද අංශ විසින් හදපු ලේඛනයක්ද?

පි : අංශය විසින් සකස් කරන ලද ලේඛනයක්.

ප්‍ර : එතකොට මේ යම් යම් දත්ත කිහිපයක් මහත්මයා ලේඛනයේ දක්වලා තියෙනවනේ?

පි : දක්වලා තියෙනවා.

ප්‍ර : ඒ දත්ත තහවුරු කරන්න පුළුවන් ආශ්‍රිත ලේඛන තියෙන්න ඕනනේ?

පි : තියෙනවා.

ප්‍ර : ඒ දත්ත උපුටා ගන්න ඕනේ සමහර ලේඛනවලින්නේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මහත්මයා මේක පුද්ගලිකව හැදුවේ නැත්නම් ඒ දත්ත වල තියෙන ලේඛන මේකට හරියාකාරව ඇතුළත් වෙලා තියෙනවාද නැද්ද කියලා කියන්න මහත්මයාට බෑනේ?

පි : බැහැ.

ප්‍ර : එතකොට දැන් මහත්මයා පිළිගන්නවද දැන් මහත්මයා ඉතාමත් පැහැදිලිව පහුගිය දිනයේදී ලකුණු කෙරුවා මේ ගරු කොමිෂන් සභාව හමුවේ C 752 දරන ලේඛනය? 752 කියලා කියන්නේ අර මහත්මයාගේ ආයතනයේ ඒ කියන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංයුතිය? C 752 කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංයුතිය?

පි : එහෙමයි.

ප්‍ර : දැන් එතකොට ඒකේ තියෙනවා පල්ලෙහා ඉඳලා උඩටත් උඩ ඉඳලා පල්ලේහාට තමන්ගේ වැඩ කටයුතු බෙදන හැටි තියෙනවා ඕකේ?

පි : එහෙමයි.

ප්‍ර : පල්ලේහා ඉඳලා උඩට වාර්තා කරණය කරන්න ඕනේ විදිහත් තියෙනවා ඕකේ?

පි : එහෙමයි.

ප්‍ර : ඕක දිහා බලපුවාම හොයා ගන්න පුළුවන්?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මහත්මයාගේ අංශ 09 ක් තියෙනවා කියලා සාක්ෂියක් දුන්නනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ අංශ 09 ක්ෂේත්‍රයන් 09 අදාළ වන එක එක විවිධ නිලධාරී මහත්වරු ඒ අවස්ථාවේ කටයුතු කෙරුවා?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM
President Secretariat's Copy

ප්‍ර : දැන් ඊළඟට මහත්යා ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා ලේඛනයක් C 753 ඒක තමයි අර කැබිනට් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව?

පි : පත්‍රිකාව.

ප්‍ර : දැන් 2005 ?

පි : එහෙමයි.

ප්‍ර : දැන් 2005 තමයි පරිපූර්ණ විස්තර සහගතව කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන්නේ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන්නේ මේ අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සම්බන්ධයෙන් යම් කිසි යාන්ත්‍රණයක් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඒ මත තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයට යම් යම් වගකීම් පැවරෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඊට පස්සේ ඔබතුමා ඒ 2005 ජූලි මාසේ 22 වෙනිදා අමාත්‍ය මණ්ඩල

පි : ජූලි මාසේ 13 වෙනිදා

ප්‍ර : ජූලි මාසේ 13 තමයි එතකොට ඊට පස්සේ මහත්මයා සඳහන් කෙරුවා මේ ගරු කොමිෂන් සභාවට තමන් ඉදිරිපත් කෙරුවා අර මාර්ග උපදේශක ලේඛනයක්? මොකක්ද ඒකට කියන්නේ මාර්ග උපදේශක

පි : සංග්‍රහය

ප්‍ර : සංග්‍රහය

පි : මාර්ග උපදේශන සංග්‍රහය.

ප්‍ර : දැන් මහත්මයා පිළිගන්නවද මේ දැන් මේ මුලින්ම මේ කොමිෂන් සභාව විසින් කරන පරීක්ෂණයට අදාළ පිත්තල සම්බන්ධයෙන් තමන්ට යම් කිසි ආකාරයක යොමු වීමක් ලැබෙන්නේ 2017 මැයි මාසේ ලේඛන අනුව? මහත්මයා දැන් 2017 මැයි මාසේ 17 වෙනිදා

පි : ඔව්.

ප්‍ර : අලෙවි කළමනාකරු හැටියට දිගටම තියා ගත්තට අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒ කියන විෂය මහත්මයාගේ විෂය පථයෙන් අයින් කෙරුවා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ආපහු ඒක ස්ථාපිත වුණේ 2019?

පි : එහෙමයි.

ප්‍ර : නවීන් අධිකාරම් මහත්මයා නැවත වරක්

පි : ස්ථාපනය කළා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා පත් කරපුවාම කියලා මහත්මයා ගරු කොමිෂන් සභාවට කිව්වා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට 2017 මැයි මාසේ 17 වෙනිදා ඉඳලා 2019 නවීන් අධිකාරම් මහත්මයා නැවත පත් කරන තෙක් මහත්මයා අලෙවි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කෙරුවට අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමක් සිදු කෙරුවේ නෑ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මහත්මයාට ඒ සම්බන්ධයෙන් යම් කිසි සාක්ෂියක් මේ ගරු කොමිෂන් සභාව හමුවේ දෙන්න පුළුවන් ලේඛන පරිශීලනය කිරීමෙන් අනතුරුව විතරයි?

පි : එහෙමයි.

ප්‍ර : මොකද ක්ෂේත්‍ර පරීක්ෂවලට ඔබතුමා සහභාගි වුණේ නෑ?

පි : නැත. මා සහභාගි වුණේ නැත.

ප්‍ර : ඕකේ තියෙන දත්තයන් සම්බන්ධයෙන් මහත්මයාට පුද්ගලික දැනීමක් නෑ ඔය ලේඛනවල?

පි : ඔව් පුද්ගලික දැනීමක් නෑ.

ප්‍ර : ලේඛන මත සාක්ෂි දෙන්න පුළුවන්?

පි : ලේඛන මත සාක්ෂි දෙන්න පුළුවන්.

ප්‍ර : එතකොට මට කියන්න දැන් මහත්මයා සාපේක්ෂව පිළිගන්නවද මේ යුධ හමුදාව තුළින් හරහා පිත්තල මිලදී ගැනීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිච්ච ඒ අවස්ථාවට සමාන අවස්ථාවක් පහු ගිය අවුරුදු කවදාවත් එච්චර විශාල ප්‍රමාණයක පිත්තල මිලදී ගැනීමට තමන්ගේ ආයතනයට ලැබිලා නෑ විශාල ප්‍රමාණයක්?

පි : මාගේ 2015 න් පසුව ලැබිලා නැහැ.

ප්‍ර : ඒ කියන්නේ සරලව කිව්වොත් 2015 ඉඳලා අදත් මහත්මයා ඒ ධූරයේ ඉන්නවා ?

පි : එහෙමයි.

ප්‍ර : මෙච්චර අවස්ථාවක් මිලදී අරගෙන නැවත විකුණන්නට අවස්ථාවක් කාර්මික සංවර්ධන මණ්ඩලයේ තිබුණ් නෑ විශාල පිත්තල ප්‍රමාණයක් හින්දා?

පි : එහෙමයි.

ප්‍ර : මහත්මයා පිළිගන්නවද දැන් මහත්මයා ළඟ තියෙනවද ගරු අධිකරණයට ඉදිරිපත් කරන්න 2015 ඒ කියන්නේ marketing division අලෙවි අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් මහත්මයා කටයුතු කරන කොට අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් මහත්මයා ක්ෂේත්‍රය ඇතුලේ ඉන්න කොට ?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා කටයුතු කරන කොට ඒ වර්ෂයේ කාර්මික සංවර්ධන මණ්ඩලයට මේ අබලි ද්‍රව්‍ය විකිණීම තුළින් හම්බ වෙච්ච උපයපු ආදායමයි ඒකෙන් ලබපු ලාභයයි කීයද කියලා මහත්මයාට ඉදිරිපත් කරන්න ලේඛනයක් තියෙනවද?

පි : මට මේ අවස්ථාවේදී ඉදිරිපත් කළ නොහැකි. ඉදිරිපත් කළ හැකි මේ අවස්ථාවේ ඒ සඳහා තොරතුරු ලබා දිය නොහැකි.

ප්‍ර : 2016 තියෙනවද?

පි : එය මා සතුව පවතින්නේ 2017, 2018 වසරවල ඒ හා සම්බන්ධ තොරතුරු පමණයි.

ප්‍ර : මම මහත්මයාට යෝජනා කළොත් මහත්මයා පිළිගන්නවද 2015 අවුරුද්දේ ලැබිච්ච ආදායම 2015 , 2016 කියන අවුරුදුවල මේ තමන්ලගේ ආයතනය මහත්මයා දැන් ලාභ ගැන කතා කෙරුවනේ තමන්ලගේ ලැබූ ආයතනයට වඩා හුඟක් අධික ලාභයක් 2017, 18 කියන වර්ෂවලදී ආයතනයට හම්බ වෙලා තියෙනවා කියලා?

පි : පිළිගන්නවා.

ප්‍ර : තමන් ලබපු ලාභයට වඩා ඇතැම් අවස්ථාවලදී හතර ගුණයක් ලැබිච්ච අවස්ථාවල් තියෙනවා?

පි : විශාල ලාභයක් ලැබුවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ කියන විදිහට 2015 සහ 2016 වර්ෂවලට වඩා සාපේක්ෂව 2017 සහ 2018 වර්ෂවල මේ අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලාභයක් ලැබුවා කියලා ඔබ දැන් කොමිෂන් සභාවට කිව්වා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ මීට පෙර කොමිෂන් සභාවට කිව්වා මේ කොලොසස් ප්‍රයිවඩ් පුද්ගලික සමාගමට ලැබිය නොයුතු වට්ටමක් 2017 ,2018 වර්ෂවලට දීලා තියෙනවා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : නිසි වට්ටම කොලොසස් ප්‍රයිවඩ් පුද්ගලික සමාගම ලබා දුන්නා නම් 2017 සහ 2018 වර්ෂවලදී කාර්මික සංවර්ධන මණ්ඩලය ලබා ගත්තු ලාභයට වඩා වැඩි එකක් ලබා ගන්න පුළුවන්ද?

පි : අනිවාර්යෙන්ම ඒ අවස්ථාව අපිට තිබ්බා ස්වාමිනි.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : දැන් මම මහත්මයාට යෝජනා කරනවා මහත්මයා ඒක පිළිගත්තා මහත්මයාගේ අධීක්ෂණ කටයුතුවලට තමන්ගේ කටයුතුවලට අර

Proof Copy
FAIR COMMENT BY JEZEEM

අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම් යොදවලා තියන කාලයට වඩා ඉතා අධික ලාභයක් ආයතනට ලැබුණා 2017, 18 අවුරුදුවල?

පි : එහෙමයි.

ප්‍ර : ඒක පිළිගන්නවනේ ?

පි : පිළිගන්නවා.

ප්‍ර : ඒ දත්ත වාර්තා වෙලා තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් එතකොට දැන් 2017 මැයි මාසේ 17 වෙනිදා සිදු වුණේ තමන්ව ධුරයෙන් අයින් කිරීමක් නෙවෙයි?

පි : එහෙමයි.

ප්‍ර : තමන්ගේ විෂය පථයන් වලින් දෙකක් ඉවත් කිරීමක් පමණයි?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඒක කෙරුවේ තමන්ගේ කාර්යක්ෂමතාවය මත වෙන්න පුළුවන්ද Board meetings වල එහෙම ඇතිනේ record වෙලා?

පි : එය සිදු විය නොහැකි. එය මා දකින්නේ මා එසේ නම් මට ඊට පෙර මට දැනුවත් කිරීම සහ මගේ warning letters එහෙම නැත්නම් කිසියම් වූ මට දැන්වීමක් කළ යුතුයි. ඒක තමයි අපේ ක්‍රියාපටිපාටිය. එසේ කිසිදු දැනුම් දීමක් නොමැතිව මෙලෙස කටයුතු කිරීමක් ලෙසයි මා දකින්නේ. පෙර මට කිසිදු එවැනි දැනුම් දීමක් සිදු කර නැහැ.

ප්‍ර : ඒ කියන්නේ ඔය ආයතන තමන්ගේ ආයතනය අංශ නවයම කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් වාර්තා වෙන එක අවස්ථාවක තමයි කළමනාකාර කමිටුව?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට දැන් කළමනාකාර කමිටුවේ ඇති යම් කිසි හේතුවක් තියෙනවා නම් මහත්මයාගේ ඔය විෂය පථය මාරු කරන්න ඒකට හේතුව එතන තියෙන්න එපැයි වාර්තා වෙලා තියෙනවා නම් ?

පි : වාර්තා වෙලා තියෙනවා නම් තිබෙනවා කෙසේ වෙතත් මා විශ්වාස කරන්නේ මට සෘජුව මාගේ අකාර්යක්ෂමතාවයක් හෝ ක්‍රියාපටිපාටියේ කිසියම් හෝ වැරැද්දක් තිබෙනවා නම් එය මා වෙත ලිඛිතව දැනුම් දී එය නිවැරදි කර ගැනීමක් සඳහා මා යොමු කිරීමක් තමයි මා බලාපොරොත්තු වෙන්නේ සේවයෙකු වශයෙන්. එසේ නොමැතිව කිසියම් පදනමක් මත මෙම තීරණය ගත්තා යැයි පැවසීම මා දකින්නේ එය

ප්‍ර : වරදක්

පි : වරදක් ලෙසයි.

ප්‍ර : ඒ වරද සම්බන්ධයෙන් තමන් ගත්ත පියවර මොකක්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එය මා මාගේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට දැනුම් දුන්නා ඒ තමයි මා ගත්තු පියවර. එතනින් එහාට මම මගේ ඇත්ත වශයෙන්ම මා රාජකාරී භාර ගන්නා අවස්ථාවේදී මහින්ද ඉන්ද්‍රසේන සභාපතිතුමා මාව රාජකාරී සඳහා බඳවා ගැනීමේදී සභාපති විදිහට කටයුතු කළේ. ඒ නිසා එතුමාට විරුද්ධව ඉදිරියට යන්නට මා කටයුතු කළේ නෑ.

ප්‍ර : ඊළඟට දැන් මහත්මයා සඳහන් කළා ගරු කොමිෂමට තමන්ට කිසිම බලපෑමක් තමන්ගේ වෘත්තිය කාලය තුළදී මහින්ද ජිනසේන මහත්මයා කෙරුවේ නෑ කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට දැන් අර මම අහපු කළමනාකරණ කමිටු වාර්තා වල සාකච්ඡා වෙනවා ඒ තියෙන ක්ෂේත්‍රයන් නවයම තියෙන ප්‍රවර්ධනය සම්බන්ධයෙන්?

පි : විශේෂයෙන්ම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී තමයි මේක සාකච්ඡා කරන්නේ. කළමනාකාරීත්ව හමුව තියෙන්නේ අබලි ඒකකයට පමණයි. මේ අදාළ අංශයන් සඳහා එය යොදා ගන්නේ නැහැ.

ප්‍ර : හරි එතකොට ඒ අබලි ඒකකයේ යම් යම් කරුණු සාකච්ඡා වෙලා තියෙනවා නම් ඒවා වාර්තා වෙලා සටහන් වෙලා තියෙන්නට ඕනේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මහත්මයාට අදාළව යම් කිසි දෙයක් 2017 තියෙනවා නම් ඒකත් අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා වල සහතික වෙලා තියෙන්න ඕනේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මහත්මයාගේ හැඟීම තමයි මහත්මයා ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කෙරුවේ තමන්ව ඒක ඉතාමත් සත්‍ය වශයෙන් වෙන්න පුළුවන් මහත්මයා ප්‍රකාශ කෙරුවා මම දන්නේ නෑ කියලා මාව අයින් කෙරුවේ මොකද කියලා?

පි : එහෙමයි.

ප්‍ර : අදත් මහත්මයා දන්නේ නෑ?

පි : නෑ මට

ප්‍ර : හේතුවක් දන්වලා නැනේ?

පි : හේතුවක් දන්නේ නෑ.

ප්‍ර : එතකොට මහත්මයා ඊළඟට ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා යම් යම් C 764 දරන ලේඛනය ආශ්‍රිතව මහත්මයා ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරුවා අර වට්ටම් නිසි ආකාරයෙන් දුන්නා නම් ලබා ගත්තා නම් දුන්නා නම් ඊට වඩා ආදායමක් කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබෙන්න ඕනේ කියලා?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මොන පදනමක් මතද ඒක කෙරුවේ කියන එකත් පැහැදිලි කරන්නේ ඕනේ අර දික්වැල්ල මහත්මයා ?

පි : එහෙමයි.

ප්‍ර : සභාපතිතුමා අබලි ද්‍රව්‍ය විකුණන්න ඒ කියන්නේ විකුණන වට්ටම් තීරණය කරන්න සහභාගි වෙන්නේ නැනේ pricing committee කියලා එකක් තියෙනවනේ?

පි : ඔව් pricing committee එකට සභාපතිතුමා සහභාගි වෙන්නේ නෑ.

ප්‍ර : එතකොට ඒකට සහභාගි වෙනවා නම් සහභාගි වෙන්නේ අර තමන් වෙනුවට ඒ ක්ෂේත්‍ර දෙක භාර ගත්ත දික්වැල්ල මහත්මයා?

පි : එහෙමයි.

ප්‍ර : එයා පැහැදිලි කරන්න ඕනේ ගරු කොමිෂන් සභාවට මොන පදනමක් මතද එහෙම තීරණය කෙරුවේ කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒක මහත්මයාට පැවරුණු රාජකාරියක් නෙවෙයි. මොකද මේ කාල සීමාවෙ මහත්මයා මේ සම්බන්ධයෙන් කටයුතු කරපු නැති හින්දා?

පි : මා සෘජු ලෙස මේ සම්බන්ධව කතා කරන්නේ අදාළ ආරක්ෂක අමාත්‍යාංශය මෙම පිත්තල කොපු ලබා ගැනීමේදී මිල කමිටුවක් පැවතියේ නැත.

ප්‍ර : එතකොට ඒක තමන්ලගේ වාර්ෂිකව තමනේග් annual report එකක් වාර්ෂික වාර්තාවක්?

පි : ඔව්.

ප්‍ර : ඒ audit report එකකුත් විගණන වාර්තාවකුත්?

පි : තියෙනවා.

ප්‍ර : එතකොට ක්‍රමවේදයේ යම් කිසි අක්‍රමිකතාවයක් තිබ්බා නම් ඒක තියෙන්න එපැයි ඒ reports වාර්තා වල?

පි : එය තිබෙන්නේ අබලි ඒකකයේ හේතුව තමයි කළමනාකරණ කමිටු රැස් වී නෑ 2017, 2018 මේ වර්ෂවල්වල. ඒ නිසා එය වාර්තා වී නැහැ. ඒ වගේම මෙහි තියෙන දැවැන්ත ගැටලුව තමයි මිල කමිටුවක් අනිවාර්යෙන්ම තිබිය යුතුයි රාජ්‍යය ආයතනයකින් භාණ්ඩ මිලදී ගැනීමේදී. මෙම දැවැන්ත මේ ව්‍යාපාරය ලබා ගැනීමේදී නීතියට පටහැනිව මිල කමිටුවකින් තොරව තමයි මේ රාජකාරී කරලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : කවුද මිල කමිටුව කැඳවන්න ඕනේ?

පි : මිල කමිටුව කැඳවන්න ඕනේ අධ්‍යක්ෂක.

ප්‍ර : අධ්‍යක්ෂක කියන්නේ ?

FAIR COMMENT BY JEZEEM

පි : අධ්‍යක්ෂක කියන්නේ අලෙවි අධ්‍යක්ෂක හෝ බලයලත් නිලධාරියා තමයි .

ප්‍ර : ඒ කියන්නේ ඔබතුමා නෙවේ. මම අහන්නේ ඔබතුමාගේ කාලේ වෙච්ච දෙයක් නෙවෙයිනේ ඒ කියන්නේ දික්වැල්ල මහත්මයා?

පි : දික්වැල්ල මහත්මයා.

ප්‍ර : මොකද pricing ඒ කියන්නේ මිල කමිටුවක මිල ගණනය කරන ක්‍රමවේදයක් තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ගෙවන්න තියෙන මිල ,විකුණුම් මිල, දෙන්න පුළුවන් වට්ටම් ඔක්කොම ඒ අනුව තමයි ඒක තීරණය කරන්න ඕනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒකෙන් පරිබාහිරව කටයුතු කරනවා නම් ඒක මහත්මයාට මේ කාල සීමාවේ අදාළ වෙන්නේ නෑ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට

පි : මා මෙහිදී සඳහන් කරන්නේ පවතින දත්තයන් මත මිසක් මා කිසිම වේලාවක මෙහි පරිපාලනය හෝ අදාළ කාර්යයන් හා සම්බන්ධ වූ බවට මා කිසිම තැනක මා සඳහන් කරන්න සුදානම් නෑ. හැම වේලාවකම මම කියන්නේ මම ඒ කාර්යයේ නිරත වුණේ නෑ. එහෙත් අදාළ දත්තයන් මත මට එක එක ප්‍රකාශ කරන්න පුළුවන් කියන ඒ අදහස තමයි මම හැම වේලාවේම කියන්නේ මොකද මේ වෙනුවෙන් මට කියන්න පුළුවන් මේ දත්තයන් බලලා ඒ ගැන කියන්න විතරයි මට පුළුවන් ස්වාමිනි එතනින් එහාට මට කතා කරන්න බෑ.

ප්‍ර : දැන් මේ අපි ඉන්නේ 2020?

පි : එහෙමයි.

ප්‍ර : 2019 වර්ෂයේ මහත්මයාට කියන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට අබලි ද්‍රව්‍ය විකිණීම තුළින් කොච්චර ආදායමක් ලැබුවද කියලා?

පි : එහි දත්ත දැන් මා සතුව නෑ.

ප්‍ර : ඒ කියන්නේ තමන් හිටපු අවුරුද්දේ ගිය අවුරුදු දෙකේ කියන්න බෑනේ?

පි : මට දැන් ඉදිරිපත් කළ නොහැකි.

ප්‍ර : එතකොට 2020 කොච්චර විකුණලා තියෙනවද කියලා කියන්න?

පි : මේ වෙනකොට මිලියන 55 ක්. ඒ කියන්නේ ලක්ෂ 550ක් අපි මේ වෙන කොට විශේෂයෙන්ම මේ පහුගිය මාස දෙක හමාර අපිට වැඩ කරන්න හම්බ වුණේ නෑ. මිලියන් 55 ක් ලක්ෂ 550 ක් මේ වෙන කොට අපි එකතු කරලා තියෙනවා අබලි ද්‍රව්‍ය ඒකකය තුළින්.

President's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 2017 ඔය වාර්තා දිහා බලලා කියන්න?

පි : මේ වාර්තාව දිහා ඇත්තටම

ප්‍ර : එක අවස්ථාවකදී මහත්මයා ඔය ධුරයෙන් අයින් වුණායින් පස්සේ මිලියන තුන්සීයක් ආදායම ඉපයපු අවස්ථා තියෙනවනේ?

පි : මිලියන තුන්සිය පනස් හතක් උපයපු අවස්ථාවක් තියෙනවා ස්වාමිනි. මා මෙතනින් උත්සාහ කරන්නේ කියන්න ආදායම ලැබුවා යන්න මා එකඟයි. ස්වාමිනි මා කියන්නේ මේ ක්‍රමවේදයේ දැවැන්ත ගැටලු රාශියක් තියෙන බවයි. එතනින් එහාට මේ අදාළ ආදායම ලැබීම පිළිබඳව මාගේ කිසිම තර්කයක් නැත. එයට හේතුව තමයි අපිට දැවැන්ත ව්‍යාපාරයක් හම්බ වුණා. ඒ ව්‍යාපාරය තමයි ආරක්ෂක අමාත්‍යාංශයේ මේ පිත්තල කොපු සම්බන්ධ ගනුදෙනුව. එයින් අපි දැවැන්ත ලාභයක් ලැබීම සහ අධික ව්‍යාපාර ඉලක්කයක් කරා යන්නට පුළුවන්. ඒත් මා මෙහිදී සාක්ෂි දෙන්නේ මේ ක්‍රමවේදයේ කිසියම් වූ ගැටලුකාරී තත්ත්වයක් මතු වෙලා තිබුණා. ඒ සඳහා වන දත්තත් එක්ක මට මේ ක්‍රමවේදයේ කිසියම් වූ පරස්පරයක් තියෙනවා. ඒ පරස්පරේ තමයි ස්වාමිනි මා ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : එතකොට බොහොම ස්තූතියි. දැන් මහත්මයා ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කළා එක්තරා අවස්ථාවකදී අර ග්‍රාමසේවා සහතිකයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරුවනේ?

පි : එහෙමයි.

ප්‍ර : සාක්ෂියක් දුන්නනේ මේ මහත්මයා?

පි : එහෙමයි.

ප්‍ර : ඒකේදී මහත්මයා කිව්වේ ඒ අදාළ කර්මාන්ත ශාලාව පිහිටලා තිබිච්ච ස්ථානයේ ග්‍රාම සේවක විසින් නෙවෙයි මේක සහතික කරලා තියෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඒ කිසිම ක්ෂේත්‍ර පරීක්ෂණයකට ඔබතුමා සහභාගි වුණේ නැනේ?

පි : මම සහභාගි වුණේ නෑ.

ප්‍ර : එතකොට මේ කොලොසස් කියන එක සම්බන්ධයෙන් කිසිම නියෝගයක් මහත්මයාට දීලා නැනේ?

පි : මට කිසිම නියෝගයක් දීලා නෑ.

ප්‍ර : මේ එතකොට ඒක සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕනේ දික්වැල්ල මහත්මයා හරිනේ?

පි : ඒ ක්‍රියාකාරීත්වය පිළිබඳ දික්වැල්ල මහත්මයා ඉදිරිපත් කළ යුතුයි. කෙසේ වෙතත් මා හැම අවස්ථාවේම උත්සාහ කළේ මම කියන්නේ අදාළ මා වෙත තියෙන දත්ත අනුව මට ප්‍රකාශ කරන්න පුළුවන් කරුණු පමණයි.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍ය තරම් මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට හැකි බව සඳහන් කරමි.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : දැන් මහත්මයා මේ ක්‍රමවේදය සම්බන්ධයෙන් සාක්ෂියක් මේ ගරු කොමිෂන් සභාව ඉස්සරහ දුන්නා?

පි : එහෙමයි.

ප්‍ර : ඊට අමතරව ඒ මේ අදාළ කාල සීමාවට අවශ්‍ය සාක්ෂියක් දුන්නා පුද්ගලික දැනීම මත නෙවෙයි ලේඛන මත?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට මහත්මයා ඒ වගේම ගරු කොමිෂන් සභාවට කිව්වා කිසිම අවස්ථාවක තමන්ට කිසිම බලපෑමක් හිටපු සභාපති මහින්ද ජිනසේන මහත්මයා මේ සම්බන්ධයෙන් කෙරුවේ නෑ කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඊට අමතරව තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළව කිසිම කරුණක් සම්බන්ධයෙන් ඔය කාලය තුළදී මහින්ද ජිනසේන මහත්මයා තමන්ට කිසිම බලපෑමක් කරලා තියෙනවද?

පි : නෑ අනිකුත් රාජකාරී සම්බන්ධවත් කරලා නැහැ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

ප්‍ර : සාක්ෂිකරු ඔබ මේ කොමිෂන් සභාවට සකස් කරලා දුන්නා නේද ලේඛනයක් C 764 කියලා අර මේ සන්සන්ධනයක් කිරීමක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම සන්සන්ධනයට අවශ්‍ය තොරතුරු තිබෙන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මොන අංශයේද?

පි : අලෙවි අංශය විදිහට ස්වාමිනි මගේ අංශයේ තියෙනවා මේක ක්‍රියාත්මක කරන්න මෙහෙයුම් කරන්නේ මගේ අංශයේ. ඒ වගේම මෙහි පිටපතක් අපි යවනවා ගිණුම් අංශයට. ගිණුම් අංශය මෙහි සියළුම තොරතුරු දත්ත ගබඩා වෙලා තියෙනවා.

ප්‍ර : එතකොට මේ C 764 දරන ලේඛනය පිළියෙල කරලා තියෙනවා කොහෙන් දත්ත ලබා ගෙනද?

පි : මේ මගේ අංශයේ අලෙවි අංශයෙන් ලබා ගත්ත දත්ත තමයි මෙතන තියෙන්නේ ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරන්නේ ඔබ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : අබලි ද්‍රව්‍ය විකිණීමේ ඒ ව්‍යාපෘතිය දැන් තිබෙන්නේ ඔබගේ අංශයේ යටතේද?

පි : එහෙමයි ස්වාමිනි.

(C 755 සාක්ෂිකරුට පෙන්වයි.)

ප : C 755 දරන ලේඛනයෙන්ද අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ඔබගේ ඉවත් කෙරුවේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔය C 755 දරන ලිපියේ සඳහන් කරලා තිබෙනවද එම ව්‍යාපෘතිය ඔබේ අධීක්ෂණයෙන් ඉවත් කිරීමට හේතුව?

පි : හේතුව සඳහන් කරලා නෑ ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප : මිස්ටර් උදයසිරි ඔබ 2015 ජූලි මාසේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක අලෙවි කියන තනතුරට පත් වුණානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔබ එම තනතුරට අයදුම් කළේ අභ්‍යන්තර අයදුම්කරුවෙකු ලෙසද නැත්නම් බාහිර අයදුම්කරුවෙක් ලෙසද?

පි : බාහිර අයදුම්කරුවෙක් විදිහට.

ප : ඒ කියන්නේ ඔබ පුවත්පත් දැන්වීමකට අයදුම්පතක් ඉදිරිපත් කළා?

පි : කළා.

ප : ඔබ ළඟ ඒ පුවත්පත් දැන්වීම තිබෙනවද හොයා ගන්නට හැකියාවක් තිබෙනවද ඔබට ආයතනයේ පරිපාලන අංශයෙන්?

පි : පරිපාලන අංශයෙන් මට සොයා බැලීමක් කළ හැකියි ස්වාමිනි.

ප : ඒ පුවත්පත් දැන්වීමේ පැහැදිලිව දක්වලා තිබුණාද මේ අධ්‍යක්ෂක අලෙවි කියන අයගේ job description එක. රැකියා විස්තරේ සහ ඔහුගේ රැකියා job specification එක මොනවද ඔහුට කරන්නට තියෙන්නේ කියලා එම පුවත්වත් දැන්වීමේ?

පි : නිවැරදි පිළිතුරක් මේ අවස්ථාවේ ලබා දිය නොහැකි ස්වාමිනි. මට මතක විදිහට

ප : ඔබ ඒක කරුණාකරලා මෙම කොමිෂමට පරිපාලන අංශයෙන් ඉදිරිපත් කරන්න?

පි : මට ඉදිරිපත් කළ හැකියි ස්වාමිනි.

ප : ඔබ දැන් 2015 ජූලි මාසේ සිට දැන් මේ දක්වාම අධ්‍යක්ෂක අලෙවිනේ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අලෙවි අධ්‍යක්ෂක.

ප්‍ර : ඔබගේ වාර්ෂික වැටුප් වර්ධක ඔබට නිසි පරිදි ලැබුණාද?

පි : නෑ.

ප්‍ර : වාර්ෂික වැටුප් වර්ධකය හැම අවුරුද්දකම ඔබට දෙනවානේ වැටුප් වර්ධකයක්?

පි : ඔව්.

ප්‍ර : ඔබ ඒක ගැන දන්නවාද?

පි : ඔව්.

ප්‍ර : ඔබට ඒක ලැබුණාද හැම වර්ෂයකම?

පි : හැම වර්ෂයකම වර්ධකය ලැබුණා.

ප්‍ර : ලැබුණා. එම වාර්ෂික වැටුප් වර්ධකය ලබා දීමේදී කාර්ය සාධන ඇගයීමක් කියන එකක් කරනවා නේද ආයතනයෙන්?

පි : කරනවා ඒක. කාර්ය සාධන ඇගයීම අපේ අධ්‍යක්ෂක ජනරාල් මහත්මයා විසින් සිදු කරනු ලබනවා.

ප්‍ර : එතකොට ඔබගේ වාර්ෂික කාර්ය සාධක ඇගයීම අධ්‍යක්ෂක ජනරාල් විසින් කළාද?

පි : සිදු කළා ස්වාමිනි.

ප්‍ර : ඔව් කාර්ය සාධක ඇගයීමක් ඔබට කිරීමෙන් අදහස් වන්නේ ඔබගේ කාර්ය සාධනය පිළිබඳව ඇගයීමක් කිරීම නේද?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඔබට වාර්ෂික වැටුප් වර්ධකය ලැබුණා නම් ඔබගේ කාර්ය සාධනය පිළිබඳව ගැටලුවක් තිබෙනවාද නැද්ද කියන එක ඒ තුළින් පැහැදිලි වෙනවා නේද?

පි : පැහැදිලි වෙනවා. ස්වාමිනි මට මෙහිදී සිහිපත් කරන්න පුළුවන් මහින්ද ජිනසේන හිටපු සභාපතිතුමා මාව මගේ සේවය අගයලා මට ලිපියක් නිකුත් කරලා තියෙනවා. එය මට ඉදිරිපත් කළ හැකියි ගරු කොමිෂන් සභාව වෙත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඒ ලිපිය තියෙනවාද දැන්?

පි : මට ඉදිරිපත් කළ හැකියි දැන් මේ අවස්ථාවේ නැහැ.

ප්‍ර : ඒක පස්සේ ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : හැකියි ස්වාමිනි.

ප්‍ර : කොයි වසරේද ඒ ලිපිය?

පි : 2017 වසර වගේ මට මතකය තියෙන්නේ.

ප්‍ර : 2017 වසරේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් මම කරපු ක්‍රියාවලියකට එතුමා මට ලිඛිතව දුන්නා ඔබ මෙය සාර්ථකව ඉටු කළා කියලා මට ප්‍රශංසාත්මක ලිපියක් මට නිකුත් කළා.

ප්‍ර : හරි ඒක කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න.

පි : ඉදිරිපත් කළ හැකියි ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර : දැන් ඔබ ගරු සභාපතිතුමාගේ ප්‍රශ්නෙකට පිළිතුරක් වශයෙන් අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ වගකිව යුතු ප්‍රධාන නිලධාරියා අලෙවි අධ්‍යක්ෂක කියලා 2013 වර්ෂයේ මාර්ග උපදේශකයේ සඳහන් වෙලා තියෙනවා කියලා සඳහන් කරනු ලැබුවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : අබලි ලෝහ ව්‍යාපෘතිය සුපරීක්ෂණය, කළමනාකරණය, ප්‍රගති සමාලෝචනය හා ඇගයීම කවුරුන් විසින් සිදු කළ යුතුයි කියලද මේ මාර්ග උපදේශකයේ සඳහන් වෙලා තිබෙන්නේ?

පි : එය සිදු කළ යුත්තේ මූලිකවම අධ්‍යක්ෂක මණ්ඩලය. ඉන් පසු තමයි කළමනාකරණ මණ්ඩලයට එය යොමු විය යුත්තේ.

ප්‍ර : එහි සභාපති සහ සාමාන්‍ය අධිකාරි විසින් කළ යුතු අතර ඉන් අනතුරුව ඔබ කියපු ආකාරයට කළමනාකරණ මණ්ඩලයට වාර්තා කළ යුතුයි කියලා සඳහන් වෙනවද?

පි : මේ මාර්ග උපදේශක සංග්‍රහයට යටත්ව අපි අපගේ සියළුම අධීක්ෂණ කටයුතු සහ මෙහෙයුම් වල තොරතුරු අපි කළමනාකරණ මණ්ඩලයට වාර්තා කළ යුතුයි.

ප්‍ර : අබලි ලෝහ ව්‍යාපෘතියේ වගකීම කවුරුන් විසින් දැරිය යුතුයි කියලද සටහන් වෙලා තිබෙන්නේ?

පි : මෙහි සම්පූර්ණ වගකීම මාර්ග උපදේශන සංග්‍රහයට යටත්ව වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වන්නේ අලෙවි අධ්‍යක්ෂකවරයායි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

සාක්ෂිකරු මුදා හරිමි.

නැවත අවශ්‍ය වූ අවස්ථාවක අපි ඔබව නැවත කැඳවන බව සාක්ෂිකරුට දන්වමි.

පි : එහෙමයි ස්වාමිනි.

අද දිනට සාක්ෂිකරු මුදා හරිමි.

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා හරස් ප්‍රශ්න ඇසීමේදී යම් යම් ලේඛන සහ යම් යම් තොරතුරු සම්බන්ධයෙන් විමසීමක් සිදු කළා. හිටපු සභාපතිවරයා හෙට දින කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දීමට නියමිතයි. අද දින මෙම සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්න වලට අනුව හිටපු සභාපතිවරයා සාක්ෂි ලබා දෙන විට ඔහුට විරුද්ධව මෙම සාක්ෂිකරු මාර්ගයෙන් එල්ල කරන ලද අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ සිදු වී ඇතැයි පැවසෙන යම් අක්‍රමිකතා සම්බන්ධයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියළු ලේඛන කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් අවශ්‍ය නම් එය ලිඛිතව කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙසටත් එලෙස දැනුම් දුන් පසු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා හෙට දින කොමිෂන් සභාව එය සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේදී ලබා දීමට හැකියාවක් ඇති බව දන්වා සිටිමි.

<u>නියෝගය</u>

මේ අවස්ථාවේදී උගත් ජනාධිපති නීතිඥවරයා විසින් දන්වා සිටින්නේ දැනටමත් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත 2020 ජූලි මස 12 වෙනි දින ලියන ලද ලිපියෙන් යම් තොරතුරු ඉල්ලා ඇති බවත් එය මෙතෙක් ලැබී නැති බවයි. මේ අවස්ථාවේදී කොමිෂන් සභාවේ ලේකම් වෙත නියෝගයක් නිකුත් කරමින් කොමිෂන් සභාවට දන්වා සිටින්නේ මෙකී 2020 ජූලි මස 12 වෙනි දින දරන ලිපියේ සඳහන් ලේඛන හෙට දින පස්වරු 12 පසු වී විනාඩි 30 වන විට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 7 වෙනි වගන්තිය යටතේ නියෝගයක් සභාපති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත වහාම නිකුත් කරන ලෙසයි. මෙම 2020 ජූලි මස 12 වෙනි දින දරන ලිපිය කොමිෂන් සභාවේ ලේඛනයක් ලෙස වාර්තා ගත කර තබා ගන්නා ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

දැන් වේලාව :- පස්වරු 02. 45 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.01 වේලාව:ප.ව.07.10 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	**256**
නම	:	**චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ**
වයස	:	**අවුරුදු 65**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**ජනාධිපති ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධ වෙලා කටයුතු කළ නිලධාරීවරෙයක්?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධ වුයේ කවද්ද? කුමන නිලයක් යටතේද?

පි : 1976 පෙබරවාරි 09 වෙනිදා. ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන්.

ප්‍ර : ඔබ පොලිස් සේවයෙන් විශ්‍රාම ගියේ මොන වර්ෂයේද?

පි : 2015 ජුනි මාසේ 15 වෙනිදා.

ප්‍ර : කුමන නිලයක් යටතේද ඔබ විශ්‍රාම යන විට කටයුතු කළේ?

පි : නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හැටියට.

ප්‍ර : ඔබගේ ඔබ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වශයෙන් විශ්‍රාම යන විට ඔබ පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරි, පොලිස් අධිකාරි ,ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යන තනතුරුවල උසස්වීම් ලබන්නට යෙදුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබගේ මෙම වසර 39 ක් පමණ ඔබගේ පොලිස් සේවයේ ඔබගේ සේවා කාලය තුළ ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ මොන මොන අංශවලට සම්බන්ධ වෙලාද රාජකාරි කළේ?

පි : සාමාන්‍ය පොලිසියේ අවුරුදු පහක් පමණ සේවය කළා. අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දිගු කාලීන සේවයක් කරලා 1995 මට එතෙනින් ඉවත් වෙන්න සිදු වුණා. ඊට පස්සේ මම 2002 වර්ෂයේදී රාජ්‍ය බුද්ධි සේවයේ එතකොට DII එක රාජ්‍ය බුද්ධි සේවයට දැන් රාජ්‍ය බුද්ධි සේවයට ගියා. ඊට පස්සේ එතන අවුරුදු දෙකක් ඉඳලා ඊට පස්සේ CRD ගිහිල්ලා මම ඊට පස්සේ ගියා

ප්‍ර : CRD කියන්නේ?

Registrar of Society's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පොලිස් ලේඛනාගාරය. අපරාධ ලේඛනාගාරය. ඊට පස්සේ ගියා මම UN mission එකට ගියා. එතන අවුරුද්දක් ඉඳලා එතකොට 2005 වෙලා. 2005 දී මම ඒ අතරතුරේ මම ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබුණේ ATU කියලා ත්‍රස්තවාදී අංශයක් තිබුණා ඒක තමයි පටන් ගත්තේ. ඒක අවසානයේ විකාශය වුණා කොට්ඨාශයක් හැටියට. ඒ කොට්ඨාශයේ අධ්‍යක්ෂක ලෙස මම එතකොට උප පොලිස් පරීක්ෂක, පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරි විදිහට කටයුතු කරලා හිටියේ ඒ අංශයේම. ඊට පස්සේ අධ්‍යක්ෂක ලෙස මම UN mission ගිහිල්ලා ඇවිල්ලා භාර ගත්තා වැඩ. එදා ඉඳලා මම නියෝජ්‍ය පොලිස්පති වෙලා විශ්‍රාම යන්න 2015/16 වෙනිදා වෙනකම් ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයෙත් ඊළඟට රාජ්‍ය බුද්ධි සේවයෙත් රාජකාරී කළා.

ප්‍ර : දැන් ඔබ රාජ්‍ය බුද්ධි සේවාවට නැවත පැමිණියේ කවද්ද කියලා කියන්න?

පි : 2011/08/17 වෙනිදා ඉඳලා 2015/01/16 වෙනකම් අධ්‍යක්ෂකවරයා හැටියට කටයුතු කළා.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවේ?

පි : එහෙමයි.

ප්‍ර : අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාව මඟින් සිදුවන කාර්යය කුමක්ද?

පි : ඒක පුළුල් විෂයක්.

ප්‍ර : නෑ ඉතා කෙටියෙන් දෙන්න?

පි : රජයටත්, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙනුත්, මහජන සාමය වෙනුවෙනුත් අවශ්‍ය පෙර සුදානම් සිදු කිරීම කිව්වොත් මම හිතන්නේ නිවැරදි.

ප්‍ර : එහිදී රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාගේ කාර්ය භාරය කුමක්ද?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා කිව්වාම මේ සම්පූර්ණ සේවා කටයුතු අධීක්ෂණය කිරීම, මෙහෙයවීම සහ සම්බන්ධීකරණය රාජ්‍ය නායකයාගේ පටන් මම හිතනවා මම විශ්වාස කරනවා පහළම ශ්‍රේණියේ ඉන්න ග්‍රාම නිලධාරියා දක්වා අපගේ සම්බන්ධතාවය තිබිය යුතුයි.

ප්‍ර : ඒ කියන්නේ රාජ්‍ය නායකයා කියන්නේ ජනාධිපතිවරයාගේ සිට බිම් මට්ටමේ සිටින ග්‍රාම නිලධාරීවරයා සමඟ දක්වා සම්බන්ධීකරණය කිරීම තමයි සිදු කරන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat Commission
FAIR COMMENT BY JEZEEM

ප : ඔබට හඳුනා ගැනීමට හැකියාවක් තිබේද එහෙම නැත්නම් වෙන් කරලා හඳුනා ගන්න පුළුවන්ද තොරතුරක් කියන්නේ මොකක්ද, බුද්ධි තොරතුරක් කියන්නේ මොකක්ද කියන එක?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔබට ඒ සම්බන්ධයෙන් හඳුනා ගන්න පුළුවන්?

පි : පුළුවන්.

ප : මෙම රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කිරීමේදී සහ ඊට පෙර බුද්ධි සේවාවට අදාළ යම් යම් පුහුණුවීම් ඔබ ලබා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : කොහේද විදේශීයවද නැත්නම් දේශීයවද?

පි : දේශීයව.

ප : 2011 අවුරුද්දේ සිට 2015 ජනවාරි 16 දක්වා ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කිරීමේදී මුස්ලිම් අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාවට වාර්තා වෙලා තිබුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එම වාර්තාවීම් වලට අනුව යම් යම් පියවරවල් රාජ්‍ය බුද්ධි සේවාව විසින් ගන්නට යෙදුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔබට මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද එලෙස රාජ්‍ය බුද්ධි සේවාව විසින් හඳුනා ගන්නට යෙදුණු ඉස්ලාම් එහෙම නැත්නම් මුස්ලිම් අන්තවාදී ක්‍රියා මොනවද ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව ගත් ක්‍රියාමාර්ග මොනවද කියලා?

පි : මගේ පූර්වගාමීයාගේ කාලයේ මම හිතන්නේ ඊටත් ඉස්සෙල්ලා 1990 වගේ වර්ෂවල ඉඳන් මේ ගැන රාජ්‍ය බුද්ධි සේවාවට තොරතුරු ලැබිලා තිබුණා.

ප : කුමක් ගැනද?

පි : මේ අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් ලෝකයේ සිදුවන ක්‍රියාකාරකම්. ඒ අනුව මම රාජ්‍ය බුද්ධි සේවාවේ රාජකාරී කරන අතරතුරේදී ඒ වේලාවෙත් මෙතන අපි ත්‍රස්තවාදී ඒ කියන්නේ උතුරේ ත්‍රස්තවාදය මෙන්ම මේ සම්බන්ධයෙනුත් කරුණු සොයා බැලුවා. ඒ අනුව විදේශීය රටවල තිබුණු මේ වහබිසම් කියන ත්‍රස්තවාදය හේතු කොට ගෙන ඇති වෙච්ච විවිධ කණ්ඩායම්වල සම්බන්ධතා ලංකාව තුළටත් ඇතුල් වීම පිළිබඳව අපිට තොරතුරු ලැබිලා තිබුණා. ඒ සම්බන්ධයෙන් අපි රහසිගත විමර්ශන කළා. අපි හිතුවොත් ඒක Intelligence operations අපි කළා. කරලා

FAIR COMMENT BY JEZEEM

දේශීය මෙන්ම විදේශීය බුද්ධි අංශත් එක්ක එකතු වෙලා ඒ ඔවුන්ට සහය වෙලා මොකද අපේ රටට වඩා පිටරටවල තමයි ප්‍රශ්නේ වැඩියෙන් තිබුණේ ඒ වකවානුවේදී. ලංකාවේ ඒ ගොල්ලො පාවිච්චි කරලා තිබුණේ මේක ඒගොල්ලොන්ගේ මේ safe heaven එකක් එහෙම නැත්නම් ඒගොල්ලන්ට සම්බන්ධීකරණය කරන්න නැත්නම් සාකච්ඡා පවත්වන්න පුළුවන් වතාවරණයක් තියෙන ප්‍රදේශයක් හැටියට.

ප්‍ර : මොහොතක් ඉන්න. ඔබ කියා සිටියා ඒ ගොල්ලන් ලංකාව පාවිච්චි කරලා තිබ්බේ safe heaven ඒ කියන්නේ ඒ ගොල්ලන්ගේ කටයුතු කිරීමට පහසු ස්ථානයක් කියලා. ඔබ ඒගොල්ලන් වශයෙන් මේ අවස්ථාවේදී හඳුන්වන්නේ කවුද?

පි : මුස්ලිම් අන්තවාදී ක්‍රියාකරුවන්.

ප්‍ර : ඒ කියන්නේ විදේශීය රටවල ඉන්න මුස්ලිම් අන්තවාදී ක්‍රියාකරුවන් ද?

පි : එපමණක් නෙවෙයි දැන් මම ඔය කියන අවදිය වෙන කොට

ප්‍ර : ඒ කියන්නේ 2011 සිට 2015 දක්වාද?

පි : 2015, 2012, 2013 වගේ කාලේ වෙනකොට මේ රටෙන් එළියට ගිහිල්ලා වෙනත් ජාතිකත්වය ලබා ගෙන අපේ උප්පත්තිය ලබපු මිනිස්සු ඒ රටවල් වලට ගිහිල්ලා ඊට පස්සේ ඒ හරහා ගිහිල්ලා පුහුණුව ලබපු කණ්ඩායමක් අපිට ආරංචි වුණා ඒ වගේම ඔවුන් හා සම්බන්ධ වෙච්ච මෙහේ හිටපු මිනිස්සු අපිට හඳුනා ගත්තා. ඒ වගේම ඒ රටවල් ඉඳලා ආගම ප්‍රචාරය කිරීමේ මුවාවෙන් සාමාන්‍ය විදිහට ආගම ප්‍රචාරය කිරීමේ මුවාවෙන් ලංකාවට ඇවිල්ලා මේ වහබිසම් ප්‍රචාරණය කිරීමේ කටයුතු කරන්න. බොහෝම වශයෙන් මම හිතන්නේ ඒ ගොල්ලන්ගේ වචන තිබුණේ ජමාත් කරන්න හුඟක් කරන්න රට පුරාම. ඒ ජමාත් වලට ගිහිල්ලා ඒ වගේ ක්‍රියාකාරකම්වල කරලා අපිව radicalize කිරීමේ කටයුතු.

ප්‍ර : දැන් මෙම ක්‍රියාකාරී කට්ටිය ඒ කියන්නේ ඔබ කොටස් දෙකක් ප්‍රධාන වශයෙන් සඳහන් කළා? එකක් තමයි ලංකාවේ සිටින ඔවුන් ඉස්ලාම් භක්තිකයන්ද විදේශ ගත වුණේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කියන්නේ ලංකාවේ සිටින ඉස්ලාම් භක්තිකයන් වෙනත් රටවලට ගිහිල්ලා ඒ රටවල පුරවැසිභාවය ලබා ගෙන මෙම ක්‍රියාකාරකම් ඒ කියන්නේ ඉස්ලාම් ආගමික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දෙවැන්න ආගම ප්‍රචාරය කිරීම යන මුවාවෙන් ලංකාවට පැමිණි විදේශීකයන් වහබිසම් ලංකාවේ ප්‍රචලිත කිරීමට කටයුතු කළා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : මා දෙවෙනියට ඔබ සඳහන් කරපු කොට්ඨාශය එනම් මේ ලංකාව තුළ වහබිසම් ප්‍රචාරය කිරීම සඳහා විදේශයෙන් පැමිණි ප්‍රචාරක ආගම ප්‍රචාරය කරන්නන් සම්බන්ධව රාජ්‍ය බුද්ධි සේවාව ඔබ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ කාල සීමාවේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගත්තද ඔවුන්ට එරෙහිව?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔබ එය කරුණාකරලා එය පැහැදිලි කරන්න?

පි : අපි ජාත්‍යන්තර බුද්ධි ඒකකත් එක්ක සම්බන්ධීකරණය වෙලා දැන් ලංකාවට සාමාන්‍ය වශයෙන් පිටරට ඉඳලා එහෙම ප්‍රචාරය කරන ආගම කතා කරන මේ මවුලවිලාට එහා පැත්තේ ඉන්න කට්ටිය ලංකාවට එනවා යනවා.

ප : මවුලවිලාට එහා පැත්තේ කියන්නේ?

පි : ඒ කියන්නේ මුස්තිලා එතකොට ඒගොල්ලන්ගේ තව ඉන්නවා තව ජ්‍යෙෂ්ඨයෝ. ඒගොල්ලන්

ප : ඔවුන් මවුලවිවරුන්ට වඩා උසස් අයද නැත්නම් පහළද ?

පි : බොහෝ වශයෙන් උසස් අය මම දන්න තරමට.

ප : හරි.

පි : ඒ ගොල්ලන් එනවා. ඇවිල්ලා මේ ලංකාවට පැමිණිලා ලංකාවෙන් මේ ලංකාවේ ඉඳගෙන පල්ලිවලට ගිහිල්ලා ඒ ගොල්ලන්ට එක එක දේශන පවත්වනවා. නමුත් මේ සියළුම දෙනා එහෙම නරක අය සහ ඒ වැරදි ක්‍රියාවල්වල නිරත වෙන අය නෙවෙයි. අපි ඒ සම්බන්ධයෙන් අනිකුත් අංශවලින් ලබා ගන්න තොරතුරු මත එහෙම ආවාම.

ප : අනිකුත් අංශ වශයෙන් ඔබ හඳුන්වන්නේ කුමක්ද?

පි : ජාත්‍යන්තර බුද්ධි අංශවලින් ලබා ගන්න තොරතුරු මත එහෙම අය ලැබුණොත් අපි ඔවුන්ව එක්කොම ලංකාවට ඇතුල් කරන්නේ නෑ. ඇතුල් වෙලා හිටියොත් ඒ ගොල්ලන්ව පිට කරනවා.

ප : ඔබගේ සේවා කාලය තුළ එසේ ලංකාවට පැමිණීම වළක්වන්නට යෙදුණු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද මේ ඉස්ලාම් ආගම අන්තවාදීන් සම්බන්ධයෙන්?

පි : සාමාන්‍යයෙන් 200 ක් 250 ක් විතර වෙන්න ඇති.

ප : ඒ හා සමානව ඔබ කියා සිටියා ලංකාවට පැමිණි මේ අන්තවාදී ආගම ප්‍රචාරය කරන්නන් පිටුවහල් කරන්නටත් කටයුතු කළා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියලා ඔබට දළ වශයෙන් හැකියාවක් තිබෙනවද එම සංඛ්‍යාව කොපමණද කියලා කියන්න?

පි : මගේ මතකේ හැටියට අපි රටවල් කීපයක තුන් හතර දෙනෙක්

ප්‍ර : පිටුවහල් කළා?

පි : පිටුවහල් කළා. නමුත් ඒවා ඔක්කොම defensive operation offensive නෙවෙයි.

ප්‍ර : ඒ කියන්නේ මොකක්ද මේ defensive operations කියලා ඔබ අදහස් කළේ?

පි : රහසිගතව හා ඒ ගොල්ලන්ට දැනෙන්නේ නැති වෙන්න කාටවත් ප්‍රසිද්ධ නොකර බොහොම මේ එළි නොකර ඒ ගොල්ලන්ව හොඳ හිතින් යවනවා.

ප්‍ර : දැන් මෙම ක්‍රියාදාමය ඔබලා සිදු කළේ කොහොමද? ඒ කියන්නේ මේ අවස්ථාවේදී එය පැහැදිලි කරන්න පුළුවන්ද ඒ සඳහා සහය දක්වපු ආයතන මොනවද කියලා?

පි : අපිට ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව ඒ කියන්නේ මෙහෙම කිව්වොත් හරි පෙරදිග සහ අපරදිග රටවල්වල බුද්ධි අංශ අපිත් එක්ක සහයෝගයෙන් කටයුතු කළා.

ප්‍ර : ඊට අමතරව එම බුද්ධි අංශ සමඟ මේ විදේශයෙන් පැමිණෙන වහබ්වාදී ආගම ප්‍රචාරය කරන්නන් සම්බන්ධයෙන් බුද්ධි මෙහෙයුම් සිදු කරන්නට යෙදුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ බුද්ධි මෙහෙයුම් වශයෙන් ඔබ කුමක්ද හඳුන්වන්නේ ?

පි : ඒගොල්ලන් දැන් අපි හිතමු පුද්ගලයෙක් එනවා රැස්වීමක් තියන්න. එයාට ඕනේ රැස්වීමට meeting point එකක් හමුවීමේ ස්ථානයක්. ඒගොල්ලන් තෝර ගන්නවා ලංකාව. එතකොට තවත් රටවල් කීපයකින් ඒගොල්ලන් සම්බන්ධීකරණ සාමාජිකයෝ ටික එක්කහු වෙනවා. එක්කහු වෙලා අපේ හෝටලයකට ඇවිල්ලා සාකච්ඡා පවත්වලා ඒ ගොල්ලන් ආපහු යනවා. ඒක ඉතින් අපි අවශ්‍ය කටයුතු කරනවා.

ප්‍ර : අවශ්‍ය කටයුතු කරනවා ඒ කියන්නේ?

පි : තොරතුරු ලබා ගෙන ඒ මිනිසුන්ගේ සම්පූර්ණ අනන්‍යතාවල් හඳුනා ගෙන ඒ අංශත් එක්ක එකතු වෙලා ඒ ගොල්ලන්ගේ තොරතුරු ටික සියල්ලම ගන්නවා.

ප්‍ර : එසේ එවැනි තොරතුරු ලබා ගැනීම තුළින් එම තොරතුරු ඒ අදාළ පුද්ගලයන් පැමිණි රටවල්වල තිබෙන බුද්ධි අංශ සමඟ හුවමාරු කර ගන්නවද?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට දැනීමක් තියෙනවද එසේ ලබා ගන්නා ලද තොරතුරු මත ඒ තොරතුරු ලබා ගන්නට යෙදුණු තැනැත්තන්ට එරෙහිව එම රටවල්වල නීතිය ක්‍රියාත්මක වුවාද නැද්ද කියලා?

පි : ඒක මම විශ්වාස කරන්නේ නෑ මොකක්ද වුණේ කියලා. ඒක මොකක් හරි ඒ ගොල්ලන්ගේ රාජකාරියක් කරන්න ඇති.

ප්‍ර : දැන් ඔබ තව කියා සිටියා ලංකාව තුළ සිටින තැනැත්තන් ඉස්ලාම් ආගම වෙනුවෙන් විදේශ ගත වෙලා පුරවැසිභාවට ලබා ගත් පුද්ගලයෝ ගැන? දැන් එසේ විදේශ ගත වූ පුද්ගලයන් ඔබගේ කාල සීමාව තුළ අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කළ කාල සීමාව තුළ ඔවුන් කවුද යන්න හඳුනා ගන්නට යෙදුණද?

පි : එහෙමයි ස්වාමිනි අපේ වාර්තාවල ඇති ඒ පුද්ගලයන්ගේ විස්තර.

ප්‍ර : ඔබට මතකයෙන් කීමට හැකියාවක් තියෙනවද කොපමණ පුද්ගලයන් සංඛ්‍යාවක් ඒ අනුව හඳුනා ගන්නට යෙදුණද මේ 2011 ත් 2015 වර්ෂයත් අතර කාල සීමාව තුළ?

පි : මම හිතන්නේ 25 ත් 30 ත් අතර සංඛ්‍යාවක් ඇති.

ප්‍ර : එතකොට මේ පුද්ගලයන් මේ ලංකාවේ පුරවැසියන් ලෙස සිටි මේ තැනැත්තන් කුමන රටකට ගොස් සිටියාද කියලා ඔබට අනාවරණය වෙලා තිබ්බද?

පි : ඔව් ඔස්ට්‍රේලියාව හරහා ගිහිල්ලා සිරියාවට තමයි යන්නේ.

ප්‍ර : ඔබට මතකයක් තියේද නිශ්චිත වශයෙන් මේ පුද්ගලයන් ඔබ කියා සිටියේ 25 දෙනෙකු පමණ .

පි : මා ළඟ සටහන තියෙනවා 23 දෙනෙක්.

ප්‍ර : 23 දෙනෙක් පමණ මේ 23 දෙනාම සිරියාවටද ගොස් සිටියේ කියලා?

පි : නෑ. ඒක හරියට කියන්න බෑ. ඒක අපි හොයන්න ගියෙත් නෑ. මේ ඒ පැත්තට ගියපු කට්ටියගේ වාර්තා ආවා. ඒ වාර්තා මම කොයි රටවල්ද කියලා මට කියන්න බෑ. කොහොම වුණත් ඔය එක ring එකක් ඇතුළේ තමයි මේ ගොල්ලො training වෙන්නේ ඒ training වලට ගිහිල්ලා තිබ්බා. ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා එතන citizenship PR එක අරගෙන ඊට පස්සේ තමයි එහෙන් එහාට ගිහිල්ලා තියෙන්නේ. ඒක එක උදාහරණයක් පමණයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඒ පුද්ගලයන් 23 දෙනාගෙන් එක්කෙනෙකුද එහෙම කරලා තිබ්බේ?

පි : නෑ. ඒ කියන්නේ

ප්‍ර : කීප දෙනෙක්?

පි : කීපදෙනෙක්.

ප්‍ර : ප්‍රශ්නය අසාධාරණත් විය හැකියි. ඔබට මතකයක් තියෙනවද මෙම මෙලෙස ඕස්ට්‍රේලියාවට ගොස් පසුව සිරියාවට යන්නට

FAIR COMMENT BY JEZEEM

යෙදුණු පුද්ගලයන් සියළු දෙනාම මුස්ලිම් ලබ්දිකයන්ද නැද්ද කියලා?

පි : මේ 23 දෙනාට අයිති මුස්ලිම් ලබ්දිකයන්.

ප්‍ර : දැන් මේ 23 දෙනාට අයිති ඒ පුද්ගලයන් වෘත්තිකයන් ඒ කියන්නේ professionals ලද නැත්නම් සාමාන්‍ය ජීවිතයක් ගත කරන්නට යෙදුණු සාමාන්‍ය පුද්ගලයන්ද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි : මතකේ හැටියට විවිධ ශ්‍රේණීවල හිටියා. උගතුනුත් හිටියා මං හිතන්නේ විවිධ තරාතිරම්වල පුද්ගලයෝ.

ප්‍ර : ඔබට ඒ එක් පුද්ගලයෙකුගේ හෝ නමක් මතකයක් තියෙනවද?

පි : වාර්තාව බලන්නේ නැතුව කියන්න බෑ ස්වාමිනි.

ප්‍ර : දැන් මෙම පුද්ගලයන් ඔබ කියා සිටියා කිහිප දෙනෙක් සිරියාවට ගොස් සිටි බව? ඔවුන් සිරියාවට කුමන කරුණක් අරභයා ගියාද කියලා වාර්තා වුණාද?

පි : අවි පුහුණුව සඳහා.

ප්‍ර : අවි පුහුණුව සඳහා?

පි : අවි පුහුණුව සහ මේ අවි පුහුණුව පමණක් නෙවෙයි මේ අපි කියන්නේ radicalize වෙනවා කියලා.

ප්‍ර : ඔව්.

පි : training ඒ radicalization වලට සම්බන්ධ වෙච්ච පුද්ගලයෝ.

ප්‍ර : දැන් මෙහෙම අවි පුහුණුව අන්තවාදී ක්‍රියාකාරකම් සඳහා මෙසේ විදේශ ගත වූ ශ්‍රී ලාංකික මුස්ලිම්වරු මේ 23 දෙනාගේ එක් කෙනෙකු හෝ කීප දෙනෙකු හෝ සියළු දෙනාම ඔබගේ ධූර කාලය තුළ නැවත ලංකාවට ආවාද නැද්ද?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : කිසිවෙකු ආවේ නෑ. දැන් ඔබගේ ධූර කාලය තුළ මෙම පුද්ගලයන් නැවත ලංකාවට පැමිණෙවීද නැද්ද යන්න සම්බන්ධයෙන් වන විමසිලිමත් රාජකාරීන් රාජ්‍ය බුද්ධි සේවාව විසින් සිදු කළාද නැද්ද?

පි : එහෙමයි, කළා ස්වාමිනි.

ප්‍ර : එසේ රාජකාරී සිදු කිරීමේදී රාජ්‍ය බුද්ධි සේවාව ලංකාව තුළ තිබෙන වෙනත් ආයතන සම්බන්ධ කර ගන්නට යෙදුණුද?

පි : පැහැදිලි නෑ.

ප්‍ර : දැන් මෙසේ පිටව ගිය පුද්ගලයෝ 23 දෙනාගෙන් කවුරුවකු හෝ පුද්ගලයෙකු ලංකාවට ඒවීද නැද්ද සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ඔබ ආගමන විගමන දෙපාර්තමේන්තුව වැනි වෙනත් ආයතන සම්බන්ධ කර ගත්තද නැද්ද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගුවන් තොටුපළේ අපගේ ඒකකයක් තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒකකයක් තිබෙනවා. එතකොට ඒ හා සම්බන්ධ වෙලා ආගමන විගමන දෙපාර්තමේන්තුවෙත් සම්බන්ධීකරණය ඇතුව ඒවා පරීක්ෂා කරනවා.

ප්‍ර : මෙම කාල සීමාව තුළ මේ රටේ පැවතියේ සාමකාමී වතාවරණයක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ අවස්ථාවේදී මෙසේ විදේශ ගත වූ පුද්ගලයන් මා කියන්නේ මේ අවි පුහුණුව සඳහා විදේශ ගත වූ පුද්ගලයන් එසේ විදේශ ගත වීමට පෙර ලංකාව තුළදී යම් පුහුණුවීම් සිදු කළාද නැද්ද කියලා කරුණු අනාවරණය වුණාද?

පි : නැත ස්වාමිනි එහෙම ඒ කියන්නේ මේගොල්ලෝ සෑහෙන කාලයක් රටින් බැහැරව ඉඳලා වෙච්ච කටයුත්තක්. ඒක නිසා ඒ සෑම දෙනාගේම මේ මෙහෙදී ක්‍රියාකාරකම් monitor වීම ඒ කියන්නේ අවස්ථාවක් ලැබෙන්නේ නැනේ. ගිහිල්ලා ඉවරයිනේ. ඒ නිසා සොයා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ කියන්නට යෙදුණු මේ කොටියාශ දෙක ඒ කියන්නේ විදේශයෙන් පැමිණිලා වහබ්වාදය දේශනා කරපු දේශකයන් හා ලංකාවෙන් පිටව ගියපු 23 දෙනාට අමතරව ලංකාවේ වහබ්වාදය අනුගමනය කරන අන්තවාදය කරා ගොස් සිටින පුද්ගයන් සිටියාද?

පි : කණ්ඩායම් වශයෙන් ඒ කියන්නේ මේ තවුහිද් ජමාත් සහ සංවිධානවල අනු සංවිධාන එහෙම කණ්ඩායම් බොහොමයක් තිබුණා. ඒවායේ සාමාජිකයෝ රටේ විවිධ තැන්වල හිටියා.

ප්‍ර : දැන් මෙම පුද්ගලයෝ අන්තවාදී අදහස් සහිත පුද්ගලයන්ද නැද්ද යන්න සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව අනාවරණය කර ගෙන තිබ්බාද?

පි : ඒවා මෙහෙමයි ඒක කියන්නේ ඕනේ ඒවා සැකයක් පමණයි. එතකොට අපි නීතිමය විමර්ශන පවත්වලා ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කරන්න ගියේ නෑ. එතකොට ඒ වකවානුවේ ඒ වගේ පරිසරයක් තිබුණෙත් නෑ. මොකද ඔවුන් offensive වුණේ නෑ. ඔවුන් වැරදි වලට නෙවෙයි ඔවුන්ගේ තියෙන්නේ න්‍යාය කතා කරන එක සහ කුර්ආනයේ තියෙන කරුණු සම්බන්ධයෙන් ඔවුන් කටයුතු කරන එක.

ප්‍ර : එම තැනැත්තන් ලංකාව තුළ දී අවි පුහුණුවක් ලැබුවද නැද්ද කියලා අනාවරණය වුණාද අවි පුහුණුවක්?

FAIR COMMENT BY JEZEEM

පි : නැත ස්වාමිනි. නමුත් අවි පුහුණුවක් කරනවා කියලා සමහර තැන්වල තොරතුරු බැලුවා. නමුත් ඒවායින් තහවුරු කර ගැනීමට හැකියාවක් ලැබුණේ නෑ.

ප්‍ර : මෙම කාල වකවානුවේදී ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ කාලවකවානුවේදී Islamic state ඉස්ලාම් රාජ්‍යයක් ලංකාව තුළ පිහිටුවන්නට අවශ්‍යයි සහ ඒ කටයුත්ත සඳහා පුද්ගලයන් මෙහෙයවීමක් සිදු වෙමින් තිබුණද?

පි : මේ සංවිධාන තියෙනවානේ තවුහිද් ජමාත් මේක මම මෙහෙම කිව්වොත් මම හිතන්නේ නිවැරදි. දැන් ලංකාවේ සුන්නි මුස්ලිම්වරු තමයි වැඩිපුර ඉන්නේ. ඒ ගොල්ලන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඉන්නේ පාරම්පරික මුස්ලිම්වරු. ඒකෙන් සාමාන්‍යයෙන් 19% ක්, 20% ක් වගේ ප්‍රමාණයක් තමයි මේ වහබිසම් වලට ගැති වෙන කණ්ඩායම. ඒ කණ්ඩායම අපි ඒ වකවානුව වන විට මට ඉස්සෙල්ලා හිටපු කට්ටියගෙනුත් තොරතුරු එකතු කර ගෙන ඇවිල්ලා ඒ ගොල්ලන් කණ්ඩායම් කීපයකට fractions කීපයක් තිබුණා. ඒ fractions වල ඒ ගොල්ලන් ඔක්කොම කතා කළේ මේ වහබිසම් තමයි. ඒ කියන්නේ දැන් Islamic state කියන්නේ ISIS කියන මේ මතයනේ. ඒ මතයට එන කට්ටිය තමයි එතන හිටියේ.

ප්‍ර : දැන් එසේ පැමිණෙන පුද්ගලයන්ව එවැනි මතවාදයකට පැමිණීම වළක්වාලීමට අවශ්‍ය වතාවරණය නිර්මාණය කළ යුතු බවට ඔබට වැටහීමක් ලැබුණාද?

පි : වැළැක්වීමට

ප්‍ර : ඔව්.

පි : ඒ ගොල්ලන් අපි සම්පූර්ණයෙන් ඒගොල්ලන් ගැන සොයා බැලුවා. සොයා බලලා ඒ තොරතුරු මොකද ඒ මම ඉස්සෙල්ලා කිව්වා වගේ ඒ ගොල්ලන් offensive වුණේ නෑ. ඊළඟට තාම ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගන්න ඒ කාලේ අපේ ක්‍රමවේදයක් හරිගස්සලා තිබුණේ නෑ. ඒ නිසා ඒ ගොල්ලන්ව සම්පූර්ණයෙන් monitor කර ගෙන හිටියේ.

ප්‍ර : ආවේක්ෂණයෙන්?

පි : ආවේක්ෂණයෙන් හිටියේ.

ප්‍ර : ඔබගේ සේවා කාලය තුළ ඒ කියන්නේ බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් සිටි සේවා කාලය තුළ මේ සහරාන් යන පුද්ගලයා සම්බන්ධයෙන් හෝ ජමීල් කියන පුද්ගලයා සම්බන්ධව ඔවුන් දැඩි මතධාරී පුද්ගලයන් බවට අනාවරණය වෙලා තිබ්බාද නැද්ද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒක මෙයා දැඩි මතධාරීද මෙයා අඩුද වැඩිද කියන එක නැහැ. නමුත් ඒ ගොල්ලන්ගේ වාර්තා තිබුණා අපේ අංශයේ.

ප්‍ර : කාගේ වාර්තාද?

පි : මේ සහරාන් ඇතුළු පුද්ගලයන්ගේ මේ වර්තමාන කියන කණ්ඩායම නෙවෙයි සහරාන්ලා මීට ඉස්සෙල්ලත් විවිධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ බවට අනාවරණය වෙලා තිබුණු නිසා ඒ වාර්තාවල තිබුණා මේ ගොල්ලන්ගේ නම්.

ප්‍ර : එම වාර්තාවන් ඔබ පරීක්ෂා කරලා බලලා තිබුණද?

පි : නෑ ඒක මෙහෙමයි වෙන්නේ මේ මෙහෙයුමක් කළාම ඒකෙන් නම් අනාවරණය වුණාම ඒ නම් ටික අපි ලේඛනාගාරයට භාර දෙනවා. එතකොට ලේඛනාගාරය ඒක සාමාන්‍යයෙන් දෛනිකව වුනත් සිද්ධ වෙන දෙයක්. ඉතින් ඒක ඒ තොරතුරු එක් රැස් වෙනවා ඉබේම.

ප්‍ර : දැන් මාගේ ප්‍රශ්නය වෙන්නේ අධ්‍යක්ෂක වශයෙන් ඔබ කටයුතු කිරීමේදී එම පුද්ගලයන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධව වැටහීමක් එහෙම නැත්නම් අවබෝධයක් ඔබට තිබුණද ඒ වේලාවේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මම ඊළඟ ප්‍රශ්නේ. ඇයි එහෙම අවබෝධයක් එහෙම නැත්නම් වැටහීමක් මෙවැනි පුද්ගලයන් සම්බන්ධයෙන් ලබා ගන්නේ?

පි : ඒක තමයි ජාතික ආරක්ෂාව මේ තොරතුරු එක් රැස් කරලා ජාතික ආරක්ෂාව වෙනුවෙන් තර්ජයන් එළඹීමට අවකාශය තිබෙනවාද නැද්ද කියන එක විශ්ලේෂණය කර ගැනීම සඳහා තමයි ඒ කටයුතු කරන්නේ. ඉතින් මේ වගේ වෙලා මේ වකවානුව වෙන කොට මම හිතන්නේ ආවා අපිට හලාල් ප්‍රශ්නේ. ඊළඟට අලුත්ගම ප්‍රශ්න. එතකොට එක එක ක්‍රියාකාරකම් මේ ගොල්ලන්ගේ සිදුවීම් සිදු වුණා.

ප්‍ර : මේගොල්ලන්ගේ කියන්නේ?

පි : මේ මුස්ලිම් අන්තවාදීන්ගේ. වහබිසම් පතුරුවන කට්ටයගේ. ඊළඟට මේ ගොල්ලන් පල්ලිවලට ගැහුවා අර සුන්නි පාරම්පරික මුස්ලිම්වරුන්ගේ පල්ලිවලට පහර දුන්නා. ඒවාට සාමාන්‍ය නීතිය යටතේ පොලිසී විසින් රාජකාරී කළා ඒ විදිහට ක්‍රියාත්මක වුණා. ඊළඟට ඔබ බෙරුවල පැත්තෙත් ඔය වගේ ආරවුල් තිබුණා. ඉතින් ඒවායේදී අපිට පෙනි යනවා මේක එන්න එන්න මේ ගොල්ලන්ගේ ක්‍රියාකාරකම් වල තීව්‍රතාවයක් තියෙනවා. ඒ නිසා ඒ ගැන ආවේක්ෂණයෙන් තමයි කටයුතු කළේ.

ප්‍ර : ඒ අනුව ඔබට මෙම නම familiar ඒ කියන්නේ ?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ එහෙම කිව්වොත් වැරදි ස්වාමිනි. මේ නම familiar වෙලයි කියලා විශේෂයක් නෑ. මේ ගොල්ලන්ගේ මොහොමඩ්ලා ඔක්කොමලා රාසික්ලා එහෙම නේ ඉන්නේ. ඉතින් ඒකට මේ සහරාන්ගේ නම ප්‍රසිද්ධ වුණේ ඇත්ත වශයෙන්ම සහරාන්ම කියන එක සිද්ධිය නිසා. නැත්නම් මේ ගොල්ලන්ගේ නම් ලැයිස්තුවේ විවිධ එක එක නම් ටික තියෙනවා.

ප්‍ර : දැන් සාක්ෂිකරු 2011 ඔබ බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් පැමිණියාට පසුව මෙම මුස්ලිම් අන්තවාදී අදහස් සහ ක්‍රියාකාරකම් ලංකාව තුළ වැඩිවීමක් සිදු වෙන බවට ඔබ නිරීක්ෂණය කරන්නට යෙදුණද?

පි : එහෙමයි ස්වාමිනි. ඒ සම්බන්ධයෙන් මම ආරක්ෂක රැස්වීමේදී presentation එකකුත් කරලා තියෙනවා.

ප්‍ර : මොකක්ද මේ ආරක්ෂක රැස්වීම කියන්නේ?

පි : ජනාධිපතිතුමාගේ ප්‍රධානාත්වයෙන් තිබෙන ආරක්ෂක මණ්ඩල රැස්වීම්.

ප්‍ර : කවුද එයට සහභාගි වෙන්නේ?

පි : ඒක මණ්ඩලයක් ස්වාමිනි. ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම්තුමා, අගමැතිතුමා සමහර විට අනිත් විදේශ කටයුතු ලේකම් ඒ වගේ කණ්ඩායමක් ඉන්නේ. හමුදා ප්‍රධානීන්, පොලිස්පතිතුමා වගේ කණ්ඩායම ඉන්නවා.

ප්‍ර : දැන් මෙම ආරක්ෂක මණ්ඩලයට තමයි ඔබ මෙම ඉදිරිපත් කිරීම සිදු කළේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ මෙම ඉදිරිපත් කිරීම අවස්ථා කීයකදී වගේ කළා ද කියලා මතකයක් තියෙනවද?

පි : ඒක ඉදිරිපත් කළා. ඊට පස්සේ ආරක්ෂක ලේකම්තුමා විසින් දැඩි ක්‍රියාමාර්ග ගත්තා. ඒ සම්බන්ධයෙන් හමුදා බුද්ධි සේවයට පැහැදිලි කරලා දීලා ඒගොල්ලත් එක්ක රාජකාරී කළා. ඊට පස්සේ රට රටවල්වලට පුහුණුවට යැව්වා නිලධාරීන් යවලා ඒවා අධ්‍යනයක් කළා. මොකද මේ ක්‍රියාකාරකම් පිළිබඳව අපේ පුහුණුව සහ දැනුම හැමෝටම තිබුණේ නැහැ සීමිතයි. ඒක වර්ධනය කර ගන්න විවිධ කටයුතු සිද්ධ කළා. ඒ වගේමයි ජාත්‍යන්තර බුද්ධි අංශත් එක්ක තිබිච්ච සම්බන්ධීකරණය තවදුරටත් තහවුරු කරලා ඒ ක්‍රියාකාරකම්වල නිරත වුණා.

ප්‍ර : දැන් මෙම presentation එක මෙම ඉදිරිපත් කිරීම ඔබ කළ කාල වකවානුව මතකද?

පි : මම හිතන්නේ 2012 වගේ වෙන්න ඇති. 2012 හෝ 13

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් සිටින විට ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන් සිටියේ කවුද?

පි : නියෝජ්‍ය පොලිස්පති හැටියට මම හිටියා. අධ්‍යක්ෂකවරයෙක් තව හිටියා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ SIS රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක. ඊට අමතරව ඒ අවස්ථාවේදී ත්‍රස්ත මර්ධන කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පති?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඇයි මේ සම්බන්ධතාවය. එහි සම්බන්ධතාවයක් තියෙනවාද? අවශ්‍යතාවයක් තියෙනවාද?

පි : මම ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වශයෙන් පත් වුණාම එතන නියෝජ්‍ය පොලිස්පති හැටියට කටයුතු කළා. ඒ ගමන්ම මට නියෝග ලැබුණා රාජ්‍ය බුද්ධි සේවාවෙත් අධ්‍යක්ෂක හැටියට කටයුතු කරන්න. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගජනායක මහත්මයා විශ්‍රාම ගියා.

ප්‍ර : එම කටයුත්ත එම තනතුරු දෙකම ඔබ දැරීම රාජ්‍ය බුද්ධි සේවාවේ කටයුතු සිදු කිරීමේදී පහසු වුණාද නැද්ද?

පි : පහසුවක් ස්වාමිනි.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවාව රාජකාරී කරන්නේ රහසිගත කටයුතු සියල්ලම. Covered operations රහසිගතව කටයුතු කරන්නේ. ඒකේ ඇත්තටම අපි හදා ගත්තේ රාජ්‍ය බුද්ධි සේවාවට මෙහෙයම් කටයුතු කරන්න සහ investigation arm එකක් හැටියට පාවිච්චි කළා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය. මොකද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ වෙන කොට විශාල සංඛ්‍යාවක් විමර්ශන තිබුණා බරවැඩි ඒගොල්ලොන්ට කරන්න. ඒ නිසා ඒ වගකීම අපි අරගෙන කළා.

ප්‍ර : මා ඔබට මේ අවස්ථාවේදී ලේඛන කිහිපයක් පෙන්වා සිටිනවා.

(C 4 (B)සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා.)

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ප්‍රථමයෙන් කියන්න මේ C 4 (B) තොරතුරක්ද බුද්ධි තොරතුරක්ද කියලා?

පි : මේක පැහැදිලි තොරතුරක්. මේකට මෙහෙම කියන්න ඕනේ. මේක විදේශීය බුද්ධි අංශයක් විසින් අප වෙත යොමු කරපු දෙයක් නිසා මේකේ විශ්වාසනීයත්වය අපිට ගන්න පුළුවන් ඉස්සෙල්ලා ගත්තොත් 50% ක්. මම ඉස්සෙල්ලා කිව්වා වගේ බුද්ධි තොරතුරක් වෙන්නේ තොරතුරක් හරියට විශ්ලේෂණය කරලා ඒ ගැන පරීක්ෂා කරලා තවත් තනියම නෙවේ තවත් තුන් හතර

FAIR COMMENT BY JEZEEM

දෙනෙක් ප්‍රබුද්ධයන් එක්ක සාකච්ඡා කරලා තීරණයක් ගත්තා. එහෙම කළාම මේක මම හිතන්නේ එහෙම කළා නම් මේක 100% ක් සාර්ථක බුද්ධි තොරතුරක් වෙනවා.

ප්‍ර : මෙම C 4 (B) හි පහරදීම් මරාගෙන මැරෙන ප්‍රහාරයන් ආයුධ ප්‍රහාරයක්, ට්‍රක් රථ ප්‍රහාරයක්

පි : පිහි ප්‍රහාරයක්

ප්‍ර : පිහි ප්‍රහාරයක් සිදු විය හැකි බව සඳහන් කර තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එසේම එය සිදු කළ හැකි පුද්ගලයන් වශයෙන් නම් හයක් ඇතුළත් වෙලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම නම් වලින් කීපයක් තමයි සහරාන්, රිල්වාන්, මිල්හාන් කියන නම්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මා ඔබ වෙත පෙන්වා සිටිනවා X 94 කියන ලේඛනය.

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : C 4 (B) මඟින් කියා සිටින්නේ සහරාන් ඇතුළු පුද්ගලයන් විසින් සිදු කළ හැකි මරාගෙන මැරෙන ප්‍රහාරයක් හෝ වෙනත් ප්‍රහාරයන් සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මා ප්‍රථමයෙන්ම අහන්නේ මේ X 94 කියන්නේ C 4 (B) කියන ලේඛනය පදනම් කර ගෙන සකස් කරන ලද වාර්තාවක්ද ?

පි : එයත් පදනම් කර ගෙන අපේ කාර්යාලයේ තිබිච්ච දත්තයනුත් රැස් කර ගෙන සකස් කරපු ලේඛනයක් කියලා මම විශ්වාස කරනවා ස්වාමිනි.

ප්‍ර : එම X 94 කියන්නේ බුද්ධි තොරතුරක්ද නැද්ද?

පි : මෙය බුද්ධි තොරතුරක් ස්වාමිනි.

ප්‍ර : මොන ආකාරයෙන් මෙයට වැදගත්කමක් දෙනවා නම් එහෙම නැත්නම් වටිනාකමක් දෙනවා නම් X 94 කියන්නේ කොපමණ වටිනාකමකින්, වැදගත්කමකින් යුතු බුද්ධි තොරතුරක්ද?

පි : ස්වාමිනි මම මෙහිදී තමයි මේ ලේඛනය දැක්කේ මේ මට පුදුමයි මේ වගේ තොරතුරක් C 4 (B) ලේඛනය ලැබිලා මේ වගේ සිද්ධියක් වුණා කියන එක.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියා සිටින්නේ?

පි : මොකද ඇත්තටම මං ප්‍රවෘත්තිවලින් දැක්කට මම මේක දැක්කේ නෑ මේ කොළේ. මේ වගේ තොරතුරක් ලැබුණාම මෙහෙම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කඩදාසියක් ලියලා පොලිස්පතිට ලියන නෙවෙයි වැඩේ ස්වාමිනි. මේක මගේ රාජකාරියක්. මම හිටියා නම් මම දැන ගන්න ඕනේ.

ප : ඒ කියන්නේ අධ්‍යක්ෂකවරයා වශයෙන්?

පි : අධ්‍යක්ෂකවරයා වශයෙන් මේකට කණ්ඩායම් සුදානම් කරලා සැලසුමක් හදලා ඒ වගේම දන්වන්න ඕනේ ආයත දැනුම් දීලා මේ බුද්ධි අංශය සම්බන්ධ වෙලා

ප : මොන බුද්ධි අංශද?

පි : ඉන්දියාවට. මේක අනිවාර්යෙන්ම. ඉන්දියාවේ අපේ counter part කෙනෙක් ඉන්නවා. එයත් එක්ක කතා කරලා එයත් එක්ක සම්බන්ධ වෙලා හරි නම් මේ එක්කෙනෙක් ගිහිල්ලා මේ කාලය ඇතුළත ගිහිල්ලා එතන ආපහු ඔවුන් හම්බ වෙලා ඒක තව සැරයක් විශ්ලේෂණ කරලා මේක රාජ්‍ය නායකයාගේ ඉඳලා පහළට දැනුවත් කරන්නත් ඕනේ රහසිගතව කරලා. රහසිගත operation එකක් කරලා මේ මිනිස්සු අල්ල ගන්න ඕනේ.

ප : රහසිගත මෙහෙයුමක් කරලා මේ මිනිස්සු අල්ල ගන්න ඕනේ?

පි : අල්ල ගන්න ඕනේ.

ප : ඔබට මතකයක් තියෙනවද 2018 අවුරුද්දේ දෙසැම්බර් මාසේ 23 සහ 26 දිනයන් වල මාවනැල්ල ප්‍රදේශයේ විශේෂයෙන්ම බුද්ධ ප්‍රතිමාවලට හිංසා කිරීම සම්බන්ධව?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එසේම පුත්තලමේ වනාතවිල්ලුව හිදී 2019/01/16 දින පුපුරන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සොයා ගැනීම සම්බන්ධව?

පි : එහෙමයි ස්වාමිනි.

ප : සහ 2019/04/16 වන දින කාත්තන්කුඩිය ප්‍රදේශයේදී මෝටර් සයිකලයක් පුපුරන ද්‍රව්‍ය යොදා පුපුරවා හැරීම සම්බන්ධයෙන් ඔබට වැටහීමක් තියෙනවද?

පි : එච්චර Details මතක නෑ. නමුත් මට හොඳට මතකයි මේ බුදුපිළිම කඩපු එකත් පුත්තලමේ සිද්ධියත්. අර බයිසිකලයක් පුපුරපු එකත් මට මතකයි.

ප : ඔව් බයිසිකලේ පුපුරපු එක. මා ඔබට රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද 2019/04/18 දින දරන වාර්තාව පෙන්වා සිටිනවා.

(X 95 ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.)

පි : එහෙමයි ස්වාමිනි.

ප : එසේම 2019/04/20 දිනැතිව රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිස්පතිතුමා ආමන්ත්‍රණය කරන්නට යෙදුණු ලේඛනයකුත් ඔබ වෙත මා පෙන්වා සිටිනවා. පරීක්ෂා කරලා බලන්න.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

****

දැන් වේලාව : ප.ව.08.10 යි.
මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

වේලාව: ප.ව.08.10
පෙර සටහන්:මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට:සචිනි මෙනවිය.

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

2019.04.20 දින දරණ රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා විසින් ජ්‍යෂ්ඨ නියෝජ්‍යය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව පොලිස්පති වෙත යොමු කරන ලද ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායක මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් නැමැත්තා පිළිබඳ යන ශීර්ෂයෙන් වන වාර්තාව X 111 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: X 95 කියලා ලකුණු කර තිබෙන වාර්තාවේ කුමක්ද සඳහන් වෙන්නේ කෙටියෙන්?

උ: ප්‍රථමයෙන්ම කියන්න ඕන ස්වාමීනි මේක මේ බුද්ධි අධ්‍යක්ෂකවරයෙක් ඉදිරිපත් කළ යුතු වාර්තාවන් නෙවෙයි. මේක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන නිලධාරියෙකු විසින් සපයන වාර්තාවක්. මේකේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වැරදි. මා විසින් කළ යුත්තේ බුද්ධිමය සහ ඉදිරියට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව පොලිස්පතිතුමා හෝ රාජ්‍යය නායකයා දැනුවත් කිරීම. මේක පරීක්ෂණ වාර්තාවක් තමයි මට මෙතැන පේන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙම X 95 කියන වාර්තාවේ දී බුද්ධි අධ්‍යක්ෂකවරයා කුමක්ද සඳහන් කර තිබෙන්නේ?

උ: තවත් පරීක්ෂණ කරනවයි කියලා. එහෙම කියලා හරියන්නේ නැහැනේ ස්වාමීනි. මේක පටන් ගත්තේ ආරම්භය තියෙන්නේ මෙතැන මේ මම මවිතයට පත් වෙනවා. මේකේ තියෙනවා මෙච්චර පැහැදිලි කරලා මේ මිනිස්සු මේ විස්තරයක් දීලා තියෙනවා නම් C 04B ලේඛනයේ මෙච්චර හොඳට විස්තර කර තියෙද්දී ඒකට විශ්ලේෂණයක් කරලා ජනාධිපතිතුමා හෝ ආරක්ෂක ලේකම්තුමා හෝ බුද්ධි ප්‍රධානී පොලිස්පතිතුමා හමුදාපතිතුමා ඒ අයව දැනුවත් කරන්න ඕන වේලාවේ මේ පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම කාලෝචිත නැහැ ස්වාමීනි. අනිත් එක මේකට වෙලාව මෙච්චර අරන් තියෙනවා 20 වැනිදා වෙනකන්. මේ වගේ දෙයක් කියන්න රාජ්‍යය බුද්ධි සේවාවට මෙච්චර දවස් යන්නේ නැහැ. මගේ විශ්වාසය හැටියට මේක මේ තොරතුර තමන්ට තහවුරු කරගන්න හොඳටම දවස් 03 ක් ඇති ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ මොන තොරතුරු ද?

උ: මේ මුල් තොරතුර .

ප්‍ර: C 04 B කියන?

උ: C 04 B කියන තොරතුර.

ප්‍ර: දැන් C 04 B කියන තොරතුරේ සඳහන් නොමැති නමුත් කාත්තන්කුඩි ප්‍රදේශයේ සිදු වූ මෝටර්සයිකල්වල පුපුරා හැරීම සම්බන්ධයෙන් තමයි **X 95** කියන ලේඛනයේ සඳහන් වන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: 2019.04.20 දින දරණ **X** 111 ලේඛනයේ සඳහන් වෙනව ද මාවනැල්ලේ සිදු වූ බුද්ධ ප්‍රතිමා කඩා දැමීම සමබන්ධයෙන්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කඩා දැමීම සම්බන්ධයෙන් වන ප්‍රධාන සැකකරුවෙක් හෝ සැකකරුවන්ගේ නම් සඳහන් වෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කුමක්ද සඳහන් වෙන්නේ?

උ: මාවනැල්ල සිදුවීමට සම්බන්ධ ප්‍රධාන සැකකරුවන් දෙදෙනා අතරින් මොහොමඩ් ෂහීඩ් අබ්දුල් බාල සහෝදරයා නැමැත්තා සහරාන් සමඟ රැදී සිටින බවත් සහරාන්ගේ ජාලය සම්බන්ධ පුද්ගලයන් ගම් ප්‍රදේශ වලින් පලා ගොස් සිටින (කිහිප දෙනෙක්) ෂහීඩ් ඉල්මාම් හැදුනුම්පත් අංකය තියෙනවා. නැමැත්තියට අයත් මාතලේ මරුක්කොත ප්‍රදේශයේ පිහිටි නිවසක රැඳී සිටින බවට තොරතුරු ඇත.

ප්‍ර: ඒ කියන්නේ 2018 දෙසැම්බර් මාසේ මාවනැල්ලේ සිදුවුණු ඒ බුද්ධ ප්‍රතිමා වලට හානි කිරීමේ ප්‍රධාන සැකකරු සහරාන් කියන පුද්ගලයා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සමඟ සම්බන්ධතාවයක් තිබෙන බවත් ඔවුන් එතැන රැඳී සිටින බවත් එකී වාර්තාවේ සඳහන් වෙනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: 2018 දෙසැම්බර් මාසයේ මාවනැල්ලේ සිදු වූ බුද්ධ ප්‍රතිමා හානි කිරීමේ සිද්ධියේ සැකකරුවන්ගෙන් ලැබුණු තොරතුරු මත මාවනැල්ල බුද්ධ ප්‍රතිමාවේ හානි කිරීම සහ ඊට අදාළ පුද්ගලයන් සහ 2019 ජනවාරී මාසයේ 16 වන දින සොයා ගන්නට යෙදුණු විශාල පුපුරන ද්‍රව්‍යය අතර සම්බන්ධතාවයකුත් තිබුණු බව මා ඔබට යෝජනා කරනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙන්න මෙම වාතාවරණය තුළ 2019.04.20 X 111 දරණ වාර්තාව සකස් කිරීමේ දී රාජ්‍යය බුද්ධි අධ්‍යක්ෂක විසින් C 04B කියන තොරතුරේ සඳහන් කරුණක් හෝ කරුණු සඳහන් කරලා තියෙනව ද?

ප්‍ර: ප්‍රශ්නය නැවත සැරයක්. C 04 B ගැන කියලා තියෙනව ද.

ප්‍ර: නැහැ C 04 B වල අඩංගු කරුණු ඒ කියන්නේ Suicide attack සහ ඒ කියන්නේ මරාගෙන මැරෙන ප්‍රහාරය හෝ ඊට සම්බන්ධිත කරුණු?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: **X** 111 ට අනුව පැහැදිලි වෙනව ද මාවනැල්ල බුදුපිළිම කැඩීම පුපුරන ද්‍රව්‍යය සොයා ගැනීම මෝටර්සයිකලයක් පුපුරවා හැරීම එකම කණ්ඩායමක් විසින් සිදු කර ඇති බව?

උ: ඒක කියවන එක්කෙනා තේරුම් ගන්න තමයි ලියලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර: මොකද්ද?

උ: මට නම් පුදුමයි ස්වාමීනි මේ අපිත් උගන්වපු මිනිස්සු මේ ගොල්ලන් මේ ආයතනයේ හිටියේ. ඇත්තමයි හරිම ආවේගයක් ඇති වෙනවා ස්වාමීනි. මේ වගේ මේක වටේ යන කතාවක් ඇත්ත වශයෙන්ම කියනව නම්. කතාවෙන් කියනව නම්. පොලිස්පතිතුමා දැනුවත් කරන්න ඕන මේවා නෙවෙයි ස්වාමීනි. අනිත් එක අධ්‍යක්ෂකවරයා මේකට තියන්න ඕන ක්‍රියාමාර්ගයක්. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට ලියලා තියෙනවා ලිවුමක් එයාට පරීක්ෂණය කරන්න දීලා අපි මෙහෙයුම් කටයුතු කරන්න ඕන. බුද්ධි මෙහෙයුම් කටයුතු කරන්න ඕන ඒ වගේම මෙහෙයුම් කටයුතු කරන්න ඕන. මේ මිනිස්සු අල්ල ගන්න කටයුතු කරන්න ඕන. මේ දවස් ගාණක් මෙච්චර කාලය මරලා තියෙන්නේ මොකටද කියලා මට ප්‍රශ්නයක් තියෙනවා.

ප්‍ර: ඔබගේ පිළිතුරු පැහැදිලි නැහැ.

උ: මේ වාර්තා 03 ම කියවලා බැලුවාහම බුද්ධි අධ්‍යක්ෂකවරයෙකු විසින් ඉදිරිපත් කළ යුතු බුද්ධි වාර්තාවක් නෙවෙයි මේක. මේ වාර්තා 03 නේම

FAIR COMMENT BY JEZEEM

අඩංගු කරුණු. ඒ විමර්ශන නිලධාරීයකු විසින් විමර්ශන පිළිබඳව කරන වාර්තාවක්. එතකොට මෙතුමාට ලැබිලා තිබෙනවා බුද්ධි තොරතුරක්.

ප්‍ර: ඒ කියන්නේ C 04 B ?

උ: C 04 B . ඒකට අදාළව තමයි මේ පොලිස්පතිතුමා දැනුවත් කළ යුත්තේ. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ ඒක නෙවෙයි. මෙතැන වෙලා තියෙන්නේ ඔහුගේ විමර්ශන ඔහු කරපු විමර්ශන සම්බන්ධයෙන් වාර්තාවක් දීලා ඔබතුමාට ඕන්නම් හිතා ගන්න කියලා තමයි කියලා තියෙන්නේ. මට කියන්න තියෙන්නේ එච්චරයි.

ප්‍ර: ඒ කියන්නේ බෝම්බ ගැහිල්ලක් ඕන්නම් වෙන්න පුළුවන්?

උ: මොනව වුණත් එයාට ගාණක් නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඔය **X** 111 තියෙන තොරතුරු රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක සතුව තිබුණා නම් සහ C 04 B කියන තොරතුරු ඔහු වෙත තිබුණා නම් කුමක්ද ඔහු බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් කළ යුතු වන්නේ?

උ: ඇත්ත වශයෙන්ම මේ තොරතුරු මේ ආකාරයෙන් තියෙන කොට සැලසුමක් හදන්න ඕන. ඊළඟට මේකට සම්බන්ධීකරණය කරගන්න ඕන CNI කියලා අනිත් බුද්ධි අංශ. ඊළඟට හමුදාව. STF එක TID එක CID එකට කියන්නේ නැත්නම් TID එකට කියන්න ඕන. TID එකට මේ වගේ වැඩ වලට කරන්න පුරුදු කරලා තියෙන මිනිස්සු ඉන්නේ ඒකේ ඇතුළේ. ඒ ගොල්ලන් එක්කහු වෙලා මේක මෙහෙයුමක් කරන්න ඕන. මෙහෙයුමක් නොකර මෙහෙම සටහන් ලියලා හරියන්නේ නැහැ ස්වාමීනි. පොලිස්පතිතුමා මොනව ගත්තත් පොලිස්පතිතුමා කුමන ක්‍රියාමාර්ගය ගත්තත් බුද්ධි අධ්‍යක්ෂකවරයා විසින් ඔහුගේ වගකීමක් තියෙනවා. අනිත් එක මේක පොලිස්පතිතුමාට කිය කියා ඉන්නවාට වඩා රාජ්‍යය නායකයට කියන්න ඕන. ආරක්ෂක ලේකම්ට කියන්න ඕන. මොකද මම වගකියන්නේ රාජ්‍යය නායකයාට සහ ලේකම්ට.

ප්‍ර: ඒ කියන්නේ බුද්ධි අධ්‍යක්ෂක?

උ: බුද්ධි අධ්‍යක්ෂක. පොලිස්පතිට වගකියන්න මගේ මුල් ස්ථානය නිසා. මගේ සම්පූර්ණ වගකීම තියෙන්නේ ආරක්ෂක ලේකම් සහ ජනාධිපතිවරයාට. දැන් මේ වගේ තොරතුරක් ජනාධිපතිවරයාට දැන් මේ ලැබුණේ කවදද 04 වැනිදා ලැබුණ නම් 05 වැනිදා කියන්න ඕන උදේට. අනිත් එක අපේ Daily report එකක් තියෙනවා. ඒ Daily report එකේ අපි ඒක දාන්න ඕන.

ප්‍ර: කාටද ඒ Daily report එක තියෙන්නේ?

උ: ආරක්ෂක ලේකම්තුමාටයි. ජනාධිපතිතුමාටයි.

ප්‍ර: ජනාධිපතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයා වෙත දිනපතා වාර්තාවක් සපයන බවද ඔබ කියන්නේ ?

FAIR COMMENT
BY JEZEEM

උ: එහෙමයි ස්වාමීනි මේක ලියලත් දෙනවා. කටිනුත් කියනවා. ලියලා දීපු එක යන්න වේලාව යනවා. උදේ පාන්දර අපි මේවා කියනවා.

ප්‍ර: මේවා කියන්නේ මොනවද?

උ: මේ තොරතුරු තියෙන විශේෂ දේවල් අපි සෑම දෙයක්ම කියනවා. මීට වඩා ලාභාල තොරතුරු අපි කියනවා. මේ රටේ යම්කිසි තැනක උද්ඝෝෂණයක් තියෙනව නම් ඒක පවා කියනවා.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා විමර්ශනයන් කරන්න ඕන CID එක TID එක කියලා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට. නුමත් රාජ්‍යය බුද්ධි සේවාවේ වගකීම සහ යුතුකම වෙන්නේ මෙහෙයුමක් සැලසුම් කරලා ඒක ක්‍රියාත්මක කරන්න ඕන?

උ: ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙනවා.

ප්‍ර: පැහැදිලි කරන්න මේ ඔබගේ ස්ථාවරය. මොකද්ද ඔබ මෙමගින් අදහස් කරන්නේ කියලා?

උ: දැන් මේ බුද්ධි තොරතුරු තියෙන්නේ බුද්ධි සේවාවේනේ. මේ බුද්ධි සේවාවේ තිබෙන තොරතුර මෙහෙයුමක් හැටියට ක්‍රියාත්මක කරන්න offensive වෙන්න අපි ඒ විමර්ශනය කරන මිනිස්සුන්ට ගත යුතු ක්‍රියාමාර්ග ඒ ඔපරේෂන් එක කළයුතු ක්‍රියාමාර්ග අපි අතේ තියෙන්නේ. ඒවා ඒ ගොල්ලොන්ට දැනුවත් කරන්න ඕන. ඒ නිසා ප්‍රථමයෙන්ම මේ නායකයෝ ටික එකතු කරගෙන ඒ ගොල්ලොන්ට මේ ටික briefing එකක් කරන්න presentation එකක් කරන්න ඕන. මේ presentation එක දවස් ගණන් තියෙන එකක් නෙවෙයි ස්වාමීනි. මේක පැයක් දෙකක් ඇතුළත කරන්න ඕක. රෑ 12 ට හරි රෑ 1.00 හරි කරන්න ඕන. කරලා ඒ මිනිස්සු දැනනුවත් කරලා වහාම ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන්න ඕන.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මෙම තොරතුර පොලිස් අධිකාරීවරුන්ට නියෝජ්‍යය පොලිස්පතිවරුන්ට යැවීමෙන් මෙය වළක්වා ගැනීමට හැකියාව තියෙනවද?

උ: හැකියාවක් තියෙනවා ස්වාමිනි නමුත් මේක කල් ඇතිව කියන්න ඕන ඒ මිනිස්සුන්ට. මෙච්චර කාලයක් තිබ්බා මේ කාල පරාසය තුළ මේ කටයුතු සියල්ලම කරගන්න අවකාශය තිබුණනේ. මම ඇත්තටම මම දැන ගෙන හිටියේ නැහැ මෙච්චර කාල පරාසයක මෙච්චර මන්දගාමීව මේක කරලයි කියලා.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබට පේන විදියට මෙහෙම වෙලා තියෙන්නේ අත්දැකීම් නොමැති කමද නැත්නම් පළපුරුද්ද නොමැතිකම ද නැත්නම් නොදැනුවත්කමද?

උ: එකක් ස්වාමීනි මම පුද්ගලයෙකුට හිංසා කරන්න කැමති නැහැ. මේ නිලධාරියා පළපුරුදු අඩුයි. මං ගාව හිටියේ. මගේ පුද්ගලික සහකාර හැටියට කටයුතු කළේ. නමුත් ඔහු ඒ වේලාවේ ජ්‍යෙෂ්ඨම නිලධාරියා. නමුත් ඔහුට මේ පොලිස් සේවයේ පොලිස්පති වෙනකන් යන්න පුළුවන් කාල පරාසයක් තිබෙනවා. ඔහුට මම කිව්වා එළියට ගිහිල්ලා ඉගෙන ගන්න කියලා.

ප්‍ර: මොකද්ද එළියට ගිහිල්ලා ඉගෙන ගන්න කියන්නේ?

උ: පොලිස් රාජකාරී. සාමාන්‍යය නීතිය සහ පොලිස්පති කෙනෙක් වෙනව නම් ඒ ටික දැන ගන්න ඕන කියලා. ඊගාවට ඒ මහත්මයට පොඩ්ඩක් මගේ තද බව ඇල්ලුවේ නැහැ. මං කිව්වා යන්න කියලා. ලේකම්තුමා මට කිව්වා. ලේකම්තුමා මගෙන් ඇහුවා ඇයි මෙයා යවන්නේ කියලා. මං කිව්වා මේක හේතුව කියලා. ඒ නිසා මං එයාව යැවුවා. යැවුවේ යාපනයට ගියේ. යාපනයට ගිහිල්ලා මං හිතුවා ඔහු හොඳට ඉගෙන ගනී කියලා. එතැනත් ගිහිල්ලා PA Job එක තමා කළේ.

ප්‍ර: කාගේ PA ද?

උ: DIG මහත්මයාගේ.

ප්‍ර: කවුද DIG?

උ: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා එතකොට හිටියේ. ඊට ඉස්සර වෙලා තව කවුද හිටියා. මං කණගාටු වෙනවා ස්වාමීනි මට මෙහෙම කියන්න සිදු වුණ එක ගැන.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කියන තත්ත්වය යටතේ මොහු බුද්ධි සේවා අධ්‍යක්ෂක වශයෙන් පත් වුණේ කෙසේ ද? දැන් ඔබ කිව්වා දුර්වල නිලධාරියෙක් තව වැඩ ඉගන ගන්න තියෙනවා කියලා. ඔහු බුද්ධි සේවා අධ්‍යක්ෂක වශයෙන් ඉහළම තනතුරකට එකපාරට එකවර පත් වුණේ කෙසේ ද?

උ: පසුව එයට උත්තර දෙන්නම්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අවස්ථාවේ කොමිෂන් සභාව නැවත රාත්‍රී 09.00 ට රැස් වේ.

****

FAIR COMMENT BY JEZEEM

විවේකයෙන් පසුව කොමිෂන් සභාව නැවත රැස්වේ.
වේලාව: ප.ව. 09.20
ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: දැන් ඔබ කියා සිටියා මේ **X** 111, **X** 95 කියන ලේඛන විමර්ශනයට ඉදිරිපත් කරන තොරතුරක් ලෙස තමයි ඔබ සටහන් කළේ. ඇයි ඔබ එහෙම කියන්නේ?

උ: මෙවැනි වාර්තා සාමාන්‍යයෙන් මම නම් ඉදිරිපත් කරලා නැහැ මේ ආකාරයෙන්. මේක උපදේශනාත්මකව තියෙන්න ඕන බුද්ධි තොරතුරක් වාර්තා කිරීමේදී. අනිත් එක මේ තොරතුරෙහි යම්කිසි වටිනාකමක් දෙන්න ඕන. මේ ඔක්කොම කතාව කියලා අන්තිමට තවදුරටත් කරනවයි කියලා මේක දියාරු කරලා දාලා තියෙනවා. ඉතිං මෙහෙම වාර්තා මම නම් දන්න තරමින් මං හිතන්නේ මගේ හිටපු ජ්‍යෙෂ්ඨයන් කවුරුත් කරලා නැතුව ඇති. මම දැකලත් නැහැ. මේ ඇත්තටම එහෙම ප්‍රතිපත්තියකුත් නැහැ.

ප්‍ර: උපදේශාත්මක වාර්තාවක් විය යුතුයි. මොකද්ද උපදේශාත්මක වාර්තාවක් කියන්නේ?

උ: උපදේශාත්මක වාර්තාවක් කියන්නේ දැන් අපි තමයි මේ තොරතුරු අරගෙන අනිත් නිලධාරීව දැනුවත් කරන්නේ මේකට මොකද්ද කරන්නේ කියලා. දැන් මෙතැන කරන්න දෙයක් කියලා නැහැනේ. මේවා අරෙහෙන් බැලුවා මෙහෙන් බැලුවා මේක බැලුවා මෙතැන මෙහෙම තියෙනවා මේක තියෙනවා තව දුරටත් විමර්ශනය කරනවා. ඉතිං අඩුගානේ මේ මේ මුල් තොරතුරට සම්බන්ධ කරලවත් මේක කියන්න ඕන මේ කරුණු අනුව අපි සොයා බැලුවා. ඊළඟට මේ කරුණු අනාවරණය වෙලා තියෙනවා. ඒ නිසා මේක සම්බන්ධයෙන් මේ තොරතුර සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වෙන්න ඕන. නැත්නම් තවදුරටත් සැලකිලිමත් වෙන්න ඕන ද, මොකද්ද කරන්න ඕන. ආවේක්ෂණය කරනව ද කියලා මොකක් හරි කියන්න ඕන මේ ගොල්ලොන්ට. එහෙම දෙයක් කියන්නේ නැතුව මේ විදියට කිව්වාහම මේක බලන් යන මනුස්සයාට මේකේ වටිනාකමක් නැහැ. මේක උසාවියට දෙන්න ඕන විමර්ශනයක වාර්තාවකට නම් හොඳයි.

ප්‍ර: දැන් ඔබ බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් සිටිය නම් ඔබට **X** 111 කියන වාර්තාව ඉදිරිපත් කිරීමට අවශ්‍යතාවය මතුවුණා නම් ඔබ **X** 111 ඉදිරිපත් කිරීමේ දී C 04 B දරණ විදෙස් රටකින් ලැබුණු තොරතුර ගැන සටහන් කිරීමක් කරනවාද නැද්ද?

Registrar's Copy
LAW COMMENT BY JEZEEM

උ: ඇත්ත වශයෙන් මේ C 04 B දරණ තොරතුර සම්බන්ධයෙන් මෙච්චර දිග වැල්වටාරමක් ලියන්න ඕනේ නැහැ ස්වාමීනි. කියන්න තියෙන්නේ මේ සම්බන්ධයෙන් බුද්ධි අංශ වෙත ලැබී ඇති තොරතුරු අනුව මේක ඉතාම බරපතල සිද්ධියක් වෙන්න තිබෙනවා. මේ වළක්වා ගැනීම සඳහා මෙන්න මේ ක්‍රියාමාර්ගය ගත යුතුයි කියලා යෝජනා කිරීම.

ප්‍ර: මෙන්න මේ ක්‍රියාමාර්ග ගත යුතුයි කියලා යෝජනා කරා මොනවද ඒ ක්‍රියාමාර්ග?

උ: දැන් මේක මට දීර්ඝ ලෙස විස්තර කරන්න වෙනවා ස්වාමීනි. බුද්ධි අංශ කිව්වාහම බුද්ධි අංශ මේ ලංකාව පුරාම Network එකක් තියෙනවා. ජාලයක් තියෙනවා. මේ රාජ්‍යය බුද්ධි සේවාවටත් තියෙනවා. අනිත් බුද්ධි සේවාවන්ටත් තියෙනවා. එතකොට, දැන් මේ ලියුම ගැන කියනව නම් පටන් ගත්තොතින් මේ ලියුමේ දී ඊට ඉස්සෙල්ලා. මේ ලියුම ලියන්න ඉස්සෙල්ලා අධ්‍යක්ෂකතුමා විසින් කළ යුත්තේ තමන්ගේ බුද්ධි අංශ දැනුවත් කරලා මේ ස්ථාන ටික ආවේක්ශණය කිරීම. මම දන්නේ නැහැ මේ ආවේක්ෂණයන් කරලා තියෙන්නේ මේ පුද්ගලයින් පස්සේ මිසක් මර්මස්ථාන ගැන ආවේෂණයක් කරාද කියලා මට සැකයි. මර්මස්ථාන ආවේක්ෂණයක් කරා නම් මේ ක්‍රිස්තියානි පල්ලි ඒ වගේ දේවල් ගැන ඉස්සෙල්ලා Surveillance දාලා තියෙන්න ඕන. ඒක එකක්. එතකොට ඒ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: පොඩ්ඩක් පැහැදිලි කිරීමක් කරන්නේ මර්මස්ථාන වශයෙන් ඔබ අදහස් කෙරුවේ ඔය ලේඛනය සඳහන් ස්ථානද, නැත්නම් සාමාන්‍යයෙන් මර්මස්ථාන වශයෙන් ගණන් ගන්න ඒවද?

උ: නැහැ තොරතුරේම දීලා තියෙනවනෙ මේ මර්මස්ථාන වගයක් ස්වාමීනි. ඒ මර්මස්ථාන ඉස්සෙල්ලා බලන්න ඕන. ඉතිං ඒ ඒක කරන ගමන් මේ දැන් මෙතැන කියවෙනවා මේ මඩකලපුව එහෙ මෙහෙ ගැන කියවෙනවා. නමුත් මේ වාර්තාවේ දී ඒ මඩකලපුව ගැන කියවෙන කොට මේකට අදාළව ඕන මේ පරීක්ෂණය කරන්නේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඒ කියන්නේ C 04 B අදාළව,

උ: C 04 B ට අදාළව. දෙවනුව කරන්න පුළුවන් අනිත් වැඩ ටික. දැන් මේ වේලාව වන කොට මාවනැල්ල, පුත්තලම ඔය හැම තැනම සිද්ධීන් සිද්ධ වෙලා තියෙනවා. ඒවා ගැන එයාට පූර්ව දැනුමක් තියෙනවා.

ප්‍ර: අධ්‍යක්ෂකවරයාට?

FAIR COMMENT BY JEZEEM

උ: අධ්‍යක්ෂකට සහ එම නිලධාරීන් සියළු දෙනාට. ඉතිං එහෙම තියෙද්දී මේ සියල්ලම පොලිස්පතිතුමාට කීම කාලෝචිත නැහැ ස්වාමිනි මේ තියෙන කාල පරාසය ඇතුළත.

ප්‍ර: එහෙනම් මොකද්ද පොලිස්පතිට කියන්නේ නැත්නම් කාටද කියන්නේ?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: මේ C 04 B කියන ලේඛනය මෙම කොමිෂන් සභාවට දැනට තිබෙන තොරතුරු වලට අනුව රාජ්‍යය බුද්ධි සේවාවට ලැබිලා තියෙන්නේ 2019.04.04 වැනිදා?

උ: එහෙමයි ස්වාමීනි. මං කිව්වේ ඒක තමයි 04 වැනිදා ඉඳලා 20 වැනිදා දක්වා කාලයක් තියෙනවා. දින 16 ක් තියෙනවා. ඒකට මේ සිංහල අවුරුද්ද මේ මොකද්ද තියෙන කියලා බලන එක අපේ රාජකාරිය නෙමේ. අපි පටන් ගත්තු දවසේ ඉඳන් මේකට වැඩ කරන්න ඕන. වැඩ කරනව නම් අපි නිලධාරීන් Stand by කරලා ප්‍රථමයෙන් කරන්න ඕන මේ සිද්ධිය ගැන ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කරලා ආරක්ෂක ලේකම්තුමා සමඟ බුද්ධි ප්‍රධානියාත් එක්ක රැස්වීමක් තියලා ඒ රැස්වීමට අනුව මෙහෙයුම සූදානම් කරලා මගේ plan එක එයාට කියලා ඒ ගොල්ලොත් එක්ක කතා කරලා ඒ ගොල්ලොන්ගෙන් තව Inputs අරගෙන මේක සැලසුම් කරන්න ඕන ස්වාමීනි. පොලිස්පතිතුමා කියන්නේ එක අංගයක් එතැන්දි. පොලීසිය කියන්නේ. යුධ හමුදාව තියෙනවා. තවත් බුද්ධි අංශ තියෙනවා. STF එක තියෙනවා. වැඩ කරන්න ඕන මිනිස්සු ටික TID එක තියෙනවා CID එක තියෙනවා. මේ ගොල්ලොත් එක්ක එක්කහුවෙලා මේක සැලසුමක් හදලා ඒ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා බුද්ධි වාර්තාවක් තමයි පොලිස්පතිතුමාට දෙන්න ඕන. මෙන්න මේක මෙහෙම කරන්න කියලා. එතකොට පොලිස්පතිතුමාට මම කියන වගේම බුද්ධි ප්‍රධානීන් එහෙම නැත්නම් ආරක්ෂක ලේකම්තුමා රැස්වීමක් කැඳවලා ඒක කරන්න ඕන.

ප්‍ර: X 111 අධ්‍යක්ෂකවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත පිටපත් කරලා තිබෙනවා. මේක?

උ: පිටපත් කරලා තිබෙනවා.

ප්‍ර: ඉතිං ඔබ කියන පරමාර්ථය එතැන දී ඉෂ්ඨ වන්නේ නැද්ද?

උ: මේක ලිව්ව පමණින් ඉෂ්ඨ වන්නේ නැහැනේ ස්වාමීනි. දැන් ලිව්ව පමණින් ඉෂ්ඨ වුණා නම් අද යාථාර්තයක් වෙලා නැහැනේ ඒක.

ප්‍ර: ඒ කියන්නේ පැහැදිලි නැහැ.

උ: දැන් මෙහෙම ලියලා හරියට වැඩේ කෙරුන නම් මේ මරණය සිද්ධ වෙන්නේ නැහැනේ. වැඩේ හරියට කෙරුන්නේ නැති නිසා තමයි මේ මරණය සිද්ධ වුණේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කියා සිටියා යම් යම් ආයතන ඒකරාශී කරලා සැලැස්මක් හදන්න ඕන කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ආරක්ෂක සැලැස්මක් ද සලස්සන්න ඕන?

උ: නැහැ මෙහෙයුම් සැලැස්මක් .

ප්‍ර: ඒ කියන්නේ?

උ: offensive මේව එකක් කරන්න ඕන.

ප්‍ර: ඒ සැලැස්ම හැදීමේ වගකීම සහ සැලැස්ම හදන්න ඕන කවුරුද?

උ: මේකට මූලික වෙන්න ඕන බුද්ධි අධ්‍යක්ෂකවරයා.

ප්‍ර: ඇයි ?

උ: එයාගේ අතේනේ මේ තොරතුර තියෙන්නේ. එයානේ මේ ගැන හොඳට දන්නේ. ඊළඟට මෙයා තමයි මේක තොරතුරු පැහැදිලි දැන් හිතන්නකෝ මෙතැන මේ අපි කණ්ඩායමක් ඉන්නවයි කියලා. මේකේ ඉන්නවා Director Intelligence military intelligence ඉන්නවා. Secretary defense ඉන්නවා. CNI ඉන්නවා. පොලිස්පති ඉන්නවා. එහෙම නැත්නම් පොලිස්පතිගේ අනුගාමිකයෙක් ඉන්නවා. නියෝජිතයෙක්. එහෙම නැත්නම් ඊළඟට Special branch එකේ ඉන්නවා. මේ ගොල්ලොන්ට මේක පැහැදිලි කරන්න ඕන. මොකද අපි ගාව තමයි පැහැදිලි කරන්න ඕන මේ සිද්ධියේ බරපතලකම තියෙන්නේ සහ මේ තොරතුරට අදාළව අපි කළ යුතු ක්‍රියාමාර්ග මොනවද කියලා.

ප්‍ර: මම ඔබට hypothetical question එකක් ඉදිරිපත් කරන්නම් දැන් ඔබ මේ කියන ක්‍රියාපිළිවෙල ඔබ කියා සිටින්නේ මෙම ප්‍රහාරයේ සිදු වූ නිසා ඒ සම්බන්ධයෙන් ගත හැකිව තිබූ ක්‍රියාපිළිවෙතක් තමයි ඔබ කියා සිටින්නේ?

උ: නැත ස්වාමීනි මෙය මං හිතුවා ඔබතුමා මේ විදියට අහයි කියලා මගෙන්. මේ වගේ මෙහෙයුම් අපි එකක් නෙවෙයි දෙකක් නෙවෙයි කරලා තියෙන්නේ. මේ වගේ සිද්ධීන් අපි මුහුණ දීලා තියෙනවා. එතකොට ඒක මැඩ පවත්වාගන්න අපි කරන ක්‍රමය තමයි මම කිව්වේ. මේකටත් ඒක අදාළ විය යුතුයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබගේ මතය වන්නේ දැන් මෙම තොරතුර ලැබුණයින් පස්සේ ඔබ බුද්ධි අධ්‍යක්ෂක විසින් අනිකුත් සියළුම බුද්ධි අංශ දැනුවත් කරලා ඒ කියන්නේ ආරක්ෂක කවුන්සලයේ දැනුවත් කරලා යම්කිසි මෙහෙයුමක් ක්‍රියාත්මක කළ යුතුයි කියන මතේ ද ඉන්නේ?

උ: ඒකාබද්ධ මෙහෙයුමක් කළ යුතුයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙහි තොරතුරක් ලැබුණාම මෙවැනි අනතුරක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට පමණක් පොලීසිය මගින්ම එය වළක්වා ගැනීම සඳහා පියවර ගැනීමට සම්පත් තියෙනව ද, ක්‍රියාකළ හැකිද?

උ: ක්‍රියාකළ හැකියි. හරියට කරොත් ස්වාමීනි. නමුත් මෙච්චර පහසුකම් තියෙද්දී ඇයි අපි එහෙම කරන්නේ මොකද මේකට ආරක්ෂක ලේකම් එතකොට මේ වෙලාවේ ආරක්ෂක ලේකම් එක්ක තමයි සම්බන්ධීකරණය වුණේ හැම කටයුත්තක්ම.ඉතිං එතුමාට සහ ඒ ආරක්ෂක අමාත්‍යාංශය පොලිස් අමාත්‍යාංශය තිබුණා. ඒ වෙලාවේ මං හිතන්නේ එකේ ලේකම් කෙනෙක් හිටියා. මේ ගොල්ලොත් එක්ක මට මතක නැහැ ඒකේ හිටියද නැද්ද කියලා ස්වාමීනි ඒ වෙලාවේ. ඉතිං මේක සම්බන්ධීකරණයක් අවශ්‍යයි. මොකද මේ අපිට LTTE ත්‍රස්තවාදය කාලේ මේ අපිට මේ Suicide attack අහවල් තැන තියෙනවායි මෙහෙම තියෙනවයි කියලා මෙහෙම Information ආවේ නැහැ එච්චර සරලව. ලේසියට. මේක හරි වටිනවා. ඒ අතින් බැලුවහාම. මේකේ attack එකේ Details තියෙනවා. ඉතිං මෙච්චර Details එක්ක Information එකක් ලැබිලා ඒක හරියට කළමනාකරණය කරන්නේ නැත්නම් ඒකේ මොකක් හරි වැරැද්දක් තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඔබ කියන්නේ සැලසුම සකස් කරලා ගත යුතු පියවර ඔබ යෝජනා කරලා ඉදිරිපත් කරන්නේ කාටද?

උ: CNI ජාතික බුද්ධි ප්‍රධානී. මොකද මෙතැන මගේ කාලය නම් ජාතික බුද්ධි ප්‍රධානීත් එක්ක මගේ හොඳ සම්බන්ධතාවයක් තිබුණා. එතුමත් බුද්ධි අංශ ගැන අවබෝධයක් තියෙන නිලධාරීයෙක්. ඒ වගේමයි අපේ සම්බන්ධතාවය මං හිතන්නේ මං මේ වකවානුවේ එහෙම තිබුණේ නැද්ද මං දන්නේ නැහැ. අපිට හොඳ සම්බන්ධයක් තිබුණා ජාතික බුද්ධි ප්‍රධානී, ආරක්ෂක ලේකම් , ආරක්ෂක හමුදාපතිවරු, ත්‍රිවිධ හමුදාපතිවරු , පොලිස්පති ඒ වගේම ජනාධිපති. ඉතිං මේක එතකොට ඒ සම්බන්ධීකරණය නිසා මේක සැලසුම් කරන්න ප්‍රථමයෙන් කතා කරනවා බුද්ධි ප්‍රධානීත් එක්ක. මොකද එයා ඒකට පස්සේ එයාගේ Inputs දාලා මේක හරියට සැලසුම් කරනවා. මොකද මේ Information එක අර කියන්නේ හොඳට පෝෂණය වෙච්ච තොරතුරක් හැටියට මේ තියෙන පසුබිමත් එක්ක ගන්න පුළුවන්. ඉතිං ඒ නිසා මං මේ උපකල්පනයක් කරනවා කියලා හිතන්න එපා. නමුත් මේ කරන්න පුළුවන් දෙයක්. ඉතිං ඒක නිසා බුද්ධි ප්‍රධානීත් එක්ක සම්බන්ධ වෙලා සාකච්ඡා කරලා ඊට පස්සේ ඔවුන් කාර්යාලයට ගෙන්න ගෙන කතා කරලා එක්කො එතැන්ට

FAIR COMMENT BY JEZEEM

යනවා එක්කොා මෙතැන්ට යනවා. ඒකේ කිසි ගැටළුවක් නැහැ. ඊළඟට මේ ඉන්දියාවේ counter parts ගෙන්න ගන්න පුළුවන්. ඒ ගොල්ලොන්ගේ තව තියෙන material ගන්න පුළුවන්.අරගෙන මේ සැලස්ම මං ඔබතුමාට කියන්න බැරිවුණා දැන් අපි තොරතුර විශ්ලේෂණය කරලා විශ්ලේෂණයෙන් ඊට පස්සේ කරන්නේ සැලසුමක් කරනවා. ඒක Disseminate කරන්න ඒ කියන්නේ බෙදා හැරීමට ප්‍රථමයෙන් මේක සැලසුම් කරන්න ඕනි. කාටද කියන්න ඕන කින්ද මන්ද කියලා. ඊට ප්සසේ මේ සැලසුම ක්‍රියාත්මක කිරීම තමයි අර operation arms වලට අපි කියන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: මෙම ස්වයං ඝාතකයින් පිළිබඳව බුද්ධි අංශ කරුණු විස්තරාත්මකව දැන සිටිලා තියෙනවා?ඒක ඔබ දන්නව ද?

උ: දැන් මෙතැන මං කියලා තියෙනවා.

ප්‍ර: ඔයිට අමතරව වෙනත් බුද්ධි අංශ ඔවුන්ගේ නිවෙස් පවා දැනසිට තියෙනවා. තමන් ඒක දන්නව ද?

උ: මම දන්නේ නැහැ ස්වාමීනි ඒක.

ප්‍ර: එහෙම දැන සිටලා තියෙනව නම් වෙනත් බුද්ධි අංශයක් ඔවුන් සිටින නිවාස පවා ඔවුන් 05, 06 දෙනෙක් සිටියත් එවැනි අවස්ථාවක එම බුද්ධි අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වෙනව ද?

උ: මගේ ඉතිහාසයේ මං එහෙම කරලා තියෙනවා ස්වාමීනි. විදේශීය බුද්ධි අංශයත් එක්කම ගිහිල්ලම ඒ operation කරලා තියෙනවා ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: ඒවා සාර්ථක වෙලා තියෙනව ද?

උ: සාර්ථක වෙලා තියෙනවා.

ප්‍ර: ඔබ අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් සකස් කරන සැලැස්ම ඔබ ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය ලේකම් වෙත ඔබ ඉදිරිපත් කරනව ද?

උ: ඒක ඉදිරිපත් කළ යුතු වන්නේ CNI ඒ කියන්නේ බුද්ධි ප්‍රධානීන්ට එහා යමක් අපිට සාකච්ඡා කළ යුතු නම් නමුත් දැන් මේකේ ප්‍රායෝගික පැත්ත දැන් මේ වාගේ තොරතුරක් ලැබුණාහම ඒක කිව්වහම ආරක්ෂක ලේකම්ට ආරක්ෂක ලේකම්තුමා ඒකට යුහුසුළුව මේ ගැන හොයනවා. මොකද වෙන්නේ කියලා. එතකොට මේ කරන්නේ මොකද්ද කියන එක එතුමාට අපි කිව යුතු වෙනවා. එතකොට එතුමත් ඒකට අවශ්‍ය දෙයක් සපයලා දෙනවා. ඒකයි මම අදහස් කළේ ඒ විදියට. නැත්නම් මීට වඩා සරල දෙයක් නම් ආරක්ෂක බුද්ධි ප්‍රධානීත් එක්ක කතා කරන්න පුළුවන්

FAIR COMMENT BY JEZEEM

එහෙම නැත්නම් පොලිස්පතිතුමා එක්ක කතා කරලා ඒ මෙහෙයුම සැලසුම් කරලා ඒක ක්‍රියාත්මක කරනන් පුළුවන්. ඉතිං මේකේ වටිනාකමක් තියෙනව නම් මේ වටිනාකම බැරැරුම්කම කවුරු හරි තේරුම් ගත්ත නම් ඒක ආරක්ෂක මාණ්ඩලික රැස්වීමට පවා යන්න තිබුණ දෙයක් මේක.

ප්‍ර: ඒ කියන්නේ security Council

උ: security Council එකට මොකද security Council එක 04 වැනිදා කියන්නේ කවදදා දන්නේ නැහැ. දැන් අපි හම්බු වෙනවනේ සතියෙන් සතිය. එතකොට ඊළඟ සතිය අවස්ථාව තිබුණා. security Council එක හම්බු වෙන්න.

ප්‍ර: ඒ කියන්නේ security Council එක ඔබට අනුව සතිපතා රැස් වෙන මණ්ඩලයක් ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කියා සිටියා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යය පොලිස්පති නිලන්ත ජයවර්ධන ඔබ අධ්‍යක්ෂක කාලේ ඔබගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කළා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ තවදුරටත් කියා සිටියා මෙම නිලධාරීවරයා හට ඔබ උපදෙස් දුන්නා කියාලා සාමාන්‍ය පොලිස් රාජකාරී සහ ground situation සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා field එකට යන්න කියලා ඔබ උපදෙස් දුන්න කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පසුව මෙම නිලධාරීවරයා SIS එකෙන් ඉවත් කර බව තමයි ඔබ කියා සිටියේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මගේ ප්‍රශ්නය වන්නේ දැන් ඔබ SIS එකේ රාජ්‍ය බුද්ධි සේවාවේ අවුරුදු 04 ක් පමණ එහි ප්‍රධානියා වශයෙන් සේවය කරා. දැන් මේ කාලයේ දී ඔබ රාජ්‍යය බුද්ධි සේවාවේ සේවය කරමින් සිටි නිලධාරීන් ඒ ආකාරයට රාජ්‍යය බුද්ධි සේවාවෙන් ඉවත් කිරීම සාමාන්‍යය දෙයක් ලෙස සිදු කරාද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කිය්නනේ. ඔබ රාජකාරිය භාර ගන්නට යෙදුණේ අධ්‍යක්ෂක වශයෙන් ඔබ කියා සිටියා හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කීර්ති ගජනායක මහත්මයගෙන් කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ අධ්‍යක්ෂක වශයෙන් ඇවිල්ලා ඒ අධ්‍යක්ෂක ධුරයේ රාජකාරී කිරීමේ දී අර පෙර සිටි නිලධාරීන් ඉවත් කරලා අලුතෙන් බාහිර නිලධාරීන් අරගෙන මේ රාජ්‍යය බුද්ධි සේවාව පවත්වාගෙන ගියා ද නැද්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඔබ ඇයි අලුතෙන් නිලධාරී ඒ කියන්නේ හිටපු නිලධාරීන් ඉවත් නොකර අලුත් නිලධාරීන් ඒ කියන්නේ ඒ වෙන කොට අලුත් නිලධාරීන් බඳවා ගැනීමක් සිදු නොකරන්න විශේෂ හේතුවක් තිබුණ ද?

උ: අලුත් නිලධාරීන් බඳවා ගත්තා පහළ ශ්‍රේණි වලට ස්වාමීනි.

ප්‍ර: නැහැ මං කියන්නේ රාජ්‍යය බුද්ධි සේවාවේ සිටම සේවය කරමින් සිටි ඔබ අධ්‍යක්ෂක ලෙස සේවය කරමින් සිටි පළපුරුදු නිලධාරීන් එයින් ඉවත් නොකිරීමට හේතු තිබ්බ ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඇයි ?

උ: ඔහුගේ විනය රාජකාරීය දුර්වලතාවයක් නැත්නම් ඒ සම්බන්ධයෙන් පරිණතබාවයක් තියෙන නිලධාරීයෙක් අපි එළියට යැවීම කාලෝචිත නැහැ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මේ නිලන්ත ජයවර්ධනට විශේෂ හේතුවක් තිබ්බ ද ඉවත් කරන්න?

උ: ඉවත් කිරීම නෙවෙයි ස්වාමීනි. මම දැනුම් දුන්නේ දැන් එතුමා තමයි මේ ඒ වෙලාවේ හිටපු ජ්‍යෙෂ්ඨත්වයෙන් ජ්‍යෙෂ්ඨතම පුද්ගලයා. නමුත් තව නිලධාරීන් හිටියා පළපුරුද්දෙත් වැඩි සේවයෙන් වැඩි නමුත් ඔවුන්ට ජ්‍යෙෂ්ඨත්වය නැහැ. ඒක පොලිස් දෙපාර්තමේන්තුවේ තියෙන පොඩි අඩුපාඩුවක්. ඉතිං ඒ නිසා මේ නිලධාරියාට කාලය තියෙනවා තව වැඩ කරන්න. මේ නිලධාරියාගේ යම් කිසි මං දැක්ක එයාගෙ තිබ්බිච කලබලකාරී ගතිය නිසා එයා මට කිව්වා මම යම්කිසි අවවාදයක් කරාම මම යන්නම් සර් කියලා. මං කිව්වා එහෙනම් ඔයා යන්න කියලා. යන්න කිව්වාහම මම ආරක්ෂක ලේකම්තුමාට දැනුවත් කරලා එයාව ඉවත් කරා. මොකද ආරක්ෂක SIS එක තියෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ. අපි Secondment එකක් තමයි පොලිසිය. ඒක නිසා ආරක්ෂක අමාත්‍යාංශයට ඕනම නිලධාරීයෙක් පොලිසියට ආපහු revert කරන්න පුළුවන්. යවන්න පුළුවන්. අවශ්‍ය නැත්නම්. ඉතිං ඒ නිසා ඒ මහත්මයා පොලිස්පතිතුමාට දුන්නා. පොලිස්පතිතුමා විසින් ඒ මහත්මයව මේ පොලිස් කොමිෂම විසින් යාපනයට ස්ථාන මාරු ගත කරා. ඉතිං ඒක නැතුව එයාව demotion එකක් කළේ නැහැ. එයාට කිසිම එහෙම හිංසාවක් අපි කළේ නැහැ. එයාට ඒ විදියටම ගිහිල්ලා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරියේ එතකොට හිටියේ. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හැටියට එහෙ කරන්න වෙන දෙයක් තිබුණේ නැහැ. මං හිතන්නේ මොකද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරවරයෙක් කොට්ඨාශය භාරව හිටියා. ඒ නිසා එතුමා

FAIR COMMENT BY JEZEEM

පුද්ගලික සහකාර ලෙස එතැනත් ගිහිල්ලා වැඩ කරන්න ඇති. ඊට ජ්සසේ මං හිතන්නේ මතකයි ටික කාලයක් division එකක් බැළුවා කියලා. මගේ මතකයේ හැටියට.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: දැන් ඔහු රාජ්‍යය බුද්ධි සේවාවේ ඔබ යටතේ සිටි නිලධාරීවරයෙක් ඒ තත්ත්වයෙන් නික්ම ගියාට පසු රාජ්‍යය බුද්ධි සේවාවෙන් ඔහු සහ ඔබ අතර කොයි වගේ සම්බන්ධතාවයක්ද තිබ්බේ ඔබගේ ධුරකාල තුළ?

උ: එහෙම විශේෂ සම්බන්ධතාවයක් නැහැ. සාමාන්‍යයෙන් අපේ ප්‍රතිපත්තියක් තිබෙනවා රාජ්‍යය බුද්ධි සේවාවෙන් එළියට ගියාම අපි ඒ ගැන සම්බන්ධතාවයක් තියාගන්නේ නැහැ. මම වුණත් මම විශ්‍රාම ගියාට පස්සේ මම ආපහු ඒ පැත්තට ගිහිල්ලා ඒකේ ඇගිලි ගහන්න ගියේ නැහැ. ඒක ඒ ගොල්ලොන්ට කර ගන්න දීලා පැත්තකට වෙනවා. ඒක සාමාන්‍යයෙන් discipline එකක් ස්වාමීනි.

ප්‍ර: 2015 ජනවාරී මාසයේ 16 වැනි දින ඔබ අධ්‍යක්ෂක රාජ්‍යය බුද්ධි සේවාව කියන තනතුරෙන් ඉවත් වුණාට පසුව එම තනතුරට පත් කරන්න යෙදුණේ කාවද?

උ: නිලන්ත ජයවර්ධන මහතා. නැහැ මෙහෙම කිව්වොත් හරි ස්වාමීනි. මම 2015 ජනවාරී 16 වැනිදා එවකට පත් වෙලා හිටපු ආරක්ෂක ලේකම්තුමාට ගිහිල්ලා මම කියා සිටියා. මම මෙතැනින් ඉවත් වෙනවා. සුදුස්සෙක් පත් කරන්න කියලා. ඊළඟට අනුප්‍රාප්තිකයා මට හිටියේ ඒ වෙලාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා තමයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මාසෝ. මං එයාව නම් කරලා මං ලිපියක් දීලා මම ගිහිල්ලා මගේ අනිත් ඩෙස් එකේ වාඩි වුණා. මගේ TID එක තිබුණා මම එතැන ගිහිල්ලා වාඩි වුණා. ඒ අතරතුරේ දී ඊට පසුව නිලන්ත ජයවර්ධන මහත්මයා අධ්‍යක්ෂක ධුරයට පත් වුණා.

ප්‍ර: මාසෝ මහත්මයට මොකද වුණේ?

උ: මාසෝ මහත්මයා එතැන හිටියා. එයා විශ්‍රාම යනකන්ම නමුත් එයාට අධ්‍යක්ෂක ධූරය දුන්නේ නැහැ අර මහත්මයා මෙතැන්ට පත් කරා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: මං කලින් අහපු ප්‍රශ්නයට පසු උත්තර දෙනව ද? දැන් මම අර විවේකයට ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයට කියන්න බැහැයි කිව්වනේ උත්තරයක්.

උ: ඒක දීර්ඝ විස්තරයක් කරන්න ඕන ස්වාමීනි ඒකයි.

ප්‍ර: ඒක මාධ්‍යය නැති වෙලාවක කියන්න එහෙනම්.

****

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: Mr. වාකිෂ්ඨ ඔබ දැන් මොහොතකට ප්‍රථමයෙන් ප්‍රකාශ කරා 2015 ජනවාරී මාසයේ නව ජනාධිපතිවරයෙකු පත් වුණාට පසුව ඔබ ආරක්ෂක ලේකම්ට ගිහිල්ලා කිව්වා කියලා ඔබ මෙම තනතුරෙන් යනවා වෙන සුදුස්සෙකු පත් කරන්නට කියලා. ඔබට මෙම කොමිෂමට කියන්න පුළුවන් ද රාජ්‍යය බුද්ධි සේවාව වැනි රටේ තියෙන ප්‍රධානම බුද්ධි ආයතනයක ප්‍රධානියා ඇයි එහෙම ඉල්ලා අස් වෙනවා කියලා ඔබට අලුත් ජනාධිපතිවරයෙක් පත් වුණාම ස්වාධීන පුද්ගලයෙකු ලෙස රාජකාරී කරන්න බාධාවක් තිබුණ ද, ඔබ ඇයි එහෙම ගිහිල්ලා අලුතින් පත් වූ ජනාධිපතිවරයාගේ ලේකම්ට ආරක්ෂක ලේකම්ට කිව්වෙ ඔබ යනවා වෙන කෙනෙක් පත් කරන්න කියලා. ඇයි ඒ එහෙම තත්ත්වයක් සිද්ධ වුණේ ඇයි කියලා කියන්න පුළුවන් ද?

උ: මම බුද්ධි නිලධාරීයෙක්. මම දන්නවා මට තේරුම් ගියා මට Comfortable නැහැ කියලා මේ අනිත් කණ්ඩායමත් එක්ක වැඩ කරන්න. මොකද මම රාජ්‍යය නායකයන් 07 දෙනෙක් මගේ කාල පරිච්ඡේදය තුළ මගේ සේවා කාලය තිබුණා. මේ යන ක්‍රමය හරියන්නේ නැහැ කියන එක මම තේරුම් අරගෙන තිබුණේ. ඉතිං මම හිතා ගත්තා මම ඊට වඩා සාධාරණයි. මම මෙතැනින් ඉවත් වෙලා මගේ පොලිස් රාජකාරිය මට තව එතකොට 06 මාසයයි තිබුණේ. Retire වෙන්න.මං ඒක මේ ඕන තැනක ලංකාවේ ගිහිල්ලා වැඩ කරන්නම් කියලා කරා. ඒක පොලිස්පතිතුමාටත් කියලා ලේකම්තුමාටත් කියලා තමයි මා ඉවත් වුණේ.

ප්‍ර: ඔය ආකාරයට ජනාධිපතිවරු මාරු වෙන හැම අවස්ථාවකම රාජ්‍යය බුද්ධි සේවාවේ ප්‍රධානීයා මාරුවීමේ සංස්කෘතිය කවදාද ඔය ආයතනයේ ඇති වුණේ?

උ: මං හිතන්නේ හැමදාම නායකයන් මාරුවෙන කොට සමහර වෙලාවට මාරු වෙලා තියෙනවා. ගජනායක මහත්මය නම් මාරු වුණේ නැහැ. ඒත් ගජනායක මහත්මයා නම් අධ්‍යක්ෂක හැටියට නෙමේ හිටියේ එතකොට හිටියේ. එතුමා හිටියේ මං හිතන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා විදියට. ඒක ඇවිල්ලා සම්ප්‍රදායක් නෙවෙයි . ඒක මගේ මතය. මම ගත්ත තීරණය මම මෙතනින් යනවා කියලා.

ප්‍ර: ඔබ හිතනව ද මෙසේ සිදු වීම තුළින් ඔබ හිතනවාද මේ වගේ උත්තරීතර ශ්‍රේෂ්ඨ ආයතනයක් මේ රටේ තියෙන එකම ආයතනය රාජ්‍යය බුද්ධි සේවාව. එයත් එක්තරා ආකාරයකට දේශපාලනීකරණයකට ලක් වෙලා තියෙනවා වගේ කියලා දැන් රාජ්‍යය සංස්ථාවල නම් ඇමතිවරු යන කොට පරණ අය ඔක්කොම ඉල්ලා අස්වීම් දීලා අලුතෙන් පත් කරන්න යනවා පළාත් වලින් තියෙනවා එහෙම බලතල. නමුත් ඔබ හිතනවද

FAIR COMMENT BY JEZEEM

මෙහෙම දේශපාලනීකරණයකට ලක් වෙලා කියලා මේ විශිෂ්ඨ ආයතනය?

උ: ඒක ස්වාමීනි දේශපාලනීකරණය කිරීමක් නෙවෙයි. මං ඒ පිළිතුර දෙන්නම් මගේ අනිත් අවස්ථාවේ දී පිළිතුරු දෙන්නම්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: එම ප්‍රශ්නයට මම ඔබගෙන් අහන්නේ ගරු කොමසාරිස්තුමිය අහපු ප්‍රශ්නයට වැඩිමනක් වශයෙන්. ඔබ මීට පෙර කියා සිටියා සාක්ෂි දෙන කොට ඔබ රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් සිටි කාල වකවානුවේ දී ඔබ අනිකුත් රාජ්‍යය වල තිබෙන රාජ්‍යය බුද්ධි සේවාවන් සමඟ සම්බන්ධතාවයක් පවත්වාගෙන ගියා කියලා. දැන් අධ්‍යක්ෂක රාජ්‍යය බුද්ධි සේවාව ශ්‍රී ලංකාවේ ඔබ කටයුතු කරන විට ජාත්‍යන්තරයේ තිබෙන ඒ කියන්නේ වෙනත් රටවල තිබෙන බුද්ධි අංශ වල ක්‍රියාකාරීත්වය ගැන ඔබට වැටහීමක් තිබ්බ ද?

උ: තිබ්බා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට කීමට හැකියාවක් තිබේ ද වෙනත් රටවල රාජ්‍යය නායකයා මාරුවීමේ දී බුද්ධි අංශ වල නායකයන් බුද්ධි අංශ වල ප්‍රධානීන් වෙනස් වනවාද නැද්ද කියන්න ඔබට දැනීමක් තියෙනවා ද?

උ: සාමාන්‍යයෙන් දැනීමක් තියෙනවා. සමහර රටවල වෙනස්වීම් සිදු වෙනවා.

ප්‍ර: දැන් රාජ්‍යය බුද්ධි සේවාවෙන් ඔබ ඉවත් වුණාට පසුව එම රාජ්‍යය බුද්ධි සේවාවේ සේවයක් කරපු නිලධාරීන්ගේ සංයුතිය ඒ වෙනස් වීමක් තිබුණා ද එහෙම නැත්නම් ඔබගේ සේවා කාලයේ සිටි නිලධාරීන්ම ඒ ආකරයටම තම රාජකාරීන් එකී සේවාව තුළ කරගෙන ගිය ද නැද්ද යන්න පිළිබඳව ඔබට දැනීමක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එසේ නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වශයෙන් පත් වුණාට පසුව රාජ්‍යය බුද්ධි සේවාව එතෙක් සේවය කරන්නට යෙදුණු පළපුරුදු නිලධාරියෙක් ඒ ආකාරයටම එම ආයතනයේ තව දුරටත් සේවය කරාද නැද්ද?

උ: ස්වාමීනි ප්‍රථමයෙන් කියන්න ඕන දැන් නිලන්ත ජයවර්ධන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හැටියට නෙවෙයි රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක හැටියට ප්‍රථමයෙන් පත් වුණේ. මම හිතන හැටියට ඔහු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරෙන් තමයි අධ්‍යක්ෂක වුණේ. ඊට පස්සේ තමා ඔහුගේ උසස් වීම් ලැබුණේ මගේ මත.කයේ හැටියට. කෙසේ වෙතත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යය පොලිස්පති වුණේ මේ මෑතක. එතකොට ඊළඟට මේ නිලධාරීන් මේ ව්‍යුහය ඇතුළේ හිටපු .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබගේ පිළිතුරට අතුරු ප්‍රශ්නයක් මට අහන්න ඕන නිසා ඔබගේ පිළිතුර මදකට නවත්වනවා. සාමාන්‍යය රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක තනතුරට පත් වන නිලධාරියා කුමන තුනතරකද සිටිය යුතු වන්නේ?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නියෝජ්‍යය පොලිස්පති ඒකේ ගැටළුවක් නැහැ. අර පළවෙනි ප්‍රශ්නේ පිළිතුර ස්වාමීනි මේ නිලධාරීන් අතරින් කිහිපදෙනෙක් එහෙම වෙනස් වීම වලට භාජනය වුණා. මාරු කිරීම් සිද්ධ වුණා. සමහරු විශ්‍රාම ගියා. ඉන්න බැරුව. ඒ වගේ සිද්ධීන් වුණා ඒකේ ඇතුළේ. ඒක මට පිටින් දැන ගන්න ලැබුණා ඒ නිලධාරීන්ගෙන්.

ප්‍ර: විශ්‍රාම ගියපු නිලධාරින් ඔවුන් විශ්‍රාම ගියේ තම සේවා කාලය සම්පූර්ණ වෙලා විශ්‍රාම යෑමක් ද නැත්නම් අර free mature retirement?

උ: ඔවුන්ට ඉන්න බැරි කමට ඒ ගොල්ලන් ගියේ.

ප්‍ර: ඒ කියන්නේ කොහේද ඉන්න බැරි?

උ: ඒ බුද්ධි සේවාවේ රාජකාරී කරන්න බැරි. මොකද මම දන්නවා එක නිලධාරියෙක් රාජ්‍යය බුද්ධි සේවාවටම ගත්තු නිලධාරියෙක්. ඔහු Uniform එකක් ඇඳලා නැහැ. ඔහු රාජ්‍යය බුද්ධි සේවාවේ දීර්ඝ කාලයක් සේවය කරා. කරලා ඔහු අවසානයේ දී ඔහුට තව තියෙනවා මං හිත්නනේ අවුරුදු 10 ක් විතර සේවය කරන්න. ඔහු විශ්‍රාම ගියා මෙතැන ඇති වෙච්ච ප්‍රශ්න නිසා.

ප්‍ර: දැන් එම නිලධාරියා කුමන තනතුරකින් සම්බන්ධ වෙලා විශ්‍රාම යන විට කුමන තනතුරක්ද දැරුවේ?

උ: පොලිස් අධිකාරී.

ප්‍ර: දැන් මෙසේ ඔබ කියන ආකාරයට තම සේවා කාලය අවසන් වීමට පෙර විශ්‍රාම ගියපු නිලධාරීන් සහ රාජ්‍යය බුද්ධි සේවාවෙන් ඉවත් වූ ඒ කියන්නේ අයින් වුණු නිලධාරීන් මෙම නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාව, එසේ නැත්නම් රාජ්‍යය බුද්ධි සේවාවේ කටයුතු වලදී ඔවුන්ගේ දක්ෂතාවය ඔබගේ ඇගයීමට අනුව කුමන මට්ටමකද තිබ්බේ?

උ: ස්වාමීනි මේකත් අර පස්සේ උත්තරේ දෙමු.

පසුවට උත්තර දෙන බවට ප්‍රකාශ කරමි.

ප්‍ර: බුද්ධි සේවාවක මෙවැනි ප්‍රවීණ නිලධාරීන් ඉවත්වීම එම බුද්ධි සේවාවේ දෛනික ක්‍රියාවලීන් වලට සහ බුද්ධි සේවාවේ අරමුණු කරා ගමන් කිරීමේ ක්‍රියාවලියට බලපාන්නේ කොයි ආකාරයටද කියලා ඔබට මතයක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: ඉවත් කිරීම.

ප්‍ර: නැහැ නිලධාරීන් මා කියන්නේ ඔබ කියා සිටියා පළපුරුදු නිලධාරීන් ඉවත් වුණා සමහර අය කාලයට පෙර විශ්‍රාම ගියා. මෙවැනි වැකුමයක් ඒ කියන්නේ මෙවැනි තත්ත්වයක් ඇති වූ විටක ඔබගේ මතයට අනුව බුද්ධි සේවාවක පැවැත්මට එය බලපාන්නේ කොයි ආකාරයට ද?

FAIR COMMENT BY JEZEEM

උ: ඒක ඉතා බරපතල අර vaccume එකක් කිව්ව වගේ රික්තයක් ඇති වෙනවා. ඒ නිසා ඒකේ තියෙන කාර්යක්ෂම බාවය සහ ඒකේ තියෙන වටිනාකම නැති වෙනවා. ඒකේ ප්‍රතිඵල රජයට අවශ්‍යය ප්‍රතිඵලය ලැබෙන්නේ නැති වෙනවා.

ප්‍ර: ඇයි ඒ ?

උ: පළපුරුදු නිලධාරීන්ගේ හැකියාව මත තමයි බුද්ධි සේවාව කියන එක මේ දවසින් හදන්න පුළුවන් දෙයක් නෙවෙයි. බුද්ධි නිලධාරියෙක් දවසින් ගොඩනඟන්න බැහැ. ඒක කාලාන්තරයක් තිස්සේ ඔහුව පුහුණු කරන්න ඕන. ඒකට ඒ වපසරිය හදන්න ඒ මනුස්සයාව එක විදියකට හදාගන්න ඕන. ඉතිං ඒක නිසා ඒ වගේ කෙනෙක් අඩු වුණාම තව කෙනෙක් එතැන්ට ගෙනත් දාන්න ටිකක් වෙලාව යනවා.

ප්‍ර: මා අතුරු ප්‍රශ්නයක් අහන්නම්. දැන් මේ බුද්ධි නිලධාරීන් ඒ බුද්ධි කටයුතු වලදී ඔවුන් එක්රැස් කරන කරුණු සම්බන්ධයෙන් තිබෙන අවබෝධයත් සහ ඒ සම්බන්ධයෙන් තියෙන දැනීමත් එම දැනීම මත බුද්ධි සේවාවට ලබා දෙන ඔහුගේ දායකත්වය එමගින් බලපෑමක් ඇති වෙන ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මා උදාහරණයක් ඔබගෙන් අසන්නම්. යම් නිලධාරීවරයෙකු හෝ නිලධාරීන් කිහිපදෙනෙකු මේ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් කාලයක් තිස්සේ මේක නැවතත් උපකල්පිත ප්‍රශ්නයක් . නිලධාරීන් කිහිපදෙනෙකු මේ ඉස්ලාම් අන්තවාදය සහ ඒ ක්‍රියාකාරකම් එයට සම්බන්ධ පුද්ගලයන් සම්බන්ධව කටයුතු කරන ලද නිලධාරීන් හෝ නිලධාරීන් කිහිපදෙනෙකු බුද්ධි සේවාවෙන් ඉවත් වුවහොත් එහිදී හදිසි අවස්ථාවක බුද්ධි තොරතුරක් විශ්ලේෂණය කිරීමට එහෙම නැත්නම් යම් පුද්ගලයෙකු පුද්ගල කණ්ඩායමක් සමඟ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සම්බන්ධව යම් අගතිදායක බලපෑමක් සිදු වෙන්න පුළුවන් ද? මං කියන්නේ උපකල්පිත ප්‍රශ්නයක් යම් සුවිශේෂිත වූ කරුණක් සම්බන්ධව පුහුණුව ලත් ඒ සම්බන්ධව බුද්ධිමය මෙහෙයුම් සිදු කර ඒ සම්බන්ධව තොරතුරු රැස්කරපු නිලධාරීවරයෙක් හෝ නිලධාරීන්වරු කිහිපදෙනෙක් බුද්ධි ආයතනයෙන් ඉවත් වූ අවස්ථාවකදී එම කරුණ සම්බන්ධව ක්ණිකව ලබාගත යුතු එහෙම නැත්නම් ඒ සම්බන්ධව විශ්ලේෂණය කළයුතු එහෙම නැත්නම් ඒ සම්බන්ධව තවදුරටත් විමර්ශනය කිරීමේ ක්‍රියාවලියට අගතිදායක බලපෑමක් වෙනවා ද නැද්ද?

උ: අගතිදායක කිව්වොත් වැරදි ස්වාමීනි. ඒකෙන් ප්‍රතිඵල අඩුවෙන්න පුළුවන් ස්වාමීනි. ඒ කියන්නේ ඒකේ තියෙන ප්‍රතිඵල ලබාගැනීමේ වේගය ඒකේ තියෙන ප්‍රමිතිය අඩුවෙන්න පුළුවන්. එතකොට ඒක ජාතික ආරක්ෂාවට බලපානවා. නැත්නම් ඒ සිද්ධියට අදාළ කරුණට බලපෑමක් ඇති වෙනවා. විශේෂයෙන්ම මේ මුස්ලිම් අන්තවාදය ගැන කිව්වොතින් ඒකට බොහෝම අල්පයයි අපිට හිටියේ මිනිස්සු මේ ගැන Study කරපු

FAIR COMMENT BY JEZEEM

සහ පුරුදු කරගත්ත. ඉතිං මං උදාහරණයක් ගත්තොත් ඒ මනුස්සයෙක් ඒ නිලධාරියෙක් අපි අඩු කරොත් ඒක ලොකු රික්තයක් ඇති වෙනවා එතැන.

ප්‍ර: ඔබගේ සේවා කාලය තුළ අර ඉස්ලාම් මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරපු කණ්ඩායමක් හෝ නිලධාරීවරයෙක් හිටියද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම නිලධාරීන් ඔබ රාජ්‍යය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් ඉවත් වුණාට පසු ඔවුන් එම සේවාවේ දිගටම සිටියාද නැද්ද කියන්න ඔබට වැටහීමක් තියෙනව ද?

උ: මට ඒක දන්නේ නැහැ ස්වාමීනි. ඔය විශ්‍රාම ගිය හැරුණු කොට ඇතුලේ ඔය කවුරුත් මාරු වුණාද කියන්න මම දන්නේ නැහැ ස්වාමීනි.

වේලාව: ප.ව 10.00
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.10.00
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: මම ඔබට 2019 පෙබරවාරි මාසේ 2 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානීව ආමන්ත්‍රණය කරන ලද NTJ නායක මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් විසින් සිය සමාජ ජාලා ගිණුම් ඔස්සේ අන්තවාදී මතවාද ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් වන වාර්තාව පෙන්වා සිටිනවා.

පි: ස්වාමිනි මේ ලියුමට අදාළව මට මතක් වෙනවා. අපි මේ කුරාන් ඒකේ තියෙන ඉගැන්වීම් අනුව සාමාන්‍යයෙන් මේ ලෝකයේ ඉන්නවා විවිධ පුද්ගලයන් මේක විශ්ලේෂණයක් කරලා අධ්‍යනයක් කරපු පුද්ගලයෝ. ඒ වගේ පුද්ගලයෙක් මට හමු වුණා ලංකාවේ පුද්ගලයෙක් පිටරටක ඉන්නේ. ඒ මනුස්සයා ගාව හොඳ එකතුවක් තිබුණා. ඔහු ඉතා හොඳ පැහැදිලි කිරීමක් කරා. ඉතින් ඒක මම විශේෂ රහසිගත උපදෙස් පන්තියක දී ඒක අපේ නිලධාරින්ට මේ විෂයට අදාළ නිලධාරින්ට දැනුවත් කරා. හුහාක් දුරට මේකේ තියෙන්නේ එයින් සියය ගාණක්ම තමයි මෙතන තියෙන්නේ. ඉතින්..

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: පුංචි බාධා කිරීමක්. ඔබ ඔය කියන පුද්ගලයා 2014 වර්ෂයේ දී රාජ්‍ය බුද්ධි සමඟ සම්බන්ධ වීමක් වුණා නේද?

පි: 2014 ඒ වගේ ස්වාමිනි. මේ ලිපියේ මට තේරුම් ගන්න බැරි දෙයක් තියෙනවා ස්වාමිනි. මේ ලිපිය මෙහෙම ලියන්නේ ඇයි කියලා. මේකේ කිසිම යෝජනාවක් නැහැ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා

ප්‍ර: හරි. මේ ලිපියේ දී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත දන්වලා තියෙනවා ද සහරාන් කියන පුද්ගලයා විසින් ඔහුගේ අනුගාමිකයන් වෙත ලබා දෙන ලද පණිවිඩයක්?

පි: ඔව්. මේකේ කියන්නේ ඇත්ත වශයෙන්ම Radicalize කරන හැටි කියලා තියෙන්නේ. අනුගාමිකයන්ව මනස උත්තේජනය කරන ආකාරය තමයි කියලා තියෙන්නේ.

ප්‍ර: එහි දී සහරාන් කියන පුද්ගලයා තමාගේ අනුගාමිකයන් වෙත දන්වලා තියෙනවාද ඉස්ලාම් ධර්මය පිළිනොගන්නා පුද්ගලයන්ව මරාගෙන මැරෙන ප්‍රහාර මඟින් පොදු ස්ථාන වල දී ඝාතනය කරන්න කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

එකී ලේඛනය මා X – 112 ලෙස මා ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: දැන් මේ X – 112 කියන ලේඛනයේ පැහැදිලිවම දක්වලා තිබෙන්නේ සහරාන් කියන පුද්ගලයා විසින් ඉස්ලාම් ධර්මය පිළිනොගන්නා තැනැත්තන් පොදු ස්ථාන වල දී මරාගෙන මැරෙන ප්‍රහාරයකින් ඝාතනය කරන්න කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කුමන අරමුණක් සඳහාද?

පි: ඔවුන්ගේ වහාබිසම් ඒ කියන්නේ කුරානයේ තිබෙන මේ එක්තරා විදිහක අර්ථ කතනයක් ක්‍රියාත්මක කිරීම සඳහා.

ප්‍ර: හරි. දැන් මා ඔබට කියා සිටියොත් මේ X – 112 අනුව 2019 පෙබරවාරි මාසේ 02 වෙනිදා වන විට රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා අවබෝධයක් තිබ්බා. සහරාන් කියන පුද්ගලයා විසින් පොදු ස්ථාන වල මරාගෙන මැරෙන ප්‍රහාරයන් දියත් කිරීම සඳහා තමාගේ අනුගාමිකයන් යොමු කර ඇති බව.

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මගේ ප්‍රශ්නය වන්නේ එවැනි අවබෝධයක් තිබුණු බුද්ධි නිලධාරිවරයෙක් විශේෂයෙන්ම බුද්ධි අධ්‍යක්ෂකවරයා මේ C – 4 (B) ලේඛනයෙන් මේ X – 112 දරන ලේඛනයේ කරුණු තහවුරු වෙලා තියෙනවා කිව්වොත් හරිද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එවැනි වෙලාවක දී එසේම C – 4 (B) හි සඳහන් වන්නේ ක්‍රිස්තියානි දේවස්ථාන අපිට පොදු ස්ථාන සාමාන්‍ය ජනතාව ගැවසෙන පොදු ස්ථානයක් ලෙස පිළිගන්න හැකියාවක් තිබෙනවා නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එසේම ක්‍රිස්තියානි දේවස්ථාන වලට පැමිණෙන්නේ ක්‍රිස්තු භක්තිකයන් කියන්නේ ඉස්ලාම් ධර්මය පිළිනොගන්නා කොට්ඨාශයක්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: සාමාන්‍ය බුද්ධියක් තියෙන පුද්ගලයෙකුට වඩා බුද්ධි අංශයේ ප්‍රධානියෙකුට වැටහෙන්න ඕනිද මේ තමා පෙර සඳහන් කරපු X – 112 මඟින් සඳහන් කරපු කරුණු ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවට මේ C – 4 (B) මඟින් සහරාන් පැමිණිලා තියෙන බව?

පි: එහෙමයි ස්වාමිනි. මම තව ටිකක් ඒකට එකතු කරන්නම්.

ප්‍ර: YES

පි: මට පුදුමය ස්වාමිනි මේක මෙතන පෙබරවාරි මාසේ තියෙද්දී මේ වැල්වටාරම් පොලිස්පතිට ලිව්වේ මොකද කියන එක. මේක කෙළින්ම මේ කඩදාසි දෙක එක්කහු කරලා ඒ මහත්මයා එක්කෝ මේක කියවලා නැතුව තමයි අත්සන් කරලා තියෙන්නේ. එහෙම නැත්නම්.....

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොකක් ද අත්සන් කරලා තියෙන්නේ කියවලා නැතුව?

පි: මේ අනිත් ලිපි 2. ඒ කියන්නේ X - 95 සහ X – 94 අත්සන් කරලා තියෙන්න ඕනි මේක කියවන්නේ නැතුව. මේ තොරතුරත් එක්ක මේක ගැලපෙනවා මෙච්චර ලස්සනට.

ප්‍ර: ඔබතුමා අංකනය කිරීම වැදගත් වෙනවා. අංකය?

පි: C – 4 (B) තොරතුරත් එක්ක X – 112 ලේඛනයේ තියෙන තොරතුර මනාවට ගැලපෙනවා. ඒ කියන්නේ මම අර පෙර කිව්වා වගේ තොරතුරක් ලැබුණාම ඒක කට්ටියක් එක්ක වාඩි වෙලා විශ්ලේෂණය කරලා සාකච්ඡාවට බඳුන් කරන්න ඕනි ඒගොල්ලන්. ඒ නිලධාරින් එක්ක. එහෙම දෙයක් වුණානම් මීට ඉස්සෙල්ලා මේකට මීට වඩා සාර්ථක පිළිතුරක් දෙන්න පුළුවන්. ඉතින් එක්කෝ මේක බැලුවේ නැහැ. එහෙම නැත්නම් මේ Report එක හදපු කෙනා මේක ඒකට යොමු කරේ නැති බවක් තමා මට මේකෙන් ගම්‍ය වෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු මෙන්ම මීට පෙර රාජ්‍ය බුද්ධි සේවයේ සේවයේ යෙදී සිටි සාක්ෂිකරු සමහරක් විසින් සඳහන් කිරීමට යෙදුණු පරිදි රාජ්‍ය බුද්ධි සේවාවේ Q අංශය භාරයේ පවතින ඉස්ලාම් අන්තවාදී සංවිධාන සහ/හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් කරන ලද සහ කරමින් පවතින ආවේෂණ රාජකාරී මෙන්ම සංවෘත සහ විවෘත මූලාශ්‍ර වලින් ලබාගෙන ඇති සියලුම දත්ත සටහන් කර ඇති ගොනුව සහ /හෝ ගොනු මෙම කොමිෂන් සභාවට රහස්‍ය ලේඛනයක් ලෙස ඉදිරිපත් කරන ලෙසට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වෙත කොමිෂන් සභා පනතේ 7 වෙනි වගන්තිය ප්‍රකාරව මේ අවස්ථාවේ දී නියෝග කරමි. එම ලේඛන මෙම දැන්වීම ලැබී දින 2ක් ඇතුළත කොමිෂන් සභාව වෙත රහස්‍ය ලේඛන ලෙස ලැබීමට සලස්වන ලෙසට ද නියෝග කරමි.

ඊට අමතරව වැඩි දුරටත් නියෝග කරන්නේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව විසින් පූජිත ජයසුන්දර පොලිස්පතිවරයා වෙත යවන ලද 2019.04.09 දිනැති සහ මගේ යොමු අංකය INT/IN/535/19, S1612/19 දරන ලිපියට පාදක වූ ලිපි ගොනුව හෝ ලිපි ගොනු සියල්ල එනම් ඊට ආනුශංගික හෝ යම්කිසි සම්බන්ධතාවයක් ඇති සියලු ගොනු මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු බවයි. ඒ සඳහා ඉහත කී ලිපියේ පිටපතක් ද නියෝගය සමඟ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව වෙත යවන ලෙස කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

මෙම නියෝගය මෙම කොමිෂන් සභාවේ ලේකම් විසින් එහි අඩංගු කරුණු වල රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි සීල් කර මුද්‍රා තබා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සුරක්ෂිතව අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව වෙත පුද්ගලිකවම පණිවිඩකරුවෙකු විසින් අතින් භාර දිය යුතු බවට ද නියෝග කරමි.
එසේම ඊට පිළිතුරු වශයෙන් එවනු ලබන ලේඛන රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක විසින් නියම කරනු ලබන වගකිව යුතු නිලධාරියෙකු මාර්ගයෙන් මෙම කොමිෂන් සභාවේ ලේකම් වෙත පුද්ගලිකවම අතින් භාර දිය යුතු බවට නියෝග කරමි. එසේම එම ලේඛනය රාජ්‍ය බුද්ධි සේවාවේ සිට මෙම කොමිෂමට එවන අවස්ථාවේ දී එහි රහස්‍යභාවය සුරක්ෂිත කිරීම සඳහා ගනු ලැබිය හැකි සියලු පියවර ගෙන එය කොමිෂන් සභාවේ ලේකම්ට පුද්ගලිකව භාර දිය යුතු බවද නියෝග කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: මෙම C – 4 (B) කියන තොරතුර ජාතික ආරක්ෂාවට තර්ජනයක් හෝ විය හැකි වන තොරතුරක් හැටියට ඔබ සළකනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරක් ද නැද්ද?

පි: එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තොරතුරක් හැටියට තමයි සළකන්න ඕනි ස්වාමිනි.

ප්‍ර: මෙම වතාවරණය තුළ රාජ්‍ය නායකයා කිසියම් ප්‍රදේශයක සංචාරය කිරීමට නියමිත වෙලා තිබෙන අවස්ථාවක එම සංචාරයට පෙර (ලංකාව තුළ) රාජ්‍ය නායකයාගේ ආරක්ෂාව සම්බන්ධව තක්සේරු වාර්තාවක් බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වෙතින් කැඳෙව්වොත් එම තක්සේරු වාර්තාවෙහි මේ C– 4 (B) ලේඛනය හා මාවනැල්ල බුදු පිළිම කැඩීම්, පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම් මේ සියලු කරුණුත් එක්ක ඒ ලබා දෙන වාර්තාවේ ඒ සම්බන්ධව සටහන් කරනවද නැද්ද?

පි: ඒක විශ්ලේෂණය කරලා ඉතාම සංෂිප්ත වශයෙන් ඉතාම ලස්සනට හදන්න පුළුවන්. මේ තොරතුරත් මේක හා ගැටෙන අර පෙබරවාරි ලියුමේ තියෙන කරුණු ටිකත් මේ මාවනැල්ලේ බුදුපිළිමයේ කරුණුත් සහ පුත්තලමේ කරුණුත් ඔක්කෝම එකට අරගෙන හොඳ සංෂිප්ත වාර්තාවක් මේ පිටු ගණන් ලියන්න ඕනි නැහැ ස්වාමිනි. මේක පිටු 2කට අරන් පිටුවක් ඇතුළත ලියන්න පුළුවන් තනි කොළේට මේක ලස්සනට ගළපලා ලියලා මේකේ වැදගත්කම මේකට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සඳහන් කිරීම මගේ වගකීම.

ප්‍ර: ඔබට මේ වන විට ගරු කොමිෂන් සභාවේ ලකුණු කර ඉදිරිපත් කර ඇති X–97 දරන ලේඛනය ඉදිරිපත් කර සිටිනවා. 2019.04.12 දින රාජ්‍ය නායකයාව සිටි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මඩකලපුව ප්‍රදේශයේ නිල සංචාරයක් යෑම සඳහා ඒ සම්බන්ධයෙන් වන ආරක්ෂක

FAIR COMMENT BY JEZEEM

බුද්ධි වාර්තාවක් කැඳවූ අවස්ථාවේ දී අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව තමයි ඔබ ඉදිරියේ දී තියෙන්නේ හරි?

පි: හරි.

ප්‍ර: මෙහි X – 97 (A) දරන අනු ලකුණු කිරීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කර සිටිනවා. එමඟින් සඳහන් කර තිබෙන්නේ ජනාධිපතිතුමාට ත්‍රස්තවාදී හෝ අන්තවාදී කණ්ඩායම් වලින් තර්ජනයක් විය හැකි බවට නිශ්චිත තොරතුරක් නැති බවයි නිවැරදි ද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මේ වන විට මෙම C – 4 (B) තොරතුර බුද්ධි අධ්‍යක්ෂක වෙත ලැබිලා තියෙන්නේ. එසේම X – 94ත් බුද්ධි අධ්‍යක්ෂ විසින් පිළියෙළ කර තිබෙන්නේ. එවන් පසු බිමක මෙම X – 94 දරන වාර්තාව මේ ආකාරයෙන් ඉදිරිපත් කිරීම නිවැරදි ද නැද්ද?

පි: නිවැරදි නැහැ ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ?

පි: මේ වෙලාවේ විශ්වාසනීයත්වය රඳා පවතින විදේශ බුද්ධි අංශයක් විසින් අර C – 4 (B) ලේඛනය අනුව තොරතුරක් ලබා දීලා තියෙනවා. ඊට 2019.04.12 වෙනකොට මම දන්නා තරමින් මේ සම්බන්ධයෙන් සුදුසු විශ්ලේෂණයක් කළ යුතුව තිබෙනවා. එහෙනම් බුද්ධි අධ්‍යක්ෂකවරයා හා මණ්ඩලය අතරේ යම්කිසි අවබෝධයක් තිබෙන්න ඕනි මේ තොරතුරේ බැරෑරුම්කම. මට මේකෙන් ගම්‍ය වෙන්නේ මේ තොරතුර හෑල්ලුවට ලක් කරලා ජනාධිපතිතුමා මඩකලපුවට යන ඒකේ දී මේ විදිහට සටහන් කරයි කියන එක තමයි.

ප්‍ර: ඒ කියන්නේ මොන තොරතුරද හෑල්ලුවට ලක් කරලා තියෙන්නේ?

පි: C – 4 (B)

ප්‍ර: ඔබ කියන්නේ මේ C – 4 (B) කියන විදේශ රටක බුද්ධි තොරතුර බුද්ධි සේවා අධ්‍යක්ෂක විසින් හෑල්ලුවට ලක් කර ඇති බවද?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඔබ අධ්‍යක්ෂක වශයෙන් සිටියෙනම් ඔබ මෙම ගමන යෑම සඳහා වන Clearance එක ඒ කියන්නේ නිශ්කාශණය ලබා දෙනවද නැද්ද?

පි: මෙසේ සිදුවිය යුතුයි ස්වාමිනි. දැන් මේ තොරතුර සඳහන් වෙන්නේ ආගමික සිද්ධස්ථාන සම්බන්ධයෙන්. එතකොට මෙතන වතාවරණය අනුව දේශපාලනික මතයක් මෙතන ගොඩනැඟිලා නැහැ කියලා තමයි මට හිතෙන්නේ. කරුණු 2ක් තියෙනවා. එක්කෝ මේගොල්ලන්ට මීට කළින් මෙතන Threat එකක් නැහැ කියලා අවබෝධයක් තියෙන්න ඕනි.

ප්‍ර: කාටද මේගොල්ලෝ කියලා කියන්නේ?

පි: Intelligence බුද්ධි සේවයට. එහෙම නැත්නම් මේකේ මේ සටහන යොදන්න ඕනි මම. මොකද නැත්නම් මම වැරදියි. මේ වගේ Suicide

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

attacks තියෙනවා කියලා. මොකද Suicide attack එකක් කිව්වාම මෙතන Churches වලට කියලා කිව්වාට Suicide attack එක Churches විතරක් කියලාත් හිතන්න බැහැ. එතකොට සහරාන්ගේ සැලැස්ම ගැන පෙබරවාරි මාසේ ආකල්පමය වශයෙන් තියෙනවානම් ඊළඟට මෙතන සිදුවීම් 2කුත් තිබිලා තිබෙනවානම් බුද්ධි අධ්‍යක්ෂක හැටියට මීට වඩා ගැඹුරු වාර්තාවක් දීලා ජනාධිපතිතුමා යන නොයන එක මගේ වැඩක් නෙවේ. ඒක ජනාධිපතිතුමාගේ වැඩක්. නමුත් මගේ වැඩේ මම ඒක කියන්න ඕනි. කියලා ඒකට Precautionary Action මොනවද ආරක්ෂක වැඩපිළිවෙළවල් මොනවද හරි ගස්සන ඕනි PSD එක ලව්වා. ජනාධිපති ආරක්ෂක අංශය ලව්වා කරවන්න ඕනි. මොකද ජනාධිපතිවරයාට ලංකාවේ තැනකට යන්න එපැයි කියන එක එච්චර කාලෝචිත නැහැ. මේ කියන වකවානුවේ දී. එතකොට රටේ සාමය තියෙනවා කියලා උපකල්පනයක් තිබුණානේ. ඉතින් ඒක නිසා මේකේ දී ලියන්න වටිනවා මේක. මේක ලියලා සඳහන් කළ යුතුයි. මට තියෙන ගැටලුව ඇයි එහෙම ලිව්වේ නැත්තේ කියන එක.

ප්‍ර: මෙම X – 97ත් දරන වාර්තාව ඉදිරිපත් කරලා තියෙන ආවරණ ලිපිය අත්සන කර තිබෙන්නේ අධ්‍යක්ෂක බුද්ධි රාජ්‍ය බුද්ධි..

පි: අත්සන් කරලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍ය බුද්ධි සේවාව හැටියට.

ප්‍ර: නමක් තිබේද?

පි: නිලන්ත ජයවර්ධන කියලා Seal එක ගහලා තියෙනවා ස්වාමීනි. ස්වාමීනි මේ Security Report එක Threat Assessment Report එක හදන්න වෙනම කණ්ඩායමක් ඉන්නවා. ඒ කණ්ඩායම තමයි මේක හරිගස්සන්නේ. ඉතින් ඒක හැදුවාට මේක කියවලා බලලා අඩු වැඩි දාන එක අධ්‍යක්ෂකවරයාගේ වගකීම. දැන් මේක දිහා බැලුවාම මඩකලපුවේ හාමුදුරුවෝ ගැන පිටු 1 ½ ක් විතර ලියලා තියෙනවා. සහරාන් ගැන ලියලා නැහැ එච්චර. මොකද අපි හොඳාකාරව දන්නවා මඩකලපුවේ තමයි මේකට ප්‍රශ්නයට මුල් වෙන මිනිස්සු වැඩිය ඉන්නේ කියලා. ඉතින් ප්‍රශ්නේ ඇති වුණෙත් එහේ. ඉතින් ඒක නිසා මේකේ මීට වඩා බර කරාම තමයි PSD Directorට පුළුවන් ඒකට weight එකක් ගන්න. අන්න ඒකයි මම අදහස් කරන්නේ. එහෙම ලිවිය යුතුයි කියන එක ගැන.

ප්‍ර: ඔබ කියා සිටියා නිලන්ත ජයවර්ධන ඔබගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කරා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට ඔහු විසින් යොදන අත්සන මීට කළින් දැකලා තිබේද?

පි: එහෙමයි ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොච්චර අවස්ථාවලදී ද?

පි: මේ නිලධාරියා මාත් එක්ක සෑම අවස්ථාවකම ඔහුගේ පුරුදු අත්සන මේක.

ප්‍ර: දැන් මේ ඔබට ඒ අනුව කියන්න පුළුවන්ද මෙම X – 97 දරන ලේඛනයේ තිබෙන්නේ කාගේ අත්සන ද කියලා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කාගේද ඒ අත්සන?

පි: මේ ලේඛන X – 97, X – 95, X – 94, X – 96 මගේ දැනීමේ හැටියට අත්සන් කර තිබෙන්නේ නිලන්ත ජයවර්ධන කියන වර්තමානයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා.

ප්‍ර: ඔබ අත්සන හඳුනා ගන්නවා ද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මේ වාගේ වාර්තාවක් ඉදිරිපත් කිරීමේ දී X – 97 ඇතුළු අනිකුත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේ දී නිලන්ත ජයවර්ධන කියන බුද්ධි අධ්‍යක්ෂකවරයා වෙනුවෙන් වෙනත් නිලධාරිවරයෙකුට අත්සන් කර එම ලේඛනය ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි: සම්ප්‍රදානුකූලව එහෙම අත්සන් කරන්න බැහැ. අධ්‍යක්ෂකවරයා කියලා යටින් title එක දැම්මානම් අධ්‍යක්ෂකවරයා පමණයි අත්සන් කරන්නේ. එහෙමනම් වෙනුවට තියලා ඒ අත්සන් කරන එක්කනාගේ නම යටින් සඳහන් කරන්න ඕනි ස්වාමිනි.

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර: වාකිෂ්ඨ මහත්මයා ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා හැටියට Derector හැටියට වසර 4කට ආසන්න කාලයක් සේවය කළා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබේ ළඟ හිටපු ඔබේ හොඳම ගෝලයා තමයි මේ දැනට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධුරය දරන නිලන්ත ජයවර්ධන මහත්මයා?

පි: හොඳම ගෝලයා කියන්න බැහැ ස්වාමිනි.

ප්‍ර: එහෙනම් ඔබ ඔහුව ඔබේ පුද්ගලික සහකාර හැටියට තියා ගත්තේ ඇයි?

පි: ඒ වේලාවේ ඔහු ජ්‍යෙෂ්ඨතමයා. ඒකත් මම එනකොටත් ඔහු පුද්ගලික සහකාර හැටියට කටයුතු කළේ මගේ පූර්වගාමියත් එක්ක.

ප්‍ර: නමුත් ඔහුගේ සේවය හොඳයි කියලා ඔහු කාර්යක්ෂම කියලා, ඔහු අගය කළ යුතු පුද්ගලයෙක් කියලා හිතනවානම් නේද තමන්ගේ පුද්ගලික සහකාර කර ගන්න ඕනි?

පි: ස්වාමිනි පුද්ගලික සහකාර කියන්නේ එක් වේලාවකට අපි වැඩේ ගන්න පමණයි පාවිච්චි කරන්නේ. එක්කෝ language issue එකට නැත්තම් එයාට මේ වෙන වැඩක් දෙන්න බැරි වුණාමත් කරනවා.මොකද ඒක

FAIR COMMENT — BY JEZEEM

එතනින් ඔබතුමා කියන විදිහට එහෙම ගණනය කරන්න බැහැ. ඊට වඩා දක්ෂ නිලධාරින්, පළපුරුදු නිලධාරින් ඇතුලේ හිටියා. මේ නිලධාරියා අර ජ්‍යෙෂ්ඨතම නිලධාරියා නිසාත්, ඔහුගේ කටයුතු වල ඒ කාලේ සාමාන්‍යයෙන් අධ්‍යනයක් කරලා තිබුණා. මොකද මම අද මම කණගාටු වෙනවා සාක්ෂි දෙන්න වුණාට. මගේ යටතේ හිටපු, මම කවදාකවත් මගේ නිලධාරියෙක් අමාරුවේ දාලා නැහැ. දඬුවම් කරලාත් නැහැ. ඉතින් මේ නිලධාරියා දක්ෂයෙක්. එයා හොඳ දැනුමක් තියෙන කෙනෙක්. දැනුම තිබුණාට බුද්ධිය කියන්නේ වෙන එකක් ස්වාමිනි. ඒ නිසා එයා ඒක හසුරව්වේ නැති එක තමයි මට හිතෙන්නේ ලොකුම පාඩුව.

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් මේ තනතුර දරන තැනැත්තා සාමාන්‍යයෙන් වගකියන්න ඕනි ජනාධිපතිතුමාට සහ ආරක්ෂක ලේකම්වරයාට?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මේ අපි සඳහන් කරපු ඔය C – 4 (B) ලේඛන ජනාධිපතිතුමාට හෝ ආරක්ෂක ලේකම්තුමාට යවපු බවක් හැඟෙනවාද තේරෙනවාද?

පි: මෙතන තියෙන ලේඛන වලින්නම් නැහැ ස්වාමිනි. මම දන්නේ නැහැ යැව්වාද කියලා.

ප්‍ර: ලේඛන අනුව තේරෙන්නේ නැහැනේ යවපු බවක්?

පි: මෙතන තියෙන ඒවාගෙන් නැහැ ස්වාමිනි.

ප්‍ර: එහෙනම් එවැනි ලේඛන යැව්වේ නැහැ කියලා අපිට තියෙන තොරතුරු අනුව අපිට හිතුනොත් එය නිවැරදි ක්‍රියාමාර්ගය හැටියට අපිට අනුගමනය කරලා හිතන්න පුළුවන්ද?

පි: බැහැ ස්වාමිනි. ඒක අධ්‍යක්ෂකවරයාගේ පූර්ව වගකීම මෙක මේ කාට කියන්නත් ඉස්සෙල්ලා මේක ආරක්ෂක ලේකම්තුමාට සහ බුද්ධි ප්‍රධානීටත් ජනාධිපතිතුමාටත් සැල කරන්න ඕනි. ඒක අපි දෛනිකව කරන වැඩක්. දවසේ එන තොරතුරු වලින් වැදගත් තොරතුරු උකහාගෙන අපි ඒවා කියනවා. ඒවායින් ආරක්ෂක ලේකම්තුමා මගේ හිටපු දැන් වර්තමාන ජනාධිපතිතුමාට මම ඒක අනිවාර්යෙන් කියනවා. කියලා එතුමා ඊට පස්සේ මට උපදෙස් දෙනවා මේක අරේහට කියන්න මෙහෙට කියන්න මේ වැඩේ කරමු මේ වැඩේ කරමු කියලා ඒක CNIට කියලා ඒවගේ ලොකු වැඩපිළිවෙළක් කරනවා. ඉතින් ඒවගේම තමයි ජනාධිපතිතුමා. එහෙම නැත්තම් කාට හරි අදාළනම් ඒයාට වහාම කියන්න කියනවා. ඉතින් ඒ නිසා මට තේරුම් ගන්න බැරි ඒක තමයි. මෙතන දී මෙහෙම දෙයක් වුණේ ඇයි කියලා.

ප්‍ර: දැන් අපි මෙහෙම දෙයක් හිතමු. දැන් මේ දේ කිව්වාම අහන කෙනා ගණන් ගන්නේ නැතිව හිටියා කියලා අපි හිතමු. එහෙම වුණොත් බුද්ධි අංශයේ ප්‍රධානියා හැටියට ඔබට යුතුකමක් තියෙනවා නේද මේ තොරතුරේ තියෙන වටිනාකම වැදගත්කම සහ එහි තියෙන ප්‍රබලත්වය සලකා බලලා එහෙම නෙවෙයි අපි මෙහෙම කරමු කියලා යෝජනා

FAIR COMMENT BY JEZEEM

කරලා ඒ නියෝග ලබා දිය යුතු පුද්ගලයාව මෙවැනි නියෝග ලබා දෙන්න පොළඹවන්න.

පි: උද්යෝගීමත් කරන්න ඕනි.

ප්‍ර: එහෙම කළ යුතුව තිබුණා නේද?

පි: යුතුව තිබුණා. ඇත්තටම මේ ආරක්ෂක මණ්ඩල රැස්වීම මම හිතන්නේ තියෙන්න ඇතිනේ දැන් ඊළඟට සතියේ. ඒ වෙලාවේ එතුමාට කියන්නම තිබුණානේ මේක ආරක්ෂක මණ්ඩල රැස්වීම නොතිබ්බත් CNIගේ රැස්වීම ආරක්ෂක ලේකම්ගේ රැස්වීමක් තියෙනවා අහහරුවාදාට හැම සතියේම. ඒක කියන්න පුළුවන්. ඉතින් ඒ ඔක්කෝම අතහැරුණේ මොකද කියන එක මට ප්‍රශ්නයක්.

ප්‍ර: ඒ විදිහට සළකා බලන කොට පැහැදිලිව නිශ්චිතවම අපට හැඟෙනවා නේද ඔබටත් හැඟෙනවා නේද තමන්ගේ රාජකාරිය නිසිලෙස ඉටු කිරීමට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා හැටියට නිලන්ත ජයවර්ධන මහත්මයා තමන්ගේ රාජකාරිය පැහැර හැරලා තියනවා?

පි: එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂක සෘජුවම වාර්තා කරන්නේ ජනාධිපතිවරයාට වාර්තා කිරීමට පහසුකමක් තියෙනවද කෙළින්ම කතා කරන්න පුළුවන් කමක් තිබෙනවාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය දීර්ඝ කාලයක් පවතින සිරිතක් ද ඒක?

පි: ඔව් ස්වාමිනි අපි ගාව Hot line එකක් තියෙනවා. ඒක Hot line තිබුණේ අපේ මේ cord wired තියෙන කාලයේ. දැන් අපිට mobile එකක් තියෙනවා. ඒකේ තියෙනවා මම ගාව තියෙනවා වෙනම mobile එකක්. ඒ number එක දීලා තිබෙනවා ජනාධිපතිතුමාට. ඒක එතකොට ජනාධිපතිතුමා දන්නවා මේ number එකෙන් එන්නේ මම කියලා.

ප්‍ර: ජනාධිපතිතුමා විදේශ ගත වූ අවස්ථාවක වුවත් කතා කිරීමේ හැකියාව තිබෙනවාද?

පි: ඔව් ස්වාමිනි. අපායේ ගියත් කියන්න පුළුවන්.

දැන් වේලාව: ප.ව.11.00

මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය.

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව.11.00
පෙර සටහන්:ල/ලේ නිල්මිණි කුමාරි.
මෙතැන් සිටි:ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; ජනාධිපතිවරයාට යම් කිසි දෙයක් දිවයිනෙන් බැහැරව සිටි අවස්ථාවකදී ජනාධිපතිවරයා ට මුලින්ම දන්නවා සිටිමේ කාර්ය බාර්ය කාටද තියෙන්නෙ?

පි: දැන් මේ වගේ ආරක්ෂක ප්‍රශ්නයක් නම් අනිවාර්යෙන් කියන්න ඕනේ ස්වාමිනි. දැන් හිතන්නකෝ ජනාධිපතිතුමා කොහේ හරි වැඩකට නිරත වෙලා පිටරටකට ගිහිල්ලා රැස්වීමක හිටියත් ඒයාගේ PSO ඉන්නවා. එයාට එක්කෙනෙක් ඉන්නවා පණිවිඩ ගන්න. එයාට කියලා කියන්න පුළුවන් මට හදිසි පණිවිඩයක් තියෙනවා වහාම මාව contact කරන්න කියලා. එතකොට ඒයා ඒ රැස්වීමෙන් එළියට ඇවිල්ලා හරි දැන් අපි හිතමුකෝ ස්වාමිනි මේ යූ.එන් එකේ රැස්වීමකට ගියත් එළියට එන්න පුළුවන්නේ එහෙම බැරිකමක් නැනේ ස්වාමිනි.

ප්‍ර; දැන් මෙම කාල සීමාවේදී එවැනි දැනුම් දීමක් බුද්ධි අධ්‍යක්ෂක විසින් නොකිරීමට හේතුවක් ඔබට කියන්න පුළුවන්ද ඇයි මෙහෙම කරේ නොකරේ කියලා දැනුම් දීමක්?

පි; මට නම් තේරෙන්නේ නැහැ ස්වාමිනි ඇයි කියලා.

ප්‍ර: දැනුම් දුන්නා නම් දැනුම් නොදීමක් කරේ මොකද?

පි: ඒක තමයි ප්‍රශ්නේ ස්වාමිනි. මටත් ප්‍රශ්නයක් ඒක මේක සාමාන්‍යයෙන් අපේ මේ බුද්ධි අධ්‍යක්ෂකවරු දැන් හිටියා මං හිතන්නේ 12,15 ක් මේ සුදු මිනිස්සුන් ගේ කාලේ ඉඳලාම ඒ හැමෝම එකම ක්‍රමවේදයක් අනුගමනය කරා ඒක discipline එකක් තිබුණා.

ප්‍ර: මෙවැනි තොරතුරක් බුද්ධි අධ්‍යක්ෂක විසින් අගමැතිවරයාට ලබා දෙන අවස්ථාත් තියෙනවාද?

පි: එහෙමයි.මට කියන්න පුළුවන් ස්වාමිනි. මට දැන් මෙහෙමයි අගමැතිතුමාත් ඇවිල්ලා ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී සමාජිකයෙක් අගමැතිතුමාට දැන් ජනාධිපති තුමා දැන් ලංකාවේ නැත්නම් අගමැතිතුමාට කියන්න ඕනේ.

ප්‍ර: ඒ අගමැතිතුමාට දන්නාවා සිටිමේ බාධාවක් තියෙන්...?

පි: නෑ ස්වාමිනි.

ප්‍ර: අවහිරතාවයක් නැහැ ?

පි: නෑ ස්වාමිනි.දැන් මගේ ප්‍රායෝගික පුරුද්ද මම දැන් මේ වගේ දෙයක් ආරක්ෂක ලේකම්ට හෝ ජනාධිපතිතුමාට කියන්න කිව්වාම සමහර විට relevant minister ට මට කියන්න කියලා එක්කෝ මං කෝල් එකක්

FAIR COMMENT BY JEZEEM

අරන් හරි එහෙම නැත්නම් ළඟට ගිහිල්ලා හරි කියනවා. කියලා ඒ ප්‍රශ්නේට උත්තරයක් හදාගෙන තමයි ඊළඟ පියවරට යන්නේ.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: MR වාකිෂ්ඨ ඔබ ප්‍රකාශයේදී සඳහන් කරලා තියෙනවා මේ රාජ්‍ය බුද්ධි සේවාව කියන ආයතනය එක්තරා අවදියකදි National Intelligence Bureau කියලා තමයි තිබුණේ කියලා?

පි; එහෙමයි.

ප්‍ර: එතකොට National Intelligence Bureau එක පොලිස් ආඥා පනත යටතේ ඒ ස්ථාපිතව ඒ පොලිස් දෙපාර්තමෙන්තුව යටතේ තිබුණ ආයතනයක්ද?

පි: ස්වාමිනි දැන් මේක ආරම්භයේ ඉදලාම පොලිස් ආයතනයක් හැටියට තමයි තිබුණේ නමුත් National Intelligence Bureau ආවේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේදී අපේ ඇතලත් මුදලි මහත්මයා ආරක්ෂක ලේකම් හැටියට ඉන්න කාලයේදී.

ප්‍ර: ආරක්ෂක ඇමති?

පි: ආරක්ෂක ඇමති ඉන්න කාලේ ඒ කාලයේ National Intelligence හැදුවේ අර ඒ කාලේ තිබිච්ච අවශ්‍යතාවයට අනුව කලෝචිතයි කියලා බුද්ධි අංශ එක්කාහු කරා මොකද ඒ වෙනකම් හමුදාවේ බුද්ධි අංශයක් තිබුණේ නැහැ බුද්ධි අංශ ක්‍රියාත්මක වුනේ අර හමුදාවට ආවේණික කටයුතුවලට පමණයි ඉතින් හමුදාවටත් අවශ්‍යවුනා බුද්ධි රාජකාරිය ඉගෙන ගන්න ඒ කාලයේ හිටපු නිලධාරීන් ඒ නිසා ඒක පුහුණු කරලා බුද්ධි නිලධාරීන් හැටියට බඳව ගත්තා ඒ එක්කෙනෙක් තමයි සාක්ෂි දෙන්න එන්න හිතාගෙන ඉන්න හෙන්දවිතාරණ මහත්මයාත් ඒ කාලේ අපිත් ඒ කාලේ හිටපු කටයුතු කරපු නිලධාරියෙක්.

ප්‍ර: මම ඔබගෙන් විශේෂයෙන් අහන්න කැමති දැනගන්නට මේ National Intelligence Bureau කියන එක පොලිස් ආඥා පනතේ තියෙන මොකක් හරි නෛතික රාමුවක් තුලද ඒ යුගයේදී ආරම්භ වුනේ කියලා ගැසට් නිවේදනයක් මගින් එවැනි ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේනේ පොඩි ආයතනයක් හැටියට තිබුණේ යුනිට් එකක් වගේ?

පි: ඒක පෝෂණය කරා විතරයි මෙතනින් කරේ ස්වාමිනි ඒ National කියන්නේ Intelligence Bureau එක හැදුවේ මේක තව ටිකක් පෝෂණය කරන්න නමුත් ඒක පොලිස් පනතින් තියෙන වරප්‍රසාද අනුව සහ අනිකුත් පනත් එක්ක එකකහු කරගෙන තමයි මේක කරේ ඉතින් ඒක නිසා ඒ වෙලාවේත් NIB එකේ ඩිරෙක්ටර් වුනේ පොලිස් නිලධාරීයෙක් ඒක බහුතරයක් හිටියේ පොලිස් නිලධාරීන් අර

FAIR COMMENT BY JEZEEM

combination එක හදාගන්න ඕන හින්දාත් අර මේක හරියට co-ordinate වෙන්න ඕන හින්දාත් යුධ හමුදාව නාවික හමුදාව ගුවන් හමුදාව වගේ නිලධාරීනුත් තවත් සිවිල් නිලධාරිනුත් එක්කහු කර ගන්නවා.

ප්‍ර; එකතු කරලා NIB නේවි එකෙනුත් වැඩ කරා පොලිස් නිලධාරිනු විතරක් නෙවේ?

පි; නෙවේ ක්‍රියාත්මක වුනා ව්‍යුහය ඇතුලත තියෙන සම්ප්‍රදායනුකූල සහ විනය ගරුක ක්‍රියාකාරකම් ඔක්කෝම අර පරණ තිබිච්ච දේවල් .

ප්‍ර; එතකොට අර NIB එකේ ප්‍රධානියා වාර්තා කලේ පොලිස් පතිටද නැත්නම් කෙලින්ම ජනාධිපතිටත් හෝ ඒ යුගයේදී හෝ වාර්තා කරනවාද?

පි: ඒ යුගයේ දී තමයි මේක ආරක්ෂක අමාත්‍යාංශයට සම්බන්ධ වුනේ.

ප්‍ර: මොකක්ද?

පි: මේ NIB එක.

ප්‍ර: කොයි යුගයේදීද ?

පි; ඒ කියන්නේ NIB එක හැදුනාම තමයි NIB එකෙන් තමයි ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ක මේ Intelligence මේවා එක සම්බන්ධ වුනේ .

ප්‍ර ආරම්භවුනේ?

පි: එතකම් පොලිසිය එක්ක තමයි ඇති වුනේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ වගේ තිබුණේ ඒ කාලය වෙනකම්ම ඒ කියන්නේ Special Branch එකයි ISD එකයි ඒ දෙකේම තියෙන කොට තිබුණේ පොලිසිය පොලිස්පතිත් එක්ක ගනුදෙන් ඇතිවුනේ පොලිස්පති තමයි සන්නිවේදනය කරේ ඉතින් නමුත් ඒ වෙලාවේත් රජයේ රාජ්‍ය නායකයාට බොහොම විශ්වාසනිය පුද්ගලයා තමයි මේකේ අධ්‍යක්ෂක වෙන්නේ.

ප්‍ර: NIB එකේ.?

පි: එහෙමයි Special Branch එක ISD එක NIB එක එහෙමයි දිගට ආවේ.

ප්‍ර; එතකොට NIB එකත් තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ටද වාර්තා කරේ NIB ප්‍රධානියා?

පි; NIB එකට වාර්තා කරේ එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ප්‍රධානියා වාර්තා කරෙත් එහෙමයි?

පි: එහෙමයි. එදා ඉදලා තමයි මේක ආරක්ෂක අමාත්‍යාංශයත් සමඟ සම්බන්ධ වුනේ මොකද අපිට තිබුණා ඒ කාලයේ මේ වැටුප් සම්බන්ධ ප්‍රශ්න පොලිස් දෙපාර්තමෙන්තුවක්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ වැටුප් සම්බන්ධයෙන් නිලධාරින්ට ලැබෙනවා මදී මේ ක විශේෂිත

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රාජකාරියක් හැටියට special Allowance එකක් දුන්නා ඒක දෙන්න පුළුවන් වුනේ අමාත්‍යාංශයේ budget එකෙන්'

ප්‍ර: එතකොට රාජ්‍ය බුද්ධි සේවාව කියන ආයතන කවදද ඇතිවුනේ NIB එක රාජ්‍ය බුද්ධිසේවාවේ ?

පි: NIB එකෙන් පස්සේ DII කියලා ආවා directorate of Internal intelligence කියලා. ඒක Directorate of external intelligence කියලා දෙකකට කැඩුනා එතකොට මම සහකාර අධ්‍යක්ෂකවරයෙක් හැටියට හිටියා එහෙම ඇවිල්ලා ඒකත් සාර්ථක නැති නිසා තමයි SIS කියලා හැදුනේ ගජනායක මහත්මයාගේ කාලේ.

ප්‍ර; ඔබ බුද්ධි තොරතුරක් නම් උත්තර නොදුන්නාට කමක් නැහැ රාජ්‍ය බුද්ධි සේවාවේ වර්තමානයේදී කොච්චරයක් ඉන්නවාද සමස්ථ කාර්ය මණ්ඩලය?

පි: දැන් කෝච්චර ඉන්නවාද කියලා මට.

ප්‍ර: ඔබ හිටපු කාලේ අධ්‍යක්ෂක ලෙස ?

පි; නිත්‍ය නිලධාරින් 1500 ක් විතර හිටියා.

ප්‍ර: ඒ කියන්නේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ සහ පිට කාර්යාල වල?

පි: එහෙමයි.මොකද ඊට අමතරව ඉන්නවා DIB කියලා තියෙනවා අපේ පොලිස් කොට්ඨාශවලට අනුයුක්ත වෙලා පොලිස් අධිකාරිවරයාගේ යටතේ ඉන්නේ නමුත් සම්පූර්ණ රාජකාරි කරන්නේ අපිත් එක්ක එහෙම කණ්ඩායමකුත් හැම දිස්ත්‍රික්කයකම හිටියා පොලිස් කොට්ඨාශ 22 ම

ප්‍ර: සාමාන්‍යයෙන්ම බුද්ධි තොරතුරු පිළිබඳව කටයුතු කරන ආයතනයකට විවිධ ජනවර්ග වලට අයත් නිලධාරීන් සේවය කල යුතුයිනේ ?

පි; එහෙමයි.

ප්‍ර: දැන් ප්‍රධාන කාර්යාලයේ ජනවර්ග අනුව සිංහල දෙමළ,දෙමළ කිව්වාම මුස්ලිම් අයත් ඇතුලත්ව කී දෙනෙක් වගේ ඉන්නවාද ප්‍රධාන කාර්යාලයේ.

පි: ප්‍රධාන කාර්යාලයේ ඇත්තටම සෑහෙන ප්‍රමාණයක් හිටියා මොකද අපිට යුද්ධ වෙලාවේ භාෂා ප්‍රශ්නේ තිබුණා ඒ නිසා අපි හුගක්ම පාවිච්චි කරේ දෙමළ කතා කරන්න පුළුවන් නිලධාරීන් ඉතින් ඒ වගේ බිහි වෙච්ච නිලධාරීන් ගොඩාක් ඉන්නවා හොඳ නිලධාරීන් විශ්වාසවන්ත ඒ ගොල්ලන් තාමත් ඉන්නවා ඒ විදියට ඒ කියන්නේ මේ අංශය කියන්නේ මේක විනය ගරු ස්වයං විනයක් තියෙන්න ඕන නිලධාරීන් තමයි මේකේ ඇතුලේ ඉන්න ඕනේ මේකට යුනිෆෝම් දීලා චාර්ජ් ෂීට් දීලා මේ punishment දීලා හදාගන්න නිලධාරීන් නෙමේ මේකට ස්වයං විනයක් තියෙන නිලධාරින් මොකද සිවිල් ඇදුම් රාජකාරි කරන්නේ ඒ ගෝල්ලන් ගිය තැන ආව තැන හොයන්නේ නැහැ. ඉතින් ඒක නිසා

FAIR COMMENT BY JEZEEM

මේක බොහෝම විශේෂිත අංශයක් ඒකම තමයි ඉස්සර Special Branch කියලා අපිට කිව්වේ ඒ විශේෂ කාර්යංශය කියලා ඉතින් ඒ නිසා මේ නිලධාරීන් ජාති වර්ගය භාෂාව ගැන අපි සැලකිලිමත් වෙන්නේ නැහැ ඔහුගේ කර්යක්ෂමතාවය ගැන තමයි අපි සැලකිලිමත් වෙන්නේ

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසන් වශයෙන් දුන් උත්තරය මාධ්‍යයෙන් ප්‍රසිද්ධ කරන්න එපා

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කෙරුවා 2011 ඉදලා 2015 කාල සීමාව තුලදී ආගමික අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් ඉස්ලාම් ආගමික අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාවට තොරතුරු ලැබුණා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම කාල සීමාව තුල එවැනි ක්‍රියාකාරකම්වල යෙදුනු කණ්ඩායම්වල නම් ඔබට මතක තිබෙනවාද?

පි: NTJ එක තවුහිද් ජමාත් එක ස්වාමිනි ප්‍රධාන එක තවුහිද් ජමාත් එක එකෙ වර්ගවලට බෙදුනා තවුහිද් ජමාත් ජමෙයිතුල් උලමා මුස්ලිම් JM ඊළඟට ඔල් සිලෝන් තබ්ලික් ජමාත්, තර්පික් ජමාත් අහමදියා මුස්ලිම් ජමාත්, ආමර් සුමතුල් මොහිදියා, කියලා එකක් තිබුණා ඊළඟට ශ්‍රී ලංකා නැෂනල් තවුහිද් ජමාත්, නැෂල් තවුහිද් ජමාත්, ඔය වගේ අංශ තිබුණා ඒවා කොළඹත් තිබුණා පිටත් තිබුණා.

ප්‍ර: ජමාතේ ඉස්ලාමිය සංවිධාන සම්බන්ධයෙන් ඔබගේ අවධානය ඒ කාල සීමාව ඒ කාලයේදී යොමු වුනාද?

පි; ජමාතේ ඉස්ලාමිය එකක් තිබුණා මේ ඒ කියන්නේ වහබිසම් එකේ උඩින්ම හිටපු කට්ටිය .

ප්‍ර: වහබිසම් එකේ උඩින්ම හිටියේ ජමාතේ ඉස්ලාමිය?

පි: ජමාතියා ඉස්ලාමිය

ප්‍ර; ඔබට මතකද එම සංවිධානය පිළිබඳ මොනවාහරි තොරතුරු ඔබට මතකද කොයි කාලයේද ආරම්භ කෙරුවේ මොකක්ද ඔවුන්ගේ?

පි: ඇත්තටම ස්වාමිනි මම මේකේ පොතක් ගහලා ඇති මේකේ සම්පූර්ණ විස්තර දාලා තියෙන එකක් booklet එකක් හදලා තියෙනවා.

ප්‍ර: කොහේද තියෙන්නේ ඒ පොත් ?

පි; එහේ තියෙනවා. SIS එකේ තියෙනවා ස්වාමිනි.

ප්‍ර: කාගේ භාරේද එකේ දත්ත ගබඩාවේද තියෙන්නේ?

පි: එහෙමයි.

ප්‍ර; ඒ පොතේ නම මොකක්ද?

FAIR COMMENT BY JEZEEM

පි: ඒක මුස්ලිම් අන්තවාදය හෝ IS නැහැ මුස්ලිම් අන්තවාදය.

ප්‍ර; මුස්ලිම් අන්තවාද,ඒ කියන්නේ ඔබ කතෘ වශයෙන් සඳහන් කරලා ද ඒ පොත තියෙන්නේ?

පි; නෑ ස්වාමිනි ඒක අපි හැදුවා අපි ඔක්කෝම කලෙක්ෂන් එකක් හදලා මේක DMI ට දුන්නා එදා මං presentation කරන කොට ඒක ඉදිරිපත් කරා.

ප්‍ර එදා කියන්නේ කවද්ද?

පි; මම දැන් මෙතන සාක්ෂි දුන්නා 2012 හෝ 2013 මම ආරක්ෂක කවුන්සිලයට මේ කරුණු ඉදිරිපත් කරා මේකේ තියෙන වටපිටාව .

ප්‍ර: දැන් ඔබ කියපු පොත කොහේද තියෙන්නේ?

පි: ඒක අපේ රාජ්‍ය බුද්ධි සේවාවේ රෙජිස්ට්‍රරයේ තියෙන්න ඕනේ ස්වාමිනි.

ප්‍ර; ඒක හදුනා ගැනීමේ යම් කිසි ?

පි; නැහැ ඒ ගොල්ලන් දන්නවා කිව්ව ගමන්

ප්‍ර: මොනවා කියල ද ඉල්ලන්නේ?

පි: මේක ඒ කාලේ දාපු මේ presentation එක කිව්වානම් ස්වාමිනි.

ප්‍ර: ඔබ විසින් දාපු ?

පි; මම කියන්නේ පුද්ගලිකව නෑ අපි ඔක්කෝම එක්කහු වෙලා එක collection එකක් තමයි ස්වාමිනි.

ප්‍ර: කොයි කාලේ කියලාද කියන්නේ?

පි: 2012 වගේ මට මතක තියෙන්නේ

ප්‍ර: එකෙන් presentation එකකට නමක් දුන්නාද?

පි: මං හිතන්නේ අර හලාල් ප්‍රශ්නේ ආවානේ ඒ වගේ ඒ කාලේ පටන් ගත්තේ ඉස්සර ප්‍රසිද්ධ වෙන්න මේ ගොල්ලන් ක්‍රියාකාරකම් මෙතන හලාල් එකෙන් වගේ ඒ කාලේ තමයි මේක ප්‍රසිද්ධ කරේ පැහැදිලි කරලා දුන්නේ ඒකේ තියෙන ලංකාව ඇතුලත තියෙන ක්‍රියාකාරකම්.

ප්‍ර: එතකොට මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් ඔබ විසින් ඔබගේ කණ්ඩායම විසින් කරන්නට යෙදුනු ඉදිරිපත් කිරීම කියලා කිව්වොත් නිවැරදිද?

පි: එහෙමයි.

මේ අවස්ථාවේදී රාජ්‍ය බුද්ධි සේවාවේ දත්ත ගබඩාවේ තිබිය යුතුයැයි කිලා පවසන මුස්ලිම් අන්තවාද සම්බන්ධයෙන් සකස් කරන ලද පිළිගැන්වීම ඔහු මෙම සාක්ෂිකර පවසන පරිදි ආරක්ෂක මණ්ඩලයට කරන ලද පිළිගැන්වීමක් බවත් එම පිළිගැන්වීමේ ඇතුලත් පිළිගැන්වීමේ පිටපතක් මෙම කොමිෂන් සභාවට ලබා දෙන ලෙසට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වෙත කොමිෂන් සභාපනතේ 07 වගන්තිය යටතේ නියෝග කරමි. එය රහස්‍ය ලේඛනයක් ලෙස .

ප්‍ර: ඔබ පාවිච්චි කරපු රහස්‍ය වචනය මොකක්ද?

FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමිනි ඒක රහස්‍ය කියන්න ඕනේ නැහැ ඒකට ඒක සාමාන්‍යයෙන් මෙහෙට රහස්‍ය ලේඛනයක් හැටියට ගෙන්නුවාට කමක් නැහැ. වගකියයුතු ලේඛනයක්.
රහස්‍ය ලේඛනයක් ලෙස වගකිවයුතු නිලධාරියෙක් මාර්ගයෙන් කොමිෂන් සභාවේ ලේකම්ට ලැබිය යුතු බවට නියෝග කරමි.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් වෙනුන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාට අවශ්‍යදැයි විමසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි අවසර ලබා දෙනවා.

****

<u>පල්ලිය වෙනුවෙන් ජනාධිපති නීතිඥ ශ්‍රීමල් පෙරේරා මහතා</u>

ප්‍ර සාක්ෂිකරු තමා ජාතික බුද්ධිසේවයේ කරන අවස්ථාවේදී මුස්ලිම් අන්තවාදීන් විසින් කතෝලික බැතිමතුන්ට විරුද්ධව යම් යම් ක්‍රියාකාරකම් ගැන තමාට දැන ගන්න ලැබුණාද?

පි: මුස්ලිම් අන්තවාදී ප්‍රතිපත්තිය මුස්ලිම් ආගම අදහන්නේ නැති සියලු දෙනාම එක්කෝ මුස්ලිම් වෙන්න ඕනේ එහෙම නැත්නම් මරන්න ඕනේ.ඒක තමයි තියරි එක එකේ.

ප්‍ර: තමාට දැනගන්න ලැබුණාද ඒ කාලේ තමා සේවය කරන කාලේ කතෝලික බැතිමතුන්ට විශේෂයෙන් යම් යම් ක්‍රියාකාරකම් ගැන ?

පි: කතෝලික කියලා නෙමේ අනෙක් සියලු ආගම් එකේ ලියලා තියෙන්නෙත් එහෙමයි සියලු ඇදහුම්කරන කට්ටිය සියලු දෙනාම මුස්ලිම් නොවන සියළු දෙනාම.

මේ අවස්ථාවේදී වෙනත් ප්‍රශ්න නොමැති බව දන්නවයි මෙම සාක්ෂිකරුගෙන් තවත් ප්‍රශ්න ඇසීමට අවශ්‍ය හෙයිනුත් ඒ ප්‍රශ්න වලට පිළිතුරු මාධ්‍ය නොමැතිව ලබා දීමට සාක්ෂිකරු කැමැත්තක් දක්වා ඇති හෙයින් මෙම අවස්ථාවේදී සාක්ෂිකරුගෙන් මෙම ඉතිරි සාක්ෂි මාධ්‍ය නොමැතිව රහස්‍ය ලෙස ලබා ගැනීමට නියම කරමි මාධ්‍ය ශාලාවෙන් පිටකරයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ පෙර සඳහන් කරපු ගරු කොමිෂන් සභාවෙන් සහ මා විසින් අසන ලද ප්‍රශ්නයකට පසුව පිළිතුරු දෙන බව කියා සිටියා ඔබට එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී පිළිතුරු ලබා දෙන්න පුළුවන්ද?

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු මන් මුලින් ප්‍රශ්නය මතකද මං ඇහුව?

FAIR COMMENT BY JEZEEM

පි: මට ටිකක් මතකයි ඔබතුමා ටිකක් මතක් කරොත් හොදයි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කිව්වා ඒ බුද්ධි අධ්‍යක්ෂක ඒ අවස්ථාවේ හිටිය ඔබ විසින් ඔහුගේ ඔහු මෙතරම් පලපුරුදු නිලධාරියකුත් නොවන යම් යම් හේතුන් මත ඔහුව වෙන ස්ථානයකට මාරු කරා කියලා ?

පි; එහෙමයි.

ප්‍ර: ඊළඟට මම ඇහුවා ඇයි එවැනි පුද්ගලයෙකු නැවත බුද්ධි අධ්‍යක්ෂක වරයෙක් පත්කර ගත්තේ කියලා එතකොට ඔබ කිව්වා එක දිග කතාවක් පස්සේ කියන්න නම් කියලා ඒ කතාව කියන්න?

පි: දැන් මේ ස්වාමිනි දැන් මේකට අදාල අය අනෙක් ප්‍රශ්නයත් මේ දැන් මෙහෙමයි ඒ නිලධාරියා ස්ථානයෙන් මාරුවෙලා ගියාම ඒ කාලේ තිබිච්ච දේශපාලන කැම්පේන් එකේදී නිකුත් වෙච්ච ප්‍රකාශ හා ක්‍රියාකාරකම් දිහා බැලුවාමත් ඔහුගේ නම්‍යතාවයත් ආරංචි වුනා මට මේ අනිත් පැත්තට වැඩකරනවා කියලා ඊට පස්සේ මට කනගාටුයි කියන්න මේ බුද්ධි සේවාවේ කටයුතු අපි මිය යන තුරු රහසක් හැටියට තමයි තියාගන්නේ මේ මට මේ වගේ සාක්ෂි දෙන්න සිදුවෙන එක ගැනත් මගේ අවාසනාවක් ලෙස තමයි මම හිතන්නේ ඉතින් ඒ වෙලාවේ මේ නිලධාරියා යම් කිසි වරප්‍රසාදයකට මට හිතෙන්නේ අපි මෙහෙයුම්වලට අනුයුක්ත කරපු නිලධාරීන් ඒ නිලධාරීන් ජීවිතය පරදුවට තබා තමයි ඒ රජකාරිවලට යන්නේ එහෙම නිලධාරින් දෙන්නෙක් expose කරලා තිබ්බා දේශපාලන අවශ්‍යතාවයට මං හිතන්නේ නැවත ඔහුට එමට අවකාශ ලැබුණේ ඒ නිසාම තමයි .

ප්‍ර: ඒ කාටද?

පි: ස්වාමිනි.

ප්‍ර: කාටද expose කරේ කොහොමද කොයි විදියටද?

පි: එයා දැන් ඔබතුමා ගාව රියදුරෙක් ඉන්නවා ඒ රියදුරා මගේ මිනිහෙක් නම් මම කිව්වොත් ඔබ තුමාට මෙයා මගේ එස්.අයි.එස්. informant කියලා ඔබතුමා මොකද කරන්නේ. ඒ මිනිහාගේ ජීවිතය අදත් අවධානමේ .

ප්‍ර: ඒ අනුව කොහොමද ඔහු ආපහු මේ තනතුරට එන්නේ තනතුරට පත්කරන්නේ කවුද?

පි: ජනාධිපතිතුමානේ .

ප්‍ර: පත් කරන්නේ ජනාධිපතිතුමා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ අනුව තමයි පත්වීම හම්බවුනේ?

පි: නෑ මම හිතනවා මේ වරප්‍රසාද නිසා තමයි ඔහු නැවත ආවේ මොකද ඒ ගමන්ම එකට එතනම හිටිය පුජිත් ජයසුන්දර මහත්මයාත් පොලිස්පති වුනා.මෙතුමාත් අධ්‍යක්ෂක බුද්ධි වුනා ඉතින් ඒ ඇවිල්ලාත් මේ කරපු සෑම දෙයක්ම මේ සාමන්‍යයෙන් අපේ සම්ප්‍රදායට විරුද්ධයි ඒ විරුද්ධව

FAIR COMMENT BY JEZEEM

වැඩකරේ ඇයි කියන එක අපිට ප්‍රශ්නයක් ඉතින් මේවා පෙළින් පෙළ දැන් මම යන කොට මෙතනින් මේක එක්තරා මට්ටමකට මේ හැම කරුණක්ම මේක විතරක් නෙමේ මුස්ලිම් ත්‍රස්තවාදය විතරක් නෙවේ. LTTE ත්‍රස්තවාදය නැවත එන වැටලිම් අවස්ථා තුනක් අපි මැඩලුවා කරලා ඒකට අවශ්‍ය පියවරවල් ගත්තා අපි ඒ මිනිස්සු අරගෙන ඒක ලෝකයට දුන්නා අර තහනම් කරලා ගැසට් කලා. ඒ සෑම දෙයක්ම කරලා මේ අපේ අර තොරතුරු ජාලය අර network එක හරි හොඳට නිපදවලා තිබුණේ ඒකට මට පූර්ණ සහය දුන්නා මේ වර්තමාන ජනාධිපතිතුමා ඒ කාලයේ අපිට ඒක කරන්න නියම හයිය දුන්නා ඒක නිසා ඒ රජයෙන් අපිට කිසි කරදරයක් තිබුණේ නැහැ අපේ රාජකාරිය කරන්න නමුත් දේශපාලන වශයෙන් දේශපාලන කරලියේ ඒ කාලය වෙනකොට තිබිච්ච කතා බහෙන් මට තේරුම් ගියා මට මේ ආණ්ඩුවත් එක්ක වැඩ කරන්න බැහැ කියලා ඔලුව තියාගෙන ඒ නිසා තමයි මං එතනින් මේ ඇහුව ප්‍රශ්නයට උත්තරය දෙන්නේ ඉවත්වුනේ ඇයි කියලා. ඒක තමයි මම ඊට පස්සේ බොහොම නිශ්කලංකව මඩකලපුට ගිහිල්ලා හිටියා.ඉදලා විශ්‍රාම ගියා නමුත් ඒ වකවානුවෙන් අනතුරුව මම දැක්කා මම විතරක් නෙමේ මාත් එක්ක හිටපු අනිත් නිලධාරීන් ඒ කණ්ඩායම් මොකද අපි හිටියේ එක bunch එකක් හැටියට යුධ හමුදාපති, ගුවන් හමුදාපති,නාවික හමුදා පති, එකේ intelligence කට්ටිය ඒ ඔක්කෝම එක බන්ච් එකක හිටියේ ඉතින් අපිට මේක පේනවා දැන් අපි ගොඩ නගා ගත්ත පවුර මේක දවස ගානේ බිඳෙනවා මේ ගොල්ලෝ ඉතින් මෙතැන්ට කරුමේටම ගියා මං හිටපු තැනට නාලක සිල්වා කියලා මගේ ඒත් SIS එකේ හිටපු නිලධාරීන් මං පොලිස්පතිතුමාට නොවදිනා වැදුම් කියලා කියලා කිව්වා මේ ළමයා මේ වැඩේට හරියන්නේ නැහැ ඒ ළමයාට ඉන්න දෙන්න SIS එකේ තව ඉගෙන ගන්න කියලා.එතකොට මම යෝජනා කරා මෙයාව එවන්න කියලා එතැන්ට. මේකාව එළියට දාලා තිබුණේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: කවුද?

පි: වැලිකන්නව මෙයා මාත් එක්ක හුගකාලයක් වැඩකරපු නිලධාරීයෙක් අඩු ගානේ එයාවත් තියන්න එතන එයා මොකට ද එළියට දැම්මේ එහෙම නැත්නම් එයාට දෙන්න TID එක මොකද මං දන්නවා මෙයාට පුළුවන් Intelligence පැත්ත මෙයා පුංචි කාලේ ඉදලාම අපිත් එක්ක වැඩ කරා. ඉතින් ඒ වගේ උපදෙස් දුන්නාහමත් ඇහුවේ නැහැ මට තේරෙනවා ඉලංගකෝන් මැතිතුමා ඒ කරේ මේ එතුමාගේ මනස නෙමේ වෙන කාගේ හරි බලපෑමක් උඩතමයි පත්කිරීම් කරේ ඉතින් ඒ වගේ මේ

FAIR COMMENT BY JEZEEM

රාජ්‍ය බුද්ධි සේවාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය Special Branch එක පොලිස් එකේ ඒවා හරි වැදගත් තැන් ඉතින් ඒවා නිකම් ඒ නිකම් සාමාන්‍ය දේවල් සාමාන්‍ය කොට්ඨාශ බවට පත් කරනවා නම් ඒක කවදාවත් අනාගතයේ බලපාන්න බැහැ.ඒක තමයි අද මේ අපිට වෙච්ච අගාදේ අපි කොහොම හරි අපි එක්තරා කාලයක අපි බුද්ධි සේවාවන් ඉතාම විශිෂ්ඨයි කියාගෙන ලෝකයේ පිට මිනිස්සු හිටියා අපිත් එක්ක හිතවත් වෙලා වැඩකරා. ඒ දැන් ඒ මිනිස්සු අහන ප්‍රශ්නවලට අපිට උත්තර දෙන්න නැති වුනා . අපි ඊට පස්සේ මම ඇහුවා ලේකම්තුමාගෙන් සර් මොනවාද මේවාට කරන්නේ කියලා එතුමා මොනවා කරන්නද එතකොට CNI මහත්තමයා දැන් සිසිර මෙන්ඩිස් මහත්මයා මගේ එකට හිටපු නිලධාරී සහෝදරයෙක් වගේ එතුමා එතැන්නට ගියේ එක අපි හිතුවා ලොකු සාධාරණයක්වෙයි කියලා නමුත් එතුමාට අඹමල් රේණුවක ශක්තියක් නැහැ ඔහුට බලයක් දුන්නේ නැහැ. එතුමා එතන නිකම් මේ අනිත් එක මේ අධ්‍යක්ෂක වරයා ඒයා එක්ක එයාගේ මල්ලි වගේ තමයි තියන් හිටියේ එයා මට කියනවා මොනවා කරන්න ද මේ මිනිහා මාත් එක්ක කතා කරන්නේ වත් නැහැ කියලා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: කවුද ?

පි: ඩිරෙක්ටර් එස්.අයි.එස් හරි නම් මෙයා මිස්ටර් මෙන්ඩිස් කියන්නේ ජ්‍යෙෂ්ඨයෙක් මමත් එයාට sir කරනවා ඒයාට මෙයා නිකම් සොච්චං විදියට සලකන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: මිස්ට වාකිෂ්ය නිකම් එයා මෙයා කියන්නේ නැතිව නම් සඳහන් කරන්න?

පි: නිලන්ත ජයවර්ධන සලකන්නේ ඒ විදියට.

ප්‍ර: කාටද සලකන්නේ?

පි: මිස්ටර්.සිසිර මෙන්ඩිස්ට ඉතින් සිසිර මෙන්ඩිස්ට උඩින් තිබ්බෙත් නැහැ link එකක් මෙහෙන් තිබුනෙත් නැහැ link එකක් SIS එකෙනුත් පොලිස්පතින් ඉන්නේ වෙන විදියකට ඉතින් CNI එක කියන තනතුර බාල්දු කරලා දැම්ම එකයි අපි දැක්ක එළියෙන් ඉදන් දැක්ක. මේ නිරීක්ෂණය ඉතින් ඒක නිසාම තමයි මේ ඩෙබ්කල්ස් වුනේ ඊළඟට දැන් නාලක සිල්වා මහත්මයා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය ගිහිල්ලා එතන ඉදන් කරේ ඩි.එම්.අයි කරපු සික්‍රට් ඔපරේෂන් ඔක්කෝම අල්ලා කුඩු කරා පොලිස් ඉන්ෆෝමන්ට්ස්ලා අපි ඉස්සෙල්ලා කිව්වා අපි එක

FAIR COMMENT BY JEZEEM

එක ව්‍යාපෘතිවලට මිනිස්සු දානවානේ ඇතුලේ. ඒ මිනිස්සු ඇල්ලුවා අල්ලලා රිමාන්ඩ් කරා ඊට පස්සේ ඒ මිනිස්සුන්ට ඒක කර ගන්න බැරි වුනා. කොටින්ම කියනවා නම් ඔය දැන් ඉන්න අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක පවා අත්අඩංගුවට ගන්න ලැයිස්ති වුනේ ඉතින් ඒවා අපි මේ ජීවිතය පරදුවට තියලා කරපු වැඩ ඉතින් ඒවා ඔක්කෝම විනාශ වෙනවා නම් මෙතුමිය අහපු ප්‍රශ්නයට මං කොහොමද අධ්‍යක්ෂකවරයෙක් හැටියට ඒ මිනිස්සුත් එක්ක ජීවත් වෙන්නේ.

****

<u>ගරු විනිසුරු රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු බුද්ධි අධ්‍යක්ෂකගෙන් ලිපියක් පොලිස්පතිතුමාට ලැබුණු අවස්ථාවේදී පොලිස්තුමාටත් මේ සම්බන්ධයෙන් රාජ්‍ය නායකයාට ආරක්ෂක අමාත්‍යවරයාට මේ කරුණු ඉදිරිපත් කරලා කුමක්ද කරන්න ඕනේ යම් කිසි මෙහෙයුමක් කරන්න අවශ්‍යද සාකච්ඡා කරන්න තිබුණා නේද?

පි: එහෙමයි.

ප්‍ර ඇයි ඔහු ඒ පැහැර හැරීමක් කරලා තියෙන්නේ?

පි: ඒක තමයි මට තියෙන ඔබතුමාට ප්‍රශ්නයක් තියෙනවා කියලා මේක වෙන්න අතඇරලා බලන් හිටියාද අපේ කරුමේට මේක සිද්ධ වුනාද කියන එක ප්‍රශ්නයක්.

ප්‍ර: ඒ පොලිස්පතිතුමාගේ වගකීම ඉටු කරන්නේ නැතිව ඔහුට වඩා ඒ ඉහල නිලධාරින් මේ ගැන සාකච්ඡා කිරීමක් කරලා තියෙනවාද?

පි: නැහැ එතුමා හරිනම් ආරක්ෂක ලේකම් එක්ක කතා කරන්න ජනාධිපතිතුමාට කියන්න මොකද ජනාධිපතිතුමාත් එක්ක සම්බන්ධ වෙන්න හයිය මේ විදියටම තියෙනවානේ ශක්තිය නීතිමය අවසරය තියෙනවානේ ජනාධිපතිතුමා සහ පොලිස්පතිට එකට කතා කරන්න ඒ ජනාධිපතිටත් පොලිස්පතිටත් තියෙනවා Direct line එකක් ජනාධිපතිට කතා කරන්න. ඉතින් මේ CID Director ටත් තියෙනවා. CID එකේ DIG ටත් තියෙනවා මේ secret number එකක්. ඒ ඔක්කෝම තියෙන්නේ මේ වයර් ලයින් එකෙනුත් යනවා නිකම් wire වලිනුත් කතා කරන්න පුළුවන් ඉතින් ඒ ඔක්කෝම පහසුකම් මේ ජාලය තුල සිද්ධවෙලායා තිබුණේ ඉතින් ඒවා නැතිවුනේ කොහොමද කියන එක අපිට ප්‍රශ්නයක් පිටින් ඉදන්.

ප්‍ර: ඇයි මේ සියලුම ප්‍රධානීන් මේ සම්බන්ධව එච්චර පහසුකම් ජනාධිපතිවරයාට තමයි මේ තොරතුරු හෙළිකරන්න තිබියදිත් මේ සියලු දෙනාම පැහැර හැරීමක් කරලා තියෙන්නේ?

පි: ඒක තමයි දැන අපිට තේරුම් ගන්න තියෙන්නේ එක්කෝ මේක දේශපාලන අරමුණක් නිසා සිද්ධ වුනා එහෙම නැත්නම් තවත්

FAIR COMMENT BY JEZEEM

කෙනෙකුට හොදහිත තියාගන්න කරලා මට මතකයි දැන් ඔය වගේ දෙයක් වුනානේ අපි ප්‍රේමදාස ජනාධිපතිතුමා ගාව හිටියා අර මිනිහා suicide bomber බාබු බාබු ඉන්නකොට බාබු තියාගෙන හිටියා වැඩගන්න කියලා අන්තිමට බාබු බෝම්බය පත්තු කරා. ඒ වැඩි confidence දෙන්න හොද නැහැ. එහෙම තමයි අපි ඕන තැනක රාජ්‍ය නායකයෙක් හැටිය ඒ කියන දේ අහන්න ඕනේ ඉතින් ඒවා ඇහුවේ නැති වුනාම වෙන ප්‍රතිවිපාක තමයි, මෙවා. මිනිස්සු අපිට උදව් කරයි කියලා දේශපාලන වශයෙන් මගේ අත්දැකීම තමයි උදව් කරාට ඒ මනුස්සයා අතේ දුරින් තියාගන්න. මොකද මේ ලෝක ඉතිහාසයේ හැමතැනම ඔය ප්‍රශ්නේ ඇතිවෙලා තියෙනවා. තමන් ළඟ ඉන්න මිනිස්සු තමයි වැඩිය විශ්වාස කරන්න ඕන. ඉතින් ඒවා පිළිපදින්නේ නැති සමාජ තත්ත්වයක් මේ වකවානුවේ සිද්ධ වුනැයි කියන එක තමයි මට නිරීක්ෂණය වෙන්නේ. මේක විතරක් නෙවෙයි දැන් එල්ටීටීඊ සංවිධානය අපි දැන් හිතන් ඉන්නවා මේ ඔක්කොම හරියි කියලා. නමුත් මං අර අපි අවසාන වශයෙන් තුන්වෙනි කණ්ඩායම අකර්මණ්‍ය කළාට පස්සේ දැං ඒගොල්ලන් ආපහු බිහිවෙලා තියෙනවා. මොකද අපි තුන්දාස් ගාණක් හාරසිය ගාණක මිනිස්සු band කළා. පිටරටවලින් ලංකාවට එන්න බැහැයි අරවා මේවා කියලා. අර මං කිව්වේ අර UN resolution එකක් තියෙනවා 13/73. මේ resolution එකෙන් මේ band කරපු මිනිස්සු ටික දවස ගානේ මේ වකවානුව ඇතුළත release කළා. ෆාදර් ඉමැනුවෙල්ගේ ඉඳලා පහළට. ඉතින් ඔය මිනිස්සු ලංකාවට ආවා ඒගොල්ලන්ගේ operations ඒගොල්ලන් ලස්සනට ලෝකේ ඇතුළේ කරනවා. ඉතින් අපිට දැන් certificate එකක් දෙන්න බෑ එල්ටීටීඊ සංවිධානය නැවත නැගිටියිද නැද්ද කියලා. ඉතින් ඒ වගේම තමයි මම ඒකයි කිව්වේ අරගොල්ලෝ අර අපි ඉන්න කාලේ මේක cowardly තියාගෙන බරපතල සිද්ධීන් දෙකක් වුනා. එකක් තමයි අලුත්ගම සිද්ධිය. අලුත්ගම සිද්ධිය වෙලා ඒක තමයි අවසාන සිද්ධිය මගේ කාලෙදි බරපතල සිද්ධියක් හැටියට මුස්ලිම් අය නමුත් ඒක අපේ ඥානසාර හාමුදුරුවෝ එතන්ට ගිහිල්ලා සිද්ධියත් එක්ක ඇතිවෙච්ච උද්ගතවෙච්ච දෙයක්. ඒක ඒගොල්ලන් සැළසුම් කරන්න ඉස්සෙල්ලා සිද්ධවුන දෙයක්. නමුත් මේ සංවිධානවලට ඒක ප්‍රයෝජනයක් වුනා. අර එල්ටීටීඊ එකට 83 ජූලි කලබලේ ප්‍රයෝජනයක් වුනා වගේ. මේ ගොල්ලන් එකෙන් ප්‍රයෝජනයක් ගත්තා ඉතින් ඒ ප්‍රයෝජනය නිසා මේ ගොල්ලන්ගේ සංවිධාන ශක්තිය වැඩි වුනා. නමුත් LTTE සංවිධානය IS සංවිධානය කියන්නේ දෙක එක වගේ දෙකක් නෙමේ IS සංවිධානය කියන්නේ නායකයෝ හිටියාට පොඩි පොකට්ස් තියෙන්නේ මේක මර්දනය කිරීම LTTE මර්දනය කරා වගේ යුධමය වශයෙන් හෝ කරන්න හරි අමාරුයි

FAIR COMMENT BY JEZEEM

ඒකට Intelligence තමයි තියෙන්න ඕනේ මොකද මේ පොකට් ටිකයි අර පොකට් එකත් එක්ක සම්බන්ධ නැහැ. ඉතින් ඒක අපි intercept කරලා තමයි ඒ ගොල්ලන්ව identify කරන්නේ ඉතින් ඒක ලොකු Intelligence operations ඉතින් ඒවා කෙරෙන්නේ නැති වුනාම රටක මේ ප්‍රතඵල අපට ලැබෙනවායි කියන එක අහන්න දෙයක් නෙමේ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: අර යම් දේශපාලන අරමුණක් තිබෙන්න පුළුවන් කියලා මේ සිද්ධිය සම්බන්ධයෙන් මොකක්ද ඒ දේශපාලන අරමුණ?

පි; දැන් ඒ ආණ්ඩුවත් එක්ක මේ දේශපාලන වශයෙන් මේ ජිහාද් සංවිධානයට එහෙම නැත්නම් වහබිසම් ප්‍රමෝට් කරන නැත්නම් ෂරියා නීතිය ලංකාවේ ක්‍රියාත්මක වෙන්න ඕනේ කියලා කියන දේශපාලනඥයෝ ඉන්නවානේ ඒ..

ප්‍ර: නම් කරන්න?

පි: ඔව් දැන් ගත්තොත් මේ රිසාඩ් බදුර්දීන් මහත්මයා එතකොට අර මාළිගාවත්තේ එක්කෙනා කවුද් මුජිබර් රහුමාන් මේ මේ ගොල්ලන් ඊළඟට නගරාධිපති හිටියා අසාද් සාලිලා ඒ ගොල්ලන්ට තියෙනවා මේ අර එළිපිට නොකිව්වත් හිත යට ප්‍රශ්නනයට උත්තරයක් දෙන්න පුළුවන් කම තියෙනවා ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන් මේ ගොල්ලත් එක්ක එක්කහු වෙලා ඉන්න එකෙන් අරකට බලපෑමක් සිද්ධ වෙනවා ඒක නිසා තමයි මං කිව්වේ අර ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා හෝ කවුරු හරි මේක නිකම් අහක බලන් ඉන්න ඇති මේක මෙහෙම වෙන එකක් නැතෙයි කියලා මේ ගොල්ලන් ඉන්න ඕනේ මේක බෙරයි කියලා ඔය වගේම දෙයක් වුනා අපේ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමාට ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමා LTTE එකත් එක්ක සම්බන්ධතා තියාගෙන හිටියා එයාට විශ්වාසයක් තියෙනවා එයා මරන්නේ නැහැ කියලා මට information ඇවිල්ලා මංම පොලිස්පතිතුමාගේත් අවසරය ඇතිව ගිහිල්ලා කිව්වා කිව්වට ගනන් ගත්තේ නැහැ. එම කණ්ඩායම ඇවිල්ලා එතුමා මැරුවා. ඉතින් ඒ වගේ තමයි මේ සන්සිද්ධින් මේ වගේ වෙනවා. ඉතින් ඒක නිසා අපිට හිතා ගන්න උපකල්පනය කරන්න පුළුවන් මේ වගේ දෙකයක් වෙන්න ඇති කියලා. නැත්නම් මේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක පැත්තක තියන්න තව මේ ගැන වෙන කෙනකුට කියන්න කියලා රහසිගතව කියන්න තිබුණානේ. එහෙම වෙච්ච වෙලාවල් ඉතිහාසයේ තියෙනවානේ. අපේ ඉතිහාසයේ තියෙනවා රාජ්‍ය බුද්ධි සේවාව එක්කෙනෙක් කියලා නැතිව අනෙක් එක්කෙනා ගිහිල්ලා රාජ්‍ය

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නායකයාට කියලා බේර ගත්ත වෙලාවල් තියෙනවා දැන් පොලිස්පතිතුමා හිටියේ ස්ටැන්ලි සේනානයක මහත්මයාගේ කාලයේ එතැන්ට crew එකක් තිබුණා එතැන්ට කෲ එක expose කරානේ ඒ expose කරානේ ඊට ඉස්සෙල්ලා හිටපු නිලධාරීන් වගයක් ඒ වගේ දේවල් මේ රට තුල සිද්ධ වෙනවා මේ ලෝකයේ සිද්ධ වෙනවා. ඉතින් ඒක නිසා ඒවාවෙන්නේ යම් කිසි දේශපාලන අරමුණක් ඇතිව ඉතින් ඒක නිසා අපි පොඩ්ඩක් මේකේදී අපි පොඩ්ඩක් හොයලා බලන්න ඕනේ මේ දේශපාලන අරමුණ මොක්කද කියලා ඉතින් අපි පිටස්තරයෙක් හැටියට මම එතකොට service එකේ නැති හින්දා මට ඒකට හරි කෙලින් උත්තරයක් ඔබ තුමන්ලාට ඉදිරිපත් කරන්න බැහැ.

ප්‍ර: මට යම් පැහැදිලි කිරීමක් කරගන්න අවශ්‍යයි ඔබ දැන් කියපු දේ ඔබ කියපු දෙයින් ඔබ අදහස් කරන්නේ රිසාඩ් බදුර්දීන් අසාද් සාලී සහ මුජිබුර් රහමාන් වැනි දේශපාලනඥයෝ වහබ් වාදීන් නිසා අන්තවාදී අදහස් දරණ පුද්ගලයෙක් කියලාද?

පි; එහෙමයි.

ප්‍ර එතකොට ඔබගේ 2011 ඉදලා 2015 කාල සීමාව තුල ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගත්තාද?

පි; ඒක දැනුවත් වෙලා තිබෙනවා නායකයෝත් දන්නවා නමුත් ඒ ගොල්ලන් මේ වගේ මේ කරලියට බැස්සේ නැහැ. ඒ ගොල්ලන් පාලනය කරා මට මතකයි එක දවසක් එක රැස්වීමකට ගෙනල්ලා ඔය මේ මොකක්ද හලාල් ප්‍රශ්නයේදී අපි සාකච්ඡාවට ගත්තාම එදා හිටිය පොලිස්පතිතුමාත් එක්ක ඒකට විරුද්ධව අපි රාජකාරි කරනකොට මේ රිසාඩ් බදුර්දීන් මැතිතුමා ඇවිල්ලා ලොකු ගෝරියක් දාගත්තේ එතන ඉතින් ඒවා වාර්තා වෙනවා රාජ්‍ය නායකයාට එතකොට ඒයා ගානට ඒ ගොල්ලන්ව කොන් කරලා තියා ගන්න ඕනේ ඉතින් මෙතන ගෙනල්ලා කර උඩ තියා ගත්තාම ඒ මිනිස්සුන්ගේ අපිට ගුටි කන එක අහන්න දෙයක් නෙමේ ස්වාමිනි.

ප්‍ර: එවැනි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙනවාද?

පි; එහෙමයි.

ප්‍ර: ඔබ නම් කරපු තැනැත්තන් තුන්දෙනා සම්බන්ධයෙන් තියෙනවා?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කොහෙන්ද අපි ඒ තොරතුරු ලබා ගන්නේ?

පි: හැබැයි ස්වාමිනි මේ විදියට හරි අකමැතියි රාජ්‍ය බුද්ධි සේවාව කියන්නේ ක්ලෝස් මේවා එකක් ඉතාම රහසිගත තැනක් ඉතින් මේ වගේ දේවල් ඔක්කෝම මේක මං හිතන්නේ මේ මුළු ඉතිහාසයටම මේ වගේ සිද්ධියක් වෙලා නැහැ මේ අපේ ඉතිහාසයටම රාජ්‍ය බුද්ධි සේවාවට ඉතින් මේවා මේ රහසිගත දේවල් එකිනෙකට අපි නීතිමය

FAIR COMMENT BY JEZEEM

වශයෙන් ලබා ගත්තාම එතකොට ඒ නිලධාරීන්ට තියෙනවා ලොකු මානසිකව වැටීමක්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: ඒ වුනාට සත්‍ය සොයා ගැනීමට ඔයගොල්ලන්ගේ සහය අවශ්‍යයි කොමිෂන් සභාවට?

පි; එහෙමයි ඉතින් සාක්ෂි වශයෙන් ලබාගත්තොත් හොඳයි

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිවලින් තොර ලබා ගන්න තමයි මම අහන ප්‍රශ්නය ඔබ ප්‍රසිද්ධ කියන්න අවශ්‍යතාවයක් නෑ ඔබ ඔය නම් කරපු දේශපාලඥයන් තුන්දෙනාගේ වහබ්වාදී අදහස් නැත්නම් අන්තවාදී ඉස්ලාමිය අදහස් සම්බන්ධයෙන් ආවේක්ෂණ රාජකාරී එහෙම නැත්නම් යම් කිසි operation එකක් කරලා කරපු නිශ්චිත නිලධාරීන් රාජ්‍ය බුද්ධි සේවයේ ඉන්නවාද ?

පි: ඉන්නවා ස්වාමිනි.

ප්‍ර: මම ඔබට ලේඛණයක් ලබලා දෙන්නම් ඒ ආවේක්ෂණ රාජකාරී භාරව කටයුතු කර පුද්ගලයාගේ නම ලියලා දෙන්න?

පි: ඒකට ස්වාමිනි මම පරීක්ෂා කරලා බලලා ඕනේ කියන්න.

ප්‍ර: මතකයෙන් කියන්න බැහැ ?

පි: මතකයෙන් කියන එක වැරදියි ස්වාමිනි.

ප්‍ර: එම තොරතුරු සටහන් වෙලා තිබෙනවාද?

පි: අපේ ලේඛනාගාරයේ තියෙනවා ස්වාමිනි.

ප්‍ර: අර ඔබ කලින් කියපු අංශය භාරවද ඒ තොරතුර තියෙන්නේ?

පි; නෑ ඒ ලේඛනාගාරයට ගියාම ඒ එක එක.

ප්‍ර: නෑ ඒ ආවේක්ෂණ රාජකාරී කෙරුවේ අර ඉංග්‍රිසි අකුර තියන අංශයෙන්ද?

පි: නෑ ස්වාමිනි.

ප්‍ර: වෙනම අංශයක්ද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ අංශය? ඒ අංශය අපිට ලියලා දෙන්න?

පි: ඒක surveillance කරන කට්ටිය ආවේක්ෂණ කරන කට්ටිය මේක එහෙම එකේ කියන්න බැහැ දැන් මේ මේක ලංකාව පුරාම තියෙන මිනිස්සුන්ගෙන් හිතන්නකෝ කොළඹ තියෙන DIB එක රිපෝට් කරනවා මඩකලපුවේ තියෙන DIB එක යුනිට් පත රිපෝට් කරනවා. ඒ ඔක්කෝම එක්කහුවෙලා... රිජිස්ට්‍රියට ආවාම ඒ එ රිජිස්ට්‍රයෙන් ආපු

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

information එක Branch එකෙන් ඊටපස්සේ තමයි එයා රිපෝට් එකක් හදන්නේ අන්න එහෙමයි ඒක වෙන්නේ ඉතින් ඔබතුමාලා මේ ලේඛණ ඉල්ලුවොතින් අර ලේඛන ටික ගන්න හරි දිග ගමනක් යන්න ඕනේ ඒ ගොල්ලන්ට ඊළඟට එතකොට ඒකෙන් සමහරවිට expose වෙනවා අර මිනිස්සු ටික

ප්‍ර: දිගු ගමනක් යන්න ඕනේ නැහැනේ දැන් රාජ්‍ය බුද්ධි සේවයේ දත්ත ගබඩාව ස්වැංක්‍රීයව ක්‍රියාත්මක කරනවා 48 ඉදලා සියළුම ලේඛනවල තිබ්බ දත්තයන් දැන් ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩාවට ඇතුලත් කරලානේ තියෙන්නේ?

පි: එහෙමයි 49 ඉඳලා නෙමේ 32 ඉදලා.

ප්‍ර: search engine එකකුත් තියෙනවානේ?

පි: එහෙමයි

ප්‍ර: එතකොට ආවේශන රාජකාරි හරි කරලා තිබ්බ නම් යම් කිසි පුද්ගලයෙක් සම්බන්ධයෙන් ඔබ අද දුන්න සාක්ෂියට අනුව ඒ දක්ත ගබඩාවට යනවා.

ප්‍ර: ස්වාමිනි මේ රිසාඩ් බදුර්දීන්ගේ නම ගැහුවාම ඒ විස්තර ටික එනවා.

ප්‍ර: ඒක තමයි මං අහන්නේ.

පි: මෙතෙන්ට ගේන්නේ කොහොමද.

ප්‍ර: ඒක මේ ප්‍රින්ට් අවුට් එකක් ගන්න බැරිද?

පි: ප්‍රින්ට්අවුට් එකක් අරගෙන නිලධාරියෙක් ඇවිල්ලා සාක්ෂි දෙන්න වෙයි.

ප්‍ර: නැහැ ඒක තමයි මං අහන්නේ ප්‍රින්ට් අවුට් එකක් ගන්න පුළුවන්නේ?

පි; එහෙමයි.

ප්‍ර: පුළුවන්නේ?

පි: එහෙම නම් ඔබ තුමාගේ ඔබතුමාලා ඒකට දෙන්න ඕනේ රහස්‍යබාවය ආරක්ෂා වන පරිදි ඉදිරිපත් වන පරිදි ඉදිරිපත් කරන්න කියලා.

ප්‍ර: ඒක අපි..?

පි: මොකද නැත්නම් individuals අමාරුවේ වැටෙනවා.

ප්‍ර: ඒක අපි කරන්නනම්.

ප්‍ර: දැන් දෙනෙනෙක් අමාරුවේ වැටිලා ඉන්නේ ඒකයි ස්වාමිනි.

ප්‍ර: ඒ මෙවැනි කාර්යක් සදහා නොවේ නේ ඔබ කිව්වේ ඒක වෙනම expose කරපු ඒවා කියලා?

පි: ඒත් මේ වගේම Intelligence operation තමයි.

ප්‍ර: නැහැ ඔබ කිව්වේ ඒ...?

පි: කිව්ව එකට සම්බන්ධ නෙමේ.

ප්‍ර: ඒ අමාරුවේ වැටුනු දෙන්නා expose වෙලා වෙනත් පුද්ගලයකුගේ ක්‍රියාකාරකම් වලට කියලා ?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමිනි.නමුත් ස්වාමිනි ඒකත් එක්ස්පෝක්ස් වුනේ ඒ අපේ මිනිහෙක් කිව්ව නිසා නැත්නම් එක්ස්පෝක්ස් වෙන්නේ නැහැ කවදාවක්වත් දැන් මේ රිපෝට් එක අරගත්තාම එකෙන් යම් කිසි එකක් යම් කිසි අවාසනාවකට හෝ යම් තැනකට ගියෝතින් අර වැඩ කරපු නිලධාරීන්ට ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන් කියලා මට නම් විස්වාසයි.

ප්‍ර: නමුත් ඔබ කියන හැටියට දත්ත ගබඩාවේ තියෙන්න ඕනේ?

පි; තියෙන්න ඕනේ ස්වාමිනි.

ප්‍ර: නම් ගැහුවාම හොයා ගන්න පුළුවන්?

පි: එහෙමයි.

ප්‍ර: ඒ පුද්ගලයින් තිදෙනාට අමරතව වෙනත් දේශපාලනඥයකු සම්බන්ධයෙන්?

පි: තවත් ඇති.

ප්‍ර: නෑ වහබ් අන්තවාදය සම්බන්ධයෙන් ඔබගේ කාල සීමාව තුල යම් කිසි ආවේශන රාජකාරි කෙරුවාද?

පි: ඔය දෙන්නා විතරක් නෙමේ තවත් ඉන්නවා කට්ටිය.

ප්‍ර: කවුද ඒ දේශපානඥයෝ?

පි: මට මතක නැහැ දේශපාලන කරලියේ හිටපු කට්ටිය ඉන්නවා තව ඉන්නවා කිප දෙනෙක් මේකට supportive කරපු.

ප්‍ර: වහබ් වාදයට?

පි: එහෙමයි.

ප්‍ර: ඔබට නම් මතකයිද?

පි: මං හිතන්නේ මෙහෙම කරොත් මේ සභාවට වැදගත්වෙයි ඒ නිලධාරියෙක් සාක්ෂි කැදවන්න බැරිවෙයිද ස්වාමිනි.

ප්‍ර: ඒ කැඳවීම සඳහා ඒක තමා කාවද කැඳවන්නේ?

පි: q අංශයේ නිලධාරියාව.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: එම දේශපාලනඥයන්ට විරුද්ධව තියෙන්නේ වහබ්වාදයට යන්න පමණක් ද නැත්නම් සංවිධානයට සහය වීමක් ඒ විදිය කටයුතු සම්බන්ධයෙනුත් තියෙනවාද?ඒ කියන්නේ වහබ් වාදය සම්බන්ධයෙන් පමණක් ද නැත්නම් නොයෙකුත් සංවිධානවලට සහය දීමක් කරලා තියෙනවාද අධාර දීමක් මුදල් දීමක්,?

පි: මේ කට්ටියද කිව්ව කට්ටියද,

ප්‍ර: ඔව් කිව්ව කට්ටිය ඒ ගැන තොරතුරු තියෙනවාද?

පි: ඔව් මූල්‍යමය වශයෙන් තමයි මේ ගොල්ලෝ හුගාක්ම සම්බන්ධතාවල් තිබෙන්නේ .

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබ දැන් මේ අලුත් ගම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කෙරුවානේ බොදුබල සේනා සංවිධානයේ ක්‍රියාකාරකම් ඔය මුස්ලිම් අන්තවාදී ක්‍රියාකාරකම් හා සම්බන්ධව යම් කිසි සම්බන්ධතාවයක් තිබෙන බවට ඔබට නිරීක්ෂණය වුනාද?

පි: සම්බන්ධතාවයක් කිව්වේ ඒගොල්ලන් එක්ක සම්බන්ධයි කියලාද?

ප්‍ර: නෑ නෑ ඒ කියන්නේ ඒ දෙක අතරේ යම් කිසි සම්බන්ධකමක් නෙමේ මං කියන්නේ ඒ ක්‍රියාකාරකම් දෙක අතර මේ එකකින් තවත් එකක් ඇතිවෙනවා කියන එක සම්බන්ධයෙන් යම් අදහසක් තිබ්බාද?

පි: එතන ස්වාමිනි අඩුවැඩි වශයෙන් දෙපැත්තට තියෙනවා නමුත් අපේ රටේ මිනිස්සු මේ ගැන දැනුවත් වුනේ මේ ගොල්ලන්ගේ මේ ප්‍රසිද්ධ කිරීම තුලින් .

ප්‍ර: මේ ගොල්ලන් කිව්වේ?

පි: බොදු බල සේනාව විසින් කරන ලද ප්‍රචාර කටයුතු නිසා තමයි අපේ සාමාන්‍ය මහජනතාව මේ වගේ ප්‍රශ්නයක් මේ රට තුල තියෙනවායි කියලා හරියට ටිකක් ඒක දැනුවත් වුනේ මොකද අපි වුනත් කවදාවක්වත් ඒක කොහේටවත් පත්තරයට ලියන්නේ නැහැනේ නමුත් මේක ප්‍රසිද්ධ කරේ මේ ගොල්ලන් study එක කරලා අර මං කිව්ව විදියට විවිධ පුද්ගලයන් මේ ගැන හරියට අධ්‍යයනයන් කරපු කට්ටිය ඒ ස්වාමින් වහන්සේලා එක්කලා කතා කරලා මේ ගොල්ලන් ඉස්සෙල්ලාම ත්‍රස්වාදය ගැන කතා කරලා ඒවාත් එක්ක ප්‍රචලිත වෙලා හිටපු කට්ටිය ඒ ගොල්ලන්ට මේ සමාජයේ හඩක් තිබුණා ඒක හින්දා ඒ ගොල්ලන් කතා කරා නමුත් දැන් අලුත් ගම සිද්ධියයි මේක ඔවුන්ගෙන් වෙච්ච සේවයයි අතරේ ලොකු වෙනසක් තියෙනවා දැන් උදාහරණයක් ගත්තොත් කුරගලට අපේ ස්වාමින් වහන්සේ යන්න හැදුවා. ගිහිල්ලා එතන ලොකු ගැටුමක් ඇතිවෙන්න ගියා පස්සේ අපි ඒක භාර ගත්තා කුරගල ප්‍රශ්නේ අපි විසඳන්නම් ඔබ වහන්සේ යන්න එපා කියලා එතකොට උන්වහන්සේ ගියේ නැහැ අපි ගිහිල්ලා කුරගල තිබ්බිච්ච ඒ තියෙන ප්‍රශ්නය සමතයකට පත්කර ගත්තා ඒ වකවානුවේ ඊට පස්සේ ඒක ආපහු ගිහිල්ලා තියෙනවා නමුත් එතකොට අර මේ ස්වාමින් වහන්සේලාගේ තියෙන දේකට යොමු වන ක්‍රමය වැරදියි නිසා මේ රට තුල විවිධ ප්‍රශ්න ඇතිවුනා නමුත් ඒ ගොල්ලන්ගෙන් සේවයක් නොවුනයි කියන්න බැහැ මේ ප්‍රශ්නේදී මිනිස්සු දැනුවත්වෙලා මිනිස්සු මේකට අවධානයක් යොමු කරා ඒ අවධානය නිසා සමහර තැන්වලදි අර ගොල්ලන්ට කරගෙන යන්න තියෙන අවකාශයන් මග හැරුනා දැන් ඔය සංවිධානයේ ක්‍රමවේදය තමයි ඒ ගොල්ලන් ප්‍රේෂස් කිහිපයට තමයි මේ මේක ලංකාව තුල සහ ලෝකය ක්‍රියාත්මක වෙන්නේ ඉස්සෙල්ලාම අපි ගාව ඉන්න...

ප්‍ර: ඔබ ඒගොල්ලෝ කියන කොට අපි දන්නේ නැහැ ඒ නිසා.

FAIR COMMENT BY JEZEEM

පි: මුස්ලිම් ජාතිකයෝ ඒ කියන්නේ පාරම්පරික මුස්ලිම්වරු ලංකාවේ ඉන්නවා පාරම්පරික මුස්ලිම්වරු ඉන්නේ මේ වහබ් වාදයට එකඟ නැතිව ඒ ගොල්ලන් තමයි බහුතරයක් ලංකාවේ ඉන්නේ ඒ පාරම් පරික මුස්ලිම්වරු මේ නමා ගැනීම සඳහා කාල පරිච්චේදයක් දෙනවා එතකොට මේ ගොල්ලන් 2050 වෙන කොට තමයි මේක ටයිම් පොජෙක්ට් එකේ තිබුණේ මේ ගොල්ලෝ සම්පූර්ණයෙන්ම අයත් කරගන්නවා ලෝකයම හරවා ගන්නවායි කියන ආකල්පය තිබුණේ ඉතින් එතකොට මේ මට මතකයි විශ්ලේෂණය කරපු මනුෂ්‍යයා කිව්වා 2025 විතර වෙන කොට ලංකාවේ මෙම ගැටුම අද මේ වෙච්ච ප්‍රශ්නය වගේ දේවල් ඇති වෙන්න පුළුවන් කියලා නමුත් කෙනෙක් කිසියම් හේතුවක් නිසා විශේෂයෙන්ම සිරියාවේ වෙච්ච pressure එක නිසා ඔය ගොල්ලන්ට වෙච්ච pressure එක නිසා ඒ ගොල්ලන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගන්න මේ ආසියා කරයට ඒ ගොල්ලන් බැස්සා නැත්නම් අපිට තිබිව තොරතුරු අනුව ඒ ගොල්ලන් මේ ලංකාවට මෙච්චර ඉක්මනට අතපොවන්නේ නැහැ නමුත් අර ක්‍රිස්තියානි පල්ලියත් එක්ක තිබුණු ගැටුම නිසා මේ සිද්ධිය මෙසේ වුනා කියන එක අපිට උපකල්පනය කරන්න පුළුවන් ඉතින් මම ඉස්සෙල්ලා කිව්වා ඔබතුමා මගෙන් අහයි කොහොමද දේශපාලනයට මේක සම්බන්ධ වුනේ කියලා ඒක අර සම්බන්ධ වීමට වඩා නිහඬව සිටීමත් එක්තරා විදියක අනුබල දීමක් වෙනවා ඉතින් ඒ වගේ දෙයක් වුනා කියන එක තමයි අපිට මේ හිතෙන්නේ මේ වගේ අකර්මන්‍ය සිටීම ඉතින් ඒ නිසා ඒ ඒ ගොල්ලන්ගේ ව්‍යාපෘති තියෙනවා කාලයක් ඒ ගොල්ලනට ඉඩ දෙනවා ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ගේ ජන ගහනය සහ අනෙකුත් දේවල් වැඩි වැඩි වෙන කොට percentage එක වැඩි වෙන කොට තමයි ඒ ගොල්ලන් ඊළඟ step එකට යන්නේ එතකොට පහුගිය වකවානුවේ ඒ ගොල්ලන් හිටියේ අර යටත් වෙලා බලාගෙන radicalized වෙලා ලැස්තිවෙලා ඉන්න ඉතින් ඒ කාල වකවානුව දැන් මෙකෙන් ආපහු පස්සට ගියා කියලා තමයි මගේ නිරීක්ෂණය තව අවුරුදු පහකට දහයකට පස්සට ගියා මොකද මේ ගහපු එකෙන් අපි නැගිට්ටා අපිට තේරුම් ගියා සමාජය අවබෝධය වුනා ඒක නිසා පාරම් පරික මුස්ලිම්වරු ටිකක් ප්‍රවේශම් වෙනවා ඒ නිසා ඒ ගොල්ලන් තව ටිකක් මේ face එක පස්සට යන්න පුළුවන් ඉතින් ඒ වගේ දේවල් තමයි මේ ගොල්ලන්ගේ ක්‍රියාදාමය තුල තියෙන්නේ .

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: මිස්ටර් වාකිෂ්ඨ අහගෙන හිටපු ප්‍රශ්නයක් ඒක අහන්න මට අමතක වුනා අර ඉස්සෙල්ලා මං එතන අහන්නම් එස්.අයි.එස් එක ගැන මං ඇහුවානේ මේක NIB එක තිබිලා SIS වෙලා කාර්ය මණ්ඩලය

FAIR COMMENT BY JEZEEM

කොච්චරක් ඉන්නවාද කියලා දැන් SIS එකේ ඩිරෙක්ටර් සාම්ප්‍රදායක් ලෙස නිරතුරුවම පත්වුනේ ශ්‍රී ලංකා පොලිසියෙන්ද?

පි: ඔව්.

ප්‍ර: SIS ඩිරෙක්ටර් කවදාත්ම පත්වෙලා නැද්ද හමුදාවල් වල කවුරු හරි එක්කෙනෙක් SIS එකේ ඩිරෙක්ටර් විදියට වර්ථමානයේත් නැද්ද?

පි: දැන් වර්තමානයේත් ඉන්නේ හමුදා නිලධාරියෙක්නේ නමුත් ඒ නිලධාරියා දැන් මේ සිද්ධියේ දී පත්කරන්න කෙනෙක් හොයන කොට ඒකට ප්‍රවීණයෙක් හොයා ගන්න බැරී වුනා පොලිස් දෙපාර්තමේන්තුවේ විශ්වාසනීයත්වයක් කාර්යක්ෂමතා බාවයත් දැනුමත් එක්ක මේ නිලධාරියා මගේ දැනුමේ හැටියට මාත් එක්ක වැඩකරලා තියෙනවා එකට වැඩකරලා තියෙනවා බොහොම දක්ෂක නිලධාරියෙක් ඉතින් ඊළඟට මෙතෙන්ට අවශ්‍යයි විශ්වාසනීයත්ව කියන එක ඒ නිසා මං හිතන්නේ එයාව පත් කරා මොකද එතන හිටපු අනික් නිලධාරීන් ගෙන් මේ සර්විස් එක මෙච්චර මේ කාර්යක්ෂමව ගන්න ඒකට හේතුවම තමයි අර මට දැක්කේ පහුගිය වකවානුවේ දී සමහර නිලධාරීන් විශ්‍රාම ගියා එළියට ගියා ඔය වගේ දේවල් වුනා ඒ කියන්නේ දෙවන පෙළ තුන්වන පෙළ හිටපු නිලධාරීන් එහාට මෙහාට වුනා ඒ කෙන් තමයි ප්‍රශ්නය ඇති වුනේ .

ප්‍ර: ඒ ප්‍රශ්නය මම ඔබගෙන් ඇහුවේ දැන් පත්වීම දීලා තියෙන පුද්ගලයාගේ තියෙන සුදුසු කම් විමසන්නට නෙමෙයි පොලිස් දෙපාර්තමේන්තුව තුලින්මනේ හැමදාම පත් කරපු නිසා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තුල කිසියම් ඒකට නොසතුටක් වගේ දෙයක් තිබුණා ද කියා දැන ගැනීම සදහා පමණයි?

පි: නොසතුටක් කියන්නේ ඉතින් අර සම්ප්‍රදායි මමත් ඒකට ජනාධිපතිතුමාට කිව්වා මේ පොලිසියේ මිනිහෙක් නැහැ කියන්න කෙනෙක් නැහැ කියලා ඉතින් ඒ නිසා ඒ විදියට පත් වුනා නමුත් මෙතන ගැටලුවක් තියෙන්නේ පොලිස් නිලධාරීන්ට යන්තන් එල්ලෙන්න පුළුවන් සාමාන්‍ය නීතියක් යටතේ තියෙන වරප්‍රසාද අනුව යම් කිසි රාජකාරියකදි නීතිමය ආරක්ෂාවක් තියෙනවා නමුත් හමුදා නිලධාරීන්ට ඒක නැහැ හදිසි අවස්ථා රෙගුලාසි නැත්නම් එහෙම නැත්නම් කැඳවීම් කරන්න ඕන පොලිස් පතිතුමා විසින් යුධහමුදා පතිතුමාට ඔය තියෙන ප්‍රශ්නේ තියෙන ඒක තමයි අපි මේ හදන්නේ මේ කොහොමහරි මේකට පනතක් ගෙනත්ලා මේක ක්‍රියාත්මක කරන්න බුද්ධි අංශවල තියෙන වැදගත්කම දැන් මේ රට තුලත් ලෝකයේ මිනිසුන්ට තේරිලා තියෙන නිසා මොකද මේ රටේ මෙතෙක් කල් මේ ඉතිහාසයේ අපිට මේ ගැන පනතක් තිබුණේ නැහැනේ නීතිමය ආවරණයක් තිබුණ් නැහැනේ ඒ නිසා ඒක කරන්න යනකොට නම් මේ දැන් උදාහරණයක් විදියට ගත්තොත් ඉන්දියාවේ බුද්ධි අංශ තියෙනවා

FAIR COMMENT BY JEZEEM

ඒවයේ පොලිස් නිළධාරින් නෙමේ ඉන්නේ ඔක්කෝම පොලිසිය ,හමුදාව සිවිල් දොස්තර වරු නීතිඥවරු එතකොට ගණකාධිවරු විවිධ ක්ෂේත්‍රයන් වල පුද්ගලයන් විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කරනවා මොකද බුද්ධි සේවාවක් කිව්වාම ජාතික ආරක්ෂාව පමණක් නෙවෙයි ඊට පස්සේ ඒ රට කරගෙන යන්න අනෙක් ආයතනවල තියෙන තොරතුරු දැන ගන්න ඕනේ ඒක හින්දා හැම තැනමට අපේ නෙට්වර්ක් එක හැදෙන්න ඕනේ ඉතින් ඒකට විශේෂ පනතකින් මේ විදියට ක්‍රියාත්මක වෙන්න ඕන ඒක නිසා තමයි ඉතින් නමුත් අද ලංකාවේ එකට ලොකු ගැටලුවක් නැහැනේ හමුදා නිලධාරියෙක් වැඩ කරයි කියලා ලොකු ගැටලුවක් නැහැ. මට මතකයි ඒ නිසා තමයි ඒක ආවරණයක් කරගෙන මිස්ටර් නාලක සිල්වා අපේ හමුදා නිලධාරීන් ටික අත්අඩංගුවට ගත්තේ operation වල හිටපු ගැටුම් ඒක ඉතාම සීමා සහිත වේලාවල් වලදි වෙන්නේ එහෙම සමහර මිනිහෙක් තමයි එහෙම කරන්නේ රටට ආදරය තියෙන මිනිහෙක් නැත් නම් මේකේ තියෙන වටිනාකම දන්න මිනිහෙක් ඒ වැඩේ කරන්නේ නැහැ එහෙම ඒක මෙතෙන්ට ප්‍රශ්නයක් වෙයි කියලා මං හිත්නනේ නැහැ.

ප්‍ර: ඔබ සඳහන් කරා CNI ,IGP Director SIS අතර 2015 වෙන් පසුව රාජකාරිමය වගකීම් ඉටු කිරීමේදී තිබිය යුතු සුහදතාවය හෝ සමීප සබඳතාවය දකින්නට ලැබුණේ නැති බව ඔබ ප්‍රකාශ කරා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ මේක දැක්කේ 2015 ජනවාරිවල අය අලුතෙන් බලයට පත් වූ රජය ආරම්භ වීමෙන් පසුවද ඔබ දුටුවේ මේ සම්බන්ධතාවය තිබෙන්නේ නැහැ කියලා?

පි: එහෙමයි.

ප්‍ර: එය ඔබ දුටුවාද 2019 අප්‍රේල් 21 ප්‍රහාරය සිදු වන අවස්ථාව වෙන කොටත් ඒ අකාරයටමයි තිබුණේ කියලා ?

පි: එහෙමයි.

ප්‍ර: ඔබ ඔබට නිරීක්ෂණය වුනාද ඔබ මේ කියන දේම අතිගරු ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම් අතරත් අති ගරු ජනාධිපතිතුමා සහ පොලිස්පතිතුමා අතරත් ඒ අකාරයටම ද තිබුණේ කියලා?

පි: සම්බන්ධතාවයද.

ප්‍ර: ඔව්?

පි: මට නිරීක්ෂණය වුනා ඒ වගේ ඒ කියන්නේ ඒ ගොල්ලන්ට එහෙම අපි කියන්නේ close relationship එකක් නැහැ. ඒක අර මං ඉස්සෙල්ලා කිව්වා වගේ බන්ච් එක වගේ නැති ගතියක් තේරුණා ඒ නිසා තමයි කියලා මේ වගේ ප්‍රශ්න ඇතිවෙන්නේ කියලා අනෙකුත් හේතු රාජකාරිවලදි .

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් එම 2019 අප්‍රේල් 04 වෙනි දින ඉන්දිය බුද්ධි තොරතුරු ආයතනය විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවාවට ලබා දුන්නු තොරතුරුත් ඔබ සඳහන් කර පරිදි මැනවින් කළමනාකරණය කර ක්‍රියාත්මක බවයට පත් කර මෙම ප්‍රහාරය වලක්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු නොවුනේ මේ සියලුම දෙනා මම දැන් සඳහන් කරපු සියලුම දෙනා අතරේ තිබිච්ච රාජකාරි වශයෙන් තිබිච්ච ලබැදියා සබැදියාව නොමැතිකමද?

පි: ඒකත් එක හේතුවක් සහ කාර්යක්ෂමතා දුර්වලතා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ වැඩිදුරටත් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් උගත් රජයේ අධිනිතිඥවරයා ඉල්ලයි අවසර ලබා දෙයි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ නාලක ද සිල්වා කියන පොලිස් නිලධාරිවරයා ගැනත් ප්‍රකාශ කර සිටියා. ඔහු රාජ්‍ය බුද්ධි සේවාවේ ඔබගේ කාල වකවානුවේදි ඔවුන් සිටියේ රාජ්‍ය බුද්ධි සේවාවේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ 2015 ජනවාරි 16 වන විට එම සේවාවෙන් ඔහු එතකොටත් හිටියේ රාජ්‍ය බුද්ධි සේවාවේද?

පි: ඔහුත් මට මතක නෑ ඒක නැත්නම් Narcotics දෙකෙන් එකක

ප්‍ර: මෙම නිලධාරිවරයා ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ කටයුතු කරන අවස්ථාවේදී අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බුද්ධි ඒකකයේ ස්ථානාධිපති හෝ එවැනි නිලයක් දැරුවද කියලා ඔබට මතකයක් තියෙනවාද?

පි: නිලයක් q Branch එකේ හිටියා ද කියලා මතකයක් නෑ. නමුත් ඉතින් එයා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් එයාට අවබෝධයක් තියෙනවා.

ප්‍ර: q Branch එක කියලා ඔබ ඔබ හදුන්වන්නේ අන්තවාදී?

පි: මුස්ලිම් අන්තවාදී සම්බන්ධයෙන් අංශය ස්වාමිනි.එයා H එකේ හිටියා ත්‍රස්වාදී අංශයේ හිටියා.

ප්‍ර: ඔබට මතක ද ත්‍රස්ත වාදියා ඔබ කියා සිටියා එම නිලධාරිවරයා පසුව අධ්‍යක්ෂක ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක බවට පත්වුනා කියලා?

පි: එහෙමයි.

ප්‍ර: 2017,2018 අවුරුද්ද කාල වකවානුවේදී ත්‍රස්වාදී විමර්ශ කොට්ඨාශයේ අධ්‍යක්ෂක හැටියට හිටියේ ඔහුද නැත්නම් වෙනත් පුද්ගලයෙක් කියලා ඔබට මතකයක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි: 2017,18, ඔව් ඔවුන් අත්අඩංගුවට ගන්න තුරු හිටියේ එහෙනේ. ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ තමයි හිටියේ.

ප්‍ර: දැන් ඔබ මීට පෙර කියා සිටියා සාක්ෂි දෙමින් LTTE සංවිධානය තහනම් සංවිධානයක් වශයෙන් යුරෝපා සංගමය විසින් තහනම් කිරීම?

පි: එහෙමයි.

ප්‍ර: දැන් එම තහනම් කිරීම වාර්ෂිකව සිදුවන දෙයක්ද නැත්නම් දිගටම පැවැත්වීමක්ද කියලා ඔබට මතකයි තියෙනවාද?

පි: වාර්ෂිකව තහනම්.

ප්‍ර: වාර්ෂිකව තහනම් දැන් එම වාර්ෂික තහනම් කිරීම සිදු කිරීම කාගේ ඉල්ලීමක් මතද සිදුවෙන්නේ?

පි: ලංකාවේ විදේශ අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කරලා ඒක ජිනිවා පහලට යවන්න ඕනේ.

ප්‍ර: ඔබට වැටහීමක් තියේද විදේශ කටයුතු අමාත්‍යාංශයට ඒ අවශ්‍ය වාර්තා සපයන්නේ කවුරුද කියලා?

පි; රාජ්‍ය බුද්ධි සේවාව සි.එන්.අයි. ජාතික බුද්ධි ප්‍රධානී පොලිස් දෙපාර්තමේන්තුවෙන් CID එකෙන් ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයෙන් තමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ විශ්‍රාම ගියාට පසුව කිසියම් හෝ අවස්ථාවක එල්.ටී.ටී සංවිධානය සම්බන්ධයෙන් තියෙන තහනම දිර්ඝ කිරීමට අදාලව යම් වාර්තාවක් ඉදිරිපත් කරන්නට යෙදුනාද?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: කොයි කාලවකවානුවද ?

පි: ඔය නාලක සිල්වා Director ඉන්න කාලේ ගිය අවුරුද්ද හෝ අන්තිම තිබ්ච්ච resolution එකේදී ඒක පාස් වුනේ අපේ වාර්තාව අනුව තමයි ඒ වාර්තාව ලබා දෙන්න ඒ වෙලාවේ අදාල අංශ වලින් වාර්තා ඉල්ලලා ඒක ප්‍රමාණවත් නැහැයි කියලා නිරීක්ෂණය වුනා මටත් සිදුවුනාට ඒසම්බන්ධයෙන් affidavit එකක් ලබා දෙන්න.

ප්‍ර: එතකොට ඒ සම්බන්ධයෙන් ඔබ කියන්නේ affidavit එහෙම නැත්නම් දිවුරුම් ප්‍රකාශයක් කවුද ඉල්ලා සිටියේ?

පි: ඇත්තටම අමාත්‍යවරයා.

ප්‍ර: කවුද විදේශ ඇමතිවරයාද?

පි: විදේශ ඇමතිවරයා ඒ වෙලාවේ හිටියේ මාරපන මහත්මයා.

ප්‍ර: තිලක් මාරපන?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ මහත්මයාගේ ඉල්ලීම මත ඔබ විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දුන්නා?මගේ ප්‍රශ්නය වන්නේ එම කාල වකවානුවේදී නාලක සිල්වා කියන පොලිස් නිලධාරියා එනම් අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු

FAIR COMMENT — BY JEZEEM

කරේ ත්‍රස්වාද විමර්ශන ඒකකයේ ඔහු ඒ වෙන කොට ත්‍රස්වාදි විමර්ශන ඒකකයේ සිටියා ද නැද්ද කියලා?

පි: සිටියා.

ප්‍ර: කවුරු වශයෙන් ද?

පි: අධ්‍යක්ෂක වශයෙන්

ප්‍ර: ඔබ දැන් ඒ ලබා දෙන්නට යෙදුන දිවුරුම් ප්‍රකාශයට සම්බන්ධ කරුණු ඔබගේ දැනීමේ හැටියට කුමන කොට්ඨාශයක් මගින් ඉදිරිපත් කරන්න ඕනේද ?

පි: ඔය හැමෝම ඉදිරිපත් කරා.

ප්‍ර: හැමෝම ඉදිරිපත් කරා ඒ ප්‍රමාණවත් හේතුව මත තමයි විශ්‍රාමික නිලධාරීවරයෙක් වුනත් ඒ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා දුන්නේ?

පි: එහෙමයි.

ප්‍ර: ඔබ කියා සිටියා හමුදා යුධ හමුදා බුද්ධි ඒකකයේ නිලධාරී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කවුරු විසින්ද එය සිදු කරන්න යෙදුනේ?

පි: ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය විසින්.

ප්‍ර: ඔබට දැනීමක් තියේද ඒ වන විට මෙම නිලධාරීන් අත්අඩංගුවට ගන්න අවස්ථාවේදී ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන් සිටියේ කවුද කියන්න?

පි: නාලක සිල්වා මහත්මයා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම අවස්ථාවේදී මෙම සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥවරයා දන්වයි සාක්ෂිකරු ලබා දුන් සාක්ෂියට අමතරව වෙනත් යමක් ඔහුට කොමිෂන් සභාවට පැවසීමට අවශ්‍ය දැයි විමසමි.

<u>සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කර සිටී</u>

මම මේ කියපු කරුණු අතරේදී ස්වාමිනි මගේ කාල වකවානුව තුල සහ එදායින් පසුව සිදුවූ අවසනාවන්ත සිද්ධින් අතරදී සඳහන් කල යුතුයි 2015 උදාහරණයක් ලෙස ජනවාරි මාසය වෙනකොට අපගේ බුද්ධි සේවාවන් රාජ්‍ය බුද්ධි සේවාවන් සහ අනෙකුත් බුද්ධි සේවාවන් ඉතාම කාර්යක්ෂමව ජාතික ආරක්ෂාව පිළිබඳව සෑම අංශයක්ම පුළුල් ලෙස සහ ක්‍රියාත්මක හොඳ ආවේක්ෂනයක් සිදු කරමින් පවත්වාගෙන ගියා. අර මගෙන් ඉස්සෙල්ලා ඇහුව ප්‍රශ්නේ වගේ ඇයි මම එතැනින් ඉවත් වුනේ කියලා මම දැක්කා ඊට පස්සේ ඒ අධිකාරි බලය හෝ ශක්තිය මේකට ලැබෙන්නේ නැහැ කියලා. ඒ නිසා තමයි මං මෙතනින් ගියේ ඉතින් ඒ වෙලාවේ තිබිච්ච කලමණාකාරිත්වය සාර්ථක භාවයත් ඉන්පසු ඇති වුනු අසාර්ථක භාවයත් නිසා තමයි අපිට මේ ප්‍රශ්නයට

LAW COMMENT BY JEZEEM

මුහුණ දෙන්න සිද්ධ වුනේ ඉතින් ඒ නිසා ඒ සිදු වීම ඒ අවාසනාවන්ත සිදුවීම මගේ පුද්ගලික නිරීක්ෂණය අනුව කිසියම් කණ්ඩායමකට ඕනකමට සහ එහෙම නැත්නම් ඉබාගාතේ යන්න දීලා නිකම් හිටියා කියලා අහක බලාගෙන හිටිය කියන කරුණ මට පුද්ගලිකව නිරීක්ෂණය වෙනවා මගේ අත්දැකිම අනුව ඉතින් ඒක නිසා මම විශ්වාස කරනවා මේ කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් වඩාත්ම උචිත සාධාරණයක් ඉෂ්ඨ වේවි කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම අවස්ථාවේදී මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය හේතුවෙන් ඔහුට යම් අනතුරක් හෝ බලපෑමක් ඇතිවිමට හැකියාවක් ඇති බව කොමිෂන් සභාවට පෙනී යන හෙයින් 2015 අංක 04 දරණ සාක්ෂිකරුවන් සහ විත්දිතයන් හට පහසුකම් සැලසීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 4 උපවගන්තිය ප්‍රකාරව මෙම සාක්ෂිකරුට හිමිවියයුතු සියළු අයිතින් සහ වරප්‍රසාදයන් සාක්ෂිකරුට ලබා දෙන ලෙසට විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට පහසුකම් සැලසීමේ හා ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

කොමිෂන් සභාවේ ඉදිරියට පැමිණ සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂියෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පල කරමි.

දැන් වේලාව ප.ව.12.25

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.02 වේලාව:පෙ.ව.10.40 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	594
නම	:	**මොහොමඩ් මොහිදීන් අබ්දුල් ගපූර්**
වයස	:	**අවුරුදු 64**
ආගම	:	**ඉස්ලාම්**
රැකියාව	:	**හිටපු අභියාචනාධිකරණ විනිසුරු**
ලිපිනය	:	**නො. 635, මල්වත්ත, මල්වාන.**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ගපූර් මැතිතුමනි ඔබතුමා අධිකරණ ක්ෂේත්‍රයට බැඳුනේ කවදද?

පි : ගරු සභාපතිතුමනි මම අධිකරණ ක්ෂේත්‍රයට බැඳුනේ 1987 ඔක්තෝම්බර් මාසේ 12 වෙනිදා.

ප්‍ර : ඒ කුමන තනතුරකටද?

පි : මම පළමුවෙන්ම මම සම්බන්ධ වුණේ කොළඹ අතිරේක මහේස්ත්‍රාත් කෙනෙක් වශයෙන්.

ප්‍ර : ඔබතුමා අද දින දිවුරුම ලබා දෙන අවස්ථාවේදී සඳහන් කරනු ලැබුවා ඔබතුමා විශ්‍රාමික අභියාචනාධිරකණ විනිසුරුතුමෙක් බව?

පි : එසේමයි.

ප්‍ර : එහෙම නම් ඒකෙන් අදහස් වෙනවා කියලා මා කිව්වොතින් නිවැරදිද ඔබ එතෙක් මහේස්ත්‍රාත්වරයෙකුගේ තනතුරේ සිට අභියාචනාධිකරණ විනිසුරුවරයෙකුගේ තනතුර දක්වා වූ දිසා අධිකරණ, මහ අධිකරණ යන ඒ සියල්ලේම රාජකාරී කරලා තිබෙන බව?

පි : එසේමය මැතිනියනි.

ප්‍ර : එසේ නම් ඔබතුමා මා කිව්වොතින් නිවැරදිද අප ශ්‍රී ලංකාව තුළ බොහෝ ස්ථානවල සේවයේ යෙදී තිබෙන බව?

පි : එසේමයි.

ප්‍ර : ඔබතුමාට අභියාචනාධිකරණ විනිසුරුවරයෙක් විදිහට පත් වීම ලැබුණේ මොන වසරේද?

පි : මම හිතන විදිහට 2015 වසරේදී.

ප්‍ර : ඔබතුමා එතකොට විශ්‍රාම ලැබුවේ මේ විනිසුරු දිවියෙන්?

පි : 2019.

ප්‍ර : මැතිඳුනි ඔබතුමා ඔය මහේස්ත්‍රාත්වරයෙකුගේ තනතුරේ සිට අභියාචනාධිකරණ විනිසුරුතුමෙකුගේ තනතුර දක්වා වූ මේ සේවා කාලය තුළදී රටේ විවිධ ප්‍රදේශවල සේවය කොට තිබෙන බව කියනු ලැබුවා?

පි : එසේමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේ අවස්ථාවල් වලදී විවිධ සිද්ධීන් ඔබතුමාගේ මතකයෙහි රැඳී තිබෙන්නට ඇති?

පි : එසේමයි.

ප්‍ර : අද දින ඔබතුමා පැමිණිලා තියෙන්නේ මේ ගරු කොමිෂන් සභාව ඉදිරියට ඔබතුමාට අත්දකින්නට ලැබුණු යම් සිද්ධියක් සම්බන්ධයෙන් සාක්ෂි දෙන්නට?

පි : එසේමයි මැතිතුමනි.

ප්‍ර : ඒ සිද්ධියට අමතරව ඔය අධිකරණ ජීවිතයේ දිවයිනේ වෙනත් පළාත්වල අධිකරණ රාජකාරීවල නියැලෙන කොට අත්දකින්නට ලැබුණු තවත් සිද්ධීන් පිළිබඳව ඔබතුමාගේ මතකයේ තියෙනවාද?

පි : තියෙනවා මැතිනියනි,සභාපතිතුමනි එහෙම තියෙනවා.

ප්‍ර : ඒ වගේ සිද්ධීන් කීයක් පිළිබඳව ඔබතුමාට මේ ගරු කොමිෂන් සභාවට දැනුම් දෙන්නට පුළුවන්?

පි : මම හිතනවා මේ සිද්ධියට අදාළ මං සිද්ධීන් තුනක් සම්බන්ධයෙන් විතර මට කියන්න හැකි.

ප්‍ර : ඒ කියන්නේ දැන් මේ අද දින මේ ගරු කොමිෂන් සභාවට කියන්නට යන සිද්ධියට අමතරව තව සිද්ධීන් කිහිපයක් මතකයේ තිබෙනවා කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : පළමුවන සිද්ධිය සිදු වුණේ මොන වකවානුවේද?

පි : මම 2012 වර්ෂයේදී මම නුවර එළිය මහ අධිකරණයේදී සේවය කළා. එක් දවසක් මම මගේ රාජකාරිය සඳහා නුවර එළියට යෑමෙන් සිටියදී මගේ ඉදිරියෙන් ගිය වාහනයකින් අත් ප්‍රතිකා රාශියක් බෙදා ගෙන යන එක දුටුවා. ඒ දුටු විගසම මම මගේ ආරක්ෂාවට හිටියා පොලිසියේ රාජමානික්කම් කියලා කෙනෙක්. එතුමාට කිව්වා මම ඒ අත් පත්‍රිකා එකක් මට ලබලා දෙන්න මොනවද කියලා මම බලන්න ඕනේ පාරේ දිගේ මෙහෙම විසි කරලා යනවා මම දකිනවා විදේශීකයන් විදිහට තමයි ඔවුන් දකින්නේ මම.

ප්‍ර : කාවද විදේශීකයන් විදිහට ඔබතුමා දැක්කේ නිරීක්ෂණය කළේ?

පි : ඔවුන්ගේ පාටෙන්.

ප්‍ර : නෑ නෑ කාවද දැක්කේ?

පි : ඒ වැන් එකේ ගමන් කරලා ඒ අත් පත්‍රිකා ගෙනල්ලා දාන අයව.

ප්‍ර : බෙදන අයව?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ ඒ වගේ උපදෙස් දුන්නා ඔබේ පෞද්ගලික ආරක්ෂක නිලධාරියාට?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඊට පස්සේ මොකද වුණේ?

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතුමා මට ඒ අත් පත්‍රිකාවක් ලබා දුන්නා. ඒ අත් පත්‍රිකාව මම බැලුවාම ඒකේ තිබුණා බුදු දහම නින්දා කරලා. මට

ප්‍ර : මොන භාෂාවෙන්ද තිබුණේ මැතිතුමනි?

පි : සිංහල භාෂාවෙන් ඕකේ තිබුණේ.

ප්‍ර : සිංහල භාෂාවෙන් තිබ්බේ. දැන් මේ නුවර එළිය ප්‍රදේශයේ බෙදන්නේ?

පි : මේ රම්බොඩ පාස් කරලා මම යනවා.

ප්‍ර : ඔව්.

පි : මේ බෙදා ගෙන යනවා.

ප්‍ර : ඔව්.

පි : මට ලොකු වේදනාවක් ඇති වුණා.

ප්‍ර : ඇයි ඒ?

පි : මේ හැම සමාජයේම ඉතාම සාමයෙන්, සමඟියෙන්, සතුටින් ජීවත් වන මේ අවදියේදී මෙවැනි අත්පත්‍රිකාවක් තවත් ආගමක් නින්දා කරමින් බෙදන කොට මම හිතුවා මට වගකීමක් තියෙනවා මේ සම්බන්ධයෙන් පියවර ගන්න ඕනේ කියන මට හැඟීමක් ඇති වුණා.

ප්‍ර : ඔව් ඔබතුමා ශ්‍රී ලාංකිකයෙක්?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඒ වගේම ඔබතුමා සඳහන් කරනු ලැබුවා මෙම වාහනයේ මේ අත් පත්‍රිකා බෙදපු වාහනයේ සිටි අය ඒ බෙදීම සිදු කළ අය විදේශිකයන් බව ඔබතුමා නිරීක්ෂණය කළා කියලා?

පි : එසේමයි.

ප්‍ර : ඒ මොන කරුණු හේතු කර ගෙනද ඔබතුමා එම නිරීක්ෂණය සිදු කෙරුවේ?

පි : මම ඒ ලංකාවේ ඒ අයයි මම මේ ලංකාවේ ගොඩක් අධිකරණවල වැඩ කරලා තියෙනවා. නුවර එළියේ ගොඩක් විදේශිකයන් යනවා ඒ කාලේ. ඒ නිසා මම ඔවුන්ගේ පාටෙන් ඔවුන්ගේ අනිත් එක රූපෙන් මම දැක ගත්තා ඔවුන් විදේශිකයන් බව.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : වර්ෂය?

පි : 2012.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : මැතිදුනි ඔවුන්ගේ හැඳ පැළඳ සිටි ආකාරයේ යම් වෙනසක් දැක්කද ඔබ?

පි : ඔව් අපි ලාංකිකයන් අඳින ඇඳුම් නෙවෙයි ඔවුන් ඇඳගෙන හිටියේ.

ප්‍ර : මොනවද ඔවුන් ඇඳගෙන හිටියේ?

පි : ඔවුන් අරාබි දේශයේ මිනිස්සු ඇඳගෙන හිටිය ඇඳුම්.

ප්‍ර : ඔබතුමා සඳහන් කෙරුවා දැන් මේ අත් පත්‍රිකා මඟින් ඒ සිංහලෙන් මුද්‍රණය කරලා තිබ්බේ. බුදු දහමට නිගාවෙන ආකාරයට තමයි ඒ අත් පත්‍රිකාවල අන්තර්ගතය තිබ්බේ කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඒ වගේම ඔබතුමා සඳහන් කළා දැන් යම් පියවරක් මේ සම්බන්ධයෙන් ගන්නට ඕනේ කියන හැඟීම ශ්‍රී ලාංකිකයෙක් විදිහට ඔබතුමාට ඇති වුණා කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඉතින් මොකද ඔබතුමා කළේ?

පි : මම ඒ වේලාවේම මගේ ආරක්ෂක නිලධාරීන්ට කිව්වා ඒ පළාත අයිති වෙන්නේ මං හිතන්නේ තලවතැන්න පොලිසියට. තලවතැන්න පොලිසියට දුරකථනයක් ලබා දීලා මොවුන් සම්බන්ධයෙන් පියවර ගන්න කියලා මං කිව්වා.

ප්‍ර : ඔබතුමා ඊට පස්සේ පෞද්ගලිකව ඒ පිළිබඳව විමසිලිමත් වුණාද ඔබතුමාගේ උපදෙස් ඔවුන් විසින් ක්‍රියාත්මක කරලා තිබුණද කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : මොනවද ඔබතුමා දැන ගත්තේ?

පි : ඊට පස්සේ ඔවුන්ව අත්අඩංගුවට අරන් මං හිතන්නේ රැඳවුම් නියෝග මත ඔවුන්ව මම හිතනවා නුවර එළිය හෝටලයක තබා ගෙන හිටියා. ඉන් පසුව ඔවුන් සම්බන්ධයෙන් මම හිතුවා රටින් පිටුවල් කිරීමට මං හිතනවා පියවර ගත්තා කියලා .

ප්‍ර : පියවර ගත්තයි කියලා ඔබතුමා හිතනවා?

පි : ඔව්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : අත්පත්‍රිකාවක් තබා ගත්තේ නැද්ද?

පි : මා ළඟ අත් පත්‍රිකාවක් තිබුණා. මට අද ගෙන්න බැරි වුණා. මම ළඟ තිබුණා අත් පත්‍රිකාවක් දැන් හොයලා බලන්න ඕනේ . I had one I think it is or with the law enforcement authorities.

ප්‍ර : ඒකේ කියලා තිබ්බේ මොකක්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : I can't just I can't tell those things (මට මතකයෙන් කියන්නට අපහසුයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : නමුත් එහි තිබුණේ මොකක්ද කියන එක සාරාංශයක් විදිහට ඔබතුමාට කියන්නට හෝ මතකයක් තියෙනවාද? ඔබතුමා කිව්වනේ බුදුදහමට නිගාවන දෙයක් එහි තිබ්බේ?

පි : එසේමයි.

ප්‍ර : ඒකයි ඔබතුමා මේ වගේ තීරණයක් ගත්තේ කියලා?

පි : එසේමයි.

ප්‍ර : පොලිසියට කියන්නට?

පි : ඔහුගේ බුදුරජාණන් කියන බුදු ගුණය අවතක්සේරු වන අන්දමට තමයි ඕකේ කරුණු තිබුණයි කියලා මට මතකයි.

ප්‍ර : ඒ පළවෙනි සිද්ධිය 2012?

පි : ඔව්.

ප්‍ර : ඊළඟ සිද්ධිය කොයි කාලේද මැතිඳුනි ඔබතුමාගේ මතකයේ තියෙන්නේ?

පි : දැන් ඒ සිද්ධියේදී මම හිතනවා ඉතාම ක්ෂණිකව පියවර ගත්තා ඒ කාලේ අරන් මම හිතන්නේ ඒක පහළ ඉඳලා ඉහළ දක්වා වූ ඕක ගියා. ඒ කාලේ හිටිය ජනාධිපති මං හිතන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා පවා ඕක දැන ගත්තයි කියලා අපිට ආරංචි වුණා මේ වගේ සිද්ධියක් වෙන්න ගිහිල්ලා ලංකාවේ ලොකු මේ වගේ ප්‍රපාතයකින් මිදින්න මේ සිද්ධිය නිසා වැළකුණා කියලා.

ප්‍ර : එතකොට ඔය ඔබතුමා කියන්නට උත්සාහ කරන ඔය දෙවෙනි සිද්ධිය මොන වසරේදී වගේද සිද්ධ වුණේ?

පි : මම කියන්නේ මේ පාස්කු සිද්ධිය දෙවෙනි සිද්ධිය. මම හිතන්නේ 2016 වර්ෂයේ කියලා මම හිතන්නේ.

ප්‍ර : ඒක පාස්කු සිද්ධියට සම්බන්ධ නෑ. නමුත් ඊට පෙර 2016 දී සිදු වුණු සිද්ධියක්?

පි : ඔව්.

ප්‍ර : මොකද මැතිඳුනි වුණේ 2016 දී?

පි : ඇත්ත වශයෙන්ම මම මාල්වාන ජාතික පාසලේ ඉගෙනුම ලබපු කෙනෙක්.

ප්‍ර : ඔව්.

පි : මට ඒ කාලේ නුවර පළාතෙන් ගුරුවරියක් හිටියා .

ප්‍ර : එයට පෙර ස්වාමිනි තවත් සිද්ධියක් තිබෙනවා ඒ පිළිබඳව දැන් සාක්ෂිකරුගෙන් විමසනවා.

FAIR COMMENT
BY JEZEEM

පි : 2016 අපේ අන්තර්ජාලයේ වයිබර්, වට්ස්ඇප් තාක්ෂණය ඔස්සේ අපි බලන විට මට මේ ඒ කාලේ සහරාන් කියලා කියන තැනැත්තා කියලා දන්නවා. නමුත් ඔහුගේ කතාවල් අපි බැලුවා. මේක ලංකාවට ගැළපෙන්නේ නෑ.

ප්‍ර : මොකේද ඔබතුමාලා බැලුවේ?

පි : මේ වට්ස්ඇප්, වයිබර් ඔස්සේ මේ Facebook ඔස්සේ ඔහු පතුරවනවා ලොකු ප්‍රචාරවල්.

ප්‍ර : මොනවද ඔහු පතුරපු ප්‍රචාර?

පි : මේ අනිකුත් ආගම නින්දා කරලා මේ නොයෙකුත් කතාවල් කියනවා ලංකාවේ ඉන්න සමාජයේ අය අතර මේ ප්‍රශ්න ඇති කිරීම තරම් ඉතාම වැදගත් කරුණු රාශියක් අඩංගු කතාවල් ඔහු කියනවා.

ප්‍ර : මැතිතුමනි මම පොඩ්ඩක් බාධා කරනවා. නමුත් සහරාන් විසින් ඒ විඩියෝ මාර්ගයෙන්, වට්ස්ඇප්, වයිබර් තාක්ෂණ මාර්ගයෙන්, නොයෙකුත් මෘදුකාංග මාර්ගයෙන් ඔහුගේ අදහස් ප්‍රකාශ කරමින් කිව්වේ කුර්ආන් එකේ සහ ශුද්ධ වූ කුර්ආනයේ සහ හදීස්වල තියෙන දේවල් නෙවෙයිද?

පි : නෑ නෑ.

ප්‍ර : ඔහු නමුත් කියනවා නේද ඒ විඩියෝ පටවල ඒ ඔහුගේ කථිකාවල යම් යම් he cites verses

පි : YES.

ප්‍ර : යම් යම් යෙදුම් පිළිබඳව ඔහු ගෙන හැර දක්වමින් නේද ඒ ඔහුගේ කතාවල් කරන්නේ?

පි : ඔව් ඔහු විකෘති කරලා තමයි ඕවා කියන්නේ.

ප්‍ර : ඔබතුමා කියන්නේ එසේ අදහස් ප්‍රකාශ කිරීම විකෘති කිරීමෙන් පසු?

පි : විකෘති කරලා ඔහු ඒ කුර්ආන්වල තියෙන්නේ සාමය, සමගිය ගැන තමයි. ඔහු කියන්නේ නිකම් විකෘති කරලා ඔහුගේ මං හිතන්නේ අන්තවාදී මනසින් තමයි ඔහු එවැනි දේවල් පතුරුවන ගෙන ගියේ.

ප්‍ර : මැතිඳුනි ඔබතුමා අද දින මේ ගරු කොමිෂන් සභාවට කිව්වා ගරු අභියාචනාධිකරණයේ විනිසුරු පදවියෙන් ඔබතුමා විශ්‍රාම ගත්තේ 2019 කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : එතකොට එහෙම නම් ඔය 2016 සිද්ධිය සිදු වන විටත් ඔබතුමා ඔය නිරීක්ෂණය කරපු සහරාන් විසින් විවිධ ආගමික අන්තවාදී මත නේ පතුරුවලා තියෙන්නේ. ඒවා ප්‍රකාශ කරන කොටත් ඔබතුමා විනිසුරු ධූරයක් හොබවනු ලැබුවා?

පි : එසේමයි මැතිනියනි.

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම නම් ඔබතුමා මොකක්ද ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර. ඔබතුමා මේ ගැන කවුරුහරි කතා කළාද මේ සහරාන් මේ වගේ ක්‍රියා කලාපයක් පවත්වා ගෙන යනවා කියන එක දැන ගත්තේ ඔබතුමා විතරද? මුස්ලිම් ජන කොටඨාශයේ අනිත් අය ඒ ගැන දැන ගෙන හිටියේ නැද්ද?

පි : අනිත් කොටඨාශයත් දැන ගෙන ඉඳලා ඇති. මං කියන්න යන්නේ ඒ සහරාන් කියන තැනැත්තා මේ 2016 ගංවතුර කාලයේදී.

ප්‍ර : කොහේටද ගංවතුර තිබුණේ මැතිතුමනි?

පි : අපේ ගමේ මල්වානේ සම්පුර්ණයෙන්ම යටවුණා. ඒ යට වෙච්ච කාලයේදී ඔහු ආධාර වශයෙන් හාල් ලොරියක් අරගෙන ඇවිල්ලා තිබුණා. දැන් පස්සේ තමයි මේ පුද්ගලයා කියලා අපිට දැනුනේ.

ප්‍ර : ඒ කියන්නේ පස්සේ තමයි ඔබතුමන්ලා දැන ගත්තේ මේ සිද්ධිය භාජනය වෙලා තිබ්බේ සරහාන් කියලා?

පි : ඔව්.

ප්‍ර : හාල් ලොරිය ගෙනල්ලා තිබ්බේ සහරාන් කියලා?

පි : ඔව්.

ප්‍ර : මොකද වුණේ මැතිතුමනි?

පි : අපි ඒක ගත්තේ නෑ. ඔහුව ගමෙන් පලවා හැරියා ඔවුන්ගේ මේ ආධාර අපිට ඕනේ නෑ. ඒක ගත්තත් මේක හරි කරදරකාරී, කලබලකාරී ගන්න හොඳ නැති පුද්ගලයෙක් කියලා අපි පලවා හැරියා මල්වාන ප්‍රදේශයේ ඉඳලා අපි එපා කියලා.

ප්‍ර : ඔබතුමා ඔබතුමාගේ පිළිතුරේ මේ අපි කියන බහු වචනය පාවිච්චි කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබතුමා හැරෙන්නට වෙන කවුද ඔය තීරණයට එළඹුණේ?

පි : අපේ මේ සාමාන්‍යයෙන් පරණ නිකායකට අයිති කට්ටියක් මමත් ඒ පල්ලිවල ඉන්නවා.

ප්‍ර : ඔබතුමාට ඒක හෙළි කිරීම ප්‍රශ්නයක් නැත්නම් අපිට දැන ගන්නට පුළුවන්ද ?

පි : I belong to the surfi sect

ප්‍ර : Surfi?

පි : Yes. That is the old traditional surfi sect.

ප්‍ර : YES . පාරම්පරික

පි : සූෆි මතවාදය හිතේ පමණක් තමයි ආගම රඳා පවතින්න ඕනේ කියලා තමයි සූෆි මතවාදය That is inner version. Not a outer

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Look. That means we are only concerned about the divine love, not the love letter.

ප්‍ර : එතකොට මැතිතුමනි දැන් ඔය අපි කියන ඒ බහු වචනය ගැනනේ මම ඇහුවේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය මල්වානේ ඉන්න සූෆී නිකායට අයිති කට්ටියද ඔය ඒ තැනැත්තන්ද තීරණය ගත්තේ සහරානුත් එපා එයාගේ ගෙනාපු හාල් ලොරිත් එපා කියලා?

පි : එහෙමයි මැතිනියනි.

ප්‍ර : දැන් එහෙම කරන්නට ඇයි හේතු වුණේ?

පි : ඔහු ඔහුගේ අන්තවාදී මේ අපි සිංහල ජනතාව අතර තමයි මේ අවුරුදු ගාණක් ජීවත් වෙන්නේ. අපි අතර ගොඩක් සම්බන්ධතා තිබුණා. සාමාන්‍යයෙන් ඕන විපතකදී, සැපතකදී අපි යනවා පන්සල්වලට. ඊයේ පෙරේදා කොරෝනා ආපු වේලාවෙත් මම තවත් යාළුවෙක් සමඟ ගිහිල්ලා බඩු බාහිර ආදීය පන්සල්වලට ගිහිල්ලා බෙදලා ආවා. ඒ මොකද අපිට ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබුණා. දැන් මේ වගේ මේ අන්තවාදී අදහස් තියෙන මේ වගේ පුද්ගලයෙකුගෙන් බඩු ගත්තා නම් අපි කොහොමද ඔය පළාත්වල අපේ තිබුණු මේ සම්බන්ධතාවය දිගට ගෙනියන්න බෑ. ඒ මොකද මං හිතන්නේ ඒ කාලේ අපි ගත්තු තීරණය මම අදට සතුටු වෙනවා ඔහුගේ හාල් ඇටයක්වත් ගන්නේ නැතුව අපිට ඔහුව පළවා හරින්න කරන්න තිබුණු එකේ මේ අපි සතුටු වෙන්න පුළුවන් ඇයි දැන් මෙච්චර කතෝලික ජනතාව මිය ගිහිල්ලා තියෙනවා. මේ වගේ දේකට සම්බන්ධ වෙලා මූලිකව කටයුතු කළේ මේ සහරාන් කියන එක්කෙනා. අපි කතෝලික ජනතාවගෙන් සමාව පතන්න ඕනේ මුස්ලිම් සමාජය වෙනුවෙන් මේ වගේ දෙයක් මුස්ලිම් නම තියාගෙන මේ වගේ දෙයක් කළා. අපි ඔවුන්ව භූමදානවත් කළේ නෑ. උන් මේ රටට හතුරෝ. මං කියන්නේ මේ සිද්ධියෙන් පස්සේ ලංකාවේ ලේ වැගිරීමක් නැති වුණා නම් ඒ අර අතිඋතුම් කාදිනල්තුමාගේ හැසිරීම ඔහුගේ පසු හැසිරීම ඔය එතුමාගේ ගොඩක් මහත්මා ගතිගුණ, නායකත්වය නිසා තමයි ලංකාව මෙතරම් දුරට බේරුණේ. නැත්නම් මේක වෙනත් විදිහට ගියා නම් ලංකාවේ හැම පැත්තෙන්ම ලේ වැගිරෙන්න සිද්ධ වෙන්න ඉඩ තිබුණා. ඒ නිසා තමයි අපි කතෝලික ජනතාවගෙන් සමාව පතන අතර ඔවුන්ගේ නායකයාගෙන් අපි ඔබ උතුම් ගුණ සම්බන්ධයෙන් අපි සතුටට පත් වෙන්න ඕනේ. මට මතකයි මේ දෙවෙනි ලෝක යුද්ධයේදී මම පොතක කියවනකොට හිට්ලර්ගේ දෙවෙනියාට චෝදනාවක් තිබුණා කෝටි තුනක මිනිස්සු පුළුස්සා මරා දැමීම. ඔහු කිව්වා මට

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මේක කිව්වේ අපේ නායකයා කියලා හිට්ලර් කියලා ඔහුගේ නිදහසට කරුණු . මෙවැනි මීට වඩා හරි උතුම් නායකයෙක් තමයි කතෝලික ජනතාවට ඒ අවස්ථාවේ හිටියේ.

ප්‍ර : ලංකාවේ?

පි : ඔහු කිව්වා මේ නියම මිනිස්සු අත්අඩංගුවට ගන්නවා මිසක අසරණ මිනිසුන්ට හිරිහැර කරන්න එපා. මේක අපි හොයා බලමු කියලා ඔහුගේ පසු හැසිරීම නිසා සමාජයේ ලොකු කැලැල්ලක් මම හිතුවා නැති වුණා කියලා. අපි ඒ සම්බන්ධයෙන් මම කතෝලික ප්‍රදේශවල වැඩ කරලත් තියෙනවා. මාරවිල, මීගමුව වගේ ප්‍රදේශවල. ඔවුන් ඉතාම අහිංසක ජනතා කාණ්ඩයක් තමයි ඉන්නේ එම කාණ්ඩයට.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔය සහල් ලොරිය ඔබලා විසින් පිටකර ඇරියේ භාර නොගෙන මොන අවුරුද්දේද?

පි : 2016 මේ ගංවතුර කාලේ මං හිතන්නේ මැයි මාසේ වෙන්න ඕනේ කියලා මම හිතනවා.

ප්‍ර : එයින් වැටහෙන්නේ ඔබලා මෙම සහරාන් හඳුන ගෙන ඒ ඔහු අන්තවාදීයෙක් බව එම අවස්ථාවේ මල්වානේ යම් පිරිසක් දැන ගෙන හිටියා?

පි : ඔව් සහරාන් ඒ කාලේ අන්තවාදය පතුරවනවා කියලා අපිට දැනුමක් තිබුණා.

ප්‍ර : දැනුමක් තිබ්බා?

පි : ඔව්.

ප්‍ර : එතකොට තමන්ලාගේ මල්වානේ ප්‍රභූවරු පිරිසක් හිටියා?

පි : එසේමයි.

ප්‍ර : ඒ ඉස්මයිල් හජ්ජියාරුත් ඒ ප්‍රභූවරු අතර හිටපු පුද්ගලයෙක්ද?

පි : නෑ. අපි වෙන නිකායකට අයිති වෙන්නේ.

ප්‍ර : ඔහු වෙන නිකායකට.

පි : අපි වෙන නිකායකට.

ප්‍ර : ඔහු?

පි : එයා අපේ විවිධ මත දරන පල්ලි තියෙනවා. ඒ නිසා ඔහු අපිට සම්බන්ධ කෙනෙක් නෙවෙයි.

ප්‍ර : එතකොට සාක්ෂිකරු එදා සහරාන් ලොරියක් අරන් එන අවස්ථාවේදී සහරාන් සමඟ ආ මල්වානේ පිරිසකුත් ඉන්න ඇතිනේ. මල්වානේ කට්ටියකුත් ඉන්න ඇතිනේ නැත්නම් එන්න බෑනේ.

FAIR COMMENT BY JEZEEM

පි : ඒ කාලයේ ගරු විනිශ්චකාරතුමනි ඒ කාලේ විවිධ පළාත්වලින් ආධාර ආවා මල්වාන යට වෙලා කියලා. අපි ඒක කියන්නේ නැතුවම සාමාන්‍යයෙන් බෞද්ධ ජනතාවත් අරන් ආවා.

ප්‍ර : කෙසේ හෝ විශේෂයෙන් දැන ගන්න සහරාන්ගේ අනන්‍යතාවය හඳුනා ගෙන ඔහුව එළවා දැමීමට යම් පිරිසක් ඔහු ගැන දැන ගෙන ඉඳලා තියෙනවා මල්වානේ?

පි : එසේමයි.

ප්‍ර : ඒ පිරිස කවුද?

පි : අපේ ආගමික නායකයෙක් හිටියා. ඔහු මේයාව දුටුවා. දුටුවා දුටුවා කිව්වා නම් මෙයා සහරාන් ඒ නිසා මෙයාගේ දේවල් ගන්න එපා කියලා.

ප්‍ර : කවුද නායකයා ?

පි : එයා මේ බේරුවල ඉන්න ෂූෆි සෙක්ට් එකේ ආගමික නායකයා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : Sir if you have any problem in giving out any information in public you are permitted by the Honourable commissioners to write it and give it. That option is available.

පි : No, that he is the leader of the qadiriyya sect who was residing in beruwala. He was there in order to do this type of operation, that is relief operations. He saw him.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඒ සහරාන් ඒ අන්තවාදී කටයුතු දැන ගත් අවස්ථාවේදී ඔබලා යම් කිසි ඔහුගේ කටයුතු සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් හෝ ඔහු සම්බන්ධයෙන් 2016 හෝ පොලිසියට අවශ්‍ය පුද්ගලයෙක් බව දැන ගෙන ඒ සම්බන්ධයෙන් යම් තමන්ලා අන්වාදය සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු වට්ස්ඇප් මාර්ගයෙන් දැන ගෙන හිටියා. එම අන්තවාදී කටයුතුවල තියෙන බැරුරුම් තත්ත්වය මත තමයි ඔහුව පලවා හැරියේ?

පි : එසේමයි.

ප්‍ර : ඔහු සම්බන්ධයෙන් යම් කිසි නීතිමය පියවරක් ගන්න පොලිසියට හෝ පැමිණිලි කිරීමට බලාපොරොත්තු වෙලා නැද්ද?

පි : ඒ කාලේ ඔහු සම්බන්ධයෙන් ලංකාවේ කිසිම පැමිණිල්ලක් හෝ චෝදනාවක් කවුරුත් නඟලා තිබුණේ නෑ. අපි අපිම හිතලා තමයි ඔහුව පලවා හැරියේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඔබලා ඒ අවස්ථාවේදී ඔහු ගැන නිවැරදි තීරණයක් අර ගත්තේ?

පි : එසේමයි ගරු විනිශ්චකාරතුමනි. අදත් ඒ සම්බන්ධයෙන් අපි සතුටට පත් වෙනවා.

ප්‍ර : ඒ නිවැරදි තීරණය තවදුරටත් ඔහුට විරුද්ධව එම තීරණය උඩ නීතිමය ක්‍රියාමාර්ග වලට යොමු වෙන්න බැලුවේ නැද්ද ඔබලාගේ මල්වානේ ප්‍රභූ පන්තිය?

පි : දැන් ඒ කාලේ ඒ සම්බන්ධයෙන් ඊට ඔබ්බෙන් මොනවත් කරන්න අපිට ඔහු අන්තවාදී ප්‍රචාරක කටයුතු නිසා තමයි අපි කළේ. වෙන දෙයක් අපි කළේ නෑ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබතුමා දැන් කව්වනේ සිද්ධීන් කිහිපයක් මැතිතුමනි?

පි : ඔව්.

ප්‍ර : ඔබතුමාගේ මනසේ තියෙනවා කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න. එතකොට එයින් දෙකක් කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඊළඟ එක කවදද සිද්ධ වුණේ මොක වකවානුවේද?

පි : මම හිතනවා තුන්වෙනි එකත් 2016 තමයි ඒ සිද්ධිය මට මතක.

ප්‍ර : 2016 සිද්ධ වුණේ.

පි : ඔව්.

ප්‍ර : 2016 දී ඔබතුමාගේ මතකයේ ඉන්න ඔය ඊළඟ සිද්ධිය මොකක්ද? ඒ තුන්වෙනි සිද්ධිය 2016 දී සිදු වුණා කියන දෙවෙනි සිද්ධිය?

පි : මන්ද මේ දැන් මට දවසක් මම මගේ කාර්යාලයේ ඉන්න කොට මට ඒ කාලේ මම ඒලෙවෙල් පන්තියේ ඉගෙනුම ලැබූ ගුරුවරියක්. මට දුරකථනය ඔස්සේ කතා කරලා කිව්වා දැන් අර ආශික් නැමැති තැනැත්තා අන්තවාදය ISIS සංවිධානයට සම්බන්ධව වැඩ කරන බවත්, මේ සම්බන්ධයෙන් එය ඔහුට මේක කරන්න එපා කියලා පැවසූ විට ඇයවත් මරා දැමීමට තමන්ට ඉහළ නියෝග තිබෙන බවත් මට මගේ ගුරුවරිය කිව්වා.

ප්‍ර : ආශික් කියන්නේ ඔබතුමාගේ ගුරුතුමියගේ කවුද?

පි : පුතෙක්. ඒ නිසා ඇය බය වුණා ඇය හිතුවා මේක ඉතාම හොඳ කෙනෙකුට කියලා තමයි මොහුව පුනරුප්ඨාපනය කරන්න ඕනේ නැත්නම් මේකෙන් ලොකු කැලැල්ලක් වෙයි. එයා හිතුවා මම හිතන්නේ එයා විරෝධාර කාන්තාවක් කියලත් මට කියනව පුළුවන්. ඒ මොකද ඇයට ඒ සිද්ධිය දැනුණු විගසම මට කතා කරලා කිව්වා මේකට යම් කිසි පියවරක් ගන්න කියන කතාව.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මැතිතුමනි ඔබතුමාට විරෝධාර බව දැනුණු ඒ මැණියන්ගේ නම මොකක්ද? ඒක ප්‍රකාශයට පත් කරන්න අපහසුයි නම් ලියලා දෙනවා නම් අපි ස්තූතිවන්ත වෙනවා.

පි : Zakiya Moulana of kandy

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

(මේ අවස්ථාවේදී සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ඔහු ලේඛනයක සටහන් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එය සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නේට පිළිතුරක් ලෙස සටහන් කළ යුතු බව ලඝු ලේඛිකාවට නියෝග කරමි.)

ප්‍ර : මැතිතුමනි ඔබෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබ කියන හැටියට මේ ආශික් කියන තැනැත්තා ISIS මතවාදය දරමින් සිටියා කියලා ඒ අවස්ථාවේදී ඔහුගේ මවට වැටහුණාද?

පි : එසේමයි ගරු සභාපතිතුමනි.

ප්‍ර : එතකොට ඒ මව තමයි දැන් ඔබ නම ලියලා දුන්නු ඒ මව තමයි ඔබට කතා කරන්නේ?

පි : මට කතා කරලා එළියට ඇවිල්ලා කතා කරලා කිව්වා මෙහෙමයි මේ විදිහට.

ප්‍ර : එතකොට ඔහු ඒ මව ඔබට කතා කරන්න ඉස්සෙල්ලා ඒ ආශික් කියන තැනැත්තාව ඒ මතවාදයෙන් බැහැර කිරීමට ප්‍රයත්නයක් දරලා තියෙනවා?

පි : එසේමයි ගරු සභාපතිතුමනි.

ප්‍ර : එම ප්‍රයත්නය දැරුවාම එම ආශික් කියන තැනැත්තා තමන්ගේ මවට මරණ තර්ජනයක් එල්ල කෙරුවා?

පි : එසේමයි ගරු සභාපතිතුමනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබතුමාට ඔය කරුණු ඔබතුමාගේ ගුරුතුමිය දැනුම් දුන්නේ කොහේදීද?

පි : මම එම ගුරුතුමිය මම මේ මගේ අභායාචනාධිකරණයේ තනතුරු ලබා ගැනීමට පෙර ගිහිල්ලා ආශිර්වාදය ලබා ගෙන ආවා. ඊට පස්සේ එතුමිය මට දුරකථන මාර්ගය ඔස්සේ තමයි මට මේක කිව්වේ.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඒ කියන්නේ දැන් එතුමිය ඒ මැණියන් ඔබතුමාට කතා කරන්නට තීරණය කරන අවස්ථාව වන විට එහෙනම් එතුමිය දන්නවා ඔබතුමා මේ අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ තනතුරක් දරනු ලබන පුද්ගලයෙක් බව නේද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් එතුමිය මට කතා කරලා හොඳට සතුට පළ කළා මේ වගේ ඒ මම ඉගෙන ගත්තේ ඒ කාලේ 74 වකවානුවේ තමයි එතුමිය මට ඉගැන්නුවේ. ඉන් පස්සේ මේ වගේ මම උසස්වීමක් ලැබිලා මේ වගේ දේවල් කිරීම සම්බන්ධයෙන් එතුමිය මට සතුට පල කරලා තියෙනවා.

ප්‍ර : එතකොට ඊට පස්සේ තමයි එතුමිය ඔබතුමාට කතා කරලා එතුමියට තියෙන මේ පෞද්ගලික ප්‍රශ්නය තමන්ගේ ආදරණීය දරුවා ගැන තියෙන ප්‍රශ්නය ගැන කිව්වේ?

පි : එසේමයි.

ප්‍ර : ඒ වගේම ගරු සභාපතිතුමා අහන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔබතුමාණන් වැඩිදුරටත් පැහැදිලි කරනු ලැබුවා ඒ වගේ මවකට ඒ පුතණුවන් මරණ තර්ජන පවා එල්ල කරලා තියෙනවා කියලා ඒ ඔහු ඒ සම්බන්ධ වෙලා ඉන්න කරුණ පිළිබඳව ඒ කටයුතු පිළිබඳව අනාවරණය කෙරුවොත් වෙන දේ විදිහට?

පි : එසේමයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඒ පුතාගේ වයස කීයද?

පි : Just after I think peradeniya university education.

ප්‍ර : 22 ක් විතර?

පි : මම හිතන විදිහ 22 ක් 23 ක් ඇති කියලා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබතුමාණන්ට අවස්ථාවක් ලැබුණද ආශික්ව මුණ ගැහෙන්න?

පි : නෑ මැතිනියනි.

ප්‍ර : හම්බ වුණේ නෑ?

පි : ඒ අර ගෙදරදී දැකපු අවස්ථාව මිසක ඊට පස්සේ මට

ප්‍ර : හම්බ වුණේ නෑ?

පි : හම්බ වුණේ නෑ.

ප්‍ර : එතකොට දැන් දුරකථනයෙන් ඔබතුමාගේ ගුරුතුමිය මේ කරුණු ඔබතුමාට දැනුම් දුන්නාම ඔබතුමාට මොනවද හිතුණේ?

පි : මම හිතුණා මේ සම්බන්ධයෙන් අපි තීරණයක් ලොකේ හැම රටවල්වලම මේ ISIS මතධාරීන් විනාශකාරී දේවල් කර ගෙන යන වකවානුවක මම හිතුවා මේකට මට කියපු එයා කියපු විශ්වාස විදිහට මට කිව්වේ ස්වාමිනි සම්බන්ධයෙන් යම් කිසි පියවරක් ගන්න ඕනේ කියලා.

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබතුමා කල්පනා කළාද දැන් ගුරුතුමියගේ ගෙදරත් ගිහිල්ලා තියෙන නිසා ඒ අවස්ථාවේදී හම්බ වුණානේ මේ පුතණුවන්ව ඔහුව මුණ ගැහිලත් තියෙන නිසා ඔහුට කතා කරොතින් වඩා සුදුසුද කියලා?

පි : මන්ද ඔහු මේ ත්‍රස්තවාදීන් ගණනාවක් එක්ක සම්බන්ධ වෙලා තිබෙන පුද්ගලයෙක් කියලා ඒ මව කියන කොට කිව්වා ඔහු සමඟ තවත් ගොඩක් අය මේකට සම්බන්ධ වෙලා ඉන්නවා කියලා. ඉතින් මට බයත් හිතුණා මේක එළියේ එයාට කතා කරන්න එයාගේ අම්මාට මෙවැනි කතාවක් කිව්වාම මට ඊට වඩා දරුණු විදිහට නැත්නම් ඒ ඡාලයේ ඇති පිරිසකට කියලා හානියක් කරයි කියලා. මට ඒක බය හිතුනා.

ප්‍ර : දැන් ඒ තැතිගැන්ම ඒ කනස්සල්ල ඔබතුමාගේ හිතේ ඇති වුණාම දැන් ඔබතුමාගේ ගුරුතුමියට උදව් කරන්නට ඕනනේ?

පි : එසේමයි.

ප්‍ර : ඉතින් මොකක්ද ගත්ත පියවර?

පි : ඇත්තමයි අපේ ගමේ මේ ඉන්නවා අපේ නිකායට අයිති මේ කට්ටියත් ඉන්නවා. එකේ එක්කෙනෙක් තමයි මේ සාජාත් මාසුන් කියලා මේ ෂැංග්‍රීලා හෝටලයේ ලංකාවේ කොටස්කරුවා අයිතිකාරයා ලංකාවේ partner .

ප්‍ර : ඔහු ඔබතුමාට යම් ඥාති සම්බන්ධකමක් තියෙනවද?

පි : ඥාති සම්බන්ධයකුත් තියෙනවා. මම එතුමාට කිව්වා ඒ මොකද ඒ එතුමා ඉතාම වැදගත් පුද්ගලයෙක්. අපිත් එක්ක ආගමික කටයුතුවලත් සම්බන්ධ වෙනවා. මම මේ සම්බන්ධයෙන් එතුමාට තමයි පළමුවෙන්ම කිව්වේ.

ප්‍ර : එතුමාව තෝරා ගැනීමට ඔබතුමාට තිබුණු හේතුව මොකක්ද?

පි : එතුමා සාමාන්‍යයෙන් ලංකාවේ ඉහළ තලයේ ගොඩක් අයත් එක්ක සම්බන්ධකම් තියෙනවා. මම හිතුවා එයා හරි උපදෙසක් මේ සම්බන්ධයෙන් ලබා දෙයි කියලා මම හිතුවා.

ප්‍ර : එතකොට මොහොමඩ් සාජීත් මවුසුත් නේ ?

පි : එතුමා තමයි.

ප්‍ර : එතුමාට දැනුම් දුන්නාම ඊට පස්සේ මොකද වුණේ?

පි : එතුමා මට ඊට පස්සේ ඔහුගේ තවත් ඒකේ කාමිල් මුස්තෆා කියලා ඉන්නවා එතුමාගේ යාළුවෙක්. තවත් ඉන්නවා මේ ෆයිරූස් මරික්කාල් කියලා එයා නීතිඥ මහත්මයෙක් ගාල්ලේ. එතුමා යාළුවෝ කණ්ඩායම. එතුමා මට කිව්වා එතුමාට ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් තියෙනවා මංගල සමරවීර ඇමතිතුමාට කියලා.

ප්‍ර : එවකට ඇමති?

පි : ඔව් විදේශ ඇමති මංගල සමරවීර ඇමතිතුමාට කියලා එතුමාට අපි මේක කියමු කියලා.

Proceedings Copy
LEAR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ තීරණයට එළඹුණාට පස්සේ මොකද වුණේ?

පි : එතුමා මට එන්න කිව්වා ඒ සිද්ධිය එතුමාට දැනුම් දෙන්න ඊට පහු දවසක් හෝ දවස් දෙකකට පස්සේ .

ප්‍ර : ඒ කියන්නේ මවුසූත් මැතිතුමා ඔබතුමාට කිව්වා ?

පි : ඔව්.

ප්‍ර : මංගල සමරවීර හිටපු ගරු විදේශ ඇමතිතුමාට මේ පිළිබඳව දැනුම් දෙන්නට එන්නට කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : එතකොට ඔබතුමාලා ගියාද?

පි : එසේමයි.

ප්‍ර : කවදා කොයි කාලේ වගේද ගියේ?

පි : මම මගේ ආරක්ෂක නිලධාරී

ප්‍ර : එහෙමයි.

පි : සමඟ තුන්දෙනෙක් හිටියා. මම ගියා. ඒ අවස්ථාවට ඇවිල්ලා හිටියා අර ගාමීල් මුස්තෆා කියන තැනැත්තා ඇවිල්ලා හිටියා. ෆයිරූස් මරික්කාර් කියන නීතිඥ මහත්මයා ඇවිල්ලා හිටියා. මමත් ගිහිල්ලා මේ සම්බන්ධයෙන් එතුමාට දැනුම් දුන්නා.

ප්‍ර : දැන් මම පොඩි ප්‍රශ්නයක් ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි. දැන් ඔබතුමා එවකට රාජකාරී කෙරුවේ ගරු අභියාචනාධිකරණ විනිසුරුවරයෙක් විදිහටනේ?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : එතකොට ඇයි එවැනි ධුරයක් හොබවමින් දේශපාලඥයෙකු මුණ ගැසෙන්නට යාමට ඔබතුමා තීරණය කළේ?

පි : නෑ ඒ කාලේ හරි භයානකයි මේ වගේ දේවල් කතා කරන එකයි කාට කිව්වත් මේ යටෙන් පත්තුවෙයිද නැත්නම් කොයි විදිහට මේ සිද්ධිය පතුරලා යයිද ඕක ලියා ගත්තා නම් මගේ ජීවිතේට හානි වෙයිද මේ වගේ සිද්ධියක් එළියට ගියා නම් කියලා තමයි මම එයාට ගිහිල්ලා උඩින් යටට එන්න කියන කල්පනාව දැරුවේ.

ප්‍ර : දැන් මැතිතුමනි නීතිය බලගංවන්නට පුළුවන්නේ විමර්ශන මාර්ගයෙන්?

පි : එසේමයි.

ප්‍ර : එතකොට එහෙම නම් පොලිසියට මේ පිළිබඳව දැනුම් දීමට ඔබතුමා කල්පනා කළේ නැද්ද?

පි : නෑ.

ප්‍ර : කල්පනා කළා නම් එසේ නොකර හිටින්නට යම් හේතුවක් තිබුණද?

පි : දැන් එතුමා මට ගරු මංගල සමරවීර ඇමතිතුමා ඒ අවස්ථාවේදී කිව්වා අපි මේක නීතිය හා සාමය පිළිබඳ එවකට ඇමති, පොලිසිය භාර ඇමති, බුද්ධි අංශය භාරව ඇමති සාගල රත්නායක

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇමතිතුමාට කියන්න කියලා. එසේම දුරකථන ඔස්සේ කතා කරලා අපිට appointment එකක් අර වේලාවක් අරන් දුන්නා මේ සම්බන්ධයෙන් සාගල රත්නායක ඇමතිතුමාට කියන්න කියලා.

ප්‍ර : නීතිය හා සාමය

පි : එයා තමයි ඒ කාලේ නීතිය හා සාමය පිළිබඳ ඇමති.

ප්‍ර : ඉතින් ඔබතුමාලා ඒ අනුව මුණ ගැහුණාද නීතිය හා සාමය පිළිබඳ එවකට ගරු ඇමති සාගල රත්නායක මහතා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඒ කවදා වගේද කියලා මතකයක් තියෙනවද, මොන වසරේද, අඩු ගාණේ මාසේ හරි මතකද?

පි : මේ සිද්ධිය මම දැන ගත්තු විගසම ඊට පහුව ඒ දවසකින් දෙකකින් වගේ අපි මම හිතන්නේ එදාම හවස ගියාද කියලත් හිතෙනවා මට.

ප්‍ර : හැබැයි ඔබතුමා මේ වන විට ගරු කොමිෂන් සභාවට සඳහන් කරලා තියෙනවා මේ සිද්ධිය සිදු වුණේ 2016 වසරේදී කියලා?

පි : එසේමයි.

ප්‍ර : එහෙමනම් ඒ මුණ ගැසීමත් වෙලා තියෙන්නේ 2016 වසරේ වන්නට පුළුවන්ද ?

පි : එසේමයි.

ප්‍ර : ඔබලා කොහේදීද මේ නීතිය හා සාමය පිළිබඳ ගරු ඇමතිවරයාව මුණ ගැසුණේ?

පි : අරලියගහ මන්දිරයේදී.

ප්‍ර : අරලියගහ මන්දිරේ ඉන්නේ ගරු අගමැතිතුමා නේද ඔහුගේ නිල නිවස නේද ?

පි : නෑ එතුමා ඒයාගේ කාර්යාලයකුත් තිබුණා මම හිතන යැටියට අපිට එන්න කිව්වේ එතනට. ඇවිල්ලා කතා කරලා ඉවර වෙලා කිව්වා මේ සම්බන්ධයෙන් අගමැතිතුමා විමසිල්ලෙන් ඉන්නවයි කියලා.

ප්‍ර : විමසිල්ලෙන් ඉන්නවා කියලා?

පි : ඔව්.

ප්‍ර : මොනවා ගැනද ගරු අගමැතිතුමා විමසිල්ලෙන් ඉන්නවා කියලා කිව්වේ?

පි : එයා කිව්වා මේ වගේ අන්තවාදී ක්‍රියාදාමය ලංකාවෙත් පැතිරිලා යනවා කියලා. මේ වගේ සිද්ධීන් සම්බන්ධයෙන් එයත් උනන්දුයි කියලා තමා කිව්වේ.

ප්‍ර : එතකොට ඔය හමුවේදී ඔබතුමාණන් විසින් ගරු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයාට ඔබතුමාණන්ගේ ගුරුවරියගෙන් දැන ගත්තු සියළුම කරුණු අනාවරණය කළාද?

පි : එසේමයි.

ප්‍ර : කළා?

FAIR COMMENT BY JEZEEM

පි : එසේමයි.

ප්‍ර : එතකොට මේ ප්‍රශ්නේ තියෙන බරපතලකම පිළිබඳව එතුමාට වැටහුණු බව ඔබතුමාට අවබෝධ වුණාද?

පි : එසේමයි.

ප්‍ර : ඇයි එහෙම වැටහුණාය කියලා කියන්නේ?

පි : එතුමා කිව්වා මේ සම්බන්ධයෙන් පියවර ගන්නවා කියලා තමයි අපිට කිව්වේ ඒක එයා ලියා ගත්තා ඒ දේවල්. අපි සිද්ධිය සම්පූර්ණයෙන්ම කිව්වා. මන්ද මේ සාමාන්‍යයෙන් දැන් සමාජයක මමත් මුස්ලිම් සමාජයේ පුද්ගලයෙක්. ඉතින් දැන් ලංකාවේ ඒ කාලේ දැන් වෙන කොට මේ සිද්ධියෙන් පස්සේ හැමෝම හැමදෙනාටම අත් උස්සන කොට අපි මේ වගේ පියවරක් ගත්තා මේක වළක්වන්න කියලා කියන දේ අපිට කියන්න ඕනේ කාටහරි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : මැතිතුමනි

පි : එසේමයි ගරු සභාපතිතුමනි

ප්‍ර : ඔය ඔබගේ ගුරුවරිය කියපු තොරතුරු ආශික් සම්බන්ධයෙන් කියපු තොරතුරු එවකට ගරු ඇමතිවරයා වශයෙන් හිටපු සාගල රත්නායක මහතාට දැන් වූ විටක දැන් ඔබ දන්වන්නේ ඉස්ලාම් අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන්නේ?

පි : එසේමයි සභාපතිතුමනි.

ප්‍ර : ඔබ ඔහුට ඒ සම්බන්ධයෙන් දැන් වූ විට ඔහු ඒ සම්බන්ධයෙන් යම් පුදුමයට පත් වුණාද නැත්නම් ඔහු ඒ වන විටත් එවැනි ක්‍රියාදාමයන් ලංකාව තුළ සිදු වන බව දැනුවත් වීමක් තිබුණද නැද්ද කියලා ඔබට වැටහුණාද?

පි : ඔහු ඉතාම උනන්දුවෙන් අවධානයෙන් තමයි එතුමා ඒක ලියා ගත්තේ ඒ අවස්ථාවේදී. ඒ මොකද අපි මේ කණ්ඩායමක් අසාමාන්‍යය ලෙස අභියාචනාධිකරණ විනිශ්චකාරයෙක් ඇවිල්ලා කියන තොරතුරක්.

ප්‍ර : මැතිඳුනි දැන් ඔය වගේ ඔබතුමාලාට ගන්නට පුළුවන් පියවර වඩා සුදුසුයි කියලා හිතෙන තැනැත්තෙක්ට ගිහිල්ලා ඔබතුමාලා සඳහන් කෙරුවා නේද?

පි : එසේමයි.

ප්‍ර : ඒ ගැන දැනුම් දුන්නා?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : එතකොට දේශපාලනයේදී දේශපාලඥයින්ට රටේ පුරවැසියන්ගේ ඡන්දය වැදගත් වෙනවානේ?

Project Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : එසේමයි.

ප්‍ර : එතකොට මොකක්ද රජයක් විදිහට එහෙම නැත්නම් දේශපාලඥයන් විදිහට එහෙමත් නැත්නම් ඔබතුමා ගරු අභියාචනාධිකරණ විනිසුරුවරයෙක් විදිහට ගිහිල්ලා දන්වපු මේ සංවේදී කරුණු පිළිබඳව දක්වලා තියෙනවයි කියන යම් ප්‍රතිචාරයක් පිළිබඳව ඔබලාට දැන ගන්නට ලැබුණාද?

පි : මොනවත්ම නෑ මම හිතුවා කියලා දවසකින් හෝ දෙකකින් කවුරු හරි බුද්ධි අංශයෙන් නිලධාරීයෙක් හරි ඇවිල්ලා මා ළඟ කට උත්තරයක් ගනී කියලා මං බලාගෙන හිටියා. නමුත් කවුරුවත් මා ළඟට මේ සිද්ධිය වෙලා මම පුවත්පත්වල මේ මිනිහා මේකට සම්බන්ධයි මෙයා අත්අඩංගුවට අරන් තියෙනවා කියලා දැකපු ගමන් මිසක මා ළඟ කිසිම කට උත්තරයක් හෝ මා ළඟ ගත්තේ නෑ. ඒකයි මට හිතේ එදා තිබුණු අර සිද්ධියෙන් පස්සේ තිබුණු වේදනාව මොනවද කිව්වා නම් අපි කියලා දුන්නනේ මෙයා මං දන්නේ නෑ එයා ඒ කාලේ එයා ඕකට මේ නායකත්වය දුන්නද කියලත් දන්නේ නෑ මම කියපු පුද්ගලයා. ඉතින් ඒ අවස්ථාවේදී ඒකට යම් කිසි ප්‍රතිචාරයක් දක්වලා මොනවා හරි ක්‍රියාමාර්ගයක් අරන් තිබුණා නම් මම හිතනවා එය සම්පූර්ණයෙන්ම මේ ජාලයම වනසන්න තිබුණා. මේ සිද්ධිය වෙන්නේ නැතුව මම හිතන්නේ ලංකාවේ මේ මිලේච්ඡ ක්‍රියාව නොසිදු වෙන්න ඉඩ තිබුණා මම නිකම් උපකල්පනය කරනවා.

****

දැන් වේලාව : පෙ.ව.11.25 යි.
මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

President Secretariat (Copy)
FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.11.20
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : මැතිතුමනි ඔබ කියන්නේ ඔබ මේ ආශික්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් තොරතුරු ඔහුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මේ ඉහළ අංශ දැනුවත් කෙරුවා. ඔබ කියන්නේ ඒ දැනුවත් කිරීමෙන් පසුවත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ කියලද?

පි : එසේමයි ගරු සභාපතිතුමනි.

ප : එතකොට දැන් පාස්කු ප්‍රහාරය සිදුවන තෙක් ඔබගේ ගුරුවරිය ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් කෙරුවා කියලා දැන්නුවේ නැහැ?

පි : නැහැ නැහැ එතුමිය ඊට පස්සේ කතා කලේ නැහැ එතුමිය හිතුවද දන්නේ නැහැ අපි පියවරවල් අරන් ඒ නිසා මේක ඉවරයි කියලා හිතුවද දන්නේ නැහැ ඒ කාලේ එයා කොළඹ හිටියේ, මේ ගුරුවරිය නුවර හිටියේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : කවුද කොළඹ හිටියේ ඒ කාලේ. ඔබතුමා කිව්වා එයා ඒ කාලේ කොළඹ හිටියේ, මේ ගුරුතුමිය හිටියේ නුවර හිටියේ කියා?

පි : නැහැ ඒ කියන්න ටික කාලෙකට කලින්නේ මට කිව්වේ මෙයාට කොළඹට රස්සාවක් හම්බ වෙලා තියෙනවයි කියන කතාව.

ප : මේ තැනැත්තා, මේ ගුරුතුමියගේ පුතාට කොළඹ රස්සාවක් හම්බ වෙලා තියෙනවා?

පි : ඔව් ලැබිලා තියෙනවයි කියලා.

ප : ඒ අනුව ඔවුන් දෙදෙනා තැන් 2 ක හිටියා කියලා ඔබතුමා කියන්නේ?

පි : කියලා තමයි මගේ..

ප : දැන් ඔබතුමා කිව්වා නේ මේ ගුරුතුමියගේ පුතා යම් අවස්ථාවකදී අත්අඩංගුවට ගත්ත බවක් පත්තරෙන් කියෙව්වා කියලා?

පි : එසේමයි මැතිනියනි.

ප : ඒ කොයි කාලේද ඕක කිව්වේ?

පි : පාස්කු ප්‍රහාරයකින් පසුව තමයි අත්අඩංගුවට ගත්තයි කියලා ඔහුගේ සම්පූර්ණ නම එහෙම දක්වලා කොළඹ ප්‍රදේශයකදී අත්අඩංගුවට ගත්තයි කියලා තමයි පත්තරවල දකින්න ලැබුණේ.

****

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ සමඟ මංගල සමරවීර සහ සාගල රත්නායක හමු වෙන්න තවත් තිදෙනෙක් ගියානේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ තිදෙනා ඊට පසු තමන්ගෙන් ඇහුවේ නැද්ද මොකක්ද වුණේ කියලා කතාබස් කලාද?

පි : නැහැ සජාත් මවුසුම් මහත්මයා මට දැන් මේ සිද්ධියෙන් පස්සේ දවසක් හම්බ වෙලා කිව්වා එයා සාගල රත්නායක ඇමතිතුමාට කිව්වයි කියලා ඔබතුමාලගේ ක්‍රියාදාමය නිසා තමයි තොරතුරු දීලත් එයා මට කියපු ද දේ, He say. මෙවැනි සිද්ධීන් වුණා කියලා. මොකද ඒ දෙදෙනාම රාජකීය විද්‍යාලයේ එකට ඉගෙනුම ලබා ගත්තු දෙදෙනෙක්.

****

<u>ගරු අදිකාරී මැතිනිය</u>:

ප්‍ර : මැතිතුමනි දැන් ඔබතුමා ප්‍රකාශ කළානේ අම්මා පුතා පිළිබඳව ඔබතුමාට කිව්වා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ කියපු දේවල් නිසාම නේ ඔබතුමා ඉතාමත්ම කඩිනමින් ම දේශපාලන නායකයින් පවා හම්බ වුනේ කණ්ඩායමක් ?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඔබතුමාට මොනවාද මේ අම්මා මේ පුතා ගැන මෙතරම් බය හිතෙන දේවල් මොනවද කිව්වේ, මේ පුතා කරනවා කියලා?

පි : නැහැ, නැහැ එතුමිය කිව්වානේ මෙයා ISIS සංවිධානයට අනුයුක්තව වැඩ කරනවා කියලා කිව්වා, ඒක එපා කියලා කියපු අවස්ථාවේ දී ඇයව මරා දැමීමට පවා තැත් කලා කියලා කිව්වානේ.

ප්‍ර : එතකොට ඔබතුමා තේරුම් ගත්තා ISIS සංවිධානය කියන්නේ නම් භයානක තත්ත්වයක්..

පි : මෙහෙමයි ඒ කාලේ ලෝකේ මිනිස්සු මරා දමන මිලේච්ඡ ක්‍රියාවල් කරන සංවිධානයක් හැටියට.

ප්‍ර : මේ ඉස්ලාම් රාජ්‍යයක් කරා ගමන් කරන සංවිධානයක් ලංකාවෙත් ඇති වුනොත් මේක භයානකයි කියලා ඔබතුමා හිතුවා.?

පි : එසේමයි මැතිනියනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබතුමා ප්‍රකාශ කළානේ සූෆී මුස්ලිම්වරයෙක් කියලා ඔබතුමා?

පි : එසේමයි.

ප්‍ර : සූෆී මුස්ලිම් කියන්නේ තරිකා නිකාය නේද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප : සූෆී මුස්ලිම්වරුන්ට මැතිතුමනි ඉස්ලාම් රාජ්‍යය කියනවා වගේ සංකල්පයකට කොයිම අවස්ථාවක හෝ යොමුවීමට හැකියාවක් තියෙනවද? ඔබතුමා නෙමෙයි මම අදහස් කරන්නේ, තරුණ පිරිස්?

පි : නැහැ එහෙම නැහැ.

ප : එහෙම වෙන්නේ නැහැ?

පි : නැහැ.

****

<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා</u>:

ප : මැතිතුමනි දැන් ඔය ආසික් කියන තැනැත්තා තවත් ඉන්නවද එහේ?

පි : අත්අඩංගුවේ මං හිතන්නේ රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන ඉන්නවා මම හිතන්නේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අර්ෂා ජිනසේන මෙනවිය:</u>

ප : ගරු මැතිතුමනි ඔබතුමා ඉතා සවිස්තරාත්මකව ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා අතීතයේ සිදු වූ යම් සිද්ධීන් තිබුණා 2012, 2016 ඊට පස්සේ 2019 දී මේ අප්‍රේල් මාසේ 21 වෙනිදා බෝම්බ ප්‍රහාරයක් එල්ලවීම සිදු වුණා. ඔය වෙන කොට ඔබතුමා අද දින සඳහන් කරපු ආකාරයට ඔබතුමාගේ බලය තුළ රැඳී සිටිමින් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විදියට ඔබතුමාට ගන්නට පුළුවන් ක්‍රියාමාර්ගයන් ගත්ත ආකාරය පිළිබඳව ඔබතුමා පැහැදිලි කෙරුවා?

පි : එසේමයි මැතිනියනි.

ප : ඔබතුමාගේ පුර්ව අත්දැකීම් එක්ක තමන්ගේ ගුරුතුමියගේ දරුවාව ඔහු යොමු වෙලා තියෙන මාර්ගයෙන් ගලවා ගන්නට යම් ආධාරයක්, උපකාරයක් ලබා ගැනීමට ඒ සම්බන්ධයෙන් පියවර ගන්නට පුළුවන් පුද්ගලයින් ගාවට ගිහිල්ලා ගරු අභියාචනාධිකරණ විනිසුරුතුමෙක් වෙලා සිටියදී එවැනි පියවරක් අරගෙන තිබියදීත් යමක් සිදු නොවී අර මම සඳහන් කරපු පාස්කු ප්‍රහාරය සිදු වුණාම ඔබතුමාට මොකක්ද හිතුනේ?

පි : මම හරියට කම්පාවට පත් වුණා. මේ ලංකාවේ ඉපදිච්ච පුද්ගලයෙක් හැටියට මට තිබුණ අවස්ථාව මම කියලා දුන්නා මේ වගේ ලේ වැගිරීම් නවත්වන්න පුළුවන් කියන මේ නිලධාරීන් බලධාරීන් නොකිරීම මත අදත් මට හරියට කල්පනා වෙන කොට මම කම්පා වෙනවා. ඒ මොකද මේ රටේ තිබුණු සාමය, සමඟිය, සතුට නැති වී ගියා ලංකාවේ. බිඳිලා ගියා. එක් එක්කෙනා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

බලන්නේ සැකයෙන් බලන තත්ත්වයකට අපි භාජනය වුණා. දැන් අපි සාමාන්‍යයෙන් හවසට අපි ව්‍යායාම්වලට ගියාම අපි සිංහල සහෝදරයින් එක්ක තමයි අපි එකට ව්‍යායාම් කරන්නේ. අපිට අවස්ථා නැහැ අනික් අවස්ථාවලට අපි එකට වැඩ කරන්න. ඒ ගොඩක් අයත් එක්ක අපි සම්බන්ධ වෙලා තමයි ඒ මල්වාන ප්‍රදේශයේ හවසට අපි මේවා වෙනවා. එතනට ලොකු බුද්ධිමතුනුත් එනවා. ඒ අවස්ථාවේ වුණත් එදා මට සිද්ධියක් වුණා. ඒ මොකද එදා මට සැලුන් එකට යන්න අවශ්‍ය වෙලා තිබුණා එදා හවස. මේ සිද්ධිය වෙලා හවස. එතන හිටියා චන්දන කියලා මහත්මයෙක් යුද හමුදාවේ සෙබලෙක්. මම එයාට කියලා කිව්වා, අපේ මිත්‍රයෝ ඒගොල්ලෝ. මම පොඩ්ඩක් අද සැලුන් එකට මේ වයි හංදිය සපුගස්කන්ද වයි හංදියට යනවයි කියලා. එච්චර අපේ මිත්‍රකම කොච්චරද කියලා මම පෙන්නන්නේ සිංහල සමාජයත් එක්ක මම වයි හන්දියට යනවයි කියලා. ගිහිල්ලා මම සැලුන් එකට ඇතුල් වෙලා කොණ්ඩේ කපලා එළියට එන කොට මේ මගේ මිත්‍රයෝ ටික මේ චන්දන සහ අනෙක් අය ඒ සැලුන් එකේ දොර ගාව ඉන්නවා මාව ආරක්ෂා කරගෙන. එහෙම තමයි අපිට තිබුණු බැදීම. මේ වගේ බැදීමවල් සාමාන්‍යයෙන් මේ වගේ සිද්ධින් නිසා හරියට කැඩිලා යනවා. මිනිස්සු අතරේ සැකයෙන් බලන්න පටන් ගන්නවා මිනිස්සු. මම හිතන්නේ ඒක තමයි මේ ලංකාවේ හරි වේදනාත්මක සිදුවීම්. ඒ නිසා තමයි මම හිතන්නේ මේ වගේ දේවල් ගැන තාම හොඳ නිගමනයකට එන්න ඕනේ ඉදිරියට මේ වගේ දේවල් වෙන්නේ නැතුව ඉන්න ඕනේ. ලංකාව ඉතාම හොඳ රටක්. ඉතාම ආදර්ශවත් රටක් හැම ජන කොට්ඨාශයම සාමයෙන් සතුටින් ඉන්න රටක්. මේ වගේ දේවල් වෙන්නේ නැතුව ඉන්න ඕනේයි කියන එක තමයි මම මේ සාක්ෂි දෙන්නත් ඉදිරිපත් වුණේ. ඒ මොකද අපිත් යම්කිසි පියවරවල් අරන් තියෙනවා. ඒක ජනතාව කවුරුත් දන්නේ නැහැ. මිනිස්සු දන්නේ නැහැ අපි වාගේ අය ගිහිල්ලා මේ ගැන කියලා තියෙනවා කියන එක කවුරුත් දන්නේ නැහැ. හැමදෙනාම එකයි කියලා බලන්නේ. අපිට ගන්න පුළුවන් හැම .

ප : ඒ කියන්නේ මුස්ලිම් ජන කොට්ඨාශයට අයිති හැමෝම එක වගේ කියලා තමයි දැන් සැකෙන් බලන්නේ?

පි : සැකෙන් බලන්නේ. නමුත් 99% ක්ම එහෙම නැහැ. පොඩි කාණ්ඩයක් තමයි මේවට සම්බන්ධ වෙලා ඉන්නේ. දැන් මම නුවරඑළියේදී මම මගේම උවමනාවෙන් තමයි දුරකථන ඔස්සේ නවත්වලා CID කණ්ඩායමක් ගෙනල්ලා ඔවුන්ව පිටමං කරන්න මම කටයුතු කලේ. මේකත් කවුරුත් දන්නේ නැහැ. මේවත් කරුත් දන්නේ නැහැ, මේ රටේ ඒකීය භාවයට, රටේ සාමයට,

FAIR COMMENT BY JEZEEM

රටේ ජනවාර්ගික සතුටට අපි මේවගේ දේවල් කරන එක කවුරුත් දන්නේ නැහැ. නමුත්..

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ මංගල සමරවීර ඇමතිතුමා සහ සාගල රත්නායක ඇමතිතුමා හම්බ වුණ වෙලාවේ සහරාන්ගේ සිද්ධි සම්බන්ධවත් ප්‍රකාශ කර සිටියද මොකද 2016 වර්ෂයේ සිදු වූ ..

පි : නැහැ ඒක මම කිව්වේ නැහැ මොකද ඒ වෙලාවේ ඔහු සම්බන්ධයෙන් ලොකුවට කතා බහකට පත්වෙලා තිබුණේ නැහැ ඒ අවස්ථාවේදී. ඒ නිසා ඔබතුමා අහන්නේ මල්වානෙට හාල් බෙදපු සිද්ධිය ගැන නේ.

ප්‍ර : ඔව්

පි : නැහැ. නැහැ.

ප්‍ර : ඔය සහරාන්ට අයත් තමන්ගේ නිකායට අයත් තවුහිද් ජමාත් පල්ලි මල්වානේ තිබ්බද?

පි : මල්වානේ පල්ලි තියෙනවා. සහරාන්ට අයත් පල්ලි එහෙම නැහැ.

ප්‍ර : සහරාන් එම ප්‍රදේශයේ පදිංචි වෙලා හෝ නැවතිලා හිටියද?

පි : නැහැ, නැහැ. එහාට සම්බන්ධ නැහැ. මල්වානේ ඉන්නේ මුස්ලිම් ජනතාව පරණම ජනතාව අර පෘතුගීසි කාලයේ ඉදලා මල්වාන ගිවිසුම කාලේ ඉදලා ඉන්න පරණම කණ්ඩායමක් තමයි මල්වානේ ඉන්නේ.

ප්‍ර : තවදුරටත් මල්වාන ගැන අපි දැන ගන්න අහන්නේ, රඹුටන් ගැන නෙමෙයි, මල්වානේ තවත් ඔබගේ නමින් විශ්වයකාරතුමෙක් ඉන්නවද?

පි : ඔව් අපේ ලෆාර් තාහිර් අපේ සිවිල් අභියාචනාධිකරණයේ ඉන්න විනිශ්චයකාරතුමා අපේ අනෙකුත් විනිශ්චයකාරවරුන්ට දන්නවා, එතුමා මල්වානේ.

ප්‍ර : නැහැ, නැහැ ගෆුර් නමින් තවත් විනිශ්චයකාරතුමෙක් ?

පි : නැහැ මම තමයි ගෆුර් කියන්නේ.

ප්‍ර : ගෆුර් කියලා තවත් විනිශ්චයකාරතුමෙක් ඒ ප්‍රදේශයේ හිටියද?

පි : නැහැ ගෆුර් කියලා නැහැ, අපේ ලෆාර් තාහීර් විතරයි ඉන්නේ.

ප්‍ර : එම ප්‍රදේශයේ පොලිසියේ ප්‍රභූ, උසස් තනතුර දරණ පුද්ගලයෙකුත් ඉන්නවද?

පි : පොලිසියේද?

ප්‍ර : ඔව්.

පි : නැහැ එහෙම නැහැ.

ප්‍ර : ඔබගේ පල්ලිවලට එන?

පි : නැහැ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : ගෞරව මැතිතුමනි දැන් මේ ඔබතුමන්ට මුහුණ දෙන්න වෙච්ච ඒ සිද්ධිය පිළිබඳව ඔබතුමන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව හමුවේ කරුණු දක්වන්න හිතුවද?

පි : මම ඒ අවස්ථාවේ හිතලා මම අවස්ථාවක් ඉල්ලුවා මට ලැබුන් නැහැ.

ප්‍ර : ඒ මොකද දැන් මෙච්චර වැදගත් තොරතුරක් ඔබතුමා සතුව තියෙද්දි ඒක පාර්ලිමේන්තු කාරක සභාවකට දැනුම් දුන්නා නම් හුඟක් හොඳයි. ඇයි ඔබතුමාට අවස්ථාවක් නොදුන්නේ ඔබතුමාට හිතෙන විදියට?

පි : මට කියන්න දන්නේ නැහැ ඒ කාරක සභාවේ ඇයි මට නොදුන්නයි කියලා. මම ප්‍රයත්නයක් යෙදුවා. මට හම්බ වුණේ නැහැ.

ප්‍ර : දැන් ඔබතුමාට පේන විදියට ඔබතුමාට ඇහෙන විදියට ඒ වගේම ඔබතුමා දකින විදියට මේ ඉස්ලාම් අන්තවාදීන් ඔවුන්ගේ ඒ එක පැත්තකට නැඹුරු වෙච්ච ඒ මතය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙල ගෙන යන බව ඔබට හැඟෙනවද?

පි : එහෙම නැහැ දැන් හැම පැත්තේ ඔස්සේම තාම විමසිලිමත්ව ඉන්නවා. මම තව සිද්ධියක් කියන්න ඕන with Your permission Can I say more ? දැන් 2007 වර්ෂයේ මම ගම්පහ මහාධිකරණයේ ඉන්න කොට මට ඒ කාලේ ගිහිල්ලා ගුවන්විදුලි සංස්ථාවේ මේ වැඩ සටහන් එහෙම නිරීක්ෂණය කරන්න කියලා, මුස්ලිම් මාධ්‍ය ඔස්සේ යන වැඩ සටහන් නිරීක්ෂණය කරන්නත් කියලා මං ඒ වගේ දැඩි මතවාදයට යන්නේ නැති විදියට ඒ මාධ්‍යත් මම හසුරුවලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබට හැඟෙන විදියට මේ අන්තවාදී අදහස් තියෙන තරුණයන් ඉදිරි කාලේදීත් බිහි වෙන්න අවස්ථාවක් තිබෙයි කියලා හිතෙනවා නම් ඔවුන්ට දෙන්න ඔබතුමාට පණිවිඩයක් තියෙනවද?

පි : මං හිතන්නේ ලංකාව අපේ ආගමන විගමන පැත්තෙන් අපේ උනන්දුවක් වෙලා ලංකාවට දැන් සාමාන්‍යයෙන් ලංකාවට නරඹන්න එන අය සම්බන්ධයෙන් අපේ නිලධාරීන් බොහොම අවධානය යොමු කරන්නට ඕනේ. මම ඊට කලිනුත් යම් අවස්ථාවක කියලා තියෙනවා දැන් අපේ කටුනායක ගුවන් තොටුපලට බහින විටම දැන් විදේශිකයන්ට අත්පත්‍රිකාවක් හරි ලබලා දෙන්න ඕනේ, උඹලට මෙහේ ආගම් කටයුතු කරන්න බැහැ කියලා. නමුත් ලංකාව නරඹලා යන්න. ඒ විදියට This is a globalization. The globalization mean world without Army

FAIR COMMENT BY JEZEEM

world without Boarder they define that. Because everything and everybody can creep in. now corona has come without any hindrance there fore. There should be some sort of restriction who ever come here what are the preaching going on those type of restriction. If exist I think we would have actually done lot more.

ප්‍ර : ඔබතුමන්ගේ අදහස කොහොමද මද්‍රාසා පාසැල්වල ව්‍යාප්තිය පිළිබඳව?

පි : මේ මද්‍රාසා කියන එක කියන්නේ ඉස්කෝල කියලයි කියන්නේ. දැන් සාමාන්‍යයෙන් මද්‍රාසා කියන්නේ ආරාබි භාෂාවෙන් කියන්නේ ඉස්කෝල. School. දැන් ඒක අවුරුදු ගාණක් තියෙනවා. මම හිතන්නේ ඒකේ ඒ මද්‍රාසාවලින් මේක පැතුරුණයි කියලා කියන්න නැත්නම් කිව්වට මට නම් කියන්න දන්නේ නැහැ ඒක. නමුත් මේ රටට එන පොත්පත් හෝ විදේශිකයන් හෝ ගැන යම්කිසි අවධානයක් යොමු කළා නම් මම හිතන්නේ මේක වඩාත් දුරටත් යහපත් අන්දමින් ගෙනියන්න පුළුවන් කියලා මම හිතනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබතුමාණන් සඳහන් කෙරුවා ගරු කොමසාරිස්තුමාණන් අසන ලද ප්‍රශ්නයට තහනම් කරන දේවල් අතර මේ පොත්පතුත් තහනම් කරන්නට ඕනෑය කියලා. මොන පදනමක් මතද එම යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ?

පි : සමහර දේවල් පොත්පත් තියෙනවා අන්තවාදී දේවල් පැතිරෙන දේවල්. ඉතින් ඒ නිසා ඒ වගේ අධ්‍යනය කරලා එව්වා අපි වහාම නවත්වන්න පියවර ගන්න ඕන.

ප්‍ර : ඔබතුමා ඒකෙන් අදහස් කරනවද විදේශවල ඉදලා ලංකාවට ලැබෙනවාය කියලා ඉස්ලාම් ආගම පිළිබඳව ආගමික අන්තවාදී අදහස් අන්තර්ගත වන පොත්පත්? මම මෙහෙම අහන්නද ඔබතුමාගෙන්, ඔබතුමා දන්නවද ශුද්ධ වූ කුර්ආනය පරිවර්ථනය කරන කොට සහ එය විවිධ සංවිධාන විසින් ප්‍රකාශයට පත් කරන කොට ඇතැම් අවස්ථාවල් වලදී සමහර පරිවර්ථන එකිනෙකට වෙනස් ඒවා තියෙනවා කියලා?

පි : ඒක තමයි මම කියපු කාරණයත් ඒ සම්බන්ධයෙන් තමයි. සමහර දැඩි මතවාදීන් ඕක අර්ථ කථනය කරන්නේ වෙන විදියටයි.

ප්‍ර : නමුත් ඒක නිවැරදි ද? එහෙම කරන්නට පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ඒ ඔවුන්ගේ තනි මතයක් ඔවුන් කරන දෙයක්. ඒක ලංකාවට උචිත වෙන්නේ නැහැ.

ප්‍ර : ඔව් ඉතින් ගරු මැතිතුමනි එතකොට ඒවගේ දෙයක් පාලනය කරන්නට බැරිද ඔය මුස්ලිම් ජන කොට්ඨාශයේ කාට හරි?

පි : නැහැ ඒක දැන් මුස්ලිම්

ප්‍ර : උලමා සංවිධානයට බැරිද ඕක පාලනය කරන්න?

පි : දැන් ආණ්ඩුවෙන්ම තියෙනවානේ මුස්ලිම් ආගමික පිළිබඳ දෙපාර්තමේන්තුවක්. ඒකට පුළුවන් ඕවා පාලනය කරන්න යම්කිසි දෙයක් වෙන කොට බලන්න ඒක රජයෙන් cultural Ministry ය යටතේ තමයි ඕක සංස්කෘතික අමාත්‍යාංශය යටතේ තමයි ඕවා තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.:</u>

ප්‍ර : මැතිතුමනි ඔබගේ දැනීම අනුව මෙවැනි නිවැරදි නියාමනයක් වෙලා තියෙනවද?

පි : කොයි සම්බන්ධයෙන් ද ගරු සභාපතිතුමනි.

ප්‍ර : මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධ දෙපාර්තමේන්තුව විසින් ලංකාවට එන ඔබ කියන පරිදි අන්තවාදී පොත්පත් නිසි පරිදි නියාමනයක් වෙලා තියෙනවද? Has it been properly regulated?

පි : නැහැ ඊට කලින් ඒක ඉතාම හොඳින් ඒගොල්ලෝ කරගෙන ගියා. මම හිතන්නේ මේ විදේශිකයන් එන කොට කටුනායකයේදී දැන් සාමාන්‍යයෙන් නීති මාර්ගයෙන් is a proper channel එකෙන් එන පොත්පත් තමයි ඒගොල්ලෝ යටතේ යන්නේ. If you come illegally but it should be done ….

ප්‍ර : ගරු මැතිතුමනි මේ කිතාබුල් තවුහිද් කියලා පොතක් තියෙනවද?

පි : ඒක ලංකාවට අදාල පොතක් නෙමෙයි.

ප්‍ර : නැහැ පොතක් තියෙනවා නේද මැතිතුමනි?

පි : ඒක වහබිසම් කියලා සෞදි අරාබියේ රජ්ජුරුවන්ට ඒ කාලේ අබ්දුල් වහබ් කියලා එක්කෙනෙක් තමයි ඒ පොත ලිව්වේ. ඒක දැන් සෞදි අරාබියේ විතරක් තමයි කිතාබුල් තවුහිද් කියන පොත වලංගු වෙන්නේ.

ප්‍ර : හුඟක් රටවල ඒක තහනම් කරලා නේද තියෙන්නේ?

පි : එසේමයි. ලංකාවේ අපි දැකලාවත් නැහැ ඕක.

ප්‍ර : නමුත් ලංකාවේ පොත් හල්වල ඔය පොත තියෙනවා නම් ඒ කියන්නේ අර මුස්ලිම් කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් නිසි නියාමනයක් වෙලා නැහැ නේද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙම තියෙනවා නම් ඒක වෙලා නැහැ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ගරු සභාපතිතුමා විසින් අසන ලද එම ප්‍රශ්නයටම මම තවත් කොටසක් ඔබතුමාණන්ගේ අවධානයට යොමු කරන්නට කැමතියි, ඔබතුමා දන්නවද අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් NIE එක National Institute of Education හරහා ප්‍රකාශයට පත් කරන ඉස්ලාම් ධර්මයට අදාලව ප්‍රකාශයට පත් කරන පොත්වල ආගමික අන්තවාදී අදහස් දරන පුද්ගලයින් පිළිබඳව ඒ දරුවන්ට

1. ඉගැන්වීම සඳහා ගුරුවරුන්ට මාර්ගෝපදේශ පිළියෙල වෙලා තියෙනවද
2. දරුවන්ට වැඩිදුර කියවීම සඳහා ඒ ආගමික අන්තවාදී අදහස් දරන පුද්ගලයින් පිළිබඳ නිර්දේශ කරලා තියෙන.

දැන් ඒ වගේ දෙයක් මේ සමාජයට පිවිසිලා පුරවැසියන් වෙන්න අපේක්ෂාවෙන් ඉන්න කුඩා දරුවන්ට ලබාදීම සුදුසු ද? ඔවුන්ට ඒ පිළිබඳව කියවලා කරුණු කාරණා හරියට තේරෙන්නේ නැති අවස්ථාවකදී හොඳ නරක තේරෙන්නේ නැති අවස්ථාවකදී ඒවගේ දේවල් ඔවුන්ගේ අවධානයට යොමු කිරීම සුදුසු ද?

පි : නුසුදුසුයි. ළමයින්ට කියලා දෙන්න ඕනේ ලංකාවට උචිත වන දේවල් තමයි ලංකාවේ උගන්වන්න ඕනේ. අනිකුත් ආගම්වලට ගරු කරන්න, අනෙකුත් ආගම්වලට අපි ඉස්සර පොඩි කාලේ අපිට උගන්වලා තිබුණේ මෙහෙමයි. බෞද්ධ ස්වාමීන් වහන්සේ කෙනෙක් පාරේ යනවා නම් අපි නැගිටලා හිට ගන්නවා. ඒ බෞද්ධ ස්වාමීන් වහන්සේලා ගියායින් පස්සේ තමයි අපි ඔතන ඉඳගන්නේ. ඒ වගේ දේවල් තමයි ඉස්සර ඉස්කෝලවල අපි ගරුත්වය දැන් අපි යන යන තැන වැඩ කරන කොට අපි ඒ පළාතේ ඉන්න ලොකු බෞද්ධ ස්වාමීන් වහන්සේලා ගිහිල්ලා මුණ ගැහෙනවා. අනුරාධපුරට ගියාම එහෙන් එහෙමයි. දැන් සාමාන්‍යයෙන් අපි විනිසුරුවරුන් වශයෙන් විනිසුරු සංගමයක් තිබුණා. ඒ විනිසුරු සංගමයෙන් අවුරුදුපතා මම හිතන්නේ අපේ විනිශ්චයකාරවරුන්ට දන්නවා අපි යනවා ආගමික සිද්ධස්ථානවලට. එක්කෝ රුවන්වැලි සෑයට යනවා, එක්කෝ නුවර දළදා මාළිගාවට යනවා, එක්කෝ කළුතරට යනවා අපි ඒ අවස්ථාවේදී මට තමයි පවරන්නේ ඒ කාලේ ස්වාමීන් වහන්සේලාට තුවා ලබලා දෙන්න කියලා. මේ අපේ සංගමයෙන්. තුවා. අපිට ඒ වගේ බැඳීම් එහෙම තමයි ආගමික දේවල් අපි කලේ, අපි ලහ තිබුණ එක්සත් භාවය එහෙම තමයි. එහෙම තමයි

FAIR COMMENT BY JEZEEM

අපි හැදුනේ වැඩුනේ. ඒ විදියට තමයි අපි ඉදිරි පරම්පරාවත් හදන්න ඕනේ. දැන් world Tolerance Day කියලා තියෙනවා. ඒකේ Tolerance Day කියලා කියන්නේ අනිත් අයගේ cultural එක Tolerance කරන්න. නැත්නම් ස්වාමියාට, නෝනාට තියෙන ප්‍රශ්නේ Toleranceකරන එක නෙමෙයි. අනිත් cultures වලට, අනිත් ආගම්වලට අපි නැඹුරු වී ඔවුන්ට ගරු කිරීම. දැන් මම සාමාන්‍යයෙන් අනුරාධපුරට මාව පළමුවෙන්ම මහාධිකරණයට මාරු කරපු වෙලාවේ දී මම සරත් නන්දසිරි ද සිල්වා ගරු අග්‍රවිනිශ්චයකාරතුමා ලඟට ගිහිල්ලා කිව්වා මොන මුස්ලිම් භක්තිකයෙක් මම ඔබතුමා මාව දාලා තියෙනවා අනුරාධපුරට, මට මෙහෙම හැසිරෙන්න දන්නවද දන්නේ නැහැ මම වැරැද්දක් කලා නම් ඒ පළාතේ කියලා මම ගිහිල්ලා ආයාචනයක් කරලා මට වෙන තැනක මාරුවීම් දෙන්න. එතුමා ඒ අවස්ථාවේදී කිව්වේ ඔබතුමාට ආගම් දේවල් ඔක්කොම හොඳට දන්නවා, ඒ නිසා බය නැහැ ඔබතුමා ගිහිල්ලා දැන් එහේ වැඩ කරන්න කියලා. මම ඒ වගේම එතන අර ශ්‍රීමහා බෝධීන් වහන්සේ ලඟ තමයි තියෙන්නේ සිසිලස. සිසිලසේ ඉන්න කොට රෑට බණ දානවා. මම මගේ රූපවාහිනිය හෝ මම රේඩියෝවත් දාන්නේ නැහැ. දැන් අපි මල්වානේ ඉදලා එන කොට කැළණිය අපිට හම්බ වෙනවා. ඒ පළාතේ අපි කිසිම සද්දයක්වත් මේ හෝන් එකක්වත් ගහන්නේ නැහැ. ඒ විදියට තමයි අපි පුරුදු වෙලා තියෙන්නේ. ඒ කාලේ ඉදලා. අපිට ඒ පළාත්වල මොනවා හරි විපතක් වුණා නම් ඕනෑම පන්සලක ඉදලා දුරකථන ඔස්සේ කියනවා මෙහෙම එකක් වෙලා තියෙනවා, එන්න මේකට අපිට උදව් වෙන්න කියලා. අපි එහෙම තමයි ඒ කාලේ ඉදලා හැදුනේ. ඒ වගේ කාලෙකට තමයි අපි යන්නත් ඕනේ. ඒ වගේ හොඳ හැම දෙනාම සමඟියෙන් සතුටෙන් ඉන්න පුළුවන් වාතාවරණයක් තමයි අපි හදන්න ඕනේ ඉදිරියට.

****

<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා</u>:

ප්‍ර : මැතිතුමනි දැන් වහබ්වාදය කියන එක අද ඊයේ එකක් නෙමෙයි නේ ටිකක් පරණ එකක් නේ?

පි : ඔව්.

ප්‍ර : ඒ වහබ්වාදය තිබුණද ඔබතුමාලගේ ඉස්සර ඉදන් මල්වාන ප්‍රදේශයේ එහෙම?

පි : නැහැ. වහබ්වාදය කියන එක මල්වාන ප්‍රදේශයේ නැහැ. සාමාන්‍යයෙන් පල්ලීන් අතර මතභේද තියෙනවා එක කරුණක් සම්බන්ධයෙන් මතභේද තියෙනවා. එකක් මේ විදියට කරන්න ඕනේ, දැන් සාමාන්‍යයෙන් නබි නායකතුමාගේ ක්‍රියාදාමයත් අපි

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ආගමට ගන්නවා. His conduct. එක එක්කෙනා දකින අන්දමින් ඒක වෙනස් විදියට අර්ථ නිරූපනය කරනවා. ඒකෙන් මතවාදය තියෙනවා මිසෙක ලංකාවේ මම දන්නා විදියට වහබ් වාදය අපේ පැත්තේ නම් නැහැ.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : මැතිතුමනි, ඔබතුමා ඉතාමත්ම හොඳින්ම සංහිදියාව සඳහා කොහොමද මේ අපි පැරණි යුගයේ ජීවත් වෙච්ච විදියට යා යුත්තේ කියන එක සඳහන් කළා. මෙම කොමිෂම හමුවේ ගොඩක් කරුණු ඉදිරිපත් වුණා මෙම නව රැල්ල ඉස්ලාම් ආගමික අන්තවාදයට විශේෂයෙන්ම මුස්ලිම් තරුණ පිරිස ගමන් කිරීම පිළිබඳව. එම අවස්ථාවේදී ගොඩක් කතා වුණා ඔය කිතාබුත් තවුහිද් වැනි පොත්පත් ලංකාවේ නිදහසේ සංසරණය වීම. ඒ වගේම අල්බුහාරීස් කියන ග්‍රන්ථ කියවීම, ඒ වගේම සුන්නා සහ හදීස් වැරදි විදියට අර්ථ කථනය කරමින් මෙම තරුණ පිරිස් අන්තවාදය කරා යොමු වීමක් අපේ රටේ සිද්ධ වෙනවා කියලා. මම ඔබතුමා විශ්‍රාමික විනිශ්චයකාරතුමෙක් නිසා මෙම ප්‍රශ්නය යොමු කරන්නට කැමතියි. ඔබතුමාට අවස්ථාවක් ලැබුණාද කියවන්නට Madina Charter or Madina Declaration එක ගැන?

පි : මම කියවලා තිබෙනවා කලකට පෙර කියවලා තියෙනවා Madina Declaration එක.

ප්‍ර : එය නබීතුමන් විසින් රචිත එතුමා යුද්ධයට සම්බන්ධ වී තිබිච්ච යුගයේදී එතුමා විසින් රචිත ලියවිල්ලක් කියන්නේ ලෝකේ ප්‍රථම Constitution එක කියලා තමයි ඒක හඳුන්වන්නේ. එහි සියළුම ආගම් අතර සංහිදියාව ඇති කිරීමේ වැදගත්කම සහ සෑම ආගමක්ම අදහන පුද්ගලයෙකුට ආගමික නිදහස තමන් කැමති ආගම ඇදහීමේ ආගමික නිදහස පිළිබඳව කතා කර තිබෙන බව මෙම කොමිසමට විශේෂඥ සාක්ෂි ලබාදුන් පුද්ගලයෙක් විසින් සඳහන් කළා. ඔබතුමාට කියන්න පුළුවන්ද එවැනි නබිතුමන්ව රචිත ලියවිල්ලක් තිබෙද්දි අවුරුදු 200 ක් විතර පරණ කාලෙකදී ඇති වෙච්ච හදීස් එක්තරා එක් එක් විදියට අර්ථකථනය කරමින් ඇයි මේ මුස්ලිම් තරුණ පිරිස මේ අන්තවාදය කරා ගෙන යාමේ ක්‍රියාදාමයක් සිද්ධ වෙන්නේ, ඒ වගේම Madina Declaration වගේ දේවල් අපිට භාවිතා කරන්නට බැරිද ඒකේ තියෙන ආගමික සංහිදියාව වැනි දේවල් මේ තරුණ පිරිස අන්තවාදයට යාම වළක්වා ගැනීම සඳහා?

FAIR COMMENT BY JEZEEM

පි : එසේම ඒක පුළුවන්. දැන් කුර්ආනය කියනවා අරාබි වචනයෙන් ලාඉක්‍රාහිද්ධීන් කියලා. No compulsion in religion . You cannot compel other person to act on a religion. He has is own wish. He can whatever religion he want to believe he can believe in that ඉතින් මේක වෙලා තියෙන්නේ දැන් සාමාන්‍යයෙන් ආගමික දේවල් අර්ථ නිරූපනය කරන්න ආගමික නායකයන්ට දෙන්න ඕනේ. දැන් grade 10, grade 12 තියෙන අය නිකම් එක එල්ලේම බලලා ඒක අර්ථකථනය කරන්න බලනවා මේ දේවල්. ඒක ඒ කොයි අවස්ථාවේද මේක වෙලා තියෙන්නේ කොහොමද මේක ආවේ කොහොමද ගැඹුරු අදහස් තියෙන අය තමයි මේ දේවල් අර්ථ නිරූපනය කරන්න ඉඩ දෙන්න ඕන. එහෙම නැතුව සාමාන්‍ය මිනිස්සු ආගමට අර්ථ නිරූපනයක් දෙන කොට ඒ ගොල්ලෝ නිකම් අර අලියාව රෑ බැලුවා වගේ එක එක අර්ථ නිරූපනය කරනවා. ඒ නිසා මම හිතනවා ඒක ඉතාම හොඳ දෙයක්.

ප්‍ර : මැතිතුමනි ඔබතුමා හිතන්නේ ආගම අර්ථකථනය කරන්න ඕනේ ආගමික නායකයන් කියලනේ. දැන් ඉස්ලාම්වරුන්ට අල්ලාහ් දෙවියන් හැර වෙනත් ආගමික නායකයෙකු අප බුදු දහමේ නම් පන්සලේ හාමුදුරුවෝ එහෙම ඉන්නවානේ. එහෙම අයෙකු සිටිනවද?

පි : නැහැ අපේ ගම්වල දැන් ආගම ගැඹුරින් ඉගෙන ගත්තු මවුලවිවරු ඉන්නවානේ.

ප්‍ර : ඔබ අදහස් කරන්නේ මේ මවුලවිවරුන්?

පි : මවුලවිවරුන්ට තමයි ඒ වගකීම දෙන්න ඕනේ.

ප්‍ර : එතකොට මැතිතුමනි දැන් මෙම කොමිෂම හමුවේ සූෆී මුස්ලිම්වරු විශාල පිරිසක් කරුණු ඉදිරිපත් කළා. ඔබත් අපි සතුටුයි ඔබ වගේ කෙනෙක් දැකපු එක ගැන. ඒ සූෆී මුස්ලිම්වරුනට තියෙන ලොකුම දුක් ගැනවිල්ල තමයි මේ 1980 න් පසුව ලංකාවේ සාම්ප්‍රදායික මුස්ලිම් මවුලවිවරුන් විසින් ක්‍රියාත්මක කරගෙන යන මුස්ලිම් දේවස්ථාවලට මේ සූෆී නිකායකට අයත් නොවන තවුහිද් නිකායන්වලට අයත් මවුලවිවරුන් පත්කිරීම සහ ඔය අබ්දුල් රාසික් වැනි ඉස්ලාම් ආගමික අන්තවාදී මත ප්‍රචාරය කරන අයෙකු විසින් පරිවර්ථනය කරන ලද කුර්ආනයක් මෙම සාම්ප්‍රදායික දේවස්ථානවල තිබෙන කුර්ආනය ඉවත් කර අළුතින් මෙම අන්තවාදී කුර්ආනය පල්ලිවලට දමමින් සහ එහි සිටින සාම්ප්‍රදායික මතධාරීන් මවුලවිවරුන් ඉවත් කිරීමේ වැඩ සටහනක් තිබෙනවා. එවැනි මවුලවිවරුන් මේ අන්තවාදී ආගමික මතධාරී මවුලවිවරුන් විසින් අන්තවාදී දේශනා තමයි පවත්වන්නේ

FAIR COMMENT BY JEZEEM

කියලා. ඔබතුමන්ට මේ පිළිබඳව මොකක්ද කියන්නට තිබෙන්නේ?

පි : නැහැ අපේ පල්ලිවලට අපි අපේ සූෆී නිකායේ මවුලවිවරු විතරයි ගන්නේ. අපි වෙන පිට අය ගන්නේ නැහැ කවදාවත්. එහෙම එන්නෙත් නැහැ. දැන් අපිට අයිති පල්ලිවල දායකයෝ අපි තමයි. අපි තමයි තීරණය කරන්නේ කවුද දේශනා කරන්න ඕනේ, මොනවද දේශනා කරන්නේ කියලා තීරණය කරන්නේ. ඒක එහෙම බලෙන් දාන්න බැහැ කවදාවත් බැහැ.

ප්‍ර : ඔබතුමාට මම මේ පොතක් ගැන කියන්නට කැමතියි, මම මැතිතුමනි විශ්වාස කරන්නේ මේක වළක්වා ගැනීම කියන සංකල්පයේ ඉදලා පමණයි මොකද මේක මේ දෙවියන් සමඟ කිසියම් පිරිසක් කරන ගණුදෙනුවක් කියන එක තමයි මෙම කොමිෂම හමුවේ හුඟක්ම පෙනුනේ මියගිය ත්‍රස්තවාදී තරුණයන්. අන්තවාදී. මෙම පොත ඩස් අල්කුර්ආන් එන්කරේජ් වයලන්ස් කියලා මුස්ටාස් එම්.ඒ මන්සුර් නලීමියා තමයි ලියලා තියෙන්නේ. මේක මිස්කාස් රිසර්ච් ඉන්ටිටියුඩ් කලම්බු. ඔබතුමාට වෙලාවක් තිබුණොත් මේ පොත කියවලා මේ කොමිෂමට ඔබතුමාගේ අදහස දක්වන්න ලිඛිතව හරි මෙම පොත පාසැල් ළමුන්ට කුර්ආනය පිළිබඳ අධ්‍යනය කිරීමේදී අනිවාර්යයෙන්ම ලබා දිය යුතු පොතක්ද කියන එක. මා මේ පොත එහෙම පොතක් ලෙස තමයි දකින්නේ. මේකේ තියෙනවා කියලා කුර්ආනයේ යුද්ධය ගැන කියන්නේ නබිතුමන් යුද්ධයට මදීනා මක්කම සිට යුද්ධයට පැතිරුණ කාලේ මේ යුද්ධයක් ගැන තමයි කියන්නේ. මේ වර්ථමානයට ගැලපෙන්නේ නැහැ. ඒ වගේ ගොඩාක් දේවල් මේ පොතේ තියෙනවා ඔබතුමන්ට අවස්ථාවක් ලැබුනොත් කියවලා මේ කොමිෂමට ලිඛිතව අපිට ලබා දෙන්න මම හිතනවා අපිට ලොකු යුතුකමක් තියෙනවා කියලා මෙම අන්තවාදයට තරුණ පිරිස යාම වලක්වා ගැනීම සහ රටේ සියළුම ජනවර්ගයන් සමඟියෙන් ඔබ සඳහන් කල පරිදි අතීතයේ විදියට නැවත ජීවත්වීමට. බොහේම ස්තුතියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : එපමණයි ඔබට යමක් කියන්න අවශ්‍යද?

පි : නැහැ මම කියන්නේ මේක ඉදිරියට එන්නේ නැතුව ඉන්න ඔබතුමාලට මං හිතනවා ලොකු වගකීමක් තියෙනවා. මේ කොමිෂන් සභාවට. ඇත්ත වශයෙන්ම මම ඕනකමින් ආවේත් ඒක කියන්නමයි. මේක ඉතිහාසයේ නැවත වරක් වෙන්න හොඳ නැහැ. ලංකාවේ සාමය,සමඟිය, සතුට පවත්වන්න ඕන. ලස්සන

FAIR COMMENT BY JEZEEM

රටක් ලස්සන විදියට අපි ජීවත් වුණු රටක්. ඒ සම්බන්ධයෙන් මම හිතන්නේ ඔබගේ ක්‍රියාදාමය ඔබතුමාලාගේ ක්‍රියාදාමය ඉතාමත් ම වැදගත් රටට. ඒ නිසා අපි ඒක ඉදිරියේදී ඉතාම ඕනෑකමින් බලා සිටිනවා ගරු සභාපතිතුමනි. මම විශ්වාස කරනවා ඔබතුමාලට මේක ඉතා හොඳින් කරන්න පුළුවන්. ඔබතුමාලා ඉතාමත්ම බුද්ධිමත් අය. මේ සභාපතිතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ ඉතාම වැදගත් ධූරයක් දරපු කෙනෙක්. මෙතුමා අභියාචනාධිකරණයේ අපිත් එක්ක වැඩ කරපු ඉතාමත් බුද්ධිමත් කණ්ඩායමක් තමයි මෙතන ඉන්නේ මං හිතන්නේ. අපි බලාපොරොත්තු වන හැම දෙනාම බලාපොරොත්තු වෙන දේවල් ඉෂ්ඨ වේයැයි මම හිතනවා. ස්තූතියි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි. නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

****

<u>සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කරයි:</u>

අපි එතුමාට මං කියන්නේ එතුමියට අපි ස්තූතිවන්ත වුණා එතුමා අති උතුම් කියන වචනයට මේ නව යුගයේදී ඉතාම හොඳ අර්ථ නිරූපනයක් ලෝකෙට ලබා දුන්නා. ඔහුගේ පසු හැසිරීම ඔහුගේ කතාවල් නිසා තමයි මම කිව්වා මගේ දේශනයේදී මේ ලංකාව මෙවැනි විදියට සාමයෙන් සතුටෙන් අපිට ඉන්න පුළුවන් වුණේ වෙන විදියට ඒ වගේ නායකයෙක් නොතිබුණා නම් මං හිතන්නේ ලංකාවේ මීට වඩා විනාශකාරී තත්ත්වයක් ඇති වෙන්න ඉඩ තිබුණා. ඒ නිසා අපි එතුමාට ස්තූතිවන්ත වෙන්න ඕනේ මේක එතනම නවත්වන්න එතුමා කළ ක්‍රියාදාමය එතුමා අති උතුම් කියන එකට හරි අර්ථ නිරූපනයක් ලබා දුන්නාය කියලා කියන එක තමයි මම එතුමාට කියා සිටින්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිය හේතුවෙන් ඔහුට යම් තර්ජනයක් හෝ අනතුරක් සිදු විය හැකි බවට කොමිෂන් සභාවට හැඟි යන හෙයින් 2015 අංක 4 දරන සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට පහසුකම් සැලසීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාරව ඔහුට හිමිවිය යුතු සියළු වරප්‍රසාද හා අයිතීන් ඔහුට ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දියන් හට ආරක්ෂා කිරීමේ හා පහසුකම් සැපයීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

FAIR COMMENT BY JEZEEM

ඊට අමතරව මෙම සාක්ෂිකරු ඔහුගේ ස්ව කැමැත්තෙන්ම මෙම කොමිෂන් සභාවට ලිපියක් ඉදිරිපත් කිරීමෙන් ඉල්ලීමක් කරනු ලැබුවා සාක්ෂි ලබාදීමට අවස්ථාවක් ලබා දෙන ලෙසට. එලෙස කරන ලද ඉල්ලීමට අනුව කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

සභාපතිතුමනි මගෙන් යම්කිසි වරදක් වෙලා තිබුණ නම් ඔබතුමාලා සභාපතිතුමා ඇතුළු අනිත් සෙසු සාමාජිකයන් ළඟ මම සමාව පතනවා.

වේලාව: ප.ව.12.05

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.02 වේලාව: ප.ව12.05

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය සමඟ නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය පෙනී සිටී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	**606**
නම	:	**වරුණ සංජීව ඒකනායක ජයසුන්දර.**
වයස	:	**අවු 44**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**බුද්ධාගම**
දැනට දරණ තනතුර	:	**නියෝජ්‍ය පොලිස්පති දැනට විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරීයා හැටියට රාජකාරී කරනවා.**

ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: නියෝජ්‍ය පොලිස්පති ජයසුන්දර මහත්මයා ඔබ පොලිස් සේවයට බැඳුණේ කවදාද?

උ: උතුමාණනි 2001 වර්ෂයේ පෙබරවාරී 01 වැනිදා ආධුනික සහකාර පොලිස් අධිකාරීවරයෙක් හැටියට ශ්‍රී ලංකා පොලීසියට සම්බන්ධ වෙනවා.

ප්‍ර: ඔබ එදින සිට විශේෂ කාර්ය බලකායේ සේවය කෙරුවා බොහෝ කාලයක් කියලා මා කිව්වොතින් නිවැරදි ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ මොන තනතුරට ද බැඳුණේ?

උ: ආධුනික සහකාර පොලිස් අධිකාරීවරයෙකු විදියට.

ප්‍ර: එතැන් පටන් ඔබ විවිධ උසස් වීම් ලබලා අද වන විට නියෝජ්‍ය පොලිස්පතිධුරය දරනවා නේද?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: ඔබ යම් අවස්ථාවකදී විශේෂ කාර්ය බලකායේ අධ්‍යක්ෂක බුද්ධි ලෙස කටයුතු කෙරුව ද?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: එම ඒකකය පිහිටුවනු ලැබුවේ මොන වකවානුවේ ද ?

උ: මම විශේෂ කාර්ය බලකායට බැඳෙන්න කලිනුත් වරින් වර බුද්ධි ඒකක විශේෂ කාර්ය බලකාය තිබිලා තියෙනවා. නමුත් 2002 වර්ෂයේ අප්‍රේල් 23 වගේ දිනයක මම විශේෂ කාර්ය බලකායට බැඳිලා මූලික බුද්ධි පාඨමාලාවක් හදාරලා. 2002 සැප්තැම්බර් මාසයේ මඩකලපුව අම්පාර ප්‍රදේශ ආශ්‍රිතව බුද්ධි ඒකකයක් ස්ථාපිත කරා.

ප්‍ර: ඔබේ නිලධාරීන් දිවයිනේ හැම තැනම විසිරිලා ඉන්නව ද එහෙම නැත්නම් ඒ ප්‍රදේශය වල පමණක් ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: උතුමාණනි කුඩාවට පටන් ගත්තේ. මුල්ම ඒකකය අපි අම්පාර ස්ථාපිත කරලා ඒ කියන්නේ අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල ස්ථාන කිහිපයක විශේෂ කාර්ය බලකා කඳවුරු වල ඒකක පිහිටවලා තිබ්බා.

ප්‍ර: ඔබ දරණ ලද විශේෂ කාර්ය බලකායේ අධ්‍යක්ෂක බුද්ධි කියන තනතුරේ ඔබ කොයි වෙලාවක හරි වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවක් ලැබුවාද?

උ: උතුමාණනි 2018 මැයි මාසේ 14 වැනිදා මං යාපනය කොට්ඨාශ භාර නිලධාරී විදියට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරෙන් ස්ථාන මාරුව ලැබ පිටව ගියා.

ප්‍ර: යාපනයෙන් ඔබ නැවත ස්ථාන මාරුවක් ලැබුවාද වෙන කොහාට හරි?

උ: එහෙමයි උතුමාණනි 2018 දෙසැම්බර් 14 වැනිදා මම ත්‍රස්ත මර්ධන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා විදියට නැවත පැමිණියා.

ප්‍ර: නැවත පැමිණියා කිව්වේ?

උ: පැමිණියා. කොළඹට පැමිණියා.

ප්‍ර: ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා 2018 දෙසැම්බර් මාසයේ 14 වැනිදා ඔබව ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා ලෙසට පත් කරනු ලැබුවාය කියලා?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද එදින වන විට ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශය සහරාන් හෂීම් පිළිබඳව විමර්ශන ආරම්භ කරලා තිබුණ ද කියලා?

උ: ආරම්භ කර තිබුණා උතුමාණනි.

ප්‍ර: මොන වකවානුවේ ද විමර්ශන ඔවුන් ආරම්භ කරලා තිබ්බේ?

උ: පැහැදිලිව 2017 මට මතක හැටියට මාර්තු 10 වැනිදා වගේ දිනයක කාත්තන්කුඩියේ සිද්ධියක් ඇති වෙලා තිබ්බා. මොහොමඩ් සහරාන් සහ ඔහුගේ කණ්ඩායම සහ තවත් කණ්ඩායමක් හැප්පිලා එතැන 10 දෙනෙක් අත්අඩංගුවට ගෙන ඒ සිද්ධියට අදාළව වාර්තාවක් එවලා තිබ්බා එහෙ සංවිධානයක් විසින් මට පෙර හිටපු නියෝජ්‍යය පොලිස්පතිවරයාට. ඒ අනුව විමර්ශන ආරම්භ කරලා තිබ්බා උතුමාණනි.

ප්‍ර: ආරම්භ කරලා තිබ්බා?

උ: තිබ්බා.

ප්‍ර: එතකොට මොනව ගැනද ඔවුන් විමර්ශනය කරලා තිබුණේ. ඔබේ පූර්වගාමියා සහ ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය ?

උ: අංශ රාශීයක් ඔස්සේ මේ මොහොමඩ් සහරාන්ගේ ක්‍රියාකාරීත්වය විමර්ශනය කරලා තිබ්බා. විශේෂයෙන්ම ඒ ලිව්මේ මොහුගේ මේ ප්‍රචණ්ඩකාරීත්වය සහ අන්තගාමී අදහස් දැක්වීම් පිළිබඳ විස්තර ඇතුළත් කරලා තිබ්බා. ඒ අනුව එවකට සිටි නියෝජ්‍යය පොලිස්පතිවරයා විසින් දැනට අපි Unit 2 කියලා හඳුන්වන්නේ ඒ කියන්නේ ඒකක දෙක කලින් තිබ්බේ ඒ අන්තවාදී කටයුතු පිළිබඳ හොයන ඒකකයට භාර දිලා තිබ්බා

FAIR COMMENT BY JEZEEM

2017 ම. ඒ අනුව සහරාන්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව විමර්ශන ආරම්භ කරලා තිබ්බා. විශේෂයෙන්ම සහරාන් මුහුණු පොත Fecebook එක හරහා තමයි ගොඩාක් articles පළ කරලා තිබ්බේ. ඒවා සම්බන්ධව වෙනම ගොනුවක් ආරම්භ කරලා ඒවා නිරන්තරයෙන් අධීක්ෂණය කරලා තිබ්බා. පර්යේෂණ හා විශ්ලේෂණ අංශයෙන්. ඒ වගේම සහරාන් සමහරක් අවස්ථාවල ඔය කාත්තන්කුඩි වල පල්ලි වලට ගිහින් කතා පවත්වලා දේශන දාලා තිබ්බා. ඒවා එකතු කරලා 2018 වර්ෂයේ මං මතක හැටියට 05 වෙනි මාසයේ කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරලා තිබ්බා. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින්. ඒ වගේම ඒ සම්බන්ධව පොලිස්පතිතුමාත් දැනුවත් කරලා තිබ්බා මට මතක හැටියට ගොනු 15ක් විතර සහරාන් හෂීම් සම්බන්ධව මම අධ්‍යක්ෂක තනතුරේ රාජකාරි බාර ගන්න කළිනුත් එවකට සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් පොලිස්පතිවරයා ඉදිරිපත් කරලා ඒවා Calendar dates දාලා මේ හුවමාරු වෙලා තිබ්බා.

ප්‍ර: එවකට හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා කවුද?

උ: නාලක සිල්වා මහතා

ප්‍ර: ප්‍රථමයෙන්ම කරුණු වාර්තා කරලා තිබුණේ ඔබේ කොට්ඨාශය විසින් කුමන මහේස්ත්‍රාත් අධිකරණයකට ද?

උ: කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට 2018.05 මාසේ 04 ඉදිරිපත් කරලා තිබ්බා B වාර්තාවකින්. මෙයා මේ දරණ අන්තවාදී අදහස් හා මුහුණු පොතේ දාන දේවල් සම්බන්ධව.

ප්‍ර: නඩු අංකය ඔබට මතක ද?

උ: මගේ ෆයිල් එකේ.

උ: 2018.05.04 වෙනිදා ස්ථානාධිපති ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියට කරුණු වාර්තා කරනවා B වාර්තාවකින්. මෙහි අන්තර්ගතය මම කියන්නම්.

ප්‍ර: B වාර්තාවේ අංකය මොකද් ද?

උ: B 92358/08/18

ස්වාමීනි කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B 92358/08/18 දරන නඩුව යටතේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ ස්ථානාධිපතිවරයා විසින් 2018 මැයි මස 04 වන දින ගොනු කොට ඇති B වාර්තාව C 766 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: එම වාර්තාව මඟින් ගරු අධිකරණය වෙත ඔබේ කොට්ඨාශය විසින් දැනුම් දී තිබෙන කරුණු මොනවාද?

උ: ප්‍රධානම මාතෘකාව වෙන්නේ උතුමාණනි මූලධර්මවාදී හා අන්තවාදී කරුණු ඉස්මතු කරමින් විඩියෝ පට හා ඡායාරූප වෙබ් අඩවිය සහ මුහුණු පොත භාවිතා කරමින් ප්‍රචාරය කරල බවට ත්‍රස්තවාදී විමර්ශන

FAIR COMMENT BY JEZEEM

කොට්ඨාශය විසින් කරුණු වාර්තා කිරීමක් කරනවා. නැගෙනහිර පළාතේ මේ වන විට ක්‍රියාත්මක වන මුස්ලිම් සංවිධාන කිහිපයක් විසින් පිහිටුවා ගන්නා ලද නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධව ලැබුණු තොරතුරු අනුව අන්තර්ජාලය උපයෝගි කරගනිමින් පුළුල් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. ඒ අනුව එහි නායකයා වන මොහොමඩ් සහරාන් සම්බන්ධව ඔහුගේ පදිංචිය තියෙනවා මිරා පල්ලිය පාර කාත්තන්කුඩි 06. ඒ වගේම මාර්තු 10 වෙනිදා වෙච්ච සිද්ධිය සම්බන්ධ කරුණු දැක්වීමක් කරනවා. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ඒ වගේම NTJ media unit කියන එකෙන් නැෂනල් තවුහිද් ජමාත් එකේ මුහුණු පොත හරහා මේ ප්‍රචාර කරන බව සඳහන් කරනවා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය. ඒ වගේම යම් සඳහන් කිහිපයක් ඒ කියන්නේ ප්‍රකාශ වෙලා තියෙන extreme Content කිහිපයක් සඳහන් වෙනවා. මෙම විමර්ශන යට අදාළව 2017.02 .17 වන දින කාත්තන්කුඩි හිස්බුල්ලා ශාලාවේදී සැකකරු විසින් ඉස්ලාමිය ධර්මය සාමයට අයත් ධර්මයක් නොව නීතියට සම්බන්ධ ආගමක් බවත්, එය කඩුවක් වැනි තියුණු දෙයක් බවටත්, ශ්‍රී ලංකා ජාතික කොඩිය එසවීම ඉස්ලාම් ධර්මයට හානිදායක බවත් කරුණු සටහන් කරමින් මෙම NTJ සංවිධානයට අයත් .www.ntj com වෙබ් අඩවිය සහ NTJ media unit නැමැති මුහුණ පොත Facebook භාවිතා කරමින් ලොව පුරා ප්‍රචාරය කර ඇති බව කරුණු අනාරවණය විය. NTJ සංවිධානට අයත් NTJ media unit නැමැති Facebook පරීක්ෂා කිරිමේදී 2018 මාර්තු මාසයේදී මහනුවර හා අම්පාර ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් ජනතාව අතර ඇති වූ කලහකාරී සිද්ධියෙන් පසු 2018 මාර්තු 15 වන දින ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් සඳහා ඇති විසඳුම කුමක්ද තේමාව යන යටතේ අන්තවාදී අදහස් ඇතිවන ආකාරයේ විඩියෝ පටයක් නිකුත් කර ඇත. ඊට පස්සේ තියෙනවා. ඒ වගේම උතුමාණනි පහත දිනයන් වලදිත් මෙයා දාපු Facebook එකේ මේකේ දාපු articles මේක අපි සඳහනක් කරනවා 2018.03.16 දින තියෙනවා ඉස්ලාම් දේශයේ අවශ්‍යතාවය කියලා articles එකක් මෙයාගේ brief එකක් 2018.03.28 තියෙනවා ඉස්ලාම් අවි සටනේ ජිහාදය ඇයි නීතියක් වශයෙන් පත් කර ඇත්තේ. 2018 අප්‍රේල් 04 මහනුවර තැන්නේ කුඹුර පල්ලියේ පිරිත් කියපු බිහිසුනු ක්‍රියාවට හේතුව කවුරුන් ද ආදි වශයෙන් 2007 අංක 56 දරණ ICC Pr Act එකට ගැනෙන ජාතීන් අතර සංහිදියාවට බාධාවක් වන ආකාරයේ ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමක් කරනවා.

ප්‍ර: දැන් ජයසුන්දර මහත්මයා ඔබ 2018 12 වෙනි මාසේ 14 වෙනිදා ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා ලෙස ස්ථාන මාරු

FAIR COMMENT BY JEZEEM

ලැබුවාට පස්සේ සහරාන් හෂීම්ට අදාළව එතෙක් සිදු කරලා තිබුණු විමර්ශන වගේම ඔබ විසින් දැන් C 766 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරපු ඔය B වාර්තාව ඇතුලු නීති කෘත්‍යට අදාළ වූ සියලුම කරුණු පිළිබඳව කියවලා අවබෝධයක් ලබා ගත්තාද?

උ: මම විශේෂයෙන්ම උතුමාණනි අධ්‍යක්ෂක විදියට වැඩ බාර ගත්තා පස්සේ ඇත්තටම පළමු වතාවට මං විමර්ශන අංශයක් භාර ගත්තේ. මම විශේෂ කාර්ය බලකා නිලධාරියෙක්. මේ අංශවල ස්ථානාධිපතිවරුන් ගෙන්නලා මීට අමරතවත් කරපු විමර්ශන ගැන අදහසක් ගත්තා ඇත්තටම LTTE සංවිධානය සම්බන්ධව වෙනම අංශයක් තිබ්බා ඒකත් ඒ OIC ලා ගෙන්නලා දැනුවත් වුණා. ඒ වගේම මෙතන සහරාන්ට අමතරවත් අයි.එස්.අයි එස් සංවිධානයේ ඒ වගේ කරුණු සම්බන්ධව දැනුවත් විමක් වුණා. ඒ වගේම උතුමාණනි මේ පුද්ගලයා සම්බන්ධව ගොනු සංසරණය සිදු වීමක් වුණා. ගොඩාක් වෙලාවට සති තුනකට සැරයක් විතර පොලිස්පතිවරයා විසින් විමර්ශන වල ප්‍රගතිය අහනවා එතකොට මේ articles එකක් කොහේ හරි වැටුණා නම් අපි පරීක්ෂණ විශ්ලේෂණ ගොනුවක් හදලා පොලිස් පතිවරයාට යොමු කරපුවාම ඒක පල්ලෙහාට මට ආවා Calendar date එකක් අදලා මේ ගැන Further report එකක් දෙන්න කියලා. එහෙම ගිය ගොනු 15 විතර තිබ්බා මට මතකයි

ප්‍ර: එතකොට දැන් ඕවා සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්න නම් ඔබ තුමා ඒ ගැන දැනගෙන ඉන්න ඕනේනේ?

උ: ඔව්.

ප්‍ර: ඒක නිසා ඔබ කියන්නේ ගරු කොමිෂන් සභාවට අදාළ නිලධාරීන් ගෙන්නලා ඔවුන් සමඟ සාකච්ඡා කරලා ඒ අදාළ ලේඛන කියවලා දැනුවත් වුණා කියලා නේද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ වගේ ඔබ අද දින සාක්ෂියේදී සඳහන් කරා 2017 මාර්තු මාසේ 10 වෙනිදා කාත්තන්කුඩියේ දී සිදුවුණු යම් ගැටීමක් නිසා එතනින් පස්සේ සහරාන් යන තැනැත්තා සොයාගත නොහැකිව හිටියාය කියලා?

උ: එහෙමයි.

ප්‍ර: විශේෂ කාර්ය බලකායේ ඔබ ඉන්න කොට ඔබ ඒ පිළිබඳව දැනුවත් වෙලා හිටියාද?

උ: මොහොමඩ් සහරාන් ගැන දැනුවත් වෙලා හිටියේ නැහැ.

ප්‍ර: දැනුවත් වෙලා හිටියේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: එතකොට ඔබ ප්‍රථමයෙන්ම ඔහු ගැන දැනුවත් වුනේ කොහේදී ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක විදියට පත් වුණාට පස්සේ ස්වාමිනි.

ප්‍ර: එතාකොට මේ සහරාන් අධිකරණය මගහරිමින් සිටිනවාය කියන කරුණ එහෙම නම් ඔබ දැනගත්තේ මේ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයට ආවාට පස්සේ නේද?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර; දැන් ඒ අවස්ථාව වන විටත් ඒ කියන්නේ ඔබ අධ්‍යක්ෂකවරයා විදියට රාජකාරි භාර ගන්න කොටත් ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය විසින් සහරාන්ව අත්අඩංගුවට ගැනීම සඳහා යම් යම් උත්සාහයන් දරා තිබුණාද?

උ: ගොඩාක් උත්සාහයන් දරලා තිබ්බා අවස්ථා කිහිපයකම විශේෂයෙන්ම මොහු පදිංචි කාත්තන්කුඩි ප්‍රදේශයටත් ඒ වගේම තොරතුරක් ආවා කුරුණෑගල කැකුණ ගොල්ලේ. ඒ කියන්නේ බිරිඳගේ ගම් ප්‍රදේශයේ ඉන්නවා කියලා ඒ තැන්වලටත් ගියා මමත් අවස්ථා කිහිපයක නිලධාරීන් පිටත් කර හැරියා මොහුව අත්අඩංගුවට ගන්න. මං එන්න කලිනුත් සෑහෙන්න උත්සාහයක් දරලා තිබ්බා TID එක මේ සහරාන්ව අත්අඩංගුවට ගන්න.

වේලාව: ප.ව. 12.20
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.12.25
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය</u>

ප්‍ර: ඔබ සතුව ඒ අදාළ ගොනු මේ අවස්ථාවේ තියෙනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඔබට කියන්න පුළුවන් ද ඔබ අධ්‍යක්ෂකවරයා විදිහට ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයේ වැඩ භාර ගැනීමට පෙර සහරාන්ව අත්අඩංගුවට ගැනීමට එකී කොට්ඨාශය මොන මොන අවස්ථාවන් වල දී උත්සාහ අරගෙන තිබුණාද කියලා?

පි: උතුමාණෙනි මුලින්ම මේ ආරම්භ වෙන්නේ මං කළින්ම කිව්වා වගේ 2017 මාර්තු 27 වෙනිදා ලිඛිත තොරතුරුක් TID එකට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ලැබෙනවා. ඊට පස්සේ ඒක යොමු කරනවා.

ප්‍ර: මොනවා ගැනද?

පි: සහරාන්ගේ අර මාර්තු 10 වෙනිදා සිද්ධිය සහ මේ extreme සහ කලහකාරී සහ අන්තවාදී අදහස් සම්බන්ධව ලිඛිතව කරුණු වාර්තා කරලා තිබ්බා. එහේ සංවිධානයක් විසින් මාර්තු 27 වෙනිදා.

ප්‍ර: ඔබ සඳහන් කෙරුවා ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාශයට යම් පාර්ශවයක් වෙතින් ලිඛිතව කරුණු දැක්වීමක් සිදු කරලා තිබුණායි කියලා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ ලිඛිත කරුණු දැක්වීම සිදු කළ බවට දැක්වෙන්නේ කවදද ජයසුන්දර මහත්මයා?

පි: මේකේ දිනය තියෙන්නේ 2017 මාර්තු 27 ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඔබේ කොට්ඨාශයේ විමර්ශන ආරම්භ වෙලා තිබුණේ සහරාන් සහ ඔහු දරණ මේ අන්තවාදී අදහස් පිළිබඳව විමසමින් විමර්ශනය කිරීමට ඉන් අනතුරුවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ සඳහන් කෙරුවා විවිධ අවස්ථාවන් වල දී සහරාන් සොයා බැලීමට ඔහු ඉන්න තැනකින් සොයා බලන්නට විවිධ උත්සාහයන් ඔබේ කොට්ඨාශය අරගෙන තිබුණායි කියලා?

පි: එහෙමයි.

ප්‍ර: ඒ මොන මොන අවස්ථාවන් වල දී ද කියලා ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන් ද?

පි: මුලින්ම උතුමාණෙනි මෙම එවකට හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අර ආපු document ..

ප්‍ර: ඒ කියන්නේ නාලක සිල්වා මහතා විසින්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: නාලක සිල්වා මහතා විසින් මෙම විමර්ශනය මූලධර්මවාදී හා අන්තවාදී අංශ වෙත යොමු කරන්න ඕනි කියලා මැයි 4 වෙනිදා 2017 නියෝග යොදලා තියෙනවා. ඒ අංශයට භාර කරලා තියෙනවා මුලින්ම විමර්ශන කටයුතු කරන්න කියලා.

ප්‍ර: ඒ කියන්නේ 2017 මාර්තු මාසේ 27 වෙනිදා දාතම ඇති ඒ ලිපිය නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ඒ අදාළ ඔබ කිව්ව අංශයට යොමු කරලා තියෙන්නේ 2017 මැයි 4 වෙනිදා නේද?

පි: මැයි 4 වෙනිදා.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ ඒ අනුව විශේෂයෙන්ම අන්තර්ජාලය මඟින් මෙයා පළ කරන දේවල් පිළිබඳව පර්යේෂණ සහ විශ්ලේෂණ අංශය there's another section විමර්ශන කටයුතු කරලා තියෙනවා. web based investigation එකක්. අන්තර්ජාලය උපයෝගී කරගෙන. මෙහෙම inquiry කරගෙන එද්දී අපි හඳුනා ගන්නවා. විශේෂයෙන්ම පර්යේෂණ සහ විශ්ලේෂණ අංශය NTJ Media Unit කියන එකත් www.ntj.com කියන මෙයාගේ මේ මුහුණු පොත ආශ්‍රයෙන් කරන propaganda එක අපි මාස 2ක් විතර study කරලා තියෙනවා. ඊට පස්සේ මේ සම්බන්ධව අපි ඉස්සෙල්ලාම 2017.05.25 වෙනිදාම අපේ විශේෂ කාර්යාංශය කියලා විශේෂ අංශයක් තියෙනවා. ඒ කියන්නේ සෑම පොලිස් ස්ථානයකම ඉන්නවා බුද්ධි අංශ නිලධාරීන්. ඒ කොට්ඨාශයේ මොහොමඩ් සහරාන් ගැන යම් තොරතුරක් ගැබ් වෙලා තියෙනවද කියලා අපි ලිඛිතව අහනවා. විශේෂ විමර්ශන අංශයෙන්. ඒකට උත්තර එනවා අපිට 2017.06.01 දින. ඒවගේම අපි දිගටම මොහොමඩ් සහරාන් ගැන study කරන් යද්දී මේ අදුන ගන්නවා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මොහු ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායකයා වගේම එයාගේ සහෝදරයා මේකේ ලේකම් ෂෙයිනි මවුලවි ලේකම් විදිහට කටයුතු කරනවා කියලා. ඒ වගේම අපේ කල්මුණේ කුඩා ඒකකයක් තියෙනවා TID එකේ. එතන නිලධාරීන් 7, 8 දෙනෙක් ඉන්නේ. ඒගොල්ලෝ විශේෂයෙන්ම කාත්තන්කුඩි ප්‍රදේශයට ගිහින් මම හිතනවා මේ තොරතුරු වාර්තා කරා කියලා. මේ සංවිධානය ගැන අපි හඳුනා ගන්නවා. ඒ කියන්නේ එයයි එයාගේ මල්ලීයි තමයි මේ සංවිධානයේ විශේෂයෙන්ම මේ අන්තවාදී අදහස් දරමින් මේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ වගේම මේ දේශන සම්බන්ධත් වාර්තා කරනවා.

ප්‍ර: මා ඔබට පොඩ්ඩක් මදකට බාධා කරනවා. ඔබ කිව්වානේ සහරාන් සහ ඔහුගේ සහෝදරයා වෙන අර ලේකම් ෂෙයිනි මවුලවි පිළිබඳව ඔබට අනාවරණය වුණා කියලා. ඔබලාට අනාවරණය වුණාද රිල්වාන් කියන කෙනෙක් ගැන?

FAIR COMMENT BY JEZEEM

පි: එතකොට රිල්වාන් කෙනෙක් ගැන සඳහන් වෙන්නේ නැහැ.

ප්‍ර: හරි කමක් නැහැ. වෙන මොනවද අනාවරණය වෙන්නේ?

පි: ඒ වගේම මේ වෙද්දී..

ප්‍ර: එතකොට ඔය මොන වකවානුවද ඕක?

පි: මේ වෙන්නේ උතුමාණෙනි 05 මාසේ ඒ කියන්නේ අපි inquiry පටන් ගත්ත එක ගැන සඳහන් වෙන්නේ නැහැ.

ප්‍ර: year, month and the date

පි: මේකේ generally සඳහන් වෙනවා date එකක් නැතුව නමුත් දිගටම විශේෂයෙන්ම මේ සංවිධානය කල්මුණේ කියන එක සඳහන් වෙන්නේ නැහැ. නමුත් TID එක හදුන ගන්නවා NTJ එකේ මේ Head and the Secretary ඒ කියන්නේ ප්‍රධානියා සහ ලේකම් මේ අයයි කියන එක. date එකක් සඳහන් වෙන්නේ නැහැ. එතකොට ඊට පස්සේ අපි අර මුල් ලියුමට ගිහින් 2017 මාර්තු 10 වෙනිදා දෙපැත්තක් ගහගත්ත එක සම්බන්ධව බලද්දී ..

ප්‍ර: ඒ කියන්නේ ඔය 2017 මාර්තු 27 දිනයෙන් ලැබුණු ලියුම ?

පි: ලියුමෙන් සඳහන් වෙන මාර්තු 10 සිද්ධිය සම්බන්ධව ඒ වෙද්දීත් ගරු මඩකලපුව ගරු මහේස්ත්‍රාත් උසාවියට කරුණු වාර්තා කරලා තියෙනවා. ඒවගේම සහරාන්ගේ කණ්ඩායමේ 8 දෙනෙකුත් අනිත් කණ්ඩායමේ දෙදෙනෙකුත් අත්අඩංගුවට අරගෙන තියෙනවා. ඒවගේම සහරාන්ට වරෙන්තු නිකුත් වෙනවා ඒ කියන්නේ උසාවිය මඟ අරිනවා. ඔහුයි සහෝදරයායි. ඊට පස්සේ අපි මේ සියල්ලම කැටි කරලා ගරු නීතිපතිතුමාගෙන් උපදෙස් ලබා ගන්න අපි ගොනුවක් යොමු කරනවා. 2017.06.07 වෙනිදා. EER8/17 කියලා.

ප්‍ර: ඔබට තියෙනවද EER කියලා යොමුවක් නැත්නම් නීතිපතිතුමාට ද තියෙන්නේ EER?

පි: එතන EER එකක් අපි නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරාට පස්සේ එහෙන් අපි ලබා ගන්න අංකයක්.

ප්‍ර: දෙපාර්තමේන්තුවෙන් ඔබට ලබා දුන්න අංකය තමයි ඔය EER8/17 කියන අංකය?

පි: එහෙමයි උතුමාණෙනි. එකේ උතුමාණෙනි කරුණු පිටු 3ක් විතර සඳහන් කරලා ගරු නීතිපතිතුමාට යොමු කරනවා. ඒ වගේම අපි දන්න විදිහට මෙයාගේ එකේ සඳහන් වෙන්නේ විශේෂයෙන්ම මුහුණු පොත ආශ්‍රිතව කරන මේ web based propaganda එකේ content එක සඳහන් කරලා ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 291 (අ) , (ආ) ඒවගේම 483 , 484, 485 සහ දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්ති සහ 2007 අංක 24 පරිගණක අපරාධ පනතේ 6 වගන්තිය. ඒ කියන්නේ අපි ගරු නීතිපතිතුමාට දන්වනවා මේ සහරාන්ගේ මේ විශේෂයෙන්ම මුහුණු පොත හා අන්තර්ජාලය

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධව කරන මේ Propaganda නැත්නම් අන්තවාදී අදහස් ප්‍රචාරනය කිරීම සම්බන්ධව සඳහන් කරලා ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අර මම කළින් සඳහන් කරපු 291 (අ), 291(ආ) ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 483 වගන්තිය, 484 , 485 සහ 120 වගන්තිය සහ 2007 අංක 24 පරිගණක අපරාධ පනතේ 6 වන වගන්තිය ජාතික ආරක්ෂවට එරෙහිව සිදු කරන වැරදි කියන එක යටතේ අපි කරුණු සඳහන් කරලා ගරු නීතිපතිතුමාට කියනවා. කරුණු මෙසේ හෙයින් NTJ සංවිධානය සම්බන්ධයෙන් හා ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාල web අඩවිද සමාජ ජාලා web අඩවිද තහනම් කිරීමේ හැකියාවක් පවතින්නේ ද යන්න සහ මෙම නීති විරෝධී ක්‍රියාකාරකම් වල නිතර වන පුද්ගලයින් අත්අඩංගුවට ගෙන විමර්ශනයක් සිදු කිරීමට හැකියාව ඇද්ද යන්න සම්බන්ධයෙන් ඔබතුමාගේ උපදෙස් ලබා ගැනීම සඳහා ස්ථානාධිපති ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ වාර්තාව සමඟින් විමර්ශනයේ උද්ධෘත ගොනු 2ක් සකස් කර කාරුණික ඉදිරිපත් කරනවා කියලා එවකට වැඩ බලන අධ්‍යක්ෂකවරයා විසින් 2017.06.07 වෙනිදා ගරු නීතිපතිතුමා වෙත විමර්ශන ගොනු දෙකක් සහිතව මෙම ලිපිය ඉදිරිපත් කරනවා.

ප්‍ර: එම ලිපියේ පිටපතක් ඔබ ලඟ තියෙනවද?

පි: ඔව් උතුමාණෙනි.

ප්‍ර: වැඩබලන අධ්‍යක්ෂක ලෙස ඒ ලිපිය යවන අවස්ථාව වෙන විට රාජකාරි කළේ කවුද?

පි: ජගත් නිශාන්ත මහත්තයාත් වැඩ කරා. වැඩ බලන අධ්‍යක්ෂක විදිහට. මෙතන නම සඳහන් වෙන්නේ නැහැ. තියෙන්නේ වැඩ බලන කියලා සඳහන් වෙන්නේ.

ස්වාමීනි 2017 ජුනි මස 7 දින දරන ගරු නීතිපතිතුමා වෙත ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයේ ඒ වැඩ බලන අධ්‍යක්ෂකවරයා විසින් යවා ඇති බවට සඳහන් කරන ලද එම ලිපිය C -767 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: ඔව් ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ උතුමාණෙනි 2017.09.13 වෙනිදා මට ජේනවා. අපි යනවා කාත්තන්කුඩි ප්‍රදේශයට තොරතුරු පරීක්ෂා කරන්න. දැනට ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරි කණ්ඩායමක් කාත්තන්කුඩි ප්‍රදේශයට යනවා 2017.09.13 වෙනිදා මේ තොරතුර සම්බන්ධව පරීක්ෂා කරන්න.

ප්‍ර: 2017.09.13?

පි: ඔව්.

ප්‍ර: ඒ තොරතුරු වලින් සාර්ථක ප්‍රතිඵලයක් ලැබෙනවද?

පි: මේකේ අදාළ ප්‍රදේශයට ගියා කියන එක සටහන් වුණත් ..

ප්‍ර: අත්අඩංගුවට ගැනීමක් සිදු වෙලා තියෙනවද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: අත්අඩංගුවට ගැනීමක් සිදු වෙලා නැහැ.

ප්‍ර: ඊට පස්සේ මොකද වෙලා තියෙන්නේ?

පි: ඊට පස්සේ කාල වකවානුවක් සඳහන්ව නැතත් සඳහන් වෙනවා. මේ සහරාන් සහ ඔහුගේ සමාජ ජාලා ගිණුම් වෙබ් අඩවි නිරන්තරයෙන් අපේ පර්යේෂණ හා විශ්ලේෂණ අංශයෙන් පරීක්ෂා කරගෙන ගිහින් තියෙනවා. ඒවගේම උතුමාණෙනි 2017.08 .14 දින අපි ඩයලොග් ආයතනයට ලියලා තියෙනවා. මෙයා යම් දුරකතනයක් පාවිච්චි කරනවද කියලා service provider ගෙන්. එතකොට සඳහන් කරලා තියෙනවා ඒ දුරකථන අංකය භාවිතයේ නැහැ කියලා. ඊට පස්සේ නැවතත් 2017.10.20 වෙනිදින TID එකේ නිලධාරින් කණ්ඩායමක් සහරාන්ගේ බිරිඳ පදිංචිව සිටි කැකුණුගොල්ල , නාරම්මල ලිපිනයට ගිහින් තියෙනවා සහරාන්ව හොයන්න. 2017.10.20 වෙනිදා. ඒත් සඳහන් වෙනවා මොහු සිටින ස්ථානයක් සම්බන්ධව තොරතුරක් අනාවරණය වෙලා නැහැ ඒ ගිය ගමනේ දී.

ප්‍ර: අනතුරුව

පි: ඒ වගේම මේකේ දෙයක් සඳහන් වෙනවා මේ කාත්තන්කුඩි සිද්ධියත් සමඟම NTJ සංවිධානය එහි වගකීම භාර ගන්නේ නැහැ කියලා 2017.12.29 එම සංවිධානය විසින් පවත්වාගෙන යන NTJ. Media. Unit නැමැති මුහුණු පොතේ දැන්වීමක් පළ කරලා තියෙනවා.

ප්‍ර: මොනවා ගැන ද වගකීම භාර ගන්නේ නැහැ කියලා කියන්නේ?

පි: ඒක මම කියවනවානම් ඒ මාර්තු 10 දින සිදුවූ ගැටුම හේතුවෙන් මොහොමඩ් සහරාන් හට නිකුත් කර තිබූ වරෙන්තුව මඟ හරිමින් අධිකරණය හා ආරක්ෂක අංශ මඟහරිමින් ඔහුගේ face book ගිණුම් මඟින් නිරන්තරයෙන් අන්තවාදී අදහස් සහිත දේවල් බෙදා හැරීම හේතුවෙන් ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ කටයුතු වලට සහභාගී නොවන බවට හේතු ඉදිරිපත් කරමින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් එම සංවිධානයේ සියලු තනතුරු වලින් සහරාන්ව ඉවත් කල බවත්, ඔහු විසින් සිදු කරනු ලබන ප්‍රචාරයන් සම්බන්ධයෙන් NTJ එක වගකියන්නේ නැහැ කියලා ඒගොල්ලන්ගේ website එකේ article එකක් දාලා තියෙනවා 2017.12.29.

ප්‍ර: එම ලිපියේ පිටපතක් තියෙනවද ඔබ ළඟ?

පි: මෙතන ඇතුළත් වෙන්නේ නැහැ.

ප්‍ර: 2017.12.29 ?

පි: එහෙමයි.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

President's Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි: ඊට පස්සේ මේගොල්ලෝ 2017.12. 29 දින සිට ජාතික තවුහිද් ජමාත් සංවිධානය නායකයා ලෙස මොහොමඩ් යුසුෆ් මොහොමඩ් තවුෆික් පත්වී ඇති බවට තොරතුරු අනාවරණය වෙනවා TID එකට.

ප්‍ර: මොහොමඩ් යුසුෆ් මොහොමඩ් තවුෆික්?

පි: ඔව්.

ප්‍ර: ඒ තොරතුර කොහේද සඳහන් වෙලා තිබුණේ?

පි: එකේ තියෙන්නේ 2 Sentences ..

ප්‍ර: From where has that been taken

පි: ඔව් ඒක මම TID එකෙන් අහලා මේ තියෙන්නේ generally source එක සඳහන් වෙන්නේ නැහැ ඇත්තටම කොහෙන්ද ලැබුණේ කියලා. අනාවරණය කර ගත්තා කියලා තියෙන්නේ.

ප්‍ර: අනාවරණය කර ගත්ත තොරතුරක් ගැන තමයි ඔබ මේ කියන්නේ?

පි: ඔව්. තොරතුරු අනාවරණය වුණා කියලා TID එකට සඳහන් වෙනවා. 2017 දෙසැම්බර් 29 වෙද්දී සහරාන්ව අයින් කරලා වෙන කෙනෙක් NTJ නායකත්වයට පත් කරා කියලා.

ප්‍ර: ඒ තමයි මොහොමඩ් යුසුෆ් මොහොමඩ් තවුෆික් ?

පි: ඔව්.

ප්‍ර: ඔබ කියන ආකාරයට අනාවරණය වුණේ?

පි: එහෙමයි.

ප්‍ර: ඊට පස්සේ ඔබලාට මොකක්ද දැන ගන්නට ලැබෙන්නේ?

පි: ඊට පස්සේ අපි ගත්ත ක්‍රියාමාර්ගයක් හැටියට 2018 මාර්තු 23 සහරාන් සම්බන්ධයෙන් අපි ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවනවා. ඒ වාර්තාවට පිළිතුරු අපිට හම්බවෙනවා ආගමන විගමන එකෙන් 2018 මාර්තු 28 වෙනිදා. ඒ අනුව මේ පුද්ගලයාට N2017422 කියලා ගුවන් බලපත්‍රයක් භාවිතා කරමින් 2009 ජනවාරි 8 මේක තියෙන්නේ නම් හොංකොං බැංකොක් කියලා තියෙන්නේ පිටත්ව ගොස් ආයි 2009 අප්‍රේල් 08 ලංකාවට ඇවිල්ලා තියෙනවා. ඒ Immigration Report එක තියෙනවා දීලා.

ප්‍ර: ඊට පස්සේ ඔහු නීතියානුකූලව ගුවන් තොටුපලකින් එහෙම නැත්නම් වරායකින් ලංකාවෙන් බැහැර වූ බවට යම් තොරතුරක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලැබිලා තියෙනවද?

පි: පස්සේ අහපු එකක දීලා තියෙනවා.

ප්‍ර: මා මෙසේ ඇහුවොත් 2017 මාර්තු මාසේ 10 වෙනිදා අලියාර් හන්දියේ සිදු වූ ගැටුමට පසුව සහරාන් හෂිම් ලංකාවෙන් ගුවන් තොටුපළකින් හෝ ලංකාවේ පිළි ගන්නා ලද ගුවන් තොටුපලකින් හෝ ලංකාවේ පිළිගන්නා ලද වරායකින් දිවයිනෙන් බැහැර වූ බවට ආගමන විගමන වාර්තා මඟින් හෙළිදරව් වුණාද ඔබේ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයට?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙම ආරංචි වෙලා නැහැ උතුමාණෙනි. නමුත් අපි එයාව Stop List එකට දාලා තියෙනවා. මම දිනය කියන්නම්.

ප්‍ර: ඒ කියන්නේ වාරණයක් ලබා ගනු ලැබුවා?

පි: වාරණයක් ලබා ගත්තා TID එක. ඒ කියන්නේ සහරාන්ගේ ගුවන් ගමන් වැළැක්වීම සඳහා ඔහුගේ පෞද්ගලික විස්තර ගුවන් ගමන් තහනම් කිරීමේ ලේඛනයට ඇතුළත් කරන්න Stop List දාන්න කියලා මගේ පූර්වගාමී නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නාලක සිල්වා මහත්මයා විසින් 2018.05.16 දින අධ්‍යක්ෂකතුමා රාජ්‍ය බුද්ධි සේවය වෙත ලිපියක් යොමු කර ගුවන් ගමන් තහනම් කිරීමේ ලේඛනයට මෙයාව ඇතුලත් කරලා තියෙනවා. 2018.05.10 වෙනිදා ලියුමේ stop list එකට දාලා තියෙනවා.

ප්‍ර: Stop list එකට දැම්මා?

පි: ඔව්.

ප්‍ර: ඊළඟට මොකක්ද ඔබලා ගත්ත පියවර මොකක්ද ඔබලාට දැන ගන්න ලැබුණේ ?

පි: ඊට කළින් අර sequence එකේ එද්දී විමර්ශකයන් ඒ ප්‍රදේශ වලට ගිය ආකාරය බලද්දී 2018 මාර්තු මාසේ 27 වෙනිදා මේ සහරාන් ඉන්න තැනක් අනාවරණය කර ගන්න ඔහුගේ මව වන අබ්දුල් කාදර් සිත්ති සමීමා යන අය ප්‍රශ්න කරලා තියෙනවා. ඒ ප්‍රශ්න කිරීමේදීවත් අපිට අනාවරණය වෙලා නැහැ මේ සහරාන් ඉන්න තැනක්. සහරාන්ගේ අම්මාව ප්‍රශ්න කරලා තියෙනවා කල්මුණේ ඒකකයෙන් ගිහින්. ඊට පස්සේ අපි ...

ප්‍ර: වෙන මොන අවස්ථාවල දී ද සහරාන් ඉන්න ස්ථාන පිළිබඳව සෙවීම සඳහා ඔබේ කොට්ඨාශයේ නිලධාරීන් බැහැර වෙලා තියෙන්නේ?

පි: අපි ග්‍රාමසේවක හම්බවෙලා තියෙනවා. මොකද ග්‍රාමසේවක තමයි සාමාන්‍යයෙන් පදිංචි ප්‍රදේශයේ පුද්ගලයෝ ගැන දන්නේ. 2018 මාර්තු 27 සහරාන් ඒ කාත්තන්කුඩි ප්‍රදේශයේ කුලී නිවසක හිටියා කියලා ලැබිච්ච තොරතුරු අනුව ඒ අදාළ වසම භාර ග්‍රාම නිලධාරිවරයාගෙන් අපි අහපුවාම එයා ලිඛිතව වාර්තාවක් දීලා තියෙනවා මෙයා එහි පදිංචියක් නැහැ කියලා. ඒ 2018 මාර්තු 27 වෙද්දී. එතකොට අපේ කල්මුණේ ඒකකයෙන් ගිහින් තමයි ඒ පැත්තේ හොයලා තියෙන්නේ සහරාන් ගැන අපි ග්‍රාම සේවකත් හම්බවෙලා තියෙනවා 2018 මාර්තු 27.

ප්‍ර: දැන් ඒවගේ විවිධ පුද්ගලයින්ගෙන් සහරාන් ඉන්න ස්ථාන පිළිබඳව ඔබලා සොයාගන්නට උත්සහා කරා?

පි: උත්සාහත් කරා ලිඛිතව දීලා තියෙනවා.

ප්‍ර: නමුත් එය සාර්ථක වුණේ නැහැ ඔබ කියන්නේ?

පි: නැහැ නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ වගේම ඔබගේ කණ්ඩායම් නිලධාරීන් යම් යම් ස්ථාන වලට ඔබලාට ලැබෙන තොරතුරු අනුව ගිහිල්ලා ඔහුව සොයා බැලුවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නමුත් එයිනුත් ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ කියලායි ඔබ කියන්නේ?

පි: එහෙමයි.

ප්‍ර: හොඳයි දැන් ඔහොම ඉන්න අවස්ථාවේ දී යම් වෙලාවක ඔබට ලැබුණද ජාතික බුද්ධි ප්‍රධානීගෙන් යම් ලිපියක්?

පි: 2019 අප්‍රේල් 09 වෙනිදා ලියුමද අර Top Secret..

ප්‍ර: ඔව්.

පි: මට 2019 අප්‍රේල් 10 වෙනිදා eyes only Top Secret කියලා Document ලැබුණා.

ප්‍ර: ලිපිය නැවත දැක්කොත් ඔබට හඳුනන්නට පුළුවන් ද?

පි: පුළුවන් උතුමාණෙනි.

ප්‍ර: ඔබට මා ඔය පෙන්වන C - 4 (A) ලේඛනය ඔබ දැන් මීට මොහොතකට පෙර සඳහන් කරපු 2019 අප්‍රේල් මාසේ 9 දින දරණ ලිපියක් ඔබට ලැබුණයි කිව්ව එකත් එක්ක යම් සම්බන්ධතාවයක් තියෙනවද?

පි: ඔව් මේ ලියුම තමයි මට හම්බුණේ.

ප්‍ර: ස්වාමීනි සාක්ෂිකරු ලේඛනය හඳුනා ගනු ලබනවා. දැන් ඒ ලිපිය ඔබට ලැබුණේ කා විසින්ද?

පි: මට වෙලාව මතක නැහැ. 10 වෙනිදා Office එකට යද්දී CNIගේ ලියුමක් තිබ්බා. මට අතින් භාරදීලා තිබ්බේ ඇවිල්ලා Office එකට. පස්සේ මම ඒක විවෘත කරලා බලද්දී උතුමාණෙනි මේ ලියුම තිබ්බා.

ප්‍ර: ඔබ ළඟ අද දින පොලිස්පතිවරයා විසින් ලැබුණු ඒ ලිපිය තිබෙනවද?

පි: ලැබිච්චි මුල්ම ලිපිය මම ළඟ තියෙනවා.

ප්‍ර: එහි පොලිස්පතිතුමා විසින් ඔබේ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය වෙත එම ලිපිය එවන බවට දක්වන යම් සටහනක් තිබෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි. එකේ යටම

ප්‍ර: එය තිබෙන්නේ ඒ ලිපියේ කොයි ස්ථානයේ ද?

පි: දකුණු පහළ කෙළවරේ.

ස්වාමීනි අවසර පතනවා. මෙම සාක්ෂිකරු සඳහන් කරනු ලබන පොලිස්පතිවරයා විසින් ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය වෙත යොමු කර ඇති එම ලිපිය C 768 ලෙසත් ඔවුන් වෙත යැවීම සඳහා පොලිස්පතිවරයා පිටසන් කොට ඇති ස්ථානය C– 768 (A) අක්ෂරයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

පි: එකේ ස්වාමීනි අර CTID කියන එක high light කරලා මට copyය එවලා තිබ්බේ. එසේම ඒ පොලිස්පතිවරයා එවපු ඒ ලියුමේ 4 දෙනෙකුට යොමු

FAIR COMMENT BY JEZEEM

කරලා තිබ්බා. මේ ලියුම කෙටියෙන් කිව්වොත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඉංග්‍රිසියෙන් තියෙන්නේ.

(ඉංග්‍රිසි භාෂාවෙන් ලිපිය කියවයි සාක්ෂිකරු)

පි: Senior DIG , Western Province.

ප්‍ර: ඒ කියන්නේ WP?

පි: WP

(ඉංග්‍රිසි භාෂාවෙන් ලිපිය කියවයි සාක්ෂිකරු)

No,that is for the senior DIG. Western Province. Then its commandant STF, then DIG SPR. That's special Protection Range. And Director / CTID . It's Director. Counter Terrorism and Investigation Division

ඒක තිබ්ලා FNA කියලා තිබ්බේ.

ප්‍ර: දැන් ජයසුන්දර මහත්මයා මේ ලිපියක FNA කියලා සඳහන් වුණාම ඔබට එයින් ඔබට හැඟෙන්නේ මොකක් ද? මොකක්ද එයින් ඔබට ලැබෙන උපදෙස?

පි: FNA කියන්නේ For Necessary Action කියලා. ඒකේ කියන්නේ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා කියලා.

ප්‍ර: එතකොට ඒ ගන්නට ඕනි ක්‍රියාමාර්ගය කියන එක තීරණය කරන්නේ ඒ ලිපිය ලැබෙන පුද්ගලයා විසින්ද?

පි: මේකේ දෙපැත්තකින්, දැන් මේ වගේ ලියුමක් ලැබුණාම මට පොලිස්පතිවරයාගෙන් කුමක් ද කළ යුත්තේ කියලා සඳහන් වුණේ නැති වුණත් දැන් මම තීරණය කරා. මම මොකක් ද මේ වගේ අතිරහස්‍ය ලියුමකට ගත යුතු පියවර කියලා. දැන් මේකේ ඇත්තටම පොලිස්පතිවරයාගෙන් directive නැහැ. මේ කියන බුද්ධි තොරතුර සම්බන්ධව මේ මේ දේවල් කරන්න කියලා.

ප්‍ර: දැන් මොහොතක් ඔබ ඔබේ පිළිතුරේ සඳහන් කරා . මෙහි සඳහන් බුද්ධි තොරතුර ගැන මොකක්ද කරන්නේ කියලා පොලිස්පතිවරයාගෙන් උපදෙසක් ලැබිලා නැහැ කියලා විශේෂයෙන්?

පි: ඔව් තියෙන්නේ For Necessary Action.

ප්‍ර: ඇයි ඔබ බුද්ධි තොරතුර කියන වචනය පාවිච්චි කළේ?

පි: It says ...

Q: You didn't use the word information you use the word intelligence. ඇයි ඒ?

R: To correct myself it says information and to correct myself but in the top it says top secret eyes only. සාමාන්‍යයෙන් බුද්ධි තොරතුරක් තමයි සාමාන්‍යයෙන් top secret එකක් වෙන්න. For your eyes only කියන්නේ. ඉතින් මේකේ මට තේරුණා මේක වැදගත් තොරතුරක් කියන

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

එක. මොකද විශේෂයෙන්ම මේකේ classification එකේ අපි කියනවා. Limited, Secret , ඊට පස්සේ top එකේ තියෙන්නේ top secret. එතකොට මේ document එකෙන් මට හැඟුනා මේකේ මට උපදෙස් නැති වුණත් මේක this is a very Important document කියන එක.

ප්‍ර: ඇයි ඔබට හිතුණේ මේ ලේඛනය ඒ කියන්නේ C 768 වශයෙන් දැන් ලකුණු කරලා ඉදිරිපත් කරපු ලේඛනය දැන් වැදගත් ලේඛනයක් කියලා?

පි: Because as an.. මම බුද්ධි අංශ නිලධාරියෙක් විදිහට අපි ලිපි ලේඛන වර්ගීකරණය කරද්දී ඉංග්‍රීසියෙන් Limited කියනවා. ඊට පස්සේ Secret කියනවා. ඊට පස්සේ top secret කියනවා. ඉතින් මේකේ intelligence කියලා තිබ්බේ නැතත් මේක ඇවිල්ලා තිබ්බේ වෙන පිටරට source එකකින්. එතකොට SIS එකට ලැබිච්චි ඒ තොරතුර

ප්‍ර: ඔබ කොහොමද දන්නේ ඒක පිටරටකින් ලැබුණා කියලා?

පි: මෙතන ඒක සඳහන් වුණේ නැහැ. හැබැයි මේක අපි පසු කාලීනව බලද්දී මේක ඉන්දියාවෙන්.

ප්‍ර: ඔබතුමා මේ ලිපිය ලද දිනයේ දී ඔබතුමාට ඇති වුණ හැඟීම අන්න ඒක තමයි දැන් මෙතන වැදගත් වෙන්නේ?

පි: නිවැරදි කරනවානම් මේක තොරතුරුක් විදිහට ඇවිල්ලා තිබ්බේ. ඒ කියන්නේ information එකක් විදිහට.

ප්‍ර: එතකොට මෙහෙම, මේක තොරතුරක් විදිහට ආවායි කියන්න ඔබ තීරණය කළේ හේතුව කියන්කෝ යම් වචනයක් ද මොකක්ද හරි සටහනක් ද ඇයි එහෙම කිව්වේ?

පි: ඒ කියන්නේ මේ document එක classify කරලා තියෙන විදිහට නම් ගොඩාක් වැදගත්කමක් වටිනාකමක් තියෙන විදිහට සඳහන් වුණා. ඒ වගේම එවලා තිබ්බේ මේ රටේ Chief of National Intelligence. ඒ කියන්නේ ජාතික බුද්ධි ප්‍රධානියා පොලිස්පතිවරයාට ලියනවා. top secret , eyes only classification එක යටතේ යම් තොරතුරක්.

ප්‍ර: එතකොට top secret කියලා ඔබ කියන්නේ ඉතාම ඉහළ grading එකේ ඉතාම ඉහල ශ්‍රේණියක තියෙන තොරතුරක් මේක. ඒ නිසා ඒ බව ඔබට අවබෝධ ලැබුණා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔබට එකේ මාතෘකාවේ තියෙන්නේ information නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒක නිසාද ඔබ කියන්නේ මේක තොරතුරක් කියලා?

පි: ඔව්. තොරතුරක් වුණාට මම බුද්ධි අංශ නිලධාරියෙක් විදිහට this is an Intelligence for me. මට

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි ඔබ කියන්නේ මේක බුද්ධි තොරතුරක් කියලා?

පි: කියන්නේ මොකද මේකේ මෙතන information කියලා දැම්මාට..

ප්‍ර: මාතෘකාව දැම්මාට?

පි: ඒ ලියුම ලියන කෙනා මේක classify කරනවා. for your eyes only කියලා. හරිනම් මේක මට විතරයි. ඊට පස්සේ මම මේක destroy කරලා දාන්න ඕනි.

ප්‍ර: එහෙමනම් මේකෙන් අදහස් කරන්නේ මේ ලිපිය ලියන ලද ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා විසින් පොලිස්පතිවරයා වූ පූජිත ජයසුන්දර මහතාගේ ඇස් දෙකට පමණයි නේද මේ ලිපිය එවලා තියෙන්නේ?

පි: එහෙම තමයි අදහස් වෙන්නේ.

ප්‍ර: එතකොට එතුමාට පුළුවන් ද පොලිස්පතිතුමාට පුළුවන් ද FNA කියලා සඳහන් කරලා මේ ලිපිය ඒ කියන්නේ 768 ලෙස ලකුණු කරලා ඉදිරිපත් කරපු මේ ලිපිය ඔය සඳහන් කරපු Western Province එකේ නිලධාරියාට, STF එකට එතකොට Special Protection Range කියන එකට ඔබට පිටපත් කරා, ඒකද ක්‍රමවේදය? ඒක ද නිවැරදි දේ?

පි: ඒක නිවැරදි ක්‍රමයක් ලෙස මගේ assessment එකෙන් පිළිගන්නේ නැහැ. හැබැයි උඩ top priority කියලා Secret කියලා seal එකක් දාලා තියෙනවා.

ප්‍ර: ඒ කවුද එහෙම දාලා තියෙන්නේ?

පි: පොලිස්පතිවරයාගේ office එකෙන් top priority secret. හැබැයි directive නැහැ. FNA කියලා තිබ්බේ.

ප්‍ර: එතකොට ඔබ කිව්වා නේද තව දුරටත් මේ ගරු කොමිෂන් සභාවට මෙහි අඩංගු තොරතුරු ඔබට බුද්ධි තොරතුරක් විදිහට වැටහුණා කියලා intelligence විදිහට?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්න හේතු කියන්නේ ඔබ මේ Top Secret කියන එක විතර ද?

පි: විතරක් වගේම මෙතන අපි assess කරනවා තොරතුරක් ආවාම. එතකොට අපි තීරණය කරනවා මේ තොරතුර බුද්ධි තොරතුරක් ද කියලා. එතකොට මට තොරතුරක් විදිහට ආවාට මම මේකේ යම්කිසි risk එකක් දැක්කා. ඒ කියන්නේ මේකේ සඳහන් වෙනවා key words ටිකක් මම කිව්වොත් එහෙම.

ප්‍ර: මොනවද ඒ ?

පි: දැන් මේක එන්නේ SIS එකට. ඒ කියන්නේ ලංකාවේ තියෙන Intelligence Agency in Sri Lanka . ඒ වගේම මොහොමඩ් සහරාන් කියන කෙනා ගැන කියනවා. එයා කොහොමත් අන්තවාදී අදහස් දරන පුද්ගලයෙක් කියන එක මම දන්නවා. ඒ වගේම It says planning to

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

carry out a suicide terrorist attack මොකද ඒ වෙද්දී ISIS සංවිධානයේ ක්‍රියාකරකම් ලංකාවේ නැතත් සිරියාවේ සහ ලිබියාවේ බලද්දී මේ momentum එක තිබ්බා. ඊට පස්සේ and it says an attack in Sri Lanka.

ප්‍ර: ඒ ප්‍රහාරය සිදු වෙන්නේ ලංකාවේ කියලා සඳහන් වෙනවා?

පි: සඳහන් වෙනවා ඔව්. ඒ වගේම it says important Churches ඒ කියන්නේ පල්ලි ආශ්‍රිතව සහ reconnaissance ඒ කියන්නේ ආවේක්ෂනයක් කරලා තියෙනවා තොරතුරු ලබා ගැනීමක් Indian High Commission in Sri Lanka. එතකොට target දීලා තියෙනවා. targets 2ක් specifically කියනවා Indian High Commission එක කියලා. හැබැයි general word එකක් දාලා තියෙනවා Churches කියලා. මොන Churches ද..

ප්‍ර: ඔය ආවේක්ශන කරලා තියෙන්නේ එතකොට කුමන ස්ථානයකට අදාළව ද කවුද ඒ ආවේක්ශන කරලා තියෙන්නේ?

පි: ඒකේ කියන්නේ. According to the information මේ ලැබිච්ච තොරතුර Indian High Commission in Sri Lanka is one of the targets among the planned attack and reconnaissance has already been conducted.එතකොට මේකේ කියන්නේ නැහැ මේ කොයි Church එකද කියලා. හැබැයි මේ කියන තොරතුර සම්බන්ධව මේගොල්ලෝ ඔත්තු බලලා rekey එකක් කරලා තියෙනවා කියලා සඳහන් වෙනවා.

ප්‍ර: ඒක තමයි මේ reconnaissance කියන වචනයේ තේරුම.

පි: තේරුම rekey එක කරලා තියෙනවා. එතකොට ඊළඟට කියනවා මේගොල්ලෝ පාවිච්චි කරන්න පුළුවන් ප්‍රහාරක මාධ්‍යන් suicide attack, weapon attack, knife attack , truck attack කියලා.

ප්‍ර: ඒ කියන්නේ බරපතල ආකාරයට හානිදායක වන විවිධ ක්‍රම ගැන සඳහන් වෙන්නේ?

පි: ඔව්. ඒ වගේම පුද්ගලයෝ 6 දෙනෙක් ගැනත් සඳහන් වුණා. ඒ කියන්නේ මේ ප්‍රහාරයට likely team members of the planned suicide terrorist attack කියලා තිබ්බා.

ප්‍ර: දැන් එහෙම කරුණු ඔබ උකහා ගත්තාම මේ ලේඛනය කියවලා. ඔබ කිව්වා මේක ටිකක් බරපතල බවට ඔබට වැටහුණා කියලා. Information කියන වචනය යොදලා තිබුණාට මාතෘකාවේ කියලා ?

පි: ඔව්

ප්‍ර: ඉතින් ඔබ මොකද කරේ?

පි: මම එන්න කිව්වා වහාම මගේ ASPයි , OIC, TID එකේ.

ප්‍ර: ඔවුන්ගේ නම් මොනවද ?

FAIR COMMENT BY JEZEEM

පි: කෙනෝ අපේ OIC. ස්ථානාධිපති ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය. ඒ වගේ මට මතක හැටියට ASP පෙරේරා. සහකාර පොලිස් අධිකාරිවරයාට මම එන්න කිව්වා office එකට. එන්න කියලා මම ලියුම පෙන්නුවා. පෙන්නලා කිව්වා මගේ වචනයෙන්ම මම කිව්වා. ලෙඩක් attack එකක් කරන්න යන්නේ කියලා පෙන්නලා ලියුම ඒ දෙන්නා කියෙව්වා. කියෙව්වාට පස්සේ මම ඒත් කිව්වා මේක Top secret eyes only. මේක out ward කරන්නවත් photo copy ගහන්නවත් යන්න එපා. මොකද මේක for your eyes only . ඒ කියන්නේ top secret document එකක් කියලා මම මේක මගේ අතින්ම මම මේක ලකුණු කරා මේකේ තිබ්බා තව සිංහලෙන් ගහපු attachment එකක්. එකේ තියෙනවා ....

ප්‍ර: ඒක තියෙනවද?

පි: එකේ තියෙනවා.

ප්‍ර: you have it there ?

පි: yes original එකේම මම මගේ අතින් පුද්ගලයෝ 4 ගැන සඳහන් වුණා.

ප්‍ර: ස්වාමීනි මේ අවස්ථාවේ දී සාක්ෂිකරුගේ අවධානයට C – 4 C ලේඛනය යොමු කොට සිටිනවා.

ප්‍ර: මා ඔබේ අවධානයට යොමු කරන ඔය C – 4 C ලේඛනය ඔබට ලැබුණු ලේඛනයක් ද?

පි: ඔව් ඒකම ලැබිලා තිබුණා අර Covering letter එකත් එක්ක ලැබුණා.

ප්‍ර: ඒ ඇරෙන්නට ඔබට වෙන ලේඛන ලැබුණද?

පි: තව ඉංග්‍රීසියෙන් ඇමුණුම (ආ) කියලා මේකකුත් තිබ්බා.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔය අපි මේ වන විට C – 4 C වශයෙන් ලකුණු කරලා තියෙන ලිපියත් ඔබට ලැබුණු ලිපියේ 768යේ තව කොටසක් කියලා නේද?

පි: ඔව් එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එතකොට ඔය ඔබ සඳහන් කරපු ඒ අපේ ලඟ දැනට තියෙන මේ ගරු කොමිෂන් සභාවේ තියෙන C – 4 C ලේඛනය හැරෙන්නට තව වෙන ලේඛන ඔබට ලැබුණද C- 768 සමඟ? That information. That's what we ask yes.

පි: ඔව් ඒ ටික තමයි උතුමාණෙනි ලැබුණේ. මුලින්ම Covering latter ආවා. ඊට පස්සේ සිංහලෙන් පිටු 2ක් සඳහන් වෙන ලියුමක් තියෙනවා.

ප්‍ර: ඔබට ආවරණ ලිපිය ලැබුණා කියලා කියනවා?

පි: ඔව්.

ප්‍ර: ඒක ඔබ දැන් C – 768 කියලා ලකුණු කරලා ඉදිරිපත් කෙරුවා?

පි: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ලිපිය සමඟ ඔබ කියනවා තවත් ලිපියක් ලැබුණාය කියලා. ඇමුණුමක් ලැබුණාය කියලා?

පි: ඇමුණුම් 2ක් තියෙනවා.

ප්‍ර: එයින් එකක් ඔබ දැනට හඳුනා ගත්තා. දැනට ගරු කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන C – 4 C කියන ලේඛනය කියලා?

පි: ඔව්.

ප්‍ර: ඊළඟට ඔබ කිව්වා තව ලේඛනයක් ඔබට ලැබුණා කියලා ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒ ලේඛනය මා ඔබේ අවධානයට යොමු කරන C – 4 B ලේඛනය සමඟ සැසඳෙනවද?

පි: ඔව්.

ප්‍ර: එහෙමනම් මම නැවත් ඔබේ අවධානයට යොමු කරනවා. දැන් ඔය C – 768 කියලා අපි ලකුණු කරානේ ලේඛනයක්?

පි: ඔව්.

ප්‍ර: ඒකට දැන් ඔබේ අවධානය මා යොමු කරන්නේ C – 4 A වශයෙන් ලකුණු කරලා ගරු කොමිෂන් සභාව ඉදිරියේ තියෙන ලේඛනයට?

පි: ඔව්.

ප්‍ර: ඒ ලේඛනයයි, ඔබ ළඟ තියෙන C – 768 මුල්පිටපත ඔබට ලැබුණු පොලිස්පතිතුමාගෙන් ඒ දෙක සැසඳෙනවද? Is it identical?

පි: Yes its identical but there are different notes in there but it's content it's the same.

ප්‍ර: Yes. ඒ දෙකේ අන්තර්ගතය නමුත් සමානයි නේද?

පි: සමානයි.

ප්‍ර: එහෙමනම් මා නැවතත් පැහැදිලි කර ගැනීමට ඔබෙන් අහන්නේ each of the documents please show him so that he will compare. ඔබ ළඟ තිබිලා අද ලකුණු කරපු C – 768 සමඟ කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරලා තියෙන C – 4 A ලේඛනය ගැළපෙනවානේ?

පි: එහෙමයි.

ප්‍ර: ඔබ ළඟ තිබෙන C – 768ට තියෙන ඇමුණුමක් මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ C – 4 B වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් වෙලා තියෙනවානේ? The Intelligence

පි: ඔව් C -4 (C) .

ප්‍ර: එතකොට ඔබ ළඟ තිබෙන C – 768 සමඟ තියෙන අනිත් ඇමුණුම C – 4 C සමඟ ගැළපෙනවානේ?

පි: ඔව් ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී දැනටමත් මෙම සාක්ෂිකරු භාරයේ තිබී කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරන ලද C – 766, C – 767 සහ C – 768 දරන ලේඛන වල ඡායා පිටපත් ලබාගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර C – 766 සිට C – 767 , C – 768 දක්වා ලකුණු කරන ලද ලේඛන වල මුල් පිටපත් නැවත අධිකරණයකින් දැන්වීමක් ලැබෙන තුරු සුරක්ෂිතව තබා ගන්නා ලෙසට සාක්ෂිකරුට නියෝග කරමි.

මේ අවස්ථාවේ දී කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 2 වෙනතෙක් කල් තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ
ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.02 වේලාව :- පෙ.ව. 2.15
සටහන් කළේ :- කේ.එම්.වන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතීඥ හරීන් සද්ධාසේන මහතා සමඟ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටී.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

මේ අවස්ථාවේදී දිවා ආහාරයට ප්‍රථම මෙහෙය වමින් සිටි වරුණ සංජීව ජයසුන්දර මහතාගේ ඉතුරු සාක්ෂිය වෙනත් දිනයක ලබා ගන්නා බව කොමිෂන් සභාව තීරණය කර ඇත.

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ගෞරවයෙන් ඉල්ලීමක් කරනු ලබනවා ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවේ සාක්ෂි ලබා දෙන ලද කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක අලවි විසින් සාක්ෂි ලබා දෙමින් ඔහුට එවකට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කරන ලද මහින්ද ජිනසේන මහතා විසින් ඔහුගේ සේවය අගය කරමින් ලිපියක් ලබා දී ඇති බවට සාක්ෂි ලබා දුන්නා ඒ අනුව එම සාක්ෂි කරු අද දින නැවත කැඳවා එම සාක්ෂිකරුගෙන් එකී ලිපිය ගරු කොමිෂන් සභාව වෙත ලකුණු කර ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තුවෙනවා. එසේම මෙම සාක්ෂිකරුගේ පත්වීමේ ලිපියද මෙම සාක්ෂිකරු භාරයේ මේ අවස්ථාවේ ඇති බවට වාර්තා වෙනවා. ඒ අනුව අදාල ලේඛන ලකුණු කිරීමේ කාර්ය සඳහා පමණක් මෙම සාක්ෂිකරු අද දින නැවත කැඳවීමට අවසර ලබා දෙන ලෙසට අයැද සිටිනවා.

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

අවසර ලබා දෙනවා.

****

සාක්ෂිකරු:
සම්පූර්ණ නම පන්නල ලේකමලාගේ සරත් උදයසිරි
ප්‍රතිඥා පිට

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි මෙහෙය වන අවස්ථාවේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා ද සමඟ නීතීඥ සද්ධාසේන මහතා සමඟ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටින බව සටහන් කර තබමි. ඊට අමතරව කාර්මික නීතිඥ නෙරංජන් ඊරිය ගොල්ල මහතා සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය අලෙවි අධ්‍යක්ෂක වන ඩී.පී.පී ශාන්ත මහතා වෙනුවෙන් නීතිඥ නෙරංජන් ඊරියගොල්ල මහතා සමඟ නීතීඥ චලක විදානගේ මහතා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙනී සිටින බව දන්වා සිටින අතර ඒ සඳහා අපට අවසර ලබා දුන් ලිපිය ලබා දීමට අවසර පතනවා.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

එකී ලිපිය කොමිෂන් සභාවේ ලේඛනයක් ලෙස වාර්තාගත කොට තබාගන්නා ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි. සාක්ෂිකරුගෙන් සාක්ෂි මෙහෙවීමට අවස්ථාව ලබා දෙමි

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: මහත්මයා ඔබ ඊයේ දින මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේදී සාක්ෂි ලබා දෙනු ලැබුවා?

පි: එහෙමයි.

ප්‍ර: ඔබ ඊට පෙර දිනත් සාක්ෂි ලබා දෙන අවස්ථාවේදි ඔබ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක වශයෙන් 2015 වර්ෂයේ ජූලි මස 10 වන දින වැඩ භාර ගත්තා බවට ප්‍රකාශ කරා?

පි: එහෙමයි නිවැරදියි.

ප්‍ර: ඔබ රාජකාරි භාර ගන්නා අවස්ථාවේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් කවුද කටයුතු කලේ?

පි: සභාපති වශයෙන් කටයුතු කලේ මහින්ද ජිනසේන මහත්මයා.

ප්‍ර: ඔබට එකී පත්වීම භාර ගන්න අවස්ථාවේදී පත්වීමේ ලිපියක් මාවෙත භාර දුන්නාද?

පි: පත් වීමේ ලිපියක් භාර දුන්නා.

ප්‍ර: කවුරුන් විසින්ද එකී ලිපිය කවුරුන් අත්සන් කරලාද ඔබට භාර දුන්නේ?

පි: ඒකී ලිපිය මා වෙත ලබා දුන්නේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහත්මයා විසින්.

ප්‍ර: මේ අවස්ථාවේදී එකී ලිපියේ පිටපතක් ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: එකී ලිපිය දිනය කවදද එකී ලිපියේ?

පි: දිනය 2015.06.26 දිනැති ලිපියකින් තමයි මා වෙත දැනුම් දුන්නේ.

ප්‍ර: ඔබ කුමන තනතුර සඳහා පත් කර ඇති බවට එකී ලිපියේ සඳහන් වෙන්නේ?

පි: එකී ලිපියේ සඳහන් වෙනවා මා අධ්‍යක්ෂක අලෙවි තනතුරේ පිහිටවා ඇති බව.

ප්‍ර: එකී ලිපියේ ඔබ අධ්‍යක්ෂක අලවි රාජකාරි භාර ගත්ත බවට දැනුම් දීමක් ඔබ විසින් අත්සන් කරලා ලිඛිතව භාරව දීලා තියෙනවාද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමිනි. 2015.07.10 වෙනි දින රාජකාරි මා භාර ගත් බවට මගේ අත්සන යොදා මම සහතික කර අදාල පත්වීම් ලිපිය නැවත කාර්මික සංවර්ධන මණ්ඩලයට භාර දී තිබෙනවා.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුව අධ්‍යක්ෂක අලෙවි කාර්මික සංවර්ධන මණ්ඩලයේ පත්වීමේ ලිපිය සහ ඔහු රාජකාරි භාරගත් බවට එකී ලිපියේ සටහන තිබෙනවා එම ලිපිය C 769 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා

ප්‍ර: සාක්ෂිකරු එසේම ඔබ ඊයේ දින සාක්ෂි ලබා දෙමින් සටහන් කරනු ලැබුවා ඔබව එවකට සිටි ඔබේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති ඔබේ සේවයේ අගය කරමින් ඔබ වෙත ලිපියක් නිකුත් කර තිබූ බවට ?

පි; එහෙමයි එය නිවැරදියි.

ප්‍ර: ඔබට එකී ලිපියේ මුල් පිටපත සහ එහි පිටපතක් මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවාද?

පි: හැකියාවක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කවදද? එකී ලිපිය නිකුත් කර තිබෙන්නේ?

පි: එය 2018 වසරේ 02 වෙනි මස 26 වෙනි දින සේවය අගය කිරීම නමින් ලිපියක් මා වෙත ඉදිරිපත් කර තිබෙනවා.

ප්‍ර: එය කවුරුන් විසින් ද නිකුත් කර තිබෙන්නේ ?

පි: එය නිකුත් කර තිබෙන්නේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහත්මයා විසින්.

ප්‍ර: එතුමා එහි අත්සන් කරලා තිබෙනවාද?

පි: එහි අත්සන් කර තිබෙනවා.

ප්‍ර: ඔබට ඒ අත්සන හඳුන ගන්න හැකියාවක් තිබෙනවද?

පි: මට අත්සන හඳුන ගන්න හැකියාක් තිබෙනවා.

ප්‍ර: රාජකාරි පරාශය තුල දී එතුමාගේ අත්සන ඔබ මීට පෙර ඔබ දැකලා හුරුපුරුදුයිද?

පි: එහෙමයි

මේ අවස්ථාවේදී 2018.02.26 දින දරණ සරත් උදයසිරි අධ්‍යක්ෂක අලවි ලංකා කාර්මික සංවර්ධන මණ්ලය යන නිලධාරියා වෙත සභාපති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වශයෙන් සටහන් කර අත්සනක් යොදා සේවය අගය කිරිමක් වශයෙන් ඇති ලිපිය C 770 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා. මේ අවස්ථාවේදී ගෞරවයෙන් සැල කර සිටින්නේ මෙම සාක්ෂිකරු භාරයේ අදාල ලිපියේ මුල් පිටපත ඇති බවත් ඔහු මේ අවස්තාවේ ගරු කොමිෂන් සභාවේ පරික්ෂාවට ඉදිරිපත් කිරීමට ඉදිරිපත් කරනු ලබන බව.

ප්‍ර: මේ සේවය අගය කරලා තියෙන්නේ ?

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී C770 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ මුල් පිටපත සාක්ෂිකරු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. C770 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය මෙම මුල් පිටපත හා සැසඳීමෙන් පසුව එය මුල් පිටපතේ පිටපතක් බව සැහීමට පත්වන බව සටහන් කර තබමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් මහත්මයා මේ සේවය අගය කිරීම ඒ ලිපියේ මොනවද අඩංගු වන කරුණු?

පි ස්වාමිනි මේ ලිපිය මා වෙත ඉදිරිපත් කරන ලද්දේ 2018 වසරේ අපි කාර්මික සංවර්ධන මණ්ඩලය බණ්ඩාර නායක සම්මන්ත්‍රණ ශාලාවේ දැවැන්ත ප්‍රදර්ශනයක් පැවැත්වුවා ඒ සම්බන්ධ පාවහන් ප්‍රදර්ශනයයි මේ ප්‍රදර්ශනයේ සියලුම මෙහෙයුම් කටයුතු සහ අදාල දින ගණනාව තුල අදාල මෙහෙයුම්වල ප්‍රගතිය සහ කිසිම ගැටලුවක් ඇති නොවෙන්න ආරක්ෂාව විශේෂයෙන් ජනාධිපතිතුමා පැමිණියා. ආරක්ෂාව මේ සියලුම දෙවල්වල සම්පූර්ණ වගකීම මා වෙත පැවරුවා ඒ වගකීම අනුව මම වැඩකටයුතු කලා. සාර්ථකව අපි අවසන් කලා.ඒ ප්‍රදර්ශනය මේ වන විට මේ මෙවැනි කාර්යක් මා වෙත භාර දුන්නේ දැඩි විශ්වාසයකින් නිසා ඒ වෙනකොට පැවති දැඩි විශ්වාසයක් තිබුණා මාත් එක්ක ඒ නිසා විශ්වාසය තුල මා එය සාර්තකව නිම කළා. ඒ වෙනුවෙන් මා වෙත මේ අගය කිරීම ලබා දී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් මහත්මයා ප්‍රවර්ධන දැන් ඔබ ඔබේ පත්වීම අද දින ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු පත්වීමේ ලිපිය අනුව ඔබට තනතුර ලබා දීලා තිබෙන්නේ අධ්‍යක්ෂක අලෙවි කියලා?

පි: එහෙමයි එය නිවැරදියි.

ප්‍ර: ඔබට ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද ප්‍රවර්ධන අධ්‍යක්ෂක කියලා තනතුරක් කාර්මික සංවර්ධන මණ්ඩලයේ තියෙනවද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: ප්‍රවර්ධන කටයුතු සිදුකරනු ලබන්නේ කවර නිලධාරියෙක් විසින්ද?

පි: ප්‍රවර්ධන කටයුතු භාර මගේ භාරයේ පවතිනවා එක ක්‍රියාකාරකමක් පමණයි ප්‍රවර්ධන වශයෙන් මූලිකවම කාර්මික සංවර්ධන මණ්ඩලයේ තොරතුරු ඒ සේවාවන් අදාල වැඩකටයුතු අපි මහජනයාට කර්මාන්තකරුවන් වෙතට රැගෙන යාමේ යම් කිසි

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

අපි යාන්ත්‍රණයක් භාවිතා කරනවා ඒ සඳහා අපි ක්‍රම ශිල්ප භාවිතා කරනවා. මෙන්න මේ ක්‍රම ශිල්ප හරහා මහජනයාට අපගේ තියෙන සේවාවන් ලබා දීම තමයි මෙහිදි ප්‍රවර්ධනය අපි යන්නෙන් වැඩකටයුතු කරන්නේ මගේ අංශය තුල ඒක මගේ එක කාර්යක් පමණයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් හිටපු සභාපති මහින්ද ජීනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි අවසර ලබා දෙයි

****

මහින්ද ජීනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින නීති ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා

ප්‍ර: ස්තූතියි උතුමාණෙනි උදයසිරි මහත්මයා?

පි; එහෙමයි.

ප්‍ර: ඔබතුමා අද ඉදිරිපත් කෙරුවා මහින්ද ජීනසේන හිටපු සභාපතිවරයා විසින් තමන්ට නිකුත් කරපු එක්තරා ලිපියක් C 770 කියලා සලකුණු කරන ලද

පි: එහෙමයි.

ප්‍ර: ඒ ලිපිය නිකුත් කරන්නට යෙදුනේ බණ්ඩාරනායක ජාත්‍යයන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවතිච්ච යම් කිසි වෙළඳ ප්‍රවර්ධනයක්?

පි: එහෙමයි.

ප්‍ර: සාර්තකව නිම කිරීම සම්බන්ධවයි?

පි: එහෙමයි.

ප්‍ර: ඒ 2018 අවුරුද්දේ?

පි: එහෙමයි.

ප්‍ර: තමන්ගේ විෂය පථයන් මාරු කිරීම සිදුවුනේ 2017 අවුරුද්දේ?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඒ ලිපියෙන් යම් කිසි එක්තරා සීමිත event එකක් එහෙම නැත්නම් එක event එක සිද්ධියකට එක වැඩසටහනක් සම්බන්ධයෙන් තමයි ඔය ලිපිය නිකුත් කරලා තියෙන්නේ?

පි: එහෙමයි.

ප්‍ර: අබලි ද්‍රව්‍යවලට අදාලව ප්‍රසන්සා කිරීමක් ඔය ලිපියෙන් නිරික්ෂණය කරලා නැහැනේ?

පි: මේ ලිපියෙන් සදහන් කරලා නැහැ.

ප්‍ර: ස්තූතියි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: සවාමිනි මට පුංචි අවස්ථාවක් දෙන්න පුළුවන්ද.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: මේ අවස්ථාවේදී ඩි.පි.පි.ශාන්ත නියෝජ්‍ය අධ්‍යක්ෂක ලංකා කාර්මික සංවර්ධ මණ්ඩලය එහෙම නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඩි.පි.පි.පි. ශාන්ත නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටිනව උගත් නීතිඥ චලක විතානගේ මෙම සාක්ෂිකරුගෙන ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය ද යන්න විමසයි?

පි: අවශ්‍ය නැති බව ප්‍රකාශ කර සිටිනවා ගරු ස්වාමිනි.

ප්‍ර: ස්තීතියිඔබට යමක් ප්‍රකාශ කරන්න තියෙනවද?

පි: එහෙමයි ස්වාමිනි. මට ලබා දීලා තියෙන සේවා අගය කිරීමේ සහතිකය ස්වාමිනි එක් ඉසව්වක් පමණක් බව මෙහි සඳහන් වෙනවා. ඒ මේ ඉසව්ව කළමණාකරනය කිරීම සහිත සම්පූර්ණ මෙහෙයුම් කටයුතු භාර දීම සඳහා එතුමා තුල මා කෙරෙහි විශ්වාසයක් සහ මේ වැඩේ කරන්න පුළුවන් කියන හැකියාව තිබෙන බව එතුමා දන්න නිසා තමයි මෙවැනි වැඩසටහනත් මා වෙත භාර දීලා තිබුණේ මෙතනදී මා විශ්වාස කරනවා මගෙ අක්‍රිය සම්පූර්ණ කාර්ය භාර්ය ස්වාමිනි ගැන පැහැදීමක් තිබුණ නිසා තමයි මෙවැනි කාර්ය භාර්යක් මා වෙත පවරන්නට ඇත්තේ කියා. එපමණයි ස්වාමිනි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ස්තූතියි . සාක්ෂිකරු මුදා හරිනවා.

දැන්වේලාව: ප.ව. 2.35

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ
ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.02 වේලාව :- ප.ව. 2.35

සටහන් කළේ :- කේ.එම්.වන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

- ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

- ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අඟරදගුරු අතිදතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

- කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතීඥ හරීන් සද්ධාසේන මහතා සමඟ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටී.

- සාක්ෂිකරු වෙනුවෙන් නීතීඥ චලක විදානගේ මහතා පෙනී සිටී.

සම්පූර්ණ නම	: දික්වැල්ල පටබැදිගේ පාලිත පුෂ්ප ශාන්ත.
වයස	: අවුරුදු 55
ජාතිය	: සිංහල
ආගම	: බෞද්ධ
රැකියාව	: නියෝජ්‍ය අධ්‍යක්ෂ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ප්‍රතිඥා පිට,

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: මහත්මයා ඔබ දැනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්තව සේවය කරනු ලබනවා?

පි: ඔව්

ප්‍ර: කුමන තනතුරේද?

පි: නියෝජ්‍ය අධක්ෂකවරයෙක්

ප්‍ර: ඔබ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මුලින්ම සේවයට අනුයුක්තව වුනේ කවදද?

පි: 1994. 03 වෙනි මස 01 වෙනිදා.

ප්‍ර: ඒ කවර තනතුරකටද?

පි: කර්මාන්ත ව්‍යාජ්ත නිලධාරීන්.

ප්‍ර: ඉන් පස්සේ ඔබට අද සේවය කරන තනතුර දක්වා උසස් වීම් ලැබුණාද?

පි: උසස් වීම් ලැබුණා.

ප්‍ර: ඒ කවර උසස් වීම්ද? මොන දිනවලදී කියලා කෙටියෙන් පැහැදිලි කරන්න?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අපේ කර්මාන්ත ව්‍යාප්තියේ නිලධාරීන් කියලා නම වෙනස් වුනා ව්‍යාපාර ප්‍රවර්ධන කළමනා කරු විදියට ඒක මට දිනය මතක නැහැ.

ප්‍ර: වර්ෂය සඳහන් කරන්න පුළුවන්ද?

පි: මං හිත්නේ 2002,2003 වගේ ඊට පස්සේ මට සහකාර අධ්‍යක්ෂක තනතුර ලැබුණා 2008 නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලැබුණා 2014 එදා ඉදලා නියෝජ්‍ය අධ්‍යක්ෂක විදියට කටයුතු කරනවා.

ප්‍ර: නියෝජ්‍ය අධ්‍යක්ෂක ඔබ නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් යම් කිසි අංශයකට අනුයුක්තවද සේවය කරන්නේ?

පි: දැන් සේවය කරන්නේ ක්‍රම සම්පාදන අංශයේ නියෝජ්‍ය අධයක්ෂක විදියට.

ප්‍ර: ඒ කොයි කාලේ ඉඳන්ද ඔය ක්‍රම සම්පාදන අංශයට අනුයුක්තව ඔබ සේවය කරන්නේ ඔබ?

පි: මම ක්‍රම සම්පාදන අංශයට ආවේ 2019 මැයි .

ප්‍ර: ඔබ යම් කාල වකවානුවකදී නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි අංශයට අනුයුත්කව සේවය කලාද?

පි: ඔව් ඒ කොයි කාලවකවානුවේද අලෙවි අංශය?

පි: අලෙවි අංශයට අනුයුක්ත වුනේ 2014 දී .

ප්‍ර: 2014 ඉදලා 2019 වර්ෂය දක්වා කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔව් එක හරි.

ප්‍ර: 2019 වර්ෂයේ මොන මාසය වෙනකම්ද?

පි: ජූනි මාසය වෙනකම්.

ප්‍ර: දැන් ඔබ නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් නම් සේවය කරන්නේ 2014 සිට 2019 කාල වකවානුව වෙනතුරු අධ්‍යක්ෂක අලෙවි විදියට කවුද කටයුතු කලේ?

පි: 2014 වසරේ අලෙවි හිටියේ නන්දනී පෙරේරා මහත්මිය.

ප්‍ර: 2015 ජූලි මාසේ 10 වෙනිදා ඉදලා ?

පි: සරත් උදයසිරි.

ප්‍ර: සරත් උදයසිරි කියලා මහත්මයෙක් අධ්‍යක්ෂක අලෙවි විදියට රාජකාරි භාර ගත්තද?

පි: ඔව්.

ප්‍ර: දැන් එතකොට ඔබේ ප්‍රධානියා වශයෙන් මේ අලෙවි අංශයේ ඔබ නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි නම් අධ්‍යක්ෂක අලෙවි විදියට ඔබේ ආසන්නතම ප්‍රධානියා වශයෙන් කටයුතු කලේ සරත් උදයසිරි මහත්තයා කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වශයෙන් කටයුතු කරන කොට මොනවද ඔබට පැවරිලා තිබ්බේ රාජකාරි?

පි: මට ප්‍රධාන වශයෙන් අතුරු කොන්ත්‍රාත් ඒකකයේ තමයි මුලින්ම මං වැඩ කෙරුවේ.

ප්‍ර: පැහැදිලි කරන්න මොකක්ද මේ අතුරු කොන්ත්‍රාත් ඒකකය කියන්න කියලා?

පි: අතුරු කොන්ත්‍රාත් ඒකකය කියන්නේ අපේ අලෙවි අංශයේ ඒ 1983 විතර ඉදලා පවත්වගෙන යන ඒකකයක් ඒ ඒකකයෙන් කරන්නේ රජයේ ආයතනවලට අවශ්‍යවෙන ද්‍රව්‍ය ඒ කියන්නේ ලී බඩු ඒ වගේ දේවල් අපි ටෙන්ඩර් කරලා අරගෙන අපේ Register වෙලා ඉන්න කර්මාන්තකරුවන් ලවා ඒවා නිෂ්පාදනය කරලා සැපයීම කිරීම .

ප්‍ර: දැන් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ එක් ප්‍රධානතම කාර්යභාර්යක් තමයි අබලි ලෝහ කළමණාකරන ඒකකය කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවාද?

පි: ප්‍රධානම කර්තව්‍ය නෙමේ .

ප්‍ර: ප්‍රධානම ඒකකයක් ?

පි: ඔව් ප්‍රධාන ඒකකයක් ඊට කාර්මික සංවර්ධන මණ්ලයේ අලෙවි අංශයේ ඊට එහා ගියපු මේවා එකක් තියෙනවා ඒකට අනුයුක්ත කරපු එකක් තමයි 2005 ඉදලා .

ප්‍ර: දැන් යම් අවස්ථාවකදී අබලි ද්‍රව්‍ය කළමණාකරන ඒකකය භාර කටයුතු කරන්න කියලා මහත්මයාට යම් කිසි උපදෙසක් ලැබුණාද?

පි: මට ලිපියකින් ලැබුණා දැනුම් දීමක් .

ප්‍ර: කවුද ඒ දැනුම් දීම කලේ?

පි: ඒ වෙන කොට හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන මහතා.

ප්‍ර: ඔබට ලිපියකින් තමයි මේ රාජකාරි ආවරණය කරන්න කියලා දැනුම දීම සිදුකලේ?

පි: ඔව්

ප්‍ර: ඒ ලිපියේ පිටපතක් තියෙනවද මේ අවස්ථාවේදී?

පි: තියෙනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ මෙම ජනාධිපති කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට විමර්ශන ඒකකයට ඔබේ කටඋත්තරය ලබා දෙන අවස්ථාවේ දී මේ ලිපිය ලබා දුන්නද?

පි: මට මතකයක් නැහැ මං දුන්නා වගේ කියලා මතකයක්.

ප්‍ර: කොස්වත්තත් ඔබට මේ අවස්ථාවේ දී අදාල ලිපිය ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: ඒ ලිපිය ඔබට 2017.05 වෙනි මාසේ 17 වෙනිදා ලබා දුන්න ලිපියක් කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔව්.

ප්‍ර: ඒ ලිපිය තිබෙන්නේ ඔබට යම් කිසි රාජකාරියක් ආවරණය කිරීම සම්බන්ධයෙන් වාර්තා වෙන ලිපියක් ?

පි: ඔව්.

ප්‍ර: ඒ ලිපිය ඔබට ලබා දීලා තියෙන්නේ කවුද?

පි: මහින්ද ජිනසේන හිටපු සභාපතිතුමා.

ප්‍ර: එතුමාගේ අත්සන ඔබට රාජකාරි පරාශය තුල දැකලා පුරුදුද?

පි: පුරුදුයි.

ප්‍ර: අදුන ගන්න ඔබට හැකියාවක් තිබෙනවද?

පි: ඔව්.

මෙම අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලබන රාජකාරි වෙනස් කිරීම සම්බන්ධයෙන් එවකට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති මහින්ද ජිනසේන මහතා විසින් අත්සන් කරනු ලැබ අතැයි කියන මෙම ලිපිය DPP 01 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර දැන් මේ ලිපිටයේ මොනවද සටහන් වෙන්නේ? මොනවද ඔබට අවරනය කරන්න කියලා භාරදීලා තියෙන රාජකාරි?

පි: පළවෙනි එක Identify and provide subcontracting facilities and to industrialists අනිත් එක් Distribution

ප්‍ර: ඔබ සිංහලෙන් ඒක පැහැදිලි කරන්න පුළුවන්ද?

පි: අතුරු කොන්ත්‍රාත් ඒකකයේ වර්ධනය කිරීම, අතුරු කොන්ත්‍රාත් ඒකකයේ කොන්ත්‍රාත් ලබා දීම සහ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ බෙදාහැරීම් කටයුතු.

ප්‍ර: ඒ කියන්නේ අබලි ලෝහ ද්‍රව්‍ය කළමනාකරන ඒකකයේ සම්පූර්ණ රාජකාරි මහත්මයාට භාර දීලා තියෙනවා?

පි: භාර දීලා තියෙනවා.

ප්‍ර: රාජකාරි භාර ගන්න කියලා ඔය ලිපියෙන් දැනුම් දීලා තියෙනවා?

පි: දැනුම් දීලා තියෙනවා

ප්‍ර: දැන් ඔබ ඒ අනුව රාජකාරි භාර ගත්තාද?

පි: රාජකාරි භාර ගත්තා.

ප්‍ර: එවකට කවුද ඒ ඒකකය භාරව ඒ රාජකාරි කරමින් හිටියේ?

පි: එවකට අධ්‍යක්ෂ අලෙවි, සරත් උදයසිරි මහතා.

Proofread Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඔබට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ?

පි: ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්.

ප්‍ර: දැන් ඔබට ඔය රාජකාරි භාර ගන්න කියලා එවකට සභාපති මහින්ද ජිනසේන මහත්මයා දැනුම් දුන්නාම ඔබ ඇයි මට මේක භාර දෙන්නේ කියලා ඔබ විමසලා හිටියාද හොයලා බැලුවාද?

පි: වාචිකව මං ගිහිල්ලා ඇහුවා මම විමසා හිටියා ඒ වෙලාවේ සභාපතිතුමා කිව්වේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ වැඩකටයුතු ගොඩාක් තියෙනවා duties ගොඩාක් තියෙනවා ඒකෙන් ඒ නිසා දැන් මේ අබලි අංශයත් මේ අංශයත් දැන් ඔක්කෝම කරන කොට වැඩ කෙරෙන්නේ නැහැ සරත් උදයසිරි මහත්මයාට ඒක කරගන්න අමාරුයි ඒ නිසා මට මේක භාරගන්න කියලා මං ඇහුවා ඇයි මට භාර දෙන්නේ කියලා අධ්‍යක්ෂකවරයෙක් ඉදිද්දි එතුමා උත්තර දුන්නේ ඒ විදියට.

ප්‍ර දැන් ඔබ දන්නවද අබලි ලෝහ කළමණාකරනය සම්බන්ධයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකල යුතු ආකාරය සම්බන්ධයෙන් 2013 වර්ෂයේ නොවැම්බර් මාසයේ මාර්ගෝපදේශන සංග්‍රහයක් හදුන්වලා දීලා තිබෙනවා කියලා?

පි: ඔව් දන්නවා.

ප්‍ර: දැන් ඒ වගේම ඒ අනුව ඔබට දැනීමක් තිබෙනවද අබලි ලෝහ කළමණාකරන ඒකකයේ අබලි ලෝහ මිලදී ගැනිම විකිණිම ආදිය සිදු කල යුතු වන්නේ නිත්‍යානුකූලව එකී මාර්ගෝපදේශන සංග්‍රහයට අනුකූලවයි කියලා?

පි: ඒ ගැන යම් සෑහෙන දැනුමක් තියෙනවා.

ප්‍ර: දැනීමක් තිබිය යුතුයිනේ මහත්මයා ඒ සම්බන්ධයෙන් රාජකාරි කරනේන්?

පි: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: අහපු ප්‍රශ්නයට උත්තරය හම්බුන් නැහැ ඔබ දන්නවද ඒ අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම් සහ විකිණිම ඒ මාර්ගෝපදේශන මාලාවට අනුව සිදු කල යුතු බව ?

පි: ඔව් එහෙම දැනීමක් තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඒ 2013 වර්ෂයේ මාර්ගෝපදේශන මාලාව ඔබ හොදින් පරිහරනය කරලා ඇති?

President's Commission
FAIR COMMENT
BY JEZEEM

පි: මට ලැබුණු කාලයේ ඊට පසුව මම දිගටම මේක පරිහරණ කලා.

ප්‍ර: ඔබ කොපමණ කාලයක් ඔය අබලි ලෝහ කළමණාකරන එකකයේ රාජකාරි කරාද?

පි: භාරව කටයුතු කරාද?අවුරුදු දෙකක් පමණ.

ප්‍ර: දැනටමත් C754 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටියි දැන් ඔබ මේ පෙන්වන ලේඛනය හදුන ගන්නවද 2013 වර්ෂයේ මාර්ගෝපදේශන ආයතන සංග්‍රහය වශයෙන්?

පි: ඔව් මම හදුන ගන්නවා.

ප්‍ර: එම ලේඛනයේ දැනටමත් C 754 A වශයෙන් ලකුණු කර ඇති කොටසක් සාක්ෂිකරුට පෙන්වා සිටියි. දැන් සාක්ෂිකරු බලන්න මෙම මාර්ගෝපදේශන සංග්‍රහයේ පිටු අංක 04 හි කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ කළමණාකරන ඒකකය සම්බන්ධයෙන් තමයි සටහන් වෙලා තිබෙන්නේ ?

පි: ඔව්

ප්‍ර : පිළිගන්නනවාද?

පි: පිළිගන්නවා.

ප්‍ර: එහි දැනටමත් C 754 A කියලා ලකුණු කරලා තියෙනවා කොටසක් පෙනෙනවද?

පි: ඔව් පෙනෙනවා මට.

ප්‍ර: එහි මොකක්ද සටහන් වෙලා තිබෙන්නේ ?

පි: අබලි ලෝහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ අබලි ලෝහ කළමණාකරන ඒකකය මගින් සිදු කල යුතු අතර එහි වගකිවයුතු ප්‍රධාන නිලධාරියා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක වේ.

ප්‍ර: දැන් ඒ අනුව මහත්මයා ඒ ප්‍රතිපාදන අනුව කලමණාකරණ එකකයේ වගකිව යුතු නිලධාරියා වන්නේ අලෙවි අධ්‍යක්ෂක කියලායි එහි සටහන් වෙලා තිබෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් එතකොට මහත්මයා ඒ කාලයේ කටයුතු කලේ අලෙවි අධ්‍යක්ෂක වශයෙන් නෙමේ?

පි: අලෙවි අධ්‍යක්ෂක විසින් නෙමේ.

ප්‍ර: අලෙවි අධ්‍යක්ෂක කියලා තනතුරක් තිබුණා ඒ තනතුරේ තව නිලධාරියෙක් රාජකාරි කටයුතු කරා?

පි; ඔව්.

ප්‍ර: දැන් එතකොට ඔබ මේ සම්බන්ධයෙන් ඔබට නෛතිකව මේ රාජකාරි කරන්න හැකියාවක් තිබෙනවද කියලා හොයලා බැලුවද මේ සම්බන්ධයෙන් සභාපතිතුමාට දැනුම්දීමක් කරාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙම දැනුම්දීමක් කරලා නැහැ මං ඒ වෙන කොට ඔය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා තිබුන් නැහැ දැනුම් දීමක් කරලා තිබුන් නැහැ. සභාපතිතුමාට.

ප්‍ර: දැන් එතකොට ඒ පත්කිරීමම සහ ඒ රාජකාරි කිරීමත් මේ මාර්ගෝපදේශකයේ තිබෙන ප්‍රතිපාදන වලට පටහැනි කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවද?

පි: දැන් මේ අවස්ථාවේදී ඒක පිළිගන්නවා. මොකද ඒ මාර්ගෝපදේශන සංග්‍රහයේ තියෙන්නේ ඒ විදියට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

පි: ඒ මාර්ගෝපදේශන සංග්‍රහයට අත්සන් කරලා තියෙන්නේ කවුද?

පි: අත්සන් කරලා තියෙන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමා සහ එවකට තිබු අමාත්‍යාංශයේ ලේකම්තුමා

ප්‍ර: එතකොට මාර්ගඋපදේශන සංග්‍රහයේ නිකුත් කරලා තියෙන්නේ අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ එවකට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාගේ නම් යටතේනේ?

පි: ඔව්.

ප්‍ර: ඔබ මේ කොමිෂන් සභාවට අද ඉදිරිපත් කරපු DPPI එක දරණ ලේඛනයෙන් ඒ අබලි ද්‍රව්‍ය පිළිබඳ කටයුතු ඔබට භාර ගන්න කියලා අත්සන් කරලා තියෙන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති?

පි: සභාපති.

ප්‍ර: සභාපතිවරයා විතරයි?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් එවැනි අත්සනක් බලය පැවරීමක් ඔබට වෙලා තිබ්බාද?

පි; එහෙම බලය පැවරීමක් වෙලා තිබුන් නැහැ. සභාපතිතුමා තමයි අත්සන් කරලා මට ලබා දීලා තියෙන්නේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඔබට එවකට සිටි සභාපතිතුමා විසින් මේ අබලි ලෝහ කළමණාකරන ඒකකයේ රාජකාරි භාර ගන්න කියලා කිව්වාම ඔබව අධික්ෂණය කරේ කවුරුන් විසින්ද?

පි: මම අධික්ෂණය කෙරුවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමා සහ සභාපතිතුමා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ අධ්‍යක්ෂක අලෙවි කියන ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ඔබව අධීක්ෂණය කිරීමේ හැකියාවක් ඒ අවස්ථාවේදී නැතිවුනාද?

පි; එහෙමම කියන්නත් බැහැ මොකද .

ප්‍ර: දැන් ඇයි ඔබට ඒ රාජකාරිය ඒ නිලධාරියාගෙන් ඔබට භාර දීලා තියෙනවානේ?

පි: ඔව්

ප්‍ර: දැන් ඔබට භාර දුන්නාම ඒ රාජකාරි සම්බන්ධයෙන් ඒ නිලධාරියාටත් තවදුරටත් කටයුතු කරන්න හැකියාවක් නැහැනේ?

පි: ඔව්.

ප්‍ර: අ?

පි; ඔව් එහෙම මට භාර දුන්න නිසා මට කරන්න සිද්ධ වුනා මම ඒ කියන්නේ මට ආයතනයේ ප්‍රධානියා දීපු රාජකාරිය මට කරන්න සිද්ධ වුනා.

ප්‍ර: මා ඔබට යෝජනා කරොත් ඒ අනුව අබලි ලෝහ කළමණාකරණ ඒකකයේ ද්‍රව්‍ය මිලදී ගැනීම විකිණීම අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්තකරුවන් ඉදිරිපත් කරන අයදුම් පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම ආදිය සෘජුව ඒ අනුව ඔබව අධීක්ෂණය කරේ සභාපතිතුමා කියලා ඔබ ඒක පිළිගන්නවද?

පි: සභාපතිතුමා විතරක් නෙමේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාත් සහභාගි වෙලා තියෙනවා.

ප්‍ර: කවුද එවකට අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළේ?

පි: PPU රත්නමලල මහත්මයා.

ප්‍ර: මහත්මයා ඔබට මේ කොමිෂන් සභාවේ සාක්ෂි ලබා දෙන්න එන්න කියලා සිතාසියක් ලැබුණානේ?

පි: ලැබුණා.

ප්‍ර: ඒ සිතාසිය සමඟ ඔබට තවත් ඇමුණුමක් ලැබුණද ඔබට අවශ්‍ය නම් ඔබ සාක්ෂි ලබා දෙන අවස්ථාවේදී ඔබට නීතිඥ සහයක් ඔබට පෞද්ගලිකව ලබාගත හැකි බවට?

පි: ඔව් මට නීතිඥ සහය ලබා ගන්න.

ප්‍ර: ඒ අනුව කටයුතු කරලා අද දින ඔබ වෙනුවෙන් පෙනිසිටීමට නීතිඥ මහත්මයෙක් හෝ මහත්මියක් අද මේ ගරු කොමිෂන් සභාවේ පෙනී සිටිනවද?

පි: පෙනි සිටිනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ අබලි ලෝහ කළමණාකරන ඒකකයේ භාරව කටයුතු කරන අවස්ථාවේදී මේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ

FAIR COMMENT BY JEZEEM

අබලි ලෝහ මිලදී ගැනිම සහ කර්මාන්තකරුවන්ට විකිණිම සම්බන්ධයෙන් කටයුතු කරන්න ඇති?

පි: ඔව්

ප : දැන් ඒ අනුව අබලි ලෝහ මිලදී ගැනිම සිදු කරේ කොහොමද?

පි: අබලි ලෝහ මිලදී ගැනිම සිදු කරේ රාජ්‍ය ආයතනවලින් ලබා දෙන දැනටමත් ලබා දෙන ආයතනවලින් අපි ඒ තොග තියෙනවා කියලා දැනුම් දුන්නාම අපි ඒවා මිලදී ගත්තා අරගෙන අපේ ලියාපදිංචි කර්මාන්තකරුවන් අතර බෙදා හැරියා. ඒ නියම කර තිබුණා මිල ගණන් යටතේ.

ප්‍ර: දැන් ඔබ දන්වාද 2013 මාර්ගෝපදේශන සංග්‍රහයේ මිල කමිටුව කියලා එකක් තියෙනවා කියලා ?

පි: මිල කමිටුව කියලා එකක් තියෙනවා.

ප්‍ර: ඒකේ අංකය 06 යටතේ තමයි මේ මිල කමිටුව සම්බන්ධයෙන් කරුණු සඳහන් වෙලා තියෙන්නේ ?

පි; අංක.06.ඔව්

ප්‍ර: දැන් ඒ අනුව රජයේ දෙපාර්තමේන්තුවකින් හරි අනෙකුත් රජයේ ආයතනවලින් බැහැර කරනු ලබන අබලි ලෝහ මිලදී ගැනිමේදී ඒ මිලදී ගන්න මිල තීරණය කරන්නේ ඒ මිල කමිටුව විසින්ද?

පි: මිල කමිටුව විසින් තීරණ ගන්නේ.

ප්‍ර: මිල කමිටුව එසේ භාණ්ඩ ලබා ගන්න හැකියාවක් තිබෙනවද?

පි: මිල කමිටුවක් නැතිව භාණ්ඩ ලබා ගැනීමට අපි මේ ක්‍රියාත්මක කරලා නැහැ. සහ හැකියාවක් නැහැයි කියන මට එකක් කියන්න අමාරුයි ඊට එහෙම නැතිව ක්‍රියාකරලා තියෙනවා අපි ඒ අවස්ථා.

ප්‍ර: හැකියාවක් නැහැ කියලා කියන්න අමාරු මොකද මහත්මයා?

පි: මේ ඒ කියන්නේ .

ප්‍ර: දැන් මේ 2013 මාර්ගෝපදේශන සංග්‍රහය අනුවනේ ඔබ කටයුතු කරන්න ඔනේ ඔබ දැන් ටිකකට කලින් සාක්ෂි ලබා දුන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් එහි තිබෙනවා මේ අංකය 06 යටතේ මිල කමිටුවක් සකස් කරන්න ඕනේ කියලා ඒ මිල කමිටුවෙන් තමයි ඒ මිල තීරණය කරන්න ඕනේ කියලා?

පි: ඔව් එහෙම තියෙන්නේ .

ප්‍ර: ඒ කියන්නේ ඒක නියාමනයකට ලක් කරන්න තමයි මේ නෛතික ප්‍රතිපාදන හදලා තියෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ 2017 වර්ෂයේන් ඒ අනුව අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ භාරව කටයුතු කෙරුනු ලැබුණාවානේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: 2017 වර්ෂයේ මැයි මාසේ සිට.

ප්‍ර: දැන් 2017 වර්ෂයේ කාර්මික සංවර්ධන මණ්ඩලයට පෙර නොතිබුණු ආකාරයට විශාල ආකාරයට පිත්තල රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගැනීමක් සිදු කරනු ලැබුවාද?

පි: ඔව්.

ප්‍ර: ඒ කොහොමද ඒක ලබා ගත්තේ කියලා ?

පි: මේක පිත්තල තඹ සහ යකඩ වර්ග තුනක් තිබුණා. ඒ තුන ලබා ගන්න කියලා මිලක් සඳහන් කරලා ලිපියක් එවලා තිබුණා කැබිනට් එක විසින් තීරණය කරපු මිලක් තමයි එවලා තිබුණේ.

ප්‍ර: ඒ කියන්නේ ඔය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් පිත්තල කොපු නිකුත් කිරීමේදී මිල කමිටුවක් නැතිව තමයි ඒ ලබා ගැනීම සිදු කරනු ලැබුවේ?

පි: ඔව් මිලදී ගැනීමේ මිල තීරණය කිරීමේ මිල කමිටුවක් නැතිව තීරණය.

ප්‍ර: දැන් මිල කමිටුවක් නොමැතිව ඒ ආකාරයෙන් මිලදි ගැනීමක් සිදු කරනු ලැබුවා නම් ඔබ ඔය කියන ආකාරයේ ලිපියකින් දැනුම් දුන්නාය කියලා තියෙනවානේ?

පි: ඔව්

ප්‍ර : ඔබට ඒ ලිපිය මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවද?

පි: හැකියාව තියෙනවා.

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන 2017 මැයි 17 දින දරන රාජ්‍ය ආරක්ෂක අංශයෙන් පිත්තල, යකඩ සහ තඹ නිකුත් කිරීම සම්බන්ධයෙන් මිල නියම කිරීමට අදාල ලිපිය පිටු තුනකින් සමන්විත ලිපියක් එම ලිපියේ අධ්‍යක්ෂක ජෙනරාල් කාර්මික සංවර්ධන මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන අදාල ලිපිය DPP 2 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ මේ අබිලි ලෝහ කළමණාකරන ඒකකය භාරව කටයුතු කරන කොට කාර්මික සංවර්ධන මණ්ඩලයට රජයේ ආයතනවලින් ලබා ගන්නා ලෝහ අබලි ද්‍රව්‍ය කාර්මාන්තකරුවන්ට ලබා දෙන්නේ යම් කිසි සහන මිලකට කියලා කිව්වොත් ඒක හරිද?

පි: සහන මිලකට ලබා දෙනවා .

ප්‍ර: ඒක මහා පරිමාණ කර්මාන්තකරුවන්ට ලබා දෙනවද කියලා?

පි: මහා පරිමාණ අයට ලබා දෙන්නේ නැහැ.

ප්‍ර: එහෙනම් කාටද ලබා දෙන්නේ?

පි: සුළු, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ සුළු, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට යම් කිසි සහන මිලකට ලබා දෙන්නේ ඇයි ? මොකක්ද කාර්මික සංවර්ධන මණ්ඩලයේ පරමාර්ථය?

පි: ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කරනවා.

ප්‍ර: සහ මෙම කර්මාන්තකරුවන් ප්‍රවර්ධනයේ කරන්න මේ නගා සිටුවන්න සංවර්ධනය කරන්න කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඒක හරි.

ප්‍ර දැන් මේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ පිහිටුවලා තිබෙන්නේ 1969 අංක 36 දරණ පනත මගින් කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔව්.

ප්‍ර: මේ පනත පිහිටුවිමේ පරමාර්ථ යටතෙත් ඔය කියන ආකාරයට කර්මාන්තකරුවන්ට සහන සලසලා දිරිගන්නලා සංවර්ධනය කරන්න කියලා කිව්වොත් ඒක සටහන් වෙලා තියෙනවා කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවද?

පි: ඒක පිළිගන්නවා.

ප්‍ර: දැන් යම් කිසි කර්මාන්තකරුවෙක් තමන්ගේ නිෂ්පාදන ධාරිතාව සුළු මධ්‍යම සහ කුඩා පරිමාණ වාර්ෂික පිරිවැටුම සුළු, මධ්‍යම සහ කුඩා කාණ්ඩවල සඳහන්ව තිබෙන පරිමාණය ඉක්මවලා යනවා නම් භාණ්ඩ ලබා දෙන්න හැකියාවක් තිබෙනවද?

පි: මේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව එහෙම සඳහනක් නැහැ

ප්‍ර: මාර්ගෝපදේශන?

පි: සංග්‍රහය අනුව ඒ වගේ සඳහනක් නැහැ ලොකු අයට දෙන්න

දැන් ඔබ අතේ තිබෙනව ද සාක්ෂිකරුට නැවතත් දැනටමත් C 754 වශයෙන් ලකුණු කර ඇති මාර්ගෝපදේශන සංග්‍රහය නැවතත් සාක්ෂිකරුට පෙන්වා සිටියි.

ප්‍ර: දැන් ඒකේ තියෙනවා නේද මහත්මයා මේ කුඩා මධ්‍යම සහ සුළු පරිමාණ වශයෙන් කර්මාන්තකරුවන් බෙදීමේ නිර්ණායක තියෙනවානේ නිර්වචනය කරලා තියෙනවානේ?

පි: ඔව් නිර්ණායක තියෙනවා.

ප්‍ර: එහි තියෙනවානේ මේ වාර්ෂික පිරිවැටුප සම්බන්ධයෙන්?

පි: ඔව්.

ප්‍ර: එතකොට වාර්ෂික පිරිවැටුම සුළු පරිමාණ අයට කොච්චරද කියලා පැහැදිලි කරන්න?

පි: සුළු පරිමාණ අයගේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ට අඩු වෙන්න ඕන. කුඩා පරිමාණ ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ත් 200 ත් අතර වෙන්න ඕන. මධ්‍ය පරිමාණ ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 ත් 600 ත් අතර වෙන්න ඕන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැවතත් කියන්න පුළුවන්ද මහත්මයා?

පි: කාණ්ඩ සුළු පරිමාණ වාර්ෂික පිරිවැටුම ශ්‍රී ලංකා මිලියන 10 ට අඩු වෙන්න ඕන කාණ්ඩය කුඩා පරිමාණ ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ක් 200 ත් අතර විය යුතුයි කාණ්ඩය මධ්‍ය පරිමාණ ශ්‍රී ලංකා රුපියල් මිලියන 200,ත් 600 ත් අතර විය යුතුයි.

ප්‍ර: මේ අනුව මහත්මයා යම් කිසි කර්මාන්තකරුවෙකු ඔහුගේ වාර්ෂික පිරිවැටුප රුපියල් මිලියන 600 ඉක්මවා යනවා නම් ඔහු මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෙක් කියන නිර්ණායකයෙන් ඉවතට ගිහිල්ලා මහා පරිමාණ කර්මාන්ත ගණයට වැටෙනවායි කියලා කිව්වොත් ඒක හරිද?

පි: මේ නිර්ණායකය අනුව එසේ වැටෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා</u>

ප්‍ර: මධ්‍යම පරිමාණ ගණයට වැටෙන කර්මාන්ත කරුවෙකුට මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපාර යටතේ අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි: මධ්‍ය පරිමාණ අයට පුළුවන්.

ප්‍ර: ඕනම අබලි ද්‍රව්‍යයක් මධ්‍යම පරිමාණ කියන්නේ 200 යි 600 අතර?

පි: රුපියල් මිලියන 200 ත් 600 ත් අතර ස්වාමිනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් කර්මාන්තකරුවන් ඔබේ ආයතනය කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ ලබා ගන්නවානම් අයදුම්පතක් ඉදිරිපත් කරලා එහි ලියාපදිංචිය සිදු කල යුතුයිද?

පි: එසේ සිදු කල යුතුයි.

ප්‍ර: දැන් ඒ අනුව කර්මාන්තකරුවෙකු විසින් තමන්ට ඒ අවශ්‍ය ලෝහ ප්‍රමාණය එකී අයදුම්පතේ සටහන් කරලා ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔබේ ආයතනයෙන් නිලධාරීන් යවා ඒ ඉල්ලන ප්‍රමාණයට ලෝහ ලබා දෙන්න කලින් ධාරිතාවය කර්මාන්තයේ ධාරිතාවය සම්බන්ධයෙන් පරීක්ෂා කරලා බලනවද?

පි: පරීක්ෂා කරලා බලනවා ධාරිතාව.

ප්‍ර: ඒ ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරීන්ගෙන් සහ ප්‍රාදේශිය ලේකම්වරයාගෙන් ඒ ප්‍රදේශයේ එවැනි ආකාරයේ කර්මාන්තයක් පවතිනවාය කියන කාරණය සම්බන්ධයෙන් සහතික ලබා ගැනීමකුත් සිදුකරනු ලබනවද?

පි: අයදුම්පත්‍රයේ සඳහන් වෙලා තියෙනවා ඒ නිසා අපි එය ග්‍රාම සේවක මහත්ම මහත්මියගෙන් නිර්දේශය සහ ප්‍රාදේශිය ලේකම්තුමාගේ නිර්දේශය ලබා ගන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් යම් කිසි අයදුම්පතක ඒ කාරණා සම්පූර්ණ වෙලා නැත්නම් නියම ආකාරයෙන් සම්පූර්ණ කරලා නැත්නම් ඔබ අයදුම් පත භාර ගන්නවද අබලි ලෝහ ද්‍රව්‍ය නිකුත් කිරීම සිදු කරනවාද?

පි: අපි ප්‍රධාන කාර්යාලය විදියට අපි බලන්නේ අපේ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරියා හෝ නිලධාරීන් ගිහිල්ලා කරන නිරීක්ෂණය තමයි ප්‍රධාන විදියට සලකන්නේ අනෙක් අයට ඒ පිළිබඳ දැනුමක් නැති නිසා.

ප්‍ර: ඒ මහත්මයා ඒ අයදුම්පතේ එක කොටසක පමණයිනේ තියෙන්නේ මේ ඒ අදාල නිලධාරියා ගිහිල්ලා පරීක්ෂාකරන එක?

පි: ඔව් එහෙමයි.

ප්‍ර: දැන් එහි අයදුම්පතේ වෙන වෙනම ග්‍රාම නිලධාරිවරයා විසින් සම්පූර්ණ කල යුතු කොටසකුත් අදාල ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම් සම්පූර්ණ කලයුතු කොටසකුත් තියෙනවා කියලා මහත්මයා කිව්වොත් මහත්මයා පිළිගන්නවද?

පි: ඔව් පිළිගන්නව.

ප්‍ර: මහත්මයාගෙන් මේවා අහන්නේ ඔබේ අංශයේ ඔබ නිතර දකින හුරුපුරුදු දෙයක් නිසා තමයි ඔබෙන් මේ අහන්නේ දිනපතාම ඔබට මේ විදියේ අයදුම්පත් ලැබෙනවා ඇති ඔබ මේවා පරීක්ෂා කරනවා ඇති?

පි: ඔව්.

ගරු කොමිෂන් සභාවේ අවසරයට යටත්ව සාක්ෂිකරුට නැවතත් DPP 02 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටිනවා.

ප්‍ර දැන් මහත්මයා මේ ලේඛනයේ ඔබ කලින් සඳහන් කරා පිටු තුනකින් සමන් විත ලේඛනයක් කියලා?

පි: ඔව්.

ප්‍ර: පළවෙනි පිටුවේ මොනවද තියෙන්නේ? එකේ පිටපතක් නැනේද?

පි: නෑ.

ප්‍ර: මේක විතරද තියෙන්නේ?

පි: පළවෙනි පිටුවේ තියෙන්නේ අධ්‍යක්ෂ ජනරාල් කාර්මික සංවර්ධන මණ්ඩලය අමතලා මා විසින් ඉදිරිපත් කරපු නෑ ඒකේ තියෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අබලි පිත්තල උණ්ඩ කොපු අලෙවි කිරීම සඳහා මිල නියම කිරීම.

ප්‍ර: කවුරුන් විසින් කාටද කවදද ඒ ලිපිය එවලා තියෙන්නේ?

පි: මේකේ කමිටියක් විසින් තමයි මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ.

ප්‍ර: මං කිව්වොත් නිවැරදිද මේ DPP 02 කියන ලිපියේ පළවෙනියාටම තිබෙන පිටුවේ තිබෙන්නේ අධ්‍යක්ෂක ජෙනරාල් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත 2017.08.03 වන දිනයේදී ඔබ සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු අත්සන් කරලා ඉදිරිපත් කරපු ලිපියක් කියලා?

පි: දෙදෙනකු නෙමේ තිදෙනෙක් ඉන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ සහ තවත් දෙදෙනෙක්?

පි: තිදෙනෙක් ඉන්නවා.

ප්‍ර: තිදෙනෙක් විසින් අත්සන් කරලා ලිපියක් ඉදිරිපත් කරපු?

පි: සභාපතිතුමාගේ අත්සනින් ඊට උඩින් අත්සනක් තියෙනවා

ප්‍ර: ඔබ කියන විදියට ඔබ සහ තවත් නිලධාරීන් තිදෙනෙකු අත්සන් කරලා තිබෙනවා?

පි: තිදෙනෙකු අත්සන් කර තිබෙනවා.

ප්‍ර : ඒ ලිපියේ තියෙන්නේ රාජ්‍ය ආරක්ෂික අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අබලි පිත්තල උණ්ඩ කොපු අලෙවි කිරීම සඳහා මිල නියම කිරීම සම්බන්ධව?

පි: එහෙමයි.

දැන් වේලාව:ප.ව.3.15

මෙතැන් සිට : මුතුමාලි මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.03.15 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප : එහි සටහන් වෙන්නේ අබලි, පිත්තල, උණ්ඩ කොපු කිලෝ එකක විකුණුම් මිල NBT ඇතුළත්ව එක වශයෙන් සුළු සහ කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ට රුපියල් 395 කට මිලකට කියලා සටහන් වෙලා තියෙනවනේ?

පි : ඔව්.

ප : මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට රුපියල් 406.50 ක මිල කියලා සටහන් වෙලා තිබෙනවද?

පි : ඔව් පිළිගන්නවා.

ප : ඉහත මිල ගණන්වලට අබලි ද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ලියාපදිංචි කළමනාකරුවන්ට පිත්තල උණ්ඩ කොපු අලෙවි කිරීමට නිර්දේශ කරන බවටත් එහි සටහන් වෙලා තිබෙනවාද?

පි : එහෙම සඳහන් වෙලා තිබෙනවා.

ප : දැන් ඔබ මෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් පී.පී.පී.එස්.දික්වැල්ල කියලා ඔබ අත්සන් කරලා තියෙනවා?

පි : ඔව්.

ප : ඔබ කිව්වා ඔබ ඇරුණාම තවත් නිලධාරීන් තුන්දෙනෙක් අත්සන් කරලා තියෙනවා කියලා?

පි : ඔව්.

ප : ඒ කියන්නේ ඔබත් සමඟ ඒ කමිටුවේ හිටපු අනිත් නිලධාරීන්?

පි : අනිත් නිලධාරීන්.

ප : ඒ අයගේ නම් කියන්න පුළුවන්ද? බලලා කියන්න.

පි : බී.ඒ.වීරසූරිය එයා කර්මාන්ත ශාලා foundering , අනිත් එක්කෙනා බී.ඒ.කුමාරසිංහ එයා Mechanical Engineer , අනිත් එක්කෙනා බී.ජේ.කුමාර Accountant

ප : ඒ ඔබත් සමඟ ඒ කමිටුවේ හිටපු ඔබ සඳහන් කරපු නිලධාරීන් මේ ලිපියේ අත්සන් කරලා තියෙනවා?

පි : ඔව්.

ප : ඔබට ඒ අත්සන් හඳුන ගන්න පුළුවන්ද?

පි : හඳුන ගන්න පුළුවන්.

මෙම ලිපිය DPP 2 (A) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප : මහත්මයා ඒ DPP 2 කියන ඒ ලිපියේ දෙවෙනි පිටුවේ තියෙනවා අලෙවි අංශය අභ්‍යන්තර සටහන් පත්‍රිකාව කියලා එකක්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : එහි තිබෙන්නේ අධ්‍යක්ෂක ජෙනරාල් වෙත ආමන්ත්‍රණය කරලා නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි අංශය විසින් ඉදිරිපත් කරපු ලිපියක්?

පි : ඔව් මා විසින්.

ප්‍ර : ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් අත්සන් තබලා තිබෙන්නේ ඔබ?

පි : මම

ප්‍ර : එහි විෂය වශයෙන් තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අබලි පිත්තල උණ්ඩ කොපු අලෙවි කිරීම සඳහා මිල නියම කිරීම?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත කිලෝ එකක් රුපියල් 308.12 ක මිලකට ලබා දෙන බව අබලි ද්‍රව්‍ය කළමනාකරුවන්ට අලෙවි කරන මිල තීරණය කර නැත කියලද එහි සටහන් වෙලා තිබෙන්නේ? ඒක පැහැදිලි කරන්න ඔබට පුළුවන්ද?

පි : ආරක්ෂක අමාත්‍යාංශයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත කිලෝ ග්‍රෑම් එකක් 308.12 ක මිලට ලබා දෙන අතර එම අබලි ද්‍රව්‍ය කර්මාන්තකරුවන්ට අලෙවි කරන මිල තීරණය කර නැත.

ප්‍ර : එසේම එම පිත්තල උණ්ඩ කොපුවල අලෙවි මිල කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් තීරණය කළ යුතු අතර එම මිල තීරණය කිරීම සඳහා සුදුසු කමිටුවක් පත් කර දෙන ලෙස කාරුණිකව ඉල්ලමි කියලා සටහන් වෙලා තිබෙනවා?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද ඔබ අදහස් කළේ ඒකෙන්?

පි : අපිට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලැබුණු ලිපියේ ඒ ලිපියේ දෙවෙනුට තියෙනවා ඒ ලිපියේ සඳහන් කරලා තිබුණේ අපිට ඒ පිත්තල ලබා දෙන මිල විතරයි. ඒක කැබිනට් තීරණයක් අනුව දීලා තියෙන්නේ ඒ මිල. එතකොට අපි විකුණන මිල අපිට තීරණය කරලා තිබුණේ නෑ. ඒ නිසා ඒකට මිල තීරණය කරන්න කමිටුවක් තමයි ඉල්ලුවේ.

ප්‍ර : ඒ අනුව ඔබට අධ්‍යක්ෂක ජෙනරාල්තුමාගෙන් යම් කිසි නම් කිරීමක් නිලධාරීන් කමිටුවට නම් කරනු ලැබුවද?

පි : ඔව්.

ප්‍ර : ඒ කවර නිලධාරීන්ද එතුමා විසින් නම් කර තිබෙන්නේ?

පි : මිස්ටර් විජේකෝන්, මගේ නම තියෙනවා මිස්ටර් දික්වැල්ල, ඊළඟට මිස්ටර් රුවන් වීරසූරිය, බී.ජේ.කුමාර, මිස්ටර් අජිත් කුමාරසිරි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් එහි අධ්‍යක්ෂක ජනරාල්තුමා අත්සන් කරලා තියෙනවාද?

පි : අත්සන් කරලා තියෙනවා.

ප්‍ර : එතුමාගේ අත්සන මේ ලිපියේ නම් කිරීම අවසානයේදී තිබෙනවාද?

පි : තිබෙනවා.

ප්‍ර : ඔබ හඳුන ගන්නවාද?

පි : ඔව් හඳුන ගන්නවා.

ප්‍ර : දිනය සටහන් වෙලා තිබෙනවාද?

පි : 08/03 වෙනිදා විදිහට සටහන් වෙලා තියෙනවා.

ප්‍ර : දිනය පැහැදිලි නෑ ඔබට මේ අවස්ථාවේදී?

පි : මාසේ සහ දිනය පැහැදිලියි. වර්ෂය ඒ තරම් මට පැහැදිලි නෑ.

මෙම ලිපිය DPP 2 (B) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : එම ලිපියේ තුන්වෙනි පිටුවේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ පිත්තල, යකඩ සහ තඹ ඔවුන් විසින් ලබා දීමට නියමිත ප්‍රමාණය සහ ඔවුන් විසින් ලබා දෙන මිල කිලෝ එකක මිල වශයෙන් සටහන් කරලා තියෙනවාද?

පි : තියෙනවා.

ප්‍ර : එය බලලා කියන්න පුළුවන්ද ඔබට?

පි : පිත්තල ලබා දෙන ප්‍රමාණය ටොන් 784 යි, කිලෝ 784,584.31 යි, ඊට පස්සේ යකඩ අයන් කිලෝ 64,549.19 යි. කෝපර් තඹ කිලෝ 2000 ක් මිල විදියට සඳහන් කරලා තියෙන්නේ පිත්තල කිලෝ එකක මිල රුපියල් 308.12 යි, යකඩ රුපියල් 24 යි, තඹ රුපියල් 358.25 යි.

DPP 02 දරන ලිපියේ තුන්වෙනි පිටුව DPP 02 (C) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : මහත්මයා ඔබ මේ ගරු කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ඔබේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී ඒ එක් එක් වර්ෂය සඳහා 2017 සහ 2018 වර්ෂයන් සඳහා අබලි ලෝහ ලබා ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වුණු කර්මාන්තකරුවන්ගේ ලේඛනයක් ලබා දීමක් සිදු කරනු ලැබුවද?

පි : සිදු කරනු ලැබුවා.

ප්‍ර : ඒ ලේඛනය නැවත දැක්කොත් ඔබට හඳුනා ගන්න හැකියාවක් තිබෙනවද?

පි : පුළුවන්.

2017 වර්ෂය සඳහා අබලි ලෝහ ලබා ගැනීමට ලියාපදිංචි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්තකරුවන්ගේ නම් ලැයිස්තුව ඇතුළත් ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර : ඒක හඳුනා ගන්නවද මහත්මයා මේ අවස්ථාවේදී?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : හඳුන ගන්නවා.

ප්‍ර : දැන් ඔබට එය පරීක්ෂා කරලා බලලා කියන්න පුළුවන්ද 2017 වර්ෂයේදී

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2017 වර්ෂය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ පිත්තල, තඹ සහ තාරාපැවි ලබා ගැනීමට ලියාපදිංචි වූ කර්මාන්තකරුවන්ගේ නම් ඇතුළත් ලේඛනය C 771 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයා ඔබට C 771 දරන ලේඛනය පරීක්ෂා කරලා බලලා කියන්න පුළුවන්ද 2017 වර්ෂය සඳහා එසේ අබලි ලෝහ ලබා ගැනීමට කර්මාන්තකරුවන් කී දෙනෙකු ලියාපදිංචි වෙලා තියෙනවද කියලා?

පි : පරීක්ෂා කර බලා පවසන්න පුළුවන්.

ප්‍ර : මේක තියෙනවනේ?

පි : ඒක නෑ. මට ප්‍රකාශය කරන්න පුළුවන්ද.

ප්‍ර : දැන් මහත්මයා ඔබෙන් අහන්නේ දැන් ඔය ඔබ විසින්ම ලබා දුන්න ලේඛනය සම්බන්ධයෙන්. දැනටමත් එය C 771 කියලා ලකුණු කරලා ඉදිරිපත් කළා. ඔබෙන් අහන්නේ ඒ ලේඛනය අනුව 2017 වර්ෂය සඳහා කර්මාන්තකරුවන් කී දෙනෙක් ලියාපංදිවි වෙලා තියෙනවද කියලා?

පි : මේ ලේඛනය අනුව මේකේ තියෙන්නේ තඹ, පිත්තල සහ ට්‍රාන්ස්පෝමර් සඳහා ලියාපදිංචි අය. එහෙත් මෙහි යම් අඩුපාඩුවක් තියෙනවා මෙහි සඳහන් වෙලා තියෙනවා මීට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ලබා දෙනවා යකඩ සහ ඇලුමිනියම්. ඒ අයගේ නමුත් මේකට ඇතුළත් වෙලා තියෙනවා.

ප්‍ර : දැන් එහි පිටකවරයේ ඔබ සටහන් කරලා තිබෙන්නේ පිත්තල, තඹ සහ ට්‍රාන්ස්පෝමර්ස් කියලා. ඒකයි ඔබෙන් ඒ ප්‍රශ්නේ ඇහුවේ?

පි : ඔව්. මේකේ සඳහන් කරලා තියෙන්නේ අපි යම් අඩුපාඩුවක් වෙලා තියෙනවා. ඒ අනිත් අයගේ නමුත් තියෙනවා මෙතන. ඒ එකම list එකකින් ගන්නේ.

ප්‍ර : දැන් මහත්මයාගෙන් මම මෙහෙම ඇහුවොත් ප්‍රශ්නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ මේ ලේඛනයක් ඉදිරිපත් කරලා තියෙනවනේ file එකක්?

පි : ඔව්.

ප්‍ර : නම් ලැයිස්තුවක් ඇතුළත්ව මොකක්ද ඒක?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක තඹ, පිත්තල සහ ට්‍රාන්ස්පෝමර් සඳහා ලියාපදිංචි අයගේ නාම ලේඛනය.

ප්‍ර : දැන් ඒ නාම ලේඛනයේ 219 යටතේ කුමන කර්මාන්තකරු ලියාපදිංචි වෙලා තිබෙන්නේ?

පි : එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ්.

ප්‍ර : එම කර්මාන්තකරුගේ ලියාපදිංචි අංකය කුමක්ද?

පි : ලියාපදිංචි අංකය 11216.

ප්‍ර : කර්මාන්තය පිහිටා තිබෙන ස්ථානයේ ලිපිනය තියෙනවද?

පි : ලිපිනය තියෙනවා. නොම්බර් 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය

ප්‍ර : දැන් මේ ලේඛනයේ මේ වගුවේ අවසානයේ එම කර්මාන්තකරුට 2017 වර්ෂය සඳහා recommend කරලා තියෙන නැත්නම් නිර්දේශ කරලා තිබෙන ප්‍රමාණයනුත් සඳහන් කරලා තියෙනවද?

පි : සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : ඒ වගුවේ කෝපර් වශයෙන් සටහන් වෙලා තිබෙනවා. ඊළඟට බ්‍රාස් කියලා සටහන් වෙලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව පිත්තල සහ තඹ කොච්චර ප්‍රමාණයක් 2017 වර්ෂයේ මේ කර්මාන්තකරුට ලබා දෙන්න සුදුසුයි කියලා නිර්දේශ කරලා තියෙනවද මේ වගුව අනුව?

පි : මාසයකට තඹ කිලෝ 30,000 ක්, පිත්තල කිලෝ 15,000 ක්.

මේ අවස්ථාවේදී දැනටමත් C 771 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයේ අයිතම number අංක 219 යේ සටහන් මෙම සාක්ෂිකරු විසින් සඳහන් කරන ලද එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුගේ දත්ත ඇතුළත් කොටස C 771 (A) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. වාර්තා ගත කිරීම සඳහා උතුමාණනි සඳහන් කරනවා ඒ ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුගේ දත්ත ඇතුළත් වෙලා තිබෙන්නේ අංක 219 කර්මාන්තකරුගේ නම් ලේඛනයේ නම වශයෙන් සහ එය තිබෙන්නේ පිටු අංක 101 වශයෙන් සැලකර සිටිනවා. මේ අවස්ථාවේදී මා වෙත ලබා දී ඇති ලේඛනය උතුමාණනි ඒ පිටුව 101 කියලා සටහන් වුනත් සාක්ෂිකරු විසින් පොලිස් ඒකකයට ලබා දී ඇති අනිත් පිටපතෙහි ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුගේ දත්ත ඇතුළත් කොටස සඳහන් වෙලා තිබෙන්නේ පිටු අංක 99 බවට සැලකර සිටිනවා.

ප්‍ර : දැන් මහත්මයා ඔබ පොලිස් ඒකකයට ඔබේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී 2018 වර්ෂයේත් ඒ ආකාරයටම අබලි ලෝහ ලබා ගන්න ලියාපදිංචි වෙච්ච කර්මාන්තකරුවන්ගේ නාම ලේඛනය සහ ඔවුන්ගේ දත්ත ඇතුළත් ගොනුවක් ඔබ විසින් භාර දුන්නාද?

FAIR COMMENT BY JEZEEM

පි : භාර දුන්නා.

ප්‍ර : ඒ භාර දුන්න ගොනුව ඔබට නැවත දැක්කොත් හඳුන ගන්න පුළුවන්ද?

පි : පුළුවන්.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට 2018 වර්ෂයේ අබලි ලෝහ ලබා ගැනීමට ලියාපදිංචි කර්මාන්තකරුවන්ගේ නාම ලේඛනය පෙන්වා සිටී.

ප්‍ර : හඳුන ගන්නවද?

පි : හඳුන ගන්නවා.

මෙම ලේඛනය උතුමාණනි C 772 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයා කියන්න මේ ලේඛනයේ කුමන වර්ගයේ අබලි ලෝහ ලබා ගැනීම සම්බන්ධයෙන්ද ඔබ ඉදිරිපත් කරනු ලැබුවේ?

පි : මෙහි සඳහන් වෙනවා ඇලුමිනියම්, තඹ, පිත්තල, ට්‍රාන්ස්පෝමර් වර්ග හතරක්.

ප්‍ර : දැන් ඔබේ අවධානය යොමු කරනවා C 772 දරන ලේඛනයේ නොම්බර 225 වශයෙන් සටහන්ව තිබෙන කර්මාන්තකරුවෙකුගේ විස්තර කෙරෙහි.

පි : ඔව්.

ප්‍ර : එහි 225 අංකය යටතේ තිබෙන කර්මාන්තකරුගේ ලියාපදිංචි අංකය කුමක්ද?

පි : 18/11226

ප්‍ර : කර්මාන්තකරුගේ නම කුමක්ද?

පි : එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ්

ප්‍ර : එහි කර්මාන්තය සහ එහි පිහිටා ඇති ස්ථානය සටහන් වෙනවද?

පි : ඔව්. කොලෝසස් ප්‍රයිවඩ් ලිමිටඩ් 111A6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර : ඒ අනුව කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙම කර්මාන්තකරුට ලබා දීමට නිර්දේශ කර තිබෙන ද්‍රව්‍ය සහ ප්‍රමාණය මේ ලේඛනය අනුව ඔබට කියන්න පුළුවන්ද?

පි : ඔව් කියන්න පුළුවන්. ඇලුමිනියම් කිලෝ 50,000ක්, තඹ කිලෝ 150,000ක්, පිත්තල කිලෝ 100,000 ක්, ට්‍රාන්ස් පෝමර් 150 ක්.

උතුමාණනි මේ අවස්ථාවේදී දැනටමත් C 772 වශයෙන් ලකුණු කර තිබෙන ලේඛනයේ සාක්ෂිකරු විසින් 01 සිට 312 දක්වා ශ්‍රේණී ගත අංක යටතේ එක් එක් කර්මාන්තකරුවන්ගේ තොරතුරු ඇතුළත් කරලා තිබෙනවා. එහි අංක 225 යටතේ තිබෙන කරුණුයි මේ අවස්ථාවේදී ඔහු විසින් සඳහන් කරනු ලැබුවේ. ඒ අනුව ලියාපදිංචි අංක 18/11226 එම්.අයි.ඉන්ෂාෆ් යන

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

කර්මාන්තකරුගේ තොරතුරු ඇතුළත් අදාළ කොටස C 772 (A) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප : මහත්මයා දැන් ඔබ ඒ ලේඛන දෙක ඉදිරිපත් කළේ නිර්දේශ කරන ලද ප්‍රමාණයන් සම්බන්ධයෙන් පමණයි?

පි : ඔව් නිර්දේශ කිරීම.

ප : දැන් ඔබ ඔබේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී එක් එක් කර්මාන්තකරුට නිකුත් කරන ලද අබලි ලෝහ ප්‍රමාණයන් සම්බන්ධයෙන් ලේඛනද ගරු කොමිෂන් සභාවට ලබා දුන්නද?

පි : ලබා දුන්නා.

ප : එයත් ඔබ පෙර ආකාරයටම 2017 වර්ෂයේ එක් එක් කර්මාන්තකරුට ලබා දුන් අබලි ලෝහ ප්‍රමාණයන් සහ 2018 වර්ෂයේත් එක් එක් කර්මාන්තකරුට ලබා දුන්නු අබලි ලෝහ සම්බන්ධයෙන් වෙන වෙනම ලේඛන ඉදිරිපත් කරනු ලැබුවද?

පි : ඔව් ලැබුවා.

සාක්ෂිකරුට මේ අවස්ථාවේදී ඔහු විසින් ලබා දෙන ලද 2017 වර්ෂයේ ජනවාරි 01 වෙනිදා සිට 2017 වර්ෂයේ 12 මාසේ 31 වෙනි දින දක්වා කාල වකවානුවට අදාළව කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කරන ලද අබලි ලෝහ සම්බන්ධයෙන් දත්ත ඇතුළත් ලේඛනයක් පෙන්වා සිටි.

ප : දැන් ඔබට පෙන්වන මේ ලේඛනය ඔබ හඳුන ගන්නවද?

පි : හඳුන ගන්නවා.

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එකී ලේඛනය C 773 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප : දැන් මහත්මයා ඔබ මේ C 773 කියන ලේඛනයේ මොනවද ඇතුළත් කරලා තිබෙන දත්තයන්? මම අහන්නේ ඔබ ඒක වගු ගත කරලනේ තියෙන්නේ?

පි : ඔව්.

ප : ඒ වගුවේ මොනවද මොන මොන ආකාරයටද ඒ තොරතුරු ඇතුලත් කරලා තියෙන්නේ?

පි : කර්මාන්තකරුගේ ලියාපදිංචි අංකය තියෙනවා. කර්මාන්තකරුගේ නම තියෙනවා. ලිපිනය තියෙනවා. කර්මාන්තයේ ලිපිනය. ඊට පස්සේ invoice කරපු දිනය තියෙනවා. Invoice number එක තියෙනවා. ඊට පස්සේ එක එක අයට එක එක අවස්ථාවලදී දීපු එක එක වර්ගවලින් ලබා දුන් අමුද්‍රව්‍යවල විස්තර තියෙනවා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබට ඔබ කලින් සඳහන් කරපු එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ඒ අවුරුද්දේ ලබා දුන්නු අබලි ලෝහ ප්‍රමාණයන් සම්බන්ධයෙන් මෙහි ඇතුළත්ව තිබෙනවද?

පි : ඇතුළත්ව තිබෙනවා.

ප්‍ර : ඒ ඇතුළත් වෙන්නේ දැන් ඒ ඔබ විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයේ 52 වෙනි පිටුවේ ඒ දත්තයන් ඇතුළත් වෙලා තියෙනවා කිව්වොත් ඒක හරිද?

පි : ඔව් නිවැරදි.

ප්‍ර : දැන් ඔබට ඒ ලේඛනයේ ඒ පිටුව පරීක්ෂා කරලා බලලා සඳහන් කරන්න එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට 2017 වර්ෂයේ මොනවද ලබා දීලා තිබෙන්නේ, කවදද, මොන ප්‍රමාණවලින්ද අබලි ලෝහ ලබා දීලා තිබෙන්නේ කියලා?

පි : ලියාපදිංචි අංක 1611216 යටතේ එන්.අයි.ඉන්ෂාෆ් අහමඩ් address එක විදියට සඳහන් වෙලා තියෙන්නේ අංක 111/416 අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය. Invoice date එක විදියට දිනය විදියට දාලා තියෙනවා 2017/11/10. Invoice number එක විදියට H/0/5747. ඇමුණුම් Ammunition cup brass ඒ කියන්නේ පිත්තල උණ්ඩ කොපු කිලෝ 15,000 ක්. ඊට පසුව තියෙනවා ඒ අයටම එදාම ලබා දීලා කිලෝ 175 ක්.

මෙම සාක්ෂිකරු විසින් සඳහන් කරන ලද දැනටමත් C 773 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයේ 2017/11/10 දිනට අදාළ තොරතුරු ඇතුළත් එම කොටස C 773 (A) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : ඉන් පස්සේ ඔබ සඳහන් කළා එදිනම තවත් පිත්තල 175 ක් කියන්නේ?

පි : කිලෝ 175 ක්

ප්‍ර : කිලෝ 175 ක ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එම කර්මාන්තකරුටම?

පි : එම කර්මාන්තකරුටම.

අදාළ දත්ත ඇතුළත් කොටස C 773 (B) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : ඊට අමතරව එම කර්මාන්තකරුටම එම වර්ෂයේ තවත් දිනකදී ලෝහ ලබා දීමක් සිදු කර තිබෙනවාද?

පි : ලෝහ ලබා දීමක් සිදු කර තිබෙනවා. මට වැරදීමක් කලින් සඳහනේදී සිදු වුණා දිනයේදී ඒක අපි දීලා තියෙන්නේ 10/11 වෙනිදා. සමාවෙන්න 11/10 හරි. මේ දිනය වෙනස්වීමක් වගේ පෙන්නේ ඒක. ඊට පස්සේ අපි ලබා දීලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප : පොඩ්ඩක් ඉන්න නැවත ඔබ කියපු දේ පැහැදිලි කර ගන්න. දැන් මේකේ සටහන් වෙලා තිබෙන්නේ 2017/11 වෙනි මාසේ 10 කියලා?

පි : 2017/11/10 ඒක නිවැරදි.

ප : ඒ දිනය හරිද?

පි : ඒක නිවැරදි.

ප : ඒ කොටස තමයි මේ C 773 (A) කියලා ලකුණු කරලා ඉදිරිපත් කළේ?

පි : ලකුණු කළේ.

ප : දැන් ඔබ සඳහන් කළා තවත් කිලෝ 175 ක් පිත්තල ලබා දීලා තියෙනවා කියලා එම කර්මාන්තකරුටම එදිනම?

පි : එදිනම ලබා දීලා තියෙනවා.

ප : හරිද?

පි : ඔව් නිවැරදි.

ප : එම කොටස තමයි C 773 (B) කියලා ලකුණු කරලා ඉදිරිපත් කළේ?

පි : නිවැරදි.

ප : දැන් ඔබ එම ලේඛනය පරීක්ෂා කරලා බලලා කියන්න 2017 වර්ෂයේ ඊට අමතරව මේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට වෙන මොනවද ලෝහ ලබා දීලා තිබෙන්නේ ඒ කවදද ලබා දීලා තිබෙන්නේ?

පි : දිනය 2017/11/07 වෙනිදා. කොපර් කේබල් ඒ කියන්නේ තඹ රැහැන් ලබා දීලා තියෙනවා කිලෝ 5734.5 ක්.

ප : 2017/11 වෙනි මාසේ 07 වෙනිදා එම්.අයි.ඉන්ෂාෆ් කියන කර්මාන්තකරුට නැවතත් ඒ ලබා දුන්නු ප්‍රමාණයනුයි ඔබ සඳහන් කරනු ලැබුවේ?

පි : එහෙමයි නිවැරදි.

2017/11/07 දරන දිනට අදාළ තොරතුරු ඇතුළත් දත්ත කොටස C 773 (C) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප : දැන් මහත්මයා ඔබ විසින් ඒ ලබා දීලා තිබෙන ලේඛනය අනුව එම එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ඊට අමතරව එම වර්ෂයේ වෙනත් අබලි ලෝහ ලබා දීමක් සිදු කර තිබෙනවද?

පි : ලබා දීමක් සිදු කරලා තිබෙනවා.

ප : ඒ කවදද?

පි : 2017/09/29 වෙනි දින.

ප : මොනවද ලබා දීලා තියෙන්නේ කවර ප්‍රමාණවලින්ද 2017/09/29 වන දින?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 09/29 වන දින. පිත්තල උණ්ඩ කොපු කිලෝ 50 ක් ලබා දීලා තියෙනවා එදින. එදිනම තවත් කිලෝ 6.2 ක් ලබා දීලා තියෙනවා පිත්තල උණ්ඩ කොපු.

2017/09 වෙනි මාසේ 29 වෙනි දින එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුට අබලි ලෝහ ලබා දීම සම්බන්ධයෙන් සටහන් දත්තය C 773 (D) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : එසේම මහත්මයා තවත් අවස්ථාවලදී එසේ ලබා දීමක් සිදු කර තිබෙනවා නේද?

පි : ලබා දීමක් සිදු කරලා තිබෙනවා. 2017/10 වෙනි මාසේ 11 වෙනි දින කිලෝ 1625.6 ක් ලබා දීම කරලා තියෙනවා.

ප්‍ර : දිනය නැවත කියන්න මහත්මයා?

පි : 2017/10 වෙනි මාසේ 11 වෙනිදා

2017/10 වෙනි මාසේ 11 වෙනිදා එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුට අබලි ලෝහ ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධයෙන් අදාළ සටහන C 773 (E) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : එදින තවත් ලෝහ ලබා දීමක් සිදු කර තිබෙනවාද?

පි : එදින නෑ.

ප්‍ර : වෙන කවදද ලබා දීලා තිබෙන්නේ?

පි : කලින් මම සඳහන් කරපු සංඛ්‍යාවේදී 2017/09/29 කිලෝ 50 ක් සහ ඊට පසුව සඳහන් වෙලා තියෙනවා එදිනම කිලෝ 6.2 ක්. 2017/09/29 වන දින පිත්තල උණ්ඩ කොපු 50 ක් ලබා දීලා තියෙනවා. එදිනම පිත්තල උණ්ඩ කොපු කිලෝ 6.2 ක් ලබා දීලා තියෙනවා.

ප්‍ර : මහත්මයා දැන් කිව්වේ මේ 2017/09 වෙනි මාසේ 29 වෙනිදා?

පි : ඒ ලබා දීපු ප්‍රමාණය තමයි නැවත සඳහන් කළේ.

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් සටහන් කරන ලද එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් යන කර්මාන්තකරුට ලෝහ 2017/09/29 වෙනි දින ලබා දුන් ලෝහ සම්බන්ධයෙන් දත්ත ඇතුළත් කොටස C 773 (F) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයාට තවදුරටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්ද ඒ වර්ෂය තුළ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට නිකුත් කර ඇති අබලි ලෝහ ද්‍රව්‍ය සම්බන්ධයෙන්?

පි : පරීක්ෂා කරලා බලලා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කරමින් සිටියේ 2017 වර්ෂයේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට නිකුත් කරපු ලෝහ අබලි සම්බන්ධයෙන් දත්තයන්?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : ඔබ C 773 (F) දක්වා අවස්ථා හයක් ගැන සඳහන් කළා?

පි : අවස්ථා හයක් පිළිබඳව.

ප්‍ර : ඒ අන්තිම දවස තමයි ඔබ කිව්වේ 2017/09 වෙනි මාසේ 29 කියලා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ බලන්න.

පි : ඊට පස්සේ ඒ වර්ෂයේ ලබා දීමක් කරලා නෑ ලේඛනය අනුව.

ප්‍ර : නැවතත් ඔබෙන් අහන්නේ ඔබ පොලිස් විමර්ශන ඒකකයට කට උත්තරය ලබා දෙන අවස්ථාවේදී 2018 වර්ෂයට අදාළව එක් එක් කර්මාන්තකරුවන්ට කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් නිකුත් කරලා තිබෙන අබලි ලෝහ ප්‍රමාණය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දුන්නාද?

පි : ලබා දුන්නා.

ප්‍ර : දැන් ඔබ එම වාර්තාව ඔබ ඊට කලින් පරිශීලනය කරලා තියෙනවනේ දැක්කොත් අදුර ගන්න පුළුවන්නේ?

පි : අඳුර ගන්න පුළුවන්.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට 2018 වර්ෂයේ ජනවාරි 01 වෙනි දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාල වකවානුවට අදාළව අබලි ලෝහ නිකුත් කිරීමට අදාළ වාර්තාව පෙන්වා සිටී.

ප්‍ර : දැන් ඔබට පෙන්වන ඒ වාර්තාව හඳුන ගන්නවද?

පි : හඳුන ගන්නවා.

ඒ අනුව 2018 වර්ෂයට අදාළ එකී වාර්තාව C 774 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මේ C 774 කියන වාර්තාව අනුව ඔබ අර කලින් සඳහන් කරපු එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට නිකුත් කරන ලද අබලි ලෝහ සම්බන්ධයෙනුත් දත්ත ඇතුළත් වෙලා තිබෙනවද?

පි : ඇතුළත් වෙලා තිබෙනවා.

ප්‍ර : දැන් ඔබ පොලිස් විමර්ශන ඒකකයට ඔබේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී එම ලේඛනත් සමඟ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට 2017 වර්ෂයේ සහ 2018 වර්ෂයේ සම්පූර්ණයෙන්ම ලබා දෙන ලද අබලි ලෝහ සම්බන්ධයෙන් විස්තර ඇතුළත් සාරාංශයක් සංක්ෂිප්ත වාර්තාවක් සකස් කර භාර දෙනු ලැබුවද?

පි : භාර දෙනු ලැබුවා.

ප්‍ර : ඔබට එය නැවත දැක්කොත් හඳුන ගන්න පුළුවන්ද?

පි : හඳුන ගන්න පුළුවන්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛනයක් පෙන්වා සිටි.

පි : එම ලේඛනය හඳුනා ගැනීමේ හැකියාව තිබෙනවා.

ප්‍ර : දැන් මහත්මයා ඔබ හඳුන ගත්ත ලේඛනය තමයි 2017, 2018 වර්ෂයේ සඳහා ලියාපදිංචි අංක 1611216 යටතේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් නිකුත් කරන ලද අබලි ලෝහ සම්බන්ධයෙන් සංක්ෂිප්ත වාර්තාව?

පි : ඔව්.

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එකී ලේඛනය C 775 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයා C 775 කියන ලේඛනය බලන්න. ඒ ලේඛනය අනුව 2017 වර්ෂයේ අවස්ථා හයකදී කර්මාන්තකරුට භාණ්ඩ ලබා දීමක් සිදු කර තිබෙනවද?

පි : ලබා දීමක් සිදු කරලා තිබෙනවා.

ප්‍ර : දැන් ඔබට එහි මුළු වටිනාකම සම්බන්ධයෙන් සඳහන් කරන්න පුළුවන්ද?

පි : මුල් 2017/09/29 වෙනිදා 21,250.17 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා. එදිනම 2017/09/29 වෙනිදාම 2,635.02 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා. 2017/10/11 වෙනි දින 661,172.16 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා. 2017/11/07 වෙනිදා 943,181.89 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා. 2017/11/10 වෙනිදා 6,104,853 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා. එදිනම 11/10 වෙනිදා 71,221.50 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබ 2018 වර්ෂයේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ලබා දීලා තිබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් සහ මිල සම්බන්ධයෙනුත් මේ C 775 කියන ලේඛනයේ සටහන් කරලා තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබට ඒ වර්ෂයේ සම්පූර්ණ කොපමණ වටිනාකමක් සහිත ද්‍රව්‍ය ඔහුට නිකුත් කරලා තියෙනවද කියලා කියන්න පුළුවන්ද ?

පි : ඒ වර්ෂයේ මේක එකතු කිරීමෙන් පසුව තමයි කියන්න වෙන්නේ.

ප්‍ර : එකතු කරලා ඔබ ඒ වගුවේ දාලා නැද්ද?

පි : මේකේ දාලා නෑ.

ප්‍ර : දැන් ඔබෙන් අහන්නේ 2017 වර්ෂයට 2018 වර්ෂයට සහ ඔබ ගාව දත්ත තියෙනවා නම් 2019 වර්ෂය උදෙසා එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට නිකුත් කර ඇති අබලි ලෝහවල එකතුව මිල ප්‍රමාණය?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉන්ෂාෆ් අහමඩ්ට

සාක්ෂිකරුට දැනටමත් C 764 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර : දැන් ඔබට දැන් ඔබ පෙන්නපු ලේඛනයයි ඔබ විසින් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරපු ලේඛනයි සසඳලා බලලා දැන් අර අහපු ප්‍රශ්නේට උත්තර දෙන්න පුළුවන්ද?

පි : ලබා දීමට හැකියි. පිත්තල උණ්ඩ කොපු ලබා දීලා තියෙනවා 2017 වර්ෂයේදී . 2017 වර්ෂයේ 7,804,313.74 ක අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා.

ප්‍ර : 2018 වර්ෂයේ?

පි : 2018 වර්ෂයේදී 72,065,420.52 කඅමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා.

ප්‍ර : 2019 වර්ෂයේ කොපමණ ලබා දීලා තියෙනවද?

පි : 2019 වර්ෂයේදී 9,385,858.81 අමුද්‍රව්‍ය ලබා දීලා තියෙනවා.

ප්‍ර : දැන් මේ එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුගේ කර්මාන්ත ශාලාව ඔබ සඳහන් කළා මේ අවිස්සාවෙල්ල ලිපිනය ඔබ සඳහන් කරනු ලැබුවා.

පි : එහෙමයි.

ප්‍ර : නැවත ලිපිනය කියන්න?

පි : අංක 111A6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර : දැන් එහි කර්මාන්තකරුගේ කර්මාන්තයේ නම ලියාපදිංචි වෙලා තිබෙන්නේ කොලෝසස් කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි : පිළිගන්නවා.

සාක්ෂිකරුට දැනටමත් 758 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර : මහත්මයා දැන් ඔබට පෙන්වන මේ ලේඛනය ඔබ හඳුන ගන්නවද?

පි : හඳුන ගන්නවා.

ප්‍ර : එය එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරු විසින් 2016/2017 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට ඉදිරිපත් කරන ලද අයදුම්පත වශයෙන් ඔබ හඳුන ගන්නවද?

පි : හඳුන ගන්නවා ස්වාමිනි.

ප්‍ර : එහි කර්මාන්තයේ නම කොලෝසස් පෞද්ගලික සමාගම වශයෙනුත් සටහන් වෙනවද?

පි : සටහන් වෙනවා.

ප්‍ර : එහි කර්මාන්තකරු විසින් පුරවා ඇති අදාළ අයදුම්පතේ ලිපිනය වශයෙන් නොම්බර් 37, පරණ යොවුන් වීදිය, කොළඹ 12 වශයෙන් සටහන් වෙනවද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සටහන් වෙලා තියෙනවා.

ප්‍ර : එය පස්සේ එය කපලා වෙනත් අත්අකුරකින් අංක 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය කියලා සටහන් වෙලා තිබෙනවද?

පි : සටහන් වෙලා තිබෙනවා.

ප්‍ර : දැන් එහි මේ අයදුම්කරුගේ පෞද්ගලික තොරතුරු සහ ඒ කර්මාන්තයේ ධාරිතාව සම්බන්ධයෙනුත් සටහන් වෙලා තියෙනවද?

පි : සටහන් වෙලා තිබෙනවා.

ප්‍ර : එසේම එහි කර්මාන්තකරු විසින් ඉල්ලා ඇති අබලි ලෝහ ද්‍රව්‍ය ප්‍රමාණයත් සටහන් වෙලා තිබෙනවද? අංක 12 වශයෙන් කර්මාන්තකරු විසින් ඉල්ලා සිටින අබලි ලෝහ ද්‍රව්‍ය සහ ප්‍රමාණයනුත් සටහන් වෙනවද?

පි : සටහන් වෙලා තියෙනවා.

ප්‍ර : දැන් මහත්මයා එහි තුන්වෙනි පිටුවේ ග්‍රාම නිලධාරීවරයෙකුගේ අත්සනක් සහ නිල මුද්‍රාවක් තිබෙනවා?

පි : තිබෙනවා.

ප්‍ර : ඔබ ඒක ඔබට පෙනී යනවද?

පි : පෙනී යනවා.

ප්‍ර : කොහේ ග්‍රාම නිලධාරී විසින්ද අත්සන් තබලා නිල මුද්‍රාව යොදා තිබෙන්නේ?

පි : ග්‍රාම නිලධාරී කොච්චිකඩේ දකුණ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

ප්‍ර : දැන් මේ කර්මාන්ත ශාලාව කොහේ තිබෙනවයි කියලද හඳුනා ගෙන තිබෙන්නේ මේ කොලෝසස් කියන පෞද්ගලික සමාගම?

පි : 111A6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය

ප්‍ර : ඒ අනුව අදාළ ග්‍රාම නිලධාරී වසම භාර කවර නිලධාරියෙකු විසින්ද මේක සහතික කරන්න ඕනේ?

පි : ඒ අදාළ ලිපිනය සඳහන්

ප්‍ර : මම ඔබට යෝජනා කළොතින් වැල්ලම්පිටිය ග්‍රාම නිලධාරීවරයා විසිනුයි තමන්ගේ ප්‍රදේශයේ මෙවැනි කර්මාන්තයක් තියෙනවා කියලා සහතික කරලා ඉදිරිපත් කළ යුත්තේ කියලා මහත්මයා ඒක පිළිගන්නවද?

පි : වැල්ලම්පිටිය කියන එක මට පිළිගන්න බෑ ස්වාමිනි. ලිපිනයේ සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නිලධාරීවරයා තමයි සටහන් නිරීක්ෂණය කෙරුවේ.

ප්‍ර : දැන් මහත්මයා ඔබ එම්.අයි.ඉන්ෂාෆ් කියන කර්මාන්තකරුගේ කර්මාන්ත ශාලාව මේ කොලෝසස් කියන පෞද්ගලික සමාගමේ

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

කර්මාන්ත ශාලාව පිහිටලා තියෙන්නේ කොහේද කියලා දැන් දන්නවද?

පි : දන්නවා.

ප්‍ර : කොහේද තියෙන්නේ?

පි : වැල්ලම්පිටියේ. අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර : දැන් එතකොට ඔබ සඳහන් කරපු ආකාරයට මේ අයදුම්පතේ නිල මුද්‍රාව සහ අත්සන යොදා තිබෙන්නේ කොච්චිකඩේ දකුණ ග්‍රාම නිලධාරී කියන එක මහත්මයාට පෙනී යනවද?

පි : ඔව් මම නිරීක්ෂණය කරනවා.

ප්‍ර : දැන් එතකොට ඒක නිවැරදිද?

පි : එය නිවැරදි නෑ.

ප්‍ර : දැන් ඊට පස්සේ තියෙනවා නේද ප්‍රාදේශීය ලේකම් කොළඹ කියලා කාංචන ගුණවර්ධන කියලා මහත්මයෙක්ගේ නමක් සහ අත්සනකුත් නිල මුද්‍රාවකුත් තියෙනවද?

පි : එහෙම තියෙනවා මේ සටහනේ .

ප්‍ර : ඒ නිල මුද්‍රවේ ප්‍රාදේශීය ලේකම්, වේල්ලවීදිය, කොළඹ 12 කියලා තියෙනවද නිල මුද්‍රාවේ?

පි : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වේල්ලවීදිය, කොළඹ 12.

ප්‍ර : දැන් ඒ අනුව අදාළ මේ කර්මාන්ත ශාලාව පිහිටි වැල්ලම්පිටිය ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයෙකුගේ අත්සනක් හෝ නිල මුද්‍රාවක් සහතික කිරීමක් මේ අයදුම්පතේ තියෙනවද?

පි : මේ අයදුම්පතේ නෑ.

ප්‍ර : දැන් ඒ අනුව මේක අසම්පූර්ණ නිවැරදි නොවන දත්ත ඇතුළත් අයදුම්පතක් කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවද?

පි : එසේ පිළිගන්නවා.

ප්‍ර : දැන් එසේ වුනත් ඔබ අලෙවි අධ්‍යක්ෂක වශයෙන් රාජකාරී කරන කාලය තුළදී මෙම අයදුම්පත පිළි අරගෙන මෙම එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරු කොලෝසස් පෞද්ගලික සමාගමේ අයදුම්කරුට ලියාපදිංචි කිරීමක් සිදු කර තිබෙනවද?

පි : ලියාපදිංචි කිරීමක් සිදු කර තිබෙනවා.

ප්‍ර : ඒ ලියාපදිංචි සිදු කිරීමෙන් අනතුරුව එකී කර්මාන්තකරුට ඔබේ ආයතනය විසින් අබලි ලෝහ 2017 වර්ෂයට අදාළව නිකුත් කර තිබෙනවයි කියන එකත් ඔබ දැන් පිළිගන්නවද?

පි : නිකුත් කරලා තිබෙනවා.

ප්‍ර : දැන් මේ අසම්පූර්ණ අයදුම්පතකට ඒ ආකාරයේ ලියාපදිංචියක් සිදු කළේ සහ එසේ නිකුත් කළේ ඇයි?

පි : මේ වැරදීම අපි නිරීක්ෂණය කරලා නැහැ අපි අනිත් application වලදීත් ග්‍රාම නිලධාරී කොට්ඨාශය අපිට කොහේත්ම හදුනා

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගැනීමේ හැකියාවක් නෑ. ඒත් මෙතන වේල්ලවීදියේ, කොළඹ 12 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියන එක සඳහන් වෙලා තියෙනවා. අපි ඒත් මේක පිළිබඳ ප්‍රධාන කාරණය විදිහට මෙතන නිරීක්ෂණය කරන්නේ නෑ හැම වේලාවේම. අපි අවධානය යොමු කරන්නේ දිස්ත්‍රික් කාර්යාලය කර්මාන්තයේ අපේ නිලධාරීගේ නිරීක්ෂණය තමයි ඔහු හෝ ඇය ගිහිල්ලා බලලා කරන නිරීක්ෂණය තමයි අපි ඒකට තමයි අවධානය යොමු කරන්නේ. මේකට අවධානය යොමු කරලා නෑ.

ප : දැන් මහත්මයා ඒක හරි ක්‍රමවේදයක්ද?

පි : ක්‍රමවේදයේ වැරදි අපි සාමාන්‍යයෙන් මේ දෙකට අපි අවධානය යොමු කරන්නේ නෑ මොකද අපේ කර්මාන්තයේ අපේ නිලධාරී මේ දෙක බලලා තමයි අපිට එවනවා කියන නිගමනය අපි ඉන්නේ.

ප : දැන් මම ඔබෙන් මුලින් ඇහුවා මේ C 758 කියන මේ ලකුණු කරලා ඉදිරිපත් කරපු අයදුම්පතේ අංක 05 යටතේ එහි තිබෙන ලිපිනය නැවත වැල්ලම්පිටිය අංක 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය කියලා අතින් නැවත ලියලා තියෙනවා. මුලින් සඳහන් කරලා තියෙන ලිපිනය කොළඹ 12 ලිපිනය කපා හැරලා තිබෙනවා?

පි : එහෙමයි.

ප : දැන් ඒ අනුව මෙහි කර්මාන්තය පිහිටි ස්ථානය වශයෙන් වැල්ලම්පිටිය කියලා හඳුනා ගෙන තිබෙනවා?

පි : එහෙමයි.

ප : දැන් හඳුනා ගෙන තිබෙන අවස්ථාවකදී කොළඹ ප්‍රාදේශීය ලේකම්ට තමන්ගේ හෝ කොච්චිකඩේ ග්‍රාම නිලධාරීවරයාට තමන්ගේ ප්‍රදේශයේ පිහිටා නැති කර්මාන්තයක් සම්බන්ධයෙන් සහතික කරලා ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද ඒක සහතික කරලා තිබෙනවා නම් මහත්මයාට ඒ අයදුම්පත පිළිගන්න පුළුවන්ද?

පි : මේක මම නිරීක්ෂණය නොකර කිරීමක් තියෙන්නේ. නිරීක්ෂණය කළා නම් එය එසේ කරන්න මම ඉඩ දෙන්නේ නැහැ එත් අපේ සාමාන්‍ය ක්‍රමවේදය අනුව මේ ග්‍රාම සේවක සහ ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණයන් අපි බලන්නේ නෑ. මොකද අපේ කර්මාන්ත ව්‍යාපෘති නිලධාරී අදාළ ස්ථානයට ගිහිල්ලා බලලා දෙන නිරීක්ෂණයන් තමයි අපි හැම වේලාවේම අවධානයට යොමු කරන්නේ.

දැන් වේලාව : ප.ව.04.15 යි.

මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.04.15
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: දික්වැල්ල මහත්මයා ඒ විදියට තමන් නොසැලකිල්ලෙන් ක්‍රියාකරන්නේ ඇයි හේතුව. තමුන්ට තේරෙනවද ඔතැන කියලා තියෙන එක තේරුම මොකද්ද කියලා. ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහන් කරන්න තියෙන තැන මොකද්ද කියලා තියෙන්නේ ග්‍රාම නිලධාරී සහතික කරන්නේ මොකද්ද කියලා කියන්න බලන්න?

උ: අදාළ ස්ථානයේ මෙවැනි කර්මාන්තයක් තියෙනවා කියලා.

ප්‍ර: එතකොට ග්‍රාම නිලධාරී සහතික කරලා තියෙන දේ වැරදි කියන එක ඔබට තේරෙනවා නේද?

උ: වැරදි කියන එක තේරෙනවා.

ප්‍ර: එතකොට ඔබ ඒක පිළිගන්න අකමැති ඇයි? ඔබ එහෙට මෙහෙට හැරි හැරි ඒක මිදෙන්න හදන්නේ මොකද?

උ: මම පිළිගන්නවා ඒක.

ප්‍ර: එතකොට දැන් අහන්නේ වැරදි විදියට ලේඛනයක් පිළියලා කරලා ඒ වැරදි ලේඛනය මත තමුන් මෙපමණ ප්‍රමාණයක් මේ අබලි ද්‍රව්‍යය නිකුත් කරපු එක නොසැලකිල්ලෙන් ක්‍රියාකරා කියලා පිළිගන්න පුළුවන් ද තමුන්ට?

උ: නොසැලිකිල්ලෙන් ක්‍රියාකරලා තියෙනවා. මං නිරීක්ෂණය කරලා නැතුව නොසැලකිල්ලෙන් කරලා තියෙනවා. ඒක පිළිගන්නවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් මහත්මයා මේ ලේඛනයේ Direct marketing කියලා නිල මුද්‍රාවක් සහිතව 2017/08/22 වන දින Recommend කියලා සටහනක් යොදලා අත්සනක් යොදලා තිබෙනවා ඒ කවුරුන් විසින් ද?

උ: මේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍යය අධ්‍යක්ෂකගේ අත්සන.

ප්‍ර: ඒ කවුද ඒ මහත්මයගේ නම?

උ: නිමල් පෙරේරා මහත්මයා.

ප්‍ර: දැන් ඔබ මීට පෙර සාක්ෂි ලබාදීලා සටහන් කරා 2018 වර්ෂයේ එම්.අයි. ඉන්සාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ඔබේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ආයතනයේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් අබලි ලෝහ ලබාදීලා තිබෙනවයි කියලා ?

ඇ: ලබාදීලා තිබෙනවා.

සාක්ෂිකරුට දැනටමත් C 760 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර: ඔබට පෙන්වන ලේඛනය හඳුනගන්නවද?

ඇ: හඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: එය එම්.අයි. ඉන්සාෆ් අහමඩ් කියලා කර්මාන්තකරුවෙකු 2018 වර්ෂයේ සඳහා ලියාපදිංචිවීමට ඉදිරිපත් කරන ලද අයදුම්පත වශයෙන් ඔබ හඳුන ගන්නවද?

ඇ: හඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: එකී අයදුම්කරුගේ ලියාපදිංචි අංකය අංක 18/ 11226 කියලා කිව්වොත් ඒක නිවැරදිද ?

ඇ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: අදාළ කර්මාන්තකරුගේ පෞද්ගලික විස්තර සටහන් වී තිබෙනව ද?

ඇ: සටහන් වී තියෙනවා.

ප්‍ර: ඉන් අනතුරුව එකී අංක 05 යටතේ කර්මාන්තශාලාවේ නම සහ එය කොහේද පිහිටලා තියෙන්නේ කියලා සටහන් වෙලා තියෙනව ද?

ඇ: සටහන් වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: කොහොමද සටහන් වෙලා තියෙන්නේ?

ඇ: ක්ලෝසස් Private Limited නොම්බර 111 A 06 අවිස්සාවේල්ල පාර වැල්ලම්පිටිය.

ප්‍ර: දැන් පෙර ආකාරයටම එම කර්මාන්තකරුට අවශ්‍ය අබලි ලෝහ ද්‍රව්‍යය ප්‍රමාණයන් ද එහි සටහන් කරලා තිබෙනවද?

ඇ: සටහන් කරලා තිබෙනවා.

ප්‍ර: එහි කොහොම ද සටහන් වෙලා තිබෙන්නේ?

ඇ: තඹ මෙට්ට්‍රික් ටොන් 150 ක් පිත්තල මෙට්ට්‍රික් ටොන් 100 ක් ඇලුමිනියම් මෙට්ට්‍රික් ටොන් 50 ක්.

ප්‍ර: දැන් මෙහි සඳහන් වෙන්නේ මාසයකට මෙම කර්මාන්තකරුට අවශ්‍ය ප්‍රමාණය ?

ඇ: මාසයකට අවශ්‍යය ප්‍රමාණය.

ප්‍ර: එතකොට මේකෙන් වාර්ෂික පරිවැටුම මේ කර්මාන්තශාලාව ඔබට ගණනය කරන්න පුළුවන් නේද?

ඇ: මෙතැනින් වාර්ෂික පිරිවැටුම ගණනය කිරීම අපහසුයි. මේ සම්පූර්ණ 100% ක ධාරිතාවය පිළිබඳ තමයි මේ සඳහන් කරලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ. සාමාන්‍යයෙන් අපේ අත්දැකීම් අනුව මෙපමණ ප්‍රමාණයක් 100% ක ධාරිතාවයෙන් යන්නේ නැහැ.

ප්‍ර: මා ඔබට යෝජනා කරෝතින් කර්මාන්තකරු මේ අයදුම්පතේ සටහන් කරලා තිබෙන ප්‍රමාණය සලකාබැලීමේ දී ඔහු මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙක් කියන සීමාව ඉක්මවා යනවා කියලා කිව්වොත් ඔබ පිළිගන්නව ද?

උ: මේ අයදුම්පත්‍රයේ දී කර්මාන්තයේ පරිමාණය තීරණය කරන කොට තීරණය කරන අවස්ථාවේ දී විශේෂ අවධානය යොමු කරලා තියෙන්නේ සේවක සංඛ්‍යාව. ඊට පසුව තියෙන්නේ පිරිවැටුම. පිරිවැටුම මේකේ සඳහන් කරන්න අවස්ථාවක් නැහැ සඳහන් කරලා නැහැ මේ application එකේ. මේක දිගටම 2017 ඉඳලා එන application එකක් සඳහන් කරලා නැහැ.

ප්‍ර: දැන් ඔබ 2013 මාර්ගෝපදේශකයේ ඔබ හොඳින් පරිහරණය කරලා තියෙනවා කියලා ඔබ කිව්වා ඔබ දැන් මේ මොහොතකට කලිනුත් ඒක කියවලා බැලුවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහිදී මං ඔබට පෙන්වලා දුන්නා සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වර්ගීකරණය කරන නිර්ණායක මොනවද කියලා එකේ සටහන් වෙලා තිබෙනවයි කියලා. ඔබ ඒක කියවලා බැලුවනේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔබ දැන් පිළිගන්නව ද එහි සේවක සංඛ්‍යාව පමණක් නොවේ වාර්ෂික පිරිවැටුමත් නිර්ණායකයක් කියලා කර්මාන්තකරුවෙක් කුමන ගණයට ද වැටෙන්නේ කියලා. හොයලා බලන එක?

උ: ඔව්. එහෙම සොයලා බැලීමක් මා ක්‍රියාත්මක වෙලා තියෙන්නේ දිගටම ක්‍රියාත්මක වූ ආකාරයෙන් කොයි වෙලාවකවත් සොයා බැලීමක් කරලා නැහැ පිරිවැටුම පිළිබඳව. සේවක සංඛ්‍යාව සහ යන නිලධාරියාගේ අත්දැකීම් මත තිබෙන නිරීක්ෂණය මත තමයි ඒ කර්මාන්තය සුළු, කුඩා හෝ මධ්‍යම පරිමාණ කියන එක තීරණය කරලා තියෙන්නේ. ඒ විදියට තමයි දිගටම මා ක්‍රියාත්මක වෙලා තියෙන්නේ . අපිට දැන් මේ application එකේ කොයි වෙලාවකවත් සඳහනක් කරලා නැහැ. පිරිවැටුම සඳහන් කරලා නැහැ.

ප්‍ර: මා ඔබට යෝජනා කරනවා මේ අයදුම්පතේ විශේෂයෙන් පිරිවැටුම සටහන් කරලා නැති වුණාට මාසෙකට මේ කර්මාන්තකරුට ලබාදීලා තියෙන අඛලි ද්‍රව්‍යය ප්‍රමාණය සහ මේ අයදුම්පතේම ඔහු සටහන් කරලා තිබෙන ප්‍රමාණය සලකා බලන කොට ඔබට දැනීමක් තිබිය යුතුයි කියලා මෙම කර්මාන්තකරු

FAIR COMMENT BY JEZEEM

මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවෙකුගේ සීමාව ඉක්මවලා යන කර්මාන්තකරුවෙක් කියලා?

ඌ: මේ සම්පූර්ණ ප්‍රමාණය නිෂ්පාදනය සිදුවෙලා අලෙවිවෙනව නම් ඒ ප්‍රකාශය මා පිළිගන්නවා නිවැරදි කියලා.

සාක්ෂිකරුට නැවතත් දැනටමත් C754 වශයෙන් ලකුණු කර ඇති 2013 නොවැම්බර් මාසයේ මාර්ගෝපදේශක සංග්‍රහය පෙන්වා සිටී.

ප්‍ර: එහි මහත්මයා දැන් එම ලේඛනය ඔබ භාරයේ ඔබ අත තිබෙනවා නේද?

ඌ: මා භාරයේ තිබෙනවා.

ප්‍ර: එහි කර්මාන්ත වර්ගීකරණය සුළු, කුඩා හෝ මධ්‍යම පරිමාණ වශයෙන් වර්ගීකරණය කරන ආකාරයන් නිර්වචනය කරලා වගුගත කරලා තියෙනවා නේද?

ඌ: එසේ තියෙනවා.

ප්‍ර: කොහොමද තියෙන්නේ දැන්.ඔබ මොහොතකට කලිනුත් කිව්වා නැවතත් බලන්න?

ඌ: සුළු පරිමාණ, සේවක සංඛ්‍යාව 10 ට අඩු විය යුතුයි. වාර්ෂික පිරිවැටුම මිලියන 10 ට අඩුවිය යුතුයි. කුඩා පරිමාණ , සේවක සංඛ්‍යාව 10 ත් 50 ත් අතර වාර්ෂික පිරිවැටුම ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ත් 200 ත් අතර. මධ්‍ය පරිමාණ, සේවක සංඛ්‍යාව 51 ත් 200 ත් 600ත් අතර ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 ත් අතර වාර්ෂික පිරිවැටුම.

ප්‍ර: දැන් ඒ වාර්ෂික පිරිවැටුම කියන කොටස සලකා බැලීමේ දී රුපියල් මිලියන 600 කට වැඩි වාර්ෂික පිරිවැටුමක් තිබෙනව නම් එම කර්මාන්තකරු මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙක් ගණයට වැටෙන්නේ නැහැනේද?

ඌ: මේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව වැටෙන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔබෙන් අහන්නේ නැවතත් ඔබේ අවධානය යොමු කරනවා C 760 කියලා ලකුණු කරලා ඉදිරිපත් කරපු ලේඛනය. ඒ කියන්නේ එම්.අයි. ඉන්සාෆ් අහමඩ් කියන කර්මාන්තකරු 2018 වර්ෂයේ ලියාපදිංචියට ඉදිරිපත් කරපු අයදුම්පත. ඒ අයදුම්පතේ සඳහන් කරුණු අනුව දැන් ඔබට පෙනී යනව ද මේ කර්මාන්තකරු මධ්‍යම පරිමාණකරුවෙකුගේ නිරිණායක වලට වැටෙන්නේ නැහැ කියලා?

ඌ: සේවක සංඛ්‍යාව අනුව වැටෙනවා. මේ කියන ප්‍රමාණය නිෂ්පාදනය වෙලා අලෙවි කරොත් ඒක මිලියන 600 ට ඉක්මවා යනවා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබම මීට පෙර ගරු කොමිෂන් සභාව ඉදිරියේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් නිකුත් කරපු ප්‍රමාණයන් අබලි ලෝහ ප්‍රමාණයනුත් සම්බන්ධයෙනුත් සාක්ෂි ලබා දුන්නා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ අබලි ලෝහ ප්‍රමාණය සලකා බලන කොටත් මේ කර්මාන්තකරු මධ්‍යයම පරිමාණ කර්මාන්තකරුවෙකුට වඩා වැඩි නිෂ්පාදන ධාරිතාවක් වාර්ෂික පිරිවැටුමක් තිබෙන කර්මාන්තකරුවෙක් කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

උ: එසේ පිළිගැනීමට නොහැකියි ස්වාමීනි.

ප්‍ර: ඇයි ඒ?

උ: 2017 වර්ෂයේ අපි ලබාදීලා තිබුණේ මිලියන 78 ක ප්‍රමාණයක්. ඊට පස්සේ 2018 වර්ෂයේ සමාවෙන්න මිලියන 78 2018 වර්ෂයේ. මගේ ළඟ එකතු කිරීම් නැහැ. ඒ නිසා මට ප්‍රකාශ කරන්න අමාරුයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හරි මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. මාර්ගෝපදේශ මාලාවේ සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත තීරණය කිරීමේ දී නිර්ණායකයක් තියෙනවා නේද සේවක සංඛ්‍යාව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ එතකොට ඒ නිර්ණායක වලට අනුව කුඩා කර්මාන්ත වලට වැටීමට සේවක සංඛ්‍යාව කීයකට වඩා අඩුවෙන් තියෙන්න ඕනද?

උ: 10 ත් 50 ත් අතර.

ප්‍ර: කුඩා?

උ: කුඩා පරිමාණ 10 ත් 50 ත් අතර.

ප්‍ර: සුළු?

උ: සුළු පරිමාණ 10 ට අඩුවෙන්න ඕන අවශ්‍යයි.

ප්‍ර: එතකොට මධ්‍යම වෙන්නේ?

උ: මධ්‍යම වෙන්නේ 51 ත් 200 ත් අතර.

ප්‍ර: දැන් ඔබ කියන හැටියට මේ ග්ලොසොස් සමාගම සමඟ කාර්මික සංවර්ධන මණ්ඩලය ගනුදෙනු කෙරුවේ එම සමාගම කුමන කර්මාන්තයක් වශයෙන් සලකලාද?

උ: මුල් ලියාපදිංචියේ නම් ඒක කුඩා කර්මාන්තයක් විදියට යන්නේ. සේවක සංඛ්‍යාව තමයි අපි ප්‍රධාන වශයෙන් බලලා තියෙන්නේ. සේවක සංඛ්‍යාව එක්

ප්‍ර: ඒ කියන්නේ 2017 වර්ෂයේ දී?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: 2017 වර්ෂයේ. 2017 වර්ෂයේ සේවක සංඛ්‍යාව ස්වාමීනි 25, 30, 37 යි ඉඳලා තියෙන්නේ. එතකොට කුඩා පරිමාණ කර්මාන්තයක 10 ත් 50 ත් අතර ඉන්න පුළුවන්. එතකොට 2018 වර්ෂයේ දී

ප්‍ර: නෑ නෑ අවුරුද්දෙන් අවුරුද්ද ගමු. 2017 වර්ෂයේ දී කාර්මික සංවර්ධන මණ්ඩලය ඔය ක්ලෝසස් සමාගම සමඟ ගනුදෙනු කෙරුවේ ඔවුන් මොන ගණයේ කර්මාන්තයක් ලෙස සලකලාද?

උ: අපි ගනුදෙනු කළේ මධ්‍ය පරිමාණ කර්මාන්තයක් විදියට.

ප්‍ර: ඒ කියන්නේ 2017 වර්ෂයේ දී?

උ: 2017 වර්ෂයේ දී.

ප්‍ර: ඔබ ගනුදෙනු කළේ ඔවුන් මධ්‍යම පරිමාණයේ ?

උ: එහෙම හිතලා තමයි ගනුදෙනු කළේ. ඒත් මෙතැන නිරීක්ෂණය කරන කොට ඒක වැටෙන්නේ අපේ මේකත් එක්ක කුඩා කර්මාන්ත විදියට.

ප්‍ර: ඒ කියන්නේ නිවැරදිව වැටෙන වනම් වැටෙන්න ඕන මොකද්ද?

උ: නිවැරදිව වැටෙනව නම් අපි නිරීක්ෂණය කරනවා කුඩා කර්මාන්ත විදියට.

ප්‍ර: නමුත් ගනුදෙනු කෙරුවේ මධ්‍යම පරිමාණ කර්මාන්තයක් විදියට?

උ: මධ්‍යම පරිමාණ කර්මාන්තයක් කියන නිරීක්ෂණය යටතේ.

ප්‍ර: එතකොට ඒක හරිද?

උ: එය නිවැරදි නැහැ.

ප්‍ර: වැරදියි?

පි: වැරදියි.

ප්‍ර: ඇයි ඒ විදියට වැරදි විදියට ගනුදෙනු කෙරුවේ කෙලෝසස් සමාගම සමඟ?

උ: අපි කර්මාන්තය නිරීක්ෂණය කරලා තියෙනවා. සහ මම දිස්ත්‍රික් කාර්යාලයක අවුරුදු 17 ක් විතර වැඩකරලා තියෙනවා. ඒ නිසා මං කර්මාන්ත නිරීක්ෂණයට යනවා පරීක්ෂනයට යනවා. ඒ තියෙන අත්දැකීම් එක්ක අපිට දැනිච්ච දෙයක් තමයි පොඩි ඒවගේ මට්ටම මේ ආකාරයෙන් සහ කුඩා සුළු අය ස්වයං රැකියා මට්ටම කියනවා වගේ මට්ටම. ඉතිං මේකේ සේවක සංඛ්‍යාව සහ ඒගොල්ලෝ කරන ක්‍රියාවලියත් එක්ක මධ්‍ය පරිමාණ මට්ටම කියන නිරීක්ෂණයේ තමයි අපි හිටියේ.

ප්‍ර: දැන් ඔය අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතිය වැඩ කටයුතු සිදුවෙන්න ඕන ඔය මාර්ගෝපදේශ සංග්‍රහය අනුව නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: තමන්ගේ අත්දැකීම් අනුව නෙමේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: අපිට ස්වාමීනි දැන් කර්මාන්ත මේ සේවක සංඛ්‍යාව අනුව තමයි අපි විශේෂ නිරීක්ෂනය කරන්නේ. ඒ එක්කම අපේ අත්දැකීමත් ප්‍රයෝජනයට ගන්නවා.

ප්‍ර: අහන ප්‍රශ්නයට උත්තර දෙන්න. ඔය අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතියට නිර්ණායක තීරණය කිරීම කෙරුවේ ඔබද?

උ: නැහැ මම නෙවෙයි ස්වාමීනි.

ප්‍ර: කවුද තීරණය කළේ? අමාත්‍ය මණ්ඩලයද?

උ: අමාත්‍යය මණ්ඩලය.

ප්‍ර: එතකොට අමාත්‍ය මණ්ඩලයෙන් තීරණය කරපු නිර්ණායක වලට පිටින් ඔබට ගනුදෙනු කරන්න පුළුවන් ද?

උ: එසේ කළ නොහැකි.

ප්‍ර: එතකොට මේ අවස්ථාවේ දී ඔබ ක්‍රියා කරලා තියෙන්නේ ඒකට පිටතින් නේද?

උ: අපි ක්‍රමවේදය අනුව දිගටම කරගෙන ඇවිල්ලා තියෙන විදියට අපි නිරීක්ෂණය කරපු විදියට කරලා තියෙනවා. ඒ කියන්නේ සේවක සංඛ්‍යාවෙන්. අපි ඒත් මධ්‍ය පරිමාණ විදියට තමයි මේ කර්මාන්තය නිරීක්ෂණය කරලා තියෙන්නේ.

ප්‍ර: ඒ කර්මාන්තය කොයි ගණයට ද වැටෙන්න ඕන ද කියලා තිරණය කරන නිර්ණායක කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරලා තිබ්බනේ?

උ: අනුමත කරලා තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඒ නිර්ණායක අනුව ඔබ කටයුතු කෙරුව නම් 2017 වර්ෂයේ දී ග්ලෝසොස් සමාගම කොයි පරිමාණයේ කර්මාන්තයක් වශයෙන් ද ඔබ සැලකිය යුත්තේ?

උ: එය අපි සලකා බලන නිර්ණායකය අනුව නම් කුඩා කර්මාන්තයක්.

ප්‍ර: අප කියන නෙමේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරපු නිර්ණායක අනුව එය මොකක්ද?

උ: කැබිනට් මණ්ඩලයේ අනුමත කරපු නිර්ණායක අනුවත් අපිට දීලා තිබෙන දත්ත අනුවත් මේ කර්මාන්තය කුඩා කර්මාන්තයක් විදියට තමයි නිරීක්ෂණය කරන්න පුළුවන්.

ප්‍ර: නිරීක්ෂණය කරන්න පුළුවන් ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: 2017 වර්ෂයේ දී කාර්මික සංවර්ධන මණ්ඩලය ග්ලෝසොස් සමාගම සමඟ ගනුදෙනු කෙරුවේ මොන පදනමකින් ද?

උ: ඒත් අපි ගනුදෙනු කෙරුවේ මධ්‍ය පරිමාණ කර්මාන්තයක් ආකාරයට.

ප්‍ර: එය හරිද වැරදිද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඌ: එය නිවැරදි නැහැ. වැරදි.

ප්‍ර: 2018 වර්ෂයේ ?

ඌ: 2018 වර්ෂයේ මධ්‍ය පරිමාණ කර්මාන්තයක් ආකාරයෙන් අපි ගනුදෙනු කළේ.

ප්‍ර: ඒ කියන්නේ 2017, 2018 දෙකේම මධ්‍යම පරිමාණය හැටියට තමා ?

ඌ: අපි ගනුදෙනු කළේ.

ප්‍ර: එතකොට මාර්ගෝපදේශ සංග්‍රහයේ තිබෙන නිර්ණායකයන් දෙක අනුව 2018 වර්ෂයේ දී ග්ලෝසොස් සමාගම මොන ගණයට ද වැටිය යුත්තේ?

ඌ: ඒ අනුව නම් මහා පරිමාණයේ. 2018 වර්ෂයේ.

ප්‍ර: 2018 නම්,

ඌ: මේ තියෙන දත්ත සේවා සාධාරන නම් සේවක සංඛ්‍යාව අනුව නම් මධ්‍ය පරිමාණ. 2018 ත්.

ප්‍ර: පරිවැටුම අනුව?

ඌ: පිරිවැටුම අනුව මේ කියන පරිවැටුම තිබුණොත් අපි නිරීක්ෂණය කරලා නැහැ ඒ පරිවැටුම. ඒ පිරිවැටුමත් නිරීක්ෂණය කරානම් එය මහ පරිමාණ විය යුතුයි සත්‍යය නම්.

ප්‍ර: එතකොට මහා පරිමාණ කර්මාන්ත වලට මේ අඛලි ද්‍රව්‍යය ව්‍යාපෘතියේ ප්‍රතිලාභය ලබා ගන්න පුළුවන් ද?

ඌ: මහා පරිමාණ කර්මාන්තයට ලබාදිය නොහැකි. මේ Guide Line එක අනුව.

ප්‍ර: Guide Line එක අනුව ලබාදිය නොහැකි?

ඌ: නොහැකියි.

ප්‍ර: නමුත් 2018 වර්ෂයේ දී ඔබ ග්ලෝසොස් සමාගමට ඒ ප්‍රතිලාභ ලබාදීලා තියෙනවා?

ඌ: ලබාදීලා තියෙනවා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් කර්මාන්තකරුවන්ට යම් කිසි සහන මිලකට නේද මේ අඛලි ලෝහ ද්‍රව්‍යය ලබාදීම සිදුකරනු ලබන්නේ?

ඌ: සහන මිලකට ලබාදෙන්නේ.

ප්‍ර: ඒ සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට එසේ සහන මිලට ලබාදෙන්නේ ඔවුන්ගේ කර්මාන්ත වැඩිදියුණු කරලා ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවය වැඩිකර ගැනීම සඳහා රජයෙන් කරන යම්කිසි සහනයක් කියලා කිව්වොත් ඒක නැවැරදිද ?

ඌ: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් එතකොට මහා පරිමාණ කර්මාන්තකරුවෙකුට එය ලබාදෙනව නම් එයින් කාර්මික සංවර්ධන මණ්ඩලය බලාපොරොත්තු වන ඒකේ පරමාර්ථ ඉෂ්ඨ වෙනව ද?

උ: Guide Line එක අනුව ඉෂ්ඨ වෙන්නේ නැහැ. Guide Line එකේ තියෙන පරාමාර්ථ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මේ විදියට වැරදි විදියට ඔබට වැඩ කරන්න කියලා කවුරුහරි ඔබට උපදෙස් දුන්න ද?

උ: එහෙම උපදෙස් දීමක් වුණේ නැහැ. මේ වගේ එකක් කරන්න කියලා සභාපතිතුමාගේ තියෙනවා උපදෙස්.

ප්‍ර: කාගේ උපදෙස්ද තියෙන්නේ?

උ: සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේත් මේ පිළිබඳ උපදෙස් තිබෙනවා. යම් යම්

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියන්නේ මේ විදියට මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතිය කටයුතු කරලා තියෙන්නේ කාගේ හරි උපදෙස් මත කියල ද?

උ: මේ ආයතනය ලියාපදිංචි කිරීම පිළිබඳව උපදෙස් නැහැ එහෙම. ඒත් ලබාදීපු ප්‍රමාණ පිළිබඳව උපදෙස් තිබෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ක්ලෝසස් සමාගමට අබලි ද්‍රව්‍යය ලබාදීම සම්බන්ධයෙන් ඔබට උපදෙස් දුන්නා කවුරු හරි?

උ: උපදෙස් තියෙනවා.

ප්‍ර: කවුද ඒ උපදෙස් දුන්නේ?

උ: අධ්‍යක්ෂ ජනරාල් සමහර අවස්ථාවලදී දීලා තියෙනවා.

ප්‍ර: නම් කරන්න?

උ: අධ්‍යක්ෂ ජනරාල් පී.එල්.ඒ. රත්නමලල මහත්මයා. හිටපු සභාපතිතුමා. මහින්ද ජිනසේන මහත්මයා.

ප්‍ර: මොකක්ද ඔවුන් දුන්නු උපදෙස්?

උ: ලබාදෙන්න දැන් මේ වෙලාවේ අවස්ථාවේ දී ඉල්ලුම් කරන ප්‍රමාණ. විශාල ප්‍රමාණයක . යම්කිසි ප්‍රමාණයක. වැඩි ප්‍රමාණයක් අපි තීරණය නොකළ යුතු ප්‍රමාණයක්. ඒ කියන්නේ අපේ මට්ටමෙන් . ඒ වගේ වේලාවක උපදෙස් ලබාදීලා තියෙනවා.

ප්‍ර: තමන්ගේ මට්ටමෙන් ලබාදිය නොහැකි ප්‍රමාණයට ප්‍රමාණයක් ලබාදෙන්න කියලා ඔබට උපදෙස් ලබා දුන්නා.

උ: උපදෙස් ලබා දීලා තියෙනවා.

ප්‍ර: ඒ උපදෙස් ලබාදුන්නේ කවුද?

FAIR COMMENT BY JEZEEM

උ: අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ සභාපතිතුමා.

ප්‍ර: ඔබ කලින් නම් කරපු පුද්ගලයන් දෙදෙනා ද?

උ: ඔව්.

ප්‍ර: එම උපදෙස් ලබාදුන්නේ ලිඛිතව ද වාචිකව ද?

උ: ලිඛිතව ලබාදීලා තියෙනවා.

ප්‍ර: කෝ ඒ උපදෙස්?

උ: මේ ලිපි ගොනුවේ තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: කියන්න. ඔය ලිපි ගොනුවේ තිබෙන කරුණු මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශ දෙන වෙලාවේ ලබා දුන්න ද?

උ: මේවා ලබා දුන්නා මා අත්සන් කෙරුවා ඒ ලිවුම්වලට.

ප්‍ර: ලබාදීලා තියෙනවා?

උ: ඔව්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: මහත්මයගෙන් අහන්නේ මේක පොලිස් ඒකකයට ලබාදුන් පිළිතුරක් නේද?

උ: පොලිස් ඒකකයේ ලබා දුන්නා. මා විසින් ලබාදුන්නේ නැහැ. කලින් ලබාදීලා මගෙන් අත්සන ලබාගත්තා. ස්වාමීනි මට මතක විදියට මං අත්සන් කරා මේවට.

ප්‍ර: දැන් ඔබ පෙන්වන්නේ ක්ලෝසස් සමාගමේ කළමණාකරු විසින් අත්සන් කරලා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපියක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබෙන් මේ ගරු සභාපතිතුමා ඔබෙන් ඇහුවේ ඔබෙන් ඒක නෙමේ. ඔබෙන් ඇහුවේ ක්ලෝසස් සමාගමට ඒ ආකාරයට සාමාන්‍යය නිර්ණායක නැත්නම් සාමාන්‍යයෙන් මාර්ගෝපදේශනයේ තිබෙන ප්‍රතිපාදන වලට පටහැනිව ක්‍රියාකරලා ක්ලෝසස් සමාගමට අබලි ද්‍රව්‍යය ලබා දෙන්න කියලා ඔබට ලිඛිතව උපදෙස් දීලා තියෙනව ද කියලා?

උ: ලිඛිතව උපදෙස් දීලා නැහැ. ලබාදෙන ප්‍රමාණ වලට උපදෙස් දීල තියෙනවා. මේ වගේ ප්‍රමාණ ලබා දෙන්න කියලා. ලබාදෙන ප්‍රමාණ වලට උපදෙස් ලබාදීලා තිබෙනවා. අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ සභාපතිතුමා.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මෙම උපදෙස් ලබා දුන්නේ ලිඛිතව ද?

උ: ලිඛිතව ලබාදීලා තිබෙනවා. ක්ලෝසස් ආයතනය ඉදිරිපත් කළ ලිපි වලින් .

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් ඒ ලිපියේ තිබෙන්නේ ඔබ මේ යම්කිසි සටහනක් යොදලා තියෙනවා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ සටහන යොදලා තිබෙන්නේ මිස්ට දික්වැල්ල කියලා ඒ ඔබට?

උ: එහෙමයි.

ප්‍ර: ඒ ලිපියේ තිබෙන්නේ එෆ්.එන්. ඒ කියලා?

උ: එහෙමයි.

ප්‍ර: දැන් මේක ද ඔබ කියන්නේ මේ අනුමැතිය දුන්නයි කියලා?

උ: ඊට යටින් තියෙනවා සභාපතිතුමා approve කරපු එකක්. අනුමත කරපු එකක්.

ප්‍ර: දැන් ඔබ මේ අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නේ ග්ලෝසොස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිතව අධ්‍යක්ෂක ජනරාල් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත එවන ලද ලිපියක්?

උ: එහෙමයි.

ප්‍ර: මෙම ලිපියේ ක්ලෝසස් සමාගමේ මුද්‍රාව යොදලා එහි කළමණාකරු වශයෙන් පුද්ගලයෙක් අත්සන් කරලා තියෙනවා?

උ: එහෙමයි.

ප්‍ර: මේ ලිපිය ඉංග්‍රීසියෙන් තියෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඉංග්‍රීසි භාෂාවෙන් තියෙන්නේ. ඒ ලිපියේ තියෙන්නේ මෙක්ට්‍රික් ටොන් 15 ක් Artillery mortar Shells ඒ කියන්නේ පිත්තල කොපු ලබාගැනීම සම්බන්ධයෙන් ?

උ: කාලතුවක්කු උණ්ඩ ලබා ගැනීම සම්බන්ධයෙන්.

ප්‍ර: දැන් එහි දී මෙම ක්ලෝසස් සමාගමේ කළමණාකරු විසින් ඉල්ලා සිටිනවා මේ ලිපියෙන් කාලතුවක්කු පිත්තල උණ්ඩ මෙක්ට්‍රික්ටොන් 15 ක් ඔවුන්ට ලබාදෙන්න කියලා?

උ: එහෙමයි.

ප්‍ර: එම ලිපිය ඔබ වෙත යම්කිසි සටහනක් යොදලා නිලධාරීන් දෙදෙනෙක්ගේ සටහන් තිබෙනවා?

උ: එහෙමයි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

DPP 03 වශයෙන් මෙම ලිපිය ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් සාක්ෂිකරු මෙම ලිපියේ කවුද ඔබට යම් කිසි සටහනක් යොදලා තිබෙන්නේ?

උ: අධ්‍යක්ෂක ජනරාල්තුමා යොදලා තිබෙනවා.

ප්‍ර: මොකක්ද යොදලා තිබෙන සටහන?

උ: FNA කියන සටහන දලා තියෙන එකේ For necessary action කියන එක.

ප්‍ර: තව කිව්වා තවත් නිලධාරියෙක්. ඒ නිලධාරියා අත්සන් කරලා තියෙනව ද අධ්‍යක්ෂක ජනරාල්තුමා?

උ: අත්සන් කරලා තියෙනවා.

ප්‍ර: එතුමගේ අත්සන ඔබ හඳුනගන්නව ද?

උ: හඳුනගන්නවා.

ප්‍ර: තවත් නිලධාරියකුගේ සටහනක් තියෙනවා කියලා ඔබ කිව්වා?

උ: ඔව්. ඒ සභාපතිතුමාගේ.

ප්‍ර: කොහොමද හඳුනගන්නේ ඒ සභාපතිතුමාගේ සටහන කියලා?

උ: ඒ සභාපතිතුමාගේ අත්සන ඒ කියන්නේ අපිට පුරුදුයි කෙටි අත්සන.

ප්‍ර: කවුද සභාපතිතුමා කියන්නේ. නම කියන්න?

උ: මහින්ද ජිනසේන මහත්මයා.

ප්‍ර: දැන් ඒ ඔබ සඳහන් කරන ලිපියේ තියෙන්නේ එක් අවස්ථාවකදී පිත්තල උණ්ඩ මෙක්ට්‍රික් ටොන් 15 ක් ලබාදීම සම්බන්ධයෙන් අනුමැතියක් ලබාදුන්න ලිපියක් පමණයි කියලා කිව්වොත් ඒක හරිද?

උ: දැන් මේ තිබෙන්නේ ඒ අනුමැතිය පමණයි.

ප්‍ර: ඊට අමතරව ඔබට ලිඛිතව උපදෙස් ලබාදිලා තිබෙනව ද?

උ: ලිඛිතව උපදෙස් ලබාදීලා නැහැ.

ප්‍ර: දැන් මහත්මයා මෙහි සටහනක් තිබෙනවා මිස්ට දික්වැල්ල ඔබ කිව්වා මේකේ FNA කියලා සටහන් කරලා තියෙනවා. ඉන්පස්සේ අත්සනක් තියෙනවා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ අත්සන ඔබ කාගේ අත්සන වශයෙන් ද හඳුනගන්නේ?

උ: FNA යටින් තිබෙන

ප්‍ර: FNA අකුරු තුනට පස්සේ තිබෙන අත්සන කාගේද?

උ: එය අධ්‍යක්ෂක ජනරාල්තුමාගේ P.L.U. රත්නමලල මහත්මයගේ.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මේ අවස්ථාවේ දී සාක්ෂිකරුගෙන් ප්‍රශ්න විමසන්නේ ඔහුට DPP 03 දරණ ලේඛනය පෙන්වීමෙන් බව සටහන් කර තබමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

එම අත්සන DPP 03 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

DPP 03 දරණ ලේඛනය නැවත සාක්ෂිකරුට පෙන්වා සිටි.

ප්‍ර: දැන් ඔබ හඳුනගත්ත අත්සනට පස්සේ තව සටහනක් සහ අත්සනක් තිබෙනවා?

උ: එහි තිබෙන්නේ approved කියන වචනය ඉංග්‍රීසියෙන්. එහි අත්සන් කරලා තියෙන්නේ මහින්ද ජිනසේන හිටපු සභාපතිතුමා.

ප්‍ර: ඒ අත්සන ඔබ හඳුනාගන්නව ද?

උ: මා හඳුනගන්නවා.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එවකට සභාපති මහින්ද ජිනසේන යන අයගේ අත්සන තිබෙන ඒ සටහන DPP 03B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මීට අමතරව ඔබට ලිඛිතව තවත් උපදෙස් දීලා තිබෙනව ද?

උ: ලිඛිතව එක් එක් අවස්ථාවල් වලදී ලබාදෙන්න ඕන ප්‍රමාණ පිළිබඳ උපදෙස් ලබාදීලා තිබෙනවා.

ප්‍ර: ඒ ලේඛන ඔක්කොම ඉදිරිපත් කරන්න කොමිෂන් සභාවට.

උ: මේකේ තියෙනවා ෆයිල් එකේ ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් ලබාදෙන ලද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිත සහ එකී සමාගමේ මුද්‍රාව යටතේ අධ්‍යක්ෂක වශයෙන් අත්සන් කර කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරන ලද ලිපිය DPP 04 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මේ ලිපියෙන් මොකද්ද මහත්මයා ඔබට ලැබෙන උපදෙස?

උ: එයින් මේ ලිපිය ඉල්ලීමක් කරලා තිබෙනවා ටොන් 25 ක් මෙක්ට්‍රික් ටොන් 25 ක් ඉල්ලීම් කරලා තිබෙනවා. ඒකේ

Registered Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙහි නැවතත් තිබෙන්නේ මෙක්ට්‍රික් ටොන් 25 ක් කාලතුවක්කු පිත්තල කොපු ලබාගැනීම සම්බන්ධයෙන් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

උ: එය නිවැරදියි.

ප්‍ර: ඒ අනුව කාලතුවක්කු පිත්තල කොපු මෙක්ට්‍රික් ටොන් 25 ක් ලබාදෙන ලෙසට ක්ලෝසස් සමාගමේ අධ්‍යක්ෂකවරයා විසින් සභාපති කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් සිදුකරන ලද එකී ඉල්ලීමට ක්‍රියාකරන්න කියලා ඔබට යම්කිසි උපදෙසක් ලැබිලා තිබෙනව ද?

උ: ලැබිලා තිබෙනවා. ඒ ප්‍රමාණය අනුමත කරලා සභාපතිතුමා.

ප්‍ර: මේ ලිපියේ කොහිද ඒක තිබෙන්නේ? පෙන්වන්න පුළුවන් ද?

උ: මෙතැන Approved කියලා සඳහන් කරලා තියෙනවා.

2018 මාර්තු 27 දරණ එකී ලිපිය DPP 04 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මේ Approved කියන තැන අත්සනක් තිබෙනව ද දිනයක් තිබෙනොා ද ඒ අත්සන ඔබ හඳුනගන්නවද?

උ: හඳුනගන්නවා.

ප්‍ර: කාගෙද?

උ: එයා සභාපතිතුමාගේ.

ප්‍ර: ඒ කියන්නේ නම ?

උ: හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන මහත්මයා.

එකී සාක්ෂිකරු විසින් පෙන්වා දෙනු ලැබූ එකී අත්සන DPP 04A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: සාක්ෂිකරු ඔබ ගරු කොමිෂන් සභාවට මේ අවස්ථාවේ දී තවත් ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. එය අධ්‍යක්ෂක අලෙවි වෙත නියෝජ්‍ය අධ්‍යක්ෂක කොළඹ දිස්ත්‍රික්කයේ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද ලිපියක් කිව්වොත් ඒක හරිද?

උ: ඒක නිවැරදියි.

ප්‍ර: එය මේ ඔබේ ආයතනය තුළ තිබෙන අභ්‍යන්තර සටහන් පත්‍රිකාවක්?

උ: අභ්‍යන්තර සටහන් පත්‍රිකාවක්.

ප්‍ර: එහි සඳහන් වෙලා තිබෙන්නේ ක්ලෝසස් පෞද්ගලික සමාගමට විදුලි ට්‍රාන්ස්ෆෝමර් 150 ක් පමණ ලබාදෙන්න සුදුසුයි කරලා කරන ලද නිර්දේශයක්?

උ: එහෙමයි.

ප්‍ර: එය සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 07 තමයි ඒ අභ්‍යන්තර පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙන්නේ?

උ: එහෙමයි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එහි තිබෙන මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා ඔබට යම්කිසි උපදෙසක් ලබාදීලා තියෙනව ද?

උ: ලබාදීලා තියෙනවා.

ප්‍ර: කවුරුන් විසින් ද?

උ: හිටපු සභාපතුමා විසින්.

ප්‍ර: ඔහුගේ අත්සනක් තිබෙනව ද?

උ: අත්සනක් තිබෙනවා.

ප්‍ර: දිනයක් තිබෙනව ද?

උ: දිනයක් තිබෙනවා.

ප්‍ර: කවදද දිනය?

උ: 2018/09/17 විදියට තමයි සඳහන් වෙන්නේ.

මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද මෙම ලිපිය DPP 05 වශයෙනුත් මෙම සාක්ෂිකරු විසින් පෙන්වාදෙනු ලැබූ එවකට සභාපති වශයෙන් කටයුතු කළ නිලධාරියාගේ අත්සන DPP 05A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

සාක්ෂිකරු විසින් තවත් ලිපියක් ඉදිරිපත් කරලැබ තිබෙනවා. එකී ලිපියේ දිනය 2018 මාර්තු 19 වැනි දින එයත් ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිතව සහ එහි අධ්‍යක්ෂකගේ අත්සන සහ මුද්‍රාවක් සහිත ලිපියක් එම ලිපිය තිබෙන්නෙත් කාලතුවක්කු පිත්තල උණ්ඩ මෙක්ට්‍රික් ටොන් 25 ක් ලබාගැනීම සම්බන්ධයෙන් සභාපති, කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් සිදු කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් මෙම ලිපිය DPP 06වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: එහි DD Marketing Approved කියලා අත්සනක් සහ දිනයක් තිබෙනවා ඒ අත්සන ඔබ හඳුනගන්නව ද?

උ: අත්සන හඳුනාගන්නවා.

ප්‍ර: මේ අත්සන කාගේද ?

උ: ඒ අත්සන සභාපතිතුමා.

ප්‍ර: නම කියන්න සභාපතිතුමාගේ?

උ: හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන මහතා.

අදාළ ලිපිය 2018 මාර්තු 19 වන දින දරණ ලිපිය DPP 06 ලෙසත් සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එවකට සභාපතිගේ අත්සන DPP 06A ලෙසත් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

සාක්ෂිකරු විසින් තවත් ලිපියක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එහි දිනය 2018 මාර්තු 21. එය ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂයක ලිපියක් එහි අධ්‍යක්ෂක වශයෙන්

FAIR COMMENT BY JEZEEM

අත්සනක් සහ මුද්‍රාවක් තබා තිබෙනවා. එහි අධ්‍යක්ෂක ජනරාල් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ට්‍රාන්ස්පෝමර් මිලට ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද ඉල්ලීමක් එහි ඔවුනට අදාළ ක්ලෝසස් සමාගමට අදාළ අමුද්‍රව්‍යය හිඟයක් පවතින බැවින් කොපර් වයර් ලබාදීම සම්බන්ධයෙනුයි තිබෙන්නේ එසේම එහි ලිපිය අවශ්‍ය නම් අද කාර්මික සංවර්ධන නිලධාරී මණ්ඩලයේ නිලධාරීන්ට තමන්ගේ ආයතනයට පැමිණ එය පරීක්ෂා කර බැලීමට හැකියාවක් ඇති බවට ද එකී ලිපියේ සටහන් වෙනවා.සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද මෙම ලිපිය 2018 මාර්තු 21 දරණ ලිපිය DPP 07 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. නැවත සාක්ෂිකරුට එම ලිපිය පෙන්වා සිටිනවා.

ප්‍ර: එහි පැති සටහනක් තිබෙනවා. ඒ සටහන කවුරුන් විසින් ද යොදලා තිබෙන්නේ?

උ: ඒ සටහන හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන මහත්මයා අත්සන් කරපු ලිපියක්.

ප්‍ර: කාටද සටහන යොදලා තිබෙන්නේ?

උ: එහි ඇමතීමක් කරලා නැහැ.

ප්‍ර: ඔබට ලිපිය ලබාදුන්න ද?

උ: මා වෙත ලබා දුන්නා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කවුද ලබා දුන්නේ?

උ: සභාපතිතුමා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ නම කියන්න?

උ: මහින්ද ජිනසේන මහතා.

ප්‍ර: මොනවද ඒ ඔබට ලබාදුන්නු උපදෙස් ලිඛිත?

උ: මේ උපදෙස් ලබාදීලා තියෙන්නේ 2018/04/11 වැනි දිනට පෙර ඒ ට්‍රාන්ස්ෆෝමර් ඉවත් කරගන්න ඕන. ඒ නිසා ඒ ට්‍රාන්ස්ෆෝමර් ප්‍රමාණයෙන් 75% ක් ක්ලෝසස් ආයතනයටත් 25% ක් අනෙකුත් ට්‍රාන්ස්ෆෝමර් ලබාගැනීම සඳහා ලියාපදිංචි වෙලා ඉන්න අයට ලබාදෙන්න කියලා.

ප්‍ර: එහි අවසානයේ එම නිලධාරියා ඔහුගේ අත්සන යොදා තිබෙනව ද?

උ: අත්සන යොදා තිබෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අත්සන ඔබ හඳුනාගන්නවද?

උ: මා හඳුනගන්නවා.

ප්‍ර: කාගේ වශයෙන් ද?

උ: හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා.

මෙම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී අත්සන DPP 07 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයට කියන්න පුළුවන් ද ඇයි මේ ග්ලෝසොස් සමාගමට මේ සම්පූර්ණ ට්‍රාන්ස්ෆෝමර් ප්‍රමාණයෙන් 75 % ක් ලබාදෙන්න කියලා නිර්දේශ කරලා තිබෙන්නේ කියලා?

උ: ඔය ට්‍රාන්ස්ෆෝමර් පිළිබඳ මට මතකයක් තිබෙනවා. ඒ ට්‍රාන්ස්ෆෝමර් තුල්හිරිය මට මතක හැටියට තුල්හිරිය විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කරපු ට්‍රාන්ස්ෆෝමර් 438 ක්. ඒ ට්‍රාන්ස්ෆෝමර් ඉවත් කරගන්න කියලා අපිට ලිඛිතව දැනුම් දුන්නා. ඒ ලිඛිතව දැනුම් දීමේ දී දින යොදලා තිබුණා. අපිට මං හිතන්නේ සතියක් හෝ දෙකක් තිබුණේ. ඒ සතිය තුළ ට්‍රාන්ස්ෆෝමර් ගන්න Register වෙලා ඉන්න අය ලියාපදිංචි වෙලා ඉන්නේ 09 දෙනයි. ඒ 09 දෙනාටම ඒ ප්‍රමාණය ගන්න බැහැ කියන තීරණය මත ඒ කියන්නේ ලොකු මුදලක් වියදම් කරන්න වෙනවා. ඒ මත අපි අලෙවි අංශය විදියට කිව්වේ අපි මේ ප්‍රමාණය නොගෙන ඉම්මු කියලා. ඒ කියන්නේ අපේ අයට විකුණ ගන්න බැහැ. ඒ නිසා ඒවා සලකා බලලා මට මතකයි සභාපතිතුමා සහ අධ්‍යක්ෂක මුදල් දෙදෙනාම සාකච්ඡා කරලා මේක ලබාගත යුතුයි කියන තීරණයේ ඉඳලා මේ ප්‍රමාණය ඔය විදියට බෙදලා දෙන්න කියලා කිව්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ නිර්දේශ කරා මේක ගන්න එපා කියලා?

උ: අපි කිව්වේ ගන්න එපා කියලා මොකද මේක අපි ඉන්න අයට දෙන්න අමාරුයි. ඒගොල්ලොන්ට ගන්න බැහැ. අපි විමසලා බැලුවා. ඒගොල්ලොන්ට මේ දවස් කිහිපය ඇතුළත මේගොල්ලොන්ට ගන්න බැහැ. මං හිතන්නේ මිලියන 35 ක විතර ප්‍රමාණයක ට්‍රාන්ස්ෆෝමර්.

ප්‍ර: දැන් ඔය DPP 07 කියන ලේඛනයේ දිනය කවද්ද ?

උ: 2018 මාර්තු මස 21.

ප්‍ර: 2018 වර්ෂය වන විට ඔබ කලින් පිළිගත්තා ක්ලෝසස් පුද්ගලික සමාගමට මේ අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතියෙන් මේ අබලි ද්‍රව්‍යය ලබාගැනීමට සුදුසුකම් තිබ්බේ නැහැ කියන එක?

FAIR COMMENT BY JEZEEM

ඔව් Guide Lineඑක අනුව නැහැ.

ප්‍ර: මාර්ගෝපදේශ අනුව ඔවුන්ට ඒ ?

උ: මාර්ගෝපදේශ සංග්‍රහය සහ ඔවුන්ගේ Turnover එක ඒ කියන්නේ පිරිවැටුම සත්‍යය නම් අපි ඒක බලලා නැහැ. එය සත්‍යය නම් සුදුසු නැහැ.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

සාක්ෂිකරු විසින් තවත් ලිපියක් ඉදිරිපත් කරනු ලබනවා. එහි දිනය උතුමාණනි 2018 මාර්තු 05. එය ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිත ලිපියක්. එහි අධ්‍යක්ෂක වශයෙන් අත්සනක් යොදා තිබෙනවා. එසේම එහි නිලමුද්‍රාවක් යොදා තිබෙනවා. මෙම ලිපියෙන් ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂකවරයා විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් විසින් කාලතුවක්කු පිත්තල කොපු මෙට්‍රික් ටොන් 25 ක් ලබා දීම සම්බන්ධයෙන් සිදුකරන ලද ඉල්ලීමක්. මෙම ලිපිය 2018 ජනවාරි 05 වන දින දරණ මෙම ලිපිය DPP 08 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරනු ලබනවා. එකී ලිපිය නැවත සාක්ෂිකරුට ලබාදෙනවා පරීක්ෂාවට.

ප්‍ර: දැන් එහි යම්කිසි උපදෙසක් සටහනක් යොදා තිබෙනව ද?

උ: අධ්‍යක්ෂ ජනරාල් විසින් මට සඳහන් කරලා තියෙනවා. FNA For necessary action තියලා ගහලා.

ප්‍ර: අත්සනක් තිබෙනව ද? අත්සන හඳුනගන්න පුළුවන් ද?

උ: අත්සන හඳුනගන්නවා.

ප්‍ර: කාගේද?

උ: අධ්‍යක්ෂක ජනරාල්තුමාP.L.U. රත්නමලල මහත්මයා.

මෙම සාක්ෂිකරු විසින් පෙන්වා දෙනු ලැබූ එකී අත්සන DPP 08 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුට DPP 07 දරණ ලේඛනය පෙන්වයි නැවත.

ප්‍ර: දැන් ඔය DPP 07 දරණ ලේඛනයෙන් ක්ලෝසස් පුද්ගලික සමාගම සභාපතිට ලියන්නේ ට්‍රාන්ස්ෆෝමර් ගැන සඳහන් කරලා නේද?

උ: ට්‍රාන්ස්ෆෝමර් ගැන සඳහන් කරලා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ක්ලෝසස් සමාගම ඔය ට්‍රාන්ස්ෆෝමර් ගැන දැනගන්නේ කොහොම ද?

උ: ඒක මා දන්නේ නැහැ ස්වාමීනි. මීට කලිනුත් ලිපියක් එවලා තියෙනවා.

ප්‍ර: නෑ නෑ දැන් කාර්මික සංවර්ධන මණ්ඩලය ලංකා විදුලි බල මණ්ඩලයෙන් මේ ට්‍රාන්ස්ෆෝමර්ස් ගන්න පුළුවන් කියන තොරතුර දන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලය විතරයිනේ?

උ: අපිට තමයි ලිපියකින් දැනුම් දෙන්නේ.

ප්‍ර: ඔබටනේ දැනුම් දෙන්නේ?

උ: දැනුම් දෙන්නේ අපිට.

ප්‍ර: ඔබ ඒක පිට අයට දැනුම් දෙන්නේ නැහැනේ?

උ: නැහැ කොයි වෙලාවකවත් නැහැ.

ප්‍ර: එතකොට ඔබට ට්‍රාන්ස්ෆෝමර් ලැබෙන බව ක්ලෝසස් private සමාගම දැනගන්නේ කොහොමද?

උ: ඒක මට ප්‍රකාශ කිරීමට අපහසුයි ස්වාමීනි. ඒත් අපි කර්මාන්තකරුවන්ගෙන් විමසනවා. අපි ට්‍රාන්ස්ෆෝමර් ලබාගන්නවා. ඒගොල්ලොන්ට අපි දැනුම්දෙනවා.

ප්‍ර: නමුත් ඔබ මීට ඉස්සෙල්ලා කිව්වනේ ඔය ට්‍රාන්ස්ෆෝමර්ස් ලබාගැනීම ඔබ නිර්දේශ කෙරුවේ නැහැ කියලා?

උ: නිර්දේශ නොකළේ අපේ ට්‍රාන්ස්ෆෝමර් ලබාගන්න අය මේ පිළිබඳව එතරම් උනන්දුවක් දැක්කේ නැහැ. ඉක්මන්ට ගන්න.

ප්‍ර: ඒ කියන්නේ ඔබ ඔබගේ ලියාපදිංචි අයගෙන් ඇහුවද ට්‍රාන්ස්ෆෝමර්ස් ඕනද කියලා?

උ: ඇහුවා.

ප්‍ර: ඒ කියන්නේ DPP 08 දරණ ලේඛනයට පෙර ?

උ: ඊට කලින් ඇහුවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

සාක්ෂිකරු උතුමාණනි තවත් ලිපියක් ඉදිරිපත් කරනු ලබනවා. එය 2017 නොවැම්බර් 06 වැනි දින දරණ ලිපියක් . එය ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂයක් සහිතව එහි කළමණාකරුගේ අත්සන සහ නිල මුද්‍රාවක් සහිත ලිපියක්. එහිදී ද පාවිච්චි කරන ලද ට්‍රාන්ස්ෆෝමර්ස් මිලදී ගැනීමක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපියක්. මෙම ලිපිය DPP 09 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. සාක්ෂිකරුට එම ලිපිය නැවත ලබා දෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔය ලිපියේ තිබෙන්නේ පාවිච්චි කරන ලද ට්‍රාන්ස්ෆෝමර්ස් මිලදී ගැනීමට සිදුකරන ලද ඉල්ලීමක්?

උ: එහෙමයි.

ප්‍ර: එම ලිපිය ඔබ අතට පත්වුණාද ?

උ: මා අතට පත් වුණා.

ප්‍ර: කවුරුන් විසින් ද ලබාදුන්නේ?

උ: සභාපතිතුමා විසින්.

ප්‍ර: එහි සභාපතිතුමා විසින් යම්කිසි උපදෙසක්?

උ: උපදෙසක් supply as copper users කියලා සඳහන් කරලා තිබෙනවා.

ප්‍ර: මොකක්ද?

උ: supply as copper users

ප්‍ර: එහි අත්සනක් තිබෙනව ද?

උ: අත්සනක් තිබෙනවා.

ප්‍ර: අත්සන හඳුනාගන්නව ද?

උ: අත්සන හඳුනාගන්නවා.

ප්‍ර: කාගේද?

උ: හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන. මා කලින් සඳහන් කළ ලිපිය මෙයයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද ඔබ කලින් සඳහන් කරා කියන්නේ. පැහැදිලි කරන්න?

උ: කලිනුත් අපෙන් ට්‍රාන්ස්ෆෝමර්ස් මේ ගොල්ලෝ ඉල්ලා තියෙනවා. ඔය ලිපියට කලින්. මේකට ලබාදීලා නැහැ.

ප්‍ර: මේකට?

උ: ට්‍රාන්ස්ෆෝමර් අපි ලබාදීලා නැහැ ඒ කාලේ.

ප්‍ර: කොහොමද ඔබ තීරණය කලේ ලබාදීලා නැහැ කියලා?

උ: අපි දුන්නේ නැහැ ලබාදීපු ලේඛනත් එක්ක සසඳලා බලලා කියන්න පුළුවන්.

ප්‍ර: මෙම ඉල්ලීම අනුව කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ඔබ කියන්නේ මේ ට්‍රාන්ස්ෆෝමර්ස් ලබාදුන්නේ නැහැ කියලා?

උ: ඔය ලිපියට ලබාදුන්නේ නැහැ.

ප්‍ර: මේ ලිපිය කරන ලද ඉල්ලීම මත ලබා දුන්නේ නැහැ?

උ: ලබා දුන්නේ නැහැ.

ප්‍ර: මේ අත්සන ඔබේ එවකට සිටි සභාපති මහින්ද ජිනසේන මහතාගේ අත්සන කියලා ඔබ හඳුනාගත්තා?

උ: හඳුනගන්නවා.

මේ අවස්ථාවේ දී මෙම DPP 09 A වශයෙන් ලකුණු කර ඉදිරපත් කරනු ලබනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු විසින් තවත් ලිපියක් ඉදිරිපත් කරනු ලැබ තිබෙනවා. එම ලිපිය 2017 දෙසැම්බර් 17 දින දරණ ලිපියක්. එය ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිත ලිපියක්. එය අත්සන් කර තිබෙන්නේ අධ්‍යක්ෂක ක්ලෝසස් සමාගම වශයෙන්. මුද්‍රාවකුත් තබා තිබෙනවා. එය කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත කාලතුවක්කු පිත්තල කොපු මෙට්‍රික් ටොන් 25 ක් ලබාගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද ලිපියක්. මෙම ලිපිය DPP10 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. සාක්ෂිකරුට නැවත ලිපිය පෙන්වා සිටී.

ප්‍ර: මේ ලිපියේ සටහනක් සහ අත්සනක් තිබෙනවා. එය කාගේද? ඔබ හඳුනගන්නවාද?

උ: මා හඳුනගන්නවා. ඒ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතාගේ.

ප්‍ර: සටහනේ කුමක්ද තියෙන්නේ?

උ: Please issues as per badge production

ප්‍ර: මේ ඉල්ලීම අනුව නිකුත් කරනු ලැබුව ද භාණ්ඩ?

උ: ඒ ඉල්ලීම අනුව නිකුත් කෙරුවා.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී අත්සන DPP10 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

සාක්ෂිකරු විසින් තවත් ලිපියක් ඉදිරිපත් කර සිටී. එකී ලිපියේ දිනය 2017 ඔක්තෝම්බර් 24 වන දින මෙය ද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිත ලිපියක්. එකී සමාගමේ කළමණාකරු විසින් අත්සනක් සහ මුද්‍රාවක් යොදා තිබෙනවා. එය සටහන් වෙන්නේ Underground Copper cable ටොන් 05 ක් ලබාගැනීම සම්බන්ධයෙන්. කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක වෙත සිදුකරන ලද ඉල්ලීමක්. මෙම ලිපිය DPP 11 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. සාක්ෂිකරුට එකී ලිපිය පෙන්වා සිටිනවා.

ප්‍ර: මෙම ලිපියේ සටහනක් සහ අත්සනක් තිබෙනවා. එය ඔබ හඳුනගන්නව ද කාගේද?

උ: මා හඳුනගන්නවා. හිටපු සභාපති මහින්ද ජිනසේන මහත්මයගේ අත්සනක්.

ප්‍ර: මොකද්ද ඔබට ලබාදීල තිබෙන උපදෙස?

උ: Tech assessment done by IDA Team. Eligible. Approved කියලා.

ප්‍ර: මොකක්ද ඒක සිංහලෙන් පැහැදිලි කරන්න. මොකද්ද ඒ උපදෙස කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: තාක්ෂණික කමිටුවේ assessment එකේ හැටියට මේ ඒ කියන්නේ මේක යෝග්‍යයි දෙන එක කියන එක තමයි දීලා තියෙන්නේ. තාක්ෂණික කමිටුවක් ගිහිල්ලා නිරීක්ෂණය කරා මේ කර්මාන්තය.

ප්‍ර: ඒ අනුව ලබාදීමක් සිදුකරනු ලැබුවද? මොකන්ද මේ Underground Cable කියලා තියෙන්නේ?

උ: Underground Cable කියන්නේ විදුලි බල මණ්ඩලයෙන් ඉවත් කරන භූගත රැහැන්. එහි තඹ තියෙනවා. තඹ ප්‍රමාණය ඒ රැහැන් කිලෝ එකක බර තඹ තියෙන්නේ 41% යි. ඒ සම්පූර්ණ ප්‍රමාණය තමයි අපි විකුණන්නේ.ඒ කියන්නේ ගලවලා විකුණන්නේ නැහැ. සම්පුර්ණ ප්‍රමාණය ඒක ඇතුළේ තිබෙනවා PVC තියෙනවා නයිලෝන් තිබෙනවා,ඒවත් එක්ක සම්පූර්ණ බර තියෙනවා. ඒකෙන් 41% ක් තමයි ඒ ඇතුළේ තඹ තියෙන්නේ. ඒක තමයි Underground Cable කියන්නේ.

ප්‍ර: දැන් මේක නිකුත් කරනු ලැබුව ද?

උ: නිකුත් කරනු ලැබුවා.

ප්‍ර: මේ අත්සන ඔබ හඳුනගන්නවද එකී ලිපියේ?

උ: ඔව්. සභාපති

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී ලිපියේ සටහන් එවකට සභාපති මහින්ද ජිනසේන යන අයගේ අත්සන DPP11 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

සාක්ෂිකරු තවත් ලිපියක් ඉදිරිපත් කරනු ලබනවා. එය 2017 සැප්තැම්බර් 21 දින දරණ ලිපියක්. එයද ක්ලෝසස් පෞද්ගලික සමාගමේ ලිපි ශීර්ෂය සහිතව එහි Account ගණකාධිකාරී විසින් අත්සන් තබා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපියක්. එහි සඳහන් වෙන්නේ කිලෝ 50 ක කාලතුවක්කු පිත්තල උණ්ඩ කොපු ලබාදීමක් සම්බන්ධයෙනුයි මෙම ලිපිය DPP12 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා මෙම DPP11 වශයෙන් ලකුණු කරපු ලිපියේ සටහන් කිහිපයක් තිබෙනවා. මෙහි එක් සටහනක් තිබෙනවා Mr. දික්වැල්ල FNA කියලා FNA අකුරු තුන සටහන් කරලා අත්සනක් ඒ කාගෙද අත්සන?

උ: ඒ අත්සන අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ. පී.එල්.යූ. රත්නමලල මහත්මයගේ.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී අත්සන DPP12 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබට පෙනෙනවද ඒ 12 A කියලා ලකුණු කරපු සටහනට යටින් තවත් සටහනක් තිබෙනවා. ඒ කවුරුන් විසින් යොදා ඇති සටහනක් ද කාගේ අත්සන ද?

උ: එකක් තිබෙනවා සභාපතිතුමාට මා විසින් ඉදිරිපත් කරපු මෙම ආයතනය සාම්පල් ලෙස පිත්තල උණ්ඩ කොපු කිලෝග්‍රෑම් 50 ක් ඉල්ලා ඇති අතර එම ප්‍රමාණය ලබාදීමට අනුමැතිය පතමි.

ප්‍ර: ඔබේ සිංහල අත්අකුරෙන් ලියලා තියෙන සටහනක් ද?

උ: ඔව් මගේ අත්අකුරෙන්.

ප්‍ර: ඔබ අත්සන් තබා තිබෙනව ද එම සටහනේ

උ: අත්සන් තබා තිබෙනවා.

ප්‍ර: කවදද ඔබ දිනය දාලා තිබෙන්නේ?

උ: 2017/09/28

සාක්ෂිකරු විසින් එකී ලිපියේ යොදා ඇති එකී සටහන DPP12 B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: ඒ ඔබේ සටහනට ඉදිරියෙන් තවත් සටහනක් තිබෙනවා නේද?

උ: තවත් සටහනක් තිබෙනවා.

ප්‍ර: ඒ මොකද්ද තිබෙන සටහන කවුරුන් විසින් ද යොදලා තිබෙන්නේ. කවුද අත්සන් කරලා තියෙන්නේ?

උ: මා වෙත සඳහන් කරලා තියෙන්නේ. අනුමත කරලා අත්සන් යොදලා තියෙන්නේ. හිටපු සභාපතිතුමා මහින්ද ජිනසේන.

සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී සටහන DPP12 C වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

දැන් සාක්ෂිකරු විසින් තවත් එක් ලේඛනයක් ඉදිරිපත් කරනු ලබනවා. එය 2017 ඔක්තෝම්බර් 04 දින දරණ ලේඛනයක්. එයද ක්ලෝසස් පෞද්ගලික සමාගම ලිපි ශීර්ෂය සහිත ලිපියක්. එහි අධ්‍යක්ෂක වශයෙන් නිල මුද්‍රාවක් සහ අත්සනක් යොදා තිබෙනවා. එම ලිපිය කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙතින් ඉල්ලා තිබෙන්නේ කාලතුවක්කු උණ්ඩ පිත්තල කොපු මෙට්‍රික් ටොන් 05 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද ඉල්ලීමක් මෙම ලිපිය DPP13 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා. සාක්ෂිකරුට එකී ලිපිය නැවත පෙන්වා සිටිනවා.

ප්‍ර: සාක්ෂිකරු දැන් ඒ ලිපියේ තවත් සටහනක් තිබෙනවා නේද?

උ: සටහනක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: කවුරුන් විසින් ද එහි සටහන යොදා තිබෙන්නේ?

උ: අධයක්ෂ ජනරාල් පී.එල්.යූ. රත්නමලල මහත්මයා.

ප්‍ර: කාටද සටහන් යොදලා තිබෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: සභාපතිතුමාට.

ප්‍ර: මොන භාෂාවෙන්ද සටහන් යොදලා තියෙන්නේ ?

උ: ඉංග්‍රීසියෙන් යොදලා තියෙන්නේ.

ප්‍ර: ඔබට ඒක කියවන්න පුළුවන් ද?

උ: කියවන්න පුළුවන්. (කියවයි.)

ප්‍ර: දැන් එය යම්කිසි අනුමැතියකට යටත්ව නිර්දේශ කරලා තිබෙනවා නේද ඒක ලබාදෙන්න කියලා?

උ: නිර්දේශ කර තිබෙනවා. සභාපතිතුමාට නිර්දේශ කරලා තිබෙනවා.

ප්‍ර: දැන් ඒ සටහන යටින් අත්සනක් තියෙනවා ඔබට පේනවද ඔබ ඒක හඳුනගන්නවද?

උ: අත්සනක් තියෙනවා එය හඳුනගන්නවා.

ප්‍ර: ඒ කාගේද?

උ: අධ්‍යක්ෂක ජනරාල් පී.එල්.යූ. රත්නමලල මහත්මයා.
එකී සටහන හා අත්සන DPP13 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ මේ කොමිෂන් සභාව විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු සපයමින් තමා මේ DPP 03 සිට DPP13 දක්වා ලේඛන ඉදිරිපත් කෙරුවේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කිව්වා ඔබ ක්ලෝසස් පුද්ගලික සමාගමට මේ අබලි ද්‍රව්‍යය නිකුත් කිරීමේ දී ඒ සඳහා හිටපු සභාපති ජිනසේන මහතා සහ අධ්‍යක්ෂක ජනරාල් රත්නමල්ල මහතා ඔබට විටින් විට උපදෙස් ලබාදුන්නා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒවා සනාථ කිරීම සඳහා තමයි ඔබ මේ ලේඛන DPP 03 ඉඳලා 13 වෙනකන් ඉදිරිපත් කලේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ඉදිරිපත් කරපු ලේඛන 10 යේ?

උ: එහෙමයි.

ප්‍ර: කරන ලද ඉල්ලීම් වලට අනුව ඒ කී අවස්ථාවක ඒ ඉල්ලීම සැපයුවාද ? කී අවස්ථාවක ඒක දුන්නෙ නැද්ද?

උ: පොඩ්ඩක් ඉන්න.

උ: ඒ 13 න් අවස්ථා 02 ක් තියෙනවා. එකක් තමයි කාර්මික සංවර්ධන කොළඹ දිස්ත්‍රික්කයේ

FAIR COMMENT
BY JEZEEM
President's Secretary's Copy

සාක්ෂිකරුට DPP 03 සිට 13 දක්වා වූ ලේඛන පෙන්වයි.

ප්‍ර: ඔය ලේඛන බලලා කියන්න කොයි අවස්ථාවේ දී ද ඒ ඉල්ලීම ඉටුකෙරුවේ නැත්තේ කියලා. ලේඛනයට යොදලා තියෙන අංකය භාවිතා කරලා කියන්න?

උ: DPP 05 කියන අංකය යටතේ

ප්‍ර: ලබාදුන්නේ නැහැ?

උ: එතැන ස්වාමීනි නියෝජ්‍යය අධ්‍යක්ෂක කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ නිමල් පෙරේරා මහත්මයා විසින් එවලා තියනවා ක්ලෝසස් ආයතනයට ට්‍රාන්ස්ෆෝමර් 150 ක් නිර්දේශ කරලා. ඒ වුණාට ඒක නිර්දේශ කෙරුවට ඒ නිර්දේශයන් අනුව ඒ වෙලාවේ ලබා දුන්නේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ DPP 05 දරණ ඉල්ලීම සභාපතිවරයා අනුමත කරලා තිබ්බත් ඒක ලබා දුන්නේ නැහැ?

උ: ඔව් නිර්දේශ කරලා තියෙනවා ලබාදෙන්න ඉස්සරහට. ඒ නිසා ඒ වෙලාවේ ලබාදුන්නේ නැහැ. ඒ ආසන්නයේ ලබා දුන්නේ නැහැ.

වේලාව:ප.ව. 05.15
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.5.15
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
මෙතන් සිට ල/ලේ : නිල්මිණි

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නමුත් එම ලිපිය පදනම් කරගෙන ඊට පස්සේ ලබලා දුන්නද?
පි: ලිපිය පදනම් කරලා 2019 දී ලබාදුන්නා?
ප්‍ර: එතකොට DPP 5 දරන ලිපිය කවද්ද ලියලා තියෙන්නේ?
පි: 2018 සැප්තැම්බර් 07 වෙනිදා.
ප්‍ර: ඒක පදනම් කරගෙන 2019 දී දුන්නා?
පි: 2019
ප්‍ර: 2019 කොයි කාලෙද දුන්නේ?
පි: 2019 මුල් මාසයේ ජනවාරි වල.
ප්‍ර: හරි එතකොට වෙන එතකොට ඇත්ත වශයෙන්ම ඒකට ලබාදීලා තියෙනවානේ? ඒ ඉල්ලීම අනුව පසුකාලයක හරි?
පි: ඔව් පසු කාලයක.
ප්‍ර: කොහෙත්ම ලබා දුන්නේ නැති ඉල්ලීමක් තියෙනවද?
පි: 2017 DPP 9 එහි සඳහන් වෙනවා Request to purchase used transformer මේ ලිපියට ලබා දුන්නේ නැහැ.
ප්‍ර: කොහෙත්ම ලබා දුන්නේ නැහැ?
පි: මේ ලිපියට කොහෙත්ම ලබා දුන්නේ නැහැ. ඊට පස්සේ ලිපියකට තමයි ලබාදුන්නේ ස්වාමීනි.
ප්‍ර: එතකොට ලිපි 10 කින් 9ක් සඳහා කරන ලද ඉල්ලීම් ලබාදීලා තිබෙනවා?
පි: ලබාදීලා තියෙනවා.
ප්‍ර: දැන් ඔබ මේ ඉදිරිපත් කරපු ලිපි DPP 3 සිට 13 දක්වා ලිපි ඔබ කියනවනේ සමහරක් හිටපු සභාපතිවරයා අනුමත කරලා එව්වා, සමහරක් අධ්‍යක්ෂක ජෙනරාල්වරයා අනුමත කරලා එව්වා කියලා?
පි: එහෙමයි ස්වාමීනි.
ප්‍ර: දැන් මෙම අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතියේ ඉන්නවනේ වෙනත් ලියාපදිංචි කර්මාන්තකරුවන්?
පි: එහෙමයි ස්වාමීනි.
ප්‍ර: ඔවුන්ගෙන් මේ විදියට සභාපතිවරයා හෝ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් අනුමත කරලා එවපු ලිපි තියෙනව ද?
පි: එසේ දැන් මා ළඟ නැහැ. ඒත් 2018 වර්ෂයේ එහෙම ලිපි තියෙනව ද කියලා මට මතකයක් නැහැ. 2018 වර්ෂයේ අපි ලබාදීමක් කරලා

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා වෙන අයෙකුට. සුළු කර්මාන්තකරුවන්ට එහෙම ලිපි ඉදිරිපත් කරන්නෙත් නැහැ එහෙම ලබාදීලා නැහැ.

ප්‍ර: සුළු කර්මාන්තකරුවන්ට එහෙම ලිපි ඉදිරිපත් කිරීමක් කරන්නෙත් නැහැ සභාපතිවරයා අනුමත කිරීමක් කරන්නේත් නැහැ?

පි: ඔව්. එහෙම ලබාදීලා නැහැ අනුමත කරන්නවත්

ප්‍ර: කුඩා?

පි: සුළු සහ කුඩා ඒවා දිලා නැහැ.

ප්‍ර : එතකොට සුළු සහ කුඩා කොහෙත්ම ලිපි දීලා නැහැ?

පි: එහෙමදීලා නැහැ. මට මගේ මතකයේ අනුව නම් එහෙම දීලා නැහැ කොයි වේලාවෙවත්.

ප්‍ර: ඔබගේ කාලය තුළ?

පි: ඔව්, එහෙමයි ස්වාමීනි .

ප්‍ර: එතකොට මේ මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ගැන තමයි දැන් ඉතුරුවෙලා තියෙන්නේ කතාකරන්න?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් කිසිවෙකු විසින් මෙවැනි ලිඛිත ඉල්ලීමක් කරලා ඒක සභාපතුමා විසින් අනුමත කරලා තිබුණ ද?

පි: මීට අමතරව 2018 වර්ෂයේ මධ්‍යය පරිමාණ වර්ගයේ කර්මාන්කරුවෙක් ඇවිල්ලා සාකච්ඡාවක් තියලා එකේ දී ඒ අයට අමුද්‍රව්‍යය ලබාදෙන්න කියන ඉල්ලීමක් තියෙනවා.

ප්‍ර: ඒක අනුමත කරා සභාපතිවරයා?

පි: ඒක Meeting එකක් තියලා . එහි Minuets තියෙනවා.

ප්‍ර: මොන රැස්වීමක්ද?

පි: එතැන හිටියා සභාපතිතුමා, අධ්‍යක්ෂක ජෙනරාල්තුමා , මම සහ මගේ තව officer කෙනෙක් ඉන්නවා. සහ මණ්ඩලයේ ලේකම් හිටියා.

ප්‍ර: කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලේකම්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේ දී ඒ සියළුදෙනමා රැස්වීමක් තියලා තමා ඒ ඉල්ලීමට දෙනවද නැද්ද කියලා තීරණය කෙරුවේ?

පි: ස්වාමීනි ඒ ප්‍රමාණයක් ඒ වේලාවේ දෙන්න නෙමෙයි. එයාට ලබාදෙන්න ඕන කියන ඉල්ලීම තිබුණා. ලබාදෙන්න ඕන කියන තත්ත්වයේ තමයි කතා කෙරුවේ. එතැන කතා කෙරුවේ Minuets තමයි තියෙන්නේ.

ප්‍ර: එතැන යම් තීරණයක් ගත්තා?

පි: ගත්තා. ඒ ඔහු මට මතක නැහැ ඔහු ඒ වන කොට ඔහු ලියාපදිංචි වෙලා හිටියද කියලා. ලියාපදිංචි වීමෙන් පස්සේ ලබාදුන්නා.

ප්‍ර: ඔබ ඒ කියන්නේ එක් අවස්ථාවක් ගැනනේ.

පි: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් ගැන දැන් ඔබ ඉදිරිපත් කරපු DPP 3 ඉඳලා 13 දක්වා ලේඛන එවලා තියෙන්නේ කර්මාන්තකරු කෙලින්ම සභාපතිට නැත්නම් අධ්‍යක්ෂ ජනරාල්ට ලියනවා ඔවුන් ඔබට උපදෙස් දෙනවා.

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එවැනි ක්‍රමවේදයක් අනෙක් මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් සිදුවුණාද?

පි: මගේ මතකයේ හැටියට එහෙම නැහැ.

ප්‍ර: එවැනි ක්‍රියාදාමයක් සිදුවුණේ කොලොසස් සමාගම සම්බන්ධයෙන් විතරයි?

පි: ඔව්. ක්ලෝසොස් සමාගම සහ අර එක්.

ප්‍ර: අර එක් නමුත් ඒ අර අනිත් අවස්ථාව ඔබ කිව්වනේ සියළුදෙනා සාකච්ඡා කරලා තීරණයක් ගත්තා කියලා?

උ: Meeting එක තියලා ලබාදීපු උපදෙස් තමයි තියෙන්නේ.

ප්‍ර: කොලොසස් සමාගමට එහෙම රැස්වීම තියලා තීරණ ගත්ත ද?

පි: මගේ මතකයේ හැටියට එහෙම රැස්වීමක් නැහැ.

දැන් වෙලාව: ප.ව.5.25
කොමිෂන් සභාවේ කටයුතු 5.45 වන තෙක් කල් තබනවා.

****

දැන් වේලාව: ප.ව.6 .00
තේ විවේකයන් පසු
ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැනටමත් C – 764 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී. දැන් මහත්මයා ඔබට දැන් පෙන්වන ලේඛනය සහ ඔබ කළින් ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා බැලීමේ දී 2018 වර්ෂයේ දී අනිකුත් ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන්ට ලබා දී ඇති ලෝහ අඹලි ප්‍රමාණය සහ කොලොසස් පෞද්ගලික සමාගමට නිකුත් කර ඇති ලෝහ අඹලි ප්‍රමාණය සළකා බැලීමේ දී මුළු ධාරිතාවෙන් 30% ක ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් කොලොසස් සමාගමට නිකුත් කරලා තියෙනවා කිව්වොත් ඒක පිළිගන්නවද?

පි: ස්වාමීනි 2018 වර්ෂයේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පිත්තල මුළු ප්‍රමාණයෙන් 30% ක වැඩි ප්‍රමාණයක් ලබා දීලා තිබ්බා කියලා කිව්වොත් ඒක පිළිගන්නවද ඔබ?

පි: මේ ලේඛනය අනුව නම් මම පිළිගන්නවා.

ප්‍ර: ඒ ලේඛනය ගැන විතරක් නෙමෙයි. දැන් මහත්මයා භාරයේ තිබෙනවනේ එක් එක් කර්මාන්තකරුවන්ට ඒ වර්ෂයේදී නිකුත් කරපු ලෝහ අබලි ද්‍රව්‍ය පිත්තල ප්‍රමාණය තියෙනවානේ. ඒ ලේඛන මත මම මහත්මයාගෙන් අහන්නේ?

පි: සියයට මට ප්‍රශ්නය පැහැදිලි නැහැ ඒක.

ප්‍ර: නැවතත් අහන්නම් ඔබෙන්. මම ඔබෙන් ඇහුවොතින් 2017.08 වෙනි මාසේ 01 වෙනිදා ඉඳලා 2018.04 මාසේ 28 දක්වා කාලය තුළ පිත්තල කර්මාන්තකරුවන්ට නිකුත් කිරීමේ දී ඒ කර්මාන්ත ඔබේ ආයතනය සතුව තිබිච්චි මුළු ප්‍රමාණයෙන් 30%කට වැඩි ප්‍රමාණයක් එකම කර්මාන්තකරුවෙකුට එනම් කොලොසස් පුද්ගලික සමාගමට නිකුත් කරා කියලා කිව්වොත් ඒක ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේ දී සාක්ෂිකරුට දැනටමත් C – 762 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටි. ඒ ලේඛනය 2018.06.19 දින දරන නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වෙත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන විසින් ඉදිරිපත් කර ලද අභ්‍යන්තර විගණන විමසුම් ලිපියක්. එම ලිපිය ඔබ හඳුන ගන්නවද?

පි: හඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: එය ඔබ වෙත අභ්‍යන්තර විගණක විසින් ඔබ වෙත නිකුත් කරන ලද ලිපියක් කියලා ඔබ හඳුන ගන්නවද?

පි: ඔව්. හඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ අභ්‍යන්තර විගණක විසින් ඔබ වෙත කොලොසස් පෞද්ගලික සමාගමට පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කර ගන්න තමයි මේ විමසුම ඉදිරිපත් කරලා තියෙන්නේ කියලා කිව්වොත් ඒක පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ ලිපියේ තියෙන්නේ මේ කොලොසස් පෞද්ගලික සමාගමට පිත්තල නිකුත් කිරීම පිළිබඳ විමසුමක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ ලිපියේ පළවෙනි කරුණ වශයෙන් තියෙන්නේ 2017.11.17 වන දින එම ආයතනයට පිත්තල 15,000kgක් ලබා දීමට නිර්දේශ කරලා තිබුණත් ලියාපදිංචි කර්මාන්තකරුවන්ගේ ලේඛනයේ ඒ බව ඇතුලත්ව නොතිබීම සහ ඔවුන්ගේ වාර්තාව මතින් කර්මාන්තකරුගේ තෘප්තිමත් අවශ්‍යතාව පිළිබඳ වාර්තා කර නොතිබීම යන්න සම්බන්ධයෙන් කියලා සටහන් වෙලා තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙම සටහන් වෙලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ ලිපියට ඔබ පිළිතුරු ලිපියක් ඇරියද?

පි: පිළිතුරු ලිපියක් යැව්වා ස්වාමීනි.

ප්‍ර: සාක්ෂිකරුට C – 763 ලේඛනය පෙන්වා සිටී. දැන් මොකක්ද ඔබේ ඒ විගණක විමසුමට මොකක්ද ඔබේ පිළිතුර වුණේ ඔබ මේකට පිළිතුරු බඳින්න ඇතිනේ?

පි: පිළිතුරු බැඳලා තියෙනවා.

ප්‍ර: මොකක්ද ඔබේ ?

පි: මගේ පිළිතුර මම කියවන්නම්. 2017.08.21 දින කොළඹ දිස්ත්‍රික්ක කාර්යාලය විසින් ආයතනය පරීක්ෂා කර බලා තඹ ටොන් 30ක් ලබා දීමට නිර්දේශ කර තිබූ අතර පිත්තල නිෂ්පාදනය සඳහා අවශ්‍ය උඳුන් ඉදි කරමින් පවතින බැවින් පිත්තල ලබාදීම නිර්දේශ කර නොතිබිණි. ඒ අනුව අදාළ කර්මාන්තය පරීක්ෂා කිරීම සඳහා සභාපතිතුමා විසින් පත් කළ කමිටුව 2017.09.12 වෙනි ස්ථාන පරීක්ෂාවක් කළ අතර එහිදී තඹ නිෂ්පාදනය තහවුරු විය. ඒ පිළිබඳව අදාළ වාර්තාවේ සඳහන් කර ඇත. එහෙත් පිත්තල නිෂ්පාදනය සඳහා උඳුන් සහ යන්ත්‍ර සූත්‍ර සවි කරගැනීමට පැවැති නිසා එම සවිකිරීම් අවසන් වූ පසු යන්ත්‍ර ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා පිත්තල ලබා දීමට නිර්දේශ කරන ලදී. ඒ අනුව අදාළ ආයතනයට පිත්තල උණ්ඩ කොපු නිකුත් කිරීමෙන් පසුව නිෂ්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණ කිරීමෙන් පසු මසකට 15,000Kg ක් ලබාදීම නිර්දේශ කරන ලදී. කොළඹ දිස්ත්‍රික් කාර්යාල විසින් අයදුම්පත්‍රයේ තඹ ප්‍රමාණය නිර්දේශ කර තිබූ හෙයින් අදාළ අයදුම්පත්‍රය ලියාපදිංචි කළ අතර ලියාපදිංචි කර්මාන්ත ලේඛනයට කර්මාන්තකරුගේ තඹ අවශ්‍යතාවය ඇතුලත් කර ඇත. එහෙත් පිත්තල ලබාදීම සඳහා පසුව නිර්දේශ කළ හෙයින් පිත්තල අවශ්‍යතාවය ලියාපදිංචි කර්මාන්ත ලේඛනයට ඇතුලත් කිරීමට අතපසු වී ඇත.

ප්‍ර: ඒ කියන්නේ ඔබ පිත්තල ලබාදීම පසුව නිර්දේශ කරපු නිසා පිත්තල අවශ්‍යතාවය ලියාපදිංචි කර්මාන්ත ලේඛනයට ඇතුළත් කරන්න ඔබට අතපසු වුණයි කියලායි ඔබ පිළිතුරු ලබා දීලා තියෙන්නේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නැවත සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා C – 762 කියන ලේඛනය කෙරෙහි. මේ ඒ ලේඛනයේ දෙවැනි විමසුමෙන් තියෙන්නේ 2017.08.01 වෙනි දින සිට 2018.04.28 දක්වා කාලය තුළ පිත්තල කර්මාන්තකරුවන් 129 දෙනෙකුට දීපු ප්‍රමාණයි. ඒ තොගයෙන් 30%ක ප්‍රමාණයක් එකම කර්මාන්තකරු එනම් කොලොසස් පෞද්ගලික සමාගමට නිකුත් කරලා තියෙන්නේ ඇයි කියලයි ඒක ප්‍රශ්නේ අහලා තියෙන්නේ?

පි: එහෙමයි.

Fair Comment by Jezeem

ප්‍ර: දැන් ඔබේ පිළිතුර කුමක්ද ?

පි: සභාපතිතුමාගේ දැනුම් දීම හා නිර්දේශය මත එම පිත්තල ප්‍රමාණය නිකුත් කර ඇති අතර මාස 9කට ආසන්න කාලයක් සඳහා මෙම ප්‍රමාණය නිකුත් කර ඇත.

ප්‍ර: දැන් මොකක්ද ඒ කියන්නේ ඔබ කියන්නේ මේ සභාපතිතුමාගේ දැනුම් දීම නිර්දේශය මත තමයි ඒ පිත්තල ප්‍රමාණය එක කර්මාන්තකරුවෙකුට 30%කට වැඩි ප්‍රමාණයක් ලබා දුන්නේ කියලා?

පි: එහෙමයි කියලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඔබ පිළිගන්නවද කර්මාන්තකරුවන් 129 දෙනෙක් අතර සමානුපාතිකව බෙදා දිය යුතු ප්‍රමාණයක් එක පුද්ගලයෙකුට 30%කට වැඩි ප්‍රමාණයක් දුන්නාම ඒක නිවැරදි ක්‍රමවේදයක් නොවන බව?

පි: අපි සමානුපාතිකව ලබා දීමක් කරන්නේ නැහැ. ඔවුන්ගේ ධාරිතාවය අනුව තමයි ලබා දීම සිදු කරන්නේ. එතකොට සමානවම බෙදී යන්නේ නැහැ.

ප්‍ර: ඔව් දැන් ඒක මම ඔබෙන් නැවතත් ඇහුවොතින් ඒ ඒ පුද්ගලයාට නිෂ්පාදන ධාරිතාව කියන දේනේ ඔබේ ප්‍රධාන නිර්නායකයක් වෙනවා ඇත්තේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට තවත් පිත්තල ඒ අවුරුද්දේ ඉල්ලලා සිටිපු කර්මාන්තකරුවන් සිටියදී 30%ක ප්‍රමාණයක් එකම පුද්ගලයෙක්ට දුන්නම ඒක නිවැරදි ක්‍රමවේදයක් නෙමෙයි කියලා මම ඔබට යෝජනා කළොත් ඔබ පිළිගන්නවද? දැන් ඒකනේ අහලා තියෙන ප්‍රශ්නේ ඔබෙන්. විගණක විමසුමෙන් අහලා තියෙන්නෙත් ඒ ප්‍රශ්නයමනේ?

පි: එහෙමයි අහලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඔබ ඒකට ලබා දීලා තියෙන පිළිතුර සභාපතිතුමාගේ දැනුම් දීමයි නිර්දේශය මතයි ඒක නිකුත් කළේ කියලා?

පි: එහෙම තමයි දැනුම් දීලා තියෙන්නේ.

ප්‍ර: එහෙම නැතුව ඔබ ඒක සාධාරණීකරණය කිරීමක් එතන දී කරලා නැහැනේ. එහෙම නැත්නම් ඒක ලබා දීම හරි ද වැරදි ද කියන කාරණය සම්බන්ධයෙන්?

පි: එහෙම කරලා නැහැ.

ප්‍ර: 3 වෙනි කාරණය මොකක්ද මේ C – 762 කියන ලේඛනයෙන් විගණන විමසුමෙන් අහලා තියෙන්නේ?

පි: කර්මාන්තකරු වෙත දැනුම් දීම 2018.01.24 දින පිත්තල 25,000kgක් ද 2018.02.22 දින පිත්තල 25,000 kgක් ද ලබාදී තිබුණි. මසකටත් අඩු කාලයක් තුල නිර්දේශිත මාසික අමුද්‍රව්‍ය සීමාවන් ඉක්මවා එකම කර්මාන්තකරුවෙක්ට පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් එකේ තියෙන්නේ මාසයකටත් අඩු කාලයක් නිර්දේශිත මාසික අමුද්‍රව්‍ය සීමාව ඉක්මවා කොලොසස් පෞද්ගලික සමාගමට නිකුත් කිරීම සම්බන්ධයෙන්?

පි: එහෙමයි.

ප්‍ර: මොකක්ද ඔබේ පිළිතුර?

පි: මගේ පිළිතුරු වෙන්නේ අදාල කර්මාන්ත ස්ථානය කමිටුව විසින් නිරීක්ෂණය කිරීමේ දී පිත්තල නිෂ්පාදන කිරීමේ ධාරිතාවේ තඹ නිෂ්පාදන කිරීමේ ධාරිතාවට සමාන ලෙස නිරීක්ෂණය වුවත් කර්මාන්තකරු විසින් අයදුම්පත්‍රය සඳහන් කර තිබූ මසකට පිත්තල 15,000kgක් පමණක් නිර්දේශ කරන ලදී. ඒත් කර්මාන්තකරු විසින් සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීම් වලට අනුමැතිය සහිතව මෙම ප්‍රමාණය ලබා ඇත.

ප්‍ර: දැන් ඒක කර්මාන්තකරු විසින් සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීමට අනුවයි ලබා දීලා තියෙන්නේ කියලා ඔබ පිළිතුර ලබාදීලා තියෙන්නේ?

පි: සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර: 4 කාරණයෙන් විමසා සිටින්නේ කුමක්ද?

පි: කර්මාන්තකරුවන් සඳහා අබලි නිකුත් කිරීම ලැයිස්තුගත අනුපිළිවෙල සිදුකරන බව සඳහන් වෙන නමුත් 2017 අගෝස්තු මස හෝ ඊට ආසන්න දිනයක අලෙවි අංශයේ ලියාපදිංචි කර ඇති ඉහත ආයතනයට කෙටිකලක් තුළ අංක 2 මඟින් දක්වා ඇති පරිදි අනිකුත් කර්මාන්තකරුවන් අභිබවා පිත්තල නිකුත් කිරීමේ ක්‍රමවේදය පැහැදිලි කිරීම සඳහා.

ප්‍ර: දැන් අනිකුත් කර්මාන්තකරුවන් අභිබවා කොලොසස් පෞද්ගලික සමාගම් වලට පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙනුයි විමසලා තියෙන්නේ?

පි: ඔව්. එහෙම සඳහන් කරලා තියෙන්නේ. ව්‍යාපෘතියේ ලියාපදිංචි වී ඇති පිත්තල කර්මාන්තයේ නියැළී සිටින කර්මාන්තකරුවන්ට එම කාලය තුල දී ඔවුන්ගේ අවශ්‍යතාවය සඳහා පිත්තල නිකුත් කර ඇති අතර කොලොසස් කර්මාන්ත ආයතනයට සභාපතිතුමාගේ දැනුම් දීම හා අනුමැතිය ඇතිව එම කර්මාන්ත ශාලාවේ අවශ්‍යතාවයට අමුද්‍රව්‍ය ලබාදී ඇත.

ප්‍ර: ඔබ එහිදීත් කියලා තියෙන්නේ සභාපතිතුමාගේ දැනුම් දීම හා අනුමැතිය මත කර්මාන්ත ශාලා අවශ්‍යතාවයට අමුද්‍රව්‍ය ලබා දුන්නායි කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ සභාපති කියලා කියන්නේ මේ කාල වකවානුවේ දී 2018.06 මාසේ 19 කාලවකවානුවේ දී ඔබ සභාපතිතුමා කියලා අදහස් කරන්නේ පුද්ගලයාගේ නම කියන්න.

පි: එවක හිටපු සභාපති මහින්ද ජීනසේන මහතා.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් 5 වෙනි කරුණෙන් කුමක්ද විමසලා තියෙන්නේ?

පි: අබලි ලෝහ ව්‍යාපෘතියේ ලියාපදිංචි කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතා සපුරන ආකාරයෙන් පිත්තල භාණ්ඩ නිෂ්පාදකයින්ට අගතියක් නොවන ආකාරයෙන් පිත්තල අමුද්‍රව්‍ය නිකුත් කර ඇති අතර ඉදිරියේ දී ඔවුන්ගේ අවශ්‍යතාවය සපුරන ආකාරයෙන් පිත්තල නිකුත් කරනු ඇත.

ප්‍ර: දැන් ඔබෙන් අහන්නේ මේ මෝටාර් උණ්ඩ ටොන් 25ක් ලබාදෙන්න කියලා ඉල්ලුවාම මෙම කර්මාන්තකරුගේ ස්ථානය පරීක්ෂා කරන්න කියලා සටහනක් තිබ්බායි කියලා ඔබ දැන් කළිනුත් සාක්ෂි ලබා දුන්නානේ?

පි: පස්වෙනි සමාවෙන්න

ප්‍ර: ඒ ගොනුවෙන් පෙනී යන්නේ නැහැ කියලා කියන්නේ ඒ පරීක්ෂා කිරීම ස්ථානයට ගිහිල්ලා කරලා නැද්ද?

පි: ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කරලා තියෙනවා මුල් අවස්ථාවේ.

ප්‍ර: නමුත් ඒ බවක් කර්මාන්තකරුගේ ගොනුවෙන් පරීක්ෂා නොවන බවයි මේ විගණන පරීක්ෂක සටහන් කරලා තියෙන්නේ 5 වෙනි කාරණයේදී?

පි: ඒ ලබා දීපු අවස්ථාවේ පරීක්ෂා කරලා නැහැ.

ප්‍ර: පරීක්ෂණ කරලා නැහැ?

පි: පරීක්ෂණ කරලා නැහැ.

ප්‍ර: 6 වෙනි කරුණෙන් අභ්‍යන්තර විගණන මොනවද විමසා සිටින්නේ ?

පි: අබලි ලෝහ ව්‍යාපෘති මාර්ග උපදේශ සංග්‍රහයේ සඳහන් වන පරිදි යකඩ නොවන ලෝහ අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන දේශීය කුඩා පරිමාණ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයකට අමුද්‍රව්‍ය සැපයීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කර තිබුණි. කොලොසස් පෞද්ගලික සමාගමෙන් මාසික අමුද්‍රව්‍ය අවශ්‍ය සැපයීම සඳහා එකවර පිත්තල 25,000 kgක් බැඟින් ලබා දී තිබුණි. ඒ අනුව මණ්ඩලයෙහි ලියාපදිංචි පිත්තල අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කරන ලබන අනිකුත් කර්මාන්තකරුවන් හට ද අගතියක් සිදු නොවන පරිදි ඔවුන්ගේද මාසික අමුද්‍රව්‍ය අවශ්‍යතා සපයනු ලබන්නේ ද යන්න.

ප්‍ර: ඒ අනුව එක පුද්ගලයෙක්ට 25,000 kgක් ලබා දුන්නාම අනික් කර්මාන්තකරුවන්ට අගතියක් සිදු නොවන ආකාරයෙන් සපයනවද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්නයට ඔබේ පිළිතුර වුණේ කුමක්ද?

පි: අබලි ලෝහ ව්‍යාපෘතියේ ලියාපදිංචි කර්මාන්තකරුවාගේ අවශ්‍යතාවය සපුරන ආකාරයෙන් පිත්තල භාණ්ඩ නිෂ්පාදකයින්ට අගතියක් සිදු නොවන ආකාරයෙන් පිත්තල අමුද්‍රව්‍ය නිකුත් කර ඇති අතර ඉදිරියේ දී ඔවුන්ගේ අවශ්‍යතාවය සපුරන ආකාරයෙන් පිත්තල නිකුත් කරනු ඇත.

ප්‍ර: මොකක්ද ඔබ අදහස් කරන්නේ ඉදිරියේ දී සපුරන ලද ආකාරයෙන් පිත්තල නිකුත් කරනවා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: ඉදිරියේ දී කියලා අදහස් කරන්නේ ඉස්සරාහදී ඒගොල්ලන්ගේ අවශ්‍යතාවය සපුරන ආකාරයේ , විදියට අපි පිත්තල ලබා දෙනවා කියන එක.

ප්‍ර: දැන් එක පුද්ගලයෙක්ට පිත්තල 25,000 kgක් ලබා දුන්නාම ඒ අවුරුද්දේ පිත්තල ඉල්ලලා ඔබේ ආයතනයෙන් පිත්තල ඉල්ලපු ගිය අවුරුද්දේ ලියාපදිංචි වෙච්ච අනිකුත් කර්මාන්තකරුවන්ට ලබාදීමට හැකියාවක් නැතිව යනවා. නැත්නම් එක පුද්ගලයෙක්ට ගොඩක් අනිත් අයට ඊට වඩා අඩු ප්‍රමාණයක් තමයි බෙදලා දෙන්න වෙන්නේ කියලා මම යෝජනා කළොත් ඔබ ඒක පිළිගන්නවද?

පි: එසේ පිළිගන්නේ නැහැ. ඒ අවස්ථාවේ දී අපි මම පැහැදිලි කරන්නම් ස්වාමීනි. අපි ලැබෙන තොගය ගේනකොට ඒ ගෙනල්ලා දිස්ත්‍රික්ක ඔෆිස් එකෙන් නිර්දේශ මත නැවතත් නිර්දේශ කර ගන්නවා මේ අය නැවතත් හොඳට කර්මාන්තය කරනවද නැද්ද කියන එක. එහෙම නිර්දේශ කරගෙන ලබා ගන්නා අවශ්‍යතාවය අනුව තමයි අපි ලබා දීලා තිබෙන්නේ. මගේ ළඟ ලේඛන තිබෙනවා. අපි නුවර දිස්ත්‍රික්කයේ තියෙනවා ඒවගේ ගම්මානයක් තියෙනවා. ඒ ගම්මානයේ අපි දිස්ත්‍රික්ක ඔෆිස් එකෙන් නිලධාරින් ගිහිල්ලා බලලා ඒගොල්ලෝ නිර්දේශ කරලා එවනවා. අපිට මේ ප්‍රමාණය මේ සැරේ දෙන්න කියලා. ඒ අතරේ තමයි මේ අයටත් මෙහෙම දීලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඔය ඔබ කිව්වේ 2018.06.19 වන දින අභ්‍යන්තර විගණක විසින් සිදු කරන ලද විමසීම සහ එයට ඔබ ලබාදුන්න පිළිතුර?

පි: එහෙමයි.

ප්‍ර: මම ඔබට කිව්වොත් ඔබ පිළිගන්නවද ඊට පස්සේ ඒ කියන්නේ 2018.07 මාසේ 05 වෙනිදා අභ්‍යන්තර විගණන විසින් කොලොසස් පෞද්ගලික සමාගමට ගිහිල්ලා ඒ ස්ථානයට ගිහිල්ලා ක්ෂේත්‍ර පරීක්ෂණයකුත් වැඩිදුර කරලා තියෙනවා කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි: මා ඒ පිළිබඳව දැනුවත් නැහැ.

සාක්ෂිකරුට කාර්මික සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් සකස් කර 2018.08.31 දරන දිනය සහිතව ඉදිරිපත් කර ඇති ලේඛනයක් පෙන්වා සිටිනවා.

ප්‍ර: 2018.07.05 වෙන කොටත් මහත්මයා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස සහ අලෙවි?

පි: නියෝජ්‍ය අධ්‍යක්ෂක.

ප්‍ර: ලෝහ අබලි කළමනාකරණ ඒකකය බාරව කටයුතු කරානේ?

පි: ඔව් එහෙමයි.

ප්‍ර: ඒ ලේඛනය පරීක්ෂා කරලා බලන්න සාක්ෂිකරු ඔබට ඒක හදුනා ගන්න පුළුවන්ද?

පි: මේ ලේඛනය මට ඉදිරිපත් කරලා නැහැ. දැකලා නැහැ මම

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒ ලේඛනය කියවලා බැලුවාම ඔබට ඒක කුමක්ද කියලා හඳුනා ගන්න හැකියාවක් තිබෙනවද?

පි: අභ්‍යන්ත විගණන විසින් සකස් කරපු වාර්තාවක්.

ප්‍ර: දැන් ඔබට දැනීමක් නැද්ද කොලොසස් පෞද්ගලික සමාගම වෙත අභ්‍යන්ත විගණන නිලධාරීන් ගිහිල්ලා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරයි කියලා?

පි: මා දැනුවත් නැහැ. මට සඳහන් කරලා නැහැ ඒ පිළිබඳව.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: දික්වැල්ල මහත්මයා දැන් මේ අබලි භාණ්ඩ නිකුත් කරන කොට ඒවා අදාළ ස්ථානයේ ඉඳලා ඔබලාගේ ආයතනයට ගෙනල්ලා තියලා එතනින් ද මුදා හරින්නේ?

පි: ක්‍රම 2කටම සිද්ධ කරනවා. එතන අපිට ලබා දෙන ආයතනයෙන් නිකුත් කිරීමත් කරනවා. අපේ ආයතනයට ගෙනල්ලා නිකුත් කිරීමත් කරනවා.

ප්‍ර: දැන් ඒ සඳහා තියෙන මාර්ගෝපදේශක මොකක්ද ?

පි: මාර්ගෝපදේශක සංග්‍රහයේ සඳහන් වෙලා තියෙනවා. ඒ ආයතනයේ නිකුත් කරන්නත් පුළුවන්. අපේ ආයතනයට ගෙනල්ලා ගබඩාවේ තියලා නිකුත් කරන්නත් පුළුවන් කියලා.

ප්‍ර: දැන් උදාහරණයකට ගනිමු හමුදාවේ අර කාලතුවක්කු උණ්ඩ වලට යොදන ඒ cap එක. දැන් ඒවා අපි හිතමු තියෙන්නේ කිලිනොච්චි වල කියලා. එතකොට කිලිනොච්චි වලින් ගන්න කියලා ඔබලා ඒ සඳහා නියෝගයක් දෙනවා ඒ ඔය භාර ගන්න සමාගමට හරි. එතකොට මේ අය ගිහිල්ලා කිලිනොච්චි වලින් ඒ අදාළ ප්‍රමාණය අරගෙන එනවා. එතකොට ඔබගේ ආයතනයෙන් කවුරුහරි එතෙන්ට යනවද ?

පි: අපේ ආයතනයෙන් යනවා ස්වාමීනි.

ප්‍ර: කවුද සාමාන්‍යයෙන් යන්නේ?

පි: අපේ ආයතනයෙන් අපේ අලෙවි අංශයේ නිලධාරීයෙක් යනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ අංශයෙන්?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ වගේ අවස්ථාවල දී දැන් අදාළ නියෝගය පරිදි නිකුත් කරන්න කියලා තියෙන්නේ අපි හිතමු ටොන් එකයි කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අයට අවශ්‍යනම් ටොන් 2ක් හරි අරන් යන්න පුළුවන් නේද අදාළ හමුදා කඳවුරෙන්?

පි: එහෙම ගෙනියන්න බැහැ.

ප්‍ර: ඇයි?

පි: අපේ නිලධාරීන් ගිහිල්ලා හමුදා කඳවුරෙන් අපිට භාර දෙන්නේ අපේ නිලධාරීයාට. අපේ නිලධාරීයා තමයි ඒ අයට දෙන්නේ. එතකොට අපි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හිතමු ටොන් 25ක් ගන්නවානම් මේක කරන්නේ ලොරියට දාලා පාලම් තරාදියකින් කිරන්නේ. එතකොට ඒගොල්ලෝ දන්නවා සාමාන්‍ය වශයෙන් උණ්ඩ කොපුවක බර. ඒවා කිරලා තියෙන්නේ හමුදාව මඟින්. එතකොට ටොන් 25ක් නම් ටොන් 25කට කොච්චර යනවද කියලා දළ වශයෙන් සොයා ගන්නවා.

ප්‍ර: පාලම් තරාදි කොහේද තියෙන්නේ දැන් හැම හමුදා කඳවුරක් කිට්ටුවම පාලම් තරාදි නැහැනේ. කොහොමද ඒවා කළේ?

පි: අපි ලබා දුන්නා ස්වාමීනි පනාගොඩින් සහ මින්නේරියෙන්. ඔය කෑම්ප් දෙකෙන් විතරයි අපිට නිකුත් කෙරුවේ පිත්තල උණ්ඩ. එතකොට අපි පනාගොඩින් ගන්න කොට පනාගොඩ තියෙනවා කෑම්ප් එකට ලඟම අතුරුගිරියේ එකක් තියෙනවා. අනිත් එක ගලවිලවත්තේ එකක් තියෙනවා. ඒ දෙකෙන් එකක තමයි කිරන්නේ.

ප්‍ර: දැන් එවැනි අවස්ථාවක දී යුධ හමුදාව මඟින් ඒ පිළිබඳව නිරීක්ෂණයක් කරනවද?

පි: ඔව්.

ප්‍ර: එතනින් ඔෆිසස්ලා දෙන්නෙක් හෝ 3 දෙනෙක් එනවා. අපේ ඔෆිසස්ලා යනවා. එහෙම ගිහිල්ලා තමයි කිරලා බලන්නේ.

පි: දැන් එවැනි අවස්ථාවන් වල පැමිණිලි ලැබිලා නැද්ද මේ අදාළ ප්‍රමාණය ඉක්මවා මේ විදිහට රැගෙන ගිහිල්ලා තියෙනවා කියලා?

ප්‍ර: නැහැ පැමිණිලි ලැබිලා නැහැ. මොකද අපේ officer කෙනෙක් යන හින්දා ඒ වගකීම ඒ ආකාරයෙන්ම ඉටු කරනවා.

ප්‍ර: මාර්ගෝපදේශක සංග්‍රහයේ දක්වලා තියෙන ආකාරයටම ඔබ කටයුතු කරා කියලා ඔබ හිතනවද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඊළඟට දැන් සමහර අවස්ථාවන් වල දී ඔබ නිරීක්ෂණය කරා. ඔබ පිළිගත්තා මාර්ගෝපදේශන සංග්‍රහයේ දක්වලා තියෙන කරුණු උල්ලංඝනය කරමින් මේ අබලි භාණ්ඩ නිකුත් කිරීම සිද්ධ වෙලා තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් එය ඔබ ඉස්සෙල්ලා මම අහපු වෙලාවේ පිළිගත්තා එය නොසැලකිල්ල නිසා සිද්ධ වුණා කියලා. දැන් එවැනි අවස්ථාවල් සිද්ධ වුණේ ඔබට යම් යම් ආකාර වලදී ලැබුණු බලපෑම් හින්දයි කිව්වොත් මොකද ඒ ගැන කියන්නේ ?

පි: එවැනි අවස්ථාවල දී අපි මට නම් කරලා කියන්න පුළුවන් ඒවා බලපෑම් කියන්නේ.

ප්‍ර: ඉහළ නිලධාරීන්ගේ බලපෑම් නිසා?

පි: ඉහළ නිලධාරීන් ඒ අයගේ නිර්දේශයන් හා අනුමැතිය මත කරන්න සිද්ධ වෙච්ච ඒවා. එහෙම නැතුව ස්වාමිනි මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය කරගෙන

FAIR COMMENT BY JEZEEM

යද්දී සමහර වෙලාවට සමහර අයට දැන් අපිට කියනවා උදාහරණයක් විදිහට රෝහලක යකඩ ටික ගන්න කිව්වොත් අපි දන්නේ නැහැ කොච්චර තියෙනවද කියලා. එතෙන්ට යවනවා අපි එක්කෙනෙක්. අපේ officer එක්ක යන්නේ. එතකොට ඒක ලොරියට කිරලා තමයි පටවන්නේ. පටවලා තමයි කිරන්නේ. ඒ අවස්ථාවේ දී එයාගේ නිර්දේශ ප්‍රමාණයට වැඩියෙනුත් අපි දීලා තියෙනවා. මොකද අතන අපිට අවශ්‍යතාවය තියෙනවා මෙතනින් ඉවත් කරන්න. මොකද රෝහලට අවශ්‍ය වෙන්නේ ඉවත් කර ගැනීම. එතකොට අපිට තව සැරේකට යන්න බැහැ. එතකොට ඒ වගේ අවස්ථා ඇතිවෙනවා.

ප්‍ර: දැන් මාර්ගෝපදේශක සංග්‍රහයේ දක්වලා තියෙන ඒ රෙගුලාසි උල්ලංඝනය කරමින් යම් යම් අවස්ථාවල දී ඔබට කටයුතු කරන්න සිද්ධ වුණාට ඔබ දැනන් හිටියද එලෙස උල්ලංඝනය කිරීම ඉහළ නිලධාරීන්ගේ අනුමැතියක් මත කිරීම වරදක් කියලා?

පි: ඒක ගැන මා සැළකීමක් කෙරුවේ නැහැ. ඉතින් ඒක සැලකීමක් කෙරුවොත් එහෙම උල්ලංඝනය කිරීම වරදක්.

****

<u>**ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා**</u>

ප්‍ර: දික්වැල්ල මහත්මයා දැන් මේ කොලොසස් ආයතනයට වැඩි ප්‍රමාණයක් quota එක දුන්නම නිකුත් කරපුවාම දැන් ඔය ගෘහ කර්මාන්ත කරන අයට අනිත් ලියාපදිංචි ආයතන වලට අඩුයි කියලා හිටන් ඒගොල්ලෝ විරෝධතා හරි මොනවාහරි ඉදිරිපත් කරලා නැද්ද කවදාකවත්?

පි: එහෙම විරෝධතා ඉදිරිපත් කරලා නැහැ. ලිඛිතව කියලා නැහැ අපිට කොයි වෙලාවෙත්.

ප්‍ර: නමුත් මම දැකලා තියෙනවා පුවත්පත් වල සමහර වෙලාවට ඒගොල්ලන්ට අවශ්‍ය ප්‍රමාණය ලැබෙන්නේ නැහැ කියලා මෙහෙම වාර්තා කරලා තියෙනවා කියලා?

පි: එහෙම විරෝධතාවයක් ආවා. ඒ ආවේ තඹ පිත්තල රට යවන එක පිළිබඳව. අමාත්‍යාංශයෙත් අපිත් ඇවිල්ලා සාකච්ඡා කරා. මම හිතන්නේ 2018 ජුනි මාසේ ජුලි මාසේ ,අගෝස්තු වගේ. ලිඛිතව අපිට දැනුම් දීලා නැහැ. මොකද අපිට ලබා දෙන වෙලාවේ දී පිත්තල කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවයට සපිරෙන විදියට දුන්නා. ඒ අයගේ තියෙන අවශ්‍යතාවය එකක් තමයි මුදල් පිළිබඳ ප්‍රශ්නය ගන්න කොට. අනිත් එක ඒගොල්ලන්ගේ හදලා විකුණන කොට ලොකු ඒ තියෙනවා කාලයක් සල්ලි ආපහු එන්න. එතකොට ඒවාත් එක්ක බලලා සමහර වෙලාවට දෙන ප්‍රමාණය ගන්නත් බැහැ ඒගොල්ලොන්ට. ඒ නිසා ඒවාත් එක්ක බලලා තමයි අපි දෙන්නේ ඒගොල්ලන්ට දෙන්නේ. සමහර අය සමහර ලොඩ් ගෙනාවොත් තොග ගෙනාවට පස්සේ සමහර වෙලාවට

FAIR COMMENT BY JEZEEM

ඉතුරු වෙනවා පොඩ්ඩක්. ඒවගේ ඉතුරු වීමක් තමයි අර ටොන් 5ක් ඉල්ලපු වෙලාවේ කොලොසස් එකට 1625ක් මං හිතන්නේ දුන්නේ. ඒ ඉතුරු වෙච්ච ප්‍රමාණයක්.

ප්‍ර: දැන් ඔය කොලොසස් සමාගම අරන් යන තඹ, පිත්තල ආදිය දේවල් වලට කෙරෙන්නේ මොකක්ද කියලා ඔබ දන්නවද?

පි: අපි දන්නවා. අපි ගිහිල්ලා බැලුවා මුල්ම අවස්ථාවේදීත්. ඒ වීඩියෝ එකක් තිබුණා මගේ අනිත් phone එකෙන් මම විඩියෝ කෙරුවේ. ඒ phone එක නැහැ. ඒකේ හදන්නේ ඒ කියන්නේ ඒක රොඩ් එක කියලා කියන්නේ. කම්බියක් හදන්නේ. පිත්තල උණු කරලා කම්බි හදනවා.

ප්‍ර: තඹ වලටත් ඒ විදිහටද කරන්නේ?

පි: තඹත් ඒක කරනවා. තඹ කම්බියකුත් හදනවා. ඒකට කියන්නේ හොලෝ මේකක් ලොකු බාර් එකක් හදනවා ඇතුලේ හිල තියෙනවා.

ප්‍ර: ඒ බාර් එක මොකද කරන්නේ?

පි: ඒවා රට යවන එක ඒගොල්ලන් කරන්නේ.

ප්‍ර: ඒකත් රට යවනවා?

පි: ඔව්.

****

<u>**ගරු විනිසුරු අදිකාරි මැතිනිය**</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මතකයක් තියෙනවද ආරක්ෂක අමාත්‍යාංශය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ඔය පිත්තල කොපු හිස් පිත්තල උණ්ඩ කොපු ලබාදීම ආරම්භ කරේ මොන අවුරුද්දේ මොන මාසේ සිටද කියලා?

පි: අපිට ලබාදීම දෙනවා කියලා දැනුම් දුන්නේ 2017 මැයි මාසේ 26 තමයි අපිට ලියුම ඇවිල්ලා තියෙන්නේ.

ප්‍ර: ඊට පස්සේ ඔබට මතකයක් නැද්ද සත්‍ය වශයෙන්ම මෙම අමුද්‍රව්‍ය ලබාදීම කවදද කරන්නේ ?

පි: මට මතක විදිහට 2017.09 මාසේ හෝ මුල්ම තොගය ලබා ගත්තේ අපි ඒ කාලේ.

ප්‍ර: 2017 .09 මාසේ?

පි: 2017 .09 මාසේ මට මතක හැටියට. මගේ ලේඛන තියෙනවා මම බලලා කියන්නද

ප්‍ර: නැහැ කමක් නැහැ මේ ඇති. ඔබ ළඟ තියෙනවද තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය මාසිකව ද ලබා දෙන්නේ එහෙම නැත්නම් තියෙන ඒවා ඔක්කෝම එක සැරේකට ලබා දෙනවද කොහොමද ලබා දෙන්නේ?

පි: අපිට මුලින්ම දැනුම් දීලා තිබුණා ආරක්ෂක අමාත්‍යාංශයේ සහකාර අතිරේක ලේකම්වරයෙක් ලියුමක් එවලා තිබුණා. ඒ ලියුම මගේ ළඟ දැන් නැහැ. ඒක තියෙනවා. එකේ තිබුණේ ඉක්මනින් ලබා ගන්න කියලා.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේ ප්‍රමාණය ඉක්මනින් ඉවත් කරගෙන යන්න කියලා. ඒ වුණත් මේ පිත්තල උණ්ඩ කොපු අපිට ලබා දෙන්නේ ඒගොල්ලෝ තලලා. තැලීමකින් තොරව ලබා දෙන්නේ නැහැ. ඒ තලන තොගය තමයි අපි ඊට පස්සේ ගෙන්නේ.

ප්‍ර: දැන් ඔබ මීට පෙර සඳහන් කරපු විදිහට කොයි කඳවුරු වලින්ද මේ පිත්තල කොපු ලබා ගන්නේ?

පි: ලබා ගත්තේ පනාගොඩ කෑම්ප් එකෙන් සහ මින්නේරිය කෑම්ප් එකෙන්.

ප්‍ර: එතකොට දැන් මේ කර්මාන්තය සඳහා ඉල්ලුම් කරන කර්මාන්තකරුවෝ ඉන්නේ ඔක්කෝම කොහේද?

පි: වැඩි ප්‍රමාණයක් කිරිබත්ගොඩ සහ නුවර පිළිමතලාවේ. අනිත් දිස්ත්‍රික්ක වල කොළඹ මට මතක විදිහට පස් හය දෙනෙක් විතර අනිත් පළාත් වල ගොඩක් අඩුයි.

ප්‍ර: එතකොට ඒ සියලුම කර්මාන්තකරුවන්ට ඔබලා මෙම අමුද්‍රව්‍ය ලබාදුන්නේ ඒගොල්ලන් විසින් අර හමුදා කඳවුරු 2කට ගිහිල්ලා එතනින් ලබා ගැනීමේ ක්‍රමවේදය අනුවද?

පි: නැහැ එහෙම නෙවෙයි.

ප්‍ර: එහෙනම් කොහොමද දුන්නේ?

පි: දැන් කොලොසස් ආයතනය වැඩි ප්‍රමාණයක් ගන්නවා. ඒ අයට එතනින්ම ලබා දුන්නා. ඒක අපිට වාසියකුත් තියෙනවා. මොකද අපිට Transport එක ඒ කියන්නේ ගමන් වියදම් කිලෝ එකකට ගාණක් යනවා අපිට. ඒක අඩු වෙනවා. ඊට අමතරව පොඩි විදියට අපිට ටොන් 1, 2, 3, 4 ඒ විදියට බෙදිලා දීලා තියෙනවා. ඒ වෙනකොට අපේ කටුබැද්දේ නව්බිම ගබඩාව තියෙනවා එතෙන්ට ගෙනල්ලා අපි දවසකට දෙන්න පුළුවන් ප්‍රමාණයට ලියුම් දාලා ගෙන්වගෙන ඒගොල්ලන්ට දෙනවා. ඊට අමතරව නුවර පිළිමතලාවට අපි විශේෂයෙන් මින්නේරියෙන් කඳවුරෙන් ගත්තේ. එතනින් අරගෙන ඇවිල්ලා පිළිමතලාවේ දී අපි අලෙවි අංශයෙනුත් ගිහිල්ලා දිස්ත්‍රික්ක ඔෆිස් එකේ අයත් එකතු කරගෙන එක දවසින් අපි ටොන් 30ක් විතර බෙදනවා හැම වෙලාවේම.

ප්‍ර: එතකොට දැන් මේ කොලොසස් ප්‍රවයිට් ලිමිටඩ් කියන පුද්ගලික සමාගමට දැන් මේ පිත්තල කොපු අමුද්‍රව්‍යයක් ලෙස මින්නේරියෙන්නේ ලබා දුන්නේ නේද?

පි: මින්නේරියෙන් සහ මුලින්ම පනාගොඩින්.

ප්‍ර: එතකොට එහිදී දැන් මේ තොග ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉන්වෙන්ට්‍රි වලට ඇතුළු කරනවානේ නේද?

පි: එහෙමයි.

ප්‍ර: ඒ ඇතුළු කර ගැනීමෙන් පසුව ඔබලා විසින් නිකුත් කරන ඉන්වොයිස් එකකට එම සමාගම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට මුදල්

FAIR COMMENT BY JEZEEM

ගෙව්වාට පසුව ඔබ ඔවුන්ට එම වවුචරය දීලා කියනවද යුධ හමුදා කඳවුරෙන් මේ ටික ගන්න කියලා කොහොමද මොකක්ද ක්‍රමවේදය?

පි: ක්‍රමවේදය අපි ඔවුන්ට දැනුම් දෙනවා මේ ප්‍රමාණය ගන්න පුළුවන් කියලා. දිනයන් ඊට පස්සේ කැම්ප් එකත් එක්ක කතා කරනවා යන්න පුළුවන් දිනයක්. ඒගොල්ලෝ තමයි අපිට දෙන්නේ එන්න දිනයක්. අපිට ඕනි දවසකට යන්න බැහැ කැම්ප් එකට. එතකොට කැම්ප් එකේ දැනුම් දෙන දිනයට කළින් අපි දැන් දැනුම් දුන්නොත් ටොන් 25ක් දෙනවා කියලා ඒකේ කීයද කියලා ඒගොල්ලන්ට දැනුම් දෙනවා. ඒ දැනුම් දීම මත ඒගොල්ලෝ සල්ලි බඳිනවා අපිට.

ප්‍ර: ඔයගොල්ලන්ට බඳිනවා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල.

පි: ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශයට හෝ නැත්නම් බැංකුවට තැම්පත් කරලා මෙතනින් රිසට් එකක් issue කරනවා. ඊට පස්සේ තමයි ලබා දෙන්නේ.

ප්‍ර: එතකොට ඒ තොග ප්‍රමාණය ගැන නිසි පරිදි ඉන්වෙන්ටි ගත වෙනවා නේද?

පි: ඉන්වෙන්ටි ගත වෙනවා.

ප්‍ර: guide lines තියෙනවනේ ක්‍රමයක් කියලා ඒ පරිදිම වෙනවා නේද?

පි: ඒ පරිදිම වෙනවා. ඕකේ මෙහෙම ප්‍රශ්නයක් එනවා. ඔය 25,000 කිව්වොත් සමහර අවස්ථාවල ඒක තියනවා. 25,000ක් කිව්වාම 25,000 කිරලා ඉවර වුණාම තව 175ක් විතර අර උණ්ඩ හරියටම කිරා ගන්න බැරි නිසා ඒකේ ලොරියට පටවලානේ කිරන්නේ. පොඩ්ඩක් වැඩිවෙනවා. එතකොට අරගොල්ලොන්ගේ සල්ලි බැඳලා තියෙන්නේ 25000ට විතරයි. අර ඉතුරු ගාණට ඒ වෙලාවේම සල්ලි බැඳ ගන්නවා බැංකුවට.

ප්‍ර: කවුද?

පි: බැංකුවට ඒ අපේ යන නිලධාරියා.

ප්‍ර: ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට තමයි ඒ අමතර වැඩිබර ප්‍රමාණයක් එවලෙම සල්ලි ගෙවන්නේ?

පි: සල්ලි ගෙවනවා නැත්නම් ලොරිය අරගෙන යන්න දෙන්නේ නැහැ අපි.

ප්‍ර: නැත්නම් වෙලාසනින් සල්ලි ගෙවලා ඒ රිසිට් එකත් අරගෙන තමයි යුධ හමුදා කඳවුරට ගිහිල්ලා බඩු ටික අරගෙන යන්නේ?

පි: අනිවාර්යයෙන් අර ලොකු අපි කියන ප්‍රමාණයට සල්ලි බඳිනවාමයි. එහෙම නැත්නම් යන්න දෙන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔබට මතකයක් තිබෙනවද මේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් 2017 වසරේදී මෙම පිත්තල උණ්ඩ කොපු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදීම සම්බන්ධයෙන් මොකක්ද තිබුණු රැස්වීම් පැවැත් වුණාද කොහොමද මේක සිද්ධ වුණේ හදිස්සියේම?

පි: 2017ට කළින්ද

ප්‍ර: නැහැ 2017නේ ඔබලාට මේ දීලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් 2017 මුලින්ම මට මතක විදියට 2017 මැයි මාසේ. මට එතකොට මේ රාජකාරි පැවරීම කරලා තිබුණේ.

ජ්ර: ඔබගේ රාජකාරි පැවරුණෙත් මැයි මාසේ?

පි: මැයි මාසේ 17 පැවරුණේ. ලියුම ආවේ මැයි මාසේ 26. අධ්‍යක්ෂක ජනරාල්තුමාට ඇවිල්ලා තිබුණේ. එතුමා මට FNA කියලා ගහලා ලියුම එවලා තිබුණා. ඒ ලියුම මම අනිත් ඔෆිසර් ධම්මික රත්නායකට දාලා තියෙනවා ක්‍රියාමාර්ග ගන්න කියලා. ඒත් එක්කම එකේ තිබුණා 26 ආපු ලියුම මට ආවේ 29. මගේ අංශයට එතකොට 31 කළින් දැනුම් දෙන්න ගන්නවද නැද්ද කියන එක තමයි ඒකේ තිබුණේ.

ප්‍ර: එහෙම නැතුව දැන් අමාත්‍යාංශය දැන් සාමාන්‍යයෙන් දැන් ඔබ කිව්වානේ අතිරේක ලේකම් කෙනෙක් සමඟ සාකච්ඡා කරා කියලා ආරක්ෂක අමාත්‍යාංශයේ. ඒ අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන්ද කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන්ද ආරක්ෂක අමාත්‍යාංශයේ අර ඉහළ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වුයේ මේ පිත්තල ලබා ගැනීම සඳහා?

පි: මට ඒ පිළිබඳ දැනුමක් නැහැ. මොකද මට 2017 මැයි මාසනේ මට රාජකාරි පැවරුවේ. මට ආවාට පස්සේ තමයි මේ ලියුම ආවේ. හැබැයි සමහර විට ඉස්සර කතා කරලා තියෙන්න ඇති.

ප්‍ර: අමාත්‍යාංශ මට්ටමින්?

පි: අමාත්‍යාංශ මට්ටමින්.

ප්‍ර: ඔබලාට නිරීක්ෂණය වෙලා තිබෙනවාද 2017 වසරට පෙර මෙම පිත්තල අවශ්‍යතාවය කොතරම් තිබුණත් ආරක්ෂක අමාත්‍යාංශයක් පිත්තල ලැබුණේ නැති බවට නිරීක්ෂණය වුණාද?

පි: පිත්තල ලැබුණේ නැහැ. පිත්තල ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර: කොච්චර කාලයක් උත්සාහ කළාද එහෙම පිත්තල ලබා ගන්නට?

පි: මම කාලය දන්නේ නැහැ. ඊට කළින් කෙරුණද කියලා ඒක මට අදහසක් නැහැ.

ප්‍ර: ඔබ කිව්වා කිසියම් නිලධාරියෙක්ගේ නමක් සහිත ලිපියක් තියෙනවා කියලා නේද ආරක්ෂක අමාත්‍යාංශයෙන් මෙම පිත්තල ලබා ගන්න කියලා එවපු ලිපියක්. ඔබ ළඟ දැන් ඒ ලිපිය දැන් නැහැනේ?

පි: ලිපියක් තියෙනවා ඒක මගේ ළඟ දැන් නැහැ.

ප්‍ර: ඒ ලිපිය ඉදිරිපත් කරන්නට පුළුවන්ද දවසක?

පි: ඉදිරිපත් කරන්න පුළුවන් මේ ඔක්කෝම ලිපිගොනු අධ්‍යක්ෂ ජනරාල්තුමා ළඟ තියෙන්නේ.

ප්‍ර: අධ්‍යක්ෂක ජනරාල්තුමාට එහෙම එන දවසට ඒවා ගෙන්න කියලා?

පි: ඒවා තියෙනවා. ඒ ලියුම එතන තියෙනවා. ඒ file එකේ. මට ලබා දුන්නේ නැහැ මේවා වෙලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබාදීමට ඔවුන්ව ලියාපදිංචි කර ගැනීම පිළිබඳව මේ guide lines වල තියෙනවානේ හරියටම උපදෙස් දීලා?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට දැන් ඔබ කොලොසස් pvt limited කියන පුද්ගලික සමාගම 2017 වසරේ අගෝස්තු මාසයේදීත්, 2018 වසරේ ජුනි මාසයේදීත් තමයි ලියාපදිංචි කරගෙන තිබෙන්නේ මේ වාර්ෂික හැම අවුරුද්දකම මේ Register වෙන්න ඕනිනේ?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබලා මේ පිළිබඳව පුවත්පත් දැන්වීමක් දාලාද වාර්ෂිකව මේ කර්මාන්තකරුවන්ව අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ලියාපදංචි කරන්නේ?

පි: guide lines එකේ තියෙනවා පුවත්පත් දැන්වීමක් දාන්න කියලා.

ප්‍ර: දානවද ඔයගොල්ලන්?

පි: ඔව් සමහර වර්ෂවල මං නිරීක්ෂණය කරලා තියෙනවා ඒක හරියටම අවුරුද්දට සිද්ධ වෙලා නැහැ. ඒත් අපි දැම්මා. 2017, 2016 දාපු පුවත්පත් දැන්වීම අනුව තමයි 2017 තියෙන්නේ 2018 අපි දැම්මා.

ප්‍ර: දැන් මේ කොලොසස් කියන සමාගම 2017 වසරේ සහ 2018 වසරේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කර්මාන්ත අමුද්‍රව්‍ය ලබා ගැනීමට අවශ්‍යතාවයක් තියෙන කර්මාන්තකරුවෙක් ලෙස ලියාපදිංචි කලේ ඔය පුවත්පත් දැන්වීම් වලට අනුකූලවද?

පි: පුවත්පත් දැන්වීම අපි දානවා.

ප්‍ර: නැහැ මම අහන්නේ ඒක නෙමෙයි. දැන් මේ සමාගම 2017 වසරේ සහ 2018 වසරේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඔය අමුද්‍රව්‍ය ලබා ගැනීමට අවශ්‍යතා තිබෙන කර්මාන්තකරුවෙකු ලෙස ලියාපදිංචි කර ගත්තේ පුවත්පත් දැන්වීමකට අනුකූලවද?

පි: අනුකූලව

ප්‍ර: ඔබට ඒවා පෙන්වන්නට පුළුවන් ද ඒ පුවත්පත් දැන්වීම?

පි: පුවත්පත් දැන්වීම මා මේ අවස්ථාවේ ගෙනල්ලා නැහැ.

ප්‍ර: දැන් ඒවා ඉදිරියේදී ?

පි: පුළුවන්. දැන් මම ඒ අංශයේ නැති නිසා පොඩි ගැටලුවක් තියෙනවා. ඒත් අපි කාර්මික සංවර්ධන මණ්ඩලයේ විදියට දැනුම් දීලා ගන්න ඕනි. මම දන්නවා මොන ලිපි ගොනු වලද ඒවා තියෙන්නේ කියලා.

ප්‍ර: සාමාන්‍යයෙන් මේ guide lines තියෙනවා. සෑම වසරකම ජනවාරි මාසයේ දී තමයි මෙම පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ පුවත්පත් කිහිපයකම දාන්න කියලා සියලුම සිංහල, දෙමළ , ඉංග්‍රීසි දැන් ඔබලා ඒ උපදෙස් අනුවම ජනවාරි මාසයේද මේ?

Fair Comment BY JEZEEM

පි: ජනවාරි මාසයේම දාලා නැහැ. මේකේ දී ප්‍රශ්නයක් තියෙනවා. අපි පුවත්පත් දැන්වීම දානකොට ඒකට අවසාන දිනයක් දානවා. මෙදාට පස්සේ කළින් එවන්න කියලා. ඒත් ඒ වෙනකොට එවන්නේ නැහැ ඉල්ලුම්පත්‍ර. අපි ඒ එක්කම කරනවා. ගිය සැරේ ලියාපදිංචි වෙච්ච කර්මාන්තකරුවන්ට ලියුම් දානවා application එකත් එක්ක ආපහු ඉල්ලුම් කරන්න කියලා. ඒත් සමහර වෙලාවට එවන්නේ නැහැ. ඒ අර කියන දිනයට කළින් එවන්නේ නැහැ. අපි කොහොමත් අවුරුද්ද පුරාම ලියාපදිංචි කරනවා. ඕක තමයි ක්‍රමවේදය දිගටම තිබුණේ. දිනයක් දැම්මත් ..

ප්‍ර: guide lines වල කියලා තියෙන විදිහට නැතුව අවුරුද්ද පුරාම කරනවද?

පි: guide lines එකේ එහෙම කියලා නැහැ. දිනයක් කියලා නැහැ.

ප්‍ර: නැහැ guide lines එකේ තියෙනවා ජනවාරි මාසයේ ?

පි: ජනවාරි මාසයේ දාන්න කියලා තියෙනවා පුවත්පත් දැන්වීම. හැබැයි ලියාපදිංචි කිරීම නවත්වන්න කියලා නැහැ. මට නිරීක්ෂණය වෙලා නැහැ ඒක.

ප්‍ර: දැන් මේ ට්‍රාන්ස්ෆෝමර් දෙනවා කියලා කිව්වානේ ඔබ මේ ක්ලොසස් පුද්ගලික සමාගමට. ඔහුගේ මේ අයදුම්පත් වල තියෙනවානේ ඔහුට අවශ්‍ය අබලි ලෝහ ද්‍රව්‍ය වර්ග 3ක්. ඒ වර්ග 3න් මොකක්ද මේ ට්‍රාන්ස්ෆෝමර් වල තියන්නේ?

පි: ට්‍රාන්ස්ෆෝමර් තියෙනවා. ඇතුලේ වැඩිම වටිනාකමක තියෙන්නේ තඹ.

ප්‍ර: ඊට අමතරව මේ ට්‍රාන්ස්ෆෝමර් වල තියෙනවා නේද අර පරිසරයට ඉතාමත්ම අහිතකර විෂ ද්‍රව්‍ය ප්‍රමාණයක්?

පි: නැහැ ට්‍රාන්ස්ෆෝමර් ඔයිල් කියන එක.

ප්‍ර: ඔව්.

පි: ඔයිල් විෂ වෙන්නේ 1982 කට කළින් ගෙනාපුවා. මට මතකේ හැටියට PC මට වවනේ මතක නැහැ. PCV කොහෙදෝ. ඒ රසායනය අඩංගු වුණොත් තමයි විෂ වෙන්නේ. හැබැයි කොයි වෙලාවකවත් අපිට විදුලි බල මණ්ඩලයෙන් ඒගොල්ලන්ට නිකුත් කරන්නට බැහැ ඒ විෂ තියෙන ට්‍රාන්ස්ෆෝමර්

ප්‍ර: ඒ ඔයිල් එකේ තියෙන රසායනික සංයෝගයන් වල නම් ඔබ දන්නවද? මොනවද තියෙන රසායනික සංයෝග?

පි: ඒක පිළිබඳව මට දැනුමක් නැහැ.

ප්‍ර: ඔබලා ගිහිල්ලා බලනවද මේ කොලොසස් සමාගමට මෙම ට්‍රාන්ස්ෆෝමර්ස් දුන්නාම ඒගොල්ලෝ කොයි ස්ථානයකදී ද මේ ට්‍රාන්ස්ෆෝමර්ස් ගලවලා ඒවායේ තඹ ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන්නේ කියලා. මේ ඔය ඔරුගොඩවත්තේ කර්මාන්ත ශාලාවේ භූමියේ ද එහෙම

FAIR COMMENT BY JEZEEM

නැත්නම් වෙනත් කැළැබඳ ප්‍රදේශයක පරිසරයට හානියක් සිදු නොවන තැනක ද මෙම ට්‍රාන්ස්ෆෝමර්ස් ගැලවීමේ කාර්යය කරන්නේ?

පි: අපි ගිහිල්ලා නිරීක්ෂණය කරලා නැහැ එක.

ප්‍ර: බලලා නැහැ?

පි: බලලා නැහැ.

ප්‍ර: ඕගොල්ලන් ඒක අරන් දෙනවා විතරයි.

පි: ඔව් අනිත් ආයතනත් එහෙම ගෙනල්ලා දුන්නාට පස්සේ ගිහිල්ලා බලලා නැහැ.

ප්‍ර: නමුත් ඔබ දන්නවද මෙම ට්‍රාන්ස්ෆෝමර්ස් වල බරපතල පරිසර විනාශකාරී තත්වයක් තිබෙන බවට වාර්තා වෙමින් තිබුණා කියලා?

පි: ඔව් පරිසර හානියක් තියෙනවා. අර තියෙන මම කියපු රසායනික ද්‍රව්‍ය තිබුණොත් විතරයි ප්‍රශ්නේ තියෙන්නේ. එහෙම තියෙන රසායනික ද්‍රව්‍ය තියෙන ට්‍රාන්ස්ෆෝමර් අපිට ලබා දීමට නොහැකි කොයි වෙලාවකවත් හැකියාවක් නැහැ විදුලි බල මණ්ඩලයට. ඒගොල්ලෝ පරීක්ෂා කරලා දෙන ට්‍රාන්ස්ෆෝමර් විතරයි අපි ගන්නේ.

ප්‍ර: මෙම කොලොසස් සමාගම පිත්තල වලින් කිසියම් අග එකතු කරලා කිසියම් දෙයක් නිෂ්පාදනය කරානේ මේ අමුද්‍රව්‍ය වලින්. ඒ අමුද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කරපු අර්ධ නිමි භාණ්ඩ මොන රටවල් වලටද අපනයනය කළේ?

පි: 2017 අපේ ගිහිල්ලා කමිටුවක් විසින් ගිහිල්ලා බලපු රිපෝට් එකක් තියෙනවා මගේ ළඟ. ඒගොල්ලෝ කියන්නේ ඉන්දියාවට අපනයනය කරපු බවක්.

ප්‍ර: ඉන්දියාව විතරයි ද?

පි: ඉන්දියාව විතරයි කියලා තියෙන්නේ.

ප්‍ර: ඒ එක්කම ඔබ මෙම කොමිෂම හමුවේ ලිපි ගොඩාක් පෙන්නමින් සභාපතිතුමාට විටින් විට කොලොසස් පුද්ගලික සමාගම ඉදිරිපත් කරන ලද ලිපි වලට අමුද්‍රව්‍ය විශාල වශයෙන් ලබාදීම අනුමැතිය වූ බව සඳහන් කරානේ?

පි: එහෙමයි.

ප්‍ර: අර guide linesවල තියෙනවා කළමනාකරණ කමිටුවකට මඟින් තමයි මෙම අමුද්‍රව්‍ය ලබා දීමේ, මිල දී ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය කළ යුත්තේ කියලා?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබ ඔය කාර්ය භාරයන් කරන යුගයේ දී ඔබව අධ්‍යක්ෂකවරයාගෙන් එම විෂය අයින් කරලා ඔබට දුන්න දවසේ සිට ඔබ මේ guide lines වල තියෙන දේවල් ගිහින් සභාපතිතුමාට පෙන්නුවේ නැද්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: guide lines එක එහෙම මට මතකයක් නැහැ පෙන්නපු. කළමනාකරණ රැස්වීම් තියන්න කියලා නම් අපි ලියුම් යවලා තියෙනවා අමාත්‍යාංශයට. මොකද ඒ

ප්‍ර: ඇයි ඔබ සභාපතිවරයාට guide lines එකේ මෙහෙම උපදෙස් දීලා තියෙනවා මෙහෙමයි කරන්න ඕනි කියලා කිව්වේ නැත්තේ ?

පි: ඒක මට මතකයක් නැහැ මම කිව්වද කියලා.

ප්‍ර: මතක නැහැ?

පි: ඔව්.

ප්‍ර: සභාපතිතුමාට මතක ඇති නේද ඔබ එහෙම කිව්වද නැද්ද කියලා ?

පි: සභාපතිතුමාට මතක ඇති.

හොඳයි. බොහොම ස්තුතියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු මෙම අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සහ විකිණීම සඳහා ඔබ පිළිගත්තා මාර්ගෝපදේශක සහිත ලේඛනයක් නිකුත් කරලා තිබ්බා කියලා?

පි: එහෙමයි.

ප්‍ර: එය ඇමති මණ්ඩල තීරණයක් මත නිකුත් කරපු එකක්නේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහි මේ අබලි ද්‍රව්‍ය විකිණීමේ දී කර්මාන්තකරුවන්ට දිය හැකි වට්ටම් සඳහන් කරලා තියෙනවා නේද?

පි: වට්ටම් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: එහි කුඩා, සුළු සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට දෙන වට්ටම් ප්‍රමාණය වෙනස්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් 2017 වර්ෂයේ දී ක්ලොසස් පුද්ගලික සමාගමට ලබාදීලා තිබෙනවද වට්ටම්?

පි: වට්ටම් ලබාදීලා තියෙනවා.

ප්‍ර: ඒ ලබා දුන්නු වට්ටම් මේ මාර්ගෝපදේශක සංග්‍රහයේ තියෙන අනුමත වට්ටම් වලට වඩා වෙනස් ද නැත්නම් ඒකද?

පි: අනුමත වට්ටම් ඇතුළත තියෙන්නේ.

ප්‍ර: 2018 වර්ෂයේ දී කොලොසස් පුද්ගලික සමාගමට ලබාදුන් වට්ටම් මෙම මාර්ගෝපදේශක සංග්‍රහයේ තියෙන ප්‍රමාණයට අනුවද නැත්නම් පිටින් ද දීලා තියෙන්නේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අපි නිරීක්ෂණය කරපුවාගෙන් මධ්‍ය පරිමාණ විදියට තියෙන්නේ. ඒ නිසා අපි ඒ කළින් වට්ටම තමයි දීලා තියෙන්නේ.

ප්‍ර: ඒ ඔබගේ නිරීක්ෂණය අනුවනේ?

පි: ඔව්.

ප්‍ර: දැන් මේ මාර්ගෝපදේශක සංග්‍රහයේ තිබෙනවානේ කුඩා, සුළු සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ද යන්න නිර්ණය කිරීම සඳහා යම් නිර්ණායකයන්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම නිර්ණායකයන් යෙදීමෙන් 2017 වර්ෂයේ දී කොලොසස් පුද්ගලික සමාගම ඔබ පිළිගත්තා එක්තරා ගණයකට වැටෙන්නේ කියලා?

පි: එහෙමයි.

ප්‍ර: මොකක්ද ඒ ගණය?

පි: ඒක මහා පරිමාණ විදිහට තමයි.

ප්‍ර: මාර්ගෝපදේශක සංග්‍රහයේ තියෙන නිර්ණාකයන් යෙදුවානම් එය මහා පරිමාණ ගණයේ කර්මාන්තයක් නේද?

පි: නැහැ ස්වාමීනි. වර්ග 2ක් තියෙනවා. එකක් සේවක සංඛ්‍යාව. සේවක සංඛ්‍යාව අනුව මධ්‍ය පරිමාණ. පිරිවැටුම අනුව නම් පිරිවැටුප අපිට දීපු ඒ කියන්නේ අපි නිරීක්ෂණය කරපු විදියටනම් ඒකේ තියෙන Capacity අනුව ඒක මධ්‍ය පරිමාණ. ඒත් මේ අවස්ථාවේ දී එක නිර්ණායකදී මහ පරිමාණ විදිහට තමයි යන්නේ.

ප්‍ර: මොකක්ද ඒ නිර්ණායකය?

පි: ඒ කියන්නේ පිරිවැටුපම.

ප්‍ර: එතකොට ඒ විදිහට බැලුවා නම් 2017 වර්ෂයේ දී කොලොසස් පුද්ගලික සමාගමට දුන්න නිර්ණායක මේ දුන්න වට්ටම් මෙම මාර්ගෝපදේශක සංග්‍රහයට අනුකූලද නැද්ද?

පි: එහෙම ලබාදෙන්න වට්ටම් ලබා දෙන්න නිර්දේශයක් නැහැ. ඒ නිසා අනුකූල නැහැ.

ප්‍ර: 2018 වර්ෂයට කොලොසස් පුද්ගලික සමාගමට ලබා දුන්නු වට්ටම් මේ මාර්ගෝපදේශන සංග්‍රහයට අනුකූලද නැද්ද මේ මාර්ගෝපදේශ සංග්‍රහයේ තියෙන නිර්ණායකයන් යොදලා ඒ කර්මාන්තය කුමන ගණයේ කර්මාන්තයක් යන්න තීරණය කෙරුවද ?

පි: එහෙම නිර්ණය කෙරුවොත් අනුකූල නැහැ.

ප්‍ර: එතකොට ඔබ මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රාජකාරි භාර ගන්නේ 2017 මැයි 17 වෙනිදා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය කර්මික සංවර්ධන මණ්ඩලයේ 2005 ඉඳලා තිබ්බා?

පි: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: 2005 ඉඳලා 2017 වෙනකම් යුද්ධ හමුදාවෙන් ලැබෙන අබලි ද්‍රව්‍ය මෙම කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබුණද පිත්තල?

දැන් වේලාව: ප.ව.6.50
මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.6.50
පෙර සටහන් : නිල්මිණි කුමාරි.
මෙතැන් සිට :චන්දිමා දිල්හානි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

පි: මා ඒ පිළිබඳව දන්නේ නැහැ. ඒත් තියෙනවා පිත්තල උණ්ඩ කොපුවෙන්න ඕන ලැබිච්ච කාලයක් තිබුණා ඒක වර්ෂය තිබුණා මට මතක නැහැ මම එතකොට මේ සම්බන්ධ නැහැ. ප්‍රධාන කාර්යාලයේ හිටියේත් නැහැ මං.

ප්‍ර: ඔබ ප්‍රධාන කාර්යාලයට ආවේ කවද්ද?

පි: මම ප්‍රධාන කාර්යාලයට ආවේ 2008

ප්‍ර: එතකොට 2008 ඉදලා 2017 වෙනකම් එවැනි පිත්තල අබලි ද්‍රව්‍ය හැමදාවලින් ලැබුණේ නැහැ නේද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට?

පි: ලැබුණා කියලා මා දැනුවත් නැහැ කොයිවෙලාවකවත්.

ප්‍ර: ඔබ අලෙවි අංශයේ මම ඉන්නේ?

පි: නැහැ අලෙවි අංශයේම ආවේ 2014 වර්ෂයේ.

ප්‍ර: හරි 2014 කියලා ගමු .2014 අලෙවි අංශයට එනවා?

පි: එහෙමයි ස්වාමිනි .

ප්‍ර: 2014 ඉදලා 2017 වෙනකම් යුධ හමුදාවෙන් මේ පිත්තල කොපු වැනි දේවල් ආරක්ෂක අංශවලින් කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබුණද?

පි: නෑ ලැබුන් නෑ.

ප්‍ර: එතකොට ඒ වකවානුව තුල අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියෙන් ලැබුණු ලාභය 2017 ට පස්සේ ලැබුණු ලාභයට වඩා අඩුයි නේද?

පි: 2017 ට පස්සේ ලැබුණු ලාභයට වැඩිය අඩුයි.

ප්‍ර: 2017 ට පස්සේ ඔබගේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයෙන් යම් ලැබුණු ලාභයක විශාල වශයෙන් වැඩිවීමට හේතු වුණේ හමුදාවෙන් ආරක්ෂක අංශවලින් ලැබුණු මේ පිත්තල කොපු හින්දා නේද?

පි: ඒ විදියටම කියන්න අමාරුයි ස්වාමිනි. අපි අනිත් ද්‍රව්‍යයක් වැඩි ප්‍රමාණයක් ලබා ගනිමින් තියෙනවා.

ප්‍ර: සාපේක්ෂව වැඩිම විකුණුවේ මොකක්ද?

පි: මේක ප්‍රමාණය අනුව නම් වැඩිය විකුණුවේ ඇලුමිනියම්.

ප්‍ර: හරි එතකොට පිත්තල? ඒ කියන්නේ පිත්තල කොපු මේ හමුදා අංශයෙන් ලැබුණද?

පි; කලින් පිත්තල කොපු ලැබුන් නැහැ මේකෙන් හමුදාවෙන් තමයි ලැබුණේ.

ප්‍ර: එතකොට වටිනාකම අතින් බලන කොට ඒ ඇලුමිනියන් ද්‍රව්‍යවලද වටිනාකම වැඩි පිත්තල කොපුවලද වටිනාකම වැඩි?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: කිලෝ එකක ගාන බැලුවොත් පිත්තල කොපු වෙනවා.

ප්‍ර: එතකොට 2017 මැයි මාසයෙන් පස්සේ තමා මේ වටිනා ද්‍රව්‍ය ඔබගේ අලෙවි අංශට විකිණීමට ලැබෙන්නේ?

පි: ඔව් පිත්තල ලැබෙන්නේ 2017 න් පස්සේ .

ප්‍ර; එතකොට ඒ අනුව බලන කොට 2017 ට පස්සේ අලෙවි අංශයේ ලාභය වැඩිවීමට ප්‍රධාන සාධකයක් වුණේ මේ පිත්තල ද්‍රව්‍ය විකිණීම කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: මේ පිත්තල ලැබීමත් ප්‍රධාන සාධකයක් තමයි අපි ඊට අමතරවත් තව වැඩි ප්‍රමාණයක් ඇදලා තියෙනවා.

ප්‍ර: නමුත් ප්‍රධාන සාධකයක්?

පි: ප්‍රධාන සාධකයක් කියලා පිළිගන්නවා.

ප්‍ර : පිත්තල ලැබුණා කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔබ මීට කලින් සාක්ෂි දෙමින් පිළිගත්තා වරින් වර හිටපු සභාපති ජිනසේන මහතා සහ සමහරක් අවස්ථාවලදී මේ රත්නමල්ල මහතා අධ්‍යක්ෂක ජනරාල් ඔබට ලිඛිතව උපදෙස් ලබා දුන්නා මේ කොලෝසස් පුද්ගලික සමාගමට වැඩියෙන් මේ අඛලි ද්‍රව්‍ය ලබාදීම සඳහා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක හරිද?

පි: එහෙමයි.

ප්‍ර: දැන් එලෙස වැඩියෙන් අඛලි ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධයෙන් කොලෝසස් සමාගමට වැඩියෙන් ලබා දීම සම්බන්ධයෙන් ඔබ සභාපතිවරයාව යම් අවස්ථාවක දැනුවත් කෙරුවද?

පි: යම් අවස්ථාවල මං වාචිකව කතා කරලා තියෙනවා.

ප්‍ර: මොකක්ද ඔබ වාචිකව ඒ සභාපතිවරයාව දැනුවත් කෙරුවේ?

පි: වාචිකව කතා කෙරුවේ වැඩි ප්‍රමාණයක් දෙන අවස්ථාවලදී වැඩි ප්‍රමාණයක් දීම ගැන එතකොට එතුමාගේ පිළිතුර වුනේ ලොකු අයට දෙන්න ඕනේ පොඩි අයටත් ඒ පරිමාණයෙන් දෙන්න ඕන කියන එක.

ප්‍ර: එතකොට ලොකු අය පොඩි අය අතර මේ විදියට වෙනස් විදියකට ලබාදීම සම්බන්ධයෙන් ඔබ යම් කිසි කාරණාවක් සභාපතිවරයාට ඒ අවස්ථාවේදී දැනුම් දුන්නාද?

පි: එසේ දැනුම් දුන්නේ නැහැ වැඩි ප්‍රමාණයක් අපිට පුරුද්දක් තිබුණ නැහැ වැඩි ප්‍රමාණයක් ලබාදීලා. ඒ නිසා තමයි සභාපති කියන්නේ නැත්නම් අපි කොයිවෙලාවකවත් පොඩි අයට ලබාදීමේ දී අනුමැතියක් ඉල්ලන්නේ නැහැ.අනුමැතියක් ලබා ගන්නෙත් නැහැ. එහෙම කවුරුවත් එතෙන්නට එහෙම ගිහිල්ලා නැහැ.

Presidential Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: හරි මං ප්‍රශ්නේ මෙහෙම අහන්නම් ඔබ ඒ අවස්ථාවක සභාපතිවරයාට දැනුම් දුන්නද මෙලෙස කොලෝසස් සමාගමට වැඩියෙන් ලබා දීමෙන් අනෙකුත් කර්මාන්තකරුවන්ට අසාධාරණයක් ඇති වෙනවා කියලා?

පි: අසාධාරණයක් ගැන මම සඳහන් කරලා නැතුව ඇති ඒ වුණත් මං දැනුම් දීලා වාචිකව යම් යම් අවස්ථා කීපයක් ද කියලා කියන්න බැහැ. මතකයක් නැහැ. දැනුම් දීලා ඇති අසාධාරණයක් පිළිබඳ නෙමේ ඒ කියන්නේ මේ ප්‍රමාණය ලබා දීම පිළිබඳව සහ අනෙක් අයට ලබා දීම පිළිබඳව කතා කරලා ඇති.

මේ අවස්ථාවේදී සාක්ෂිකරුට සාක්ෂිකරු විසින් මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකය වෙත කරන ලද 2020/05/23 වැනි දින දරන ප්‍රකාශය පෙන්වා සිටියි.

ප්‍ර: ඕකේ හත් වෙන පිටුව බලන්න නැහැ 6 වෙනි පිටුව බලන්න. ඔබගේ අත්සන තියෙනවද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබට පෙන්වා සිටින්නේ ඔබ විසින් 2020.053 දින දරණ කරන ලද ප්‍රකාශයද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ හැම පිටුවකම යට ඔබ අත්සන කරලා තියෙනවද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: 6 වෙනි පිටුව බලන්න. ඔතන දෙවනි ප්‍රශ්නයක් තියෙනවා නේද උලුප්පා දක්වපු අකුරු වලින් තියෙන?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒකට යටින් දීලා තියෙන උත්තරය මොකක්ද?

පි: 2018 වර්ෂයේ කිරිබත්ගොඩ ප්‍රදේශයේ.

ප්‍ර: නැහැ නැහැ ඒකට උඩින් තියෙන ප්‍රශ්නය?

පි: ඒ සම්බන්ධ මා දන්නේ නැහැ. නමුත් මා විසින් මෙම කර්මාන්ත ශාලාවට විශාල වශයෙන් අබලි ලෝහ ලබාදීම සිදුකළේ සභාපතිවරයාගේ නියම පරිදි මෙසේ අබලි ලෝහ ලබා දීම සම්බන්ධව අවස්ථා කිහිපයකදී මා වාචිකව දන්වා සිටියා.මෙසේ විශාල වශයෙන් අබලි ලෝහ ලබා දීම අනෙකුත් කර්මාන්තකරුවන් යම් අසාධාරණයක් ඇති විය හැකි බැවින් මෙම තත්ත්වය සමතුලිත කිරීමට මේ දෙන අමුද්‍රව්‍යය ප්‍රමාණය කළමණාකරන කිරීමට සුදුසු බව දන්වා සිටී. නමුත් ඒ පිළිබඳව ඔහු සැලකිල්ලක් නොලද අතර එබැවින් එම තත්ත්වය පාලනය කිරීමේ හැකියාවක් මා සතුව නොතිබුණි.

ප්‍ර: එතකොට ඔබගේ ප්‍රකාශයට අනුව මෙම ගරු කොමිෂන් සභාවට දීපු ප්‍රකාශයට අනුව ඔබ මේ කොලෝසස් පුද්ගලික සමාගමට විශාල වශයෙන් භාණ්ඩ දීමෙන් අනෙකුත් කර්මාන්තකරුවන්ට අසාධාරණයක් ඇති විය හැකි බව සභාපතිවරයා දැනුවත් කරලා තියෙනවානේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් මේ අනුව තියෙනවා.

ප්‍ර: එතකොට දැන් ඔබ මෙම කොමිෂමේ අද දින දුන්න සාක්ෂිය ද හරි මෙම ප්‍රකාශයේ තියෙන සාක්ෂියද හරිද?

පි: මේ ප්‍රකාශය හරි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ අද දින සාක්ෂි ලබාදීමේදී කිව්වා නේද ඔය කොලෝසස් පුද්ගලික සමාගමට වැඩියෙන් අබලි ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධයෙන් අනෙකුත් කර්මාන්තකරුවන්ට අසාධාරණයක් වෙනවා කියලා ඔබ සභාපතිවරයා දැනුවත් කලේ නැහැ කියලා?

පි: එහෙමයි ස්වාමිනි මට මතක හැටියට කිව්වේ.

ප්‍ර: එතකොට අද දින කොමිෂමේ කියපු ප්‍රකාශය ද හරි ඔබ පොලිස් ඒකකයට ලබාදුන් ප්‍රකාශයද හරි?

පි: පොලිස් ඒකකය ලබා දීමෙන් දුන් එක හරි ඇති.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

සාක්ෂිකරුට දැනටමත් C 765 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටියි.

ප්‍ර: ඔබගෙන් ගරු සභාපතිතුමා ඇහුවා ප්‍රශ්නයක් මේ 2013 මාර්ගෝපදේශන සංග්‍රහය අනුව මධ්‍යම සහ සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට ලබාදෙන එක් වට්ටම් සම්බන්ධයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ වට්ටම් වලදී සුළු කර්මාන්තකරුවන්ට එක වට්ටමකුත් මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවටන්ට එක වට්ටමකුත් ලබාදෙනවා?

පි; එහෙමයි.

ප්‍ර: දැන් ඔබ 2017 වර්ෂයේදී කොලෝසස් පුද්ගලික සමාගම කුමන වර්ගීකරණයකට ද ඇතුළත් යටත් කර තිබුණේ?

පි: මධ්‍ය පරිමාණ.

ප්‍ර: මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙකුට ලබාදිය යුතු වට්ටම කොපමණද ප්‍රතිශතය?

පි: අමුද්‍රව්‍යයේ වෙළඳපොළ වටිනාකමින් 10% ත් 15% ත් අතර ප්‍රමාණයන්.

ප්‍ර: ඒ කියන්නේ 15% තමයි උපරිම වට්ටම ලබාදෙන්න පුළුවන්?

පි: එහෙමයි.

ප්‍ර දැන් ඔබට පෙන්වා සිටින්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් 2017.11 වැනි මාසේ 10 වන දින පිත්තල කොපු මිලදී ගැනීමට අදාලව එම්.අයි ඉම්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට නිකුත් කරන ලද ඉන්වොයිසි පත්‍රයක පිටපතක් කියලා කිව්වොත් එක හරිද?

පි: එහෙම හරි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඉන්වොයිසි පත්‍රයේ සටහන් කර තිබෙනවද පිත්තල කිලෝ එකක් රුපියල් කීයටද මේ කර්මාන්තකරුට ලබා දීලා තියෙන්නේ කියලා?

පි; පැහැදිලි නැහැ 398.75 වගේ මගේ උහතියේ ඇති මම ඒකෙන් බලන්නම්

ප්‍ර: ඒ අනුව ඉන්වොයිස් පත්‍ර අංක H/05560 යටතේ 2017.10.11 වන දින පිත්තල කිලෝග්‍රෑම් එකක් සඳහා අය කර ගෙන තියෙන්නේ ඔය ලේඛනය අනුව රුපියල් 398 සත 75 කියලා කිව්වොත් ඒක හරිද? ලේඛනය

පි: ඒක හරි.

ප්‍ර: නමුත් එම කාල වකවානුවේදී පිත්තල කිලෝග්‍රෑම් එකක් මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙකුට ලබා දිය යුතුව තිබෙන්නේ දළ වශයෙන් රුපියල් 438.85 කට කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවාද?

පි: ඒක මං පිළිගන්න අමාරුයි .

ප්‍ර: ඒ අනුව ඔය ලේඛනයය අනුව කොපමණ ප්‍රමාණයක් ද පිත්තල ලබා දීලා තිබෙන්නේ?

පි: 1625 කිලෝ.

ප්‍ර: එසේම එකී වර්ෂය පුරාවටම කොලෝසස් පෞද්ගලික සමාගමට එක්ලක්ෂ දහසය දහස් අටසිය හැට අටක කිලෝ ප්‍රමාණයක පිත්තල ලබා දීලා තිබෙනව නම් දළ වශයෙන් රුපියල් මිලියන 4.6 ක මෙය පාඩුවක් කාර්මික සංවර්ධන මණ්ඩලයට සිදුවී තිබෙනවා කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවද?

පි: එය පිළිගැනීමට අපහසුයි ස්වාමිනි.

ප්‍ර: ඇයි අපහසු වෙන්නේ?

පි: අපහසුයි මෙම මිල තීරණය කිරීම පදනම විස්තර කරන්න පුළුවන්ද ස්වාමිනි මට

****

<u>ගරු සභපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඊට ඉස්සෙල්ලා කියන්න ඔබ කිව්වා දෙන්න පුළුවන් ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක් දීලා තියෙනවා කියලා දෙන්න පුළුවන් වට්ටමට වඩා වැඩි වට්ටමක් දීලා තියෙනවා කියලා.

පි: නෑ ස්වාමිනි .

ප්‍ර: ඔබ කිව්වා.

පි: දෙන්න පුළුවන් වට්ටම් අතරේ තමයි දීලා තියෙන්නේ.

ප්‍ර: නෑ ඔබෙන් ඇහුවා ප්‍රශ්නයක් මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට දෙන්න පුළුවන් වට්ටම 10% යි 15% අතරේ මේ අවස්ථාවේ දී ඔබට පෙන්නපු ලේඛනය අනුව 20% කට ආසන්න වට්ටමක් දීලා තියෙනවා.?

FAIR COMMENT BY JEZEEM

පි: එය එසේ නෙමේ ස්වාමිනි මම ඉස්සෙල්ලා කිව්ව පිළිතුරමයි ඒක පැහැදිලි නොවුනා නම් සමාවෙන්න එසේ නෙමේ දීලා තියෙන්නේ

ප්‍ර: එහෙනම්?

පි: මට පැහැදිලි කරන්න පුළුවන්. මම පැහැදිලි කරන්න ද ස්වාමිනි හොඳට මිල තීරණය කිරීමේදී මිල කමිටුවක් පත් කරනවා සාමාන්‍ය ක්‍රමය ඒකේදී අපි මිල තීරණය කරන්නේ අමුද්‍රව්‍ය වෙළඳපොල මිල මත පදනම් වෙලා වෙළඳපොල මිල තීරණය කරන්නේ තීරණය කරන්න පදනමක් නෑ ලොකු එකේදී අපි කර්මාන්තකරුවෝ ගෙන්වනවා ඒ ඒක්කම වාත්තු අංශයේ ඉංජිනේරුවෝ ඉන්නවා ඒගොල්ලොත් එක්ක සාකච්ඡා කරලා තීරණය කරගන්නවා කීයද වෙළඳ පොල මිල කියලා ඒ මිලෙන් තමයි අපි වට්ටමක් දී ගෙන යන්නේ දැන් අපි හිතමු මෙකේදී මේ මිල තිරණය කිරීමේදී අධ්‍යක්ෂක ජෙනරාල්තුමා කියලා තියෙනවා මෙන්න මේක තමයි මාකට් ඒක තියෙන්නේ ඒ විදියටමයි. මාකට්ප්‍රයිස් එක මට මතක විදියට රුපියල් 450 යි 500 අතර තියෙන්නේ. එතකොට අපි ඒ වගේ අගයන් දෙකක් තිබුණට මැද අගය ගන්නවා. ඒ මැද අගය අරගෙන අඩුකරලා 15% ක් අරගෙන තියෙන්නේ මෙතනදි අපි මිලතීරණය කරා මිල කමිටුවටත් තියෙනවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරපු ලියවිල්ල එහෙම බැලුවාම 403 යි සත 50 ක් වගේ ගානක් තියෙන්නේ මේක අපට 406 යි ඒක තීරණය කරලා තියෙන්නේ අතුලත්ව NBT එකත් ඇතුලත්ව තමයි මිල තීරණය කරලා තියෙන්නේ අනිත් අයටත් මේ අයටත් එතකොට 406 ශත 50 ට තමයි අපි විකුණලා තියෙන්නේ සම්පූර්ණ මුදල

ප්‍ර: දැන් විකුණන මුදල ඔය කට්ටිය කොහොම ද තීරණය කරේ?

පි: විකුණනමිල තීරණය කරන්නේ අර වෙළඳපොලේ තියෙන මිලක් තීරණය කරනවා මෙන්න මේක තමයි කියලා මොකද ඕක වෙනස් වෙනවා මිල අද තියෙන මිල නෙමේ හෙට තියෙන්නේ ඒ මිල මැද අගයක් අරගෙන ඒ මැද අගයන් අඩු කරනවා දෙන්න තියෙන වට්ටම අපි හිතමු අපිට ආවේ 475 යි කියලා ඒක බෙදනවා 100 යෙන් සියෙන් බෙදලා 15% ක් නම් දෙන්නේ අපි 85 න් වැඩිකරනවා 85 න් වැඩි කෙරුවාම එනවා එයාට දෙන්න ඕන මිල

ප්‍ර: එතකොට ඔය විකුණන මිල තීරණය කෙරුවේ ඒ පදනම් මත විතරද?

පි: ඒ පදනම් මත.

ප්‍ර: මාර්ගෝපදේශන සංග්‍රහයේ තිබ්බේ නැද්ද විකුණන මිල තිරණය කරන්නේ කොහොමද කියලා?

පි; එහෙම තමයි තියෙන්නේ. වට්ටම් ප්‍රමාණය තියෙනවා වෙළඳපොල මිල ගන්න ක්‍රමයක් කියලා නෑ කොයි වෙලාවෙවත් ඒ ගන්න ක්‍රමයකුත් නෑ අබලි ද්‍රව්‍යවල වෙනස් වෙනවා සැරින් සැරේ එතකොට අපි අපේ පවුන්රියේ වාත්තු අංශයේ ඉංජිනේරුවෝ ඒ ගොල්ලෝත් දන්නවා

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලොත් අබලි ද්‍රව්‍ය ගන්නවා සහ අමුද්‍රව්‍ය ගන්නවා ඒ එක්කම කර්මාන්තකරුවොත් ගන්නවා. එතකොට ඒ ගොල්ලෝන් කතා කරලා තමයි ගන්නේ මෙතනදි පවුන්රියේ අයගේ නිර්දේශය තමයි දීලා තියෙන්නේ අපි මිල සඳහන් කරපු ලේඛනයක් තිබුනා මුලින්ම මම ඉදිරිපත් කෙරුවා ආරක්ෂක අමාත්‍යාංශයෙන්ම එවපු ලියූ මෙම අධ්‍යක්ෂක ජනරාල් විසින් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: දැන් ඔය මාර්ගෝපදේශන සංග්‍රහය බලන්න? 08 වෙනි පිටුව බලන්න? ඒ කියන්නේ අංක 07 උප කරුණ යටතේ මිලසූත්‍රයක් තියෙනවා නේද විකුණන මිල සූත්‍රයක් තියෙනවා නේද?

පි: මිල සූත්‍රයක් තියෙනවා.

ප්‍ර: කොහොමද විකුණ මිල තීරණ යකරන්නේ?

පි: විකුණුම් මිල තීරණය කරන්නේ ගැණුම් මිලට ප්‍රවාහන ගාස්තු එකතු කරලා

ප්‍ර: හරි දැන් ගැනුම් මිල කීයද මේ තුන්සිය අසූ ගානට විකුණපු තඹ වල?

පි: 308. සත 12 යි.

ප්‍ර: කොහේද ඒක තියෙන්නේ ?

පි: ගැනුම් මිල ආරක්ෂක අමාත්‍යාංශයෙන් එවපු ලියුමේ තියෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ අවුරුදු දෙකටම ඒ මිල මත ද ගත්තේ?

පි: දිගටම ඒ මිලට තමයි ගත්තේ.

ප්‍ර: 308 යි?

පි: ශත 12 යි.

ප්‍ර: එතකොට කොච්චර ප්‍රතිශතයක් තියාගන්න ඕනේ ද ලාභ හැටියට?

පි: ලාභ එක එක තියෙනවා 25,% 30 යි 15,20 යි 25යි. 10,15

ප්‍ර: නෑ දැන් ඔය පෙන්නපු ලේඛනයේ

පි: 10,15 යි අතර තියා ගන්නවා.

ප්‍ර: ඩිස්කවුන්ට් එක ගැන නෙමේ කියන්නේ? ලාභයත් තියා ගන්න ඕනේනේ.

පි: ලාභයක් තියා ගන්න ඕනේ ලාභය 5% යි තියාගෙන තියෙන්නේ

ප්‍ර: කොහේද 5% යි කියලා තියෙන්නේ

පි: ස්වාමිනි මේ ලේඛනයේ නැහැ අපේ මිල කමිටුවල තියෙනවා මේ 5% යි කියලා මිලකමිටුවේ තියෙනවා අපේ වෙනම පෝමැට් එකක් එකේ සඳහන් කරලා තියෙන්නේ 5% යි ඊට පස්සේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යාලය වියදම් 20% විදියට තමයි තියාගෙන තියෙන්නේ.

ප්‍ර: ඒ 20% යි කියන්නේ ගැනුම් මිලෙන් 20% ක් ?

පි: ගැනුම් මිලෙන් 20% ක් .

ප්‍ර: එතකොට 308 ට 20% එකතු කලාම කීයද?

පි: 300 ට නම් .

ප්‍ර: 368 ක් විතර වෙනවානේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් 300 ට නම් 368 ක් විතර වෙනවා.

ප්‍ර: 368 ට නම් එතකොට transport charge ?

පි: එකතු කරන්න ඕනේ.

ප්‍ර: කීයද?

පි: රුපියල් 5 ත් 10 ත් අතර වෙනවා දුර අනුව වෙනස් වෙනවා.

ප්‍ර: එතකොට profit margin එක?

පි: profit margin 5% යි.

ප්‍ර; overhead charges 20%?

පි: 20% ක්?

ප්‍ර: කීයෙන් සීයට 20 ක් ද ?

පි: ඒක තීරණය කරන්නේ ස්වාමිනි මෙන්න මෙතන මං පැහැදිලි කරන්නම් මේකේ මේ මිල කමිටුව මේක මේ මිල තීරණය කරලා තියෙන්නේ මේ වගේ සුවිශේෂි අවස්ථාවක් කියලා නැහැ.

ප්‍ර: මොකක්ද මේකේ තියෙන සුවිශේෂි අවස්ථා?

පි: අපිට ගැනුම් මිල තීරණය කරලා එවලා තිබුණා. අපි වෙනදා

ප්‍ර: මේ මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙන කොටත් ගැනුම් මිල තීරණය කරනවා බව දැනගෙනන හිටියේ?

පි: ගැනුම් මිල තිරණය කරන්නේ මිල කමිටුවෙන්.එතනයි වෙනස තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: එතන සුවිශේෂි කාරණාවක් වෙන්න බැහැනේ මේ මාර්ගෝපදේශන සංග්‍රහය නිකුත් කරන කොට කැබිනට් ඇමති මණ්ඩලය තීරණය කෙරුවානේ මේක මේ ගානට ගන්න ඕනේ කියන එක?

පි: ඔව් .

ප්‍ර: ඔව් ද නැද්ද?

පි; පිත්තල ගන්න ඕන ගාන අපිට කියලාම එවලා තිබ්බා.

ප්‍ර: එතන සුවිශේෂි කාරණයක් නෙමේනේ?

පි: සුවිශේෂි කාරණයක් නෙවේ ස්වාමිනි අපි වෙන ආයතනවල මිල තීරණය කරන්නේ මේ විදියට නෙමේ. වෙන ආයතනවලදී අපි තීරණ ගන්නේ ඉස්සෙල්ලාම ගන්නේ වෙළඳ පොලේ අමුද්‍රව්‍ය මිල ඊට පස්සේ එකෙන් සුළු කර්මාන්තවල 25%ක් දෙනවානම් 25% ක් අඩුකරලා තමයි මිල තීරණය කරන්නේ දැන් මේ අපිට මිල තීරණය කරලා එවලා තිබුණේ එතකොට ඒ විදියට ගැනුම් මිල තීරණය කෙරුවාම ඊට පස්සේ තමයි මේ ඒ විදියට අඩු කරගෙන අඩු කර ගෙන ඇවිල්ලා ආයතනයෙන් ගන්න මිල තීරණය කරන්නේ. මුලින්ම තීරණය කරන්නේ වෙළඳපොලේ මිල තීරණය අරගෙන එකෙන් සීයට ගාන අඩු කරලා ප්‍රමාණය තමයි ගැනුම් මිල විකුණුම් මිල විදියට තීරණය කරන්නේ කර්මාන්තකරුට ඊට පස්සේ එතනින් අඩු කරගෙන තමයි ගැනුම් මිල තීරණය කරන්නේ මේක ඒ විදියට කර ගන්න බැරිවුනා අපිට

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් දාලා ඒගොල්ලන් මෙම පිත්තල අමුද්‍රව්‍ය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට විකිණිය යුතු මිලක් තීරණය කරලා තියෙනවානේ?

පි: එහෙමයි.

ප්‍ර: ඔබ කියන්නේ Guild lines අනුව අමුද්‍රව්‍ය ගැනීමේ දී මිල කමිටුවක් මගින් තමයි ඒ ගැනුම් මිල තීරණය කරන්නේ.

පි: එහෙමයි.

ප්‍ර: දැන් ඒක පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මෙතන කැබිනට් තීරණයකට පසුව ගත්ත කැබිනට් තීරණයක් අනුව තමයි ආරක්ෂක අමාත්‍යාංශය ඒගොල්ලොන්ගේ විකුණුම් මිල තීරණය කරන්නේ. ඒක තමයි ඔබලාගේ ගැනුම් මිල වෙන්න ඕන.

පි: එහෙමයි.

ප්‍ර: අපි හිතමු දැන් ගැනුම් මිල ඔබලා සූත්‍රයට හදපු එකක් තියෙනවා. ගැනුම් මිල අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියක් පරිදි ආරක්ෂක අමාත්‍යාංශය දීපු ගැනුම් මිලක් තියෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: ගැනුම් මිල මත ඔබලා අර කර්මාන්තකරුවන් වර්ගීකරණ තුනක් තියෙනවනේ. සුළු කර්මාන්තකරුවන් සහ තව කවුද ඉන්නේ?

පි: සුළු කුඩා සහ මධ්‍යම පරිමාණ.

ප්‍ර: එතකොට දැන් සුළු, කුඩා සහ මධ්‍ය අයට අර වට්ටම් ප්‍රතිශතයකුත් තියෙනවනේ දෙන.

පි: එහෙමයි.

ප්‍ර දැන් මධ්‍යම එක්කෙනෙකුට දෙන්නේ 10,15 ත් අතර නම් ඔබලා දීලා තියෙනවානේ 20% ක වගේ වට්ටමක්.?

පි: ඔව්

ප්‍ර: දැන් ඒක ගැන කතා කරනකොට අර ගැනුම් මිල තීරණය කිරීමේ කමිටුව ඒවා මේවා අදාල වෙන්නේ නැහැ නේද? මොකද මේක අමාත්‍ය මණ්ඩල තීරණයකින් ගැනුම් මිල තීරණය කරලා තියෙනවා. දැන් ඔබලාට තියෙන්නේ ඒ ගැනුම් මිල අරගෙන එකෙන් කොහොමද අර කර්මාන්ත වර්ගීකරණයන් 03 අනුව වට්ටමක් දීලා විකුණන මිල තීරණය කරන්නේ කියන එක නේද ඔයගොල්ලෝ කරන්න ඕනේ?

පි: එසේ කලොත් වෙළඳපොළ මිලට වැඩිය සීයට මේ තියෙන ප්‍රමාණය දැම්මොත් 475 යි වෙළඳපොළ මිල කියලා අපි තීරණය වෙලා තියෙන්නේ සමහර විට 500,600 වෙනවා.

ප්‍ර: දැන් එතකොට ඔයගොල්ලෝ මොකද කරේ?

Parliament Secretary's Copy
HAIR COMMENT BY JEZEEM

පි: අපි කරේ වෙළඳපොළ මිල අරගෙන අපිට ගැනුම් මිල තියෙනවා වෙළඳපොළ මිල අරගෙන වෙළඳපොල මිලෙන් වට්ටම් දුන්නා ගන්න අයට.

ප්‍ර: හරි එතකොට ඔයගොල්ලෝ වෙළඳපොල මිල කියන එකත් fix එකක්නේ ගන්නේ?

පි: fix එකක් ගත්තේ

ප්‍ර: fix එකක් අරගත්තේ. අපි හිතමුකෝ 475 යි එතකොට ඒ 475 නේද අර වර්ගීකරණ තුන අනුව Discount එක තීරණය කල යුත්තේ?

පි: එහෙම තමයි.

ප්‍ර: එතකොට දැන් මේ ප්‍රශ්නය වෙන්නේ ඒ 475 දී මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙකුට දිය යුතුව තිබූ වට්ටම් ප්‍රතිශතය 10,15 ත් අතර තිබියදී ඔබලා 20%,25% අතර ඒ කියන්නේ අර සුළු කර්මාන්තකරුවෙකුට දෙන වට්ටම් ප්‍රතිශය අනුව ගණනය කරලා තමයි මෙම මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවාගේ විකිණීමේ මිලනිරණය කිරීමේ දී වට්ටම ලබා දීලා තිබෙන්නේ කියන එක ඔබ ඒක එකඟ වෙනවා නේද එහෙම?

පි: නැහැ.එකඟ වෙන්නේ නැත්තේ මෙතන ස්වාමිනි අපි තීරණය කරලා තියෙන්නේ NBT එකත් එක්ක ඇතුලත් මිලක්.

ප්‍ර: කොයි මිලද ඔය කියන්නේ?

පි; ඉතින් ඒ කියන්නේ විකුණන මිල

ප්‍ර: ඒවා ප්‍රශ්නයක් නැනේ NBT කියන ඒවා අර කර්මාන්ත categories තුනේ ඔක්කෝටම සමානයිනේ?

පි: සමානව යන්නේ එතකොට අපි

ප්‍ර: මෙතන මේ එකම විවිධකාරයෙන් සැලකිම තියෙන්නේ කර්මාන්ත වර්ගීකරණ තුනට ඩිස්කවුන්ට් එක දීමනේ මිල තීරණය කිරීමේදී දැන් ඔබ සඳහන් කරනවා ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩලය සංදේශයේ විකිණීමේ මිල ඔබ අර ගෙන ඔබත් විකිණීමේ මිල එහෙම තීරණය කරොත් පාඩු නිසා ඔබලා කිසියම් සුත්‍රයක් භාවිතා කරලා මිලක් තීරණය කරා?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඒ මිල ඇත්තටම මාකර්ට් ප්‍රයිස් එකටත් වඩා වැඩි මිලක් වුනා නමුත් ඒක ප්‍රශ්නයක් නැහැ ඒකට නේ ඩිස්කවුන්ට් එක දෙන්නේ අර වර්ගීකරණ තුනට ?

පි: ඔව්.

ප්‍ර: අපි දැන් අහන්නේ ඔබලා එසේ තීරණය කරන ලද මිලට කර්මාන්ත වර්ගීකරණයත් අනුව වට්ටම් ලබා දීමේදී සුළු හා මධ්‍යම පරිමාණ ?

පි: සුළු කුඩා හා මධ්‍ය පරිමාණ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සුළු හා කුඩ,මධ්‍යමනේ මධ්‍යම කර්මාන්තකරුවෙකුට දෙන ඩිස්කවුන්ට් වට්ටම 10% ක් 15% අතර තිබියදි ඔහුට දීලා තියෙනවා සුළු කර්මාන්ත කරුවෙකුට දෙන 20% ක වට්ටමක් ඒක තමයි අහන්නේ ඔබගෙන් ප්‍රශ්නය?

පි: ඔව් ඒක මට පැහැදිලි ස්වාමිනි අපි සුළු හා සුළු සහ මධ්‍ය පරිමාණ අයට මිල නියම කිරිමේදි තීරණය කරලා තියෙන්නේ NBT ඇතුලත් මිලමයි එතකොට ඒ NBT ඇතුලත් මිල හැම වෙලාමේම 475 න් 475 සියෙන් බෙදලා දැන් මධ්‍ය පරිමාණ අයට 15 නම් දෙන්නේ 85 න් වැඩි කෙරුවාම එන්නේ 403.50 යි අපි 406.50 තීරණය කරලා තියෙනවා NBT ඇතුලත්ව.ඒක තමයි NBT අඩු කෙරුවාම තමයි 399.75 එන්නේ.

ප්‍ර: නෑ මේ NBT එක හැමෝටම පොදු දෙයක් නේ?

පි: හැමෝටම පොදු දෙයක්.

ප්‍ර කර්මාන්ත වර්ගීකරණයට බාධාවක් නැහැ දැන් ඔබලා කිසියම් මිලක් තිරණය කරනවානේ විකුණන ඊට පස්සේ ඒකට දෙනවානම් වට්ටම අර කර්මාන්ත වර්ගීකරණයන් අනුවනේ වට්ටම දෙන්නේ ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ 10% ක් සිට 15% ක් දක්වා වට්ටමක් දෙන කර්මාන්තකරුවෙකුට 20% ක හෝ 25% වට්ටමක් දීලා මිල තිරණය කලාම ඒ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවා ගෙවිය යුතු මුදලට වඩා අඩු මුදලක්නේ ගෙවන්නේ තේරේණවද ඒ කියන දේ?

පි: ඔව් මට තෙරේනවා

ප්‍ර: එසේ ගෙවිය යුතු මුදලට වඩා අඩු මුදලක් ගෙවිම තුලින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු ආදායමෙන් කිසියම් ප්‍රමාණයක් අහිමි වී යනවා. ඒක ගැන තමයි ඔබගෙන් මේ ප්‍රශ්නය අහන්නේ?

පි: ඔව්.

ප්‍ර: අනිත්වා පටල ගන්නේ නැතිව උත්තර දෙන්න?

පි: නෑ අපි තීරණය කරපු මිල වෙළඳපොල මිලත් එක්ක බලලා 475 ට තීරණය කරලා තියෙන්නේ 475 න් සියට 15 ක් අඩු කෙරුවාම තමයි ඔය මිල එන්නේ ඒ කියන්නේ අපි හැම වෙලාවේම මම නැවතත් පැහැදිලි කරන්නම් අපි ඒ මිල තිරණය කෙරුවේ NBT එක්ක ඇතුලත් මිල එතකොට ඒ දෙකේම එතකොට

ප්‍ර: මං හිතන්නේ මෙච්චර සරලව මම ඔබට ප්‍රශ්නය දැන්මම ඔබ නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයෙක්නේ මේ ලංකා කාර්මික සංවර්ධන මණ්ලයේ මාකර්ටින් එකේ මාර්කටින් කියන්නේ මේ ගණන් ඒවාත් එක්ක නිතරම කටයුතු කරන කෙනෙක්නේ දැන් ඔබට මම සරලව කියපු දේ මං කියන්නේ ඔබලා කිසියම් මිලක් තීරණය කරා NBT වැට් ඒවා ගැන ඔක්කෝම පොදුයිනේ තීරණය කරපු මිලෙන් තමයි ඔය

FAIR COMMENT BY JEZEEM

කර්මාන්තකරුවන්ගේ වර්ගීකරණය තුන අනුව වට්ටම් දිය යුත්තේ ඔබ සුළු කර්මාන්තකරුවෙකුට දිය යුතු වට්ටමක් මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවෙකුට දුන්නාම ඔබලාගේ ආයතනයට ඒ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවාගේ ලැබිය යුතු නියම මුදල නෙමෙයි ලැබෙන්නේ ඊට වඩා අඩු මුදලක් ඒ හේතු කොට ගෙන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් සිදුවෙලා තියෙනවා ඔබලාගේ තීරණය තුලින් ඒක ගැනයි අහන්නේ ආයේ පටලවන්න එපා ඒක ගැන හරි උත්තරේ දෙන්න?

පි: ඒක තමයි ස්වාමිනි 15% තමයි අපි දීලා තියෙන්නේ 475 න් ඔය ඔතන ගණනය කිරිමේදී 399 ට වැට් NBT එකතු කිරිම තමයි ඔතන තියෙන්නේ අපි NBT

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි අවශ්‍ය නොවන බව පවසයි සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිමේ අවස්ථාවක් කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතාට සලස්වා දෙමි

****

<u>මහින්ද ජිනසේන වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු තමන්ගෙන් ගරු කොමිෂන් සභාව ප්‍රශ්න කෙරුවේ තමන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ 2017 ඉදලා 2019 ජූනි මාසේ වෙනකම් කටයුතු කරපු යම් යම් ක්‍රියාවන් සම්බන්ධයෙන් තමන්ගේන් ප්‍රශ්න කෙරුවා?

පි: එහෙමයි.

ප්‍ර: හරිනේ?

පි: එහෙමයි.

ප්‍ර: තමන් දෙදෙහස් දැන් අවුරුදු කීයක් තමන් සාක්ෂිකරු වැඩ කටයුතු කරලා තියෙනවාද ඔය ආයතනයේ?

පි: මේ වෙනකොට අවුරුදු 26 ක්

ප්‍ර: දැන් තමන් අලෙවි අංශයට සම්බන්ධ වෙන්නේ කොයිකාලේද?

පි: මම 2014 දි. මම හිතන්නේ මාර්තු වගේ

ප්‍ර: අලෙවි අංශයට සම්බන්ධවන්නේ 2014 මැයි මාසේ මාර්තු 2014 කොයි කාලේද?

පි: 2014 මාර්තු හෝ අප්‍රේල් මට මතක හැටියට

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට දැන් තමන්ගේ ආයතනයේ තියෙනවානේ මේ වාර්තා කලයුතු ව්‍යුහයක්.?

පි: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුට C 752 ලේඛනය පෙන්වා සිටියි

****

<u>මහින්ද ජිනසේන වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>

ප්‍ර: දැන් මහත්මයාට ගරු කොමිෂන් සභාවේ නියෝග පරිදි දැන් පෙන්න ලේඛනය බලලා කියන්න කාර්මික සංවර්ධන මණ්ඩලයේ තමන්ලා වාර්තා කරන ආකාරය දැක්වෙන ව්‍යුහද ඕකේ තියෙන්නේ?

පි එහෙම ඇති

ප්‍ර: එතකොට තමන්ලාගේ ආයතනයේ මූලික වශයෙන් කටයුතු කෙරෙන්නා වූ අංශ 09 ක් තියෙනවා කියලා කිව්වොත් මහත්මයා පිළිගන්නවද?

පි: අංශ 09 ක් තියෙනවා

ප්‍ර: එතකොට 2014 තමන් මාකටින් ඩිවිෂන් එකට ඒ කියන්නේ මාකටින් කියන එහෙම නැත්නම් අලෙවි අංශයේ වැඩ කටයුතු ආරම්භ කරනවා?

පි: ඔව්.

ප්‍ර: එතකොට කවුද ඒ අංශය භාරව හිටියේ?

පි: ඒ වෙන කොට නන්දනී මහත්මිය හිටියේ?

පි: එතකොට යම් කිසි අවස්ථාවක 2015 අවුරුද්දේ ඒ ධූරය ඒ කියන්නේ ඒ නන්දනී කියන මහත්මිය මොන නිලයක් ද දැරුවේ ඒ කාලයේ?

පි: ඒ වෙනකොටත් වැඩ බලන අධ්‍යක්ෂකවරයා විදියට හිටියේ.

ප්‍ර: එතකොට පුරප්පාඩුවක් ඇතිවුනාද? යම් කිසි අවස්ථාවක?

පි: ඒ මහත්මිය 2015 අප්‍රේල් මාසේ විතර විශ්‍රාම ගියා.

ප්‍ර: විශ්‍රාම ගියායින් පස්සේ පුරප්පාඩුවක් ඇතිවුනාද?

පි: පුරප්පාඩුවක් ඇති වුනා .

ප්‍ර: එකට ඉල්ලුම් කැදෙව්වාද? ඉල්ලුම්පත්?

පි: ඉල්ලුම්පත් කැදෙව්වා.

ප්‍ර: අභ්‍යන්තර වශයෙන් කැදෙව්වාද?

පි: අභ්‍යන්තර වශයෙන් කැදෙව්වා.

ප්‍ර: බාහිර වශයෙනුත් කැදෙව්වාද?

පි: බාහිර වශයෙනුත් කැදෙව්වා.

ප්‍ර: අභ්‍යන්තර වශයෙන් තමුනුත් ඉල්ලුම්පතක් ඉදිරිපත් කෙරුවද?

පි: මාත් ඉල්ලුම්පතක් ඉදිරිපත් කෙරුවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට අමතරව මහත්මයා දන්නවා උදයසිරි මහත්මයාත් ඉල්ලුම්පතක් ඉදිරිපත් කෙරුවද?

පි: මම පසුව දන්නේ .

ප්‍ර: එතකොට ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වශයෙන් තෝරා පත්කර දැම්මේ කවුද?

පි: සරත් උදයසිරි මහත්මයා.

ප්‍ර: දැන් තමන් සරත් උදයසිරි මහත්මයා යටතේ සේවය කෙරුවා අලෙවි අංශයේ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ 2015 ඉඳලා 2015 අවුරුද්දේ වැඩකෙරුවා 2016 අවුරුද්දේ වැඩ කෙරුවා ?

පි: එහෙමයි.

ප්‍ර: දැන් ඔය සරත් උදයසිරි මහත්මයාගේ ඔය පත්වීම සම්බන්ධයෙන් යම් කිසි ස්ථානයකදී ප්‍රශ්නයක් ඇතිවුණාද ප්‍රශ්න ගත කිරීමකට ලක් වුනාද ආයතනයේ කරපු පත්වීම් ගැන?

පි: ප්‍රශ්න ගත කිරීම් තිබුණා.

ප්‍ර: මොකක්ද ප්‍රශ්නගත කිරීම්?

පි: ඔහුට මූලික සුදුසුකම වන මේ උපාධිය අවශ්‍යයි අපේ කර්මාන්ත ව්‍යාපෘතියේ නිලධාරියෙක් ආවත් අධ්‍යක්ෂකවරයාටත් මූලික උපාධිය අත්‍යවශයි. ඊට පස්සේ තමයි අනික් උපාධි ගැන සලකා බලන්නේ මේ ඔහුට මූලික උපාධි නැහැයි කියන එක අපි පසුව දැනගත්තේ. එහෙම ප්‍රශ්නයක් තිබුණා.

ප්‍ර: ඒක පාර්ලිමේන්තුව දක්වා ගියාද කෝප් කමිටුව?

පි: කෝප් කමිටුව දන්වා කොහොම උනත් ඒක තිබුණා විගණන වාර්තාවල තිබුණා ඒක.

ප්‍ර: දැන් එතකොට මහත්මයා ඔය අංශයේ වැඩකරන ඉන්න කාලේ මහත්මයාට කිසිම ලේඛණයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද 2015 ඉඳලා 2019 දක්වා කාල පරිච්ඡේදය තුල මහත්මයාගේ ඔය ආයතනයෙන් අලෙවි අංශයෙන් ලබා ගත්ත ආදායම් සම්බන්ධයෙන් විස්තරයක් 2015 සිට? දැන් ගරු සභාපතිතුමා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදි සටහන් කර තබනු ලබන්නේ සරත් උදයසිරි මහතා දින දෙකකදී මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් අතර ඔහුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් මහින්ද ජිනසේන හිටපු සභාපතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට ලබා දී තිබුණු අතර අද දින මෙම සාක්ෂිකරු හරහා යෝජනා කරනු ලැබූ යෝජනාව එනම් සරත් උදයසිරි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මහතාට කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක ධූරය දැරීමට තිබූ මූලික සුදුසුකම් නැත යන ස්ථාවරය එම සාක්ෂිකරුට කිසිම අවස්ථාවක යොමු නොකල බවත් එලෙස නොකර මෙම සාක්ෂිකරු හරහා එය ඉදිරිපත් කිරීම සරත් උදයසිරි මහතාට සිදුවන අසාධාරණයක් බව සටහන් කර තබමි.ඒනමුත් මෙම කොමිෂන් සභාවේ මූලික පරමාර්තය වන්නේ සියලු කරුණු සම්බන්ධයෙන් සත්‍ය දැනගැනිම සඳහා හෙයින් එම ප්‍රශ්නවලට මෙම කොමිෂන් සභාව අවසර ලබා දුන්නත් අතර ඉදිරි දිනයකදී නැවත උදයසිරි මහතා කැඳවා මේ සම්බන්ධයෙන් විමසිමක් කරන බව සටහන් කර තබමි.

****

<u>මහින්ද ජිනසේන වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>

ප්‍ර: දැන් මහත්මයා දන්නැත්නම් අවශ්‍ය නැහැ කිසි ප්‍රකාශ කරන්න?

පි: මහත්මයා දන්න විදියට ඔය උදයසිරි මහත්මයාගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තමන්ගේ ආයතනයේ ඇතිවෙලා තියෙනවද?

පි: මේ දවස්වල ප්‍රශ්නයක් අපි දැනුවත් දැන් මේ වෙන කොට වැටුප් වර්ධක ලැබිලා නෑ කියන තොරතුරු ලැබිලා තියෙනවා අපිට ඒක කියන්නේ ප්‍රසිද්ධ වෙලා තියෙනවා ඉස්සර අපි දන්නේ නැහැ.

C 753 දරණ ලේඛන සාක්ෂිකරුගේ අවධානයට යොමු කරයි.

ප්‍ර: මේ C 753 කියන්නේ 2005 ජූලි මාසේ 22 වෙනිදා නිකුත් කරනු ලැබූ නිකුත් කරන්නට යෙදුනු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් කියලා මහත්මයා පිළිගන්නවද?

පි: එහෙමයි.

ප්‍ර: දැන් මේ ලේඛනය තමන්ගේ රාජකාරි කටයුතු වලදී මහත්මා මීට පෙර අවස්ථාවකදී දැකලා තියෙනවද?

පි: දැකලා තියෙනවා.

ප්‍ර: දැන් ගරු කොමිෂන් සභාවෙන් මහත්මයා වෙත යොමු කරනු ලැබුවා යම් කිසි ප්‍රශ්නයක් ඒක තමයි මොන කාලයේද මේ පිත්තල සැපයිම ආරම්භ කෙරුවේ කියලා පිත්තල මිලදී ගැනීම?

පි: එහෙමයි.

ප්‍ර: දැන් අබලි ද්‍රව්‍ය කියපුවාම මහත්මයාගේ ආයතනයෙන් මිලදී ගන්නවා ඇලුමිනියන්?

පි: ඔව්

ප්‍ර: පිත්තල දැන් වෙනකොට ?

පි: ඔව්.

ප්‍ර: තඹ.

පි: ඔව්

ප්‍ර: ඊට අමතරව වෙනත් දේවල් මිලදි ගන්නවද?

පි: යකඩ මිලදී ගන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: යකඩ මිලදි ගන්නවා?

පි: චීනත් වට්ටි.

ප්‍ර: එතකොට ගරු සභාපති විනිසුරු තුමා අහපු විදියට පිත්තල මිලදී ගැනීමක් මහා පරිමාණයෙන් අරම්භ වුනේ 2017 දී ඒක පිළිගන්නවානේ?

පි: 2017 මම කරුණු හරියටම දන්නේ නැහැ ඒත් ඊට කලිනුත් අරගෙන තියෙනවා මම හිතන්නේ අවුරුදු 6,7 කට කලින් ඊට පස්සේ 2017 තමයි විශාල ප්‍රමාණයක් අවේ

ප: මම මොහොතකට ඉස්සෙල්ලා මන් මහත්මයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා 2015 ඉඳලා 2019 දක්වා කාල පරිච්ඡේදය තුල තමන්ලගේ ආයතනය අලෙවි අංශයේ ඔය අබලි ලෝහ මිලදි ගැනීම තුලින් උපයපු ආදායම ගරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන් පුළුවන්ද කියලා?

පි: ඒ ලේඛනයක් මගේ ළඟ නැහැ මේ වේලාවේ.

ප්‍ර: ඒ ලේඛනයක් තමන් ගෙනල්ලා නැහැ.

පි: මොකද කොමිෂන් සභාව විසින් මහත්මයාගෙන් ප්‍රශ්න කෙරුවා 2017 අවුරුද්දේ තමයි යුධ හමුදාවෙන් පිත්තල මිලදී අරගෙන විකුණන්නට මහත්මයාට අවස්ථාවක් ලැබුණේ?

පි: ඔව්.

ප්‍ර: ඒක විශාල ප්‍රමාණයක ආදායම ඉහල යන දෙයක්?

පි: ඔව්

ප්‍ර: මහත්මයා පිළිගන්නවානේ?

පි: ඔව්

ප්‍ර: 2017 මැයි මාසේ වෙනකන් තමන් කටයුතු කරපු අධ්‍යක්ෂ අලෙවි කියන ඒ ධූරය දැරුවේ උදයසිරි මහත්මයා දැන් ඒ උදයසිරි මහත්මයා කාලයට වඩා වැඩි ආදායමක් 2017 , 2018 ,2019 කියන අවුරුදුවල ලැබුනා.

පි: 2017 , 2018, 2019 ලැබුනා

ප්‍ර: අබලි ලෝහ මිලදී ගෙන විකිණිම තුලින්.

පි: විකිණිම තුලින්

ප්‍ර: ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් තමන්ට යොමු කරා ගරු සභාපති විනිශ්චිවකාර තුමා විසින් ඒ ආදායම වැඩි වුනේ තමන් යුධ හමුදාව මඟින් පිත්තල අරගෙන ඒ පිත්තල විකිණිම නිසා නේද ඒ ආදායම වැඩි වුනේ කියලා ඇහුවානේ?

පි: එහෙම ඇහුවා.

ප්‍ර: 2017 ඒ විකුණපු පිත්තලවලින් ලැබිච්ච ආදායම පැත්තකට දැම්මොත් චීනත් වට්ටි,යකඩ අනෙකුත් ලෝහ වලින් ලැබිච්ච ආදායම සැලකුවොත් ඒත් උදයසිරි මහත්මයා ගේ කාලයට වඩා ඉතා අධික ආදායමක් තියෙනවා නේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප; මට මගේ මතකයේ හැටියට මං කියන්නේ 2017 මට මැයි මාසේ ලැබෙන කොට අංශයේ ආදායම විදියට තිබුණේ විදියට තිබුනේ මිලියන 25 යි. 2017 අවසන් වෙනකොට මිලියන 163 ක තුනක ආදායමක් ලැබුවා.

ප්‍ර: එකෙන් ඒ 163 ක න් පිත්තල වලට ගිය ප්‍රමාණය මහත්මයාට කියන්න පුළුවන්ද?

පි; පිත්තලවලට පිත්තල ටොන් 105 යි අරගෙන තිබුණේ. පිත්තල ටොන් 105 ක් කියන්නේ මිලියන 48 ක විතර 40 යි 42 ක විතර ප්‍රමාණයක්.

ප්‍ර: ඒ කියන්නේ ඊට පෙර අවුරුද්දේ මිලියන 25 යි ?

පි: ඒ පෙර අවුරුද්දේ නෙමේ.

ප්‍ර: පළවෙනි මාස 05 ද?

පි: පළවෙනි මාස පහේ 25 යි ඊට පස්සේ 163 ක් වෙනකම් වැඩිවුනා වැඩිකර ගත්තා අපි .

ප්‍ර: එතනින් මොකද වුනේ ? ඒ 163 න් මිලියන 48 ක් පමන පිත්තල ආදායමක්?

පි: ඔව් 43 ක් වගේ සමාන්‍යයෙන් ටොන් සියකට එන්නේ මිලියන 40 ක් විතර 42 ක් වගේ

ප්‍ර: එතකොට 2018 තත්ත්වය මොකක්ද?

පි: 2018 මිලියන තුන්සිය පනස් අටක් ආසන්න වශයෙන් අපිට ලැබෙනවා.

ප්‍ර: ඒකෙන් පිත්තලවලින් ලැබිච්ච ආදායම වෙන් කරන්න පුළුවන්ද මහත්මයාට?

පි: පිත්තල ටොන් 291 ක් අපි අරගෙන තියෙනවා අරගෙන විකුණලා තියෙනවා 291 කියන්නේ මිලියන සියකට 40 යි මිලියන 120 විතර වෙනවා.

ප්‍ර: 348 ක වාර්ෂික ශුද්ධ ආදායමෙන් ?

පි: 358 ක්

ප්‍ර: 358 ක 120 ත් කියන්නේ පිත්තලවලින් ලැබිච්ච ආදායමක් ඉතුරුවික අනික් ලෝහ විකිණීමෙන් කියලාද මහත්මයා ගරු කොමිෂන් සභාවට කියන්නේ?

පි: එහෙම තමයි.

ප්‍ර: දැන් මේ අලෙවි අංශය තමන්ට භාර දෙන්න මොකක් හරි හේතුවක් තිබ්බයි කියලා මහත්මයා දන්නවද තමන් දන්නවද?

පි; මට භාරදෙන කොට මං සභාපතිතුමාගෙන් විමසීමක් කෙරුවා.

ප්‍ර: එහෙමයි?

පි; ඒ වෙලාවේ මට ප්‍රකාශ කෙරුවේ මට භාර දෙන්නේ අලෙවි අංශයේ අනෙකුත් කාර්යයන් මෙකත් අබලි ද්‍රව්‍යත් එකත් සිද්ධ වෙන්නේ නැහැ ඒ හින්දා දෙකම සිද්ධ වෙන්නේ නැහැ ඒ නිසා මේක මට ලබා දෙනවා කියලා. ඒ කියන්නේ මේක ලබා දෙමින් කිව්වේ මෙකේ අලෙවිය වැඩිකරන්න ඕන කියන අදහස තමයි ඒ වේලාවේ කිව්වේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් මහත්මයාගෙන් තමන්ට අලෙවි අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් ඒ කොටස පැවරුනේ ඒ කියන්නේ අබලි ද්‍රව්‍ය කොටසයි අනෙක් එක තමයි තවත් ක්ෂේත්‍රයක් තමන්ට භාර දුන්නානේ?

පි: ඔව් මට තවත් අතුරු කොන්ත්‍රාත් ඒකකය භාර දුන්නා

ප්‍ර: ඒ ඒකකය භාර දුන්නේ 2017 මැයි මාසේ 17 වෙනිදා.

පි: අතුරු කොන්ත්‍රාත් ඒකකයේ මං ඊට කලින් ඉඳන් නියෙළිලා හිටියේ 2017 අතුරු කොන්ත්‍රාත් ඒකකය සමඟ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය මට භාර දුන්නා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු 2019 මැයි මාසය වෙනකම් ඔබ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය භාරව හිටියා නේද?

පි: ජූනි මාසේ වෙනකම් හිටියා.

ප්‍ර: 2019 ජූනි මාසේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියෙන් ඉවත් වන විට ඒ වෙනකොට ලබා තිබ්බ ලාභය කීය දල වශයෙන්?

පි: ලාභය පිලිබඳ මට අදහසක් කියන්න බැහැ ඒකේ ආදායම පිළිබඳව කියන්න පුළුවන් turnover එක මට මතක විදියට මිලියන 160 ක් හෝ 50 ත්,60 ත් අතර තිබුණේ.

ප්‍ර: මිලියන?

පි: 150 ත්, 160 ත් අතර.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 754 සාක්ෂිකරුට පෙන්වයි.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>

ප්‍ර: මේ C 754 කියන ලේඛනය අබලි ලෝහ කළමණාකරනය පිළිබඳ මාර්ගෝපදේශක වශයෙන් දක්වලා තියෙනවා?

පි: ඔව්

ප්‍ර: මේ ලේඛනය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් මහත්මයාගෙන් ප්‍රශ්න කෙරුවා ගරු කොමිෂන් සභාවට සහය වෙන රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරිය විසින්?

පි: එහෙමයි.

ප්‍ර: දැන් එතන දී කොමිෂන් සභාව විසිනුත් ප්‍රශ්න කෙරුවා මහත්මයාගෙන් මේ අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන විට අබලි ලෝහ සම්බන්ධයෙන්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වන විට කාණ්ඩ කීයක් තියෙනවද කියලා තමන් විසින් ඔය ලෝභ ලබා ගෙන විකිණිම සිදුකරන?

පි: කාණ්ඩ 03 ක් තියෙනවා.

ප්‍ර: එහෙම ප්‍රශ්න කෙරුවානේ?

පි: ඔව්.

ප්‍ර: ඒකට පිළිතුරු වශයෙන් මහත්මයා සඳහන් කෙරුවා කාණ්ඩ තුනක් තියෙනවා කියලා?

පි: එහෙමයි.

ප්‍ර: දැන් කල්පනා කරලා බලන්න ඔය ලේඛනයේ දක්වලා තියෙනවා ඒ කාණ්ඩ තුන මොකක්ද එක්තරා පිටුවක? මහත්මයා ළඟ ඒක තියෙනවාද?

පි: ඔව් තියෙනවා. කාණ්ඩ තුනක් තියෙනවා සුළු පරිමාණ,කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ.

ප්‍ර: දැන් ගරු කොමිෂන් සභාව විසිනුත් කොමිෂන් සභාවට සහය දෙන්නා වූ උගත් රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරය විසිනුත් ප්‍රශ්න කෙරුවා මොන පදනමක් මත ද යම් කිසි ඉල්ලුම්කරුවෙකු තෝර ගන්නේ මේ මොන කාණ්ඩයකට වැටෙනවද කියලා හරිනේ?

පි: ඔව් .

ප්‍ර: දැන් මේ මාර්ගෝපදේශක ලේඛනය අනුව ඒ කියන්නේ **C 754** අනුව එකක් තමයි සේවක සංඛ්‍යාව ?

පි: සේවක සංඛ්‍යාව

ප්‍ර: අනිත් එක තමයි වාර්ෂික පිරිවැටු?

පි: වාර්ෂික පිරිවැටු.

ප්‍ර: මට මහත්මයා කරුණාකරලා කියන්න මේ කිසිම තැනක මහා පරිමාණ කියන එක නිර්වචනය කරලා තියෙනවාද ඔය ලේඛනයේ?

පි: එහෙම නිර්වචනයක් නැහැ මෙකේ.

ප්‍ර: එතකොට යම් කිසි අවස්ථාවක සේවක සංඛ්‍යාව මහත්මයාගේ දැනීම අනුව කියන්න සේවක සංඛ්‍යාව ඇයි අවශ්‍ය අංගයක් වශයෙන් මේ කාණ්ඩ ගත කරීමට දන්වලා තියෙන්නේ කියලා?

පි: සේවක සංඛ්‍යාව බලපානවා නිෂ්පාදනයට.

ප්‍ර: නිෂ්පාදනයට?

පි: ඔව් ඒ මත සමහර අවස්ථාවලදී ඒ මත තීරණය වෙනවා එකේ නිෂ්පාදන පිරිවැටුම

ප්‍ර: දැන් යම්කිසි සේවක සංඛ්‍යාව 10 යි 50 යි අතර නම් වාර්ෂික පිරිවැටුප මිලියන 10 යි 200 යි අතර නම් එවැනි ඉල්ලුම්කරුවන් අයිති වන්නේ කුඩා පරිමාණ කියන කාණ්ඩයට?

පි: එහෙමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සේවක සංඛ්‍යාව 10 යි 50 යි අතර නම් වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 600 යි නම් කොහාටද වර්ගී කරණය කරන්නේ ඒක?

පි: අපිට ඒ පිළිතුර දෙන්න අමාරුයි මොකද අපි ඒ වගේ වෙලාවක හුගක් වෙලාවට අපි වාර්ෂික පිරිවැටුම අපි හැම වෙලාවේම අයදුම්පත්‍රයේ නැති නිසා ඒ ගැන වැටහිමක් ඇත්තේම නැහැ හුගක් වෙලාවට කුඩා පරිමාණ අංශයට තමයි ඒක එන්නේ.

ප්‍ර: මහත්තයෝ දැන් මෙන්න මේක මට කියන්නකෝ මං අහන්නේ බොහොම සරල ප්‍රශ්නයක්?

පි: ඔව්.

ප්‍ර: සේවක සංඛ්‍යාව ඉතාමත් වැදගත් දත්තයක් කාණ්ඩ ගත කිරීමට තමන් ඉස්සරහට එන්න ඉල්ලුම්කාරයෙක්ව ඒ වගේම වාර්ෂික පිරිවැටුමත් සලකා බැලිය යුතුයි කියලා මේ ලේඛනයේ දක්වලා තියෙනවා?

පි: ඔව්.

ප්‍ර: C 753 ?

පි: ඔව්

ප්‍ර: හරිද? එතකොට යම් කිසි අවස්ථාවක සේවක සංඛ්‍යාව 10 යි 50 යි අතර නම් ඔවුන්ගේ ආදායම රුපියල් මිලියන 600 ඉක්මවනවා නම් මේ මාර්ගෝපදේශන ලේඛනය අනුව C 754 අනුව එවැනි ආයතනයක් තමන්ට වර්ගීකරණය කරන්න බැහැ?

පි: වර්ගීකරණය කරන්න අපහසුයි. ප්‍රශ්නයක් තියෙනවා එතන.

ප්‍ර: එතකොට මහපරිමාණ කියලා කොහේවත් දක්වලා නැහැ මේ ලේඛනයේ? C 754 ? කාණ්ඩයක්?

පි: කාණ්ඩ තුනයි තියෙන්නේ මධ්‍යපරිමාණ

ප්‍ර: මහා පරිමාණ කියලා දක්වලා තියෙනවද?

පි: දක්වලා නැහැ.

ප්‍ර: එතකොට දැන් ඇතැම් අවස්ථාවේදී මහත්මයා පිළිගන්නවද මම ඉස්සර සඳහන් කරපු උදාහරණය අනුව විතරයි වර්ගීකරණය කරන්න බැරි අවස්ථා එන්න පුළුවන් ? ඒ උදාහරණය අනුව මං අහන්නේ?

පි: ඔව් උදාහරණය අනුව එන්න පුළුවන්.

ප්‍ර: එතකොට මහත්මයා දන්නවද ඔය තමන්ගේ වෘත්තිමය කටයුතු වලදී අතර මගදි මහත්මයාට හම්බෙලා තියෙනවද scrap project minutes of the committee meeting held on 11/08/2010 මේක එන්න ඉස්සෙල්ලා At the minsters office 2010 අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරේ කවුද?

පි: 2010 මට මතක විදියට ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා.

ප්‍ර: ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබ්බිච්ච මේ අබලි ලෝහවලට අදාල රැස්වීමකදී යම් කිසි මේ අබලි ද්‍රව්‍ය විකිණීම

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් යම් යම් තීරණ ගත්තායි කියලා මහත්මයා දන්නවද?දන්නේ නැත්නම් දන්නේ නැහැ කියන්න?

පි: මම සම්බන්ධ නැති නිසා මම දන්නේ නැහැ.

ප්‍ර: එතකොට මහත්මයා දැන් යම් කිසි ක්‍රමවේදයක් තමන්ගේ ආයතනයේ නම කරනවානේ මේ යම්යම් ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කරන්න?

පි: ඔව්.

ප්‍ර: මේ ගරු කොමිෂන් සභාව විසින් අහපු ප්‍රශ්නයකට මහත්මයා පිළිතුරු දුන්නා ජනවාරි මාසේ පුවත්පත් දැන්වීමක් දාන්න ඕනේ කියලා?

පි: ඔව්.

ප්‍ර: මේ එකේ අර closing date එකක් නැහැ ඒ කියන්නේ කුමන දිනයකට ඉස්සෙල්ලා ඒ ඉල්ලුම්පතට ප්‍රතිචාර දක්වන්න ඕනේද කියලා නැහැ? ඒකනේ කිව්වේ

පි: නැහැ මං කිව්වේ closing date එකක් තියෙනවා ඒ වුනාට ඒක නොසලකා හැරලා දිගටම අපි එන ඇප්ලිකේෂන් ලබා ගන්නවා.

ප්‍ර: ඒක වැරදියිනේ? මහත්මයා පිළිගන්නවානේ ඒක වැරදියි කියලා?

පි: ඔව් ඒක වැරදුනත් අපිට ක්‍රියාත්මක කරන්න වෙලා තියෙනවා මේ ව්‍යාපෘතියේ ඉල්ලුම්කරුවන් වැඩිකරගන්න .

ප්‍ර: ඒ කොයි කාලේ ඉඳන් ද ඒ වැරදි පිලිවෙතක්‍රියාත්මක කෙරුවේ?

පි: දිගටම ක්‍රියාත්මක වෙමින් තිබ්බිච්ච ක්‍රමවේදය තමයි මමත් ක්‍රියාත්මක කෙරුවේ.

ප්‍ර: නන්දනි පෙරේරා මහත්මියගේ කාලේත් ඒ විදියටද ගියේ ලේඛන අනුව?

පි: ඔව්.

ප්‍ර: උදයසිරි මහත්මයාගේ කාලෙත් ඒ විදියට ද ගියේ ලේඛන අනුව?

පි: ඔව්.

ප්‍ර: තමන්ගේ කාලෙත් ඒ විදියට ද ගියේ?

පි: මගේ කාලෙකින් ඒ විදියට ගියේ.

ප්‍ර: තමන්ට පස්සෙත් ඒ විදියට ද දැන් යන්නේ?

පි: දැන් යන්නෙත් ඒ විදියට.

ප්‍ර: එතකොට මේ මහත්මයා පිළිගන්නවද මම මහත්මයාට යෝජනා කෙරුවොත් 2015 තමයි ඔය සභාපතිවරයා මහින්ද ජීනසේන කියන පුද්ගලයා තමන්ගේ ආයතනයට පත්වෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: එයා 2018 අර දවස් පනස් දෙකේ රජයක් පිහිටුවීමත් එක්ක නැවත සේවයට වාර්තා කරන්නේ නැහැ?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ එන්නේ වර්තමාන සභාපතිවරයා වශයෙන් කටයුතු කරන නවීන් අදිකාරම් මහත්මයා?

පි: වර්තමානයේ නෙවේ එතුමාත් හිටපු සභාපති.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සමාවෙන්න හිටපු සභාපතිවරයා වශයෙන් කටයුතු කරපු නවීන් අදිකාරම් මහත්මයා හරිනේ?

පි: ඔව්.

දැන්වේලා 7.50
මෙතැන් සිට මුතුමාලි

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.07.50 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : එතකොට ඒ 2019 අවුරුද්දේ මහින්ද ජිනසේන තමන්ලගේ ආයතනයේ සභාපති හැටියට කටයුතු කළේ නැනේ?

පි : 2019 වර්ෂයේ නෑ.

ප්‍ර : එතකොට 2019 වර්ෂයෙත් මේ කොලෝසස් සමාගමට තමන්ලගේ ආයතනය නිකුත් කරලා තියෙනවනේ යම් යම් අබලි ලෝහ ප්‍රමාණයක්?

පි : 2019 වර්ෂයේ නිකුත් කරලා තියෙනවා.

ප්‍ර : එතකොටත් මහත්මයා තමයි ඔය marketing අලෙවි අංශයේ අධ්‍යක්ෂක?

පි : ඔව්.

ප්‍ර : එතකොට හැබැයි මහින්ද ජිනසේන සභාපති නෙවෙයි?

පි : නෑ ඒ වෙන කොට සභාපති නෙවෙයි.

ප්‍ර : එතකොට නවීන් අධිකාරම් තමයි සභාපති?

පි : සභාපතිතුමා එතුමා.

ප්‍ර : එතකොට ඒ කාලය තුළදීත් අනුගමනය කෙරුවේ ඔය ක්‍රමවේදයම තමයි?

පි : ඔව්.

ප්‍ර : නිකුත් කිරීම, මිල තීරණය කිරීම, විකිණීම ඒ සියළුම දේවල්වලට?

පි : ඔව්.

ප්‍ර : අදත් අනුගමනය කරන්නේ ඒක තමයි ඒ ක්‍රමයමයි මහත්මයා දන්නවද?

පි : මා දැන් අලෙවි අංශයේ නොවන නිසා මා දන්නේ නැහැ. එහෙම වෙනස් කිරීමක් කරලා කියලා අපිට දැනුවත් වීමක් නෑ.

ප්‍ර : උදයසිරි මහත්මයා අද දරන තනතුරු මොකක්ද?

පි : අධ්‍යක්ෂක අලෙවි.

ප්‍ර : අධ්‍යක්ෂක අලෙවි කියන්නේ තනතුරක්. යම් කිසි අංශයක ප්‍රධානියෙක්නේ?

පි : ඔව් එහෙමයි.

ප්‍ර : එතන ඕගොල්ලොගේ තියෙනවා නේද රැස්වීම් HOD රැස්වීම් කියලා?

පි : ඔව්. අංශ ප්‍රධානීන්ගේ රැස්වීමක් තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ අංශ ප්‍රධානියෙකුට අංශයේ වැඩ කරන තවත් සහෝදර නිලධාරී මහත්වරු ඉන්නවනේ?

පි : ඔව්.

ප්‍ර : තමනුත් ඒ අංශයේ වැඩ කරන එක්කෙනෙක්නේ?

පි : ඒ කාලේ ඒ අංශයේ හිටියේ.

ප්‍ර : හරිනේ?

පි : ඔව්.

ප්‍ර : දැන් මහත්මයා කොහේද ඉන්නේ?

පි : මම දැන් ක්‍රම සම්පාදන අංශයේ ඉන්නේ.

ප්‍ර : එතකොට මහත්මයාගෙන් මම අහන්නේ මට කොලෝසස් සමාගමට තමන්ලගේ ආයතනය විසින් මුලින්ම පිත්තල සැපයීම සිදු කෙරුවේ 2017 අවුරුද්දේ?

පි : 2017 අවුරුද්දේදී.

ප්‍ර : යම් කිසි ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕනේ ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කරන කොට?

පි : ඔව්.

ප්‍ර : පළවෙනි පියවර තමයි පුවත්පත් දැන්වීම?

පි : ඔව්.

ප්‍ර : අවුරුද්ද පුරා ඉල්ලුම්පත් භාර ගන්නවා?

පි : භාර ගන්නවා.

ප්‍ර : එතකොට මේකත් එක අවුරුද්දක ඒ අවුරුද්ද පුරා මාසේක ආපු ඉල්ලුම්පතක්?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 758 සාක්ෂිකරුට පෙන්වා සිටී.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : දැන් තමන්ගේ වෘත්තිමය කටයුතු අතරතුරේදී තමන් මේ ලේඛනය දැකලා ඇතිනේ?

පි : ඔව්.

ප්‍ර : දැන් මේක තමයි ඉස්සෙල්ලාම ඔය කොලෝසස් පුද්ගලික සමාගමෙන් තමන්ලගේ ආයතනය වෙත ඉදිරිපත් කරපු ඉල්ලුම්පත කියලා කිව්වොත් හරිනේ?

පි : ඔව් මේ ඉල්ලුම්පත තමයි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මේක මහත්මයාගෙන් ගරු කොමිෂන් සභාවට සහය වන ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥතුමිය ඇහුවා මෙතන ලිපිනය සම්බන්ධයෙන් නොම්බර 37, පැරණි යෝනක වීදිය, කොළඹ 12 කියලා සඳහන් කරලා ඊට පස්සේ යම් කිසි පුද්ගලයෙක් විසින් ඒක වෙනස් කරලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : හරි?

පි : ඔව්.

ප්‍ර : දැන් ඉල්ලුම්පතක් ලියාපදිංචි කරන්න පවා අනුගමනය කරන ක්‍රමවේදයක් තියෙනවද?

පි : ඔව්.

ප්‍ර : තමන්ලගේ ආයතනයේ තියෙනවා දිස්ත්‍රික් කාර්යාල?

පි : දිස්ත්‍රික් කාර්යාලයක් තියෙනවා.

ප්‍ර : ඉල්ලුම්පත් එන්න ඕනේ දිස්ත්‍රික් කාර්යාලය හරහා හරිනේ ඇතැම් අවස්ථාවලදී ප්‍රධාන කාර්යාලයට එන්න පුළුවන් නමුත් සාමාන්‍යයෙන් දිස්ත්‍රික් කාර්යාලය හරහානේ ක්‍රියාත්මක වෙන්නේ?

පි : ඔව් දිස්ත්‍රික් කාර්යාලයට භාර දෙන්නත් පුළුවන් ප්‍රධාන කාර්යාලයට භාර දෙන්නත් පුළුවන්. හැබැයි කොහොම භාර දුන්නත් අපි දිස්ත්‍රික් කාර්යාලයට ආපහු යවනවා.

ප්‍ර : හරියට හරි. ඒ කියන්නේ ඉල්ලුම්කාරයෙකුට අර පුවත්පතට ප්‍රතිචාරයක් වශයෙන් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන්න පුළුවන් කෙළින්ම ප්‍රධාන කාර්යාලයට කොළඹ?

පි : ඔව්.

ප්‍ර : එහෙම නැත්නම් ඉදිරිපත් කරන්න පුළුවන් දිස්ත්‍රික් කාර්යාලයට හරිද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ මොනවා වුනත් යම් යම් දිස්ත්‍රික්කයකින් ඉල්ලුම් කරන යම් ඉල්ලුම්කාරයෙක් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යය පරිපූර්ණ කරන්න ඕනේ දිස්ත්‍රික් කාර්යාලය විසින්?

පි : දිස්ත්‍රික් කාර්යාලය විසින්.

ප්‍ර : පිළිමතලාවේ ගොඩාක් ඉන්නවනේ සුළු පරිමාණ නිෂ්පාදකයෝ?

පි : ඔව් 100 කට ආසන්න ප්‍රමාණයක්.

ප්‍ර : කර්මාන්තකාරයෝ ?

පි : ඔව්.

ප්‍ර : ගම්පහ දිස්ත්‍රික්කයෙත් ඉන්නවනේ?

පි : ගම්පහ දිස්ත්‍රික්කයෙත් ඉන්නවා කිරිබත්ගොඩ ආසන්නයේ.

ප්‍ර : කිරිබත්ගොඩ ගම්පහනේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ අදාළ දිස්ත්‍රික් කාර්යාලවලින් තමයි අර ප්‍රාථමික කරුණු ටික සලකලා බලලා තමන්ලට නිර්දේශයක් කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඒක පිළිගන්නවද කිව්වොත්?

පි : ඔව් පිළිගන්නවා ඒක එහෙම තමයි සිද්ධ වෙන්නේ.

ප්‍ර : මේ පුද්ගලයන් ලියාපදිංචි කරන කාර්යාලයට සභාපතිවරයා සම්බන්ධ වෙන්නේ නැනේ?

පි : මේකට සම්බන්ධ වෙන්නේ නෑ.

ප්‍ර : එතකොට දැන් මේක ලියාපදිංචි කරලා දැන් මේකේ දැන් මහත්මයාට යම් කිසි දැනීමක් තියෙනවද දන්නේ නැත්නම් නෑ කියන්න මේ ලිපිනය Address of the industry කියලා තියෙනවනේ C 758 ?

පි : ඔව්.

ප්‍ර : පස්වෙනි අයිතම අංකය යටතේ?

පි : ඔව්.

ප්‍ර : මේ සංශෝධනය මොන අවස්ථාවක වෙච්ච දෙයක්ද කියන්න මහත්මයාට දැනීමක් තියෙනවද?

පි : මේ සංශෝධනය වෙන්නේ

ප්‍ර : මොන අවස්ථාවක වෙච්ච දෙයක්ද කියන්න මහත්මයාට දැනීමක් තියෙනවද?

පි : මේ සංශෝධය වෙන්න අවශ්‍ය වෙන්නේ

ප්‍ර : දැනීමක් තියෙනවද ඒකයි අහන්නේ?

පි : දැනීමක් තියෙනවා.

ප්‍ර : එතකොට දැන් සාමාන්‍යයෙන් මෙවැනි ඉල්ලුම්පතක් ඉදිරිපත් කරපුවාම අලෙවි අංශයෙන් නිලධාරීන් සහ තමන්ගේ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරී මේ පරිශ්‍රයට යන්න ඕනේ?

පි : ඔව්.

ප්‍ර : ඒක පරීක්ෂා කරන්න ඕනේ?

පි : ඔව්.

ප්‍ර : ඉල්ලුම්පතේ තියෙන කරුණු සත්‍යද කියලා හොයන්න ඕනේ?

පි : ඔව්.

ප්‍ර : ක්‍රියාත්මක වෙමින් පවතින කර්මාන්ත ශාලාවක් නම් ධාරිතාව හොයන්න ඕනේ?

පි : ඔව්.

ප්‍ර : ධාරිතාව මත තමයි ඉල්ලුම හා සැපයුම තීරණය කරන ප්‍රධාන කාරණයන්?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : පිළිගන්නවද?

පි : පිළිගන්නවා.

ප : ඊළඟට දැන් ඔබතුමාගෙන් ප්‍රශ්න කෙරුවා ගරු කොමිෂන් සභාව විසිනුත්, උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥතුමිය විසිනුත් මේ ග්‍රාම සේවක සහතිකය සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප : මහත්මයාට මතකනේ?

පි : ඔව්.

ප : ඒ ග්‍රාම සේවක සහතිකය සහ Assistant Divisional Secretary සහකාර ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය සම්බන්ධයෙන් ප්‍රශ්න කෙරුවා?

පි : ඔව්.

ප : එතකොට ඒක සම්බන්ධ වෙනවා මේ C 758 කියන ලේඛනයේ අයිතම අංක පහ යටතේ තියෙන ලිපිනය සඳහන් කිරීම සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප : මොකක්ද ග්‍රාම සේවා සහතිකයක අවශ්‍යතාවය?

පි : ග්‍රාම සේවක සහතිකයක අවශ්‍යතාවය ඒ තමන්ගේ ග්‍රාම සේවා කොට්ඨාශයේ මේක තියෙනවද කියන එක තහවුරු කර ගන්න මේ කර්මාන්තය තියෙනවද කියලා.

ප : ඇත්ත වශයෙන්ම ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුට මෙහෙම ව්‍යාපාරික ස්ථානයක් යම් කිසි භූගෝලීය ප්‍රදේශයක පිහිටුවලා තියෙනවද නැද්ද කියන එක සහතික කර ගන්න තමයි ග්‍රාම සේවක සහතිකය අවශ්‍ය වෙන්නේ?

පි : ඔව්.

ප : එතකොට මේ ඉල්ලුම්පත අයිතම අංක පහේ සංශෝධනය නොකර තිබ්බා නම් මේ සහතිකය හරිද?

පි : නොකර තිබුණා නම් මේ සහතිකය හරි.

ප : ඒ කියන්නේ මේ No.37, Old Moor Street, Colombo 12 කියලනේ මේකේ දාලා තියෙන්නේ?

පි : ඔව්.

ප : ඒක පසු අවස්ථාවකදී මේ සංශෝධනයක් වෙලා තියෙන්නේ වැල්ලම්පිටියට?

පි : ඔව්.

ප : ඒ සංශෝධනයන් නැතුව තිබ්බා නම් මේ සහතිකය හරිද?

පි : නොතිබ තිබ්බා නම් සහතිකය හරි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : දැන් ඔය සහතිකයේ ඔය තියෙන ලිපිනය නේද ඒ කර්මාන්තය තියෙන ලිපිනය නේද ඔතනින් දක්වන්න ඕනේ? කර්මාන්ත ශාලාව තිබෙන ලිපිනය නේද ඔතන දක්වන්න ඕනේ?

පි : ඒකේ දාලා තියෙන්නේ Name of Industry කියන එක.

ප්‍ර : ඔව් Name of Industry නම ඒක යටින්?

පි : Address එක දාන්න ඕනේ.

ප්‍ර : එතකොට ඒ ලිපිනයෙන් දැක්වෙන්නේ ඕනේ කර්මාන්ත ශාලාව තියෙන තැන නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය ඔබ බලන ලේඛනයේ කර්මාන්ත ශාලාව තිබෙන ස්ථානය හැටියට තියෙන්නේ මොකක්ද?

පි : ප්‍රධාන කාර්යාලය ඒගොල්ලො සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර : ප්‍රධාන කාර්යාලය නෙවේ කර්මාන්ත ශාලාව තියෙන තැන?

පි : ඒගොල්ලො සඳහන් කරලා තියෙන්නේ වෙන එකක්. ඒ වුණාට කර්මාන්ත ශාලාව තියෙන්නේ වෙන තැනක.

ප්‍ර : නෑ මං අහන්නේ ඔය අයදුම්පතට අනුව ඔය ලිපිනය දාන්න තියෙන්නේ කර්මාන්ත ශාලාව තියෙන තැනද නැද්ද?

පි : කර්මාන්ත ශාලාව තියෙන තැන.

ප්‍ර : එතකොට ඔය අයදුම්පතේ දාලා තියෙන්නේ මොන ලිපිනයේ කර්මාන්ත ශාලාව තියෙනවා කියලද?

පි : Old Moor Street, Colombo 12

ප්‍ර : ඔබගේ දැනුම අනුව Old Moor Street කොළඹ 12 යේ කොලෝසස් සමාගමේ කර්මාන්ත ශාලාවක් තියෙනවද?

පි : දැනුම අනුව නෑ.

ප්‍ර : ආ

පි : දැනුම අනුව නෑ. අපි පසුව ගිහිල්ලා බලපු නිසා දන්නවා.

ප්‍ර : දන්නවා. කර්මාන්ත ශාලාවක් නෑ කියලා?

පි : ඔව් පස්සේ අපි දන්නවා.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : එතකොට මහත්මයා දන්නවයි කියලා කිව්වා දන්නවාද දැන් සාමාන්‍යයෙන් මෙහෙම Application එකක් ආපුවාම ඒ පරිශ්‍රය පරීක්ෂා කරන්න යනවනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කවුද යන්නේ සභාපතිතුමා යනවද?

පි : සභාපතිතුමා යන්නේ නෑ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට කවුද යන්නේ?

පි : මෙතෙන්ට යන්නේ ඒ ප්‍රදේශය භාර ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු හෝ කළමනාකාරිනිය.

ප්‍ර : එතකොට මේ අත් අකුරුවලින් සංශෝධනයක් කරලා තියෙනවා නේද 111/A/6 ,අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒක මොන අවස්ථාවකදී සංශෝධනය කෙරුවද ඒක තමන් කරපු සංශෝධනයක්ද?

පි : මං කරපු එකක් නෙවෙයි.

ප්‍ර : මේ මහත්මයාගේ අත් අකුරුද?

පි : නෑ.

ප්‍ර : මේ සභාපතිවරයාගේ අත් අකුරුද?

පි : නෑ.

ප්‍ර : එතකොට මේ සංශෝධනය ඇති වෙච්ච ආකාරය තමන් දන්නවද?

පි : සංශෝධනය මං

ප්‍ර : දන්නවා නම් දන්නවා කියන්න නැත්නම් නෑ කියන්න ඉතින්?

පි : ඒ අවස්ථාවේදී දන්නේ නෑ පසුව තමයි මම දන්නේ.

ප්‍ර : කවුද මේක සංශෝධනය කෙරුවේ?

පි : සංශෝධනය කරන්නේ අපේ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු.

ප්‍ර : නම?

පි : බුද්ධිනි රොද්‍රිගු.

ප්‍ර : කාන්තාවක්ද?

පි : කාන්තාවක්.

ප්‍ර : දැන් මේක මහත්මයාගේ සටහන් අනුව සහ මහත්මයාගේ වාර්තාවල් අනුව මේ කර්මාන්ත ශාලාව පරීක්ෂා කරන්න ගියාද කණ්ඩායමක්?

පි : ප්‍රධාන කාර්යාලයෙන් ගියා.

ප්‍ර : එතකොට ඔය C 754 ලේඛනයේ අවසන් පිටුවට පෙරලන්න 758 ලේඛනයේ .

පි : 754

ප්‍ර : 758 සමාවෙන්න

පි : ඔව් හරි.

ප්‍ර : ඒ ලේඛනය 2017 අගොස්තු මාසේ 22 වෙනිදා?

පි : ඔව්.

ප්‍ර : හරිද ඒකේ තියෙනවා නේද මේ ස්ථානයට ගියපු යම් කිසි නිලධාරියෙක් හෝ නිලධාරිනියක් බී.කේ. පී.බී. රොද්‍රිගු කියලා?

පි : ඔව්.

ප්‍ර : යම් කිසි සඳහනක් කරලා තියෙනවා නේද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සඳහනක් කරලා තියෙනවා.

ප්‍ර : එකේ තියෙනවද මෙහෙම බලන්න can මට කියන්න පුළුවන් අකුරු විදිහට can recommend maximum quantity copper.

පි : ඔව්.

ප්‍ර : Because they are export companies

පි : ඔව්.

ප්‍ර : can't recommend brass and Zink

පි : ඔව්.

ප්‍ර : Because furnet is under construction

පි : ඔව්.

ප්‍ර : ඊට උඩ තියෙනවා වගුවක්?

පි : ඔව්.

ප්‍ර : ඒ වගුවේ brass කියන එක කපලා තියෙනවා Zink කියන එක කපලා තියෙනවා හරිද?

පි : ඔව්.

ප්‍ර : මේකෙන් මහත්මයාට නිර්දේශ වුණේ මොකක්ද?

පි : මේකෙන් නිර්දේශ වුණේ කොපර් දෙන්න කියන එක Brass එක ඒ කියන්නේ පිත්තල කර්මාන්තයේ ඉඳි කරමින් පවතිනවා කියන එක තමයි නිරීක්ෂණය වෙන්නේ.

ප්‍ර : පිත්තල කර්මාන්තය නෙවේ පිත්තල අර පෝරණු?

පි : නිෂ්පාදනයට අවශ්‍ය පෝරණු.

ප්‍ර : එතකොට ඒ මේ නිර්දේශය මතද මහත්මයා කටයුතු කෙරුවේ මුල් අවස්ථාවේදී මහත්මයාගේ අලෙවි අංශය?

පි : මේ නිර්දේශය මත කටයුතු කළේ නෑ.

ප්‍ර : ඇයි ඒ?

පි : මේ වගේ ප්‍රමාණයක් අපිට කලින් ඉල්ලලා නැති නිසා මේක අපිට ප්‍රධාන කාර්යාලයෙන් නිරීක්ෂණය කරන්න අවශ්‍ය වුණා.

ප්‍ර : ඒ අනුව නිරීක්ෂණය කෙරුවද?

පි : ඔව් සභාපතිවරයාට ඉල්ලීමක් කරලා සාකච්ඡා කරලා ඒ අනුව committee යක් දාගෙන ඒ committee යේ ගිහිල්ලා නිරීක්ෂණය කෙරුවා.

ප්‍ර : දැන් ඒ කියන්නේ දැන් මේ තමන් දික්වැල්ල මහත්මයා C 758 දරන ලේඛනයේ අර බුද්ධිනි රොද්‍රිගු කියන මහත්මිය අත්සන් කරලා තියෙනවා 2017 අගෝස්තු මාසේ 21?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මේ ඉල්ලුම් පත්‍රයේ දෙවෙනි පිටුව දිහා බැලුවොත් ඒකේ තියෙන විදියට මේ ඉල්ලුම් පත්‍රය පුරවලා තියෙන්නේ 2017 අගෝස්තු මාසේ 09 වෙනිදා?

පි : ඔව්.

ප්‍ර : දැන් මේ නිර්දේශය කෙරුවට ඊළඟට ගත්ත පියවර තමයි තමන්ලා මේක සභාපතිවරයාට වාර්තා කෙරුවා?

පි : ඔව් වාර්තා කෙරුවා.

ප්‍ර : මොකක්ද වාර්තා කෙරුවේ? දැන් එතකොට තමන් තමයි අලෙවි අංශයේ අධ්‍යක්ෂක අර ලෝහ අබලි ලෝහ විකිණීම සම්බන්ධයෙන් තමන්ගේ අධීක්ෂණයට වැටෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : තමන් මොනවද කිව්වේ සභාපතිතුමාට?

පි : සභාපතිතුමා අපි ඉතින් මට අලෙවි අංශයේ මේ ව්‍යාපෘති භාර දුන්නට පස්සේ අධීක්ෂණය කරනවා සැරින් සැරේ කොච්චර sales තියෙනවද ප්‍රශ්න. ඒ වගේ අවස්ථාවක මේ අයදුම්පත් පත්‍රය පැමිණීම පිළිබඳව මම සභාපතිතුමාව දැනුවත් කෙරුවා. දැනුවත් කරලා මම ම කිව්වා මේක දිස්ත්‍රික් office එකෙන් බලලා තියෙන්නේ ඒ වුනාට අපේ foundry manager ලා ගිහිල්ලා බලන එක සුදුසුයි කියන එක ප්‍රධාන කාර්යාලයේ. එහෙම කියලා තමයි මොකද වැඩි ප්‍රමාණයක් මෙතන ඉල්ලලා තියෙනවා එහෙම කියලා අපි committee එකක් මේවා කර ගත්තා අපි.

ප්‍ර : මේකේ ඉල්ලලා තියෙනවා තඹ මාසෙකට මෙට්‍රික් ටොන් 30ක් හරිනේ?

පි : ඔව් තඹ 30 ක්.

ප්‍ර : ඒක සාමාන්‍යයෙන් අනුපාතිකව ගත්තාම තමන්ලගේ කලින් කරලා තියෙන sales විකිණීම් අනුව එක්ක ඒක විශාල ප්‍රමාණයක්?

පි : වැඩි ප්‍රමාණයක්.

ප්‍ර : ඒක තමයි අර නිර්දේශය සම්බන්ධයෙන් කටයුතු කරන්න ඉස්සෙල්ලා තමන් ඉදිරිපත් කෙරුවයි කිව්වේ සභාපතිතවරයාට?

පි : ඔව්.

ප්‍ර : එතකොට සභාපතිවරයා කිව්වද තමන්ට කොයි වේලාවකවත් එහෙම නිර්දේශයක් අවශ්‍ය නෑ මේ නිර්දේශය උඩ කටයුතු කරන්න කියලා?

පි : නෑ එහෙම ප්‍රකාශ කෙරුවේ නෑ.

ප්‍ර : තමන්ලගේ කණ්ඩායමක් ගියාද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපි කණ්ඩායමක් ගියා ඒ කණ්ඩායම යෝජනා කෙරුවෙත් සභාපතිතුමාමයි.

ප්‍ර : කවුද ඒ කණ්ඩායමට ගියේ?

පි : ITI කාර්මික තාක්ෂණික ආයතනයේ ප්‍රධාන ඉංජිනේරුවරයා . අපේ වාත්තු අංශයේ වාත්තු ඉංජිනේරුවරුන් දෙදෙනා, මම සහ මුලින්ම මේ කර්මාන්තය පරීක්ෂණය කරපු බුද්ධිනි රොද්‍රිගු මහත්මිය.

ප්‍ර : දැන් එතකොට තමන්ලා යන කොට අර බුද්ධිනි රොද්‍රිගු අර ලිපිනය සම්බන්ධයෙන් මේ ඉල්ලුම් පත්‍රය සංශෝධනය කරලනේ?

පි : ඔව්.

ප්‍ර : හරිද ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය දෙවෙනි අවස්ථාවේදී තමන්ලා පරීක්ෂා කරපුවාම

පි : පරීක්ෂා කරපු

ප්‍ර : දැන් ඔය පරීක්ෂක යම් කිසි Address එකක් දාලා තියෙනවනේ ව්‍යාපාරික ස්ථානය තියෙන තැන හැටියට?

පි : ඔව්.

ප්‍ර : ඒකේ ඒක වැරදිනේ ඒ Application එකේ?

පි : ඔව්.

ප්‍ර : මුලින්ම පුරවලා තිබිච්ච හැටියට Application එක වැරදි?

පි : ඔව්.

ප්‍ර : ඒක තමන්ලට ඒත්තු ගියේ අර ස්ථාන පරීක්ෂාවට ගිය අවස්ථාවක?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : ඔව්. අපිට ඒත්තු ගියා.

ප්‍ර : ඒක සභාපතිතුමා සම්බන්ධ දෙයක් නෙවෙයිනේ?

පි : නෑ සභාපතිතුමා දැනුවත් කරලා නෑ.

ප්‍ර : එතකොට ඒ ස්ථාන පරීක්ෂාවට යන එක සාමාන්‍යය දෙයක්ද?

පි : සාමාන්‍යයෙන් යන්නේ නෑ. සාමාන්‍යයෙන් යන්නේ නෑ කියන්නේ දිස්ත්‍රික් office එකෙන් යනවා. සාමාන්‍යයෙන් කර්මාන්තය පරීක්ෂා කරන්න ප්‍රධාන කාර්යාලයෙන් යන එක සාමාන්‍යයෙන් සිද්ධ වෙන්නේ නෑ.

ප්‍ර : එතකොට පළවෙනි අවස්ථාව තමයි ඔය ස්ථානය ගිහිල්ලා පරීක්ෂා කෙරුවේ බුද්ධිනි?

පි : රොද්‍රිගු මහත්මිය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : රොද්‍රිගු මහත්මිය. ඊට පස්සේ ඒ යම් කිසි නිර්දේශයක් ඉදිරිපත් කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : ඒ නිර්දේශය මත කටයුතු කරන්නේ නැතුව තමන් සභාපතිතුමාට ඒ බව දැන්වුවා?

පි : ඔව්.

ප්‍ර : ඒ උපදෙස් මත කමිටුවක් පත් කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : ඒ කමිටුව නැවත පාරක් ගිහිල්ලා පරීක්ෂා කෙරුවා?

පි : පරීක්ෂා කෙරුවා.

ප්‍ර : පරීක්ෂා කරලා තමයි තීරණයක් ගත්තේ කියලා කිව්වොත් හරිද?

පි : ඔව්.

ප්‍ර : දැන් තඹ තමන්ලට හම්බ වෙන්නේ කොහේන්ද Transformer වලින්නේ ?

පි : Transformer හම්බ වෙනවා.

ප්‍ර : තඹ සාමාන්‍යයෙන් තමන්ලට හම්බ වෙන්නේ Transformer වලින්?

පි : Transformer වලින්.

ප්‍ර : 2015 අවුරුද්දේ Transformer ලැබුණද තමන්ලගේ ආයතනයට?

පි : 2015 අවුරුද්දේ මට දැනීමක් නැහැ. Transformer හම්බ වෙන්න ඇති කියලා හිතනවා නිකමට.

ප්‍ර : Transformer කියන එක ලංකා විදුලි බල මණ්ඩලයෙන් සාමාන්‍යයෙන් එළියට දාන දේවල් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : එළියට දාන අවස්ථා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : භාවිතයට නොහැකි හින්දා?

පි : ඔව්.

ප්‍ර : එතකොට භාවිතයට නොහැකි හින්දා ඒක එළියට දාන කොට ඒවා ඕගොල්ලන්ට මිලදී ගන්න අවස්ථාවක් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඔය 2014 ටත් ඉස්සෙල්ලා Transformer මිලදී ගත්ත අවස්ථා තියෙනවනේ?

පි : Transformer මිලදී අරන් තියෙනවා.

ප්‍ර : විශේෂයෙන්ම වැඩියෙන්ම තඹ හම්බ වෙන්නේ මම මහත්මයාට යෝජනා කරනවා තඹ හම්බ වෙන්නේ තමන්ලගේ ආයතනයට අවස්ථා දෙකකදී. එකක් තමයි Transformer පිළිගන්නවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : දෙවෙනි එක තමයි underground cables හරිද?

පි : ඒ දෙකෙන් තමයි ලැබිලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඒවා මිලදී අරගෙන තමයි තමන්ලා අර සුළු, කුඩා

පි : ඔව්.

ප්‍ර : මධ්‍ය පරිමාණයෙන් කටයුතු කරන ඒ ව්‍යවසායකයන්ට, ව්‍යාපාරිකයන්ට විකිණීම සිදු කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : හරිනේ?

පි : ඔව්.

ප්‍ර : C 760 දරන ලේඛන ගරු උතුමාණනි.

පි : ඔව්.

ප්‍ර : මේ ඔය කොලෝසස් එකෙන් හම්බ වෙච්ච දෙවෙනි ඉල්ලුම්පත්‍රයද?

පි : අයදුම් පත්‍රය ඔව්.

ප්‍ර : ආ ?

පි : ඔව්.

ප්‍ර : ඒකේ මොකක්ද දාලා තියෙන ලිපිනය?

පි : ඒකේ දාලා තියෙනවා කොලෝසස් ප්‍රයිවට් ලිමිටඩ්, නොම්බර් 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර : ඒ කියන්නේ C 760 දරන ලේඛනයේ දික්වැල්ල මහත්මයා ලිපින දෙකක් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : එකක් තමයි නොම්බර් 37, Old Moor Street, Colombo 12.

පි : ඔව්.

ප්‍ර : ඒ නොම්බර 37, Old Moor Street, Colombo 12 කියන එක තමයි පළවෙනි Application එකේ අයිතම අංක 05 යටතෙන් දාලා තිබ්බේ?

පි : ඔව්. ඒකම තමයි.

ප්‍ර : හරිනේ?

පි : ඔව්.

ප්‍ර : ඒක තමයි බුද්ධිනි මොකක්ද?

පි : රොද්‍රිගු.

ප්‍ර : බුද්ධිනි රොද්‍රිගු මහත්මිය විසින් කැපුවයි කියලා තමන් කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : කපලා දැම්මේ අලුත් address එකක් එකේ?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ C 758 ?

පි : ඔව්.

ප්‍ර : ඒක තමයි 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒක දාලා තියෙනවා මේ අලුත් Application එකේ. ඒ කියන්නේ C 760 දරන ලේඛනයේ අයිතම අංක පහ යටතේ?

පි : ඔව්.

ප්‍ර : ඒකේ තියෙන්නේ නොම්බර 111/A/6,අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය.

පි : ඔව්.

ප්‍ර : හරිනේ ?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් මහත්මයාගෙන් ගරු කොමිෂන් සභාවට සහයෝගය දෙන උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥමිය අහන් හිටියා එක්තරා අවස්ථාවක මේ පළවෙනි Application එකේ අසම්පූර්ණභාවය?

පි : ඔව්.

ප්‍ර : ඒ අසම්පූර්ණභාවය වශයෙන් යෝජනා වුණේ කාරණා දෙකක්. හරිද? එකක් තමයි ලිපිනය වශයෙන් අර කොළඹ 12, Old Moor Street කියන ලිපිනයක් දාලා තිබීම?

පි : ඔව්.

ප්‍ර : දෙවෙනි එක තමයි ඇත්ත වශයෙන්ම පරිශ්‍රය, ව්‍යාපාරික ස්ථානය පිහිටා තිබ්බේ වැල්ලම්පිටියේ අවිස්සාවෙල්ල පාරේ අංක 111/A/6, දරන ස්ථානය වීම හා ඒ අනුව ග්‍රාම සේවක සහතිකය සහ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය නොගැළපීම?

පි : ඔව්.

ප්‍ර : හරි?

පි : ඔව්.

ප්‍ර : එතකොට මේ 2018 එන ඉල්ලුම්පතේ එහෙම අසම්පූර්ණභාවයක් නැනේ බලලා කියන්න?

පි : ලිපිනයේ අසම්පූර්ණභාවයක් නෑ. අනිත් සියලුම දේවල් සම්පූර්ණ කරලා තියෙනවා.

ප්‍ර : ලිපිනයක් නෑ ඒකේත්?

පි : ලිපිනය නෑ. ලිපිනය ප්‍රශ්නයක් නෑ.

ප්‍ර : එතකොට මහත්මයාලා 2017 දැන් මේ C 760 දරන ලේඛනයේ දිනය 2018 මාර්තු මාසේ 27 දිනයක් හරිද?

පි : ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට C 758 දිනය 2017 අගෝස්තු මාසේ 09 වෙනිදා හරිනේ? අගොස්තු මාසේ 2017/ 09 වෙනිදා ඉඳලා C 760 තමන්ලගේ ආයතනය විසින් පිළිගන්නා තෙක් තමන්ලා පිත්තල හා තඹ මේ ආයතනයට නිකුත් කෙරුවේ C 758 මත හරිද?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් තමන්ලගේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : ඔව්.

ප්‍ර : Management committee රැස්වීම් තියන්න ඕනේ?

පි : තියන්න ඕනේ.

ප්‍ර : ඒක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරන්න ඕනේ දෙයක්?

පි : ඔව්.

ප්‍ර : Policy Planning committee කියලා තියෙනවා රැස්වීම් හරිද?

පි : ඔව්. Policy committee කියලා.

ප්‍ර : Policy committee?

පි : ප්‍රතිපත්ති කමිටු.

ප්‍ර : දැන් 2017 මැයි මාසේ ඉඳලා 2019 තමන් ඔය ධුරයෙන් අයින් වෙනකන් ඔය රැස්වීම් තියෙන්න ඇතිනේ?

පි : එක රැස්වීමක්වත් තිබ්බේ නෑ.

ප්‍ර : මොකක්ද තිබ්බේ නැත්තේ?

පි : ප්‍රතිපත්ති කමිටුව සහ කළමනාකරණ කමිටුව.

ප්‍ර : කවුද ඒ දෙක කැඳවන්න ඕනේ?

පි : අමාත්‍යාංශය විසින් කැඳවිය යුතුයි.

ප්‍ර : ඒක IDB එකට අයිති කාරණයක් නෙවෙයි?

පි : එහෙම සඳහනක් නෑ Guide line එකේ.

ප්‍ර : ඒක කැඳවන්න ඕනේ අමාත්‍යාංශ ලේකම්?

පි : ඔව් ලේකම්තුමා.

ප්‍ර : ඒක සභාපතිට අයිති කාර්යකුත් නෙවෙයි?

පි : සභාපතිට කරන්න අමාරුයි. සභාපතිට බෑ.

ප්‍ර : ඒක තමයි සභාපතිට බෑ. එතකොට ඒක කැඳවීමක් නොකෙරුවා නම් ඒ සම්බන්ධයෙන් වගකියන්න ඕනේ අමාත්‍යාංශ ලේකම් පිළිගන්නවද මහත්මයා?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ආ?

පි : පිළිගන්නවා.

ප්‍ර : ඒක තමන්ට කරන්නත් බෑනේ?

පි : බෑ.

ප්‍ර : හැබැයි තමන්ලා ඉල්ලීම් කරන්න ඇතිනේ දිගින් දිගටම මේක කැඳවන්නයි කියලා?

පි : ඉල්ලීම් කරලා තියෙනවා අපි.

ප්‍ර : තමුනුත් කෙරුවනේද සභාපතිත් කෙරුවද?

පි : සභාපතිතුමා කරලා තියෙන්නේ. සභාපතිතුමාගේ අත්සනින් අපි යවලා තියෙනවා ලියුම්.

ප්‍ර : එහෙම Management committee , Policy committee කැඳවන්න කියලා යම් කිසි අමාත්‍යාංශයක යටතේ තියෙන ආයතනයක සභාපතිවරයෙක් ඉල්ලනවා නම් ඒක තමයි හරි ක්‍රමවේදය කියලා මම තමන්ට යෝජනා කරනවා මහත්මයා පිළිගන්නවද කැඳවන්න කියලා කරන ඉල්ලීම?

පි : මතක් කිරීමක් කරන්න ඒක යුතුකමක් විදිහට මතක් කිරීමක් කරනවා අවශ්‍යතාවය මත. නැත්නම් අමාත්‍යාංශය විසින් කැඳවිය යුතු දෙයක් ඒක.

ප්‍ර : නෑ ඒක තමයි මම අහන්නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය සම්පූර්ණ කාලේ මොන ආණ්ඩුව ආවත් ඇමතිවරයා හැටියට හිටියේ රිෂාඩ් බදුර්දීන්නේ?

පි : ඔව්. ඊට කලින් ආණ්ඩුවේ රජය.

ප්‍ර : මට මතක නෑ. මතක ඇති කාලේක ඉඳලා එයානේ ඇමතිවරයා?

පි : ඔව් ඊට කලින් රජයෙත් කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමති.

ප්‍ර : එතකොට එයාගෙනේ ලේකම්වරයා හෝ වරිය. එයාගේ අමාත්‍යාංශයනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට මේ Management committee හා Policy committee කැඳවීම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කර්තව්‍යයක්නේ?

පි : ඔව්.

ප්‍ර : ඒකට සභාපතිවරයාට කරන්න පුළුවන් සිහි කැඳවීම් යවන එක විතරයි?

පි : ඔව්.

ප්‍ර : දැන් මහත්මයා ලේඛන වගයක් අද ඉදිරිපත් කෙරුවා.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 762 සාක්ෂිකරුට පෙන්වයි

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දකිස්ස මහතා</u>

ප්‍ර : දැන් මහත්මයා දන්නවාද Head of Department meetings කියලා තියෙනවනේ?

පි : ඔව් HOD.

ප්‍ර : HOD?

පි : ඔව්

ප්‍ර : දැන් ඔය HOD meetings තියන්න ඕනේ තමන්ගේ ආයතනයෙන්නේ?

පි : ඔව් අපේ ආයතනයෙන් තියන්නේ.

ප්‍ර : HOD meetings තිබ්බද 2017 ඉඳලා 2019 දක්වා කාල පරිච්ඡේදවල?

පි : HOD meetings තියෙනවා.

ප්‍ර : ඊට ඉස්සෙල්ලත් තිබ්බණේ?

පි : ඊට ඉස්සෙල්ලත් තියෙනවා.

ප්‍ර : දැන් මහත්මයා තමන්ගේ ලේඛන අතුරතුරදී තමන් කොහේවත් දැකලා තියෙනවාද 2016 මාර්තු මාසේ 15 වෙනිදා පැවතිච්ච Head of Department meeting එකකදී රැස්වීමකදී මේ 2016 මාර්තු මාසේ 15 පැවතිච්ච මතක නැත්නම් මතක නෑ කියන්න. HOD රැස්වීමකදී මේ scrap project එකෙන් ඒ කියන්නේ අබලි ලෝහ ව්‍යාපෘතියෙන් මීට වඩා ලාභ ගන්න නම් මේක වෙනම පුද්ගලයෙක් මේකට පත් කරන්න ඕනේ කියලා තමන්ලගේ DG ඒ කියන්නේ අධ්‍යක්ෂක ජනරාල් සාකච්ඡා කරලා නිර්දේශ කරලා තියෙනවා කියලා තමන් දන්නවද ඒ ලේඛන දැකලා තියෙනවද?

පි : මා දැනුවත් නෑ ඒ පිළිබඳව.

ප්‍ර : එතකොට දැන් මේක පැහැදිලි බොහොම සරල ප්‍රශ්නයක් මම අහන්නේ තේරුම් අරගෙන කාල වේලාව අරන් උත්තර දෙන්න. පළවෙනි එක තමයි මහත්මයා වැඩ කටයුතු භාර ගන්නේ අලෙවි අංශයේ අධ්‍යක්ෂකවරයා හැටියට 2017 මැයි මාසේ 17?

පි : අධ්‍යක්ෂක නෙවෙයි අබලි ද්‍රව්‍ය අංශයේ භාරව වැඩ කටයුතු

ප්‍ර : අබලි?

පි : අබලි ඒකකය භාරව.

ප්‍ර : අබලි ඒකකය භාරව?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට 2019 ජුනි මාසේ වෙනකම් මහත්මයා ධුරයේ කටයුතු කෙරුවා?

පි : ඔව් 2019 ජුනි මාසේ වෙනකම්.

ප්‍ර : එතකොට දිගින් දිගටම කොමිෂමට සහය වන උගත් රජයේ අධිනීතිඥවරිය තමන්ගෙන් ප්‍රශ්න කෙරුවා මේසා විශාල ප්‍රමාණයක් එක පුද්ගලයෙකුට එක ආයතනයකට දීම තුළින් අනිත් පුද්ගලයන්ට අනිත් ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් වුණාද නැද්ද කියලා ප්‍රශ්න කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : එතනදී තමයි මහත්මයා කිව්වේ අර විශාල ප්‍රමාණයන් නිකුත් කරලා තියෙන්නේ සභාපතිවරයාගේ උපදෙස් මත කියලා ඇතැම් අවස්ථාවලදී?

පි : ඔව්.

ප්‍ර : සහ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ උපදෙස් මත කියලා?

පි : ඔව්.

ප්‍ර : තමන් DPP 13 දක්වා ලේඛන වගයක් ඉදිරිපත් කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : දැන් මම මේ අහන්නේ බොහොම සරල ප්‍රශ්නයක්. කුඩා පරිමාණ, සුළු පරිමාණ ව්‍යාපෘතිවල යෙදෙන පුද්ගලයන් ඉන්නවා?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : ඔව්.

ප්‍ර : කුඩා පරිමාණ ව්‍යාපෘතිවල පිත්තල යොදා ගෙන ව්‍යාපෘති කරන ව්‍යාපාරික කටයුතු කරන තමනුත් එක්ක ලියාපදිංචි වී සිටින ඉල්ලුම්කරුවන් සිටිනවා?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : ඔව්.

ප්‍ර : ඒගොල්ලන්ට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්න පුළුවන් යම් කිසි පිත්තල ප්‍රමාණයක් ඉල්ලලා?

පි : ඔව්.

ප්‍ර : මේ කාලය තුළදී එහෙම පිත්තල ඉල්ලපු කොලෝසස් නොවන කිසිම සුළු පරිමාණ ව්‍යාපෘතියක යෙදෙන්නා වූ ව්‍යාපාරිකයෙකුට පිත්තල නොදීමක් සිදු වුණාද? වෙන්න පුළුවන් එක අවස්ථාවකුත් මං කියන්නම් උත්තරයෙන් පස්සේ.

පි : පිත්තල නොදීමක් සිදු වුණේ නැහැ. සමහර විට

ප්‍ර : ඉල්ලපු පිත්තල ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් දුන්න අවස්ථා තියෙනව හරිද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඒකට හේතුව වශයෙන් මම තමන්ට යෝජනා කරනවා ධාරිතාවය පරීක්ෂා කිරීම හරිද එකක්?

පි : ඒ අවස්ථාවේ දිස්ත්‍රික් කාර්යාලය විසින් පරීක්ෂා කරන්න ඇති.

ප්‍ර : තමන්ලා මට ඉල්ලන්න පුළුවන් උදාහරණයන් වශයෙන් මට ඉල්ලන්න පුළුවන් පිත්තල කිලෝ 10 ක්?

පි : ඔව්.

ප්‍ර : දිස්ත්‍රික් කාර්යාලය නිර්දේශ කරන්නේ පිත්තල කිලෝ 5 යි නම්

පි : ඔව්

ප්‍ර : තමන් දෙන්නේ 10 ද 5 ද?

පි : 5 යි දෙන්නේ දිස්ත්‍රික් කාර්යාලය කියන නිසා.

ප්‍ර : ඔය කාලපරිච්ඡේදය තුළ දිස්ත්‍රික් කාර්යාලය විසින් නිර්දේශ කරපු සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට ඒ නිර්දේශ කරපු පිත්තල ප්‍රමාණය කොලෝසස්ට පිත්තල දීම තුළින් ප්‍රතික්ෂේප වෙච්ච පැහැර හැරපු අවස්ථා තියෙනවද?

පි : එවැනි අවස්ථාවක් නෑ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු එහෙම අවස්ථාවක් නැත්නම් ඔබ අද දින කොමිෂම ඉදිරියේ පිළිගත්තා කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට දුන්නු ප්‍රකාශයේ ඔබ සඳහන් කෙරුවා කියලා සභාපතිවරයාව ඔබ දැනුවත් කෙරුවා කොලෝසස් සමාගමට මේ විදිහේ වැඩි ප්‍රමාණයක් දෙන එක අනිත් කර්මාන්තකරුවන්ට අසාධාරණයි කිව්වද නැද්ද?

පි : එසේ කිව්වා.

ප්‍ර : එහෙනම් ඒ අසාධාරණය කොහොමද වෙන්නේ?

පි : අසාධාරණය වෙන්නේ දැන් අපි දෙන අවස්ථාවේදී ඔවුන්ට ගන්න පුළුවන් ප්‍රමාණය අපි ලබා දෙනවා. සමහර විට තව වටයක් දෙන්න තිබුණා එච්චරයි. ඒත් මාසෙන් මාසේ ඒ අයට ගන්න අපහසුතාවයක් තියෙනවා කොච්චර කිව්වත්.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : දැන් පිළිමතලාවේ ප්‍රදේශවලින් පිත්තල ගන්න කට්ටිය යෙදෙන ව්‍යාපාරවලින් නිෂ්පාදනය වන නිෂ්පාදිතයන් තමයි පහන්, මල් පොච්චි ඒ වගේ සුළු සුළු දේවල් හරිද?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිබත්ගොඩ, පෑළියගොඩ පැත්තෙන් පිත්තල ගන්න කට්ටිය නිෂ්පාදනය කරන්නේ ඊට වඩා වෙනස් දේවල්?

පි : ඔවුන් සරනේරු, හුළං කොකු ඒ වගේ දේවල්.

ප්‍ර : එතකොට සරනේරුයි, හුළං කොකුයි ලංකාවේ දේශීය වෙළෙඳ පොළට එන එක ප්‍රධාන ස්ථානයක් තමයි කිරිබත්ගොඩ?

පි : කිරිබත්ගොඩ

ප්‍ර : එතන ඉන්නවා සුළු පරිමාණ ව්‍යාපෘතිවල යෙදෙන ඉල්ලුම්කරුවන්?

පි : ඔව්.

ප්‍ර : කුඩා පරිමාණත් ඉන්නවා?

පි : ඔව්.

ප්‍ර : හරි?

පි : ඔව්.

ප්‍ර : මධ්‍ය පරිමාණත් ඉන්නවද?

පි : එතන මධ්‍ය පරිමාණ අය නැහැ.

ප්‍ර : නැහැ?

පි : රෙජිස්ටර් වෙලා නෑ.

ප්‍ර : එතකොට පිළිමතලාව ප්‍රදේශයට යන පිත්තල පාවිච්චි වෙන්නේ අර මේ පිත්තල පහන්, අර පුන්කලස් වැටිච්ච පිත්තල ලොකු විශාල පහන් ඒ වගේ දේවල් හදන්න?

පි : ඔව්.

ප්‍ර : එතනත් හුඟ දෙනෙක් ඉන්නේ සුළු පරිමාණ හා කුඩා පරිමාණ ව්‍යවසායකයන් හරිද?

පි : ඔව්.

ප්‍ර : හරි?

පි : ඔව්.

ප්‍ර : එතනත් මධ්‍යම පරිමාණ මහා පරිමාණ කියලා එකක් නැනේ තමන්ලගේ මේ මාර්ගෝපදේශකයෝ?

පි : මාර්ගෝපදේශයේ නෑ.

ප්‍ර : එතනත් ඉන්නේ අර සුළු සහ කුඩා ව්‍යාපාරිකයන් පිළිගන්නවාද මහත්මයා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් තමන් කියන්න අසාධාරණයක් වෙනවා නම් මේ එක සමාගමකට මේසා සුවිශාල පිත්තල සැපයීමක් කරන කොට අසාධාරණයක් වෙනවා නම් වෙන්නේ දෙවෙනි වටයක් supply කරන්න සපයන්නට නොහැකි වීමේ ප්‍රවණතාවය තුළින් විතරයි?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : කරුණාකරලා කියන්න ගරු උතුමාණන්ලට.

පි : මම පැහැදිලි කරන්නද ස්වාමිනි.

ප : කරන්න.

පි : අපි ලබා දෙන කොට ඔවුන්ගේ ගන්න පුළුවන් උපරිම ප්‍රමාණය ලබා දීලා තියෙනවා. ඒ අපිට ලැබෙන ප්‍රමාණයෙන්. ඒ අතරේ තමයි කොලෝසස් ආයතනයටත් ලබා දීලා තියෙන්නේ. මේ අයට ඒ එක්කම අපි හිතමු මේ මාසෙත් දුන්නත් ලබන මාසෙත් දුන්නත් ගන්න ක්‍රමයක් නෑ. අපි නිරීක්ෂණය කළා අපේ තියෙන අත්දැකීමත් එක්ක. හැබැයි ඔය අතරේ අපිට ලැබෙන්නේ නැති කාලයක් තියෙනවා අන්න ඒ කාලේට මේ ටික තිබුණා නම් දෙන්න තිබුණා. මොකද ආරක්ෂක අමාත්‍යාංශයෙන් දිගටම අපිට දෙන්නේ නෑ ඒගොල්ලො තළලා තමයි දෙන්නේ. දිගින් දිගටම දෙන්නේ නෑ. ඒ තළන ප්‍රමාණයෙන් තමයි අපි ඒ විදියට ලබා දීලා තියෙන්නේ ඔහොම .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : දැන් සාක්ෂිකරු මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය පටන් ගන්න මූලික වෙන්නේ මාර්ගෝපදේශ සංග්‍රහය?

පි : ඔව් ස්වාමිනි.

ප : පටන් ගන්නේ 2013 ඔක්තෝම්බර් මාසේ 17 වෙනිදා තිබ්බ කැබිනට් අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන් කියලා කිව්වොත් පිළිගන්නවද?

පි : පිළිගන්නවා මාගෝපදේශ සංග්‍රහය.

ප : මාගෝපදේශ සංග්‍රහය පිළිගන්නවා?

පි : ඔව්.

ප : ඒ මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රකාශිතව දක්වනවද මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය මේ ක්‍රියාවේ යොදවන්නේ කවුරු සඳහාද කියන එක ?

පි : එහි තියෙන සුළු, කුඩා, මධ්‍ය පරිමාණ කර්මාන්ත.

ප : සුළු, කුඩා, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්?

පි : ඔව්.

ප : ඔවුන්ගේ මොන අවශ්‍යතාවය සපුරාලන්නද මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාවේ යොදවන්නේ?

පි : ඔවුන්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරන්න.

ප : අන්න හරි ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා?

පි : ඔව්.

ප : ඒ අවස්ථාව ඇති කිරීම සඳහා එම මාර්ගෝපදේශ සංග්‍රහයේම කියනවාද යම් කිසි කාරණාවක් තහනම් කරනවා කියලා?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද ඒ තහනම් කරපු කාරණාව?

පි : තහනම් කරලා තියෙනවා අබලි සුන්බුන් අපනයනය.

ප්‍ර : අබලි සුන්බුන් අපනයනය තහනම් කෙරුවා ඒ කැබිනට් අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන්?

පි : ඔව්.

ප්‍ර : හරිද?

පි : එහෙමයි.

ප්‍ර : පිළිගන්නවාද?

පි : එහෙම තමයි.

ප්‍ර : එතකොට ඊට පස්සේ 2014 දී තවත් කැබිනට් ඇමති තීරණයක් ගන්නවා කියලා ඔබ දැනුවත් වෙනවද අගය එකතු කිරීමක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කැබිනට් සංදේශයක් මත?

පි : අගය එකතු කිරීමක් මත අපනයනයට අවසර ලබා දීලා තියෙනවා.

ප්‍ර : අන්න හරි. ඒ අගය එකතු කිරීමක් මත අපනයනයට අවසර ලබා දෙන්නේ කුමන අගය එකතු කිරීමක් දාලාද?

පි : අගය එකතු කිරීම මට දැනුවත් විදියට 35% ක්.

ප්‍ර : 35% ක්?

පි : එය නිවැරදි ඇති මට මතක නෑ.

ප්‍ර : ඊට ඉස්සෙල්ලා තිබ්බේ කීයද? ඊට ඉස්සෙල්ලා සම්පූර්ණයෙන්ම තහනම් කරලනේ තිබ්බේ?

පි : අබලි ද්‍රව්‍ය අපනයනය තහනම් කරලා තිබ්බේ.

ප්‍ර : එතකොට අර 2014 දී දාපු කැබිනට් අමාත්‍ය මණ්ඩලයෙන් 35% ක් අගය වැඩි කිරීමක් කරලා මොකක්ද අපනයන කරන්න අවසර ලබා දුන්නේ?

පි : නිෂ්පාදන කරන්න.

ප්‍ර : නිෂ්පාදනය කරන්න?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ මේ අබලි ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන්?

පි : ඔව් අබලි ද්‍රව්‍ය පාවිච්චි කරලා නිෂ්පාදනය කරන්න.

ප්‍ර : කාර්මික සංවර්ධන මණ්ඩලය විකුණන අබලි ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් 35% ක අගය එකතු කිරීමක් දුන්නම් පස්සේ එය අපනයනය කරන්න අවකාශය දුන්නා නේද?

පි : ඔව් ඒක කාර්මික සංවර්ධන මණ්ඩලය විතරක් නෙවෙයි අනිත් තැන්වලින් එකතු කරනවා.

ප්‍ර : අනිත් අයටත් දුන්නනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කැබිනට් මණ්ඩල පත්‍රිකාව දැම්මේ කවුද?

පි : ඒ පිළිබඳ මට දැනීමක් නෑ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැනීමක් නෑ?

පි : ඒ පිළිබඳ දැනීමක් නෑ.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප : දැන් මහත්මයා සඳහන් කරමින් හිටියේ ගරු සභාපති විනිශ්චයකාරතුමන් විසින් ප්‍රශ්න කරන්නට ඉස්සෙල්ලා මම මහත්මයාගෙන් ප්‍රශ්න කෙරුවේ අර සුළු ව්‍යවසායකයන්ට පාඩු වෙන්න පුළුවන් ආකාරයක් ගැන මම ඇහුවා?

පි : ඔව්.

ප : අර මහත්මයා සඳහන් කෙරුවා දෙවෙනි අවස්ථාවක් ඕගොල්ලොන්ට නැති වෙන්න ප්‍රවණතාවයක් තිබ්බා සහ අර පිත්තල නැති කාලවලදී සැපයීමට නොහැකි අවස්ථාවක් ඇති වෙනවා කියලා?

පි : ඔව්.

ප : දැන් ඒ වගේම තමන්ගෙන් ගරු සභාපති විනිශ්චයකාරතුමා අහපු ප්‍රශ්නෙකට මහත්මයා කිව්වා සත්‍ය කරුණක් වශයෙන් පිළිගත්තා තමන් මේ විමර්ශන කටයුතුවලදී කරපු ප්‍රකාශයේ සභාපතිතුමාට මේ බව දැනුම් දුන්නයි කියලා?

පි : ඔව්.

ප : ලිඛිතවද දැනුම් දුන්නේ?

පි : නෑ ලිඛිතව දැනුම් දීලා නෑ.

ප : ඒක ලිඛිතව දැනුම් දුන්නා නම් ටිකක් වඩා හොඳයි නේද?

පි : ලිඛිත දැනුම් දුන්නා නම් හොඳයි ඒත් අපිට

ප : නමුත් ලිඛිතව දැනුම් දීලා නෑ පිළිගන්නවනේ මහත්මයා?

පි : ලිඛිතව දැනුම් දීලා නෑ.

ප : එතකොට දැන් මහත්මයාගෙන් විනිශ්චයසභාවත්, ගරු විනිශ්චයකාරතුමන්ලත්, කොමිෂන් සභා සාමාජිකයිනුත්, රජය වෙනුවෙනුත්, කොමිෂන් සභාව නියෝජනය කරමින් උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරියනුත් ප්‍රශ්න කෙරුවා මේ වට්ටම් ගැන?

පි : ඔව්.

ප : දැන් මහත්මයාගෙන් මම ඇහුවා අර අනුමත වට්ටම් සීමා ගැන මහත්මයා කතා කෙරුවා?

පි : ඔව්.

ප : ඒක මට තේරුණේ නෑ මහත්මයා කියපු උත්තරේ? දැන් මම මේ නිකම් අහන්නේ සාමාන්‍යයෙන් මොකද දැන් මට කියන්නකෝ මෙහෙම දැන් මට කරුණාකරලා කියන්න ඔබතුමා වට්ටමක්

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

දෙන්න ඕනේ නම් උපරිම වට්ටම දෙන්න ඕනේ සුළු පරිමාණ කර්මාන්තයට?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ කුඩා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ මධ්‍ය?

පි : ඔව්.

ප්‍ර : එතනින් එහාට වට්ටම් නැත?

පි : වට්ටම් නෑ.

ප්‍ර : වට්ටම් නෑ හරිද? එතකොට මට කියන්න කරුණාකරලා ඔය වට්ටම ගණනය කරන්නේ කොහොමද කියලා?

පි : වට්ටම ගණනය කරන්නේ දිගටම කරගෙන ආපු ක්‍රමවේදය. අපිට අමුද්‍රව්‍ය ලබා දෙන්න කිව්වාම දෙනවා කියපුවාම ආයතනයක ඒ අමුද්‍රව්‍ය වලට මිල නියම කරලා තිබුණේ නැත්නම් ඒ ආයතනයෙන් ලබා ගන්න අපි මිල කමිටුවක් රැස් කරනවා. රැස් කිරීමේදී ඒක Guide line එකේ තියෙනවා මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රමයක්. ඒ ක්‍රමයට අනුව එකතු වෙලා මිල තීරණය කරනවා. මිල තීරණය කරන්නේ මුලින්ම අපි තීරණය කරන්නේ වෙළෙඳපොළ මිල. ඒක සාකච්ඡා කරලා තීරණය කරනවා.

ප්‍ර : ඒක තමයි අර මැද අගයකට එන්නේ?

පි : ඔව්.

ප්‍ර : ආ?

පි : මැද අගයකට එන්නේ ඒ කතා කරන අර ඒකට කියන්නේ සාකච්ඡා කිරීම තුළින් මැද අගයකට එනවා. මැද අගයකට ඇවිල්ලා ඒ මිලෙන් අපි දෙන්නේ 25% නම් කර්මාන්තකරුට සහනය ඒ අලෙවි market ඒ කියන්නේ වෙළෙඳපොළ මිලෙන් 25% ක් අඩු කරලා කර්මාන්තකරුට දෙන මිල නියම කරනවා ඉස්සෙල්ලම.

ප්‍ර : දැන් මම නිකම් අහන්නම්කෝ මෙහෙම. මැද අගය රුපියල් 100 නම්?

පි : ඔව්.

ප්‍ර : අඩු කරන්න ඕනේ මොකක්ද ඊළඟට ?

පි : අඩු කරන්න ඕනේ කර්මාන්තකරුට අලෙවි කරන මිල.

ප්‍ර : 25% ක් නම් වට්ටම

පි : 25% ක්.

ප්‍ර : බිංදුවයි 75 ට එනවා?

පි : 75 ට එනවා.

ප්‍ර : ඊට පස්සේ?

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒ 75 න් තමයි අපි අඩු කර ගෙන යන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ පරිපාලන වියදම්.

ප්‍ර : රුපියල් 5 යි?

පි : 20% ක්.

ප්‍ර : 20% ක් කියන්නේ 20% ක්?

පි : ඔව්.

ප්‍ර : කීයද? 55 ට බහිනවා?

පි : 55 ට බහිනවා.

ප්‍ර : තවම නම් 20% යි 55 ට බහින්නේ නෑ. 75 නම් ගාණ 60 කට විතර බහින්නේ. 60 යි.

පි : ඔව්. 75 න් 20% ක් .

ප්‍ර : 75න් 20% නේ.

පි : 75 න් 20% ක්

ප්‍ර : ඒ කියන්නේ රුපියල් 60 ට බහිනවා දැන්?

පි : 75 න් 20% යි කියන්නේ 7.50 යි. රුපියල් 15 ක් අඩු වෙනවා.

ප්‍ර : ඔව් ඒ කියන්නේ රුපියල් 75 ඉඳලා බහිනවා 60 ට.

පි : 60 ට අඩු වෙනවා.

ප්‍ර : ඊට පස්සේ තව මොනවද බහින්නේ?

පි : ඊට පස්සේ ලාභය 5% ක් අඩු කරනවා.

ප්‍ර : සියට නම් පහයි 60 ට නම් කීයද?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : අඩු කරනවා නෙවේ වැඩි කරනවා ලාභයක්නේ හොයන්නේ?

පි : නෑ අර කර්මාන්තකරුට දැන් අපි ඊට පස්සේ හොයා ගෙන යන්නේ ආයතනයට ගෙවන මිල. ආයතනයෙන් මිලදී ගන්න මිල තමයි දැන් අපි හොයා ගෙන යන්නේ. ඒක හොයන්නේ

ප්‍ර : ආයතනයේ මිල නෙවෙයි තමන් විකුණන මිල හොයන්නේ?

පි : නෑ විකුණන මිල මුලින්ම තීරණය වෙනවා නියම ක්‍රමයට.

ප්‍ර : නෑ නෑ ආරක්ෂක අමාත්‍යාංශයෙන් නැත්නම් යුධ හමුදාවෙන් ගන්න මිල තීරණය කරලා ඉවරයිනේ?

පි : ඔව් එකේදී එහෙමයි . මම මේ පැහැදිලි කෙරුවේ සාමාන්‍යයෙන් අපි වෙන ආයතනවල කරන ක්‍රමය. ඒක නෙවෙයි මෙතන සිද්ධ වෙලා තියෙන්නේ.

****

<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්දතිස්ස මහතා</u>

ප්‍ර : ඒක නෙමෙයි මෙතන සිදු වුණේ කියන්නේ තමන්ලට 2017 මැයි මාසේ 26 වෙනිදා ආපු ලියුම ආරක්ෂක අමාත්‍යාංශයෙන්?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒකේ සාමාන්‍ය සම්මතයන්ට පටහැනිව මිලදී ගන්න ඕනේ army එකෙන් යුධ හමුදාවෙන් මිලදී ගන්න ඕනේ මිල සඳහන් කරලමයි ඒ ලියුම ආවේ?

පි : සඳහන් කරලා එව්වා.

ප්‍ර : හරිද?

පි : ඔව් සඳහන් කරලා එව්වා.

ප්‍ර : ඒ මත තමයි තමන්ලා මේ pricing ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරුවේ?

පි : ඔව්.

ප්‍ර : ඒක කෙරුවේ Marketing Division එකෙන්?

පි : Marketing Division එක සහ ඒ සඳහා පත් කරපු තව සාමාජිකයන්ගෙන් යුත් committee යක් මඟින්.

ප්‍ර : එකේ සභාපතිතුමා හිටියේ නැනේ?

පි : සභාපතිතුමා හිටියේ නෑ.

ප්‍ර : එතකොට pricing තීරණය කෙරුවේ committee එකෙන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් මහත්මයා ලිපි වගයක් ඉදිරිපත් කෙරුවනේ සභාපතිගෙන් අනුමැතිය ගත්තයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුමැතිය දැන් සාමාන්‍යයෙන් මහත්මයා පිළිගන්නවද ඕනෑම ආයතනයක පල්ලෙහා ඉඳලා උඩට ලියුමක් එනකොට නිර්දේශයක් එක්කනේ එන්නේ සාමාන්‍යයෙන් Travelling claim එකක් පවා නිර්දේශ කරන්න එපැයි?

පි : ඔව්.

ප්‍ර : වවුචර් එකක් පවා සකස් කරමි අනුමත කරමි එහෙම තියෙන්න එපැයි?

පි : ඔව්.

ප්‍ර : එතකොට මේකේ තියෙන්නේ ඔබතුමලා ඉදිරිපත් කරපු ලියුම් කීපයක් තියෙනවා සටහන් යෙදීමක් තියෙනවා සභාපතිගේ?

පි : ඔව්.

ප්‍ර : නමුත් අර ආයතනයක බලාපොරොත්තු වන ආකාරයේ නිර්දේශයක් සඳහන් වෙලා නෑ හුඟක් දේවල්වල?

පි : ලබා දීලා නෑ.

ප්‍ර : එතකොට සභාපතිතුමයි ඔබතුමයි අතර තමයි ඒ සංවාදය පැවතුණේ සමහර අවස්ථාවලදී DG මහත්මයාත් ඒවාට සම්බන්ධ වෙන්න ඇතිද?

පි : සම්බන්ධ වෙලා තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා වෙච්චි දේවල් තමන්ට කියන්න පුළුවන් සභාපතිට කියන්න පුළුවන් හරිනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට මම මේ අහන්නේ මහත්මයාගෙන් අවසාන ප්‍රශ්නය පහුගිය ඔය මහින්ද ජිනසේනගේ සභාපතිත්වයෙන් යුතු කාලයේ වැඩියෙන් පිත්තල ලැබුණා වගේම IDB එකේ ආදායම සහ ප්‍රතිලාභ වැඩි වුණා පිළිගන්නවාද?

පි : පිළිගන්නවා ඒක.

ප්‍ර : 2015 තමාලට බෝනස් කීයක් හම්බ වුණාද?

පි : මට මතක විදියට රුපියල් 3000 ක්.

ප්‍ර : රුපියල් 3000 ක් බෝනස්. මහින්ද ජිනසේන යනකොට කීයක් හම්බ වුණාද?

පි : එක වර්ෂයකදී 2017 හෝ 13500 ක් හම්බ වුණා.

ප්‍ර : IDB එකේ සේවකයන් කීයක් ඉන්නවද?

පි : ආසන්න වශයෙන් 650 ක් හෝ 600 ගාණක්.

ප්‍ර : ඒ 600 ටම තමන්ගේ වැටුප් තල මත පිහිටා ඒවා හම්බ වෙන්න එපැයි නේද?

පි : ඔව් සියළු දෙනාටම එකම ගාණ හම්බ වුණේ.

ප්‍ර : එතකොට ඒ ඇරෙන්න ඔය කටයුතුවලදී දැන් තමන්ට කරපු අනුමත කිරීම් තමන් ගරු කොමිෂමට ඉදිරිපත් කෙරුවද ලිපි කිහිපයක්?

පි : ඔව්.

ප්‍ර : ඒ දැන් ඔය දෛනික කටයුතුවලට සභාපතිවරයා සම්බන්ධ වෙන්නේ නැනේ?

පි : නෑ සම්බන්ධ වෙන්නේ නෑ.

ප්‍ර : දැන් ඔය පිත්තල තොගය විටින් විටනේ තමන්ලට එන්නේ?

පි : විටින් විට එන්නේ තැලුවට පස්සේ.

ප්‍ර : එතකොට සමහර අවස්ථාවලදී ඒ එන පිත්තල අර ඒ අදාළ උණ්ඩ තළලා තියෙන Camp එකෙන්ම ඉවත් කරනවා?

පි : ඔව්.

ප්‍ර : අර මහත්මයා සඳහන් කරපු ක්‍රමවේදය අනුව?

පි : ඔව් ප්‍රමාණය වැඩි නම් අපි එතනින්ම ඉවත් කරනවා.

ප්‍ර : එහෙම නැත්නම් තමන්ගේ ආයතනයට ගෙනල්ලා ඒක නිදහස් කරනවා මුදා හරිනවා?

පි : ආයතනයට ගෙනල්ලා නිදහස් කරලා තියෙනවා. නුවර නම් අපි කර්මාන්තකරු ළඟට ගිහිල්ලා පිත්තල ලබා දීලා තියෙනවා.

ප්‍ර : එතකොට ඔය දෛනික කටයුතු වලට සභාපතිවරයා කවදාවත් සම්බන්ධ වුණේ නැනේ?

FAIR COMMENT BY JEZEEM

පි : සභාපතිවරයා සම්බන්ධ වෙලා නෑ. හැබැයි නුවර යද්දී නම් අපිට උපදෙස් දුන්නා ගොඩක්.

ප්‍ර : මොනවගේ උපදෙස්ද දුන්නේ?

පි : ඒ ලබා දෙන්න ඕනේ ආකාරය, ලොරි ගෙනියන්න ඕනේ ආකාරය.

ප්‍ර : ලොරි එලවන්න ඕනේ ආකාරයද?

පි : නෑ ලොරියේ ගහගෙන යන්න ඕනේ බෝඩ් එක. එතකොට ඉබ්බෝ දාන විදිහ. ඒවා උපදෙස් දුන්නා ඔක්කොම.

ප්‍ර : ඒ සාමාන්‍ය විධි විධාන?

පි : ඔව්. ඒවා සාමාන්‍යයෙන් දැන් කෙරී ගෙන යන්නේ නැතත් අපිට ඒවා

ප්‍ර : වැදගත් වෙනවද?

පි : ඔව් තරයේ ඒවා පිළිපදින්න කියලා කිව්වා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මෙම අවස්ථාවේදී කොමිෂන් සභාවේ කටයුතු රාත්‍රී ආහාරය සඳහා නවය පසු වී විනාඩි 30 වන තෙක් කල් දමනවා. එම කාලය තුළදී මෙම සාක්ෂිකරු වෙනත් පුද්ගලයින් සමඟ කතා කිරීම නොකළ යුතු බවට ඔහුට අවවාද කරනවා. ඔහුට අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔහුට රාත්‍රී ආහාරය ගැනීම සඳහා පහසුකම් සලසන ලෙසටත් නියෝග කරනවා.

දැන් වේලාව : ප.ව.08.50 යි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.09.35
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් සාක්ෂිකරු වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ වලක විදානගේ මහතාට ලබාදෙනවා.

****

<u>නීතිඥ වලක විදානගේ මහතා.</u>

ප්‍ර: මහත්මයා ඔබතුමා ප්‍රකාශ කරා ගරු රජයේ අධිනීතිඥවරිය ප්‍රශ්න ඇසීමේ දී ප්‍රකාශ කරනු ලැබුවා ආරක්ෂක අමාත්‍යාංශයෙන් යම්කිසි පිත්තල කොපු ප්‍රමාණයක් ලැබුණා කියලා?

උ: ඔව්.

ප්‍ර: දැන් මේ පිත්තල කොපු ප්‍රමාණය ලැබීමේ දී හිස් කොපු ප්‍රමාණය ලැබීමේ දී ඒ බව ඔබතුමා දැනගත්තේ කවද්ද?

උ: මම දැනගත්තේ 2017 මැයි 29.

ප්‍ර: ඒ මොන ආකාරයෙන් ද දැනගත්තේ ලිඛිතව දැන්නුවද?

උ: අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් මට ලිපිය යොමු කරලා තිබුණා.

ප්‍ර: එතකොට ඒ ලිපිය තමන්ට ලැබුණට පස්සේ ගත්ත පළවෙනි ක්‍රියාමාර්ගය මොකද්ද?

උ: පළවෙනි ක්‍රියාමාර්ගය මගේ ඊළඟ නිලධාරියා හිටියා ධම්මික රත්නායක. එතුමාට මං අවශ්‍යය කටයුතු කරන්න කියලා ලිපිය යොමු කෙරුවා .

ප්‍ර: එතකොට මේ ලිපියේ දැන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබාදෙන්න යම්කිසි අවසාන දිනයක් ලබාදීලා තිබුණ ද?

උ: අවසාන දිනයක් ලබාදීලා තිබුණා. මැයි 31.

ප්‍ර: ඒ කියන්නේ ඔබට මේ ලිපිය ලැබෙන මැයි 29 /2017 ඊට පස්සේ දින දෙකකට පසුව මේ ලිපියට පිළිතුරු ලබාදිය යුතුයි?

උ: ඔව් එහෙම තමයි තිබුණේ.

ප්‍ර: එතකොට ඒ ලිපියට පිළිතුරු ලබාදීම සඳහා ඔබතුමා ගත්ත ක්‍රියාමාර්ගය මොකද්ද?

උ: 29 වැනිදා මා වෙත එවලා තිබුණා හවස්වරුවේ ලිපිය. අධ්‍යක්ෂ ජනරාල්තුමා. ඊට පස්සේ මට මේකට ක්‍රියාමාර්ගයක් ගන්න

FAIR COMMENT BY JEZEEM

විදියක් නැහැ සාකච්ඡා කරන්න කෙනෙක් හිටියේ නැහැ. අධ්‍යක්ෂ ජනරාල්තුමා 29 හිටියේ නැහැ. 30 වැනිදත් හිටියේ නැහැ ආයතනයේ. සභාපතිතුමා ආවේත් නැහැ. මම 31 අධ්‍යක්ෂ ජනරාල්තුමා හම්බවෙන්න උදේ නම් ගිහිල්ලා මේ ගැන සාකච්ඡා කරලා මේකට යම්කිසි ක්‍රියාමාර්ගයක් ඉක්මනින් ගත යුතුයි කියන එක සඳහන් කෙරුවා.

ප්‍ර: එතකොට දැන් ඒ ක්‍රියාමාර්ගය ගැනීමේදී දැන් යම්කිසි ආකාරයක මිල නියම කිරීමක් කළ යුතුයිනේ. මේවා මිලදී ගැනීමට යම්කිසි යෝජනාවක් කළයුතුයිනේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ යෝජනාව කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්තුමාට ඔබතුමා යෝජනා කරාද මොනව හරි?

උ: අධ්‍යක්ෂ ජනරාල්තුමාට මා ඒ අවස්ථාවේ ප්‍රකාශ කෙරුවේ ආරක්ෂක අමාත්‍යාංශයට මේ බව දැනුවත් කළ යුතුයි කියන එක. ඒ එක්කම අධ්‍යක්ෂ ජනරාල්තුමා අපේ වාත්තු අංශයේ ඉංජිනේරුවරුන්ගෙන් විමසලා එහි සඳහනක් දැම්මා වෙළඳපොල මිල කීයද කියලා. ඒ කියන්නේ ඒ අමුද්‍රව්‍යය වල.

ප්‍ර: එතකොට වෙළඳපොළ මිල වැදගත් වෙන්නේ අර කලින් කියපු විදියට මිල නියම වට්ටම් සැකසීමේ දී ?

උ: වට්ටම් සැකසීමේදී.

ප්‍ර: ඒ නිසා වෙළඳපොළ මිල මේ අවස්ථාවේ දී දැනගෙන සිටීමට අනිවාර්ය කාරණයක්?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ මිල නියම කිරීම දැන්නුවේ අධ්‍යක්ෂක ජනරාල්තුමා?

උ: ඔව්. ඒ සඳහන දැම්මේ අධ්‍යක්ෂ ජනරාල්තුමා.

ප්‍ර: ඒකට ඔබතුමාගේ සම්බන්ධයක් තිබ්බේ නැහැනේ?

උ: මගේ සම්බන්ධයක් තිබ්බේ නැහැ.

ප්‍ර: එතකොට මහත්මයා ප්‍රකාශ කරා යම්කිසි ආයතනයක් කොලෝසස් කියන ආයතනය ලියාපදිංචි වීම සඳහා මේ අඛලි ලෝහ මිල දී ගැනීමට ලියාපදිංචි වීම සඳහා යම්කිසි අයඳුම්පත්‍රයක් යොමුකරා කියලා?

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ අයඳුම්පත්‍රය යොමුකිරීමේ දී සාමාන්‍ය කෙනෙක් අයඳුම්පත්‍ර යොමු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය පැවරෙන්නේ කාටද? ඒ කියන්නේ දැන් කවුරු හරි කෙනෙක් අයඳුම්පත්‍රයක් දිස්ත්‍රික් කාර්යාලයට යොමු කරනවා කියලා ඔබතුමා කලින් සාක්ෂිදීමේදී කියා සිටියානේ?

උ: ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඒ දිස්ත්‍රික් කාර්යාලයට යොමු කරාම ඒ සම්බන්ධයෙන් අවසාන නිර්දේශය යොමු කරන්නේ කවුද?

උ: අවසන් නිර්දේශය යොමු කරන්නේ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍යය අධ්‍යක්ෂකවරයා විසින්.

ප්‍ර: එතකොට ඒ යොමු කරන නිර්දේශය මත ක්‍රියාකරනවා හැර ඔබ විසින් ඒ එන හැම Application එකක්ම ඒ අයදුම්පත්‍රයක්ම පරීක්ෂා කරලා බලන්නේ නැහැනේ?

උ: එහෙම පරීක්ෂා කිරීමක් කරන්නේ නැහැ.

ප්‍ර: එතකොට මේ අයදුම්පත්‍රය පිළිබඳව විශේෂ අවධානයක් යොමු වුණේ අර කලින් කියපු විශාල ප්‍රමාණය නිසා?

උ: ඔව්. තඹ විශාල ප්‍රමාණයක් නිර්දේශ කරලා තිබුණා.

ප්‍ර: නිර්දේශ කර සිටි නිසා සහ ඔවුන් ඉල්ලා සිටි නිසා?

උ: ඉල්ලා සිටි නිසා.

ප්‍ර: එතකොට සාමාන්‍යයෙන් දැන් අලුත් මේ අංශයේ වැඩ අලුතෙන්නේ භාර ගත්තේ. 2017 මැයි මාසේ 17 වැනිදානේ ඔබතුමාට ලැබෙන්නේ මේ අංශයේ සියළු වගකීම්?

උ: ඔව් අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතිය.

ප්‍ර: එතකොට දැන් මේ අංශයේ මේ වගකීම භාර ගත්තට පස්සේ මේ හම්බවෙන මේ වගේ දෙයක් මේ වගේ අවස්ථාවක් පළවෙනි අවස්ථාවට තමයි ඔබතුමාට ඉදිරියට එන්නේ?

උ: ඔව්.

ප්‍ර: මේ වගේ ලොකු ප්‍රමාණයක්?

උ: ඔව්.

ප්‍ර: ඉතිං ඒ නිසා මේ බව දැන්වීමේ දී ඔබතුමා මේ සම්බන්ධයෙන් ඉහළ නිලධාරීන්ට දැනුම් දිය යුතුයි කියලා තීරණය කරා?

උ: ඔව්. එහෙම තමයි කෙරුවේ.

ප්‍ර: එතකොට ඒ ආකාරයෙන් දැනුම්දීමේ දී ඔබ විසින් ඉස්සෙල්ලම මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්තුමා සමඟ හෝ සහාපතිතුමා සමග කතා කරාද?

උ: මුලින්ම අධ්‍යක්ෂ ජනරාල්තුමා එක්ක කතා කරා.

ප්‍ර: එතකොට අධ්‍යක්ෂ ජනරාල්තුමා මොකද්ද කිව්වේ?

උ: අධ්‍යක්ෂ ජනරාල්තුමා මට අවශ්‍ය වුණේ ආරක්ෂක අමාත්‍යාංශයට එහෙම මුලින්ම දැනුම්දීමක් කරන්න. අපි මේක නැත්නම් 31 ඒවා අපිට අන්තිම දිනය දීලා තිබුණේ. ඒක නිසා අපි ලිවුමක් අධ්‍යක්ෂ ජනරාල්තුමාට ලිවුමක් හදලා අපි මේක

ප්‍ර: නෑ නෑ මහත්මයා ඒක නෙවෙයි මං අහන්නේ. දැන් මේ මම අහන්නේ ක්ලෝසස් ආයතනයේ අයදුම්පත්‍රය සම්බන්ධයෙන්? එතකොට විශාල ප්‍රමාණයක් ඔවුන් අයදුම් කරලා තිබ්බනේ. ඒ

FAIR COMMENT BY JEZEEM

සඳහා යම්කිසි ක්‍රියාමාර්ගක් ගත යුතුයි කියලා ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් කළ යුතුයි කියලා ඔබතුමා තීරණය කරනවා ඒ අංශයේ මේ වන විට වැඩ භාරව සිටින කෙනා විදියට?

ඇ: ඔව්.

ප්‍ර: එතකොට ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක ජනරාල්තුමාට දැනුම් දුන්නද කියලා මං ඇහුවේ?

ඇ: අධ්‍යක්ෂ ජනරාල්තුමාට .

ප්‍ර: වාචිකව දැනුම් දුන්න ද?

ඇ: දැනුම්දීමක් කරන්න ඇති මට

ප්‍ර: එතකොට සභාපතිතුමාට ?

ඇ: සභාපතිතුමාට දැනුම් දුන්නා.

ප්‍ර: එතකොට සභාපතිතුමා ඒ වෙලාවේ දී ඔබතුමාට කිව්ව ද යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඒ සම්බන්ධව ලිඛිතව යම්කිසි නිර්දේශයක් යොමු කරන්න කියලා?

ඇ: නිර්දේශය යොමු කිරීම නෙවෙයි ඒ කියන්නේ මේක පරීක්ෂා කරන්න ඕන කියන එක මතේ හිටියා.

ප්‍ර: ඒ කියන්නේ පරික්ෂා කරන්න ඕන කියන්නේ මේ සම්බන්ධයෙන් නිකන් තීරණයක් දෙන්න නෙමේ. නමුත් සියළු දෙනා එකතු වෙලා මේ අවස්ථාවේ යම්කිසි ආකාරයක ලාභයක් ලබාගන්න මේ අබලි ලෝහ ව්‍යාපාරයට සහ IDB එකට. ඒ කියන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයට. ඒ වගේම එහි තියෙන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට?

ඇ: ඔව් ඒ පිළිබඳව එතුමා ලොකු සතුටක් දැක්වුවා ඒ ප්‍රමාණය සහ මණ්ඩලයට ලැබෙන ලාභය පිළිබඳ ගණනය කිරීමත් යම්කිසි ප්‍රමාණයක් නිකන් ගණනය කිරීම් කෙරුවා.

ප්‍ර: එතකොට මේ වන කොට දැන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලොකු පරිමාවක දේවල් ඇවිල්ලා තියෙනවා ඒවත් විකිණීමට අවශ්‍යතාවයකුත් තියෙනවා.

ඇ: ඔව්.

ප්‍ර: ඒ වගේම මේ අවස්ථාවේ දී සුළු සහ කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයන් මේ හා විශාල ලෝහ ප්‍රමාණයක් මිලදී ගැනීමේ සක්ෂ්‍යතාවයක් තිබ්බෙ නැහැ ඔවුන්ට?

ඇ: මේ ප්‍රමාණය සම්පූර්ණ ලැබුණ නම් මිලදී ගැනීමේ හැකියාවක් නැහැ.

ප්‍ර: ඒ නිසා මේ වගේ ලොකු ප්‍රමාණයක් සම්බන්ධයෙන් යම්කිසි කෙනෙක් උනන්දුවක් දක්වද්දී ඒ සම්බන්ධයෙන් අළෙවි අංශය විදියට ඔබතුමා උනන්දුවක් දැක්වීම සාමාන්‍යයි.

FAIR COMMENT BY JEZEEM

උ: ඔව් අපිට ලැබිච්ච ප්‍රමාණය ලබාදීම අවශ්‍යයැයි. ඒ වගේම ආයතනයේ හැම වේලාවේම මගෙන් විමසනවා ඒ කාලය අධ්‍යක්ෂ මුදල් සහ සභාපතිවරයා අද කොහොමද බිස්නස් අද කොහොමද එහෙම දිගටම විමසීමක් කරනවා.

ප්‍ර: එතකොට දැන් මේ සම්බන්ධයෙන් සභාපතිතුමාට දැනුම් දුන්නාම සභාපතිතුමා ඔබතුමාට ලිඛිතව යම්කිසි දෙයක් ඉදිරිපත් කරන්න කිව්ව ද?

උ: මට පැහැදිලි නැහැ.

ප්‍ර: ඒ කියන්නේ මේ මේ ක්ලෝසස් ආයතනයේ මේ වගේ විශාල ප්‍රමාණයක් තඹ ඉල්ලලා තියෙනවා කිව්වාහම ඒ සම්බන්ධයෙන් යම්කිසි නිර්දේශයක් ඉදිරිපත් කරන්න කිව්ව ද ඔබතුමාට මොකක් හරි ගන්න ඕන ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන්?

උ: ඔව්. ඒ අවස්ථාවේ තමයි මම යෝජනා කළේ .

ප්‍ර: වාචිකව කිව්වා කියලා ඔබතුමා කිව්වානේද මෙතැන්ට ගිහිල්ලා බලන්න ඕන කියලා?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් සභාපතිතුමා යන්නේ නැහැනේ බලන්න?

උ: සභාපතිතුමා යන්නේ නැහැ.

ප්‍ර: එතකොට ඔබට කියන්න ඇතිනේ මේ සම්බන්ධයෙන් යම් බලන්න යන්න එක්කෝ තමන්ට යන්න කියන්න ඇති. නැත්නම් කමිටුවක් පත් කරගන්න කියන්න ඇති මොකද්ද කිව්වේ?

උ: ඔව් කමිටුවක් පත්කරගන්න කිව්වා. කමිටුවේ සංයුතියත් එතුමා වාචිකව ප්‍රකාශ කෙරුවා.

ප්‍ර: එතකොට ඒ අනුව ඔබ ලිඛිතව ලියවිල්ලක් යොමු කරා සභාපතිතුමාට මෙන්න මේ පුද්ගලයින් සුදුසුයි කියලා යෝජනා කරනවා කියලා?

උ: ඔව්. සභාපතිතුමාගේ සාකච්ඡාව අනුව සුදුසුයි කියලා නැත්නම් මට යෝජනා කරන්න බැහැ. ඒ අනුව සුදුසුයි කියලා ඒ අය නම් කරලා ඇරියා. අනුමැතියපතා.

ප්‍ර: එතකොට කවුද ඔය පත්වෙච්ච නම් කරලා යවපු සාමාජිකයින්?

උ: සභාපතිතුමා කිව්වා මොරටුව විශ්ව විද්‍යාලයෙන් එක් අයෙක් යෝජනා කරන්න කියලා. ඊට පස්සේ අපේ වාත්තු අංශයේ ඉංජිනේරුවරයා. ඒ එක්කම බුද්ධිනි රෞද්‍රිගු මහත්මිය කලින් ගිහිපු නිසා ඒ වගේම මාවත් පත් කරන්න කියලා.

ප්‍ර: ඒ කියන්නේ මේ කමිටුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්ගෙන්ම විතරක් නෙවෙයි නමුත් බාහිර නිලධාරීන් ඒ කියන්නේ මේ සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි ITI ආයතනය

FAIR COMMENT BY JEZEEM

වැනි බාහිර නිලධාරීන්ගෙනුත් සැදුම්ලත් කමිටුවක් තමා මේ නිර්මාණය කරගත්තේ.

උ: ඔව් කලින් නිර්දේශ කෙරුවේ ඒක විශ්ව විද්‍යාලයේ අයෙක්. ඒත් මං හිතන්නේ එතුමා කතා කරලා විශ්ව විද්‍යාලයෙන් ලබාගන්න බැරි නිසා මම ලිපියකින් දැනුම් දුන්නා ඒ අයගේ සංයුතිය. එතෙන් දී එතුමා කපලා මොරටුව විශ්ව විද්‍යාලය කියන එක කපලා . ITI කියනඑක එතුමාගේ අත්අකුරෙන්ම සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ITI ආයතනය මේ දේ කරන්න ඒ නියෝජිතයෙක් ලබාදෙන්න කැමතිවුණා?

උ: ඔව් ඊට පස්සේ අපි ඉල්ලීමක් කෙරුවා නියෝජිතයෙක් ලබාදෙන්න කියලා. ඒ නියෝජිතයා ITI එකෙන් ලබාදුන්නා.

ප්‍ර: ලිඛිතව ද ඒ ඉල්ලීම කළේ?

උ: ලිඛිතව සිද්ධ කෙරුවා.

ප්‍ර: එතකොට ඒ ඉල්ලීමට ප්‍රතිචාර ලැබුණෙත් ලිඛිතව ද?

උ: ප්‍රතිචාර ලැබුණේත් ලිඛිතව.

ප්‍ර: ඔබතුමා සතුව ඒ ලේඛන තියෙනව ද?

උ: මා සතුව තිබෙනවා. ලේඛන තිබෙනවා.

ප්‍ර: මොන ලිපියද ඔබතුමා අතේ පළවෙනියට තියෙන්නේ?

උ: මා ළඟ තිබෙනවා ඒ ඉල්ලීම කිරීමේ ලිපිය තිබෙනවා. ඊට පසුව ඒ ආයතනයෙන් පත් කරලා එවපු ලිපිය තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ පළවෙනි ලිපිය බලන්න මහත්මයා මොකද්ද දිනය කියලා?

උ: 2017/09/06 වැනිදා.

ප්‍ර: 2017/09/06 වැනි දින කවුරු විසින්ද මේ ලිපිය යොමු කරන්නේ?

උ: අධ්‍යක්ෂ අලෙවි විසින් .

ප්‍ර: අධ්‍යක්ෂ අලෙවි විසින් කා වෙතද මෙය යොමු කරන්නේ?

උ: ආචාර්ය ජී.ඒ.එස් . ප්‍රේමකුමාර මයා අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික තාක්ෂණ ආයතනය.

ප්‍ර: ඒ කියන්නේ ITI ආයතනය?

උ: ඔව්.

එම ලිපිය DPP 14 ලෙස ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා ගරු ස්වාමීනි.

ප්‍ර: එම ලිපියට පිළිතුරු ලිපියක් ලැබී තිබෙනවාද?

උ: පිළිතුරු ලිපියක් ලැබී තිබෙනවා.

ප්‍ර: කා විසින් කා හටද ඒ ලිපිය යොමු කර තිබෙන්නේ?

උ: ඒ.එස්. පන්නිල අධ්‍යක්ෂ ජනරාල් වැඩබලන, ITI ආයතනයෙන් අධ්‍යක්ෂ අලෙවි, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත.

Proof Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එම ලිපිය DPP 15 ලෙස ලකුනු කිරීමට අවසර අයැද සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ දිනය ආපසු කියන්න?

උ: 2017/09/07 ෆැක්ස් මගින් ලැබිලා තියෙන්නේ.

****

<u>නීතිඥ චලක විදානගේ මහතා.</u>

ප්‍ර: එතකොට ඒ ලිපිය බලන්න කාවද ඒ සඳහා මේ කමිටුවට පත් කරලා එවලා තියෙන්නේ කියලා?

උ: ඒ සඳහා කමිටුව නියෝජනය කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු, ඒ. සූරියආරච්චි මහතා නම් කර එවමි.

ප්‍ර: ආපහු කියන්න මහත්මයා කවුද?

උ: ඒ. සූරියආරච්චි මහතා නම්කර එවමි.

ප්‍ර: ඔහුගේ නිලතලය කුමක්ද?

උ: කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රධාන ඉංජිනේරු.

ප්‍ර: ඒ කියන්නේ මේ සම්බන්ධයෙන් හොඳට නිරීක්ෂණය කරලා යම්කිසි වැදගත්කමක් ඇති සහ වටිනාකමක් ඇති නිර්දේශයක් ඉදිරිපත් කිරීමට හැකි නිලධාරියෙක් තමා එවලා තියෙන්නේ.

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ නිලධාරීන් සියළු දෙනා එකතුවෙලා මේ ස්ථානය පරීක්ෂා කිරීමට ගියාද ක්ලෝසස් ආයතනය?

උ: ගියා.

ප්‍ර: ඒ කොහේටද ගියේ?

උ: අපි ගියේ නොම්බර 111 A/ 06 අවිස්සාවේල්ල පාර වැල්ලම්පිටිය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කවද්ද ගියේ?

උ: අපි ගියේ 2017/09/12 වැනිදා.

****

<u>නීතිඥ චලක විදානගේ මහතා.</u>

ප්‍ර: 2017/09/12 වැනි දින ගිහින් මොනවද ඔබතුමාලා නිරීක්ෂණය කළේ?

උ: මේ ගියපු කමිටුව නියෝජනය කරා ITI ආයතනය වගේම අපේ ආයතනයෙත් වාත්තු අංශයේ ඉංජිනේරුවරුන් දෙදෙනාම.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොකද මේ පිළිබඳව අපිට ඒ තරම් දැනුමක් නැහැ. මේ වගේ කර්මාන්තයක් නිරීක්ෂණය කරන්න. එතකොට ඒ අයත් එක්ක අපිත් ගියා. ගිහිල්ලා නිරීක්ෂණය කරා කෝව. තඹ සහ පිත්තල උණු කරන කෝව. ඒ එක්කම මේකේ තඹ ඒ දවස්වල උණු කරනවා. තඹ උණු කරලා කෝවෙන් උණු කරලා ඊයි පස්සේ තව මැෂින් එකකින් ඒක මට කියන්න දන්නේ නැහැ මොකද්ද කියලා ඒකෙන් අදිනවා කම්බිය. උණු වෙන තඹ කම්බි අදිනවා එකකින් එක මැෂින් එකකින්. ඒකෙන් තමයි කම්බි නිර්මාණය වුණේ. ඒවා තමයි නිරීක්ෂණය කෙරුවේ. ඊට පස්සේ ගබඩාව ඒවා නිරීක්ෂණය කෙරුවා.

ප්‍ර: එතකොට මේ නිරීක්ෂණය කිරීමේ දී ඔබතුමාලට මේ කමිටුවේ අය දැන් එතැනදී කතා වෙන්න ඇතිනේ . මේ සම්බන්ධයෙන්?

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ ආයතනයට මේ වගේ පරිමාණයක දේවල් මිලදී ගන්න සහ ඔවුන් යම්කිසි නිෂ්පාදනයක් කිරීමේ හැකියාවක් තියෙනවා කියන මතය දැරුවද, නැත්නම් එහෙම නැත්නම් මේගොල්ලෝන්ට මේක කර ගන්න බැහැ කියන මතය ද දැරුවේ කොහොමද?

උ: තඹ නිෂ්පාදනය ඒ වන කොටත් සිදු කරමින් පැවතුණා. එතකොට පිත්තල නිෂ්පාදනය ඒ වේලාවේ කරන්න අවශ්‍යය යන්ත්‍ර සූත්‍ර තිබුණේ නැහැ. ඒවා ගොඩනගමින් තිබුණේ. මුල් අවස්ථාවේ යන කොට.

ප්‍ර: එතකොට මේ නිර්දේශ ඇතුළත් කරමින් යම්කිසි වාර්තාවක් ඔබතුමා විසින් පිළියෙළ කලාද?

උ: ඔව්. කමිටුව විසින් පිළියෙළ කරා.

ප්‍ර: එතකොට ඔබතුමා විසින් නෙවෙයි කමිටුවේ සියළු දෙනා එකතුවෙලා?

උ: සියළු දෙනා එකතුවෙලා.

ප්‍ර: එතකොට ඒ වාර්තාව කා වෙතද යොමු කළේ?

උ: යොමු කරා සභාපතිතුමා වෙත.

ප්‍ර: එතකොට සභාපතිතුමා වෙත මේක යොමු කරද්දී ඒ සියළුදෙනාම මේ වාර්තාවට අත්සන් කරාද?

උ: සියළුදෙනාම අත්සන් කරා.

ප්‍ර: මොනවද ඒ වාර්තාවේ සඳහන් කළේ?

උ: ඒ වාර්තාවේ සඳහන් කළා කර්මාන්තකරුගේ නම , ආයතනයේ නම, ලිපිනය, පරීක්ෂා කළ දිනය, ඉඩමේ ප්‍රමාණය, පවතින යන්ත්‍ර සූත්‍ර සහ ඒවයි ධාරිතාවය බලශක්තිය කුමක්ද, සේවක සංඛ්‍යාව කීයද, ගොඩනැගිල්ලේ නිෂ්පාදන කොටසේ වර්ගඵලය

FAIR COMMENT BY JEZEEM

කොහොමද, අමුද්‍රව්‍යය ගබඩාවේ වර්ගඵලය, දැනට නිෂ්පාදන භාණ්ඩ වර්ග. සාම්පල් ලබාගත්තා. ඊට පස්සේ මාසික නිෂ්පාදන ධාරිතාවය, ඊට පස්සේ යෝජිත නිෂ්පාදනය. ඒකට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර. ඒකේ ඉදිකරමින් පවති කියලා තියෙනවා. යෝජිත නිෂ්පාදන භාණ්ඩ. ඊට පස්සේ මං මේක කියවන්න ද.

ගරු ස්වාමීනි මේ අවස්ථාවේ දී මා හට දැන ගැනීමට හැකියාව තියෙනව නම් මේ මෙතුමා මේ බලන ලියවිල්ල මේ වන විට සලකුණු කොට තිබෙනව ද යන වග.

ප්‍ර: මහත්මයා බලන්න මේ තියෙන ඔය දැන් කියන වාර්තාව පිත්තල සහ තඹ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ස්ථානය පරීක්ෂණ කරන වාර්තාව ද කියලා?

උ: පිත්තල හා තඹ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ස්ථානය පරීක්ෂණ වාර්තාව.

ඒ වාර්තාව DPP 16 ලෙස සලකුණු කිරීමට අවසර අයැද සිටිනවා ගරු ස්වාමිනි.

ප්‍ර: දැන් මහත්මයා කිව්වනේ ඒ වාර්තාවට අනුව ඔබ විසින් නිරීක්ෂණය කර දේවල්?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ නිරීක්ෂණ මඟින් යම්කිසි නිගමනයකට එළඹෙන්න ඇතිනේ?

උ: ඔව් නිගමනයකට එළඹුණා.

ප්‍ර: අන්න ඒ නිගමනය කියවන්න බලන්න?

උ: සම්පූර්ණ කියවන්නම් මං. (සාක්ෂිකරු නිගමනය කියවයි)

ප්‍ර: එතකොට මේ ඔබතුමා නෙවෙයි මේක කියන්නේ මේ කමිටුවේ හිටපු සියළු දෙනා ඒකමතිකව තීරණය කරලා අත්සන් කරලා තියෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව ඒ කියන්නේ දැන් මහත්මයා මට කියන්න මේ වෙලාවේ දී මේ නිර්දේශ වලින් ඔබතුමා ඇතුළු ඒ කමිටුව නිගමනය කළේ මේ ආයතනයට යම්කිසි නිෂ්පාදනයක් කිරීමේ හැකියාව තිබෙනවා සහ ඔවුන්ට මේ අමුද්‍රව්‍යය මිලදී ගෙන ඔබතුමා සේවය කරන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ න්‍යායයන්ට අනුව එහි තිබෙන කාර්යන් ඉෂ්ට කිරීමට හැකියාව තිබෙන බව. ඒ අනුව තමයි ඔබතුමා මේ සම්බන්ධයෙන් සභාපතිතුමාව දැනුවත් කරන්නේ?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ දැනුවත් කිරීම උඩ තමයි සභාපතිතුමා මේ තීරණයට එළඹෙන්නේ. මේ සමාගමත් සමඟ ඉදිරියේ දී කටයුතු කළ යුතු බවට?

උ: ඔව් එහෙම තමයි.

ප්‍ර: ඒ කියන්නේ මේක මේ එකපාරට බලලා ගත්ත තීරණයක් නෙවෙයි. හොඳින් කමිටුවක් විසින් ගිහිල්ලා තීරණය කරලා නිගමනය කරලා නිරීක්ෂණය කරලා ගත්ත නිර්දේශ මේ. ඒ අනුව තමයි මේ ඔවුන්ට මේ භාණ්ඩ සැපයීම පටන් ගන්නේ?

උ: සුදුසු කමිටුවක් ඇත්තටම ඒ පිළිබඳව දැනුම තියෙන අය අපිට වැඩිය කර්මාන්තය පිළිබඳ දැනුම තිබෙන නිලධාරීන් ගිහිල්ලා බැලුවේ.

ප්‍ර: එතකොට මහත්මයා දැන් මේ උගත් කොමිෂමේ දී ඔබතුමාගෙන් ප්‍රශ්න කරනු ලැබුවා වට්ටම් සම්බන්ධයෙන් ?

උ: ඔව්.

ප්‍ර: දැන් මේ කියන ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාගත්ත අමුද්‍රව්‍යය විශේෂයෙන්ම මේ පිත්තල 2017 වර්ෂයේ දී වෙළඳපොල වටිනාකම කීයක් කියලද ඉස්සෙල්ලම නිර්ණය කළේ?

උ: වෙළඳපොළ වටිනාකම 450- 500 අතර.

ප්‍ර: ඒ කියන්නේ අර කලින් කියපු ක්‍රමවේදයට අනුව 475 තමයි මධ්‍යය අගය වෙන්නේ?

උ: ඔව් මධ්‍යය අගය.

ප්‍ර: එතකොට 475 ඉඳලා පිටුපස්සට තමයි ගණන් හදාගෙන එන්නේ?

උ: ඒ විදියට තමයි ගණන් හදාගෙන තියෙන්නේ.

ප්‍ර: එතකොට 475 ඉඳලා මේ ක්ලෝසස් කියන සමාගම මධ්‍ය පරිමාණ කර්මාන්තයක් කියලා නිර්ණය කරාම ඔවුන්ට හිමිවෙන්නේ 15% ක වට්ටමක්?

උ: ඔව් 15% ක වට්ටමක්.

ප්‍ර: දැන් කලින් සඳහන් කරානේ එක් අවස්ථාවකදී ඔබතුමාගෙන් ප්‍රශ්න කරනු ලැබුවා මාර්ගෝපදේශනයට අනුව එය කුඩා කර්මාන්තයක් ලෙසද සැලකිය හැකි බව?

උ: ඔව් අපි අයඳුම්පත්‍රය විශ්ලේෂණය කෙරුවාහම කුඩා කර්මාන්තයක් විදියට අර්ථ කථනය කරන්න පුළුවන්.

ප්‍ර: එතකොට බැරි වෙලා හරි මේක කුඩා කර්මාන්තයක් විදියට අර්ථ කථනය කරානම් ඔවුන්ට හිමිවෙන වට්ටම් ප්‍රමාණය කියද?

උ: ඔවුන්ට 25% ක්.

ප්‍ර: ඒ කියන්නේ දැන් ඔබ ලබාදුන්න වට්ටම් ප්‍රමාණයට වැඩිය වැඩි වට්ටමක් හිමිවෙනවා?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඔබට අවශ්‍යතාවය තිබුණ නම් මේ සමාගමට වැඩි වට්ටමක් ලබාදීලා අඩුවට විකුණන්න කුඩා කර්මාන්තයක් ලෙස සලකලා කරන්න තිබ්බා?

උ: ඔව්.

ප්‍ර: නමුත් ලාභ ඉපයීමේ සහ මෙහි මේ වගේ විශාල පරිමාවකින් ඔවුන් කරන නිසා මධ්‍ය පරිමාණයෙන් සලකලා ඒ ආශ්‍රයෙන් ලාභයක් ලබා ගැනීමට ඔබට හැකියාව ලැබුණා?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔය 475 න් 15% වට්ටම දාලා කීය ගාණෙද කිලෝග්‍රෑම් එකක් විකුණුවේ?

උ: සම්පූර්ණ මුදල 406 ශත 50 ක් මුලින් තීරණ කෙරුවා. පසුව එය 407 දක්වා වැඩි කෙරුවා.

ප්‍ර: එතකොට ඔය 406 කියන්නේ NTB බද්දත් සමඟ?

උ: සමඟ ඔව්.

ප්‍ර: එතකොට NTB කරානම් කීයක් විතර එයිද?

උ: NTB අඩු කෙරුවාහම 399 යි ශත ගණනක්.

ප්‍ර: ඒක තමයි අර ඉන්වොයිස් පත්‍රයේ තියෙන අගය?

උ: ඔව් ඔව්.

ප්‍ර: ඒ කියන්නේ මේ කරපු කිසිම ගනුදෙනුවකින් කිසිම අවස්ථාවක ක්ලෝසස් සමාගම සමඟ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ලාභයක් මිස පාඩුවක් උද්ගත වෙලා නැහැ?

උ: නැහැ එහෙම උද්ගත වෙලා නැහැ.

ප්‍ර: එතකොට අවසාන වශයෙන් මං ඔබතුමාගෙන් අහන්නේ දැන් ක්ලෝසස් සමාගමට වැඩි වැඩියෙන් මේ දේවල් මේ අමුද්‍රව්‍යය ලබාදුන්න අනිත් අයට සාපේක්ෂව කියලා ප්‍රශ්න කරානේ ඔබතුමාගෙන්?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ ප්‍රශ්න කිරීම දැන් අපි ගත්තොත් එහෙම සුළු පරිමාණ සහ කුඩා පරිමාණ අනිකුත් ලියාපදිංචි වී සිටින ගැණුම්කරුවන් එහෙම නැත්නම් කාර්මිකයින් කර්මාන්තකරුවන් ඔවුන් සාමාන්‍යයෙන් කොපමණ ප්‍රමාණයක ශ්‍යකතාවයක් ද ඔවුන්ට තිබෙන්නේ , ධාරිතාවයක් ද ඔවුන්ට තිබෙන්නේ මිලදී ගැනීමේ දී?

උ: නිර්දේශ කරලා තියෙනවා ප්‍රමාණයම ලබාගැනීමේ ධාරිතාවයක් නැහැ. හුඟක් වෙලාවට ටොන් 1, ටොන් 2 සමහර සීමිත ප්‍රමාණයක් ටොන් 3 විතර අරන් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ දැන් මේ ටොන් 15 ක් විතර බලද්දී මේ ටොන් 1ක් 2ක් තමයි ඔවුන්ට මිලදී ගැනීමේ හැකියාව කොහොමත් තිබෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

ඌ: ඒ වැඩිම අය. අඩුම අය කිලෝ 300 , කිලෝ 500.

ප්‍ර: එතකොට මේ ඉතාම සුළු ප්‍රමාණ වලින් මිලදී ගන්න අයට ඒ දේවල් ලබාදීමට ක්ලෝසස් සමාගමට තියෙන ධාරිතාවත් එක්ක ඔවුන් ලබාගන්න ප්‍රමාණය ඔවුන්ට ලබාදීම සමඟ කිසිම ප්‍රශ්නයක් නැහැ අනිත් අයට මේක ලබාගන්න?

ඌ: ඔව් ඒ ගොල්ලොන්ගේ ධාරිතාව අනුව ප්‍රශ්නයක් නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඒ ගොල්ලොන්ට ග්ලෝසොස් සමාගමට ඔබ මණ්ඩලය විසින් විශාල ප්‍රමාණයක් විකිණීම මත කිසිදු ආකාරයක අසාධාරණයක් සිද්ධ වෙන්නේ නැහැ?

ඌ: ඔව් ඒ අවස්ථාවේදී සිද්ධ වෙන්නේ නැහැ.

ප්‍ර: එතකොට දැන් මේ තව වට ගාණක් විකුණන්න කියලා මේක බලන් හිටිය නම් ඔබට ඔබේ ඒ වර්ෂ වල ලබාගන්න පුළුවන් එහෙම නැතිනම් ඉක්මනින් විකුණන්න පුළුවන් දේවල් ලබාගන්න බැහැ?

ඌ: ඔව් ඒ මගෙන් බලාපොරොත්තු වෙච්ච ඒ කියන්නේ ආයතනයෙන් බලාපොරොත්තු වෙච්ච ආදායම ලබාගැනීමේ හැකියාවක් නැහැ.

ප්‍ර: ඒ වගේම මේකේ වෙළඳපොළ අගය ඉහළ යන්නත් පුළුවන් පහළ යන්නත් පුළුවන්. ඒ අනුව වෙළඳපොල වටිනාකම අඩුවීමක් සිදුවුණොත් පාඩුවක් සිදුවිය හැකිද?

ඌ: වෙළඳපොළ වටිනාකම අඩු වුණොත් පාඩුවක් සිද්ධ වෙන්න පුළුවන්.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතාගේ ප්‍රශ්න වලට පිළිතුරු ලබාදෙමින් ප්‍රකාශ කරා 2015 වර්ෂයේ දී එකට අධ්‍යක්ෂක අලෙවිවිදියට සේවය කරපු මේ නන්දනී කියන නිලධාරිනිය විශ්‍රාම ගියයි කියලා?

ඌ: ඔව්.

ප්‍ර: ඒ විශ්‍රාම ගියාට පස්සේ අධ්‍යක්ෂක අලෙවි තනතුරේ පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවනු ලැබුවයි කියලා?

ඌ: ඔව්.

ප්‍ර: ඔබ කිව්වා ඔබත් ඒකට අයදුම් කරයි කියලා?

ඌ: ඔව්.

ප්‍ර: නමුත් ඔබව ඒකට තෝරාගත්තේ නැහැ?

Proof Not Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: මගේ අවුරුදු 03 ක විතර Experience එක මදී කියලා මාව Interview කෙරුවේ නැහැ. Interview එකටත් කැඳෙව්වෙත් නැහැ.

ප්‍ර: එකතමා ඔබ ඒ තනතුර දරන්න අවශ්‍ය සුදුසුකම් සපුරා නොසිටීම මත ඔබව ඒ තනතුරට බදවාගත්තේ නැහැ?

උ: ඔව්.

ප්‍ර: ඉන් අනතුරුව එකී තනතුරට සරත් උදයසිරි මහත්මයව බඳවා ගැනීම සිදුකරනු ලැබුවා?

උ: ඔව් සිදුකරනු ලැබුවා.

ප්‍ර: දැන් සරත් උදයසිරි මහතා තමන්ගේ පත්වීම ගත්තා 2015/07 වැනි මාසේ 10 වැනිදා ඉඳලා අද දක්වා නොකඩවා අධ්‍යක්ෂක අලෙවි තනතුරේ සේවය කරලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

උ: ඔව් සේවය කරනවා. පිළිගන්නවා.

ප්‍ර: දැන් කිසිම අවස්ථාවක එම නිලධාරියාගේ සේවය කඩවීමක් හෝ අත්හිටුවීමක් හෝ සිදුවෙලා තිබෙනව ද?

උ: අත්හිටුවීමක් සිදුවෙලා නැහැ.

ප්‍ර: සේවය කඩවීමක් සිදුකරලා තිබෙනව ද?

උ: ඒ පිළිබඳ මට දැනීමක් නැහැ.

ප්‍ර: දැන් මහත්මයාත් ඒ ස්ථානයේමනේ රාජකාරී කරේ අවුරුදු 05 පුරාම. ඒකයි මහත්මයගෙන් අහන්නේ ඉතින් එහෙම වුණානම් මහත්මයා දැනගන්න එපැයි?

උ: අංශයේ ඒ වැඩකටයුතු අඩාලවීමක් සිද්ධ වෙලා තියෙනවා.

ප්‍ර: ඒක තීරණය කරන්න ඔබට හැකියාවක් තියෙනව ද?

උ: මට තීරණය කරන්න හැකියාවක් නැහැ. ඒත් මගේ තියෙන පළපුරුද්ද මත අපි කරපු වැඩ ටික ටික අඩුවෙලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබගෙන් ඇහුවේ සේවය අඩාලවීමක් වුණා ද නැද්ද කියන එක නෙවෙයි. උදය කුමාර මහතා 2015 ඉඳලා දැන් වෙනකම් ඒ කාර්මික සංවර්ධන මණ්ඩලයේ එම තනතුර දරනවද නැද්ද කියලා?

උ: ඔව් ඒක දරනවා කියලා මං කිව්වා ස්වාමීනි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් එම නිලධාරියගේ සේවය ඒ තනතුරෙන් ඉවත් කරන්න හරි එහෙම නැත්නම් වෙනත් අංශයකට යොමු කරන්න හරි මොනයම් අවස්ථාවක දී හරි ඉහළ නිලධාරීන් පියවර අරගෙන තියෙනවද?

උ: එසේ පියවර අරන් නැහැ. මං දන්නා තරමින්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඒ නිලධාරියා පත්කරපු දැන් මහත්මයා දැනගන්න එපැයි මහත්මයත් එතැනනේ අවුරුදු 05 ක්ම සේවය කලේ. ඒ කාලවකවානුව පුරාවටම සම්පූර්ණයෙන්ම.

උ: ඒ ප්‍රශ්නය,

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා හරස් ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් මේ සරත් උදයසිරි කියන මහත්මයට උපාධියක් නැහැයි කියලා යම්කිසි තොරතුරක් ඔබට ලැබුණයි කියලා. ඔබ එහෙම කතා බවක් ඇති වුණයි කියලා?

උ: ඔව්.

ප්‍ර: මොන පදනමක් මතද මහත්මයා එහෙම කියන්නේ?

උ: ඒ සම්මුඛ පරීක්ෂණය කරන අවස්ථාවේ දී මූලික උපාධියක් නැහැයි කියන තත්ත්වය තමයි ප්‍රකාශ කරලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඒ සම්මුඛ පරීක්ෂණය කියලා කියන්නේ බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය ?

උ: බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය.

ප්‍ර: බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වලා ඒ නිලධාරියා අවුරුදු 05 ක් සේවය කරලා මේ වන විටත් අඛණ්ඩව මෙහි සේවය කරනවනේ?

උ: සේවය කරනවා.

ප්‍ර: දැන් බඳවා ගැනීමේ දී එහෙම ප්‍රශ්නයක් ඇති වුණානම් මේ වන විට ඒ මහත්මයට තනතුරෙන් ඉවත් කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් ගැනීමක් සිද්ධ කරලා තියෙන්න එපැයි. එහෙම වෙලා තියෙනව ද?

උ: එසේ කරපු බවක් අපිට දැනිලා නැහැ.

මේ අවස්ථාවේ දී දැනටමත් C 769 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී. එය සරත් උදයසිරි නිලධාරියා අලෙවි අධ්‍යක්ෂක තනතුරට පත්කිරීමේ පත් ලිපිය වශයෙන් සැලකර සිටිනවා. එහි අංක 16 කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා.

ප්‍ර: දැන් මේ අංක 16 යටතේ මේ පත්වීමේ ලිපියේ තිබෙනව නේද මේ තනතුර ලබාගැනීම සඳහා සුදුසුකම් හෝ පළපුරුදු හෝ පිළිබඳව අසත්‍යය කරුණක් ඉදිරිපත් කර ඇති බව හෝ ඉදිරිපත් කළ යුතු කිසියම් විස්තරයක් ඕනෑකමින් වසන් කර ඇති බව හෝ අධ්‍යක්ෂක මණ්ඩලයට කවර අවස්ථාවක දී හෝ වැටහී ගියහොත් ඔබ වහාම සේවයෙන් පහ කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය තිබෙයි කියලා?

උ: එහෙම සඳහන් කරලා තිබෙනවා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එය මහත්මයා කියන විදියට උපාධියක් නැතුව හෝ අවශ්‍ය සුදුසුකම් එම නිලධාරීයාට නොතිබුණා නම් මේ අවුරුදු 05ක කාලය තුළ මේ වන විට ඔහුව සේවයෙන් පහ කරන්න හෝ ඔහුට විනය ක්‍රියාමාර්ගයක් ගන්න ඕනතරම් අවශ්‍ය හැකියාව කාලය තිබුණ නේද?

උ: ඔව් මණ්ඩලයට ඒ හැකියාව කාලය තියෙනවා.

ප්‍ර: දැන් මේ අංක 16 ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය ඒ අනුව ක්‍රියා කරලා තියෙනව ද?

උ: මේ වන තෙක් එසේ ක්‍රියාකරලා නැහැ.

ප්‍ර: ඒ අනුව මං මහත්මයට කියා සිටිනවා ඔබ මේ නොදන්න කාරණයක් සම්බන්ධයෙන් මේ ගරු කොමිෂන් සභාවේ අසත්‍යයක් ප්‍රකාශ කරලා තියෙන්නේ කියලා?

උ: උත්තරයක් නැත.

ප්‍ර: දැන් ඒ සරත් උදයසිරි කියන මහත්මයාගේ සම්පූර්ණ නම පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි කියලා මං කිව්වොත් මහත්මයා පිළිගන්නවාද?

උ: ඔව් පිළිගන්නවා.

ප්‍ර: දැන් ඔබ දන්නවාද පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි කියන නිලධාරීයට ලන්ඩන් මෙක්ට්‍රෝපොලිකොලිටන් විශ්ව විද්‍යාලයේ Bachelor of Arts with upper 2nd class Honours Degreeඋපාධියක් තිබෙනවයි කියලා. නැවතත් කිව්වොතින් ලන්ඩන් මෙක්ට්‍රෝපොලිකොලිටන් විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියක් දෙවන පන්තියේ ගෞරව සාමාර්ථ සහිතව තියෙනවා?

උ: මා ඒ ගැන දැනුවත් වී නැහැ.

ප්‍ර: සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටී. දැන් මේ ලේඛනය අනුව ඔබ පිළිගන්නවාද?

උ: මේ ලේඛනය අනුව පිළිගන්නවා.

2017 ජූලි 17 වන දින එකී විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද උපාධි සහතිකයේ පිටපතක් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. DPP 17 ලෙස.

එසේම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි යන අයට 2017 දෙසැම්බර් 29 වන දින ඉදිරිපත් කරන ලද ලිපියක් මේ අවස්ථාවේ දී සාක්ෂිකරුට පෙන්වා සිටිනවා. එම ලිපියෙහි අඩංගු වී තිබෙන්නේ එම පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි යන අය උපාධිය ලබාගන්නා ලද ලන්ඩන් මෙක්ට්‍රෝපොලිකොලිටන් **විශ්ව විද්‍යාලය මහ බ්‍රිතාන්‍යයේ පොදු රාජ්‍යය මණ්ඩලයේ පිළිගන්නා**

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ලද විශ්ව විද්‍යාලයක් වශයෙන් එම ලිපිය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.

ප්‍ර: ඒ මා කලින් සඳහන් කර විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉදිරිපත් කළ ලිපියක් වශයෙන් ඔබ හඳුනාගන්නවා ද?

උ: හඳුනගන්නවා.

මෙම ලිපිය DPP 18 වශයෙන් ලකුණු කර සිටිනවා.

සාක්ෂිකරුට වයඹ විශ්ව විද්‍යාලයෙන් පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි යන අයට 2012 ඔක්තෝම්බර් 22 වන දින පවත්වන ලද උපාධි ප්‍රදාන උත්සවයේ දී Master of Business Administration ව්‍යාපාර පරිපාලනය සම්බන්ධයෙන් ශාස්ත්‍රපති උපාධි සම්බන්ධයෙන් නිකුත් කර ඇති සහතික ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර: එම ලේඛනය අනුව සරත් උදයසිරි යන අයට ශාස්ත්‍රපති උපාධියක් ප්‍රදානය කර ඇති බවට ඔය ලේඛනයේ සඳහන් වෙලා තිබෙනව ද?

උ: මේ ලේඛනයේ සඳහන් වෙලා තියෙනවා. ඒක අපි කලින් දැනුවත් වීමකුත් තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ සාක්ෂි දෙන විට දැනුවත් වෙලා තිබ්බ ද ඔය ප්‍රදානය ගැන?

උ: නැහැ මේක ස්වාමීනි මේ මාස්ටර් එකක් තියෙනවා කියලා දැනගෙන තිබුණා. මම ප්‍රකාශ කෙරුවේ මූලික සුදුසුකම නැති බව තමයි සම්මුඛ පරීක්ෂණය කරන අවස්ථාවේදී. ඒ පිළිබඳවයි මා ප්‍රකාශ කෙරුවේ. සම්මුඛ පරීක්ෂණය කරන වේලාවේ දී මූලික

ප්‍ර: සම්මුඛ පරීක්ෂණය කෙරුවේ කවදද?

උ: 2015 එතුමා මණ්ඩලයට බැඳුණේ.

ප්‍ර: එතකොට ඔය උපාධිය ලබලා තියෙන්නේ කවද්ද?

උ: මේ තියෙන්නේ මූලික උපාධිය නෙවෙයි. මාස්ටර් එකක්.

ප්‍ර: මාස්ටර් එකක් තියෙන කොට Degree එකක් ඕනද?

උ: Degree යක් අවශ්‍යයි ස්වාමීනි.

ප්‍ර: අවශ්‍ය ද?

උ: අවශ්‍යයි. මූලික සුදුසුකම බඳවා ගැනීමට මූලික උපාධිය. එය අපිටත් තියෙනවා. ඒ කියන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයට ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකරුවෝ බඳවා ගන්න කොටත් මූලික උපාධිය අතවශ්‍යයි.

ප්‍ර: ඔබට තිබ්බේ මොකද්ද 2015 ?

Proofread Copy
FAIR COMMENT BY JEZEEM

ඌ: මට වාණිජවේදී විශේෂ උපාධියක් තියෙනවා.

ප්‍ර: 2015 වන කොට?

ඌ: 2015 නෙවේ. මම 1992 වාණිජවේදී උපාධිය, 2004 ශාස්ත්‍රපති උපාධිය.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

මෙම ලේඛනය උතුමාණනි **DPP 19 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

සාක්ෂිකරුට The Chartered Institute of Marketing CIM ආයතනයෙන් එහි සාමාජිකත්වය ලැබීම සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 29 වන දින පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි අයට නිකුත් කර ඇති සහතිකයක් පෙන්වා සිටී.

ප්‍ර: පන්නල ලේකම්ලාගේ සරත් උදයසිරි කියන නිලධාරියා CIM **The Chartered Institute of Marketing** ආයතනයේ සාමාජිකත්ව ලද තිබෙන පුද්ගලයෙක් කියන එක මේ ලේඛනය අනුව පිළිගන්නවාද?

ඌ: පිළිගන්නවා.

මෙම ලේඛනය DPP 20 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මම ඔබට යෝජනා කරනවා එකී නිලධාරියා වැටුප් වර්ධක නියමිත ආකාරයට ලබාගෙන මේ දක්වා ඒ තනතුරේ නොකඩවා සේවය කරනු ලබනවයි කියලා?

ඌ: වැටුප් වර්ධක ලබාගත්ත ද නැද්ද කියලා මට ප්‍රකාශ කිරීමට අපහසුයි. ඒත් මේ දක්වා දිගින් දිගටම සේවය කරනවා.

ප්‍ර: දැන් එහෙම නම් ඔබ හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලබාදෙමින් මේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා කිව්වේ අසත්‍යයක් ද?

ඌ: එය මණ්ඩලයේ තිබෙන ආරංචියක් විතරයි මට. අසත්‍යක්ද සත්‍යක්ද

ප්‍ර: ඒ කියන්නේ මහත්මයා නොදන්න කාරණයක් සම්බන්ධයෙන් තමයි ඔබ හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීලා කිව්වේ?

ඌ: නොදන්නා කාරණයක් ඒ සත්‍යයතාවය මට තහවුරු කරන්න බැරි නිසා මං ඒක පිලිගන්නවා.

ප්‍ර: දැන් ඔබ නීතිඥ මහත්මවරුන්ගේ ප්‍රශ්න වලට උත්තර ලබාදෙන කොට කිව්වා විශේෂයෙන්ම ඔබ ජනාධිපති නීතිඥ මහතාගේ ප්‍රශ්නයක පිළිතුරක් වශයෙන් කිව්වා 2015 සිට 2019 දක්වා අබලි

FAIR COMMENT BY JEZEEM

ලෝහ කළමණාකරණ ඒකකයෙන් ලැබිච්ච ආදායම සම්බන්ධයෙන් ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබ භාරයේ තිබෙනව ද 2015 ඉදලා 2019 දක්වා අබලි ලෝහ කළමණාකරන ඒ ව්‍යාපෘතියෙන් උපයාගත්ත කාර්මික සංවර්ධන මණ්ඩලය ලාභ ලබාගත්ත ආකාරය සම්බන්ධයෙන් වෙනම වාර්තාවක්?

උ: වාර්තාවක් මේ අවස්ථාවේ නැහැ.

ප්‍ර: එතකොට මේ අවස්ථාවේ වාර්තාවක් නැතුවද ඔබ සාක්ෂි ලබාදුන්නේ මේ මේ අවුරුදු වල මේ මේ ප්‍රමාණ වලින් ලාභ ලැබිල තියෙනවයි කියලා?

උ: මගේ මතකයෙන් මා කිව්වේ. ලාභ ලැබීම පිළිබඳ නෙවෙයි. මම කිව්වේ අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතියේ ආදායම ගැන පිරිවැය නෙවෙයි ආදායම ගැන. පිරිවැටුම කියන්න පුළුවන් අපිට.

ප්‍ර: දැන් ඔබ ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන් කිව්ව නේද මේ විශාල ආදායම ලබා ගැනීමෙනුත් වැඩිවීමක් සිද්ධ වුණයි කියලා?

උ: ආදායම ලබාගැනීම.

ප්‍ර: කාර්මික සංවර්ධන මණ්ඩලයේ විශාල ලාභ ලැබුවයි කියලා?

උ: ලාභ ප්‍රමාණයත් වැඩිවෙනවා.

ප්‍ර: 2017 වර්ෂයෙන් පස්සේ?

උ: ලාභ ප්‍රමාණයත් වැඩිවෙනවා පිරිවැටුම් වැඩිවෙනකොට.

ප්‍ර: දැන් ඔබ ඒක කිසියම් ලේඛනයක් බලන්නේ නැතුව තමයි මේ අවස්ථාවේ දී සාක්ෂි ලබා දුන්නේ?

උ: ලේඛනයක් බලන්නේ නැතුව.

ප්‍ර: දැන් මේ අවස්ථාවේදීවත් ඔබට මේ ගරු කොමිෂන් සභාවට එවැනි ලේඛනයක් ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ?

උ: මේ අවස්ථාවේදීවත් නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් එසේම ඔබ සඳහන් කරා 2017 මැයි මාසයේ දී විශාල තඹ ප්‍රමාණයක් රාජ්‍ය ආරක්ෂක අංශයෙන් විශාල පිත්තල කොපු ලබාගැනීම මත කාර්මික සංවර්ධන මණ්ඩලයට විශාල ලාභයක් ලබාගන්න හැකියාවක් ලැබුණයි කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ කාරණය හරිද?

උ: විශාල ලාභයක් ලැබුණා.

ප්‍ර: දැන් ඔබ ඒ එක්කම සටහන් කරා ඊට අමතරව වෙන අබලි ලෝහ ලබාගැනීම් සහ විකිණීම් සලකා බැලුවහාමත් ලාභයක් ලැබිලා තියෙනවා කියලා 2017 වර්ෂයෙන් පස්සේ?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කොයි අවස්ථාවක හරි මේ සම්බන්ධයෙන් ගණනය කරලා වාර්තාවක් සකස් කරලා තිබෙනවා ද?

උ: ගණනය කිරීම් කරලත් තියෙනවා. ඒත් මේ අවස්ථාවේ දී මගේ ළඟ ඒ වාර්තාව නැහැ.

ප්‍ර: මං ඔබෙන් අහන්නේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාදුන්නු පිත්තල ප්‍රමාණය හැරුණු කොට අනිකුත් ආයතන වලින් ලබාගත්ත අබලි ලෝහ ප්‍රමාණය ලබා ගැනීමෙන් සහ විකිණීමෙන් ඒ ලැබුණු ලාභයන් සම්බන්ධයෙන් සංසන්දනාත්මකව වාර්තාවක් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයෙන් හෝ ඔබ භාරව සිටියදී අබලි ලෝහ කළමණාකරන ඒකකයෙන් වාර්තා සකස් කරලා තියෙනව ද?

උ: ඒත් වෙන වෙනම වාර්තා සකස් කර නැහැ.

ප්‍ර: එහෙම නම් ඔබ ඒ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාදුන්නු පිත්තල කොපු හැරුණු කොට වෙනත් ලාභ ලබලා තියෙනවයි කියලා යන කාරණය සම්බන්ධයෙනුත් මෙම අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවේ සාක්ෂි ලබා දුන්නේ කරුණු හරි හැටි නොදැන අසත්‍ය තොරතුරුයි කියලා මා ඔබට යෝජනා කරනවා?

උ: කරුණු හරිහැටි නොදැන නෙවෙයි මගේ සනාථ කරන්න සාක්ෂි නැහැ. එහෙත් ඒ සාක්ෂියේ මං කියන ප්‍රමාණය ලබාගැනීමේ හැකියාව තියෙනවා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන්. මා දිගටම වැඩකරන ඒ කියන්නේ ක්‍රියාකරපු කාලය තුළ ලැබුණු ආදායම වෙලාවෙම ගණනය කිරීම් සහ මණ්ඩලයේ director broad එකට ඒ කියන්නේ අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරනවා හැම මාසේම. ඒවත් සලකා බලලා තමයි මං කිව්වේ. මගේ මතකයෙන් මං කිව්වේ.

ප්‍ර: ඔබේ මතකය නිවැරදි වෙන්නත් පුළුවන් වරදින්නත් පුළුවන්?

උ: එසේ විය හැකියි. මා සිතනවා මං නිවැරදි කියලා.

ප්‍ර: දැන් ඔබ ජනාධිපති නීතිඥ මහතාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් කිව්වා 2013 මාර්ගෝපදේශක සංග්‍රහයේ මහා පරිමාණ කර්මාන්තකරු කියන එක නිර්වචනය කරලා නැහැ කියලා?

උ: එහෙම නිර්වචනයක් නැහැ.

ප්‍ර: එහෙම නිර්වචනයක් නැත්තේ 2013 මාර්ගෝපදේශක සංග්‍රහයේ අදාළ කරගත යුතු වන්නේ සුළු, කුඩා සහ මධ්‍යම කර්මාන්කරුවන්ට පමණක් අදාළ කර ගත යුතු නිසයි කියලා මම කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවාද?

උ: එය පිළිගන්නවා.

ප්‍ර: දැන් ඔබ ජනාධිපති නීතිඥ මහතාගේ තවත් ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන් කිව්වා මේ යම් කර්මාන්තකරුවෙක් සුළු, කුඩා, මධ්‍යම ද

FAIR COMMENT BY JEZEEM

එහෙම නැත්නම් මහා පරිමාණ ද කියලා වර්ගී කරන්න බැරි අවස්ථාවලුත් එන්න පුළුවන් කියලා. එහෙම වෙන්න පුළුවන් ද?

උ: එතුමා ප්‍රකාශ කරපු අවස්ථාවේ දී ඒ නිදර්ශනය වගේ අවස්ථාවක් පැමිණිනොත් වර්ග කිරීමේ නොහැකියාවක් තියෙනවා. ගැටීමක් ඇති වෙනවා.

ප්‍ර: ගැටීමක් ඇතිවන අවස්ථාවක දී ඒ එක් අංශයක් හරි දක්වා තිබෙන නිර්ණායක වලට ඉහළ යනව නම් ඒ අවස්ථාවේ දී ඔහු කුඩා, මධ්‍යම හෝ සුළු පරිමාණ කර්මාන්තකරුවෙක් විදියට සලකන්න බැහැ කියලා මං කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නව ද?

උ: ගැටීමක් ඇතිවුණ වෙලාවක ඒ නිර්ණායක දෙකයි තියෙන්නේ එයින් එකක් එක පැත්තකට එන්න පුළුවන්. අනිත් පැත්තට. එතකොට අපිට තීරණය කිරීමේ නොහැකියාවක් යම් ප්‍රමාණයක තියෙනවා.

ප්‍ර: තීරණයක් ගන්න බැරිද සේවක සංඛ්‍යාව වැඩි වුණොතින් එහෙම නැත්නම් මාසික පිරිවැටුම මිලියන 600 කට වඩා වැඩි නම් ඒක මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙක් වෙන්නෙ නැහැ මහා පරිමාණ කර්මාන්තකරුවෙක් වෙනවයි කියන එක ඔබට පිළිගන්න හැකියාවක් නැද්ද?

උ: එතැනදී අපිට ගැටීමක් තියෙනවා අපේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ තියෙන කාර්යභාර්යත් සමඟ අපි ඒ පැත්තත් කල්පනා කරන්න සිද්ධ වෙනවා. අපි හැම වෙලාවේම කර්මාන්තයකට උදව් කිරීම හැර එය ඉවත් කිරීම පිළිබඳ තත්ත්වයක ඉන්නේ නැහැ. ඉතින් ඒ වගේ අවස්ථාවක් අපිට උද්ගත වුණොත් ඒ වගේ ප්‍රශ්නයක් එනවා. අපිට මොකද කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉලක්කය තියෙන්නේ සියළුම කර්මාන්ත වලට සේවා සැපයීම.

ප්‍ර: මං ඔබට යෝජනා කරනවා කාර්මික සංවර්ධන මණ්ඩලයේ පනවන ලද පනතේ අරමුණු අනුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන මණ්ඩල පනත සහ 2013 මාර්ගෝපදේශක සංග්‍රහය අනුව ඒ පරමාර්ථ වන්නේ සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට අතහිත දීම නඟාසිටුවීම ප්‍රවර්ධනය මිසක මහා පරිමාණ කර්මාන්තකරුවන්ට ලාභ ලබාදීම සඳහා ක්‍රියාකිරීම නෙවෙයි කියලා?

උ: ඒත් මේ වන කොට අපි ආයතනයේ දැක්ම විදියට හදලා තිබෙන්නේ සියළු කර්මාන්ත වලට සේවා සැපයීම. එය එසේ නම් මණ්ඩලය විසින් සිදුකරපු දෙයක්.

ප්‍ර: දැන් පාර්ලිමේන්තුවෙන් සම්මත ව්‍යවස්ථාපිත පනතකට ඉහළින් වෙනත් නීතියක් ඒ විදියට පනවලා තියෙන්න පුළුවන් ද?

FAIR COMMENT BY JEZEEM

උ: අපිට ලබාදීලා තියෙන vision, mission එක්ක තමයි ඔය ප්‍රකාශ කරපු දේ තියෙන්නේ. මම සංසන්දනය කරලා නැහැ ඒකේ පනතත් අපේ දැනට තියෙන vision සහ mission එක්ක.

ප්‍ර: මා ඔබට වැඩිදුරටත් යෝජනා කරනවා 2013 මාර්ගෝපදේශ සංග්‍රහයේ සුළු, කුඩා, සහ මධ්‍යම කියන පරිමාණ තුන පමණක් තිබෙන්නේ එකී කර්මාන්තකරුවන්ට පමණක් වට්ටම් ලබාදෙන්න කියලා ප්‍රතිපාදන සඳහන් කරලා තිබෙන්නේ ඒ අබලි ලෝහ ඒ කර්මාන්තකරුවන්ට පමණක් විශේෂයෙන් ඇති කරලා තියෙන මාර්ගෝපදේශක සංග්‍රහයක්ය කියලා මම ඔබට යෝජනා කරනවා?

උ: එය පිළිගන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔබට ජනාධිපති නීතිඥ මහත්මයා C 758 කියලා ලකුණු කර ඉදිරිපත් කරපු ලේඛනය පෙන්වලා ඔබෙන් ප්‍රශ්න කරා අංක 05 යටතේ තියෙන මේ ලිපිනයක් කපලා අලුතෙන් ලිපිනයක් ප්‍රවර්ධක නිලධාරීනිය ලියලා තියෙනවයි කියන කාරණය ?

උ: එහෙමයි .

ප්‍ර: එහිදී එතුමා ඔබෙන් ප්‍රශ්න කරා එක සංශෝධනය කරන්නෙ නැතුව එහෙම්ම තිබ්බ නම් ඒක නිවැරදි අයදුම්පතක් වෙනවද කියලා ඔබට ප්‍රශ්නය තේරුණා ද?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබෙන් ඇහුවේ මේ අංක 05 යටතේ තියෙන ලිපිනයේ සඳහන් කරලා තිබෙන ලිපිනය කපන්නේ නැතුව කපලා මේ ලියලා තියෙනවනේ වැල්ලම්පිටියේ ලිපිනයක්?

උ: ඔව්.

ප්‍ර: එහෙම නැතුව මේක මෙහෙම තිබ්බනම් මේක නිවැරදි අයදුම්පතක් වෙනවද කියලා?

උ: එසේ නිවැරදි අයදුම්පතක් වෙනවා යම්කිසි දුරකට පමණක්.

ප්‍ර: කොහොමද මහත්මයා නිවැරදි අයදුම්පතක් වෙන්නේ කර්මාන්තය තියෙන ස්ථානය නැතුව වෙනත් ස්ථානයක ලිපිනයක් දාලා තියෙනව නම්?

උ: ඒක තමයි මං කිව්වේ.

ප්‍ර: ඒක නිවැරදි අයදුම්පතක් වෙනවද?

උ: සම්පූර්ණ නිවැරදි අයදුම්පතක් නෙවෙයි.

ප්‍ර: මොකද්ද ඔබ අදහස් කරන්නේ සම්පූර්ණ කියන එකේ එක කොටසක් වැරදි නම් සම්පූර්ණයෙන් වැරදි. දැන් ඔබ සඳහන් කරා 2017/05 වැනි මාසේ 17 වැනිදා ඔබව පත්කරා කියලා අබලි ලෝහ කළමණාකරන ඒකකයේ භාරව එවකට හිටපු මේ සරත් උදයසිරි කියන නිලධාරියාව ඒ රාජකාරී වලින් ඉවත් කරලා?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ පත්කිරීම කළේ එවකට සිටි සභාපති මහින්ද ජිනසේන මහත්මයා කියලා ඔබ සඳහන් කරා?

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ ආකාරයට ඔබව පත් කළේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියක් ඇතිවද?

උ: ඒ පිළිබඳව මං දැනුවත් නැහැ.

ප්‍ර: මං ඔබට යෝජනා කරනවා ඒක සභාපතිතුමාගේ තනි කැමැත්තට ඔහු විසින් ගන්නා ලද තීරණයක් මත සිදුකරන ලද පත් වීමක් කියලා?

උ: ඒ පිළිබඳ මට ප්‍රකාශයක් කරන්න අපහසුයි. මා දැනුවත් නැහැ.

ප්‍ර: දැන් ඔබ කිව්වා 2016 මාර්තු 15 වැනිදා HOD Head of the meeting කියලා රැස්වීමක් පැවැත්තුවා. එහි දී අබලි ලෝභ ලාභ ගන්න නම් වෙනම කෙනෙක් පත්කරන්න ඕන කියලා තීරණයක් තිබුණයි කියලා?

උ: මා එසේ ප්‍රකාශ කෙරුවේ නැහැ.

වේලාව: ප.ව.10.35
මෙතැන් සිට : නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.10.35
පෙර සටහන් ල/ලේ: සවිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: ඔබට ඒ ගැන දැනීමක් නැහැ?

පි: දැනීමක් නැහැ.

ප්‍ර: එසේම ඔබ ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් සඳහන් කරා අනිකුත් කර්මාන්තකරුන් මේ කොලොසස් සමාගම කර්මාන්තකරු හැරුණාම අනිකුත් පිත්තල ඉල්ලුම් කරන ලද කර්මාන්තකරුවන්ට ඉල්ලපු පිත්තල ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණ වලින් ලබාදෙන්න සිදු වෙච්ච අවස්ථා තිබුණායි කියලා?

පි: සමහර අවස්ථා තිබුණා.

ප්‍ර: එහෙම වුණේ ඒ කාලයට අදාළව කොලොසස් සමාගමට වැඩි ප්‍රමාණයක් පිත්තල ලබාදීපු නිසායි කියලත් ඔබ සඳහන් කරා?

පි: ඉල්ලපු ප්‍රමාණයට නෙවෙයි නිර්දේශිත ප්‍රමාණයට.

ප්‍ර: දැන් ඔබ කිව්වා මේ අසාධාරණ ඔබේ පිළිතුරක්මයි මහත්මයා මම මේ කියන්නේ. ඔබ කිව්වා මේකේ අසාධාරණයක් වෙන්නේ දෙවැනි වටයේ දෙන්න හැකියාවක් නොමැති වන නිසා තමයි මේ අසාධාරණයක් මේකේ ඇති වෙන්නේ කියලා ඔබ කිව්වා.

පි: ඔව් ඒක.

ප්‍ර: දෙවැනි වටයේ දෙන්න හෝ එහෙම ඒ ඉල්ලපු ප්‍රමාණයට වඩා දෙන්න ඉල්ලපු ප්‍රමාණයට අනිකුත් කර්මාන්තකරුවන්ට ලබා දෙන්න හැකියාවක් නොමැති වෙන්නේ එක් කර්මාන්තකරුවෙකුට මේ කොලොසස් සමාගමට වැඩිපුර ලබා දුන්න නිසායි කියන දේ ඒ අනුව ඔබ පිළිගන්නවද? ඔබේ පිළිතුරක්මයි මම ඇහුවේ.

පි: තව වටයක් ලබා දීමේ නොහැකියාවක් තියෙන්න ඇති.

ප්‍ර: දැන් ඔබ පිළිතුරු ලබා දුන්නා මේ 2017 වර්ෂයට පස්සේ සේවකයන්ගේ ලබා දුන්න බෝනස් ප්‍රමාණයත් වැඩිවුණා කියලා?

පි: මට මතක විදියට වැඩි වුණා.

ප්‍ර: දැන් මේ කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීමේ අරමුණ ලාභ ලබා ගැනීමද නැත්නම් කුඩා මධ්‍යම සහ සුළු කර්මාන්තකරුවන්ට කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට අතහිත දීමද?

පි: පනත අනුව තියෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සේවා ලබාදීම. ඒත් සේවකයන් පැත්තෙන් බැලුවාම සේවකයන්ට බෝනස් ලබා ගැනීමේ හැකියාවකුත් සහ ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවක් තිබිය යුතුයි කියලා තමයි මගේ කල්පනාව.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ ප්‍රශ්න කළ පිළිතුර වශයෙන් කිව්වා අයදුම්පතක් ඉදිරිපත් කළාම ප්‍රදේශිය කළමනාකරු එවන නිර්දේශ මත පමණයි ඔබ ක්‍රියා කරන්නේ කියලා?

පි: ඔව්.

ප්‍ර: දැන් එහෙම ප්‍රදේශිය කළමනාකරු එවන නිර්දේශ මත පමණක් ක්‍රියාකරනවා නම් එය සුපරීක්ෂාවට ලක් කරන්න අධ්‍යක්ෂක අලෙවි හෝ එම නිලධාරියාගේ ක්‍රියාකාරීත්වය මහත්මයා වෙත පවරා තිබීමෙන් ප්‍රයෝජනයක් තියෙනවද?

පි: අපිට පවරලා තිබෙන රාජකාරිය අපි ලංකාව පුරා තිබෙන කර්මාන්ත බලන්න යෑමේ හැකියාවක් අපිට නැහැ.

ප්‍ර: ඒ කර්මාන්ත බලන්න යන්නේ ධාරිතාව තියෙනවද නැද්ද කියන එක පරීක්ෂා කරන්නනේ?

පි: ඔව්

ප්‍ර: ඒ කාරණය ගැන නෙවෙයි මම මහත්මයාගෙන් අහන්නේ. අයදුම්පතේ කරුණු වසන් කරලා තිබෙනවා නම් එහෙම නැත්නම් අයදුම්පත අනුව ඔහුට කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සේවය ලබා දෙන්න බැරි කර්මාන්තකරුවෙක් නම් ඒ කාරණා ඔබේ පරීක්ෂාවට සැලකිල්ලට යොමු විය යුතුව තිබෙනවා නේද?

පි: සැලකිල්ලට යුතුයි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා එක්තරා 2017.09 මාසේ 06 වෙනිදා සභාපතිතුමා විසින් පත්කර කමිටුවකට ඔබත් සාමාජිකයෙක්ව ඇතුළත්ව මේ කොලොසස් සමාගමේ කර්මාන්තය බලන්න ඔබ ගියායැයි කියලා?

පි: එහෙමයි.

ප්‍ර: එහිදී මේ කෝවා නිරීක්ෂණය කරා කියලා ඔබ සඳහන් කරා. මේ ඉඩම බැලුවා කියලයි කියලා මාසික නිෂ්පාදන ධාරිතාව යෝජිත නිෂ්පාදිත ධාරිතාව ඒ සියල්ල ඔබ පරීක්ෂා කර බැලුවැයි කියලා?

පි: ඔව්.

ප්‍ර: ඒ ලේඛනය ඔබ DPP – 16 කියලත් ලකුණු කරා. දැන් ඔබ ඒ වන විට සෑහෙන කාලයක සිට මේ ක්‍රියාවලියේ යෙදිලා පළපුරුදු නිලධාරියෙක්නේ?

පි: මට මේ රාජකාරි භාර දීලා වැඩි කාලයක් නැහැ.

ප්‍ර: දැන් එහිදී ඒ මාසික නිෂ්පාදන ධාරිතාව ඔබ නිරීක්ෂණය කරයි කිව්වනේ?

පි: ඔව්

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා ඒ මාසික නිෂ්පාදන ධාරිතාව ඒ අවස්ථාවේදී ඔබේ නිරීක්ෂණයට ලක්වුණා නම් එය මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවෙකුගේ නිෂ්පාදන ධාරිතාව ඉක්මවා ගිය බවට ඔබට ඒ අවස්ථාවේදීම පැහැදිලි විය යුතුව තිබුණා කියලා? ඔබ එතෙන්ටම ගිහිල්ලා බැලුවා නේද එම ස්ථානයටම ගිහිල්ලා.

FAIR COMMENT BY JEZEEM

පි: ඒ ධාරිතාව පිළිබඳ මටත් ඒ වෙනත් ඒ කර්මාන්තය පිළිබඳව මට දැනුමක් නැහැ. ඒ නිසා තමයි සුදුසුකම් සහිත ඉංජිනේරුවරු අරගෙන ගියේ.

ප්‍ර: ඒ අය ඉංජිනේරුවරුන් තාක්ෂණික නිලධාරීවරුන් අවශ්‍ය වෙන්නේ ඉල්ලුම් කරලා තියෙන ද්‍රව්‍ය ප්‍රමාණයට සාපේක්ෂව එය නිෂ්පාදනය හැකියාවත් ධාරිතාවක් ඒ කර්මාන්තයේ තියෙනවද කියලා බලන්නේ?

පි: ඔව්.

ප්‍ර: ඒ සඳහා තාක්ෂණික දැනීම මහත්මයාට නැති නිසා තමයි ඒ සම්බන්ධයෙන් ඒ නිලධාරීන් රැගෙන ගියේ. නමුත් නිෂ්පාදන ධාරිතාව දැනුම් දුන්නාට පස්සේ ඒක ගණනය කරලා ඔහු කුමන කාණ්ඩයට වැටෙන කර්මාන්තකරුවෙක් ද කියලා ගණනය කරන්නට මහත්මයාට හැකියාවක් තිබෙනවානේ?

පි: ඔව්. මට ඒ වාර්තාව නැතුව එහි

ප්‍ර: ඔබ ඉදිරිපත් කරපු වාර්තාවක් මම සඳහන් කරන්නේ.

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ තව සඳහන් කරා. 2017 වර්ෂයේ මේ පිත්තල කොපුවල වටිනාකම පිත්තල 1Kg වටිනාකම රුපියල් 450ත් 500ත් අතර ඒ අනුව ඔබ මධ්‍ය අගය රුපියල් 475ක් කියලා ගත්තායි කියලා?

පි: ඔව්.

ප්‍ර: ඔබ මීට පෙර මූලික ප්‍රශ්න අහනකොට කිව්වා මේ මුදල 403කට වගේ මුදලකට තමයි දිය යුතුව තිබුණේ කියලා. ඒ දෙකෙන් මොකක්ද හරි? දැන් ඔබ කිව්වානේ මේ හරස් ප්‍රශ්න වලට උත්තර දෙනකොට 399.95ක් වෙන්න ඕනි කියලා?තේරේන්නේ නැත්නම් මම ආපහු අහන්නම්.

පි: මට තේරුණා.මට කියපු දේ මට කියා ගන්න බැරි වෙන්න ඇති.

ප්‍ර: මම නැවත ප්‍රශ්නය අහන්නම්. දැන් ඔබ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඔබේ නීතිඥ මහත්මයා අහන ප්‍රශ්න වලට ඔබ සඳහන් කරේ රුපියල් 399.95කට මේ පිත්තල 1Kg ඒ කාලේ දෙන්න පුළුවන්කම තමයි නියම මිල කියලා?

පි: වට්ටම් අඩු කෙරුවම

ප්‍ර: ඔව් ඒක තමයි අවසානයේ දී දෙන්න පුළුවන් මිල?

පි: අවසානයේ මිල විදිහට තීරණය වෙන්නේ NBT සමඟ එන මිල. අපි තීරණය කරලා තියෙන්නේ ප්‍රමිතියෙන්. ඒක තමයි 406.50 විදියට නියම කරලා තියෙන්නේ. NBT, Invoice එකේ දානකොට NBT අඩු කරලා පෙන්නලා NBT වෙනම පෙන්වනවා. එතකොට ඒ දෙකේ එකතුව 406.50යි ඒ විදියට තමයි හදලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඔබ මූලික සාක්ෂි දෙනකොට කිව්වේ ඊට වඩා අඩු ගාණකටයි දීලා තියෙන්නේ මේ මුදල රුපියල් 403ක්වත් වෙන්න ඕනි කියලා. ඒ දෙකෙන් කොයි එක ද හරි?

FAIR COMMENT BY JEZEEM

පි: නැහැ 406.50 , 403.50 තමයි තිබුණේ. අපි 406.50ට තමයි අලෙවි කළේ.

ප්‍ර: නමුත් ඒ Invoice එකේ සඳහන් වෙන්නේ රුපියල් 399.95 ක් කියලා?

පි: 399.75යි. ඒකට NBT එකතු වුණාම 406.50 හෝ 407

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: Invoice එක හදන්න පුළුවන් NBTත් එක්ක?

පි: ඔව් Invoice එකට NBT ඇතුල් කරනවා. ඒ ඒකකයේ මිල විදියට එහෙම වැටුණට NBT ඇතුල් කරලා තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: Invoice එකට?

පි: ඔව්. Invoice එකට

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් ඔබෙන් අවසාන වශයෙන් මේ ඔබේ නීතිඥ ඔබ වෙනුවෙන් නීතිඥ මහත්මයෙක් හරස් ප්‍රශ්න කරන කොට ඇහුවා. සුළු ප්‍රමාණ වලින් මිලදී ගැනීම් වලට වඩා මහා පරිමාණ වලින් මිලදී ගැනීමේ දී ඒ වැඩිපුර ධාරිතාවක් තිබෙන නිසා තමයි ඒ විශාල ප්‍රමාණයක් අබලි ලෝහ ඉල්ලන කර්මාන්තකරුට ලබා දුන්නේ කියලා?

පි: නැහැ එසේ ප්‍රකාශ කරේ නැහැ මම. එයින් ලාභයක් ලැබුණා කියන එක.

ප්‍ර: ඒක තමයි ඔබ කිව්වා එකෙන් ලාභ ලැබෙන්න පුළුවන් මේ මහ පරිමාණ වලින් ඉල්ලන අයට ඒ ඔබ සන්තකයේ තිබෙන ද්‍රව්‍ය දුන්නහම ලාභ වැඩිපුර ලබා ගන්න පුළුවන් කියලා?

පි: ඔව් ඒක. සත්‍යයක්

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා 2013 මාර්ගෝපදේශක සංග්‍රහයේ තිබෙන පරමාර්ථයි, කාර්මික සංවර්ධන මණ්ඩල පනතේ පිහිටුවීමේ අරමුණු වලටයි පටහැනිව තමයි ඒ ලාභ ලැබීම මත පමණක් සළකලා කොලොසස් කර්මාන්ත ශාලාවේ කර්මාන්තකරුට ඒ වැඩිපුර අබලි ලෝහ ප්‍රමාණය ලබා දීමෙන් සිදු කර තිබෙන්නේ කියලා?

පි: ස්වාමීනි ඒ කාර්මික සංවර්ධන මණ්ඩලයේ විදිහට දැන් ඔය පරමාර්ථයේ ඒක මා දන්නා තරමින් මම දන්නේ නැහැ වෙනස් වෙලා තියෙන්නේ. හැම වෙලාවෙම අපිට කාර්මික සංවර්ධන මණ්ඩලයට මුදල් නැහැ. අපිට ලැබෙන්නේ පඩිය විතරයි. අනිත් සියලුම දේවල් උපයා ගන්න ඕනි. එතකොට ඒ අදහස තමයි හැමෝගෙම අතේ තියෙන්නේ. එතකොට ඒක තමයි මටත් පේෂණය වෙන්නේ. ඒ අනුව තමයි මම මෙතන ප්‍රකාශ කරලා තියෙන්නේ. ACT එක පිළිබඳව මම ලොකු ඒ තරම් මගේ මට්ටමින් සළකා බලලා නැහැ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කියපු කාරණා සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබගේ ස්ථාවරය වන්නේ මේ කොලොසස් පුද්ගලික සමාගමට මේ අබලි ද්‍රව්‍ය නිකුත් කිරීම කරන්නේ ඔබ මේ විසින් ඉදිරිපත් කරපු DPP - 16 දරන ස්ථානීය පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන ඔවද?

පි: ඒක මුල් අවස්ථාවේ ඒක පදනම් කර ගත්තා.

ප්‍ර: මුල් අවස්ථාවේ ඒක පදනම් කර ගත්තා?

පි: ඔව් ඊට පසුවත් අපි නිරීක්ෂණය කරා.

ප්‍ර: ඊට පසු අවස්ථාවක මේ DPP - 16 වගේ ස්ථානීය පරීක්ෂණ වාර්තාවක් තියෙනවද?

පි: තියෙනවා.

ප්‍ර: ඔබ ගාව තියෙනවද?

පි: ඔව්.

ප්‍ර: කවද්ද ඒක කළේ?

පි: ඒ ස්ථානීය පරීක්ෂාවේ දී ඔයිතරම් වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ. එහි අපි නිර්දේශ කරලා තියෙනවා ස්ථානීය පරීක්ෂාව කරලා.

ප්‍ර: කවද්ද ඒක කෙරුවේ?

පි: ඒක තියෙනවා ස්වාමීනි මා ළඟ. ඒක 2017.11 මාසේ 17 වෙනිදා අපි 4 දෙනෙක් ගිහිල්ලා නිරීක්ෂණය කරලා තියෙනවා.

ප්‍ර: 2017?

පි: 11 මාසේ 17 වෙනිදා.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

උතුමාණෙනි මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන 2017. 11මාසේ 17 වන දින පිත්තල හා තඹ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ස්ථානය පරීක්ෂණ වාර්තාව ඒ පරීක්ෂා කරලා තිබෙන ආයතනය කොලොසස් PVT Limited කියලා සඳහන් වෙලා තිබෙනවා. DPP - 21 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: DPP – 16 දරන ස්ථානීය පරීක්ෂණ වාර්තාවෙන් මොන අබලි ද්‍රව්‍ය කොලොසස් PVT Limitedට විකුණන්නද නිර්දේශ කෙරුවේ?

පි: තඹ පළවෙනි වාර්තාවේ.

ප්‍ර: ඒ කියන්නේ 2017.09.12 දින දරන වාර්තාවට අනුව තඹ ද්‍රව්‍ය කොලොසස් පුද්ගලික සමාගමට විකුණන්න නිර්දේශ කෙරුවා?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: DPP – 16 වාර්තාවේ ස්ථානීය පරීක්ෂණ වාර්තාවේ පැහැදිලිව කියලා තියෙනවා නේද පිත්තල සම්බන්ධයෙන් නිර්දේශ පසුව කරනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට DPP – 16 දරන ස්ථානීය පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන පිත්තල අමුද්‍රව්‍ය කොලොසස් පුද්ගලික සමාගමට විකුණන්න පුළුවන් ද බැරිද?

පි: මුල් වාර්තාව පදනම් කරගෙනද ස්වාමීනි.

ප්‍ර: ඔව්

පි: ඒ වාර්තාවේ අපි කියලා තියෙනවා ලබා දෙනවා කියලා. මෙහෙයවන්න.

ප්‍ර: සාක්ෂිකරු වගකීමකින් යුතුව මේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන්න.

DPP - 16 පෙන්වයි.

පි: ඒ අනුව ස්වාමීනි අපි මේ සඳහන් කරලා තියෙනවා. ඒ අනුව දැනට පවතින තඹ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබා දෙන සුදුසුකම් නිර්දේශ කළ හැකි අතර යෝජිත ව්‍යාපෘති වැඩ කටයුතු අවසන් කිරීමෙන් පසු ආරම්භක නිෂ්පාදනය සඳහා පිත්තල අමුද්‍රව්‍ය ප්‍රමාණය ලබා දීමට නිර්දේශ කරමු.

ප්‍ර: ආරම්භ කිරීමෙන් පසු?

පි: ආරම්භක නිෂ්පාදනය සඳහා අවශ්‍ය පිත්තල.

ප්‍ර: ඒ කියන්නේ ඒ සම්බන්ධයෙන් ඔබ ස්ථාන පරීක්ෂණ වාර්තාවෙන් පිත්තල නිෂ්පාදනය විකුණන්න නිර්දේශ කෙරුවේ නැහැනේ?

පි: මේකේ නිර්දේශ කරලා තියෙන්නේ තඹ වලට. හැබැයි අපි මේකේ ප්‍රකාශ කරලා තියෙනවා. යෝජිත ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරීමෙන් පසු ආරම්භක නිෂ්පාදනය සඳහා අවශ්‍ය පිත්තල අමුද්‍රව්‍ය ප්‍රමාණය ලබාදීම නිර්දේශ කරමු.

ප්‍ර: ඒ නිර්දේශය කෙරුවේ ඔය 2017 සැප්තැම්බර් 12 වන දින දරන ස්ථානීය පරීක්ෂණය කරන විට ඒ නිර්දේශය ලබාදෙන්න බැරි හින්දානේ?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ පිත්තල ලබා දීම සඳහා අවශ්‍ය මූලික කරුණු වෙලා තිබ්බේ නැහැ කියන එකනේ ඔබලාගේ නිරීක්ෂණයෙන් පැහැදිලි වුණේ?

පි: ඔව් ඒ වෙනකොට කරලා තිබුණේ නැහැ.

ප්‍ර: ඒ පිත්තල කොලොසස් පුද්ගලික සමාගමට ලබාදීම ඔබ ඇත්ත වශයෙන්ම අනුමත කරන්නේ DPP – 21 දරන වාර්තාවට අනුව නේද?

පි: ඔව්.

ප්‍ර: හරිද?

පි: ඔව්. ඒත් ස්වාමීනි

ප්‍ර: DPP – 21 වාර්තාවේ දිනය කවද්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එකේ දිනය 2017.11.17

ප්‍ර: 2017.11.17ට ඉස්සෙල්ලා කොලොසස් පුද්ගලික සමාගමට පිත්තල, අබලි ද්‍රව්‍ය විකුණුවද නැද්ද?

පි: මේ දිනයට කළින් විකුණුවා.

ප්‍ර: ඒ දිනට කළින් විකුණුවා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ විකුණුවේ ස්ථානීය පරීක්ෂණයක් කරන්නේ නැතුව?

පි: ස්ථානීය පරීක්ෂණයක් කරන්නේ නැතිව. ඒත් ස්වාමීනි අපි මේ වාර්තාවෙන් කියලා තියෙනවා ආරම්භක නිෂ්පාදනය කරන්න අපි මේක දෙනවා යන්ත්‍ර සූත්‍ර ඉවර කරලා පෙන්නුවට පස්සේ?

ප්‍ර: යන්ත්‍ර සූත්‍ර ඉවර කරලා පෙන්නුවාට පස්සේ?

පි: පෙන්නුවාට පස්සේ කියන්නේ අපිට දැනුම් දුන්නාට පස්සේ.

ප්‍ර: ඒ කියන්නේ 2017 සැප්තැම්බර් 12 වෙනිදා ඔබ ස්ථානය පරීක්ෂණය කරන කොට ඒ යන්ත්‍ර සූත්‍ර සවි කරලා තිබ්බේ නැහැ?

පි: ඒ වෙනකොට සවි කරමින් පැවතුනේ.

ප්‍ර: ඉවර කරලා තිබ්බේ නැහැනේ?

පි: ඉවර කරලා තිබ්බේ නැහැ.

ප්‍ර: එකනේ නිර්දේශය දුන්නේ දැන් දෙන්න බැහැ කියලා?

පි: ඔව් දැන් දෙන්න බැහැ කියලා. ඒත් අපි කියලා තියෙන්නේ මේ යන්ත්‍ර සූත්‍ර සවි කරලා ඉවර කරලා අපිට කියන්න. එතකොට අපි මුල් ඒ කියන්නේ ක්‍රියාකරන්න අපි අමුද්‍රව්‍ය ලබා දෙනවා. ඊට පස්සේ එම ලබා දුන් පිත්තල අමුද්‍රව්‍ය භාවිතා කර නිෂ්පාදනය කරන භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු ඉදිරියේදී පිත්තල අමුද්‍රව්‍ය ලබාදීමෙන් නිර්දේශය ලබාදිය හැක. එහෙම තමයි සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර: එතකොට ඔබට අනුව කොලොසස් පුද්ගලික සමාගමට පිත්තල ද්‍රව්‍ය විකුණපු පළවෙනි දිනය කවදද? 2017 සැප්තැම්බර් 21 කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: 50kg විකුණපු දිනය වෙන්න ඕනි. මට බලලා කියන්න ඕනි ස්වාමීනි. 2016.09.29

ප්‍ර: 2016 නෙවේ 2017?

පි: 2017.09.29

ප්‍ර: කීයක් දුන්නද?

පි: 56kgක්

ප්‍ර: 56kgක් දුන්නා?

පි: ඔව්.

ප්‍ර: ඒකද මේ ඔබ කියන හැටියට ආරම්භක භාණ්ඩ නිෂ්පාදනය සඳහා ලබාදුන්නේ?

පි: නැහැ ඒ සාම්පල් විදිහට ලබා දුන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට පස්සේ ඒ ලබා දුන් සාම්පල අනුව නිෂ්පාදනය කරපු භාණ්ඩ පරීක්ෂා කෙරුවද?

පි: ඒ ප්‍රමාණයෙන් මේ කෝවට දාලා උණු කරලා Production එකක් ගන්න අමාරුයි. ඒගොල්ලෝ ඒක ඉල්ලුවේ පිත්තල උණ්ඩ කොපු වල තියෙන සංයුතිය බලන්න.

ප්‍ර: හරි. ඒත් ඔය ඊට පස්සේ පිත්තල කවද්ද වික්කේ?

පි: ඊට පස්සේ අපි විකුණලා තියෙනවා. 10.11

ප්‍ර: 10.11 කොච්චරක් වික්කද?

පි: කිලෝ1625ක්

ප්‍ර: 10.11ට ඉස්සර වෙලා තව සැරයක් වික්කේ නැද්ද? 29 වෙනිදා දෙපාරක් වික්ක නේද?

පි: ඒ අර කිරනකොට 50යි 56යි ගාණක් වැඩි වෙලා තියෙනවා අර කිරනකොට.

ප්‍ර: හරි. එතකොට 2017 ඔක්තෝබර් මාසේ 11 වෙනිදා කොච්චරක් වික්කද?

පි: 1625ක්.

ප්‍ර: එතකොට ඒ වෙනකොටත් ඔය DPP - 13 වාර්තාව සකස් කරලා නැහැ නේද?

පි: ඒ වෙනකොටත් නැහැ.

ප්‍ර: දැන් ඉස්සෙල්ලා 2016, 2017 වර්ෂයට මේ කොලොසස් පුද්ගලික සමාගම ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරානේ register කරන්න නේද?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට ඒ register කරන ඉල්ලුම් පත්‍රය ඔබලාගේ ඇතුළත තියෙන සංවිධාන ඇතුලෙන් තිබ්බ ක්‍රියාමාර්ගය අනුව නිර්දේශ කරලා තිබ්බා?

පි: ඔව් තඹ සඳහා.

ප්‍ර: තඹ කොච්චරක්ද?

පි: තඹ ටොන් 30ක්.

ප්‍ර: ඒ නිර්දේශ වල තිබ්බද පිත්තල සහ සින්ක් නිර්දේශ කරන්න බැහැ කියලා?

පි: නිර්දේශ කරන්න බැහැ කියලා ඒකට හේතුවත් දක්වලා තිබුණා.

ප්‍ර: දැන් ඒ විදියට තමන්ගේ ආයතනයේ තියෙන ක්‍රමවේදයෙන් ඒ නිර්දේශ කරන්න බැහැ කියලා තියෙද්දී ඇයි තවත් කමිටුවක් පත් කෙරුවේ?

පි: කමිටුව පත් කෙරුවේ තඹ ටොන් 30ක් ඉල්ලීමක් කරලා තිබුණා. ප්‍රමාණය වැඩියි ඒ නිසා ඒ සඳහා තවත් දැනුම තියෙන අයගේ කමිටුවකින් නිරීක්ෂනයකින් නිර්දේශ ලබා දිය යුතුයි කියන අදහස තමයි තිබුණේ.

ප්‍ර: දැන් ඒ කමිටුව පත්කිරීම සඳහා ඔබ කිව්වානේ ලියුම් ඇරියා කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: දැන් ඒ ලියුම් කාර්මික තාක්ෂණික ආයතනයටයි තමා ඇරියේ නියෝජිතකයෙක් නම් කරන්න කියල?

පි: ඔව්.

ප්‍ර: එයට ලැබෙන පිළිතුර ඔබලාගේ ආයතනයට ලැබුණායින් පස්සේනේ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන්නේ නේද?

පි: ඔව්

ප්‍ර: දැන් බලන්න DPP – 15 දරන ලේඛනයට අනුව එම ලිපිය තමන්ගේ අංශයට ලැබී තිබෙන්නේ කවද්ද?

ප්‍ර: ස්වාමීනි මේ ලිපිය fax මඟින් අපිට එවලා තියෙනවා. fax මඟින් එවලා ඊට පස්සේ original එක අපිට එවලා තියෙන්නේ.

පි: එතකොට මේකේ සඳහන් වෙලාවම තියෙනවා. fax 11.50, 2017.09.08 කියලා. ඒ ලිපිය අනුව තමයි අපි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ.

ප්‍ර: ඒ සීල් එක දාලා තියෙන්නේ තමන්ගේ ආයතනයෙන්ද?

පි: නැහැ. කාර්මික තාක්ෂණ ආයතනයෙන්.

ප්‍ර: ඒක තමයි මම අහන්නේ. ඒ සීල් එක ගහලා තියෙන්නේ කාර්මික තාක්ෂණික ආයතනයෙන් නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒකෙන් පෙන්වන්නේ එහෙන් fax කරපු දිනය?

පි: එහෙන් fax කරපු එක.

ප්‍ර: නමුත් ඔය ලේඛනයට අනුව ඔය ලේඛනය තමන්ගේ කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිලා තියෙන්නේ කවද්ද?

පි: මේ ලේඛනයට අනුව මේක ලැබිලා තියෙන්නේ ඔක්තෝබර් 2 වෙනිදා. ඒත් අපිට fax එක මත තමයි අපි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ.

ප්‍ර: ඒ fax එක මත ක්‍රියාත්මක වෙන්නනම් ඒක ගොනු ගත කරන්න ඕනි නේද?

පි: ගොනුගත කිරීමක් වෙලා ඒක අයින් වෙලා මේක ගොනු ගත වෙලා.

ප්‍ර: එහෙම නැත්නම් සැප්තැම්බර් මාසේ 21 වෙනිදා දුන්න තඹ වලට පස්සේ කරපු ස්ථාන පරීක්ෂණයට කළින් දිනයක් දැම්මද?

පි: නැහැ එසේ නොවේ ස්වාමීනි. අපි ඒ ආපු නියෝජිතයාට ගෙවීමක් හිටන් කරලා තියෙනවා.

ප්‍ර: ITI එකෙන්?

පි: ITI එකට රුපියල් 5000ක් ගෙවීමක් කෙරුවා. ඒකට අනුමැතිය අරගෙන තියෙනවා.

****

FAIR COMMENT BY JEZEEM

ගරු විනිසුරු අදිකාරි මැතිනිය

ප්‍ර: සාක්ෂිකරු මට පොඩි පැහැදිලි කර ගැනීමක් තියෙනවා ඔබගෙන්. ඔබ ප්‍රකාශ කරා පිත්තල 50Kgක් මෙම සමාගමට ලබා දුන්නා කියලා. එහි සංයුතිය පිළිබඳව පරීක්ෂා කර බැලීමෙන්. ඒක පොඩ්ඩක් විස්තර කරන්න පුළුවන්ද?

පි: පිත්තල හදන්නේ තඹ සහ තුත්තනාගම් එකතු කරලා. ඒ කියන්නේ සින්ක් කියන්නේ ඒක. ඒ දෙකේ සංයුතිය. ඕකේ ඒ සංයුතිය වෙනස් වුණාම පිත්තල වල Quality එක වෙනස් වෙනවා.

ප්‍ර: දැන් එම විද්‍යාත්මක දේ කර දීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට තාක්ෂණික පහසුකම් නැද්ද?

පි: පහසුකම් නැහැ. අපිට නැහැ.

ප්‍ර: නැහැ පහසුකම්?

පි: නැහැ අපිට.

ප්‍ර: තිබුණානම් ඔබ කිලෝ 50 අතෙන්ට දෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ නේද?

පි: අවශ්‍ය වෙන්නේ නැහැ.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: සාක්ෂිකරු අවසාන ප්‍රශ්නයක් තියෙනවා. මේ කොලොසස් පුද්ගලික සමාගමට මේ විදියට විශාල වශයෙන් භාණ්ඩ ලබා දීම සම්බන්ධයෙන් ඒ කර්මාන්තය යෙදී සිටිය දේශීය කර්මාන්තකරුවන්ගෙන් විරෝධතාවයක් තිබ්බද?

පි: 2018 ජුනි හෝ ජුලි මාස වල විරෝධතාවයක් තිබුණා ලබාදීම පිළිබඳව සහ පිටරට යැවීම පිළිබඳව උද්ඝෝෂණ තිබුණා. අපිටත් වැඩිය අමාත්‍යාංශයට විරෝධතාවය දක්වලා තිබුණා. එහි රැස්වීම් තිබුණා අපි ගිහිල්ලා සහභාගී වුණා.

ප්‍ර: කාගේ ප්‍රධානත්වයෙන්ද ඒ රැස්වීම් තිබුණේ?

පි: මට මතක විදිහට ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්.

ප්‍ර: ලේකම්තුමා විතරද?

පි: ලේකම්තුමා අපේ සභාපතිතුමාට එන්න කිව්වා. මමත් ගියා. මගේ අනිත් නිලධාරියාත් ගියා. තව ඊට අදාළ Additional Secretary ඒ අයත් එතන හිටියා. එතන නිලධාරී ලේකම් අමාත්‍යාංශයේ.

ප්‍ර: එතකොට ඒ උද්ඝෝෂණය තිබ්බේ ඔබ මේ කොලොසස් පුද්ගලික සමාගමට වැඩියෙන් ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් සභාපතිවරයා දැනුවත් කිරීමට පෙර ද පසුද?

FAIR COMMENT BY JEZEEM

පි: ඊට පසු අවසාන කාලේ.
සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බවට කොමිෂන් සභාව දන්වයි.
සාක්ෂිකරු මුදා හරී.

****

දැන් වෙලාව: ප.ව.11.00යි

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.02 වේලාව: ප.ව. 11.00

සටහන් කළේ - නිල්මිණි කුමාරි විසිනි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.
* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

* කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතීඥ හරීන් සද්ධාසේන මහතා සහ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටි.

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම : මහින්ද ජිනසේන
වයස : අවු 62යි
ජාතිය : සිංහල
ආගම : බුද්ධාගම
දැනට දරණ තනතුර : කළමනාකාර අධ්‍යක්ෂක
රැකියා ස්ථානය : Ashoka Glass and Mirror PVT Limited
ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: ඔබට අද දින මෙම ගරු කොමිෂන් සභාවේ සාක්ෂි ලබාදීම සඳහා සිතාසියක් ලැබුණාද?
පි: ලැබුණා ස්වාමීනි.
ප්‍ර: ඒ සිතාසිය සමඟ ඔබට ඇමුණුමකුත් ලැබුණද ඔබට අද සාක්ෂි ලබා දෙන අවස්ථාවේදී අවශ්‍ය නම් ඔබට නීතිඥ මහත්මයෙකුගේ සේවය ලබා ගන්න හැකියාවක් තිබෙන බවට?
පි: තිබෙනවා ස්වාමීනි.
ප්‍ර: ඒ අනුව ඔබ නීතිඥ මහත්මයෙක්ගේ සේවය මේ වන විට ලබාගෙන තිබෙනවද?
පි: එසේයි ස්වාමිනි.
ප්‍ර: ඔබ වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග එදිරිසිංහ මහතා පෙනී සිටිනවද?
පි: එසේයි ස්වාමිනි.
ප්‍ර: ඔබ දැනට ව්‍යාපාර කටයුතු කරන බවට සඳහන් කරා. ඔබේ පෞද්ගලික ව්‍යාපාර කටයුත්තක් ද කරන්නේ?
පි: එඑසේයි ස්වාමිනි.
ප්‍ර: ඔබ යම්කාල වකවානුවකදී කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්තව සේවය කරාද?
පි: එසේයි ස්වාමිනි.
ප්‍ර: ඒ කවර කාල වකවානුවේදකුමන තනතුරකද?
පි: 2015 පෙබරවාරි 20 වෙනිදා සිට 2018 ඔක්තෝබර් මස 3 වන සතියේ ඒ
ප්‍ර: ඔබ කුමන තනතුරක ද සේවය කළේ?
පි: සභාපති වශයෙන් ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ උපාධිධාරියෙක්ද ?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඔබේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් සැකවින් විස්තර කරන්න.

පි: කොළඹ රාජකීය විද්‍යාලයේ උසස් පෙළ දක්වා ඉගෙන ගෙන ඉන්පසු ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ ටාටා ඉංජිනියරින් විශ්වවිද්‍යාලයේ මෝටර්යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය ලබාගෙන තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: 2015.02 මාසේ 20 වන දින ඔබ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් පත්වීම භාරගන්න කොට එය කුමන අමාත්‍යාංශයකට ද අයිතිව තිබුණේ?

පි: එය කර්මාන්ත සහ වෙළඳ අමාත්‍යාංශය යටතේ.

ප්‍ර: කවර ඇමතිවරයෙක්ද එකී අමාත්‍යාංශය භාරව කටයුතු කළේ?

පි: හිටපු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබව සභාපති ධුරයට පත් කරනු ලැබුවේ කවුරුන් විසින්ද?

පි: හිටපු අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින්.

ප්‍ර: දැන් ඔබ දන්නවද කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවා තිබෙන්නේ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටයි කියලා ?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: එකී පනතේ 17 වෙනි වගන්තිය ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයක් සිටින බවටත් එහි සාමාජිකයෝ 9 දෙනෙක් සිටින බවටත් සඳහන් වෙලා තියෙනවා කීවොත් ඒක පිළිගන්නවද?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ සාමාජිකයන් 9 දෙනා අතරින් 6 දෙනෙකු අමාත්‍යවරයා විසිනුත් ඉතිරි තිදෙනා මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු සහ එම කාර්මික සංවර්ධන මණ්ඩලය අයිති වෙන අමාත්‍යාංශයේ නිලධාරින් දෙදනෙකු කියලා කිව්වොත් ඒක මහත්මයා පිළිගන්නවද?

පි: මුදල් අමාත්‍යාංශයේ නිලධාරිනියක් සහ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්වරුන් දෙදෙනෙක් කිව්වොත් පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: එසේම ඇමතිවරයා විසින් ඒ සාමාජිකයන් 9 දෙනා අතරින් එක් අයෙකු සභාපති ධුරයට පත් කළ යුතු බවටත් එකී පනතේ සඳහන් වෙලා තිබෙනවද මේ 17 දෙවැනි වගන්තිය ප්‍රකාරව?

පි: එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව ඔබව සභාපති ධුරයට පත් කිරීමේ නෛතික බලය තිබෙන්නේ ඒ වන විට අදාළ අමාත්‍යාංශය භාරව කටයුතු කරපු රිෂාඩ් බදියුදීන් අමාත්‍යවරයාට කියලා කිව්වොත් ඒක මහත්මයා පිළිගන්නවද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඔබ සඳහන් කරා 2018.10 මාසේ අග බාගය දක්වා එකී තනතුරේ කටයුතු කළා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මම ඔබට යෝජනා කළොත් 2018.10 මාසේ 26 දින දක්වා ඔබ එකී තනතුරේ රාජකාරි කළයි කියලා ඒක හරිද?

පි: එම දිනය ස්වාමීනි එවකට තිබුණු රජය විසුරුවා හැරිය දිනය නම් මට හරියට මතක නැහැ. ඒ හරි ස්වාමීනි.

ප්‍ර: දැන් ඇයි ඔබ 2018 ඔක්තෝබර් 26 දින දක්වා පමණක් රාජකාරි කළයි කියලා කියන්නේ ඔබව ඒ තනතුරෙන් එදා ඉවත් කරනු ලැබුවද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඇයි ඔබ 2018.10.26 දක්වා ඔබ රාජකාරි කරා කියලා කියන්නේ?

පි: මම ඒ තනතුරට පත් කළේ පැවති රජය බැවින් රජය වෙනස් වුණු පසු මම සිතුවා මම මෙම තනතුරට යා යුතු නැහැ කියලා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ තනතුරින් ඉල්ලා අස්වීමක් සම්බන්ධයෙන් ඔබ ලිඛිතව දැනුම් දීමක් කරලා තිබෙනවද එදින?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ මේ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය භාර ලේකම්වරයාට හෝ විෂය භාර අමාත්‍යාවරයාට ලිඛිතව දැනුම් දීමක් සිදු කළාද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් මම ඔබට යෝජනා කළොතින් 2019.01 මාසේ 10 වෙනිදා තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයට අලුතින් සභාපතිවරයෙකු පත් කරේ මේ නවීන් අදිකාරම කියලා ඒක හරිද?

පි: මට හරියට දිනය කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: 2019 අවුරුද්දේ ජනවාරි මාසයේ කියලා කිව්වොත් මහත්මයා පිළිගන්නවද?

පි: මට දිනය හරියට මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ මෙම ජනාධිපති විමර්ශන ඒකකයේ පොලිස් විමර්ශන ඒකකයට ප්‍රකාශ ලබා දෙනකොට ඒ දිනය මතක තිබ්බද?

පි: මතක තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරලා තිබෙනවා කියලා මා යෝජනා කළොත් 2019.01 මාසේ 10 වෙනිදා තමයි අලුතින් සභාපති කෙනෙක් පත් කළේ කියලා කාර්මික සංවර්ධන මණ්ඩලයට ඒක හරිද?

පි: ඒ දිනය හරියට මට මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා 2018.10මාසේ 26 වෙනිදායින් පස්සේ ඔබ සේවයට වාර්තා කළේ නැහැ කියලා?

පි: ඔව් එසේයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ඉල්ලා අස්වීමේ ලිපියක් ලබා දුන්නෙත් නැහැයි කියලා කිව්වා?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: ඔබව ඒ තනතුරුන් ඉවත් කරයි කියලා ඔබට ලිපියක් ලබා දීලා තියෙනවද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට 2019 ජනවාරි මාසේ වෙනකම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් ඔබ ඔබේ රාජකාරි කටයුතු ඉටු කළේ නැද්ද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට ඔබේ තනතුර උදෙසා නිල රථයක් හාර දීලා තිබ්බද?

පි: තිබ්බා ස්වාමීනි

ප්‍ර: ඒ නිල රථය ඔබ 2018.10 මාසේ 26 වෙනිදා රාජකාරියට වාර්තා කරන්නේ නැහැයි කියලා තීරණය කරාට පස්සේ හාර දුන්නද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: ඔබ කවදා වෙනකම් ඒ නිල රථය භාරයේ තබා ගත්තද?

පි: අලුත් සභාපතිවරයෙක් පත් කරා කියලා දැනගත් පසු ඊට පසු දින නිල රථය සහ මා පාවිච්චි කල ටැබ් පරිගණක යන්ත්‍රය භාර දෙනු ලැබුවා.

ප්‍ර: ඒ කවදාද ඒ?

පි: මට දිනය හරියට මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: 2019 වර්ෂයේ ජනවාරි මාසයේ කිව්වොත් හරිද?

පි: වෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ එසේ ඔබව පත් කර තිබිච්ච නිල තත්ත්වය රාජකාරියට වාර්තා නොකර එම රාජකාරි පැහැර කර සිටීම වැරදි ක්‍රියාවක් කියන එක ඔබ පිළිගන්නවද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: ඇයි පිළිගන්නේ නැත්තේ?

පි: ඒ අවස්ථාවේ රටේ තිබුණු අස්ථාවර තත්ත්වයත් එක්ක මීට පෙර හිටපු අමාත්‍යවරයෙක් අමාත්‍යාංශයට ගොස් රටේ ඇතිවුණු ඒ කලබල නිසා පූර්වාදර්ශය නිසා මම ඒ ස්ථානයට නොගිහින් සිටියා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට යම්කිසි වගකීමක්නේ මහත්මයා සභාපති වශයෙන් භාරදීලා තියෙන්නේ? කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් ඔබට යම්කිසි රාජකාරි වගකීමක් පැවරෙනවානේ. ඒ අනුව ඔබට ලබා දීලා තිබිච්චි රාජකාරි පැහැර හැරීමක් කියලා මම ඔබට යෝජනා කරනවා. ඔබ සේවයට නොදන්වා වාර්තා කර සිටීමෙන්?

පි: මම පිළිගන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඇයි පිළිගන්නේ නැත්තේ?

පි: ඒ අවස්ථාවේදී රටේ තිබුණු අස්ථාවර තත්ත්වයත් එක්ක කවුරුත් කිසිම සභාපතිවරයෙක් තම තමන්ගේ සේවයට වාර්තා කෙරුවේ නැහැ ස්වාමීනි මා දන්නා තරමින් ස්වාමීනි.

ප්‍ර: ඔබේ රැකියාවට මොකුත් අස්ථාවර තත්ත්වයක් ප්‍රශ්නයක් තිබුණේ නැහැනේ. ඔබට ඉවත් වෙන්න කියලා දැනුම් දීමක් තිබුණේ නැහැනේ?

පි: මම හිතුවා මා පත්කරපු රජය ඒ වෙලාවේ නොතිබුණු නිසා මම එතෙන්ට යා නොවිය යුතු යි කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ පත්කළේ රජයක් විසින් නෙමෙයිනේ?

පි: රජයේ සිටි ඇමතිවරයෙක් විසින් ස්වාමීනි.

ප්‍ර: දැන් එහෙනම් ඔබ කළින් කිව්වේ එවකට සිටිය අගමැති තුමා පත් කළැයි කියලා?

පි: මගේ නම යෝජනා කරන ලද්දේ අගමැතිතුමා විසින්.

ප්‍ර: නම යෝජනා කරාට පත් කිරීමේ බලය තියෙන්නේ මේ පනත අනුව අමාත්‍යාවරයට කියලා දැන් ඔබ පිළිගත්තද?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ 2015 දෙවැනි මාසේ 20 වෙනි දින ඉඳලා ඒ අනුව 2018.10.26 වෙනකම් රාජකාරි කරනු ලැබුවා?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් මොනවද ඔබට මූලිකව පැවරිලා තිබිච්ච රාජකාරි කියලා?

පි: ඇත්ත වශයෙන්ම ස්වාමීනි මේ රජයේ වගකීමක් දරපු පළවෙනි අවස්ථාව. මා සභාපති ධූරය භාර ගැනීමට පෙර මේ පනත කියවා එය තේරුම් ගෙන පරිපාලන සහ මුල්‍යමය රෙගුලාසි පිළිබඳ දැනුවත් වී ඒ අනුව ක්‍රියාකරන්න තිබෙන බව මම දැනුවත් වී සිටියා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ පනත කියලා කිව්වේ මේ 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත ද?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ පනත ප්‍රකාරව ඒ අනුව ඔබ තේරුම් ගත්තේ ඔබේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ පිහිටුවීමේ පරමාර්ථය එහෙනම් එසේඅරමුණු මොනවා කියල ද ඔබ තේරුම් ගත්තේ?

පි: දේශීය සුළු, කුඩා, මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත වලට දිය හැකි සෑම පහසුකමක්ම ලබාදීම තාක්ෂණය සහ ඒ මණ්ලයේ තියෙන අංශ 10කින් සිදුවිය යුතු සේවාව කර්මාන්තකරුවන්ට ලබාදීම ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් ඔබේ කාර්යයන් අධීක්ෂණය කරනු ලැබුවේ කවුරුන් විසින්ද?

පි: සාමාන්‍යයෙන් මණ්ඩල අධීක්ෂණය කරනු ලබන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් කියලා මා සිතනවා.

ප්‍ර: දැන් ඔබේ අධික්ෂණ නිලධාරියා වශයෙන් මේ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සිටියා කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: කාර්මික සංවර්ධන මණ්ඩලයේ එක් ප්‍රධාන අංශයක් තමයි අලෙවි අංශය කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබට කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යුහය Organizational Structure එක දැක්කොත් අඳුන ගන්න පුළුවන් ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැනටමත් C – 752 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා. දැන් එහි ඉහළම නිලධාරියා වශයෙන් මේ සභාපති වශයෙන් ඔබ ඔබේ නිලය දක්වා තිබෙනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ යටතේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයෙකුත් ඉන් අනතුරුව සිටිනවා?

පි: සිටිනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබේ සේවා කාලය තුළ සම්පූර්ණ සේවා කාලයේ තුළ ඒ අමාත්‍යාංශය භාර ඇමතිවරයා විදිහට කවුද හිටියේ?

පි: රිෂාඩ් බදියුදීන් ඇමතිවරයා.

ප්‍ර: අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් කවුද කටයුතු කළේ?

පි: මම සභාපති භාර ගන්නා විට වැඩ බලන අධ්‍යක්ෂක ජනරාල්වරයෙක් හිටියේ ස්වාමීනි.

ප්‍ර: කවුද එතුමා?

පි: රත්නමල්ල මහත්මයා.

ප්‍ර: ඉන් අනතුරුව ඔහුට ස්ථිර පත්වීමක් ලැබුණද අධ්‍යක්ෂක ජනරාල් වශයෙන්?

පි: ඔහු අවුරුදු 5ක් පමණ එම තනතුරේ වැඩ බලා තිබුණා. අපි සම්මුඛ පරීක්ෂණයකින් අයදුම්පත් බාහිරව සහ අභ්‍යන්තරව කැඳවා ඔහුව පත් කර ගනු ලැබුවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඉන් අනතුරුව නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් තනතුරු 2ක් තිබුණත් එය ප්‍රයෝගිකව ක්‍රියාකාරිත්වය වුණේ නැහැ කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඒක හරි ස්වාමින.

ප්‍ර: දැන් අධ්‍යක්ෂක ජනරාල්ට පස්සේ ඔහු යටතේ අධ්‍යක්ෂකවරුන් 9 දෙනෙකු ඒකක 9කට අනුයුක්ත කරලා පත් කරලා තිබෙනවා?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එයින් එක අංශයක් තමයි අලෙවි අංශය කියලා කියන්නේ ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: ඒ අලෙවි අංශයට අනුයුක්තව තමයි අබලි ලෝහ කළමනාකරණ ඒකකයත් පිහිටුවලා තියෙන්නේ දැන් ඒ අබලි ලෝහ කළමනාකරණ ඒකකය අබලි ලෝහ මිල දී ගැනීම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදංචිකරු කර්මාන්තකරුවන්ට සහන මිලකට ලබාදීම ආදිය කටයුතු සිදු කළ යුතු වන්නේ යම්කිසි මාර්ග උපදේශකයකට එකට අනුකූලවද?

පි: එසේයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එය 2013 වර්ෂයේ මාර්ග උපදේශක සංග්‍රහය කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද? 2013නොවැම්බර් මාසේ ඇති කරන ලද මාර්ග උපදේශක සංග්‍රහය කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබේ සේවා කාලයේ ඔබ සේවය භාරගන්න කොට මේ අලෙවි අධ්‍යක්ෂක වශයෙන් කවුද කටයුතු කෙරුවේ?

පි: ඒ තනතුරට වැඩ බලන අධ්‍යක්ෂකවරියක් හිටියා ස්වාමිනි.

ප්‍ර: 2015.07 මාසේ 10 වෙනිදා ඒ තනතුරේ ස්ථීර නිලධාරියෙක් පත් කරුණු ලැබුවද? මම ඔබට යෝජනා කළොත් ඒ සරත් උඩයසිරි කියන නිලධාරියා කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: දිනය මට හරියට මතක නැහැ. නමුත් ඔව් මම පිළිගන්නවා. ඔහු සම්මුඛ පරීක්ෂණයකින් පුද්ගලික අංශයෙන් මම අපි, මමත් හිටපු Interview මණ්ඩලයෙන් තෝරා ගත්තා කියලා පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ යම් අවස්ථාවකදී අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරි කටයුතු එම නිලධාරියාගෙන් ඉවත් කරලා වෙනත් කෙනෙකුට භාර දීමට කටයුතු කළාද?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ එම සරත් උඩයසිරි කියන නිලධාරියාට යම්කිසි ලේඛනයකින් ලිපි ලිඛිතව දැනුම් දීමක් සිදු කරාද?

පි: ලිපි 2කින් දැනුම් දීමක් සිදු කළා මම හිතන්නේ.

ප්‍ර: දැන් ඒ ඔබ ඒ නිලධාරියාගේ රාජකාරි වෙනස්කිරීම සම්බන්ධයෙන් ලබාදීලා තිබිච්චි ලිපිය ඔබට නැවත දැක්කොත් හඳුනා ගන්න හැකියාවක් තිබෙනවද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: C – 755 ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටි. මෙම ලේඛන ඔබ හඳුනා ගන්නවද?

පි: හඳුනා ගන්නවා.

ප්‍ර: එය ඔබ විසින් සරත් උඩයසිරි කියන අලෙවි අධ්‍යක්ෂක නිලධාරියා වෙත ලබාදුන්නු ලිපිය වශයෙන් රාජකාරිය වෙනස්කිරීම සම්බන්ධයෙන් ලබා දුන්නු ලිපිය වශයෙන් හඳුනා ගන්නවද?

පි: ඔව්Change of duties පිළිගන්නවාස්වාමීනි.

ප්‍ර: එහි ඔබේ අත්සන තිබෙනවද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එය ඔබේ වශයෙන් ඔබ හඳුනා ගන්නවද?

පි: අඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මොකක් ද ඔබ ඒ ලිපියෙන් ඒ නිලධාරියාට දැනුම් දුන්නේ ?

පි: මේ ලිපියෙන් ඔබ පහත සඳහන් 1 සිට 1 1දක්වා සඳහන් කර තිබෙන marketing ප්‍රවර්ධන අංශයට අයිති වැඩකටයුතු කිරීමට වගවෙන්න

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා තිබෙනවා ස්වාමීනි. තවද scrap අබලි ද්‍රව්‍ය බෙදා හැරීම සහ උපකොන්ත්‍රාක් පහසුකම් සැලසීම මේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ප්‍රවර්ධන පී. පී.පී. එස්. දික්වැල්ල මහතා වෙත භාරදෙන ලෙසත් දන්වා සිටිනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ප්‍රවර්ධන කියලා වචනයක් සඳහන් කරා නේද?

පි: marketing

ප්‍ර: දැන් ඒක අධ්‍යක්ෂක අලෙවි කියලයි ඒ තනතුර තියෙන්නේ කියලා මම කිව්වොත් මහත්මයා පිළිගන්නවද?

පි: සිංහලෙන් තියෙන්නේ මේ පොතේ අලෙවි කියලා. ඉංග්‍රිසියෙන් තියෙන්නේ marketing කියලා.

ප්‍ර: දැන් යම් නිලධාරියෙකුට පත්වීම ලබාදෙනකොට ඔහුගේ පත්වීමේ ලිපියේ සඳහන් කරන්නේ එය නිවැරදි නිල නාමයද? යම් නිලධාරියෙකුට පත්වීමක් දෙනකොට පත්වීම් ලිපියක් දෙනවානේ?

පි: එසේ විය යුතුයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මේ C – 755 ලේඛනයේ ඔබේ අත්සන ඔබ අඳුන ගත්තා?

පි: හඳුනා ගත්තා.

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ඔහුගේ අත්සනC – 755(A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් ඔබට දැනටමත් C – 769 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටි. මහත්මයා දැන් ඔබට පෙන්වන ලේඛනය අධ්‍යක්ෂ අලෙවි තනතුර වශයෙන් එම තනතුරේ රාජකාරි භාර ගැනීමේදී 2015.06.26 දින පී. එල්. එස්. උදයසිරි මහතා වෙත ලබාදී ඇති පත්වීමේ ලිපිය කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: එහි තිබෙන තනතුර ප්‍රවර්ධක නෙමෙයි අධ්‍යක්ෂක අලෙවි කියලා තියෙනවා කියන කාරණය පිළිගන්නවද?

පි: සිංහලෙන් එහෙම සඳහන් වෙලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: මේ C – 769 කියන ලේඛනයේ පත්වීම භාරදුන්නු නිලධාරියා වශයෙන් මහින්ද ජිනසේන සභාපති ලංකා කාර්මික සංවර්ධනය මණ්ඩලය කියලා සටහන් කරලා තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එහි අත්සනක් තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: අත්සන කාගේද?

පි: මගේ ස්වාමීනි.

ප්‍ර: ඒ ඔබ හඳුනා ගන්නවද?

පි: හඳුනා ගන්නවා ස්වාමීනි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා එකී අත්සන C- 769 (A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

සාක්ෂිකරුට C – 754 කියන ලේඛනය පෙන්වා සිටිනවා. එහි C – 754(A) වශයෙන් ලකුණු කර ඇති කොටස කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා.

ප්‍ර: දැන් සාක්ෂිකරු C – 754(A) කියලා ලකුණු කරලා තිබෙන කොටසේ, දැන් ඒ කොටස මහත්මයාට කියවන්න පුළුවන්ද C – 754(A) ලකුණු කරලා තියෙන්නේ.

පි: කර්මාන්තකරුවන් ලියාපදංචිය. රාජ්‍ය ආයතන වලින් බැහැර කරන අබලි ද්‍රව්‍ය තඹ, පිත්තල , ලෝකඩ , ඇලුමිනියම්, ඇලුමිනියම් මිශ්‍ර ලෝහ , ඊයම් යකඩ වලින් සෑදී ලෝහ කොටස් විශේෂ වර්ගයේ යකඩ චීනච්චම් සහ අබලි වගේ ආදී අබලි ලෝහ ලබා ගැනීමට අපේක්ෂා කරන සියලු සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණකර්මාන්තකරුවන් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ලියාපදිංචි කළ යුතුය.

ප්‍ර: දැන් මහත්මයා අබලි ලෝහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයේ අබලි ලෝහ කළමනාකරණ ඒකකය මඟින් සිදු කළ යුතු අතර එහි වගකිය යුතු ප්‍රධාන නිලධාරියා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක වේ කියලා එහි සඳහන් වෙලා තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමීනි.

දැන් වේලාව: ප.ව.11.35

මෙතැන් සිට ල/ලේ: චන්දිමා දිල්හානි

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව11.35
පෙර සටහන්:නිල්මිණි කුමාරි
මෙතැන් සිට:චන්දිමා දිල්හානි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න මිය

ප්‍ර: දැන් ඔබ අලෙවි අංශයේ ඒක ඒකයක් වන අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරි ඒ අලෙවි අධ්‍යක්ෂ වශයෙන් සිටපු සරත් උදයසිරි කියන නිලධාරියාගෙන් ඉවත් කරලා තමයි වෙනත් නිලධාරියෙක්ව පත් කරන්න කටයුතු කරේ?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒ ඔබ ඉවත් කරලා ඔබ පත් කිරීම සිදු කෙරේ කවර නිලධාරියෙකුද?

පි: ඇත්ත වශයෙන්ම මම ඔහුගේ රාජකාරියේ ස්භාවය වෙනස් කරා මිස තනතුරෙන් ඉවත් කරේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ අබලි ලෝහ කළමනාකරණ ඒකකයට රාජකාරි කටයුතු ආවරණය කරන්න කියලා ඔබ නියෝග කරේ ඔබ යොමු කරේ කවර නිලධාරියෙකුටද?

පි: මං දෙදෙනෙකුට නියෝග කරා. එක් පුද්ගලයෙක් දික්වැල්ල කියන මහත්මයා අනිත් එක්කෙනා ධම්මික රත්නායක කියන මහත්මයා නියෝජ්‍ය අධ්‍යක්ෂක සහ සහකාර අධ්‍යක්ෂක.එම අංශයේ.

ප්‍ර: නැහැ මම ඔබෙන් විශේෂයෙන් අහන්නේ මහත්මයා අබලි ලෝහ කළමනා කරණය ඒකකය සම්බන්ධයෙන් කටයුතු කාටද පැවරුවේ කියලා? ඩී.පී..පී. දික්වැල්ල මහත්මයාට කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: එම මහතාට සහ එම ලියුමේම යටින් සඳහන් වෙනවා ඔහුගේ සහකාර අධ්‍යක්ෂකගේ නමත්. ස්වාමිනි.

ප්‍ර: මොන ලියුමේද එහෙම සටහන් වෙන්නේ?

පි: දිග්වැල්ල මහතාට මෙම තනතුර අධීක්ෂණය කරන්න කියලා නිකුත් කරන ලද ලිපියේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔය දික් වැල්ල මහත්මයාට ඒ අධීක්ෂණ කටයුතු කරන්න කියලා යවපු ලිපිය ඔබ මහත්මයා භාරයේ තිබෙනවද?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේ අවස්ථාවේදී දැන් මේ DPP 01 එක වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටියි.

ප්‍ර: මම ඔබට යෝජනා කරොත් ඔබ DS රත්නායක කියන මහත්මයාගේ නම සඳහන් කර තිබෙන්නේ ඒ රාජකාරිවලදී දික්වැල්ල මහත්මයාට ඒ නිලධාරියාගේ සහය ලබා ගන්න පුළුවන් කියන කාරණය පමණක් කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔහුට සහය වීම සහ ඔහුට එම රාජකාරිය කිරීමට සහ එහි duties attached to scrap project please assist mr. dikwella deputy director in performing the The duties attached to the scrap project කියලා තමයි ඉංග්‍රිසියෙන් ලියලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: මහත්මයා අබලි ලෝහ කලමනාකරණ ඒකකය වගේ වගකිව යුතු ඒකකයක් යම්කිසි නිලධාරියෙකුට ඒ වගකීම භාර දෙන්න ඕනනේ?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ භාර දිලා තියෙන්නේ කාටද එකේ වගකී සම්පූර්ණ වගකීම මං යෝජනා කරොත් ඩි.පි.පී. දික්වැල්ල මහත්මයාට ද කියලා ඒක පිළිගන්නවද?

පි: ප්‍රවර්ධන නිලධාරි අධ්‍යක්ෂතුමා භාර ව යටතේ ඔහු වෙන වැඩ වලට යොමු කර මට එම රාජකාරිය භාර දීලා තියෙනවා ස්වාමිනි.අබලි ලෝහ සම්බන්ධයෙන් රාජකාරි.

ප්‍ර: ඇයි අලෙවි අධ්‍යක්ෂක කෙනෙක් ඉන්දැද්දි ඔබ මේ වෙනත් නිලධාරීයෙකුට ඒ රාජකාරිය පැවරුවේ?

පි; මම ලිපි වගයක් ඉල්ලා තිබුණා ස්වාමිනි. මං හිතන්නේ අද ඒ ලිපිය ලැබිලා තියෙනවා. මට ඒ ලියුම බලන්න පුළුවන් නම් මේ උත්තරය දෙන්න ස්වාමිනි මේ පුද්ගලයා මේ තනතුරට බැදුනායින් පසුව ටික දිනකින් පසුව අපිට දැනගන්නට ලැබුණා මොහුගේ රාජකාරියට බැදුන අවස්ථාවේ සපයා තිබුණු එම සුදුසුකම් සඳහන් ලිපි නිවැරදි නැත කියලා ස්වාමිනි. එම නිසා ඔහුට වැටුප් වර්ධක ලබා දීම අත්හිටවනු ලැබුවා ඔහු අද වෙනතුරු මා විස්වාස කර පරදි අනියම් සේවකයෙක් වශයෙන් සේවය කරන්නේ ඔහුගේ සේවය ස්ථීර කර නැත. තවද 2008 අපි වාර්ෂික වාර්තාවේ 74 වන පිටුවේ පාර්ලිමේන්තුවටත් දන්වා තිබෙනවා 2013 අනුමත කර මණ්ඩලයේ බදවා ගැනීම් පරිපාටිය අනුමත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියෙකු අලෙවි අධ්‍යක්ෂක තනතුරේ බඳවාගෙන 2015 ජුනි 26 සිට 2019 ජුනී 31 දක්වා මිලියන 06 යි පන්ලක්ෂ පනස් අටදහස් හත්සිය හැට අටක වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණේ එක හේතුවක් ස්වාමිනි. අනික් හේතුව අප කාර්මික සංවර්ධන මණ්ඩලයේ

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඉතුරු ඊ ළඟ හේතුවත් කියන්න?

පි: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාසිකව අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම audit and management රැස්වීම සහ අංශ ප්‍රධානී රැස්වීම පැවැත්වෙනවා. ඒ පැවැත්වෙන හැම meeting එකේදීම අපි ඒ ඒ අංශයේ ප්‍රධානියා ලවා එම මාසයේ ලබා දුන් ක්‍රියාකාරකම් ඒ මේ සපුරා ලනවද කියලා විග්‍රහයක් කරලා බලනවා එම බැදෙන්නට පෙර වර්ෂයේ තිබුණ වර්ධනය මොහු බැදුනායින් පස්සේ ඉතාමත් දුර්වල තත්තවයට පැවතුනා. එය සනාථ කිරීමට ලිපිලේඛන තියෙනවා. එම රැස්වීම් වල වාර්තා සටහන් කීපයකුත් මා සමඟ තිබෙනවා අධ්‍යක්ෂක මණ්ඩලයේම අපි අවවාද උපදෙස් දුන්නා මේ නගා සිටුවන්න අවවාද දුන්නා පසුව මේ තීරණය කරා මේ එක්තරා මිටිමක තියෙනවා තීරණය කරලා මේ මේ විස්තර වල අබලි ලෝහ සඳහා පමණක් වෙනම කාර්ය මණ්ඩලයක් මේ ඇතුළේම පවත්වන්න කියලා යෝජනා කරලා තියෙනවා.

ප්‍ර: ලේඛන ටික බලලා කියන්න ඒ අවශ්‍ය ලේඛන?

පි: 2016 .15.03 අංශ ප්‍රධානීන්ගේ රැස්වීම සහභාගිවෙන නිලධාරින් මහින්ද ජිනසේන, රත්තන මල්ල ඇතුලු සෑම අධ්‍යක්ෂකවරයෙක් එකේ අංක 09 අබලි ව්‍යාපෘතිය අබලි ව්‍යාපෘතිය සම්බන්ධ මාර්තු 04 වෙනි දින පැවැති රැස්වීමට 2020.07.02 වෙනි දින මෙම වැදගත් කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දැනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වන උපසේන දිසානායක මහතා විසින් එවන ලද ලිපිය සහ මෙම සත්‍ය පිටපත් වලින් මෙහි අඩංගු එම වාර්තාවලින් ස්වාමිනි ගම්‍ය වෙනවා මෙම සරත් උදය සිරි මහතාට ඒ විවිධ අවස්ථාවල පැවැති රැස්වීම්වලදී ඔහුගේ අබලි ද්‍රව්‍ය පිළිබඳ රාජකාරි කටයුතු වන ප්‍රවර්ධනයක් තිබුණේ නැති බවත් එය දුර්වල තත්ත්වයක තිබුණු බවත් එය අංශ ප්‍රධානීන්ගේ රැස්වීම

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න මිය</u>

ප්‍ර: දැන් මහත්මයා සඳහන් කරා ඔබට යම් කිසි ලේඛනයක් තිබෙනවාය කියලා ඔබ අර සරත් උදයසිරි මහත්මයාගේ ඒ අලෙවි අධ්‍යක්ෂකට තිබිච්ච අබලි ලෝහ කළමණාකරණ ඒකකයේ රාජකාරි කටයුතු වෙනත් නිලධාරියෙකුට දෙන්න ඒකට ඒ සඳහා දෙන්න හේතු වුනේ ඔබ සඳහන් කරා ඒ දෙන්න තීරණ ය කරේ යම් කිසි රැස්වීමකදී ගත්ත තීරණයක් මත කියලා?

පි: රැස්වීම් කීපයකදී.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් අපිට මහත්මයාට පුළුවන්ද එකින් එක පෙන්වන්න එක ඔබ දැන් මේ එක ලේඛනයක් පෙන්වා සිටිනවා සාක්ෂිකරු විසින් උතුමාණනි 2016.03වෙනි මාසේ 15 වෙනි දින සභාපතිතුමාගේ නිල කාමරයේ පවත්වන ලද රැස්වීමක සටහන් ඉදිරිපත් කර සිටියි. එම 2016 03.15 දරණ අංශ ප්‍රධානීන්ගේ රැස්වීමේ සටහන් ඇතුලත් වාර්තාව 2016 .03 මාසේ 15 MJ 01 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ එම ලේඛනයේ අංක 09 යෙහි අබලි ව්‍යාපෘතිය කියලා කොටසක් පෙන්නුම් කර සිටිනවා?

පි: එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකරු යම් අපහසුතාවයකින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන පෙනී යන හෙයින් කොමිෂන් සභාවේ කටයුතු අද දිනට මේ අවස්ථාවේදී නතර කරමි කොමිෂන් සභාවට නැවත ජූලි මස 03 වෙනි සිකුරාදා ප.ව 12.30 ට නැවත රැස්වෙන බව දන්වනවා.

සාක්ෂිකරුට අවවාද කරමි පස්වරු 4. ට පෙනි සිටින ලෙසට නියෝග කරමි.

දැන්වේලාව: රාත්‍රී 12.05 යි

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.03 වේලාව:ප.ව.01.15 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිශානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	633
නම	:	**කළුටුවාගේ දොන් නීල් රංජිත් අශෝක**
වයස	:	**අවුරුදු 57**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මානව සම්පත්**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර : මහත්මයා ඔබ දැනට අතිරේක ලේකම්වරයෙක් වශයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරනු ලබනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ රාජ්‍ය සේවයට එක් වුණේ කුමන වසරේදීද?

පි : 1990 අගෝස්තු මාසේ 01 වෙනිදා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරීයෙක් වශයෙන් සේවයට බැඳුනා.

ප්‍ර : ඔබ 1990.08.01 වෙනි දින ශ්‍රී ලංකා පරිපාලන සේවයට ආධුනික නිලධාරීවරයෙක් වශයෙන් බැඳුනද?

පි : ඔව්.

ප්‍ර : ඉන් අනතුරුව ඔබ මේ දක්වා ඔබේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : පළමුවෙන්ම මා දකුණ පළාත් සභාවේ සහකාර ලේකම්වරයෙකු හැටියට අපේ පුහුණු කාලයෙන් පස්සේ පත් කළා. ඊට පස්සේ වැලිගම ප්‍රාදේශීය ලේකම් වශයෙන් වසරක පමණ කාලයක් සේවය කළා. ඊට පස්සේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ බෙලුඋල්ඔය කියන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් හැටියට සේවය කළා. ඊට පස්සේ එතන වසර හතරක් පමණ සේවය කරලා 94 මං 95 මුල අවුරුද්ද මම ආවා මුදල් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක් හැටියට එතන වසරක කාලයක් සේවය කරලා ඊට පස්සේ මං රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයෙක් හැටියට කටයුතු කළා. එතෙන්දී මං නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් දක්වා උසස් වෙනකම් සේවය කළා. ඒ කාලය තුළ මං ජපානයේ මගේ first master එක කළා. ඊට පස්සේ 2007 මම ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි අධ්‍යක්ෂක මෙහෙයුම් හැටියට කටයුතු කරන්න ගියා. එතන වසර තුනක් සේවය කරලා මම අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් හැටියට බැඳුනා 2010 වර්ෂයේ. එතෙන්දී 2007

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වර්ෂයේ. එතෙන්දී මාව උසස් කළා අතිරේක ලේකම්වරයෙක් හැටියට. එතන කෙටි කාලයක් සේවය කරලා මම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙක් වශයෙන් බැඳුණා. එතන වසර දෙකක පමණ කාලයක් ඉඳලා ඊට පස්සේ මං වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් හැටියට කටයුතු කරමින් ඉන්න අවස්ථාවේ 2015 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ නැවතත් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයා හැටියට කටයුතු කරන්න ස්ථාන මාරුවක් ලබා ගත්තා. ඉන් අනතුරුව එතන වසර එකක පමණ කාලයක් සේවය කරලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ඉල්ලීම පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා හැටියට ස්ථාන මාරුවක් ලබා ගත්තා. එතන කටයුතු කරමින් ඉන්න අවස්ථාවේ තමයි 2017 ඔක්තෝම්බර් 02 වෙනිදා පත්වීම් ලිපිය මඟින් හිටපු අතිගරු ජනාධිපතිතුමා මාව කර්මාන්ත අමාත්‍යාංශයේ එවකට තිබුණේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට පත් කළේ. එතකොට ඒ පත්වීම් ලිපිය අනුව

ප : දැන් ඔබ දීර්ඝ වශයෙන් ඔබේ රාජ්‍ය පරිපාලන සේවයේ සේවා කරපු කාල සහ ඒ ස්ථාන සම්බන්ධයෙන් ඔබ සඳහන් කරනු ලැබුවා. එසේම ඔබ 2017 /10 වෙනි මාසේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්වීමක් ලැබූ බවට ප්‍රකාශ කරනු ලැබුවා?

පි : එහෙමයි.

ප : ඔබ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් 2017 වර්ෂයේ ඔක්තෝම්බර් මාසේ ඉඳලා කොපමණ කාලයක් සේවය කරනු ලැබුවද?

පි : 2017 ඔක්තොම්බර් සිට 2019 මට මතක විදිහට නොවැම්බර් 27 දක්වා මා ඒ අමාත්‍යාංශයේ සේවය කළා. ඉන් අනතුරුව තමයි මං රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයට ස්ථාන මාරුවක් ලැබුණා.

ප : ඔබේ සේවා කාලය තුළ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ භාරව හිටපු අමාත්‍යවරයා කවුද?

පි : රිෂාඩ් බදුර්දීන් ඇමතිවරයා.

ප : ඔබ ඊට පෙරත් එම අමාත්‍යවරයා භාරව සිටි අමාත්‍යාංශවල ලේකම් හෝ අතිරේක ලේකම් වශයෙන් කටයුතු කරලා තියෙනවද?

පි : නෑ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය පථයන් මොනවද?

පි : කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය තමා ලංකාවේ කර්මාන්ත සංවර්ධනය කිරීම. මොකද මේ විෂය ඉතාමත්ම වැදගත් විෂයක්. ඒකට හේතුව මම හිතන්නේ ඔබතුමාලා දන්නවා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ගත්තොත් ආර්ථිකය ප්‍රධාන කොටස් තුනකට බෙදෙනවා. කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා හැටියට. මෙතෙන්දී අපේ දළ දේශීය නිෂ්පාදිතයන් නැත්නම් රටේ නිෂ්පාදිතයන් ගත්තොත් මේ ප්‍රධාන අංශ තුනෙන් තමා රටේ දළ දේශීය නිෂ්පාදනය විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව මනිනු ලබන්නේ. එතෙන්දී කර්මාන්ත කියන විෂය ඉතාමත්ම වැදගත්. මොකද මේ ප්‍රධාන අංශ තුනේ ප්‍රධාන වැදගත් අංශයක් හැටියට.

ප : කර්මාන්ත කියන විෂයට අමතරව වාණිජ දිගු කාලීන අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ නිපුණතා සංවර්ධන කියලා තවත් කොටස් කිහිපයක් තිබෙනවද?

පි : ඒක මෙහෙයි වුණේ මට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. මුලින්ම මා පත් වීම ගන්න අවස්ථාවේ තිබුණේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ කියලා. ඊට පස්සේ ඒ අමාත්‍යාංශයේ නම වෙනස් කළා කර්මාන්ත හා වාණිජ කටයුතු හා සම්පකාර සංවර්ධන සහ ඕකට එකතු කළා දිගු කාලීන වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම කියන කොටස. එතකොට ඒ අනුව නම වෙනස් කිරීමක් සිද්ධ කළා. අවසාන වශයෙන් මට මතකයි අර දින 51 ආණ්ඩු වෙනසෙන් පස්සේ පසු කාලේක ඒකට වෘත්තිය පුහුණු කොටසත් එකතු වුණා. එතකොට ඒ අවස්ථාව අවසාන අවස්ථාව වෙන කොට තිබුණේ කර්මාන්ත හා වාණිජ කටයුතු සම්පකාර සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධනය ඒ වගේම දිගු කාලීන පුද්ගලයන් නැවත පදිංචි කිරීම කියන අමාත්‍යාංශය.

ප : දැන් මෙම අමාත්‍යාංශය යටතට රජයේ ආයතන කොපමණ සංඛ්‍යාවක් ගැසට් පත්‍රය මඟින් අනුයුක්ත කරලා තිබ්බද?

පි : මගේ මතකය හැටියට මුලින් තිබුණා මම යන අවස්ථාවේ 36 ක වගේ ප්‍රමාණයක්. අවසාන අවස්ථාව වෙන කොට 46 කට ආසන්න ප්‍රමාණයක් තිබුණා.

ප : කාර්මික සංවර්ධන මණ්ඩලයත් ඒ අනුව එසේ ගැසට් පත්‍රයෙන් ඔබේ අමාත්‍යාංශය යටතට වැටෙන ආයතනයක්ද?

පි : එහෙමයි.

ප : දැන් ඔබ ලේකම් වශයෙන් ඔබට අතිරේක ලේකම්වරු පත් කර තිබුණද?

පි : එහෙමයි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ අය කීදෙනෙක් හිටියද මොන අංශ සඳහද?

පි : මුලින්ම අතිරේක ලේකම්වරු 07 දෙනෙක් හිටියා. ඊට පස්සේ අවසාන අවස්ථාව වන විට අතිරේක ලේකම්වරු 10 ක් හිටියා. මුල් අවස්ථාවේදී අතිරේක ලේකම්වරු 7 දෙනාට අමතරව ප්‍රධාන මූල්‍ය නිලධාරී එක තනතුරක් තිබුණා. මම ඇත්තටම සඳහන් කරන්නේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්. ඊට පස්සේ අර වෘත්තීය පුහුණු කොටස එකතු වුණායින් පස්සේ තව මූල්‍ය නිලධාරියෙක් එකතු වුණා. ඒ අනුව අවසාන අවස්ථාව වෙන කොට අතිරේක ලේකම්වරු 10 වගේ ප්‍රමාණයකුත්, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් දෙදෙනෙකුත් හිටියා.

ප්‍ර : ඔබ දන්නවා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අමාත්‍යාංශ ලේකම් විදිහට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන්නේ ඔබයි?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව ඒ සියළු ආයතනවල අධීක්ෂණ කටයුතු සහ එහි මූලික වගකීම අමාත්‍යාංශ ලේකම් විදිහට ඔබ වෙත පැවරෙනවද?

පි : මූලික වගකීමට වඩා වගවීම. ඒ වගකීම ඒ පවරා තිබෙන නිලධාරීන් ඉටු වන බවට වග බලා ගැනීම ප්‍රධාන ගණන් දී මේ නිලධාරියා හැටියට මගේ වගකීමක් බව මම ඉතාමත්ම හොඳින් තේරුම් අරන් හිටියා.

ප්‍ර : දැන් ඔබ කිව්වා කාර්මික සංවර්ධන මණ්ඩලය ඒ ආකාරයට ඔබේ අමාත්‍යාංශය යටතට වැටෙන ආයතනයක් කියලා?

පි : ඔව්.

ප්‍ර : කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටු වීමේ මූලික අරමුණ තමයි කර්මාන්තකරුවන්ගේ කර්මාන්තවලට රජයෙන් අතහිත දීම, ඒ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම කියලා කිව්වොත් ඒක මහත්මයා පිළිගන්නවද?

පි : ඔව්.

ප්‍ර : දැන් රජයේ ආයතනවලින් බැහැර කෙරෙන යකඩ නොවන තඹ පිත්තල, ඇලුමිනියම් ආදී ලෝහ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ලබා දීම සඳහා යම් කිසි අමාත්‍ය මණ්ඩල තීරණයකින් ඒ සම්බන්ධයෙන් තීරණයක් සිදු කරනු ලැබුවද?

පි : ඔව්.

ප්‍ර : එය 2005 වර්ෂයේ ජූලි මාසයේදී එවකට කුඩා කර්මාන්ත සහ ග්‍රාමීය කටයුතු අමාත්‍ය වශයෙන් කටයුතු කරපු කේ.ඩී.කේ. ලාල්කාන්ත කියන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද සංදේශයක් මත සිදු කරන ලද කැබිනට් තීරණයක් කියලා කිව්වොත් ඒක මහත්මයා පිළිගන්නවද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ලාල්කාන්ත මහත්මයාට ඒක ඉදිරිපත් කරලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබට ඒ ලාල්කාන්ත අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද සංදේශය මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : ඔව් මං ළඟ තියෙනවා පොඩ්ඩක් හොයා ගන්න ඕනේ.

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුක්‍රමික අංක 12/2005 සහ ඉදිරිපත් කළ දිනය වශයෙන් 2005/05/31 වශයෙන් සඳහන්ව තිබෙනවා. එහි මුල් පිටුව අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සිංහල පිටපතත් මේ සමඟ තවත් පිටු දෙකකින් සමන්විත ඉංග්‍රීසි පිටපතකුත් තිබෙනවා. ඒ අනුව අදාළ සංදේශයේ සිංහල පිටපත C 776 (A) සහ ඉංග්‍රීසි පිටපත C 776 (B) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද මේ සංදේශයේ මොනවද අඩංගු වෙලා තියෙන කරුණු කියලා? මොකක්ද පරමාර්ථය කියලා මේ සංදේශයේ?

පි : මේ සංදේශය ඇත්තටම ඉදිරිපත් කරලා තියෙන්නේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් නෙවේ මම මුලින් කිව්ව ආකාරයට. එවකට තිබ්බ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයෙන්. මොකද ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය බැලුවොත් අපි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ විශ්ලේෂණයක් කරනවා නම් ඒකෙන් 80% ක් හා සමහරක් විට ඊටත් වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නේ කුඩා පරිමාණ කර්මාන්තකරුවෝ. ඉතුරු ප්‍රමාණය තමා ඇත්තටම මම හිතන්නේ ඊටත් වඩා වැඩි. ඉතුරු ප්‍රමාණය තමා මහ පරිමාණ සහ මධ්‍යම පරිමාණ විශේෂයෙන්ම මහ පරිමාණ කර්මාන්තකරුවෝ ඉන්නේ. එතකොට ලංකාවේ කර්මාන්ත සංවර්ධනය කරනවා නම් අපි විශේෂයෙන්ම මේ කුඩා කර්මාන්තකරුවෝ ගැන විශේෂයෙන් හිතන්න ඕනේ. ඒ වගේම මහ පරිමාණ කර්මාන්තකරුවෝ ගැනත් හිතන්න ඕනේ මොකද මහා පරිමාණ කර්මාන්තත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හැටියට ඉතාමත් වැදගත්. එතකොට මේ මම හිතන්නේ ඒ 2005 ලාල්කාන්ත ඇමතිතුමා මේ වාර්තාව ඉදිරිපත් කරලා තියෙන්නේ ඒ අවස්ථාවේ මේ හිටපු කුඩා කර්මාන්තකරුවන්ට විශේෂයෙන්ම මේ ලෝහ සහ scraps අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගෙන උදාහරණයක් හැටියට පිත්තල කර්මාන්තය වගේ යොදා ගෙන කරන කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී තියෙන අපහසුව මහ හරවන්න තමයි මේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරලා තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ සංදේශයේ අදාළ අමාත්‍යවරයා කරුණු හතරක් යටතේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිනවද?

පි : කරුණු හතරක් යටතේ ඉල්ලනවා.

ප්‍ර : ඒවා කෙටියෙන් ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : පුළුවන්. එකක් තමා සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තිබෙන ඉවත් කරන ද්‍රව්‍ය උදාහරණයක් හැටියට දුම්රිය දෙපාර්තමේන්තුව, විදුලි බල මණ්ඩලය වෙන්න පුළුවන් ඒවායෙන් ඉවත් කරන ද්‍රව්‍ය IDB එකට ලබාදීම තමයි ඒකේ ප්‍රධාන අරමුණ වුණේ මේ කුඩා කර්මාන්තකරුවන්ට බෙදා දීම. ඇත්තටම මේ කරුණු හතරේම කැටී වෙලා තියෙන්නේ ඒ අරමුණ.

ප්‍ර : ඒ අනුව ඒ සම්බන්ධයෙන් කැබිනට් තීරණය මහත්මයාට මහත්මයා භාරයේ තියෙනවද ?

පි : ඔව්.

ප්‍ර : එය ඔබට නැවත දැක්කොත් අඳුන ගන්න පුළුවන්ද ඒ අනුව ඒක තියෙනවනේ කැබිනට් තීරණය?

පි : ඔව් කැබිනට් තීරණය තියෙනවා.

(සාක්ෂිකරුට දැනටමත් C 753 වශයෙන් ලකුණු කර ඇති 2005 ජූලි 22 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකාව පෙන්වා සිටි.)

ප්‍ර : දැන් ඒ අනුව දැන් මහත්මයා ඔය කැබිනට් අමාත්‍ය තීරණයක් වශයෙන් ඔබ ඒ අනුව හඳුන ගන්නවද?

පි : ඔව්.

ප්‍ර : එය 2005/05/31 වන දින ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කරපු සංදේශයට අදාළව 2005 ජූලි 13 වෙනි දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණ සඳහන් වෙලා තිබෙනවද?

පි : ඔව් තිබෙනවා හැබැයි ඊට කලින් ඒ අතර තිබිච්ච අමාත්‍ය මණ්ඩලයට අනුව ඉදිරිපත් කරලා තියෙනවා. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා ඒක කල් තියලා තියෙනවා. මං හිතන්නේ ඒ කල් තියලා තියෙන්නේ සෑම අමාත්‍ය මණ්ඩල වාර්තාවකටම මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ එනකල් කල් තියෙනවා. ඊට පස්සේ තමා මේක 05/30 අනුමත වෙලා තියෙන්නේ. මේ සඳහා අර 2005 ඉදිරිපත් කළ ලාල්කාන්ත ඇමතිතුමා ඉදිරිපත් කරපු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට මුදල් ඇමතිතුමා නිරීක්ෂණ දීලා තියෙනවා 07/07. එතුමා ඒක නිරීක්ෂණ දීලා තියෙනවා I agree කියලා. එතකොට මුදල් ඇමතිතුමා හිටියේ සරත් අමුණුගම ඇමතිතුමා.

ප්‍ර : දැන් මේ තීරණ අනුව තමයි ඒ අනුව රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ලෝකඩ, ඇලුමිනියම් මිශ්‍රිත ලෝහ ඇලුමිනියම්, ඊයම් යනාදි ලෝහ සුන්බුන් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ලබා දීමට නෛතික බලය ලැබුණේ?

Presidential Secretary's COPY
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ඊට පස්සේ ඔය අමාත්‍ය මණ්ඩලයේ තීරණය ආවාට පස්සේ ජනාධිපති කාර්යාලයෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තියෙනවා රාජ්‍ය ආයතනවලට ජනාධිපති ලේකම්තුමා විසින්. මෙහෙම අමාත්‍ය මණ්ඩලයේ අනුමත වුණා. ඒ හින්දා සියළුම රජයේ ආයතන වල අබලි ද්‍රව්‍ය , IDB එකට ලබා දෙන්න කියන කාරණය.

ප්‍ර : ඒ ජනාධිපති කාර්යාලයෙන් අදාළ ලිපිය සියලුම අමාත්‍යාංශ ලේකම්වරු වෙත 2006 අප්‍රේල් 05 වෙනි දින අංක SP/2/5/2 යටතේ එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ අත්සනින් යුතුව ලිපි ඉදිරිපත් කරලා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : එහි පිටපතක් සභාපති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත යවා ඇති බවටත් එකී ලිපියේ සටහන් වෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : එකී ලිපියේ පිටපතක් මහත්මයාට මේ අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවද?

පි : එහෙමයි.

මෙම ලිපිය C 777 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : ඒ රජයේ ආයතනවලින් අබලි ද්‍රව්‍ය ලබා ගන්න කොට මිල තීරණය කිරීම සම්බන්ධයෙන් මොකක්ද ගත්ත පියවර?

පි : ඇත්තටම ඔය අවස්ථාවේදී මිල තීරණය කිරීම සම්බන්ධයෙන් ඔය කැබනට් පෙපර් එකේ සඳහන් වෙලා නෑ මගේ දැනුම හැටියට. නමුත් ඔය සම්බන්ධයෙන්ම 2013 වර්ෂයේදී ඉදිරිපත් කරලා තියෙනවා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්. ඒකේ තමා යෝජනා කරලා තියෙන්නේ ඕකටත් සම්බන්ධ කරලා guide line එකක් හදලා ඒ guide line එකේ තමා සඳහන් කරලා තියෙන්නේ කමිටු තුනක් සඳහන් කරලා තියෙනවා ප්‍රතිපත්ති කමිටුව. කළමනාකරණ කමිටුව සහ මිල කමිටුව. එතකොට ඒ මිල කමිටුව සඳහන් වෙලා තියෙන්නේ guide line එකේ.

ප්‍ර : දැන් ඔබ කිව්වා 2013 දී ඔක්තෝම්බර් 17 වෙනිදා පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමකදී තමයි මේ තීරණය ගත්තේ කියලා?

පි : ඔව්.

ප්‍ර : මේ අවස්ථාවේදී ඔබට 2013 ඔක්තෝම්බර් 17 වෙනිදා පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණ ඒ වාර්තා ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : හැකියාවක් තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ 2013 ඔක්තෝම්බර් 25 වන දින දරණ යකඩ නොවන ලෝහ සුන්බුන් අපනයනය කිරීම පිළිබඳ 2013 ඔක්තෝම්බර් 17 වෙන දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණ සම්බන්ධයෙන් වාර්තා වන අදාළ ලිපිය සිංහල පිටපත සහ ඉංග්‍රීසි පිටපතකුත් තිබෙනවා. අදාළ ලිපිය C 778 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට ඉංග්‍රීසි පිටපත C 778 (B) නේ, C 778 (A) වශයෙන් සිංහල පිටපතත්, C 778 (B) වශයෙන් එහි ඉංග්‍රීසි පිටපතත් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් මහත්මයා ඒ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලෝහ අබලි ලෝහ කැබලි ඒ ආකාරයෙන් පිටරට යැවීම වළක්වලා එයට නිපදවෙන අගය එකතු කරලා නිෂ්පාදන අපනයනය කිරීම නියාමනය කිරීම පිණිස කමිටුවක් පත් කිරීම සම්බන්ධ තීරණයක් කිව්වොත් හරිද?

පි : එහෙමත් හරි.

ප්‍ර : එසේම ඔබ කිව්වා මේ 2013 ඔක්තෝම්බර් 17 වෙනිදා පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණ අනුව තමයි කියලා අබලි ලෝහ කළමනාකරණය පිළිබඳ මාර්ග උපදේශකයක් සකස් කරනු ලැබුවේ?

පි : හ්ම්.

(දැනටමත් C 754 වශයෙන් ලකුණු කර ඇති 2013 වර්ෂයේ මාර්ග උපදේශක සංග්‍රහය සාක්ෂිකරුට පෙන්වා සිටි.)

ප්‍ර : ඔබ ඒක අඳුන ගන්නවද ඒ තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයේ අබලි ලෝහ කළමනාකරණය සම්බන්ධයෙන් මේ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පස්සේ සකස් කරන ලද මාර්ග උපදේශකය වශයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : එහි ඔබ කිව්වා මිල කමිටුවක් සම්බන්ධයෙන් එහි අංක 6 යටතේ සඳහන් වෙලා තිබෙනවා?

පි : හ්ම්... කමිටු තුනක් තියෙනවා.

ප්‍ර : ඒ කමිටු තුනක් තියෙනවා මේ මිල තීරණය කිරීම සඳහා අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත මිල කමිටුවක් පත් කළ යුතු බවට තීරණයක් තියෙනවයි කියලා?

පි : එහෙමයි.

ප්‍ර : කවුද ඒ මිල කමිටුවේ ඉන්න සංයුතිය?

පි : මිල කමිටුවේ සංයුතිය වෙන්නේ අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු ඉන්නවා. IDB ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු ඉන්නවා.

ප්‍ර : කියන්න.

පි : ඒ වගේම මේ මිල කමිටුව රැස් වෙන්නේ අපි හිතමු උදාහරණයක් හැටියට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් IDB එකට යකඩ ලබා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

දෙනවා නම් ඒ අවස්ථාවේදී. එතකොට ඒ ආයතනයේ නියෝජිතයෝ දෙන්නෙක් ඉන්නවා. ඊට අමතරව කාර්මික සංගම් තියෙනවා කර්මාන්ත සංවර්ධන පනත යටතේ ලියා පදිංචි වෙච්ච. ඒ කාර්මික සංගම්වල නියෝජිතයෝ දෙන්නෙක් ඉන්නවා.

ප : මම ඇහුවොත් ඔබෙන් ඇයි මේ කාර්මික සංගම්වල සමාජිකයෝ දෙදෙනෙකුත් ඇතුල් කරන්නේ කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : ඇත්තටම මේ මිල කමිටුව දාලා තියෙන්නේ ඒ ගොල්ලොන්ට සාධාරණ මිලකට රජයේ ආයතනවලින් බඩු ලබා ගන්නත් IDB එකට. එතකොට IDB එකල ලබා ගත්තොත් තමයි සාධාරණ මිලකට දෙන්න පුළුවන් වෙන්නේ. ඒ හින්දා ඒ ගොල්ලන්ගේ නියෝජනයක් වෙන්න.

ප : එසේම ඔබ කිව්වා ඔබ මුලින් සාක්ෂි දෙන කොට මේ 80% ක් විතරම ඉන්නේ කර්මාන්තකරුවන් කුඩා, ශුද්ධ එහෙමත් නැත්නම් මධ්‍යම පරිමාණයට අයිති අය කියලා?

පි : මම ළඟ නිවැරදි තොරතුරු නෑ. මම හිතනවා ඊටත් වඩා වැඩි.

ප : නෑ ආසන්න වශයෙන් ඔබෙන් අහන්නේ ඔබේ අත්දැකීම?

පි : ඊටත් වඩා වැඩි කියලා තමා මගේ අදහස.

ප : ඒ කියන්නේ මේ මාර්ග උපදේශකය පිහිටුවීමේ මූලික අරමුණ තමයි එවැනි කුඩා, මධ්‍යම සහ සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට සහන සැලසීමක් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : පැහැදිලිවම ඒ වෙනුවෙන්ම තමයි ඒක පිහිටුවලා තියෙන්නේ.

ප : දැන් මේ මාර්ග උපදේශකයේ කුඩා, මධ්‍යම සහ සුළු කර්මාන්තකරුවන් වර්ගීකරණය කරන නිර්ණායකයක් සකස් කරලා තිබෙනවා. එය සේවක සංඛ්‍යාව සහ වාර්ෂික පිරිවැටුප මත කියලා ඒ වගුවේ සඳහන් වෙලා තිබෙනවද?

පි : එහෙමයි.

ප : ඒ අනුව එයිනුත් පැහැදිලි වෙනවා යම් කර්මාන්තකරුවෙක් මධ්‍යම පරිමාණව ඉක්මවා යනවා නම් ඔහුට මේ රජයේ ආයතනවලින් බැහැර කෙරෙන ද්‍රව්‍ය මිලදී ගැනීමට මෙයින් ප්‍රතිපාදන සලස්වා නොමැති බවට කිව්වොත් ඒක මහත්මයා පිළිගන්නවද?

පි : ඔව් අතිවිශාල කර්මාන්තවලට ලබා ගැනීමේ ගැටලුවක් තියෙනවා.

ප : මොකක්ද ඔබ අදහස් කළේ අති විශාල කියලා?

පි : මොකද දැන් ලංකාවේ කර්මාන්තකරුවෝ සියයක් හැටියට ගත්තොත් ඒ කියන්නේ උදාරහණයක් හැටියට අපි හිතමු 90% ක් ඉන්නේ SMA කියලා. 10% ක් ඉන්නේ විශාල කර්මාන්ත වෙන්න පුළුවන්. එතකොට ඒ ගොල්ලන්ටම ඒ යටතේ යකඩ ලබා

FAIR COMMENT BY JEZEEM

දෙන්න බෑ. මධ්‍යම ප්‍රමාණය, සුළු ප්‍රමාණය සහ ශුද්ධ කියලා තමා මේකේ සඳහන් වෙන්නේ.

ප : දැන් කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් යම් කර්මාන්තකරුවන් ලියා පදිංචි වුණාට පස්සේ ඒ කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල සිටින නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරලා සුදුසු නිර්දේශ කරලා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් නැවත ප්‍රධාන කාර්යාලයට ඒ අයදුම්පත ඉදිරිපත් කරනු ලබනවද?

පි : එහෙමයි.

ප : ඒ අනතුරුව එය සලකා බලලා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් අයදුම්කරුට නිකුත් කළ යුතු ලෝහ ප්‍රමාණය සම්බන්ධයෙන් නිර්දේශ කිරීමක් සිදු කරනු ලබනවද?

පි : එහෙමයි.

ප : ඒ නිර්දේශ කිරීමේදී මොනවද සැලකිල්ලට ගන්න කාරණේ?

පි : විශේෂයෙන්ම ඒ ගොල්ලන්ගේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පළවෙනි එක. ඊළඟට ඒ ගොල්ලන්ගේ කර්මාන්ත ශාලාවල තියෙන ධාරිතාවය සහ ඒ ගොල්ලන්ගේ ඉන්න සේවක සංඛ්‍යාව. ඇත්තටම ඒ ගොල්ලො මාසිකව දෙනික වශයෙන් බලලා මාසිකව වාර්ෂිකව කොච්චරක් නිෂ්පාදනය කරනවාද කියන ප්‍රමාණය තමයි බලන්නේ ඊට අමතරව ඒ ගොල්ලන්ගේ ගිණුම් පොත් තියා ගෙන යනවා නම් සමහරක් වේලාවට මේ සුළු කර්මාන්තවල ගිණුම් පොත් නැති වෙන්න පුළුවන් ගිණුම් පොත් තියා ගෙන යනවා නම් ඒ ගොල්ලන්ගේ ආදායම ආදීයත් අවධානයට යොමු කරනවා.

ප : දැන් යම් කිසි අයදුම්පතක් අසම්පූර්ණ නම් එහි කර්මාන්තය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීවරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් නිවැරදි සහතිකයක් නොමැති නම් එවැනි අයට ලෝහ භාණ්ඩ අබලි ලෝහ නිකුත් කිරීමට හැකියාවක් තිබෙනවද?

පි : මෙහෙමයි මේ සුළු කර්මාන්තකරුවෝ බොහෝ වේලාවට සමහරක් වේලාවට නූගත් කර්මාන්තකරුවෝ. සමහරක් වේලාවට Application එක හරියටම දාන අයත් ඇති. සමහරක් වේලාවට නිවසේ පදිංචි ස්ථානය නැත්නම් වෙනියම් ස්ථානයක් බඩු විකුණන ස්ථානය Application එකේ දානවා ඇති. කොහොම වුනත් ඒ Application register කරන්න ඕනේ දිස්ත්‍රික් මට්ටමෙන්. මොකද IDB කාර්යාලයේ, මම පැහැදිලි කරන්නද

ප : ඔව් කියන්න?

පි : IDB කිර්යාලයේ තියෙනවා දිස්ත්‍රික්ක 25 ට කාර්යාල 25 ක්. ඒ දිස්ත්‍රික්ක කාර්යාල ප්‍රධානීයා හැටියට ඉන්නේ නියෝජ්‍ය

FAIR COMMENT BY JEZEEM

අධ්‍යක්ෂකවරයෙක් IDB එකේ. එතකොට මේ ගොල්ලො දිස්ත්‍රික්ක මට්ටමෙන් register වුණායින් පස්සේ දිස්ත්‍රික්කයට තමා පළවෙනි Application එක දෙන්නේ. දුන්නයින් පස්සේ ඒ දිස්ත්‍රික්කයෙන් තමා පරීක්ෂා කරලා ප්‍රධාන කාර්යාලයට එවන්නේ.

ප : ඒ අනුව ඒ අදාළ නිලධාරීන්ගේ වගකීමක් තියෙනවා ඒ අයදුම්පත නිවැරදිව පුරවලා තිබෙනවද අදාළ දත්ත තොරතුරු නිවැරදිව ඉදිරිපත් කරලා තිබෙනවද කියන එක සොයලා බැලීමට?

පි : අනිවාර්යෙන්ම වගකීමක් තියෙනවා. ඊට අමතරව මම කියන්නද

ප : කියන්න කියන්න?

පි : ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකයකුත් ඕනේ වෙනවා ඒ ලබා දෙන ඉල්ලුම්පත්‍ර නිවැරදි බවට.

ප : දැන් ඒ ග්‍රාම නිලධාරියා හරි ප්‍රාදේශීය ලේකම්වරයාගේ හෝ සහතිකය අදාළ අයදුම්පතේ ලබා ගන්න අවශ්‍යතාවය තිබෙන්නේ ඒ තමන්ගේ වසමේ ග්‍රාම නිලධාරී වසමේ නැත්නම් ප්‍රාදේශීය ලේකම් ඒ ප්‍රදේශය තුළ අදාළ කර්මාන්තය පිහිටලා තිබෙනවද කියන දේ නිවැරදිව සහතික කර ගන්නද?

පි : සහතික කර ගන්න.

ප : දැන් කර්මාන්තය පිහිටි ප්‍රදේශය නොවන ස්ථානයක සේවය කරන ග්‍රාම නිලධාරීවරයෙක්ට හරි ප්‍රාදේශීය ලේකම්වරයෙක්ට හරි ඒක ඒ කර්මාන්තය තිබෙනවයි කියලා සහතික කරන්න හැකියාවක් තිබෙනවද?

පි : සාමාන්‍යයෙන් නම් නෑ.

ප : සාමාන්‍යයෙන් නෑ කියන්නේ ?

පි : සමහරක් වේලාවට මම ඒකයි කිව්වේ සමහරක් වේලාවට මේ පුද්ගලයෝ මම දන්නේ නෑ ප්‍රශ්නේට මොකක්ද පාදක වුණේ කියලා මේ පුද්ගලයෝ සමහරක් වේලාවට කර්මාන්තය තියෙන්නේ එක තැනක, මේ පුද්ගලයෝ පදිංචි එක තැනක සමහරක් වේලාවට ඒ ගොල්ලන්ගේ වෙළඳාම කරන්නේ තව තැනක එතකොට මේ පුද්ගලයෝ ඉල්ලුම් කරන අවස්ථාවේ ඔය ස්ථානවලින් කොයි හෝ ස්ථානයක Application එක දාන්න ඉඩ කඩ තියෙනවා. හැබැයි ඒ දාන එකේ ඒ දාන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සහතික කරන්න ඕනේ.

ප : දැන් මහත්මයාට යම් කිසි අයදුම්පතක් පෙන්නුවොත් එක පරීක්ෂා කරලා බලලා ඔබේ දැනුම අනුව මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්න හැකියාවක් තිබෙනවද?

පි : ඔව්.

Parliament Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

දැනටමත් C 758 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප : මහත්මයා දැන් ඔබට පෙන්වා සිටින ලේඛනයේ කර්මාන්තය පිහිටි ලිපිනය වශයෙන් සඳහන් වෙන්නේ නොම්බර 111/A/6, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය කියලා සටහන් වෙනවද?

පි : ඔව්.

ප : දැන් ඔබ එහි අදාළ ග්‍රාම නිලධාරීවරයාගේ සහ දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය තිබෙන ස්ථානය පරීක්ෂා කර බලන්න සීල් එකක් ගහලා තියෙන්නේ.

පි : හ්ම්.

ප : කවුරුන් විසින්ද එය සහතික කරලා තියෙන්නේ?

පි : කොච්චිකඩේ දකුණ ග්‍රාම නිලධාරී ප්‍රභාත් එස් වීරසිංහ

ප : දැන් ඒ කොච්චිකඩේ දකුණ ප්‍රදේශ භාර නිලධාරීවරයෙකුට වැල්ලම්පිටියේ පිහිටි කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් එහෙම සහතිකයක් ලබා දෙන්න හැකියාවක් තියෙනවද?

පි : සාමාන්‍යයෙන් නම් බෑ. නමුත් මෙතන ඉල්ලුම්කරුගේ ලිපිනය හැටියට තියෙන්නේ නොම්බර 37, Old Moore street , Colombo 12 . මම දන්නේ නෑ මේ කොච්චිකඩේ දකුණ ග්‍රාම නිලධාරීවරයා මේ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයාද කියන එක මම දන්නේ නෑ. නමුත් එහෙම සාමාන්‍යයෙන් ලබා දෙන්න බෑ. ඒක නිවැරදි කරලා ගන්න ඕනේ.

සාක්ෂිකරුට දැනටමත් C 760 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.

ප : දැන් මහත්මයා මෙම ලේඛනයේ අයදුම්පතේ ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරීගේ සහතික කරන ස්ථානය සම්බන්ධයෙන් ඔබට මොකක්ද කියන්න පුළුවන්?

පි : හිස්තැනක් තියෙන්නේ.

ප : දැන් එවැනි අවස්ථාවකදී මේක සහතික කරන ලද නිවැරදි අයදුම්පතක් වශයෙන් සැලකිල්ලට ගන්න හැකියාවක් තිබෙනවද?

පි : අයදුම්පත නිවැරදි වුනත් ඇත්තටම මේක අසම්පූර්ණ අයදුම්පත්. මොකද ග්‍රාම නිලධාරීගේ සහතිකය තියෙන්න ඕනේ guide line එකේ කියලා තියෙනවා මේ guide line එක ඒ කියන්නේ පනතක් වගේ නීතියක් නොවුනට මේකේ තියෙන්නේ මේ විදිහට කරන්න කියන කාරණේ. හැබැයි guide line එකේ කියලා තියෙනවා ග්‍රාම නිලධාරීගේ සහතිකයත් ඕනේ , division secretary ගේ සහතිකයත් ඕනේ කියලා. මේ අනුව මට ඒක පෙන්නේ නෑ ඒ ටික තියෙනවා කියලා.

FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔබ දැනුවත්ද කාර්මික සංවර්ධන මණ්ඩලයට 2017 වර්ෂයේ මැයි මාසේදී විශාල වශයෙන් පිත්තල ලබා ගැනීමක් සිදු කරනු ලැබුවයි කියලා?

පි : මේ වන විට මා දැනුවත්.

ප : ඒ කොයි කොහොමද මොන ආකාරයටද?

පි : විශේෂයෙන්ම අර පාස්කු ප්‍රහාරයෙන් පස්සේ පත්තරවල ගියා මේක සම්බන්ධ එක ත්‍රස්තවාදී පුද්ගලයෙකුට කර්මාන්ත අමාත්‍යාංශයෙන් පිත්තල ලබා දීලා තියෙනවා IDB එකෙන් පිත්තල ලබා දීලා තියෙනවා කියලා එතකොට ඇත්තටම මම අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මා සොයා බැලුවා මොකක්ද මේ කියන කාරණේ විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශයේ නමත් යම් යම් අවස්ථාවල කියවුණු නිසාත් IDB ආයතනය අපේ තිබිච්ච ප්‍රධාන ආයතනයක් හැටියට ඒකේ නම කියවීම නිසාත්.

ප : දැන් ඔබ කිව්වා ඔබ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් මේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් මේ කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබා දීම සම්බන්ධයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සේ විශේෂයෙන් කමිටුවක් රැස් කරයි කියලා?

පි : එහෙමයි.

ප : ඒ ඇයි?

පි : අමාත්‍යාංශයේ නම කියවීම සහ ඊළඟට IDB ආයතනයට මේක සම්බන්ධ හින්දා මම මගේ හිටපු අතිරේක ලේකම්වරු ඒ අවස්ථාව වන විට මට මතක විදිහට හිටියා 11 ක් වගේ ප්‍රමාණයක්. එයින් ගණකාධිකාරී ශ්‍රේණියේ විශේෂ ඇත්තටම එයා තමයි senior officer මට මතක විදිහට ඒ අවස්ථාවේ හිටපු. එතුමා සහ තව නිලධාරීන් දෙන්නෙක් දාලා මම විමර්ශනයක් කළා.

ප : නෑ මේ බෝම්බ පිපිරීමයි මේකයි අතරේ මොකක්ද සම්බන්ධය කියලා ඔබ දන්නවද?

පි : බෝම්බ පිපිරීමෙන් පස්සේ තමයි මේ පරීක්ෂණය කරන්න කියලා ඕනේ වුණේ මොකද මේ බෝම්බ පිපිරීමට සම්බන්ධ පුද්ගලයාට IDB ආයතනය අපේ අමාත්‍යාංශයේ තිබිච්ච ආයතනයකින් යකඩ දීලා තියෙන කාරණය හැම තැනම පුවත්පත්වල මාධ්‍යවල කියවුණා.

ප : යකඩද ඒක පොඩ්ඩක් නිවැරදි කරලා කිව්වොතින්?

පි : sorry, පිත්තල. අපි කියන්නේ scraps කියලා අබලි ද්‍රව්‍ය.

ප : ඒ කොහේද කවුද මේ කර්මාන්තකරු කොහේද කර්මාන්තකරුගේ කර්මාන්ත ශාලාව පිහිටලා තිබුණයි කියලා අනාවරණය වුණේ මොකක්ද කර්මාන්ත ශාලාව?

පි : මට මතක විදිහට දෙමටගොඩ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මේ පොත තියෙනවනේ?

පි : ඔව්.

ප්‍ර : බලලා කියන්න.

පි : කොලෝසස් පුද්ගලික සමාගම.

ප්‍ර : කොහේද ඒ කර්මාන්තය පිහිටලා තිබෙන්නේ? කවුද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් අබලි ලෝහ ලබා ගෙන තිබෙන කර්මාන්තකරු?

පි : මෙතන ආයතනයේ තියෙන Address එක නම් මට හරියටම Sure නෑ මේ මොකක්ද කියලා . මට මතක දෙමටගොඩ ප්‍රදේශය තමයි.

ප්‍ර : වැල්ලම්පිටිය කියලා මම කිව්වොත් මහත්මයා පිළිගන්නවද?

පි : ඔව් වැල්ලම්පිටිය.

ප්‍ර : දැන් ඔබ කිව්වා ඔබ කමිටුවක් පත් කරනු ලැබුවයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ කමිටුවේ සාමාජිකයෝ කවුද?

පි : කේ.ඩී.චිත්‍රපාල මහතා මම මුලින් කිව්ව අතිරේක ලේකම්වරයා එයා එතුමා අතිරේක ලේකම් පොදු ව්‍යාපාර හා ප්‍රති ව්‍යුහගත කරන හැටියට ඒ අවස්ථාවේ සේවය කළා. ඊට අමතරව සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අධ්‍යක්ෂිකා ආර්.ඒ.ඉන්දිකා රණතුංග මහත්මිය සහ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ප්‍රතිපත්ති සංවර්ධන එම්.කේ.සිතාරා ජයසේන මහත්මිය එහි සාමාජිකයෝ හැටියට පත් කළා.

ප්‍ර : එය මේ කමිටුවේ වාර්තාව කවදද එළි දක්වනු ලැබුවේ?

පි : 2019.05.06

ප්‍ර : එකී වාර්තාව ඔබ විසින් අධීක්ෂණය කරනු ලැබුවද?

පි : ඔව් මම බැලුවා.

ප්‍ර : ඒ අදාළ නිලධාරීන් පත් කරනු ලැබුවේ ඔබ විසින්ද?

පි : මා විසින්.

ප්‍ර : ඒ වාර්තාවේ පිටපතක් මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඔබට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : ඉදිරිපත් කරන්න පුළුවන්.

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් කර්මාන්තකරුවන් වෙත අමුද්‍රව්‍ය ලබා දීම පිළිබඳ විමර්ශනය සඳහා පත් කළ 2019.05.06 දිනැති වාර්තාව C 779 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : මහත්මයා එහි පිටු කීයක් තියෙනවද?

පි : වාර්තාවේ පිටු

ප්‍ර : ඔක්කොම කියන්න කමක් නෑ ලේඛනත් එක්ක.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : වාර්තාවේ පිටු 14 ක් තියෙනවා. ඒ වුණාට ඇමුණුම් තියෙනවා ඔක්කොම ඊට අමතරව ඇමුණුම් 29 ක් තියෙනවා. මේ ඇමුණුම් අංක කරලා නෑ මට මතක විදිහට. නෑ 137 ක් තියෙනවා. මම හිතන්නේ පිටු 137 ක් තියෙනවා.

ප්‍ර : මේ වාර්තාව දී මොනවද නිලධාරීන් සොයලා බලපු කරුණු?

පි : ප්‍රධාන වශයෙන් සොයලා බැලුවේ ඒ සිද්ධිය පාදක කර ගෙන මෙහෙම පුද්ගලයෙකුට පිත්තල ලබා දීලා තියෙනවද , ඒ ලබා දීලා තියෙන්නේ මොන ක්‍රමවේදයක් යටතේද කියන කාරණය තමයි ප්‍රධාන වශයෙන් සොයලා බැලුවේ.

ප්‍ර : ඒ අනුව ඔබ මේ වන විට කොලෝසස් පුද්ගලික සමාගමේ එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන කර්මාන්තකරුට ලබා දීලා තිබෙන 2017 සහ 18, 19 වර්ෂවල ලබා දීලා තිබෙන අබලි ලෝහ ද්‍රව්‍ය ප්‍රමාණය, ඒවායේ ප්‍රතිශතයන් සහ ඒ සම්බන්ධ විගණනන වාර්තා ආදීය සම්බන්ධයෙන් ඒ අනුව ඔබ දැනුවත්ව ඇති මේ වන විට?

පි : සාමාන්‍ය දැනුමක් තියෙනවා මම මේක කියෙව්ව හින්දා.

ප්‍ර : ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඔබට අවශ්‍ය නම් මේ වාර්තාවත් පරිශීලනය කරලා කියන්න පුළුවන්ද 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කොපමණ සංඛ්‍යාත්මකව කර්මාන්තකරුවන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියා පදිංචි වී තිබෙනවද කියලා?

පි : කියන්න පුළුවන්. 2014 වර්ෂයේ 256 යි, 2015 වර්ෂයේ 227 යි, 2016 වර්ෂයේ 227 යි, 2017 වර්ෂයේ 289 යි, 2018 වර්ෂයේ 313 යි.

ප්‍ර : දැන් මේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඔබ අධීක්ෂණය කරනවද ඔබේ සෘජු අධීක්ෂණයකට ලක් වෙනවද ලේකම්වරයා වශයෙන්?

පි : නෑ ලේකම්වරයා වශයෙන් මගේ සෘජු අධීක්ෂණයකට ලක් වෙන්නේ නෑ. මේක අතිරේක ලේකම්වරයෙක් යටතේ තිබුණේ . ඔහුගේ සෘජු අධීක්ෂණයකට ලක් වෙනවා. නමුත් මේක මගේ සෘජු අධීක්ෂණයට ලක් නොවුනත් මගේ අවධානයට යොමු වෙච්චි ආයතනයක්.

ප්‍ර : ඔබ යටතේ වෙනත් අතිරේක ලේකම්වරයෙකුත් මේ සඳහා පත් කර තිබුණද මේ ඔය කර්මාන්ත සංවර්ධන මණ්ඩලය භාරව?

පි : කර්මාන්ත සංවර්ධන අතිරේක ලේකම්.

ප්‍ර : වෙනම නිලධාරීයෙක් හිටියා?

පි : හිටියා.

ප්‍ර : කවුද ඒ කාලේ කටයුතු කළේ?

පි : බාලසුබ්‍රමනියම් මහත්මයා.

ප්‍ර : දැන් මේ කොලෝසස් පුද්ගලික සමාගමේ කර්මාන්තකරු එම්.අයි.ඉන්ෂාෆ් අහමඩ් කියන යන මුල් වරට කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියා පදිංචි වෙලා තිබෙන්නේ 2017.08.10 වෙනිදා

FAIR COMMENT BY JEZEEM

කියලා කිව්වොත් ඒක හරිද? දැන් ඔබට ඔබේ ඒ විමර්ශනයේදී හෙළි දරව් වුණාද එම කර්මාන්තකරු ඉන් අනතුරුව ඊළඟ වසරෙත් ලියාපදිංචි 2018 වර්ෂයටත් ලියා පදිංචි වෙලා තිබෙනවා කියලා?

පි : ඔව්.

සාක්ෂිකරු මම ඔබට නැවතත් C 758 සහ C 760 කියන ලේඛන දෙක පෙන්වා සිටිනවා.

ප්‍ර : දැන් මේ ලේඛන අනුව ඔබ මේ විමර්ශනය සිදු කරන ලද කොලෝසස් පෞද්ගලික සමාගමේ කර්මාන්තකරු ලියා පදිංචි වීම සම්බන්ධ අයදුම්පත් කියලා ඔබට මේ අවස්ථාවේදී හඳුන ගන්න හැකියාවක් තිබෙනවද?

පි : ඔව් හඳුන ගන්න පුළුවන්.

ප්‍ර : දැන් ඒ අනුව ඔබේ සේවා කාලය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විදිහට කවුද කටයුතු කළේ?

පි : ජිනසේන මහත්මා.

ප්‍ර : මහින්ද ජිනසේන මහත්මයා කිව්වොත් පිළිගන්නවද?

පි : එහෙමයි.

ප්‍ර : අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් කවුද කටයුතු කළේ?

පි : රත්නපල්ල මහත්මයා.

ප්‍ර : දැන් ඔබට මේ කොලෝසස් පුද්ගලික ආයතනයට 2017 වර්ෂයේදී ලබා දීලා තිබෙන අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැකවින් සඳහන් කරන්න හැකියාවක් තිබෙනවද?

පි : 2017 වර්ෂයේදී දීලා තියෙනවා මෙක්ට්‍රික් ටොන් 16.5 ක්.

ප්‍ර : මොකක් බලන්ද ඔබ පිළිතුරු දෙන්නේ?

පි : මගේ නිලධාරීන් යොදවා කරපු විමර්ශන වාර්තාව.

ප්‍ර : ඒ කියන්නේ C 779 කියන ලේඛනයෙන්?

පි : ඔව්.

ප්‍ර : ඒකේ මොන පිටුවේද ඔබ දැන් මොන පිටුව බලාගෙනද සාක්ෂි දෙන්නේ?

පි : 7 වෙනි පිටුව.

ප්‍ර : 7 වෙනි පිටුව. ඒ අනුව 2017 වර්ෂයේදී කොච්චර ප්‍රමාණයක් කොලෝසස් පුද්ගලික සමාගමට ලබා දීලා තිබෙනවද?

පි : 2017 වර්ෂයේදී මෙක්ට්‍රින් ටොන් 16.85 ක් ලබා දීලා තියෙනවා.

ප්‍ර : මොනවද ලබා දීලා තිබෙන්නේ?

පි : පිත්තල.

ප්‍ර : 2018 වර්ෂයේදී?

පි : 2018 වර්ෂයේදී හතර පාරක් ලබා දීලා තියෙනවා.

ප්‍ර : පිත්තල?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පිත්තල. මේ ඔක්කොම පිත්තල. 2018 වර්ෂයේ ජනවාරි 24 මෙක්ට්‍රින් ටොන් 25 යි, පෙබරවාරි 22 මෙක්ට්‍රින් ටොන් 25 යි, පස් වෙනි මාසේ 17 මෙක්ට්‍රින් ටොන් 25 යි, හය වෙනි මාසේ 29 මෙක්ට්‍රින් ටොන් 25 යි.

ප්‍ර : දැන් පිත්තල ලබා ගැනීමේ මේ කාල වකවානුවේදී මේ මූලික ප්‍රභවය මොනවද ?

පි : මේ කාලයේදී යුධ හමුදාව තමයි මූලික ප්‍රභවය.

ප්‍ර : ඒ කියන්නේ මේ

පි : ලබා ගැනීමේ මූලික ප්‍රභවය.

ප්‍ර : උණ්ඩ?

පි : උණ්ඩ.

ප්‍ර : හිස් උණ්ඩ කොපු?

පි : උණ්ඩ කොපු ගල් රෝලෙන් තලලා තමයි මම දන්න විදිහට IDB එකට දෙන්නේ. ඊට අමතරව මම දන්නේ නෑ මට මම අහල තියෙන විදිහට අර පොඩි උණ්ඩ ඒ විදිහටම ලබා දෙනවද කොහේද. නමුත් ලොකු කාල තුවක්කු උණ්ඩ ලබා දෙන්නේ ගල් රෝලෙන් තලලා.

ප්‍ර : මෙම කොලෝසස් සමාගමට 2018 වර්ෂයේ සහ 19 වර්ෂයේ කොපමණ Transformer ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවද කියල ඔබට දැනීමක් තිබෙනවද?

පි : මට දැනීමක් තියෙනවා. ප්‍රමාණය තමයි මතක නැත්තේ. 2018 වර්ෂයේ 328 කුත්, 2019 වර්ෂයේ 71 ක් වශයෙන් මුළු ගණන 399 ක් ලබා දීලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබේ මේ විමර්ශන වාර්තාව අනුව 2018, 2019 වර්ෂවල කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් විශාලතම එහෙම නැත්නම් වැඩි ප්‍රතිශතයක් ලෝහ අබලි නිකුත් කරලා තිබෙන්නේ කවර කර්මාන්තකරුටද?

පි : කොලෝසස් private limited.

ප්‍ර : දැන් කර්මාන්තකරුවන් ඔබ කියපු හැටියට විශාල සංඛ්‍යාවක් ලියා පදිංචි වෙලා සිටියදී එක් කර්මාන්තකරුවෙකුට විශාල වශයෙන් අබලි ලෝහ ප්‍රමාණයක් මේ ආකාරයට ලබා දීම සඳහා කවුරුන් හරි විශේෂ අනුමැතියක් ලබා දීලා තිබුණද කියලා ඔබ හොයලා බැලුවද?

පි : මම පස්සේ දැන ගත්තා මේක ගරු සභාපතිතුමා IDB එකේ ඒ අවස්ථාවේ හිටපු මහින්ද ජීනසේන මහත්මයාගේ අනුමැතියෙන් ලබා දීලා තියෙනවා කියලා.

ප්‍ර : පස්සේ දැන ගත්තා කියන්නේ කොහොමද දැන ගත්තේ?

පි : අපි පරීක්ෂණයෙන් පස්සේ මේ කරපු මේ විමර්ශනය අනුව.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ ඉදිරිපත් කරපු මේ වාර්තාවේ ඒ පිළිබඳ කොයි හරි සටහනක් තිබෙනවද C 779 ?

පි : මේ වාර්තාවේ තිබුණා ඒක මට මේ තැන මතක නෑ.

ප්‍ර : දැන් මේ වාර්තාවේ එක ඇමුණුමක් විදිහට තියෙනවද 2018/07/05 වෙනිදා කොලෝසස් පුද්ගලික ආයතනය වෙත කාර්මික සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක්?

පි : ඔව්.

ප්‍ර : තියෙනවද ඔබ ඉදිරිපත් කරපු වාර්තාවේ ඇමුණුමක් විදිහට?

පි : ඔව් තියෙනවා.

ප්‍ර : එහි 2018/07/05 වෙනිදා අභ්‍යන්තර විගණන විසින් ගිහිල්ලා පරීක්ෂා කරලා ඔවුන්ගේ නිර්දේශයක් ඒ වාර්තාවේ සටහන් කරලා තිබෙනවද?

පි : ඔව්.

සාක්ෂිකරු විසින් මේ අවස්ථාවේදී පෙන්වා දෙනු ලබන දැනටමත් C 779 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයේ ඇමුණුමක් වශයෙන් තිබෙන 2018/07/05 වන දින ක්ෂේත්‍ර පරීක්ෂණ කොලෝසස් කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව C 779 (A) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : දැන් ඔබට මේ ලේඛනය පරීක්ෂා කරලා බලලා ගරු කොමිෂන් සභාවට කෙටියන් පැහැදිලි කරන්න පුළුවන්ද ?

පි : එකේ අවසානයේදී පොඩි recommendation එක යටතේ තියෙනවා 30% කට වඩා වැඩි ප්‍රමාණයක් එක් පුද්ගලයෙකුට ලබා දුන්නත් IDB ආයතනය මූල්‍යම තත්ත්වය ගැන හිතලා. මේක දිගු කාලීනව කරන්න ගියොත් ආයතනයේ කීර්ති නාමයට එය හානියක් වෙයි කියලා? මේක ඉංග්‍රීසියෙන් තියෙන්නේ නමුත් සිංහල සාරාංශය ඒකයි මට තේරුම් යන විදිහට.

ප්‍ර : කියවන්න පුළුවන්ද?

පි : කියවන්න පුළුවන්. සම්පූර්ණ එකම

(සාක්ෂිකරු විසින් ඉංග්‍රීසියෙන් සටහනක් කියවනු ලබයි)

ප්‍ර : ඒ අනුව මේ 2018/07/05 වෙනිදා අභ්‍යන්තර විගණන කරපු ක්ෂේත්‍ර පරීක්ෂන වාර්තාව අනුවත් මේ එක පුද්ගලයෙකුට 30% ප්‍රමාණයේ අබලි ලෝහ ලබා දීමක් වාර්තා වෙලා තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : එය මේ එකවර විශාල ලාභයක් ලබා ගැනීම සඳහා ඒ ආකාරයට ක්‍රියා කිරීම නිවැරදි නොවන බවටත් ඒ වාර්තාවේ ඒ අනුව සටහන් වෙනවද?

Proof Copy
FAIR COMMENT BY JEZEEM

පි : නිවැරදි නොවන බවට සටහන් වෙනවා කියන්නේ ඒ ගැන සඳහන් වෙලා තියෙනවා 30% කට වඩා ලබා දීම මෙතෙන්දී කියලා තියෙන්නේ මට තේරෙන විදිහට අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා හැටියට ඇත්තටම ඔය අවස්ථාවේ මට මතක විදිහට මුදල් අවශ්‍යතාවයක් තිබුණා. ඒ මේකේදී මුදල් අවශ්‍යතාවය හින්දා ලබා දුන්නත් ඒක guide line එක තියාගෙන මේ ආකාරයට දිගු කාලීනව ලබා දීම හානියක් වෙයි කියන කාරණය තමයි මේකේ කියලා තියෙන්නේ.

ප්‍ර : දැන් ඔබම මොහොතකට කලින් සාක්ෂි දීලා කිව්වා මේ මාර්ග උපදේශකයේ අරමුණ වුණේ සුළු, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට වැඩි සහන සලසා දෙන්නයි කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ මාර්ග උපදේශක සංග්‍රහයේ තිබෙන අරමුණුවලට පටහැනි වෙනවා නේද මේ ආකාරයට කටයුතු කළොත් එක පුද්ගලයෙක්ට විශාල ප්‍රමාණයක් ලබා දුන්නොතින්?

පි : ඇත්තෙන්ම ඒක නවත්වන්න තමයි guide line එක හදලා තියෙන්නේ. guide line එකේ තියෙන්නේ ඉල්ලන ප්‍රමාණය දිස්ත්‍රික්ක මට්ටමෙන් register කරලා ඒ ගොල්ලන්ගේ capacity එක check කරලා IDB ආයතනයට ලැබෙන ප්‍රමාණය සාමානුපාතික බෙදන්න තමයි guide line එක හදලා තියෙන්නේ.

ප්‍ර : දැන් අමාත්‍යාංශයේ ලේකම් විදිහට මේ අනිකුත් සුළු කර්මාන්තකරුවන්ගෙන් ඔබට විරෝධතා ඉදිරිපත් වෙලා තිබෙනවද ඉදිරිපත් වුණාද ඒ කාල වකවානුවේදී මෙහෙම එක පුද්ගලයෙක්ට වැඩිපුර ලෝහ අබලි ලබා දීම ගැන?

පි : මෙහෙමයි මේ ක්ෂේත්‍රයේ ගොඩාක් ඉන්නවා මේ කර්මාන්තයේ යෙදිලා ඉන්න අය. අමාත්‍යාංශවලින් නිතරම එනවා අමුද්‍රව්‍ය නෑ අමුද්‍රව්‍ය නෑ කියන ප්‍රශ්නේට. ඒ අවස්ථාවේ ඒ අදහස් යොමු වුණා අමුද්‍රව්‍ය නැති බවට.

ප්‍ර : නෑ මම ඇහුවේ ඔබෙන් සුළු කර්මාන්තකරුවන්ගේ මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් විරෝධතාවයක් අමාත්‍යාංශයට යොමු කළාද කියලා?

පි : අමාත්‍යාංශයට යොමු වුණා අපනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන්. අපනයනය කරන්න ඉඩ දෙන්න එපා මොකද මේ අපනයනය කිරීම තුළින් නීතිමය ආකාරයට වගේම නීතිමය නොවන ආකාරයට මේ අපනයනය කළ නොහැකි ද්‍රව්‍ය අපනයනය කරනවා. ඒක තුළින් සුළු කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය නෑ කියන කාරණය ඉදිරිපත් වුණා.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් මේ ආකාරයේ රැස්වීමක් ජනාධිපති කාර්යාලයේ පවත්වනු ලැබුවද?

පි : ජනාධිපති කාර්යාලේ රැස්වීම් තුනක් මේ සම්බන්ධයෙන් පවත්වනු ලැබුවා.

ප : ඒ කවදා කවදද?

පි : 2018/11/23, 2018/12/05, 2019/03/27

ප : දෙවෙනි එක කිව්වේ 2018/12 ?

පි : දෙවෙනි රැස්වීම 2018/12/05 රැස්වීම් තුනක් තිබ්බා.

ප : දැන් ඒ එක් එක් රැස්වීම්වලදී ඒවාට අදාළ වාර්තා ඔබට මේ අවස්ථාවේදී කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවද?

පි : ඉදිරිපත් කරන්න පුළුවන්.

ප : මුලින්ම 2018/11/23 වෙනි දින වාර්තාව ඉදිරිපත් කරන්න.

පි : කැඳවීම් ලිපියයි වාර්තාවයි.

මේ අවස්ථාවේදී 2018/11/23 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැති ශ්‍රී ලංකා වාත්තු නිෂ්පාදන කම්කරුවන් සමඟ පැවැති රැස්වීමේ වාර්තාව C 780 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප : මහත්මයා එම රැස්වීමට ඔබත් සහභාගි වුණාද?

පි : නෑ අතිරේක ලේකම් බාලසුබ්‍රමනියම් මහත්මයා සහභාගි වුණේ.

ප : අතිරේක ලේකම් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ බාලසුබ්‍රමනියම් මහත්මයා?

පි : ඔව්.

ප : මේ රැස්වීමේදී අවසානයේදී මොකක්ද අරගෙන තිබෙන තීරණය?

පි : ප්‍රධාන වශයෙන් ඕකේ සාකච්ජා වුණේ ඒ කර්මාන්තකරුවෝ තමා ඉල්ලීමක් කරලා තිබුණේ ජනාධිපති ලේකම් කාර්යාලයට මේ පිළිබඳව සාකච්ජාවක් පවත්වන්න කියලා. අමුද්‍රව්‍ය හිඟයත්, මේ අනවශ්‍ය ඒ කියන්නේ අපනයනය කළ නොහැකි ද්‍රව්‍ය අපනයනය වෙනවා නම් ඒක වැළැක්වීම තමයි ප්‍රධාන කාරණේ වුණේ?

ප : ඇයි ඒ අබලි ලෝභ ඒ තත්ත්වයෙන්ම අපනයනය කිරීම සුදුසු නෑ කියලා ඒක තීරණය වුණේ?

පි : සුළු කර්මාන්තවලට ඒක අමුද්‍රව්‍යයක් හැටියට ඒක යොදා ගන්න හින්දා.

ප : ඒ කියන්නේ කර්මාන්තකරුවන්ට ඒකෙන් අගතියක් වන නිසා?

පි : අගතියක් වෙනවා අමුද්‍රව්‍ය නැති වීම තුළින් ඒ ගොල්ලන්ගේ කර්මාන්තය කඩා වැටෙන තත්ත්වයට පත් වෙන හින්දා.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : සාක්ෂිකරු මේ මාර්ග උපදේශ සංග්‍රහය හදන කොටම ඒකේ දාලා තිබ්බා නේද ඒ අපනයනය කිරීම තහනම් කරන්න ඕනේ කියලා?

පි : අපනයන සර් සමහරක් items තහනම් කරලා තියෙනවා.

ප : මාර්ග උපදේශය බලන්න.

පි : මේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් කුඩා සහ පරිමාණ කර්මාන්තකරුවන්ට සහය වීම යකඩ නොවන අබලි ලෝහ අපනයනය අත්හිටුවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලදී.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප : කොහේද ඒක තියෙන්නේ?

පි : පිටුව 21. පළවෙනි පිටුව මාර්ග උපදේශ සංග්‍රහයේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : ඒ කියන්නේ ඒ මාර්ග උපදේශ සංග්‍රහය ප්‍රධාන පදනමක් වී තිබුණේ මේ අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම වැළැක්වීම නේද? ඒ කියන්නේ ඒ අමුද්‍රව්‍ය කෙළින්ම අපනයනය කිරීම වැළැක්වීම නේද?

පි : ඒකත් එක්තරා අරමුණක්.

ප : ඒක ප්‍රධාන අරමුණක් කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි : ප්‍රධාන අරමුණ කියන්නේ අමාත්‍යාංශයෙන් කැබිනට් Papers ගිහිල්ලා තියෙනවා අපනයනය සම්බන්ධයෙනුත්. එතකොට මේක දාලා තිබුණේ දේශීය වශයෙන් තියෙන අමුද්‍රව්‍ය කොහොමද සාධාරණ ආකාරයට දේශීය කර්මාන්තකරුවන්ට ලබා දෙන්නේ කියන කාරණාව.

ප : හරි ඒ කියන්නේ මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන අරමුණක් වුණේ ඔය අපනයනය තහනම් කිරීම කියලා කිව්වොත් හරිද?

පි : ප්‍රධාන නෑ මේ මාර්ග උපදේශ සංග්‍රහයේ ප්‍රධාන කාර්යය වුයේ අපනයනය තහනම් කිරීම නෙවෙයි. සාධාරණ අයුරින් දේශීය ව්‍යාපාරිකයින්ට කොහොමද මේ තියෙන අමුද්‍රව්‍ය සුළු ප්‍රමාණය බෙදන්නේ කියන කාරණය.

ප : ඒ තියෙන ටිකත් බෙදන්න බැරි වෙනවනේ එක පුද්ගලයෙක් අරගෙන ගියොත්?

පි : අනිවාර්යෙන්ම.

ප : අපනයනය කළොත් ?

FAIR COMMENT BY JEZEEM

පි : බැරි වෙනවා.

ප්‍ර : අරමුණ ව්‍යාප්ත වෙනවා නේද?

පි : අනිවාර්යෙන්ම ව්‍යාප්ත වෙනවා.

****

දැන් වේලාව : ප.ව.02.15 යි.

මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.02.15
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් ඔබ සඳහන් කරපු මේ C- 754 කියන මේ අපි දැනටමත් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන මාර්ග උපදේශක ඒ හැඳින්වීම යටතෙත් තියෙනවා නේද යකඩ නොවන ලෝහ අමුද්‍රව්‍ය, අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරමින් ජීවන උපාය ගෙනු යනු ලබන කුඩා පරිමාණ දේශීය කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් තමයි මේකේ පියවර අරගෙන තියෙන්නේ කියලා නියාමනය කරලා තියෙන්නේ කියලා?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා ජනාධිපති කාර්යාලයේ 2018.12 වැනි මාසේ 05 වෙනිදාත් රැස්වීමක් තිබ්බයි කියලා. ඒ රැස්වීම් වාර්තා ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: ඒ රැස්වීම් වාර්තාව නැහැ. නමුත් ඒක සම්බන්ධයෙන් යවන ලද ලිපියක් මට ඉදිරිපත් කරන්න පුළුවන්. ලිපි 2ක් තියෙනවා. මොකද මේ ජනාධිපති කාර්යාලය තිබුණට අපි තමයි මේකේ රැස්වීම් වාර්තා හැදුවේ. මොකද මේ කාර්ය අමාත්‍යාංශයට පැවරිච්චි කාර්යක්. මුල් එකේ වාර්තාව හදලා තියෙන්නේ අපි. දෙවැනි එකේ වාර්තාව සකස් කරලා නැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර අතිරේක ලේකම් බාලසුබ්‍රමනියම් මහත්මයා වාර්තා කරලා තියෙනවා ජනාධිපති ලේකම්තුමා වෙත. ඊට පස්සේ මම වාර්තා කරලා තියෙනවා ඒක සම්බන්ධයෙන්. ඒ දෙකම මට ඉදිරිපත් කරන්න පුළුවන්.

****

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: Mr. අශෝක දැන් ඔය ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබිච්ච රැස්වීමේ දී කවදාද ඒ රැස්වීම 2ක තිබුණේ?

උ: රැස්වීමට දවස් 3ක් තිබුණා.

ප්‍ර: මොන අවුරුද්දේද?

උ: 2018 තිබුණා. 2019 තිබුණා.

ප්‍ර: ඒ රැස්වීමේදී ඔය කර්මාන්තකරුවන්ගේ සහ ඔය association වලින් මේ ක්ලොසියස් පුද්ගලික සමාගමට මේ විශාල ප්‍රමාණයක් තඹ දෙනවා කියන එක , පිත්තල දෙනවා කියන එක සම්බන්ධයෙන් විශේෂයෙන්ම කතා කරාද කර්මාන්තකරුවෝ?

උ: ඔය හැම කාරණාවක් වගේම කතා කරා. නමුත් ඒගෝල්ලන්ගේ ප්‍රධාන ඉල්ලීම වුණේ ඒ ගොල්ලො ඒ අවස්ථාවේ දී මට මතකයි ඉල්ලීමක් කළා.

FAIR COMMENT BY JEZEEM

ඒ ගොල්ලෝ කරන value added product එකක් නවත්වන්න කියන කාරණය. මොකද ඒ අවස්ථාවේ ක්ලෝසියස් සමාගම හදමින් තිබුණේ මට මතක විදිහට 8mm දගර. තඹ දගර. එතකොට මේගොල්ලෝ කිව්වා 8mm Export කරන්න දෙන්න එපා. 3mm දෙන්න කියලා. මොකද ඔය අවස්ථාවේදී ඔය ක්ලෝසස් සමාගමේ මට මතක නැහැ පුද්ගලයාගේ නම. ගණකාධිකාරි තමයි ඔය රැස්වීම්වලට ඇවිල්ලා හිටියේ. ඇත්තටම මම හිතාගෙන හිටියේ ඒ මනුස්සයා ඒ ආයතනය සම්බන්ධයෙන් කෑගහන විදියට එයා තමයි ඒකේ අයිතිකාරයා කියලා. මේ බෝම්බ සිද්ධියෙන් පස්සේ තමයි මම ලේකම්වරයා හැටියට දැනගත්තේ මේ වෙනත් පුද්ගලයෙක් අයිතිකාරයා කියලා. මොකද එයා ඒ තරම් වේදනාවෙන් ඒ කර්මාන්තය ගැන කතා කරා. එයා ඉල්ලීම කළේ ඒ ගොල්ලෝ 8mm හදනවා. එතකොට සේවකයෝ සංඛ්‍යාව.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: මේක 6 ද 8 ද කියලා බලලා කියන්න.

උ: 8mm

ප්‍ර: මේකේ තිබෙන්නේ 06 නේද?

උ: 06 ට වඩා කියලා තියෙන්නේ. නමුත් එයාලා හදමින් හිටියේ 08. 08 ඉඳන් 12 දක්වා හදන්න පුළුවන්. 8mm තමා මට මතක විදියට. මේකේ තියෙන්නේ 6mm ට වඩා වැඩි තඹ කම්බිවලට නිර්දේශ ලබාදෙනවා කියන කාරණය. නමුත් මේ ආයතනය හදමින් හිටියේ 8mm. මට හොඳට මතකයි.

****

<u>ගරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: දැන් ඔය සුළු කර්මාන්තකරුවෝ මොකක්ද කිව්වේ පැහැදිලි වුණේ නැහැ ඔබ කිව්ව දේ?

උ: සුළු කර්මාන්තකරුවෝ කිව්වේ මේ 8 හැදීම තුළ, දැන් 8 කියන්නේ මැඩම් දැන් උදාහරණයක් හැටියට මේක අපි මේ rod එක කියලා හිතුවොත් 8 කියන්නේ මේක ලොකු ප්‍රමාණයක්. මේකේ පොඩි ප්‍රමාණයක් තමයි මේක දැන් 8 කියලා කිව්වොත් ඒගොල්ලෝ කිව්වේ මීට වඩා පොඩි එකක් හදන්න දෙන්න කියලා. ඒකේ value addition එක වැඩියි කියලා. මොකද මේ ආයතනය .

ප්‍ර: ඒගොල්ලෝ කියන්නේ කවුද?

උ: කුඩා කර්මාන්තකරුවෝ.

ප්‍ර: ආ.... කුඩා කර්මාන්තකරුවෝ?

FAIR COMMENT BY JEZEEM

උ: කුඩා කර්මාන්තකරුවෝ ඒ අවස්ථාවේදී ඉල්ලා සිටියා ක්ලෝසියස් සමාගම හදන 8mm ට අපිට නිර්දේශය දෙන්න එපා. ආනයන අපනයන දෙපාර්තමේන්තුවෙත. ඒගොල්ලෝ කිව්වේ කිව්වේ 3 හදලා Export කරනවට අපි නිර්දේශ දෙනවට විරුද්ධ නැහැ. නමුත් 8mm ට නිර්දේශ දෙන්න එපා කියන කාරණය.

ප්‍ර: ඒකට හේතුව 8 හදන්න ගොඩක් ප්‍රමාණයක්?

උ: ඒගොල්ලෝ කිව්වේ මේ 8 හදන එක ලේසියි. මහත එක හදන එක. පොඩි එක හදන එකයි මේකේ අමාරු කියන කාරණය.
මේගොල්ලෝ කියා හිටියා 08 හදන එකේ ඒ තරම් Value addition එකක් නැහැ. 03 හදන්න දෙන්න ඒකේ Value addition එක වැඩි කියලා. මොකද මේ ආයතනය Export කර කර තිබුණේ ඒ ගොල්ලෝ Value addition එකක් කරනවා කියන කාරණය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ කියන්නේ ලංකාවේ ඒ වෙනකොට තිබ්බ කුඩා හා සුළු පරිමාණ කර්මාන්තකරුවන් හුඟාක් දෙනෙක් කර කර හිටපු කර්මාන්තය වුණේ වැඩි ඇගයීමක් දාලා ඔය කුඩා ප්‍රමාණයේ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමක්?

උ: ඔව් සර් මේගොල්ලෝ ඔක්කෝම කුඩා ප්‍රමාණයේ සරනේරු අරවා මේවා හදන මිනිස්සු. සමහරක් වෙලාවට පිත්තල පහන් සරනේරු ඔය hinges ඒ වගෙ ඒ වගෙ ඒවා

ප්‍ර: එතකොට ඒවාගේ අගය වැඩි වෙනවා. ඒවයි අගය සාමාන්‍යයෙන් ඒවට වැයවන මුදල වැඩියි?

උ: ඔව්, මේ ගොල්ලෝ කිව්වේ එතකොට ඒවා හදන්න අමුද්‍රව්‍යමදි. මෙහෙම කෙනෙක් ලේසියෙන් Value add එකක් කරලා පිටරට යවන එක කියලා. එතකොට කිව්වේ රටටත් හොඳයි. ඒක පොඩි එක හදන එක කියන එක තමයි කිව්වේ.

ප්‍ර: ඒ කියන්නේ ඒ විදිහට පොඩි Value addition එකක් දාලා පිටරට යවන්න පුළුවන් වෙන විදිහට කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් මේ අබලි ද්‍රව්‍ය වෙනත් තැනැත්තෙකුට ලබාදීමෙන් මෙම අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය මූලික පරමාර්ථය නැති වුණ එකනේ කියන්නේ?

උ: ඔව් ඒක අදහස් වෙනවා ඒක වක්‍රාකාරව අදහස් වෙනවා. ඔව්

ප්‍ර: ඇත්ත වශයෙන්ම ඒකනේ වෙන්නෙත්?

උ: ඒක ඇත්ත වශයෙන්ම ඒක වෙනවා. ඒක නැහැයි කියන්න බැහැ. ඒක වෙනවා.

ප්‍ර: ඇත්ත වශයෙන්ම වුණේ ඒකයි?

උ: ඔව්.

****

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: Mr. අශෝක ඔබට කියන්නට පුළුවන් ද දැන් මේ ඔය කුඩා කර්මාන්තකාරයෝ විශාල ප්‍රමාණයක් හිටියානේ. ක්ලෝසියස් කියන්නේ එක කර්මාන්තයක්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට එකේ සේවකයෝ සුළු සංඛ්‍යාවකුයි, මේ කුඩා කර්මාන්තකරුවන්ගෙන් ස්වයං රැකියා හෝ ඔවුන් කුඩා කුඩා කර්මාන්ත කරන දෙතුන් දෙනෙකුට රැකියාව දීලා හෝ විශාල වශයෙන් සේවා නියුක්තියක් තිබුණේ මේ කුඩා කර්මාන්තකරුවන් තුළ නේද?

උ: මැඩම් සංඛ්‍යාව ගත්තොත් මම මුලින් කිව්වා වගේ 85%ක් විතර ලංකාවේ ඉන්නේ කුඩා කර්මාන්තකරුවෝ. එතකොට යකඩ අංශයටත් ඒක පොදුයි. එතකොට ක්ලොසියස් සමාගම ආයතනයක් හැටියට මම ගත්තොත් මම විශ්වාස කරනවා ඒ අවස්ථාවේ දී වැඩි සේවක සංඛ්‍යාවක් හිටියා කියලා. නමුත් අනිත් මිනිස්සු සමහරක් වෙලාවට පොඩිම අය Home based industry එකක් හැටියට කරනව වෙන්න පුළුවන්.

ප්‍ර: Self Employed Informal sector ?

පි: Informal sector ඔව්.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබේ දැනීම අනුව 80% කට වැඩි ප්‍රමාණයක් කර්මාන්තකරුවන් ඉන්නේ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් කියලා ශ්‍රී ලංකාවේ. එතකොට ඒ සුළු හෝ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් අතර විශාල සේවක සංඛ්‍යාවක් ඒ කියන්නේ ආසන්න වශයෙන් කොපමණ විතර සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබනවද?

උ: ඒක මට හරියටම Figure එකක් හැටියට කියන්න අමාරුයි. මොකද ලංකාවේ වැඩ කළ හැකි සහ වැඩ කරන පිරිසෙන් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සේවය ඇරුණාම වැඩි පෞද්ගලික අංශයේ ඉන්නේ. එතකොට මේ සුළු කර්මාන්ත අංශයේ ඉන්න අය සලකන්නේ පෞද්ගලික අංශයේ ඉන්න සේවකයෝ හැටියට. දැන් රාජ්‍ය අංශය ගත්තොත් ඉන්නේ ඔක්කෝම 1.5 මිලියනයක් වගේ ප්‍රමාණයක්. එතකොට ඉතිරි ප්‍රමාණය ලංකාවේ සමස්ත ජනගහනය මිලියන 21න් වැඩි ප්‍රමාණයක් ඉන්නේ වැඩකරන ජනතාවෙන් මේ වගේ කර්මාන්තවල. මට අදහසක් නැහැ. යකඩ කර්මාන්තයේ කොච්චරක් ඉන්නවාද කියන කාරණය.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නැහැ අපි නිවැරදි ගාණ ඕනි නැහැ. අපි හිතමු ආසන්න වශයෙන් දාහකට වඩා ?

උ: හපොයි ඊට වැඩියි ස්වාමීනි. ඊට වඩා ගොඩක් වැඩියි.

ප්‍ර: 10000 කට වඩා වැඩියි?

උ: නැහැ, යකඩ කර්මාන්තයේ සමහරක් වෙලාවට 1000 ක් වගේ ඇති. නමුත් මේ සුළු කර්මාන්ත කියන කොටස ඊට වඩා වැඩියි. Home based industry යන්නෙත් මේකට.

ප්‍ර: දැන් ක්ලෝසියස් සමාගමේ හිටපු සේවක සංඛ්‍යාව 54 යි නේද?

උ: මට මතක

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: ඔබතුමාට ඒ Application එක පෙන්නුවොත් බලලා කියන්න පුළුවන්ද?

උ: පුළුවන් පුළුවන්. මට මතක 20ක් හිටියා Foreign අය.

ප්‍ර: සාක්ෂිකරුට C – 758 සහ C – 760 පෙන්වා සිටි. අයදුම්පතේ සඳහන් වෙලා තිබෙන ආකාරයට ඔබට කියන්න පුළුවන්ද?

උ: මේකේ එකක තියෙන්නේ 37යි කියලා. අනිත් එකේ තියෙනවා 20යි , 30යි. අනිත් එකේ තියෙනවා 54 යි කියලා. මේ අනිත් එකේ කියන්නේ දෙදාස්

ප්‍ර: C ඉලක්කමෙන් කියන්න?

උ: C 760 කියනවා 54 ක් , C 758 කියනවා 37 ක්

ප්‍ර: දැන් ඔබ කියන විදියට කුඩා මධ්‍යම පරිමාණයට මේ අබලි ලෝහ කර්මාන්තය ආශ්‍රිතව සුළු පරිමාණ කර්මාන්තවල යේදී සිටින සේවක සංඛ්‍යාව මේ හා සසඳා බලන කොට අති විශාල ප්‍රමාණයක් ප්‍රතිශතයක් වශයෙන් සැලකුවාම මෙතන තියෙන්නේ 54 දෙනායිනේ. දැන් ඔබ කිව්වානේ 80% කට වැඩියෙන් ඉන්නේ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් කියලා?

උ: සමස්ත සුළු කර්මාන්තකරුවන්.

ප්‍ර: ඒක අදාළ වෙනවනේ අබලි ලෝහ කර්මාන්තවලට ?

උ: ප්‍රතිශතයක් හැටියට ගත්තොත් ..... ඔක්කේත් වැඩි ඇති.

ප්‍ර: ප්‍රතිශතයක් කියන්න ඒක හරියට ප්‍රතිශතයක් වශයෙන්?

උ: මං කිව්වේ ලංකාවේ ආර්ථිකය තුළ සුළු කර්මාන්ත තුළ අපි ඉන්න යෙදිලා ඉන්න employment බැලුවම 80% ක් විතර මං හිතන්නේ යෙදිලා ඉන්න වැඩකරන ජනතාව සුළු කර්මාන්තවල

****

Presidential Secretariat's Copy
FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: යකඩ කර්මාන්තවල?

උ: යකඩවල අපිට අදහසක් නැහැ. ඇත්තටම අතන ලියාපදිංචිවෙලා තියෙන්නේ 200 ගාණනයිනේ. මං හිතන්නේ කොහොමත් ඔබතුමා කිව්ව 1000 වඩා වැඩි ප්‍රමාණයක් ඇති එතන ඇත්තේම සෘජු ශ්‍රමිකයෝත් ඇති වක්‍ර ශ්‍රමිකයොත් ඇති.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු මෙම සමාගම සුළු, මධ්‍යම ප්‍රමාණයේ මහා ප්‍රමාණයේ කර්මාන්තයක් කියලා නේද පෙනෙන්නේ?

උ: ඔව්. නෑ සර් මෙහෙමයි. මං ඒක පැහැදිලි කරන්නම් මේ ලියාපදිංචිවෙලා තියෙන ආයතනවල් එක්ක සන්සන්දනය කරාම මේක විශාල එකක් බව පේනවා. හැබැයි මේ ගොල්ලොගෙ තියෙන සේවක සංඛ්‍යාව බැලුවම මොකද සුළු ද මධ්‍යම ද කියන කාරණය තීරණය වන්නේ ප්‍රධාන කාරණා දෙකක් තියෙනවා. එකක් ඒ ආයතනයේ පිරිවැටුම. ඊළඟට වැඩ කරන සේවක සංඛ්‍යාව. එතකොට ඔය Category දෙකෙන් එකකට වැටෙනවා නම් අපිට මධ්‍යම ද සුළු කෂුද්‍ර දකියලා තීරණය කරන්න පුළුවන්. එතකොට මේ Category දෙකෙන් ආදායම පැත්ත බැලුවාම මේ ආයතනය මධ්‍යම පරිමාණය එකක් කියලා පෙන්නේ නැහැ. හැබැයි සේවක සංඛ්‍යාව බැලුවාම මට පේන්නේ මේ තියෙන Guide line එක අනුව සහ කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මේ ආයතනය මධ්‍යම ගණයට වැටෙනවා කියලා.

ප්‍ර: එතකොට ඒ කර්මාන්තශාලාව රජයේ කර්මාන්තශාලාවට වැඩිය විශාල කර්මාන්ත ශාලාවක් නේද? යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින්?

උ: නෑ සර් රජයේ කර්මාන්තශාලාවක් කියලා අපි උදහරණයක් හැටියට අපි හැමදාම කතා කරන යකඩ කර්මාන්තය ගැන කතා කරනවා. ඔරුවලනේ ඊහාවට තියනවා .තව මෙල්වා වගේ තියෙනවා තව Private investors එක්කෙනෙක්ගේ දෙන්නෙක් ගේ මට නම් මතක නැහැ තියෙනවා . ඒ අතින් බැලුවාම මධ්‍යම ප්‍රමාණයේ අපි ලියාපදිංචි වෙච්ච විශාල කර්මාන්තශාලාවක්.

ප්‍ර: ඒ මහා පරිමාණයට වැටෙන්නේ නැත්තේ ඔබලා කියන්නේ Guide line එක නිසාද මධ්‍යම පරිමාණයට වැටෙන්නේ නැත්තේ මහා පරිමාණයට වැටෙන්නේ නැත්තේ?

උ: නෑ ස්වාමිනි කර්මාන්ත අමාත්‍යාංශයේ තියෙනවා නිර්ණාකයක්. මේ Guide line එකේ සඳහන් වෙලා තියෙනවා කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්ණායකක් තියෙනවා මධ්‍යම , කුඩා සහ සුළු වශයෙන් කොහොමද බෙදන්නේ කියන කාරණය .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ නිර්ණායක දැන් වෙනස් වන අවස්ථාවක් නැද්ද?

උ: ඇත්තටම මේවා කලානුරූපව වෙනස් වෙන්න ඕනේ සමහරක් ඒවා වෙනස් වෙලා නැහැ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: සාක්ෂිකරු විසින් මේ අවසථාවේදී ලිපි දෙකකක් ඉදිරිපත් කරනු ලැබුවා එක් ලිපියක් 2019.02.01 වන දින ජනාධිපති ලේකම් වෙත අතිරේක ලේකම් එස්.බාල සුබ්‍රනියම් මහතා විසින් ජනාධිපති කාර්යාලයේ පවත්වන ලද සාකච්ඡාවේ තීරණය වෙච්ච කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය. එම ලිපිය C 781 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. සාක්ෂිකරුට නැවත C 781 පෙන්වා සිටිනවා. දැන් මහත්මයා මේ සකච්ඡාවේදී කොලෝසස් ආයතනයේ හැර අනෙකුත් ආයතන අර ඔබ කලින් සඳහන් කරපු අර තීරණය ක්‍රියාත්මක කිරීමට එකඟ වුණු බවත් ක්ලෝසස් පුද්ගලික සමාගම මිලිමීටර් තුනේ තඹ කම්බි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය දැනට තමන් සතුව නොමැති බවත් කෙටිකාලිනව එසේ වෙනස් කිරීමට නොහැකි බවත් ඒ සඳහා සැලකියයුතු කාලයක් සහ අමතර ආයෝජනයක් සිදු කල යුතු බවටත් ප්‍රකාශ කරල මේ තීරණයට විරුද්ධ වුණායි කියලා කිව්වොත් ඒක හරිද?

උ: කොයි තීරණයටද

ප්‍ර: මේ මිලිමීටර් තුන ප්‍රමාණය තමයි අපනයනය කරන්න පුළුවන් කියලා .

උ: ඒ අවස්ථාවේදී සුළු කර්මාන්තකරුවෝ ඉල්ලා හිටියේ ක්ලොසස් සමාගමටත් මිලිමීටර් 08 නිෂ්පාදනය කරන්න දෙන්න එපා කියලා. සර් අපිට කර්මාන්ත අමාත්‍යාංශයේ හැටියට අපි කරන්නේ කර්මාන්ත facilitation කිරීමක්. අපිට තීරණය කරන්න බැහැ කර්මාන්තකරුවෙක් තියෙන නීතිය යටතේ මිලිමීටර් අට නිෂ්පාදනය කලාම එයා Export කරන්න ලැස්තිවෙලා ඉන්නකොට නැවත ඔයා ගිහිල්ලා මිලිමීටර් තුන නිෂ්පාදනය කරන්න කියන එක අමාරුයි. මොද ලංකාවේ සර් අපි කර්මාන්ත අමාත්‍යාංශයේ හැටියට සුළු කර්මාන්ත විතරක් නෙමේ අපිට ප්‍රධාන කර්මාන්තත් වැදගත්. අපේ වගකීම වුණේ කොහොමද කර්මාන්ත කේෂ්ත්‍රයේ ජී.ඩි.බී. එකට දෙන දායකත්වය මොකද සර් ලංකාවේ trend එක බැලුවාම 2015 කර්මාන්ත අංශයෙන් GDB එකට 17% ක දායක්තවයක් වෙලා තියෙනවා. ඒක 2017 වෙන කොට 15% දක්වා අඩුවෙලා තියෙනවා. එතකොට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මං පත්වෙන කොට මට තිබුණා ප්‍රධාන වගකීමක් වගකිවය යුතු නිලධාරියෙක් හැටියට මේ කොහොමද මේ Contribution එක වැඩි කරන්නේ කියලා. එතනදි මම දැක්කා ඒ සුළු කර්මාන්තකරුවෝ කරපු

FAIR COMMENT BY JEZEEM

ඉල්ලීම අසාධාණයි මොකද අතීතයට බලපානවා. එතකොට මිනිස්සු ඒක හදලා තිබුණේ. ක්ලොසියස් සමාගම ත්‍රස්තවාදී සමාගමක් කියලා දැනගත්තේ අපි මේ බෝම්බ පිපිරිමෙන් පස්සේ . ඒ වෙනකම් අපේ කර්මාන්ත කරුවෙක්. අපි facilitate කරපු කර්මාන්තකරුවෙක්. එතකොට මේ කර්මාන්තකරුවා ඒ ජනාධිපති ලේකම් කාර්යාලයටය රැස්වීම තියෙන කොට අර මිනිස්සු ඉල්ලනකොට ක්ලොසස් සමාගමටත් යවන්න දෙන්න එපා කියලා ඒක මම දැක්කේ අසාධාරණයක් හැටියට. නමුත් මට ඒකට තීරණය ගන්න පුළුවන් කමක් තිබ්බේ නැහැ. ඒ ගොල්ලන්ගේ දැඩි ඉල්ලීම. ඒ ගොල්ලෝ කිව්වේ අර 8 හදලා Export කරන්න තියෙන Items නැවත 03 බවට හදන්න කියන කාරණය ඒකට තමා ඒ ගොල්ලෝ විරුද්ධ වුණේ.

මෙම ලිපිය C781 වශයෙන් ලකුණු කර ඉදිරපත් කරනු ලබනවා. සාක්ෂිකරු විසින් 2019.02.15 වන දින ජනාධිපති ලේකම් වෙත කේ.ඩී.එන්. රංජිත් අශෝක ලේකම්වරයා විසින් ලෝහ සුන්බුන් හා අග එකතු කර ලෝහ නිෂ්පාදන අපනයන කිරීම සඳහා ලබා දෙන නිර්දේශ තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය C 782 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබට අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් මේ එන්තළුවාසියක් ලැබුණාද?

උ: එන්තර වාසියක් ලැබුණා.

ප්‍ර: කාගෙන්ද කුමන ආයතනයෙන්ද කවදද ලැබුණේ?

උ: ක්ලොසියස් සමාගම වෙනුවෙන් Mr. අභිමානි රන්දෙණි කියන නීතිඥවරයාගෙන් මට එන්තරවාසියක් ලැබුණා 2019 මාර්තු 01 වෙනිදා.

ප්‍ර: ඒ එන්තරවාසිය පිටපතක් ඔබට මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

උ: පුළුවන්.

නීතිඥ අභිමානි රන්දෙණි මහත්මිය විසින් මෙම සාක්ෂිකරුට 2019 මාර්තු 01 වෙනි දින ලියාපදිංචි තැපැලෙන් සහ අතින් ගෙනවිත් භාර දෙන බවට වාර්තා වී ඇති එන්තරවාසිය පිටපතක් C 783 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. එහි පිටපත් රිෂාඩ් බදුර්දීන් අමාත්‍යවරයා වෙත සහ අතිරේක ලේකම් වාණිජ සහ කර්මාන්ත අමාත්‍යාංශය වෙත යවා ඇති බවටත් එහි වාර්තා වෙනවා.

ප්‍ර: දැන් මහත්මයා මේ C 783 කියන ලේඛනයෙන් මොනවද ඒ එන්තරවාසියෙන් ඔබ වෙත දැනුම්දීමක් කර තිබුණේ. ඒ ක්ලොසියස් සමාගම වෙනුවෙන්?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ සමාගම වෙනුවෙන් ඒ නීතිඥවරයා ඇත්තට මං හිතුවා ඒ නීතිඥවරයෙක් කියලා. මං දන්නේ නැහැ නීතිඥවරියක් කියලා. ඉල්ලා හිටියේ තමන්ගේ සමාගමේ අයිතිකරුවන්ට අපි ජනාධිපති කාර්යාලයේ තිබ්බිච්ච රැස්වීමේ දී ගත්ත තීරණය අනුව අගතියක් වෙනවා. මේ වෙන කොට මෙක්ට්‍රික් ටොන් 260 ක් අතිවිශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරලා තිබුණා. ඒකට මං බලපත්‍ර දුන්නේ නැහැ. ජනාධිපති කාර්යාලයේ තිබ්බිච්ච රැස්වීම ගත්ත තීරණය අනුව. එතකොට එයා කියලා තිබුණේ ඒකෙන් තමන්ගේ සේවාදායකයට අගතියක් වෙනවා. ඒ නීතිය අනුව එතකොට තිබ්බිච්ච ග්‍රැසට් පත්‍රය අනුව තමයි ඒ ගොල්ලෝ නිෂ්පාදනය කරලා තිබුණේ. ඒ හින්දා ඒක ඒවා අපනයන කරන්න බලපත්‍රය දෙන්න කියන කාරණය තමයි කියලා තිබුණේ.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් මොනව හරි පියවරක් ගත්ත ද ඔබතුමා?

උ: නෑ ගත්තේ නැහැ. ඒත් මං දුන්නේ නැහැ. මම දුන්නේ නැත්තේ ඇත්තටම මාත් උත්සහා කරා එයාලවුව මොකද Value addition එකක් ඒක අඩුයි කියලා. කර්මාන්තකරුවෝ ප්‍රකාශ කරන හින්දා මාත් try කරා එයාලවුව කොහොම හරි මේක මිලිමීටර් 03 ට බවට හගවන්න සකස් කරවන්න.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: මෙසේ සකස් කරවන්න විශාල පිරිවැයක් යනවද?

උ: මං හිතන්නේ සර් යනවා. ඒ ගොල්ලන් ඒ මැෂින් එහෙම එතකොට Import කරලා තිබ්බිච්ච මැෂින් මිලිමීටර් 08 ට තමයි හදලා තියෙන්නේ. මං මේ මැෂින් දැකලවත් නැහැ. ඒ ගොල්ලෝ කිව්ව ආකාරයට ඒ මැෂින් තිබෙන්නේ මිලිමීටර් 08 ට. එතකොට ඒ ගොල්ලෝ ඒ අවස්ථාවේ මට මතකයි කියා සිටියේ එක්කෝ ඒවා Import කරන්න ඕන. කොහොමත් නැවත සකස් කරන්න ඕන මිලිමීටර් 03ට කියන එක. ඒ ගොල්ලො කිව්වේ ඒකට කාලයක් ගතවෙනවා. එතකොට දැන් අතීතයේ දී අපි මේ රැස්වීම තියෙනවටත් කලින් මිලිමීටර් 08 හදන්න දීලා ඒවා Export කරන්න තහනම් කිරීම අසාධාරණයි කියන කාරණාව තමයි ඒ ගොල්ලෝ කිව්වේ.

ප්‍ර: ඒකෙන් විශාල අලාභයක් සමාගමට සිදුවෙනවා කියලා කිව්වේ?

උ: අනිවාර්යෙන් සර් මොන සමාගමට වුණත් එහෙම මැෂින් එක පාරට අපි හිතමු නිෂ්පාදනයක් කරලා අපි හිතමු මේ පුටුව කියලා ඒක නිෂ්පාදනය කරලා මේක Standed නැහැ ඔයිට වඩා පොඩි කරන්න ගියොත් එහෙම මේක නැවත මුල ඉඳන් හදන්න ඕන. ඒක හදන සමාගමට අනිවාර්යෙන් වියදමක්.

ප්‍ර: ඒකට ඉඩදුන්නේ නැත්තේ?

FAIR COMMENT BY JEZEEM

උ: ඉඩදුන්නේ නැත්තේ ජනාධිපති ලේකම් කාර්යාලයේ සිදුවෙච්ච රැස්වීමේ දී අර සුළු කර්මාන්තකරුවෝ ඉල්ලා සිටියා මිලිමීටර් 08 දෙන්න එපා. එකේ Value addition එක අඩුයි. මිලිමීටර් 03 නම් කමක් නැහැ කියන කාරණය ඒ ගොල්ලෝ කියා සිටියා.

ප්‍ර: ඒ ජනාධිපති කාර්යාලයේ තීරණය මත තමයි දුන්නේ නැත්තේ?

උ: ඒ තීරණය මත තමයි දුන්නේ නැත්තේ.

ප්‍ර: නමුත් තමන් කියන්නේ ඒක කරන්න අමාරුයි කියලා?

උ: ඒ අවස්ථාවෙත් මං ජනාධිපති ලේකම්තුමාට කිව්වා සර් මේක අසාධාරණයි කියලා ඒ කර්මාන්තකරුවට. අපි එයාට සාධාරණ කාලයක් දීලා ඔයාගේ මැෂින් වෙනස් කරගන්න කියන කාරණය කියලා මොකද ඒ පුද්ගලයා ඒ වන කොට මේ බෝම්බ පුපුරලත් නැහැ අපේ කර්මාන්කරුවෙක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ විදියට ඒ වන කොට ක්ලොසස් පුද්ගලික සමාගම විශාල වශයෙන් එම ද්‍රව්‍යය නිපද වුවේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් විශාල වශයෙන් ඔහුට ඒ ලබාදුන්න අමුද්‍රව්‍යය හින්ද නේද?

උ: නැහැ සර් එහමෙ නෙවෙයි. ඒකට හේතුව ඒ පුද්ගලයා දැන් උදාහරණයක් විදියට එයා 2017 මෙක්ට්‍රික් ටොන් හාරසිය ගාණක් එයා Export කරලා තියෙනවා. 2018 මෙට්‍රික් ටොන් නෑ දෙදාස් මගේ figures වැරදිද දනෑ මගේ මතකයේ හැටියට 2017 එයා මෙක්ට්‍රික් ටොන් අටසිය ගාණක් Export කරලා තියෙනවා. මං ළඟ figures තියෙනවා. මට ඕන්නම් නිවැරදි කරන්න පුළුවන්. ඊට පස්සේ එයා 2018 මෙක්ට්‍රික් ටොන් අටසිය ගාණක් Export කරලා තියෙනවා. නැවත 2016 එයා මෙක්ට්‍රික් ටොන් හාරසිය ගාණක් Export කරලා තියෙනවා. 2017 මෙක්ට්‍රික් ටොන් හාරසිය ගාණක් Export කරලා තියෙනවා. 2018 එක්දාස් ගාණක් Export කරලා තියෙනවා. හැබැයි අපි 2016 එයාට දීලා නැහැ. ඊට පස්සේ 2017 අයිඩීබී එකෙන් දීලා තියෙන්නේ මෙක්ට්‍රික් ටොන් 25 යි. එයා එතකොට Export කරලා තියෙනවා මට මතක හැටියට මෙක්ට්‍රික් ටොන් හාරසිය ගාණක්. 2018 අපි දීල තියෙන්නේ අයිඩීබී එකෙන් දීලා තියෙන්නේ මෙක්ට්‍රික් ටොන් 100 යයි. හැබැයි එයා Export කරලා තිබෙනවා දාහක වගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ මේ පුද්ගලයා අපෙන් ගන්න ප්‍රමාණයට අමතරව අතිවිශාල ප්‍රමාණයක් පිටින් අමුද්‍රව්‍යය හැටියට අරගෙන නිෂ්පාදනය කරපු සමාගමක්. අපි දීලා තියෙන්නේ ඒ ප්‍රමාණයෙන් මං ගණන් බැලුවා 17% ක වගේ ප්‍රමාණයක්. මං ළඟ ඒ data තියෙනවා.

****

FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.

ප්‍ර: දැන් මහත්මයා ඒ ආකාරයට ලංකාවේ තිබෙන මේ අබලි ලෝහ වලින් අග එකතු කිරීම කුඩා ප්‍රමාණයක් සිද්ධ කරලා ලෝහ පිටරට ඇරියාම කුඩා කර්මාන්කරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු කරන්න ඒ අමුද්‍රව්‍යය සොයා ගැනීමේ අපහසුතාවයකුත් ඒ ලංකාව තුළ ඒ කර්මාන්ත වැඩිදියුණු කරන්නේ ඒ කර්මාන්තකරුවන්ට සේවය කරන්න තිබෙන අවස්ථාවන් මහහැරීමක් සිද්ධ වෙනවා නේද?

උ: ඇත්තටම මහ හැරීමක් සිද්ධ වෙනවා. නමුත් ඇත්තටම අපි කර්මාන්ත අමාත්‍යාංශය හැටියට අපේ කර්මාන්ත අමාත්‍යාංශයට සුළු කර්මාන්ත මධ්‍යම කර්මාන්ත ශුද්ධ කර්මාන්ත වගේම ප්‍රධාන කර්මාන්තත් අදාළයි. අපේ කර්මාන්ත අමාත්‍යාංශය උත්සහා කරන්න ඕන ඇත්තටම දේශීය වශයෙන් අපේ නිෂ්පාදන අලෙවි කරන්න නෙවෙයි අපි පුළුවන් තරම් Export දියුණු කරන්න ඕන. මේ රටේ ලොකුම ප්‍රශ්නය සර් අපනයනය සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නේ නැති එක. මොකද අපේ රටේ එන්න එන්න ගෙවීම් ශේෂය වැඩිවෙනවා. ගෙවීම් ශේෂය කියන්නේ ආනයන සහ අපනයන අතර වෙනස. මේ රටේ පුළුවන් තරම් උත්සහා කරන්න ඕන අපනයන වර්ධනය කරන්න. කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මම හිටපු අවුරුදු 02 තුළ මං උත්සාහ කළේ කොහොමද මේ කාර්ය කරන්නේ කියලා. මොකද මං කර්මාන්ත අමාත්‍යාංශයට ආවේ දීර්ඝ කාලයක් මුදල් අමාත්‍යාංශයේ සේවය කරලා. එතකොට මගේ මිෂන් එක තිබ්බේ How to develop Export කියලා. For increasing the export revenue කියන කාරණය මොකද අපේ රටේ එන්න එන්න ණය බර වැඩි වෙනවා. ගිණුම් ශේෂය වැඩිවෙනවා. Badget deposit එක වැඩිවෙනවා. එතකොට මෙම තත්ත්වය මඟහරවා ගන්න නම් අපේ රටේ කුමන හෝ ආකාරයකින් Export වැඩිකරන්න ඕන.

ප්‍ර: දැන් ඔබට දැන ගන්න ලැබුණ ද ක්ලොසියස් කර්මාන්තශාලාවේ විදේශිකයන් සේවය කරලා තිබෙන බවට?

උ: මට දැනගන්න ලැබුණා බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ. මං ඒ ගැන වහාම ආරක්ෂක අමාත්‍යාංශයට දැනුම් දුන්නා. මොකද අපිට තේරුණා අපෙන් අමුද්‍රව්‍යය ගත්ත පුද්ගලයෝ ත්‍රස්තවාදී කටයුතුවලට මැදිහත් වෙලා තියෙනවා කියලා. මට දැඩි කම්පාවක් ආවා. මොකද එයා කර්මාන්තකරුවෙක්. ඊට පස්සේ මං වහාම දැනුම් දුන්නා ඒ ඉන්න සේවක සංඛ්‍යාව අහලා ආරක්ෂක ලේකම්තුමාට වහාම ඒ සම්බන්ධයෙන් පියවර ගන්න කියලා. මොකද මට සාධාරණ සැකයක් ඇතිවුණා සමහරක් වෙලාවට අපෙන් වීසා අරගෙන ඉන්න පුද්ගලයොත් ඔකට සම්බන්ධද දන්නේ නැහැ කියන කාරණය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මුලින් කියන්න ඔබේ විමර්ශනයේ දී අනාවරණය වුණේ 2019 අප්‍රේල් මාසය වන කොට ක්ලොසියස් පුද්ගලික සමාගමේ විදේශිකයෝ කී දෙනෙක් සේවය කරලා තිබෙනවද?

උ: ඔය අවස්ථාවේ විදේශිකයෝ 25 ක් සේවය කරලා තිබුණා. 25 න් එක්කෙනෙක් නේපාල් ජාතිකයෙක්. දෙන්නෙක් බංගලාදේශ ජාතිකයෝ. ඉතුරු අය ඉන්දියන් ජාතිකයෝ.

ප්‍ර: ඇයි මහත්මයා මේ විදේශිකයෝ සේවකයන් වශයෙන් කර්මාන්ත වලට බදවා ගැනීමට ඒ අය ගෙන්න ගන්න වීසා ලබාදෙන්නේ අවසර ලබාදෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ද?

උ: අපේ අමාත්‍යාංශයෙන් නෙවෙයි අවසර ලබා දෙන්නේ ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව. අපි කරන්නේ රෙකමන්ඩේෂන් එකක් ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවට.

ප්‍ර: මං ඒක නිවැරදි කරලා ඇහුවොත් මේ නිර්දේශ ලබා දෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන්?

උ: අපේ අමාත්‍යාංශයෙන් කර්මාන්ත වලට අදාළව.

ප්‍ර: දැන් මේ කතා කරන්නේ ක්ලොසියස් පුද්ගලික සමාගමේ සේවය කරපු විදේශිකයන් ගෙන්වා ගැනීම සම්බන්ධයෙන්?

උ: ඔව්.

ප්‍ර: ඒ නිර්දේශ කරන්නේ මොකද්ද ගන්න පදනම, මොන පදනමක් මතද, මේ විදේශිකයන් මේ කර්මාන්තයේ සේවයට අවසර ලබාදුන්නේ?

උ: මේ ආයතන ඉල්ලනවා. මේ සමාගම විතරක් නෙවෙයි තවත් සමාගම් ඉල්ලනවා අපෙන් අවශ්‍ය සේවකයෝ සංඛ්‍යාව නැහැ. එහෙම නැත්නම් ඒ ගොල්ලොන්ගේ අවශ්‍යය නිපුණතා මේ තියෙන සේවකයන්ට නැහැ. සමහරක් වෙලාවට අපේ රටේ මිනිස්සු ඒ තැන්වල වැඩ කරන්න කැමති නැහැ. මොකද දැන් මේ සමාගම ගත්තොත් ඔබතුමිය මෙම සමාගම ගැන අහන හින්දා මේ සමාගම යකඩ උණු කරලා උදුන්වලින් තමා ඒ යකඩ උණු කරන්නේ. එතකොට මේ සමාගම මේ වගේ ආයතන කියන්නේ ලංකාවේ අය වැඩ කරන්න කැමති නැහැ. ඒ හින්දා මේවට අර යකඩ කුඩු අරහෙ මෙහෙම වෙන හින්දා කැමති නැහැ. නමුත් ඉන්දියාවේ සමහරක් ප්‍රදේශ තියෙනවා මේ කර්මාන්තයේ යෙදිලා ඉන්න එතකොට ඒ වගේ ප්‍රදේශවලින් කම්කරුවෝ ගෙන්වලා වැඩකරන එක ලංකාවේ මිනිස්සු යොදාගෙන වැඩ කරනවට වඩා පහසුයි කියන කාරණය තමා මේ ගොල්ලෝ ඉල්ලීම් කරන්නේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: දැන් එහෙම ඉල්ලීම් කරාම දේශීය වෙළඳපොළේ දේශීය අපේ තියෙන Labour market එකේ ශ්‍රම වෙළඳ පොළේ දේශීය ශ්‍රමිකයන්ට මේ ඔය කියන දේ ඇත්තමද කියන එක ඔබ කම්කරු කොමසාරිස්ගෙන් විමසලා බැලුවද මේවා ඔබගේ නිලධාරීන්?

උ: නැහැ මැඩම් අපි කම්කරු කොමසාරිස් විමසුවේ නැහැ. නමුත් අපි දන්නවා සමහරක් වෙලාවට අපේ අත්දැකීම් අනුව අපේ පෞද්ගලික අත්දැකීමයි මේ අමාත්‍යාංශයට ආවයින් පස්සේ සමහරක් කර්මාන්ත ඇත්තටම මිනිස්සු නැතුව කරගෙන යන්න බැහැ. සමහරක් වෙලාවට උදාහරණයක් හැටියට මං කියන්න උත්සාහ කරන්නේ සමහර අපේ කඩවල දැන් ඊයේ මම හවස ගියා කඩේකට මුදලාලි කියනවා වැඩක් නැහැ මහත්තයෝ මිනිස්සු නැහැ වැඩට එන්නේ නැහැ කියලා. ඕක තමා තත්ත්වය. අපි එළියේ බැලුවොත් මිනිස්සු ඕන තරම් රස්තියාදු ගගහා ඉන්නවා. නමුත් අපේ මිනිස්සු වැඩ කරන්න කැමති නැහැ. ඒකයි තියෙන ප්‍රශ්නේ. අපේ මිනිස්සු කැමති ඇත්තටම White Colure job වලට. සමහරක් වෙලාවට මිනිස්සුන්ට ඇත්තටම හොඳ ආදායමක් ගන්න පුළුවන් මේෂන් වඩුවැඩ වගේ දේවල්. නමුත් අපේ මිනිස්සු ඒවට යන්නේ නැහැ. නමුත් මැඩම් දන්නවද දැන් සමහරක් වෙලාවට මං අහලා තියෙන කතාව මට මේක ඔප්පු කරන්න සාධක නැහැ. ඉන්දියාවෙන් ගෙනිහිල්ලා ගොයම් කපලා ආපහු ඉන්දියාවට යනවා. හැබැයි ගොයම් කැපීම කලේ අපේ ගොවියෝ. නමුත් ඒ තත්ත්වට තමයි පත්වෙලා තියෙන්නේ සමහරක් වෙලාවට අපේ මිනිස්සු ඒකට නැහැ. මොකද ශ්‍රමය වැඩියි වගේම අපේ රටේ ඒ කර්මාන්තවලට ශ්‍රමය අඩු කමකුත් තියෙනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: දැන් මෙවැනි කර්මාන්ත ශාලාවල සේවය කරන පුද්ගලයින්ට රෝගාබාධ වැඩීමකුත් තියෙනවානේ?

පි: මේවට සර් රෝගාබාධ අනිවාර්යෙන් වැඩිවෙනවා මොකද ඒ යකඩ එකක් තමයි මේ උදුන් ලඟ ඉන්න අමාරුයි. මේවා ගිනි උදුන් මං දන්න විදියට. මේ ඒකත් හේතුවක්. අනික තමයි යකඩ කුඩු මිශ්‍ර වීම .

ප්‍ර: ඒකත් හේතුවක් ද කියල ද කියන්නේ?

පි ඒකත් හේතුවක් ඒ හින්දා මං හිතන්නේ ලංකාවේ අය කැමති නැහැ. නමුත් ඉන්දියන් අය සමහරක් වේලාවට දැන් උදාහරණයක් හැටියට බලන්න දැන් අපි දන්නවා ඉදිකිරීම් ශ්‍රැංග්‍රිලා අරෙහෙ මෙහෙ හෝටල්වල ඉදිරිකිරීම්වල ඉන්නේ වයිනිස් අය ඇවිල්ලා කරන්නේ labour හැබැයි අපේ රටේ labour නැද්ද, අපේ රටේ labour තියෙනවා. නමුත් ඒ මිනිස්සු ආහම අපේ මිනිස්සුන්ට ඕන ඇත්තටම මට මෙතන කොමිෂන්

FAIR COMMENT BY JEZEEM

එකේ කියන්න වෙනවා ඇත්තටම අපේ මිනිස්සුන්ට වඩා වැඩ කරනවා. ඉතිං ඒ කර්මාන්තකරුවෝ කොන්ත්‍රාත්කරුවෝ කැමති ඒ මිනිස්සු ගෙනත් තියාගෙන වැඩ කරන්න. අපි දන්නවා ඒක සමහරක් වෙලාවට රටටත් හානියක් වෙයි කියලා. අපි ශ්‍රම මාකට් එක තියාගෙන ඇයි අපි Import කරන්නේ. නමුත් මේක ප්‍රශ්නයක්. මේක ක්ෂේත්‍රයේ තියෙන ප්‍රශ්නයක්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් මහත්මයා ඔය කර්මාන්ත අමාත්‍යාංශයෙන් විදේශිකයන්ට වීසා ලබාදීමට ආගමන විගමන පාලකවරයට නිර්දේශ කරන කොට ඒ එන ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳවනව ද?

උ: අපි කැඳවනවා බෝම්බ පිපිරීමෙන් පස්සේ . ඒ වෙනකන් කැඳෙව්වේ නැහැ. මොකද කිසිම අවස්ථාවක මේ යකඩදීම සම්බන්ධයෙන්වත් අපි ලබාදෙන සේවක නිර්දේශ සම්බන්ධයෙන්වත් මේ රටේ ආරක්ෂාව භාරවෙලා තියෙන කිසිම ආයතනයක් අපිට කියලා නැහැ ඔය ගොල්ලෝ යකඩ දෙන්නේ වැරදි පුද්ගලයට කියලා. අපිට කියලා නැහැ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට ලේකම්තුමා ඔන්න ඔබතුමාලා නිර්දේශ ලබාදෙන්නේ වැරදි අයට කියලා. අපි හිතන්නේ අපි මේක යහපත් සේවයට කරන කොට යහපත් විදියට සිද්ධ වෙයි කියලා. හැබැයි අවාසනාවන්ත සිද්ධියක් සිද්ධ වුණයින් පස්සේ තමයි අපි තේරුම් ගත්තේ මෙතැන මෙහෙම සිද්ධියක් වෙලා තියෙනවා කියලා. දැන් අපි මං දැන් කර්මාන්ත අමාත්‍යාංශයේ නැහැ. මං දැන් ඒ නිලධාරීන්ගෙන් අහලා බැලුවම ඒ ගොල්ලෝ දැන් ආරක්ෂක අමාත්‍යාංශයේ නිෂ්කාශන වාර්තාව ලබාගන්නවා. එතකම් ගත්තේ නැහැ.

ප්‍ර: දැන් බෝම්බ පිපිරීමෙන් පස්සේ හරි විමර්ශනයක් කරලා හොයල බැලුවද ඒ වන විට ඔය ක්ලොසියස් පුද්ගලික සමාගමේ සේවය කරපු මේ විදේශිකයන් 25 දෙනා සම්බන්ධයෙන් ඒ කියන්නේ ආරක්ෂක නිෂ්කාශන වාර්තා කැඳෙව්ව ද , ඔවුන් කවුද කොහෙන්ද ඇවිල්ලා තියෙන්නේ ඒවා හොයලා බැලුවද ?

උ: නෑ වහාම මම මට පුළුවන් හැකි ඉක්මනින් ආරක්ෂක ලේකම්වරයා වෙත දැන්නුවා 04/23 වැනිදා මෙහෙම සිද්ධියක් වෙලා තියෙනවා ඒ ලිපිය මං ළඟ තියෙනවා. ඔවුන් ගැන සොයා බලන්න කියන කාරණය.

ප්‍ර: දැන් මහත්මයට වාර්තා වුණාද ඒ අය සම්බන්ධයෙන් ඒ වාර්තා කියවලා?

උ: නැහැ මට වාර්තා වුණේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ එහෙම හොයලා බැලුවාද වාර්තා කැඳෙව්ව ද කියලා ඔබතුමාට මේ අවස්ථාවේ දැනීමක් තිබෙනවද?

උ: නැහැ මට එහෙම දැන්නුවේ නැහැ. නමුත් මං විශ්වාස කරනවා එහෙම ආරක්ෂක අමාත්‍යාංශයේ මගේ letter එකට reference කරලා letter

FAIR COMMENT BY JEZEEM

එකක් ආවේ නැහැ. ඔන්න මේ දීලා තියෙන 25 යෙන් මෙච්චරක් ත්‍රස්තවාදීන් කියලා ලියමනක් ආවේ නැහැ. එහෙම දැනුවත් කිරීමක් කළේ නැහැ. මං හිතනවා අපි නිවැරදි යට විසා recommendation දීලා තියෙනවා කියලා. මොකද අපි කරන්නේ facilitation in the industry.

ප්‍ර: දැන් මහත්මයට කියන්න පුළුවන් ද දැන් ඔය ආරක්ෂක නිෂ්කාශන වාර්තා ඔබ කිව්වා බෝම්බ පිපිරීමෙන් පස්සේ දැන් කැඳවනවයි කියලා?

උ: කැඳවනවා කියලා කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් මෙතැනත් ඉන්නවා දෙන්නෙක් ඇවිල්ලා. ඒ ගොල්ලෝ කිව්වා කැඳවනවා කියලා.

ප්‍ර: දැන් ඒ කොහොමද ඒක කැඳවන්නේ. ඒ රටේ පොලීසිවලින් ද නැත්නම් කොහොම ද ඒක හොයලා බලන්නේ. ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් කොහොමද මොන ආකාරයට ද ඒක ක්‍රියාත්මක වෙන්නේ?

උ: ඇත්තටම ඒ පිළිබඳව දැන් ගන්න ක්‍රියාමාර්ග පිළිබඳ මගේ මම අමාත්‍යාංශයේ නැති හින්දා මගේ දැනුවත් භාවය අඩුයි.

ප්‍ර: නමුත් එසේ සොයා නොලැබුවොත් ඒක ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙනවා නේද, ඒ ඕනම පුද්ගලයෙකුට එහෙම Working ?

උ: වෙන්න හැකියාව තියෙනවා ඉතිං ඇත්තටම.

ප්‍ර: රැකියා කරන්න එන්න වීසා ලබාදුන්නොත් ඒක ජාතික ආරක්ෂාවට වුණත් තර්ජනයක් වෙන්න පුළුවන් නේද?

උ: ඇත්තටම රැකියා කරන්න විතරක් නෙවෙයි රටට එන ඕනම පුද්ගලයන්ගෙන් විදේශ අයගෙන් එහෙම හැකියාවක් වෙන්න පුළුවන්. මොකද විවිධ ත්‍රස්තවාදී සංවිධානවලින් එහෙම එනවා නමුත් ඇත්තටම අපිට කර්මාන්ත facilitate කරන්න ගියොත් එහෙම මම කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා හැටියට මේ සියල්ල බෙරගෙන එතකොට ඒක කරන්න අමාරුයි කර්මාන්ත අමාත්‍යාංශයට. ඇත්තටම ඒක කරන්න ඕන රටේ ආරක්ෂක අමාත්‍යාංශය කියන එක තමයි මගේ නම් විශ්වාසය.

ප්‍ර: අර ඉන්දියාවේ ඉඳලා ආපු පුද්ගලයෝ ඉන්දියාවේ කොයි ප්‍රදේශයේ ද ඒ සම්බන්ධයෙන් සොයලා බැලීමක් හරි දැනීමක් හරි ඔබට තිබෙනව ද?

උ: නැහැ. ඒකේ Application එකක් නම් මං ළඟ තියෙනවා. මට ඒ පිළිබඳව හැගිමක් නැහැ කොයි ප්‍රදේශයෙන් ද කියලා.

ප්‍ර: මේ අවස්ථාවේ දී දැන් ඔබ කිව්වා මේ විසා නිර්දේශ කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම් වෙත ලේකම් රංජිත් අශෝක යන අයගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරලා තිබෙනවා ලිපියක්. ඒ බෝම්බ පිපිරීමෙන් පස්සේ. 2019/04/23 වැනිදා. ඒ වාර්තාවේ ඒ වන විට ක්ලොසියස් සමාගමේ සේවය කරපු සේවකයින් 25 දෙනාගේ නම් ඒ අයගේ ගුවන් ගමන් බලපත්‍ර අංකය ඔවුන් කුමන රටේද සහ ඔවුන් කුමන තනතුරකද එහි සේවය කළේ. ඔවුන්ගේ වීසා වලංගු කාල පරිච්ඡේදය සහ

FAIR COMMENT BY JEZEEM

ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණි දිනය ආදී සියළු තොරතුරු ඇතුළත් වාර්තාවක් ඔබට මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: හැකියාවක් තිබෙනවා.

ක්ලොසියස් Private සමාගමේ නේවාසික වීසා නිර්දේශ කිරීම සම්බන්ධව ලිපිය C 784 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මේ බෝම්බ පිපිරීමට අදාළව ඔබ පස්සේ මේ සම්බන්ධයෙන් සොයලා බැලුවම දැනගත්තයි කිව්වා මේ එම්.අයි. ඉන්සාෆ් අහමඩ් කියන කර්මාන්තකරුත් මේ බෝම්බ පුපුරාගෙන මියගොස් ඇති බවට?

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ පුද්ගලයා ඔබට ඔබේ රාජකාරී පරාසය තුළදී ඔබේ ආයතනයට ඇවිල්ලා තිබෙනව ද හමුවෙලා තිබෙනව ද?

උ: ඇත්තටම කර්මාන්ත අමාත්‍යාංශයට ඇවිල්ලා තිබෙනවා. කවදාවත් මයි කාමරයට ඇවිල්ලා නැහැ ඔතන හිටියා ඉජාමඩ් ද කවුද කියලා Accountant කෙනෙක් ඒ Accountant තමයි එන්නේ. මම ඇත්තටම හිතන් හිටියේ ඒ පුද්ගලයයි අයිතිකරු කියලා. මොකද ඔහු කර්මාන්ත අමාත්‍යාංශයට ආවම කතා කරන්නේ එයාගේ ආයතනය වගේ. ඇත්තටම ඒ තරම් බැඳීමක් ඒ මනුස්සයට තිබුණා. පස්සේ තමයි මං දැනගත්තේ මේකේ අයිතිකාරය වෙන එක්කෙනෙක්. මේ එන පුද්ගලයා වෙන එක්කෙනෙක් කියන කාරණය.

ප්‍ර: දැන් ඉන්සාෆ් අහමඩ් කියන මේ පුද්ගලයා එවකට කර්මාන්ත අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා වශයෙන් හිටපු මේ රිෂාඩ් බදුර්දීන් මහත්මයත් එක්ක මොකක් හරි සම්බන්ධතාවයක් තිබුණ ද කියලා ඔබ ඒ සම්බන්ධයෙන් සොයලා බැලුව ද?

උ: නැහැ මං සොයලා බැලුවේ නැහැ.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් මොනව හරි ඔබට දැනගන්න ලැබුණ ද?

උ: නැහැ දැනගන්න හම්බවුණේ නැහැ. හැබැයි ඔය ඉන්සාෆ් අහමඩ්ගේ මොකද ඒ දවස්වල වෙබ් එකේ ගියා එයාගේ තාත්තා අමාත්‍යාංශයට ඇවිල්ලා ගත්ත ෆෝටෝ වගයක්. ඒ හැබැයි ඉස්සර ගත්ත ෆෝටෝ වගයක්. මොකද ඒ ඉන්සාෆ් අහමඩ් විතරක් නෙවෙයි ඒ තාත්තා ඉන්සාෆ් අහමඩ්ට මේ රටේ දේශපාලන නායකයෝ දීලා තියෙනවා හොඳම කර්මාන්තකරු හැටියට ඡායාරූප. මේ ත්‍යාගදීලා තියෙනවා. Recommendation දීලා තියෙනවා. ඒවා Social media වල ඕන තරම් ගියා. එතකොට මම එක ෆොටෝ එකක් දැක්කා තාත්ත ඇවිල්ලා අමාත්‍යාංශයේ ඉඳලා ගත්ත ෆෝටෝ එකක්. පස්සේ හොයලා බලන කොට මට දැනගන්න ලැබුණා ඒක ගොඩක් කල් එකක් කියලා. මට ඒක වැදගත් වුණේ නැහැ ඇත්තටම.

ප්‍ර: දැන් ක්ලොසියස් සමාගමට අබලි තඹ සහනදායි මිලට ටොන් 500 ක් ලබාදෙන්නයි කියලා ඒ කාලේ ජනාධිපතිතුමාගේ මහජන සම්බන්ධතා

FAIR COMMENT BY JEZEEM

අධ්‍යක්ෂක ජනරාල්වරයෙක් විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ලිපියක් එවා තිබුනයි කියලා ඔබතුමා දැනුවත් ද?

උ: ඔව්.

ප්‍ර: ඒ ලිපියේ පිටපතක් මේ අවස්ථාවේ දී ඔබට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනව ද?

උ: පුළුවන්.

ප්‍ර: ඒ ලිපිය C 779 කියලා ඔබ ඉදිරිපත් කරපු කමිටු වාර්තාවේ තිබෙනව ද?

උ: තියෙනවා.

ප්‍ර: ඒ ලිපිය C 779 කියලා ඔබ ඉදිරිපත් කරපු කමිටු වාර්තාවේ තිබෙනව ද?

උ: තියෙනවා.

ප්‍ර: කමිටු වාර්තාවේ මොන පිටුවේ ද තියෙන්නේ?

උ: 130 පිටුවේ.

ප්‍ර: 130 පිටුවේ?

උ: ඔව්. ඇමුණුම් අංක 24.

ප්‍ර: එය කවුද අත්සන් තබා තිබෙන්නේ?

උ: ගරු ජනාධිපතිතුමාගේ මහජන සම්බන්ධතා අධ්‍යක්ෂක ජනරාල් ශාන්ත බණ්ඩාර. දිනය 2018 ජුනි 06.

ප්‍ර: මොන පදනමක් මත ද මේ ලිපිය ඉදිරිපත් කරල තිබෙන්නේ එතුමා?

උ: මම ඒකනම් දන්නේ නැහැ. මං හිතන්නේ මේ කර්මාන්තකරුවා යන්න ඇති එතැන්ටත් තඹ අවශ්‍යයි තඹ දෙන්න කියන කාරණය. සාමාන්‍යයෙන් ඕනෙම දේශපාලඥයෙක් ළඟට එහෙම ඉල්ලීමක් ආවයින් පස්සේ හෝ දේශපාලන කාර්යාලයකට එහෙම ඉල්ලීමක් ආවයින් පස්සේ ඒ අදාළ තැනට යොමු කරනවා. මං හිතන්නේ මම දන්නේ නැහැ මේකේ පදනම මොකද්ද කියලා මං හිතන්නේ මේකේ 500 කියලා සඳහන් වෙලා තියෙන හින්දා ඒ ගොල්ලෝ ඉල්ලන්න ඇති මෙක්ට්‍රික් ටොන් 500 දෙන්න කියලා. ඒ පුද්ගලයට.

ප්‍ර: දැන් එය යොමු කරලා තියෙන්නේ සභාපතිතුමා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත?

උ: කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත.

ප්‍ර: ඔබ වෙතත් ඉන්පසු ඉදිරිපත් වුණා ද?

උ: නැහැ මට ඉදිරිපත් වුණේ නැහැ.

ප්‍ර: මෙම ලිපිය C 779 B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. එය 2018 ජුනි 06 වන දින. ශාන්ත බණ්ඩාර ගරු ජනාධිපතිතුමාගේ මහජන සම්බන්ධතා අධ්‍යක්ෂක ජනරාල්තුමා විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලිපියක්. එසේම මෙම ක්ලොසියස් පුද්ගලික සමාගමේ කළමණාකරු වෙත ආරක්ෂක අමාත්‍යාංශයේ 2018/02/05 වන දින වන විට ක්‍රියාකර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් දේවිකා ලියනගේ මහත්මිය යම්කිසි ලිපියක් යවා තිබෙනවයි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා ඔබට ඔය කමිටු වාර්තාවේ දී විමර්ශනයේ දී හෙළිවෙලා තිබෙනව ද?

උ: හෙළිවෙලා තිබෙනවා. ඔව්.

ප්‍ර: ඒ කුමන කාරණයක් සම්බන්ධයෙන් ද?

උ: ඒත් මේ කාරණය සම්බන්ධයෙන් මං හිතන්නේ මේ පිත්තල ලබාදෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය හින්දා මේ පුද්ගලයා එතැන්ටත් ඉල්ලීමක් කරන්නත් ඇති. අපිට පිත්තල ලබාදෙන්න කියන කාරණය. එතැන්දි මං හිතන්නේ මේකේ Heading එකම තියෙන්නේ හිස් පතුරම් කොපු පිත්තල කොපු 1000 ක් ලබාගැනීම කියලා. අනිවාර්යෙන්ම මේ පුද්ගලයා ඉල්ලීමක් කරලා ඇති ආරක්ෂක ලේකම්වරයා වෙත අපිට අපේ කර්මාන්තයට පිත්තල කොපු 1000 ක් ලබාදෙන්න කියන කාරණය. එතැන්දී මේ සරත් කුමාර මහත්මයා අතිරේක ලේකම් ආරක්ෂක හැටියට කියලා තියෙනවා ජාතික ශිල්ප සභාව ලියාපදිංචි ආයතනයක් නොවන බවත් ජාතික ශිල්ප සභාව විසින් විරල මේ කතාව කියලා ඉවර වෙලා ලිපියක් යවලා තියෙනවා.

ප්‍ර: ඒ ලිපිය ඔබ ඉදිරිපත් කරපු කමිටු වාර්තාවේ ඇමුණුමක් විදියට තිබෙනවා ද?

උ: 131 වශයෙන් තියෙනවා ඇමුණුම 25.

ප්‍ර: ඇමුණුම 25 ඒ පොතේ පිටු අංක 131 සඳහන් වෙනවා.

උ: ඔව්.

2018 /02/05 දිනැති දේවිකා ලියන්ගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් යන අයගේ නමින් ඉදිරිපත් වී ඇති ලිපිය C 779 C වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා. එපමණයි උතුමාණෙනි.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ විසින් මේ කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරුවා නේද වාර්තාවක්. C 779 කියලා ඒකේ තියෙනවා නේද ඔබ විසින් පත් කරපු කමිටුවේ විමර්ශන වාර්තාව?

උ: ඔව්.

ප්‍ර: එම විමර්ශන වාර්තාව සලකා බලලා තියෙනව ද මෙම අබලි ද්‍රව්‍යය ක්ලොසියස් පුද්ගලික සමාගමට විකුණුවේ මාර්ගෝපදේශක සංග්‍රහයට අනුකූලව ද නැද්ද කියන කාරණය ?

උ: ඒක සලකලා තියෙනවා. මේක සලකලා තියෙනවා සර් මේක අමුණලත් තියෙනවා.

ප්‍ර: ඒකේ නිරීක්ෂණ කියලා තියෙනව ද?

උ: ඔව්.

ප්‍ර: සලකලා බලලා තියෙනව නම් නිරීක්ෂණත් තියෙන්න ඕනනේ?

උ: නිරීක්ෂණ තියෙන්න ඕන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තියෙනව ද කියලා බලලා කියන්න?

උ: මේකේ 07/05 යටතේ තියෙනවා. අංක 07/05 10 වැනි පිටුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම ක්‍රියාවලිය කිරීමේ දී අනුමත මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස අනුව හැකිකාත් ක්‍රියාකර ඇති බව නිරික්ෂණය වේ.

ප්‍ර: හැකිතාත් ක්‍රියාකර ඇති බවෙන් තේරෙන්නේ ඒ කියන්නේ ඒක සම්පූර්ණයෙන් මේව වෙලා නැද්ද?

උ: සර් ඇත්තටම මේ ප්‍රමාණය Guide line එක ඒ විදියටම කටයුතු කරානම් මේ ප්‍රමාණය ලබා දෙන්න බැහැ.

ප්‍ර: ඒක පිළිගන්නව ද?

උ: ඒක පිළිගන්නවා.

ප්‍ර: ඒ කියන්නේ මාර්ගෝපදේශ සංග්‍රහය හරියටම ක්‍රියාත්මක කෙරුවනම්?

උ: හරියටම ක්‍රියාත්මක කෙරුවනම් ලබාදෙන්න බැහැ.

ප්‍ර: ක්ලොසියස් පුද්ගලික සමාගමට මෙපමණ ද්‍රව්‍යය ලබාදෙන්න බැහැ?

උ: දෙන්න බැහැ මොකද සමානුපාතිකව තමා දෙන්න ඕන.

ප්‍ර: ඒක මාර්ගෝපදේශ සංග්‍රහයේ තියෙනවා?

උ: පැහිදිලිවම තියෙනවා.

ප්‍ර: ඒ මාර්ගෝපදේශ සංග්‍රහය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරපු මාර්ගෝපදේශ සංග්‍රහයක්ද?

උ: මාර්ගෝපදේශ සංග්‍රහයක්.

ප්‍ර: එතකොට එවැනි කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරපු මාර්ගෝපදේශ සංග්‍රහයකට පටහැනිව රජයේ සංස්ථාවකට ක්‍රියාත්මක කරන්න පුළුවන් ද බැරිද?

උ: සර් මෙහෙමයි මාර්ගෝපදේශ සංග්‍රහයක් කියලා කියන්නේ මට පැහැදිලි කරන්න අවස්ථාවක් දෙන්න. සමහරක් අවස්ථාවලදී ඇත්තටම අපි යා යුතු දිශාව සමහරක් වෙලාවට අපි හිතමු දැන් උදාහරණයක් විදියට අපේ තිබෙනවා මුදල් රෙගුලාසි නමුත් අපි හතමු රටේ disater එකක් ආවා කියලා. එතකොට ඒ අවස්ථාවේ දී අපි සාධාරණ හේතුමත මුදල් රෙගුලාසිවලින් බැහැර වෙන අවස්ථා තියෙනවා. මාර්ගෝපදේශ සංග්‍රහයක් කියන්නෙත් සාමාන්‍යය තත්ත්වයක් යටතේ ක්‍රියාකළ යුතු ආකාරය. සාමාන්‍යය තත්ත්වයක් යටතේ. එතකොට අපි හිතමු ඒක හැමදාම වෙන්න පුළුවන් එකක් නෙවෙයිනේ සාමාන්‍යය තත්ත්වයක් යටතේ. එතකොට ක්‍රියාකළ යුතු ආකාරය තමයි මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් වෙන්නේ. හැබැයි මේක පුරුද්දක් හැටියටම කරගෙන යනව නම් ඒක වැරදි.

ප්‍ර: එතකොට මෙතැන අඩුම ගාණේ අවුරුදු 02 ක් තියෙන සාක්ෂිවලට අනුව මෙම මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ක්‍රියාත්මක කරලා නැහැ නේද?

උ: නැහැ එතැන ක්‍රියාත්මක වෙලා නැහැ. හැබැයි අර audit report එකේ පැහැදිලිව එකතැනක audit recommendation වල internal audit

Parliament Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

recommendation වල සඳහන් වෙනවා මූල්‍යය තත්ත්වය ගැන සිතා ගත්තත් දිගු කාලීනව කිරීම මේක නිරීක්ෂණයයි. එතකොට මං හිතන්නේ සභාපතිතුමා ඔය අවස්ථාවේ මට මතකයි මම අයිඩීබී එකට ඇතත්ටම මුදල් හිඟයකුත් තිබුණු වගේ මතකයක් තියෙනවා. මං හිතන්නේ ඒ හින්දා තීරණය ගත්ත ද කියලා දන්නේ නැහැ කියන කාරණය තමයි මට ලේකම්වරයා විදියට හිතෙන්නේ.

ප්‍ර: එතකොට මුදල් හිඟයක් තියෙනවා කියලා කැබිනට් තීරණයට පටහැනිව ක්‍රියාකරන්න පුළුවන් ද?

උ: නෑ කැබිනට් තීරණයකට සමානාත්මයෙන් පටහැනිව ක්‍රියාත්මක කරන්න බැහැ. නමුත් ආයතනයක සභාපතිවරයෙක් දැම්මාම ආයතනයේ සභාපතිවරයගේ වගකීමක් තමයි ඒක කළමණාකරණය කරන එක. සමහර අවස්ථාවලදී එතුමට ඒක ප්‍රශ්නයක් වෙන්න පුළුවන් ආයතනයක් මුදල් නැතුව කරගෙන යන්න අමාරු වුණාම.

ප්‍ර: එතකොට මුදල් නැතිවෙලා නැහැ බෝනස් ගෙවලා තියෙනවා දහතුන්දාහස් ගාණේ, නේද ඔබ දන්නවා නේද දහතුන්දහස් ගාණක් බෝනස් ගෙවලා කියලා?

උ: නැහැ මං ඒක දැනුවත්ව හිටියේ නැහැ.

ප්‍ර: දන්නැද්ද ඒක?

උ: නැහැ මං දැනන් හිටියේ නෑ.

ප්‍ර: ලේකම් වශයෙන් ඔබ දැනගෙන සිටිය යුතුයිනේ?

උ: දැන් සමහරක් අවස්ථාවලදි බෝනස් ගෙවන්න පුළුවන් රජයේ ආයතනවල ලාභ තියෙනව නම් පමණයි. නමුත් අපේ සමරක් සංස්ථාවල

ප්‍ර: නැහැ මං ඒක කිව්වේ දැනටමත් මේ කොමිෂන් සභාව ඉස්සරහ සාක්ෂිදිලා තියෙනවා ඔය දික්වැල්ල මහත්මයා. ඔහු කියනවා මේ විදියට විකුණපු හින්දා බෝනස් දෙන්න පුළුවන් වුණා දහතුන්දාහ ගාණේ. ඒක හරිද, සාධාරණයි ද?

උ: දැන් මේක බෝනස් දෙන්න මේක වික්ක නම් සම්පූර්ණයෙන්ම වැරදි. හැබැයි මොකක් හරි ආර්ථික දැන් මොකක් හරි මම දන්නේ නැහැ හේතුව. එහෙම ඒ වෙලාවේ වෙනත් විශේෂ හේතුවක් හින්දා ගත්ත නම් සභාපතිවරයා තීරණය සමහරක් වෙලාවට ඒක වෙනම කාරණයක්.

ප්‍ර: නමුත් ඔබ පිළිගන්නවා කැබිනට් තීරණයක් තියෙනව නම් ඒක

උ: අපි පුළුවන් තරම් හැකිතාක් දුරට ඒක ක්‍රියාත්මක කරන්න ඕන.

ප්‍ර: අනිත් එක ඔය මාර්ගෝපදේශ සංග්‍රහයට අත්සන් කරලා තියෙනවා නේද? එවකට හිටපු කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා සහ අමාත්‍යාංශයේ ලේකම්වරයා? දෙන්නම අත්සනක් කරලා තිබෙනව ද?

උ: ඔව්.

ප්‍ර: ඔබව කොයි අවස්ථාවක හරි දැනුවත් කෙරුවද මේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ක්‍රියාත්මක වෙන්න බැහැ අපි ඊට පටහැනිව ක්‍රියාත්මක වෙනවා කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: නැහැ මාව දැනුවත් කළේ නැහැ.

ප්‍ර: ඔබ එහෙම දැනුවත් කෙරුව නම් ඔබ මොනව ද කරන්නේ?

උ: මං කියන්නේ පුළුවන් තරම් මාර්ගෝපදේශ සංග්‍රහයට මට ලේකම්වරයා හැටියිට ඊට පටහැනි දෙයක් කියන්න බැහැ. නමුත් මං කියන්නේ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කරන්න කියන කාරණය.

ප්‍ර: ඒ කියන්නේ ඔබ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ඔබටත් මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව වැඩ කරන්න එපා කියලා කියන්න බැරිනම් සභාපතිවරයටත් බැහැ නේද?

උ: ඒක උත්තරයක් හැටියට බැහැ. නමුත් මේ කළමණාකරන තියෙනවා සමහරක් වෙලාවට ආයතන කළමාණාකරණය කරන කොට ඒ කළමණාකරුවන්ට ගන්න සිද්ධ වෙනවා.

ප්‍ර: උත්තරයක් වශයෙන් බැහැනේ නේද? ඔබට අනුන්ව ආරක්ෂා කරන්න අවශ්‍යතාවයක් නැහැනේ?

උ: නැහැ මං කිසිම කෙනෙක් ආරක්ෂා කරන්නේ නැහැ. නමුත් ඒ වෙලාවේ හිටපු කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මේ ආයතනවල මම නිතරම හිතුවේ කොහොම ද මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය වැඩිදියුණු කරන්නේ කියන කාරණය.

ප්‍ර: නමුත් ඔබ පිළිගන්නවා මේ විදියට මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ඒ අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතිය නිර්මාණය කරන්න බැරිව තිබ්බනම් ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා වශයෙන් ඔබව දැනුවත් කිරීමක වගකීමක් තිබ්බා කියලා?

උ: ඔව් අඩු ගාණේ මගේ අතිරේක ලේකම්වරයා හරි දැනුවත් කරානම් හොඳයි.

ප්‍ර: හොඳයි නෙමේ ඒක වෙන්න ඕන නේද?

උ: එහෙමයි සර්. දැන් මෙහෙමයි වැඩේ මං අර මුලින් කිව්වා ආකාරයට මම ලේකම්වරයා හැටියට අතිරේක ලේකම්වරු 10 ක් වගේ ප්‍රමාණයක් එක්ක හිටියා. ඊට ප්සසේ අමාත්‍යාංශය දැන් අද බැලුවාහම ඒ අමාත්‍යාංශය මගේ තිබ්ච්ච අමාත්‍යාංශය අමාත්‍යාංශ 04 ට විතර කැඩිලා තියෙන්නේ. එතකොට මේ මම ඒක අතිරේක ලේකම්වරුන්ට රාජකාරිය පැවරුවයින් පස්සේ මේ හැම කාරණයක් ගැනම ලේකම්වරයට සොයා බැලීමට තියෙන අපහසුවක් තියෙනවා. එතකොට මේ ඇත්තටම මේ බෝම්බ සිද්ධියෙන් පස්සේ තමයි මේකේ වැදගත් කාරණයක් වුණේ.

ප්‍ර: නැහැ ඒක අපි පිළිගන්නවා.අපි ඔබගේ අතපසුවීමක් ගැන නෙවෙයි අහන්නේ. ඔබ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් අවසාන වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඔබටයි හිමි වන්නේ?

උ: මට සම්පූර්ණ වගකීම තියෙනවා.

ප්‍ර: හරි එතකොට මේ අබලි ද්‍රව්‍යය ව්‍යාපෘතියේ යම්කිසි පාඩුවක් නැත්නම් මාර්ගෝපදේශ වලට පටහැනිව ක්‍රියා කරල යුතු තියෙනව නම් අවසානයේ දී වගකියන්න ඕන ගණන්දීමේ නිලධාරියා වශයෙන් ඔබ?

FAIR COMMENT BY JEZEEM

ඌ: මට වගවීමක් එනවා. නමුත් ඒ තීරණය ගත්ත පුද්ගලයා තමයි වග කියන්න ඕන.

ප්‍ර: හරි ඔබ accountability එකක් ඔබට එනවා?

ඌ: අනිවාර්යෙන්ම එනවා. ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හැටියට.

ප්‍ර: ඒ accountability එකට ඔබට එන හින්දා එවැනි මාර්ගෝපදේශනය සංග්‍රහවලට පටහැනිව ක්‍රියාකරනව නම් අනිවාර්යෙන්ම ඔබ දැනුවත් කිරීමක් කළ යුතුව තිබුණා?

ඌ: කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කරානම් හොඳයි ඒ අවස්ථාවේ දී ඇත්තටම.

ප්‍ර: යුතුව තිබුණා නේද?

ඌ: ඔව්.

ප්‍ර: යුතුව තිබුණා නේද?

ඌ: හැබැයි සර් මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මේ කාර්මික සංවර්ධන මණ්ඩලය ගත්තාම IDB ආයතනය ගත්තාහම සභාපතිවරයාට උඩින් අධ්‍යක්ෂක මණ්ඩලයක් ඉන්නවා. ඒ අධ්‍යක්ෂක මණ්ඩලය මං දන්න විදියට මං ළඟ ඒ දැන් ඉතාමත් මං දන්න විදියට ඒ Board එකේ ඉන්නේ මං ළඟ ඒ අධ්‍යක්ෂක මණ්ඩලයේ විස්තර නැහැ. මේ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් තියෙන අය තමයි වැඩි හරියක් ඉන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔබ කිව්වා යම්කිසි පාඩුවක් Guide line එක අනුගමනය නොකර පාඩුවක් සිදුවුණා නම් එයට වගකිව යුත්තේ කවුද?

ඌ: තීරණය ගත්ත පුද්ගලයා.

ප්‍ර: එතකොට ඔහු ඒ තීරණය ගත්ත පුද්ගලයා ඒ පාඩුව ඔහුගෙන් Surcharge කරන්න පුළුන් බව විගනන පනත අනුව දන්නව ද?

ඌ: එහෙම Surcharge කරන්න පුළුවන්. හැබැයි යුතුකමක් තියෙනවා ඒ පුද්ගලයගෙන්.

ප්‍ර: ඔය විගනන පනත අනුව අනිවාර්යෙන්ම Surcharge කරන්න පුළුවන් ද?

ඌ: Surcharge කරන්න පුළුවන් නමුත් ඒක සාධාරණව ඔප්පු වෙන්න ඕන. ඇයි එයාගෙන් අහන්න ඕන. ඇයි ඔයා

ප්‍ර: ඒක වෙනම දෙයක් අහලා ඔහු වරදකාරය වුණොත් Surcharge කරන්න පුළුවන් ?

ඌ: කිසිම රජයේ නිලධාරියෙකුට අයිතියක් නැහැ රජයේ මුදල් අවභාවිතා කරන්නවත් රජයට පාඩුවක් කරන්නවත්. එහෙම කරොත් ඒක අනිවාර්යයෙන් Surchargeකරන්න පුළුවන්. එහෙම තමන් කළේ සත්භාවයෙන් කියන කාරණය ඔප්පු කරන්න බැරි වෙන කොට.

ප්‍ර: ඒ බලතල විගනන පනත අනුව දැන්?

FAIR COMMENT BY JEZEEM

ඌ: අනිවාර්යයෙන් තියෙනවා.

ප්‍ර: අනිවාර්යයෙන් තියෙනවා?

ඌ: අනිවාර්යයෙන් තියෙනවා. සියළුම රජයේ නිලධාරීන් දැනගන්නත් ඕන.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මං ඔබෙන් ප්‍රශ්න ඇහුවේ C 779 වශයෙන් ලකුණු කරපු කමිටු වාර්තාවට අනුව.

ඌ: ඔව් සර්.

ප්‍ර: ඔබ එතකොට මගේ අවධානය යොමු කෙරුවා 7/5 කියලා මෙම ක්‍රියාවලිය හැකිතාක් දුරට මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කරලා තියෙන්නේ කියලා?

ඌ: ඔව්.

ප්‍ර: නමුත් ඔය නිරික්ෂණවල කොහෙවත් ප්‍රකාශිතව මේ ක්ලොසියස් පුද්ගල සමාගමට මේ අබලි ද්‍රව්‍යය විකිණීමේ දී විකුණුම් මිල මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලවද නැද්ද කියන එක ප්‍රකාශිතව මේ සලකා බලලා නැහැ?

ඌ: ඔව්.

ප්‍ර: ඊට අමතරව ඔය නිරීක්ෂණවල ක්ලොසියස් පුද්ගලික සමාගම මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සුළු, කුඩා හෝ මධ්‍යයම කර්මාන්තයක් ද කියන එක ප්‍රකාශිතව සලකා බලලා නැහැ?

ඌ: ප්‍රකාශිතව සලකා බලලා නැති වුණාට සර් මේ අපේ තියෙනවා මම ඒ කර්මාන්ත අමාත්‍යාංශයෙන්ම ලිඛිතවම ගෙන්න ගත්තා.

ප්‍ර: නැහැ නැහැ මං ඒ වෙනත් කරුණු ගැන නෙවෙයි වාර්තාව ගැන විතරයි අහන්නේ. වාර්තාවේ එහෙම ප්‍රකාශිව සලකා බලලා තියෙනව ද?

ඌ: ඒක සලකා බලලා නැහැ.

ප්‍ර: එම කමිටු වාර්තාවේ නිරීක්ෂණවල ප්‍රකාශිතව සලකා බලලා තියෙනව ද අභ්‍යන්තර විගනන අංශය විසින් ඉදිරිපත් කරපු විගණන විමසීම් හා ඊට අදාළව ලබාදුන් පිළිතුරු සම්බන්ධයෙන් ඔය නිරික්ෂණ වාර්තාවේ ප්‍රකාශිතව සඳහන් කරලා තියෙනව ද?

ඌ: මේකේ ප්‍රකාශිතව සඳහන් කරලා නැහැ. හැබැයි ඒක ඇමුණුමක් හැටියට දාලා තියෙනවා.

ප්‍ර: අපිට ඕන ලේඛනයක් අමුණන්න පුළුවන්නේ. වාර්තාවක අගය තියෙන්නේ නිරික්ෂණය මොනවද කියන එකනේ.

ඌ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ වැරැද්දක් වෙලාද නැද්ද කියන්නේ නිරික්ෂණ වලින් නේද?

ඌ: ඔව්.

ප්‍ර: එතකොට ඒ නිරික්ෂණ වල පෙන්වනවා නේද මොන කරුණුද සලකා බලලා තියෙන්නේ කියලා. මොනවද සලකා බලන්නේ නැත්තේ කියලා?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.

ප්‍ර: හරිනේ ඒකත් එතකොට සලකා බලලා නැහැනේ?

උ: නැහැ. Report එක ගැන මේකේ කියවිලා නෑ.

ප්‍ර: දැන් ඊයේ කොමිෂම ඉස්සරහ සාක්ෂි දීමේදී එක් සාක්ෂිකරුවෙක් කිව්වා 2018 වර්ෂයේ දී කිරිබත්ගොඩ ප්‍රදේශයේ හිටපු කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් කාර්මික සහ වාණිජ අමාත්‍යාංශයට ඇවිල්ලා උද්ඝෝෂණයක් කෙරුවා කියලා. ක්ලොසියස් පුද්ගලික සමාගමට වැඩි වශයෙන් ලබාදුන්නු අබලි ද්‍රව්‍යය සම්බන්ධයෙන්? ඔබට ඒක මතකයක් තිබෙනව ද?

උ: නැහැ මට මතකයක් නැහැ.

ප්‍ර: එහෙම සිද්ධියක් වුණා ද නැද්ද කියලා ඔබට මතක ද?

උ: මං දැනුවත්ව නම් උද්ඝෝෂණයක් වුණේ නැහැ.

ප්‍ර: සාක්ෂි ලබාදීලා තියෙන්නේ 2018 වර්ෂයේ කිරිබත්ගොඩ ප්‍රදේශයේ පිත්තල කර්මාන්තකරුවා ඔබට මතකයක් නැහැ?

උ: නැහැ මට මතකයක් නැහැ.

ප්‍ර: මැයි හෝ ජූනි මාසයේ 2018?

උ: සර් එහෙම උද්ඝෝෂණයක් කරා කියලා මතකයක් නැහැ. නිතරම ඔය මිනිස්සු ඇවිල්ලා ඉල්ලනවා. නමුත් ඒක උද්ඝෝෂණයක් හැටියට මම

ප්‍ර: වචනය වෙන්න පුළුවන්.

උ: නිතරම ඇවිල්ල ඉල්ලනවා.

ප්‍ර: යම්කිසි විරෝධතාවයක් ක්ලොසියස් පුද්ගලික සමාගමට මේක ලබාදුන්නා කියලා.

උ: ඔව් සර් ජනාධිපති කාර්යාලයේ දී ඒ ගොල්ලෝ විරුද්ධ වුණා.

ප්‍ර: දැන් ඔබ අද කොමිසමේ සාක්ෂි දෙනකොට පිළිගත්තා මේ ක්ලොසියස් පුද්ගලික සමාගමට මේ විදිහට අබලි ද්‍රව්‍යය දිලා ඔවුන් ඒවායි යම් අගය වැඩිකිරීමක් කරලා පිටරට යවපු එකෙන් මේ මාර්ගෝපදේශ සංග්‍රහයේ පරාමර්ථවලට පටහැනි කියලා? මේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව. ඔබ කිව්වා තවත් ඒවා තියෙනවා කියලා වෙන වෙන කරුණු සම්බන්ධයෙන් අබලි ද්‍රව්‍යය විකිණීම සම්බන්ධයෙන් තියෙන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනියි කියලා ඔබ ඉස්සෙල්ලා පිළිගත්තා හරි ඒක?

උ: හ්ම්.

ප්‍ර: ඒක හ්ම් එක හරියන්නේ නැහැ ඔව්ද නැද්ද කියන්න?

උ: සර් මෙහෙමයි ඇත්තටම මං කිව්වේ ඒ මාර්ගෝපදේශ සංග්‍රහයේ දී පැහැදිලව සඳහන් වෙලා තියෙනවා ඒවා ලැබෙන යකඩ ප්‍රමාණය කොහොමද බෙදන්න ඕන කියන ප්‍රමාණය. පිත්තල ප්‍රමාණය කොහොම බෙදන්නේ කියලා.

ප්‍ර: ඒක ගැන නෙමේ මං අහන්නේ. ඒ මාර්ගෝපදේශ සංග්‍රහයේම තියෙනවනේ මේ ද්‍රව්‍යය අපනයනය කිරීම තහනම් කරන්න ඕන කියලා.

උ: ඔව්.

Presidential Secretariat COPY
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක තහනම් කරන එක පරමාර්ථය ඒවා අමුද්‍රව්‍යය වශයෙන් ලංකාවේ අර සුළු සහ කුඩා කර්මාන්කරුවන්ට ලබාදීමනේ?

උ: ඔව්.

ප්‍ර: අපනයන තහනම් කෙරුවම මේක ලංකාවේ විකුණන්න ඕන?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ විදියට ක්ලොසියස් සමාගමට ලබාදීලා ඒ කට්ටිය විශාල වශයෙන් පිටරට යවපු එකෙන් ඒ ලංකාවේ තියෙන පුද්ගලයින්ට තියෙන ප්‍රමාණය අඩුවීම මේ මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිනේ?

උ: සර් ඒ වුණාට ඔය සම්බන්ධයෙන් දැන් මෙතන Value added products Export කරන එක සම්බන්ධයෙන් ඊට පස්සේ කැබිනට් එකෙන් decision එකක් අරන් තියෙනවා.

වේලාව:ප.ව.03.15
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.03.15
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: නැහැ Mr. අශෝක මම හරි මම ඒක පිළිගන්නවා.

පි: ඔව් සර්.

ප්‍ර: ඔබ කියනවා වෙනත් වෙන වෙන අවස්ථාවල වෙන වෙන කැබිනට් පත්‍රිකා ඇති. මම මේ කතා කරන්නේ මේ මාර්ග උපදේශ සංගහ්‍රය ගැන විතරයි.

පි: මේ මාර්ග උපදේශ සංග්‍රහයේ එහෙම සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර: එතකොට ඔය විදිහට කොලෝසියස් සමාගමේ ඒක කෙරුවාම මේ මාර්ග උපදේශ සංග්‍රහයේ මූලික පරමාර්ථවලට පටහැනියිනේ?

පි: පටහැනි වීමක් වෙලා තියෙනවා එතන.

ප්‍ර: එතකොට ඒ පිළිබඳව ඔබ ආමත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් දැනුවත් වීමක් වුණා නම් ඔබ ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා නේද?

පි: ඔව් අනිවාර්යයෙන් මං කියනවා කරන්න එපා කියලා එහෙම.

හරි ස්තුතියි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: අශෝක මහත්මයා ඔබ වාණිජය පිළිබඳ හදාරලා උපාධිය ලබාගෙන තිබෙනවා. ඔබ ඒ විෂය පිළිබඳ හොඳ හසල දැනුමක් තියෙනවා. දැන් ඔබ සාක්ෂි දීපු විදිහට මට තේරුණේ අපේ රටට විදේශ විනිමය ගලාගෙන ඒම ආර්ථිකයට ශක්තියක්. එතකොට දැන් මේ කොලෝසියස් සමාගම මේ විදිහට විශාල වශයෙන් සල්ලි උල්පතක් මවාගෙන ඒගොල්ලෝ අපනයනය කරලා ලංකාවට ආදායමක් ගෙනාවනම් සත්භාවයෙන් ඒක ලොකු දෙයක් හැටියට අපිට සළකන්න පුළුවන් නේද?

පි: ඔව්.

ප්‍ර: ඒ වුණාට ඒ අය ඒ ගෙනාපු විශාල මුදල් සම්භාරය වැඩි හරියක් වැය කරලා තියෙන්නේ අන්තවාදී ඉස්ලාම් ත්‍රස්තවාදී ක්‍රියාවලට නම් මේ කටයුත්ත කොහෙත්ම සාධාරණීකරණය කරන්න බැහැ නේද?

පි: බැහැ මේ කටයුත්ත සාධාරණීය කරන්න බැහැ. ඔව්

ප්‍ර: එතකොට දැන් ඔබ කොයි ආකාරයට මේක සාධාරණීකරණය කරන්න උත්සාහ කළත් ආර්ථික පැත්තෙන් යම් වාසියක් අපේ ලංකාවට තිබුණා කියලා මේ කොමිෂම ඉදිරියේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව 2019 ජනවාරි, පෙබරවාරි, මාර්තු ඒ මාස 3 තුළ පමණක් මේ ඉන්ෂාෆ් අහමඩ් ඇතුළු පිරිස රුපියල් කෝටි 4 ½කට ආසන්න මුදලක් මේ පිරිස විසින් ඒ

FAIR COMMENT BY JEZEEM

අන්තවාදී ත්‍රස්තවාදී කටයුතුවලට යොදවලා තියෙනවා. දැන් ඔබට පැහැදිලි වෙනවද මේ පැන පැන ගිහිල්ලා මේ සල්ලි හම්බ කරලා තියෙන්නේ කුමන කාර්යයක් සඳහාද කියලා? තේරෙනවා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ මට්ටමින් බලනකොට 2018 ජුනි මාසේ 6 වෙනිදා ජනාධිපති කාර්යාලයට ගිහිල්ලා ජනාධිපති කාර්යාලයේ ඉන්න එතන ඒ ශාන්ත බණ්ඩාර කියන ජනාධිපති මහජන සම්බන්ධතා අධ්‍යක්ෂකවරයාගේ උපකාරය ඇතිව ඒ අය උත්සාහ දරලා තියෙන්නේ තවත් තඹ ටොන් 500ත් අරගන්න සහන මිලට?

පි: ඔව් සහන මිලට

ප්‍ර: ඊට අමතරව 2018 පෙබරවාරි 05 වෙනිදා ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක් වූ දේවිකා ලියනගේ මහත්මියගේ උපකාරය සහ ලිපිය උදව් කරගෙන පිත්තල 1000kg ක් සහන මිලට ගන්න. එතකොට ඔබට වැටහෙනවා නේද මේ අය මේ රටේ ආර්ථිකය පෝෂණය කරනවාට වඩා ඒ අයගේ ත්‍රස්තවාදය සහ අන්තවාදයට මුදල් යෙදවීමේ අරමුණින් තමයි මේවා කරලා තියෙන්නේ කියලා. එවැනි අවස්ථාවක දී ඔබ කියන විදිහට ඔබ දැනන් හිටියේ නැහැ මේවා ගැන. එවැනි අවස්ථාකව දී මෙවැනි පුද්ගලයන් කරන මෙම කටයුතු සම්බන්ධයෙන් මීට වඩා සුපරීක්ෂාකාරීව වැඩ කළ යුතුයි කියන එක ඔබ පිළිගන්නවද?

පි: අනිවාර්යයෙන් පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: ඔබ හිතන විදිහට මෙවැනි කටයුතු මින් ඉදිරියට සිදු නොවෙන්නට මොනවද කරන්න ඕනි?

පි: ඇත්තටම සර් දැන් අපි පැහැදිලි කරලා දෙන්නම්. මම කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මම වුණත් කවුරු වුණත් එතන හිටියාම මගේ ප්‍රධාන වගකීමක් තියෙනවා මේ රටේ අපනයන කොහොමද වර්ධනය කරන්නේ කියලා. එතකොට කර්මාන්ත අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය නෙමෙයි. අපිට ආරක්ෂක නිලධාරීන් නැහැ. අපිත් ආරක්ෂක සේවාවක් ගන්නේ පිටින්. එතකොට අපි කරන්නේ මේ රටේ ඉන්න කර්මාන්තකරුවෝ අපි ළඟට එනකොට අපිට කුමන ජාතියක් ද කුමන වසයක් ද කුමන ප්‍රදේශයක් ද කියන එක අපි බලන්නේ නැහැ. උදාහරණයක් විදිහට අපේ ඒ කාලේ තිබුණා වෙළෙඳ කටයුතු අමාත්‍යාංශය තිබුණෙත් අපේ. අපේ වෙළෙඳ අංශය ගත්තොත් දැන් පිටකොටුවේ වෙළෙන්දෝ ගත්තොත් වැඩි ප්‍රමාණයක් ඉන්නේ විවිධ සිංහල මිනිස්සුන්ට වඩා මුස්ලිම් සහ දෙමළ අය. එතකොට මේ ඔක්කෝම අපිට එකයි. මේ ඔක්කෝම ශ්‍රී ලංකිකයෝ. එතකොට අපි කරන්නේ මේ trade facilities හරි එහෙම නැත්නම් industry facilities හරි මේ රටේ ආරක්ෂක අංශයේ ප්‍රධාන වගකීමක් තියෙනවා. මේවා හොයලා බලන්න කාටද මේ මිනිස්සු උදව් කරන්නේ කියන කාරණය.

FAIR COMMENT BY JEZEEM

මොකද අපි ළඟට කර්මාන්තකරුවෙක් එනකොට දැන් මට පේන්නේ සියලු කර්මාන්තකරුවෝ එකයි කියලා. නමුත් ඕකෙන් පේනවා සියලු කර්මාන්තකරුවෝ එක නෙමෙයි කියලා. එතකොට අපිට දැන්වුවා නම් ඔයගොල්ලන්ගේ අමාත්‍යාංශයේ උදව් කරන්නේ මේවගේ පුද්ගලයින්ට, වීසා ලබා දෙන්නේ මේවගේ පුද්ගලයින්ට කියලා අපි තව දුරටත් ඒ කාර්ය කරන්නේ නැහැ. ඇත්තටම ඒ අංශවල වගකීමක් තියෙනවා සහාය කටයුතු අංශවල. ඒ නියාමනය කටයුතු කරන්න.

ප්‍ර: හරි මම ඔබගෙන් තව ප්‍රශ්නයක් අහන්නම්. මේක මගේ අවසාන ප්‍රශ්නය. ඔබට මතකද බෝම්බ පිපිරීම සිද්ධිය අප්‍රේල් 21 සිද්ධ වුණානේ?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ කර්මාන්ත අමාත්‍යාංශය පිහිටා තිබෙන ඒ ගොඩනැඟිල්ලේ රිෂාඩ් බදියුර්දීන් ඇමතිවරයා ඉන්න ඒ අදාළ ගොඩනැඟිල්ලේ 9 වන තට්ටුවේ රහස් කාමරයක යම් කටයුතු කෙරුන බවක් ඔබ පරීක්ෂණ කටයුතුවලදී සොයා ගත්ත තොරතුරක් තියෙනවද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: මොනවද ඒකේ තිබුණේ?

පි: ඒක 9 තට්ටුව මට 9 ද 8 ද කියන එක මතකයක් නැහැ. එහෙම චෝදනාවක් තිබුණා. ඒකත් මීඩියා වල ගියා. ඔය කියන්නේ සර් අපේ අමාත්‍යාංශයේ නෙවේ. අපේ අමාත්‍යාංශය තිබුණේ නවම් මාවතේ අනිත් පැත්තේ පාරේ. ඔය කියන ගොඩනැඟිල්ල ස.තො. ස බිල්ඩින් එක. ස.තො.ස බිල්ඩින් එකේ අපිට තිබුණේ සර් විදේශ ව්‍යාපෘතියක්. ඒ විදේශ ව්‍යාපෘතියට අපි රට හැටියට තිබුණේ ඒක international trade organization එකෙන් තමයි ආධාර මුදල් සපයලා තිබුණේ රට හැටියට. රට හැටියට අපි government එක දෙන්න ඕනි ඒගොල්ලන්ගේ ඉන්න තැන. එතකොට මං කතා කරලා තමයි මම 8 වෙනි තට්ටුව ඒකට වෙන් කරලා දුන්නේ. එතකොට මට දැන ගන්න හම්බුණේ එතන හිටියේ සර් foreignersලා. foreignersලත් හිටියා . local අයත් හිටියා. Project director හිටියෙත් foreigner කෙනෙක් තාමත් මම හිතන්නේ ඒක එතනමයි ඉන්නේ. එතකොට මට දැන ගන්න හම්බුණේ සැකයක් ඇතිවුණා. ඇත්තටම ඒ දවස්වල සැකයක් ඇති වුණා ගරු ඇමතිතුමා යන හැම තැනම මේ ත්‍රස්තවාදයට සම්බන්ධ කිසිවක් සැකයක් ඇතිවුණා. ඒක තමයි හේතු වුණේ. නමුත් ඒක බලනකොට එහෙම එකක් තිබුනේ නැහැ.

ප්‍ර: එතකොට ඔබ තාමත් විශ්වාස කරනවා එවැනි එහෙම සැක සහිත සැකකටයුතු දෙයක් ඒ 9 වෙනි තට්ටුවේ ඒ කාමරවල සිද්ධ වුණේ නැහැ කියලා?

පි: මම විශ්වාස කරනවා. මම දන්නේ නැහැ ඇත්තටම. මම දන්නේ නැහැ. එතන හිටපු පුද්ගලයෝ අනුව කොහොම කෙරුන ද කියලා. නමුත් මම

FAIR COMMENT BY JEZEEM

හිතන්නේ එහෙම එකක් වුණේ නැහැ කියලා තමයි මගේ විශ්වාසය තියෙන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කියන්න පුළුවන් ද ඔබ අමාත්‍යාංශයේ කටයුතුවලට අමාත්‍යවරයා මැදිහත් වෙන්නේ කුමන අවස්ථාවල දී ද?

පි: සර් රිෂාඩ් බදියුර්දීන් ඇමතිවරයා බොහෝ අවස්ථාවල සහභාගී වෙනවා. මොකද මම ඇත්තටම ඇමතිවරු මම ලේකම්වරු හැටියට කටයුතු කරලා තියෙන්නේ රිෂාඩ් බදියුර්දීන් ඇමතිවරයා එක්ක විතරයි. නමුත් මං රාජ්‍ය සේවයේ අවුරුදු 30 ක් රාජ්‍ය සේවය. මම ගොඩාක් ඇමතිවරුත් එක්ක කටයුතු කරලා තියෙනවා. රිෂාඩ් බදියුදීන් ඇමතිවරයා මම දැක්කේ මට වඩා බාල අමාත්‍යවරයෙක්. මම දැක්කේ තරුණ අමාත්‍යවරයෙක් විදිහට හැම දෙයක් ගැනම හොයලා බලන ඇමතිවරයෙක්. ඒ කියන්නේ සමහරක් වෙලාවට එතුමා පසු කාලයක දී කිව්වා එතුමා engineering NDT කරා කියන කාරණය. සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය මුදල්වලින් දැඩි ලෙස හොයා බලපු ඇමතිවරයෙක්. ඒ වගේම මට තේරුම් ගියා මම ලේකම්වරයා හැටියට කටයුතු කරන කොට එතුමා එතුමාගේ දේශපාලන කටයුතුවලත් දැඩි කැපකිරීමෙන් කටයුතු කරපු ඇමතිවරයෙක්.

ප්‍ර: දේශපාලන කටයුතු නෙවෙයි. ඔබගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් ඔබට මෙවැනි අබලි ද්‍රව්‍ය බැහැර කිරීම් වගේ එවැනි කටයුතුවලදී සහ රාජකාරි කටයුතුවලදී තමන්ට උපදෙස් ලබා දෙනවද?

පි: උපදෙස් ලබා දෙනවා. ඇමතිවරයා උපදෙස් ලබා දෙනවා.

ප්‍ර: ඒ උපදෙස් කුමන ආකාරයෙන් ද දේශපාලනට බර වී ද නැතහොත් ?

පි: කවදාවත් සර් මට එහෙම දේශපාලන වශයෙන් උදව් කරන්න කියලා කවදාවත් කියලා නැහැ. මට දවසක් කිව්වා එතුමා ඔබතුමා අමාත්‍යාංශයේ වැඩ බලා ගන්න. මං මගේ දේශපාලන වැඩ බලා ගන්නම් කියන කාරණය. මට කවදාවත් එහෙම කිසිම බලපෑමක් කරල නැහැ. මං මෙතන සාක්ෂි දෙන්නේ දිවුරුම්පිට. කිසිම බලපෑමක් මට කරලා නැහැ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය.</u>

ප්‍ර: Mr. අශෝක ඔබ අර මීට පෙර සඳහන් කරානේ 8mm යි 3mm යි පිළිබඳව සහ කුඩා කර්මාන්තකරුවන්ගේ ගැටලුව මොකක්ද ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද value addition එක 8mm කුමක්ද කියා. කරන value addition එක?

FAIR COMMENT BY JEZEEM

පි: මැඩම් මට ඒ පැත්තේ technical knowledge එකක් නැහැ. නමුත් මම තේරුම් ගත්තේ 8mm කියන්නේ ලොකු කම්බියක්. ලොකු rod එකක්. ඒක හදන්න වෙන මහන්සිය අඩුයි 3mm ට කම්බිය හදනවට වඩා. එතකොට අර කර්මාන්තකරුවෝ කිව්වේ සර්ලා දෙනවා නම් අවසර දෙන්න 3mm ට, 8mm ට දෙන්න එපා. 3mm දෙන්න කියලා. හැබැයි මැඩම් අපි මේවා අපනයනය කරන්න දෙන්නේ මොරටුව විශ්වවිද්‍යාලය. ඊට පස්සේ ITI ආයතනය. නර්ඩ් කියන ආයතන 3 න් සහතිකයක් අරගෙන. ඒගොල්ලෝ සහතික කරනවා. මේකේ 35% කට වඩා වැඩි වටිනාකමක් තියෙනවා කියන කාරණය. value addition එක එතකොට තමයි අපේ අමාත්‍යාංශයෙන් අපි නිර්දේශයක් ලබා දෙන්නේ export control department එකට. මේක අපනයන කරන්න නිර්දේශ කිරීම සුදුසුයි කියලා. හැබැයි ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබ්ච්ච රැස්වීම්වලදී ගත්ත තීරණ අනුව මම දුන්නේ නැහැ. නමුත් අන්තිමට ඒක දෙන්න සිද්ධ වුණා.

ප්‍ර: දැන් ඔය value addition එක 35% අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් අනුව ද කරේ?

පි: ඔව්. අමාත්‍ය මණ්ඩලයේ තීරණයක්.

ප්‍ර: ඒ අමාත්‍ය මණ්ඩල සංදේශය ඔබ ළඟ තියනවද ?

පි: මගේ ළඟ තියෙනවා.

ප්‍ර: ඒක දැම්මේ කවුද ඒ අමාත්‍ය මණ්ඩල සංදේශ?

පි: එතකොට දාලා තිබුණේ ඇමතිවරු 3 දෙනෙක් එක්ක ඒක දාලා තිබුණේ.

ප්‍ර: ඒ මොන අවුරුද්දේ ද?

පි: මට විනාඩියක් දෙන්න. 2014 මට මතක හැටියට. 2014 දාලා තිබුණේ. ඒක ඇමතිවරු 3 දෙනෙක් අත්සන් කරලා තිබුණා.

ප්‍ර: ඔබ ළඟ ඒක තියනවද?

පි: ඔව්.

ප්‍ර: පිටපතක් දෙන්න පුළුවන්ද ?

පි: දෙන්න පුළුවන්.

ප්‍ර: තීරණයක් තියෙනව හොඳයි?

පි: තීරණයක් තියෙනවා.

ප්‍ර: ඒක 2014 කියලා ඔබ සඳහන් කරා?

පි: මේකේ සඳහන් කරලා තියෙන්නේ 2014 මැයි 19 තමයි මේ තීරණය අරන් තියෙන්නේ එදා තිබ්ච්ච අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී. ඒක තීරණය අරන් තියෙනවා . ඒක යෝජනා කරලා තියෙනවා. මේක ඉස්සෙල්ලාම දාලා තියෙන්නේ ඇමැතිවරු 3 දෙනෙක්ගේ නම් සඳහන් වෙනවා.

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද ඇමතිවරු 3 දෙනා කවුද කියලා?

පි: ඇමතිවරු වෙන්නේ එක්කෙනෙක් ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා, ඊළඟට රිෂාඩ් බදියුර්දීන් ඇමතිතුමා. ඊළඟට ලක්ෂමන් යාපා අබේවර්ධන

FAIR COMMENT BY JEZEEM

ඇමතිතුමා. ඒකේ අත්සන් කරලා තියෙනවා රිෂාඩ් බදියුර්දීන් ඇමතිතුමා සහ ලක්ෂමන් යාපා ඇමතිතුමා. එතකොට එකේ දිනය තියෙන්නේ 2014.04.11 ඊට පස්සේ මේ හා සම්බන්ධවම අරකෙ අත්සන් කරලා නැති වුණත් ඩගලස් දේවානන්ද ඇමතිතුමා නැවත note එකක් දාලා තියෙනවා. 2014.05.07 හරියට අරක දාලා තියෙන්නේ 2014.04.11 note to කැබිනට් දාලා තියෙනවා 2014.05.07 ඒ දෙකම සලකා බලලා අනුමැතිය දීලා තියෙනවා.

ප්‍ර: ඔය ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා ඔය අමාත්‍ය මණ්ඩල සංදේශය ඇයි අත්සන් කරලා නැත්තේ කියලා ඔබට කියන්නට පුළුවන්ද?

පි: මට ඒක ගැන අවබෝධයක් නැහැ.

ප්‍ර: ඔය note to the cabinet කියලා දාන එකේ මොනවද එතුමා ලියන්නේ?

පි: මේකේ දළ වශයෙන් තියෙන්නේ මැඩම් එතකොට අර තීරණයක් අරන් තිබුණා. Scrap export කරන්න බැහැ කියලා. එතකොට මේකේ දළ වශයෙන් කියන්නේ ලංකාවේ එකලස් කළ හැකි ඒවා export කරන්න එපා. ඊට පස්සේ ලංකාවේ එකලස් කළ නොහැකි ඒවා export කරන්න දෙන්න. එතකොට ලංකාවේ එකලස් කරන්න පුළුවන් ඒවාත් value addition එකක් කරාට පස්සේ අර ආයතන 3නේ මොරටුව Universityය, නර්ඩ් ආයතනය සහ ITI ආයතනය කියන ආයතන වලින් එකක එක සහතිකයක් අරගෙන මේගොල්ලන්ට export කරන්න දෙන්න කියන කාරණය.

ප්‍ර: ඔය අමාත්‍ය මණ්ඩල සංදේශය දමන අවස්ථාවේ දී ඩග්ලස් දේවානන්ද අමාත්‍යතුමා නේද සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා?

පි: ඔව්.

ප්‍ර: එතකොට එතුමා යටතේ තමයි ඔබ මෙම කොමිෂම හමුවේ දී කතා කරන ලද සුළු කර්මාන්ත කුඩා කර්මාන්ත ඔය සාම්ප්‍රදායික ශිල්පීන්ගේ කර්මාන්ත ගම්මාන සියල්ලම තිබුණේ එම අමාත්‍යවරයාගේ විෂය පථය යටතේ නේද?

පි: නැහැ අපිට මැඩම් එහෙම්මම කියන්න බැහැ. මොකද මෙතන ඒ අවස්ථාවේ දී මම මේ ඒ Paper එක දිහා බලාගෙන කතා කරන්නේ. මම ඒ අවස්ථාවේ හිටියේ නැහැ. ඒ අවස්ථාවේ රිෂාඩ් බදියුර්දීන් ඇමතිවරයා ඉඳලා තියෙන්නේ Minister of industry and commerce හැටියට. ඊට පස්සේ ලක්ෂමන් යාපා ඇමතිතුමා ඉඳලා තියෙන්නේ Minister of Investment Promotion හැටියට. එතකොට මේ 3 දෙනාටම ලංකාවේ කර්මාන්ත සංවර්ධනය කියන එක අදාලයි. අපිට කියන්න බැහැ. මෙතන ඇත්තටම බැලුවාම එහෙම බැලුවහම සුළු කර්මාන්ත විතරයි ඩග්ලස්

FAIR COMMENT BY JEZEEM

දේවානන්ද ඇමතිතුමාට අයිති. නමුත් ඇත්තටම මේ රටේ මහා පරිමාණ කර්මාන්ත තියෙනවා. අපනයන කරන කර්මාන්ත තියෙනවා. සුළු කර්මාන්ත තියෙනවා. මෙතනින් ඒ දෙන්නෙක් අත්සන් කරලා තියෙනවා. මොකද අපනයන කර්මාන්ත භාර වෙලා තියෙන්නේ ගොඩාක් වෙලාවට ඒ අවස්ථාවේ දී Minister of Investment Promotion ඊළඟට Minister of industry and commerce වලට තමා අනිත් කර්මාන්ත සම්බන්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර: නමුත් ඩග්ලස් දේවානන්ද අමාත්‍යතුමා මේ අර දැන් මෙම කොමිසම හමුවේ ඉදිරිපත් කරානේ guide line එකක්. අර අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ. අබලි ද්‍රව්‍ය අපනයනය කිරීම නතර කළ යුතුයි සුළු කර්මාන්තකරුවන්ට මෙම අබලි ද්‍රව්‍ය ලබා දිය යුතුයි කියලා?

පි: ඔව්

ප්‍ර: ඒකෙන් පස්සේ ද ඔය කැබිනට් paper එක දැම්මේ දාල තියෙන්නේ? ඒ දිනෙන් පස්සේද?

පි: මම හිතන්නේ ඒ දිනෙන් පස්සේ වෙන්න ඕනෑ මේ තීරණ අරන් තියෙන්නේ 2014 මැයි 30. මට අර තීරණය

ප්‍ර: ඔබට පොඩ්ඩක් කියවලා බලන්න පුළුවන් ද ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාගෙ එකේ මොනවද කියන්නේ කියලා දිග නැත්නම්? දිගයි ද ඒක paper එක

පි: pages 4ක් තියෙනවා.

ප්‍ර: ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාගේ?

පි: නැහැ ඩග්ලස් දේවානන්ද ඇමතුතිමාගේ note එක one 1 page තියෙන්නේ. ඒකේ කියන්නේ මැඩම් එකක් ආයතන 3න් එකකින් සහතිකය අරගෙන ලබා දෙන්න කියන කාරණය. 35%කට වඩා value addition එකක් තියෙනවා හෝ 35% කට වඩා value addition එකක් තියෙනවා නම් export කරන්න අවසර දෙන්න කියන කාරණය.

ප්‍ර ඔබ අමාත්‍යාංශයේ ලේකම්ව සිටියේ නැහැ මේ කාලයේදී නේද?

පි: නැහැ මම සිටියේ නැහැ. ඒ වුණාට මැඩම් මේ තීරණ මත පදනම්ව තමයි අමාත්‍යාංශයෙන් export recommendation දීලා තියෙන්නේ.

ප්‍ර: recommendation එක දුන්නේ?

පි: ඔව්.

ප්‍ර: කාටද ඔය අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පස්සේ export recommendation එක දුන්න සමාගම් පිළිබඳ විස්තර තිබෙන්නේ කොහේද?

පි: කර්මාන්ත අමාත්‍යාංශයේ තියෙනවා.

ප්‍ර: ඔබට මතකයක් නැද්ද මතකයෙන් කියන්න කාටද මේ export recommendation

FAIR COMMENT BY JEZEEM

පි: මැඩම් ගොඩාක් දීලා තියෙනවා. එක කාරණයක් නෙවේ. අවුරුද්දක් ගත්තාම අවුරුද්දට ගොඩාක් අය දෙනවා අපි ඔය දුන්නු මම ඉන්න කොට මට මතකයි දුන්නා යකඩ කුඩු. ඒ කියන්නේ මේ යකඩ කපන කොට එකතු වෙන කුඩු එක්කහු කරලා export කරන මිනිස්සු ඉන්නවා. සමහරත් වෙලාවට අපේ තියෙන පරණ කොම්පියුටර් අරමේ මෙහෙ. එකතු කරලා කඩලා තඹ වෙනම වෙන් කරනවා. පිත්තල වෙනම වෙන් කරනවා. යකඩ වෙන් කරනවා. ඒ වගේ export කරන මිනිස්සු ඉන්නවා. මේක ලොකු industryයක්. ඒ විතරක් නෙවෙයි ඉන්දියාවෙන් වගේ මට මතකයි ඒ කාලේ පුද්ගලයෙක් ආවා. ඉන්දියාවෙන් මේ නළුවෙක් වගේ පුද්ගලයෙක් ඇවිල්ලා මොකද ඇහුවාම කරන්නේ යකඩ අපනයනය කරනවා කිව්වා. මම කිව්වා ඔයා ගිහිල්ලා film එකක් මොනවා හරි කරන්න කියලා. මොකද දැන් ඒවගේ පුද්ගලයෝ ඉන්නවා. දේශිය අය වගේම විදේශිය අය ඉන්නවා. මේක ලොකු කර්මාන්තකරුවෝ සම්බන්ධ මේකක්.

ප්‍ර: දැන් ඔය කොලෝසියස් කියන සමාගම ඔබටත් හොඳට මතකයිනේ අර බෝම්බ ප්‍රහාරයින් පස්සේ?

පි: ඊට පස්සේ මතකයි

ප්‍ර: ඒ සමාගම ඔය අමාත්‍ය මණ්ඩල සංදේශය තියෙන වරප්‍රසාදය භාවිතා කරලා ?

පි: අනිවාර්යයෙන්ම මැඩම්. මේක 35%ක් recommendation එක export වලට දෙන්නේ මේ යටතේ ආපු වරප්‍රසාද යටතේ. නැත්නම් අපිට දෙන්න බැහැ කොලෝසියස් සමාගමට.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

මේ අවස්ථාවේ දී උතුමාණෙනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන 2014 මැයි 30 දින දරන අමාත්‍ය මණ්ඩල තීරණය C – 785 වශයෙන් සළකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන 2014.04 මාසේ 11 දින දරන මෙහි ඉංග්‍රීසියෙන් තියෙන්නේ උතුමාණෙනි note to cabinet කියලා. ඒ අනුව ඒ අමාත්‍ය මණ්ඩල සටහන C- 785 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

මේ අවස්ථාවේ දී එම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන අතර තවත් කැබිනට් මණ්ඩල සටහනක් note to cabinet වශයෙන් ඒ ලේඛනයේ සටහන් වෙලා තියෙන්නේ. 2014. 05 මාසේ 07 දින දරන අදාළ ලේඛනය C- 786 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ ඉදිරිපත් කරන ලද ලේඛන අතර කැබිනට් සංදේශ ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒක පැහැදිලි කරන්න පුළුවන් ද මහත්මයාට?

පි: දැන් මෙහෙමයි සමහරක් වෙලාවට ඇමතිවරු විවිධාකාරයේ සටහන් ඉදිරිපත් කරනවා. ඒගොල්ලෝ ඉදිරිපත් කරනවා අමාත්‍ය මණ්ඩල ප්‍රතිකා හැටියට. සමහරක් වෙලාවට note to කැබිනට් හැටියට ඉදිරිපත් කරනවා. මම හිතන්නේ මේකේ මට පොඩ්ඩක් ආපහු බලන්න පුළුවන්ද

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: note to the cabinet එක හැමෝටම යන්නේ නැහැ වෙලාවට?

පි: ස්වාමීනි ඒක යවන අවස්ථාත් තියෙනවා. නැති අවස්ථාත් තියෙනවා.

ප්‍ර: කැබිනට් memorandum හැමෝටම යවනවද? note to the cabinet හැමෝටම යන්නේ අවසාන මොහොතේ?

පි: ඔව් මේක දෙකම note to cabinet හැටියට තමයි දාලා තියෙන්නේ. සමහරක් වෙලාවට එහෙම වෙන අවස්ථා තියෙනවා.

ප්‍ර: අවසාන මොහොතනේ note to the cabinet සාමාන්‍යයෙන් දාන්නේ?

පි: නැහැ සර් මෙහෙමයි. දැන් ඉස්සෙල්ලා ගත්ත තීරණයක් සම්බන්ධයෙන් තමයි බොහෝ වෙලාවට note to cabinet දාන්නේ. අලුත්ම එකක් නම් cabinet memorandum එකක් හැටියට යන්නේ. note to the cabinetනුත් circulate කරනවා මම දන්න විදිහට නම්.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

2014 මැයි 30 දරන අමාත්‍ය මණ්ඩල තීරණය C – 787 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔබ ඉදිරිපත් කරපු C – 787 දරන කැබිනට් තීරණයට අනුව නේද ක්ලොසියස් සමාගමට මේ 2017 සහ 2018 වර්ෂවල දී මේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් විශාල වශයෙන් අබලි ද්‍රව්‍ය මිලදී ගෙන අපනයන කරන්න පුළුවන් වෙන්න හැකියාව ලැබුණේ ඒ තීරණය අනුව නේද?

පි: ඒක විතරක් හින්දා නෙවෙයි සර්. ඒක තමයි එතන තියෙන වැදගත් කාරණය. මට මේ ඇත්ත සත්‍ය කතා කරන්න වෙනවා.

ප්‍ර: නැහැ කියන්න. අපි දැන ගැනීම සඳහා අහන්නේ

පි: ඒක තමයි ස්වාමීනි මං ඒක තමා දැනුවත් කිරීම මං හිතනවා මගේ යුතුකමක් කියලා. මම දැක්කා මේ ආයතනය සඳහා කර්මාන්ත

FAIR COMMENT BY JEZEEM

අමාත්‍යාංශයෙන් ලබා දීලා තියෙන නිර්දේශ. 2016, 2017, 2018 සහ 2019 වර්ෂවල දී. සර් ඉල්ලලා තියෙනවා මේ සමාගම විතරක්. 2016 වර්ෂයේ මෙට්‍රික් ටොන් 930ක්

ප්‍ර: නැහැ නැහැ. අපි දෙන්නා කතා කරන්නේ 2ක් ගැන. මම අහන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් අබලි ද්‍රව්‍ය ලබා ගැනීම ගැන විතරක් නෙවෙයි මං අහන්නේ. මං අහන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලබා ගත්ත මේ අබලි ද්‍රව්‍යවලට යම්කිසි අගය එකතු කිරීමක් කරලා අපනයනය කරන්න පුළුවන්කම කොලෝසියස් පුද්ගලික සමාගමට ලැබුණේ මේ C – 787 දරන කැබිනට් තීරණය මත නේද කියලායි මම අහන්නේ?

පි: ඔව් ඔව් අපනයනය කරන්න පුළුවන් වුණේ ඒ හින්දා.

ප්‍ර: එතකොට ඒ C – 787 දරන කැබිනට් තීරණය තිබ්බේ නැත්නම් කොලොසියස් පුද්ගලික සමාගටම ඒක අපනයනය කරන්න බැහැ?

පි: බැහැ.

ප්‍ර: ඒක ලංකාවේම නිෂ්පාදනයක් හැටියට තියාගන්න වෙනවා?

පි: ලංකාවේ නිෂ්පාදනයක් හැටියට තියා ගන්න වෙනවා.

ප්‍ර: එතකොට ඒ C – 787 දරන කැබිනට් තීරණය ගනු ලබන්නේ C – 785 දරන note to the cabinet එක පදනම් කරගෙන නේද?

පි: ඒ දෙකම එකට සම්බන්ධයි.

ප්‍ර: එතකොට C – 785 දරන . note to the cabinet එක කැබිනට් පත්‍රිකාව අත්සන් කරලා තියෙන අමාත්‍යවරු දෙදෙනා කවුද?

පි: ඔතන රිෂාඩ් බදීයුර්දින් ඇමතිතුමයි. ලක්ෂ්මන් යාපා වර්ධන ඇමතිතුමායි.

****

<u>**ගරු විනිසුරු අදිකාරි මැතිනිය**</u>

ප්‍ර: ඔබ ධූරය දරන්නේ ?

පි: 2017 ඔක්තෝබර් 04

ප්‍ර: ඔබට මතකයක් තියෙනවද ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට පිත්තල හිස් කොපු ලබා දීමේ තීරණය ගත්තේ කවදාද කියලා?

පි: මට මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර: අමාත්‍යාංශය මේ පිළිබඳව සාකච්ඡා කරලාද මේ ආරක්ෂක අමාත්‍යාංශය දෙන්න තීරණය කළේ?

පි: එහෙම අවශ්‍ය නැහැ ඇත්තටම ජනාධිපති කාර්යාලයෙන් චක්‍රලේඛනයක් යවලා තියෙනවා. රජයේ ආයතනවල තියෙන ඒ ද්‍රව්‍ය IDB එකට ලබා දෙන්න කියලා.

ප්‍ර: කොයි කාලේද ඒ යවලා තියෙන්නේ ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඇයි ජනාධිපති කාර්යාලයෙන් අර මුල් cabinet paper එකෙන් පස්සේ චක්‍රලේඛනයක් යවලා තියෙනවා. මම ඒක ලේඛන ගත කරා. ඒ චක්‍රලේඛනයේ තියෙනවා.

ප්‍ර: මොන අවුරුද්දේද? අබල් ද්‍රව්‍ය දෙන්න කියලා.

පි: 2005 මට මතක විදිහට. 2005

ප්‍ර: 2005 ඒ චක්‍රලේඛය හරි තිබුණට ආරක්ෂක අමාත්‍යාංශය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට පිත්තල ලබාදීලා නැහැයි කියන එක ඔය guide line එකේ බලන්න. There is a table which says about scrap item එක කියලා මොන මොන ආයතන ද දෙන්නේ කියලාත් තියෙනවා ඒකේ?

පි: නැහැ මැඩම් ගොඩාක් ආයතන දෙනවා සියලුම.

ප්‍ර: ඔයා ඒක බලන්න වුට්ටක්. මේ මෙකේ මේ Table එක Table 1 brass කියන එක ගැන බලන්න. brass ලබා දෙන ආයතන ලෙස ත්‍රිවිධ හමුදාව හෝ ආරක්ෂක අමාත්‍යාංශය ඔය Table එකේ සඳහන් කරලා තියෙනවද?

පි: නැහැ මේකේ නම් සඳහන් කරලා නැහැ. හැබැයි මට හිතෙන්නේ අර චක්‍රලේඛනයේ විදිහට. මගේ දැනුමේ හැටියට චක්‍රලේඛය නිකුත් කරලා තියෙන්නේ මේ ගත්ත කැබිනට් decision එක මත.

ප්‍ර: මම ඔබට යෝජනා කරන්නට කැමැතියි Mr. රංජිත් ඔය අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ ත්‍රිවිධ හමුදාවල් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට කොතරම් උත්සාහ කළද පිත්තල ලබා නොදීම හේතු කොට ගෙන තමයි ඒ ආයතන අතහැරලා දමලා තියෙන්නේ කියලා ඔබ ඒක පිළිගන්නවද?

පි: මොකක්ද මැඩම් මට තේරුණේ නැහැ.

ප්‍ර: දැන් ඔය අමාත්‍ය මණ්ඩල සංදේශයේ තියෙන guide line එකට පිත්තල යටතේ සඳහන් වෙන්නේ නැහැනේ ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ ත්‍රිවිධ හමුදාවල් ලබා දෙනවා කියලා පිත්තල?

පි: ඔව්.

ප්‍ර: නමුත් ඔබ දන්නවානේ පිත්තල ලබා ගත යුතු ප්‍රධානතම ආයතන තමයි ආරක්ෂක අමාත්‍යාංශය කියලා?

පි: ඔව්

ප්‍ර: ඒ නිසා මම ඔබට යෝජනා කරනවා. ආරක්ෂක අමාත්‍යාංශය ඒ වන විට ඔය අමාත්‍ය මණ්ඩල සංදේශය දමන අවස්ථාවේ දී කිසිම ආකාරයකින් පිත්තල ලබාදුන්නේ නැහැ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට. ඒ නිසා තමයි ඔය අමාත්‍ය මණ්ඩල සංදේශයට ඒ ඇතුළත් නොවුණේ කියලා? එය ඔබ පිළිගන්නවද එහෙම නිසයි ඒක ඇතුල් වෙලා නැත්තේ කියලා?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: මට ඒක හිතන්න බැහැ මොකද කියලා . මට හිතාගන්න බැහැ මේ අනිත් තැන්වල නම් තියෙනවා. Navy එක තියෙනවා. Sri Lanka Airforce තියෙනවා. Sri Lanka Army තියෙනවා. දැන් Scrap and cast iron කිව්වම ඒවා තියෙනවා. අලුමිනියම් මොකද මේ පිත්තල කියන එක යටතේ ඒක නාවේ කියන එක මට හිතාගන්න බැහැ මොකක්ද තියෙන technical issue එක කියන එක.

ප්‍ර: එතකොට දැන් මේ 2017 වසරේ ආරක්ෂක අමාත්‍යාංශය හදිස්සියේම තමයි දැන් ඔබත් අමාත්‍යාංශයේ ලේකම් හැටියට රැස්වීමක්වත් පවත්වලා නෙවෙයිනෙ මේ පිත්තල දීමේ තීරණයකට ඇවිල්ලා තියෙන්නේ නේද?

පි: ඔව්.

ප්‍ර: ඔබ සම්බන්ධ වුණේ නැහැනේ ඒ අමාත්‍යාංශයේ ලේකම්ට ලියුම් ලිවීමට පිත්තල ලබා දෙන්න කියලා?

පි: නැහැ මම සම්බන්ධ වුණේ නැහැ.

ප්‍ර: ඔබගේ ගරු අමාත්‍යතුමා ඒ අමාත්‍යතුමාට ලියුම් ලිව්වද පිත්තල ලබා දෙන්න කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් කියලා?

පි: මට දැනුවත් නැහැ.

ප්‍ර: එතකොට එහෙම තිබෙද්දි හදිස්සියේම එම පිත්තල ලබා දීමේ තීරණයක් ආරක්ෂක අමාත්‍යාංශය ගන්නවා. ඒ අරන් තියෙන්නේ කැබිනට් decision එකකින්ද?

පි: මම දන්නේ නැහැ ඒක.

ප්‍ර: ඔබ දන්නව ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කොලොසියස් පෞද්ගලික සමාගම කර්මාන්තකරුවෙකු ලෙස ඔය පිත්තල ඉල්ලීමේ ලියාපදිංචිය සිද්ධ කරලාත් තියෙන්නෙත් ඔය 2017, 2018 වර්ෂවල නේද කියලා?

පි: මම හිතන්නේ 2017 මැයි

ප්‍ර: 2017 වර්ෂයේ මෙම ආරක්ෂක අමාත්‍යාංශයේ පිත්තල දීමට ආසන්නව කාලයක දුන්නට පස්සේ ආසන්න හෝ දීමට පෙර ආසන්න කාලයේ?

පි: දීමට පෙර.

ප්‍ර: ඒ එක්කම ඔබ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස දන්නවද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා විසින් එහි අධ්‍යක්ෂක ඔය marketing අලෙවි අධ්‍යක්ෂක විසින් ඔය guide line වලින් පැහැදිලිව අධ්‍යක්ෂක marketing යටතේ පවරා තිබූ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ඔහුගෙන් අයින් කර එහි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ලෙස guide lines වල තියෙන උපදෙස්වලට පටහැනිව පවරා දීම කරලා තියෙන්නෙත් 2017 මැයි මාසේ හෝ ජුනි මාසයේ දී කියලා. දන්නවද ඔබ එය ?

පි: මම දන්නේ මේ මේකෙන් පස්සේ පරීක්ෂණයෙන් පස්සේ දන්නවා.

ප්‍ර: ඒ අනුව ඔබට කිසිමයම් ආකාරයකට උපකල්පනයක් කරන්නට පුළුවන්ද මේ සියලුම සිදුවීම් එකිනෙකට අනුසංගිකව ඇතිවී තිබෙන

FAIR COMMENT BY JEZEEM

සිදුවීම් බවට ආරක්ෂක අමාත්‍යාංශයේ පිත්තල දෙනවා. 2017 අගෝස්තු හෝ සැප්තැම්බර් මැයි මාසේ. ඊට පස්සේ කොලෝසියස් සමාගම ගිහිල්ලා ආයේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් පිත්තල ඉල්ලීම සඳහා කර්මාන්තකරුවෝ ලෙස register වෙනවා. ඒ සියල්ලම ආසන්නයේදීම එහෙම ආයතනයේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් පරිදි පත් කළ සිටි අධ්‍යක්ෂකවරයාගේ මේ විෂය අයින් කරලා එහි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට මෙම අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ රාජකාරි කටයුතු අමාත්‍ය මණ්ඩල සංදේශයේ කොන්දේසි වලට පටහැනිව සහ මා හිතනවා මා විශ්වාස කරනවා එම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියකින් තොරව කර තිබෙනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: ඔබට පැහැදිලි වෙනවද කිසියම් එකිනෙකට අනුසංගික සබඳතාවයක් මේ තුළ තිබිය හැකියි කියලා හෝ?

පි: මට හිතා ගන්න බැහැ ඒක.

ප්‍ර: දැන් ඔබ අර කමිටුවක් පත් කරානේ බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඔය අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ හොයන්න වාර්තාවක් ඉදිරිපත් කරානේ එම කමිටුවේ ඉන්නවද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කර සිටින අමාත්‍යාංශ නිලධාරීන් කවරෙකු හෝ?

පි: මා දන්නා ආකාරයට නම් නැහැ. මෙතන හිටියේ චිත්‍රපාල මහත්මයායි ඉන්දික අරන්තුංග මහත්මයයි සිතාරා ජයසේන මහත්මියයි.

ප්‍ර: දැන් ඔබ ලේකම් නිසා දන්නා ආකාරයට නැහැයි කියනවට වඩා සුදුසුයි ලේකම්වරයාගේ දන්නේ නැතුව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයට නිලධාරීයෙක් පත් කරන්නට බැහැ වෙනත් අයෙකුට. එක්කෝ ඒ ගරු අමාත්‍යතුමාගේ අත්සනින් ලිපියක් යන්න ඕනි එහෙම නැත්නම් අමාත්‍යාංශයේ ලේකම් තමයි ඒ තනතුරුවලට පත් කරන්නේ. ඔබට පැහැදිලිව කියන්න පුළුවන්ද මේ 3න් දෙනාගෙන් කවුරුත් නැහැ කියලා එම අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් මිස?

පි: මම හිතන්නේ නැහැ කියලා.

හොඳයි බොහොම ස්තුතිය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: අවසාන වශයෙන් එක ප්‍රශ්නයක් තියෙනවා Mr. අශෝක දැන් ඔය මාර්ග උපදේශ සංග්‍රහයේ පැහැදිලිවම කියලා තියෙනවානේ මගේ උගත් කොමසාරිස්තුමිය කිව්ව විදිහට මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය පිළිබඳව සම්පූර්ණයෙන් වගකීම දරන්න ඕන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ වගකීම හා අධ්‍යක්ෂණය දරන්න ඕනෑ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක අලෙවි ඒක තියනවානේ?

FAIR COMMENT — BY JEZEEM

පි: ඔව්

ප්‍ර: ඒක තියෙනවානේ ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒක කැබිනට් තීරණයක් අනුවනේ අරගන්නේ ?

පි: ඔව්. මාර්ග උපදේශය අනුමත කරලා තියෙනවානේ කැබිනට් එකේ.

ප්‍ර: එතකොට එම ධූරය දරන තැනැත්තාගෙන් අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය වෙනත් තැනැත්තෙකුට පවරන්න පුළුවන්ද කැබිනට් අනුමැතිය නොමැතිව?

පි: කැබිනට් එකට දැන්වුවානම් හොඳයි ඒක ඉතින් ඇත්තටම. දැන් මෙහෙමයි ස්වාමීනි විෂයක් පවරන්න ඒක අධ්‍යක්ෂක අලෙවිට පවරලා තියෙන එකම විෂය නෙමෙයි ඒක. එතකොට ඒ වගේ විෂයක් මාරු කරනකොට අපි අනන්තවත් ඒ විෂය මාරු කරනවා. දැන් අතිරේක ලේකම්වරුන්ගෙත් මම ඉන්නකොටත් මම රාජකාරිය මාරු කරා.

ප්‍ර: ඒක හරි Mr. අශෝක නමුත් කැබිනට් මණ්ඩලය විසින් යම්කිසි දෙයක් අනුමත කරන්නේ යම්කිසි ක්‍රමවේදයකට අනුවනේ ඒ කියන්නේ යම්කිසි පරමාර්ථ එහෙම තියාගෙන නේ නේද?

පි: ඔව්

ප්‍ර: එවැනි වගකීමක් මේ අධ්‍යක්ෂක අලෙවිගෙන් ඉවත් කරන්න පුළුවන් ද කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාට?

පි: ඉවත් කරන්න පුළුවන්.

ප්‍ර: කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරපු මාර්ග උපදේශවලට පටහැනිව?

පි: නැහැ ඇත්තටම ඒ වෙලාවේ එයා ඒක අයින් කරලා ඒ තනතුර වෙනස් කරානම් හරි නමුත්

ප්‍ර: තනතුර වෙනස් කරන්නේ නැතුව මම කියන්නේ ඒ ධූරය එහෙම්මම තියෙනවා. අධ්‍යක්ෂක අලෙවි ධූරය එහෙම්මම තියෙනවා. ඒ ධූරය දරන තැනැත්තා එහෙම්මම ඉන්නවා.

පි: ඔව්

ප්‍ර: අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය වෙන තැනැත්තෙකු භාරයට පත් කරනවා?

පි: එයා යටතේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂක.

ප්‍ර: එයා යටතේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂක නෙවේ. සම්පූර්ණයෙන්ම ඔහුගේ අධීක්ෂණයෙන් පිටතට අරගෙන?

පි: ඔව්

ප්‍ර: ඒක කරන්න පුළුවන්ද?

පි: ඒක නොකර හිටියානම් ඇත්තටම හොඳයි ඉතින්. ඒක තමයි මට කියන්න තියෙන්නේ.

ප්‍ර: ඔබව දැනුවත් කෙරුවද එවැනි දේකට?

පි: නැහැ මා දැනුවත් කෙරුවේ නැහැ.

ප්‍ර: ඔබව දැනුවත් කෙරුවා නම් ඔබට ඒකට අවසර දෙන්න පුළුවන් ද කැබිනට් මණ්ඩල දැනුම් දීමක් කරන්නේ නැතුව?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමීනි අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මාර්ග උපදේශයක් තියෙන කොට මම ලේකම්වරයා හැටියට කියන්නේ මාර්ග උපදේශය අනුව කටයුතු කරන්න කියලා.

ප්‍ර: එතකොට අලෙවි අධ්‍යක්ෂක ධූරය යටතේ තිබ්බ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ඔහුගෙන් ඉවතට අරගෙන ඔහුගේ අධීක්ෂණය සම්පූර්ණයෙන්ම ඉවත් කර වෙනත් තැනැත්තෙකුට පැවරීම මාර්ග උපදේශි සංග්‍රහයට විරුද්ධව කරන බලවත් ක්‍රියාවක් කියලා ඔබ පිළිගන්නවද?

පි: ඒක මට එහෙම හිතුනේ නැහැ ඔබතුමා අහන කොටනම් එහෙම හිතෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ පිළිගන්නවද නැද්ද?

පි: මම පිළිගන්නවා.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍ය ද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. අවශ්‍ය නොමැති බව දන්නවයි. සාක්ෂිකරු මුදා හරී.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM